අඟිස්සනවා = (අගිස්සවනවා-හගිස්සනවා) 1. සැබෑදැයි පරීක්ෂා කර බලනවා. 2. ගිවිස්සනවා.

අඟු=1. අග. 2. අගුව. 3. රාහු. 4. අගුරට. 3. මිදුල. 6. තණ කැරලි. 7. මිල. 8. කෑමට ගත් බතින් සතුන්ට දෙන බත් පිඩ. 9. දිරා ගිය පිදුරු අස් කොට අළුතෙන් ගසන පිදුරු. 10. කෑම ඉදුල් කොට පරීක්ෂා කොට බැලීම. 11. කෙළවර.

අඟු කර්ණි = 1. බෙහෙත් පැළෑටියක්. 2. ගොටු කොළ. 3. මිකන් පලා.

අඟු කවනවා = 1. දිරා ගිය පිදුරු අස් කොට සෙවිලි කරනවා.

අඟු කොණ = 1. බිත්තක්කය. 2. අඟු කෙළවර.

අඟුම්බ = (අඟුටු) 1. කපන ලද ගසක ඉතිරි වූ මුල් කොටස.

අගුත්ත = නොරක්නා ලද.

අගුණ = 1. ගුණ නැති. 2 අපථ්‍ය. 3. හැපයට ඔබා වන. 4. නරක. 5. වරද. 6. දෙස.

අගු පක = 1. පිළිකන්න.

අගු පත් = 1. වෙල් හෑංකින් හෙරා ගිය කැබැල්ල. 2. අගු කෙළවර.

අගුපත් කුඹුරු = අගාර කුඹුරු.

අගු පල්ල = 1. ගෙයි පිටිපස්ස. 2. අගු කෙළවර.

අගුප්ත = ගුප්ත නොවන. 2. නොසැඟවුණු. 3. රහසක් නොවන.

අගු බඹුරු = (අගු බඹරු–අගු බඹුරු). 1 අගින් වකුටු වූ. අගින් නැමුණු

අගු බලනවා = 1. කෑම ඉඳුල් කොට පරීක්ෂා කොට බලනවා.

අගු වෙදා = 1. රජුගේ භෝජනයෙන් ටිකක් පළමුකොට කා වස-විෂ දමා තිබේ දැයි පරීක්ෂා කරන වෙද නිලමේ.

අගුරු = 1. අගිල්. 2. දවන විට සුවඳ විහිදෙන ලී වර්ගයක්. 3. ඇට්ටේරිය. 4. මුරුංගා. 5. බර නොවූ. 6 නොවැදගත්. 7. අධම. 8. සැහැල්ලු.

අගුල = (අගුළ) 1. දොර පොල්ල. 2. අගුල් පොල්ල. 3. ඉරුණු වස්ත්‍රයන්ට යා කරන රෙදි කැබැල්ල.

අගුල් ඉද්ද = 1. අගුලක් මෙන් අරින වසන පොල්ල.

අගුල් ගෑනුම් = දොරගුළු ලෑම.

අගුල් ඔංචි = අගුළ වැටෙන උළුවහු කණුව.

අගුල් දිව = අගුලේ දොරට අනු වන කොටස.

අගුල් දුහරුව = 1. ස්ත්‍රී පලඳනාවක්.

අගුල් කොරේ = 1. අගුල වැටෙන සිදුර. 2. අගුල් තව්ච.

අගුව = 1. පිළිකන්න. 2. ගෙයි පිටි පස්සා කොන. 3. පියස්සෙන් පිටට වැටෙන කොටස.

අගුහිරිල්ලීම = 1. අගුවේ වහලට සවිකරන හිරිල්ලීම.

අගූඪ = 1. ගූඪ නොවූ. 2. ලිහිල්. 3. නොසැඟවුණු තේරුම් ඇති. 4. සුගම වූ.

අගෘද්ධ = 1. කෑදර නොවූ. 2. ගිජු නොවූ.

අගෘහීත = 1. නොගන්නා ලද. 2 ඇතුළත් නොවූ.

අගේ = 1. වටිනාකම. 2 අගය.

අගෝචර = 1. අගොදුරු 2. අනැප 3. නුදුටු තැන. 4. විෂය නුවූ

අගෝපිත = 1. ආරක්ෂා රහිත. 2. නොරක්නා ලද.

අඝෝෂ = 1. ඝෝෂ රහිත. 2. අඝෝෂාක්ෂර. (අඩුවෙන් ශබ්ද කරන අකුරු).

අගෝස්තු = 1. එනම් මාසය.

අගෞරවය = 1. ගරු නොකිරීම. 2. නොසැලකිල්ල.

අග් = 1. අග. 2. මුදුන. 3. ඉදු කැමය. 4. ගෙය. 5. මිල.

අග් ගෘහ = (අග්‍රගෘහ) 1. මුදුන. 2. ඉහළ කෙළවර.

අග් උපස්ථාය = 1. අග්‍ර උපස්ථායකයා.

අග්‍ර බීජය = 1. කරටිය සිටුවා පැළ ඇති කිරීම.

අග්‍ර = 1. අග. 2. මුදුන. 3. කොන. 4. අග්‍ර වූ. 5. උතුම්. 6 ශ්‍රේෂ්ඨ.

අග්‍ර කුලීන = 1. උතුම් කුලැති

අග්‍රඥ = 1. ශ්‍රේෂ්ඨ යයි පිළිගත්.

අග්‍රතා = 1. අග්‍ර භාවය. 2. ශ්‍රේෂ්ඨභාවය.

අග්‍රදක්ෂිණෙය්‍ය = 1. දන් පිළිගැන්වීම සඳහා අග්‍ර වූ.

අග්‍රපුද්ගල = 1. ශ්‍රේෂ්ඨ පුද්ගලයා.

අග්‍රඵල = 1. රහත් ඵලය. 2. මුලින් හටගත් ගෙඩිය. 3. උසස් ප්‍රතිඵලය.

අග්‍රමාර්ග = 1. රහත් මඟ.

අග්‍රමහෙෂී = 1. අග මෙහෙසිය. 2. ප්‍රධාන බිසොව.

අර්ගල = 1. එනම් කැවිලි වර්ගය. 2. අගුල. 3. අත්යල. (ගල් පොසිය).

අර්ගලා = 1. එනම් කැවිලි වර්ගය.

අග්‍රශ්‍රාවක = 1. ප්‍රධාන ශ්‍රාවකයා.

අග්ගි = 1. අග්නි. (ගිනි). 2. අගිහි. 3. වටිනි.

අග්ගිකා = 1. ගිනිදෙවියා අදහන.

අග්ගිකා = 1. බදුල්ල ගස්.

අග්ගිකාණ්ඩ = 1. ගිනි කන්ද.

අග්ගිජාලය = 1. ගිනි දැල්ල

අග්ගිදාහය = 1. ගින්නෙන් දා විනාශ වීම.

අග්ගිනී = 1. අග්නිය. 2. සාගින්න. 3. මූලාග්නිය. 4. අර්ශස් රෝගය.

අග්ගිනි සාරය = 1. ගිනිනත් ගිය.

අග්ගින්න = 1. මූලාග්නිය. 2. අර්ශස් ගාය. 3. ගිනිගම.

අග්ගිදඩ්ඪ = 1. ගින්නෙන් දැවුණු. 2. පිලිස්සුණු.

අග්ගිපරිචරණ = 1. ගිනි දෙවියා පිදීම.

අග්ගිභය = 1. ගිනි බිය.

අග්ගිමාලි = 1. අක්මැල්ල නම් බෙහෙත් පැළෑටිය. 2. පුරාණ ග්‍රන්ථයන්හි දක්වෙන අග්නිමාලි සමුද්‍රය.

අග්ගිය = 1. ගින්න. 2. ගිනි දෙවියා පිදීම.

අග්ගිසාලා = 1. ගිනිහල් ගෙය. (කුස්සිය).

අග්ගිස්ස = (අග්ගිශ) 1. මුදුන් කෙළවර. 2. සිහින් කොන. 3. කරටිය. 4. අග කොන.

අග්ගොන් = 1. කුඩා ලැහැබ. 2. අග කොන. 3. අකුල.

අග්ඝ = 1. වටිනාකම. 2. ආගන්තුක සත්කාරය.

අග්ඝක = 1. වටිනාකම ඇති.

අග්ඝකාරක = 1. තක්සේරුකාරයා 2. මිල නියම කරන්නා.

අග්ඝනක = 1. වටිනාකම ඇති.

අග්ඝිකාව = 1. පහන් ගස. 2. මල්වලින් හෝ පහන්වලින් කළ සැරසිල්ලක්. 3. දාගැබක සිවු දිගෙහි බැඳි තොරණ. 4. ඇගෑ.

අග්දත් = 1. දත් අග.

අග්දළුව = 1. කරටිය. 2. මුදුන් දළුව.

අග්දොර = 1. ප්‍රධාන දොරටුව.

අග්නි කර්ණිකාව = 1. ඇවිලෙන ගිනිමැලයෙන් පුපුරා ඇතට විසි වන ගිනි පුපුර.

අග්නි කපාලය = 1. අඟුරු කබල. 2. ගිනි කබල.

අග්නිකාර = 1. ගිනි ඇති කරන. (ගිනි හට ගන්නා)

අග්නි කර්ම = 1. වාතරෝග, අක්ෂිරෝග ආදියෙහි දී ශරීරයේ යම් - යම් තැන් පිළිස්සීමෙන් කරන ප්‍රතිකාර ක්‍රමය.

අග්නිකා = 1. ලියකගලා. 2. අසමෝදගම්. 3. දුන්න.

අග්නි කාෂ්ඨය = 1. ගිනි පෙතෙල්ල.

අග්නි කුණ්ඩය = 1. ගිනි කබල. 2. ගිනි වළ

අග්නි කුල = 1. එනම් රාජ කුලය.

අග්නි කෝකා = 1. රත් මාතෙල් 2. රත් ඕලු

අග්නි කෝණ = 1. ගිනි කොන. (දකුණටත් නැගෙනහිරටත් අතර වූ අනුදිශාව).

අග්නි ක්‍රීඩාව = 1. ගිනි කෙළිය.

අග්නි ගණය = 1. ගිනි ගණය. (කාව්‍ය ශාස්ත්‍රයෙහි දක්වෙන ගණ අටින් එකක් වූ රගණය. "මැදට ලගුයි දිවි මර වෙයි වන්හි ගණෝ රගණෝ" මේ ගණයෙහි මුල හා අග අකුරු දීර්ඝය. මැද අකුර හ්‍රස්වය.

අග්නි ගර්භ = 1. පළිඟු.

අග්නි ගුණ = 1. උෂ්ණ ශක්තිය. 2. දවන ශක්තිය.

අග්නිජ = 1. ගින්නෙන් උපන්. (ගින්නෙන් හටගත්).

අග්නි ජාලා = 1. ගිනි දැල්ල. 2. ගිනි මැලය. 3. ගිනි ගොඩ.

අග්නි ජ්වාලා = 1. ගිනි දැල්ල. 2. ගිනිමැළය. 3. මයිල මල්. 4. ගජ තිප්පිලි.

අග්නි ජිහ්වා = 1. නියගලා.

අග්නිතාප = 1. ගිනි රස්නය. 2. ගින්නෙන් රත් කිරීම.

අග්නිදග්ධය = 1. ගින්නෙන් දැම. 2. ගින්නෙන් පිළිස්සීමෙන් වූ තුවාලය.

අග්නිදග්ධ = 1. පිළිස්සුණු. 2. ගින්නෙන් දැවුණු.

අග්නි දිශා = 1. ගිනිකොන. (අග්නි දිශාව).

අග්නි දේව = 1. ගිනි දෙවියා. 2. කැති කැකත. 3. පුරාණ රජකුගේ නමක්.

අග්නිධාරා = 1. ශරීරයෙහි උෂ්ණය දරා සිටින හිවිය.

අග්නි ධර්මී = 1. ගින්න ස්වභාව කොට ඇති. 2. ගින්න වැනි. (ගින්නෙහි වන ස්වභාවය ඇති).

අග්නි පරිචරණ = 1. ගිනි දෙවියා පිදීම.

අග්නි පාෂාණය = 1. ගිනි ගල. 2. දෙකක් එකට ඇතිල්ලීමෙන් ගිනි ඉපදවීමේ ශක්තිය ඇති ගල් වර්ගය (අග්නි ප්‍රස්තරය).

අග්නි ප්‍රස්තර සාර = 1. ගිනි ගල් සෑදෙන ද්‍රව්‍යය.

අග්නිපුට = 1. ලෝහ වර්ග ඖෂධ සඳහා සකස් කර ගැනීමේ දී දවන ලිප. 2 භස්ම කර ගැනීම සඳහා ලෝහ වර්ග පිළිස්සීම.

අග්නි පුරාණය = 1. හින්දු ආගමට අයත් භගවත් පුරාණ, විෂ්ණු පුරාණ, මත්ස්‍ය පුරාණ ආදි 'පුරාණ' පොත් දහ අටෙන් එකක්.

අග්නි පුෂ්ප = 1. මුවකිරිය (බෝගස් ආදියෙහි හටගන්නා ඖෂධ පිණිස ගනු ලබන (පිලිල) පැලෑටි විශේෂයක්.

අග්නි පූජා = 1. ගිනි පූජාව. 2. ගිනි දෙවියන් පිදීම.

අග්නි ප්‍රස්තාර = 1. ගිනි ගල්.

අග්නි බල = (ජඨරාග්නිය) 1. බඩගිනි උපදවන බලය. 2. ආහාර පැසවීමේ ශක්තිය.

අග්නිභ = 1. රත්රන්.

අග්නි භය = 1. ගින්නෙන් ඇතිවන භය.

අග්නි භූධරය = 1. ගිනි කන්ද.

අග්නි භූෂණය = 1. ගිනි මෙන දිලිසෙන ආභරණය. 2. ගින්න. 3. ගින්නෙන් කළ ආභරණය.

අග්නි මණිය = 1. පළිඟුව.

අග්නිමත් = 1. ගිනි සහිත. 2. දිලිසෙන.

අග්නි මන්ථ = 1. ගස් වර්ගයක්. (මේ ගස්වල ලී එකට ඇතිල්ලීමෙන් ගිනි හටගනී). 2. මිදි ගස්.

අග්නි මන්දය = (අග්නි මාන්ද්‍යය) 1. බඩ ගිනි මඳ බව.

අග්නිමය = 1. ගින්නෙන් උපන්. 2. ගිනි මෙන දිලිසෙන.

අග්නි මණි = 1. දණ හිස සමීපයෙහි පිහිටි මර්මස්ථානයක්.

අග්නිමාලී = 1. පැරණි පොත්වල දැක්වෙන මුහුදක්.

අග්නිමුඛ = 1. උග්‍ර විෂ සහිත සපු විශේෂයක්. 2. ලුණුවිල. 3. සෙන්දිරික්කා 4. බඩුල්ල. 5. දේව නාමයක්.

අග්නිමූල = 1. රත්නිටුල් නම් පැළ වර්ගය.

අග්නි මූලය = 1. මූලාග්ගින්න. 2. අර්ශස් රෝගය. (මූල රෝගය.)

අග්නිය = 1 ගින්න 2. කුඩා ගින්න. 3. ගිනි-කොන.

අග්නි රක්ෂණ = 1. ගිනි දෙවියා පුදනු වස් නිවෙන්නට නොදී සදහට ගින්න රැකීම.

අග්නි වර්ණ = 1. ගිනි පැහැය. 2. ගින්දර පාට.

අග්නි වාර = 1. ගිනිගම.

අග්නි විසර්ප = 1. එනම් විසප්පු රෝග.

අග්නි වේශ = 1. එනම් ඍෂිවරයා.

අග්නි ශර = 1. එනම් ඊ සැරය. 2. ගිනි දැල් නිකුත් වන ඊය.

අග්නි ශාලා = 1. ගිනිහල් ගෙය. 2. කුස්සිය. 3. දෙවොලට පුදනු ලැබූ ගින්න සදහට දැල්වෙමින් තිබෙන ශාලාව.

අග්නි ශිඛා = 1. ගිනි සිළුව.

අග්නි සන්තාප = 1. ගින්නෙන් සිදුවන තැවීම.

අග්නි සංදීපනය = 1. ජඨරාග්නිය වැඩීම. 2. බඩ ගින්න වැඩි වීම.

අග්නි සන්නි = 1. එනම් සන්නි රෝගය.

අග්නි සාදය = 1. බඩගිනි මඳ බව.

අග්නි සාර = 1. එනම් රෝගය. 2. උමතු බව ඇති කරවන අමුද්‍රව්‍යයෙක්.

අග්නිස්කන්ධය = 1. ගිනි කඳ. 2. ගිනි ගොඩ. 3. මහ ගිනි මැලය.

අග්නි ස්තම්භනය = 1. ගිනි සිසිල් කිරීම. (අග්නි ස්තම්භකය).

අග්නි ස්ථාන = 1. ගින්න තිබෙන තැන. 2. කුජ ග්‍රහයාට අයත් රාශිය.

අග්නි හෝත්‍රය = (අග්නි හෝමය) 1. ගිනි දෙවියා පිදීම.

අග්න්‍යාගාරය = 1. ගිනි දෙවියා පුදන ශාලාව. 2. ගිනිහල් ගෙය. 3. ගිනි තබන ගෙය. 4. මුළුතැන් ගෙය. (කුස්සිය).

අග්න්‍යාධානය = 1. ගිනි දෙවි පිදුමට ගිනි රැස් කිරීම. 2. පුදනු ලබන ගින්න තැබූ ස්ථානය.

අග්න්‍යාලෝකය = 1. ගිනි එළිය.

අග්න්‍යාශය = 1. ශරීරයේ ආහාර දිරවන රසය පිහිටි ස්ථානය.

අගාන්‍යාගාරය = 1. ගිනි තබන ශාලාව?

අග්‍ර = 1. ශ්‍රේෂ්ඨ. 2. උත්තම. 3. ප්‍රධාන. 4. මුදුන. 5. කොන. 6. මුල්. 7. පළමු. 8. උසස්. 9. අනසි. 10. ප්‍රමුඛ. 11. මූලික 12. ජ්‍යෙෂ්ඨ.

අග්‍රය = 1. කොන. 2. තුඩ. 3 කෙළවර. 4. අග. 5. කෝටිය. 6. අන්තය.

අග්‍රතා = 1. ශ්‍රේෂ්ඨතා 2. මූලිකතා. 3. ප්‍රධානතා.

අග්‍ර අඞ්කුර = 1. මුදුන් දළුව.

අග්‍ර අඞ්ගුලි = 1. ඇඟිලි අග.

අග්‍ර අමාත්‍ය = 1. අගමැති. 2. ප්‍රධාන ඇමති.

අග්‍ර ආභරණය = 1. ශ්‍රේෂ්ඨ ආභරණය. (ප්‍රධාන ආභරණය).

අග්‍ර ආසනී පුද්ගල = 1. රහතන් වහන්සේ.

අග්‍ර ආසන = 1. ප්‍රධාන ආසනය 2. මුල් පුටුව.

අග්‍ර උදක = 1. නොඉඳුල් දිය. 2. උතුම් ජලය.

අග්‍ර උපස්ථාන = 1. සිවුපසයෙන් උසස් ලෙස සංග්‍රහ කිරීම. 2. උසස් සත්කාරය.

අග්‍ර උපස්ථායක = 1. උපස්ථාන කරන්නන් අතුරින් ප්‍රධානයා.

අග්‍ර උපස්ථායිකා = 1. උපස්ථාන කරන උපාසිකාවන් අතුරින් ප්‍රධාන උපාසිකාව.

අග්‍රඋපාසක = 1. උපාසකයන් අතුරින් ප්‍රමුඛයා.

අග්‍ර උපාසිකා = 1. උපාසිකාවන් අතුරින් ප්‍රධාන උපාසිකාව.

අග්‍රකාය = 1. ශරීරයෙහි පෙකණියෙන් උඩ කොටස. 2. උඩුකය.

අග්‍ර කුම්භය = 1. කලල් ඇටයෙහි දෙකෙලවර පිහිටි කොටස්.

අග්‍ර කුල = 1. උසස් කුලය.

අග්‍ර කෝටිය = 1. අග කෙළවර. 2. මුදුන්කොන.

අග්‍ර ගණ්‍ය = මුලට ගණන් ගත යුතු. 2. උතුම් කොට සැලකිය යුතු. 3. ශ්‍රේෂ්ඨයයි ගිණිය යුතු.

අග්‍ර ගන්ධ = (අග්‍ර ගන්ධක) 1. අක්මැල්ල නම් පැලෑටි වර්ගය.

අග්‍රගාමී = 1. පෙරමුණේ ගමන් කරන.

අග්‍රජ = (අග්‍ර ජාත) 1. කුළුඳුල්. 2. පළමුව උපන්. 3. වැඩිමහලු සහෝදර.

අග්‍රජා = 1. පළමුව උපන් දරුවා.

අග්‍රජිව්හා = 1. දිව අග.

අග්‍රණී = 1. ප්‍රධාන. 2. ශ්‍රේෂ්ඨ.

අග්‍ර දක්ෂිණාව = 1. ශ්‍රේෂ්ඨ දානය. 2. උත්තම දානය.

අග්‍ර දක්ෂිණාර්හ = (අග්‍ර දක්ෂිණෙය - අග්‍ර දක්ෂිණෙය්‍ය - අග්‍ර දක්ෂිණීය). 1. අග්‍ර දක්ෂිණාව. (ශ්‍රේෂ්ඨ දානය). පූජා කිරීමට සුදුසු.

අග්‍ර දර්ශනය = 1. උසස්ම දැකීම. 2. ශ්‍රේෂ්ඨ වූ දෘෂ්ටිය.

අග්‍ර දූත = අස්වැන්න ඉඳුල් කරන්නට ප්‍රථමයෙන් දෙන දානය.

අග්‍ර දායක = 1. ප්‍රධාන දායකයා.

අග්‍රදේවී = 1. අග බිසොව. 2. අගරැජින.

අග්‍ර ධර්ම = 1. ශ්‍රේෂ්ඨ ධර්මය. 2. උසස් වූ ඉගැන්වීම.

අග්‍ර ධර්ම දේශනාව = 1. බුදුන් වහන්සේගේ ධර්ම දේශනාව.

අග්‍ර ධර්ම ප්‍රතිවේධය = 1. රහත් ඵලයට පැමිණීම.

අග්‍ර ධුරය = 1. අග තනතුර. 2. ප්‍රධාන ස්ථානාන්තරය.

අග්‍ර ධුරීණ = 1. ප්‍රධාන පදවියට පැමිණි. 2. අග තනතුර දරන.

අග්‍රනාමික = 1. නොගෙතූ. 2. රචනා නොකළ. 3. ගැට නොගැසුණු (ග්‍රන්ථනය නොකළ).

අග්‍ර පණ්ඩිත = 1. ශ්‍රේෂ්ඨ පණ්ඩිතයා. 2. පණ්ඩිතයන් අතුරින් ප්‍රමුඛයා.

අග්‍ර පත්‍රය = 1. පළමුව හටගත්තා කොළය. 2. පසු ඇටයේ පහත කොටස.

අග්‍ර පද = 1. ශ්‍රේෂ්ඨ පදවිය. 2. ප්‍රධාන පදවිය.

අග්‍ර පාඨශාලාව = 1. උසස් විද්‍යාලය.

අග්‍රපාදය = 1. පාදයෙහි අග කොටස.

අග්‍ර පිණ්ඩය = (අග්‍ර පිඬු) 1. කොඉඳුල් බත් පිඬ. 2. පළමුවෙන් පුදන බත් පිඬ. 3. ශ්‍රේෂ්ඨ ආහාරය. 4. ආහාර ඉඳුල් කරන්නට මත්තෙන් පින් තකා කුලදේවතාවන් වෙනුවෙන් වෙන් කරන බත් පිඬ.

අග්‍ර පුරය = 1. අගනුවර. 2. රාජධානිය.

අග්‍ර පුද්ගලයා = (අග්‍ර පුරුෂයා) 1. බුදුන් වහන්සේ. 2. විරුද්ධ පුද්ගලයකු නැත්තා. 3. අසමාන පුද්ගලයා. 4. ශ්‍රේෂ්ඨ පුරුෂයා.

අග්‍ර පුරෝහිතයා = 1. රජුන්ට අර්ථයෙන් ධර්මයෙන් අනුශාසනා කළ බ්‍රාහ්මණයා. 2. පෙරෙවි බමුණා. 3. රාජකීය යාග - හෝම ආදියෙහි දී ප්‍රමුඛ බ්‍රාහ්මණයා.

අග්‍ර පුෂ්පය = 1. පළමු හටගත් මල.

අග්‍රප්‍රාප්ත = 1. ශ්‍රේෂ්ඨ. 2. මුදුන්පත්. 3. කෙළ පැමිණි. 4. (යම් කිසි ශිල්ප ශාස්ත්‍රාදියක හෝ ගුණධර්මාදියක) අවසානයට පැමිණි.

අග්‍ර ඵලය = 1. තැඹුල් ගෙඩිය. 2. අග්‍රීස් ඵලය.

අග්‍ර බාහුව = 1. බාහු කෙළවර. 2. අත් දණ්ඩෙහි අග කොටස. 3. වළලුකර.

අග්‍ර බිසව = (අග්‍ර බිසෝ) 1. අග මෙහෙසිය. අග රැජින.

අග්‍ර භාගය = 1. අග කොටස. 2. මුල් කොටස.

අග්‍ර භෝජනය = 1. ප්‍රණීත ආහාරය. 2. කොඉඳුල් ආහාරයෙන් පළමුව බෙදන කොටස.

අග්‍ර මන්ත්‍රී = 1. ප්‍රධාන මන්ත්‍රීවරයා. 2. අගමැති.

අග්‍ර මහා පණ්ඩිත = 1. මහා පණ්ඩිතයන් අතුරින් ශ්‍රේෂ්ඨයා.

අග්‍ර මහිෂී = (අග්‍ර මහිෂිකා) 1. අග බිසොව. 2. අග රැජින.

අග්‍ර මාණික්‍යය = 1. අග මිණ. 2. ඔටුන්නෙහි මුදුන් මැණික. 3. සිළුමිණ.

අග්‍ර මාර්ගය = 1. අර්හත් මාර්ගය. 2. ශ්‍රේෂ්ඨ මාර්ගය.

අග්‍ර රසය = 1. ප්‍රණීත රසය. 2. ඉතා මිහිරි රසය.

අග්‍ර රාජ = ප්‍රධාන රජ. 2. අග රජ.

අග්‍ර රාජ ගුරු = 1. රෝමානු කතෝලික සභාවේ ප්‍රධාන නායක තුමා.

අග්‍ර රාජධානිය = 1. රජු වසන අග නුවර.

අග්‍ර විනිශ්චයකාරයා = 1. නායක විනිශ්චයකාරයා 2. නඩු විසඳන්නන්ගෙන් ප්‍රධානයා. 3. ධර්මාධිකරණ නායකයා.

අග්‍ර ශස්‍ය = (අග්‍ර සස්‍ය) 1. පළමු පලදාව හෝ අස්වැන්න.

අග්‍ර ශාස්ත්‍ර ශාලාව = 1. මහා විද්‍යාලයය.

අග්‍ර ශ්‍රාවක = 1. අග සව්. 2. ප්‍රධාන ශිෂ්‍යයා. 3. බුදුවරුන්ගේ ප්‍රධාන ශිෂ්‍ය දෙනම.

අග්‍ර ශ්‍රාවිකා = 1. බුදුවරුන්ගේ ප්‍රධාන ශිෂ්‍යාවන් දෙනම.

අග්‍ර ශ්‍රී = ශ්‍රේෂ්ඨ සම්පත්තිය.

අග්‍රසර = 1. ප්‍රධාන. 2. පෙරමුණෙහි ගමන් කරන.

අග්‍ර සේනාධිපති = 1. සේනාපතීන් අතුරින් ප්‍රධානයා. 2. මහ සෙනෙවියා.

අග්‍ර ස්ථානාන්තර = 1. ප්‍රධාන ස්ථානාන්තරය.

අග්‍ර හෝම මංගල්‍යය = 1. එනම් යාගය. 2. අසූ එක් ආකාර බලිවලින් එකක්.

අග්‍ර හායනය = 1. උඳුවප් මස.

අග්‍ර හාරය = (අගහර) 1. බමුණන්ට පළමු කොට දුන් නින්දගම්. 2. බමුණන්ට දෙන කෙත් වතු.

අග්‍රාධිකාර = 1. මුදුන් දළුව.

අග්‍රාමක = 1. ගමක් නොවන. 2. ජනයා නොවසන.

අග්‍රිම = 1. අග්‍ර. 2. ශ්‍රේෂ්ඨ. 3. කෙළවරෙහි වූ.

අග්‍රේසර = 1. ප්‍රධානයන් අතුරින් ශ්‍රේෂ්ඨයා. 2. ඉදිරියෙහි ගමන් කරන.

අග්‍රෝදක = 1. උතුම් ජලය. 2. කොඉඳුල් දිය.

අග්ලබ = 1. අග්‍ර ලාභය. 2. උසස් ලැබුම. (සිවුරු; පිණ්ඩපාත; සේනාසන; ගිලන්පස යන) සිව්පසය ලැබීම.

අඟ = 1. ශරීරය. 2. කාරණය. 3. අඞ්ගය. 4. ශරීරයෙහි කොටසක්. 5. පරිච්ඡේදය. 6. කොටස. 7. ගුණය. 8. සීලය. 9. කුඹුරකින් ගොඩබිම දෙසට නෙරාගිය කොටස. 10. ගස් වර්ගයක්. 11. ශික්ෂාව. 12. ප්‍රතිපත්තිය. 13. අඳගස. 14. සතුන්ගේ අං 15. බාහු වෙනිද මහ වළල්ල. 16. අඟක් වැනි ලී ඵල.

අඟ තිලක = අඞ්ග තිලක නම් ආභරණය.

අඟදඟ = 1. පෙරළි. 2. මැරවරකම්. 3. කලබල. 4. තොබික්මුණු.

අඟණ = 1. මිදුල. 2. සමතලා බිම. 3. එළිමහන් තැන 4. ගස් වර්ගයක්. 5. මුදු මාළුවෙක්.

අඟණවත් = 1. මලු - පෙත් - මං ඇමදීම් ආදි ක්‍රියා.

අඟනා=1. අඞ්ගනාව. 2. ස්ත්‍රිය. 3. මිදුල. 4. මලුව.

අඟනා ප්‍රිය = 1. අසෝක (හෝපලු). 2. දිය රතඹලා.

අඟ පසඟ = 1. අඞ්ග ප්‍රත්‍යඞ්ග. 2. ශරීරය හා අත් පා ආදි අවයව.

අඟබෙරලි = 1. මුව වර්ගයක්. (අඟ මොරලියා).

අඟ මඩුවා = 1. එනම් මත්ස්‍යයා. (හිසෙහි අඟක් වැනි කටුවක් ඇති මඩුවා).

අඟ මඳු = 1. අඟට දමන මත්ද. 2. ගවයන් බඳින රැහැන් වර්ගයක්.

අඟයා = 1. එනම් මාළුවා.

අඟර = 1. අඞ්ගරාග. 2. ඇඟෙහි ගාන සුවඳ විලවුන්. 3. අනුරාග බැල්ම. 4. අඞ්ගවලන ආදියෙන් කාමුක හැඟීම් දක්වීම. 5. අඟුර. (දා ගිය දේ). 6. කොර ගහනවා.

අඟර කරනවා = 1. අඞ්ග වලනයෙන් කාමුක හැඟීම් පානවා.

අඟර දඟර = 1. කාමුක බැලුම් හා අඞ්ග වලන ආදිය. 2. ස්ත්‍රී මායා. 3. ලීලා විලාස.

අඟරා = අඟර.

අඟ රැන් = (අඟ ලනු) 1. ගවයන්ගේ අඟෙහි දමා බඳින බැන.

අඟරැලි වී = 1. වී වර්ගයක්.

අඟහිනවා = 1. ආඝ්‍රාණය කරනවා. 2. ගඳ සුවඳ දැනගන්නවා.

අඟ ලකුණු = (අඞ්ග ලක්ෂණ) 1. ශරීරයෙහි ලකුණු.

අඟ ලනවා = (ඇඟ ලනවා) 1. ඇඳගන්නවා.

අඟල = 1. අඟිලෙන් දොළොස්වන් කොටස. 2. දබරැඟිල්ලේ මැදි පුරුකේ දිග.

අඟවනවා = 1. සිතට වද්දවනවා. 2. තේරුම් ගන්නට සලස්වනවා.

අඟවැල් = 1. අඞ්ග විකල. 2. අත්-පා ආදිය නිසි හැටි නොපිහිටි.

අඟ වෙහෙල් = 1. මුව වෙසෙසක්.

අඟහර = (අඟහාර) 1. අතැඟිලි ආදි අඞ්ග වලනයෙන් දක්වන නැටුම. 2. මුද්‍රා නාට්‍යය.

අඟහරු = 1. එනම් ග්‍රහයා. 2. කුජ ග්‍රහයා.

අඟහරුවාදා = 1. අඟහරුවාට අයත් දවස. 2. කුජ දිනය.

අඟා = 1. අඟවා.

අඟාණ = 1. අඞ්ගාණිය. 2. කඩ පිල. 3. සල්පිල. 4. කඩ වීදිය.

අඟාරනවා = 1. ගාටනවා. 2. දෙපා පළල් කොට යනවා. 3. දිග අරිනවා. 4. විවෘත කරනවා.

අඟාල = 1. විවෘත කළ. 2. ආයතන. 3. විදහා ගත්. 4. පළල් වූ.

අඟැඩ = 1. ලී ගැටය.

අඟිනවා=1. මනස නඩා ගන්නවා. 2. සිතනවා.

අඟි = 1. ඇඟ ලන සැට්ටය. 2. කඤ්චුකය.

අඟිණ = 1. වනෞෂධ වර්ගයක්.

අඟි පසඟි = 1. ශරීරයෙහි කුඩා මහත් අවයව. 2. අඞ්ග ප්‍රත්‍යඞ්ග.

අඟිරස = (අඞ්ගිරස) 1. බුදුන් වහන්සේට ව්‍යවහාර වන නාමයක්. 2. බෘහස්පති.

අඟු = 1. ඇඟ. 2. රටක නමක්. 3. ගණ වෙසෙසක්. 4. ආභරණයක්. 5. විලේපන.

අඟුලු = 1. අඞ්ගුෂ්ඨය. 2. මාපටැඟිල්ල. 3. හිරා කැති ආදියෙහි අඹුව. 4 කැපූ ගස්වල ඉතිරි ව තිබෙන මුල්.

අඟුලු මසු = 1. අංකුටු මස්ස. 2. එනම් රජකමක කාසිය. 3. කොකු රිදී කාසිය.

අඟුටු මිට්ටා = 1. ඉතා මිටි මිනිසා. 2. කුරු මිනිසා. 3. ලුහුඬු අවයව ඇති මිටි මිනිසා.

අඟුට්ට = 1. මාපටැඟිල්ල. 2. කුකුළු අණ්ඩ. 3. කැපූ ගසේ ඉතිරි ව තිබෙන මුල. 4. වකුටු ලී කැබැල්ල. 5. වකුටු වූ හෝ ඇඹරී ගිය දෙය.

අඟුණ = 1. රුකඟුණ. 2. කිරි අඟුණ. 3. මිදුල. 4. තැනිතලාව.

අඟුණු = 1. අඞගණය. 2. මිදුල. 3. මලුව. 4. (අඬකොල) රුකඟුණ.

අඟුණු බොළු = 1. කුරුළු වර්ගයක්.

අඟුණු වැල් = 1. කිරි අඟුණ වැල්.

අඟුනු = 1. මිට. 2. වැසුණු අත. 3 නැමූ ඇඟිලි. 4. මෙලවූ මිට.

අඟු දළු ෂක් = (අඟු පත) 1. රාජකාරි සඳහා ත්‍යාග වශයෙන් ලැබුණු කුඩා ගම්. 2. කුඹුරකින් පිටට නෙරා ගිය කැබැල්ල.

අඟු පළඳනා = 1. බාහුවේ මුල පළඳින වළල්ල. 2. අඞගදාභරණය.

අඟුරු = 1. දැවුණු දර. 2. ගිනි අඟුරු. 3. ගිනි පුපුරු. (බිම් අඟුරු = රට අඟුරු). 4. ගල් අඟුරු. (බිමින් සාරාගනු ලබන ගල් වැනි ද්‍රව්‍යයක්).

අඟුරු කබල = 1. අඟුරු දමන තැටිය. 2. දුම් කබල.

අඟුරු බාසිනියා වෙනවා = 1. දැ අළු වී යනවා. 2. මුළුමනින් දැවී වැනසී යනවා 3. විනාශ වෙනවා.

අඟුරැලි වී = 1. වී වර්ගයක්.

අඟුරු කෑම = 1. කොටස්වලට වෙන් වූ අඟුරු කැබලි.

අඟුරු දූලි = (අඟුරු ජලි) 1. අඟුරුවල තිබෙන ඉතා සියුම් කළු පාට කුඩු වර්ගය.

අඟුරු පබු = 1. අඟුරුවලින් සෑදුණු පබීතය.

අඟුරු පස් = 1. ගින්නෙන් දැවුණු පස්.

අඟුරු මඩුව = 1. (බිම් අඟුරු) රට අඟුරු රැස් කොට තිබෙන මඩුව.

අඟුරු මස = (අඟුරු මඟ – අඟුරු මං – අඟුරු මාළුව). 1. කැවුත්ත. 2. අක්මාව 3. උදරයේ දක්ෂිණ පාර්ශ්වයේ පිහිටි යකෘති නම් මස් පිඩ. (කළු කැවුත්ත). 4. අඟුරෙහි ලා පුළුස්සා ගත් මස්.

අඟුරු මැල = 1. නිරයක නමක්. (අග්නි මාලි) 2. ගිනි අඟුරු ගොඩ.

අඟුල් = 1. ඇඟිල්ල. 2. අඟල (ලකු තවයක දිග). 3. වැල් වර්ගයක්. 4. (ඔරු දෙකක් එකට ආඳා සෑදූ). අඟුල. 5. අඟුල් ඇණය.

අඟුලු සැත = 1. ගබියෙන් දරුවකු ඉවත් කිරීමට ගන්නා ආයුධයක්.

අඟුල් දසරු = 1. ස්ත්‍රී ආභරණයක්.

අඟුල්මල් = (අඞගුලි මාල) 1. එනම් චණ්ඩ පරුෂ පුද්ගලයා. (එනම් රහතන් වහන්සේ.)

අඟුල්ලාසර = ස්ත්‍රී ආභරණයක්.

අඟුල් (අනුළු) වැල = 1. අඟුණ වැල.

අඟුව = 1. බාහු මූලයෙහි පළඳින වළල්ල.

අඟුල = 1. ඔරු දෙකක් ඇඳා සෑදූ යාත්‍රාව. 2. වනෞෂධ විශේෂයක්. 3. මත්ස්‍යයෙක්. 4. කිඳි. (පැළෑටි වර්ගයක්).

අඟුළුවා = 1. එනම් මත්ස්‍යයා.

අඟුළු ෂලා = 1. අඟුළු කොළ. (තැල්වැල්).

අඝ = 1. දුක. 2. පව. 3. අහස. 4. විපත. 5. සකන්ධ පස. 6. වෙහෙස. 7. වරද.

අඝටිත = 1. අයෝග්‍ය වූ. 2. වෙන් වූ 3. නොගැළපුණු.

අඝට්ටිත = 1. නොගැසූ. 2. නොපහළ වූ.

අඝම්පඩි = 1. අගම්පඩි සේනාවේ ප්‍රධාන සේනාපතියා.

අඝෂී = 1. නොගැසූ. 2. පැහැරීමක් නැති.

අඝා = 1. වෛරය. 2. අඝාතය.

අඝාණක = 1 ඝ්‍රාණේන්ද්‍රිය නැති. 2. ගඳ-සුවඳ නොදැනෙන.

අඝෝර = 1. භයානක නොවූ. 2. ඊශ්වරයා.

අඝෝෂ = 1. හඬක් නැති. 2. ඝෝෂයක් නැති. 3. එනම් අකුරු.

අඞ්කය = 1. ලකුණ. 2. ලපය. 3. ඉලක්කම. 4. චිත්තය. 5. තොම්මරය. 6. උකුල. 7. උදරය.

අඞ්ක ගණිතය = 1. ඉලක්කම් පිළිබඳ ගණිත ක්‍රමය.

අඞ්කන = 1. ලකුණු කිරීම. 2. ඉලක්කම්වලින් හැඳින්වීම.

අඞ්කපාලි = 1. කිරි මවු. 2. වැළඳ ගැනීම. 3. ඇකයෙන් දරුවන් පාලනය කරන්නී.

අඞ්කිත = 1. ලකුණු කරන ලද. 2. සටහන් කළ.

අඞ්කුර = 1. රජෙකුගේ නාමයක්. 2. දේව පුත්‍රයකුගේ නාමයක්. 3. පැළය. 4. දිග නොහැරුණු දළුව.

අඞ්කුරය = 1. අකුර. 2. ඉකිරිය. 3. පැළය. 4. කරටිය 5. දිග නොහැරුණු දළුව.

අඞ්කුර පත්‍ර = 1. දළුව.

අඞ්කුර බන්ධ = (අඞ්කුර සන්ධිය) 1. ගසක කොටසක් කපා වෙන ගසකට පැස්සීම.

අඞ්කුරික = 1. පැළවූ 2. දළු ලියලූ

අඞ්කුශ = 1. අකුස්ස 2. හෙණ්ඩුව. 3. කෙක්ක

අඞ්කුශ චාරණ = 1. සිවුසැට කලාවන් අතුරින් එකක්.

අඞ්කුශධාරී = 1. අකුස්ස (හෙණ්ඩුව) දරන්නා. 2. හස්ත්‍යාරෝහකයා. (ඇත් ගොව්වා).

අඞ්ග = 1. අගු රට. 2. ඇඟ. 3. හැඩතල. 4. හේතුව. 5. අත්-පා ආදි අවයව. 6. කාරණය. 7. කොටස්. 8. අංග සමාදන යයි ව්‍යවහාර කරන ධුතාංග. 9. පිළිවෙළ. 10. ක්‍රමය. 11. උපාය. 12. සිත.

අඞ්ග චලන = 1. අත්-පා ආදිය සෙලවීම.

අඞ්ගජ = 1. රුධිරය. 2. පුත්‍රයා. 3. ශරීරයෙන් උපදිනා දේ.

අඞ්ග ජාත = 1. රහසඟ. 2. ස්ත්‍රී-පුරුෂ නිමිත්ත.

අඞ්ගණ = 1. මිදුල. 2. මලුව. 3. පිට්ටනිය. 4. කිලුට. 5. ක්ලේශය.

අඞ්ගද = 1. බාහුවෙහි ලන වළල්ල.

අඞ්ග තිලක = 1. සිවුසැට අබරණ අතුරින් එකක්.

අඞ්ගනාඩී = 1. සත්‍රිය.

අඞ්ග පරිත්‍යාගය = 1. අත්-පා ආදි අවයවයන් දීම.

අඞ්ග ප්‍රත්‍යඞ්ග = 1. ශරීරයේ ලොකු කුඩා අවයව. (අඟ පසඟ).

අඞ්ග ප්‍රසාධන = 1. ශරීරාභරණය.

අඞ්ගමඞ්ගානු සාරී = 1. ශරීරයෙහි හැසිරෙන වායුවක්. 2. අඟ පසඟවල හැසිරෙන සුලු.

අඞ්ග මර්දනය = 1. ඇඟ මැඩීම. (ඇඟ මිරිකීම).

අඞ්ගරක්ෂාව = 1. උඩු කය වසා අඳින වැස්ම.

අඞ්ගරක්ත = 1. ගසක්. 2. කොකුම්.

අඞ්ග රක්ෂකයා = 1. ශරීරාරක්ෂක භටයා.

අඞ්ගරක්ෂාබ = 1. දිග බැනියම.

අඞ්ගරාග = 1. ඇඟේ ගාන සඳුන් සුණු ආදි විලවුන්.

අඞ්ගරුජා = 1. ඇඟපත රුදාව.

අඞ්ග ලක්ෂණ = 1. ශරීර ලක්ෂණ 2. හැඩ - තල.

අඞ්ග විකල = 1 ශරීරයේ අත් - පා - කන් නාසා ආදිය නිසි හැටි නොපිහිටි.

අඞ්ග විකෘත = 1. විරූප වූ. 2. අවයව විකල වූ.

අඞ්ගවික්ෂෙපය = අත් - පා ආදිය ඒ මේ අත ගැසීම.

අඞ්ග විද්‍යාව = 1. ශරීර ලකුණු බලා ශුභාශුභ කීම.

අඞ්ග වෛකල්‍ය = 1. අඞ්ග විකලභාවය.

අඞ්ග වෛද්‍ය = 1. ශරීරයෙහි සියලු කොටස්වල ආබාධයන්ට ප්‍රතිකාර කරන්නා.

අඞ්ග ශූලය = 1. එතම් වාත රෝගය. 2 බඩේ වේදනාවක් 3. ඇගේ පතේ රුදාව.

අඞ්ග සංඝර්ෂය = 1. ශරීර ස්පර්ශය. 2. ශරීර එකිනෙක ගැටීම. (අඞ්ග සඞ්ගය).

අඞ්ග සමත්වය = 1. අඞ්ගයන්ගේ සමභාවය

අඞ්ග සමුදය = 1. අඞ්ග සමූහය.

අඞ්ග සම්පන්නව = 1. අවයව නිසි හැටි පිහිටි බව. 2. අවයවයන්ගේ සම්පූර්ණත්වය.

අඞ්ග සම්බාහනය = 1. අත් - පා ආදිය මිරිකීම.

අඞ්ග සාදය = 1. ඇඟ වෙහෙසීම, 2. ඇඟ කෙට්ටු වීම.

අඞ්ග සූචිය = 1. ශරීරය විදින්නාක් වැනි වේදනාව.

අඞ්ග සූත්‍රය = 1. ප්‍රධාන රීතිය. 2. මූල රීතිය. ප්‍රධාන සූත්‍රය. 4. ව්‍යාකරණ ක්‍රම.

අඞ්ග හීන = (අඞ්ග හානි වූ) 1. අවයව අඩු වූ.

අඞ්ගාඞ්ගී = 1. ප්‍රධාන කොටස හා අප්‍රධාන කොටස්.

අඞ්ගාරකර්ෂණීය = 1. කබඩපිල. 2. මස් කබඩය. 3. කබඩ විදිය. 4. ආපණ ශාලාව. 5. වෙළඳාම් පොළ. 6. වෙළඳ හල.

අඞ්ගාරය = 1. අඟුර. (ගිනි අඟුර). 2. කුජ (අඟහරු) ග්‍රහයා.

අඞ්ගාරකය = 1. ගිනි අඟුර.

අඞ්ගාර කාසු = ගිනි අඟුරු වල.

අඞ්ගාරකාග්නි = 1. අඟුරු ගින්න.

අඞ්ගාර චෛත්‍යය = (අඞ්ගාර ථූපය) 1. අඟුරු නිදහන් කළ සෑය. (බුදුන් වහන්සේගේ ශ්‍රී දේහය ආදාහන කළ තැන ඉතිරි වූ අඟුරු නිදන් කොට මෞරිය රජුන් විසින් කරවන ලද සෑය).

අඞ්ගාර ජලක්ෂාරය = 1. අඞ්ගාර හා ජලක්ෂාර යන ධාතුන්ගේ එකතුව.

අඞ්ගාර ජලක්ෂාරාම්ලික = 1. අඞ්ගාර - ජලක්ෂාර - අම්ලකර යන ධාතුන් එකතු ව සෑදෙන දේ.

අඞ්ගාර ධාතුව = 1. අඟුරු වලින් පමණක් සෑදුණු ධාතුව.

අඞ්ගාර කපල්ල = (අඞ්ගාර කටාහ - අඞ්ගාර ධානිකා) 1. අඟුරු කබල.

අඞ්ගාර පබ්බත = 1. අඟුරු කන්ද.

අඞ්ගාර මාංස = 1. ගිනි අඟුරු මත තබා පිලිස්සූ මස (අඟුරෙහි ලා පැලහු මස).

අඞ්ගාර යුද්ධ = 1. ගිනි අඟුරු වැසි ඇති කිරීමෙන් සතුරන්ට විපත් සිදු කරන යුද්ධය. (අඞ්ගාර වෘෂ්ටි).

අඞ්ගාර වල්ලී = 1. ඔලිඳ. 2. කැල් වැල. 3. කරඳ. 4. රත් කරඳ.

අඞ්ගාරක්ෂාම්ල = 1. අඞ්ගාර ධාතුවෙන් සෑදෙන විෂ සහිත වායුවක්.

අඞ්ගිත = 1. අඞ්ග ඇති. 2. කොටස් වලින් සෑදුණු.

අඞ්ගිනී = 1. අවයවයන්ගෙන් යුක්ත කාන්තාව. 2. කොටස්වලින් සපිරුණු.

අඞ්ගිර = 1. කැති කැකත හිමි දෙවියා.

අඞ්ගීරස = (අඞ්ගිරස්) 1. බුදුන් වහන්සේ. 2. කාන්තිය විහිදෙන ශරීරයක් ඇති. 3. බෘහස්පති. 4. ඉසිවරයෙක්. 5. සිද්ධාර්ථ කුමාරයන් වහන්සේ.

අඞ්ගීකරණය = 1. එකඟවීම. 1. අනුමත කිරීම.

අඞ්ගීකෘත = 1. එකඟ වූ 2. අනුමත කළ.

අඞ්ගුෂ්ඨ =1. අතේ හෝ පයේ හෝ මාපටැඟිල්ල.

අඞ්ගුත්තරනිකාය = සූත්‍ර පිටකයට අයත් මහා ග්‍රන්ථයක්.

අඞ්ගුල = 1. ඇඟිල්ල. 2. අඟල.

අඞ්ගුලිකාව = 1. සුලැඟිල්ල.

අඞ්ගුලි දේශය = 1. අත් - පා කෙළවර.

අඞ්ගුලි ස්ඵෝටන = ඇල්ලෙන්ඇනීම.

අඞ්ගුලි සඞ්ගය = 1. ඇඟිලි පුරුක.

අඞ්ගුලි පෝෂ = 1. අසුර ගැසීම.

අඞ්ගුලිමාල = 1. එනම් චණ්ඩ පරුෂ පුද්ගලයා. 2. ඇඟිලිවලින් කළ මාලයක් දැරූ හෙයින් එනම් වූ චණ්ඩයා. 3. එනම් රහතන් වහන්සේ.

අඞ්ගුලි මුද්දිකාව = (අඞ්ගුලී මුද්‍රිකා) 1. ඇඟිල්ලේ දමන මුදුව.

අඞ්ගුලි වේෂ්ඨක = 1. ඇඟිල්ලේ දමන මුතු මුදු.

අඞ්ගුෂ්ඨ = 1. මාපටැඟිල්ල.

අඞ්ගුෂ්ඨ මුද්‍රිකාව = 1. මාපටැඟිල්ලෙහි පලඳින මුදුව.

අඞ්ඝ්‍රිය = 1. පාදය. 2. පාදයෙහි පතුල.

අචක්ෂු විඥෙය්‍ය = 1. ඇසින් දැක්ක නොහැකි.

අචක්ෂු = 1. ඇස් නැති.

අචණ්ඩ = 1. චණ්ඩ නුවූ. 2. මෘදු - මොළොක් 3. ශාන්ත.

අචණ්ඩිකා = 1. නොකිපුණු. 2. වෛර නොවූ.

අචතුර = 1. දක්ෂ නොවූ.

අචපල = 1. චපල නොවූ. 2. සුවිනීත.

අවච්ඡේදිත = 1. වච්ඡේදකය නොකළ. (රහසගෙහි සම නොකපන ලද).

අචල = 1. නිශ්චල. 2. ස්ථිර. 3. නොසැලෙන. 4. පොළොව. 5. ඊශ්වරයා. 6. පර්වතය.

අචල අධිෂ්ඨාන = 1. නොවෙනස් වන ස්ථිර අදහස.

අචල අපාදානය = (ව්‍යාකරණයෙහි) 1. ක්‍රියා සිද්ධියට සීමා කොට ගන්නා නිශ්චල වස්තුව.

අචල ජල ශාස්ත්‍රය = 1. නොසැලෙන දියෙහි ඇති බල වේගය උගන්වන ශාස්ත්‍රය.

අචල භාර ශාස්ත්‍රය = 1. නිශ්චල වස්තුවල බරින් උපදිනා බලය ගැන උගන්වන ශාස්ත්‍රය.

අචල භූමි = 1. සෙල් විය නොහැකි ස්ථානය 2. ජය භූමිය.

අචල සන්ධිය = 1. හිස් කබල. 2. නොසෙල්වී සිටිනා හිස් කබල ආදියෙහි ඇති සන්ධි. 3. නොසෙල්වී තිබෙන ඇට සන්ධිය.

අචලාසනය(අචල + ආසන) 1. ස්ථිර වූ ආසනය. 2. සෙල්විය නොහැකි ආසනය. 3. වෙනස් කළ නොහැකි හිඳීම.

අචලිත = 1. කම්පා නොවූ. 2. නොසෙල්වුණු.

අච්‍යවන = 1. චුත නොවන. 2. නොගිලෙන. 3. නොමැරෙන.

අච්‍යවන ස්වභාවය = 1. නොමැරෙන බව.

අච්චාරු = 1. විනාකිරි, අඹ, සුදුළූනු, ගස් ලබු, රතු ලූනු, මුරුංගා පොතු ආදියෙන් සාදන වැන්ජන වෙසෙසක්.

අචාපල්‍යය = 1. වෙනස් නොවන ගතිය.

අචාරිත්‍රය = 1. චාරිත්‍රයට විරුද්ධ ක්‍රියාව. 2. නොසිරිත. 3. දුශ්ශීලභාවය. 4. නොපණත්කම.

අචිකිත්ස්‍ය = 1. සුව කළ නොහැකි. 2. මිදීමට නොහැකි වූ.

අචින්තක = 1. සිත නැති. 2. කල්පනා කිරීමක් නැති.

අචිත්තීකාර= 1. නොසැලකීම. 2. ගරු බුහුමන් නොකිරීම.

අචිත්‍රීකාර 1. උසස් ලෙස නොසැලකීම. 2. අගය කොට නොසලකන ලද.

අචිත්‍ර = 1. ආශ්චර්යවත් නොවූ. 2. චිත්‍ර ගුණය නොමැති.

අචින්තිත = 1. නොසිතූ. 2. බලාපොරොත්තු රහිත.

අචින්ත්‍ය = 1. නොසිතිය යුතු වූ. 2. සිතා ගත නොහැකි. 3. අනන්ත වූ.

අචින්තනීය = 1 සිතිය නොහැකි. 2. වටහාගත නොහැකි.

අචිර = 1. මෑත කාලය. 2. වැඩි කල් නොගිය. 3. නොබෝ කලකින් සිදුවන. 4. මඳ කලක් පවත්නා.

අචිර කාලය= 1. ස්වල්ප කාලය. 2. මෑත කාලය.

අචිරද්‍යුති = (අචිරද්‍යොත-අචිර ප්‍රභා) 1 විදුලිය එළිය. 2, ක්ෂණික එළිය. (අචිරප්පභා).

අචිරවතී = 1. ඉන්දියාවේ පඤ්ච මහා ගඟා-වන්ගෙන් එකක්.

අචේතන= 1. චේතනාව නැති. 2. සිතිවිලි නැති.

අචේතනික = 1. සිතිවිල්ලක් නැති.

අචේතස්ක = 1. චේතනාව නැති.

අචේල=(අචේලක) 1. රෙදි නොහඳින. 2. වස්ත්‍ර නැති නිගණ්ඨයා.

අචේලකයා = 1. නිර්වස්ත්‍ර තාපසයා. 2. නෙළු නිගණ්ඨයා.

අචේල කාශ්‍යප = 1. බුද්ධ කාලයෙහි විසූ අන්‍ය ශාස්තෘ වරයෙක්.

අචෝර = 1. නොසොර. 2. අවංක. 3. කපටි නොවූ.

අච්චන = 1. පිදීම.

අච්චන්ත = 1. අතිශයින් අධික වූ.

අච්චය = 1. ඉක්මවා යාම. 2. අපරාධය. 3. පාපය. 4. ඇවෑම; මරණය.

අච්චන්ත සංයෝගය = 1. නොකඩවා එක් ව පැවැත්ම.

අච්චය දානය = 1. මළවුන් වෙනුවෙන් දෙනු ලබන දානය.

අච්චර = 1. ඒ තරම්. 2. එපමණ.

අච්චරය = 1. අකුරු සටහන.

අච්චායික = 1. ඉක්මන් කටයුත්ත.

අච්චා සන්න = 1. ඉතා ලංවූ.

අච්චි = 1. ගිනි දළුව. 2. රශ්මිය. 3. නාමයක් සමග යෙදෙන ගරු පදයක්. 4. පෙර පැවති තිලයක්. 5. පියා.

අච්චිකාරම = (අත්තිකාරම) 1. බඩුවක් ගැනීමට ගිවිසගෙන මුලින් දෙන මුදල.

අච්චිත = 1. පුදන ලද. 2. පිදූ.

අච්චිමන්ත = 1. දීප්තිමත්. 2. ගිනි දළු ඇති. 3. පුරාණ රජකුගේ නමක්. 4. ගින්න.

අච්චිල = 1. සිංහල රාජ්‍ය කාලයේ සුළු මූලාදෑනියෙක්. (ඇරච්චි).

අච්චු = 1. අච්චුව (යම් කිසිවක් නියම හැඩ හුරු කමකට ගැනීම සඳහා මැටියෙන්, ඉටියෙන් හෝ ලීයෙන් සාදන සැලැස්ම). 2. ඊයම්වලින් හෝ ලීයෙන් පිටපත් ගැනීම පිණිස සදගත් අකුරු සටහන. 3. දඬුවම. 4. තුවක්කු වල්ල 5. අලවංගුව.

අච්චු කන්තෝරුව = (යන්ත්‍රාලය-මුද්‍රණාලය) 1. පොත්-පත් අච්චු ගැසීමේ වැඩ පොළ.

අච්චු කඳ = 1. කරත්තයේ අලවංගුව සවිකර තිබෙන ලීය. 2 තුවක්කුවේ අල්ලා ගන්නා කොටස. 3. මුද්‍රණ යන්ත්‍රයේ කඩදාසි එතී සිටින කඳ.

අච්චු කූර = 1. තුවක්කුවේ වෙඩි බෙහෙත් කොටන කූර.

අච්චු කෝල = 1. ලිස්තර ඇදීම පිණිස ගනු ලබන පෙදරේරු උපකරණයක්.

අච්චුත = 1. චුත නොවන. 2. නොනැසෙන. 3. සිටි පරිද්දෙන් ම සිටින. 4. සංඥා නාමයක්. 5. තාපසයකුගේ නාමයක්.

අච්චුති = 1. චුති නොවීම. 2. නොනැසීම.

අච්ඡ = 1. පිරිසුදු. 2. පැහැදිලි. 3. වලසා. 4. බබළන.

අච්ඡන්දික = 1. ඇල්මක් නැති. 2. කැමැත්තක් නැති. 3. සිතට උනන්දුවක් නැති.

අච්ඡන්න = 1. නොවැසුණු. 2. නොසැඟවුණු. 3. ප්‍රකට.

අච්ඡම්භී = තැති ගැනීම් නැත්තා.

අච්ඡසා = 1 වලසා.

අච්ඡරා = 1. දිව්‍යප්සරාව. 2. දෙවඟන.

අච්ඡරා සංඝාත = 1. ඇඟිලි තුඩු එකට ගැසීම. 2. අසුර ගැසීම.

අච්ඡරිය = 1. පුදුමය. 2. විස්මය ජනක. 3. ආශ්චර්යය.

අච්ඡාදනය = 1. වැසීම. 2. හැදීම 3. පෙරවීම. 4. අඳනය. 5. සළුව. 6. වස්ත්‍රය.

අච්ඡිද්ද = 1. අඩු පාඩුවක් නැති 2. සිදුරක් නැති. 3. සම්පූර්ණ කැලැල් නැති.

අච්ඡින්දන = උදුරා ගැනීම. 2. පැහැර ගැනීම. 3. බලාත්කාරයෙන් ගැනීම.

අච්ඡින්දාපනය = 1. අනුන් ලවා උදුරවා ගැනීම. 2. බලාත්කාරයෙන් ගෙන්වා ගැනීම.

අච්ඡින්න = 1. නොකැඩුණු. 2. බලයෙන් ගන්නා වූ. 3 නොසුන්.

අච්ඡේජ්ජ = 1. නොකැපිය යුතු. 2. වෙන් කළ නොහැකි.

අච්චුත = 1. නොමැරෙන. 2. නිස් නොවූ. 3. කෙලවර නොවන.

අජ = 1. එළුවා 2. මේෂ ලග්නය. 3. පුවපුටුප නැකැත. 4. චන්ද්‍ර-සූර්යයන් ගමන් කරන විථියක්. 5. මැඩගහ නම් ගස. 6. විෂ්ණු නාමයක්. 7. වේලපරින්ති වැල. 8. මේ දවස. 9. රජකුගේ නමක්. 10. බ්‍රහ්ම - විෂ්ණු - මහේශ්වර.

අජ ඇති = (අද ඇති) 1. තමා පිළිබඳ වූ. 2. බාහිර නොවූ. 3. තමා තුළ ම පිහිටි.

අජ කාන් = 1. සුදු කුඹුක්.

අජ ශෘඞ්ග = 1. වේලා ගස. 2. රම්මතියස.

අජ ගර = 1. පිඹුරා.

අජ ගව = 1. සිව දෙවියාගේ දුන්න.

අජ[illegible]ද = 1. අපිරිසුදු.

අජටා = 1. බිම් කෙල්ලි. 2. ජටාවක් නැති.

අජටාකාශය = 1. අවුලක් නැති අහස. 2. කොනක් නැති අහස.

අජකොණ්ණාන් = 1. වැටකොළු.

අජද්ධුක = නොකෑ ඉදීම.

අජන = 1. නොමිනිස් 2. ජනයා නැති.

අජනක = 1. අසාර වූ. 2. වඳ වූ.

අජනිත = 1. නූපන්. 2. හට නොගත්.

අජන්මවත් = 1. උසස් කුලයෙහි නූපන්.

අජ පථය = 1. එළුවන්ට පමණක් යා හැකි දුර්ගම මාර්ගය.

අජ පද = 1. එළු කුරය.

අජපල් = 1. එළුවන් රකින්නා 2. එළු එඬේරා. 3. කොට්ටය. 4. අජපල් නම් නුග රුක.

අජපාල = අජපල්.

අජ පාලයා = (අජ බාලයා) 1. එළු එඬේරා.

අජම්ම = 1. වෙන ජාතියකට අයිති.

අජය = 1. පරාජය. 2. නොදිනීම.

අජර=1. නොදිරන 2. ජරා නැති. 3. ගුරුවරයා. 4. චාරිත්‍රය. 5. දෙවි. 6. පඬිවරයා. 7. බෘහස්පති.

අජර සිරි = 1. ආචාර සම්පන්නය.

අජරාමර= (අජර + අමර; අජරාමෘත) 1. නොදිරන, නොමැරෙන. 2. ජරා මරණ නැති. 3. නිර්වාණය.

අජල=1. දිය නැති. 2. අලස. 3. කැදර. 4. මෝඩ.

අජලයා = (අජල්කයා) 1. කැදරයා. 2 කම්මැලියා. 3. මෝඩයා.

අජලනිමජ්ජණීය=1. ජලයෙන් නිමිය නොහැකි.

අජල්වීම = 1. (මාළු ආදිය) නැළී කුණු වී යාම.

අජ වීථිය = (අජ වේ) 1. ඉරු-සඳු ගමන් කරන වීථි තුනෙන් එකක්.

අජ ව්‍රතය = 1. නිගණ්ඨාදීන්ගේ ප්‍රතිපත්තියක්. 2. එළුවකු මෙන් පැවැත්ම.

අජස් = 1. මේෂ රාශිය.

අජස්ස = 1. පිළිකුල්. 2. නැත.

අජා = 1. එළු දෙන. 2. කන්දක නමක්.

අජා ගර = 1. නිදි නොමරන.

අජාඩිගුල = 1. හීලෑ 2. වනයේ ජීවත් නොවන.

අජාජී = 1. දෙදුරු. 2. සුදු දුරු හා කළුදුරු.

අජාත = 1. නූපන්. 2. හට නොගත්.

අජාතය = 1. නිර්වාණය.

අජාත බුද්ධි = (අජාත බුද්ධික) 1. හොඳ-නොහොඳ නොතේරෙන.

අජාත ශත්‍රු = (අජාත සත්තු = අජාසත්) 1. රජකුගේ නමක්. 2. උපදින්නට ප්‍රථමයෙන් ම සතුරු වූ.

අජාති = 1. උතුම් ජාතියක් නැති.

අජාදනී = 1. කසඹිලියා.

අජානීය අශ්වයා = 1. අජානෙය්‍ය සෛන්ධව අශ්වයා. 2. උසස් වර්ගයෙහි උපන් අශ්වයා. 3. ස්වාමියාගේ අදහස් දන්නා අශ්වයා.

අජාල = 1. ඉතා බහුල.

අජාරෝහිණී = 1. එනම් විශාල මත්ස්‍යයා.

අජිත = 1. නොදිනන ලද. 2. අසූ මහ සව්වන් වහන්සේ අතුරින් එක් නමක්.

අජිත කේශකම්බලී = 1. බුදුන් වහන්සේගේ කාලයෙහි විසූ එනම් ශාස්තෘවරයා.

අජිතු= 1. මිථුන රාශිය. 2. එක් වීම. 3. ජෝඩුව.

අජින = 1. මුව විශේෂයක් 2. අඳුන් දිවි සම.

අජින චණු = 1. තපසුන් පොරොවන මුව සම හෝ දිවි සම. 2. අඳුන් දිවි සම.

අජින මිපි = 1. අඳුන් දිවියා.

අජින පත්‍රා = 1. වවුලා.

අජිනප්පවේණිකාව = අඳුන් දිවි සමින් කළ ඇතිරිල්ල හෝ අඳුන් දිවි සමෙන් සෑදූ දරණුව.

අජින මෘග = 1. කළු පැහැති සමින් යුත් මුව වර්ගයක්.

අජින සාටිකාව = 1. අඳුන් දිවි සමින් කළ ඇඳුම. 2. අජින සම් සළුව. 3. සළුවක් සේ නවුසන් අඳින පොරවන අඳුන් දිවි සම.

අජිර = 1. මිදුල.

අජී = 1. එළු දෙන.

අජීර්ණය = 1. එනම් රෝගය. 2. ආහාර නොදිරවීම.

අජීව = 1. ජීවත් වීම. 2. ජීවිකාව. 3. ආජීවය.

අජීව = 1. නැත. 2. අවලක්ෂණ. 3. පණ නැති. 4. ජීවය නැති.

අජීව වස්තු = 1. ප්‍රාණයක් නැති වස්තු.

අජීවක් = 1. ජීවත් නොවන. 2. මැරුණු.

අජීවන = 1. ප්‍රාණවත්භාවය ඇති නොකරන.

අජීව පටිජීවක = 1. 'ආයුබෝවන්' කියාල 'ආයුබෝවන්' නොකියන්නා.

අජීව මාන = 1. ජීවත් ව නොඉඳින.

අජීවි=(අජීවක) 1. ජීවත් නොවන 2. අප්‍රාණික

අජුගුප්සාව = 1. පිළිකුල් නොකිරීම.

අජුන් = 1. අඳුන. 2. අඤ්ජනය.

අජුරා = (අජුරු) 1. ගුරුවරයා.

අජුක = (අජුද) 1. සූදුවක්. 2. කඩදාසි කුට්ටමෙන් කරනු ලබන ක්‍රීඩාවක්.

අජුව = 1. අවලක්ෂණ. 2. නැත.

අජේලු = 1. නිර්වස්ත්‍ර. 2. ඇඳුම් නැති.

අජේලක = 1. එළු - බැටළු.

අජෙය්‍ය = 1. පැරදවිය නොහැකි.

අජෝජ්ඣුව = 1. නිරිහැරය. 2. අමාරුව.

අජ්ජ = 1. අද

අජ්ජතග්ගෙ = 1. අද පටන්.

අජ්ජතන = 1. දැන් පවතින. 2. අද දින පිළිබඳ.

අජ්ජතනාශා = 1. දැන් සිටින අය. 2. අද සිටින අය.

අජ්ජතනී = 1. (ව්‍යාකරණයෙහි) අද පටන් කොට ඇති ආසන්න අතීතය.

අජ්ජල = 1. අතින් දමා ගසන ගල.

අජ්ජවය = 1. ඍජු භාවය. 2. අවංක බව.

අජ්ජිත = රැස් කළ.

අජ්ජුන = 1. කුඹුක් ගස.

අජ්ඣක්ඛ = 1. පාලකාධිකාරියා.

අජ්ඣබා = 1. බිම් තෙල්ලි.

අජ්ඣත්ත = 1. ආධ්‍යාත්මික. 2. තමා පිළිබඳ. 3. ආත්මය. 4. ශරීරය පිළිබඳ

අජ්ඣත්තික = 1. තමා අයත්. 2. ශරීරය පිළිබඳ. 3. තමා තුළ හටගත්තා.

අජ්ඣප්පත්ත = 1. හදිස්සියෙන් පහර දීමට පැමිණි. 2. පැමිණි.

අජ්ඣත්ත සමුට්ඨාන = 1. ඇතුළතින් හටගත්තා.

අජ්ඣයන = (අජ්ඣායන) 1. ඉගෙනීම. 2. වන පොත් කීම. 3. ශබ්ද සර පාඩම් කීම.

අජ්ඣසන = 1. වැඩිය කෑම.

අජ්ඣාචාර = 1. වැරදි හැසිරීම. 2. ශික්ෂාපද කඩ කිරීම. 3. කාම සේවනය.

අජ්ඣාචිණ්ණ = 1. මනා සේ පුරුදු කළ.

අජ්ඣාපන = 1. අධ්‍යාපනය. 2. ඉගැන්වීම.

අජ්ඣාය = 1. පරිච්ඡේදය.

අජ්ඣායක = 1. ඉගෙන ගන්නා. 2. වේදය උගතා.

අජ්ඣාරූළ්හ = 1. උස් ව නැගුණු. 2. උස් ව වැඩුණු.

අජ්ඣාරෝහණ = 1 සමුද්‍රයෙහි සිටිනැයි සැලකෙන විශාල මත්ස්‍යයෙක්.

අජ්ඣාසය = 1. අදහස.

අජ්ඣාසයතා = 1. අදහස් ඇති බව.

අජ්ඣුපගත = 1. පැමිණි.

අජ්ඣෙසනාය = 1. ඉල්ලීම. 2. අයැදීම.

අජ්ඣෙසනා = 1. ආරාධනය.

අජ්ඣෝකාස = 1. එළිමහන. 2. ආවරණයක් නැති තැන.

අජ්ඣොගාහන = 1. ගැලී සිටීම. 2. ගිල ගැන්ම. 3. බලවත් ඇල්ම.

අජ්ඣෝහරණ=1. ගිලීම. 2. කෑම. 3. මුඛයෙන් ඇතුළට ගැනීම.

අජ්ඣොහරණීය = 1. ගිලිය යුතු දෙය. 2. ආහාර.

අජ්ඣලිත = 1 බැබළීමක් නැති.

අංජන = (අංජුන) 1. අඳුන. 2. ඇස ගාන බෙහෙතක්.

අඤ්චි කුඤ්චිකා = (අඤ්චිලාවා - අඤ්ජිලාවා) 1. කුඩා තෝරා.

අඤ්චිත = 1. වඳින ලද. 2. පුදන ලද.

අඤ්ජන = 1. (ඇස ගාන) අඳුන්. 2. විෂ්ණු ක්‍රාන්ති. 3. සඳුන්. 4. පල්මානික්කම්. 5. දිශා අට සිටි ඇතුන්ගෙන් එකෙක්. 6. පර්වතයක්. 7. සංඥ නාමයක්. 8. ඇත් කුලයක්. 9. වනාන්තරයක නාමයක්.

අඤ්ජන සාමිය = 1. ඇස අඳුන් ගෑම.

අඤ්ජන සල්ලු = 1. අඤ්ජන කැට. 3. රසඳුන්.

අඤ්ජන කූලය = 1. දස ඇත් කුලයෙන් කාලාවක නම් කුලය.

අඤ්ජන චුණ්ණ = 1. කළු පැහැති සුණු වෙසෙසක්.

අඤ්ජන දළු = 1. සිංහල කැටයම් විශේෂයක්.

අඤ්ජන නාළි = 1. අඳුන් භාජනය.

අඤ්ජන තිලය = 1. රජුගේ ඇස් වෙද තිලය.

අඤ්ජනම = 1. ඇසෙහි ලන බෙහෙත් අඳුන. 2. අඤ්ජනම් එළිය බැලීම සඳහා සකස් කරගත් කල්කය.

අඤ්ජන පබ්බතය = 1. කළු පැහැති පර්වතයක්.

අඤ්ජන වණ්ණය = 1. කළු පැහැය.

අඤ්ජන විකා = 1. අඳුන් දමන භාජනය.

අඤ්ජනාව = 1. අඤ්ජනම් දේවිය. 2. හනුමන්තාගේ මව.

අඤ්ජනාවතී = 1. ඊශානට අධිපති හස්තියාගේ ඇතින්න.

අඤ්ජනී = 1. අඳුන් (ගාන) කූර. 2. අංජනම් දේවි.

අඤ්ජලී = 1. ඇඳිලි. 2. දෑතේ ඇඟිලි එක් කොට හිස දක්වා එසවීම. 3. දෙහොත 4. බෙහෙත් මැනීමේ මිම්මක් (පත).

අඤ්ජලිකරණය = 1. දෑත එක්කොට වැඳීම. 2. ඇඳිලි බැඳීම. 3 දෙහොත මුදුනේ තබා වැඳීම.

අඤ්ජලිකරණීය = 1. වැන්ද යුතු.

අඤ්ජලි පුට = 1. අඤ්ජලිය නමැති ගොට්ටුව. 2. ඇඟිලි එක්තැන් කොට බොකු ගැසූ දෙඅත්ල.

අඤ්ජලි ප්‍රණාම = 1. ඇඳිලි බැඳ වැඳීම. 2. දෙහොත් මුදුන් දී වැඳීම.

අඤ්ජසය = 1. මාර්ගය; පාර.

අඤ්ජිත = 1. අඳුන් ගාන ලද. 2. අඳින ලද. 3. ගාන ලද.

අඤ්ඤ = 1. අන්‍ය. 2. බාහිර. 3. අනෙක්.

අඤ්ඤතර = 1. එක්තරා. 2. අප්‍රකට. 3. අනෙක් 4. යම් කිසි. 5. නම් ගම් නොදත්.

අඤ්ඤථා = 1. අන් ආකාරයකින්.

අඤ්ඤදත්ථුහර = 1. අනුන්ගෙන් ප්‍රයෝජන ගන්නා සිතින් මිතුරකු සේ පෙනී සිටින්නා.

අඤ්ඤදා = 1. අන් දිනක.

අඤ්ඤමඤ්ඤ = 1. එකිනෙකා හා සම්බන්ධ. 2. ඔවුනොවුන් පිළිබඳ.

අඤ්ඤවාදක = 1 ඇසූ දෙය තබා අනෙකක් කීම. 2. කාරණයෙන් පිට උත්තර දීම.

අඤ්ඤාණය = 1. නොදැනීම. 2. මෝඩකම.

අඤ්ඤාණී = 1. නුවණ නැත්තා.

අඤ්ඤා කොණ්ඩඤ්ඤ = 1. බුදුන් වහන්සේගේ ධර්මය අසා පළමුවෙන් ම මාර්ග ඵලාවබෝධය කළ ශ්‍රාවකයන් වහන්සේ. පස් වග මහණුන් වහන්සේ අතුරින් ප්‍රමුඛ වූයේත් මෙතුමාය. සිද්ධාර්ථ කුමාරයාණන් වහන්සේ ලෝ පහළ වූ අවස්ථාවේ දී ශරීර ලක්ෂණ බලා, ''මෙතුමා නිසැකයෙන් ම බුදු වන්නේ ය''යි අනාවැකියක් පළ කළේ (එවකට ගෘහස්ථ පණ්ඩිතයෙක් ව සිටි) මෙතුමාය.

අඤ්ඤාත = 1. අප්‍රකට.

අඤ්ඤාතක = 1. නෑ නොවන. 2. අප්‍රකට. 3. නොදත්.

අඤ්ඤාතකවේශ = අප්‍රකට වේශය.

අඤ්ඤාතාවී = 1. චතුස්සත්‍යය නිම කොට දත් රහතුන් වහන්සේ. 2. චතුරාර්ය සත්‍යයෙහි හරි වැටහීම ඇත්තා. 3. සම්පූර්ණ දැනුම ඇත්තා.

අඤ්ඤාතුකාම = 1. දැනගනු කැමති.

අඤ්ඤාය = 1 දැනගෙන.

අඤ්ඤොඤ්ඤ = අඤ්ඤමඤ්ඤ.

අඥ = 1. නොදත්. 2. මෝඩ. 3. නූගත්.

අඥාන = 1. නොදැනීම. 2. නොනුවණ. 3. නුවණ නැති. 4. මෝඩ.

අඥාත = 1. නොදත්. 2. නෝරුම් නොගත්.

අඥානයා = 1. මෝඩයා. 2. නොදත් තැනැත්තා.

අට = 1. වතය 2. සටන 3. ගමන. (සංචාරය). 4. යුධය. 5. ඛබරය. 6. ගණනක්. (8). 7. උස් මැස්ස. 8. පැල වෙන බීජ (බිජුවට). 9. තේරුම. 10. සම්ප්‍රදාන සම්බන්ධයක් පැවසීමට යොදන විභක්ති ප්‍රත්‍යයක්. 11. ගණකම. 12. රන් රිදී ආදි වස්තුව. 13. මතුපිට. 14. ධනය. 15. මුතු පට.

අට අක = 1. කළඳ. 2. කහවනුවක බර.

අට අක්= 1. ඇස් අටක් ඇත්තා (මහා බ්‍රහ්මයා).

අට අකණ = 1. අෂ්ට දුෂ්ටක්ෂණ (පින් නොකළ හැකි කාල අට).

අට අඟ = 1. රාජ්‍යාඞ්ග අටක්. 2. අඞ්ග අට.

අට අඟ බඹ ඝර = 1. අට වැදෑරුම් බ්‍රහ්මඝෝෂය.

අට අත = 1. අට දිශාව.

අට අනරිය වෝහාර = 1. ආර්‍යයන්ට නොහිසි අට වැදෑරුම් කථා.

අට අනුව = 1. අනූ අට (අටක් සහිත අනූව).

අට අරි පුගුල් = 1. අෂ්ටාර්‍ය පුද්ගල. (සෝවාන් ආදි මාර්ග සතරට හා ඵල සතරට ද පැමිණි ආර්‍ය පුද්ගලයෝ අට දෙන).

අට අසූ = 1. අසූ අට.

අට ඇස් = 1. මහා බ්‍රහ්මයා. (ඇස් අටක් ඇත්තා).

අට ඉස්බ = 1. එකම් දුර ප්‍රමාණය (ඉස්බක් බඹ තිස් පහකි. රියන් එක් සිය සතළිසකි. එහෙයින් අට ඉස්බකට රියන් 1120ක් වේ)

අට උන්මාද = 1. කරුණු අටකින් හටගන්නා උමතු රෝග අට.

අට උදර = 1. වාත - පිත්තාදි උදර රෝග අට.

අට කණ = 1. අෂ්ට දුෂ්ටක්ෂණය.

අට කතර = 1. යෑමට අපහසු කැලෑ මඟ.

අට කර = 1. මහා බ්‍රහ්මයා (අත් අටක් ඇත්තා.)

අට කසිණ = 1. පෘථිවි ආපෝ ආදි කසිණ අට.

අට කිරිය = 1. අමුණු දෙකිසක වී වැපිරෙන ප්‍රමාණය. (කරීසයකට හෙවත් කිරියකට අමුණු සතරෙකි.)

අට කුරුම = 1. සිංහල රජ කාලයේ (ඇතුන් බාර ව සිටි) ගජනායක නිලමේගේ කඩියුතු අට.

අට කොණ් = 1. උතුරු - දකුණු ආදි දිශා අට.

අට ගණ = 1. කාව්‍ය ශාස්ත්‍රයට අයත් භූමි - දේව ආදි ගණ අට. (මගණ - යගණ ආදි ගණ අට.)

අට ගන්නවා = 1. හටගන්නවා. 2. උපදිනවා. 3. ඇති වෙනවා. 4. පැන නගිනවා.

අටගු = 1. (බෙහෙත්වල) කොටස් අට 2 අට වැදෑරුම් බඹ ගොය. 3. භික්ෂූන් ආහාර වළඳන විට සැලකිය යුතු කරුණු අට.

අටඟ මඟ = 1. ආර්‍ය අෂ්ටාඞ්ගික මාර්ගය.

අටඟ මිණ = 1. අෂ්ට වංක මාණික්‍යය.

අට ගුල = 1. අඟල් අට.

අට ගුණ = 1 ගුණ අට. 2. ගුණ අටක් ඇති ඖෂධය. (අමු ඉඟුරු). 3. අට වරකින් වැඩි වූ ප්‍රමාණය.

අටඟ සිල් = 1. අට සිල්. (අෂ්ටාඞ්ග ශීලය)

අට ජන = 1. සතර මඟ සතර ඵලයට පැමිණි අට දෙන.

අටඩය= 1. අප්‍රාණක නාමයක්. 2. කෝටි ප්‍රකෝටි-යටත් අධික ගණනක්.

අට තඹ = 1. තඹවල් අට.

අට තන = (අට තැන) 1. බුධාගමේ තැන නොඉපදවිය යුතු ස්ථාන අට. 2. අවිද්‍යාවෙනි ලක්ෂණ අට.

අට තිස් = 1 තිස් අට.

අට තුනු= 1. අෂ්ට මූර්ති 2. ශරීර අටක් ඇත්තා. (ඊශ්වරයා.)

අට තුරු = (අට තුරා) 1. අටකින් වැඩි.

අටතුරාසියක් = (අට + උතුරු + සියක්=අටෝ රාශියක්) 1. එක සිය අටක්.

අට තුලි = (අට කෙළි) 1. රන්කරුවා.

අට කෙලි නා = 1. රන්කරුවන්ගේ ප්‍රධානයා.

අට්'ක් = (අට + අත්) 1. මහා බ්‍රහ්මයා. (අත් අටක් ඇත්තා,)

අට්'ක් දෙවි දූ = 1. මහා බ්‍රහ්මයාගේ ප්‍රියාව. (සරස්වතිය.)

අට දඹු = (අට දෙළු) 1. අඩක් දු ගිය.

අට දස = 1. දස අට.

අට දශ විද්‍යා = 1. අෂ්ටාදශවිද්‍යා. 2. චතුර් වේදය.

අට දසාස් රට = (අටදස්රට) 1. රුහුණු රට. පැරණි ජනපදයක්.

අට දික් පතිහු = (අට දික් පාලයෝ) 1. අට දිශාවට අධිපති දෙවියෝ.

අට දික් භාගය = 1. අට කොන. 2. අට දිශාව.

අට දිමු = 1. මහා බ්‍රහ්මයා. (ඇස් අටක් ඇත්තා)

අට දිමු සොහොයුරු(බු)රු = 1. මහා බ්‍රහ්මයාගේ සහෝදරයා. 2. අනඞ්ගයා.

අට දෙනා = 1. පුරාතනයෙහි ගමේ පාලනය සඳහා පත් කළ ගම් සභාව.

අට දෙස = 1. අට දිශාව.

අට දෝස = 1. ගෘහ වාසය පිළිබඳ දෙස් අට.

අටනා = 1 වනාන්තරය. 2. සටන. 3. යුද්ධය. 4. සතුරන් යට කර මිරන උගුල.

අටනය = 1. තැනින් තැන ඇවිදීම.

අටං = 1. අටැස්; අට පැත්තකින් යුක්ත.

අටං කඩාගෙන = 1. මහත් බලාපොරොත්තු ඇති ව සූදානම් වී.

අටංපහුර = (අටම්පහුර) 1. පිළිවෙළකට නැති දේ. 2. සවි නැති මැස්ස.

අට නා කුල = 1. ඓරාවතාදී ඇත් කුල අට.

අට නැණ = 1. අෂ්ට මහා විද්‍යාඥාන.

අටනිය = 1. ඇඳ වන. 2. ඇඳේ විට්ටම.

අටනෙත්= 1. නෙත් අටක් ඇත්තා. (බ්‍රහ්මයා.)

අටපට්ටම් = 1. පැති අටක් ඇති දේ.

අටපදය = 1. පාද අටක් ඇති පද්‍ය. 2. සිල් පද අට.

අටපණ(න)ස = 1 පණ(න)ස් අට.

අටපානු = 1. අෂ්ටවිධ පාන.

අටපලම = 1. පලම් අට. 2. පන දෙක.

අට පස = 1. අටසිල් හා පන්සිල්. 2. හොඳ නොහොඳ. (කිසියම් දෙයක්)

අටපා කොම්ලි = 1. කොවුල් විශේෂයක්.

අටපාවා = 1. පා අටක් ඇති සතා.

අට පිරිකර = (අෂ්ට පරිෂ්කාර) 1. භික්ෂූන්ගේ පිරිකර අට. (අඳනය, තනිපට සිවුර, දෙපට සිවුර, පටිය, පාත්‍රය, කඩ කැත්ත, ඉඳි කටුව, පෙරහන්කඩය යන අට.)

අට පිරිස = 1. බුදුන් වහන්සේගේ දහම් ඇසීමට රැස්වන අට වැදෑරුම් පිරිස.

අට පේරු = 1. කොටස් අට 2. පළාත් අට.

අට පොහෝ = 1. පෙහෙවිස් සමාදන් විය යුතු දින අට.

අට භාගය = (අට භාගය) 1. අට කොටස. 2. යුධ සේනාව පිළිබඳ කොටස් අට.

අට මුඹු = 1. මහල් අටක් ඇති.

අට මෙර = 1. අරක්කු.

අට මඟ = 1. ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය.

අට මඟුල = 1. ශුභ දායක ලක්ෂණ අට. 2. මඞ්ගල සම්මත වස්තු අට. 3. ඒ ලකුණු යෙදූ රේඛා සටහන. 4. බලි යාගයන්හි දී ආතුරයා ළඟ තබන කොළබෝ, හීරැස්ස, සහල්, පොල්, දිවි හිස හෝ දිවිකදුරු, කැත්ත, මල්ලී, මෝල් ගහ යන අට.

අට මඩිගය = 1. ගොනුන් පිට බඩු ගෙනයාමට භාර වූ තත්තෝරුවේ කොටස් අට.

අටමහස්ථාන = (අට මහා ස්ථානය)1. අනුරාධපුරයේ පිහිටා තිබෙන ප්‍රධාන සිද්ධස්ථාන අට. (1. දක්ෂිණ චෛත්‍යය 2. ශ්‍රී මහා බෝධිය 3. ලෝවා මහා ප්‍රාසාදය 4. පිරිත්ලාගෙය 5. ජනතාසර පොකුණ 6. ථූපාරාමය 7. රුවන්වැලි සෑය 8. මිහින්තලේ ශෛල චෛත්‍යය යන අට තැන හෝ, 1. ශ්‍රී මහා බෝධිය 2. ලෝවා මහා ප්‍රාසාදය 3. මිරිසවැටි විහාරය 4. අභයගිරි වෙහෙර 5. ජේතවන විහාරය 6. රත්නමාලි චෛත්‍යය 7. ථූපාරාමය 8. මිහින්තලේ ශෛල චෛත්‍යය යන අට තැන.)

අට මහ නරකය= 1. අට මහ නිරය. (1. සඤ්ජීව 2. කාල සූත්‍ර 3. සඞ්ඝාත 4. රෞරව 5. මහා රෞරව 6. තාප 7. ප්‍රතාප 8. අවීචි යන නරක අට)

අට මහා වර = 1. අනඳ මහ තෙරුන් විසින් බුදුන් වහන්සේගෙන් ලබන ලද වර අට.

අට මලු = 1. සතුන් ඇල්ලීම සඳහා මැස්සක ගල් සටවා අටවන උගුල.

අට මුළු කොප්පිය = 1 මහ නුවර රජ කුමරුන් හිසෙහි ලූ මුලු අටක් සහිත කොප්පිය.

අට යෝන් = (අට යෝනි) 1. කාව්‍ය ශාස්ත්‍රයෙහි දැක්වෙන නකුල් ආදි ජාති අට.

අටර = 1. දන අට (අටලෝස).

අට රට = 1. ශ්‍රෙෂ්ඨ හස්තීන් උපදනා ප්‍රාච්‍ය ආදි රටවල් අට. 2 බුදුන් වහන්සේගේ ශාරීරික ධාතු නිධාන කොට මුල දී චෛත්‍ය කරවූ මාගධ, වේසාලි ආදි රටවල් අට.

අට රස = 1. ශෘංගාර, වීර, කරුණා, අද්භූත, හාස්‍ය, භයානක, බීභත්ස, රෞද්‍ර යන කාව්‍ය නාටක රස අට.

අටරි සඟ = (අට + අරිසඟ) 1. අෂ්ටායී පුද්ගල මහා සංඝයා.

අටරූෂ = 1. ආඩතෝඩා.

අට ලවණ = (අට ලුණු) 1. ලුණු වර්ග අට. (සවිඳ-සුවස - කළු - මුහුදු - වැලිකර - බිලල්- උද්භිද - රෝම යන ලුණු අට වර්ගය.)

අටලු ගෙය = 1. උස් තට්ටුවක් ඇති ගොඩ නැගිල්ල.

අටලු වාසල = 1. සඳලු තලය (පියස්ස රහිත උඩුමහල්තලය)

අට ලෙව්දම් = (අට ලෝදම) 1. ලාභය - අලාභය- අයස-යසස- නින්දාව- ප්‍රශංසාව - සැප- දුක යන අෂ්ට ලෝක ධර්මය.

අට ලොවුතුරා සිත් = 1. සෝවාන් ආදි මාර්ග චිත්ත හතර හා ඵල චිත්ත හතර.

අටල්ල = 1. උස් කොට තැනූ මුර ගෙය; මුර ගෙය.

අටවක = 1. වක් අටක් ඇති. 2. එනම් පොහෝ දවස. පුර-අව පක්ෂවල අට වැනි තිථිය ලත් දවස.

අටවක මිණ = 1. අෂ්ට වංක මාණික්‍යය (අට තැනකින් නැමුණු මැණික).

අටවත් = 1. වස්තු අට. 2. මහණකම ලැබූ සත්‍රීන් හට පාරාජිකා වීමට සම්පූර්ණ විය යුතු කරුණු අට.

අට වණක් පිරිස = 1. අට පිරිස.

අටවනාවං = (අටෝකවා) 1. අසු කරනවා. 2. යොදනවා 3. තබනවා 4. පිහිටුවනවා. 5. දිග අරිනවා 6. සාදනවා. 7. විහිදුවනවා.

අට වනු = 1. අෂ්ටම (අට වැනි).

අට වර = 1. බුදුන් වහන්සේගෙන් අනද මහ තෙරුන් ලැබූ වර අට නොහොත් විශාඛා උපාසිකාව ලත් වර අට

අටවරණියා = 1. අමුක්තා 2. අත්‍යයා 3. සතුරා.

අටවරා සිය = 1. අටතුරු සිය. (අටක් වැඩි සියය-එකසියඅට.)

අටවල = අශ්ව කෙඳි අටක සතකම 2. අගලෙන් තවයෙක් පංගුව.

අටවසු = 1. ආප, ධ්‍රැව වසු ආදි නම් වූ දේවතා වෝ අට දෙන.

අටවැල් අලුව = 1. රෙදි වියන (යන්ත්‍රයක්); උපකරණයක්.

අටවි = 1. මහා වනය. 2. 'සිත' තැනක. 3. අඩවිය.

අට විඳු = 1. අෂ්ට බින්දු.

අට විද්දු නැණ = 1. අෂ්ට විද්‍යාවන් පිළිබඳ ඥානය.

අටවිඩ = 1. අට වැඳුරුම්.

අටවියට = 1. වී ඇට අටක බර. 2. මස්ස.

අටවිස්ස = 1. විසි අට.

අට විසරණ = 1. ඉන්ද්‍ර-චන්ද්‍ර-පාණිණී ආදි මහා වෛයාකරණයන් අට දෙනා විසින් නිපද-වන ලද සංස්කෘත ව්‍යාකරණ අට.

අට විසි පිරිත = 1. තණ්හංකර - මේධංකර ආදි විසි අට බුදුවරයන්ගේ නම් යෙදූ පිරිත.

අට සංඝ වත් = 1. සෝවාන් තොවූ අය සැක උපදවන කරුණු අට.

අටසකා = 1. ඇස් අටක් ඇත්තා. (මහා බ්‍රහමයා.)

අට සකමල් = (අට සක්මල්) 1. මහා බ්‍රහමයා-ගේ බාල සහෝදරයා. (අනංගයා)

අට සමවත් = 1 අෂ්ට සමාපත්ති.

අට සාලිස = 1. සතලිස් අට.

අට සැම = 1. සැට අට.

අට සැත්තෑව = 1. සැත්තෑ අට.

අට සියය = 1. අපිත් ගුණ කළ සියය (800).

අට සිල් = 1. අඞ්ග අටකින් යුක්ත ශීලය.

අට සෙනඟ = 1. පුරාතන යුධ සේනාවක පැවැති කොටස් අට.

අටළොස = 1. දහඅට.

අට්ට = 1. අට. 2. සම්ප්‍රදාන විභක්ති ප්‍රත්‍යයයක්.

අට්ටය = 1. හඩුව 2. මැස්ස. 3. පලංචිය 4. මැඩුණු. 5. පෙළුණු.

අට්ටක = 1. අටල්ල. 2. මුර සිටීම සඳහා උස් කොට සෑදූ මැස්ස.

අට්ට පට්ට වැඩ = 1. පිළිවෙළක් නැති වැඩ.

අට්ටංගය = (අට්ඨාංගය) 1. හැම් අටකින් යුක්ත මාණික්‍යය.

අට්ටමාල = 1. තක්කඩි. (ප්‍රයෝගකාර.)

අට්ටම = 1. පැත්ත. 2. අංශය.

අට්ටම් පද්දව = 1. අංශයෙහි තිබෙන කොටස.

අට්ටල් = 1. හිරිහැර.

අට්ටල = (අට්ටාල) 1. වෙහෙස. 2. හිරිහැර. 3. අවහිරය. 4. අපහසුව. 5. උස් මැස්ස.

අට්ටවාලය = 1. වහල සෙවි වීම සඳහා යට ලීයට ආධාර පිණිස යොදන ලී පෙළ.

අට්ටහලය = (අට්ටහලේ) 1. උස් ව තැනූ මුර ගෙය.

අට්ටහාසය = 1. ශබ්ද නගා සිනාසීම 2. කොක් හඬ ලා කරන මහ සිනාව.

අට්ටා කොඩි = 1. මුවකිරිය.

අට්ටාලය = (අට්ටාලේ) 1. උස් ව තැනූ මුර ගෙය.

අට්ටාල බැඳි = 1. ගස් උඩ බැඳි මැසිවල හිඳ මුවන් මරන වැද්දා.

අට්ටි = 1. පේළිය. 2. රාශිය.

අට්ටි ගැසීම = 1. (වී මලු ආදිය) පේළියට ගොඩ ගැසීම.

අට්ටික්කා = 1. එනම් ගස. (මල් නැති කඳ මැද ගෙඩි හටගන්නා ගස් වර්ගයක්;) දිඹුල්.

අට්ටියා = 1. අත්තිමයා.

අට්ටිල = 1. වාත රෝගයක්. 2. අකු ඇටය. 3. උර ඇටය.

අට්ටුව = 1. දැලි කුණු

අට්ඨානූව = 1. අනූ අට.

අට්ඨායතන = 1. පුරාතන ලංකාවේ තුබුණු ප්‍රධාන සඞ්ඝාරාම අට.

අට්ඨාසූව = 1. අසූ අට.

අට්ඨැස් = 1. මට්ටි වර්ගයක්. 2. (ඇස් අටක් ඇත්තා.) මහා බ්‍රහ්මයා. 3. පැති අටක් ඇති.

අට්ඨ = 1. අට. 2. අර්ථය.

අට්ඨක=1 අටක් ඇති. 2. අටේ සමූහය 3. එනම් රාජ කුමාරයා. 4. එනම් පසේ බුදුවරයා.

අට්ඨකථාව = 1. අටුවාව. 2. අර්ථ විස්තර සහිත ව ලියූ පොත.

අට්ඨකල්ප= 1. කල්ප අට, 2. අපායක නාමයක්.

අට්ඨ ගරුධම්ම = 1. භික්ෂුණීන් විසින් පිළිපැදිය යුතුයයි නියම කළ ප්‍රධාන කරුණු අට.

අට්ඨභාගික = 1. කොටස් අටක් ඇති.

අට්ඨදන්තක = 1. දත් අටක් ඇති. (පස් සම කිරීමට ගන්නා) උපකරණයක්. 2. රේක්කය. 3. දැති පෝරුව.

අට්ඨපද = 1. කට්ටි අටක් ඇති දුත් ලෑලි ආදිය.

අට්ඨම = (අට්ඨමක) 1. අට වැනි.

අට්ඨ මිච්ඡත්තය = 1. අට වැදෑරුම් මිථ්‍යාව.

අට්ඨ සමාපත්තිය = 1. සමාපත්ති අට.

අට්ඨංස = 1. පැති අටක් ඇති.

අට්ඨාන = 1. අයෝග්‍ය ස්ථානය. 2. නුසුදුසු කරුණ.

අට්ඨානනියෝජනය = 1. නොනිසි තැන යෙදවීම.

අට්ඨාන ඵලකය = 1. පිටේ කුණු උලන සාණ්ඩුව.

අට්ඨාරස = 1. අටළොස. (දහ අට.)

අට්ඨි = 1. ඇටය. 2. ඇට කටු.

අට්ඨික = 1. ශරීරයේ ඇට පිළිබඳ වූ.

අට්ඨිකඞ්කල = 1. ඇට සැකිල්ල.

අට්ඨිකල්‍යාණ = 1. අස්ථි කල්‍යාණ. (බුද්ධ) සිදුරු නැති, දීප්තිමත් දත් ඇති ස්ත්‍රී ලක්ෂණය. 2. ඇටවල යහපත් පිහිටීම.

අට්ඨිත = 1. නොසිටි. 2. නොපිහිටි

අට්ඨිමය = 1. ඇටවලින් සෑදූ.

අට්ඨිමිඤ්ජා = 1. ඇට මිදුළු.

අට්ඨිසඞ්ඛලිකා = 1. ඇට සැකිල්ල.

අට්ඨිසඞ්ඝාට = 1. ඇට සැකිල්ල.

අට්ඨුප්පත්තිය = 1. කරුණක් පැන නැඟීම.

අට්ටි = 1. කැමැත්ත. 2. ආශාව. 3. අදහස. 4. ඕනෑකම.

අට්ටිනවා = 1. හටගන්නවා. 2. ඇති වෙනවා. 3. පහළ වෙනවා.

අට්ටිසා = 1. කැමැත්ත ඇත්තා.

අට්ටියල් = 1. එරබදු ආදියෙහි ඇටවල මදය.

අට්ටු = 1. අටල්ල. 2. උස් කොට තැනූ මැස්ස. 3. මුළුතැන්ගෙහි දුමට උඩින් තැනූ මැස්ස. 4. වී තැබීම සඳහා තැනූ මහ තට්ටුව හෝ පෙට්ටිය.

අට්ටු ඇට = 1. තම්බා වියලා අට්ටුවේ තැබූ කොස් ඇට. (අට්ටුකොස් ඇට.)

අට්ටු කොම්බු = 1. වී තැන්පත් කරන ගෙවල්.

අට්ටු කොස් = 1. තම්බා වියලා අට්ටුවේ තැබූ කොස්.

අට්ටු දුඹුලු = 1. අට්ටුවේ බැඳුණු දුඹුළු.

අට්ටු පතිය = (අටු පැතිය) 1. හේතුවක් පහළ වීම. 2. අවස්ථාවක් ඇති වීම.

අට්ටු පල්ල = 1. අටු-කොටු පතුල.

අට්ටු පොල් = 1. අටුවෙහි ලිමෙන් දිය සිඳුණු පොල්. (ගුඩු පොල්.)

අට්ටු මඩු = 1. වී අටු රැකීමට තැනූ ගෙය.

අට්ටු මාකා = 1. මාන කොකා.

අට්ටු මැසි = 1. ධාන්‍ය තැන්පත් කොට තබන මැස්ස.

අට්ටුව = 1. උස්ව තැනූ මැස්ස. 2. වී රැස් කොට තබන ස්ථානය.

අට්ඨුවාව = 1. අර්ථ කථාව. 2. අර්ථ පැහැදිලි කිරීමට ලියූ විස්තරය.

අට්ටුගල = (අටු ගල්ල) 1. අටල්ල 2. උස් කොට තැනූ මුර ගෙය.

අට්ටුළු = 1. අටල්ල.

අට්ටුබන් කොළු = 1. ලෙලි ගසපු පුවක් කොළය.

අට්ඨුවා ඇඳුරු = 1. ත්‍රිපිටක පාලියට අර්ථ කථා ලියූ බුද්ධඝෝෂ ආදි ආචාර්යවරයෝ.

අට්ඨුවා සාලි = 1. අටුවාවෙහි දැක්වූ ධර්ම මාර්ගය.

අට්ඨුවා සන්න = (අටුවා සන්නය) 1. අටුවාවට කළ ගැට පද විවරණය.

අට්ඨෝක් = 1. ඔසවන ලද්ද. 2. උස් කළ දෙය.

අට්ඨෝක = 1. අටවක.

අට්ඨෝපය = (ආටෝපය) 1. උකුගතිය. 2. ඕජාව.

අට්ඨෝත්තර = 1. අෂ්ටෝත්තර. (අටක් වැඩි).

අට්ඨෝත්තර දහස 1. අටක් වැඩි දහස. (එක් දහස් අට.)

අට්ඨෝත්තරසිය 1. එක සිය අට.

අඩ = 1. අඩිය (දෙකෙන් පංගුව.) 2. කොටස. 3. යම් කිසිවක් නො පෙරළී තැබීම සඳහා සිර කර තබන ලීය හෝ ගල. (රුකුල.) 4. බදු වශයෙන් ගෙවන කොටස. (බද්ද.) 5 කෙ(ලු)එම්. 6. ධනවත්. 7. ආධ්‍ය. (සමෘද්ධ). 8. පද්‍යයක එක් කොට ගත් මුල් දෙපදය හෝ අග දෙපදය.

අඩ ඇස = 1. අඩක් පියූ ඇස.

අඩංගු = 1. ඇතුළත්. 2. යටත්. 3. අයිති. 4. හිකරු.

අඩකය = (අඩ කලස) 1. ලාහ. 2. හැළි හතර.

අඩ කළඳ = 1 පලම් හැටහතරක් බර.

අඩ කඩ = 1. කවයකින් දෙකෙන් කොටස.

අඩ කහවණු = 1. කහවණු භාගය. (පැරණි කාසියක්.)

අඩකිරිය = 1. කිරියකින් අඩිය. (අමුණු දෙක.)

අඩ කුඹුර = 1. පත. 2. තැලියෙන් හතරෙන් පංගුව.

අඩ කුඹ කිරීම = 1. කොඩිය අඩක් බැමෙන් කණගාටුව දක්වීම හෝ ගරු කිරීම.

අඩ කුරුසාව = 1. අඩය ලෙස ගසන කරුව හෝ කුරුසාව.

අඩ කුළුඳුල් = 1. අඩයක.

අඩකොළ = 1. කෝටියෙන් දෙකොට් පංගුව. (පණ(ක)ස් ලක්ෂය)

අඩකෝට්ටු = 1. අවහිරය. 2. වැළකීම. 3. බාධාව.

අඩක්කම = 1. මල් වෙඩි පෙට්ටිය. 2. රැක බලා ගැනීම. 3. සැඟවීම. 4. හිරවීම.

අඩක්කලම = 1. පිහිට. 2. වෙඩි බෙහෙත් පෙට්ටිය.

අඩ ගහණ = 1. (චන්ද්‍ර සූර්යයන්ගේ) අඩ ග්‍රහණය.

අඩඟ රඟ = 1. ශරීරයේ එක් පැත්තක් නො සොලවා අනෙක් පැත්ත සෙලවීමෙන් කරන නැටුම.

අඩ්ඪ = (අඩ + අඩ) 1. භාගයෙන් භාගය. (හතරෙන් පංගුව)

අඩ්ඩ = අඩය.

අඩ තැන් = අඩක් දුර.

අඩතිය = (අඩ තුන්) 1. භාගයක් අඩු තුන. (දෙකහමාර.)

අඩ තුන්කොළ=1. දෙකෝටි පණ(හ)ස් ලක්ෂය.

අඩ තෙළෙස් = 1. භාගයකින් අඩු තෙළෙස. (දොළහමාර.)

අඩදඩ = 1. කලබල. 2. ඉක්මන්. 3. ආකූල වීම.

අඩදඬු = 1. කුඩා පොල්ල.

අඩ දමු = 1. කොටසක් දැවුණු.

අඩදඹු = (අඩ දෙඹු) 1. කොටසක් දැවුණු.

අඩ දැනී = 1. බාගයක් දණ ගැසූ. (එක් දණක් බිම ගැසූ.)

අඩ දිට්ඨි = (අඩ දෘෂ්ටිය) 1. නෙත් කොනින් බැලීම. 2. අඩ බැල්ම.

අඩ දී = 1. තරමක් මිදුණු කිරි. (අඩක් මිදුණු කිරි.)

අඩණ = 1. යුධ ආයුධයක්. (පලිහ).

අඩත්තේට්ටම = 1. හිරිහැරය. 2. හිංසා කිරීම. 3. වද දීම.

අඩ නිඳි = 1. මඳ නින්ද.

අඩ පණ = 1. දුර්වල. 2. බල හීන. 3. අබලන්.

අඩ පත = 1. පත භාගය. 2. තැළියෙන් අටෙන් පංගුව.

අඩ පද = අඩ පාදය. (කවියක පදයෙන් කොටස.)

අඩපන්නේ = 1. උපකරණ. (ආම්පන්න.) 2. මෙවලම්.

අඩපය = 1. දුර්වල. 2. නිසි ලෙස බිම නොවදින පය.

අඩපහ ගහනාවා = 1. ඝොර ගගනාවා.

අඩපලක් = (අඩ පලය්) 1. අඩ පයසිබකාය. 2. භාගයක් අරමුණිය ගොනා හිඳගැනීම. 3. මෙගෙණින් බණ ඇසීමට හිඳගන්නා ක්‍රමය.

අඩ සලම = 1. සලත් හග.

අඩ සසඟල් = 1. අගල් හතර සමාර. 2 අඟ-ලෙන් භාගය.

අඩ සෙණ = 1. පෙණයෙන් අඩිය.

අඩ සෙනෙහසම = (අඩ පෙනෙවය්) 1. එක් රැයක් හෝ එක් දවාලක් රකින සීලය.

අඩ පොළු = 1. අඩය ලෙස තබන පොල්ල. 2. ඒරිය කඳට තබන ලීය.

අඩප්පරය = (අඩප්පං - අඩප්පරෙ) 1. සම්මුල් ගාය. 2. ගවයන්ට සැදෙන රෝගයක්.

අඩප්පය = (අඩප්පෙ - අඩප්පකාඩ) 1. ඇඹපය. 2. ලඟ. 3. අහල පහල.

අඩප්පෙට්ටි = 1. පෙට්ටි පියන.

අඩබ = (අඩබය–අඩබෙ) 1. දෙකෙන් කොටස.

අඩ බත් = 1. වරකට වළඳන ආහාර ප්‍රමාණයෙන් කොටස.

අඩ බඹ = 1. කොටසක් කරකැවීම. 2. අභිප්‍රාව නම් කාව්‍ය විශේෂය. (ශෘංගාර කාව්‍ය බන්ධනයක්).

අඩබර = 1. දෙළසින් අඩිය (සය).

අඩ බැලුම් = (අඩ බැල්ම) 1. යට ඇසින් බැලීම. 2. නෙත් කොනින් බැලීම. 3. රැවීම.

අඩබුක් = 1. අඹයක් අනුභව කළ.

අඩ බෝ = 1. අඩියකට වැඩි කොටස.

අඩ මක් = 1. අඩ මාත්‍රාව. (ඇසි පිය හෙළන කාලයෙන් කොටස.)

අඩ මඳුම = 1 අකකින් පසෙන් පංගුව. 2. ඔලිඳ ඇටයක බර. (මංචාඩි භාගය.)

අඩ මස් = 1. අඩ මාසය. 2. පසළොස් දවස.

අඩ මස්ස = 1. වී ඇට සතරක බර. 2. මත්ස-කින් අඩිය.

අඩමාන = 1. සැක සහිත. 2. පෙරළිය හැකි. 3. සපිර නැති.

අඩමු = (අඩමුත්) 1. තරමක් මිදුණු

අඩ මුන්දි = 1 තරමක් මිදුණු කිරි.

අඩ මුකුළු = 1. අඩියක් පිපුණු. 2. පිපීගෙන එන. 3 අඩියක් හැකුළුණ. 4. මඳ සිනාව.

අඩයටි = 1. අඩ යෂ්ටිය (දඹු මතුයෙහි සවි කළ ආයුධ විශේෂයක්.) 2 ලංසය 3. හෙල්ල.

අඩයටි දර = 1. හෙල්ලක් දරන්නා. 2. කද කුමරු.

අඩයාළම = 1. සලකුණ. 2. සිහි වීමට දෙන ලකුණ. 3. හන. 4. දඩුවම. 5. හැඩහුරුකම.

අඩයාළම් කොඩිය = 1. සටහන් (ලකුණු) සහිත කොඩිය.

අඩ රජය = 1. රාජ්‍යයෙන් අඩිය.

අඩ රෑ = 1. රාත්‍රියෙන් අඩිය.

අඩවල් = (අඩවත් - අඩවළු) 1. මඳක් පියූ. 2. අඩක් වැසූ.

අඩවිය = 1. වනාන්තරය. (අටවිය).

අඩවිය අම දෙන = 1. වන ප්‍රදේශ භාර අට දෙන.

අඩවිවල = 1. වනාන්තරය.

අඩ විෂ්ණු = විෂ්ණු දෙවියන්ගේ නාමයක්.

අඩවුම = 1. කරනම. 2. ගෞරව වශයෙන් හෝ නැශි හෝ උදෙසා කරන නැටුම.

අඩස = (අඩහ) 1. කොටස. 2. භාගය.

අඩ සඳ = (අඩ හඳ) 1. අඩ චන්ද්‍රයා. 2. එබඳු සටහන. 3. ඊ ගස් වර්ගයක්. 4. වැල් පෙණෙල නම් පැළෑටි. 5. අටවක් ද හඳ

අඩ සඳ පහණ = 1. සඳ කඩ පහණ (ගෙවල්) ඉදිරියෙහි තබන හඳ පළුවක හැඩහුරු කමට කැපූ ගල.)

අඩ සඳ මුව = 1. ඊය (ඊ තලය)

අඩ සා = 1. අඩක් හාමත් වූ.

අඩස් = 1. අර්ධාංශය. 2. භාගය.

අඩ සිරස = (අඩ සිරේ) 1 වැළැක්ම. 2. සිර කිරීම.

අඩස් බැල්ම = 1. ඇස මඳක් පියවා බැලීම.

අඩස්සිය = 1. අවහිරය. 2. වැළැක්ම. 3 වාත රෝගයක්. 4. හිරවීම 5. එනම් දැල් විශේෂය.

අඩ හැණ = 1. ඔසු වෙසෙසක්.

අඩ හැර = 1. ආකාරය 2. හැඩය. 3 පිළිවෙල.

අඩ හිටිනවා = 1. අතරක දී නවතිනවා.

අඩහුණු = 1. කළං එකහමාර.

අඩළු = (අඩාළු) 1. කොටසක් ඉතිරි. 2. අඩක් අත්හැරුණු. 3. අසම්පූර්ණ. 4. බාගයක් ගා ඉතිරි වුණු පොල් බෑය.

අඩළි = 1. මඳ පමණකට පිරූ.

අඩා = 1. එම්බල. 2. බොල.

අඩාළු = 1. කොටසක් ඉතිරි.

අඩා ලුහුඬු = (අඩු ලුහුඬු) 1. අඩු පාඩු

අඩෑස = (අඩ + ඇස) 1. අඩක් පියූ ඇස.

අඩෑස්සී = නෙත් කොනින් බැලීම.

අඩෑසි = 1. අඩක් පියූ ඇස් ඇති.

අඩෑසි බැල්ම = 1. ඇස් අගින් බැල්ම. 2, හොර ඇහින් බැලීම.

අඩි = 1. පතුල. 2. පියවර. 3. මුල් කොන 4. ලිං - වළං ආදියෙහි පල්ල. 5. දිය ඇළ. 6. යමක් උසුලා සිටින ආධාරය. (පාත්‍ර අඩිය.) 7. මත් පැන්. 8. ඉංග්‍රීසි අඟල් දොළසක දිග. 9. (චීන) අඩි නම් මල්ලව පොර විශේෂය. 10. පය. 11. තරාතිරම. 12. බිම පිහිටි කොටස. 13. කවියක හෝ සින්දුවක හෝ මුල-මැද හෝ අග කොටස්.

අඩික්කොච්ච = ලියා ගත් පුවක් ගෙඩියකින් ඉතිරි වූ කොටස.

අඩික්කොට්ට බීම = 1. (පොල් ආදිය) දෙපලු කොට බිදිමේදී කබතොලු සහිතව බිදීයාම.

අඩි කාරයා = 1. විනාඩි දන්නා. 2. මත්පැන් බොන්නා.

අඩික්කුර = 1. ගව ආදි සිවුපාවුන්ගේ කුර පහර.

අඩි කුලී = 1. ගමන් ගාස්තුව.

අඩි කෝඩය = 1. කලබල. 2. විහිළුව. 3. අවතාරය. 4. හොල්මන. 5. සෝලම. 6. අඟර දඟරය.

අඩිකෝදුව = 1. අඩියේ දිග මිම්ම.

අඩි ගහනවා = 1. මත්පැන් බොනවා.

අඩි ගෑස්ම = 1. අඩි ශබ්දය. 2. පය තැබීම.

අඩිතාලම = 1. පදනම. 2. අත්තිවාරම.

අඩි පට්ටල = 1. ලෝහ තහඩු තබා තලන ලී කොටය.

අඩි පත්තා = 1. කොටු බුලත් විට පිටතට ඇද ගැනීම පිණිස වංගෙඩියේ යොදා ඇති ලෝහ පතුර.

අඩි පල්ල = 1. පයේ යටි පැත්ත. 2. වළඳේ පතුල. 3. වළඳ පතුලේ අල්ලන දන්තුඩ.

අඩි පලුබෝ= 1. ගොයම් කොළ කැපිගැසීමේ දී අඩියට යොදන කැටසන්ද.

අඩි පසු නොලන = 1. පසු නොබසින. 2. අඩිය පස්සට නොගන්නා.

අඩි පළ = 1. මත්පැන් තිබෙන තැන. 2. සුරා ගුබ්බැයම. 3. තැබෑරුම.

අඩි පාර = 1. රථ වාහන යා නොහැකි පටු මග. 2. අඩි තලව්වෙන් සැදුණු පාර. 3. පයින් පමණක් යා යුතු පටු පාර. 4. යමකුගේ ක්‍රියා මාගීය.

අඩි පෙට්ටි = 1. පෙට්ටගම. 2. කකුල් සහිත පෙට්ටි.

අඩි මඩක්කු = 1. අඩි සහිත මැටි කෝප්පය. 2. බත්වළඳ.

අඩිය තියනවා = 1. ඇතුළු වෙනවා.

අඩි වට්ටම = 1. නැට්ටුවා පදය අල්ලන්නට මත්තෙන් රඟමඩල වටේ යන ගමන.

අඩිවළන් = 1. අඩිය සහිත මැටිවළඳ.

අඩිස්සාල් = 1. මිටි බංකුව 2. පා පුටුව.

අඩි = 1. 'අඩා' සත්තෙහි ස්ත්‍රී ලිංග රූපය. 2. බාල ගැණු ළමයා

අඩු = 1. හීන පාඩු. 2. මඳ. 3. පුංචි. 4. කොට. 5. අසම්පූර්ණ. 6 සුළු. 7. පහත්. 8. අගයෙන් අඩු. 9. අඩිය. 10. මාත්‍රා භාජිය.

අඩු ආයුෂ = 1. බොහෝ කාලයක් ජීවත් නොවීම.

අඩුආලිස්සම් = 1. වෙනස්කම් කිරීම.

අඩුකරණීය = 1 අඩු කළ යුතු ගණන.

අඩුකාලය = 1. දිය නොපිරුණු කළය.

අඩුකිරීම = 1. ලොකු ගණනකින් කුඩා ගණනක් අස්කිරීම.

අඩුකුලය = 1. පහත් කුලය.

අඩුකුළුදුල = (අඩු කුළුදුල්ල) 1. පහ භාගය. 2. පලම.

අඩුක්කු මඩුව = 1. අළුත් සහලින් පිසූ බත් දෙවියන්ට පූජා කරන මඩුව. 2. දෙවියන්ට පුදන බත පිසන මඩුව.

අඩුක්කුව = 1. උසස් කෙනකුන්ට සුදුනම් කළ කෑම. 2. ගෙදරකින් ගෙදරකට කෑම වගයෙන් යවන කෑම. 3. උයා පිළියෙළ කළ කෑම. 4. දේවාලයට ගෙනයන ආහාර 5. පිදේනි සඳහා බෙදූ බත් ආදිය. 6. එක පිට එක තබා සැදූ ගොඩ. 7. ආහාර භාජන සහිත කද.

අඩුක්කු කරනවා = 1. එක පිට එක තබනවා. (අඩුක්කරනවා).

අඩුක්කු සජ්ජායම= 1. (රදල ආදී අය) ආහාර ගැනීම.

අඩුක්කොට්ටය = 1. (සුවක් ආදිය) කපා ඉතිරි වූ කැල්ල.

අඩු ජන්මය = 1. හීන ජන්මය. 2. පහත් උත්පත්තිය. 3. අඩු කුලය.

අඩුනුන් = අඩකින් අඩු නුණ. 2. දෙකනමාර.

අඩුක්කු = 1. ඇකුළුස්. 2. යටත්. 3. අනුකූල. 4. අහිත: 5. සුළුසු. 6. අනාගත. 7. මාකන දෙයක් කැබීමට ගන්නා කාරුව.

අඩුත්තු පණ්ණම් = 1. ආදර පඬුරු.

අඩුදඬු = 1 බාගයට තැම්බුණු. 2. අඩක් දැවුණු.

අඩු දෙදහස = 1. අඩකින් අඩු දෙදහස. 2. එක් දහස් පන් සියය.

අඩුනින්ද = 1. කොට නින්ද.

අඩු පා = (අඩු පාත්‍රය) 1. කොටසක් පිරුණු පාත්‍රය.

අඩු පාඩු = 1. හිඟ. 2. මදි.

අඩු බාගෙ = (අඩු බාගය) 1. අඩම පඩිකාසිය. 2. හීන කොට්ඨාසය.

අඩු බෙදීය = 1. දෙකින් කොටස.

අඩු මස්ස = මස්සකින් බාගයක් වටිනා කාසියක්

අඩු මාව = 1. මදි කොටස.

අඩු ළුහුඬු = 1. හිඟ. 2. මදිපාඩු. 3. අසම්පූර්ණ.

අඩුව = අඩු පාඩුව. 2. මදි කොටස. 3. හිඟය. 4. අඩු බව. 5. හානිය. 6. විපත.

අඩුවක් = 1. මදි පුංචි කමක්. 2. අවහම්බුවක්. 3. අඩු පාඩුවක්. 4. අලාභයක්. 5. හිඟයක්.

අඩුව කාපිනවා = 1. විනාශ වෙනවා.

අඩු වැඩි = 1. එකින් එකට සම නොවූ. 2. අසමාන. 3. නොයෙක් විදි ඇති.

අඩු වැඩිය = 1. (කුඩා මහත්) උපකරණ. 2 බඩු මුට්ටු. 3. මෙවලම්.

අඬ = 1. ශබ්දය. 2. කෑගැසීම. 3. අණ්ඩය. 4. ඝෝෂාව.

අඬ ගහනවා = 1. ආමන්ත්‍රණය කරනවා. 2. කැඳවනවා. 3. ශබ්ද පවත්වනවා. 4. ළඟට කථාකරනවා.

අඬ ගසාගෙන එනවා = 1. කැඳවාගෙන එනවා. 2 එක්කර ගෙන එනවා.

අඬ තලනවා = 1. මහත්සේ හඬනනවා. 2. හයියෙන් කෑගහනවා.

අඬ දබර = 1. කල - කෝලාහලය. 2. ඝෝෂා සහිත සංඩුව.

අඬ දෙඩු = 1. ඇඬීම හා දෙඩීම. 2. වැලපීම.

අඬනවා - 1. ශෝකයෙන් හෝ වේදනාවෙන් කෑගසනවා,

අඬ බෑ = 1. හම්මැට්ටමේ යහපත් ශබ්දය ඇති පළුව.

අඬ බෙරය= 1. අණ බෙරය. 2. බෙරගසා කරන නිවේදනය.

අඬ බෙර ගහනවා = 1. අණබෙර ගසනවා. 2. රටේ පතල කොට හරිනවා.

අඬ මුර = 1. විලාපකීම.

අඬ ලනවා = 1. කුකුළන් මෙන් නාද කරනවා.

අඬවනවා = 1. අඬන්නට සලස්වනවා.

අඬ සද්ද= 1. අඬ ගැසීමේ ශබ්දය. 2. හූ ශබ්දය.

අඬසන් = 1. හූ ශබ්දයක් ඇසෙන තරම් දුර.

අඬසුන්= 1. අණ්ඩච්ඡේද කල. 2. කප්පාදු කළ.

අඬ හෑර ලනවා = 1. තාලයට නාද කරනවා, 2. හරකුන් මෙහෙයීම සඳහා කරනු ලබන "ඒ හේ" යනාදි දික්වූ ශබ්දය 3. හරකුන් ගේ කරේ බැඳි මිණි ගෙඩි ආදියෙහි නාදය.

අඬහැරේ = 1. තාලයකට කරන මහ හඬ.

අඬනාකිරිසා = 1. එනම් ගස් වර්ගය. (වියලුණු කරල් සෙලවූ විට හඬ නගනා ගස් වර්ගයක්).

අඬාර = 1. ශබ්දය නගමින් ගලා බස්නා ඇළ. 2. කුඩා ළැහැබ.

අඬු = 1. (කකුළු ආදී සතුන් යමක් ඇල්ලීමට පාවිච්චි කරන) නාලය. 2. රත් වූ යකඩ ආදිය ඇල්ලීමට ගන්නා උපකරණය. 3. පාදය; කකුල. 4. පසු පය. 5. ශල්‍ය කර්ම ආදිය පිණිස ගන්නා අඬු.

අඬුදූ = 1. පක්ෂියා. (අණ්ඩජයා).

අඬුබඩි = 1. බොහෝ අඬු ඇති. 2. ඉස්සන් වර්ගයක්.

අඬු මිටිය = 1. එක් පැත්තක (ඇණ ඉගිල්ලීමට) අඬුවක් සහිත මිටිය.

අඬුරබා = 1. ඇඳුරු වියමනෙහි දී යොදන රටාවක්.

අඬෝර = 1. අඬහැරේ. 2. මහත් ශබ්දය.

අනා = (ඇනීමෙහි) 1. මිශ්‍ර කිරීමෙහි. 2. උදත් ඇනීමෙහි; ප්‍රීති වාක්‍ය පැවැත්වීමෙහි. 3. පහර දීමෙහි.

අනක්ෂ= 1. වැල්පෙනෙල. (එනම් පැළෑටි).

අනඛ්‍යාත = 1. නොකියන ලද. 2. නිර්වාණය.

අනක්ෂ = 1. ඇස් නැති. 2. අන්ධ.

අනක්ෂරය = කුණුහරුප කීම.

අනඞ්ග = 1. අනඞ්ගයා.

අනග = (අනඝ) 1. අනඝී. 2. වටිනාවූ. 3. කඳු නැති.

අනඝක = 1. නොපැමිණි.

අනාගමි = 1. අනාගාමි.

අනාගාරික = 1. ගෙදරක් නැති. 2. ගෙයක් නොහොත් බිරිඳක් නැති 3. ගිහි නුවූ.

අනඝ = 1. පිරිසුදු. 2. දුක් නැති. 3. නිර්දෝෂ වූ.

අනඞ්ගණ = 1. කෙලෙස් නැති.

අනංගය = 1. සිත. 2. අහස.

අනංගයා = 1. කාම දෙවියා. (දෙවියකු ලෙස මවා ගත් රාගය). 2. ශරීරයක් නැති.

අනඞ්ගධ්වජ = 1. අනඞ්ගයාගේ කොඩිය.

අනඞ්ග ප්‍රිය = 1. හෝපළු ගස.

අනඞ්ග රඞ්ග 1 අනඞ්ගයාගේ නාට්‍යය.

අනඞ්ග රස = 1. ශෘංගාර රසය. 2. කාම රසය.

අනඞ්ග ලේඛ = ආදර හසුන.

අනඞ්ගජිසු = (අනඞ්ගරුපු) 1. ඊශ්වරයා. (අනඞ්ගයාගේ සතුරා).

අනඞ්ග සැර = 1. අනඞ්ගයාගේ ඊ. (පස).

අනඞ්ගාමි = 1. අනාගාමි.

අනච්ඡ = 1. පැහැදිලි නැති.

අනඤ්ජය මාල = 1. පත්තිනි දේවියගේ මාලයක්.

අනජ්ජි = 1. අනාචාරය.

අනජ්ඣිට්ඨ = 1. ආරාධනා නොලැබූ.

අනඩු = 1. අයුතු. 2 අසාධාරණ. 3. බොරු.

අනත=1. නිමක් නැති. 2. නැමී නැති. 3 අනන්ත නම් නාගයා. 4. අසරණ. 5. ආත්මයක් නැති.

අනත්තකර = 1. අනර්ථකාරී.

අනත භාරද = 1. අනන්ත නම් නාග රාජයා.

අනතික්‍රම = 1. වැඩි නොවන.

අනති ක්‍රාන්ත=1. ඉක්ම නොගිය. 2. වැඩි නැති.

අනතිශයෝ = 1. ආනන්තරිය පාප කර්මය.

අනතිරික් = 1. ඉතිරි නොවූ.

අනතුර = 1. අනතරාය. 2. විපත්තිය.

අනතුරු = අතර නැති. 2. ඊළඟ.

අනතුරුව = 1. පසුව. 2. ඊළඟට.

අනත් = 1. අනන්ත. 2. අනාථ. 3. අර්ථ නැති. 4. අනාත්ම. 5. අනන්ත නම් නාගරාජයා. 6. විෂ්ණු. 7. නො නැමුණු.

අනත් ලකුණු = 1. අනාත්ම ලක්ෂණ.

අනඳ = 1. ආනඳ නම් මත්ස්‍යයා. 2. අනඳ මහ රහතන් වහන්සේ. 3. සතුට. 4. නාද නැති. 5. දෙමට නම් ගස් වර්ගය.

අනාදර= 1. නොසැලකිල්ල. 2. අනාදරය. (ආදරය නැති බව). 3. අනතරාය සහිත. 4. සතුරු.

අනාදුරු = 1. අනාදරය.

අනාද්‍යතන = 1. අද දවසෙහි නුවූ.

අනධිවර = 1. බුදුන් වහන්සේ.

අනධ්‍යාසිත= 1. නුගත්; ඉගෙනීමක් නොලැබූ.

අනධීන = 1. යටහත් නැති.

අනන=1. මුහුණ. 2. මිශ්‍ර කරන. (කලවම් කරන).

අනන්ත = 1. කෙළවරක් නැති. 2. එනම් නාග රාජයා. 3. ඉතා බොහෝ.

අනන්ත ජින = 1. බුදුන් වහන්සේ. 2. අන්තය දිනූ.

අනන්ත බුද්ධි = 1. අනන්ත වූ ප්‍රඥාව ඇති බුදුන් වහන්සේ.

අනන්තර = 1. අතරක් නැති. 2. ඉතා ළංවූ. 3. තොර නැති. 4. ඒ එක්කම පවත්නා.

අනන්තාපර්‍යන්ත= 1. ඉමක් කොණක් නැති. 2. කෙළවරක් – ප්‍රමාණයක් නැති.

අනන්තාපරිමාණ = 1. සීමාවක් – ප්‍රමාණයක් කළ නොහැකි.

අනන්තරෝක්ත = ඊළඟට කියන ලද.

අනන්තර්ගත = 1. ඇතුළත් නැති. 2. අඩංගු නුවූ.

අනන්තශීර්ෂ = 1. බොහෝ හිස් ඇත්තී. 2. වාසුකී නම් නා රජුගේ බිසොව.

අනන් මනන් = 1. ඕපාදූප. 2. පිළිවෙළක් නැතිව කියන ඒක - මේක. 3. නන් දෙඩුම්. 4. වාචාල වචන.

අනන්‍ය = 1. අන්‍ය නොවූ. 2. එකම වූ.

අනන්වේෂිත = 1. සොයා නොබලන ලද.

අනන්ත්‍ය = 1. අන්තයක් (කෙළවරක්) නැති.

අනනුකූල = 1. අනුකූල නුවූ. 2. නුසුදුසු.

අනනුමිතිය = 1. එකඟ නැති බව. 2. කියන ලද හේතුවෙන් නොවන බව.

අනනුෂම්ය = 1. තර්කානුකූල නුවූ.

අනනුශාසිනී = තර්කානුකූල නොවන.

අනනුයෝග = 1. ප්‍රශ්නය.

අනපත්‍ය = 1. දරුවකු නැති.

අනපන්සි = 1. ආනාපාන සමාධිය. (එනම් හාවහාව)

අනපරාධී = 1. අපරාධ නැති. 2. දොස් නැති.

අනපවිත්‍ර = 1. සිළිටු නැති.

අනපායී = 1. අත්නොහැර යන්නා.

අනපේක්ෂ = 1. අපේක්ෂාවක් (බලාපොරොත්තු-වක්) නැති.

අනභාව = 1. සම්පූර්ණ අභාවය.

අනභ්‍යන්තර = 1. ඇතුළත නොවූ. 2. පිටත. 3. බාහිර.

අනභ්‍යස්ත = 1. පුහුණු නොකරනලද

අනභ්‍යාස = 1. පුරුද්ද නැති. 2. භාවිතය නො කළ.

අනභී = 1. නැති.

අනභිකාමික = 1. ආශා නැති. 2. අකැමැති.

අනභිඥ = 1. අඥාන. 2. සම නුවූ.

අනභිධ්‍යාව = 1. තණ්හාව නැතිකම.

අනභිනන්ද = 1. සතුටු නැති.

අනභිභවනීය = 1. යටත්කළ නොහැකි. 2. පැරදවිය නොහැකි.

අනභිභූත = 1. පරාද නුවූ. 2. යටත්කළ නොහැකි.

අනභිමත = 1. කැමැති නැති.

අනභිමුඛ = (අභිමුඛයෙහි නුවූ) ඉදිරිපිට නැති.

අනභිරත = 1. නො ඇලුණු.

අනභිරති = 1. නො ඇලීම.

අනභිවෘද්ධිය = 1. දියුණුවක් නොවීම. 2. පිරිහීම.

අනභිව්‍යක්ත = 1. ප්‍රසිද්ධ නුවූ. 2. පැහැදිලි නැති.

අනභිෂික්ත = 1. අභිෂේක නොලත්.

අනභිසම්බන්ධ = 1. වෙන්වූ. 2. සම්බන්ධ නුවූ.

අනමතග්ග = (අනමතාග්‍ර) 1. අගක් මුලක් නැති.

අනම්ම = 1. පැණි දෙඩම්.

අනය = 1. නීතියක් නැති.

අනය = 1. හානිය.

අනයව්‍යසන = 1. හානි හා විපත්ති.

අනසීති = (අන් + අසීති) 1. අනූන් අයිති.

අනර්ගල = 1 අගුල් නොදමූ. 2. වළක්වා නැති. 3. නිකුවක්කාර.

අනර්ඝ = 1. වටිනා. 2. අගය ඇති.

අනර්ථ = 1. අවැඩ. 2. තේරුමක් නැති. 3. අනතුරු සහිත. 4. හිස්.

අනරිය = 1 ලාමක. 2. පහත්. 3. අනාර්ය.

අනරුත් = 1. තේරුමක් නැති. 2. විනාශය. 3. පලක් නැති.

අනල = 1. ගින්න. 2. ජඨරාග්නිය. 3. පිත. 4. ගිනි දෙවියා. 5. කැති නැකත. 6. වාතය. 7. රත්නිටුල්.

අනලස් = 1. කඩිසර. 2. අලස නැති.

අනල්ප = 1. අල්ප නොවන. 2. බොහෝ වූ.

අනවකාශ = 1. අවකාශ නැති. 2. විවේක නැති.

අනවතග්ග = 1. නිමක් නැති.

අනවතප්ත = 1. උණුසුම් නුවූ. (සිසිල්). 2. හිමාලය පර්වතයෙහි පිහිටි විලක්.

අනවද්‍ය = 1. වරද නැති. 2. දොස් නැති.

අනවද්‍ය ධර්ම = 1. කුසල ධර්ම.

අනවධානතාව = 1. හිත යොමු නොකිරීම.

අනවබෝධය = 1. වැරදීම.

අනාවරණ = 1. අනාවරණය. 2. මුවාවක් නැති. 3. ආවරණයක් නැති. 4. අමුත්තා.

අනවරත = 1. නිරන්තරවූ. 2. නිතර. 3. නො නවතින.

අනවරාග්‍ර = 1. අග මුල නැති.

අනවලෝකනය = 1 නොදැනීම. 2 නොදැකීම.

අනවශේෂ = 1. ඉතිරි නොවූ. 2. සියලු.

අනවසර = 1. ඉඩ නැති. 2. අවකාශ නැති.

අනවස්ථිත = 1. ස්ථිරව නොපිහිටි. 2. චපල 3. චඤ්චල වන.

අනාවිත = 1. මන්ත්‍ර බලයෙන් කරන උපද්‍රව.

අනශන = 1. නො කෑම. 2. ආහාර නොගැනීම.

අනශ්‍රා = 1. වැද්ද 2. දුක්ඛෙන් විඳින්නා.

අනත් = 1. අනාත්ම. 2. ආත්මයක් නැති.

අනහංකාර = 1. උඩඟු නොවූ.

අන් = 1. අන්‍ය. 2. වෙනත්. 3. අනුන්ගට අයිති 4. බත. 5. අන්ත.

අන් අරුත් සමස් = 1. අන්‍යාර්ථ සමාසය. (සමාස වන වචනවලට වෙනස්වූ අර්ථයක් ගෙන දෙන සමාස).

අන්අලප= (අන්‍යාලාප)1. උපමා අලංකාරයක්.

අන්කරු = 1. අන්‍යකාරක. (ව්‍යාකරණයෙහි ප්‍රථම පුරුෂ).

අන්කෙල් = 1. වැල් අගුත.

අන්කොන්සානවා = 1. මෙතස්කම් කරනවා. 2. කෙනහිලි කරනවා.

අන්ජලාබා = (අන්ජිලාවා) 1. මත්ස්‍ය වර්ගයක්. (තෝර පැටියා).

අන්ත = 1. කෙළවර. 2. බඩවැල. 3. සමීපය. 4. අන්තිම.

අන්තසි = 1. පහලසි.

අන්තඃ = 1. ඇතුළු.

අන්තඃ කර්ණ = 1. ඇතුළු කන.

අන්තඃ කර්ණ නාලය= 1. කනේ මැද නළය.

අන්තඃ කල්පය = 1. අතුරු කල්ප. (බෞද්ධ ග්‍රන්ථයන්හි සඳහන් ඉතා දීර්ඝ කාලයක්).

අන්තඃ කුටිය = 1. ඇතුළු කාමරය.

අන්තඃ කුටිල = 1. ඇතුළතින් වක්වූ. 2. හක්ගෙඩිය.

අන්තඃ පථය = 1. ඇතුළු මඟ.

අන්තඃ පාතී =1. අඩංගුවන 2. ඇතුළට වැටෙන.

අන්තඃපාර්ශ්වය = 1. ඇතුළු පැත්ත.

අන්තඃ පුරය = 1 රජුගේ බිසෝවරුන් වසන ඇතුළු මාළිගාව. 2. නගරය ඇතුළ.

අන්තක = 1. යමයා. 2. මරුවා.

අන්තකර = 1. අවසන් කරන්නා.

අන්තගත = 1. අවසානයට ගිය. 2. නිවණට පැමිණි.

අන්තර ගණ්ඩිකාබාධ = බඩවැල් ගැටයේ රෝගය 2. බඩවැල ගැට ගැසීමෙන් සෑදෙන රෝගයක්.

අන්ත ගුණ = 1. අතුණුබහන්. (බඩවැල්) 2. කුඩා බඩවැල.

අන්තග්‍රාහි = 1. අන්තය ගන්නා.

අන්ත චේතනා = 1. යම්කිසි වැඩක් අවසන් කිරීමෙහිදී ඇතිවන චේතනාව.

අන්ත ද්වය = 1 දෙ කෙළවර. 2. කාමසුඛල්ලිකානු යෝගය හා අත්තකිලමථානු යෝගය යන දෙක 3. ශාශ්වත-උච්ඡේද දෘෂ්ටි දෙක.

අන්තජ = 1. අන්තිමට උපන්.

අන්ත පරාජය= ඉතා පහත් ලෙස පැරදීම.

අන්තර = 1. අතරතුරෙහි වූ 2. ඇතුළත්වූ. 3. මැද. 4. අන්‍ය. 5. වෙනස. 6. සිදුර. 7. දුර ප්‍රමාණය.

අන්තරාංශ = (අන්තර + අංශ) 1. පිටෙහි අංශ දෙක මැද. 2. පිටිකොන්ද.

අන්තර් ඝර = 1. ඇතුල් ගෙය. 2. ඇතුල් ගම.

අන්තරට්ඨක = 1. අතරෙහි පිහිටි. 2. නවන්-මැදින් දෙ මස අතරෙහි වූ අට දවස.

අන්තරද්වීප =1. ගං මෝයෙහි වූ දූපත.

අන්තර ධාන = 1. නොපෙනී යාම. 2. අතුරු-දන්වීම.

අන්තර භෞගික රාජ = 1. රාජ්‍යයක් තුළ පිහිටි නින්දගම් හිමි අධිපතියෙක්.

අන්තර මාර්ග = අතර මඟ.

අන්තරයෙහි = 1. ඇතුළෙහි. 2. අතරෙහි.

අන්තරව = 1. අනතුරුව. 2. අතර කාලයෙහි.

අන්තර වාසකය = 1. අඳනා සිවුරු.

අන්තර වීථි = 1. අතුරු වේ. (පටු පාරවල්).

අන්තර සාටක = 1. අඳින වස්ත්‍රය.

අන්ත රන්තර = 1. අතරතුර.

අන්තරස්ථ = 1. ඇතුළේ පිහිටි. 2. ඇතුළතවූ.

අන්තර ස්ථානය = 1. අතරතුර පිහිටි ඉඩම.

අන්තර් = 1. ඇතුළු. 2. මධ්‍යය.

අන්තර් ගත=1. අතුළත්. 2. අඩංගු. 3. සැඟෙන.

අන්තර ගම්‍ය = 1. අතුළු විය හැකි.

අන්තර් ගෘහය =1. ඇතුළුගෙය. (කාමරය).

අන්තර් ජ්වර =1. ඇතුළෙහි අවුල්.

අන්තර් ජාත = 1. ඇතුළෙහි උපන්. 2. ගෙයි උපන්.

අන්තර් දශා = 1. අතුරු දසා. (මහා දශාවක් බෙදූ කුඩා කොටස්).

අන්තර් ධාන = 1. නොපෙණීයාම.

අන්තර් නිමිත්ත = අභ්‍යන්තර නිමිත්ත.

අන්තර් භෞම = 1. පොළොව තුළ වූ.

අන්තර් භෞමාගාරය = 1. උමඟ.

අන්තර් වාක්‍ය = 1. මහා වාක්‍යයක් මැද වූ කුඩා වාක්‍ය.

අන්තර් වාණී = 1. බොහෝ ශාස්ත්‍ර දත් තැනැත්තා.

අන්තර් හිත = (අන්තර හිත) 1. අතුරුදන් වූ. 2. නොපෙණී ගිය.

අන්තරා = 1. උපද්‍රවය. 2. අතරෙහි. 3. මැද. 4. සමීපය.

අන්තරා පණ = 1. වෙළෙඳුම් පොළ.

අන්තරාංශය = 1. ඇතුළු පැත්ත.

අන්තරාය= (අන්තරාව) 1. අන්තිමය. 2. විපත. 3. අනතුර.

අන්තරායකර = 1. බාධාකරන. 2. අනතුරු පමුණුවන.

අන්තරාලය = 1. අතර තුර ඉඩ. 2. අතර තුර කාලය. 3. මධ්‍යය.

අන්තරාවනත =(අන්තර් + අවනත) 1. ඇතුළට නැමුණු.

අන්තරාවරණය = (අන්තර් + ආවරණය) 1. ගෙඩියක ඇතුළු කටුව.

අන්තරික = 1 අතර ඇති.

අන්තරිකා = 1. දෙකක් මැද අතර.

අන්ත රික්ෂය = 1. අහස.

අන්තරීක්ෂණය=1. තමන්ගේම සිත තුළ බැලීම.

අන්තරිත = 1. මුවහකළ 2. අතර ඇතිකළ.

අන්තරීප = 1. දිවයින.

අන්තරීය = 1. යට ඇඳුමක්. 2. යටට අඳින රෙද්ද.

අන්තලික්ඛ = 1. අහස.

අන්ත ශය්‍යාව = 1 මරණය. 2. සොහොන.

අන්තඃසාර = 1. පක්ෂපාතවූ. 2. ඇතුළත හැසිරෙන.

අන්තඃසාර පුරුෂ = 1. චර පුරුෂයා.

අන්ත ස්ථාක්ෂර = 1. යරලව යන අකුරු සතර.

අන්තාක්ෂර ලෝපය = 1. අන්තිම අකුරු ලොප් කිරීම.

අන්තානන්තික = 1. අවසාන හා අවසන් නොවූ.

අන්තානන්තවාද = 1. අන්තයක් ඇත්තේය නොහොත් අන්තයක් නැත්තේය යන ශාශ්වත වාදය.

අන්තාවසරය = 1. අන්තිම අවසරය.

අන්තික=1. සමීපයෙහි සිටින්නා. 2. අන්තයෙහි සිටින්නා.

අන්තිම = 1. කෙළවරෙහිවූ. 2. අවසන්හි වූ.

අන්තිම කැමැති පත්‍රය = 1. තමාගේ ඇවෑමෙන් මේ .මේ දේ මෙනම් තැනැත්තන්ට අයිතිවිය යුතුයයි ලියන ලියවිල්ල.

අන්තිමය = 1. අවසානය.

අන්තේවාසික = 1. අතවැසියා. 2. ශිෂ්‍යයා.

අන්තෝ ගාම = 1. ගමේ ඇතුළ.

අන්තෝ ඝර = 1. ගෙයි ඇතුළ.

අන්තෝජන = 1. පවුලට අයත් පිරිස.

අන්තෝ ජාත = 1. ඇතුළත උපන්. 2 දාසයා.

අන්තෝවස්ස = 1. වස් කාලය.

අන්තෝපුර = 1. අග මෙහෙසුන් තුවූ රාජ ස්ත්‍රී සමූහයා. (අන්තඃපුරය).

අන්තෝ නගරය=1. ඇතුළු නුවර. 2. මාලිගාව.

අන්තෝපුරය = 1. අන්තඃපුරය 2. ස්ත්‍රීන්ගේ කාමර. (ඇතොර).

අන්තෝ මණ්ඩල = 1 දඹදිව මධ්‍ය මණ්ඩලය.

අන්තෝ සීමා= 1. ඇතුළු සීමාව. (සීමාව තුළවූ).

අන්ත්‍ය = 1. අන්තයෙහි. 2. අන්තිම 3. පහත්. 4. චණ්ඩාලයා. 5. හෝඩියේ අන්තිම අකුර 6. අන්තිමයා.

අන්ත්‍ය කර්ම = (අන්ත්‍ය කාර්‍ය - අන්ත්‍ය ක්‍රියා) 1. අන්තිම කාර්‍යය. (අවමඟල කටයුතු).

අන්ත්‍ය ජාති = 1. නිවන් දක්නා ජාතිය.

අන්ත්‍ය වර්ණ = 1. අවසාන අකුර. 2. අන්තිම කුලයට අයති අය. (ශුද්‍රයා).

අන්ත්‍යාවාරය = (අන්ත්‍ය + ආවාරය). අවසාන ගෘහ ප්‍රාචීකාව.

අන්ත්‍ර = 1. බඩවැල්.

අන්ත්‍ර කෘමිරෝග = 1. බඩ පණුවෝ.

අන්ත්‍ර ගුණ = 1. අතුණු බහන. (බඩවැල බැඳි සිවියක්).

අන්ත්‍ර ජ්වර = 1. උණ සන්නිපාතය.

අන්ත්‍ර දාහය = 1. බඩ වැලේ දැවිල්ල.

අන්ත්‍ර පටල = 1. උදරය. (බඩ).

අන්ත්‍ර බන්ධන = 1. අතුණු බහන.

අන්ත්‍රරෝග = 1. බඩවැලේ ලෙඩ.

අන්ත්‍ර වෘද්ධි = (අන්ත්‍ර ව්‍යාධි) 1. බඩවැලේ ලෙඩ.

අන්ත්‍ර විද්‍යාව = 1. බඩවැල් පිළිබඳ විද්‍යාව.

අන්ත්‍රබාධය = 1. එකම රෝගය. (බඩවැල පහත් වීම).

අන්ත්‍රාවරණය = 1. බඩවැල වැසී පිහිටි සිවිය.

අන්දකාසිජ්ජ කැඩීම = 1. මොළේ අවුල්වීම. (පිස්සු වැඩ කිරීම).

අන්ධකාරය = 1. අඳුර.

අන්දතික ශක්ති = 1. වැහි අඳුරු සවභාවය.

අන්දමන්ද = 1. අඥ බාල. 2. ඉතා මෝඩ.

අන්දම = 1. හැඩහුරුකම. 2. විදිය. 3. තත්වය. 4. ලීලා විලාශ. (ඉසකේ පිරිමි රැවුල් කැපීම ආදිය).

අන්දර = 1. ගස් වර්ගයක්. 2. කතන්දර.

අන්දරස්තාන ධුනා = 1. මුලාවුනා. 2. විනාශ වුනා.

අන්දර දෙමළ = (අණ්ඩර දෙමළ) 1. පැටලිලි සහිත කථා.

අන්දුගම් = 1. ආරක්ෂා කඳවුර. (යුද සෙනඟ සවිහිත තැන). 2. සමූහය.

අන්දුගම් බදිනවා = 1. කඳවුරු බදිනවා.

අන්දිමු= 1. වැරදි මත ඇති. (අන්‍ය ආගම්කාර).

අන්දිමුවා = 1. අන්‍ය ආගම්කාරයා. 2. මිථ්‍යා-දෘෂ්ටිකයා.

අන්දිරම්මාරු = 1. ස්ථාන හෝ කොන් මාරු-වීම. 2. ගස් දෙකක් ඇඳී අතුරු රැක.

අන්දු = 1. මාංචු. 2. පයෙහි පලඳින තුඩවැලා. 3. ඇතුන්ගේ පය බදින දම්වැල.

අන්දු ඔසබනය = 1. මාංචුව. (විලංගුව). 2. දඬු කඳෙහි ලීම.

අන්දුන = (අන්දුව). 1. විලංගුව. 2. පාවළල්ල.

අන්දුඝර = 1. සිරගෙය.

අන්දුන්තන්දුන් වුනා = 1. පැටලුනා. 2. කල-බල සහිත වුනා.

අන්දුරු = 1. අඳුරු.

අන්දෝරු = 1. ඓලා විශේෂයක්.

අන්දෝරු සකි = 1. ඓලාව උපුලස්නන්ගේ ප්‍රධානයා.

අන්දේසක්කාර = 1. විදේශිකා. (පිට රටකට අයත්).

අන්ධ = 1. දෑසම නොපෙනෙන. 2. අඳුන 3. නොදක්නා.

අන්ධක = 1. ආන්ධ්‍ර දෙශය. 2. එනම් අසුරයා. 3. පුරාණයේ පැවති බෞද්ධනිකායයක්. 4. අඳුර.

අන්ධක රිපු = 1. අන්ධකාරයේ සතුරා. 2. ඉර. 3. හඳ. 4. ගිනි. 5. සිවදෙවියා.

අන්ධකාර = 1. අඳුර. 2. කළුවර. 3. කළු පාට. 4. නොපෙනීම.

අන්ධකාර වෙනවා = 1. කළුවර වැටෙනවා. 2. ඇඳිරි වෙනවා.

අන්ධ ගෘහ = 1. අඳුරු ගැබ. 2. කළුවර කාමරය.

අන්ධගජ න්‍යාය = 1. ඇතකුගේ සොඬ - පා - පිට ආදි ඒ ඒ අවයවයන් අත ගෑ අන්ධයන් ඇතා කෙසෙල් බඩයක් වැනිය, වංගෙඩියක් වැනිය, බිත්තියක් වැනිය යනාදීන් වරදවා තේරුම් ගත් ක්‍රමය හෝ නිදර්ශනය.

අන්ධතමස = 1. දැඩි අඳුර.

අන්ධබාල = 1. අඥාන වූ.

අන්ධභූත = 1. නුවණැස් නැති. 2. අන්ධ වූ.

අන්ධ යෂ්ටිය = 1. කණවැල. 2. අන්ධයාගේ හැරමිටිය.

අන්ධ වන = 1. එනම් වනය.

අන්ධුව = 1. ළිඳ.

අන්න = 1. යමක් දැක්වීම පිණිස කියන වචනයක්. 2. ආහාරය. (බත).

අන්නපන්න = 1. උපකරණ. 2. මෙවලම්.

අන්නමය = 1. ආහාරයෙන් නිපන්. 2. කෑමෙන් සෑදූ. 3. ස්ථූල ශරීර ඇත්තා.

අන්නාක්කා = 1. අන්නාසි.

අන්නට = (අන් නට) 1. වෙන කෙනෙකුට.

අන්නනවා = 1. අතින්තට සලස්සනවා.

අන්න පාන = 1. කෑම් බීම්.

අන්න ප්‍රාශ = 1. කෑම බඳුන.

අන්නමඩය = (අත්තම්ලය) 1. අසිත ආයුධය.

අන්න රස = 1. ආහාරයෙහි රසය.

අන්නවා = (අනිනවා) 1. පහර දෙනවා. 2. ආයුධයකින් සිදුරු කරනවා.

අන්නාවියා = 1. ගුරුවරයා. 2. රෝමානු කතෝලික දෙවස්ථානයෙහි යාච්ඤා පොත කියවන්නා.

අන්නාශේෂ = 1. ඉතුරු කෑම.

අන්නාහාර = 1. කෑම හෝ තණ කොළ ගෙන යන්නා.

අන්නාවෙඩිය = 1. සුවඳැති ගස් වර්ගයක්.

අන්නාසි = 1. එනම් පලතුරු.

අන්නෑය = 1. අකඩුව. 2. නීතියට විරුද්ධ ක්‍රියාව. 3. අන්‍යායය. 4. අයුක්තිය.

අන්නී = 1. මව.

අන්බව් = 1. සෘද්ධිය. 2. අනුභාවය.

අන්‍ය = 1. අනෙක්. 2. වෙනත්. 3. වෙනස් වූ.

අන්‍ය අභිභා = 1. අනුන්ට අයත්.

අන්‍ය අර්ථ = 1. අනෙක් අර්ථය.

අන්‍ය කාර්‍යක = 1. අනෙක් කාර්‍ය කෙනෙකුත් ඇති.

අන්‍ය කාරක = (ව්‍යාකරණයෙහි) 1. ප්‍රථම පුරුෂ වූ.

අන්‍ය ගතික = 1. වෙනස් ගති ඇති.

අන්‍ය ගුණ ජනක = 1. වෙන ගුණ උපදවන.

අන්‍ය ජාතික = 1. වෙන ජාතියකට අයිති.

අන්‍ය ජාතිකයා = 1. විදේශිකයා.

අන්‍යතම = 1. බොහෝ දෙනෙකුන් අතරින් එක්කෙනෙක්. 2. වෙනයම්. 3. එක්තරා.

අන්‍යතර = 1. එක්තරා. 2. නාම ගොත්‍රාදීනෙන් අප්‍රකට (එකමත් එක).

අන්‍යථා = 1. අනෙක් ප්‍රකාරයකින්.

අන්‍යතීර්ථක = 1. අනෙක් තීර්ථ (ආගම්) වලට අයත්.

අන්‍යත්‍ර = 1. අන්තන්හි.

අන්‍යද්‍යු = 1. වෙන දවසක. 2. වෙන කාලයක.

අන්‍ය දෘෂ්ටික = 1. අනෙක් ආගමක් අදහන.

අන්‍ය පදාර්ථ සමාස = 1. අන් අරුත් සමස.

අන්‍ය පාක්ෂික = 1. අනෙක් පක්ෂයකට අයත්.

අන්‍යපුෂ්ට = (අන්‍ය භෘත) 1. පරපුටු. 2. අනුන් විසින් පෝෂණය කළ.

අන්‍ය භාවය = 1. වෙනත් තත්වය. 2. වෙනත් ජීවිතය.

අන්‍ය මනස්ක = (අන්‍ය මනස්ක) 1. වෙන හිත් ඇති.

අන්‍ය ලබ්ධික = 1. වෙන ආගමකට අයිති.

අන්‍ය වර්ග කරනවා = 1. (ගණිතයේ) අන්‍ය වර්ග කිරීම. (වෙන වර්ගයකට යොදනවා).

අන්‍ය වර්තිත = 1. අනුන් විසින් ඇති කළ

අන්‍ය වාදී = 1. අන් පරිද්දෙකින් කියන.

අන්‍ය විත්ත = 1. සිත එකඟ කොට නැති. 2. අනෙක් කරුණක නැඹුරු සිත් ඇති.

අන්‍ය ශාස්තෘ = 1 අන්‍ය ධර්ම දේශනා කළ ආගම් කතෘවරයෝ.

අන්‍ය සාධාරණ = 1. අන්‍යයන්ට සාධාරණ වූ. (පොදු).

අන්‍ය සාමාන්‍ය = 1. වෙනත් අය හා සමාන බව.

අන්‍යාකාර කිරීම = 1. යමක් පවතින ආකාරය වෙනස් කිරීම.

අන්‍යාදෘශ = 1. අන්‍ය වර්ගයක.

අන්‍යාධීන = 1. අනුන් හට යටත් වූ.

අන්‍යාධීන භාව = 1. යටත් බව.

අන්‍යාධීනයා = 1. දාසයා. (යටත් වූ අය).

අන්‍යාය = 1. අයුක්තිය. 2. වැරැද්ද. 3. නුසුදුසු කම.

අන්‍යූන = 1. අනූන. 2. අඩු නැති. 3. සම්පූර්ණ.

අන්‍යෝදක = (අන්‍ය + උදක) 1 දූමස් සතා.

අන්‍යෝන්‍ය = 1. ඔවුනොවුන් සම්බන්ධ වූ. (එක් එක්).

අන්‍යෝන්‍යයෙන් = 1. ඔවුනොවුන්.

අන්‍යෝන්‍ය වශයෙන් = 1. කෙනකු තවත් කෙනකුට.

අන්‍යෝන්‍යාශ්‍රය = (අන්‍යෝන්‍ය + ආශ්‍රය). 1. එකිනෙකා අතර ආශ්‍රය.

අන්වක්ෂ = 1. (අනු + අක්ෂ). 1. පැහැදිලි 2. ඉන්ද්‍රිය අනුවගිය. 3. හොඳින් පෙනියන. 4. ඇසට ලංවූ (ප්‍රත්‍යක්ෂ).

අන්වක්ෂර = 1. එක් එක් අකුර.

අන්වර්ධමාස = 1. අඩමසක් පාසා. 2. එක් එක් අඩ මස.

අන්වධිපතියා = (අනු + අධිපතියා) 1. උප ආණ්ඩුකාරයා.

අන්වනවා = (අන්නවනවා) 1. සිදුරු කරනවා. 2. අනෙක් අන්නවනවා.

අන්වය = 1. වංශය. 2. අනුගමනය 3. පෙළපත 4. අනුපූර්ව ක්‍රමය. 5. (වචන අර්ථ ආදීන්ගේ) අන්‍යෝන්‍ය සම්බන්ධය.

අන්වය ආගත වහල් = 1 පරපුරෙන් ආ වාලා. (නිවසෙහි වෙසෙන දාස්යාගේ කුස උපන් දාසයා).

අන්වයවේදයා = 1. පෙළපත් වල ඉතිහාසය ගැන හොඳ දැනුමක් ඇත්තා

අන්වයාකාර = 1. වංශාකාර.

අන්වර්ථ = (අනු + අර්ථ) අර්ථයට එකඟ.

අන්වවාය = 1. වංශය.

අන්විත = (අනු + ඉත). 1. යුක්තවූ 2. ඇත්තාවූ.

අන්වීක්ෂක = 1. පරීක්ෂා කරන.

අන්වීක්ෂණ = 1. පරීක්ෂාව.

අන්වේෂණය = 1. සෙවීම.

අන්වේෂය = 1 වෙන ආකාරයකින් පෙනී සිටීම.

අන්වේෂිත = සොයන ලද.

අන්සතු = (අන් සන්තක) 1. අනුන්ට අයිති.

අන්සතුකරනවා = 1. අනුන්ට අයිති කොට දෙනවා.

අන්සතුවෙනවා = 1. අනුන්ට අයිතිවෙනවා.

අන්සල් = 1. කොංසෙල්වෙන.

අන්සිනයා = (අන්ස + හිනයා) 1. අබ්බාගාතයා. (කොරා).

අනා = 1. අනාගත. 2 නොපැමිණි. 3. මතු.

අනාඅරුත් = 1. අනාගත අර්ථ.

අනාකල් = 1. අනාගත කාලය.

අනාකර්ෂක = 1. නොඅදින. (ඇදීම නොකරන).

අනාකාර = 1. උත්පත්ති ස්ථාන නොවූ.

අනාකීර්ණ = (අන් + අනකීර්ණ). ගහණ නොවූ. (යහමින් නැති)

අනාකුල = (අන් + අනකුල) 1. වියවුල් නැති. 2. වරද.

අනාකුලකරනවා = 1. වියවුල් නැති කරනවා.

අනාකුලක්වුනා = 1. බලාපොරොත්තු රහිත විපතක් වුනා.

අනාගත = (අන් + ආගත) 1. නොපැමිණි. 2. මතු කාලය.

අනාගතිය = 1. ඉදිරිපිට නැතිබව.

අනාගත අපේක්ෂා = 1. මතු බලාපොරොත්තු.

අනාගත ආක්ෂේප = 1. අනාගතයෙහි විය හැකි දෙය ඊට කලින්ම වැලැක්වීම නමැති අලඞ්කාරය.

අනාගත ඥාන = 1. මතු කාලයෙහි සිදුවන දේ කලින් දැනගන්නා අභිඥා ඥානය.

අනාගත වංශ දේශනා = 1. මතු පහළවන බුදුවරයන් පිළිබඳ විස්තර කරන දේශනාව.

අනාගතවක්තා = 1. මතු සිඬවන දේ කලින් පවසන්නා.

අනාගත ව්‍යාඛ්‍යාය = 1. අනාවැකිය (වෙන්නට තිබෙන දේ කීම).

අනාගතාත්නිතවය = 1. මතු පවතින ආත්මය.

අනාගම්‍ය = 1. ලං විය නොහැකි. 2. පත් විය නොහැකි.

අනාගාමි = 1. නොඑන සුලු. 2. මරණින් පසු කාම භවයට උත්පත්ති වශයෙන් නොඑන. 3. තුන්වැනි මාර්ගයට පැමිණි ආර්ය පුද්ගලයා.

අනාගාර = 1. තවුස් බව. 2. පැවිදි බව. 3. ගෙය හෝ පවුල නැති.

අනාගාරික = 1. පැවිදි (ගෙයක් නැති).

අනාචාර = 1. නරක ගතිපැවතුම් ඇති. 2. අයහපත් හැසිරීම. 3. කාමමිථ්‍යාචාරය.

අනාචාරශීලී = 1. අනාචාරයෙහි හැසිරෙන.

අනාචාරී = (අනාචරියා) 1. ගුරුවරයකු නැති. (අනාචාර්‍ය)

අනාතුර = 1. අනතුර නොවූ. 2. ලෙඩ නැති.

අනාත්ම = 1. ආත්මයක් නැති. 2. ආත්මය නොවන.

අනාත්ම දෘෂ්ටිය = 1. ආත්මයක් නැතැයි යන වැටහීම හෝ දර්ශනය.

අනාත්මලක්ෂණ = 1. (සංසකාරයන්හි) ආත්මයක් නැතැයි යන ලකුණ.

අනාත්මවාද = 1. ආත්මයක් නැතැයි යන වාදය.

අනාත්මාර්ථ = 1. ආත්මාර්ථය නොසලකන. 2. තමාගේ ප්‍රයෝජනය ගැන නොතකන.

අනාත්මනීය = 1. තමාගේම ප්‍රයෝජනය නොසලකන.

අනාත්මානුදෘෂ්ටිය = (අනාත්ම අනුදර්ශනය) 1. ලෝකයෙහි සංස්කාරයන් මිස ආත්මයක් නැතැයි විශ්වාසය.

අනාත්මික = 1. ආත්මික නොවන.

අනාථ = 1. අසරණ. 2. පිහිටක් නැති.

අනාථයා = 1. අසරණයා. 2. පිහිටක් නැත්තා.

අනාථනාථ = 1. අනාථයන්ට පිහිට වන.

අනාථ පිණ්ඩික = 1 බුඞ කාලයෙහි විසූ එනම් මහසිටුවරයා. 2. අනාථයන් හට දන්දෙන.

අනාථශාලා = 1 අනාථ නිවාසය. (දිළිඳු මඩම).

අනාදරය = 1. ආදරය නැති බව. 2. නොසැලකීම.

අනාදවස් = නොපැමිණි දිනය.

අනාදානය = 1. නොපිළි ගැනීම.

අනාදි = 1. ආදියක් හෝ පටන් ගැන්මක් නැති.

අනාදිමත් කාලයක් = 1. ඉතා දීර්ඝ කාලයක්.

අනාදිය = 1. සදාකාලික භාවයෙන් ඇත්වූ.

අනාදිනව = 1. වරදක් නැති.

අනාදෘශ = 1. ආදෘශයක් නැති. (ගුරුකමක් නැති).

අනාදේශ = 1. නොපිළිගත යුතු.

අනාදේශා = 1. ව්‍යාකරණයෙහි ආදේශ (මාරු කල) නොහැකි.

අනාඥාත = 1. සදාකාලික.

අනාධාර = 1. පිහිට නැති (උපකාර නැති).

අනාධෘෂ්‍ය = 1. පැරදවිය නොහැකි.

අනාධ්‍යාත්මික = 1. ආධ්‍යාත්මික නොවූ. 2. බාහිර.

අනාපත්තික = 1. නොඇවැත්. 2. නිදොස්.

අනාපාන්සති = 1. ආනාපාන සමාධිය (ආශ්වාසය ප්‍රශ්වාසය මුල් කොටගත් භාවනාව).

අනාප්ත = 1. නොලැබූ.

අනාභව = 1. අනාගතභාවය. 2. අනාගත ජාතිය.

අනාභෝග = 1. කල්පනා නොකිරීම. 2. නොසිතීම; අධිෂ්ඨාන නොකිරීම.

අනාමක = 1. නමක් නැති.

අනාමය = 1. සනීපය. 2. නීරෝගී බව.

අනාමාස = 1. ස්පර්ශ නොකටයුතු.

අනාමිකා = 1. වෙදැඟිල්ල (සුළැඟිල්ල ළඟ ඇඟිල්ල). 2. මුදු ඇඟිල්ල.

අනායත්ත = 1. යටත් නැති. 2. දමනය නොවූ.

අනායතන = අස්ථානය.

අනායාස = 1. ආයාසයක් (මහන්සියක්) නැති. 2. පහසු.

අනාර්‍ය = 1. ආර්‍ය නොවූ. 2. පෘථග්ජන. 3. උතුම් නුවූ.

අනාරක්ඛිත = 1. ආරක්ෂා නැති.

අනාරත = 1. නො ඇලුණු.

අනාරම්භ = 1. පටන්ගැන්මක් නැති.

අනාරාධක = 1. අදක්ෂ. 2. අනුන්ගේ සිත් නොගත්.

අනාරාධිත - 1. නොකැඳවනලද.

අනාරෝග්‍ය = 1. රෝගී වූ.

අනාලම්බ = 1. පිහිට නැති. 2. එල්ලීමක් නැති.

අනාලය = 1. තෘෂ්ණා නැති බව. 2. නිවණ. 3 ඇල්ම නැති. 4. ගෙයක් නැති.

අනාවට = 1. විවෘත. 2. නොවසනලද.

අනාවටද්වාර = 1. නොවැසූ දොර ඇති. 2. ඇති දේ නැත නොකියා දෙන.

අනාවත්ති = 1. නොපෙරළෙන. 2. නැවී නො එන.

අනාවරණ = 1. වැස්මක් නැති. 2. බාධා නැති.

අනාවරණය = 1 එළි කිරීම. ?. වැසුම් ඉවත් කිරීම. 3. ප්‍රකාශයට පැමිණවීම.

අනාවරණ ඥානය = 1. බුදුන් වහන්සේට පමණක් ඇති උතුම් නුවණ. 2. සියල්ලෙහි ආවරණයක් නැතිව නොපැකිල පවත්නා නුවණ.

අනාවැකිය = 1. අනාගත වාක්‍යය.

අනාවිල = 1. නොකැළඹුණු. 2. කිලුටු නැති. 3. පැහැදිලි.

අනාවෘත = 1. වැස්මක් නැති.

අනාවෘත්ත = 1. වට නොකළා වූ.

අනාශ්‍රව = 1. ආශ්‍රව නැති. 2. රහතන් වහන්සේ.

අනාශ්‍ය = 1. විනාශ නොවන.

අනාශ්‍රිත = 1. වෙන්වූ. 2. යටත් නොවූ. 3. පිහිටක් නැති.

අනාශ්‍රව = 1. ආශ්‍රව නැති. 2. නිවණ.

අනාහත = 1. අන්තරාය නැති. 2. නොනසනලද.

අනාළ්හික = 1. දිළිඳු. 2. සහල් නැළියක්වත් නැති.

අනැගැමි = 1. අනාගාමි.

අනැගි = 1. අනඝ.

අනික = 1. අනෙක් එක.

අනිකක් = 1. වෙන එකක්.

අනික්කසාව = 1. කෙලෙස් කසටෙන් වෙන් නොවූ.

අනිකායික = 1. නිකාය භේදයෙන් තොරවූ.

අනිකිනිය = 1. අක්ෂෞහිණිය නම් යුධ හමුදා-වෙන් දහයෙන් පංගුව.

අනිකුත් = (අනිකුදු) 1. අනෙක් අයත්.

අනික් දා = 1. අනික් දවසෙහි (අනිද්දා). 2. දෙවැනි දින.

අනිකේතවාසී = 1. නිකේතවාසී නුවූ; ගෙයක විසීමක් නැති.

අනීඝ = 1. දුක් නැති. 2. නිවණ.

අනිච්ච = 1. නිත්‍ය නොවූ. 2. හැම කල්හි නොපවත්නා.

අනිච්චවත් = (අනිච්චේ) 1. දුක ප්‍රකාශ කරනු වස් හදිසියෙන් කියන වචනයක්. 2. අහෝ.

අනිච්ඡා = 1. නොකැමැත්ත.

අනිඤ්ජන = 1. කම්පා නොවීම.

අනිඤ්ජිත = 1. චඤ්චල නොවූ.

අනිටු = 1. අවාසනාවන්ත. 2. නොකැමැතිවූ. 3 අයහපත්. 4. නරක. 5. අහිතට.

අනිට්ඨ = 1. ප්‍රිය නොවූ. 2. අප්‍රිය දේ.

අනිට්ඨිත = 1. නොනිමි.

අනිත් = 1. වෙනත්. 2. අනිත්‍ය.

අනිත් දා = (අනිද්දා) 1. හෙටින් පසු දවස. 2. අනික් දින. 3. දෙවැනි දින.

අනිත්‍ය = 1. නිත්‍ය නොවූ. 2. ස්ථිර නැති.

අනිත්‍යතාව = 1. හැම කල්හි නොපවත්නා බව. 2. ඇතිව නැතිවන ස්වභාව.

අනිද්‍ර = 1. නින්ද නැති.

අනිනවා = 1. (අතින්) ගහනවා. 2. (අනෙන්) අනිනවා. 3. (තුඩින්) විදිනවා. 4. (පිහියෙන්) අනිනවා.

අනින්දිත = 1. දොස් නැති. 2. නින්දා නොලැබූ.

අනින්දිය = 1. නින්දා නොකට යුතු.

අනින්ද්‍රිය = 1. (න + ඉන්ද්‍රිය) 1. ඉන්ද්‍රිය නැති (ගඳ-රස-හඬ-රූප ආදිය දැනගැනීමේ අවයව නැති).

අනිබද්ධ = 1. නිරන්තර නොවන. 2. එකට බැඳී නොපවතින.

අනිමිෂ = (අනිමේෂ) 1. ඇසි පිය නොහෙළන්නා. 2. දෙවියා. 3. අමනුෂ්‍යයා. 4. මත්ස්‍යයා.

අනිමිෂ සාදෘශ = 1. දිව්‍ය ව්‍යඤ්ජන; සුරතුර.

අනිමිස ලෝචන පූජා = 1. පිය හෙළුම් නැති ඇසින් බලාසිටීම නමැති පූජාව.

අනියත = 1. නියමිත නොවූ. 2. ඒකාන්ත නොවූ 3. අනිශ්චිත.

අනියත විවරණ = !. (කාලාදිය නොදක්වා "පෙරුම් පිරුවොත් බුදු වියහැක" යන්න වැනි) නියත නොවූ ප්‍රකාශය.

අනිරාකෘත = 1. දුරු නොකළ

අනියම් = 1. නියම නැති. 2. අනිශ්චිත කාරණය. 3. නුසුදුසු.

අනියම් මිනී මැරුම = 1. මරන්නට අදහස් නොකොට කරනලද ක්‍රියාවකින් සිදුවූ මිනිසකුගේ ජීවිත හානිය.

අනියම් ලෙස = 1. නියම නැති ලෙස. 2. බලාපොරොත්තු රහිත ලෙස.

අනියම් විදි = 1. ව්‍යාකරණ විධියක්. (විකල්ප විධිය).

අනියා = 1. අන්‍යායය. 2. අයුක්තිය.

අනියායෙන් = 1. වැරදි පිළිවෙළින්. 2. අයුක්තියෙන්.

අනියෝජ්‍ය = 1. අයෝග්‍ය. 2. පත් නොකළ යුතු.

අනිරුද්ධ = 1. නැති නොවන. 2. හිතුවක්කාර. 3. නොනවත්වන.

අනිර්මල = 1. දූෂ්‍ය. 2. නිර්මල නොවන. 3 කිලුටු.

අනිර්මිත = 1. මවා නැති. 2. සෑදූ නැති.

අනිල = 1. වාතය. 2. සා නැකැත. 3. සුළඟ.

අනිලයා = 1. වාතවලාහකයා. 2. සුළඟට අධිපති දෙවියා.

අනිල පථ = 1. ආකාශය.

අනිවර්තන = 1. නොනවතින.

අනිවර්තෝ = 1. නිකරුණේ. 2. නිවැරැද්දේ.

අනිවරණ = 1. නිවාරණයක් නැති. 2. කාමාදි නීවරණ නැති.

අනිවාර්‍ය = (අනිවාර්‍යයි). 1. වැළැක් විය නොහැකි.

අනිවාරිත = 1. වළක්වා නැති.

අනිශ්චය = 1. නියම තීරණයක් නැති බව. 2. අනුමානය.

අනිෂ්ට = (න + ඉෂ්ට). 1. නපුරු. 2. අශුභ. 3. අයහපත්. 4. ඉෂ්ට නුවූ. 5. කැමැති නුවූ. 6. අනිටු.

අනිෂ්ට ඵල = 1. අයහපත් විපාක 2. දඬුවම්.

අනිස = 1. අනිත්‍ය. 2. ඇතිව නැතිවන ගති ඇති.

අනිසි = 1. සුදුසු නොවූ. 2. යෝග්‍ය නොවන.

අනිස්බිජ්ජු = 1. ඔලි යාගයක් සිඳී කියන පද්‍ය විශෙෂයක්.

අනිස්ථිර = 1. ස්ථිර නැති.

අනිහතමාන = (අනිහතමානී). 1. අහංකාර. 2. යටත් - පහත් නොවන.

අනීකය = 1. යුධය 2. යුධ සේනාව. 3. ගමන් කරන භට පඞ්ක්තිය. 4. සමූහය.

අනීකාග්‍ර = 1. සේනාවක්ගේ පෙරමුණු කොටස.

අනීකස්ථ = 1. රජුගේ ශරීරාරක්ෂකයා.

අනීඝ = 1. උපද්‍රව නැති. 2. දුක් නැති.

අනීච = 1. නීච නොවූ.

අනීතික = 1. නීතියක් නැති. 2. නොහික්මුණු. 3. නීතිය නොසලකන. 4. උපද්‍රව රහිත. 5. නිවණ.

අනීප්සිතකර්ම = කර්තෘ විසින් කරන්නට අදහස් නොකළ කර්මය.

අනීශ = (අනීශ්වර). 1. අදේව දෘෂ්ටි. 2. ප්‍රධානයකු නැති.

අනීවාරණක් = 1. නිෂ් ප්‍ර යෝ ජ න යේ. 2. නිකරුණේ.

අනු = 1. සවල්ප. 2. දෙවැනි. 3. කැටුව. 4. පසුව.

අනු ඇටය = 1. හකු ඇටය.

අනුක = 1. කාමුක.

අනුකථනය = 1. කථා බස් කිරීම. 2. පිළිවෙළින් කීම. 3. දෙවනුව කීම.

අනුකථා = 1. පසුව කරණ කථාව.

අනුකඳුළු = 1. හැඬු කඳුළු.

අනුකම්පක = 1. අනුකම්පා කරන. 2. කාරුණික.

අනුකම්පන = 1. කරුණා කිරීම. 2. අනුන්ගේ දුක් දැක හිත උණුවීම.

අනුකම්ප්‍ය = 1. අනුකම්පා කටයුතු.

අනුකරණ = 1. අනුව කිරීම. 2. අනුව යාම. 3. යමක් බලා ඒ ලෙසින් කිරීම.

අනුකරණ ධ්වනිය = (අනුකරණ ශබ්දය). 1. ශබ්දයක් අනුව ඇති ගරගත් වචනය.

අනුකෘතිය = (අනුකෘතිය). 1. යමක් බලා ඒ ආකාරයට කිරීම. 2. සමානව කළ.

අනුකාමින = 1. හිතුවක්කාර.

අනුකර්ෂණ = 1. අදින. 2. ඇදගත්තාවූ.

අනුකර්ෂිත්වය = 1. කාන්දම් ගුණය.

අනුකාරක සභා = 1. කාරක සභාවක් විසින් පත්කරනු ලබන කුඩා කාරක මණ්ඩලය.

අනුකාර = 1. අනුව කිරීම. 2. සමානවීම.

අනුකාරී = 1. අනුව ක්‍රියා කරන.

අනුකාර්‍ය = 1. අනුකරණය කළයුතු.

අනුකාල්‍ය = 1. ප්‍රථම කාලයට පසුව පැමිණි කාලය. 2. කලින් කල.

අනුකූල = 1. එකඟ. 2. ඉවුර දිගේ පවත්නා. 3. සුදුසු. 4. ගැළපෙන. 5. එකට හැසිරෙන. 6. එකට එක ගැළපෙන.

අනුවාත = 1. යෝග්‍ය වාතය. 2. තමා ගමන් කරන දිශාවටම හමන සුළඟ.

අනුක්කන් = 1. පත් වර්ගයක්.

අනුක්කම = 1. බෙර වර්ගයක්.

අනුක්ත = (න + උක්ත). 1. නොකියන ලද. 2. සඳහන් නොකළ.

අනුක්‍රම = 1. පිළිවෙළ.

අනුක්‍රමණිකා = 1. සූචිපත්‍රය. 2. අකාරාදි පිළිවෙළට වචන යොදා සකස් කළ ලියවිල්ල.

අනුක්‍රමයෙන් = 1. පිළිවෙළින්.

අනුක්‍රමික = 1. පිළිවෙළක් ඇතිව.

අනුගත = 1. අනුව ගිය. 2. පස්සෙන් ගිය. 3. සමග ගිය.

අනුගතා = 1. භාගිමාව.

අනුග = 1. අනුව යාම.

අනුගමන = 1. අනුව යාම.

අනුගමය = 1. අනුව යන දේ. 2. යමක් අනුව බලා ලැබූ තීරණය.

අනුගම්‍ය = 1. අනුගමනය කළයුතු.

අනුගහ = 1. අනුග්‍රහය.

අනුගාමී = (අනුගාමික) 1. අනුව යන. 2 අනුව යන්නා 3. යමකින් හටගන්නාවූ.

අනුගායනය = 1. එක්ව කරන ගායනය.

අනුගිය = 1. අනුගත.

අනුගුණ = 1. සමාන ගුණ ඇති. 2. සුදුසු. 3. හුරු.

අනුග්‍රහ = 1. උපකාරය. 2. කරුණාව. 3. පිහිට.

අනුග්‍රහ කරනවා = 1. පිහිට වෙනවා. 2 සුබ පතනවා.

අනුගෘහීත = 1. අනුග්‍රහ කළ. 2. අනුග්‍රහ ලැබූ.

අනුග්‍රාහී = (අනුග්‍රාහක) 1. අනුග්‍රහ කරන.

අනුඝාත = 1. නොහැපීම.

අනුචර = 1. අනුව යන. 2. සේවය කරන. 3. එක්ව හැසිරෙන.

අනුචරයා = 1. අනුව යන්නා. 2. සේවකයා. 3. ශ්‍රාවකයා.

අනුචරණ = 1. කැටුව යාම 2. අනුව හැසිරීම.

අනුචරිත = 1. පුරුදු කළ. 2. හැසුරුණු.

අනුචිත = (න + උචිත) 1. නුසුදුසු.

අනුච්ච = 1. උසස් නැති. 2. පහත්.

අනුච්චාරණය 1. උච්චාරණය නොකිරීම. (ශබ්ද නොකිරීම).

අනුච්ඡවික 1. සුදුසු. 2. යෝග්‍ය.

අනුජ = (අනුජාත) 1. පසුව උපන්. 2. බාල සහෝදර. 3. වයසින් බාල.

අනුජයා = 1. වයසින් බාලයා. 2. මල්ලී.

අනුජා 1. බාල සොහොයුරිය.

අනුජාත පුත්‍රයා = 1. පියාගේ ගති - ගුණ ඇති පුත්‍රයා.

අනුජීවක = (අනුජීවී) 1. සේවකයා 2. මෙහෙකරුවා. 3. සහකාරයා. 4 අනුව ජීවත් වන්නා 5. ආශ්‍රයකොට ජීවත් වන්නා.

අනුජු = (අනුජුක) 1. සෘජු නොවූ. 2. වක්වූ.

අනුඥා = 1. අවසර ඇතිව. 2. අනුදැනීම ඇතිව.

අනුඥාත = 1 අවසරදෙන. 2. කැමතිවෙන. 3. අණකරන.

අනුට්ඨිත = 1. නොනැගිටි.

අනුණ්හ = 1. සිහිල්. 2. උණුසුම් නුවූ. 3. අනවතප්තවිල.

අනුතර = 1. ඉතා කුඩා.

අනුතරය = 1. ගෙනයාමේ ගාස්තුව.

අනුතර්කණ = 1. නැවත නැවත කල්පනා කිරීම.

අනුතර්ෂණය = 1. බීම බෙන පාත්‍රය.

අනුතර්ෂය = 1. පිපාසය. 2. ආශාව.

අනුතාපය 1. පසුතැවිල්ල.

අනුතාපී = 1. පසුතැවෙන්නා.

අනුතාල 1. ප්‍රධාන තාලය අනුව ගිය තාලය.

අනුත්කෘෂ්ට = 1. උතුම් නොවන. 2. සාමාන්‍ය (උත්කෘෂ්ට නොවන)

අනුත්තම = 1. උතුම්නොවූ.

අනුත්තර = 1. ඉතා උතුම්. 2. උත්තර දිය නොහැකි. 3. ශ්‍රෙෂ්ඨයකු නැති.

අනුත්තරය = 1. ප්‍රශ්නයට උත්තරයක් නොවන උත්තරය.

අනුත්තරීය = 1. ශ්‍රෙෂ්ඨ බව.

අනුත්තාන = 1. අප්‍රකට. 2. ගැඹුරු 3. නොපැහැදිලි.

අනුත්පාද = 1. වෙන ඉපදීමක් නැති.

අනුත්පාදනය = 1. ඉපදීමක් නැති තත්වය. 2. නිවණ.

අනුත්සූත්‍ර = 1. නියමයට එකඟවූ.

අනුත්සූත්‍රයෙන් = 1. නියමයට එකඟ ලෙස. 2. නියම පරිද්දෙන්.

අනුතීර = 1. ඉවුරට ලංවූ පෙදෙස.

අනුත්‍රාසී = 1. තැති ගැනීම් නැත්තා.

අනුත්තර = 1. උතුර නොවන. 2. ශ්‍රේෂ්ඨ.

අනුථෙර = (අනුථේර) 1. උප ස්ථවිර. 2. දෙවැනි තෙරුන් වහන්සේ.

අනුදත් = 1. අනුදන්නා ලද. 2. එකඟවූ.

අනුදර්ශන = 1. නැවත - නැවත දැකීම හෝ නුවණින් සැලකීම.

අනුදශා = 1. මහා දශාවක් බෙදූ කුඩා කොටස්.

අනුදල 1. කුඩා පෙති.

අනුදහන = 1. දැවීම. 2 පිළිස්සීම.

අනුදාත්ත = 1. අක්ෂර පහත් හඬින් කීම. 2. තදින් ශබ්ද නොකරන.

අනුදිග් = (අනුදිශ) 1. අප්‍රධාන දිසා හතර (වයඹ - නිරිත - ගිණිකොණ - ඊසාන)

අනුදිත = 1. නොකියන ලද. 2. නොනැගිටුණු.

අනුදින 1. දවස් පතා.

අනුදිව = 1. යටි දිව. 2. කුඩා දූපත.

අනුදිවි = 1. සේවකයා. 2. අනුජීවයා.

අනුදූතයා = 1. දෙවැනි දූතයා. 2. එක්ක යන්නා.

අනුධන = (අනුධාන) 1. යටත් පහත්. 2. උස නැති.

අනුද්‍රුතය = 1. මාත්‍රාවකින් හතරෙන් පංගුවක් වූ කාලය.

අනුද්දයා = 1. කරුණාව.

අනුද්දිට්ඨ = 1. නොකී. 2. නොපෙන්වූ.

අනුද්ධංසන = 1. ද්වේෂාරෝපණය.

අනුධම (අනුධර්ම) 1. ප්‍රධාන ධර්මයට අනුකූල වූ ධර්මය.

අනුධාවන = 1. අනුව දිවීම.

අනුධ්‍යාන = 1. නිතර කල්පනා කිරීම. 2. කාන්සාවූ.

අනුනය = 1. මිත්‍රබව. 2. ඇල්ම. 3. රාගය. 4. නික්මීම. 5. ගෞරවය. 6. නැලවිල්ල. 7. සුබ පැතීම. 8. ආචාරය. 9. අනුකූල බව.

අනුන් 1. = අන් අය. 2. වෙනත් අය.

අනුනාද = 1. ද්වෝ නාරය.

අනුනායක = 1. දෙවැනි නායක. 2. ප්‍රධානත්ව-යෙන් දෙවැනියා.

අනුනාසික = 1. නාසය අනුව ශබ්ද කළ යුතු. 2. වර්ගාන්ත අක්ෂර හා බින්දුව.

අනුනීත = 1. පැමිණ වූ.

අනුඤ්ඤ = 1. නික්මවන්නා. 2. සාමදාන කරන්නා.

අනූප = 1. ජල බහුල භූමිය. 2. දියාරු. 3. පිළිවෙළ.

අනුපකාර = 1. උපකාර නැතිකම. 2. උපකාර නොකිරීම.

අනුපක්ලිෂ්ට = 1. පිරිසිදු.

අනුපටිපාටි = 1. ක්‍රමානුගත පිළිවෙළ,

අනුපද = 1. පියවර අනුව. 2. පසු පස්සෙන්. 3. වචනයක් පාසා.

අනුපදික = 1. පියවර අනුව යන.

අනුපදයෙන් = (අනුපදිකව). 1. අඩියක්-අඩියක් පාසා.

අනුපදිසෙස් = (අනුපාදිශේෂ). 1. සකන්ධයන්ගේ ඉතිරිවීමක් නැති.

අනුපම = 1. සමාන නොවූ. 2. ඉතා උතුම්. 3. උපමා රහිත. 4. අසමාන.

අනුපය = 1. පිළිවෙළ.

අනුපරිවර්තන = 1. අනුව පෙරළෙන හෝ පවතින.

අනුපලිප්ත = 1. තැවරී නැති.

අනුපසපන් = 1. උපසම්පදා නොවූ.

අනුපහත = 1. පහර නොලැබූ. 2. අනතුරු නොවූ.

අනුපාඩා = 1. හක්ක.

අනුපාදාවි මොක්ෂය = 1. කෙලෙසුන්ගෙන් වැළකීම.

අනුපානය = 1. බෙහෙත් සමග ගන්නා මී පැණි - ගිතෙල් ආදි ප්‍රතිවාපය.

අනුපාය = 1. උපාය නැති. 2. අවංක.

අනුපායාස = 1. උපායාස (බලවත් ශෝක) නැති.

අනුපාර්ශ්ව = 1. පැත්තට අයිති.

අනුපාලක - 1. රකින්නා. 2. පාලකයා.

අනුපිය භාණී = 1. ඉච්චා බස් කියන්නා.

අනුපුබ්බී = 1. පිළිවෙළ. 2. පිළිවෙළ අනුව ගිය. 3. ක්‍රමානුකූල.

අනුපෙර = 1. පිළිවෙළ.

අනුපෙති = 1. කුඩා මල්පෙති.

අනුප්‍රඥප්තිය = 1. වැඩි නියෝගය.

අනු ප්‍රාකාරය = 1. උප පවුර.

අනුප්‍රාසය = 1. නැවත නැවත කීම. 2. සමාන අකුරු යොදා ගළපන වාක්‍යය.

අනුබද්ධ = 1. සම්බන්ධ වූ. 2. එකට බැඳුණු.

අනුබන්ධ = 1. සම්බන්ධ වූ. 2. බැඳී පවත්නා ලක්ෂණ. 3. ලුහුබැඳීම. 4 (ව්‍යාකරණයෙහි) සන්ධි වූ.

අනුබන්ධන = 1. ලුහු බැඳීම. 2. පසු පස්සේ යාම.

අනුබද්ද = 1. නිතර.

අනුබලය = 1. උපකාරය. 2. උපස්තම්භය. 3. වැටෙන්නට නොදී ඉසිලීම. 4. රැකුල. 5. පසු බලය. 6. ප්‍රධාන යුද්ධ සේනාව. 7. අනුව යන දෙවැනි සේනාව.

අනුබව් = 1. අනුභාවය. 2. තේජස.

අනුබුදු = (අනුබුද්ධ). 1. දෙවැනි බුදුන්. 2. පසේ බුදුන්. 3. බුදුන් වැනි. 4. අවබෝධකළ. 5. බුදුන්ට දෙවැනි වූ මිහිඳු මහ රහතන්-වහන්සේට කියන ගරු නාමයක්.

අනුබ්‍යඤ්ජන = 1. අනුව්‍යඤ්ජන. 2. අප්‍රධාන ලකුණු.

අනුබැඳගන්නවා = ලුහුබඳිනවා. 2. පසු-පස්සේ එලවනවා.

අනුබෝධ = 1. අවබෝධය.

අනුභව කරනවා = 1. කනවා. 2. භුක්ති විඳිනවා.

අනුභවය = 1. ආහාර ගැනීම. 2. කෑම.

අනුභාව = (අනුභාවය) 1. බලය. 2. තේජස. 3. අනුහස. 4. වික්‍රමය. 5. භාග්‍යකම.

අනුභාෂණ = 1. කිවක් දෙවනු කීම. 2. පසුව කීම.

අනුභාෂා = 1. මහා භාෂාවකින් බිඳීගිය දෙවැනි භාෂාව.

අනුභුක්ත කරනවා = 1. භුක්ති විඳිනවා.

අනුභූත = 1. භුක්ති විඳි. 2. අනුභව කළ. 3. දැනගත්. 4. අත්දුටු. 5. විඳින ලද.

අනුභූති = 1. විඳීම. 2. දැනීම.

අනුභූයමාන = 1. විඳිනු ලබන. 2. අනුභව කරමින්.

අනුමර්ජිත = 1. පිරිමැද්ද. 2. අත ගෑ; ඇතිල්ලූ. 3. පිරිසිදු කළ.

අනුමත කරනවා = 1. ස්ථිර කරනවා. 2. එකඟ වෙනවා 3. පොළඹවනවා. 4. ගඟවනවා.

අනුමතය = (අනුමැතිය). 1. කැමැත්ත. 2. එකඟවීම. 3. අදහස. 4. යෝජනාව. 5. අණ. 6. අවසරය.

අනුමයදන් = (අනුමය දන්නා). 1. නිමක් නැත්තා. 2. අනන්ත නම් නා රජ.

අනුමරණය = 1. එක්ව මැරීම.

අනුමාන = 1. සැක සහිත. 2. ස්ථිර නැති. 3. විශ්වාස නැති.

අනුමෙවෙනි = (අනුමෝදන්) 1. අනුමෝදන්වූ. 2 කළ ක්‍රියාව අනුව සිත සතුටු කිරීම.

අනුමේය = 1. කරුණු බලා තීරණයකට පැමි-ණිය හැකිවූ.

අනුමෝදනා = 1. අනුව සතුටුවීම. 2. අනුමෝ-දන්වීම. 3. ඒ සඳහා කියන බණ.

අනුමෝදිත = 1. අනුමෝදන් වූ. 2. සතුටු වූ.

අනුයාගය = 1. වැඩියෙන් කරන පූජාව.

අනුයාත = 1. කැටුව යන. 2. පුරුදු. 3. අනුව ගිය.

අනුයායී = 1. අනුව යන්නා.

අනුයුක්ත = 1. එකතුවූ. 2. පත්කළ. 3. ප්‍රශ්න කළ. 4. යෙදූ. 5. සේවකයා.

අනුයුක්තක = 1. අනුව යෙදුණු; ගැටක්.

අනුයුඤ්ජන = 1. නැවත - නැවත යෙදීම.

අනුයුණු = 1. ඇඳුම. 2. වස්ත්‍රය.

අනුයෝග = 1. යෙදීම. 2. පිළිපැදීම. 3. නියමය. 4. එකතුකිරීම. 5. ප්‍රශ්නය. 6. නැවත කීම.

අනුයෝගී = 1. යොදන්නා. 2. පිළිපදින්නා.

අනුයෝග = (අනුයොග්) 1. ප්‍රශ්නය.

අනුර = 1. අනුර නැකත. 2. තුලා රාශිය. 3. කුමාරයකුගේ නාමයක්. 4. අනුරාධ පුරය ගොඩනැඟු ඇමතියා?

අනුරක්ත = 1. ඇලුණු. 2. ප්‍රේමකළ. 3. ස්නේහ කළ.

අනුරක්ෂණ = 1. නිතර රක්ෂා කිරීම.

අනුරජ = 1. දෙවැනි රජ. 2. යුවරජ.

අනුරජන = (අනුරජත) 1. ඇල්ම ඇති.

අනුරඤ්ජන = 1. පිනාවීම. 2. බැඳීම.

අනුරඤ්ජිත = 1. යුක්ත වූ. 2. බැබලෙන. 3. සතුටුකළ.

අනුරතිය = 1. ප්‍රේමය. 2. ආලය.

අනුරාගය = ආලය.

අනුරාජකීය = යුවරජුට අයිති.

අනුරාජාණ්ඩුව = 1. යුවරජුගේ ආණ්ඩුව.

අනුරාධ = 1. අනුර නැකත. 2. තුලා රාශිය. 3. එනම් පුරය.

අනුරාවය = 1. ඕංකාරය.

අනුරුද් = 1. අත්වැඩි. (අනීනට එකඟ වූ). 2 අනුරුද්ධ කිම්.

අනුරූ = (අනුරූප) 1. යෝග්‍ය. 2. සමාන. 3 සුදුසු.

අනුරෝධය = 1. එකඟබව. 2. අනුකූලභාවය. 3. රාගය. 4. සිත් පිනවන ගතිය.

අනුල්ලංඝන = 1. කඩ නොකරන. 2. ඉක්ම නොයාම.

අනුලාපය = 1. කී දේ නැවත කීම.

අනුලිප්ත = 1. තැවරුණු 2. තවරන ලද. 3. ගානලද.

අනුලේපන = 1. විලවුන් ගැම. 2. සඳුන්-කොකුම් ආදිය ගැම.

අනුලෝම = 1. විරුද්ධ නොවූ. 2. ක්‍රමානුකූල වූ. 3 යෝග්‍ය වූ 4 මුල පටන් පිළිවෙළින්.

අනුව = 1. පස්සේ. 2. කැටුව. 3. හක්ක.

අනුවර්තනය = 1. එක්ව පැවතීම. 2. අනුව යාම.

අනුවණ = 1. නුවණ නැති. 2. මෝඩ.

අනුවශ = 1. වශය. 2. යටහත් වූ.

අනුව්‍යඤ්ජන = 1. අප්‍රධාන ලකුණු.

අනුවාත = 1. අනුකූල වාතය. 2. යටි සුළඟ. 3. සිවුරේ නුවාපටිය.

අනුවාද = 1. දෝෂාරෝපණය. 2. අපවාදය. 3. නැවත කීම. 4. ව්‍යාඛ්‍යානය. 5 භාෂා පරිවර්තනය. 6. ඇනුම්පද කීම. 7. විවාදය. 8. චෝදනාව. 9. ආරංචිය.

අනුවාදේ = 1. හදිසියෙන්. 2. නිෂ්ප්‍රයෝජනයේ.

අනුවාද්‍ය = 1. එකඟ. 2. කරදර නැති.

අනුවාදක = 1. අනුවාද කරන. 2. ව්‍යාඛ්‍යාන ලියන්නා.

අනුවා = 1. සිවුරෙහි නුවාව හෝ වාටිය.

අනුවාසනය = 1. බඩට තෙල් විදීම. 2. තෙල වස්තිය. 3. සුවඳ ගැල්වීම. 4. බෙහෙත් දුම් ගැස්සීම.

අනුවිචරිත = 1. නැවත නැවත හැසුරුණු. 2. බොහෝ ගමන් කළාවූ. 3. පුරුදුකළ.

අනුවීක්ෂක = 1 පරීක්ෂකයා. 2. සුව විඳින්නා.

අනුචින්තන = 1. නැවත කල්පනා කිරීම. 2. නිතර කල්පනා කිරීම.

අනුවිදිත = 1. ප්‍රකට. 2. දන්නා ලද. 3. අනුදත්.

අනුවිද්ධ = 1. විදින ලද.

අනුවිධායී = 1 එකඟවන. 2. පවත්වන.

අනුවිශදන් = 1 අනුව්‍යඤ්ජන. 2. ප්‍රධාන නුවූ ලකුණු.

අනුවිලෝකන = 1 නැවත-නැවත බැලීම හෝ සැලකීම. 2. හාත්පස බැලීම.

අනුවිෂ්ට = 1. වශඟවූ. 2. යටත් වූ. 3. දහනමය.

අනුවිධානකී = 1. අනුව යන. 2. සිත සතුටු කරන. 3. අධිගන්න.

අනුශය = 1. වෛරය. 2 අතට පැමිණි වස්තුව. 3. සත්වයන්ගේ සිත්හි අප්‍රකටව පවත්නා රාග-ද්වේෂ ආදිය. 4. පසුතැවිල්ල.

අනුශයී = 1. පසුතැවිලිවන.

අනුශාසක = 1. දූහමුනුසාම් දෙන්නා. 2. අනු-ශාසනා කරන්නා. 3. සමාගමක නිලධර-යෙක්.

අනුශාසනාව = 1. අවවාදය. 2. දෛරසඛ අස්ත කියන දේවදූතයා හෙත් ප්‍රශ්න වශයෙන් නිමිතමක් කියන කියමන.

අනුශික්ෂණ = 1. නැවත - නැවත හික්මීම. 2. අනුව හික්මීම.

අනුශිෂ්‍ය = 1. දෙවැනි ශිෂ්‍යයා.

අනුශීලනය 1. පුරුදු කිරීම. 2. පරිශීලනය. 3. නැවත - නැවත කිරීම.

අනුශෝචනය = (අනුශෝකය) 1. නැවත - නැවත ශෝක කිරීම.

අනුෂංගය = 1. කැටුව සිඩවන දේ. 2. ඇලීම

අනුෂ්ටුප් = 1. පාදයකට අකුරු අටක් ඇති එනම් ඡන්දස.

අනුෂ්ඨාන=1. උත්සාහය. 2.කිරීම. 3 පැවැත්ම.

අනුසන්ධාන = 1. සංසන්දනය. 2. ගැලපීම. 3. පිහිටවීම.

අනුසරණය = 1. අනුගමනය. (අනුවයාම) 2. පුරුද්ද. 3. සිරිත.

අනුසරය – 1. සිහිකිරීම. 2. එක්ව හැසිරීම.

අනුසස = 1 බලය.

අනුස්මරණ = 1.සිහිකිරීම 2. මතක් කිරීම.

අනුස්වාරය = 1. බින්දු වර්ණය.

අනුසාරය = 1. අනුව යාම. 2. අනුගමනය. 3. ආශ්‍රය. 4. ක්‍රමය.

අනුසාරී = 1. අනුව හැසිරෙන.

අනුසාසනීය = 1. අවවාද දියයුතු.

අනුසැසුම් = 1. අනුශාසනාව.

අනුසිහි = 1. අනුස්මෘතිය. 2. සිහි කිරීම.

අනුසුරූ = 1. අනුච්චාරණය. 2. නොකීම.

අනුසුණු = 1. නියම පිළිවෙළට එකගවූ.

අනුසොතගාමී = 1. දිය පහර අනුව යන්නා. 2. යටි හොයට යන

අනුස්මෘති = 1. සිහිකිරීම.

අනුහස් = 1. අනුභාවය. 2. බලය. 3. ආනිශංසය.

අනුහාර = 1. යමක් කරනු බලා ඒ අනුව කරන්නා.

අනුහෝශැමි = 1. දිය පහර අනුව යන.

අනූ 1. එනම් ගණන.

අනුදෘමාන = 1. අනුමෝද කරනු ලබන.

අනූන = 1. අඩුවක් නැති. 2. සම්පූර්ණ.

අනූනතාව = 1. නොඅඩුබව. 2. පිරිපුන් බව.

අනූනාධික = 1. වැඩි - අඩු නොවූ.

අනෘජු = 1. වකුටු 2. කෙළින් නැති.

අනෘත = 1. බොරු.

අනෘතවාදී = 1. බොරු කියන.

අනෘත නිගමනය = 1 බොරු තීරණය.

අනෙක් = 1. අන්‍යවූ 2. එක්තරා. (අන් + එක්)

අනේ = 1. නොයෙක්. 2. අනේක. 3. වේදනාව දැක්වීමට කියන වචනයක්. 4. අනෝ - අයියෝ.

අනේක = 1. නොයෙක්.

අනේකජයා = 1. එකවරකට නූපන් තැනැත්තා. 2. පක්ෂියා.

අනේඩමූක = 1. ගොළු බිහිරා. 2. දුෂ්ටයා. 3. කපටයා.

අනේවඩු = 1. අනේපිඩු.

අනේවා = 1. නොයෙක් අවුරුදු.

අනෝතත්ත = (අනවතප්ත) 1. විලක්. 2. රත් නොවූ 3. සිහිල්.

අනොත්තප්ප = 1. පවට බිය නැති.

අනෝතපය = 1 භය නැතිකම. (අනෝත්‍රප)

අනෝජ = (අනෝජා) 1 එනම් ගස් වර්ගයක්. 2. එනම් පැලෑටි වර්ගයක්. 3. ගෙඩි වර්ගයක්.

අනෝමා = 1. ලාමක නොවන. (අලාමක). 2 ගඟක නමක්. 3. නපුරු. 4. උසස්.

අනෝජා මල් = 1. රත්වන් මල් වර්ගයක්.

අනෝරා = තද වැස්ස.

අනෝපම 1. අසමාන. 2. උපමා රහිත. 3. ඉතා උතුම්.

අනෝලොකිත = 1. කිසිවකු විසින් නොබැලූ.

අනෝවාදක = 1. අවවාද කරන්නකු නැති. 2. අකීකරු.

අනෝපම්‍ය = 1. අසමාන.

අණ 1. නියෝගය. 2. අනඬුව. 3. මුහුද. 4. ආකාරය. 5. පණ.

අණඉර = 1. අනඬ රේඛාව. (ඊ මත්තෙන් පැන යාම තහනම්කොට පොළොවෙහි අඳින ඉර)

අණක් ගුණක් = (අණගුණක්) 1. නීති ගරුක භාවයක් හෝ ගුණවත් බවක්.

අණක = 1. අනඬුව.

අණසණක් 1. නියෝග පැනවීම. 2. නියෝග.

අණපොල්ල = 1. අණමුගුර. 2. සැරයටිය. 3. රාජකාරියට ගෙන යන පොල්ල. 4. වලනඩිය

අණබණ = 1. ආඥව හා ධර්මය. (නීතිය හා ධර්මය)

අණබෙර = 1 රාජ නියෝගයක්. (දූත්විය යුතු කරුණක්). මහාජනයාට දූත්වීම පිණිස ගසන බෙර.

අණමුගුර = 1. අණපොල්ල. 2. සැරයටිය. 3. බලනඩිය.

අණය = 1. පණ. 2. ජීවිතය:

අණව = (අණවුරු, අණයුරු) 1. සමුද්‍රය.

අණසක = 1. අනඬුවක්‍රය. 2. අණ පවතින සීමාව. 3. චක්‍රයක් මෙන් අවට පවත්නා අනඬුව. 4. අණ.

අණසක්විති = 1. ආඥචක්‍රවර්ති. 2. අධිරාජයා.

අනම්. = (අනවු) 1. අර්ණවය; සාගරය.

අනම්දඹු = 1. එනම් කාව්‍ය වෘත්ත විශෙෂය.

අණෑගිලි = 1. ආඥව ප්‍රකාශ කරන ඇඟිල්ල; දබරඟිල්ල.

අණ්ඩ = 1. කකුල. 2. බීජය - බිත්තරය. 3. පුරුෂ ව්‍යඤ්ජනය සම්බන්ධ අවයවයක්. 4. ලීයක හෝ රෙද්දක පලුද්ද වසා පුරුද්දන ලී කෑබැල්ල හෝ රෙදි-කෑබැල්ල. 5. තක්කඩියා. 6. පේලාව.

අණ්ඩ ආකර්ෂණ = 1. කප්පාදු කිරීම.

අණ්ඩ ආකාර = 1. බිත්තරයක හැඩහුරු කම ඇති..

අණ්ඩක = 1. බිත්තරය. 2. ගැට සහිත.

අණ්ඩකෝෂ = 1. බීජ කෝෂයට අයිති.

අණ්ඩච්ඡේද = 1. කප්පාදු කිරීම; අණ්ඩයන් සිඳලීම; කරුඹීම.

අණ්ඩජ = 1. බිජුවටින් උපන්; බිත්තරයෙන් උපන්.

අණ්ඩජනක = 1. බිත්තර දැමීමෙන් පැටවුන් උපදවන.

අණ්ඩනාලිය = 1. බීජ නලය.

අණ්ඩය = 1. බිජුව. 2. පේලාව. 3. ලප්පය.

අණ්ඩ දණ්ඩ වූනා = 1. පැටළුනා. 2. වැරදුනා.

අණ්ඩසාල = 1. කෛරාටික. 2. ප්‍රයෝගකාර.

අණ්ඩරදෙමළ = 1. අතක් මතක්. 2. පැටලුම් සහිත කියමන 3. තේරුම් ගත නොහැකි කථාව.

අණ්ඩයෝනි = 1. බිජු වටින් හටගන්නා සත්ව ජාති.

අණ්ඩවෘක = (අණ්ඩවෘඩි) 1 අණ්ඩය මහත්වීම.

අණ්ඩශාස්ත්‍රය = 1. කුරුළු බිජු පිළිබඳ ශාස්ත්‍රය.

අණ්ඩූෂක = දරණුව.

අණිණාම්යා = 1. ගුරුවරයා. 2. රෝමානු-කතෝලික දේවස්ථානයෙහි යාච්ඤා පොත කියවන්නා.

අණඬු = (අණාඥ.) 1. තද්බල නියෝගය. 2. අණ.

අණිය = 1. අලවංගු ඇණය. 2. කඩ ඇණය. 3. ගැළපෙන බව. 4. අග. 5. ඇණය.

අණිමය = 1. ඉතා සියුම්.

අණිමා = (අණිමත්.) 1. අණුභාවය. 2. ඉතා සියුම්.

අණු = 1. පරමාණුව. 2. ඉතා කුඩා දෙය. 3. අත්‍යල්ප වූ. 4. පරමාණු තිස්හයක ප්‍රමාණය. 5. ආඥව. 6. දඬුවම. ඉතා සියුම්.

අණුසූක්ෂ්ම = 1. ඉතා සියුම්. 2. අණුවක් සේ කුඩා.

අණුතර = 1. ඉතාමත් සියුම්.

අණුතාව = 1. ඉතා සියුම් බව.

අණුදක්නා = 1. කුඩා දේ මහත් කොට දක්වන කන්නාඩිය,

අණුමාත්‍ර = 1. අණුවක් පමණ වූ. 2. අණුව. 3. පරමාණුව.

අම්භෝජමල් = 1. අම්භෝජ නම් මල් විශේෂ.

අත = 1. හස්තය. 2. අර්ථය. 3. තමා ම. 4. ශරීරය. 5. ධනය. 6. දිශාව. (පැත්ත.) 7. බස්නාහිර. 8. කෙළවර. 9. සීමාව. 10. සොඬමැල. 11. වාරය. 12 සමීපය.

අත් අරිනවා = 1. අල්ලාගෙන සිට යන්ට හරිනවා. 2. අත පොවනවා.

අත්උරු = 1. අන්තඃ පුරය. 2. ස්ත්‍රීන් ගේ කාමරය.

අත් උලුක් කරනවා = 1. මිට මොළවා අත දික්කරනවා.

අත්කර = 1. අතෙහි ග්‍රීවය වැනි කොටස. 2. අත හා ග්‍රීවය. 3. මැණික් කටුව.

අත්කුරු = (අත් + අකුරු.) 1. අතින් ලිවූ අකුරු.

අත්කුරු ගැසීම = 1. ශාස්ත්‍ර බැලීමට ගල් දැමීම. 2. දබරැඟිල්ලෙන් ඉලක්කයට ගල්කැට විදීම. 3. ගල් විදීමෙන් ගස්හි කොළවල රූප සටහන් කැපීම.

අත්කොළඹ = 1. ලීයෙන් සෑදූ ලොකු මිටිය.

අත්ගාගැනීම = 1. සොරාගෙණයාම.

අත්ගා යනවා = 1. අතගා බැලීමෙන් පාර සොයනවා.

අත්ගානවා = 1. අතින් පිරි මදිනවා. 2. අතුල්ලනවා.

අත්ගහනවා = 1. අතින් අල්ලනවා. 2. උදව් දෙනවා. 3. (මල්වට්ටි ආදියට). පින් සලකා අත තියනවා.

අත් ගැනුම් = 1. අත් ගැනීම. 2. විවාහය. 3. කර බන්ධනය.

අත්ඟු = (අතංගු.) 1. මසුන් අල්ලන දැල් වර්ගයක්. 2. දැල් බැඳි උපකරණයක්.

අත්ගුල් = 1. අතෙහි ඇඟිලි.

අත්තණ = 1 එකැස් බෙරය.

අත්තුර = 1. හදවත. 2. ළය. 3. පසුව. 4. අනෙක් අර්ථය නෝ කාරණය.

අත්තුන් ගුණය = (අතාදී ගුණය.) 1. (ව්‍යාකරණ- යෙහි.) බාහිර ගුණ පදය.

අත්දැණි = 1. අත් ගාතයෙහි දණ්ඩිය.

අත්දරු = 1. ළදරු.

අත්ගු = 1. එ තැන්හි. (ඒ තැන.)

අත්දිත = (අතජ්ජිත.) 1. මැලි බවක් නැති. 2. උනන්දු වූ.

අත්සන් = (හස්තප්‍රාප්ත වූ.) 1. අතට ලැබුණු. 2 අයිති වූ. 3. අත්තණ.

අත්පස්කු = 1. පලාත් භාර නිලධාරියා ගේ ආධාරකාරයෝ. 2. රජුගේ හෝ දිශාපති- යකුගේ ආරක්ෂක හමුදාව. 3. නම්බු නාමයක්.

අත්පත්තුගම් = 1. අතපත්තු හමුදාවේ හට- යන්ට දෙනලද ගම්.

අත්පත්තු මුදලි = 1. අතපත්තු හමුදාවේ ප්‍රධානයා.

අත්පත්තු ලේකම් = 1. අතපත්තුවෙහි කට- යුතුලියා තබන්නා. (අතපත්තු මෙනොව්- ටාල)

අත්පත්තු වසම් = 1. අතපත්තුවට අයත් ක්‍රියාකාරි මණ්ඩලය.

අත්පයසෝදීම් = 1. මලපහ කළපසු ජලයෙන් සෝදා පිරිසිදු කිරීම.

අත්පසුබු = (අතපහු) 1. ප්‍රමාද වූ. 2. දියුණු නොවූ. 3 පරක්කුවූ.

අත් පහරනවා = 1. අතගහනවා.

අත්ජිය = 1. කැප්තියට පැමිණවිය නොහැකි.

අත්පානවා = 1. ඉල්ලනවා. 2. අත දික්කර- නවා. 3. පිහිට වෙනවා.

අත්පැන්වක්කරනවා = 1. අතට පැන් වක්- කර (තරුණියක් තරුණයකුට) පාවා දෙනවා.

අත්පාවා වගේ = 1. පිහිට වූනාක් මෙන්.

අත්පුර = 1. අන්තඃ පුරය. 2. ස්ත්‍රීන්ගේ කාමර.

අත්ජ්තලය = 1. බ්‍රහ්ම ලෝකයක්.

අත්පොත්තැබීම = 1. ළදරුවකුට හා පුරා යයි අකුරු කරවීම.

අත්පොඩනවා = 1. අත දමනවා. 2. සම්බන්ධ වෙනවා.

අත්බාලයා = 1. බාල දරුවා.

අතබැලීම = 1. අත්ලෙහි රේඛා අනුව දෛවය ගැන කීම.

අතම = 1. ආත්මය. 2. ශරීරය.

අතමාරුව = (අත හුව මාරුව) 1. ඔප්පු ආදිය උකස් නොකොට කටේ වචනය පිට ගන්නා ණය.

අතමිට = 1. වත්කම. 2 කාසි පණම්. 3. මිල මුදල්.

අතමුගුර = 1. පොල්ල.

අත්මුදල = 1. අතපිට දෙන මුදල 2. ඒ වේලාවේම ගෙවන මුදල්. 3. තමාගේම මුදල.

අතැඹුල = 1. අතට ගත් නෙල්ලි ගෙඩිය. 2 සැකයක් නැතිව දැනගත හැකිදේ.

අතර = 1. අවකාශය. 2. ඉඩ ප්‍රමාණය. 3. වෙනස. 4. පරතරය.

අතරක් නැති = 1. ඉඩක් නැති. 2. අවකාශයක් නැති.

අතරට = 1. මැදට.

අතරණය = 1. ඇතිරිල්ල. 2. ආස්තරණය.

අතරතුර = 1. අතර කාලය.

අතරතුරේ = 1. අතර කාලය තුළ.

අතරමග = 1. ගමන නිම වන්නට පෙර. 2. ගමනෙහි මැද. 3. ගමන් මාර්ගයෙහි.

අතරමං කරනවා = 1. අත්හැර දමනවා. 2. නොසලකා හරිනවා. 3. මුළා කරනවා.

අතරමං වුනා = 1. පාර වැරදුනා 2. මංමුළාවුනා

අතරවාරයෙහි = 1. වරින්වර. 2. කලින් කල.

අතරවාරේ = 1. කලාතුරකින්. 2. අනියම් වාරයෙහි.

අතශට ගැනීම = 1. ප්‍රසිද්ධ විකිණීමක් නැතිව අප්‍රසිද්ධ ලෙස (ඉඩම් ආදිය) මිලට ගැනීම.

අතසුරු = 1. ස්ථාවර නොවූ 2. ස්ථිර නොවූ.

අතශටතට ගැනීම 1. අත් අඩංගුවට ගැනීම. 2. යටත්කර ගැනීම.

අතල = 1. තටුව. 2. කැටිය. 3. තැලිය. 4. පතුලක් නැති. 5. පාතාලය. 6 මුදුන. 6. කොණ්ඩිය.

අතලන = 1. අතෙහි දමන.

අතලස්පර්ශී = 1. ඉතා ගැඹුර.

අතලුතල = 1. හස්ත තලය; අල්ල.

අතලාස්ස = 1. අතට ගතහැකි ප්‍රමාණය. 2. ස්වල්ප ප්‍රමාණය.

අතලාඹු = 1. එල්ලී සිටීමට උපකාර වන දෙය. 2. පිළිසරණය.

අතවට = 1. අත ළඟ. 2. අත වටේ. 3. අතින් කල්ලු කරණ ලද්ද.

අත වඩන = 1 අත පමුණුවන. 2. මිශ්‍රකරන.

අතවනන = 1. අත සොලවන. 2. අත වනා කැඳවන.

අතවර = 1. උපකාරය. 2. මෙහෙය.

අතවස් = 1. වස්කාලය ඇතුළත.

අතවැසියා = (අත වැස්සා) 1. වැඩ කාරයා. 2. ගෝලයා.

අත විදීම = 1. අතට බෙත් විදීම.

අතඹුරු = 1. ඇතුළු නුවර.

අතහඟුව = 1. අකාංගුව 2. අත් දූල.

අතහන = 1. අත්සන

අතහඳ = 1. දූල.

අතහරිනවා = 1. නිදහස් කරනවා. 2. වැටෙන්නට අරිනවා.

අතළු = 1 ඇතුරුවාවූ. 2. එලූ. 3. තුනී කල.

අත ළමයා = 1. අත දරුවා. 2. බිළිඳා.

අත් = 1. ආත්මය. 2. ශරීරය. 3. (හස්ත) යමක් ඇල්ලීමට ඉවහල් වන ශරීරයේ කොටස්. 4. ගෝරුම. 5. ධනය. 6. කෙලවර. 7. ප්‍රයෝජන. 8 දහවලව. 9. දිගාව (පැත්ත) 10. සමීපය. 11. ඇතුළ. 12. අඳනවීම. (සඳ-හිරු බැසයාම) 13. ඇත් සොඬය. 14. රියන. 15. බැදි තාල් පිපි. 16. අයිතිකර ගැනීම. 17. එරබුගස.

අත් අඩංගුවට = 1. යටතට. 2. භාරයට 3. අත යටතට.

අත්අඹු = 1 සිවුපාවුන්ගේ ඉස්සරහ පාද හෝ පක්ෂීන්ගේ අත්හැදි.

අත් අකුරු = 1. අතින් ලියූ අකුරු.

අත් අතුරු = 1. පපුව. 2. ළැපැත්ත.

අත් අරිනවා = 1. අත්හැර දමනවා. 2. බැහැර කරනවා. 3. නොගෙන හරිනවා.

අත් අළුව = 1. අතින් රෙදි වියන යන්ත්‍රයෙහි නූල් තදකරන (පනාවක් වැනි) කොටස. 2. රෙදි වියන අත්යන්ත්‍ර.

අත් ඇඳි පුටුව = 1. අත් තබා ගැනීම පිණිස ඇඳි සවිකළ පුටුව. 2. පුටු වර්ගයක්.

අත් උදවු කාරයා = 1. කාර්මිකයකුට වුවමනා උපකරණ ආදිය සපයමින් සේවය කරන දෙවැනියා.

අත්කඩ = 1. ලේන්සුව.

අත්කනවා = 1. දිරා යනවා. 2. දිරුම් පිට වැටෙනවා.

අත්කණු = 1. කුරක්කන් ගල් අල්ලා කර කැවීමට එහි සවිකොට ඇති ලී.

අත්කතුරු = 1. කතුරු මුරුංගා.

අත්කම් = 1. හස්ත කර්මාන්ත. 2. අතින් කරන වැඩ.

අත්කම්හල = 1. කර්මාන්ත ශාලාව.

අත්කර = 1. මැණික් කටුව.

අත්කර ගැනීම = 1. අයිතිකර ගැනීම.

අත්කරනු = 1. අඬ කීම.

අත්කරත්තය = 1. අතින් ඇදගෙන හෝ තල්ලු කරගෙන යන කුඩා කරත්තය.

අත්කච්චකය = 1. කසාද බඳින මනාලියගේ හෝ මනාල යුවලගේ අතේ බඳින (මන්ත්‍ර) ජපකළ නූල.

අත්කිංත = 1. එතම් කුඩා තියන.

අත් ගල් = 1. ගල් පොඩිය. 2. අස්ත පර්වතය. 3. මිරිස් ආදිය අඹරන දරුගල.

අත්ගල්ලා = (අත්ගල්ලා) 1. පැණියෙන් ඇනූ බැදි පිටි ගුළිය.

අත්ගෑල් = 1. අත්යරත්ත.

අත් ගසනවා = 1. පිටි අතා පදම්කරනවා.

අත් ගිගිරි = 1. අතෙහි පළදින ගිගිරි වළලු.

අත් ගිනි උණ්ඩය = 1. තුවක්කු වර්ගයක්.

අත්ගිර = (අත්ගිරි) 1. අස්ත පර්වතය. 2. (බස්නාහිර). අවරගිර.

අත් ගුණය = 1. යම් කිසි බෙහෙතකින් රෝගීන් සුව කිරීමට වෙදකු තුළ සහජයෙන්ම පිහිටි ශක්තිය හෝ බලය. 2. අත්වාසිය. (අත්වාච්චිය).

අත්ගෙඩි = 1. පොර පොල් කෙළියෙහිදී විරුඬ පක්ෂයෙන් එවනු ලබන ගෙඩියට ගැසීම සඳහා තමන් අතේ තබාගෙන ඉන්න පොර පොල් ගෙඩිය.

අත් ගොබ = (අත්ගොබේ) 1. අතේ වැලමිට හා මැණික් කටුව අතර කොටස. 2. අත් දණ්ඩ.

අත්ත = 1. ගසක කඳෙන් වෙන්වී විහිදෙන කොටස. (ශාඛාව).

අත්තඩු = 1. තුරුල්ලන් ගේ අත් හැන්ද.

අත්තඩු සහනවා = (අත්තටු සපනවා) 1. පියාඹනවා. 2. ඉගිලෙනවා. 3. පියාසර කරනවා.

අත්තබි පුටුව = 1. හාන්සි (වන) පුටුව. 2. අත් ඇඳි පුටුව. 3. සතීප පුටුව.

අත්තනා = 1. එනම් ගස් වර්ගය. 2. තුත්තෙ.

අත්තනෝමතය = (අත්තනෝමතිය) 1. තමාගේම අදහසට වැඩ කිරීම. 2. හිතුවක්කාරකම.

අත්තම් = 1. අතින් කරන වැඩ. (හස්ත කර්මාන්ත). 2. ආයුධය. 3. වැටුපක් නොගෙන තමනුත් එබඳුම උදවු බලා පොරොත්තුවෙන් අනුන්ට කරන කුඹුරු කෙටීම් ආදි වැඩ.

අත්තම් කොටනවා = 1. අත්තම් වශයෙන් අනුන්ගේ කුඹුරු කොටනවා.

අත්තම්මා = 1. තාත්තම්මා; පියාගේ මවු. 2. ආච්චි.

අත්තරගම රාජගුරු = 1. අත්තර ගම රාජගුරු බණ්ඩාර මහ පඬිතුමා. (මෙතුමා වැලිවිට පිණ්ඩපාතික සරණංකර සඞ්ඝ-රාජ මා හිමියන්ගේ ශිෂ්‍යයෙකි. බුද්ධ ගජ්ජය මෙතුමාගේ කෘතියකි.)

අත්තල = 1. අල්ල (හස්තතලය) 2. අත්තාලම; අතුල් දෙක ගැසීමෙන් දක්වෙන තාලය.

අත්තා = 1. ආතා. (සීයා).

අත්තානිය = 1. සභාව.

අත්තානුවාදය = 1. තෙමේ තමාටම දෙස් පවරා ගැනීම.

අත්තාලම = 1. කයිතාලම.

අත්තිකාරම = 1. යමක් මිලයට ගැනීම සඳහා කලින් දෙන මුදල් කොටස.

අත්තිවාරම = 1. අඩිතාලම. 2. ගෙයක් තැනීමේදී මුලින්ම පොළොවෙහි ලන පදනම. 3. යමක් පටන් ගැනීමේදී තැන්පත්කරන දේ.

අත්තුක්කංසනය = 1. තමා උසස්යයි සිතීම.

අත්තුවක්කුව = 1. තුවක්කු වර්ගයක්.

අත්තෙල් = 1. අතින් සිඳින ලද තෙල්.

අත් දකිනවා = 1. යම් කිසි වැඩක් කර බලා දැනගන්නවා.

අත්දුටු = (අද්දුටු) 1. කර බලා දැනගත්. 2. අත් දැකීම් ඇති. 3. සිකුරු. 4. අත්හදා බැලූ. 5. ප්‍රත්‍යක්ෂ.

අත්දණ්ඩ = 1. අත් ගොබේ. (අතේ වැලමිට හා මැණික් කටුව අතර කොටස). 2. සැරයටිය. 3. වෑ-පොරෝ මිට. 4. ගොයම් පෑගීමේදී ගන්නා කරන් ලීය.

අත්දඹු = 1. කරාදිය.

අත්දම = 1. අතේ ලන මාංචුව. 2. අත් දම් වැල.

අත්දිය කොතලාව = 1. වැසිකිළියට දිය ගෙනයන කොතලය.

අත් දෙණි = 1. අත්-පා සෝදන පැන්පල.

අත්නුදුන් = 1. උපකාරී නුවූ.

අත්පඩි = 1. පුටු ඇන්දෙහි අත් තබා ගැනීමට සවි කළ ලී පටි.

අත් පඩුරු = 1. යමකු දැක්මට යන කල ගෙනයන තෑගි. 2. පොරොන්දු පිණිස දෙන මුදල්. 3. අත්තිකාරම්. 4. ඇප මුදල්.

අත් පත් කරගැනීම = 1. අයිතිකර ගැනීම.

අත් පත්ල = (අත්පල්ල - අප්පල්ල) 1. ලොකු ඇකිලිය.

අත්පය = 1. අතේ දිග පමණ ලඟ ප්‍රමාණය.

අත් පසගේ = 1. වැසිකිළිය (කක්කුස්සිය). 2. ගෙයින් පිටගේ.

අත් පසුරු = 1. අතකිය. 2. හස්තප්‍රසාරය. 3. අතේ ඇඟිලි. 4. අත දිගු කිරීම. 5 ලබු පුහුල් ආදි වැල්වල පුරුක් වලින් හට ගන්නා වක ගැසුණු කෙඳි. (මේ කෙඳිවලින් ඒ වැල ගස් - රිකිලි ආදියෙහි බැඳේ).

අත් පන්දම් = 1. පහන් වර්ගයක්.

අත් පා = 1. අත - පය.

අත් - පා මෙහෙය = (අත් - පා මෙහෙවර). 1. අත් -- පා මිරිකීම් ආදි වැඩ. 2 පහත් සේවය. 3. අතින් හා පයින් කරන වැඩ, (පණිවුඩ පණත් ගෙණයාම ආදිය පයින් කරන වැඩ වේ).

අත්පිට = 1. වහාම. 2. බඩු මිලට ගත් කෙණෙහිම. 3. එකෙණෙහිම.

අත්පිඩි ගැසීම = (අප්පුඩි ගැසීම). 1. දෙ අත්ල එකට ගැසීම. 2. අත්පොළසන්දීම.

අත්පිඩු = 1. එක්කළ දත.

අත්පියෝ = 1. තමාගේම ක්‍රියාව.

අත්පිස්නාකඩ = 1. අත් පිස්නාව. 2 අත පිස දැමීමට ගන්නා රෙදි කෑබෙල්ල.

අත්පුව = 1. දිය ගැනීම සඳහා කොට්ටුවක් මෙන් බොකුකළ අත්ල.

අත්පුටුව = 1. හාන්සි පුටුව.

අත්පෙම් = 1. ආත්ම ප්‍රේමය. (තමා කෙරෙහි ඇති ප්‍රේමය).

අත්පොත් = 1. වැදගත් කරුණු ලියා ගැනීම සඳහා අතෙහි තබා ගන්නා කුඩා පොත. 2. වැදගත් සිඩියක් කොටින් ලියා තබා ගැනීම පිණිස පාවිච්චි කරන පොත් පිංච.

අත්පොර = 1. සුදු කෙළියෙහිදී කොළ බෙදන තැනැත්තාගේ දකුණු පසින් වාඩිවී සිටින සූදුකාරයා. 2. කොළ බෙදීමට බලා පොරොත්තුවෙන් සිටින සුදු කාරයා.

අත්පොර අල්ලනවා = 1. පොර බදනවා.

අත් පොරොව = 1. තනි අතින් අල්ලා කැපිය හැකි කුඩා පොරොව.

අත්පොළන = 1. අත්පොළසන් ගසන.

අත්පොළසන් = 1. දෙ අත්ල එකට ගැසීමෙන් ශබ්ද පැවැත්වීම. 2. අප්පුඩි ගැසීම.

අත්පොළා = 1. දෑත එකට ගසා.

අත්පොවනවා = 1. අත් නැවරෙන්ට දමනවා. 2. අත් දමනවා.

අත්පෝඨනය = 1. අප්පුඩි ගැසීම.

අත්පෝරු = 1. අතෙහි පලල් කොටස. 2. කුඹුරෙහිමඩ සමතලා කිරීම පිණිස පාවිච්චි කරන මිටි සහිත ලෑල්ල.

අත්බන්දි = 1. පත්තෝරු සෙල්ලම් කරන්නන් ගේ අතෙහි ලන පිත්තල වළලු විශේෂයක්.

අත්බඹරය = 1. කුඩා ළමයින්ගේ සෙල්ලම් බඩුවක්.

අත්බර = 1. අතින් ගෙන යා හැකි බර ප්‍රමාණය. 2. (අත් දෙළසක් ඇති). කඳකුමරු.

අත්බරු = 1 එක්වරට අතින් ගෙන යා හැකි බර.

අත බලනවා = 1. මතුවට සිදුවන හොඳ නො හොඳ රේඛානුසාරයෙන් දැන ගැනීමට අත්ල බලනවා. 2. යම් සූදුකාරයකු වෙනු වට ඔහුගේ කොළ අත සෙල්ලම් කරනවා.

අතබලා හිඳීම = 1. යමකුගේ පිහිට බලාපො- රොත්තුව සිටීම.

අතබලි = 1. අතින් රැගෙන හැටිය හැකි කුඩා බලිය.

අත්බව = 1. ආත්ම භාවය. 2. ජාතිය. (ඉපදීම).

අත්බූත = (අත්භූත) 1. පුදුම්වූ. 2. ආශ්චර්යය වත්. 3. පෙරනුවූ වීරු.

අත්භව = 1. ආත්ම භාවය.

අත්ම = (ආත්ම) 1. ශරීරය; ඇඟ. 2. ආත්මය.

අත්මා = 1 කුඹුරක් අවට පිහිටි කුඩා පාර.

අත්මාංචුව = 1. අතෙහි ලන විලංගුව.

අත්මස් = 1. කිරිමෝරු හැදීමට ගන්නා දඬු කඩ.

අත්මල = 1. අතාඹුල.

අත්මාකම = 1. සෙල්ලම. 2. බෙර වැයීම් විශේෂයක්.

අත්මානම = 1. අයින් මැනීම. 2. කළගෙඩියක් හිස්පිට වළලු හෝ බත්දී උඩ දමමින් ඇල්- ලීම. 3. බෙර වැයීම් විශේෂයක්.

අත්මානම් කාරයා = 1. යම් කිසිවක් විසි කිරීමෙන් ශාස්ත්‍ර කියන්නා.

අත්මාරු කරනවා = 1. යම් කිසි බරක් එක් අතකින් ගෙනයාමේදී බර දරාගත නොහී එය අනෙක් අතට මාරු කරනවා.

අත්මාරු ගැසීම = 1. රබන් ගැසීමේදී පදයට අනුව අප්පුඩි ගැසීමෙන් හා ඇඟිලි හරඹ කිරීමෙන් කරන ක්‍රීඩාව. 2. බෙර ගැසීමේ ක්‍රමයක්.

අත්මිට හරඹය = 1. මිට මොළවාගත් අත් වලින් හරඹ දැක්වීම.

අත්මිදීම = 1. බේරීම. 2. සම්පූර්ණයෙන් නිදහස්වීම.

අත් මුගුර = 1. අතේ ගෙන යන පොල්ල. 2. ගැර සැටිය.

අත් මුදල = 1. එකෙණෙහි ගෙවන මුදල. (බඩු මිලට ගත් හැටියේ ගෙවන මුදල).

අත් මුද්ද = 1. (විවාහක යුවලකගේ අතෙහි පළඳින). සිහිවීම් මුද්ද. 2. මාරු කළ මුද්ද.

අත්මුද්‍ර = (අත් මුද්‍රා). 1. හස්ත මුද්‍රාව.

අත් මේස් = 1. පිළියෙන් කළ අත් වැස්ම.

අත් යතුරු = 1. අත කමැති යන්ත්‍රය.

අත්යන්ත්‍රය = 1. බල වේගයක් නොමැතිව අතින් ක්‍රියා කරවිය හැකි යන්ත්‍රය.

අත්රස = 1. අර්ථ රසය. 2. පල පුරුදු අතින් යෙදීම නිසා කැමෙහි ඇතිවන රසය.

අත්‍යධික = (අති + අධික). 1. ඉතා අධික. (ඉතාමත්ම).

අත්‍යධිකාරය = 1. ඉතා උසස් අධිපතිකම.

අත්‍යනර්ඝ = 1. ඉතා වටිනා. 2. බොහෝ උසස්.

අත්‍යන්ත = (අති + අන්ත). 1. ඉතාමත්ම. 2 අධික.

අත්‍යන්තකෝපනා = 1. නිතර කිපෙන සුළු තැනැත්තා.

අත්‍යන්තකාකම = 1. ඉතා අධිකකම.

අත්‍යන්ත සංයෝගය = 1. නිතර එකට බැඳී පැවැත්ම.

අත්‍යන්තාභාවය = 1. සම්පූර්ණයෙන් නැති නොවන බව.

අත්‍යන්තෝපකාර = 1. ඉතා උපකාර ඇති.

අත්‍යම්ල = (අති + අම්ල). 1. ඉතා ඇඹුල් වූ. 2. සියඹලා.

අත්‍යර්ථ = 1. අධික. 2. බොහෝ. 3. අතිශය.

අත්‍යලංකාර = (අති + අලංකාර). 1. ඉතා ලස්සන.

අත්‍යලඞ්කෘත = 1. සිත් කළු ලෙස සැරසුවාවූ.

අත්‍යල්ප = (අති + අල්ප). 1. ඉතා ටික.

අත්‍යාචාර = 1. ඉතා උතුම් හැසිරීම. 2. සිරිතෙන් පිට ගිය.

අත්‍යාධාර = 1. ඉතා උපකාර ඇති.

අත්‍යානන්ද = (අති + ආනන්ද). 1. ඉතා සතුටු.

අත්‍යාවශ්‍යක = (අති + ආවශ්‍යක). 1. ඉතා අවශ්‍ය. 2. ඉතා වැදගත්.

අත්‍යුත්කර්ෂය = (අති + උත්කර්ෂය). 1. අධික-වර්ණනය.

අත්‍යුත්කෘෂ්ට = (අති + උත්කෘෂ්ට). 1. ඉතා උතුම්. 2. ඉතා උසස්.

අත්‍යුත්තම = 1. ඉතා උතුම්.

අත්‍යුත්තරීතර = 1. ඉතා උසස්.

අත්‍යුද්‍යෝගී = 1. ඉතා උනන්දු වූ.

අත්‍යුන්නත = 1. බොහෝ උස.

අත්‍යුෂ්ණ = 1. ඉතා උණුසුම් වූ.

අත්‍යුද්ගත = 1. ඉතා උඩට ගිය.

අත්ල = 1. අල්ල.

අත්ලස් = (අල්ලස්). 1. තම අදහසට අනුකූලව කරවා ගැනීම පිණිස දෙනු ලබන මුදල්.

අත් ලියවිල්ල = 1. මුද්‍රණය නොකළ - ලේඛනය. 2. නොතාරිස් කෙනෙකු විසින් නොලියූ, ගනුදෙනු කරන්නන් විසින්ම ලියාගත් ලියවිල්ල.

අත්ව = 1. අයත්ව. 2. සන්තකව.

අත්වට = 1. අග්ගලා. 2. පැණියෙන් ඇනූ විලඳ ගුලි.

අත් වලු = 1. පක්ෂීන්ගේ අත් හැඩි.

අත්වණු = 1. රුක් අත්තන 2. වැල් අත්තන.

අත්වර = 1. හස්තවාරය, අත ක්‍රියා කරන වාරය. 2. පාර්ශ්වය. 3. කණියෝරුව, ගෙවල්හි බිත්තිය සවිවීමට බඳින උස් වූ පාදකම.

අත් වරු = 1. හස්ත කර්මාන්තකාරයා.

අත් වළල්ල = 1. අතේ පළඳින වළල්ල.

අත් වසනවා = 1. සඟවනවා.

අත් වාච්චිය = 1. රෝගීන් සුව කිරීම පිළිබඳව අතෙහි පවත්නා බලය. 2. අත්වාසිය. 3. බෙහෙත් ඇඹීම, ලෙඩාට බෙහෙතින් ගුණ ලැබීම.

අත්වාරුව 1. අතට හේත්තු කිරීම. 2. (අනෙකකුගේ) අතේ උපකාරය, අතේ බලය.

අත්වාසිය = 1. අත් වාච්චිය බලන්න.

අත් වැට = 1. පන්දම. 2. අත් ලාම්පුව.

අත් වැලුප් = 1. අතින් ගෙන යන පහන. 2. පන්දම.

අත් වැඩ = 1. තමා උදෙසා කරන කට යුතු. 2. හස්ත කර්මාන්ත. 3. අතින් කරන වැඩ.

අත්වැඩකාරයා = 1. කුලීකාරයා. 2. වැඩට උපකාරවන කැනැත්තා.

අත් වැන්නුම = 1. ආත්ම වර්ණනාව. 2. අඩුවාව. 3. අසී වණ්ණනාව.

අත් වැරැද්ද = 1. ප්‍රමාද දෝෂය. 2. අතින්වූ වැරැද්ද.

අත්වැසි = 1. පහත් වැඩකාරයා.

අත්වැල = 1. ඒදණ්ඩෙහි යන්නන්ට අල්ලා ගැනීම සඳහා බැඳි වැල හෝ රිට. 2. අතුරෙහි යන්නන්ට අල්ලා ගැනීම සඳහා බැඳි වැල. 3. උදව්ව. 4. එකට බැඳී පැවැත්ම. 5. බලි-තොවිල් වලදී කවියේ අග අල්ලන උදව්කාරයා. 6. දෙදෙනෙකුන් බැඳගත් වැලක් වැනි අත්.

අත් වැසියා = (අතවැසියා). 1. ගෝලයෝ සිටින්නා. 2. දාසයා.

අත් වැස්ම = 1. අත් මේස්.

අත් වෑය = 1. කුඩා වෑය.

අත් විදීම = 1. වසූරි ආදි රෝග වැළැක්වීම සඳහා අත්වලට බෙහෙත් විදීම.

අත්විලංගු = 1. අතෙහි දමන මාංචුව.

අත්වීම = 1. අයිතිවීම.

අත්වෙනවා = 1. අයිතිවෙනවා.

අත්සන = 1 අතින් කරන සංඥාව. 2. අතින් කරන හඩ. 3. තමන්ගේ නම ලිවීම හෝ ලකුණක් කිරීම.

අත්සර = 1. අතින් ගෙන යාහැකි තරම් රන් රිදී වස්තු. 2. අතෙහිම තබා ගතයුතු වටිනා දේ. 3. හිත වැඩෙහි හැසිරීම. 3. අතීයෙන් සාරවූ.

අත්සිදුර = 1. ඇඳුමක අත් දැමීමට තිබෙන කොටස.

අත්සුණු = 1. අඹරාගත් වී පොරි. 2. බැදි හාල් පිටි.

අත්සුරු = 1. අත හුරු.

අත්හදා බැලීම = 1. යම් කිසිවක හොඳ - නොහොඳ පරීක්ෂා කොට බැලීම. 3. යම් කිසිවක් ක්‍රියාකාරිකොට පරීක්ෂාකර බැලීම.

අත්හරී = 1. සමාන බල ඇති.

අත්හරිනවා = 1. ඉවත දමනවා.

අත්හල = 1. දුරුකළ.

අත්හැඩි = 1. (පක්ෂීන්ගේ) අත්තටු.

අත්හිටවනවා = 1. නතර කරනවා 2. නවත්-වනවා.

අත්හිස් = 1. අතෙහි මුදුන. 2. උරහිස.

අත්හුරු = 1. පලපුරුදු. 2. යම් කිසිවක් කිරී-මෙහි හුරු-පුරුදුකම් ඇති.

අතාවුදබාල = 1. අතෙහි ආයුධ ඇත්තා; ආරක්ෂක නිලධාරියෙක්.

අතැඹුල = 1. නිසැකව පෙනෙන දේ. 2. අතට ගත් නෙල්ලි ගෙඩිය.

අති = 1. ඉතා. 2. අධික. 3. ඉක්මවූ. 4. අති-ශ්‍රේෂ්ඨ.

අතිඅරහන්ත = 1. සිගලු රහතුන් අතුරින් ශ්‍රේෂ්ඨ රහතුන් වහන්සේ.

අතිළඹසන් = 1. එනම් බෙහෙත් වර්ගය.

අතිළුසු = 1. එනම් වෘක්ෂය.

අතිකාර = 1. ප්‍රමාණය ඉක්මවූ ක්‍රියාව.

අතිකාය = 1. විශාල ශරීරය.

අතික්‍රමණය = 1. ඉක්මවීම. 2. පසුකොට යාම. 3. සංඛුව. 4. ප්‍රමාණය ඉක්මවා යාම.

අතික්‍රාමික බුද්ධිය = 1 සීමාව ඉක්මවා ගිය අදහස් ඇදහීම.

අතික්‍රමික ව්‍යාක්‍ය = 1. වැඩි වර්ණනා සහිත නිගමන.

අතික්‍රාන්ත = 1. ඉක්මගිය. 2. අධිකවූ 3. වැඩි පුර.

අතික්ෂුද්‍ර = 1. ඉතා සියුම්.

අතික්ෂුද්‍ර ප්‍රාණියා = 1. ඉතා කුඩා සතා.

අතිගම්භීර = 1. ඉතා ගැඹුරු.

අතිගර්විත = 1. ඉතා අහංකාර.

අතිතර්ජිත = 1. ඉතා නින්දා කරන ලද.

අතිගරු = 1. ඉතා උතුම්. 2. ඉතා බුහුමන් කටයුතු.

අතිගුහ්‍ය = 1. ඉතා රහසිගත.

අතිචාර = 1. ආචාර සීමාව ඉක්මවා හැසිරීම. 2 වරද කිරීම. 3. පරදාර හෝ පරපුරුෂ සේවනය.

අතිචාරිණී = 1. අති චරණය කරන්නී.

අතිච්ඡත්‍ර = 1. ඉතා මහත් කුඩය.

අතිචූර්ණ කරනවා = 1. හොඳහැටි කුඩු-කරනවා.

අතිජගතී = 1. (අකුරු දෙළොසකින් යුත් පාදයක් ඇති) එනම් ඡන්දස.

අතිජව = 1. අධික වේග ඇති. 2. ඉතා වේගයෙන් දුවන.

අතිජාගර = 1. බොහෝ නිදිවරණ. 2. වැනි නින්දක් නැති. 3. නිල්වකාගා නම් පක්ෂියා.

අතිජාත පුත්‍ර = 1. පියාට වඩා උසස් ව උපන් පුත්‍රයා.

අති ජාති = 1. උතුම් ජාතියක් ඇති.

අති තෘෂ්ණාව = 1. තද ආශාව.

අති තිත්ත = 1. හොඳ ඉවසිලි.

අතිතීක්ෂ්ණ = 1. ඉතා තියුණු.

අතිකාංක්ෂිත = 1. යම් කිසිවක් ලැබීමෙන් ඇතිවූ ඉමහත් සතුට.

අතිථි = 1. ආගන්තුකයා. 2. අමුත්තා.

අතිථි සත්කාරය = 1. අමුත්තන්ට කරන සත්කාරය.

අතිදක්ෂ = 1. ඉතා සමර්ථ.

අතිදාන = 1. අධික දානය.

අතිදිව් = 1. දිවමුල ඇතිවන ගෙඩි වෙසෙසක්.

අතිදිව්‍යරාජ = 1. සියලු දිව්‍ය රාජයන් අතුරින් ශ්‍රේෂ්ඨ දිව්‍ය රාජයා.

අතිදුර්ලභ = 1. ඉතා හිඟ. 2. ලබා ගැනීමට ඉතා අපහසුවූ.

අතිදුෂ්කර = 1. කරන්නට ඉතා අමාරු.

අතිදෘඪ = 1. ඉතා තද.

අතිධෘති = 1. (කාව්‍ය ශාස්ත්‍රය අනුව) අකුරු දහ අටකින් යුත් පාදය. 2. ඉතා දැඩි වෑයම.

අතිදූරේ නිදාන = 1. ඉතා දුරෙහිවූ නිදානය. 2. බුදුවීමට නියත විවරණ නොලද බෝසතුන් වැන් ප්‍රණිධානය පිරීම.

අතිදේව = 1. සංඥානාමයක්. 2. දෙවියන්ටද වඩා ශ්‍රේෂ්ඨ.

අතිදේශ = 1. (ව්‍යාකරණයෙහි) අසමානයක් සමානකොට කීම. 2. එක් තැනක ඇති ස්වභාවය එහින් අන්තැනක ආරෝපනය කිරීම 3. සමාන කිරීම.

අතිධජ = 1. ඉතා මහත්වූ ධවජය.

අතිධාවන = අධිකවූ දිවීම. 2. ඉක්මවා යාම.

අතිනාස් ශ්‍රෝණිම = 1. හරබඩකය; කසාදය.

අතිනේත්‍ර = 1. ශ්‍රේෂ්ඨ ඇසක් ඇති.

අතිපතනය = 1. විනාශය. 2. ඉක්මවා වැටීම හෝ යාම.

අතිපතිත්ති = 1. පෙතක් යන.

අතිපාත = 1. මැරීම. 2. වැනසීම.

අතිපාන = 1. අධික සේ බීම.

අතිපරිශුද්ධ = 1. ඉතා පිරිසිදු වූ.

අතිපරිශෝධක = 1. ඉතා පිරිසිදු කරන්නා.

අතිපරිතෝෂ = 1. ඉතා සිතා උපදවන.

අතිපූර්ණ = 1. සම්පූර්ණයෙන් පිරුණු.

අතිප්‍රපඤ්ච = 1. අධික විස්තරය.

අතිප්‍රභාව = 1, තද දිලිසීම. 2. අතිශයින් බැබළීම.

අතිප්‍රමාණ = 1. වැඩි මහත්.

අතිප්‍රමෝදක = 1. ඉතා සතුට ගෙන දෙන්නාවූ.

අතිප්‍රශ්නය = 1. පිළිතුරු නොදිය හැකි ප්‍රශ්නය.

අතිප්‍රසඞ්ග = 1. බොහෝ සෙයින් සෙදීම. 2. බොහෝ සෙයින් ඇලීම. 3 අතිව්‍යාප්තිය.

අතිබහුල = 1. ඉතා බොහෝ. 2. ඉතා වැඩි.

අතිබ්‍රහ්ම = 1. බඹුන්ටද වඩා ශ්‍රේෂ්ඨ.

අතිභාරත්වය = 1. ඉතා මහත් බව. 2. ඉතා වැදගත් බව. 3. ඉතා බර බව.

අතිභාරධුර = 1. බරපතල.

අතිභාෂණය = 1. ඉතා දොඩමලු ගතිය. 2. ඉතා වාචාලකම.

අතිභාසය = 1. මහත් දීප්තිය.

අතිමන්ද = 1. ඉතා ලැසි. 2. බොහෝ පමා වන. 3. රත්නිටොල්.

අතිමනෝහර = 1. ඉතා සිත්ගන්නා සුලු. 2. ඉතා ලස්සන.

අතිමර්යාද = 1. සීමාව ඉක්මවූ.

අතිමහන්ත = 1. ඉතා මහත්.

අතිමාන්‍ය = 1. ඉතා ගරු කටයුතු. 2. ඉතා ගෞරවණීය.

අතිමාත්‍ර = 1. අධික ප්‍රමාණ.

අතිමුක්ත = 1. යොහොඹුවැල.

අතිමෝද = 1. මහත් සතුට. 2. ඉතා ප්‍රීතිය.

අතිය = 1. ඉතිරි හරිය. 2. ඉතුරු කොටස.

අතියුව = 1. ඉතා බාල.

අතිර = 1. තිර නැති. 2. වෙනස්වන සුලු. 3. චපල.

අතිරක්ත = 1. ඉතා රතු පාට. 2. ඉතා ඇලුණු.

අතිරස = 1. කැවුම් වර්ගයක්. 2. බොහෝ රස ඇති.

අතිරික්ත = 1. ඉතිරි. 2. බොහෝ අධික වූ.

අතිරුචිර = 1. ඉතා ලස්සන. 2. ඉතා කැමති.

අතිරූක්ෂ = 1. ඉතා රළු. 2. ඉතා සතීන.

අතිරේක = 1. වැඩිපුර. 2. වැඩිහරිය. 3. අධිකය. 4. අවශේෂ.

අතිරේක වර්ෂය = 1. අධික අවුරුද්ද.

අති ලජ්ජාන්විත = 1. ඉතා ලජ්ජා සහිත.

අතිවර්තන = 1. ඉක්මවා පැවැත්ම.

අති වර්ණනක = 1. බොහෝ පාට ඇති.

අතිවාක්‍ය = 1. අපවාද. 2. රොස් - පරොස් බස් 3. තද වචන.

අතිවාදය = 1. බැණුම. 2. රළු වචන කීම.

අතිවාහක = 1. නවලමේ ප්‍රධානයා 2. ගෙන යන්නා. 3. පමුණුවන්නා.

අතිවිඩයන් = (අතිවිඩයන්.) 1. ඉවද (එනම් බෙහෙත් වර්ගය.)

අති විරේචන = 1. අතිසාරය.

අති විස්තර = (අති විස්තාර.) 1. ඉතා විස්තර සහිත.

අතිවිෂ = 1. ඉතා විෂ සහිත. 2. බෙහෙත් ගස් වර්ගයක්. (අතිවිසා) ඉවද.

අති ව්‍යාප්තිය = 1. වැඩි පැතිරීම. 2. සීමාව ඉක්මවා පැතිරීම.

අතිශක්‍ර = 1. ශක්‍රයාගේ ගුණ අභිභවනය කොට සිටි. 2. ශක්‍රයන්ටත් වඩා ශ්‍රේෂ්ඨ වූ.

අතිශය = (අතිසය.) 1. වැඩි වූ. 2. බෙහෙවින්. 3. වැඩිකම.

අතිශයෝක්තිය = 1. අධික කොට කීම. 2. වැඩිපුර වර්ණනා කිරීම. 3. කාව්‍යාලංකාරයක්.

අතිශායන = 1. අධික කිරීම.

අතිසය උවම = 1. අතිශයෝපමාව.

අතිසය කියුම = 1. අතිශයෝක්තිය. (එනම් කාව්‍යාලංකාරය.)

අතිසය ලකර = 1. කාව්‍යාලංකාරයක් වශයෙන් දක්වෙන අතිශයෝක්තිය.

අතිසාර = 1. අතිසාරය.

අතිශිෂ්ටාචාර = 1. ඉතා යහපත් ලෙස හැසිරෙන. 2. මහා පැවතුම් ඇති.

අතිසිසිල් = 1. ඉතා සීතල වූ.

අතිසුගන්ධ = 1. සස්සඳ නම් බෙහෙත් වැල. 2. මහා සුවඳ.

අතිශෝභන = 1. ඉතා සිත්කළු. 2. ඉතා අලංකාර.

අතිසංරූඪ = 1. ජය ගැනීම ගැන තද විශ්වාසයක් ඇති.

අති සංඛ්‍යා = 1. ඉතා සවස.

අති සම්පන්න = 1. ඉතා සම්පූර්ණ වූ (පරිපූර්ණ වූ.)

අති සූක්ෂම = 1. ඉතා සියුම්.

අතිසරණ = 1. ගෙනයාම. 2. පය ඉදිරියට යැවීම.

අතිහාසය = 1. ඉතා තද සිනාව. 2. (ඉල-කැබෙන.) අධික සිනාව.

අතීක්ෂණ = 1. මොට්ට.

අතීත් = 1. යොහොඹු වැල.

අතික්කම් = 1. ඉක්මන් කටයුත්ත.

අතීත = 1. ඉක්මුණු; පසුගිය. 2. (ව්‍යාකරණ-යෙහි.) අතීත කාලය.

අතීත අංශ = 1. ඉකුත් වූ කොටස.

අතීත ආලම්බන = 1. අතීත වූ අරමුණ.

අතීන්ද්‍රිය = 1. ඉන්ද්‍රියයන්ට නො දැනෙන. 2. ප්‍රත්‍යක්ෂ නුවූ.

අතීත කථා = 1. ඉක්ම ගිය කාලයෙහි වූ කරුණු පිළිබඳ කථාව. 2. ජාතක කථාව.

අතීතඥාන = 1. අතීත කාලයෙහි වූ කරුණු දැනගන්නා නුවණ.

අතීත තෘෂ්ණා = 1. ගත වූ දෙය පිළිබඳ ආශාව.

අතීත මිත්‍රයා = 1. පැරණි මිතුරා. 2. ඉතා හිත මිත්‍රයා. 3. අඹ යහළුවා.

අතීත සංස්කාර = 1. ඉකුත් වූ සංස්කාර ධර්ම.

අතීව = 1. ඉතා.

අතිසාර = 1. එනම් රෝගය. 2. අධික ලෙස බඩ විරේක වීම.

අතු = 1. ගසක කඳෙන් වෙන්වී ගිය කොටස. 2. උප. 3. දෙවැනි. 4. උපකාර. 5. සිවුරු-වල දික් කැබලි. 6. මුස්න. 7. වී, හාල්.

අතුළඩයන් = 1. එනම් බෙහෙත් වර්ගය.

අතුකැබිය = 1. අතු සමූහය.

අතුකේලම = 1. අනෙකකුගෙන් අසාගෙන කියන කේලම.

අතුකොට්ට = 1. සියම්න බරක් ගෙන යන විට හිසට තබාගන්නා කොට්ටයක් මෙන් තැනූ කොළ මිටිය.

අතුකෝරාළ = 1. දෙවැනි කෝරාළ 2. එනම් මුලාදෑනියා.

අතුගඟ = (අතුගඞ්ගාව.) 1. මහ ගඟකට එක් වන කුඩාගඟ.

අතුගානවා = 1. අමදිනවා. 2. පිසදමනවා.

අතුංශ = 1. මිටි.

අතුගේ = 1. පොල් අතු සෙවිලි කළ ගෙය.

අතුඩ = 1. ඇතුරු. 2. විසිරු.

අතුණ = 1. බඩවැල.

අතුණුබහන = 1. බඩවැල බැඳි සිවියක්.

අතුතු = 1. සත. 2. සර.

අතුනකු = 1. නැමුණු. 2. අයිතිකරගත්.

අතුපතර = 1. අතු සහ කොළ. 2. අතු සමූහය.

අතුපතු = 1. ශාඛා හා කොළ.

අතුපතු ගානවා = 1. අමදිනවා. 2. පිසදමනවා.

අතුසාන් = 1. පිත්තල, රිදී ආදි ලෝහවලින් සෑදූ අතු සහිත සහන්.

අතුපාර = 1. මහා මාර්ගයකට සම්බන්ධ වූ කුඩා පාර.

අතු පාසිනවා = 1. ගස්වල අතු කපනවා.

අතුපියුම් = 1. අතුවල පිපෙන පියුම් වැනි මල් වර්ගයක්.

අතුපොල = 1. මස් මඩුව.

අතුබල්ල = 1. රුකුල. 2 කරුව.

අතුබෝල = 1. කනකම් සඳහා බඳින අතු මිටිය. 2. වතු කුඹුරු ආදියට පණු ආදී සතුන් ගෙන් ඇතිවන උවදුරු වැළැක්වීම පිණිස මතුරා තබනු ලබන මල් හා කොළ ගැසූ මැටි පිඩ.

අතුමඩුව = 1. පොල් අතු වලින් ආවරණය කළ අතු කොටුව. 2. අතු සෙවිලි මඩුව. 3. පොල් අතුවලින් වටකළ වැසිකිළිය.

අතුමාරු = 1. අතු රිකිලි ආදියෙන් කළ මුස්න.

අතුමැසි = 1. මිදු පොල් අතු ඇතිරීමට සෑදූ මැස්ස.

අතුම්බ = 1. දඹුවැල්බැ මිය.

අතුර = 1. සිදුර. 2. ගස් දෙකක් එකට ඇඳි සාඹය. 3. අනන්තර කාලය.

අතුර ගසනවා = 1. ගි ගානවා.

අතුරනවා = 1. (පැදුරු ආදිය) එලනවා. 2. විසුරනවා.

අතුරතුර = 1. අතරින් පතර.

අතුරන්නා = 1. මා පැදුර. 2. මා ගල.

අතුරිකා = 1. හුනංගු. 2. ශීඝ්‍ර කොවු.

අතුරු = 1. අන්තරය. 2. මැද. 3. මැදිහත් වෙන්නා වූ. 4. වෙනස. 5. ඉඩ. 6. අමුත්ත. 7. ඇතිරිය. 8. තොරතුරු. 9. අනය. 10. සමීපය. 11. ගස් එකට ඇඳූ සාඹ.

අතුරු අන්තරා = 1. විපත්ති. 2. හදිස්සි අනතුරු.

අතුරුඋපා = 1. අතරට යෙදෙන සුළු ක්‍රම.

අතුරුකප = 1. අන්තඃ කල්පය. 2. මහා කල්පයක කොටසක්.

අතුරුගේ = 1. කාමරය

අතුරුතුරු = 1. අතර තුර. 2. අතරින් පතර.

අතුරුදන් = (අතුරු දහන් - අතුරුධාන්) 1. අන්තර්ධානය. 2. නොපෙණීයාම.

අතුරු නාට්‍යය = 1. අනු නාටකය.

අතුරුපද = 1. පද්‍යයක දෙවැනි තෙවැනි පාද.

අතුරුපස = 1. සවස් කාලයෙහි කන කෑම. 2. දවසේ පසු කාලයෙහි කන කෑම.

අතුරුඵල = 1. පොල් රා එකතුකොට තබන තැන. 2. පොල් ගස් ඇඳ මදින තැන.

අතුරුපාර = 1. අතුපාර 2. මහපාරකින් ගිය කුඩාපාර. 3. ප්‍රසිද්ධ මාර්ගයක් නොවූ ළඟ පාර.

අතුරුබත් = 1. කෑම වේලා දෙකක් අතර.

අතුරු මං = 1. අතර මඟ.

අතුරුමාව = 1. අක්මාව. 2. උදරයේ දකුණු පැත්තේ පිහිටි යකෘත් නම් මස්පිඩ. 3. කළු කැටුත්ත.

අතුරුයුග = 1 අනාගතකල්පයක් තුළ පිහිටි යුග.

අතුරු යෝජනා = 1. ප්‍රධාන යෝජනාවක වෙනස්කම් ආදියක් කිරීම පිණිස ගෙනෙන යෝජනා.

අතුරුවදන් = 1. අනෙකකුගේ කථාවක් අතරට දමන වචන.

අතුරුවා = 1. ආස්තරණය කරවා. 2. එලා.

අතුරුවෑම් = 1. ඉඩම් දෙකකට මායිම්වන කැලෑ සහිත බිම් පටිය.

අතුරුවෙ = (අතුරු වෙහෙ) 1. වීථිය මැද. 2. වීථිය ඇතුළත.

අතුරු ව්‍යවස්ථාව = 1. පළමු ව්‍යවස්ථාවක් සංශෝධනය සඳහා පණවන ව්‍යවස්ථාව.

අතුරු සිදුරු නැතිව = 1. ඉඩක් කඩක් නැතිව. 2. සම්පූර්ණයෙන්. 3. මුළුමනින්.

අතුරුහසු = 1. බිම්මල් වර්ගයක්.

අතුරෙහි = 1. මධ්‍යයෙහි.

අතුල = 1. අතුල්‍ය. 2. අසමාන. 3 අතුල් තලය (අල්ල) එනම් කාගයා.

අතුල් පත = (ඇතුල් පත) 1. පන් වලින් වියූ උපකරණයක්. 2. පිටි ආදිය දැමීම පිණිස ගන්නා මුළුකැන් ගෙති උපකරණයක්. 3. අත් බත්දේසියක්.

අතුල් පහර = 1. මිට මොළවා ගසන පහර. 2. අතින් ගසන පහර.

අතුලාම්‍ර = 1. වෛශ්‍රවණයාගේ අඹ ගසක්.

අතුල්‍ය = 1. අසම. 2. උපමා නැති. 3. සමාන නැති.

අතුල්‍ය බුද්ධි = 1. අසමාන ඥානවන්තයා.

අතුල්ලනවා = 1. උලනවා. 2. ගානවා.

අතුවාදය = 1. කරුණෙන් පිට යන වාදය.

අතුළ = 1. අතුරුවාවූ 2. එලන ලද.

අතුළු = 1. ඇතුළත්. 2. අඩංගු වූ.

අතෘප්තිමත් = 1. ඇතැයි නොසිතූ. 2. ඇතැයි හැඟීමකට පත්නොවූ.

අතේකිච්ඡ = 1. සුවකළ නොහැකිවූ. 2. අසාධ්‍ය

අතෙවඩුද = 1. පසඟතුරු. (පඤ්චාංගික තූර්ය භාණ්ඩ) 2. සංගීත උපකරණ පස් වර්ගය.

අතෙඹුරු = 1. අන්තඃපුරය. 2. අගමෙහෙසුන් හුවූ රාජස්ත්‍රී සමූහය.

අතොම = 1. අතුරා.

අතෝනා = 1. වාදනය කරන. 2. ශබ්ද කරන.

අතෝර = 1. අතවරය. 2. හිරිහැරය.

අතෝලි = 1. මසුන් අල්ලන දැල් වෙනසක්.

අථර්වන් = (අථර්ව) 1. එනම් වේදය. 2. ශිව.

අද = 1. හෘදය. 2. පත්දුව. 3. මේෂ රාශිය. 4. මේ දවස. 5. අවුස් 6. එළවා. 7. අභ්‍යංගයා. 8. අද තැනන. 9. තෙත්. 10. අළුත්.

අදංශ = 1. අහමක්.

අදක්ෂිණාශී = 1. දක්ෂිණාවට නුසුදුසු. 2. පූජා ලැබීමට නුසුදුසු.

අදකෙළිය = 1. අතබිග ක්‍රීඩාව. (ගුම්මුස් දම්) 2. පත්දු ක්‍රීඩාව.

අදගර = (අජගර) 1. පිඹුරා.

අදණ්ඩ = 1. දඬුවම් නොකිරීම. 2. සැරයටියක් නැති.

අදත්තා = 1. සරණ පාවා නුදුන් ස්ත්‍රී.

අදත්තාදානය = 1. සොරකම.

අදන = 1. දිළිඳු. 2. ජනයා නැති. 3. අනුභව කිරීම. 4. අසුජනය.

අදන් = 1. පීඩාව. 2. වෙහෙස. 3. හිරිහැරය.

අදන්ත = 1. දත්නැති. 2. නොදැමුණු.

අදන්වීම = 1. බැඳී පැවැත්ම. 2. සම්බන්ධය.

අදන්මග = 1. දුර පාර

අදම් = 1. අධර්මය. 2. අයුක්තිය.

අදුම = (අඩම) 1. නිව.

අදමනාම = 1. දුෂ්ට බව.

අදමනීය = 1. දමනය නොකොට හැකි. 2. හීලෑ කළ නොහැකි.

අදමිට්ටු = (අදූමිට්ටු.) 1. අධර්මිෂ්ඨ. 2. අයුතු කරන.

අදමිත = 1. දමයත් නැති. 2. හීලෑ නැති.

අදයාවත් = 1. කාරුණ්‍ය රහිත. 2. අනුකම්පා-වක් නැති.

අදර = 1. ආදරය. 2. කොල්. 3. ආධාරය. 4. පිහිට. 5. ගෞරවය. 6. (ව්‍යාකරණ-යෙහි) විභක්තියක්. 7. ඖෂධ වර්ගයක්.

අදරස = 1. අළුත් රසය.

අදර්ම = 1. අධර්මය.

අදර්ශන = 1. නොපෙණීම.

අදර්ශනීය = 1. නොපෙණෙන 1. නොදැක්ක යුතු.

අදවන = 1. සදවන.

අදෙවි = 1. අජ වීථිය. 2. මේෂ රාශියේ-මාර්ගය. 3. අදේ හැකක.

අදස් = 1. ආදර්ශය 2. කැඩපත. 3. අභිප්‍රාය. 4. අදහස.

අදහුන් = 1. නො පෙණෙන. 2. අදෘශ්‍ය.

අදිස් = 1. නොපෙණීයාම.

අදස්නා = 1. අඩ.

අදහනවා = 1 විශ්වාස කරනවා. 2. වැඳුම්-පිදුම් කරනවා. 3. සරණ යනවා. 4. පිහිට බලාපොරොත්තු වෙනවා.

අදහනීය = 1. නො දැවිය යුතු; දැවිය නොහැකි.

අදහස = 1. අධ්‍යාසය. 2. අභිප්‍රාව. 3. යමක් කිරීමට හේතුව. 4. කල්පනාව. 5. අරමුණ. 6. බලාපොරොත්තුව.

අදහළ = 1. කියූ. 2. පුදුනු.

අදහැකි = 1. තමා තුළ. 2 අධ්‍යාත්මය.

අදළ = 1. රළු නුවූ. 2. දළු නුවූ. 3. සිහින්. 4. මොළොක්.

අදහාගන්නවා = 1. විශ්වාස කරනවා. 2. භක්තිය ඇතිකර ගන්නවා.

අදහොට = 1. කුඩුරු කලෙක දී. 2. ළඟදීම.

අද්ද = 1. ආර්ද්‍ර. 2. තෙත්.

අද්දර = 1. ඉවුර. 2. වාටිය. 3. කොණ. 4. අයින. 5. කෙළවර.

අද්දනවා = 1. අදින්නට සලස්වනවා.

අද්දිගුරු = 1. අමු ඉඟුරු.

අද්දිල්ල = 1. අජිත නම් රට.

අද්දුටු = (අක්දුටු.) 1. ප්‍රත්‍යක්ෂ වශයෙන් දැකගත් 2. අත්ගඳ බලා දැනගත්.

අද්දෝනය = (අත් දෝතේ.) 1. අත් සේදීමට ගන්නා භාජනය.

අද්ධාන = 1. දීර්ඝ කාලය.

අද්භූත = 1. අපූරු. 2. පුදුම ගෙනදෙන. 3. ආශ්චර්ය.

අද්‍යතන = 1. අද දවස. 2. මෙදින.

අද්‍රව්‍ය = 1. ද්‍රව්‍ය නොවූ.

අද්‍රව්‍ය දෘෂ්ටිය = 1. යමක් සිහින් උපදවා ඇති කිරීමේ ධර්මය. 2. නිර්මාණ වාදය.

අද්‍රිතනයා = 1. පාර්වතී නම් හිමාලය කඳු දුව.

අද්‍රිය = 1. සුයබියා. 2. පර්වතය. 3. ගහ.

අද්‍රිජ = 1. පර්වතයෙහි උපන්.

අද්‍රිජා = උමා දේවිය.

අද්‍රිරාජ් = 1. පර්වත රාජයා. 2. හිමාලය කන්ද.

අද්වකාත් = 1. අධිනීතිඥයා.

අද්වය = 1. දෙවැනියකු නැති. 2. එකම වූ. 3. දෙකක් නොවන.

අද්වයවාදී = 1. බුදුන් වහන්සේ. 2. එකම ධර්මයක් ඇත්තා වූ. 3. දෙ ලෙසක් නො කියන.

අද්වේෂී = 1. වෛර නැති. 2. ද්වේෂය නැත්තා වූ.

අද්වෛත = 1. දෙයාකාර නුවූ. 2. දෙකක්-නැති. 3. නිසැක.

අදෘශකයා = 1. නො දක්නා.

අදරනවා = (හදරණවා.) 1. පාඩම් කරනවා. 2. කට පාඩම් කරනවා. 3. ඉගෙන-ගන්නවා.

අදෘශ්‍ය = 1. නො දැකිය යුතු. 2. දැකීමට-නුපුළුවන් වූ.

අදුල = (ගදුල.) 1. පාවම් කුළු. 2. කටපාඩමෙන් කියවූ. 3. සම්බන්ධ නම. 4. එකතුවූ.

අදි = 1. අදියර යනාදියෙහි වැටෙන අව්‍යය පදයක්.

අදික = 1. බොහෝ. 2. වැඩි.

අදිකරණ = 1. (ව්‍යාකරණයෙහි) ආධාර විභක්තිය. 2. නඩු විසඳීම. 3. විනිශ්චය පිළිබඳ.

අදිකරණී = 1. කිණිසිරය.

අදිකාරම් = 1. සිංහල ආණ්ඩුවේ උසස් ගෞරව පදවියක්. 2. ප්‍රධානාමාත්‍යයා.

අදිකාරි = 1. කළමනාකාරයා 2. බලය ලැබූ ප්‍රධාන නිලධාරියා. 3. විනිශ්චයකාරයා.

අදිටන් = 1. අධිෂ්ඨානය.

අදිටු = 1. නුදුටු. 2. අදෘෂ්ට.

අදිති = 1. සූර්යයාගේ මව. 2. දක්ෂ ප්‍රජාපතිහුගේ දුව. 3. කාශ්‍යප සෘෂියාගේ භාර්යාව.

අදිනාකූර් නෑමය = (අදින ගැටය.) 1. අදින විට ඉබේ ලිහෙන ගැටය.

අදින්න = 1. නුදුන්.

අදින්නාදානය = 1. නුදුන් දෙයක් ගැනීම. 2. හොරකම.

අදිප = 1. අධිපතියා. 2. ප්‍රධානයා.

අදිපතියා = 1. ප්‍රධානයා. 2. නායකයා. 3 මූලිකයා.

අදිස්සුව = 1. ලි රාමුව. 2. ලි වැට. 3. අත්කළු ගැසී ඇඳ තට්ටුව. 4. කුනිම්බිය.

අදිමදි කරනවා = 1. ඇලි - මැලිකම් දක්වනවා. 2. උනන්දුවක් නො දක්වනවා. 3. අරුචි කරනවා.

අදිමන් = 1. අධික මාන්නය. 2. අභිමානය.

අදිමොක් = 1. අධිමෝක්ෂය. 2. නිශ්චය.

අදිමොදගම් = 1. අසමොදගම්.

අදියර = 1. පරිච්ඡේදය. 2. ප්‍රධාන අමාත්‍යයා. 3. බලය. 3. අභිනිවාසිකම. 4. තනතුර. 5. අධික ක්‍රියාව.

අදියස = 1. අධ්‍යාශය.

අදිරජ = 1. අධිරාජ්‍යය.

අදිරත් = 1. රසදිය.

අදිරෂ්ට = 1. බැඳපු වී පොරි.

අදිසි = (අදිස්) 1. නොපෙනෙන. 2. හදිසිය.

අදිස්සි = 1. හදිස්සි. 2. ඉක්මන්. 3. අනතුර.

අදීර්ඝ = 1. දුර නොවූ.

අඳ = 1. අණ්ඩය. 2. කොටසට කුඹුර වැඩකිරීම.

අඳගොවියා = 1. කොටසට කුඹුරු වැඩ කරන්නා.

අඳුන් = 1. කුඹුක් ගස. 2. අර්ජුන කුමාරයා 3. කළු පැහැය.

අඳුන්දිවියා = 1. දිවි වර්ගයට අයත් එනම් සත්වයා.

අඳුන් නෑම් = 1. අර්ජුන ගේ දුන්න.

අදූර = 1. සමීපය. 2. නොදුර.

අඳුව = 1. දුනුකැට ක්‍රීඩාව. 2. සුදු සෙල්ලම. 3. සවිර නැති.

අදූෂිත = 1. කිලුටු නොවූ. දූෂණය නොවූ.

අදෘඪ = 1. තද නැති. 2. මොළොක් වූ.

අදෘශ්‍ය = 1. නොපෙනෙන. 2 දක්ක නොහැකි. 3. නො දක්ක යුතු.

අදෘශ්‍යමාන = 1. නො පෙනෙන.

අදෘෂ්ටමිත්‍ර = 1. නොදුටු මිත්‍රයා.

අදෙස් = 1. ආදේශය, (ව්‍යාකරණයෙහි අකුරු මාරු කිරීම. 2. දූතමුඛකම. 3. නැවතත. 4. වෙෂය නැති. 5. ආඥාව.

අදේ = 1. අදේ නැකත; හවැනි නැකත.

අදේව දෘෂ්ටි = 1. දෙවියන් නැත විශ්වාසය නැති. 2. ලොව මැවූ දෙවියකු නැතැයි යන දෘෂ්ටිය.

අදෙස් = 1. දෙස් නැති. 2. වෙෂ නැති. 3. නිදෙස්.

අදෙජ = 1. දීප්තිය නැති. 2. නොබබලන. 3. ළහක.

අදෝනාව = (අදෝනාව.) 1. විලාපය. 2. දුක කියා - තියා හැඬීම.

අදෝමං = 1. මල මාර්ගය. 2. අධෝමාර්ගය.

අදෝමුඛ = (අදෝමුව.) 1. අධෝ මාර්ගය.

අධෝවායු = 1. අධෝමාර්ගයෙන් නික්මෙන වායුව.

අද්වේෂ = 1. ද්වේෂ නැති.

අධඃ = 1. යට. 2. පහත.

අධඃකාය = 1. ශරීරයෙහි පහළ කොටස.

අධඃකෘත = 1. යටිකුරු කළ. 2. යටට හැර වූ.

අධඃපාත = 1. පහත හෙළීම.

අධඃ ප්‍රදේශ = 1. පහළ ප්‍රදේශය.

අධන = (අධනී.) 1. දිළිඳු. 2. ධනය නැති.

අධන්‍ය = 1. පින් නැති. 2. කාලකන්නි.

අධම = 1. නීච. 2. දුෂ්ට. 3. දුශ්චරිත කරන. 4. පහත්.

අධම්ම = 1. අධර්මය.

අධම්මික = 1. අයුතු. 2. අයහපත්. 3. දැහැමි නොවූ.

අධර = 1. පහත්. 2. යට. 3. (යට) තොල.

අධර ඕෂ්ඨ = 1. යටිතොල.

අධර යුග්මය = 1. තොල් දෙක.

අධර්මය = 1. අයුක්තිය. 2. ධර්මය නොවන ක්‍රියාව. 3. නරක දේ.

අධර්මචර්යා = 1. අධර්මයෙහි හැසිරීම. 2. දුශ්චරිත කිරීම.

අධර්මවාදී = 1. අධර්මය දේශනා කරන. 2 අයුක්තිය හොඳයයි කීම.

අධර්ම වෙළෙඳම්පස = 1. අයුතු වෙළඳම් පස. (අවි - තිරිසන් - මිනිස් - විෂ - මත්පැන් යන ධර්මානුකූල නොවූ වෙළඳම් පස)

අධර්මිෂ්ඨ = 1. ධර්මිෂ්ඨ නොවන. 2. අයහපත්.

අධර්ම්‍ය = 1. අයුතු. 2. දුෂ්ට.

අධඃස්ථ = 1. යටවූ. 2. පහතින් පිහිටි.

අධ්‍යක්ෂ = 1. ප්‍රධානයා. 2. කටයුතු යොදන්නා.

අධ්‍යයනය = 1. ඉගෙනීම.

අධ්‍යශනය = 1. වැඩිපුර කෑම. 2. කලින් කෑ දෙය දිරවන්නට මත්තෙන් නැවතත් කෑම.

අධ්‍යාත්මික = 1. හිතතුළ වූ. 2. තමා පිළිබඳ. 3. තමාට අයත්. 4. අතුළත පිළිබඳ.

අධ්‍යාපනය = 1. ඉගැන්වීම.

අධ්‍යාපක = (අධ්‍යාපිකා) 1. ගුරුවරයා.

අධ්‍යාපනාධ්‍යක්ෂ = (අධ්‍යාපන + අධ්‍යක්ෂ) ඉගැන්වීම පිළිබඳ කටයුතු කරන මණ්ඩලයේ ප්‍රධානයා.

අධ්‍යාපිත = 1. ඉගැන්නුවාවූ.

අධ්‍යාය = 1. පරිච්ඡේදය. 2 කොටස.

අධ්‍යාරෝපණය = 1. පැවරීම. 2. උඩතැබීම. 3. නැංවීම.

අධ්‍යාවරෝහ = 1. මුහුදෙහි සිටිනැයි සලකනු ලබන මහා මත්ස්‍යයෙක්.

අධ්‍යාශය = 1. අදහස.

අධ්‍යාහාර = 1. ප්‍රකාශ නොකළ දේ යොදා ගන්නාවූ. 2. (ව්‍යාකරණයෙහි) අඩුවූ වචන යනාදිය යොදා ගැනීම.

අධ්‍යාහෘත = 1. අධ්‍යාහාර කරන ලද. 2. පමුණුවා ගත්.

අධ්‍යුපෙක්ෂණ = 1. පක්ෂයක් නොගෙන මැදහත්වීම.

අධ්‍යේෂක = 1. ආරාධනය කරන්නා. 2. ඉල්ලන්නා.

අධ්‍යේෂණය = 1. ඉල්ලීම. 2. ආරාධනය.

අධාර්මික = 1. අයුතු. 2. අයහපත්.

අධි = 1. වැඩි. 2. උසස්. 3. ප්‍රධාන.

අධික = 1. වැඩි. 2. බොහෝ.. 3. ඉතුරු.

අධික අක්ෂර = 1. අවශ්‍ය ගණනට වඩා වැඩි වූ අකුරු.

අධික අවුරුද්ද = 1. දින 366 ක් ඇති අවුරුද්ද.

අධික භාෂණය = වැඩි අලඞ්කාර වර්ණනාව.

අධිකරණය = 1. නඩු ඇසීම. 2. උසාවිය. 3. වස්තුව. 4. ආධාරය. 5. ඉතා උතුම්කම. 6. හබය.

අධිකරණ අමාත්‍යයා = 1. යුක්තිය පසිඳලීම පිළිබඳ කටයුතු භාර ඇමතිවරයා. 2. නඩු සම්බන්ධ කටයුතු භාර අමාත්‍යයා.

අධිකාරම = (අදිකාරම යන්න බලන්න)

අධිකාරය = 1. ග්‍රන්ථයක පරිච්ඡේදය. 2. බලය. 3. හිමිකම. 4. ආරම්භය. 5. නිලය. 6. අධික ක්‍රියාව. 7. ප්‍රධාන අමාත්‍යයා. 8. ප්‍රාර්ථනාව. 9. සම්බන්ධය.

අධිකාරී = 1. අධිකාරම් කෙනෙකුට අයත් නින්දගම. 2. ප්‍රධානයා.

අධිකාරී පත්‍ර = 1. බලය පවරා දෙන අත්ත පත්‍රය.

අධිකෘත = 1. කටයුතු සලස්වනලද. 2. ඉල්ලන ලද. 3. අධිපති. 4. ප්‍රස්තුත. 5. බලයට පත්කළ.

අධිකෝත්කෘෂ්ට = 1 ඉතා උතුම්. 2. ඉතා උසස්.

අධික්‍රමණය = 1. බලයෙන් අවුත් අල්ලා ගැනීම.

අධික්‍රියා = 1. අධිකවූ ක්‍රියාව. 2. වැඩි වැඩ.

අධික්ෂිප්ත = 1. දොස් තබන ලද. 2. නින්දා කරන ලද.

අධික්ෂේප = 1. නින්දාව.

අධිගත = 1. පැමිණි. 2. අවබෝධකළ. 3. මාර්ග ඵල ප්‍රාප්ත.

අධිගමනය = (අභිගමය) 1. අවබෝධය. 2. රහත් බවට පැමිණෙන උසස් මාර්ගය. 3. ඥානය. 4. ඉගෙණීම.

අධිගම ලාභී 1. සෝවාන් ආදී මාර්ග ඵල ලැබූ.

අධිගම අරහ = 1. අධිගමයට සුදුසු.

අධිගම සද්ධර්ම = 1. අවබෝධ කරනු ලබන සද්ධර්මය. 2 සියලු සද්ධර්මය.

අධිගම සම්පදා = 1. අධිගමය නමැති සම්පත්තිය.

අධිගම ගුණ = 1. උතුම්වූ ගුණය. 2. ශ්‍රේෂ්ඨ වූ ගුණය.

අධිගෘහීත = 1. අරක්ගත්. 2. වැඟී සිටින. 3. අයිතිකරගත්.

අධිඝාත් = 1. අභිඝාතය. 2. ඉවාගැනීම.

අධිධ්‍යාන් = 1. අභිධ්‍යානය.

අධිදේව = 1. අධිපති දෙවියා. 2. දෙවියන්ට අධිපතියා.

අධිදෛවික = 1. දේවත්වය ඉක්මවූ.

අධිනීතිඥයා = 1. ප්‍රධාන නීතිඥයා (අද්වකාත්)

අධිපති = 1. ප්‍රධාන. 2. නායක.

අධිප්‍රඥා = 1. අධික වූ ප්‍රඥාව. 2. මාර්ග ඵල ප්‍රඥාව.

අධිප්‍රාය = 1. අදහස.

අධිප්‍රේත = 1. අදහස් කළ.

අධිපති = බ්‍රහ්මයන්ටද වඩා උසස්.

අධිමන් = 1. අධික මාන්නය.

අධිමාත්‍ර = 1. වැඩිපුර. 2. ප්‍රමාණයට වඩා අධික.

අධිමාසය = 1. අධිකවූ මාසය. 2. සූර්ය මාස 12ක් තුළ චන්ද්‍ර මාස 13ක් වීමෙන් වැඩි වන මාසය.

අධි මාස වර්ෂය = 1 චන්ද්‍ර මාස 13 ක් ඇති අවුරුද්ද.

අධිමිත්‍ර = 1. කල්‍යාණ මිත්‍රයා. 2. ශ්‍රේෂ්ඨ මිත්‍රයා

අධිමුක්ත 1. නැමුණු. 2. ඇලුණු.

අධිමුක්තිය = 1. මිදී නිදහස්වීම. 2. අදහස. 3. දැඩි විශ්වාසය. 4. සිත නැමීම. 5. ඇදහීම. 6. සසරින් මිදීම.

අධිරාජ= 1. අගරජ. 2. රජුන්ගේ රජ. 3. යටත් රජුන් ඇති ප්‍රධාන රජ.

අධිරාජ්‍යය = 1. අගරජකුගේ රාජ්‍යය. 2. යටත් රටවල් ඇති මහා රාජ්‍යය.

අධිරෝහණිය = 1. ඉණිමග. 2. තරප්පුව.

අධිශර = 1. නිවන් දැකීමට හේතුවන උසස් පින්. 2. කාල පරිච්ඡේදය.

අධියෝග = 1. ශ්‍රේෂ්ඨ යෝගය.

අධිලෝකය = 1. මුළුලෝකය.

අධිවචනය = 1. නාමය 2. ගරුනාමය. 3. පර්යාය වචනය.

අධිවර = 1. ඉතා උතුම්. 2. ප්‍රධාන.

අධිවසනාය = 1. පදිංචිවීම.

අධිවාස = 1. ශ්‍රේෂ්ඨ වාසස්ථානය. 2. ඉඩම.

අධිවාස = (අධිවාසී) 1. පදිංචිකාර.

අධිවාසනාය= 1. පිළිගැනීම. 2. ඉවසීම. 3. සුවඳ ගැල්වීම. 4. වාසය කිරීම.

අධිෂ්ඨාන = 1. "මෙය මෙසේ වේවා"යි ඉටා-ගැන්ම. 2. නො සෙල්වෙන. 3 වෙනස් නොවන. 4. ස්ථිර ලෙස සිත පිහිටුවා ගැනීම.

අධිෂ්ඨිත = 1. ස්ථිර අදහස් ඇති. 2. නියම වූ. 3. අධිෂ්ඨාන කළ.

අධීත = 1. උගන්නා ලද; ප්‍රගුණ කළ.

අධීන = 1. යටත්.

අධීර = 1. ධෛර්‍ය නැති. 2. මෝඩ.

අධීශ = 1. ස්වාමියා. 2. ප්‍රධානයා.

අධීශ්වර = (අධි + ඊශ්වර.) 1. ප්‍රධාන අධිපතියා. 2. අග රජ.

අධුනා = 1. දැන්. 2. වර්තමාන 3. දැන් පවත්නා කාලයෙහි.

අධෛර්‍ය = 1. ධෛර්‍ය නැති. 2. උත්සාහ-වත් නොවූ.

අධෝ = 1. යට. 2. පහත.

අධෝගත = 1. යටට ගිය. 2. පහත බැස්ස.

අධෝගාමි = යටට යන සුළු.

අධෝ භාගය = 1. යට කොටස.

අධෝ භුවන = 1. පාතාල ලෝකය. 2. පොළව යට පිහිටි ලෝකය.

අධෝමුඛ = 1. මුණින් තලා වූ. 2. මල මාර්ගය. 3. ගුදය.

අධෝ මුඛය = (අධෝ මාර්ගය.) 1. මල මාර්ගය.

අධෝ ලම්බ = 1. පහතට එල්ලී වැටෙන.

අධෝ ලිපි = 1. පොත් පිටුවල ඉරට යටින් සඳහන් වන ලියවිලි. 2. යටින් කළ ලියමන.

අධෝශීර්ෂ = 1. හිස පහත් කොට ඇත්තා වූ.

අධ්‍රැව = 1 ස්ථිර නැති. 2. අනුමාන.

අප = 1. ජලය. 2. "මා" යන්නෙහි බහු වචනය. 3. අපේ. 4. අප විසින් 5. අපට 6. තරක. 7. පහත.

අපකර්ෂක = 1. පහතට අදින. 2. පහත් ගති ඇතිකරන.

අපකාරය = 1. අනුපකාරය. 2. වැරැද්ද.

අපකීර්තිය = 1. අවනම්බුව. 2. නින්දාව. 3 අගුණ කථාව.

අපකෘෂ්ට = 1. පහත්. 2. නීච.

අපක්ෂව්‍ය = 1. (කෑම) නොදිරන.

අපක්‍රමය = 1. අනිසි පිළිවෙළ. 2. ක්‍රම විරෝධය. 3 පලායාම. 4. පහවීම. 5. පසු බැසීම.

අපක්‍රියාව = 1. අපකාරය. 2. දුෂ්ට ක්‍රියාව. 3. අවකල් ක්‍රියාව. 2. වැරැද්ද.

අපක්‍රෝශ = 1. නින්දා කරන. 2. නින්දාව.

අපක්ව = 1. නො පැසුණු. 2 (කෑම) නොදිරූ.

අපක්ෂ = 1. පක්ෂයක් නැති. 2. මධ්‍යස්ථ. 3. විරුද්ධ.

අපක්ෂපාත = 1. පක්ෂයක් නැති කම. 2. මධ්‍ය-ස්ථ බව. 3. ළැදි කමක් නැති.

අපගත = 1 පහ වූ. 2. වෙන් වූ.

අපගමනය = (අප ගමය.) 1. පහවීම. 2. මැරීම. 3. වෙන්වීම.

අපගර්වී = 1. උඩඟු නොවූ. 2. නැවත නූපදනා.

අපගෙන් = 1. අපෙන්. 2. අප කෙරෙන්.

අපගේ = 1. අපේ. 2. අප සතු.

අපඝාත = 1. අධම ලෙස මැරීම.

අපචය = 1. ගෙවීයාම. 2. නැතිවීම. 3. රැස්-කළ දෙය විසුරුවීම. 4. සිඳ බිඳ දැමීම. 5. ගරු කිරීම.

අපචයගාමී = 1. නිවණට යන්නා.

අපචාරය = 1. නපුරු හැසිරීම. 2. වැරදි හැසිරීම. 3. වෙන්ව යාම.

අපචායන = 1. ගරු බුහුමන් කිරීම.

අපචායික = 1. පුදන්නා. 2. පුදන.

අපචිත = 1. ආචාර කරන ලද. 2. පුදන ලද.

අපචේතා = 1. මුදල් නැති කරන්නා. 2. ආදායමට වඩා වියදම් කරන්නා.

අපට = 1. අප වෙත.

අපටු = 1. පටු නොවූ. 2. සමර්ථ නැති. 3. පලල්.

අප නයනය = 1. දුරු කිරීම. 2. ගෙවීම. 3. කැඩීම.

අපනාමන = 1. ඉවත් කිරීම. 2 නෙරපීම.

අපනිහිත = 1. සැඟවූ. 2. ඉවත් කළ.

අපනීත = 1. ඉවත්කළ. 2. පහකළ. 3. දුරුවූ. 4. ගෙවන ලද.

අපනීය = 1. ඉවත් කොට.

අප නොදන = (අප නුදන) 1. දුරු කිරීම.

අපන්නක = 1. මිථ්‍යාමත ඇති. 2. වැරදි මඟට වැටුණු.

අපන්නකත්ත = 1 බුදුන් පළමු පහළවීම.

අපණ්ඩිත = 1. පණ්ඩිත නොවන. 2. නුගත්.

අපණ්ණක = 1. කොළ නැති. 2. නිදෙස්. 3. සත්‍ය වූ. 4. සථිර.

අපතර්පණය = 1. සතුටු නොවීම. 2. නිරාහාරයෙන් සිටීම.

අපතේ අරිනවා = 1. ප්‍රයෝජන නොගෙන විනාශවන්නට ඉඩහරිනවා. 2. නාස්ති කරනවා.

අපත් ප්‍රාප්ත = 1. විපත් පැමිණුණු.

අපත්‍ය ඝාතනය = 1. තමන් ගේ දරුවන් මැරීම.

අපත්‍යය = 1. දරුවා.

අපත්‍ය ශත්‍රු = 1. කකුළුවා.

අපත්‍ර = 1. පත්‍ර නැති. 2. කොළ නැති. 3. පියාපත් නැති.

අපත්‍රපා = 1. ලජ්ජාව. 2. බිය. 3. පවට බිය.

අපත්වීම = (අපවත් වීම.) 1. පරලොව යාම. 2. ඉකුත් වීම.

අපථ = 1. නොමඟ. 2. වැරදි මඟ. 3. හොර පාර. 4. නො පැමිණීම.

අපප්‍රථ = 1. නො පැතුරුණු.

අපථ්‍ය = 1 (කෑමට.) අගුණ. 2. නුසුදුසු.

අපත්ථිත = 1. නො පැතූ.

අපද = 1. පා නැති. 2. අඩියක් නැති. 3. හේතු රහිත.

අපදන් = 1. අපදානය. 2. අපාදානය. 3. අස්කරන. 4. නොපෙනී නැතිවන. 5. (ව්‍යාකරණයෙහි) අවධි විභක්තිය.

අපදන්වෙනවා = 1. නැතිවෙනවා 2. නොපෙනී යනවා.

අපදානය = 1. චරිතය. 2. යහපත් ක්‍රියාව. 3. කථාව. 4. බුදු චරිතාදිය ඇතුළත් ග්‍රන්ථයක්. 5. ජීවන චරිතය. 6. උපදේශය. 7 ඉවත් වීම.

අපදාර්ථය = 1 නැති දෙයක්. 2. විපත.

අපරදිග = (අවරදිග) 1. බස්නාහිර.

අපදිශය = 1. අතුරු දිශාව.

අපදිශන = 1. දැක්වීම. 2. කරුණු කීම.

අපදේශය = 1. බොරු පෙන්නුම 2. වෙන්වලා ගැනීම. 3. ව්‍යාජය. 4. කාරණය. (සාධකය.) 5. දැක්වීම.

අපධාරණ = 1. පිඟන 2. වහන්තරාව.

අපපති = 1. ජලාධිපතියා. 2. වරුණ දෙවිරජ.

අපපාඨ = 1. වැරදි පාඨය.

අප බෘංහණ = 1. නො වැඩීම.

අපභ්‍රංශ = (අපභ්‍රංශ.) 1. ව්‍යාකරණයට විරුද්ධවූ. 2. භාවිත වන ක්‍රමයට නො ගැලපෙන භාෂාව. 3. කිරාතාදීන් කථාකළ ප්‍රාකෘත භාෂාවක්. 4. අධර්ම හේතුවෙන් වැටීම. 6. (සංස්කෘත නාටකයේ දැක්වෙන) භාෂා හයෙන් එකක්.

අපමණ = 1. ප්‍රමාණයක් නැති. 2. බොහෝ.

අපමානය = (අපමාණය.) 1. නින්දාව. 2. අගෞරවය.

අපමාර = 1. අපස්මාර රෝගය.

අපයාත = 1. පහව ගිය. 2. වෙන් වූ.

අපර්යන්ත = 1. කෙළවරක් නැති. 2. අපිරියක්. 3. නිමක් නැති.

අපර්යාප්ති = 1. අසම්පූර්ණ. 2. අසමත්.

අපයානය = 1. වෙන්වීම. 2. අහක් ව යාම.

අපයායී = 1. පහව යන.

අපර = 1. වෙන. 2. අනෙක්. 3. විරුද්ධ. 4. පසුව. 5. බස්නාහිර. 6. ඇතාගේ පසු පැත්ත.

අපර ගෝදාන = 1. සතර මහ දිවයින් අතුරින් එකක්. 2. බස්නාහිර දිශාව.

අපරන්ත = 1. මුං - මෑ ආදි ධාන්‍ය වර්ගී. 2. අග කෙළවර 3. එනම් රට.

අපරතිය = 1. විරාගය 2. නැවැත්ම. 3. නො-ඇල්ම. 4. ක්ලේශ නැති බව.

අපරත්වය = 1. විරුද්ධ භාවය. 2. පසුව පැමිණීම.

අපර පක්ෂය = (අවර පක්ෂය.) 1. අන්‍ය පක්ෂය 2. කෘෂ්ණ පක්ෂය. 3. කාල පක්ෂය. 4. චන්ද්‍ර මාසයේ පසු කොටස.

අපර ප්‍රජා = 1. යහළුවන් ගේ දරුවන්ගේ දරුවෝ.

අපරභාග = 1. පස්වරු. 2. සවස් කාලය.

අපරාජිත = 1. නො පරදවන ලද. 2. පැරදවිය නො හැකි. 3. සම්බුද්ධයන් වහන්සේ. 4. විෂ්ණු. 5. ශිව.

අපරාධ = වැරදි. 2. නො කට යුතු දේ.

අපරාධික = 1. අපරාධ සහිත.

අපරාධීන = 1. අනුන් අයත් නුවූ. 2. වසඟ නැති. 3. නිදහස්.

අපරාන්ත = 1. බස්නාහිර කොටසක්. 2. බස්නාහිර දේශීහු.

අපරාන්තය = 1. අවසානය.

අපරාපසී = 1. (අපර + අපසී.) විපාක දෙන.

අපරාපසී වේදනීයකම් = 1. කිසියම් අත් බැවකදී අවකාශයක් ලත් විට විපාක දෙන කර්ම. 2. අහෝසි නොවන කර්ම.

අපරාර්ධ ගෝලය = 1. පෘථිවියේ බස්නාහිර භාගය.

අපරාහ්ණය = 1. දවසේ අන්තිම කොටස. 2. සවස් කාලය.

අපරික්ෂිප්ත = 1. වටලා නැති. 2. වට කොට නැති.

අපරික්ෂීණ = 1. නො පිරිහුණු. 2. පරනොවන.

අපරිග්‍රාහිත = 1. නො පිළිගන්නා ලද.

අපරිචිත = 1. නුපුරුදු.

අපරිච්ඡින්න = 1. නො සිඳී පවත්නා. 2. නො බෙදුණු. 3. නො කැඩුණු. 4. වෙන් නොකළ. 5. සීමාරහිත.

අපරිඥාත = 1. නො දන්නා ලද. 2. මනායේ අවබෝධ නො කළ.

අපරිණත = 1. නොමේරූ. 2. නො පැසුණු.

අපරිණාම = 1. වෙනස් නොවන.

අපරිතප්ත = 1. රත් නොකළ.

අපරිදේවිත = 1. නො වැලපුණු. 2. ශෝක-නුවූ.

අපරිපාක = 1. නො පැසුණු.

අපරිපූර්ණ = 1. සම්පූර්ණ නුවූ. 2. අසම්පූර්ණ.

අපරිභෝගය = 1. පරිභෝග නො කිරීම. 2. පාවිච්චි නො කිරීම.

අපරිමණ්ඩල බීජය = 1. අඩිවීපය.

අපරිමාණ = 1. ප්‍රමාණයක් නැති.

අපරිමිත = 1. ප්‍රමාණයක් නොකළ 2. ප්‍රමාණ-යක් නැති.

අපරිමේය = 1. මැණිය නො හැකි. 2. අපමණ. 3. නිමක් නැති.

අපරිශුද්ධ = 1. පිරිසුදු නැති. 2. අපවිත්‍ර.

අපරිහානී = 1. වැළැක්විය නොහැකි.

අපරීක්ෂාකාරි = 1. සැලකිල්ලක් නැති. 2. වග-විභාගයක් නැති. 3 පරෙස්සම් නැති.

අපරීක්ෂාව = 1. අපරෙස්සම් කම. 2. නොසැල-කිල්ල.

අපරීක්ෂිත = 1. පරීක්ෂා නොකරන ලද.

අපරෝක්ෂ = 1. ඉන්ද්‍රිය විෂය නුවූ. 2. පැහැදිලිව නොපෙනෙන.

අපරෝපක්‍රම = 1. වෙන උපක්‍රම. 2. වෙනත් මාර්ග.

අපර්‍යාප්ත = (අ + පරි + ආප්ත) 1. ලබා නො-ගත්. 2. අසම්පූර්ණ.

අපල = (අඵල) 1. පල නැති. 2. ප්‍රයෝජන නැති. 3. නිෂ්ඵල. 4. අසමර්ථ. 5. ග්‍රහයන් ගෙන් සිදුවන විපත්.

අපලාප = 1. සඟවා කීම. 2. බොරුව. 3. ප්‍රයෝජනවත්.

අපලාපය = 1. නැතැයි කීම. 2. රහස් සැල-කිල්ල.

අපලෝකන = 1. බැලීම.

අපවග්ග = (අපවග්ග - අපවර්ගී) 1. නිර්වාණය.

අපවිද්ධ = 1. මැරුණු. 2. ගියාවූ. 3. අවසානවූ. 4. නැතිවූ.

අපවරකය = 1. කාමරය. 2. වාසය කරන ගෙය.

අපවග්ගී = 1. (නැවත ඉපදීමක් නැති) නිර්වාණය.

අපවර්ජනය = 1. දුරුකිරීම. 2. අත්හැරීම. 3 වක්ව යෑම. 4. දානය කිරීම. 5. නිර්වාණය.

අපවර්තිකය = 1. ගණිතය පිළිබඳ ක්‍රමයක් (මහා අපවර්තීකය)

අපවර්තනය = 1. ඉතා සුළුකිරීම.

අපවාදය = 1. ද්වේෂාරෝපනය. 2. නෝක්කාඩුව. 3. නින්දා කිරීම. 4. අගුණ කීම.

අපවාදක = 1. වරද නගන. 2. අපහාස සහිත.

අපවාරණය = 1. නොපෙණී යාම. 2. වැසීම. 3. සැඟවීම.

අපවාරිත = 1. සඟවන ලද.

අපවෘද්ධ = 1. අනර්ථය. 2. අනභිවෘද්ධිය.

අපවෘත්ත = 1. නොපිටට හැරුණු.

අපශබ්ද = 1. ව්‍යාකරණ විරුද්ධ ශබ්ද. 2. වැරදි වචන.

අපශමය = (අපසමය) 1. නැවතීම.

අපශ්චාත්තාපය = 1. කළ වරද ගැන පසු තැවිලි නොවීම.

අපසක් කරනවා = 1. අඳුරු කරනවා.

අපසක් කිරීය = 1. නොපෙණෙන ක්‍රියාව.

අපසදෘශා = 1. නීචයා.

අපසර = 1. අප්සරාව. 2. දෙවඟන. 3. වෙන්වීම.

අපසරණ = 1 ඉවතට ගැනීම. 2. වෙන තැනකට යාම.

අපසර්ජනය = 1. දන් දීම. 2. නිවණ. 3. අත් හැරීම.

අපසලවිය = 1. වියන.

අපසව්‍ය = 1. දකුණු. 2. විරුද්ධ. 3. වෙනස්.

අපස්නානය = 1. අවමඟුලකට ගොස් ආපසු ගෙදර අවුත් නෑම. 2. මළවුන් උදෙසා නෑම.

අපස්මාරය = 1. එනම් රෝගය. 2. මීමැස් මොරය.

අපස්මෘතිය = 1. අමතක වීම. 2. මතක නැති කම. 3. සිහි නොකිරීම.

අපස්මාදියා = 1. ද්‍රෝහියා. 2. කළ ගුණ නොසලකන්නා.

අපස්ති = 1. ආපසු ඊම.

අපහරණ = 1. පහකිරීම. 2. ඉවත් කිරීම. 3. අහකට ගෙනයාම.

අපහසය = (අපහාසය) 1. නින්දා කිරීම. 2. අවමන් කිරීම.

අපහසු = 1. පහසු නොවන.

අපහාරය = 1. අහකට ගෙනයාම. 2. පහකිරීම.

අපා = 1. පා නැති. 2. අපාය. 3. පා නැත්තා.

අපා මං = 1. අපාය මාර්ගය. 2. සැබෝ ගස.

අපාක = 1. අමු. 2. (කෑම) නොදිරන ලද. 3. නොපිසන ලද.

අපාංග = 1. කොරවූ. 2. නෙත් කොණ. 3. අනංගයා.

අපාංග දර්ශනය = 1. අඩ බැල්ම. 2. නෙත් කොණින් බැලීම.

අපාත්‍ර = 1. නුසුදුසු. 2 ශ්‍රද්ධාවතුන්ගේ ප්‍රත්‍යය දානයට නුසුදුසු.

අපාදානය = 1. අහකට ගැනීම. 2. වෙන් කර ගැනීම. 3. අවධි විභක්තිය.

අපාන = 1. හුස්ම පිට කිරීම. 2. මල මාර්ගය.

අපාන වාත = (අපාන වායු) 1. එනම් වාතය. 2. ශරීරයෙහි යටි අතට ගමන් කරන වාතය.

අපාන ශාලා = 1. සුරා සැල.

අපාප = 1. පව් නැති.

අපා මග = 1. අපාය මාර්ගය. (නරකයට පමුණු-වන පිළිවෙත්) සැබෝ ගස.

අපාමා = 1. සත්‍රිය.

අපාම්පතියා = 1. ජලයට ස්වාමියා 2. සාගරය. 3. වරුණ.

අපාය = 1. නිරය. 2. පහවූ සැප ඇති ස්ථානය. 3. වියෝගය. 4. නැසීම. 5. නාස්තිය. 6. අවැඩ.

අපාර = 1. මෙරළක් නැති. 2. නිමක් නැති. 3. එගොඩක් නැති.

අපාර්ථ = 1. අර්ථ ශූන්‍ය. 2. නිෂ්ප්‍රයෝජන. 3. තේරුමක් නැති.

අපාර්ශ්ව = 1. පක්ෂ භජනයක් නැති.

අපාශ්‍රය = 1. පහවූ ආශ්‍රය ඇති. 2. ආශ්‍රය රහිත. 3. අසරණ.

අපාසු = (අ + පහසු) 1. පහසු නැති. 2. ලෙඩ. 3. අමාරු.

අප්කිසුනු = 1. ආපෝකසිත. 2. එනම් භාවනාව. (භාවනාවට ජලය අරමුණු කර ගැනීම)

අප්කොටැස් = 1. දිය කොටස.

අප්පච්චි – (අප්පොච්චි) 1. පියා; අප්පා.

අප්පතල = (අප්අතල) 1. කුඩා හට්ටිය. 2. ඇතිලිය.

අප්පල්ලය = 1. ඇතිලිය. 2. ලොකු ඇතිලිය.

අප්පා = 1. පියා.

අප්පිච්ඡතා = 1. අඩු ආශා ඇති බව; ලද දෙයින් සතුටුවීම.

අප්පු = 1. ප්‍රධාන වැඩ කරුවා.

අප්පුඩිගැසීම = 1. අත්පොලසන්දීම.

අප්පුතිප්පුඩුනා = 1. තැති ගත්තා.

අප්පුහාමි = 1. තම්බුදී ඇමතීම සඳහා ගම්බදව පවත්නා වචනයක්.

අප්පොච්චි = 1. පියා.

අප්පො = 1. රදළ වරුන්ට ඇමතීම සඳහා ඇතැම් පළාත්වල භාවිතවන වචනයක්. (හාමු?)

අප්සර = (අප්සරා) 1. දෙවඟන.

අපි = 1. මම යන්නෙහි බහු වචනය.

අපිධානය = (පිධානය) 1. පියන. 2. වැස්ම. 3. ඇබය.

අපිහිත = 1. පියූ. 2 වැසූ. 3. නොපියූ.

අපිරි = (අපිරිපුන්) 1. සම්පූර්ණ නැති. 2. අසම්පූර්ණ.

අපිරිමාණ = 1. ප්‍රමාණ නොවන. 2. සැක සහිත.

අපිරියන් = 1. කෙළවරක් නැති.

අපිරිසුදු = (අපිරිසිදු) 1. අපවිත්‍ර. 2. කිලිටු.

අපිරිස් = 1. නිමක් නැති. 2. කෙළවරක් නැති.

අපිස = 1. ආසා නැති. 2. මඳකින් සතුටු වන. 3 ලද දෙයින් සතුටුවන.

අපිසස් = 1. පිසාවයන් නැති. 2. ප්‍රේතයන් ආදිය වැනි නැති.

අපිස් සතොස = 1. සවල්පයකින් සතුටු වීම.

අපිහිත = 1. නොවසාපු.

අපිළිසරණ = 1. අනාථයා.

අපීඩිත = 1. කරදර නොවූ. 2. හිරිහැරයට පත් නොවූ.

අපුණ්‍ය = 1. පින් නැති. 2. අවාසනාවන්ත. 3. අකුශලය.

අපුත්‍රක = 1. පුතකු නැති.

අපුන් = 1. සම්පූර්ණ නැති. 2. නොනිමි.

අපුනාවෘත්ති = 1. නැවත නැවතීමක් (ඊමක්) නැති නිවණ.

අපුද්ගලික = 1. එක් අයකුට පමණක් අයිති නොවූ. 2. පොදු.

අපුරුෂාකාර = 1. පුරුෂයකු ආකාර නුවූ.

අපුල = 1. අප්‍රිය. 2. අරුචි. 3. පිළිකුල්.

අපුල්ලනවා = 1. රෙදි ආදිය සෝදා පිරිසිදු කරනවා 2. පහර දෙනවා.

අපුෂ්ට = 1. පොහොනි නුවූ. 2. කෙට්ටු.

අපුෂ්ප = 1. මල් නැති. 2. මල් නැතිව ගෙඩි හටගන්නා දිඹුල් – නුග ආදිය.

අපූප = 1. තෙලින් පිසූ කැවිලි.

අපූරු = 1. පුදුමය. 2. වෙනස. 3. ආශ්චර්ය.

අපූර්ණ = 1. පිරී නැති.

අපූව = 1. පුදුම. 2. ආශ්චර්ය. 3. පෙර නොදක්නා ලද.

අපෙන් = 1. අපගෙන්.

අපෙරහර = 1. නොපෙළහර. 2. නුහුඳුනු.

අපෙළුම් = (අපෙළුව) 1. අප්පුඩි ගැසීම.

අපේ = 1. අප සතු; අපට අයිති.

අපේක්ෂක = 1. බලාපොරොත්තුවන. 2. ඕනෑකම. 3. ආශා කරන.

අපේක්ෂාව = 1. බලාපොරොත්තුව. 2. ආශාව.

අජේත = 1. පහවූ 2. ගියාවූ.

අපජ්ජල = 1. සමක් නුවූ.

අපොයි = 1. අනේ. 2. අහෝ. (බියෙන් හෝ වේදනාවෙන් කරන එනම් හඬ)

අපොහොසත් = 1. පොහොසත් නුවූ 2. දිළිඳු. 3. අසමත්.

අපොල = 1. අප්පුඩි ගැසීම. 2. අත් පොළසත් දීම.

අපෝෂණ = (අපොෂ්‍ය) 1 ශරීරයට බල නො වඩන. 2. ශරීරය පෝෂණය නොකරන.

අපෝෂිත = 1. දුබල. 2. කෙට්ටු 3. පෝෂණය නුවූ.

අපෝහනය = 1. තර්ක කිරීම.

අපෞෂ්කල්‍ය = 1. නොපැහුණු.

අප්‍රකට = (අප්‍රකාශ – අප්‍රකාශිත) 1. ප්‍රකට නුවූ. 2. ප්‍රසිද්ධ නැති. 3. රහස්.

අප්‍රකෘති = 1. මුල් ශබ්දයට අයත් නොවූ.

අප්‍රකෘෂ්ට = 1. නීච. 2. අධම. 3. පිළිකුල්.

අප්‍රගල්භය = 1. ක්‍රියා සූරභාවයක් නැති. 2. බුහුටි නැති. 3. ඉදිරිපත්ව ක්‍රියා නොකරන.

අප්‍රගුණිත = 1. ප්‍රගුණ නැති 2. පුහුණු නැති. 3. නුපුරුදු.

අප්‍රඥ = 1. නුවණ නැති.

අප්‍රච්ඡන්න = 1. නොවැසුණු.

අප්‍රණත = 1. නැමී නැති.

අප්‍රණම = 1. නොනැමෙන.

අප්‍රණිහිත = 1. නුවණ නැති. 2. නියම නැති. 3. ලබා නොගත්.

අප්‍රණීත = 1. ප්‍රණීත නොවූ. 2. සුමිහිරි නොවූ. 3. ඉතා රස නුවූ.

අප්‍රතර්ක්‍ය = 1. සැක නැති.

අප්‍රතිකාර = 1. පිළියම් නැති. 2. සුව කිරීමට බෙහෙතක් නැති. 3. අසාධ්‍ය.

අප්‍රති කීර්තනීක = 1. ප්‍රසිද්ධ නැති. 2 ප්‍රකට නුවූ.

අප්‍රති කූල = 1. පිළිකුල් නැති.

අප්‍රති ග්‍රාහණීය = 1. පිළිගැනීමට නුසුදුසු.

අප්‍රතිඥාත = 1 පොරොන්දු නුවූ.

අප්‍රතිඝ = 1. පැකිලීමක් නැති. 2. නොගැටෙන. 3. ක්‍රෝධ රහිත 4. පැරදවිය නොහැකි.

අප්‍රතිනාථ = 1. ස්වාමියකු නැති. 2. නිදහස්.

අප්‍රතිනාථය = 1. අරාජික කාලය. (රජ කරන්නකු නැති කාලය).

අප්‍රතිශ්‍රේෂ්ඨයා = 1. මහා උත්තමයා.

අප්‍රතිපක්ෂ - 1. විරුද්ධ නැති.

අප්‍රති පුද්ගල = 1. ප්‍රතිවිරුද්ධ හෝ සමාන පුද්ගලයෙකු නැති; අසමාන.

අප්‍රතිභාග = 1. සමකළ නොහැකි.

අප්‍රති භේදිත = 1. නියම කොටස්වලට නොබෙදන ලද.

අප්‍රතිම = 1. අසමාන. 2 ප්‍රතිමාවක් නැති.

අප්‍රතිමල්ල = 1. විරෝධීන් නැති. 2. ප්‍රතිවිරුද්ධ මල්ලයෙකු නැති.

අප්‍රතිරථ = 1. විරෝධියෙකු නැති.

අප්‍රති රූප = 1. උපමා කළ නොහැකි. 2. නුසුදුසු.

අප්‍රතිශිෂ්ට = 1. ප්‍රසිද්ධියක් නැත්තාවූ.

අප්‍රති ශුද්ධ = 1. අපිරිසුදු. 2. අපවිත්‍ර.

අප්‍රතිෂ්ඨිත = 1. සවි නැති. 2. ස්ථිර නැති.

අප්‍රති සන්ධික = 1. ප්‍රතිසන්ධියක් නැවත ඉපදීමක් නැති. 2. සසරින් මිදුනාවූ.

අප්‍රතිහත = 1. බාධා නූත. 2. හානියට නොපැමිණි.

අප්‍රත්‍යක්ෂ = 1. ප්‍රත්‍යක්ෂ නුවූ. 2. නොපැහැදිළි. 3. නොදැනෙන. 4. නොපෙනෙන.

අප්‍රත්‍යය = 1. ප්‍රත්‍යය රහිත. 2. හේතුවක් නැති.

අප්‍රත්‍යනීක = 1. අවිරුද්ධ.

අප්‍රත්‍යාදිෂ්ට = 1. දැනුම් නුදුන්නාවූ. 2. අවවාද නොකළා වූ.

අප්‍රධාන = 1. ප්‍රධාන නුවූ.

අප්‍රපතන = 1. වැටීමක් නැති.

අප්‍රපඤ්ච = 1 සංසාරයෙහි සත්වයන් ප්‍රපඤ්ච කරන තෘෂ්ණාදිය නැති නිවණ.

අප්‍රබුද්ධ = (අප්‍රබෝධිත) 1. පිබිදීමක් නැති. 2. බුද්ධිමත් නුවූ. 3. දැනීමක් නැති.

අප්‍රභව = 1. හටගැනීමක් නැති. 2. උත්පත්තියක් නැති.

අප්‍රභූත්වය = ප්‍රධානත්වයක් නැති බව. 2. අප්‍රධානකම.

අප්‍රභේද = 1. කොටස් නොකළාවූ. 2. පැහැදිලි නැති.

අප්‍රමත්ත = 1. පමා නොවූ. 2. මත් නොවූ. 3. ප්‍රමාද නොවූ.

අප්‍රමාණ= 1. ප්‍රමාණ කළ නොහැකි. 2. ප්‍රමාණයක් නැති. 3. ඉතා මහත්.

අප්‍රමාදය = 1. ප්‍රමාද නැති බව.

අප්‍රමාද විහාර = 1. පමා නොවී විසීම.

අප්‍රමේය = 1. ප්‍රමාණයක් නැති. 2. මැනිය නොහැකි.

අප්‍රමෝදිත = 1. සතුටු නුවූ.

අප්‍රයෝක්තව්‍ය = 1. අදාල නොවන.

අප්‍රයෝග = 1. ප්‍රයෝග නැති. 2. වංක නුවූ.

අප්‍රයෝජනය = 1. ප්‍රයෝජනයක් නැති බව. 2. පලක් නැති බව. 3. අලාභය.

අප්‍රලම්බ = 1. එල්ලීමක් නැති. 2. කඩිනම. 3 ප්‍රමාද නැති.

අප්‍රවෘත්තිය = 1 නොපවතින. 2. ආරංචි නැති. 3. ප්‍රාණවත් ගතියක් නැති.

අප්‍රවේක්ෂණ = 1. දුරදිග නොදකින. 2: නුවණ මඳ. 3. කලින් නොදකින.

අප්‍රවේක්ෂිත = 1. කලින් නොදක්නා ලද.

අප්‍රවේසම = (අප්‍රවේසම්කම) 1. පරෙස්සම් නැතිකම. 2. නොසැලකිලි ගතිය..

අප්‍රව්‍රජිත = 1. පැවිදි නොවූ. 2. තාපස නොවන.

අප්‍රශාන්ත = 1. ශාන්ති නැති. 2. හිරිහැර වූ. 3. අසතුටු.

අප්‍රසන්න = 1. නො පැහැදුනු. 2. අසතුටු.

අප්‍රසමීක්ෂණය = 1. අරපරෙස්සම් කම.

අප්‍රස්තුත ප්‍රශංසා = 1. වර්ණනා කිරීමට බලාපොරොත්තු නුවූ දේ ගැන සතුති කිරීම නැමැති අලඞ්කාරය.

අප්‍රසාද = 1. පැහැදිලි නැති. 2. සතුටු නැති. 3. සැඟවුණු.

අප්‍රසිද්ධ = ප්‍රසිද්ධ නැති. 2. රහස් ලෙස.

අප්‍රසූතිකාව = 1. වඳ ස්ත්‍රී.

අප්‍රහීණ = 1. අඩු නූන. 2. නැති නොවූ. 3. අඩුවී නොගිය.

අප්‍රාණී = (අප්‍රාණික) 1. පණ නැති.

අප්‍රාණිකතාව= (ව්‍යාකරණයෙහි) 1. නපුංසක.

අප්‍රාප්ත = 1. නොපැමිණි. 2. ලබා නොගත්.

අප්‍රාප්තග්‍රාහී= 1. නොපැමිණි අරමුණු ගන්නා.

අප්‍රාප්‍ය = 1. ලබාගත නොහැකි වූ. 2. නොපැමිණිය හැකිවූ. 3. ප්‍රාප්තවිය නොහැකිවූ.

අප්‍රාමාණ්‍ය = 1. අප්‍රමාණ සත්වයන් අරමුණු කොට පවත්නා කරුණා මෘදුතා චෛතසික.

අප්‍රාර්ථිත = 1. නොඉල්ලන ලද. 2. බලාපොරොත්තු නූන.

අප්‍රාවීණ්‍යය = 1. අසමර්ථ බව.

අප්‍රිය = 1. ප්‍රිය නොවන. 2. ප්‍රීතිය නො උපදවන. 3. කැමැති නැති. 4. සතුටු ගෙන නොදෙන.

අප්‍රියාව = (අප්‍රියංසය) 1. අපුල බව. 2. අරුචි බව. 3. අසතුටු කම.

අප්‍රිය සම්ප්‍රයෝග දුඃඛ = 1. අප්‍රියයන් සමග එක්වීම නමැති දුක.

අප්‍රීතික = 1: ප්‍රීති රහිත.

අප්‍රේමණීය = 1. ආදරය නොවන.

අප්‍රේල් මස = (අප්‍රියෙල් මස) 1. එනම් මාසය.

අප්‍රෞඪ = 1. ආඩම්බර නැති. 2. බුහුටි නැති.

අඵල = 1. ඵල රහිත. 2. නිෂ්ප්‍රයෝජන. 3. නිසරු.

අඵාසු = 1. පහසු නොවන.

අඵේන = 1. පෙණය නැති.

අබ් = 1. අඹු; 2. වලාකුල.

අබ = 1. වලාකුල. 2. අබ ඇට. 3. සිද්ධාර්ථ කුමාරයාට නාමයක්. 4. ගස් වර්ගයක්. 5. අහස. 6. සුදුහතු. 7 ස්වල්පය.

අබග්ග = 1. අභාග්‍යය. 2. විපත්තිය.

අබන්තර = 1. අභ්‍යන්තරය. 2. ඇතුල. 3. කුවේරයාගේ අඹගසක්.

අබද්ධි = 1. සම්බන්ධ (ආබද්ධ).

අබද්ද = (අභද්‍ර) 1 අයහපත්.

අබධ = 1. නොබැඳුණු.

අබධ සීමා = 1. කර්ම වාක්‍ය කියා සම්මත නොකළ සීමා.

අබන් = (ආහ්වානය) 1. කැඳවීම.

අබන්ධු = 1. නෑ කමක් නැති. 2. නෑයන් නැති.

අබන්ධුර = 1. සිත් සතුටු නොකරන.

අබද්ධ = (ආබද්ධ) 1. නිරන්තර. 2. එකින් එක බැඳීමක් නැති. 3. නොකඩවා කෙරෙන 4. තේරුමක් නැති.

අබබ = 1. දශ මහා නිරයන්ගෙන් එකක්. 2. අඞ්ක 77 කින් ලිය යුතු විශාල ගණනක්.

අබබ්බ = 1 අභව්‍ය. 2. අයෝග්‍ය. 3. දුශ්ශීල.

අබය = (අභය) 1. බය නැති. 2. බය නැතිකම. 3. රජකුගේ නමක්. 4. සැවැත්ත.

අබර = 1. බර නැති. 2. වලාකුල. 3 අහස.

අබරණය = 1. ආවරණය. 2. පලඳනාව. 3. ආසිත්තම.

අබල = 1. දුර්වල. 2 බල නැති. 3. ශක්තිය නැති. 4. ලුණුවරණ ගස. 5. මහලු 6. හිස්. 7 දුක.

අබලා = (අබලී) 1. ස්ත්‍රිය.

අබලා = 1. සිරිවැඩි බැවිල.

අබලී = 1. මහලු 2. දුර්වල 3. නාස්තිවූ.

අබලුව = 1. අබ පියල්ල.

අබව් = 1. අභාවය.

අබවස් = (අබවස) 1. එළිමහන් තැන. 2. අභ්‍යවකාශ.

අබස් = 1. ආභාසය. 2. එළිය.

අබසර = 1. දේව කොටසක්. 2 ගණදේවතාවා.

අබ්ජ = 1 නෙළුම්. 2. දියෙහි උපන්. 3. චන්ද්‍රයා. 4. හක්ගෙඩිය. 5. රෙහෙණ නැකත.

අබ්ජනී = 1 නෙළුම් මල් සමූහය.

අබ්ජනීපති = 1. නෙළුම්වෙහි ස්වාමියා. 2. සූර්යයා.

අබ්ජයෝනි = 1. බ්‍රහ්මයා. 2. රෙහෙණ නැකත.

අබ්ද = 1. කලාඳුරු අල 2. වලාකුල. 3. අවුරුද්ද. 4. මේඝය.

අබ්ධි = 1. සාගරය. 2. ජලය දරන්නා.

අබ්ධිකඵ = (අබ්ධිජ) 1. මුහුදු පෙණ.

අබ්බ = 1. මිනිරන්.

අබ්බණ = වණ (තුවාල) නැති.

අබ්බත = ශීල සමාදානයක් නැති.

අබ්බහන = (අබ්බාහන) 1. උදුරා දැමීම. 3. ඉදිරීම.

අබ්බාශාක = 1. අඞ්ග විකල අය. 2. කොර. 3. ඇවිදින්නට නුපුළුවන්.

අබ්බාකාකශා = 1. කොරා.

අබ්බුද = 1. අර්බුද. 2. පිළිකාව. 3. භේදය. 4. මවු කුසෙහි කලල අවස්ථාවට පසු අවස්ථාව. 5. නරකයක නමක්. 6. අඞ්ක 56 කින් ලියයුතු ගණනක්.

අබ්බෝහාරික = 1. අව්‍යවහාරික. 2. පාවිච්චියෙන් පිට ගිය. 3. නොසැලකිය යුතු. 4. අප්‍රසිද්ධ. 5. මතක නැති. 6 ගණන් නොගතයුතු.

අබ්භ = 1. අහස. 2. වලාකුල. 3. ගල.

අබ්භක = 1. මිනිරන්.

අබ්භකූට = 1. වලාකුළ.

අබ්භන්තර = 1. ඇතුල. 2. කුවේරයාගේ අඹ රුකක්. 3 රියන් විසි අටක දිග.

අබ්භසම්ල = 1. මේඝය.

අබ්භාන = 1. සංඝයා විසින් කරනු ලබන විනය කර්මයක්.

අබ්භූත = 1. ආශ්චර්යය. 2. ඔට්ටුව.

අබ්භූත ධම්ම = 1. හිත් පුදුම කරන දේ.

අබ්භුන්නත = 1. ඉතා උස්ව නැගි.

අබ්භෝකාස = 1. එළිමහත් තැන.

අබ්භෝකාසිකාංගය = 1. (ගස් අතු-වහල්-පියසි ආදියෙන් වැසීමක් නැති) එළිමහන් තැනක සිට පුරණ සීලය.

අබ්භ්‍ර = 1. වලාකුළු. 2. අහස.

අබ්භ්‍රක = 1. තලාතු මිරන්.

අබා = 1. අබිය. 2. නිවණ. 3. අභය.

අබාද = 1. අභය දායක.

අබාධ=(අබාධිත) 1. බාධා නැති. 2. විරුඬ නැති.

අබාධක = 1. බාධා නොකරන.

අබාධ්‍ය = 1. බාධා නොකළ යුතු. 2. විරුඬ නැති. 3. බාධා නැති. 4 නිදහස්.

අබාව = 1. බය නැති කම. 2. අවාසනාව. 3. යමක් කිරීමට ඇති විශ්වාසය.

අබාවය = (අභාවය) 1. නැතිවීම. 2. මිය යාම. 3. නිවණ.

අබැදි = 1. ආබඩ. 2. මුලින් බැඳුණු.

අබැද්දිය = 1. වැරැද්ද 2. විපත.

අබි = 1. භාග්‍යාව. 2. ශ්‍රේෂ්ඨ. 3. අධික. 4. ඉස්සරින්. 5. ඉදිරිපිට, 6. අභිමුඛ. 7. උපසර්ගයක්. 8. ඒ දිසාවට. 9. ප්‍රධාන.

අබිඝාත = (අභිඝාත) 1. පහර දීම. 2. මරාදැමීම.

අබිචාර = 1. එතම් උණය.

අබිජාත = (අභිජාත) 1. වංශවත්. 2. ඥතවනාත.

අබිදන් = 1. අභිධානය. (නම)

අබිදම් = 1. අභිධර්මය. (බුදුන් වහන්සේගේ උසස් ඉගැන්වීමක්)

අබිදු = 1. තණ්හාව. 2. තද ආශාව. (අභිධ්‍යාව)

අබිනව = (අභිනව) 1. අළුත්.

අබිනික්මන් = (අභිනිෂ්ක්‍රමණය) 1. මෙලොව සම්පත් හැර දැමීම. 2. පැවිදිවීම.

අබින් = 1. එතම් මත් ද්‍රව්‍යය.

අබින්න්‍යාස = 1. සුව කළ නො හැකි උණ රෝගයක්.

අබිප්‍රාව = (අභිප්‍රාව) 1. කැමැත්ත. 2. අදහස.

අබිබවනවා = 1. යටත් කරනවා. 2. වසඟ කරනවා. 3. පරාජය කරනවා.

අබිමත් = 1. අභිමතය. 2. කැමත්ත.

අබිමන් = (අබිමාන) 1. අභිමානය. 2. උඩඟුව.

අබිමුව = 1. අභිමුඛය. 2. ඉදිරිපිට.

අබිය = 1. භය නැති.

අබියස = (අබියෙස) 1. සමීපය. 2. ඉදිරිපිට. 3. ළඟ.

අබියුත් = 1 චන්ද්‍ර රාශිය.

අබියෝ =1. අභියෝගය. 2. තරඟයට කැඳවීම.

අබියෝගය = 1. සිහිමුළාබව. 2. උමතුව. 3. අව වාදය. 4. වරද තැබීම. 5. තරඟයට කැඳවීම.

අබියෝගකාරයා = 1. පිස්සා. 2. හරි සිහියක් නැති මිනිසා.

අබිරම් = 1. මනොඥ. 2. සිත් කළු.

අබිරහස = 1. ඉතා සැක සහිත රහස් කාරණය. 2. එළිකොටගත නොහැකි රහස.

අබිරු = 1. භය නැති.

අබිලස් = 1. අභිලාෂය. 2. කැමැත්ත.

අබිවුද්දි = 1. අභිවෘධිය. 2. දියුණුව.

අබිසරය = 1. හමුවන්නට යාම.

අබිසර = (අබිසරු) 1. අභිචාරිකාව. 2 පුරුෂයකු විසින් නියම කරන ලද තැනකට යන්නී.

අබිසෙව් = (අබිසෙස්) 1. අභිෂේකය. (ඔටුණු පැළඳීම සඳහා පැන් ඉසීම)

අබීජ = 1. බීජයක් නොවන. 2. පැලයක් ඇති නොකරන.

අබු = 1. අඹු. 2. භාය්‍යාව.

අබුජ = 1. කර ගස.

අබුතු = 1. අද්භූත. 2. පුදුම. 3. පෙර නුවූ. 4. අභූත.

අබුතුවම් = (අබුතු + උවම්) 1 අද්භූතොපමාව.

අබුද්දස්සකාලය = 1. අබුඬොත්පාද කාලය. (බුදුවරයකු හෝ බුදු දහමක් නොපවත්නා අපරාධ බහුල කාලය)

අබුන් = 1. බත්

අබ්‍රරූ = 1 අහස.

අබ්‍රිළ = 1. ඇඹරූ.

අබ්‍රි = 1. අභූත. 2. නුවූ.

අභේ = 1. අභේදය. 2. නොවෙනස.

අභේ උවසර = 1. අභේද්‍යෝපචාරය.

අබෝධ්‍ය = 1. තේරුම් ගත නොහැකි.

අබෞද්ධ = 1. බෞද්ධ නොවන.

අබ්‍රහ්මචර්‍ය්‍යා = 1. මෛථුන්දම. 2. කාමුක හැසිරීම.

අබ්‍රම්සර = 1. මෛථුන්දම.

අබ්‍රහ්මණ්‍ය = 1 බ්‍රාහ්මණ ගති නැති.

අඹ = 1. අඹගස. 2. ජලය. 3. ස්ත්‍රී. 4. ඇම 5. එනම් ඵල වර්ගය. 6. මව. 7. වලාකුළ. 8. විශ්වාසය. 9. ආමිසය. (ආහාරය) 10. ඉරිවේරිය.

අඹක = 1. වලාකුළ.

අඹකැන් = 1. අඹ පොකුර. 2. අඹ ගෙඩිය.

අඹකෙළි = 1. දිය කෙළිය. (ජලක්‍රීඩාව)

අඹ ගෙඩිය = 1. එනම් පලතුරු විශේෂය. 2. හදවත. 3. වකුගඩුව.

අඹගෙඩි = 1. අංකෝත්ද ගස්.

අඹතෙස් = (අඹතේජස්ක) 1. එනම් මැණික් ගල් වර්ගය.

අඹනවා = 1 (මැටි ආදියෙන් රූප) සාදනවා. 2. එලවනවා. 3. හැඩහුරු කරනවා.

අඹපක් = 1. අඹ ගෙඩිය.

අඹපල = 1. අඹ ගෙඩිය.

අඹපැන් = 1. ඉදුණු අඹවල ඉස්ම.

අඹපිය = (අම්බුපිත්‍ර) 1. මුහුද.

අඹමළු = 1. අඹගස් වැවුනු පිට්ටනිය.

අඹයාළු = 1. ඉතා හිත මිත්‍රයා. 2. කල්‍යාණ මිත්‍රයා.

අඹරස = 1. ඉදුණු අඹ ගෙඩිවල යුෂ. 2. අඹපැන්.

අඹර = 1. ඇඳුම. 2. අහස. 3. වස්ත්‍රය.

අඹරනවා = 1. එකට ඹනනවා 2. සුදුකරනවා. 3. කරකවනවා. 4. මිශ්‍රව් සිහිඳුව තිබෙන්-නට ගළපනවා.

අඹරමිණි = 1. සූර්යයා.

අඹරා = 1. ආඹරාව. 2. කරත්ත වහල.

අඹරෝදර = (අඹර + උදර) 1. අහස් තලය.

අඹරනවා = 1. එලවනවා. 2. එලවන්ට සිදු කරනවා. 3. සාදනවා.

අඹළ = 1. ඇඹරූ. 2. කරකැවූ.

අඹහැළි = 1. එනම් වෘත්තය.

අඹ හැළිය = 1. ජලධාරාව.

අඹාළු = 1. සැඩ.

අඹු = 1. ජලය. 2. (භාර්‍යාව) බිරින්ද. 3. ස්ත්‍රීය. 4. කලාඳුරු. 5 ඉරිවේරිය. 6. කැඳ.

අඹුදරු = භාර්‍යාව හා දරුවෝ.

අඹුමිනිස් = 1. කතාව.

අඹුරය = (අඹුරෙ) 1 විලාපටලය.

අඹුරාව = 1. අහස.

අඹුරූ = 1. අහස. 2. වස්ත්‍රය. 3. වලාකුළ.

අඹුරැනි = 1. අහස්ගඟ.

අඹුල = (ඇඹුල) 1. තෙල්ලි ගෙඩිය.

අඹුසැමි = 1. භාර්‍යාව හා පුරුෂයා.

අඹුසිහින්න = 1. බිරින්ද. 2. කුඩා භාර්‍යාව.

අඹුසොඬ = 1 බිරිඳ කෙරෙහි තද ඇලුම් ඇති.

අඹුස් = 1. වතුර.

අඹුන් මිනිස් = 1. මනුෂ්‍ය ස්ත්‍රිය.

අඹුළු = 1. අමූලික. 2. මුලක් නැති. 3. අසත්‍ය.

අඹුල් = 1. ඇඹුල් රස.

අඹුළු = 1. ඇඹරූ.

අභක්ති = (අභක්තික) 1. ආගම ගැන විශ්වා-සයක් නැති. 2. ඇදහිලි නැති.

අභක්ෂණීය = 1. කෑමට නුසුදුසු.

අභංගුර = 1. කැඩී නැති. 2. අවංක.

අභතුරු = 1. අභ්‍යන්තරය.

අභබ්බ = 1. අභව්‍ය. 2. නුසුදුසු. 3. නොවිස-යුතු. 4. කාලකන්නි.

අභද්‍ර = 1. අශුභපත්. 2. අවාසනාවන්ත.

අභය = 1. භයනැති. 2. සැවැත්ත.

අභය කාරණ = 1. බිය නොවීමට කරුණ.

අභයගිරි නිකාය = 1. අනුරාධපුර අභයගිරි විහාරයෙහි ඇතිවූ භික්ෂු සමූහය. 2. එනම් නිකාය.

අභය දාන = 1. ජීවිත දානය කිරීම. 2. අභය දීම. 3. දඬුවම් වැළැක්වීම.

අභය දායක = 1. අභය දෙන. 2. ජීවිත දානය කරන.

අභය පුර = 1. බියක් නැති පුරය. (නිර්වාණය)

අභය භේරි = 1. බිය නැති බව ලෝ වැසියනට දන්වන පිණිස ගසන බෙරය.

අභයා = 1. අරළු.

අභව = 1. විනාශය. 2. නැතිවීම.

අභව්‍ය = 1. නුසුදුසු. 2. නොවිය යුතු. 3. පින් නැති. 4. කාලකන්නි.

අභා = 1. අභය.

අභාගිරි = 1. අභයගිරිය.

අභාග්‍ය = 1. අවාසනාවන්ත.

අභාජන = 1. භාජන නොවූ. 2. නුසුදුසු.

අභාජ්‍ය = 1. බෙදිය නොහැකි වූ.

අභාර = 1. බර නැති.

අභාව = 1. නොවීම. 2. නැතිබව. 3. ඇත්තේ නැති.

අභාවය = 1. මරණය. 2. නොවීම. 3. නොපෙනී යාම.

අභාව නිගමනය = 1. නැත යන තීරණය.

අභාවක = 1. ස්ත්‍රී-පුරුෂ භාව නැති.

අභාව ව්‍යවහාර = 1. අභාවය යන නම.

අභාවිත = 1. පුරුදු නැති. 2. පුහුණු නැති.

අභාෂණය = 1. කථා නො කිරීම.

අභාෂිත = 1. නො කියන ලද. 2. විස්තර නො කරන ලද.

අභාෂ්‍ය = 1. කිය නොහැකි වූ.

අභි = 1. උසස්. 2. ඒ දෙසට. 3. බොහෝ.

අභික්‍රමය = 1. ආරම්භය. 2. නැඟීම. 3. යුධය. 4. නද සටන. 5. ඉදිරියට යාම.

අභිඛ්‍යා = 1. කාන්තිය. 2. කීර්තිය. 3. නාමය.

අභිගමනය = (අභිගමය.) 1. ළඟාවීම.

අභිඝත = 1. හැපීම. 2. සපගීවීම.

අභිඝාතය = 1. ගැටීම. 2. තැලීම. 3. පහරදීම. 4. මරා දැමීම.

අභිඝාතයා = 1. විනාශකයා. 2. සතුරා.

අභිඝාත රෝගය = 1. එනම් භයානක රෝගය.

අභිචරයා = 1. වැඩ කරුවා. 2. මෙහෙකරුවා. 3. සේවකයා.

අභිචාරිකාව = 1. නියම කළ තැනට යන්නී.

අභිචාර = 1. කොඩිවින කිරීම.

අභිචාරක = 1. කොඩිවින කරන්නා.

අභිජාති = 1. උත්පත්තිය.

අභිජාත = 1. වංශවත්. 2. ශ්‍රේෂ්ඨ කුලයකට අයත් 3. ශ්‍රේෂ්ඨව උපත් පුත්‍රයා. 4. ඥාන වන්ත.

අභිජිත් = 1. දවසෙහි අටවැනි මොහොත. 2. චන්ද්‍රරාශියක්. 3. උතුරුසල - සුවණ යන නැකැත් දෙකට අතරේ පිහිටි නැකත.

අභිජ්ඣා = 1. දැඩි ලෝභය. 2. භාවනාව.

අභිඥ = 1. විශෙෂයෙන් දන්නා. 2. සමර්ථ.

අභිඥාව = (අභිඥනය) 1. ඉතා ගැඹුරු දැනීම. 2. විශිෂ්ට ප්‍රඥාව. 3. රහතුන් වහන්සේගේ විශෙෂ ඥාන පහ. 4. ලකුණ. 5 භාවනා විශෙෂයෙන් උසස් බවට පැමිණි රූපාවචර පඤ්චම ධ්‍යානය.

අභිතප්ත = 1. පිළිස්සුණු. 2. දැ ගිය 3. වෙසෙසින් තැවුණු.

අභිතාප = 1. සන්තාපය. 2. තැවීම.

අභිදූර = 1. බිඳිය නොහැකිවූ.

අභිද්‍රෝහය = 1. ද්‍රෝහ කිරීම. 2. පීඩාව. 3 නින්දා කිරීම. 4. අනිෂ්ට සිතිවිලි කිරීම.

අභිධර්ම දෙසුන් = 1. අභිධර්ම දෙශනාව.

අභිධර්මය = 1 උසස් ධර්මයක්. 2. සියලු ධර්මයන් චිත්ත-චෛතසික-රූප - නිර්වාණ වශයෙන් සතර කොටසකට බෙදා දේශනා කළ විශිෂ්ට ධර්මය. 3. බෞඩ උසස් මානසික ධර්ම කොටස.

අභිධර්ම පිටකය = 1. අභිධර්ම පාලිය ඇතුළත් පිටකය·

අභිධානය = 1. නාමය. 2. ශබ්ද කෝෂය. 3. අකාරාදිය.

අභිධාන = 1. නම් වූ 2. නම් දරණ.

අභිධේයය = 1. සඳහන් වූ දේ. 2. අර්ථය 3. කියයුත්ත.

අභිධ්‍යා = 1. අන් සතු දේ තමාට වේවායි ආශා කරන විෂම ලෝභය.

අභිධ්‍යානය = 1. තද ආශාව. 2. භාවනාව.

අභිනන්දනය = 1 ප්‍රීතිමත්කම 2 සතුටින් පිළිගැනීම. 3 සමාව

අභිඥානයා = 1. සෘෂියා. 2. රුසිවරයා.

අභිනව = 1. අළුත්.

අභිනික්මන් = 1. අභිනිෂ්ක්‍රමණය. 2. තපසට යාම.

අභිෂේණනය = (සතුරන්) ඉදිරියට යාම.

අභිනිවේශය = 1. ඇතුළුවීම. 2. යමක තදින් යෙදීම.

අභිනිෂ්පත්ති = 1. නිපදවීම.

අභිනීත = 1. සුදුසු. 2. කරුණාවන්ත. 3. සැරසුන.

අභිනීල = 1. ඉතා නිල්.

අභිනීහාරය = 1. ප්‍රාර්ථනාව. 2. තද ආශාව.

අභින්න = 1. නොබිඳුණු.

අභින්‍යාස = 1. සුවකළ නොහැකි උණ රෝගයක්.

අභිප්‍රාය = (අභිප්‍රාව) 1. අදහස. 2. තේරුම.

අභිප්‍රේත = 1. අදහස් කළ.

අභිප්ලුත = 1. වතුරෙන් වැසුණු.

අභිභවනය = 1. මැඩ පැවැත්වීම 2 යටත් කර ගැනීම. 3. පරාජය කිරීම. 4. පාලනය කිරීම. 5. ශ්‍රේෂ්ඨ වීම.

අභිභවනීය = 1. මැඩ පැවැත්විය යුතු. 2. යටත් කළ යුතු.

අභිභූ = 1. අභිභවනය කරන. 2. මැඩ පවත්වන.

අභිභූත = 1. මැඩ පවත්වන ලද. 2. යටත් වූ.

අභිමඞ්ගල = 1. ඉතා යහපත්. 2. උතුම් මඞ්ගල්‍යය. 3. ශුභ වූ.

අභිමත = 1. කැමැති වූ. 2. ඉතා සතුටු වූ. 3. අදහස් කළ.

අභිමතාර්ථය = 1. අදහස. 2. බලාපොරොත්තු වන කරුණ.

අභිමන් = 1. අභිමානය. 2. උඩඟුව 3. අහංකාරය.

අභිමන්ත්‍රණය = 1 කැඳවීම. 2. ආරාධනය.

අභිමර්ද = 1. මැඩීම. 2. යුද්ධය. 3. මත්පැන්. 4 යටත් කිරීම. 5. මිරිකීම.

අභිමානය = 1. අහංකාරය. 2. උඩඟුව.

අභිමුඛ = 1. ඉදිරිය. 2 ඉදිරිපිට. 3. ඉදිරිපත්වීම.

අභිමුඛස්ථ = 1. ඉදිරිපිට ඇත්තාවූ.

අභිමුඛීකරණ = 1 ඉදිරිපත් කිරීම.

අභිමුඛීභූත = 1 අභිමුඛ වූ. 2 ඉදිරියට පැමිණියා වූ.

අභිමුව = 1. අභිමුඛය.

අභියාචනා = 1. ඉල්ලීම.

අභියුක්ත = 1. මෙහෙකරුවා. 2. ඇබිත්තයා. 3. වට කරන ලද. 4. රැස් කරන ලද. 5. අතවැසියා.

අභියුඤ්ජන = 1 යෙදීම. 2 තඩුකීම.

අභියෝගය = 1. සටනට කැඳවීම. 2 තරගයට කැඳවීම. 3. වරද තැබීම. 4. උසස් සේ යෙදීම. 5. අවවාදය. 6. තඩු කීම. 7. යත්නය.

අභිරත = (අභිරක්ත) 1. ඉතා ඇලුණු. 2. සිත් ඇලුණු.

අභිරක්ෂිත = 1. විශේෂයෙන් රැකි.

අභිරඤ්ජිත = 1. සායම් ආදිය ගාන ලද. 2. රැඳුණු.

අභිරති = 1. ඇල්ම. 2. ආසාව. 3. තද ආලය.

අභිරමණ = 1. සිත් ඇලවීම. 2. ක්‍රීඩා කිරීම. 3. ආලය වැඩීම.

අභිරම්‍ය = 1. සිත්කළු. 2. සිත් සතුටු කරන.

අභිරාම = 1. සිත්කළු. 2. මනොඥ. 3. ඉතා ලස්සන. 4. සිත් අලවන.

අභිරුචි = 1. කැමැත්ත.

අභිරූඪ = 1. නැගුණු.

අභිරූප = 1. ඉතා ලස්සන. 2. විශිෂ්ට රූප ඇති. 3. මනා රුවැති.

අභිරූළ්හ = 1. නැගුණු.

අභිරෝපන = 1. තැංවීම. 2. සිත අරමුණක යෙදීම.

අභිලක්ඛිත = 1. යුක්තවූ. 2. සලකුණු කළ 3. සලකන ලද.

අභිලපිත = 1. කියූ.

අභිලසිත = 1. කැමැතිවූ. 2 රුචිකළ

අභිලාප = 1. කීම. 2. වචනය. 3. නාමය.

අභිලාෂය = 1. කැමැත්ත. 2. ආසාව. 3. තද ඇල්ම. 4. රාගය.

අභිලේපන = 1. ලාටුව. 2. ආලේපය. 3. ගෑම.

අභිවර්ධක = 1. දියුණුවන.

අභිවර්ධනය = 1. දියුණුව. 2. වැඩිදියුණු කිරීම. 3. වැඩීම.

අභිවන්දන = 1. වැඳීම. 2. සකසා වැඳීම.

අභිවන්දනීය = 1. වැන්ද යුතු.

අභිවාදනය = 1. මනාකොට වැඳීම. 2. නමස්කාරය.

අභිවෘද්ධිය = 1 වැඩි දියුණුව. 2. සඵලකම.

අභිවෘද්ධ්‍යාලේපය = (අභිවෘධි + ආලේපය.) 1. ක්‍රිස්තු භක්තිකයන්ගේ භක්තිය සපිර කිරීම පිළිබඳ චාරිත්‍රයක්.

අභිව්‍යක්ත = 1 ඉතා පැහැදිලි.

අභිවික්‍රම = 1. ශ්‍රේෂ්ඨ වික්‍රමය.

අභිව්‍යඤ්ජක = 1. ප්‍රකාශ කරන. 2. පෙන්වා දෙන. 3. ඉතා පැහැදිලි කරන.

අභිවිතරන = 1. දීම. 2. පරිත්‍යාගය.

අභිවිනය = 1. විනය පිටකය. 2. උසස් හික්මීම.

අභිවිසිඨ = 1. ඉතා විසිතුරු

අභිවිශිෂ්ට = 1. විශෙෂයෙන් ශ්‍රේෂ්ඨ.

අභිව්‍යාප්තිය = 1. පැතිර තිබීම. 2. මනාගේ පැතිරීම.

අභිශාපය = 1. තදින් සාප කිරීම.

අභිෂික්ත = 1. අභිෂේක කළ. 2. තෙමූ.

අභිෂික්තෝදක = 1. අභිෂේක ජලය.

අභිෂුත = 1. කාඩිදිය. 2. විනාකිරි. 3. කැඳ වතුර.

අභිෂේක = 1. ඔටුණු පැළඳවීම සඳහා හිසෙහි පැන් වැක්කිරීම. 2. රජ බවට පැමිණවීම. 3. ඔටුණු පැළඳවීම.

අභිසංයුක්ත = 1. එක්සත්වූ. 2. පිහිටා තිබෙන.

අභිසංස්කරණ = 1. සකස් කිරීම. 2. ප්‍රතිසංස්කරණය.

අභිසංස්කාරය = 1. උසස් බවට පැමිණවීම. 2. සැරසීම 3. පිළියෙළ කිරීම 4. සම්පූර්ණ කිරීම. 5. උත්කර්ෂ කිරීම. 6. තෝරුම් ගැනීම.

අභිසංස්කෘත = 1. පිළියෙල කළ. 2. හොඳින් සම්පූර්ණ කළාවූ.

අභිසඞ්ග = 1. ඇලීම.

අභිසජ්ජන = 1. ඇලීම. 2. කෝපවීම. 3. දෝෂාරෝපණය.

අභිසජ්ජිත = 1. විශෂ්ට සේ සැරසූ.

අභිසන්තාපය = 1. තද තැවීම. 2. යුධය. 3. ශාපය. 4. හාස්‍යපසිත් තැවීම.

අභිසන්ද = 1. ප්‍රවාහය. 2. ගලා බැසීම.

අභිසන්දන = 1. ගලා බැසීම.

අභිසංඛ්‍යාන = 1. ගැලපීම. 2 ගිවිස ගැනීම. 3. සම්බන්ධය.

අභිසන්ධි = 1. ගැලපීම.

අභිසපන = 1. දිව්රීම. 2. සාප කිරීම.

අභිසමනය = 1. නැති කිරීම. 2. නැවැත්වීම.

අභිසමය = 1. සුදුසු කාලය. 2. අවබෝධ කිරීම. 3. යහපත් ඇදහීම.

අභිසමාචාර = 1. ශ්‍රේෂ්ඨවූ හැසිරීම.

අභිසමාචාරික = 1. උසස් හැසිරීම පිළිබඳ. 2 මාගීඵල ශීලයන් උදෙසා පැණවූ ශීලය.

අභිසම්බුද්ධ = 1. මනා සේ වටහාගත්. 2. බුදු බව ලත්.

අභිසම්බුද්ධිය = 1. සම්පූර්ණ බුද්ධිය.

අභිසම්බෝධි = 1. සියල්ල දැනගැන්ම. 2. බුද්ධත්වය.

අභිසම්මත = 1. ශ්‍රේෂ්ඨ සේ පිළිගත්.

අභිසම්භාවනාය = 1. බොහෝ සේ ගෞරව කිරීම.

අභිසමිත = 1. අවබෝධ කළ.

අභිසම්හිත = 1. කැමැති වූ. 2. කොට නිමවූ.

අභිසරයා = 1. වැඩ කරුවා. 2. අනුචරයා.

අභිසාප = 1. දොස් කීම. 2. ශාපය.

අභිසාර = 1. නියම කළ තැනකට යාම.

අභිසාරිකාව = (අභිසාරිණී) 1. පුරුෂයන් නියම කළ තැනකට අනාචාරය පිණිස යන්නී. 2. වෙසඟන.

අභිසෙබු = 1. නිතර සේවනය කිරීම.

අභිෂේක විධි = 1. අභිෂේක කරන (ක්‍රමය) පිළිවෙළ.

අභිසේසත් = 1. ශ්‍රේෂ්ඨ ශ්වේතච්ඡත්‍ර

අභිහත = 1. ගැසූ. 2. පහර දුන්. 3. තට්ටු කරන ලද. 4. නැසූ.

අභිහනන = 1. ගැසීම. 2. තට්ටු කිරීම. 3. නැසීම.

අභිහාර = 1. ඉදිරියට ගෙන ඒම. 2. ඉදිරිපත් කිරීම.

අභිහිත = 1. කියන ලද. 2. නම් තැබූ.

අභිජ්‍යා = 1. නමස්කාර කළ යුතු.

අභීත = 1. භය නැති. 2. බිය නොවූ.

අභීතතාව = 1. භය නැතිකම. 2. නිර්භයකම.

අභීත නාද = 1. නොබියව කරන නාදය.

අභීත සිංහනාද = 1. අභීත වූ ශ්‍රේෂ්ඨ නාදය.

අභීම = 1. මෘදු. 2. භයානක නොවූ

අභීරු = (අභීරුක) 1. බිය සුලු නොවූ. 2. නිර්භය.

අභීෂ්ට = 1. විශෙෂයෙන් කැමැති වූ

අභුක්ත = 1. නොකෑ. 2. වළඳා නොවූ 3. කෙළිත්.

අභූත = 1. නොවූ 2. නැති. 3. අසත්‍යවූ.

අභූත උපමා = 1. කාව්‍ය ශාස්ත්‍රයෙහි එනම් උපමාව. 2. අභූත වස්තුවක් හා සමාන කිරීම.

අභූත චෝදනාව = 1. බොරුවෙන් කරන දොස් පැවරීම.

අභූත පූර්ව = 1. ඉහතින් සිඩනොවූ. 2. පුදුම.

අභූත මතය = හිස් කල්පනාව.

අභූතයෙන් = 1. කරුණක් නැතිව. 2. නිකරුණේ.

අභූත රූපය = 1 හිස් දර්ශනය. 2. අමනුෂ්‍ය දෘෂ්ටිය.

අභූත ස්ථානය = 1. සැබවින් නැති ස්ථානය.

අභූතවාදී = 1 බොරු කියන්නා.

අභූමික = 1. සැරසීමක් නැති. 2. වාමි.

අභේද = 1. භේද නැති. 2. කැඩී නැති. 3. බෙදී නැති. 4. වෙනසක් නැති

අභේදිතපාදික = 1. කුර බෙදී නැති.

අභේදෝපචාර = (අභේද + උපචාර) 1. නොවෙනස් සේ සිතාගැන්ම. 2. ස්වභාවිකාර්ථය තබා අප්‍රධානාර්ථ ගෙනකීම.

අභේද්‍ය = 1. බෙදිය නොහැකි. 2. නොබිඳිය යුතු.

අභ්‍යග්‍ර = 1. සමීපය. 2. ඉතා ළඟ.

අභ්‍යඞ්ග = තෙල් ආදිය ඇඟ ගෑම.

අභ්‍යඤ්ජන = 1. තෙල් ආදිය ඇඟ ගෑම.

අභ්‍යන්තර = 1. ඇතුළ. 2. අඩංගු.

අභ්‍යන්තරාගාරය = (අභ්‍යන්තර + අගාරය) 1. ඇතුළු ගෙය.

අභ්‍යන්තරාර්ථය = (අභ්‍යන්තර + අර්ථ) 1. යට අදහස. 2. සරි තේරුම.

අභ්‍යන්තරාවතත = (අභ්‍යන්තර + අවතත) 1. ඇතුළතින් නැමුණු.

අභ්‍යවකාශ = එළිමහන් තැන. 2. අහසේ ඉහළ.

අභ්‍යවකාශිකාඞ්ගය = 1. එළිමහනෙහි විසීමෙහි අංගය.

අභ්‍යවහරණ = 1. වැළඳීම.

අභ්‍යවහරණීය = 1. කෑ යුතු.

අභ්‍යසූයාව = 1. දොස් තැබීම. 2. අපහාස කිරීම.

අභ්‍යස්ත = 1. පුහුණු කළ.

අභ්‍යාස = 1. පුහුණුවීම.

අභ්‍යාඛ්‍යාන = 1. නින්දාකිරීම 2. බොරු දොස් පැවරීම.

අභ්‍යාගාරික = 1. මහාජේ ගෙදර කටයුතු කරන.

අභ්‍යාදානය = 1. ආරම්භය.

අභ්‍යාස = 1. සමීපය. 2. පුරුදු කිරීම. 3. නැවත නැවත යෙදීම. 4. පුහුණු කිරීම.

අභ්‍යාස විද්‍යාලය = 1. (ශිෂ්‍යයන්) පුහුණු කරන පාසැල.

අභ්‍යුදය = 1. අභිවෘද්ධිය. 2. වැඩිදියුණුව.

අභ්‍යුපගත = 1. එළඹුණු. 2. පැමිණි.

අභ්‍යුපගමනය = 1. එළඹීම. 2. පිළිගැනීම. 3. පොරොන්දුව.

අභ්‍යුපාය = 1. උපක්‍රමය.

අභ්‍ර = 1. වලාකුළ.

අභ්‍රක = 1. මිනිරන්. 2. තලාතු මිනිරන්.

අභ්‍රපටල = 1. වලාපටලය.

අභ්‍රංලිහ = 1. වලාකුළු ගෑවෙන.

අභ්‍රංලිහය = 1. සුළඟ.

අභ්‍රමණ = 1. භ්‍රමණය නොවන. 3. නොසැර-සැවෙන. 3. චංචල නොවී එකතැන තිබෙන.

අභ්‍රමාලාව = 1. වලාකුළු පෙළ.

අභ්‍රය = 1. අහස. 2. වලාකුළ 3. මිනිරන්. 4. තලාතු මිනිරන්. 5. කපුරු. 6. රත්රන්.

අභ්‍රවලාහක = 1. මේඝයට අධිපති එනම් දේවතා විශේෂය.

අභ්‍රාතීය = 1. සහෝදරභාවයක් නැති.

අම = 1. අමෘතය. (දෙවියන්ගේ බීමක්) 2. නොමැරෙන. 3. ජලය: 4. නිවන. 5. මවු.

අමකඩ = 1. අමුඩය. 2. පිරිමින්ගේ යට ඇඳුමක්. 3. දිය රෙද්ද.

අමකාර = 1. අමෘත කරන. 2. අමෘතාකර.

අමකිරණ = 1. සඳ.

අමගඳ = 1. අමු මස් ගඳ. 2. සුවඳ. 3. පිළිගඳ.

අමංගල = 1. අශුභ. 2. නිෂ්ඵල.

අමක් = 1. වලඳක භාජන.

අමත = 1. ආමන්ත්‍රණය. 2. පාත්‍රය. 3. අමෘතය. (දිව්‍ය භෝජනය) 4. ජලය. 5. නිර්වාණය.

අමතක = 1. මතක නැතිවීම.

අමතනවා = 1. කැඳවනවා. 2. බලාපොරොත්තු වෙනවා. 3. කල්පනා කරනවා 4. උපද-වනවා.

අමතර = 1. වෙනම. 2. අමුතුම.

අමත්තුව = 1. නැවතීම.

අමත්පැන් = 1. අමද්‍යපාන. 2. මත් නොවන බීම.

අමඳ = (අමද) 1. මඳ නොවූ. 2. බොහෝ. 3. ඇති පමණ.

අමදය = 1. සුවඳ. 2. සතුට. 3. ලාදුරු නම් රෝගය. 4. සුවඳ ගැනීම.

අමදෘ = 1. අමෘත දායක.

අමදිනවා = 1. අතුගානවා. 2. පිස දමනවා.

අමදිනී = 1. මවු. 2 කිරි දෙන්නී.

අමදිනීය = 1. මුස්න. 2. කොස්ස.

අමදු = 1. කෑම.

අමදුර = (අමධුර) 1. මධුර නොවූ. 2. අමිහිරි. 3. සතුටු දායක නොවන.

අමද්‍ය = 1. මද්‍ය නොවන. 2. මත් නො කරන.

අමද්‍යප = 1. මත් පැන් නො බොන.

අමද්‍යපාන = 1. මත් පැන් නොවන බීම.

අමන = 1. හමක. 2. මෝඩ. 3. නිවට. 4. සිහි - කල්පනා නැති. 5. අධම. 6. වහනය ඩත.

අමනවා = 1. සුළඟ මෙන් ගසනවා. 2. විහි-දෙනවා.

අමනාං = 1. නොමනා. 2. නරක. 3. අශෝභන. 4. සතුටුදායක නො වන. 5. අමිහිරි.

අමනාප = 1. අසතුටු. 2. මනාප නැති. 3. විරුඬ. 4. අප්‍රසන්න.

අමනුෂ්‍ය = 1. මිනිස් නුවූ. 2. යක් - භූ - පිසස් ආදීහු.

අමනුෂ්‍ය කාන්තාර = 1. යක්ෂ-රාක්ෂසාදීන් අධිගෘහිත කාන්තාරය.

අමනෝඥ = 1. මනෝඥ නොවූ. 2. සතුටු දායක නොවූ 3. අශෝභන. 4 අප්‍රිය.

අමනෝහර = 1. මනහර නොවූ. 2. සිත් ඇලුම් නො කරන. 3. ලස්සණ නැති.

අමන්ත්‍රී = 1. අවවාද නොමැති.

අමන්ද = 1. මඳ නොවූ. 2. බොහෝ වූ.

අමන්දල් = 1. කොට්ටම්බා ගස.

අමන්ද්‍ර = 1. සත්පුත්. 2. සත්සිදීම.

අමපා = 1. අමෘත පානය. (දෙවියන්ගේ බීම.) 2. දෙවියෝ.

අමපාඩා = 1. අමා බොන්නා. 2 දෙවියෝ.

අමබිඳු = 1. අමෘත බින්දු.

අමයුරු = (අම + අයුරු) 1. අමෘතය වැනි. 2. ඉතා රසවත්.

අමර = 1. මරණය නැති. 2. දෙව්. 3. ආඳ. 4. අම් නම් නේත්‍ර රෝගය. 5. දේවදාරු. 6. රසදිය. 7. දලුග් ගස. 8. තවහන්දි වැල. 9. අමරසිංහාචාර්‍යයා.

අමර කෝෂය = 1. එනම් නිඝණ්ටුව; අමරසිංහග.

අමරගුරු = 1. බෘහස්පති. (දෙවියන්ගේ ගුරුවරයා.)

අමරගනා = (අමර + අඟන) 1. දෙවඟන.

අමරණීය = 1. නො මැරෙන.

අමරතුරු = 1. කප්රුක.

අමරදර = 1. දේවදාරු.

අමරදෙන් = 1. සුරභි ධේනුව.

අමරපති = 1. ශක්‍රයා.

අමරපුර = 1 දෙවියන්ගේ නුවර. 2. බුරුමයේ එනම් නුවර.

අමරපුර නිකාය = 1. බුරුම රට අමර පුරයේදී උපසම්පදාව ලැබූ තෙරුන් විසින් ලංකාවේ පිහිටුවන ලද එනම් භික්ෂු නිකාය. (මෙය කොටස් කීපයකින් යුක්තය.)

අමර භාවය = 1. නොමියෙන බව.

අමර වර = 1. දේව ශ්‍රේෂ්ඨයා.

අමරසේන කිවිඳු = 1. සිය්බවුවේ අමරසේන; මහා කවියෙකි - ග්‍රන්ථ කර්තෘවරයෙකි.

අමරසූරිය මැති = 1. හැක්රි අමරසූරිය සාමදාන විනිශ්චයකාර තුමා. (ලංකා සංඛ්‍යාත ධනයක් බෞද්ධ-පොදු වැඩ සඳහා පරිත්‍යාග කෙළේය).

අමරලා = 1. මිසුත් වර්ගයක්.

අමරා = 1. දේව වර්ගයක්. 2. රසකිඳ. 3. දේවදාරු. 4. ආඳ. 5. ඊ තණ. 6. කෝමාරිකා. 7. මහෞෂධ පණ්ඩිතයන්ගේ දේවිය.

අමරාව = (ඇමරාව - ඇඹරාව.) 1. ඝරත්තයේ හෝ අඟුලේ වහල.

අමරාංගනාව = 1. දෙව්දුව. 2. දෙවඟන.

අමරාද්‍රිය = 1. මහාමෙර.

අමරාදේවී = 1. මහෞෂධ පණ්ඩිතයන්ගේ භාර්‍යාව.

අමරාලය = 1. දෙවියන් නිවෙස. 2. දෙව්ලොව.

අමරාවතී = 1. ශක්‍ර පුරය. 2. සුමේධ පණ්ඩිතයන් උපන් නුවර.

අමරාවික්ෂෙප = 1. ආඳ මෙන් ලිස්සා පැනයන. 2. දෘෂ්ටි වශයෙන් ඒ මේ අත පැනීම.

අමරාවාද=1. එක් කරුණක ස්ථිරව නො සිටින අමරා වික්ෂෙපිකයාගේ කථාව.

අමරෑපු = 1. බුදුන් වහන්සේ.

අමර්ත්‍ය = 1. දෙවියා. 2. මරණ නැති. 3. මිනිස් ලොවට අයිති නැති.

අමර්ත්‍ය භුවන = 1. දිව්‍ය ලෝකය.

අමර්දිත = 1. ඔප නැති. 2. මැඩ නොපවත්වන ලද 3. නො මැදපු.

අමර්ෂණ = 1. නො ඉවසිලි. 2. ක්‍රෝධය.

අමල = (අමල්.) 1. නිර්මල. 2. මල රහිත. 3. කිලුටු නැති. 4. පිරිසුදු. 5. පළිඟු. 6. කෙල්ලි. 7. කළුනික.

අමල් = 1. මවු.

අමලා = 1. සිරිකත. 2. පිටවක්කා.

අමලු = 1 පළිඟු 2. විදුරු.

අමිස්කන් = 1. උඩ කොටස නැති. 2. හිස නැති.

අමහාත්ම = 1. මහාත්ම ගුණ නැති. 2. උසස් ගති නැති. 3. බියගුලු. 4. නාගරිකතා-නොවූ.

අම්බතා ගල්ලෙන = 1. කොටගමුවේ ශ්‍රී රාහුල හිමියන්ගේ මෘත ශරීරය තැබුණු බැව් කියන ලෙන.

අම්බර = 1. අහස. 2. වස්ත්‍රය. 3. වල. 4. මුදේ පාවෙන එනම් ඖෂධ වර්ගය.

අම්බර ගෝචර = 1. අහසේ හැසිරෙන. 2. පක්ෂියා. 3. තාරකා.

අම්බරණ = 1. ආභරණ.

අම්බරාන්තය = 1. අහසේ අග. 2. ක්ෂිතිජය.

අම්බරී = 1. පෙර පැවැති වස්ත්‍ර වර්ගයක්.

අම්බරීෂ = 1. විෂ්ණු. 2. ශිව. 3. රජෙකුගේ නමක්.

අම්බරීෂය = 1. යුද්ධය. 2. සූර්යයා. 3. කෑම බදින භාජනය.

අම්බරීෂයා = 1. පැටවා. 2. දරුවා.

අම්බරූ = 1. ගෝනා. 2. තිත්මුවා. 3. (කමත්) මීහරකා.

අම්බලම = 1. තවාතැන් පොළ. 2. මගියන්ට විශ්‍රාම ගැනීම සඳහා මඟ අසල සැදූ ගෙවල්.

අම්බලම් පාලුවා = 1. වහලවල ලී විදින කුරුමිණි විශෙෂයක්.

අම්බා = 1. ස්ත්‍රිය. 2. මවු.

අම්බාඨක = 1. ඇම්බරැල්ල ගස.

අම්බෑට්ඨයා = (ඇම්බට්ටයා) 1. කරනවෑමියා.

අම්බිකා = 1. අම්මං. 2 භාර්‍යාව. 3. තිත්ත ලබු. 4. ස්ත්‍රිය.

අම්බිල = 1. ඇඹුල්.

අම්බිලිමාමා = 1. (ළදරුවන් නැලවීමෙහි දී) සඳට ව්‍යවහාර කරන නාමයක්.

අම්බු = 1. ජලය. 2. ඉරිවේරිය.

අම්බුචර = 1. දියෙහි හැසිරෙන.

අම්බුජ = 1. දියෙහි හටගත්. 2. පියුම්. 3 හක. 4. මාලු.

අම්බුජයා = 1. ජලයෙහි වාසය කරන සත්වයා. 2. මත්ස්‍යයා.

අම්බුජිනී = 1. පියුම් විල.

අම්බුද = 1. දිය දෙන්නා. 2. වලාකුළු. 3. කලාදුරා.

අම්බුධර = 1. දිය දරන්නා. 2. වලාකුළු.

අම්බුධාරා = 1. ජල ධාරාව.

අම්බුධි = 1. සාගරය.

අම්බු ප්‍රසාදන = 1. ඉඟිනි ඇට.

අම්බුරුහ = 1. පියුම්.

අම්භෝජ = 1. දියෙන් හටගත්. 2. පියුම්.

අම්භෝනිධිය = 1. සාගරය.

අම්මණ්ඩි = 1. මැණියෝ. 2. (උඩරට ඇතැම් පළාත් වල දී.) මාමං. 3. තලතුනා ස්ත්‍රී. 4. තැත්ද.

අම්මණ්ඩිලා = 1. ස්ත්‍රීහු.

අම්මසා = 1. අම්මා පල්ල; මවගෙන් දිව්රීමට කියන වචනයක්.

අම්මල් = 1. අඹ මල්.

අම්මා = 1. මව. 2. තලතුනා ස්ත්‍රී. 3. තැත්ද.

අම්මාවරු සත්දෙනා = 1. වසංගත රෝග බෝ කරතැයි සලකන දේවතාවියන් සත් දෙනෙක්. 2. පත්තිනි දේවියගේ අවතාර සතක්. 3. පොළෝ මහීකාන්තාව – මුදු මණිමේඛලාව – සරස්වතී දේවිය – සීතා පරමේශ්වරිය – පාර්වතී දේවිය – වල්ලි අම්මා – පත්තිනි දේවිය යන සත් දෙන.

අම්මා දේවි = 1. පාර්වතිය. 2. ඊශ්වරයාගේ භාර්‍යාව.

අම්මා පල්ල = 1. මවගෙන් දිව්රීමට කියන වැකියක්.

අම්මා වරුන්ගේ ලෙඩ = 1. පැපොල්, සරම්ප ආදි බෝවන ලෙඩ.

අම්මෙ = (අම්මෝ) 1. දුක හැඟවීමෙහිදී කියන වචනයක්.

අම්ල = 1. ඇඹුල්. 2. දෙහි. 3. කාඩිදිය. 4. සිරල. 5. විනාකිරි.

අම්ලක = 1. දෙහි. 2. දෙල්.

අම්ලකර = 1. එනම් වායුව. (ජීවත් වීමට අවශ්‍යවූ "ඔක්සිජන් නම් වායු විශෙෂය)

අම්ලකා = 1. ඇඹුල් ඇඹුලිය. 2. සියඹලා.

අම්ල ජම්බීර = 1. ඇඹුල් දෙඩම්.

අම්ලසාර = 1. විනාකිරි. 2. සල්ගස. 4. කිතුල් ගස.

අම්ලා = 1. පිටවක්කා. 2. දෙහි. 3. සියඹලා. 4. තෙල්ලි. 5. කොසෙල්.

අම්ලිකා = 1. ඇඹුල් ඇඹිලිය. 2. සියඹලා.

අමා = 1. නිවණ. 2. අමාවක් තිථිය. 3. දිව්‍ය භෝජනය. 4. රසකිඳ. 5. සම්පය. 6. අමෘතය. 7. නොමැරෙන. 8. චන්ද්‍රයාට අයිති. 9. සඳකැසි. 10. අරළු.

අමාංස ධම්මී = 1. මස් අනුභව කිරීම සදොස් යයි සිතන.

අමාංස භක්ෂණ = 1. මස් නොකන.

අමාඅරළු = 1. කද පැණි රසැති අරළු වර්ගයක්.

අමාඅඳුරු = 1. නිවණ ගැන උගන්වන්නා; බුදුන් වහන්සේ.

අමාඔසු = (අමා ඔස) 1. දිව්‍ය ඖෂධය.

අමාකර = 1. අමෘතය සාදන්නා. 2. සඳ. 3. අමෘතාකරය.

අමාකැන් = 1. අමාරැස් ඇත්තා. 2. සඳ.

අමාදහම් = 1. අමෘතය (නිර්වාණය) දෙන ධර්මය.

අමාදිය = 1. අමාපැන්. 2. අමෘත ජලය.

අමානනය = 1. අවමානය.

අමානුෂ = 1. මිනිසුන්ට අයිති නොවන.

අමාපල = 1. අරළු ගෙඩි.

අමාපැන් = 1. අමෘත ජලය.

අමාපිඩු = 1. අමෘත පිණ්ඩය. (අම ගුලිය)

අමාපොද = 1. අමෘත බිඳුව. 2. දිව්‍ය බීම බිඳු.

අමාබොජුන් = 1. අමෘත භෝජනය.

අමාමක = 1. මාගේය යි නොසිතන.

අමා මහනිවන් = 1. අමෘත මහා නිර්වාණය.

අමාමෙරස් = (අමාමෙරද) 1. චන්ද්‍රයා.

අමාය = 1. දිව්‍ය සැම. 2. නිර්වාණ.

අමායා = 1. මායා නොවන. 2. නොරවටන. 3. අවංක.

අමරනවා = 1. හරඹ කරනවා.

අමාරස = 1. අමෘත රසය. 2. ප්‍රණීත රසය. 3. දිව්‍ය රසය.

අමාරැස් = (අමාරැස) 1. සඳ. 2. සඳ කැලුම්.

අමාරු = 1. අපහසු. 2. අසීරු. 3. උගහට 4. ආබාධය.

අමාරු කාරයා = 1. දුස්සාධ්‍ය රෝගියා. 2. කොරාටික පුද්ගලයා.

අමාශී = 1. වැරදි මග. 2. පාර නැති.

අමාලිය = 1. රසකිඳ.

අමාවක් = 1. මාසෙපෝය දවස.

අමාවතුර = 1. ගුරුළු ගෝමීන් විසින් ලියන ලද ග්‍රන්ථයක්. 2. අමෘත ප්‍රවාහය (ගලා යන අමෘතය)

අමාවසී = 1 මාසේ පෝය.

අමාසේ = 1. සිත ප්‍රීති කරන සෙවන.

අමාවඝගේ = 1. අමෘත වර්ෂාව. 2. දිව්‍ය වර්ෂාව. 3. ධර්ම දේශනය.

අමාවළ = 1. අමෘතය පිරුණු වළ.

අමාසිඳු = 1. කිරි මුහුද.

අමාසිඳු දූ = 1. සිරිකත.

අමාඇල් = 1. අමෘතයෙන් පිරුණු දිය ඇල්ල.

අමාංගලික = 1. අශුභ දැයක.

අමාත්‍යයා = 1 ඇමතියා.

අමාත්‍යමණ්ඩලය = 1. ඇමති සභාව.

අමාත්සර්‍ය = 1. මසුරු නැති බව.

අමි = 1. මිහිරි නැති. 2. වැලඳීම.

අමිත = 1. ප්‍රමාණයක් නැති. 2. බොහෝ.

අමිතභෝගී = 1. අප්‍රමාණ භෝග සම්පත් ඇත්තාවූ.

අමිත් = 1. හතුරු.

අමිතුරු = 1. හතුරු.

අමිත්‍ර = 1. එදිරිකාර. 2. විරුද්ධ 3. හතුරු.

අමිත්‍රාක්ෂර= (අමිත්‍ර + අක්ෂර) 1. විරුද්ධ අකුරු (අ - ඹ - ත - ල ඈ වගෙහි පළමු වැන්නෙහි අකුරු වලට පස් වැන්නේහි අකුරුද, දෙවැන්නෙහි අකුරු වලට සවැන්නෙහි අකුරුද යන පිළිවෙළින් විරුද්ධය).

අමිථ්‍ය = 1 මිථ්‍යා නොවූ. 2. බොරු නොවූ.

අමිනිස් = 1. අමනුෂ්‍ය.

අමිණ් = 1. අප්‍රමාණ.. 2. බොහෝ. 3. සවුනය.

අමිය = (අමියුම) 1. කෑම.

අමියාව = 1. අහර නොදිරවීම. 2. ආමය. 3. අජීර්ණය.

අමිසු = 1. වැලඳූ. 2. කෑ.

අමිසුරු = 1. අමිහිරි; මිහිරි නැති.

අමිහි = (අමිහිරි) 1. මිහිරි නොවූ.

අමිසි = 1. සතකුප්ප. (ශතපුෂ්ප)

අමිස් = 1. ආමිස. (ආහාර)

අමිශ්‍ර = 1. (අමිශ්‍රිත) 1. කලවම් නොවූ.

අමිෂය = 1. මාංස.

අමිහිර = (අමිර) 1. අමිහිරි; මිහිරි නැති.

අමිරස = 1. අමිහිරි රස. 2. අරුචි රස.

අමු = 1. එනම් ධාන්‍ය වර්ගය. 2. නො පැසුණු. 3. නො ඉදුණු. 4. ආමය. (අහර නොදිර-වීම) 5. නො වියලුණු. 6. අළුත්. 7. නොපිසූ. 8. සම්මුඛ.

අමුඇට = 1. අමුනම් ධාන්‍ය ඇට. 2. තල ඇට තුණක ප්‍රමාණය.

අමු ඉඟුරු = 1. නොවියලි ඉඟුරු.

අමුකර = 1. පටන් ගන්නවා. 2. ඉදිරියට ගෙනෙනවා.

අමුක්කරා = 1. "අශ්වගන්ධා" නම් පැළෑටි වර්ගය.

අමුක්කුව = 1. බාධාව. 2. හදිසිය. 3. යමක් ඇදීමෙන් පිටකරන්නට පුළුවන් උප-කරණයක්. 4. තුවක්කු කොක්ක.

අමුක්කු සන්නිය = 1. එනම් සන්නි රෝගය.

අමුක්ත = 1. නොමිදුණු. 2. නිදහස් නූවූ. 3. තොර නොවූ.

අමුඛ්‍ය = 1. ප්‍රධාන නොවූ. 2. යටත්.

අමුඩය = 1. අමුඩේ.

අමුඩු = 1. කෑසපට. 2. පිටපටය..

අමුණ = 1. වී ආදි ධාන්‍ය මණින මිම්මක්. 2. පැල් හතර. 3 එතරම් වී වැපිරෙණ බිම් ප්‍රමාණය. 4. අක්කර දෙකක ප්‍රමාණය. 5. ලාන් හතලිහ. 6. කෙතක දිය රැඳීමට බඳින බැම්ම.

අමුණනවා = 1. එකකට එකක් සවිකරනවා. 2. පේළියකට සිටින සේ නූලක යොදනවා.

අමුනිෂ්කිනිත = 1. අසභ්‍ය වචන. 2. ග්‍රාම්‍ය වචන.

අමුතු = 1. වෙනස්. 2. ආගන්තුක. 3. අළුත්. 4. අළුත් තොරතුරු. 5. අමුක්ත. (නොමිදුණු)

අමුතුදන් = 1. අමුත්තන්ට දෙන ආහාර ආදිය.

අමුතුබත = 1 සිංහල අවුරුදු දින නෑදෑයින්ට දෙන බත. 2. අළුත් බත. 3. ආගන්තුක-යින්ට දෙන ආහාර.

අමුක් = 1. නොමිදූ. 2. අත්‍යයා. 3. නෙත. 4. පුවඳ ආදිය ගැල්වීම.

අමුත්ත = 1. අළුතින් සිදුවූ දේ. 2. වෙනස. 3. හඬ ගෑසීම. 4. කෑඳවීම.

අමුත්තා = 1. පිටින් ආ නෑනැත්තා (ආගන්-තුකයා); අළුතෙන් ආ නෑනැත්තා.

අමුද්‍රාංකිත = 1. මුද්‍රණය නොකරන ලද.

අමුපාට = 1 නො පැසුණු පාට. 2. නො ඉදුණු පාට. 3. නො වියලුණු පාට. 4. නොතැම්-බුණු පාට.

අමුඛ = 1. හමුවෙහි. 2. ඉදිරියෙහි.

අමුරන් = 1. පිරිසුදු නොකල රත්රන්.

අමූර්ති = 1. ස්වරූපයක් නැති. 2. ශරීරයක් නැති. 3. හැඩයක් නැති.

අමුලා = 1. ඉද්ද ගස.

අමුලු = 1. අමූලික. 2. මුලක් නැති.

අමුළු = 1. අමූඪ; මෝඩ නුවූ. 2. රැස් නොවූ. 3. සියල්ල නොවූ.

අමූල = (අමූලික) 1. කරුණු රහිත. 2. හේතුවක් නැති. 3. මුලක් නැති.

අමූලාග්‍ර = 1. අග-මුල නැති. 2. අවුල් සහිත.

අමූල්‍ය = 1. මිල කල නොහැකි. 2. ඉතා අගනා.

අමෘත = 1. නොමැරෙණ. 2. ජරාවට නොපැමි-ණෙන. 3. නිවණ. 4. දෙවියන්ගේ සුධා භෝජනය. 5. දෙවියන්ගේ බීම. 6. පිරිසුදු වෙඩරු. 7. රසදිය. 8. රත්රන්. 9. මධුර. 10. ජලය. 11. බත්. 12. කිරි ආදී පන් ගෝ රස. 13. නොඉල්ලා ලැබෙන දෙය.

අමෘතා = 1. බුලත් 2. අරළු 3. හෙල්ලී. 4. රසකිඳ.

අමෘතාඤ්ජන = (අමෘත + අංජන) 1. අමෘත යෙන් සෑදූ අඳුන. 2. අමෘතය සේ ගුණ ඇති අඳුන.

අමෘතාභිෂේක = 1. අමෘතයෙන් (හිස) තෙමීම

අමෘතාර්ණව = (අමෘත + අර්ණව) 1. අමා මුහුද.

අමෘත කලාව = 1. චන්ද්‍රයාගේ ගෙවීම හා වැඩීමද අනුව ශරීරයක්හි ඒ ඒ තැන්වල පවත්නා යහපත් තත්වයක්.

අමෘත පද = 1. මරණ රහිත නිවණ.

අමෘත පාන = 1. අමාපැන්. 2. අමාබීම.

අමෘත ඵල = 1. මිහිරි රස ඇති ගෙඩි. 2. නිවණ.

අමෘත වාදී = 1. අමෘතය. (නිර්වාණය) ප්‍රකාශ කරන.

අමෘත හස්ත = 1. රෝග සුව කිරීමේ බලයක් ඇති අත. 2. ගැබුණු පමණකින් රෝග සුව කිරීමේ බලයක් ඇති අත. 3. අමෘතය වැනි අත. 4. එනම් හව්කාරුව.

අමෘතාශන = 1. අමෘතය විකුණන වෙළඳ සැල.

අමෘදු = 1. මොළොක් නැති. 2. තද.

අමෘෂා = 1. නිබොරු. 2. සත්‍ය.

අමෙතිකාව = 1. එනම් මහා විපත.

අමේධ = 1. නුවණ නැති. 2. මෝඩ.

අමේධ්‍යය = 1. අශුචි. 2. කසළ.

අමේය = 1. මැනිය නොහැකි. 2. අප්‍රමාණ.

අමෛත්‍රී = 1. කරුණාවන්ත නොවන. 2. දයාවක් නැති. 3. මිත්‍ර නුවූ.

අමෝඝා = 1. සපේරාල්. 2 වළඟසාල්.

අමෝඝ = 1. නොසිස්. 2. හිස් නුවූ. 3. නිෂ්ඵල නැති.

අමෝද = 1. සතුට. 2. මහා සුවඳ.

අමෝරනවා = 1. උළුක්කරනවා. 2. ඔබවනවා.

අමෝහ = 1. මෝහ නැති. 2. සුබුද්ධිබව. 3. නුවණ.

අමෝහිත = 1. නොරැවටුණු. 2 මෝහ නැති.

අග = 1. තැනැත්තෝ. 2. ආදායම. 3. සැපය, 4 අතිවෘෂ්ටිය. 5. ලැබීම. 6. අගබඳු 7. පිහ 8. කාරණය. 9. සහයෝගය දේ. 10. යම් කිසිවක් ඉපදීමට හේතුවන දේ. 11. ගසඹ. 12. රන් ගොකටු. 13. යෑම. 14. අමාරුව. 15. අග කිරීම. 16 ඇනුම් අනිනවා.

අගකරගනවා = 1. එක්ට නිබඳ මුදල් ලබා ගන්නවා. 2. අයබදු ලබා ගන්නවා.

අගකාරයා = (අගකාර) 1. යකඩින් කර්මාන්ත කරන්නා.

අගකෑල් = 1. ගසඹ.

අගකෑමි = 1. ආදායම් බාරකාරයා. 2. ආදායම් එකතුකරන්නා. 3. භාණ්ඩාගාරිකයා.

අගගම = 1. ආදායම් උපදින ගම 2. නින්දගම.

අගජ = 1. ගාමසාරුකොට.

අගජන = 1. අගැදීම.

අගජනාව = (අගජම) 1. ආරාධනය. 2. කැඳවීම.

අගතානජද්දය = (ආගතානජද්දය) 1. දිග අතට සැපීම.

අගතෑණ = 1 ආයතන. 2. ප්‍රධාන විහාරස්ථාන. 3. විහාරස්ථානයන්හි ප්‍රධානබව.

අගති = 1. සන්තක.

අගත් = (අයිති) 1. සන්තක වූ. 2. අයිති වූ.

අගතුරු = 1. මාගීය. 2. මාවත.

අගත්න = 1. යත්න නොකරන. 2. නොවෙහෙස, 3. වෑයම් නොකරන. 4. අලස. 5. නිරුත්සාහය.

අගප්‍රාප්ති = 1. වැරදි කෝරුම. 2. වැරදි සහිත.

අගත්‍රාවාදී = 1. නොකිසි සේ සිතන. 2. වරදවා සිතන.

අගදනා = 1. ඉල්ලන. 2. ඉල්ලීම.

අගදගන්නාවා = 1. ඉල්ලා ගන්නවා.

අගදම්නාවා = 1. දුදු ගැසීමේදී වැඩිපුර ලකුණු ගන්නවා. 2. දිනන ලෙස දුදු කැට දමනවා.

අගදකුම් = 1. ආදායම් සම්බර.

අගදිනවා = 1. යාච්ඤා කරනවා. 2. යටහත් ලෙස ඉල්ලනවා. 3. කන්නලව් කරනවා.

අයන = 1. මාර්ගය. 2. ගමන. 3. නිවණ. 4. පියල් ගස. 5. සූර්යයාගේ උත්තරායන-දක්ෂිණායන මාර්ග. 6. ඒ අයනයකට අයත් කාලය. (මාස හය) 7. විවෘත කරන.

අයනවා = 1. ඇකුම් අරිනවා.

අයනෑදුරා = (අයන + ඇදුරා) 1. නිවන් මග උගන්වන්නා. (බුදුන් වහන්සේ)

අයස = 1. තො කැප.

අයසකිළි = 1. නොකැප කුටිය.

අයසබුර = 1. ආදායම් බද්ද 2. ආදායම වශයෙන් ලැබෙන තෑගි. 3. කප්පම.

අයපුගති = 1. ලාභ - ප්‍රයෝජන.

අයබද්ද = 1. රජයෙන් අයකරන බද්ද. 2. අය උපදනා බදු. 3. ආදායම් විසින් ගන්නා මුදල.

අය බිම = 1. අයබදු අයකරන ඉඩම. 2. ආදායම් උපදනා ඉඩම.

අයම = (අයම්) 1. දිග. 2. දිග පැත්ත.

අයම් නොයම් = 1. අග හිඟකම්.

අයමුඛ = 1. ආදායම් උපදනා මාර්ග. 2. ආදායම.

අයලෝහ = 1. යකඩ.

අයල = 1. ආගන්තුක. 2. අළුතෙන් පැමිණි. 3. අගිල්. 4. අමුතු. 5. තැනින් - තැන ඇවිදින. 6. පළිතය.

අයව්‍යය = 1. ආදායම හා වියදම.

අයස = 1. නින්දාව. 2. දුෂ්ටකම. 3. වෙහෙස.

අයශස් = 1. අපකීර්තිය.

අයශ්චූර්ණ = (අයසුන්) 1. යකඩ කුඩු. 2. යකුණු.

අයශලා = 1. යකඩ කූර.

අයශ්ශූලය = 1. යවුල. 2. යකඩ උල.

අයස් = 1. යකඩ.

අයස්කාවර්ෂනාව = 1. කාන්දම් බලය මැනීම.

අයස්කාන්ත = 1. කාන්දම් බලය ඇති.

අයස්කාරය = 1. යකඩ වැඩ කාරයා. 2. ආචාරියා.

අයස්ප්‍රකාශනායන්ත්‍රය = 1. කාන්දම් බලය මනින යන්ත්‍රය.

අයස්ප්‍රච්ඡාදිත = 1. යකඩින් වැසුණු.

අයස්ථාන = 1. කුමාරයා. 2. ආදිපාදයා.

අශුභ = 1 අශුභය.

අශුභපත = 1. තපුර. 2. දුක්ගිරිගැර සහිත තත්වය. 3. වරද සහිත දේ.

අශුභපක් = 1. තපුරු. 2. දුෂ්ට ගති ඇති.

අයඃ = 1. (අයස්) 1. යකඩ.

අයඃ පිණ්ඩය = 1. යකඩ කන්ද.

අයඃ ප්‍රාකාරය = 1. යකඩ තාප්පය.

අයඃස්ථාණු = 1. යකඩ කඳ.

අයාගන්නාවා = 1. ඇකුම් අරිනවා. 2. කට ඇරගෙන ඉන්නවා.

අයාචිත = 1. නො ඉල්ලන ලද.

අයාතපුම් = 1. පහන දක්වන.

අයාසක් = 1. අයහපත්.

අයාම = 1. මරණය. 2. නැතිවීම. 3. හිඟකම.

අයාමහාදෝෂ = 1. වැරදි. 2. අදෝස්තැන් 3. ඕපාදූප.

අයාම් = 1. ඇවෑම. 2. පහුවීම. 3. ගෙවීම. 4. මරණය.

අයාලයා = 1. ආගන්තුකයා. 2. තැනින් තැන යන්නා. 3. පාදඩයා. 4. ඉබාගාතේ යන්නා.

අයාසය = 1. වීර්යය. 2. වෙහෙස.

අයිති = (අයත්) 1. සන්තක. 2. බාරව හෝ අයිතිව තිබෙන.

අයිතිවාසිකම = 1. හිමිකම. 2. අයිති බව.

අයින = 1. මනුස් රංචුව. 2. අද්දර. 3. පැත්ත. 4. සමූහය.

අයින් = 1. ආයතන. 2. දුත්තේ තැති. 3. රැළ. 4 හොරෙන් ගත්. 5. පැත්ත. 6. අද්දර.

අයිනාදන් = 1. අදින්නා දානය. 2. නුදුන් දෙය ගැනීම. 3. හොරකම.

අයියා = 1. වැඩිමහල් සහෝදරයා.

අයියන් කෝවිල් = 1. අයියනායක දේවාලය.

අයියන්ඩි = 1. අයියා.

අයියනායක = (අයියනාර් - අයියනාර් - අයියන්) වන්නි හත්පත්තුවේ වනයන්ට අධිගෘහිත දේවතාවා.

අභියෝ = 1. වේදනාවක් හෝ භයක් පැමිණි විට කියවෙන වචනයක්.

අභිරා = 1. වැඩි. 2. අධික. 3. අතිරේක 4. වඩා.

අභිරාවණ = 1. ශක්‍රයාගේ ඇතා. 2. දළ ඇති ඇතා. 3. ඓරාවණ හස්තියා.

අභිරාමා = 1. කුඩා මිරිදිය මාලුවෙක්.

අභිරාවක = 1. නාරං.

අභිරූ = 1. ආකාරය. 2. හැඩහුරුකම. 3. සමාන. 4 මතක. 5. සිහිය. 6. පුරුද්ද.

අභිල = 1. ගරායකුන් නැටුමේදී තට්ටුවක් නැගී පදින කොරක ලී දෙකක් බැඳ සැදූ ඉනිමඟ. 2. යකුන්ට පිදූ ආහාර. 3. බලි තට්ටුව. 4. වීකරල් වසා තිබෙන කොළය. 5. පාදඩයා. 6. යකුන්ට පිදූ දෙය කන්නා.

අභිෂ = 1. මුදවන ලද දිය.

අභිෂ්මාළු = 1. අයිස් දමනලද මාළු; සීත කළ මාළු.

අභිසෝන්ඩුවක් = 1. වැරැද්දක්. 2. වැරදි ගැනී-මට කරුණක්. 3. පාඩුවක්.

අයු = 1. පසුගිය. 2. අතීත. 3. ආයුෂ.

අයුකාල් = 1. අතීත කාලය. 2. පසුගිය කාලය.

අයුක්ත = 1. නොගැළපුණු. 2 අයුතු. 3. අයෝග්‍ය.

අයුක්තිය = 1. යුක්තියක් නොවන ක්‍රියාව. 2. වැරැද්ද.

අයුණු = 1. අගුණ. 2 වරද. 3. ආකීර්ණ. (ගැවසුණු)

අයුත් = 1. අවුත්.

අයුත = 1. දස දහස 2. යුක්ත නොවූ.

අයුතු = 1. නුසුදුසු ක්‍රියා. 2 වැරදි.

අයුත්ත = 1. අයුතුකම. 2. වැරැද්ද.

අයුබැව් = 1. පෙර ජාතිය.

අයුරු = 1. ආකාර. 2. තොරතුරු. 3. සිහිය. 4. එවැනි. 5. විස්තර.

අයෙක් = (ආයෙත්) 1. නැවතත්.

අයෙත් = 1. නැවතත්.

අයෝග = 1. නොයෙදීම. 2. නොගැලපීම. 3. වෙන්වීම. 4. අසතුටුවීම 5. අසමාන.

අයෝග්‍ය = 1. නුසුදුසු.

අයෝගත = (අයෝගත) 1. හුළුසෙබිය.

අයෝජිත = 1. යෙදී නැති. 2. නොබැඳි.

අයෝජ්‍යමාන = 1. නොයෙදෙන.

අයෝධ්‍ය = 1. යුද්ධ කළ නොහැකි. 2. යුද්ධ නොකළයුතු. 3. පැරදවිය නොහැකි. 4. දඹදිව් පැරණි පුරයක්.

අයෝනිසෝමනසිකාරය = 1. කරුණු මුල සිට කල්පනා නොකිරීම. 2. නොනිසි ක්‍රමයකින් කල්පනා කිරීම. 3. නුනුවණින් මෙනෙහි කිරීම.

අයෝමය = 1. යකඩින් සෑදූ.

අයෝමල = 1. යකඩ මල. (මලකඩ)

අයෝමුද්ගරය = 1. යකඩ පොල්ල. 2. යගදාව.

අර = 1. ඒ. 2. තෙල පෙනෙන හරියේ. 3. අරටුව. 4. බලය. 5. රෝදයෙහි ගරාදි. 6. රසදිය. 7. ස්වල්ප. 8. සැහැල්ලු. 9. භාගය. 10 ආරම්භය.

අරඅඳිනවා = 1. සූදානම් වෙනවා. 2. සැර-සෙනවා.

අරක = 1 එය. 2. ඒක.

අරකා = 1. ඒ අය. 2. ඒ තබයා.

අරකි = 1. ඒ ස්ත්‍රී. 2. ඒ ගැහැණු සතා.

අරක් = 1. ආරක්ෂාව. 2. රැකවල.

අරක්කාරු = 1. ආරක්ෂාකාර.

අරක්කැමියා = 1. කෑම පිසන්නා.

අරක්කු = 1. පොල් රා උණුකොට සදන මත්පැන්.

අරක්ගත් = 1. අධිගෘහිත. 2. ආරක්ෂා කරන. 3. අධිපති.

අරක්ගල් = 1. ආරක්ෂාව පිණිස මන්ත්‍රජප-කොට දමන ගල්.

අරක්දෙවියා = 1. ආරක්ෂා කරන දෙවියා.

අරක්නා = 1. ආරක්ෂක ස්ථානය.

අරක්පොල් = 1. ගොයම් ඇඹිම ඇරඹීමෙහිදී ආරක්ෂාව සඳහා නාමතොකී භාජක මන්ත්‍ර ජප කළ පොල් ගෙඩිය

අරක්පොළ = 1. අරක්වළ.

අරක්මෙහෙ = (අරක්මේ) 1. මුර වැඩේ. 2. ආරක්ෂක සේවය.

අරක්මෙනා = 1. මුර වැඩෙහි ප්‍රධානයා.

අරක්සැමි = 1. ආරක්ෂක සවාමි.

අරග්ගන්නවා = 1. (යකෙකු හෝ දේවතාවෙකු මෙන්) යම්කිසි තැනක් භාරව ඉන්නවා. 2. වැහී ඉන්නවා.

අරගලය = 1. ආරාවුල. 2. කෝලාහලය. 3. ඝෝෂාව. 4. අවුල.

අරඝට්ට = 1. ලිංවලින් දිය ඇදීමට සෑදූ යන්ත්‍රයක්.

අරඟු = 1. මාගී සැරසිල්ලක්.

අරජ = 1. දූවිලි නැති.

අරජස්ක = 1. රෙදි නො අපුල්ලන.

අරද්ධවිරිය = 1. ආරද්ධ විරිය. (පටන් ගත් වීර්‍ය්‍ය ඇති)

අරඤ්ඤ = 1. අරණ්‍ය. 2. වනාන්තරයට අයිති.

අරටුව = 1. ගස්වල හරය. 2. ලීයෙහි මැද පිහිටි තද කොටස.

අරණ = 1. වනය. 2. අණිවය. 3. ගස් වෙසෙසක්. 4 යුධ රහිත. 5. මිදි වැල. 6. කැලෑව. 7. කෙලෙස් නැති. 8. ආරුළුවන. 9. දුරීම.

අරණලු = (අරණ + අලු) 1. අරුණාලෝකය. ඉරිමා උදේ ඇතිවන එළිය.

අරණි = 1. ගිනි ගානා දණ්ඩ. 2. දර. 3. ගිනි. 4. සූර්යයා. 5. මාර්ගය. 6. ගසක්.

අරණ්‍ය = 1. වනය. 2. වනාන්තරයට අයිති.

අරණ්‍යකාන = 1. වනයක් කරන ලද.

අරණ්‍යජ = 1. වනයේ උපන්. 2. වනයේ හටගත්.

අරණ්‍යවාසියා = 1. වනයෙහි වාසය කරන්නා. 2. තාපසයා.

අරණ්‍යමක්ෂිකා = 1. ඇට මැස්සා.

අරත = 1. උනන්දු නැති. 2. අමනාප වූ.

අරතර = 1. තද. 2. ඉතා. 3. සවි.

අරත්ත = 1. එනම් පැලැටි වර්ගය.

අරති = 1. නො ඇල්ම. 2. වශවර්ති මාරයාගේ දුවක්. 2. ලෝභ-ද්වෙෂ-මෝහාදි කෙලෙස් නැති. 3. අසතුටු. 4. ප්‍රිය නොකරන. 5. කෝපය. 6. කණගාටුව. 7. පිත් රෝගයක්.

අරතිචිත්ත = 1. නො ඇලෙන සිත.

අරද = 1. නිතර.

අරදග = 1. මැරවරකම්. 2. හිතුවක්කාරකම්. 3. මුරණ්ඩු ගති.

අරදු = 1. ආරද්ධ, පටන්ගත්.

අරන් = 1. අරණ්‍යය. 2. ඇරගෙන; රැගෙන.

අරන්කහ = 1. වල් කහ. 2. හරන් කහ.

අරසරෙස්සුම = 1. අඩුවෙන් වියදම් කොට මුදල් රැක ගැනීම. 2. ආරක්ෂාවෙහි පරිශ්‍රමය.

අරසිසිමුසුම් = 1. ආරක්ෂාව හා පමණට වඩා වියදම් නොකිරීම.

අරබ = 1. ආරාම.

අරබයා = (අරබ - අරභයා) 1. උදෙසා. 2. නිසා. 3. ගැන. 4. මුල් කොට ගෙන.

අරබය = (අරඹ) 1. ආරම්භය. 2. පටන් ගැන්ම. 3. ගස් කොළන් වලින් ආවරණය වූනු ස්ථානය.

අරම් = 1. ආරාමය. 2 උයන.

අරම = 1. ආරාමය. 2. උයන. 3. වනය. 4. අම්නම් නේත්‍ර රෝගය. 5. අඩම.

අරමණ = 1. වර්ණ විශෙෂයක්. 2. ලාදුරු ඩිගීයක්. 3. රාමඤ්ඤ දේශය. 4. ගස් වෙසෙසක්. 5. පැතලි.

අරමණයා = 1. අරමණ වර්ණයේ පණුවා. 2. රාමඤ්ඤ දේශයේ වැසියා.

අරමන්ද = 1. වේලාගස.

අරමිණිය = 1. කකුලකින් කකුල ගොතා හිඳීම. 2. එරමිණිය ගොතා හිඳීම. 3. දෙපා නමා බැඳ හිඳීම. 4. අරමුණු.

අරමුණ = 1. ආරම්මණය. (ඇස් ආදි ඉන්ද්‍රියයන්ට ගෝචරවන රූපාදිය. 2. අදහස. 3 පටන් ගැන්ම. 4. හිතක් ඉපදීමට ආධාර වන දේ.

අරමුදල = 1. යම් කිසිවකට යෙදූ ප්‍රධාන මුදල. 2. රැක්ක යුතු ධනය. 3. භාණ්ඩාගාරයේ එකතු වී තිබෙන මුදල.

අරමු = 1. අර මොහු. 2. අසවලා.

අරඹ = 1. උයන. 2. කැලෑව. 3. ආරම්භය. 4. ගස්කොළත් වලින් වැසී තිබෙන ස්ථානය. 5. (පුවක් ආදී) ගස් පේළිය.

අරම්‍ය = 1. රම්‍ය නොවූ. 2. ප්‍රිය නොවන.

අරය = 1. රෝද ගරාදිය.

අරරුත් = (අරලුප්.) 1. හුළංකිරිය.

අරලිය = 1. එනම් මල් ගස්.

අරව = 1. ශබ්ද නැති.

අරවනවා=1. යවත්ව සිදුකරනවා. 2. බෙරනවා.

අරවර = 1. මැරවර.

අරවා = 1. ඒවා.

අරවින්ද = 1. පද්මය.

අරවින්ද සර = 1 අනඞ්ගයා ගේ පියුම් ඊය.

අරස = 1. රස නැති.

අරසර = 1. යහපත් හික්මීම. 2. සුචරිතය.

අරහ = 1. රහසින්වත් පව් නොකරන. 2. සංසාර චක්‍රයෙහි අරයන් කැපූ. 3. කෙලෙස් නමැති අරින් නැසූ. 4. පූජාවට නිසි වූ. 5. බුදුන් වහන්සේ.

අරහත් = (අර්හත්.) 1. රහත්. 2. නිර්වාණාව-බෝධය.

අරහන්ත = 1. රහතුන් වහන්සේ.

අරහේ = 1. එහේ.

අරහස් = 1. රහස් නොවන. 2. ප්‍රකට.

අරළු = 1. එනම් බෙහෙත් ගස් වර්ගය. (හරීතකී) 2. වැටකේ-තුග ආදියෙහි කඳෙන් බිමට ඇදෙන මුල්. 3. සරළුව. (හැන්ද.)

අරළු ගින් = 1. අරළු ගස්.

අරළු ලොම්හා = 1. පිත්තල.

අරළු සුණු = 1. අරළු පිටි.

අර්ක = 1. සූර්යයාට අයිති. 2. සූර්යයා 3. වරාගස. 4. පළිගු. 5. රතු. 6. ඉන්ද්‍ර 7. විෂ්ණු. 8. පණ්ඩිතයා. 9. ඖෂධ විශේෂයක්. 10. තඹ.

අර්ක චන්දන = 1. රත් හඳුන්.

අර්ක නන්දන = 1. සූර්යයාගේ පුත්‍රයා. 2. යම.

අර්ක බන්ධු = 1. බුදුන් වහන්සේ. 2. නෙළුම්.

අර්කෝපල = 1. සූර්ය කාන්ති මැණික.

අර්ක මණ්ඩලය= 1. හිරු මඬල.

අර්කය =. පළිඟුව. 2. වරාගස. 3. තඹ.

අර්ගල = 1. අගුල 2. බාධාව. 3. රළ. 4. අරගලය.

අර්ඝිකා= 1. ඇගෑ. 2. පහන් ගහ 3. තොරණ විශේෂයක්.

අර්ඝ = 1. වටිනාකම ඇති. 2. පූජාව.

අර්චනය = 1. වැඳීම. 2. පිදීම. 3. පූජාව.

අර්චනීය = 1. පිදිය යුතු.

අර්චය = 1. ගිනිදැල්ල.

අර්චිත = 1. පුදන ලද.

අර්ජිත = 1. රැස්කළ.

අර්ජුන = 1. කුඹුක් ගස. 2. මොනරා. 3. සුදු පැහැය. 4. පාණ්ඩව කුමාරයෙක්. 5. එනම් රජ. 6. පැහැදිලි. 7. ඇසෙහි සුදු ඉංගිරියාවේ හට ගැනෙන රත.

අර්ණව = 1. මුහුද. 2. සමුද්‍රය.

අර්ණවෝද්භව=(අර්ණව + උද්භව) 1. මුදෙන් උපන්. (හඳට නාමයක්.)

අර්තාපල් = (අරතපල්.) 1. එනම් අල වර්ගය.

අර්ථ = 1. තේරුම්. 2. ධනය. 3. හිතවැඩ. 4. කාරණය. 5. බුද්ධිය. 6. ප්‍රයෝජන. 7. ශක්තිය. 8. රුචිය. 9. වැළැක්ම. 10. සාදෘශ්‍යය. 11. යහපත.

අර්ථ අනර්ථ = 1. හොඳ නොහොඳ. 2. වැඩ අවැඩ.

අර්ථ අන්විත = 1. අර්ථයෙන් යුක්ත. 2. තේරුම ඇති.

අර්ථ අලඞ්කාර = 1. අර්ථය සරසන උපමා රූපකාදිය.

අර්ථ අවගම = (අර්ථ අවබෝධ.) 1. තේරුම් දැනගැනීම.

අර්ථ ආත්මක = 1. අර්ථයට ඇතුළත්. 2. අර්ථය ශරීර කොට ඇති.

අර්ථ ආවෘත්ති = 1. කියූ අර්ථය නැවත-නැවත කීම නමැති අලඞ්කාරය.

අර්ථ උත්පත්ති = 1. කාරණයක් ඇතිවීම. 2. නිදානය.

අර්ථ උද්ධාර = 1. අදහස මතුකර ගැනීම.

අර්ථ උපාර්ජනය = 1. ධනය සැපයීම.

අර්ථ කථනය = 1. අර්ථ කීම. 2 තේරුම් කර දීම.

අර්ථකථා = 1. අටුවා 2. අර්ථය. පැහැදිලිකර දීම. 3 ලියූ ව්‍යාඛ්‍යා ග්‍රන්ථ.

අර්ථ කථාචාර්ය = (අර්ථ කථා + ආචාර්ය) 1. අර්ථ කථා (අටුවා) ලියූ බුද්ධඝෝෂ ආදි මහතෙරහු.

අර්ථකාමා = 1. ඉල්ලන්නා. 2. හිඟන්නා. 3. අවදි කරන්නා.

අර්ථ කියනවා = 1. තේරුම් ආදිය විස්තර කර දෙනවා.

අර්ථ ක්‍රියාව = 1. (ව්‍යාකරණයෙහි) ක්‍රියා කාරයා දක්වන නාම පදය.

අර්ථ ගම්භීර = 1. අර්ථයෙන් ගැඹුරු වූ. 2. ගැඹුරු අර්ථ ඇති.

අර්ථ ග්‍රාම්‍ය = 1. අර්ථයෙන් ග්‍රාම්‍යවූ.

අර්ථ චර්යාව = 1. හිත වැඩෙහි හැසිරීම. 2. නැගි වන්න කම. 3. යහපත සඳහා යෙදීම.

අර්ථ තත්වය = 1. සත්‍ය භාවය. (ඇත්ත)

අර්ථ දර්ශන = 1. අර්ථ දැක්වීම.

අර්ථ දායක = 1. වැඩ සැලසෙන. 2. ප්‍රයෝ-ජනවත්.

අර්ථ දීපන = 1. අර්ථ දැක්වීම. 2. අර්ථය බැබලවීම.

අර්ථ ද්වාර = 1 අර්ථය පිවිසෙන දොරටුව.

අර්ථ දූෂණය = 1. වස්තු නැති කිරීම. 2. අර්ථය සදොස් කිරීම.

අර්ථාන්විත = 1. අර්ථයෙන් යුක්ත. (තේරුම ඇති) 2. යහපත් අදහසින් යුත් අර්ථ ඇති.

අර්ථ නායක = 1. ධනය හෝ නීතිය පිළිබඳ ප්‍රධානයා.

අර්ථ නිරුක්තිය = 1. වචනයක උත්පත්තිය හා තේරුම විස්තර කිරීම.

අර්ථ ධර්මානුශාසනා = 1. ධනය රැස් කළ යුතු පිළිවෙළ හා ධනය හැසිරිය යුතු පිළිවෙළ ආදියක් පිළිබඳ අනුශාසනාව.

අර්ථ ප්‍රඥප්ති = 1. අර්ථය පැණවීම. 2. නම් තැබීම.

අර්ථ ප්‍රයෝගය = 1. වස්තුවෙන් ප්‍රයෝජන ගැනීම. 2. පොලිය.

අර්ථ බල = 1. ධන බලය. 2. තේරුම අන් ලෙසකින් අවබෝධ නොවීම.

අර්ථ බෝධකයා = 1. විස්තර කරන්නා.

අර්ථ භඤ්ජක = 1. අර්ථය බිඳින. 2. කාරණය වනසන.

අර්ථ භාණක = 1. අර්ථ කියන.

අර්ථ යෝජන = 1. අර්ථ යෙදීම.

අර්ථ රසය = 1. අදහසේ ශෝභනකම. 2. අර්ථ-යෙහි ඉතා සුදුසුකම.

අර්ථ වර්ණනා = 1. අර්ථ පිළිබඳ විස්තර. 2. අර්ථ කථා. 3. අටුවා.

අර්ථ විකල්ප = 1. වෙනස් වෙනස් වූ අර්ථ.

අර්ථ විඥානය = 1. තේරුම වටහා ගැනීම. 2 වේදාඞ්ග නම් ශාස්ත්‍රය.

අර්ථ විචාරණ=1 තේරුම කුමක්දැයි පිළිවිසීම.

අර්ථ විනිශ්චය කථා = 1. අර්ථය තෝරා-බේරා ගැනීමට ඉවහල් වන අටුවා.

අර්ථ විවරණය = 1. තේරුම විසඳීම. 2. තේරුම පැහැදිලි කරන ග්‍රන්ථ.

අර්ථ වෛකල්පය = 1. තේරුමේ එකක් හැර වෙන එකක් වීමේ අනුමානය.

අර්ථවෛකල්‍ය = 1. අර්ථයෙහි වෙනස් බව.

අර්ථ ව්‍යක්ති = 1. තේරුම පැහැදිලි බව.

අර්ථ ව්‍යාඛ්‍යානය = 1. තේරුම් විස්තර කිරීම. 2. ගැඹුරු වචනවල තේරුම් විස්තර කරන ග්‍රන්ථ.

අර්ථ ශරීරය = 1. අර්ථය නමැති ශරීරය. 2, කියන්නට අදහස් කළ කාරණය.

අර්ථ ශාස්ත්‍රය = 1. වස්තුව රැස්කිරීම හා පාලනය කිරීම පිළිබඳ ශාස්ත්‍රය. 3. චාණක්‍ය බ්‍රාහ්මණයා විසින් කරන ලද නීති ග්‍රන්ථය.

අර්ථ සංරක්ෂණය = 1. ධනය මනා සේ රැකීම. 2. වස්තුව හරිහැටි ආරක්ෂා කර ගැනීම.

අර්ථ සංවර්ණනා = 1. තේරුම් මනා සේ විස්තර කිරීම. 2. අර්ථය සවිස්තර කොට ලියූ ග්‍රන්ථ.

අර්ථ සංග්‍රහ = 1. අර්ථ එක්තැන් කිරීම. 2. පුරාණයෙහි ලක්දිව තුබුණු පොතක්.

අර්ථ සාධක = 1. දියුණුව සලස්සන. 2. වැඩ දායක.

අර්ථ සාදක අරමුදල = 1. දියුණුව සඳහා එකතු කරන මුදල.

අර්ථ සිද්ධිය = 1. වැඩ ඉෂ්ට වීම. 2. අර්ථය සිදුවීම.

අර්ථ ශූන්‍ය = 1. තේරුමක් නැති. 2. පලක් නැති.

අර්ථ හානි = 1. අර්ථය පිරිහීම.

අර්ථ හීන = 1. තේරුමක් නැති.

අර්ථාගම = (අර්ථ + ආගම) 1. ආදායම.

අර්ථාපත්තිය = 1. අර්ථයේ අනුමානය.

අර්ථාවගම = 1. අදහස දැනීම.

අර්ථාවාචක = 1. තේරුම නොදක්වන.

අර්ථි = 1. ප්‍රයෝජන බලාපොරොත්තුවන. 2. ඉල්ලන.

අර්ථික = 1. වන්දිභට්ටයා. 2. ඉල්ලන්නා. 3. යාචකයා.

අර්ද = 1. අර්ධ.

අර්දරා = 1. ශස්ත්‍ර කර්ම සඳහා නියම කළ අවියක්.

අර්දිත = 1. මුණේ පැත්තක් ඉදිමී ඇති වෙන රෝගයක්.

අර්ධ = 1. කොටස. 2. දෙකෙන් පංගුව. 3. භාගය.

අර්ධ අඞ්ග = 1. අර්ධ ශරීරය.

අර්ධ අශන = 1. අඩක් කෑම.

අර්ධ කවය = 1. වක්‍ර භාගය. 2. කවයකින් දෙකෙන් පංගුව.

අර්ධ කහවණු = 1. බරින් අඩක් බාල ලෝහ වගී මිශ්‍ර කොට තැනූ කහවණු.

අර්ධ කාචකාකාර = 1. අඩක් වීදුරු ආකාරවූ.

අර්ධ කාය = 1. ශරීරයෙන් දෙකෙන් පංගුව,

අර්ධකාෂ්ඨි =1. අඩක් ලී ආකාරවූ.

අර්ධගෝලය = 1. ගෝලයෙන් භාගය.

අර්ධග්‍රහණ = ඉර - හඳ දෙදෙනාගෙන් අඩක් පමණක් රාහු ඇල්ලීම.

අර්ධඝෝෂ = 1. අඩක් ඝෝෂය ඇති. 2. මඳක් ශබ්දවත. 3 යරලව යන අකුරු.

අර්ධචක්‍රය = 1 අඩ කවය.

අර්ධචන්ද්‍ර = 1. අඩ සඳ. 2. අඩ සඳ හැඩය. 3. අඩ සඳවැනි තලයඇති ඊය.

අර්ධචන්ද්‍රාකාරය = 1. අඩ සඳ හැඩ.

අර්ධ චන්ද්‍රිකා පාෂාණ = 1. අඩ සඳ පහණ (සඳකඩ පහණ)

අර්ධජානුක = 1. දණහිස් බිම ඔබා හිඳින.

අර්ධජාල පාද = 1. පාදයන්ගෙන් අඩක් දැල් ආකාරයට බැඳී ඇති.

අර්ධදෘෂ්ටිතාව = 1. අඩ ඇස් පෙණුම.

අර්ධද්‍රවීභූත = 1. මඳක් දියරවූ.

අර්ධද්වීපය = 1. කොටසක් හැර ඉතිරි හරිය ජලයෙන් වටවූ ගොඩබිම. 2. අඩ දිවයින

අර්ධනාරීශ්වර = 1. අර්ධයක් උමාවගේ වන ශරීරයක් ඇති ඊශ්වරයා.

අර්ධපක්ෂ = 1. පතබාගය. 2. අඩපත.

අර්ධපාලක = 1. අඩක් පාලනය කරන. 2. ශරීරයෙන් අඩක් පමණක් වසන නිසණ්ඨයා.

අර්ධපීඨ = 1. පුටු විශේෂයක්.

අර්ධබාහු = 1. අතේ උරෙහි සිට වැලමිට දක්වා ඇති කොටස.

අර්ධබුද්ධි = 1. යමක් වටහා ගැනීමේ ශක්ති-යක් නැති.

අර්ධභූගෝලය = 1. පෘථිවියෙන් භාගය.

අර්ධභ්‍රම = 1. කාව්‍යාලඞ්කාරයක්.

අර්ධමණ්ඩලය = 1. අඩ මඩල.

අර්ධමාගධී = 1. ප්‍රාකෘත භාෂාව.

අර්ධමාත්‍රය = 1. අකුරක් ශබ්ද කරන කාලයෙන් භාගයක්.

අර්ධමාන = 1. ලාස් හෝ තැලි හතර, 2. නිඹ.

අර්ධමාස = 1. අඩ මස.

අර්ධමූර්ජිත = 1. අඩ සිහියෙන් යුත්. 2. අඩක් මූර්ජාවූ.

අර්ධම්ලේච්ඡ = 1. තරමක් වනචර.

අර්ධයෂ්ටි = 1. අඩයටි.

අර්ධයාමය = 1. යාමයකින් භාගය. 2. සිංහල පැය පනක හෝ ඉංග්‍රීසි පැය දෙකක කාලය.

අර්ධයෝජන = 1. අඩ යොදුන.

අර්ධරඞ්ග = 1. ශරීරයෙහි අඩකින් පමණක් කරන නැටුම.

අර්ධරාජ්‍ය = 1. රාජ්‍යයකින් අර්ධය.

අර්ධරාත්‍රය = (අර්ධ රාත්‍රිය) 1. මධ්‍යම රාත්‍රිය. මැදියම් රැ.

අර්ධවිදුති ලකුණ = 1. සංගීත ලකුණක්.

අර්ධ විදුති ස්වරය = 1. සංගීත ශබ්දයක්.

අර්ධවිෂ්කම්භය = 1. චක්‍රයක මැදින් පිහිටි ඉරෙන් දෙකෙන් පංගුව.

අර්ධවීක්ෂණය = 1. ඇස් කොණින් හෝ හොර ඇහින් බැලීම.

අර්ධශිෂ්ට = 1. මඳක් ශීලාචාරවූ.

අර්ධසාංවත්සරිකය = 1. අවුරුද්දෙන් භාග-යක් (සමසක්) ගතවූ දවස.

අර්ධස්වච්ඡ = 1. මඳක් විනිවිද පෙනෙන.

අර්ධස්වර = 1. භාගයක් ශබ්දවන ප්‍රාණාක්ෂ-රය. 2. ශබ්දයෙන් භාගය.

අර්ධාංශය = (අර්ධ + අංශය) 1. භාගයෙන් භාගය.

අර්ධාලිඞ්ගන = 1. භාගයක් වැළඳගැනීම.

අර්ධක = 1. භාග.

අර්ධේන්දු = 1. අඩහඳ.

අර්පණය = 1. බාරදීම. 2. පැවරීම. 3. තැබීම. 4. අර්පණ සමාධිය.

අර්බුදය = 1. පැටලිල්ල. 2. විසඳා ගත නොහැකි කරුණ. 3. ගඩුව. 4. පිළිකාව. 5. කම්මුල් ආදියේ මස්දළු ලියලා සැදෙන රෞද්‍ර රෝගය. 6. දශ කෝටිය. 7. අර්බුද නිරය. 8. මවුකුස පිළිසිඳගත් දරුවකුගේ දෙවැනි අවස්ථාව. 9. නින්නහුත ලක්ෂය.

අර්මන් = 1. නේත්‍ර රෝගයක්.

අර්ය = 1. ආර්ය ජාතිත්ව අයිති. 2. උතුම්. 3. සත්‍යය.

අර්ශස් = 1. එනම් රෝගය.

අර්හ = 1. සුදුසු 2. යෝග්‍ය. 3. වටිනා.

අර්හත් = 1. ශුද්ධවූ. 2. කෙලෙස් නැසූ. 3 රහත්.

අර්හත්ත්ව = 1 රහත් බව.

අර්හද්ධ්වජ = 1. රහතුන්ගේ ධ්වජය; සිවුර.

අරා = 1. තැඟී 2. මාලු වර්ගයක්. 3. කුඹුර අසල තිබෙන කැලෑව. 4. අළුත අස්වැද්දූ කුඹුරෙහි කොටසක්.

අරාග = 1. රාගයෙන් වෙන් වූ.

අරාගී = 1 රාගය නැති.

අරිච්චිමුච්චු = 1. පැටලිලි සහිත දේ.

අරාජ = 1. රජ නොවන අය.

අරාජක = (අරාජික) 1. රජෙකු නැති. 2. රජුන් නැති කාලය.

අරාති = 1. හතුරා.

අරාබියා = 1. අරාබි ජාතිකයා.

අරුව = 1. අළුතෙන් ගොවිතැන් කළ පිට කුඹුර.

අරැකි = 1. ආරක්ෂකයා.

අරි = 1. සතුරා. 2. උතුම්. 3. ආර්ය. 4. අංකාර.

අරිඅටඟමඟ = 1. ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය.

අරික්කාම්බු = 1. කපටි. 2. ප්‍රයෝගකාර.

අරික්කාල = 1. අටෙන් පංගුව. 2. රාත්තලෙන් අටෙන් පංගුව.

අරිකෙළි = 1. මෛථුන ක්‍රීඩාව.

අරිටඨ = 1. ගස් වර්ගයක්.

අරිට්ඨ = 1. අරිෂ්ට. 2. අයහපත්. 3. අශුභ. 4. මැරෙණ ලකුණ.

අරිමු = 1. කපුරු. 2. අශුභ. 3. කටුබා. 4. දුෂ්ට.

අරිමුවා = 1. සතුරා. 2. කපුටා 3. කපුරු මිනිහා.

අරිඨ = 1. කපුරු. 2. අශුභ. 3. කටුබා. 4. කොකොඹ ගස. 5. පෙණෙල ගස. 6. අරිෂ්ට නමින් දක්වෙන බෙහෙත් වර්ගී.

අරිනවා = 1. ගෙතයත්තට ඇලස්වනවා. 2. (දොර – අල්මාරි ආදිය) විවෘත කරනවා. 3. අත්හැර දමනවා. 4. නිදහස් කොට අරිනවා. 5. ඉවත් කරනවා.

අරිත්‍ර = 1. රිට. 2. හබල.

අරිත්‍රකාරයා = 1. සුක්කානම අල්ලන්නා. 2. ඔරුව පදින්නා.

අරිත්‍රය = 1. සුක්කානම.

අරිදන = 1. උතුම් ධනය. 2. උතුම් දනය. 3. ශ්‍රද්ධාදි සප්තවිධ ආර්ය ධනය.

අරිනෙක් = 1. කඳකුමරු. 2. කතරගම දෙවි.

අරින්දම = 1. සතුරන් දමනය කරන්නා. 2. රජ.

අරිපුගුලා = (අරිය පුගුල්) 1. අරහත් බවට පැමුණුණ තැනැත්තා.

අරිම්බුව = 1. ලෝහයෙන් සැදූ දේක අද්දර කැටයම්. 2. අළුත් දළුව. 3 ඉතා සවල්පය.

අරිය = 1. ආර්ය. 2. උතුම්. 3. අරහත්වූ. 4. රෝදය. 5. උසස්. 6. ආරාධකයා.

අරියනවා=1. ආරාධනය කරනවා. 2. ඉල්ලනවා.

අරියර = (අරියොර) 1. නිතරම.

අරියවංශ = 1. ආර්ය පරම්පරාව.

අරියසච්ච = 1. උතුම් සත්‍යය.

අරියාදුව = 1. වැරැද්ද. 2. විරුද්ධත්වය.

අරිෂ්ට = 1. තපුරු. 2. අශුභ.

අරිෂ්ටය = 1. නරක ලකුණ. 2. අශුභ නිමිත්ත. 3. තපුර. 4. වෙඩරු. 5. බෙහෙත් අරක්කු. 6. කඳුළු. 7. සුදුලූණු. 8. විවේක ගන්නා කාමරය.

අරිෂ්ටයා = 1. කපුටා. 2. හතුරා. 3. දුෂ්ටයා. 4. අසුරයා.

අරිසඟ = 1. ආර්ය සංඝයා.

අරිසපත්නි = 1. පෙනත්ගස.

අරිසව් = 1. අර්යශ්‍රාවක. 2. උතුම් ශෝත්‍රයා.

අරිසස් = 1. එනම් රෝගය.

අරු = 1. රාජ රථය. 2 රජු නැගී යන මඟුල් රිය. 3. හස්ත්‍යාදීන් පිට නැඟෙන්නා. 4. දුර. 5. පෙළ. 6. ලෝහ වක්කරන අච්චුව. 7. නොයම් කපන්නෙකුට වෙන් කළ ගොයම් කොටස. 8. වණය – තුවාලය. 9. නොදුර.

අරුක = 1. ලාංදුරු වර්ගයක්.

අරුකා = 1. වණය. 2. තුවාලය.

අරුකාර = 1. කුඹුරු වැඩවල යෙදී සිටින්නන් ගේ මූලිකයා.

අරුකාය = 1. කුණුකය. 2. වණ සමූහය.

අරුචි = 1. රුචි නැති. 2. සතුටු නැතිවීම. 3. රස නැති. 4. පිළිකුල්. 5. ආහාරයට අප්‍රිය භාවය. 6. අමිහිරි.

අරුචිර = 1. සිත්කළු නොවූ. 2. සිත් ඇදගැනී-මක් නැති. 3. අවලස්සණ.

අරුණ = 1. සූර්යයා. 2. සූර්යයා උදාවීමට ප්‍රථම යෙන් නැඟෙනහිර අහසේ ඇතිවන රක්ත වර්ණ ආලෝකය. 3. රත් පැහැය. 4. අලුයම. 5. අසුර කොටසක්. 6. දෙඹ. 7. ලාංදුරු වර්ගයක් 8. මදටිය. 9. අතිවිඩයම්. 10. රත් තිවුල්. 11. තිරශ්සවාලු. 12. වැල් මදට. 13. නිශ්ශබ්දය. 14. සින්දුරම්.

අරුණ අලු = 1. අරුණාලෝකය.

අරුණෝදය = 1. අරුණ නැගීම. 2. අලුයම.

අරුණ උද්ගමන = 1. අරුණාලෝකය ඇතිවීම.

අරුණෝපල = 1. රතු කැට.

අරුණකර = 1. සූර්යයා.

අරුණවන් = 1. මඳක් රත් පැහැය. 2. දුඹුරු පාට.

අරුණ සාරථි = 1. ඉර. 2. සූර්ය රථාචාර්යයා.

අරුණාළු = 1. අරුණාලෝකය. 2. ඉර උදා වන්නට පෙර නැඟෙනහිර අහසේ ඇතිවන එළිය.

අරුණෝකා = 1. උළුහාල්.

අරුණු = 1. හිරුගේ රියැදුරා ලෙස සැලකෙන අරුණ. 2. අලුයම. 3. තඹපාට. 4. අඩු බව. 5. නැති බව.

අරුණෝදය = 1. අලුයම.

අරුණුසඳ = 1. ආරුණ ශබ්ද. 2. අර්ථයට විරුද්ධව ඇතිවූ නාම ශබ්ද.

අරුත = 1. තේරුම. 2. වස්තුව.

අරුත්කිරිය = 1 අර්ථක්‍රියාව.

අරුත්පල = 1. තේරුමේ පැහැදිලිකම.

අරුත්වියකන් = 1 අර්ථ ව්‍යාඛ්‍යාන.

අරුත්විලොම් = 1. අර්ථයට විරුද්ධ.

අරුත්සත් = 1. අර්ථ ශාස්ත්‍රය.

අරුත්සරු = 1. අර්ථයෙන් සාරවූ.

අරුතු = 1. අර්ථය; තේරුම.

අරුදුනු = 1. අර්ජුන නම් රජ.

අරුන් = 1 ඒ අය. 2. ඔවුන්.

අරුන්තලය = 1. තෝඩුව. 2. කඩුක්කම.

අරුන්දූ = 1. ඒ (වැඩිහිටි) අය. 2. ඒ තැනැත්තා.

අරුන්දතී = (අරුන්ධතී) 1. වශිෂ්ඨ ඍෂියාගේ භාර්යාව. 2. එනම් තරුව. 3. හත්දින්නේ තරුවක්.

අරුම = 1. අපූරු. 2. පුදුම. 3. ආශ්චර්ය. 4. දුර්ලභ. 5. අමාරු.

අරුමැක්කේ = 1. පුදුමයක් සේ. 2. අහම්බෙන්.

අරුමෝසම් බඩු = 1. විසිතුරු බඩු. 2. ඇඳ - පුටු - මේස ආදි ලී බඩු. 3. අපූරු බඩු.

අරුව = 1. රුව නැති. 2. අරූපී. 3. අවලක්ෂණ. 4. රජුගේ යුද්ධ රථය.

අරුවයා = 1. කුඹලා.

අරූ = 1. ඒ පුද්ගලයා. 2. රූපයක් නැති. 3. අශරීරික. 4. අවලක්ෂණ.

අරූකඳු = 1. අරූප ස්කන්ධ.

අරූතල = 1. අරූපාවචර බ්‍රහ්ම ලෝක.

අරූපවත් = (අරූප වත්ත) 1. අවලක්ෂණ. 2. අශරීරික. 3. විරූපී.

අරූපධ්‍යාන = 1. අරූප ලෝකයන්හි ඉපදීමට හේතුවන ආකාසානඤ්චායතනාදි ධ්‍යාන.

අරූපලෝක = 1. සිත මිස කය නැති බ්‍රහ්ම ලෝක.

අරූපවනනයා = 1. විරූපී තැනැත්තා. 2. අවලස්සණ තැනැත්තා.

අරූපාවචර = 1. අරූපතල බ්‍රහ්මලෝකයෙහි පවතින.

අරූපී = (අරූපික) 1. ශරීරයක් නැති. 2. අව-ලස්සණ. 3. රූපය නැති.

අරේ = 1. ඔයි, අඩේ, බොල, යන අර්ථ ඇති නිපාතයක්. 2. කෑදවීම.

අරෙහට = 1. ඒ පැත්තට. 2. එතැනට.

අරේණුශම් = 1. රැහැණිය.

අරෝ = 1. වියවුල. 2. කලබලය. 3. ආරවුල.

අරෝකාරනවා = 1. සණ්ඩුකරනවා. 2. ආරවුල් කරනවා.

අරෝග = 1. රෝග නැති. 2. නීරෝගී.

අරෝජන = 1. දත්වත.

අරෝම = 1. ලොම් රහිත. 2. මයිල් නැති.

අරෝව = 1. සණ්ඩුව. 2. ආරාවුල. 3. අයිතිකම් කියා ඉල්ලීම.

අරෝෂ = 1. කෝප නැති. 2. ශාන්ත.

අල = 1. (කකුළු ආදීන්ගේ) අඬුව සහිත අත. 2. බතල - දෙහි අල ආදි මුල් වෙසෙස්. 3. ආලය. (ගෙය) 4. ප්‍රේමය. 5. හැරීම. 6. අලු (පැමිණියාවූ) 7. හිරියල්. 8. කළුවර ගස.

අලං = 1. ලස්සණ. 2. ප්‍රමාණවත්වූ.

අලංශාටකයා = 1. වැඩිපුර කෑමට ඉණේ බැඳ තිබෙන පටිය බුරුල් කරන්නා.

අලක = 1. සිතියම. 2. චිත්‍රය.

අලකා = (අලකාව - අලකපුරය - ආලකමන් දව) 1. කුවේරයාගේ රාජධානිය.

අලකඩ = 1. දිරා මොලොක් වූ ලීය. 2 ගිනි මෙලවීමට ගන්නා ලී.

අලකන්ද = 1. අල සිටුවීමට සාදන දිග පස් ගොඩ.

අලකය = 1. වකුටු ඉසකේ රොද. 2. දරණුව.

අලකලංචිය = 1. කරදරය. 2. කරච්චලය. 3. කෝලාහලය.

අලකාධිපතියා = 1. අලකාපුරයේ අධිපතියා. 2. වෙසමුණු රජ.

අලකාය = 1. ගිනි පෙණෙල්ල.

අලක්ත = (අලක්තක) 1. ලාකඩ.

අලක්ෂණ = 1. ලක්ෂණ නැති. 2. අශුභ.

අලක්ෂිතව = 1. වෙතසක් නැතුව. 2. අප්‍රසිද්ධයෙන්.

අලක්ෂ්මිය = 1. අවාසනාව. 2. කාලකන්නිකම.

අලකාව = 1. කියඹුවැල; කපා නළලට වැටෙන්ට සැලැස්වූ ඉසකෙස් රොද.

අලකිෂිය = 1. කුර තම්පලා.

අලගඩුවා = (අලගොඩුවා) 1. එනම් මුදු මාලුවා.

අලගර්දයා = (අලගඩියා) 1. දියනයා.

අලගිය මුලගිය තැන් = 1. සුලමුල.

අලගුව = 1. (පොල් ආදිය මිලට ගැනීමේදී) සියයට එක බැගින් වැඩිපුර ගන්නා ගණන. 2. ගණන දැනගැනීමට සියයට හෝ දහයකට එක බැගින් වැඩිපුර තබන ගණන.

අලග්න = 1. නොබැඳුණු. 2. නොඇලුණු.

අලඞ්කරණය = 1. සැරසිල්ල. 2. අලඞ්කාර කිරීම.

අලඞ්කාර = 1. සිත්කළු. 2. ලස්සණ. 3. සැරසීම. 4. ආභරණ. 5. කාව්‍යයන් සරසන උපමා ආදිය.

අලඞ්කාරෝක්තිය = 1. විසිතුරු භාෂාව.

අලඞ්කෘත = 1. විසිතුරු කරනලද. 2. සරසන ලද.

අලඞ්ඝන = 1. කඩ නොකරන. 2. වෙනස් නොවන.

අලඞ්ඝනීය = 1. කඩකළ නොහැකිවූ. 2. කඩ කළ යුතුනුවූ.

අලග = 1. ආලිඞ්ගනය. 2. සිප වැළඳ ගැනීම.

අලජ්ජී = (අලජ්ජික) 1. ලජ්ජා නැති.

අලත්තා = 1. ලාකඩ. 2. ලාකඩ ගෑම.

අලත්තාපිරියම්කළ = 1. ලාකඩින් අළුත් වැඩියා කළ.

අලද්දරණ = 1. අලඞ්සිත.

අලන = (අලවුන) 1. අලින් බඳින කණුව. (ආලානය)

අලන්දු = 1. නොඉවසිල්ල 2. තද ආශාව.

අලපත = 1. අලවලින් එන ගොබය. 2. ගහල කොළය.

අලපලා = 1. කිඩාරම්.

අලප් = 1. ආමන්ත්‍රණය. 2. ආලපනය. 3. කැඳවීම.

අලප්විබත් = 1. ආලපන විභක්තිය.

අලබ්ධ = 1. නොලැබුණු.

අලබ්ධික = 1. ලබ්ධියක් නැත්තාවූ. 2. ආගමක් නැති 3. ඇදහිල්ලක් නැති.

අලබු = 1. ලබු වගීයක්.

අලභ්‍ය = 1. ලබාගත නොහැකිවූ.

අලමඳුව = 1. ආලකමන්දව. 2. කුවේරයාගේ නගරය.

අලමඳන්සේ = 1. අලපෙති ගසන්නාක් මෙන්.

අලම්බුසා = 1. එනම් දෙවඟන.

අලමුල් = 1. පියුම් අල. 2. අල නමැති මුල්.

අලම්බය = 1. පහළට එල්ලෙන. 2. උහුලා සිටින.

අලම්බන = 1. අරමුණු.

අලම්බදම්බු = (අලම්බයටි) 1. සැරයටිය.

අලම්බයන් = 1 විෂවෛද්‍යයා.

අලය = 1. ගස් හෝ වැල්වල මුල් මහත් වීමෙන් ඇතිවෙන ගුලියක්.

අලයම්බු = 1. වුවමනාවට වඩා හුරතල් කිරීම නිසා ළදරුවන්ගෙන් ඇතිවන කරදර.

අලරි = 1. විෂසහිත ගස් වගීයක් 2. කනේරු.

අලකිඹා = 1. මකරා වැනි සතෙක්. 2. පිස්සු බල්ලා.

අලලනවා = 1 කලත්තනවා. 2. වංචල කරනවා 3. කාල්ගානවා.

අලව = 1. සුදුදුරු.

අලවලෑල්ල = 1. කදේපිටින් ඉරූ ලෑල්ල.

අලවංගුව = 1. රථයෙහි රෝද සවිවන යකඩ පොල්ල. 2. පොළොව හෑරීම් ආදිය සඳහා ගන්නා යකඩඋල. 3. භාරාසනය,

අලවනවා = 1. ලාටු ආදිය ගැමෙන් සවිකරනවා.

අලවි = 1. පැරණි නුවරක්. 2. යකකුගේ නමක්

අලවුන = 1. (ආලානය) ඇතුන් බඳින වැඹ.

අලස = 1. කම්මැලි. 2, ක්‍රියාවෙහි මැලි.

අලසක = 1. විසූචිකා රෝගය.

අලසකාරී = 1. අලසව ක්‍රියා කරන.

අලසතා = 1. කම්මැලි බව.

අලසන්ද = 1. යොන් රටෙහි අගනුවර වූ ඇලෙක්සැන්ඩරියාව.

අල් = 1. හල්. (ව්‍යඤ්ජනාක්ෂර) 2. ස්වර රහිත අක්ෂර.

අල්අකුර = 1. ප්‍රාණාක්ෂරයක් නැති ගාත්‍රාක්ෂරය.

අල්ඉඹිඹු = 1. රත් කරුවාගේ අඬුව.

අල්කස්කිරන් = 1. කරත්ත අලවංගුවෙන් ගලන මජත්.

අල්ගෙය = 1. රෙදි වියන ශාලාව.

අල්තාර = 1. පල්ලියේ පූජාසනය.

අල්ප = 1. කුඩා. 2. ස්වල්ප. 3. සුළු.

අල්පඅක්ෂර = 1. ස්වල්පවූ අකුරු ඇති.

අල්පඅඝ = 1. වැඩි වටිනා කමක් නැති. 2. මඳක් අගනා.

අල්පඅර්ඝ = 1. මඳක් වටිනා.

අල්පආතඞ්ක = 1. සුළුලෙඩ. 2. ලෙඩ නැති බව

අල්පආබාධ = 1. රෝග අඩුබව.

අල්පආයුෂ්ක = 1. ටිකආයුෂ ඇති. 2. ආයුෂ අඩු.

අල්පආස්වාද = 1. ස්වල්පවූ රසවිඳීම ඇති.

අල්පගන්ධ = 1. රත් නෙළුම්.

අල්පග්‍රන්ථ = 1. කුඩා ග්‍රන්ථය.

අල්පචෙෂ්ටිත = 1. කඩිසර නොවූ. 2. කම්මැලි 3 ස්වල්ප ක්‍රියා ඇති.

අල්පඥ = 1. මඳ දැනුමක් ඇති. 2. ස්වල්පයක් දන්නා.

අල්පතනු = 1. ශරීරයෙන් කුඩා.

අල්පනාක්ක = 1. (හැල්පනාක්කය) 1. ගෙය පිටිපස පිල.

අල්පප්‍රාණාක්ෂර = 1. මහාප්‍රාණ නොවූ අකුරු.

අල්පබුද්ධි = 1. අනුවණ. 2. නුවණමඳ.

අල්පමාරිෂ = 1. සුලු කුර නම් පැලෑටි වර්ගය.

අල්පරජස්ක = 1. ස්වල්පවූ කෙලෙස් රජස් ඇති.

අල්පර්ඝ = (අල්ප + අර්ඝ) 1. ටිකක් වටිනා-කම ඇති.

අල්පලාභී = 1. ටික ලැබුමක් ඇති.

අල්පවාදී = 1. වඩා කථා නොකරණ.

අල්පසල්ප = 1. අල්ප ස්වල්ප. 2. ඉතා ටික.

අල්පශක්ති = 1. දුබල.

අල්පසාවද්‍ය = 1. ස්වල්ප වූ දෙස් ඇති. 2. ටික වරද.

අල්පශ්‍රැත = 1. ඇසූ පිරූ තැන් නැති. 2. නූගත්.

අල්පායුෂ = 1. මඳ ආයුස. 2. අඩු ආයුස.

අල්පාස්වාදය = (අල්ප + ආස්වාදය) 1. මඳක් රස විඳීම.

අල්පාර්ඝ = (අල්ප + අර්ඝ) 1. වඩා නුසුදුසු. 2. වඩා නොවටිනා.

අල්පෙනෙත්ති = 1. ලොගොමුවා කටු වෙසෙසක්.

අල්පෙච්ඡ = 1. මඳක් කැමති බව. 2. ආශාව නැති.

අල්පේශාඛ්‍ය = 1. බල අඩුවූ. 2. අප්‍රධාන. 3. වඩා තේජස්වී නොවන.

අල්මාරි = 1. බිරොව. 2. රෙදි නැත්පත් කිරීමට සාදගත් ගෘහ භාණ්ඩයක්.

අල්මෙර් = 1. සක්‍රිය.

අල්ල = 1. අත්ල. 2. අතේ රේඛා පිහිටි පැත්ත. 3. තෙත.

අල්ලවණි = 1. නො වියලුණු කම.

අල්ලනවා = 1. යමකට අත තබනවා. 2. හිර බාරයට ගන්නවා. 3. අතේ ශක්තියෙන් නවත්වා තබනවා. 4. හසිකරනව. 5. අඩංගු වෙනවා. 6. අත්කර ගන්නවා.

අල්ලප්‍ර = 1. යාබද. 2. එකට බැඳී පවත්නා.

අල්ලස = 1. අත්ලස.; අයුතු ලෙස යමක් ඉෂ්ට කරවා ගැනීමට දෙන දීමනාව.

අල්ලා = 1. කොත්තමල්ලි.

අල්ලාපය = 1. කථාව. 2. (පළමුවෙන්) කථා කිරීම.

අල්ලාප සල්ලාප = 1. ප්‍රිය කථා. 2. සතුටු සාමීචි කථා.

අල්ලාප්‍ර = 1. ඇල්ලුවා වූ.

අල්ලිය = 1. (බට්ටම් පැනීමේදී අත සම්පූර්ණ කොට) පාදය කරකැවීමෙන් අඳින වට රවුම. 2. ගිල්ලිය. 3. ස්ථානය. 3. දම් ලැල්ලක කොටුව.

අල්ලියාදුකුඩු = 1. හැට්ටුවන්ගේ මුණු ලස්සණ කරන පාට හුණු කුඩු. 2. තෙල් මිශ්‍ර නොකල සායම් කුඩු.

අල්ලීන = 1. එකට ඇලුණු. 2. සිතින් ඇලුණු. 3. සම්බන්ධ වූ.

අල්ලීයන = 1. ඇලීම.

අලාතය = 1. ගිනි පෙණෙල්ල.

අලාතචක්‍ර = 1. අඟුරෙකි ගිනි පෙනෙල්ලක් වේගයෙන් කරකවන විට පෙණෙන ගිනි වළල්ල.

අලාභ =(අලාභ) 1. ලාභ නැති. 2. මිල වැඩි වූ. 3. පාඩු.

අලාබය = 1. පාඩුව. 2. හානිය.

අලාබුපාත්‍ර = 1. දිය ලබු ගෙඩියෙන් සැදූ පාත්‍රය.

අලාභ = 1. පාඩුව. 2. හානිය. 3. නො ලැබීම.

අලාහි = 1. නොලබන සුලු.

අලාම්භා =(අලාම්ක) 1. ලාම්ක නොවූ. 2. ලපටි නොවූ. 3. සුළු නොවන. 4. ශ්‍රේෂ්ඨ වූ.

අලාමාලය = 1. දේශගුණය තරක් වීමෙන් මුහුද වර්‍ෂාවීම.

අලි = 1. බඹරා. 2. කවුඩා. 3. කොවුලා. 4. මී මැස්සා. 5. ගෝනුස්සා. 6. වෘශ්චික රාශිය. 7. අලි - ඇත්තු. 8. විශාල. 9. දළ නැති ඇතා.

අලීක = (අලික්) 1. සිතියම් කිරීම. 2. ලිවීම. 3. අසත්‍යය.

අලීකවාදී = 1. බොරු කියන්නා.

අලීකඩ = 1. අලින්ගේ ගමනින් සැදුණු මාර්ගය.

අලීකය = 1. නලල. 2. බොරුව.

අලීකාරයා = 1. ඇත් ගොව්වා. 2. ඇතුන් බලන්නා.

අලික්ඛැමි = 1. චිත්‍ර ශිල්පයා; සිත්තරා.

අලිකුල = 1. මී මැසි රංචුව.

අලිකෙඳි = 1. අලියාගේ හෝ ඇතාගේ වලගෙහි ලොම්.

අලිඛිත = 1. නොලියන ලද. 2. ලකුණු කොට නැති.

අලිංග = (ව්‍යාකරණයෙහි) 1. නපුංසක.

අලිග = 1. ආලිංගනය. (වැලඳගැනීම)

අලිගාල = 1. වල් අලි - ඇතුන් අල්වා ගැනීම සඳහා මහා වනයේ ඉදිකරන දඬු වැට.

අලිංචි = 1. ඉරු ලීයෙහි ඉතිරි කොටස.

අලිජිහ්විකාව = 1. උඩු දිව.

අලින = 1. මී මැස්සා.

අලිබොරු = 1. ලොකු බොරු. 2. බෙගල්. 3. කෙප්ප.

අලියම = (අලුයම) 1. පාන්දර. 2. ඉරිමා උදය.

අලියම්දුරේ = 1. හින්දු දේවාලයන්හි උදෑසන (තේවා) සංගීතය.

අලිසන්දිරි රජ = 1. මහා ඇලෙක්සැන්ඩර් රජතුමා.

අලිස් ඉලිස = 1. නොසැලකිලිකම. 2. අපක්ෂපාත කම.

අලින්විල් = 1. රුක් අගුන.

අලිඳ = 1. ආලින්දය. 2. පිල.

අලිපරිස්ති = 1. පෙතන් ගස.

අලිමෝදු = 1. සිහින් මිදි.

අලීක = 1. බොරු. 2. නිස්. 3. නලල. 4. අප්‍රිය. 5. සතුටුදායක නොවන. 6. සවගීය.

අලීන = 1. පසුබට නොවූ. 2. නොහැකුළුණු. 3. නො ඇලුණු. 4. යටත් නොවූ. 5. නො සැඟවුණු.

අලීනචිත්ත = 1. නො පසුබට සිතැති.

අලීනතා = 1. නො පසුබට බව. 2. නොහැකුළුණු බව.

අලු = 1. ආලෝකය. 2. එළිය. 3. රශ්මිය. 4. හැරියාවූ. 5. ඉරිමා උදය. 6. අලුයම් කාලය 7. රෙදි වියමනේදී හරස්නූල තද කරන (පනාව සහිත) ලී උපකරණය. 8. භස්ම. (දර දැවුණු සුණු) 9. හැඩය. 10. කඩිනමින් (වහා)

අලුකරල් = 1. රෙදි වියමනේදී දික් නූල අදින දූල් ඇස්.

අලුකර = 1. ආලෝක කොට. 2. එළිකොට.

අලුකුසඳ = 1. වුවමනා නැති විස්තර. 2. අනුන්ගේ කථා අතරට දමන වචන.

අලුක්කාල = 1. සතයේ කාසියෙන් හතරෙන් පංගුව. 2. එනම් කාසිය.

අලුකුත්තේරුවා = (අලුගුත්තේරුවා) 1. ශඨ ප්‍රයෝග කාරයා. 2. දුෂ්ට වැඩ කිරීමට ආධාර කරන්නා 3. අසත්පුරුෂයා.

අලුගසාදමනවා = 1. කෙට්ටු කම මගහැරී හම්පුරම් වෙනවා. 2. දූවිලව සිට මහත් වෙනවා.

අලු ගහ = 1. කැලණිය ගහ.

අලුත = 1. කල් නොගිය. 2. මෑත කාලයේ. 3. නවීන.

අලුතදී = 1. ලඟදී. 2. නුදුරු අතීතයේදී.

අලුතෙන් = 1. අභිනවයෙන්.

අලුත් = 1. අභිනව. 2. නවීන. 3. නූතන. 4. පාවිච්චි නොකළ. 5. පරණ නොවූ. 6. කල් නොගිය.

අලුත්කරනවා = 1. අලුත් කර සාදනවා - අලුතෙන් හරිගස්සනවා.

අලුත්වැඩියා කරනවා = 1. ප්‍රතිසංස්කරණය කරනවා. 2. නරක් වූ තැන් නැවත හරි ගස්සනවා.

අලුත් සහල් මඞ්ගල්‍යය = 1. අලුත් අස්වැන්න පිළිබඳව දුරුතු පුරපසළොස්වක් ද කරන උත්සවය.

අලුත් හඳ = 1. මාසේ පෝයෙන් පසු දක්නට ලැබෙන හඳ.

අලුත්හොද්ද = 1. කිරි නොයොදා මිරිසට පිසූ මාලු හොද්ද.

අලුදිය = 1. යවකාර දිය.

අලුදු = 1. ලෝභ නැති.

අලුදුර = 1. විහාර දේවාලයන්හි උදය පූජාව සඳහා පවත්වන තූර්ය වාදනය.

අලුදෙල් = 1. එනම් ගස් වර්ගය.

අලුනිලා = 1. මල් වෙනි වෙසෙසක්.

අලුප = 1. කුඩා කැබැල්ල.

අලුප් = 1. ලොප් නොවූ. 2. ආලෝපය. (අහර පිඩ) 3. පික. 4. කථාව.

අලුබෝ = 1. එනම් ගස් වර්ගය.

අලුමඬල = 1. ආලෝක මණ්ඩලය.

අලුමුසු = 1. උදේ කෑම.

අලුයම් = 1. ආලෝකයාමය. 2. පාන්දර.

අලුරාත්‍රී = 1. පශ්චිම යාමය. 2. රෑ එළිවෙන යාමය.

අලුලිත = 1. නිශ්චල. 2. නොසෙල්වී තිබෙන.

අලුවා = 1. එනම් රස කැවිලි වර්ගය. 2. බැදි පිටි හා උණු පැණි එකට අනා දියවී-හතරැස් කැඩයට සාදන කැවිලි වෙසෙස.

අලු විහාරය = 1. ආලෝක විහාරය. 2. මාතලේ පිහිටි එනම් වෙහෙර - වළගම්බා රජතුමා ගේ කාලයේ දී ත්‍රිපිටකය ග්‍රන්ථාරූඪ කෙළේ මෙහිදී ය.

අලුහම් = 1. සමේ ඇතිවන අළු පැහැති කැළැල් වෙසෙසක්.

අලෙන = 1. ගෙයක් නැති. 2. අසරණ.

අවලඝී කාරනවා = (අලෙව් කරනවා.) 1. වෙළඳ සැලකිත් හා හපුරා කියා බඩු ගැනීම. 2. වෙළෙඳ බඩු සියල්ලම විකුණනවා; 3. වියදම් කරනවා.

අලෙඝි මලු = (අලෙයි වි මලු.) 1. ගෙ වැදී-මෙහි දී ගෙයි යට ලියෙහි එල්ලනු ලබන (ධාන්‍ය ආදිය දැමූ) ගෙවලම් මල්ල.

අලෙව් = 1. ආලේපය. 2. ගෑම. 3. ඇඳීම. (සිතියම් කිරීම.)

අලෙව් පට = 1. සිතියම් කරන ලද වස්ත්‍රය.

අලෙව් රූ = 1. ඇඳි රූපය.

අලෙම්බ = 1. ආලේපය. 2. හිසේ තෙල් හෝ පැන් ගෑම. 3. පින්තාරු කළ සිතියම.

අලේවර්ණය = 1. සිතියම. 2. චිත්‍ර කර්මය.

අලේසි = 1. ලේසි නැති. 2. අපහසු. 3. අමාරු.

අලොප් = 1. බත් පිඩ. 2. කපා හෝ මකා නො දැමූ (ලොප් නොකළ)

අලොහල = (අලොල.) 1. කලබලය.

අලෝණික = 1. ලුණු නැති. 2. පැණි නැති.

අලෝභ = (අලෝභී) 1. ලෝභ නැති. 2. නොම-සුරු.

අලෝභ්‍ය = 1. ආශා නොවිය යුතු. 3. අප්‍රිය කරු.

අලෝම = 1. ලොම් නැති.

අලෝම මුඛ = 1. පණු කුලයක්.

අලෝල = 1. ලොල් නොවූ. 2. ආශා නොවූ.

අලෞකික = 1. මෙලොව සම්පත්තියට ආශා නො කරන.

අල්ල = 1. ඉදිරිපත් කළ. 2. පැමිණි වූ. 3. යැවූ. 4. කකුළු ආදී අඬු.

අල්ලන = 1. ආලය.

අල්ලාමක = 1. ලාමක නොවන. 2. හුළු නොවක.

අළු = 1. යමක් පිළිස්සීමෙන් ඉතුරුවන දේ. 2. එළිය. 3. රශ්මිය. 4. ඉක්මන්.

අළු කරනවා = 1. පුළුස්සා දමනවා.

අළු කරවලා = 1. එනම් සර්පයා.

අළු කොවුල් = 1. කොයෙල් වර්ගයක්.

අළු කොබෙයියා = 1. පක්ෂි වර්ගයක්.

අළු ගසා දැමීම = පුළුටිමක් වීම.

අළුන = 1. ඇතුන් බඳින කනුව.

අළු ගෝමර = 1. ශරීරයේ ඇතිවන අළුහම් විශෙෂයක්. 2. ලප විශෙෂයක්.

අළුඝෝෂ්ණයා = 1. වධකයා 2. මරණීය දඬුවමට නියම වූ තැනැත්තන්ට මරණීය වධය පමුණුවන්නා.

අළු පුහුල් = 1. අළු පැහැති පුහුල්.

අළු සොලඟා = (අළු මී පොලඟා) 1. එනම් විෂ සර්පයා

අළු බදාදා = 1. ක්‍රිස්තියානි කාරයන්ගේ ආගමික දිනයක්.

අළුයම = 1. පාන්දර. 2. ඉරිමා උදය.

අළුව = 1. රෙදි වියන යන්ත්‍රය. 2. රෙදි වියමනේ දී හරස් නූල අදින පනාව. 3. එළිය. 4. කදේ පිටින් ඉරූ ලෑල්ල. 5. පියැල්ල. 6. ඇතුන් බඳින කණුව.

අළුහම = 1. සමේ ඇතිවන අළු පැහැති කැලැල් වෙසෙස.

අළුහුණු = 1. පිළිස්සුණු හුණු. 2. කුඩු වූ හුණු.

අළුවා = 1. එනම් රස කැවිලි.

අව = 1. කළුවර පක්ෂය. 2. අපාය. 3. නරක. 4. අගක. 5. හගුලෙන් හෝ උදුල්ලෙන් කැඩුණු පස් පිඩ. 6. පහත. 7. විරුද්ධ. 8. නැති. 9. අඩු. 10. දන්වන. 11 ආවොත්. 12. අනිෂ්ට. 13. අමාවක.

අවංක = 1. වංක නැති. 2. නොවක්. 3 ඇද-නැති. 4. වංචා නැති.

අවබරූ = 1. බෙහෙත් තෙල් ආදිය පුරවා රෝගීන් ගිල්වන ඔරු.

අවකපනවා = 1. ශුභ නිමිත්ත වළක්වනවා. 2. අශුභ වචන වචන කියනවා.

අව සම්පන්න සෑදීම = 1. වැරදිලෙස අශ්වයා සෑදීම.

අව කාරුණාව = 1. අකාරුණාවන්ත භාවය. 2. කරුණා රහිත බව.

අවකර්ෂණය = 1. ඇද ගැනීම.

අවකල් ක්‍රියාව = 1. නරක හැසිරීම. 2. දුරා-චාරය.

අවකල්පනය = 1. වැරදි යෙදීම.

අවකාශය = (අවකාසය) 1. ඉඩ 2. අවසරය. 3. විවේකය. 4. ආකාශය.

අවකාරය = (අවගාරය) 1. ලොකු බුරුමය. 2. ලී ආදිය විදින එකම් ආයුධය.

අවකුඩ = 1. නගුලෙහි වක් අත්තට හා පතකඩයදින් අතර සවි කරන පලු ඇණය. සැමෙන් හෝ කෙටීමෙන් කැඩුණු පස් පිඩ. 3. ගස්කෙහි තලය සවිකරන ලී පතුර.

අව කැලෙෂනා වචන = 1. අශුභ ඵල ඇතිවන වචන. 2. බාධා ඇතිවන වචන.

අවකීර්ණ = 1. පැටලිලි සහිත. 2. විනාශ කරන ලද. 3. ගොරෝසු ලෙස කොටන ලද. 4. විසිර වූ.

අව කුජ්ජ = 1. යටිකුරු වූ. 2. මුණින් නැමූ.

අවකුජ්ජ පඤ්ඤ = අවකුජ්ජ ප්‍රාඥ 1. ධාරණ-ශක්තිය රහිත අය. 2. කුදුව ගිය හෝ යටට ගිය ප්‍රඥාව ඇත්තා.

අවකෘෂ්ට = 1. දුරු කරන ලද. 2. පහකරන ලද. 3. අඩු කරන ලද.

අවකෙළි = 1. නරක පැවැත්ම.

අවකේශී = 1. ඵලදාව නැති. 2. කෙස් අඩු.

අවක්‍ර = 1. වක්‍ර නැති. 2. ඇද නැති.

අවක්‍රන්දන = 1. ඇඬීම. 2. වැලපීම.

අවක්‍රමණ = 1. යටපත් කොට ගෙන යාම.

අවක්‍රාන්ත = 1. ඇතුළු වූ. 2. බැසගත්.

අවක්‍රාන්ති = 1. බැස ගැනීම. 2. පිහිටීම 3. පිළිසිඳ ගැනීම.

අවක්‍රියාව = 1. දුෂ්ට ක්‍රියාව.

අවක්ෂෙපණය = 1. යටට දැමීම. 2. ඇනුම්-පදය. 3. නින්දා වචනය. 4. බිම හෙළීම.

අවඛණ්ඩන = 1 කැඩීම.

අවගඩය = (අවගණ්ඩ) 1. ගඩුව. 2. කම්මුලෙහි ගෙඩිය.

අවගත = 1. අවබෝධ කළ. 2. වටහා ගත්.

අවගති = 1. නරක ගති ඇති. 2. වැරදි. 3. දෙස්.

අවගම = 1. දැනීම.

අවගමන = 1. අවබෝධය.

අවගාමී = 1. අපාය ගාමී. 2. නිරයට යන.

අවගාහ = 1. නෑම. 2. නාන තැන. 3. ඇතුළට පිවිසීම.

අවගාහන = 1. බැස ගැන්ම. 2. අවබෝධ කිරීම. 3 වැදීම. 4. නෑවීම. 5. ගිල්වීම. 6 ක්‍රිස්තියානීන් ගේ බව්තිස්මය නම්. මෙහෙය.

අවගාහභාණ්ඩාගාරය = 1. නාන කාමරය.

අවගාහිත = 1. ගිල්වන ලද.

අවගීත = 1. වරද පවරන ලද. 2. නින්දා සහිත.

අවගුණ = 1. දුර්ගුණ. 2 නරක ගති. 3. දෙස්. 4 ක්‍රොධ.

අවගුණ්ඨන = 1. ගුළි කිරීම. 2. එතීම.

අවගුණ්ඨිත = 1. හිස වසා පෙර වූ.

අවග්‍රහ = 1. ග්‍රීෂ්ම කාලය.

අවග්‍රහණ = 1. බාධා. 2. බැණුම්.

අව ඝාතය = 1. ගැසීම. 2. වෛරය. 3. මැරීම.

අවචනීය = 1. නොකිය යුතු. 2. අවවාද නොකළ යුතු. 3. කිය නොහැකි වූ.

අවචය = 1. රැස් කිරීම. 2. එකතු කිරීම. 3. මල් ආදිය නෙලීම.

අවචර = 1. හැසිරෙන.

අවචරක = 1. ඔත්තු කාරයා. 2. පහත් පැවැතුම් ඇත්තා.

අවචරණ = 1. හැසිරීම. 2. ඇවිදීම. 3. දැනීම.

අවචරිත = (අවචාරිත්‍ර) 1. දුසිරිත්. 2. දුෂ්ට ගති.

අවච්ඡායාව = 1. සෙවනැල්ලෙන් වේලාව ගැනී-මේදී අඩු කරනු ලබන ප්‍රමාණය. 2. කාලය මැනීමට ප්‍රයෝජනය වූ සෙවනැලි ප්‍රමාණය.

අවච්ඡින්න = 1. සිඳින ලද. 2. යටින් කැපූ.

අවච්ඡිද්ද = 1. කුඩා සිදුරු.

අවච්ඡේදය = 1. කැපූ කොටස. 2. පරිච්ඡේදය. 3. විරාමය.

අවජඩ = 1. නින්දිත. 2. දුෂ්ට. 3. අසත්පුරුෂ. 4. ඉතා චපල.

අවජන = 1. සිහි කිරීම. 2. දිවස්සීම. 3. නුවණින් බැලීම.

අවජලවක = 1. පසළොස්වකින් පසු සතර වන දවස.

අවජා = 1. නින්දා සහිත. 2. ගරු නොකරන.

අවජාතපුත්‍ර = 1. පියා සතු දෙය නසා පරදාර සේවන, දූ කෙළිම් ආදියෙහි යෙදී සිටින පුත්‍රයා. 2. පියාට වඩා ගති ගුණයෙන් පහත් පුත්‍රයා. 2. හදාගත් පුතා. 3. කසාද භාර්‍යාවගෙන් නුපන් පුතා.

අවජාතක = 1. අවිවාහක මවගේ දරුවා. 2. පහත් උත්පත්තියක් ඇති.

අවජිත = 1. පරාජයවූ. 2. පරදවන ලද.

අවජ්‍ජන = 1. භාවනා කිරීම. 2. ආවජ්ජනය. (නුවණින් බැලීම)

අවජ්‍රාකාන්ති = 1. වීදුරු ආකාර නොවන.

අවඤ්චා = 1. අවංක. 2. හොරකම් නැති.

අවඥා = 1. පහත් කොට සැලකීම. 2. ගරු නොකිරීම. 3. නින්දා සහිත.

අවඥාත = 1. අවමන් කළ.

අවඥෙය = 1. සැලකිය යුතු නුවූ. 2. ඉතා සුළු.

අවට = 1. වටේට. 2. හාත්පස. 3. සිසාරා.

අවටක = 1. ළිඳ. 2. මායාකාරයා. (ඉන්ද්‍රජාල යෙන් ජීවත්වන්නා) 3. ග්‍රීවයෙහි පසුභාගය.

අවටුව = 1. හිල. 2. ග්‍රීවයෙහි පසුභාගය. 3. ළිඳ.

අවඨාන = 1. සිටීම.

අවඩ = (අවැඩ) 1. අනර්ථ. 2. අයහපත.

අවතංසය = 1. කර්ණාභරණය. 2. මුදුන් මල් කඩ. 3. කරමලය. 4. කපුරු. 5. ඔටුන්න. 6. හිසේ මල් වඩම.

අවතංසාකෘතිය = 1. කරමලේ හැඩය.

අවතරණය = 1. එතරවීම. 2. බැසීම. 3. යටට යාම. 4. ගොඩ බැසීම. 5. සමුද්‍රාදියෙහි ගමන.

අවතාර = 1. බැසීම. 2. සිදුර. 3. තොටු පොළ. (බසින තැන) 4. ප්‍රස්තාවනාව. 5. ඉපදීම. 6. දෙෂය. 7. දෙවියන් අන් අයුරකින් පහළවීම. 8. අමනුෂ්‍ය වේසය. 9. හොල්මන්.

අවතාරිකා වාක්‍ය = 1. ප්‍රාරම්භ වාක්‍යය.

අවතීර්ණ = 1. බැසගත්. 2. මැඩුණු. 3. එතර වූ. 4. ලොව පහළ වූ. 5 ඇති වූ.

අවදන් = 1. කල්පනාව. 2. භාවනා කිරීම.

අවදාත = 1. සුදු පැහැය. 2. පැහැදිලි. 3. පිරිසිදු.

අවදානම = 1. අනතුර. 2. විපතකට මුණ පෑම.

අවදාන = 1 පූර්ව චරිතය. 2. සැවැත්ත.

අවධාරණ = 1. අවධාරණය. (සමූහයකින් එකක් වෙන් කිරීම) 2. සිදුරු කිරීම. 3. උදුල්ල. 4. උපමාව. 5. ඉරීම. 6. නිශ්චය කිරීම.

අවධාරය = 1. නියම කිරීම.

අවධි = 1 අවධි. (විභක්තිය) 2 අවදිය. (කාලය) 3 පිබිදීම. 4. ප්‍රස්තාව. 5. සීමාව. 6. බලය. 7 ආධාරය. 8. වළ.

අවදියෙන් ඉන්නවා = 1. නොනිදා ඉන්නවා.

අවදිවෙනවා = 1 (නින්දෙන්) පිබිදෙනවා.

අවද්‍ය = 1. දෝෂය. 2. වරද. 3. පහත්. 4. පාප සහිත. 5. කීමට නුසුදුසු.

අවධාන = 1. කල්පනා සහිත බව. 2. එකඟ සිත් ඇති බව.

අවධාරණය = 1. වෙන්කර ගැනීම. 2. නිශ්චය. 3. මෙයම යයි පිරිසිඳීම. 4. තදින් ප්‍රකාශ කිරීම.

අවධිය = 1. මායිම. 2. අවධි විභක්තිය. 3. උපකාරය. 4. අවස්ථාව. 5. බලය. 6. කාලය.

අවධි කරනවා = 1. නියම කරනවා.

අවධීරිත = 1. නින්දා කළ. 2. පැරදවූ.

අවධූත = 1. කම්පා කළ. 2. සොලවන ලද. 3. වෙන් කරන ලද.

අවධූනන = 1. යටිකුරු කොට සෙලවීම.

අවනඩුව = 1. අයුක්තිය. 2. අසාධාරණය. 3. නීතියට විරුඬ 4. නීති විරෝධී ක්‍රියාව. 5. අපරාධය. 6. වරද.

අවනත = 1 යටහත්. 2. නැමුණු. 3. පහතට නැමී තිබෙන. 4. නැඹුරු.

අවනතිය = 1. නැමීම. 2. අවනත වීම.

අවනම්බුව = 1. නම්බු නොකිරීම, 2. අගෞරවය. 3. නින්දාව.

අවනවා = 1. ශාප කරනවා. 2. අවැඩ බස් කියනවා.

අවනසත් = (අවත්සත්) 1. බඩදරු ස්ත්‍රී. 2. ගැබිණි.

අවන් = 1. පැමිණියාවූ. 2. සුරා බොන. 3. ආවා වූ. 4. රා බොන තැන.

අවන් රජ = 1. බල හද්‍රගා.

අවන් හල = 1. වෙළඳ සැල. 2. සුරා ශාලාව.

අවන්ති = 1. එකම් රට. 2. මාලව දේශය.

අවනද්ධ = 1. හාත්පසින් බැඳුණු. 2. වෙළුණු.

අවන්ධ්‍ය = 1. වඳ නොවූ. 2. සාරවත්.

අවනා = (අවන්) 1. වෙළෙඳ සැල. 2. වෙළෙඳ පොල. 3. අතතුර. 4. තැබෑරුම. 5. පැමිණීම.

අවනාප = (අමනාප) 1. මනාප නැති. 2. අසතුටු 3. විරුඬ. 4. කැමැති නැති.

අවනා මග = 1. අතතුරු සහිත පාර.

අවනිද්‍රශ = 1. තද නින්ද.

අවනිය = 1. පොළොව. 2. ලෝකය.

අවපක්ෂය = 1. කළුවර පක්ෂය.

අවපතන = 1. යටට වැටීම.

අවපය = 1. වම් පය.

අව පසලොස්වක=1. මාසේ පෝය. 2. අමාවක.

අවපාඨ = 1. වැරදි පාඨය.

අවපාත = 1. බැසීම. 2. වැටීම. 3. හෙළීම. 4. බිලය. 5. පෙතිවළ.

අව පෑලවිය = 1. මාසේ පෝය ගිය දට පසුවද.

අවපීලන = 1. ශිරෝ නස්‍යය.

අවපීඩනය = (අවපීඩය) 1. කිවිසුම් බෙහෙත. (කිඹුහුම් ඇතිකරවන බෙහෙත)

අවබාහු = 1. අංශයෙක්හි වා - සෙම් දෙකින් උපදවන වාත රොගයක්.

අවබුඩ = 1. අවබෝධ කළ. (තේරුම් ගත්)

අවබේද = 1. ශිරෝ රෝගයක්.

අවබෝධ = 1. තේරුම් ගත්. 2. බුඩිමත්.

අවභාස = 1. ආලෝකය. 2. එළිය. 3. දිළිසීම. 4. දූතගැනීම. 5. හිස් තැන.

අවභාෂ කර්ම = 1. අදහස කෙළින් නොකියා එය උපායයෙන් පළ කිරීම.

අවම = (ඇවුම) 1. සාප කිරීම. 2. බැණීම.

අවමඟුල = 1. අශුභය. 2. ශුභ නොවූ. 3. සිත් නොපිනවන. 4. මිනී මළ කටයුතු. 5. අවාසනාවන්ත සිඬිය. 6. මරණය.

අවමඞ්ගල = 1. මරණය. 2. නොමඟුල. 3. අශුභය.

අවමඞ්ගල ශාලා = 1. අවමඟුල්හි පිඹින හොරණෑ.

අවමඞ්ගල කෘත්‍ය = 1. මිනී වළලෑම හෝ ආදාහණය.

අවමඞ්ගල වේශ = 1. අවමඟුල්හි දී පාතා විලාශය.

අවමණ්ඩල = (අව මඬුලු) 1. එක තැනක වටකුරුව වැටුණු ආලෝකය.

අවමත = 1. අවතම්බු කළ 2. හුළු කොට සැලකුවා වූ. 3. නීච.

අවමන් = 1. අවතම්බුව. 2. අවමානය. 3. අපහාසය. 4. අනාදරය. 5. පහත්-කොට සැලකීම.

අවමර්දි = 1. පොඩි කිරීම. 2. මැඩීම. 3. පීඩා කිරීම. 4. වැනසීම.

අවමස = 1. අව මාසය. 2. චන්ද්‍ර මාසයේ දෙවැනි භාගය.

අවමාත්‍ර = 1. (මාත්‍රාය) ප්‍රමාණය අසමාන වීම. 2. එක මිම්මකට නො ගැනීම.

අවමාන = 1. නින්දාව. 2. පහත් කොට සැලකීම. 3. අගෞරවය.

අවමානන = 1. නින්දා කිරීම.

අවමානිත = 1. නින්දා කළ.

අවමාන්නය = 1. නින්දාව. 2. අපහාසය.

අවය = 1. අපාය.

අවයව = 1. කොටස්. 2. උපකරණ. 3. ආරංචි. 4. අඞග. 5. ශරීරාවයව.

අවයවි = 1. අවයව ඇති.

අවයෝග = 1. අශුභ යෝගය. 2. නරක ජේ ග්‍රහාදීන් යෙදීම.

අවර = 1. පසු. 2. බස්නාහිර. 3. අඩු. 4. අන්තිම. 5. වෙනත්. 6. නරක. 7. මැල් වර්ගයක්. 8. නුසුදුසු.

අවරගිර = (අවරග) 1. බස්නාහිර පර්වතය. 2. බස්නාහිර මායිම.

අවරජ = 1. බාල.

අවරජයා = 1. මල්ලී.

අවරණ = 1. වැස්ම. 2. දොර. 3. භිත්තිය 4. පියන. 5. වහන්තරාව. 6. ආවරණය. 7. අමුණ; දිය නවත්වන බැම්ම.

අවරත=1. නැවතුණු. 2. වෙන් වූ. 3. වැළකුණු.

අවරතිය = 1. නො ඇලීම 2. ආශා නොවීම. 3. නැවතීම.

අවරදිග = (අවර දිශාව) 1. බස්නාහිර පැත්ත.

අවර දේවතාවා = 1. වරුණ දෙවියා.

අවර පක්ෂය = 1. කළුවර පක්ෂය.

අවර සඳම්වෙලා=1. සඳම නුසුදුසු වී. 2. නදින් වෙරිවී.

අවරඹර = (අවර + අඹර) 1. බස්නාහිර අහස.

අවරය 1. පසු භාගය. 2. ඔරුවේ පස්සා-පැත්ත.

අවර්ජිත = 1. අත් නො හරින ලද

අවර්ණ = 1. අගත්ත. 2. පාටක් නැති. 3. පැසසුම් නොලත්.

අවර්ණනාව = 1. අගුණ කීම.

අවර්ධිත = 1. වර්ධනය නො කළා වූ. 2 දියුණු නැති.

අවරූපක = 1. යම්කිසි වස්තුවක අවයව පමණක් අන්‍ය වස්තුන්ට රූපණය කොට. ඒ වස්තුව රූපණය නොකරන අලඞ්කාරය

අවරූඪ = 1. වැළකූ. 2 චණ්ඩ පරුෂ.

අවරුඩ = 1. හිරකළ. 2. අවහිර ලැබූ 3. වළක්වන ලද.

අවරෝධි = 1 අන්තඃ පුර ස්ත්‍රීහු

අවරෝධ = 1. වැළැක්වීම. 2. අන්තඃ පුරය. 3. රාජ ස්ත්‍රීන්ට අයිති. 4. බාධාව.

අවරෝධක = 1. අවහිර කරන්නා.

අවරෝපණය = 1. අඩුවීම. 2. ඉදිරීම.

අවරෝහණය = 1. බැසීම.

අවල = 1. ඔරුවේ ඉදිරියෙහි අඳින හබල. 2. ගැවසීගත්. 3. අවුල් වූ. 4. සන්ධුව.

අවල් මලේ = 1. ඔරුවේ අවල් හබල අමුණා තිබෙන ලනු පුඩුව.

අවලකෙළි = 1. රති ක්‍රීඩාව. 2 කාම සේවනය.

අවලකුණ = 1. අසුබ ලකුණ. 2. අසුබ පෙර නිමිත්ත.

අවලක්ෂ = 1. සුදු

අවලක්ෂණ = 1. අසුබ ලකුණු. 2. විරූප. 3. කැත. 4. දුර්වර්ණ.

අවලග්න = 1. බැඳි. 2. ඇලීතිබෙන.

අවලග්නය = 1. සම්බන්ධය. 2. බැඳීම. 3. ඉඟටිය.

අවලංගු = 1. බලය නැති. 2. අස්කළාවූ. 3. පාවිච්චිය නහනම්කළ. 4. නො පිළි ගැනෙන. 5. නිෂ්ඵල කළා වූ.

අවලම් = 1. පාදඩ. 2. නින්දිත. 3. අශිෂ්ට.

අවලමා = 1. පාදඩයා. 2. අධමයා.

අවලම්බ = 1 එල්ලෙන.

අවලම්බිත = 1. එල්ලී තිබෙන.

අවලය = (අවලේ) (ඔරුව හෝ අඟුල පැදීමේදී) අවල්මලේට සවිකොට ඇති හබල.

අවලාදය = 1. දොස් නැගීම. 2. ගැදීම. 3. ශාප කිරීම. 4. පළි දූරීම. 5. දෙවියන්ට කන්නලව් කිරීම. 6. වැරැද්ද.

අවලි = 1. සේරුවෙන් හතරෙන් පංගුව.

අවලිප්ත = 1 ගාන ලද. 2. ආලේප කළ 3. උඩඟු.

අවලේඛන = 1. සූරා දැමීම. 2. ලෙවකෑම.

අවලේපන = 1. ගෑම. 2. තැවරීම. 3. බදාමය.

අවලේහනය = 1. ලෙවීම.

අවලේහය = 1. කට ගාන බෙත. 2. ලෙවිහ බෙත.

අවලෝකනය = 1. දැකීම. 2. බැලීම.

අවවාදය = 1. දනුමැතිකම. 2. ගුරුහරුකම. 3. උපදෙස් දීම.

අවශ = 1. වසඟ නොවන. 2. යටත් නැති. 3. ආවාසය. 4. නිවාසය.

අවසඟ = 1. වසඟ නැති. 2. යටත් නොවන.

අවසධ = 1. බැසගත්. 2. ඉවත්ව ගිය.

අවසන් = 1. අවසානය. 2. අන්තිම. 3. කෙළවර. 4. කොණ.

අවසන්ධි = (අවසන්දිග) 1. කැඩුණු අත් - පා ආදිය වැරදි ලෙස සන්ධි කිරීම. 2. වැරදි ලෙස වූ හන්දිය. 3. හන්දි පැනීම. 4. උළුක්කු වීම.

අවසනෝ = 1. දවල්ල 2. ඇඳුමක වාටිය.

අවසමය = 1. වැරදි ඇදහීම.

අවසර = 1. සමු ගැනීම. 2. (උතුමන් සමග සාකච්ඡාවට ප්‍රථමයෙන් හා නික්ම යාමේදී) ගරු වශයෙන් කියන වචනයක්. 3 ඉඩ දීම 4. ප්‍රස්තාව. 5. අවකාශය.

අවසර්ග = 1. සැප විඳීම.

අවස් = 1. වසඟ නොවන. 2. ගෙය. 3. ආවාසය. 4. එකම් තුයම් විශෙෂය.

අවස්තා = 1. අවස්ථාව. 2. වේලාව.

අවස්තු = 1. අයෝග්‍ය කාරණය. 2. නුසුදුසු තැන.

අවස්තුක = 1. කාරණයක් නැති. 2. වස්තුවක් නැති.

අවසථා = 1. කාලයට ඔබින. 2. තත්වයට ගැළපෙන. 3. ප්‍රස්තාව. 4. කාලය. 5. අවස්ථාව.

අවස්ථානය = 1. උපකාරය. 2. පිහිටීම. 3. තැන. 4. ගෙය.

අවස්ථාපනය = 1. පිහිටුවීම.

අවසථාවාදී = 1. නැතේ නැටියට කථා කරන. 2. අවසථාවෙන් ප්‍රයෝජන ගන්නා.

අවස්ථිත = 1. පිහිටි. 2. ස්ථිර. 3. සිටි

අවසාන = 1. අන්තිමය. 2. නිම කළ. 3. නින්දුව. 4. කොණ.

අවසිත = 1. නිමකරන ලද. 2. අන්තිම කරන ලද.

අවසීදන = 1. යටට යාම. 2. ගැලීම.

අවසිඤ්චන = 1. ඉසීම. 2. වත්කිරීම.

අවශිෂ්ට = (අවශේෂ) 1. ඉතිරි වූ. 2. ඉතිරි වූ දෙය.

අවසේ = 1. අවශෙෂ. 2. අවච්ඡායාව. (අවුරුද්දේ කාලය අනුව වේලාව මැනගන්නා හෙවණැල්ල.)

අවසේස = 1. ඉතිරි. 2. නොවැදගත්. 3. අනෙක්.

අවශේෂ = (අවශිෂ්ට) 1. ඉතිරි. 2. අනෙක්. 3. සුළු. 4. නොවැදගත්.

අවශ්‍ය = (අවශ්‍යක) 1. නියමය. 2. ඒකාන්ත. 3. නැතිව බැරි. 4. ඕනෑම වූ.

අවශ්‍යාය = 1. මීදුම. 2. පිනි.

අවශ්‍රොත්‍රු = 1. කල්පනා සහිත. 2. ඇසීමට යොමුකරන ලද කන් ඇති.

අවහස = 1. අපහාසය. 2. නිඤුව.

අවහරණ = (අවහාර) 1. පැහැර ගෙන යාම. 2. හොරකම.

අවහිත = 1. පිහිටි. 2. සැඟවුණු. 3. දැනගන්නා වූ 4. පරෙස්සම් සහිත.

අවහිර = 1. බාධා. 2. ඇද නැති. 3. වැලැක් වූ. 4. ඉඩ නැති.

අව්‍යක්ත = 1. නුගත්. 2. කථාවෙහි අදක්ෂ. 3. පැහැදිලි නැති. 4. සමථ නුවූ. 5. අප්‍රකට.

අව්‍යක්ත භාෂාව = 1. ග්‍රාම්‍ය භාෂාව. 2 නුසුදුසු බස.

අව්‍යක්තරාගය = 1. පැහැදිලි නැති පාට. 2. අඳුරු රතු පාට.

අව්‍යග්‍රතා = 1. සිත එකඟ බව.

අව්‍යතික්‍රම්‍ය = 1. වෙනස් කළ නොහැකි වූ.

අව්‍යපේක්ෂ = 1. වෙන් නොකළ 2. ඈත් නුවූ.

අව්‍යභිචාර = 1. විශ්වාස වූ. 2. අවිකල්පය. 3. විකල්පයක් නැති.

අව්‍යභිචාරී = 1. වෙන්ව නොපවතින.

අව්‍යය = 1. වැය නොවන. 2. (ව්‍යාකරණයෙහි) වර නැඟීමක් නැති. 3. විනාශ නොවන. 4. නිපාත හා උපසර්ග.

අව්‍යයීභාවසමාස = 1. අව්‍යයක් මුලින් යෙදෙන සමාසය.

අව්‍යවස්ථාන = 1. ස්ථිරව නොසිටින.

අව්‍යවස්ථාව = 1. අනියම් කම.

අව්‍යවස්ථිත = 1. නීතියට විරුද්ධ වූ. 2. අනියම්.

අව්‍යවහාරය = 1. අභාවිතය. 2. පාවිච්චි නොකිරීම. 3. ව්‍යවහාරයක් නැති බව.

අව්‍යවහාර්ය = 1. ව්‍යවහාර නො කට යුතු. 2. ව්‍යවහාර නැති.

අව්‍යවහිත = 1. අතරක් නැති. (අනන්තර) 2. සම්බන්ධ වූ

අව්‍යවහෘත = 1. අපුරු. 2. අමුතු. 3. ව්‍යවහාරයෙහි නොමැති.

අව්‍යාකෘත = 1. වෙනස් නුවූ 2. (පව්-පින් ආදියෙන්) මිදුණු. 3. ප්‍රකාශ නොකළ. 4. කොටසකට ඇතුළත් නොකළ.

අව්‍යාකුල = 1. ව්‍යාකුල නුවූ 2. අවුල් නැති.

අව්‍යාඛ්‍යාත = 1. විස්තර නැති. 2. පැහැදිලි නොවන.

අව්‍යාඛ්‍යෙය = 1. විස්තර කළ නොහැකි වූ. 2. (තේරුම් විසින්) පැහැදිලි කළ නොහැකි වූ.

අව්‍යාජ = 1. රැවටිලි නැති. 2. බොරු නැති. 3. අවංක

අව්‍යාධික = (අව්‍යාදිත) 1. නිරෝගී.

අව්‍යාපන්න = (අව්‍යාපත්ත) 1. පැතිරී නැති. 2. සාමාන්‍ය නොවන. 3. විශේෂ.

අව්‍යාපාද = 1. අක්‍රෝධය. 2. වෛර නොකිරීම. 3. නපුරු නැති. 4. මෛත්‍රිය. 5. හිංසක අදහස් නැති.

අව්‍යාප්ති = 1. නො පැතිරීම.

අව්‍යාවෘත = 1. නො යෙදුණු. 2. ව්‍යාවෘත නොවූ.

අව්‍යුත්පන්න = 1. ශබ්දය නො දන්නා අය. 2. නූගත්.

අව්‍ර = 1. ආකාරය.

අව්රා = (අව්රාව - අව්රැ) 1. පවුර.

අවුල = 1. පටලැවිල්ල.

අවුල් හරාව = 1. ඩිවරයන්ට කාල ගුණය (හරාව) අවුල් වූ කාලය.

අවුලනවා = 1. ඇහිඳ ගන්නවා. 2. ඇදනවා. 3. අමුණනවා.

අව්ව = 1. ඉරු එළිය. 2. ඉරේ රශ්මිය.

අව් තපිනවා = 1. ඉර අව්වේ හිඳ සීත පහකර ගන්නවා. 2 ඉර අව්වෙන් සිරුර උණුහුම් කර ගන්නවා.

අව්වස්සේ = 1. අතරතුරෙහි.

අවිසඳ සැපත් = 1. සුදුසු බෙහෙත් හිසි හැටි ලැබීම. 2. ඖෂධ සම්පත්තිය.

අව්හය = 1. නම. 2. කම් ඇති.

අව්හයන්ත = 1. කැඳවන.

අව්හය මාන = 1. කැඳවන (කැඳවමින්.)

අව්හා = 1. නාමය.

අව්හාන = (අව්හයන) 1. කැඳවීම. 2. අඬගැසීම.

අවා = 1. අපාය. 2. සරණ පාවා ගැනීම. 2. ආවාසය.

අවාක්ෂර = (අපායාක්ෂර) 1. එ - ක - ය - ම - ර - ජ - අ - ණ - න - ල - අං යන අකුරු.

අවාත් = (අවාචි) 1. ගොළු.

අවාහ මඟුල = 1. ආවාහයක් කර ගැනීම. 2. තරුණියක් සරණ පාවා ගැනීම.

අවාචාල = 1. මුඛරි නුවූ. 2. කථාවට අසමර්ථ.

අවාචනික = 1. පැහැදිලිව ප්‍රකාශ නොකරන.

අවාච්‍ය = 1. නො කිය යුතු. 2. නොකිය හැකි වූ. 3. කියා නිමකළ නොහැකි වූ.

අවාචී = 1. ගොළු. 2. දකුණු දෙස. 3. පහත බලන.

අවාදී = 1. තරඟ නැති.

අවාදිත = 1. නො කියන ලද්දා වූ.

අවාන = (අවාත්) 1. වියළුණු. 2. අනතුර. 3 සුරා ශාලාව. 4. පවස් පත.

අවාත් = 1. උපද්‍රවය. 2. සුරා ශාලාව.

අවාපුර = 1. අපාය නගරය. 2. අපාය.

අවාපුරණ = 1. යතුර.

අවාභීය = 1. අපාය භීතිය.

අවාමඟ = 1. අපාය මාර්ගය. (පස් පව් හා දස අකුසල් අවා මඟ වේ.)

අවාමඟුල් = 1. ආවාහ මඞ්ගලය.

අවාමුඛ = 1. (ශරීරයෙහි ලේ හැරීමට යොදන) වෛද්‍යයන්ගේ ආයුධයක්.

අවාමුඛාව = 1. වැසුණු තැන. 2. අවටට නො පෙණෙන ස්ථානය.

අවාමි = 1. වැහැසීම. 2. අන්ධය.

අවාය = 1. අපාය.

අවාරය = 1. අනියම් කාලය. 2. මෙගොඩ ඉවුර. 3. අකාලය 4. එළැඹුව නැති කාලය.

අවාරිත = 1. වළක්වා නැති. 2. නොවළක්වන ලද

අවාර්තික = 1. වෙන් ව සිටිය.

අවාර්ය = (අවාර්ගමාන) 1. වළක්වන්නට නොහැකි.

අවාහ = 1. ආවාහය. 2. සරණ මඟුලය.

අවාසය = 1. නිවාසය ගෙය.

අවාසනා = 1. අභාග්‍යය. 2, වාසනාවන්ත නොවන.

අවාසස් = 1. නිර්වස්ත්‍ර. 2. හෙලුවැලි.

අවාසි = 1. පාඩු. 2. අලාභ. 3. හානි.

අවාස්තව = 1. සත්‍ය නොවූ. 2. ස්ථිර නොවූ.

අවාස්තව්‍ය = 1. නො විසිය හැකි වූ.

අවැඩ = 1. අනපිය. 2. අප්‍රයෝජන. 3. අනතුරු සහිත.

අවැඩකරු = 1. අනර්ථ ගෙන දෙන. 2. විපත් පමුණුවන. 3. අවැඩ දායක.

අවැජ් = 1. අවුත්.

අවැම = (ඇවැම) 1. මිය යාම. 2. මරණයට පත්වීම.

අවි = 1 ආයුධය. 2. එළුවා. 3. පර්වතය. 4. සූර්යයා. 5. තැග්ග.

අවි ආයුධ = 1. ආයුධ.

අවිකම්පිත = 1. චංචල නොවන. 2. කම්පා නොවන.

අවිකලාඞ්ග = 1. නො අඩු අඞ්ග ඇති.

අවික්ෂිත = 1. තුවාල නොවූ.

අවික්ෂිප්ත = 1. නොයෙක් අරමුණුවල නො බැඳුණු. 2. එකඟ වූ.

අවික්ෂේප = 1. කලබල නැති. 2. නොයෙක් අරමුණු වල චිත්ත චෛතසිකයන් නො බැඳුණු. 3. චංචල නොවීම.

අවිකාර = 1. විකාර නොවන. 2 වෙනස් නොවන. 3. නොපෙරළෙන. 4. කලබල නැති.

අවික්‍රම = 1. බලනැති. 2 දක්ෂ ක්‍රියා නැති. 3. බල මහිමය නැති.

අවික්‍රය = 1. නොවිකිණෙන.

අවිගත = 1. වෙන්නොවූ. 2. පහනොවූ.

අවිග්‍රහ = 1. නිමිත්ත හෝ ශරීර නැති.

අවිඝ්න = 1. බාධානැති. 2. විනාශ නොවන ලද. 3. අනුපද්‍රවය.

අවිචක්ෂණ = 1. විචක්ෂණ නොවූ. 2. පණ්ඩිත නොවූ. 3. නුගත්. 4. අනුවණ.

අවිචාර = 1. විචාරයක් නැති. 2. අනුවණ. 3. (හොඳ - නොහොඳ) තෝරුම් ගැනීමේ ඥාන ශක්තියක් නැති.

අවිචාර්‍ය = 1. විචාරණය නොකටයුතු.

අවිචිත්‍ර = 1. විචිත්‍ර නොවූ. 2. විසිතුරු නැති. 3. චාම්.

අවිච්ඡිකා = 1. එහම් කුරුල්ලා.

අවිච්ඡින්න = 1. නොකඩව පැවතෙන. 2. නිරන්තර. 3. නොසිඳුණු. 4. වෙන්නොවූ.

අවිච්ඡන්ද = 1. නොසිඳීම. 2. සිඳීමක් නැති.

අවිජ් = 1 අවිද්‍යාව.

අවිද්‍යමාන = 1. නැති. 2. විද්‍යමාන නොවූ.

අවිජ්ජා = 1. මෝහය. 2. නොදැනීම.

අවිජ්ජෝඝ = 1. අවිද්‍යාව නමැති (ඕඝය) දියපාර.

අවිජ්ජායෝග = 1. අවිද්‍යාව නමැති යෝගය (සත්වයන් සංසාරයෙහි යොදන හෝ බඳින අවිද්‍යාව)

අවිජනිත = 1. ඉපදුනේ නැති. 2. ඉපැද්දුවේ නැති.

අවිජහිත = 1. අත් නොහරින ලද.

අවිජිගීෂු = 1. දියුණු වීමට හෝ උසස් වීමට ආශා නැති.

අවිඥානක = 1. සිත් නැති. 2. විඥානය නැති ගස් ගල් ආදිය.

අවිඥ = 1. මෝඩ. 2. අනුවණ.

අවිඥාත = 1. නොදන්නා ලද. 2. අප්‍රසිද්ධ.

අවිඥානය = 1. නොදැනීම. 2. මෝහය. 3. සිහි කල්පනා රහිත බව.

අවිඥෙය = 1. දැනගත නොහැකිවූ.

අවිතර්ක = 1. තර්ක නොකරන. 2. කල්පනා නොකරන.

අවිතක් = 1. විතර්ක නැති.

අවිත් = 1. ආවාවූ.

අවිතථ = 1. බොරු නොවන. 2. නොඑසේ නුවූ. 3· එසේවූ.

අවිදග්ධ = 1. බොළඳ.

අවිදු = 1. ලේ වැරැල්ල.

අවිදිත = 1. නොදත්.

අවිඳු = 1. අවිද්‍යාව. 2. මෝහය. 3. නොදැනීම. 4. ලෝභය. 5. විශාලවූ

අවිඳුමන් = 1. අවිද්‍යමාන. 2. නැති. 3. පැහැදිලි නැති.

අවිඳුමින්විදි = 1. අවිද්‍යමාන විධිය. 2. එනම් ව්‍යාකරණ විධිය.

අවිදුර = 1. කුදුරු. 2 දුර නැති.

අවිද්‍ය = 1. නුගත්.

අවිද්‍යමාන = 1. නොපෙනෙන. 2. නැති. 3. නොපැහැදිලි.

අවිද්‍යාව = (අවිදු) 1. මෝහය. 2. නොදැනීම.

අවිධාන = 1. විධාන නොකිරීම. 2. නියම නෙකිරීම.

අවිධිවත් = 1. ක්‍රමානුකූල නොවූ. 2. පිළිවෙළක් නැති

අවිනය=1. විනය නොවන. දෙය 2. නොහික්මීම.

අවිනාභාව = 1. නොවෙන්ව පවත්නා බව.

අවිනිශ්චිත = 1. තීරණයකට නොපැමිණි. 2. නියම නැති.

අවිනීත = 1. නොහික්මුණු. 2. විනයක් නැති. 3. ආචාරශීලී නොවූ. 4. උඩඟු. 5. පුරුදු නොකළ.

අවිපක්ෂ = 1. පක්ෂයකට අයිති නැති.

අවිපම = 1. ලොම් රෙදි.

අවිපරීත = (අවිපර්‍යාස) 1. වෙනස් වීමක් නැති. 2. අගති නැති. 3. පෙරළි නැති.

අවිපාක = 1. විපාක නැති.

අවිපාකවිඥාන = 1. විපාක නොවන කුශලා කුශල ක්‍රියා චිත්ත.

අවිපාකය 1. නොපැසුණු ගතිය.

අවිප්‍රවාස = 1. වෙන් නොවීම. 2. යුක්තවීම. 3 පිට රටක ජීවත් නොවීම.

අවිභක්තික = 1. විභක්ති නොගත්. 2. බෙදී- මක් නැති.

අවිභාවනාය = 1. නොදැනීම.

අවිභාවිත = 1. දැනී නැති.

අවිභූත = 1. ප්‍රකට නොවූ.

අවිමතික = 1. අදහස් විරුද්ධ නොවූ·

අවිමුක්ත = 1. මුක්ත නොවූ. 2. නොමිදුණු.

අවිමුණ = 1. (කඩු - පිහි ආදි) ආයුධවල මුව- හත් පැත්ත. 2 ආයුධයේ තුඩ.

අවිය = 1. ආයුධය. 2. ඉර. 3. එළුවා. 4. කන්ද. 5. නිපාතොපසර්ග. 6. නිවණ. 7. (ව්‍යාකරණ යෙහි) වරනැගීම් නැති. 8. බලල් මයිල් වලින් සෑදූ කම්බිලිය.

අවියත් = 1. අව්‍යක්ත. 2. සමත් නොවූ. 3. නුගත්.

අවිරත = 1. නිරන්තර. 2. නොනවතින. 3. ඇලීම ඇති.

අවිරතිශීල = 1. විරති චෛතසිකය හා යෙදුණු සෙසු චේතනාදි චෛතසික.

අවිරල = 1. විරල නොවූ. 2. තුනී නොවූ. 3. ඝන වූ.

අවිරිඳු = (අවිරුද්ධ) 1. අවිරුඬ. 2. අවිරෝධ. 3. විරුඬ නැති.

අවිලංඝනීය = 1. කඩ කළ නොහැකි වූ.

අවිලම්බ = (අවිලම්බිත) 1. ප්‍රමාද නුවූ.

අවිලෝම = 1. විලෝම නොවන. 2. එළලොම්.

අවිවර = 1. සිදුරු නැති. 2. සම්පූර්ණ.

අවිවරදන්තා = 1. අතර සිදුරු නැති දත් ඇති බව.

අවිවාදශෙෂ් = 1. විරුඬ කථාවක් නැතිව.

අවිවාහක = 1. විවාහ නොවූ 2. කසාද නොබැඳපු.

අවිච්ඡින්නාකාර = 1. එකාකාර.

අවිවෘත = 1. විවෘත නොවූ. 2. ඇරී නැති. (විවර නොවූ)

අවිවේක = 1. විවේක නැති, නිවාඩු නැති.

අවිවෙසෙස් = 1. කුන්තායුධය.

අවිශ්වාස = 1. විශ්වාස නැති.

අවිශිෂ්ට = 1. විශිෂ්ට නොවූ. 2. වෙනසක් නැති. 3. පොදු. 4. සාමාන්‍ය.

අවිශේෂ = 1. විශෙෂ නොවන. 2. සාමාන්‍ය. 3. සැලකියයුතු නුවූ.

අවිශ්‍රබ්ධ = 1. විශ්වාස නැති.

අවිශ්‍රාන්ත = 1. අවසානයක් නැති. 2. නිවාඩු නැති.

අවිෂය = 1. ඉන්ද්‍රියයන්ට ගෝචර නොවන. 2 නොදනෙන. 3. ද්‍රව්‍ය නොවූ. 4. නුහුදුනු.

අවිස = 1. විෂ රහිත. 2. විෂ නැති.

අවිසද = 1. පැහැදිලි නැති.

අවිසරඹය = (අවිසරම) 1. අවි හරඹය. 2. කඩු-දුනු ආදී ආයුධ වලින් කරන සටන.

අවිසර = 1. අභිචාරිකාව. 2. විචාරය නැති.

අවිසාච්චු = 1. මුරණ්ඩු. 2. චණ්ඩ.

අවිසාර = 1. නො විසිරීම.

අවි සිප් = 1. ආයුධ ශිල්පය. 2. කඩු - දුනු ආදිය ක්‍රියාවේ යෙදවීමේ ක්‍රමය.

අවිසේ = 1. විශෙෂයක් නැතිව. 2 එසේ ම.

අවිහ = i. පඤ්ච ශුද්ධාවාස බ්‍රහ්ම ලෝක වලින් එකක්.

අවිහිංසාව = 1. අහිංසාව. 2. හිංසා නොකිරීම.

අවිහිත = 1. ඉෂ්ට නුණ. 2. නොකළ. 3. නියම නොකළ. 4. නොදක්වන ලද.

අවීක්ෂණීය = 1. නොපෙණෙන.

අවීචි = 1. එනම් මහා අපාය.

අවීතරාග = 1. පහ නොවූ රාගය ඇති.

අවීර = 1. බල නැති. 2. උනන්දුවක් නැති.

අවීර්‍ය = 1. උත්සාහයක් නැති.

අවු = 1. හිරු එළිය. 2. ප්‍රභාව. 3. විලාසය.

අවු අකු = 1. ප්‍රභූවරයන් යන - එන විට අව්ව වැළැක්වීමට හා ගෞරව වශයෙන් දෙපසින් අල්ලනු ලබන අවන් අතු.

අවු කැවීම = (අව් ගැසීම) 1. අවුවෙන් වේලීම.

අවු කාෂ්ටක = 1. කට්ට අවුව. 2. ඉතා සැඩ අවුව.

අවු ගඳ = 1. අවුවෙන් වියලීමෙන් ඇතිවන ගඳ.

අවුජ් = 1. අවුත්

අවුඩවා = 1. ආශා කරවා.

අවුන්සය = 1. රාත්තලෙන් දහසයෙන් පංගුව. 2. එනම් බර.

අවුණනවා = 1. අමුණනවා.

අවුණ = (අවුණු) 1. අමුණ. 2. වෙලෙඳ පොළ. 3. මස්කඩේ. 4. දිය වක්කරන ඔරුව. 5. අමුණු බැම්ම. 6. ආවරණය. 7. ගෙතු.

අවුතු = 1. ආගන්තුක. 2. යෙදූ. 3. කොඩී.

අවුක් = 1. පැමිණ. 2. අනුක්ත.

අවුක්ත = 1. නො කියන ලද.

අවුදින් = 1. පැමිණ.

අවුර = 1. ඇඹිරීම. 2. වැසීම. 3. නුවර දිය අගල සමීපයෙහි බැඳි ප්‍රාකාරය.

අවුරණ = 1. ආවරණය කරන. 2. වසන.

අවුරු = 1. ප්‍රාකාරය. 2. ආවරණය. 3. පා තබන පුවරුව. 4. ආධාරකය.

අවුරුදු = 1. වර්ෂය. 2. දෙලොස් මාසය.

අවුරුදුකනවා = 1. අවුත් අවුරුද්ද උත්සව සහිතව ගත කරනවා.

අවුරුදු කුමාරයා = 1. ලිත් ගණින්නන් විසින් කුමාරයකු ලෙස රූපණය කරනු ලබන අළුත් අවුරුද්දේ ආරම්භය (අවුරුදු දේවතාවා)

අවුරුදු කුරුළු = 1. අවුරුද්දේ එක් කලකදී පමණක් දක්නට ලැබෙන කුරුලු වෙසෙසක්.

අවුල = 1. ආරාවුල. 2. පටලැවිල්ල. 3. පිළිවෙළක් නැති බව.

අවුලනවා = 1. පත්තුකරනවා. 2. ඇඹිඳිනවා. 3. එකතු කරනවා. 4. බබලනවා. 5. තරඟ කරනවා.

අවුදු = 1. රස කැවිලි. 2. ව්‍යඤ්ජන.

අවුදු මස් = 1. රස කැවිලි.

අවුල් = 1. ආරාවුල්. 2. පැටලුම්. 3. ආකුල. 4. ගැවසුණු.

අවුල්කර = 1. තද අවුල්.

අවුල් දූනි = 1. කිඹුලා.

අවුල් දැල් = 1. අවුල් ජාලය. (අවුල් වූ දැල) 2. තද පටලැවිල්ල. 3. දුෂ්කර කාව්‍ය බන්ධන විශේෂණයක්.

අවුල් වියවුල් = 1. ඉතා ගැටමුසු. (ආකුල ව්‍යාකුල) 2. ඉතා පැටලුම් සහිත.

අවුල් හර = 1. ආභරණයක්. 2. මුතු වැල් වෙසෙසක්. 3. පතාව.

අවුල් හරාව = 1. සැඩ සුළං සහිත කාල විශේෂයක්.

අවුව = 1. ඉරේ එළිය. 2. සූර්ය රශ්මිය.

අවුස = 1. බෙරය.

අවුසද = (අවුසධ) 1. බෙහෙත් ඖෂධ. (ඔසු)

අවුස් බඩු = 1. තූර්ය භාණ්ඩ.

අවුස්සනවා = 1. කලත්තනවා. 2. අත - පත ගානවා 3. කලඹනවා. 4. කෝප කරනවා. (තරහ උපද්දනවා)

අවෑගන = 1. කැට්ටක් නැති.

අවේණි = 1. මුතුන් මිත්තන් ගෙන් පැවත එන

අවේණිකා = 1. ආවේණික. 2. ප්‍රිය කරන.

අවෙස් = 1. අවේසය. 2. වැතිම.

අවෙක්ඛිත් = 1. පිරික්සමින්.

අවේක්ෂණය = (අවේක්ෂාව) 1. දැකීම. 2. බැලීම.

අවේත්‍ය ප්‍රසාද = 1. ගුණ දැන පැහැදීම.

අවිජ්ඣික = 1. නො විඳිය හැකි, 2 නොවිඳීම. 3. විච්ඡේදනය නොකළ.

අවිඥෙ = 1. දැනගත නොහැකි වූ. 2. නොදත හැකි, ඉගැන්විය නො යුතු.

අවිද්ධ = 1. කම්පා නොවන. 2. විදිය නොහැකි.

අවිභජනීය = 1. නො බෙදිය යුතු.

අවෛර = (අවෛර) 1. එදිරි නැති. 2. සතුරන් නුවූ 3. පාප ධර්ම නැති.

අවේලාව = 1. නුසුදුසු වේලාව.

අවෙමතිකතා = 1. වෙනස් වීමක් නැති. 2. පෙරළීමක් නැති.

අස = 1 ළඟ 2. ඇස. 3. අංසය. 4 සවලපය. 5. සිදුර. 6. ඇසීම. 7. අසව. 8. ආසව. (මත්පැන්)

අසංඛය =1. එතම් විශාල ගණන. 2. අසඞ්ඛ්‍යය.

අසංඥ = 1. සංඥ නැති.

අසංඥතල = 1. සංඥව නැති රූපය පමණක් පවත්නා බ්‍රහම ලෝකය. (සිත නැති වම කය ඇති බඹ තලයකි - ලෝවැඩ සඟරාව)

අසංඥ වාද = 1. ආත්මය පරිකල්පනය කර එය සංඥ නැත්තකැයි ප්‍රකාශ කරන මිථ්‍යා වාදය.

අසංකල්පිත = 1. අදහස් නො කරන ලද.

අසංකීර්ණ = 1. සංකීර්ණ නොවූ. 2. මිශ්‍ර නොවූ. 3. නිරවුල්.

අසංකුල = 1. නිදහස්. 2. සත නුවූ. 3. ගැවසී- නැති. 4. බොහෝ දෙනින් නො පිරුණ.

අසංක්ලිෂ්ට = 1. නො කිළුටු.

අසංඛිජ්ජක = 1. කොට නො කළ.

අසංඛිත = 1. සංස්කාර ධර්මයන්ගෙන් නො- සැදුණු.

අසංඛ්‍ය = (අසංඛෙය්‍ය) 1. ගණන් කළ නොහැකි. 2. නිමක් නැති.

අසංඛ්‍යාත = 1. නො ගණින ලද.

අසංගත = 1. නො ගැළපෙන. 2. එකතු නැති.

අසංගතුංග = 1. උල් වූ. 2 තියුණු. 3. උස් වූ.

අසංග්‍රාමික = 1. යුධයට නුසුදුසු.

අසංඛත = 1. ප්‍රත්‍යයක් ගෙන් හට නොගත්.

අසංඛත ධාතු = 1. නිර්වාණය.

අසංහීර = 1. කම්පා නොවන. 2. නො පරදින.

අසංහත = 1. මැඩ නො පවත්වන ලද.

අසංයුක්ත = 1. සංයුක්ත නොවූ. 2. එකට නො බැඳි. 3. සම්බන්ධ නැති. 4. යුක්ත නැති.

අසංරෝධිත = 1. සමඟි නූණ.

අසංලග්න = 1. වෙන් වූ. 2. සම්බන්ධ නුවූ. 3. නො බැඳුණු.

අසංවර = 1. නො හික්මුණු.

අසංවරණය = 1. වැස්ම ඇරීම.

අසංවාසය = 1. එක්ව නො විසීම.

අසංශෝධිත = 1. සංශෝධනය නො කළ. 2. පිරිසිදු නොකළ. 3. වරද හරි-නොගැස්සූ.

අසංශ්‍රය = 1. ආශ්‍රය නො කිරීම. 2. එක්ව නො විසීම.

අසංසට්ඨ = 1. මිශ්‍ර නැති. 2. නො ඇලෙන.

අසංසාතිය = 1. සසර ගමන නතර කිරීම.

අසංසෘෂ්ට = 1. වෙන් වූ.

අසංස්කෘත = 1. ප්‍රත්‍යයාදියෙන් පිළියෙළ නො කළ. 2. නො සරසන ලද. 3. සකස් නො කළ.

අසංහත = 1. ඝන නැති. 2. බුරුල්.

අසංහාර්‍ය = 1. වලක්වන්නට නුපුළුවන් වූ.

අසක = 1. සවකීය නො වන. 2. අන්‍ය. 3. ඇස් නැති. 4. කන වූ. 5. නිසැක.

අසකි = 1. නුපුළුවන් වූ.

අසඛාත් = 1. නොයෙක්. 2. අසඛ්‍ය. 3. අසක්‍ය. (නොහැකි) 4. එක් වරකට වැඩි.

අසඛා දුච්චාරණ = 1. එක් වරකට වඩා කීම.

අසක් = 1. ගණන් නැති. 2. හිමක් නැති. 3. සැකය.

අසක්ත = 1. ඇලුම් නැති.

අසක්දමල = 1. පුරාණ මහා කවියෙක්.

අසක්බිඹිලි = 1. සැක බහුල කොට ඇති.

අසජ්ජනයා = 1. අසත් පුරුෂයා.

අසජ්ජිත = 1. නො සරසන ලද. 2. යුධ ආයුධ නැති.

අසාබර = 1. බෝ නොවෙන. 2. කෙනෙකුගෙන් කෙනෙකුට නොයන.

අසඤ්ඤත = 1. සංඥවක් නැති. 2. නොහික්මුණු.

අසඩ = 1. අනාදර.

අසණි = 1. (අස් + ඇණි) අශ්ව සේනාව.

අසති = 1. සිහි නැති බව. 2. පතිව්‍රතාව නො-රක්නා ස්ත්‍රී.

අසතුටු = 1. අකමැති. 2. සතුටු නැති.

අසත් = 1. අවිද්‍යමාන (නැති) 2. අයහපත්. 3. සැබෑ නොවූ. 4 දුෂ්ට.

අසත්කාර = 1. හොඳ නොකරන. 2. ආගන්-තුක සත්කාර නොකරන.

අසත්දම් = 1. අධර්මය. 2. වැරදි ධර්මය.

අසත්දිටු = 1. මිථ්‍යාදෘෂ්ටිය.

අසත්පුරුෂයා = 1. දුෂ්ටයා. 2 නපුරු ගති ඇත්තා.

අසත් පුරුෂ දහම = 1. අයහපත් ලෙස දෙන දන.

අසත්‍ය = 1. බොරු. 2. සැබෑ නොවූ.

අසත්‍යවාදී = 1. බොරු කියන.

අසත් සමාගම = 1. අසත් පුරුෂයන් හා එක්වීම.

අසද = 1. අසාධ්‍ය.

අසද් = 1. අශ්‍රද්ධාව.

අසද්ගුණ = 1. අයහපත් ගති.

අසද්දම් = 1. අයහපත් ධර්ම. 2. මෙවුන්දම,

අසද්භාව = 1. නරක බව.

අසද්විධි = 1. අවිද්‍යමාන විධිය.

අසද = 1. අශ්‍රද්ධාව. 2. ශ්‍රද්ධාව හෝ සොභාගය නැතිබව. 3. ස්ත්‍රීන්ගේ මානය හෝ ශ්‍රද්ධා පූජිත ඊර්ෂ්‍යාව.

අසදිටු = (අසද්දම්) 1. මිථ්‍යා දෘෂ්ටිය.

අසදිසදානය = (අසදෘශදානය) 1. සමාන කළ නොහැකි දානය.

අසදෘශ = 1. සමාන කළ නොහැකි.

අසදෘශ දානය = 1. අසදිස දානය බලන්න.

අසද්ද = (අසද්ද) 1. අසාධ්‍ය. 2. සුවකළ නොහැකි.

අසබෙතුඩ = 1. වැරදි තීරණය.

අසනවා = 1. ප්‍රශ්න කරනවා. 2. ඇහුම්කන් දෙනවා. 3. ඉල්ලනවා.

අසන් = 1. ආසන්න. 2. ළඟ. 3. ඇහුම්කන් දෙන.

අසඤ්ඤෑ = 1. සහලේ නෑයෝ.

අසන්තක = 1. සතු නොවූ. 2. අයිති නැති.

අසන්ත = 1. පැහැදිලි නොවූ.

අසන්තර්පණ = 1. නොපිනවීම. 2. සතුටු නොකිරීම. 3. සංසඳුවන්නේ නැති.

අසන්තෝෂය = 1. අසතුට. 2. අමනාපය.

අසන්දිග්ධ = 1. අනුමාන නැති.

අසන්දේහ = 1. සැකයක් නැති බව.

අසද්දිට්ඨි = 1. මිථ්‍යාදෘෂ්ටිය.

අසන්ධි = 1. සන්ධි නැති.

අසන්නද්ධ = 1. නොසැරසුණු. 2. හැඳ නොගත් 3. යුධයට නොසැරසුනු. 4. යුධායුධ නොමැති.

අසනා = 1. ආසනය. 2. ශ්‍රවණය කරන. 3. කෑම. 4. මොරගස. 5. ප්‍රශ්න කරන.

අසනාළිදිවිරූ = 1. පෙර අසා ඇති.

අසනි = 1. හෙණය.

අසනිපාතය = 1. හෙණ වැදීම.

අසනිසමල් = (අසනි මල්) 1. පිදීමට ගන්නා මල්.

අසනීප = 1. ලෙඩ. 2. නොසැප.

අසඳ = 1. හිරු. 2. සඳ නැති.

අසඳබිඹු = 1. සූර්ය මණ්ඩලය.

අසපි = 1. ආශ්‍රමය.

අසපු = 1. ආරාමය. 2. ආශ්‍රමය. 3. තාපසාරාමය. 4. පන්සල.

අසප්පාය = 1. නොගැලපෙන. 2. අහිත දෙය. 3. නොසැප (නොසැපබව)

අසප්පුරිස = 1. අසත්පුරුෂයා. 2. දුෂ්ටයා.

අසබඩ = (අසබඩ) 1. අද්දර. 2. සමීපය 3. අසලේ වූ.

අසබඳුන = 1. දුටු සතුටු ගස. 2. අමුක්කාරා.

අසබල = 1. කැලැල් හෝ කබර නැති.

අසම්භව = 1. අසම්භාව්‍ය. 2. අනියත. 3. ඒකාන්ත සේ නො සැලකිය හැකි.

අසම්භවකිරිය = 1. අසම්භාව්‍ය ක්‍රියාව.

අසම්භවනිද්දෙස = 1. අසම් භාව්‍ය නමැති දෝෂය.

අසභා = 1. සැබෑ නොවූ. 2. සභාවට නුසුදුසු. 3. නිශ්චයකට නොහැකි.

අසබ්භින්න = 1. අසභ්‍යවූ හෝ නැත බොරුව.

අසභ = 1. ආසභ; ඉතා ශ්‍රේෂ්ඨ.

අසභ්‍ය = 1. සභ්‍යනොවූ 2. යහපත් නොවූ. 3. අශිෂ්ට. 4 නොහොබිනා. 5. ග්‍රාම්‍ය.

අසම = 1. නුහුරු 2. සමනොවූ. 3 සමානයකු නැති. 4. අසමකම.

අසමකම = 1. අසමතාව. 2. සමනැතිකම, 3. නුහුරුකම,

අසමග = 1. එකතු නොවූ. 2. අමිත්‍ර

අසමගි = 1. සමගිනැති. 2. මිත්‍රනුවූ. 3. එකතු නොවූ. 4. අමිත්‍ර.

අසමජ්ජාති = 1. අධම. 2. නීච. 3. පහත්.

අසමඤ්ජස = 1. අසමාන කම. 2. නුසුදුසු කම. 3. අයෝග්‍යතාව.

අසමත් = 1. සමර්ථ නුවූ. 2. අදක්ෂ.

අසමධුර = 1. සමකළ නො හැකි. 2. සමාන නුවූ ධුර ඇති. 3. රස නැති.

අසම ප්‍රමාණ = 1. ප්‍රමාණයෙන් සම නොවූ.

අසම්ප්‍රාප්ත = 1. නො පැමිණි. 2. ලබා නොගත්.

අසම්පාදිත = 1 සම්පාදනය නොකළ. 2 සූදානම් නැති.

අසම් මිශ්‍ර = 1. එකතු නොවී 2. මිශ්‍ර නොවී. 3. සම්බන්ධ නොවී.

අසමය = 1. නුසුදුසු කාලය.

අසමසා = 1. සම කරන්නට නුපුළුවන් තැනැත්තා; බුදුන් වහන්සේ.

අසම විෂම = 1. සියලු පාදයන්හි සමාන ලක්ෂණ නැති විෂම වෘතය.

අසමසම = 1. අසමයන් හා සමාන වූ (බුදුවරයන් හට සමාන වූ.) 2. බුදුන් වහන්සේ

අසම්දිට්ඨි = 1. මිථ්‍යා දෘෂ්ටික.

අසම්ප කම්පිය = 1. කම්පා කළ නො හැකි.

අසම්ප ජඤ්ඤ = 1. නුවණ මඳ බව.

අසම්පජාන = 1. මනා සේ නොදත්. 2. නුවණ නැති.

අසම්පූර්ණ = 1. සම්පූර්ණ නොවූ.

අසම ප්‍රමේය = 1. ප්‍රමාණයෙන් සමාන නුවූ.

අසම ප්‍රාප්‍ය = 1. පැමිණිය නොහැකි. 2. ලබා-ගන්නට නො හැකි වූ.

අසම්බන්ධ = 1. සම්බන්ධ නැති. 2. එකඟ නැති. 3. නො බැඳි 4. ගැලපී නැති.

අසම්බන්ධ කරනවා = 1. වෙන් කරනවා.

අසම්බාධ = 1. බාධා නැති. 2. විරුඬ නැති.

අසම්භාවන = (අසම්භාවනීය) 1. අනුමානය හෝ අවිශ්වාසය දක්වන. 2. නියත සේ නො සැලකිය හැකි.

අසම්භින්න = 1. නොකඩවා පැවැත්මෙන. 2. නො බිඳුණු. 3. නො කැඩුණු.

අසම්භින්න ප්‍රලාප = 1. සම්පප්‍රලාප. 2. නිෂ්ප්‍ර-යෝජන නො ගැලපෙන කථා.

අසම්භීත = 1. භය නැති.

අසම්භූත = 1. නූණා වූ.

අසම්භ්‍රම = 1. තැති නො ගැනීම. 2. වරදවා තේරුම් නො ගැනීම.

අසම්භෝග = 1. භුක්ති නො විඳින.

අසම්මත = 1. සම්මත නොවූ. 2. එකමුතු නැති 3. එකඟ නැති.

අසම්මානය = 1. ගරුසරු නැතිකම. 2. පූජනීය නොවන බව.

අසම්මානිත = 1. ගරු සැලකිලි නොලත්.

අසම්මිත = 1. ප්‍රමාණයෙන් සමාන නැති.

අසම්මුඛ = 1. ඉදිරිපිට නැති.

අසම්මූඪ = 1. මෝඩ නොවන. 2. විකල් නැති.

අසම්මෝද = 1. අසතුටු; සන්තොෂ නැති.

අසම්‍යක් = 1. හරි නැති. 2. වැරදි. 3. මිථ්‍යා දෘෂ්ටි.

අසමපෙක්ඛණ = 1. නුවණින් යුතුව නොබැලීම.

අසමස්ත = 1. සමාස නොකළ.

අසමාදානය = 1. විරුඬ බව.

අසමාදේශ = 1. දෙන්නට නුපුළුවන් වූ. 2. ලබා ගත නොහැකි වූ.

අසමාන = 1. සමානයක් නැති. 2. වෙනස්.

අසමාන්තර = 1. එකාකාර නොවන. 2 අතර එක සමානව නැති

අසමාප්ත = (අසමාප්ත) 1. සමාප්ත නොවූ. 2. ඉවර වී නැති. 3. අසම්පූර්ණ.

අසමාසික = 1. අසමාසවත්. 2. සමාස නොවන.

අසමාහත = 1. තුවාල නොවූ. 2. පහර නොවැ-දුණු 3. නොහැපූ.

අසමාහිත = 1. සන්සුන් නොවූ 2. නොතැන් පත් වූ. 3. නොසන්සුන් හිතැති.

අසමීක්ෂණය = 1. අපරෙස්සම.

අසමීක්ෂ්‍යකාරී = 1. පරීක්ෂා කොට නො කරන සුළු.

අසමුචිත = 1. නුසුදුසු.

අසමුද්ධෘත = 1. කලින් සූදානම් නොවූ. 2. සූදානම් නැති.

අසමෝදගම් = 1. බෙහෙත් වර්ගයක්.

අසය = 1. අංශය. 2. පැත්ත.

අසයා = 1. එළුවා

අසර = 1. පාර. 2. අප්සරාව. (දෙවඟන) 3. පැවැත්ම. 4. ආචාරය. 5. සදාචාරය. 6. ආශ්‍රය. 7. අසාර. (නිසරු) 8. සමීපය.

අසරම්ණි = 1. බඩපණීඩකාය. 2. පා බැඳ හෝ එරම්ණිය ගොතා හිඳගැනීම.

අසරණ = 1. කාත්-කවුරුවත් නැති. 2. අනාථ වූ 3. දිළිඳු.

අසරණ සරණවූ = 1. අනාථයන්ට පිහිට වන්නා වූ. 2. අසරණයන්හට සරණ වූ.

අසරලාක්ෂය = 1. කෙළින් නැති කොණ.

අසරාව = 1. පින් කිරීමේ ආසා නැති බව.

අසරීර = 1. සිරුරක් නැති.

අසරු = 1. සරු නැති. 2. අශ්වාරෝහකයා. (අසුන් පිට යන්නා – අසුන් විහිදුවන්නා) 3. ඵලදාව නැති.

අසරූප් = 1. අසාරූප්‍ය. 2. නුසුදුසු.

අසඤ්ඥ = 1. සඤ්ඥ නොවූ. 2. සියල්ල නොදන්නා.

අසල = 1. ස්ථිර. 2. නොසෙල්වෙන. (අචල) 3. පර්වත. 4. ළඟ. 5. සමීප.

අසල් = 1. (අචල) නොසෙල්වෙන. 2. පර්වතය. 3. ආසන්න. 4. ගස් වෙසෙසක්. 5. නිශ්චල භාවය. 6. ස්ථිර. 7. එකත් පස.

අසල් ඉඳු = (අචලේන්ද්‍ර) 1. මහාමේරු පර්වතය.

අසල්බඩ = 1. සමීපය.

අසල්වැසියා = 1. සමීපයෙහි වසන්නා. 2 කිට්ටුව පදිංචි කාරයා.

අසල් සැදැහැ = 1. අචල ශ්‍රද්ධාව; පර්වතයක් මෙන් නොසෙල්වෙන ශ්‍රද්ධාව.

අසලය = 1. කන්ද 2. චඤ්චල නොවන දේ.

අසලයා = 1. ආශ්‍රය කළ අය. 2. පුරුදු කාරයා.

අසවලා = 1. එනම් තැනැත්තා. 2. ඒ අය.

අසව = 1. ඇහුම්කන් දෙව. 2. ශ්‍රවණය කරව. 3. කාමාදි ආශ්‍රව.

අසවල් = 1. එනම්. 2. එවැනි. 3. නමා දන්නා හඳුනන ඉදිරිපිට නැති දෙය හෝ පුද්ගලයා.

අසව් = 1. ඇහුම්කන් දෙව්. 2. උළුවස්සට දොර සවි කරන ලොහොමුවා උපකරණ. 3. සරනේරු.

අසස් පසස් = 1. ආශ්වාස ප්‍රශ්වාස.

අසස්වත = (අසහස්වත) 1. අශාස්වත. (සදාකාලික නොවන) 2. සදහට නොපවත්නා.

අසහනි = (අසහමාන) 1. ඉවසිලි නැති. 2. ඉවසීමට නුපුළුවන් වූ. 3. සහන රහිත.

අසහාය = 1. සහායක් නැති. 2. උදව්කාරයෙක් නැති. 3. යහළුවෙකු නැති. 4. එකම. 5. සමකළ නොහැකි 6. හුදකලා (තනි)

අසහායනායක = 1. එකම ප්‍රධානයා.

අසහායපුත්‍රයා = 1. එකම පුතා.

අසහාය මිත්‍රයා = 1. එකම යහළුවා.

අසහ්‍ය = 1. ඉවසිය නොහැකි වූ

අස්කිඳු = 1. මාළිගාව

අස් = 1. අශ්වයා. 2. හස්මුද්ද. 3. භාගය. 4. ධාන්‍ය 5. වලසා. 6. මුද්‍රාව.

අස් ඇණිය = 1. අසුන් පිට යන සේනා කණ්ඩායම. (අසැණිය)

අස් එඬේරා = 1. කුදිරකාරයා. (අශ්වයන් රැක බලා ගන්නා - අශ්වයන්ට සාත්තුකරන්නා)

අස් එළෙඹිබ = (අස් ගෙලඹ) 1. අශ්වයන්ගේ ගෑණු සතා.

අස් ඔබ්බඩීම = 1. මුද්‍රා කිරීම. 2. තහනම් කිරීම. 3. තහනම.

අස්කඩ - 1. වතුර ගලා නොඒමට සෑදූ නාප්පයක සිදුර. 2. අංසකඩය. (සිවුරට යටින් එක උරයක් වසා අඳින එකස් පොරෝණය)

අස්කන් = 1. මුරුත ගස්.

අස්කම්බිලිය = (අස්පලස) 1. අශ්ව වැස්ම.

අස්කරනවා = 1. අහක් කරනවා. 2. වෙන් කොට තබනවා. 3. පිළිවෙළට තබනවා.

අස්කූඩය = 1. අස් පැස. (ලොකු කූඩා වර්ගයක්)

අස්කූඩුව = 1. අශ්වයන් දමන කූඩුව.

අස් කෙඳි = 1. අශ්වයන්ගේ වලගෙහි කෙස්. 2. දිග අස් ලොම්.

අස්කොනා = 1. ගිරිතිල්ල. 2. එලවුළු ආදියෙහි කපා ඉතිරිවන කැබලි

අස්ඛලිත = 1. නො පැටළුණු. 2. නො සෙලවුණු. 3. නො පැකුළුණු.

අස් ගසනවා = 1. සමතලා කරනවා.

අස් ශැල = 1. අශ්ව කරත්තය.

අස්ගිරි පාර්ශ්වය = 1. සියම් මහා නිකායේ කොටසක්

අස්ගඳ = 1. අමුක්කරා නම් බෙහෙත් වර්ගය.

අස්ගොව්වා = 1. අස් එඬේරා. 2. අසුන් බලා ගන්නා

අස්තම්භ = 1. අබපලම.

අස්ත = 1. ඉවත දමන ලද. 2. බැස්ස. 3. ඉතුරු. 4. විනාශය. 5. නොපෙණීයාම. 6. ලග්නයෙන් හත්වැනි ස්ථානය.

අස්ත අචල = 1. අස්ත පර්වතය.

අස්ත කඩදාසිය = 1. සහතික පත්‍රය. 2. බල පත්‍රය. (අස්තෝ)

අස්තගාමී = 1. අස්තයට යන සුළු.

අස්තගිරි = 1. අස්ත පර්වතය. 2. බස්නාහිර පර්වතය 3. ඉර බැස යන තැන.

අස්තංගත = 1. බට. 2. බැස්ස.

අස්තංගත වෙනවා = 1. බහිනවා.

අස්තංගම = 1. බැසීම. 2. නොපෙණී යාම.

අස්තය = 1. මරණය. 2. (ඉර) බැසීම. 3. ලග්න යෙන් හත්වැන්න.

අස්තරයා = 1. අශ්ව නාම්බා.

අස්තාචලය = 1. අපර පර්වතය.

අස්ති = (තිබෙන) 1. ඇති වූ.

අස්තිඅර්ථ = 1. ඇති යන අර්ථය.

අස්තිආකාර = 1 විද්‍යමානාකාරය.

අස්තිභාව = 1. ඇති බව.

අස්තිකාරයා = 1. වස්තුකාරයා 2. ධනවන්තයා.

අස්තිත්වය = 1. ඇති බව. 2. පැවැත්ම. 3. ජීවත්ව සිටීම.

අස්ත්‍රය = 1. ආයුධය.

අස්ත්‍රාගාරය = 1. ආයුධාගාරය.

අස්ත්‍රෛණය = 1. ගැණියකට නුසුදුසු.

අස්ථාන = 1. ස්ථානයට නුසුදුසු. 2. නො තැන. 3. නුසුදුසු තැන 4. කරුණු රහිත. 5. එකඟ නැති.

අස්ථානතාව = 1. ප්‍රස්තාවට නුසුදුසු කම.

අස්ථානාකාරයෙන් = 1. අකලට. 2. තැනට. නුසුදුසු පරිදි

අස්ථාන භය = 1. කරුණු නැතිව වන බිය

අස්ථාවර = 1. ස්ථිර නැති. 2. චඤ්චල.

අස්ථාභිමුඛ වූයේ = 1. බැස යාමට හැරුණු.

අස්ථි = 1. ඇට.

අස්ථික සංඥ = 1. ශරීරය ඇට සැකිල්ලක යන හැඟීම.

අස්ථි කඞ්ගාලය = 1. ඇට සැකිල්ල.

අස්ථි කල්‍යාණ = 1. ඇට යහපත් ව පිහිටීම. 2. අවිවරව, සුදුව, සමව ගොතා තුබූ විදුරු පෙළක් සේ හොබනා දත් ඇති බව.

අස්ථි කුහරය = 1. ඇටයක් තුළ වූ සිදුර.

අස්ථි ගත = 1. ඇටවලට ගිය.

අස්ථි ඡේදය = 1. ශරීරයේ ඇටයක් කැපීම.

අස්ථිත = 1. නො පිහිටි. 2. ස්ථිර නැති. 3. චපල.

අස්ථිත කරනවා = 1. අනියස්ථිර කරනවා. 2. අවලංගු කරනවා.

අස්ථිපඤ්ජරය = 1. ඇට කූඩුව. 2. ඇටසැකිල්ල.

අස්ථි පටලය = 1. ඇට සිවිය.

අස්ථි පරීක්ෂයය = (අස්ථි මෘතිය) 1. ඇටදිරීම.

අස්ථිත පූර්ව = 1. පෙර නො සිටි.

අස්ථි බන්ධනය = 1. ඇට බැම්ම. 2. සන්ධි-බන්ධනය.

අස්ථි භක්ෂක = 1. ඇට කටු කන.

අස්ථි භූතිය = 1. අස්ථි වීම; ඇට ආකාරවීම.

අස්ථි මත් = 1. ඇට ඇත්තා වූ.

අස්ථිය = 1. ඇටය.

අස්ථිර = 1. චපල. 2. චඤ්චල 3. ස්ථිර නැති. 4. සවි නැති.

අස්ථිරතාව = 1. ස්ථිර නැති බව. 2. චපල කම.

අස්ථිර චේතස්ක = 1. චපල සිත් ඇති.

අස්ථි විද්‍යාව = (අස්ථි ශාස්ත්‍ර - අස්ථි විස්තරය) 1. ඇට පිළිබඳ ව උගන්වන ශාස්ත්‍රය.

අස්ථි විද්‍රධිය = 1. ඇට දිරීම.

අස්ථි වෙනවා = 1. ඇට මෙන් හයි වෙනවා.

අස්ථි සන්ධි = 1. ඇට හන්දි.

අස්ථි සන්ධි විච්ඡේදය = 1. ඇට සන්ධි වෙන්-කිරීම 2. ඇගේ හන්දි වෙන් කිරීම.

අස්ථි සම්බන්ධතාව = 1. ඇට බැඳීම.

අස්ථි සඞ්ඝාත = 1. ඇට සැකිල්ල.

අස්ථි සාරය = 1. ඇට මොළ.

අස්ථි ශ්‍රී = 1. ඇටයක් වැනි හිස. 2. ඇටයක මුදුන.

අස්ථි ශේත්‍ර = 1. සන්ධි බන්ධන.

අස්ථි ශේත්‍ර විච්ඡේදය = 1. ඇට බැම්ම කැපීම.

අස්දම = 1. අශ්ව දම් වැල.

අස් දම් සැරියා = 1. අශ්වයන් පුරුදු කරන්නා.

අස්න = 1. ආරංචිය. 2. ලියුම. 3. ආසනය. 4. පතිවුඩය. 5. ප්‍රවෘත්තිය. 6. දැනුම් දීම.

අස්නෑවියා = 1. අශ්ව සේනාපතියා.

අස් පන්තිය = 1. අශ්වයන් කණ්ඩායම.

අස් පර්ශනීය = (අස් පෘෂ්ටව්‍ය - අස් පෘශ්‍යය) 1. අත තැබිය නොයුත්. 2. අත ගා-බලන්නට නුපුළුවන් වූ.

අස් පර්ශිත=(අස්පෘෂ්ට) 1. අත නො තැවරුණු

අස් පෂ්ට = 1. නො පැහැදිලි. 2. අඳුරු.

අස් පස් කරනවා = 1. පිරිසුදු කරනවා. 2. සුදුසු සේ පිළිවෙළ කරනවා.

අස් පැටවා = 1. අස් පොව්වා; අශ්ව පැටියා

අස්පෘෂ්ට = 1. නො ඉවසන ලද. 2. ස්පර්ශ-නොකළ. 3. නො වැසූ.

අස්බෙඩි = 1. ඉලත්ති.

අස්මත් = 1. මම. (අපි) 2. තමා.

අස්මදීය = 1. අපට අයිති. 2. මගේ. (අපේ)

අස් මරණතාව = (අස් මරණය) 1. අමතක වීම. 2. මතක නැති බව.

අස්මස් = 1. අකරුණා වනන.

අස්මරි = 1. එනම් රෝගය. 2. මුත්‍ර බොක්කේ ගල් හට ගැනීමේ රෝගය.

අස්මාර්ත = (අස්මෘත) 1. අමතක වූ.

අස්මි මානය = 1. ආත්ම ගෞරවය.

අස් මුද්ද = 1. පේරුස් මුද්ද. 2. මුද්දරය.

අස් මෝල = 1. අශ්ව මෝල.

අස්‍රය = 1. කොණ.

අස් රිපු = (අස්රුපු) 1. මී හරකා. (මීමා).

අස් ලිස = 1. නව වැනි නැකැත.

අස්ව = 1. අශ්වයා. 2. කාමාදි ආසව.

අස්වගන්ද = 1. අමුක්කරා.

අස්වච්ඡ = 1. විනි විද නො පෙණෙන.

අස්වච්ඡන්ද=1. හිතුවක්කාර නුවූ. 2. තමාගේම මනාපයට කටයුතු නො කරන.

අස් වද්දනවා = 1. ගොවිතැන් කරනවා. 2. බිම සකස් කොට වපුරනවා.

අස්වනවා = (අස්සවනවා) 1. ඇහීමට සිඩ-කරනවා. 2. ප්‍රශ්න කරනවා.

අස් වන් = 1. ධාන්‍ය 2. ධාන්‍ය හටගත්. 3. අස් වැදුණු.

අස්ව නාන = 1. අස් වද්දා නැති. 2. පොළොව කොටා නැති.

අස්වනු = 1. අස්වැන්න. 2. ඵලදාව.

අස්වභාව කරනවා = 1. සවභාව වෙනස් කරනවා

අස්වනිත = 1. ශබ්ද නොකරන්නා වූ.

අස්වල් = 1. අශ්ව කෙඳි.

අස් වල්ගය = 1. අශ්ව වල්ගය

අස් වසනවා = 1. සනසනවා.

අස් වස් = 1. ආශ්වාසය. 2. සැනසිල්ල. 3 සුවය. 4. අස්වැසිල්ල.

අස්වස්ථ = 1. සුවයේ නො සිටින 2. දුඃඛිත.

අස්වසුර = 1. අශ්ව බෙටි.

අස්වභාව=1. සවභාව වෙනස් වීම. 2. විරූපකම.

අස්වං = 1. නම් නබා.

අස්වා භාවික = 1. සවභාවට වෙනස් වූ.

අස්වාමික = 1. සවාමියකු නැති.

අස්වාර්ථ පර = 1. තමන් ගේ ම ප්‍රයෝජනය නො සලකන.

අස් වාලධිය = 1. අශ්ව වලිගය.

අස් වැද්දීම = (අස් වැද්දුම) 1. ගොවිතැන් කිරීම.

අස්වැන්න = 1. පලදාව. 2. කපා පාගා ගත් වී. 3. එනම් පැළැටි.

අස්වැසිලි = 1. අස්වැසීම. 2. අස්වැසීමට උපකාර වන දෙය. 3. කඳුළු වැගිරීම.

අස්වැසිල්ල = 1. සැනසිල්ල.

අස්වැසීම = 1. සැනසීම.

අස් වැසෙන = 1. සැනසෙන.

අස් විද = 1. අශ්විනී. 2. පළමුවැනි නැකැත.

අස්විස = 1. වසනැල්ල.

අස් වෙනවා = 1. පැත්තකට වෙනවා. 2. ඉවත් වෙනවා. ඈත් වෙනවා.

අස් වෙල් = 1. ගස් වර්ගයක්.

අස් වෛරිතාව = 1. කැමැති සේ නො පවතින. 2. අනුන්ට යටත්. 3. හිතු මනාපයේ හැටියට කටයුතු නොකළ හැකි බව.

අස්ස = 1. අශ්වයා 2. සිදුර. 3. යට. 4. ඇතුළත. 5. අතර.

අස්සක් මුල්ලක් නෑර = 1. හැම තැනම වැහුණු - නො වැහුණු හැම කොණකම.

අස්සට = 1. අතරට. 2. ඇතුළට. 3. යටට.

අස්සත්ථරණ = 1. අසුන් පිට එලන ඇතිරිලි.

අස්සද්ධ = 1. අශ්‍රද්ධාව. 2. විශ්වාස කළ නො හැකි බව.

අස්සධිය = 1. ශ්‍රද්ධාවට විරුද්ධ අකුසල ධර්ම. නුසුදුසු තත්හි පැහැදීම වැනි මිථ්‍යාදෘෂ්ටිය.

අස්සම් = (අත්සම්) 1. භාරකාරයා.

අස්සාස පස්සාස = 1. ආශ්වාස ප්‍රශ්වාස.

අස්සල = (අස්හල) 1. අසුන් බඳින මඩුව

අස්සලශා = 1. අස්ගොව්වා.

අස්සැද්ද = 1. වශ්‍යකළ. 2. ශස්‍යවැඩු.

අස්සේනාග = 1. අශ්ව සේනාව. 2. අසුන් පිට යන සේනාව.

අස්සෙන් = 1. යටින්. 2. සිදුරකින්. 3. ඇතුළතින්.

අස්සු = 1. අශ්‍රු. (කඳුළු)

අස්සි = 1. චක්‍රය.

අසා = 1. ශ්‍රවණය කොට. (ඇහුම්කන්දී)

අසාංගතික = 1. මිත්‍රව ආශ්‍රය නොකරන.

අසාධක = 1. සාධක නැති. 2. සාක්ෂ්‍ය නැති. 3. හරි නොයන. 4. සුව නොවන. 5. ඉෂ්ට නොකරන.

අසාධනීය = 1. ක්‍රියාවෙහි යෙදිය නොහැකි.

අසාධාරණ = 1. අයුතු. 2. සාමාන්‍ය නොවන. 3. පක්ෂපාත.

අසාධු = 1. යහපත් නොවූ. 2. නරක.

අසාමයික = 1. කලට වේලාවට නුසුදුසු.

අසාමාග්‍රී = 1. සමගි කළ නොහැකි.

අසාමාන්‍ය = 1. සාමාන්‍ය නොවන.

අසාම්‍ය = 1. සමාන නැති.

අසාර = 1. සරු නැති. 2. නිසරු. 3. කළු කඩකාර 4. අයුතු ලාභගන්නා.

අසාරූප්‍ය = 1. රූපයෙන් සමාන නොවූ.

අසාර්ථක = 1. සාර්ථක නොවූ. 2. ප්‍රයෝජනයක් නැති. 3. තේරුම් නැති.

අසාවද්‍යරා = 1. අහනවා. 2. ප්‍රශ්න කරනවා.

අසාවධාන = 1. සාවධාන නොවූ 2. හිත යොමු නොකරන

අසාස්සත = 1. සදාකාලික නොවන. 2. නැතිවී යන.

අසැක = 1. සැකයක් නැති. 2. නිසැක.

අසි = 1. කඩුව. 2. හෙල්ල. 3. සත්‍රිය. 4. යෙහෙළිය. 5. ගිනි දූල්ල.

අසිකදලික්‍රීඩා = 1. කඩු වලින් කෙසෙල්ගස් පෙති ගසමින් කරන ක්‍රීඩාවක්.

අසික්කිත = (අශික්ෂිත) 1. නොහික්මුණු. 2. කැත. 3. පිළිකුල්. 4. නීච. 5. පහත්.

අසිගස් = 1. කඩු ගැටීම.

අසිගානා = 1. අසිග්‍රාහ නායක 2. රජුට කඩුව පිළිගන්වන අමාත්‍යයා.

අසිග්‍රාහක = 1. රජුගේ කඩුව ගෙනයන අමාත්‍යයා.

අසිත = 1. සුදු නොවූ. 2. කළු. 3. කළුවර. 4. පුදුමය. 5. දැකැත්ත 6. ආහාරය.

අසිතය = 1. සෙනසුරා. 2. අව පක්ෂය.

අසිතලය = 1. කඩුපත. 2. දෑ කැත්ත.

අසිඑල = 1. බුරුල් නොවූ.

අසිධාරා = 1. කඩුමුවහත.

අසිද්ධ = 1. සිද්ධනොවූ. 2. නො පැසුණ. 3. අසම්පූර්ණ.

අසිද්ධිය = 1. ඉෂ්ටනොවීම. 2. සිදු නොවීම.

අසිද්ධ්‍ය = 1. සිඩවිය නොහැකිවූ.

අසින - (අසිනි) 1· අසල බව. 2. කිට්ටු ස්ථානය

අසිපත් = 1. කඩුව.

අසිපත්‍රවන = 1. කඩු වැනි මුවහත් ඇති කොළ සහිත ගස් වලින් යුත් නිරය; අසිපත් නිරය. 3. උග්ගස්.

අසිමාල = 1. වධයක්. (වදයට නියමවූ මිනිසා උබ්දමා උබ්දීම කඩුවෙන් පෙති ගැසීම)

අසිය = 1. පුදුමය 2. කැටුම් තාලයක්. 3. කඩුව. 4 ගිනිදළුව. 5. නිරය.

අසිරි = 1. ආශ්චර්ය (පුදුමය) 2 කැටුම් තාලයක්.

අසිරිමත් = 1. ආශ්චර්යමත්. 2. පුදුම. 3. අසිරිය

අසිරිරූ = 1. ශරීර නැත්තා. 2. අනඞ්ගයා; කාමදේවයා.

අසිරි රූ = 1. පුදුම රූපයක් ඇත්තා. 2. කාම දේවයා

අසිලිය = 1. වැලක් සේ දික්වූ කඩුව.

අසිලු = 1. අළුපුහුල්.

අසිලෝම = 1. කඩු වැනි ලොම් සහිත නිරිසතුන් පැසෙන නරකයක්.

අසිවිසයා = 1. සර්පයා. 2. නාගයා.

අසී = (අසිය) 1. මිතුරිය. 2. යහළු ස්ත්‍රී.

අසීති = 1. අසූ (අසීතිය)

අසීරූ = 1. අමාරු.

අසු = 1. අශ්ව 2. පැත්ත.

අසු අස්සෙ ස් = 1. අතරතුරෙහි.

අසුඉසුඹු = 1. ගව්ව.

අසුකරනවා = 1. (උගුලකට) අහුකරනවා. 2. අල්ලනවා.

අසුඛ = 1. සැප නැති බව. 2. දුක

අසුගහ = (අහුගහ) 1. එනම් ගස

අසුචි = 1. මල. 2. කසල.

අසුන = 1. ආසනය. 2. ලියුම. 3. පණිවුඩය. 4. ආරංචිය 5. ශාසනය.

අසුන් = 1. අශ්වයන්. 2. ආසන. 3 ලියුම්. 4 සන්දේශය. 5. ශාසනය. 6. ඇත් පිටෙහි ඉඳ ගන්නා (ආසන නම්) තැන. 7. (රජුන් යුද සඳහා බල ලැබෙන තුරු රථකවල් ඇතිව හිඳීම වන) ආසන නම් රාජ ගුණය. 8. වසනය. (අඳනය) 9. සොරුන් පැහැර ගත්.

අසුන්ඇරි = (අහුන් හැරි) 1. පණිවුඩ කාරයා. 2. දූතයා. 3. ලියුම් ගෙන යන්නා.

අසුන්කන් = 1. අඳනයේ කෙළවර.

අසුන් සිඩිසි = 1. සොරුන් පැහැරගත් සිවුරු ඇති.

අසුන්සල් = (අසුන් හල්) 1. ආසන ශාලාව.

අසුධ = 1. අපිරිසුදු.

අසුපැවත = (අහුපැවත) 1. අස්වැන්න. 2. ප්‍රිය කරු දශීනය. 3. සශ්‍රීක වූ ගොයම් ආදි ඵලදාව. 4. සිත් පිනවන.

අසුබ = (අශුභ) 1. ශුභ නොවන. 2. අයහපත්. 3. යහපත් විපාක නැති.

අසුබු = 1. අශුභ.

අසුර = 1. මිට හෝ මිටින් ගත හැකි ද්‍රව්‍ය ප්‍රමාණය. 2. අසුර නම් දේව වර්ගය. 3. ආවරණය.

අසුරකාය = 1. අසුරයන්ගේ ජාතිය. 2. අසුරයන් ජීවත්වන ස්ථානය (මහමෙරපල්ල) 3. අසුර සමූහය.

අසුර ආචාර්ය = (අසුර ඇදුරු - අසුර ගුරු) 1. අසුරයන්ගේ ගුරුවරයා. (සිකුරා)

අසුර ඉඳු = (අසුර ඉන්ද්‍ර) 1. වේපචිත්ති නම් අසුර රජ.

අසුර නිකාය = 1. කාලකඤ්ජක නම් ප්‍රේත ලෝකය.

අසුර පුර = 1. අසුරයන් වසන පුරය. 2. අසුර ලෝකය.

අසුරභවන = 1. අසුරයන් වසන තැන (මහ මෙර පත්ලෙහි තිබෙන දෙව් ලොව මෙන් රම්‍ය වූ ලෝකය.

අසුරමාතා = 1. අසුරයන්ගේ ආදිම මව මෙන් සැලකෙන දිතිනම් තැනැත්තිය.

අසුරරජ = 1. සිකුරා.

අසුර රිපු = (අසුර රුපු) 1. ශක්‍රයා. 2. විෂ්ණු.

අසුර සමර = 1. සුරාසුර යුද්ධය. 2. දෙවියන් හා අසුරයන් අතර ඇති වූ මහා සංග්‍රාමය.

අසුරඟන = (අසුර + අඟන) 1. අසුරාංගනාව.

අසුරනවා = 1. අහුරනවා. 2. අඬංගු කරනවා.

අසුර ගහනවා = (අසුරු ගහනවා - අසුරසන්) 1. ඇඟිල්ලෙන් ඇඟිල්ල ගසා ශබ්ද කරනවා. 2. මහපටැඟිල්ල හා මැඳඟිල්ල එකට ගැසීම.

අසුරුම්පි = 1. අසුරට හෝ මහපටැඟිලි - දබරැඟිලි-මැදැඟිලි තුනට අසුවන ප්‍රමාණය.

අසුරුලහළු = 1. කැවිලි වෙසෙසක්.

අසුරුවනවා = 1. අහුරවනවා. 2. පුරුදු පුහුණු කරනවා

අසුරුසන = 1 ඇඟිල්ලෙන් ඇඟිල්ල. (අසුර) ගසන කාලය හෝ එම ශබ්දය.

අසුරු සැණෙකින් = 1. මොහොතකින්. 2. අසුර ගසන තරම් (සුළු) කාලයකින්.

අසුරොබි = 1. සුරභි ධේනුව. 2. හිතු පැතු දේ දෙන ධේනුව.

අසුව = 1. අහු වී. 2. අසු වී. 3. පණ

අසුවල් = 1. අසවල්. 2. අහවල්.

අසුවෙනවා = 1. (උගුලකට) අහුවෙනවා 2. අල්ලා ගන්නට සැලසෙනවා.

අසු = 1. එනම් ගණන. 2. අසු වූ. 3. බැඳුණු

අසුඅනුව්‍යඤ්ජන = 1. කුඩා ලක්ෂණ අසූව.

අසූඅනුව්‍යඤ්ජන් = 1. අශීත්‍යනු ව්‍යඤ්ජන.

අසූගැබ් මල්බලිය = 1. ගබ් අසූවක් ඇති බලියක්.

අසූචි = 1. මල. 2. කසල. 3. කිලුටු 4. කැත කුණු.

අසූත්‍රක = 1. සූත්‍රයක් නැති. 2. නීතියක් නැති.

අසූමහසවු = 1. අශීති මහා ශ්‍රාවක.

අසෘග්දර = 1. රක්තප්‍රදරය. (මාලේ රෝගය)

අසෘෂ්ට = 1. නොමවන ලද. 2. නොසාදන ලද.

අසෙ = 1. මිතුරිය.

අසේඛයා = (අසේක) 1. රහතුන් වහන්සේ.

අසෙකි = 1. අසංඛ්‍ය.

අසෙන = 1. හෙන.

අසෙනිය මල් = 1. විලඳ. 2. පොරි. 3 අර්චනීය. 4. පූජාවට සුදුසු මල්. (ජාති පසෙකි, සුදු අබ, විලඳ, සුන්සහල්, ඊ තණ, සමන් පිච්ච යැයි)

අසෙස් = 1. අශේෂ. 2. සියලු.

අසේනි = 1. අශේනිය. 2. වෙහෙස.

අසේවිත = 1. සේවනය නොකරන ලද. 2. පාවිච්චි නොකරන ලද. 3. සම්බන්ධ නුවූ.

අසෝ = 1. අසවල්. 2. හෝපලු ගස් 3. ශෝක නැති.

අසෝක = 1. එනම් රජතුමා 2. ශෝක නැති. 3. හෝපලු.

අසෝභන = 1. නොහොබනා. 2. යහපත් නොවන.

අසෞභාග්‍ය = 1. අවාසනාවන්ත. 2. ඉසුරුමත් නොවූ. 3. අසුබ.

අසෞභාග්‍යතාව = 1. අවාසනාවන්තකම.

අශක්‍ය = 1. කළ නොහැකි. 2. සිඩවිය නොහැකි.

අශංකනීය = 1. සැක නැති. 2. අනුමාන නැති.

අශනය = 1. කෑම. 2. ගොදුර.

අශනායාව = 1. කුසගින්න.

අශනිය = 1. හෙන පහර.

අශබල = 1. කැලැල් හෝ කබර නැති.

අශබ්ද = 1. ශබ්ද නැති. 2. නිශ්ශබ්ද. 3. වැරදි පද.

අශරීර = (අශරීරක - අශාරීරක) 1. ශරීරයක් නැති.

අශරීරයා = 1. කාමදේවයා.

අශරීරභාව = 1. ශරීරයෙන් චුතවූ (නිදහස් වූ)

අශල්ක = 1. කොරපොතු නැති 2. කටු නැති.

අශස්ත්‍ර = 1. ආයුධ නොවන දෙය. 2. ආයුධ නැති.

අශ්මජ = 1. යකඩ. 2. රතුහුණු.

අශ්මරස = (අශ්මසාර) 1. යකඩ.

අශ්මරී = 1. මුත්‍ර බොක්කේ සෑදෙන ගල්.

අශ්ව = (අශ්විය) 1. අශ්වයන්ට අයිති.

අශ්වකර්ණී = 1. ගස් වර්ගයක්. 2. අශ්ව කණ. 3. සප්ත කූට පර්වතයන්ගෙන් එකක්.

අශ්වගන්ධ = 1. අමුක්කරා නම් බෙහෙත් වර්ගය

අශ්වලාඩම = 1. අසුන්ගේ කුර නොගෙවෙන පිණිස සවිකරන තහඩුව.

අශ්වත්ථ = 1. ඇසැටු (නුග හෝ බෝ ගස් වර්ගයක්.)

අශ්වත්ථ බෝධි = 1. බුඩත්වය ලැබීමට උපකාරවූ ඇසැටු ගස.

අශ්වයා = 1. එනම් සිවුපාවා.

අශ්වඑළෙම්බි = (අශ්ව ළෙම්බි - වෙළඹ) 1. අශ්ව ධේනුව. (අශ්වයාගේ ගැණු සතා)

අශ්වකාරයා = 1. අශ්ව පාලකයා. 2. කුදිර කාරයා.

අශ්වතරයා = 1. කොටළුවා.

අශ්වබලය = 1. අශ්වයන්ගේ ජව වේගය අනුව පිළිසෙල කොටගත් මිම්මක්.

අශ්වමදයා = 1. (අශ්ව නාම්බා) තරුණ අශ්වයා.

අශ්වනැම්බි = 1. තරුණ අස් වෙළඹ.

අශ්වමුඛ = 1. අශ්ව මූණක් ඇති දෙවියා.

අශ්වමේධය = 1. එනම් යාගය. 2. අශ්ව පූජව.

අශ්වාරූඪ = 1. අසකු පිට නැගී.

අශ්වාරෝහකයා = 1. අසු පිටින් යන්නා.

අශ්විනි = 1. පළමුවැනි චන්ද්‍ර නැකැත. 2. අස් විද නැකැත.

අශ්විනී = 1. සූර්ය භාර්යාව වූ සංඥා දේවිය.

අශ්විනීපුත්‍ර = 1. අශ්විනියගේ පුත්‍රවූ දෙව් වෙද්දු දෙදෙන.

අශාන්ත = 1. ශාන්ත නොවූ. 2. නිවුණු ගති නැති. 3. නිශ්චල නුවූ.

අශාස්වත = 1. සදාකාලික නුවූ. 2. නොපවතින 3. නැතිවෙන.

අශාස්ත්‍ර = (අශාස්ත්‍රිය) 1. ශාස්ත්‍රයට එකඟ නැති.

අශික්ෂිත = 1. පුහුණුවක් නැති. 2. නොහික්මුණු. 3. කැත. 4. පිළිකුල්. 5. අසික්ඛිත.

අශිත = 1. කනලද.

අශිරස් = 1. හිසක් නැති.

අශිෂ්ට = 1. ශිෂ්ට නුවූ. 2. වනචර. 3. යහපත් ගති නැති. 4. අශීලාචාර.

අශිෂ්ටයා = 1. වනචරයා. 2. අශීලාචාර මනුෂ්‍යයා.

අශීති = 1. අසූව.

අශීතිකයා = 1. අවුරුදු අසූවක් වයස ඇත්තා.

අශීල = 1. ශීලයක් නැති. 2. අනාචාර ශීලී. 3. යහපත් හැසිරීමක් නැති.

අශුචි = 1. මල 2. අපවිත්‍ර.

අශුචිභූමි = 1. අපවිත්‍ර දෙය තිබෙන ස්ථානය.

අශුචි මහා නරක = 1. අශුචියෙන් පිරුණු මහ නිරය.

අශුද්ධ = 1. අපිරිසිදු. 2. වැරදි සහිත. 3. ශුද්ධ නැති.

අශුද්ධතාව = 1. අපිරිසුදුකම. 2. වැරදි සහිතබව.

අශුද්ධාත්මය = 1. දුෂ්ට ආත්මය.

අශුභ = 1. ශුභ නැති. 2. යහපත් නොවන. 3. පිළිකුල් වශයෙන් අයහපත්ව වැටහෙන උද්ධුමාතකාදි අරමුණු දහය. 4. අවාසනා වන්ත.

අශූන්‍ය = 1. ශූන්‍යනොවූ 2. හිස්නොවූ. 3. විනාශනොවූ.

අශූන්‍යතාව = 1. හිස්නැතිකම.

අශූන්‍යකල්ප = 1. බුද්ධාදීන්ගෙන් හිස් නොවූ පඤ්චවිධ කල්ප.

අශූර = 1. ශූර නොවූ. 2. උත්සාහ නැති. 3. කාර්යයෙහි දක්ෂනුවූ.

අශාම්‍ය = 1. දමනය කළ නොහැකිවූ.

අශේෂ = 1. ඉතිරියක් නැති 2. සියලු. 3. පිරිපුන්. 4. මුළු

අශෛක්ෂ = 1. ආධුනික නොවන. 2. සම්පූර්ණවූ. 3. හික්මී අවසන් හෙයින් නොහික්මෙන රහතුන්. වහන්සේ.

අශෛක්ෂ ඥාන = 1. අර්හත් එල ඥානය.

අශෛක්ෂ ප්‍රභේද = 1. අග්‍රශ්‍රාවකාදි වශයෙන් වන ක්ෂීණාශ්‍රවයන්ගේ කොටස්.

අශෝක = 1. ශෝකනැති. 2. හෝපලු 3. රසදිය. 4. එනම් රජතුමා; ධර්මාශෝක මහ රජතුමා.

අශෝක අක්ෂර = 1. අශෝක රජතුමාගේ ශිලා ලේඛනයන්හි තිබෙන අකුරු.

අශෝක අංකුර = 1. හෝපළු දළුව.

අශෝකමාලා = 1. දුටුගැමුණු මහරජ තුමාගේ පුත් සාලිය කුමරු ගේ දේවිය.

අශෝච්‍ය = 1. ශෝක වියයුතු නොවන. 2. නොපවතින. 3. අනිත්‍ය.

අශෝධිත = 1. පිරිසුදු නොකරන ලද. 2. වරද හරි ගස්සා නැති.

අශෝභන = 1. ශෝභන නුවූ. 2. අවලක්‍ෂණ. 3. නොහොබනා. 4. යහපත් නුවූ.

අශෝෂ්‍ය = 1. වියලිය නොහැකි. 2. අවසන් කළ.

අශෞච = 1. අපිරිසුදු.

අශ්‍රද්ධා = 1. ශ්‍රද්ධාව නැති. 2. ඇදහිලි නැති.

අශ්ම – 1. ගල්

අශ්ම පුෂ්ප = 1. ගල් මල්. 2. කප්පර වල්ලිය.

අශ්මභිද් = (අශ්ම හෙද) 1. පහණ බෙය; පොල්පලා

අශ්‍රම = 1. වෙහෙස නොවන. 2. කෙඩෙත්තු නොවන.

අශ්‍රමණ = 1. ගිහි. 2. ශ්‍රමණ නොවූ. 3. තාපසයෙකුට නුසුදුසු.

අශ්‍රය = 1. කඳුල.

අශ්‍රව්‍ය = 1. නෑසෙන. 2. නෑසිය යුතු.

අශ්‍රාද්ධ = 1. ශ්‍රද්ධාව නැති. 2. ඇදහිලි නැති.

අශ්‍රී = 1. කාලකණ්ණිය. 2. අවාසනාව.

අශ්‍රීක = 1. කාලකණ්ණි. 2. ශෝභා රහිත 3. විරූපී.

අශ්‍රීමෙහෙ = 1. පහත් වැඩ.

අශ්‍රු = 1. කඳුළ.

අශ්‍රු ජනක = 1. කඳුළු උපවදවන.

අශ්‍රු ධාරා = 1. වැගිරෙන කඳුළු බිඳු.

අශ්‍රුත = 1. නො ඇසූ. 2. ශාස්ත්‍ර නොදත්.

අශ්‍රුත පූර්ව = 1. නො ඇසූ විරූ.

අශ්‍රුතවත් = 1. ඇසූ පිරූ තැන් නැති. 2. නූගත්.

අශ්‍රුනාලි = 1. කඳුළු නාළිය.

අශ්‍රු පාතය = 1. කඳුළු හෙලීම.

අශ්ලීල=1. ග්‍රාම්‍ය වූ. 2. සභ්‍ය නුවූ. 3. ඇසුවන්ට ලජ්ජාදිය ඇති කරන.

අශ්‍රේෂ්ඨ = 1. ප්‍රධාන නොවන.

අෂ්ට = 1. අට.

අෂ්ට ආපණ = සල්පිල් අට. (පුෂ්ප - ගන්ධ - ඵල - අගද - මාංස - අමෘත - රත්න - හේම යන සල්පිල් අට.)

අෂ්ට ඍෂි = 1. පුරාණ ඍෂිවරු අට දෙනෙක් (නාරද - ධන්වන්තරි - අඞ්ගීරස - කපිල - කණාද- අග්නි සෝම - අතුල - පූතිකාත්‍යා- යන යන වෛද්‍ය ශාස්ත්‍රයෙහි ප්‍රසිද්ධ රූසිවරු අට දෙන.

අෂ්ට උදර = 1. (බඩේ) උදර රෝග අට.

අෂ්ටක වර්ග = 1. කේන්ද්‍ර ලිවීමේ දී ඒ ඒ ග්‍රහයන්ගේ බලාබල කම් දැනගන්නට කරන ගණිත ක්‍රමයක්.

අෂ්ටකර්ණ = 1. මහා බ්‍රහ්මයා. 2. කන් අටක් ඇත්තා.

අෂ්ටකර්ම විධි = 1. මන්ත්‍ර ක්‍රම අට වර්ගය.

අෂ්ට කාව්‍ය භාව = 1. රති - හාස - ශෝක - ක්‍රෝධ - උත්සාහ - උද්වේග - ජුගුප්සා - විස්මය යන කවි වගී අට.

අෂ්ට කුල දූෂණ = 1. කුලයට පළුදු වන කරුණු අට.

අෂ්ටකෝණ = 1· අට කොණ. 2: අට පට්ටම්.

අෂ්ටක්‍ෂණ = 1. අපායෙහි ඉපදීම, තිරිසන් ජාතියෙහි ඉපදීම ආදි පින් කිරීමට නුපුළුවන් කාල අට.

අෂ්ටගුණ = 1. අට ගුණයක් වූ.

අෂ්ටගුරු ධර්ම = 1. භික්‍ෂුණී ශාසනය පිහිටුවීමෙහි දී භික්‍ෂුණීන් විසින් පිළිපැදිය යුතු යයි නියම කරන ලද ප්‍රධාන කරුණු අට.

අෂ්ට ගුල්ම = 1. බඩේ ඇතිවන ගුල්ම රෝග අටක්.

අෂ්ටජ්වර = 1. වාතජ - පිත්තජාදි අට වැදෑරුම් උණ රෝග අට.

අෂ්ට ඥාන = 1. නුවණ අට.

අෂ්ට දික් පාලයෝ = 1. දිශා අටට අධිපතියෝ

අෂ්ට දුෂ්ටක්‍ෂණ = 1. පින් නොකළ හැකි කල් අට.

අෂ්ට ධර්ම 1. බුදුවරයකු වීමට අවශ්‍ය කරුණු අට.

අෂ්ට නාද ක්‍රමය = 1. නාද අටක් ඇති තූර්ය ක්‍රමය.

අෂ්ට නාද භාණ්ඩ = 1. නාද අටකින් යුත් තූර්ය භාණ්ඩ.

අෂ්ට පත්‍ර = 1. පෙති අටක් ඇති.

අෂ්ට පරිෂ්කාර = 1. අටපිරිකර.

අෂ්ට පර්ෂත් = 1. අට පිරිස.

අෂ්ට පාද = (අෂ්ට පාදික) 1. පා අටක් ඇති.

අෂ්ට පාරාජිකා 1. පාරාජිකා පව් අට.

අෂ්ට ප්‍රකාර = 1. ආකාර අටක් ඇති.

අෂ්ට පුරුෂ කේශර = 1. පිරිමි රේණු වගී අට.

අෂ්ට පේරු = 1. පේරු අට හෝ පලාත් අට.

අෂ්ට භොග වස්තු = 1. සුගන්ධ - විලේපන, කෑනතා, වස්ත්‍ර, නෘත්‍ය - ගීත, තාම්බූල, ආහාර - පාන, ශයනාසන, ශෘන යන ප්‍රයෝජන ගතයුතු වස්තු අට.

අෂ්ටම = 1. අට වැනි.

අෂ්ට මඞ්ගල = 1. අට මඟුල 2. මඞ්ගල සම්මත වස්තු අට හෝ රූ සටහන් අට.

අෂ්ටමාධිපතියා = 1. (කේන්ද්‍රයේ) අට වැන්නෙහි අධිපතියා.

අෂ්ටමිය = (අෂ්ට මී දින) 1. අටවක.

අෂ්ට මූර්ති = 1. ඊශ්වරයා. (ඔහුගේ මූර්ති සේ සැලකෙන) 1. ආකාශ. 2. වායු. 3. අග්නි. 4. ජල. 5. පෘථිවි. 6. චන්ද්‍ර. 7. සූර්ය. 8. යාග හිත්ත යන කරුණු අට.)

අෂ්ටයෝනි = 1. කාව්‍ය ශාස්ත්‍රයෙහි දැක්වෙන තකුල ආදි ජාති අට.

අෂ්ටරන්ධ්‍ර = 1. සිදුරු අටක් ඇති.

අෂ්ටලෝක ධර්ම = 1. ලාභ - අලාභ - යසස් - අයසස් - නින්දා - ප්‍රශංසා - සුඛ - දුඃඛ යන ලොක සවභාව අට.

අෂ්ට ලොහ = 1. රන් - රිදී - තඹ - පිත්තල - තුත්තනාගම් - ඊයම් - යකඩ - වානේ යන ලෝහ වගී අට.

අෂ්ටවංක මාණික්‍යය = 1. අට තැනකින් වක් වූ මැණික.

අෂ්ට වර්ෂ = 1 අට අවුරුද්දක් පවතින.

අෂ්ට විද්‍යා = 1. රහතුන් ගේ ඥාන අට.

අෂ්ට විඥප්ති = 1. අට ආකාර දැනීම.

අෂ්ටවිධ පාන = 1. භික්ෂූන්ට විකාලයෙහි ද වැළඳිය හැකි අඹ, දඹ, රඹ, ඇට කෙසෙල් මී, මිදි, බොරළු දමුනු, ඔලු යන මේ ද්‍රව්‍ය මිරිකා පෙරාගත් පානය.

අෂ්ට විමෝක්ෂ = 1. සංසාරයෙන් මිදෙන අට ආකාරය.

අෂ්ට බීජ = 1. බීජ අටක් ඇති.

අෂ්ට සමාපත්ති = 1. භාවනා කිරීමෙන් සමවදිනු ලබන රූපාවචර ධ්‍යාන සතර හා අරූපාවචර ධ්‍යාන සතරදැයි යන අට.

අෂ්ට සංවේග වස්තු = 1. සංවේගය ඉපදවීමට උපකාරවන ජාති, ජරා, ව්‍යාධි, චුති, අපාය, අතීත දුඃඛ, වර්තමාන දුඃඛ, අනාගත දුඃඛ යන කරුණු අට

අෂ්ටශත = 1. අටක් සහිත සියය (108) 2. අටෙන් ගුණකළ සියය = 800

අෂ්ටව්‍රතපද = 1. මිලිඳු රජු නාගසේන තෙරුන් හමුවීමට යන්නට මත්තෙන් සමාදන්ව සත් දවසක් පිරූ ගුණ අට.

අෂ්ටක = 1. අටක් ඇති. 2. මඞ්ගල උත්සව වලදී කියනු ලබන පද්‍ය අටකින් යුත් කවි - ගාථා හෝ ශ්ලෝක පඞ්ක්තිය.

අෂ්ටාඞ්ග = 1. අංග අටක් ඇති. 2. කරුණු අටකින් යුක්ත.

අෂ්ටාඞ්ග ආයුර්වේද = 1. ශල්‍ය, ශාලාක්‍ය, කාය චිකිත්සා, භූත විද්‍යා, කුමාරභෘත්‍යා, අගද තන්ත්‍ර, රසායන තන්ත්‍ර, වාජීකරණ යන අඞ්ග අටකින් යුත් ආයුර්වේදය.

අෂ්ටාඞ්ග නමස්කාර = 1. අඞ්ග අටකින් යුත් වැඳීම.

අෂ්ටාඞ්ග බ්‍රහ්මස්වර = 1. අට ආකාර නාදය සිත් යුත් බ්‍රහ්මයාගේ කටහඬ.

අෂ්ටාඞ්ගමාර්ග = 1. ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය.

අෂ්ටාංශසනාශ = 1. පැති අටක් ඇති දේ.

අෂ්ටාඞ්ග ශීලය = 1. අට සිල්.

අෂ්ටාඞ්ගික මාර්ගය = 1. නිර්වාණයට මාර්ගය වූ සම්‍යක් - දෘෂ්ටිය, කල්පනාව, වචනය, කර්මාන්තය, ජීවිකාව, වීර්යය, සිහිය, සමාධිය යන අට.

අෂ්ටාදශ = 1. දහ අට. (අටළොස)

අෂ්ටාදශ පුරාණ = 1. බ්‍රහ්ම, පද්ම, විෂ්ණු, ශිව, භගවත්, නාරද, මාර්කණ්ඩෙය, අග්නි, භවිශ්‍යත්, බ්‍රහ්ම වෛවර්ත, ලිඞ්ග, වරාහ, සකන්ද, වාමන, කූර්ම, මත්ස්‍ය, ගරුඩ, බ්‍රහ්මාණ්ඩ යන පුරාණ ග්‍රන්ථ දහ අට.

අෂ්ටාදශ රාග = 1. ද්‍රවිඩ සංගීතයෙහි ඇතැයි සලකන ලද රාග දහ අට.

අෂ්ටාදශාඞ්ග = 1. කොටස් දහඅටකින් යුත්.

අෂ්ටාපදය = 1. දූ පෝරුව. 2. දම් පෙත.

අෂ්ටාපද ක්‍රීඩාව = 1. දම් කෙළිය.

අෂ්ටායශී පුද්ගල = 1. අටඅරි පුහුල් බලන්න.

අෂ්ටාශ්‍ර = 1. පැති අටක් ඇති.

අෂ්ටි = 1. ඇට.

අෂ්ටොත්තරශත = 1. (අෂ්ට + උත්තරශත) අටක් වැඩි සියය = 108

අෂ්ටිය = 1. මාත්‍රා දහසයක් ඇති කව් පෙළ.

අෂ්ඨිලාව = 1. ගල් කැටය. 2. ඉදිමුම, 3. ශරීරයේ යට ගෙඩිය.

අෂ්ඨි සංබලිකය = 1. ඇටසැකිල්ල.

අෂාඪ = (අෂාඪක) 1. ඇසල මාසය.

අහ = 1. දවස. 2. දවල් කාලය. 3. ප්‍රසංසාව 4. දිශාව. (පැත්ත)

අහක = 1. පැත්තක. 2. ඉවත.

අහක දමනවා = 1. ඉවතට විසි කරනවා. 2. පැත්තකට දමනවා.

අහක් වෙනවා = 1. ඉවත් වෙනවා. 2. පැත්තකට වෙනවා. 3. ඈත්වෙනවා.

අහගන්නවා = 1. අසාගන්නවා. 2. විමසා ගන්නවා. 3. කන්දී අසනවා.

අහංකාර = 1. උඩඟු. 2. අභිමානය ඇති.

අහට = 1. දිශාවට. 2. පැත්තට. (ඒ අහට = ඒ පැත්තට)

අහත = 1. අළුත්. 2. නොතැසූ. 3. තුවාල නොකළ.

අහත් පහත් = 1. යටත් පහත්.

අහත් වස්ත්‍ර = 1. අළුත් රෙදි.

අහත්ති = 1. අහේනිය. 2. පිපාසය.

අහන = 1. ඇහුම්කන් දෙන. 2. කන් දී අසන. 3. විමසන. 4. ප්‍රශ්න කරන.

අහපති = 1. ඉර. 2. සූර්‍යයා. 3. දවසට අධිපති. (දිනපති)

අහබඩ = (අසබඩ) 1. සමීපය. 2. අයින. 3. අද්දර.

අහම්බෙන් = 1. හදිස්සියෙන්. 2. බලාපොරොත්තු රහිතව.

අහම්බෙකින් = 1. කලාතුරකින්.

අහය = 1. දවස. 2. දවාල.

අහර = 1 ආහාර. 2. පාර. 3. අභිමානය.

අහරකිස = (ආහාර කෘත්‍යය 1. කෑම ගැනීම.

අහුරකුක්කා = 1. එනම් සර්පයා.

අහර්පතියා = 1. ඉර.

අහරබෝයි = 1. භික්ෂු නමක් පිඬු පිණිස වැඩි විට ගෙදර අහර නැති බව කියන්නට කැමැති නොවන්නන් විසින් ඒ සඳහා කියනු ලබන වචනයක්.

අහර්මුඛය = 1. අලුයම. (දිවසමුඛය) 2. පාන්දර.

අහරු = 1. ආහාරය.

අහල - පහල = 1. කිට්ටුපාත. 2. අසල.

අහවක = 1. හමාර; ඉවර; කම්මුතු;

අහවර = 1. අවසාන. 2. කම්මුතු. 3. විවේකය.

අහවලා = 1. අසවලා. 2. ඒ තැනැත්තා. 3. එවැනි කෙනෙක්.

අහවිවක් = 1. අහස උසට. 2. විශාල ප්‍රමාණයක්.

අහවාඩිය = 1. අද්දර.

අහස = 1. ආකාශය. 2. අවකාශය.

අහස් = 1. ආකාශය. 2. මිනිරන්.

අහස්කුස = 1. අහස. 2. කව ආකාර අහස් ගුහාව. (නභෝමණ්ඩලය)

අහස්ගඟ = 1. ආකාශ ගඞ්ගාව.

අහස්ගඞ්නාව = 1. අහස ගෙරවීම.

අහස්තලය = 1. අහස. 2. ආකාශ තලය. 3. සඳල්ල.

අහස්දිය = 1. ආකාශ ජලය. 2. වැස්ස. (වැහි වතුර)

අහස්නැව = 1. අහස් යාත්‍රාව.

අහස්නිය = 1. අහස් ගඟ.

අහස්පත = 1. සරුංගලය.

අහස්පැන් = 1. වැසි දිය.

අහස්පියෙස = 1. අහස.

අහස්බෙදි = 1. මිතිරත් අළු.

අහස්මග = 1. අහස. 2. ආකාශ මාර්ගය.

අහස්මිණි = 1. සූර්යයා.

අහස්වියන = 1. අහස නමැති වියන. 2. උඩු වියන. (අහස්සන)

අහස්සන් = 1. උඩු වියන.

අහස්සැරි = 1. අහසේ හැසිරෙන. 2. අහසින් යන.

අහඃපතියා = 1. සූර්යයා; ඉර.

අහහ = 1. අටට සියය. 2. අටට කෝටිය. 3. නිරයක්. 4. ඛෙද - විස්මයාදිය ප්‍රකාශක නිපාතයක්. 5. නිරබ්බුද සියක් ලක්ෂයක්.

අහාර්‍ය = 1. පැහැර ගත නොහැකි වූ. 2. ගන්නට නුපුළුවන් වූ. 3. සොරා ගත නොහෙන.

අහි = 1. සර්පයා. 2. සතුරා. 3. අභිමානය. 4. කඩුව.

අහිකාර = (අහිය) 1 උඩගුකම.

අහිකුණප = 1. සර්පයාගේ මළ කඳ.

අහිගරසජ් = 1. ගැරඬියා. (කළු නයා)

අහිගුණ්ඩික = 1. සර්පයන් නටවන්නා. (අහිතුණ්ඩිකයා)

අහිච්ඡත්‍රක = 1. බිම්මල. 2. හත්ත.

අහිත = 1. හිතවත් නුවූ. 2. සතුරු. 3. වැඩ නැති.

අහිතු = 1. අශුචි.

අහිනවා = 1. සහිනවා; හහිනවා.

අහිංසක = 1. හිංසාවක් නැති.

අහිඡේන = (අහිපේන) 1. සර්ප පෙන. 2. අබින්.

අහිමි = 1. හිමි නැති. 2. අයිති නැති.

අහිය = 1. අහිත. 2. අයහපත්.

අහිසා = 1. සතුරා. 2. සර්පයා.

අහිර = 1. උඩගුකම.

අහිරාවය = 1. සර්ප හඬ.

අහිරාවා = (අයිරාවා) 1. කුඩා මිරිදිය මාලුවෙක්.

අහිරි = 1. ලජ්ජා නැති.

අහිරික = 1. ලජ්ජා නැති. 2. කාලකණ්ණි. 3. අකුශල චෛතසිකයන් හා එක්ව යෙදීමට පිළිකුල් නොකරන ගතිය.

අහිරිපොර = 1. අඹු සැමියන් අතර වන දබරය.

අහිමාල = අසිමාල යන්න බලන්න.

අහිමාලවධක = 1. අසිමාල වධය කරන්නා.

අහිලතා = 1. බුලත් වැල (නාගවල්ලි)

අහිවස = (අහිවස්) 1. නයා. 2. සර්පයා.

අහිවාතක = 1. විසකුරු 2. වසංගත.

අහිවාතක රෝගය = 1. එනම් වසංගත රෝගය (මහමාරිය?) හිමාල වන ප්‍රදේශයේ නාග රාජයන් විසින් පහලට හෙළනු ලබන විෂ වාතයක් (අහි වාතයක්) ඇත. මේ විෂ වාතය ආඝ්‍රාණයවූ මිනිසුන්ට අහි වාතක රෝගය වැලඳෙතැයි ද, ඒ රෝගය යම් ගෙයක ඇතිවූයේ නම් එගෙයි භිත්ති බිඳගෙන පිටවූ අය පමණක් නොමැරෙනැයිද කියති.

අහිවිෂ = 1. සර්පවිෂ

අහිවිසයා = 1. විෂ සර්පයා.

අහිසැවය = 1. සර්ප හැවය.

අහිෂාතය = 1. දිළිඳුකම. 2. හිඟකම.

අහිවිජ්ජා = 1. සර්ප වෙදකම.

අහු = 1. විෂ්ණු. 2. ගස්වර්ගයක්.

අහුකරනවා = 1. යටකරනවා. 2. අහුකරනවා. 3. වරදට පත් කරනවා 4. අමාරුවෙ දමනවා. 5. අල්ලනවා.

අහුශාලිය = 1. මහසිනාව.

අහුපැවත = 1. අහුපැවත බලන්න.

අහුමුළු = 1. අහුමුළු. 2. සිදුරු හා කොන.

අහුර = (අහවුර) 1. මිට. 2. අතට අහුවන ප්‍රමාණය.

අඹුරනවා = 1. පිළිවෙළට අඩංගු කරනවා. 2. වසනවා.

අඹුරුගහනවා = 1. මිටිවලට ගන්නවා. 2. අඹුරු ගසනවා.

අඹුරු සැණේ = 1. අඹුරු සැණ බලන්න.

අඹුව = 1. සිවුපාවකුගේ කකුලේ කොටස

අඹුලනවා = 1. ඇඹිඳිනවා; අවුලනවා.

අහෙක් සහෙක් = 1. කටයුතු. 2. මෙහෙය.

අහේතු = (අහේතුක) 1. හේතුවක් නැති 2. නිෂ්කාරණ. 3. අවාසනාවන්ත. 4. අශුබ. 5. නිෂ්ප්‍රයෝජන.

අහේතුක = 1 හේතුවක් නැති. 3. හේතුන්ගෙන් හටගැන්මක් නැති නිවන.

අහේතුව = 1. අවාසනාව. 2. අනතුර.

අහේනි = අසේනි බලන්න.

අහේනිය = 1. කැමනැති අමාරුව. 2. ඇඟ පණනැති කම. 3. ක්ලාන්තය.

අහේ පිළිසිඳ = 1. අහේතුක ප්‍රතිසන්ධිය (ඉබේ මවු කුසෙහි පිළිසිඳ ගැනීම.)

අහේම = 1. ක්ලාන්ත ගතිය. 2. හාමතය. 3. කෙඩෙත්තුව. 4. නිරාහාරයෙන් විසීමෙන් ඇතිවන විඩාව.

අහේතුක = 1. හේතුවක් නැති.

අහෝ = 1. අපොයි. (විපතක් පැමිණිවිට මුවින් නිකුත්වන දුක් සහිත වචනයක්) 2. හෝපලු.

අහෝරාත්‍රි = 1. දිවා රෑ (දහවල් හා රෑ)

අහෝසි = 1. අවලංගු 2. නැති.

අහෝසිකම් = 1. විපාක නොදෙන බවට පැමිණි කර්මය.

ආ

ආ = 1. අයත්තෙහි දීර්ඝ රූපය. 2. ආවෑවූ. 3. ආයුෂ. 4. ආරම්භය. 5. ආදිය. 6. සීමාව (තෙක්, දක්වා) 7. බ්‍රහම. 8. පූජාව. 2. මඞ්ගල භාවය. 10. පිළිගැනීම. 11. ආදූනම.

ආකඩ්ඪනය = 1. ඇදගැනීම. (ආකර්ෂණය)

ආකණ්ඨ = 1. ගෙල දක්වා.

ආකණ්ණිත = 1. ඇසූ. 2. අසනලද.

ආකම්තෑන් = (ආකැමි) 1. අයකැමියා 2. ආදායම රැස් කරන්නා.

ආකර්ෂණ = 1. ඇදගැනීම. 2. කහන්දම් බලය.

ආකර්ෂණය වෙනවා = 1. ඇදෙනවා.

ආකලනය = 1. ඇල්ලීම. 2. බැඳීම. 3. ඇඳුම. 4. ආභරණය.

ආකල්පය= 1. වේසය. 2. හැසිරීම. 3. ඉරියව්ව.

ආකරය = 1. පතලය. 2. උත්පත්ති ස්ථානය.

ආකරවූ = 1. උත්පත්ති ස්ථානවූ.

ආකරජ = 1. ආකරයෙහි උපන්.

ආකරභූමි = 1. ආකර සහිත බිම.

ආකර්ණන = 1. ඇසීම.

ආකර්ණනීය = 1. ඇසියයුතු.

ආකර්ණිත = 1. ඇසුවාවූ.

ආකස්මික = 1. ඉබේම හැදුණු. 2. හේතු රහිතව ඇතිවූ.

ආකාඞ්ක්ෂා = 1. ආශාව. 2. අදහස.

ආක්ෂේප = 1. ඇතුලට දැමීම. 2. නින්දා කිරීම. 3. ප්‍රශ්නය. 4 දුරු කිරීම.

ආක්ෂේපකයා = 1. දුරු කරන්නා 2. නින්දා කරන්නා. 3. ආක්ෂේප කරන්නා.

ආක්ෂේපය = 1. නින්දාව. 2. හෙළීම.

ආක්ෂෝඩ = 1. ගල් පියල් ගස.

ආකාර = 1. පිළිවෙළ. 2. අන්දම. 3. වේශය. 4. වැනි. 5. ලකුණ.

ආකාර අන්ත = 1. ආ යන්න අන්තකොට ඇති

ආකාර ගුප්තිය = 1. ස්වභාව සැඟවීම. 2. කුහකකම. 3. ආකාරය වැසීම.

ආක්‍රන්ද = 1. කෑදවීම.

ආකාලික = 1 ආකාලයෙහි හටගත්. 2. අකාල. 3. ක්ෂණික; වහාම සිඬවන. 4. විදුලිය.

ආකාලිකය = 1. විදුලිය.

ආකාශ = 1. අහස.

ආකාශ අඞ්ගණ = 1. සඳළු තලය. 2. ගෙවල් මතුවෙහි පියසි රහිතව තැනූ මහල් තලය.

ආකාශකවාට = (ආකාශ කවුළු) 1. ගෙට එළිය වැටෙන සේ වහලෙහි සාදනු ලබන කවුළුව.

ආකාශ කුහර = 1. අහස් සිදුර.

ආකාශ ගව්ව = (අහස් ගව්ව) 1. ශ්‍රී පාද කන්දේ පිහිටි තැනක්.

ආකාශ ගඞ්ගා = 1. අහස් ගඟ.

ආකාශගත = 1. අහසට ගිය. 2. අහසට නැංගාවූ.

ආකාශගමන = 1. අහසින් යාම (සූ. සැට ශිල්පයන්ගෙන් එකකි.)

ආකාශගුණ්ඩු = 1. අහසට නඟින වෙඩි. 2. ගිනිකෙළි වෙසෙසක්. 3. අහසේ දී පුපුරා හත් වත් එළි නිකුත්වන වෙඩි.

ආකාශචර = (ආකාශචාරි) 1. අහසේ ගමන් කරන.

ආකාශතල = 1. අහස. (ගෙයක් මතුවෙහි වහල නැති තට්ටුව.)

ආකාශධාතුව = 1. ඉඩ ඇති බව. 2. හිස්බව.

ආකාශපථ = 1. අහස් මඟ.

ආකාශජ = 1. අහසින් හටගත්.

ආකාශමණ්ඩල = 1. වටකුරුව පෙනෙන අහස 2. අහස් තලය.

ආකාශයාත්‍රා = 1. අහස් නැව්.

ආකාශවිදුමන් = 1. අහසට විදීම.

ආකාශවිද්‍යාව = 1. අහස ගැන උගන්වන ශාස්ත්‍රය.

ආකාශවියන = 1. උඩුවියන. 2. අහස උඩ. 3. වියනක් වැනි අහස.

ආකාශවිෂුවක = 1. අහසේ මැද වක්‍රය හෝ රේඛාව.

ආකාශස්ථ = 1. අහසේ පිහිටි, 2. අහස්හි සිටින.

ආකාශෝද්ඛී = 1. අහසට උඩින් පිහිටි.

ආකාසානඤ්චායතනය = 1. පළමුවැනි අරූපාවචර බ්‍රහ්ම ලෝකය.

ආකාසකසිණ = 1. වායු ධාතුව ගැන භාවනා කර හිත එකඟ කිරීම.

ආකිඤ්චඤ්ඤායතන = 1. තුන්වැනි අරූප බ්‍රහ්ම ලෝකය.

ආකිණ්ණ = ගැවසුණු 2. පිරුණාවූ 3. සතවූ.

ආකුඤ්චනය = 1. වෙළුම. 2. ඇකුළුම. 3. කොටවීම.

ආකුඤ්චිත = 1. හැකුළුණු. 2. ඇකුළුණු. 3. එකතුකළ.

ආකුල = 1. අවුල් වූ 2. වියවුල් වූ 3. ගැවසුණු. 4. තේරවිල්ලං.

ආකුල පාකුල = 1. අවුල් පවුල්. 2. කලබලය හෝ යක්හඩ.

ආකුලිත = 1. අවුල් වූ.

ආකුලීකෘත = 1. අවුල් කරන ලද.

ආකුල ව්‍යාකුල = 1. අවුල් වියවුල්.

ආකුලත්වය = 1. අවුල් බව.

ආකෘති = 1. සැලැස්ම. 2. ආකාරය. 3. පිළිවෙළ. 4. එකාකාරවූ. 5. හැඩය. 6. ජාතිය.

ආකෘෂ්ට = 1. ආකර්ෂණය කළ. 2. ඇදීම. 3. අදින ලද.

ආකෝටන = 1. ගැසීම. 2. තැළීම. 3 කෙටීම. 4. ඇනීම. 5. ඇපිල්ලීම.

ආකෝටිත = 1. ආකෝටනය කළ.

ආක්‍රම = (ආක්‍රමණ) 1. ඉක්මවන. 2. පැගීම. 3. බලයෙන් අල්ලා ගැනීම. 4. පැරදවීම.

ආක්‍රාන්ත = 1. පැරදවූ. 2. පාගැසූ. 3. පීඩිත.

ආක්‍රාමක = 1. බලයෙන් පැමිණ යටත් කර ගත්තාවූ. 2. බලහත්කාරයෙන් (රටට) ඇතුළු වී අල්ලා ගත්තාවූ.

ආක්‍රෝශ = 1. බැණීම. 2. නින්දාව. 3. නිග්‍රහ. 4. අවලාද.

ආක්‍රෝශ පරිභව = 1. ආක්‍රෝශ හා පිරිහෙළන වචන.

ආඛණ්ඩල = 1. ඉන්ද්‍රදෙවියා; ශක්‍රයා.

ආඛ්‍යාව = 1. නාමය. 2. උපාධි නාමය.

ආඛ්‍යාත = 1. කියන ලද 2. ගණන් කළ. 3. (ව්‍යාකරණයෙහි) ක්‍රියා පදය.

ආඛ්‍යාතය = 1. කියමන. 2. ක්‍රියා පදය.

ආඛ්‍යානය = 1. කියමන. 2. ප්‍රසිද්ධ ඉතිහාස කථාව. 3. පිළිතුර.

ආඛ්‍යායිකා = 1. ගද්‍ය කාව්‍යය. 2. කථාව. 3. ප්‍රබන්ධය.

ආඛු = (ආඛුවා) 1. මීයා. 2. ඌරා. 3. හොරා.

ආගත = 1. පැමිණියා වූ.

ආගතානාගත = 1. ඔපාදූප. 2. සෝලම් තෝලම්.

ආගන්තුක = 1. අමුතු. 2. අපූරු. 3. එන. 4. අහම්බෙන් පැමිණියාවූ. 5. අවුත් පෙරළා යන. 6 අළුත්.

ආගන්තුකජ්වර = 1. (වැටීම් - තුවාළ ආදිය නිසා) අහම්බෙන් ඇතිවන උණ.

ආගන්තුකයා = 1. අමුත්තා 2. හමු වෙන්නට එන්නා

ආගන්තුක සත්කාර = 1. අමුත්තන්හට කළ මහා උපස්ථාන.

ආගන්තුක ශාලාව = 1. අමුත්තන් රැස් වී හිඳින ශාලාව.

ආගන්තුකභක්ත = 1. අමුත්තන්ට දිය යුතු ආහාර.

ආගන්තුකවත් = 1. ආගන්තුක සත්කාර.

ආගන්තුග = 1. අළුතෙන් පැමිණ.

ආගන්තුජ = 1. අමුතුවෙන් උපදනා. 2. හදිසියෙන් ඇතිවන.

ආගම = 1. ඇදහීමේ මාර්ගය. 2 පැමිණීම. 3 අවබෝධය. 4. (ව්‍යාකරණයෙහි) අමුතු අකුරු පැමිණවීම. 5. ත්‍රිපිටක ධර්මය. 6. ක්‍රිස්තු ධර්මය.

ආගමානුකූල = 1. ආගමට එකඟ ලෙස.

ආගම්කාරයා = 1. ආගමට අයිති අය.

ආගමචක්‍රවර්ති = 1. ආගමයෙහි චක්‍රවර්ති යෙකු වැනි. 2. පුරාණ පණ්ඩිතයෙක්.

ආගමඥ = 1. ආගම උගතා. 2. ආගම දන්නා.

ආගමධර = 1. ආගමය දරණ. 2. ධර්මය උගත්.

ආගමවිරෝධි = 1. ආගමට විරුඬ වූ.

ආගමසන්ධි = 1. වචන දෙකක් අතරට අමුතු අකුරක් පැමිණීමෙන් වන සන්ධිය.

ආගමනය = 1. ඊම. 2. පැමිණීම.

ආගමනය කරනවා = 1. එනවා.

ආගම්‍ය = 1. ඉදිරියට පැමිණෙන්නට පුළුවන්වූ 2. පැමිණිය යුතු. 3. ලං විය හැකි වූ.

ආග්නික = 1. ගින්නට අයිති.

ආග්නේයය = 1. අග්නිකොණ. 2. රත්රන්. 3. එළගිතෙල්. 4. ලාදිය. 5. ලේ. 6. ගින්නෙන් උපන්.

ආගාමි = 1. මතු පැමිණෙන. 2. නැවත පැමිණෙන.

ආගාරය = 1. ගෙය. 2. කාමරය.

ආගාරික = 1. නෙට අයිති. 2. පවුලට අයිති. 3. ගෘහස්ථයා.

ආගාරදාහය = 1. ගේ දැවීම.

ආගිය අතේ = 1. නන්නත්තාරේ.

ආගිය අතක් නෑ = 1. කොයි ගියාද කියා දන්නේ නෑ.

ආගුචාරියා = 1. හොරා. 2. දුෂ්ටයා. 3. අපරාධ කාරයා.

ආග්‍රහ = 1. ගැනීම. 2. ඇලීම 3. දැඩි අදහස.

ආග්‍රහායණය = 1. ඉල් මස.

ආග්‍රහායණිය = 1. මුව සිරස තරුව. 2. පසළොස්වක පෝය දින.

ආඝර්ෂණය = 1. ගැටීම. 2. ඇතිල්ලීම.

ආඝාතනය = (ආඝාතය) 1. පහර දීම. 2. මරා දැමීම. 3. වෛරය. 4. ගැසීම. 5. සතුන් මරණ තැන. 6. වැරදි කරුවන්ට වද දෙන තැන.

ආඝාතනභූමි = 1. වද දෙන තැන.

ආඝ්‍රාණය = 1. ඉවකිරීම, 2. ආශ්වාසය. 3. ඉඹීම. 4. ගඳ සුවඳ දැනීම.

ආඝ්‍රාණයවෙනවා = 1. (ගඳ හෝ සුවඳ) නාසයට දැනෙනවා.

ආචමනය = 1. සේදීම. 2. මුඛාදිය සේදීම. 3. බීම.

ආචරණය = 1. හැසිරීම. 2. ඇවිදීම.

ආචරිත = 1. පුහුණු. 2. ව්‍යවහාර කරන ලද. 3. හැසුරුණු.

ආච්චි = 1. අත්තම්මා. 2. වයස්ගත වූ ස්ත්‍රී. 3. පියාගේ හෝ මවගේ මවු. 4. ද්‍රවිඩ හෝ මුස්ලිම් ස්ත්‍රී.

ආචාමනීය = 1. බියයුතු.

ආච්ඡාදනය = 1. වැසීම. 2. වැස්ම. 3. රෙදි ඇඳීම.

ආච්ඡාදිත = 1. වැසුණු 2. ඇඳි. 3 සැරසුණු.

ආච්ඡින්න = 1. කපාදැමූ. 2. පැහැරගත්. 3. සිඳින ලද.

ආචාර = 1. යහපත් හැසිරීම. 2. ගෞරව දැක්වීම. 3. හැසිරීම. 4. චාරිත්‍රය 5. පුරුද්ද. 6. ශීල විශෙෂයක්.

ආචාර කරනවා = 1. ගෞරව දක්වනවා.

ආචාරගුණ = 1. යහපත් හැසිරීම නමැති ගුණය.

ආචාරධර්ම = 1. යහපත් හැසිරීම් ක්‍රම.

ආචාරපත්‍රය = 1. නාම පත්‍රය.

ආචාරවිනය = 1. ආචාරයෙහි පුහුණු බව.

ආචාරවිපත්ති = 1. වැරදි හැසිරීම.

ආචාරවෙඩිල්ල = 1. ගෞරව දැක්වීම් වශයෙන් තබන වෙඩිල්ල.

ආචාරශික්ෂා = 1. ආචාරයෙහි පුහුණු බව.

ආචාරශීලි = 1. මනා හැසිරීම් ඇති. 2. චාරිත්‍ර දන්නා. 3. යහපත් සේ හැසිරෙන සුළු.

අචාරසමාචාර = 1. එකිනෙකා ශුභ පැතීමෙන් හෝ වැඳීම් ආදියෙන් ආචාර කිරීම. 2. ඔවුනොවුනට ආචාර දැක්වීම.

ආචාරසම්පන්න = 1. ආචාරයෙන් යුක්ත,

ආචාරී = 1. ආචාර ඇති. 2. ආචාර්යයා. 3. යකඩ වලින් ආයුධ ආදිය සාදන්නා. 4. රන් රිදී වැඩ කරන්නා.

ආචාරිගිනිඋදුන = 1. කම්මලේ ලිප.

ආචාරිපට්ටලය = 1. කම්මල් කරුවාගේ පට්ටලය.

ආචාරිභාග = 1. ඉගැන්වීමේ ගාස්තුව වශයෙන් ගුරුවරයාට දිය යුතු දීමනාව

ආචාරියාපල = 1. ගස් වර්ගයක්.

ආචාරිණී = 1. ගුරුවරිය. 2. ශිෂ්‍යකාව. 3. ආචාර්ය වූ ස්ත්‍රී.

ආචාරින්වහන්සේ = 1. උතුම් ගුරුවරයා.

ආචාර්ය = 1. ශාස්ත්‍ර ආගමාදිය උගන්වන්නා.

ආචාර්යකුල = 1. විද්‍යාස්ථානය. 2. ගුරු ගෙදර.

ආචාර්යපාද = 1. පූජ්‍ය වූ ගුරුවරයා.

ආචාර්යභාග = 1. ගුරු පඩුර; ගුරුවරයාට දියයුතු කොටස.

ආචාර්ය මුෂ්ටි = 1. ගුරු මුෂ්ටි. 2. ගුරුවරයා අතෙහිම තබා ගතයුතු ධර්ම ශාස්ත්‍රසාරය. 3. ගුරු අඩක්කම. 4. දරුවකු වැනි ගෝලයාට දෙන රහස් ශාස්ත්‍ර.

ආචාර්යවත් = 1. ගුරුවරයාට කටයුතු උපස්ථාන.

ආචාර්යවාද = 1. ආචාර්යයන්ගේ ඉගැන්වීම්. 2. ගුරුමතය.

ආචාර්යසම්ප්‍රදාය = 1. ආචාර්ය පරම්පරාවට විශේෂවූ අධ්‍යාපන ක්‍රමය.

ආචින්න = 1. ආශ්‍රයෙන් පුරුදු වූ.

ආචින්නකල්ප = 1. ගුරුන් විසින් පුරුදු කරන ලද සියල්ලම කිරීම නිවරදයයි වැදූ රට භික්ෂූන් විසින් ඇතිකරන ලද විනය විරුඩ කල්පනය.

ආචිත = 1. රැස් කරන ලද.

ආචීරය = 1. වස්ත්‍රය. 2. ඇඳුම.

ආචීර්ණ = 1. පුරුදු.

ආචීර්ණ කර්මය = 1. නිතර පුරුදු කළ කර්මය.

ආචූෂනය = 1. කටට ඇදගැනීම.

ආච්ඡාද = 1. උසස් පැවතුම් ඇති.

ආජංසන = 1. දූහගැන්ම.

ආජානීය = 1. ශ්‍රේෂ්ඨයා. 2. උසස් වර්ගයේ අශ්වයා.

ආජානුලම්බ බාහු = 1. දන මඩල තෙක් එල්බෙන අත් ඇති.

ආජානේය = (ආජානීය) 1. උසස් වර්ගයේ අශ්වයා. 2. වංශවත් අශ්වයා. 3. භයනැති අය. 4. කොතරම් කරදර ඇතිවූවත් සාරථියාගේ අදහස් අනුව ක්‍රියා කරන අශ්වාදීහු.

ආජානේයඅශ්වයා= 1. ආජානේය වූ අශ්වයා. (සෛන්ධවයා)

ආජානේයවෘෂභයා = 1. ආජානේය වූ ගවයා.

ආජානේයහස්තියා = 1. ආජානේය වූ ඇතා.

ආජීව = 1. ජීවිකාව 2. දිවි පැවැත්වීම. 3. රක්ෂාව.

ආජීවකයා = 1. හිතමිත් ආගම අදහන නිර්වස්ත්‍ර මනුෂ්‍යයා. 2. නග්න පරිබ්‍රාජකයා. 3. බඩවියත සඳහා තපසට පැමිණි අය.

ආජීවනය = (ආජීවය) 1. රක්ෂාව. 2. ජීවිකාව.

ආජීවක භය = 1. ජීවිකා වෘත්තියෙන් වන බිය.

ආජීව පාරිශුද්ධිශීලය = 1. පිරිසිදු ජීවිතයක් ගත කිරීමේ ශීලය.

ආජ්‍ය = 1. ගිතෙල්.

ආජ්‍යමේහ = 1. ප්‍රමේහ රෝගයක්.

ආඥා = 1. අණ. 2, නියෝගය. 3. දඩුවම. 4. අණදෙව; නීතිය.

ආඥා අනුගත = 1. අණ අනුව ගිය. 2. නීතිගරුක.

ආඥාඋල්ලංඝනය = 1. අණ කඩකිරීම.

ආඥාකාරණය = 1. අණ පැවැත්වීම. 2. කීකරුකම.

ආඥාකාරණවා = 1. අණදෙනවා. 2. අණකරනවා. 3. නීතිය පණවනවා.

ආඥාචක්‍ර = 1. රෝදයක් මෙන් අවට පැතිරෙන අණ. 2. ව්‍යවස්ථා පඩිසානිය. 3. ආඥා රාශිය.

ආඥාපක = 1. නීති දායක. 2. අණදෙන. 3. නියෝග කරන.

ආඥාපණත් = 1. නියෝග පැණවීම. 2. නීති අණ.

ආඥාපර = 1. කීකරු. 2. නීති ගරුක.

ආඥාභඞ්ග = 1. අණ කඩ කිරීම.

ආඥාභාග = 1. අණ කඩ කිරීම.

ආඥාභේරී = 1. අණබෙරය (අඩබෙරය)

ආඥාත = 1. මනා කොට දත්.

ආඥාරේඛා = 1. අණ ඉර.

ආඥාවිධිය =. (ව්‍යාකරණයෙහි) විධි ක්‍රියාව.

ආටෝප = 1. එඩිය. 2. අහඞ්කාරය. 3. උකු ගතිය. 4. ඔපය. 5. පියුම. 6. තර. 7. බඩේ වාත රෝගයක්.

ආඩිටාල = 1. පීඩාව. 2. හිරිහැරය.

ආඩිමුව = 1. පැල්ලම.

ආඩ = 1. මහත්කම. 2. ඉඩකඩ. 3 ආශ්‍රයය. 4. ආඩම්බරය.

ආඩතාඩෙ = 1. තොසැලකිලිමත් ලෙස. 2. ආවාට ගියාට. ගරුසරු කමක් නැතිව. 4. ඇලය. 5. යමක් පෙරළෙන්ට හැකි බව

ආඩාතෝඩා = 1. වංඇපල. 2 පාවට්ටා. 3. එතම් ගස.

ආඩපන්න = 1. අත්තපන්ත. 2. උපකරණ.

ආඩපලි = 1. තොක්අඩු. 2. දෝෂාරෝපණ.

ආඩම්බර = 1. උඩඟු. 2. මාන්නාධික. 3. මහඩැක්කි නම් බෙර විශේෂය.

ආඩෙ = 1. ඉඩිකඩ. 2. මහත්කම.

ආඪක = 1. කුරුණිය. 2 ලාස්ස.

ආඪ්‍ය = 1. පොහොසත්. 2. පිරීගිය. 3. සමෘධ.

ආඬි = 1. කසාවත් සත්ත්‍යාසි විශෙෂයක්. 2. ලිංවලින් දිය ගැනීමට සවිකොට තිබෙන උපකරණයක්. 3. බර ඉසිලීමට යොදන උපකරණයක්. 4. මාලු වගීයක්.

ආණ = 1. පැදුරු - මලු ආදිය දූම්මට සාදගත් දෙයක්.

ආනක = 1. පටහබෙර. 2. මිහිගුබෙර.

ආනවය = 1. නිමක් නැති බව.

ආනඥ්‍ය = 1. කම්පිත නොවන.

ආනත = 1. නැමුණු. 2. නමස්කාර කළ.

ආනත්තිය = 1. අණකිරීම.

ආනද්ධ = 1. හාත්පසින් බැඳි. 2. සම් එතූ පටහාදි වාද්‍ය

ආනන = 1. මුඛය. 2. මුහුණ.

ආනනඩා = 1. ඇකුම් හරිනවා.

ආනන්තරික = 1. අනතුරුව. (ඊළඟම යෙදෙන)

ආනන්තර්‍ය = 1. අතරක් නැතිකම. 2. ඊළඟම පවතින බව. 3. අනන්තර ජාතියෙහි ම විපාක දෙන බව.

ආනන්තර්‍යකර්ම = 1. මරණින් අනතුරුව ඒකාන්තයෙන් ම නිරයෙහි ඉපදීමට හේතු වන පඤ්චානන්තරිය කර්ම.

ආනන්ත = 1. ඉමක් කොණක් නැති. 2. අනන්ත භාවය.

ආනන්ද = 1. ප්‍රීතිමත් කරන. 2. බුදුන් වහන්සේගේ අග්‍රෝපස්ථායක තෙරුන් වහන්සේ. 3. මුහුදෙහි වෙසෙන මහා මත්ස්‍යයෙක්.

ආනන්දකර = 1. ප්‍රීතිය ගෙන දෙන.

ආනන්දජනක = 1. ප්‍රීතිය උපදවන; සතුට ගෙනදෙන.

ආනන්දභාව = 1. ප්‍රීතිමත්කම.

ආනන්දනය = (ආනන්දය) 1. ප්‍රීතිය.

ආනන්ද රාජකරුණා = 1. ශ්‍රී රූපදේව ආනන්ද රාජකරුණා මහත්මා (මහා කවියෙකි. ග්‍රන්ථ කර්තෘවරයෙකි)

ආනන්දිත = 1. සතුටු කළ.

ආනමට ඉවීම = 1. ව්‍යඤ්ජනයේ ඉස්ම ටිකක් සිටින්ට ඉවීම.

ආනමානය = 1. අදහස් කළ මාගීය. 2. යෙදුම. 3. උපක්‍රමය.

ආනමාලු = (ආනවාලු) 1. කෙසෙල් වගීයක්.

ආනමේස්තරය = 1. උත්සවයන්හි පහන් තබන ස්ථානය. 2. මැද මිදුල ඇති ගෙවල් දෙකක් යා කරන ආලින්දය. 3. ගෙයක ඉදිරි ගේ පසු ඉස්තෝප්පුව.

ආනය = 1. ආශ්වාසය. 2. රාක්කය. 3. පැදුරු එල්ලන මැස්ස.

ආනම් = 1. ව්‍යඤ්ජන විශෙෂයක්.

ආනම් හොද්ද = 1. කුරහන් තලප කෑමට සාදන හොද්දක්.

ආන්කල් වෙනවා = 1. අමාරුවට පත් වෙනවා. 2. දුක් වෙහෙසට පත් වෙනවා 3. ඇඟ දුර්වල වෙනවා.

ආන්තර = 1. ඇතුළත්. 2. අභ්‍යන්තර.

ආන්තරාව = (ආන්ත්‍රාව) 1. අනතුර; අන්තරාය.

ආන්ත්‍රික = 1. බඩවැලට අයත් වූ. 2. අතුනු වලට සම්බන්ධ වූ.

ආන්දෝලනය = 1. පැද්දීම. 2. වැනීම. 3. සෙලවීම.

ආන්දෝලිත = 1. චඤ්චලිත. 2. පැද්දුණු.

ආන්ධ්‍ය = 1. අන්ධ භාවය.

ආන්ධ්‍ර = 1. තෙළිඟු රට.

ආන්නෑ = 1. ආඥව.

ආන්බාන් = 1. බැඳීම. 2. හික්මවීම.

ආන්වාසික = 1. වංශවත්.

ආන්වාහික = 1. දිනපතා.

ආනාදේශනාව = 1. විනය පිටකය.

ආනාපානය = 1. ආශ්වාස ප්‍රශ්වාසය.

ආනාය = 1. දැල. 2. මාළු කාරයා.

ආනාහ = 1. බඩ පිපුම.

ආනිය = 1. ඇනීම. 2. ඇනුම.

ආනිබාණි = 1. ඇනුම් ඇරීම. 2. ඇනුම් කෙටුම් වචන.

ආනිසංස = 1. අනුසස්. 2. විපාක. 3. ඉෂ්ට විපාක 4. පින. 5. පුණ්‍ය බලය.

ආනිසද = 1. තට්ටම් දෙක.

ආනීක = 1. යුධ සේනාව.

ආනීත = 1. පමුණුවන ලද. 2. ගෙනෙන ලද.

ආනීයමාන = 1. ගෙනෙනු ලබන. 2. පමුණුවනු ලබන.

ආනුපුබ්බිකථා = 1. පිළිවෙළින් කියන කථාව.

ආනුපූර්වී = 1. පිළිවෙළ. 2. පටිපාටිය.

ආනුභා = 1. ආනුභාවය. 2. බලය. 3. හාස්කම. 4. තෙද.

ආනුභාවය = 1. හාස්කම. 2. බලය 3. තේජස. 4. උසස් බව.

ආනුෂඞ්ගික = 1. හේතුවෙන් සිදුවන. 2. වැළැක්විය නො හැකි.

ආනූප = 1. ජල බහුල භූමිය.

ආනෙඤ්ජ = (ආනෙඤ්ජ) 1. කම්පා නොවන.

ආනෙඤ්ජකාරණ = 1. නොසෙල්ලි සිරීමට පුරුදු කරන.

ආණ්ඩ = 1. බිත්තරයකින් හටගත්.

ආණ්ඩුව = 1. රටක් පාලනයට යොදා තිබෙන මාර්ගය. 2. නීති රීති ක්‍රමය.

ආණ්ඩුකාරයා = 1. ආණ්ඩු කරන්නා. 2. උතුමාණන් වහන්සේ.

ආණ්ඩුක්‍රමය = 1. රටක් පාලනය කරන පිළි-වෙළ. 2. රජයක පවත්නා නීති රීති ආදිය.

ආණ්ඩුපෙරළිය = 1. විප්ලවය. 2. ආණ්ඩුව බලයෙන් වෙනස් කිරීම.

ආණ්ඩුවට්ටු = 1. හික්මවීම. 2. දඬුවම්.

ආණිය = 1. කඩ ඇණය.

ආඬිගුරු = 1. ශාස්ත්‍ර කියමින් ජීවත්වන ආඬියා.

ආඬියා = 1. හිඟමින් ජීවත්වන මහමත් භක්තිකයා. 2. සත්තාසි විශේෂයක්. 3. මාලුවගීයක්.

ආඬියා මානනවා = 1. බර ඇදීම පිණිස කඹ-ලී ආදිය දමා යොදා ගන්නා ක්‍රමයක්. 2. ළිං වලින් දිය ඇදීම සඳහා රිටක එක් කොණක බාල්දියක් ද අනෙක් කොණේ බරක් ද බැඳ ළිඳ ළඟ කනුවක සවි කිරීමෙන් යොදාගන්නා ක්‍රමයක්.

ආතංකය = (ආතංගය) 1. රෝගය. 2. පීඩාව.

ආතත = 1. එතම් බෙරය. 2. එක් මුණතක් ඇති බෙරය.

ආතත විතත = 1. සම්පූර්ණයෙන් සමින් වැසූ බෙරය.

ආතපය = 1. ඉර අව්ව.

ආතපත්‍රය = (ආතාපවාරණය) 1. කුඩය. 2. අව් අත්ත.

ආකර්ෂණ = 1. සංසිඳුවන.

ආතර් ද සිල්වා = 1. පොදු වැඩට සවකීය ධනය යෙදවූ දානපති සිංහල වීරයෙක්.

ආත්ත = 1. ලබාගත්. 2. කැවූ. 3. විශ්වාස සහිත.

ආත්තා = (ආතා) 1. ආච්චි. 2. ගෙඩි වර්ගයක්. 3. මුත්තා. 4. අනෝනා ගස්.

ආත්ති = 1. මයිල ගස.

ආත්ති පු = 1. මයිල මල්.

ආත්තුනැති = 1. අනාථ. 2. හව්හරණයක් නැති 3. අසරණ.

ආතාපන = 1. තැවීම. 2. කෙලෙස් තවන වීර්යයාගේ ආරම්භය.

ආතිථ්‍ය = 1. ආගන්තුක සත්කාරය. 2. ආගන්තුකයා; අමුත්තා.

ආතුර = 1. රෝගාතුරයා. 2. තොවිලය කරවා ගන්නා. 3. පීඩිත. 4. ගිලන් වූ. 5. මැඩුණු.

ආතුරකම = 1. රෝගාතුරකම. 2 රෝගී භාවය.

ආතුරපක්ෂය = 1. රෝගියාගේ නෑදෑ පිරිස හෝ රෝගියාගේ බල කාරයෝ.

ආතොද්‍යය = 1. තූර්‍ය භාණ්ඩය.

ආත්ම = 1. තමන්හට අයිති. 2. මානසික. 3. ආත්මයට අයිති. 4. චිත්තය. 5. චේතනාව. 6. පෙතෙල වැල්. 7. තෙමේ 8. ජීවය.

ආත්ම අර්ථය = 1. තමන්ගේ ප්‍රයෝජනය.

ආත්මඅර්ථකාමී = (ආත්මාර්ථකාමී) 1. තමන්-ගේ ප්‍රයෝජනය ගැනම සලකන්නාවූ

ආත්ම අධීන = 1. තමාට අයත්. 2. තමා වසඟයෙහි පවත්වන.

ආත්ම උදය = 1. තමාගේ අභිවෘද්ධිය.

ආත්මකාම = 1. තමාට වැඩ කැමති.

ආත්ම ක්ලමථ = 1. ශරීරයට දුක් හෝ වෙහෙසදීම.

ආත්මගත = 1. සිය අදහස. 2. සිතට පැමිණි.

ආත්ම ග්‍රහණ = 1. ආත්මයක් ඇතැයි ගැනීම හෝ සැලකීම.

ආත්මග්‍රාහී = 1. තමන්ගේ ප්‍රයෝජනයම සලකන්නාවූ.

ආත්මගෞරවය = 1. තමා ගරු තත්හි තබා සැලකීම. 2. තමාගේ ගුරුත්වය.

ආත්මඝාතක = 1. සිය පණ හාතිකර ගැනීම.

ආත්ම පෝෂයා = 1. කාක්කා. 2. කොහා. 3. කුකුළා.

ආත්මජ = 1. තමාගෙන් උපන්. 2. පුත්‍රයා. 3. දරු.

ආත්මජා = 1. දුව. 2. රා.

ආත්මජීවනීය = 1. කිරි.

ආත්මඥ = 1. තමා ගැනම දන්නා.

ආත්මතාව = (ආත්මභාවය) 1. ශරීරයක් නැති භාවය. 2. ආත්ම භාවය.

ආත්මතර්කණ = 1. තමාගේ තර්කණය. 2. තමා ගැන සැලකීම.

ආත්මදමනය = 1. සිත මැඩ පැවැත්වීම.

ආත්ම දර්ශනය = 1. තමාගේ සිත ගැන බලා ගැනීම.

ආත්ම දර්ශය = 1. මුහුණ බලන කන්නාඩිය. 2. කැඩපත.

ආත්ම දෘෂ්ටිය = 1. ආත්මයක් ඇතැයි යන කල්පනාව.

ආත්මද්‍රව්‍ය = 1. තමාට අයත් දෙය.

ආත්මද්‍රෝහී = 1. තමාට ද්‍රෝහ කරන.

ආත්ම ද්විතීය = 1. තමාම දෙවැනිකොට ඇති. 2. අසහාය.

ආත්ම වෙෂය = 1. තමාවම වෙෂ කරගැනීම.

ආත්මනාථ = 1. තමාම තමාට ස්වාමියා හෝ පිහිට කොට ඇති.

ආත්මනියෝජක = 1. තමා විසින්ම පත් කරනු ලැබූ.

ආත්මනිර්යාතන = 1. තමා පාවාදීම.

ආත්මනීයග්‍රහණ = 1. ආත්මයට අයත් දෙය ඇතැයි සැලකීම.

ආත්ම නිහතමානය = 1. යටහත් පහත්වූ බව.

ආත්මනේපදය = 1. (ව්‍යාකරණයෙහි) ක්‍රියා වර්ගවල භේදයක්.

ආත්මපරිතාපන = 1. ශරීරයට හිංසා කිරීම. (දුක්දීම, තැවීම)

ආත්ම පරිත්‍යාගය = 1. ජීවිතය කැපකර කටයුතු කිරීම. 2. ශරීරය පිදීම.

ආත්ම පරිත්‍රාණ = 1. තමා රැකීම 2. ආත්මය ආරක්ෂා කිරීම.

ආත්ම පරිශුද්ධතාව = 1. තමාගේ පිරිසිදුකම. 2. සිත පිරිසිදුකම. 3. තොකැලැල් බව.

ආත්ම පරීක්ෂණය = 1. තමා විභාගකර බැලීම.

ආත්ම පුනරුත්පත්තිය = 1. නැවත ඉපදීම.

ආත්ම ප්‍රභාවත් = 1. තමාගේ ම එළියෙන් බැබළෙන.

ආත්ම ප්‍රේමය = 1. තමාට කරන ස්නේහය.

ආත්ම බන්ධනය = 1. මළවුන්ගෙන් යමක් ඇසීම.

ආත්මබන්ධු = (ආත්ම බාන්ධව) 1. ලේ නෑයා.

ආත්ම බුද්ධිය = 1. තමන්ගේ නුවණ.

ආත්මභාවය = 1. තමන්ගේ ගතිය. 2. ශරීරය 3. ඉපදීම.

ආත්මභාවී = 1. ආත්ම භාවය ඇති.

ආත්මභූ = (ආත්ම භූත) 1. තමන් තමන් ම උපදවාගත්. 2. බ්‍රහ්ම. 3 අනඞ්ගයා.

ආත්ම මණ්ඩන = 1. ශරීරය සැරසීම.

ආත්මම්භරි = 1. සියතුන පමණක් පුරවා-ගන්නා . 2. අඹුදරුවන් හැර තමාගේ බඩ වඩා ඇවිදින්නා. (කිස්කර)

ආත්මමානිතාව = 1. අහංකාරකම.

ආත්මාරක්ෂාව = 1. තමන්ගේ ආරක්ෂාව.

ආත්මලාඝව = 1. තමා සැහැල්ලුවීම. 2. තමා පහත්වීම.

ආත්මවධ = 1. සිය පණ නාතිකරගැනීම.

ආත්මවඤ්චනය = 1. තමා රැවටීම.

ආත්මවර්ණනා = 1. තමා ගැන වර්ණනාව.

ආත්මවශ්‍යය = (ආත්ම විනිග්‍රහය) 1. තමාගේ සිත දමනය කිරීම.

ආත්මවාද = 1. ආත්මයක් ඇතැයි යන කථාව.

ආත්මවිද්‍යා = 1. ආත්මය දැනගන්නා න්‍යායාදි විද්‍යාව.

ආත්මවිශාලා = 1. මීවන පලා.

ආත්මවේදී = 1. තමා දන්නා.

ආත්ම ශික්ෂිත = 1. තමා විසින් ම ඉගෙන ගත්.

ආත්ම ශූන්‍යතා = 1. ආත්මයක් නැති බව.

ආත්ම ශ්ලාඝා = 1. ආත්ම වර්ණනාව.

ආත්ම සංයතනා = 1. තමා ගේ හිත දමනය කරන්නා වූ.

ආත්ම සංනියසීතනය = 1. ආත්ම පූජාව.

ආත්ම සංයමය = 1. තමා හික්මීම. 2. හිත දමනය කිරීම.

ආත්ම සංරක්ෂණය = 1. තමා මැනවින් ආරක්ෂා කර ගැනීම. 2. තමන් තමන් ම ආරක්ෂා කර ගැනීම.

ආත්ම සංවේදනය = 1. තමා ම විඳීම හෝ දැනීම.

ආත්ම සංක්‍රමණ = 1. ආත්මය යෑම හෝ මාරුවීම.

ආත්ම සම්පත්ති = 1. තමා ගේ ධන ධාන්‍යාදි වස්තුව.

ආත්ම සම්භාවනාය=(ආත්ම සාදරය) 1. තමාට ගරුකර ගැනීම.

ආත්ම සම්භාවිත = 1. අහංකාර.

ආත්ම භාව සමාධිය = 1. ආත්ම භාවයේ සම්පූර්ණත්වය.

ආත්ම සම්මතිය = 1. තමා ගැන සතුටුවීම.

ආත්ම සාර = 1. ආත්මය නමැති හරය. 2. ශරීරයෙන් ගත යුතු ප්‍රයෝජනය.

ආත්ම ස්නේහ = 1. ආත්ම ප්‍රේමය.

ආත්ම හේතු = 1. තමා විසින් ම පැවතෙන.

ආත්මාකාර = 1. ආත්ම විස්තර.

ආත්මානු දර්ශිය = 1. අත් දැකීම.

ආත්මාභි භවන = 1. තමාම දමනය කර ගන්නා වූ.

ආත්මාරූඪ = 1. තමන් ම ආරූඪ කර ගත්. 2. තමන් ගේ මතය ම ප්‍රධාන ය යි සිතන.

ආත්මාර්ථ සිද්ධිය = 1. ස්වකීය ප්‍රයෝජනය සිඩ කරන.

ආත්මාධ්‍යාශ = 1. තමන් ගේ අදහස.

ආත්මාවබොධික = 1. තමන් විසින් ම ඉගෙන ගත්.

ආත්මාවලම්බන = 1. තමන් හට ම යමක් කිරීමට ශක්තිය ඇතැයි සිතන.

ආත්මාලය = 1. ශරීරය.

ආත්මීක = 1. ආත්මයට අයිති.

ආත්මීය = 1. තමාට අයත්. 2. තමාගේ ම.

ආත්මෝත්කර්ෂණය = 1. තමා උසස් කොට පෙන්වීම.

ආත්මෝපක්‍රමය = 1. තමා විසින් ම යොදා ගත් ක්‍රමය.

ආත්‍යන්තික = 1. බොහෝ වැඩි වූ 2. බහුල වූ.

ආත්‍යයික = 1. අනතුරු සහිත. 2. ඉක්මන්.

ආතා = 1. ආච්චි. 2. කටු ආතා; අනෝදා.

ආතානාන්තා = 1. උවදුර; හානිය.

ආතිථේය = (ආතිථ්‍ය) 1. ආගන්තුක සත්කාර.

ආත්‍රේය = 1. පුරාණ ඍෂිවරයෙක්. 2. රස ධාතුව.

ආදර = 1. සෙනෙහස. 2. බුහුමන. 3. සැලකිල්ල 4. ආලය. 5. ප්‍රේමය. 6. කරුණාව 7. දයාව.

ආදරණීය = 1. ආදර කටයුතු.

ආදර වචන = 1. ආදරය සඳහා කියන වචන.

ආදර වන්ත = 1. ආදරය ඇති. 2. ආදරණීය.

ආදර ගෞරව = 1. ආදරය හා සැලකිල්ල.

ආදර්ශ = 1. ගුරුකම්. 2. මග පෙන්වීම්. 3. උපදෙස් 4. කැටපත. 5. උදාහරණය. 6. විස්තරය 7. ආදාශ.

ආදර්ශ තල = (ආදර්ශ මණ්ඩල) 1. කැටපත. (කැඩපත)

ආදර්ශනය = 1. පෙන්වීම. 2. එළිදරව් කිරීම.

ආදර්ශ පාඨය = 1. පරමාර්ථය දක්වෙන වාක්‍යය. 3. ශීර්ෂ පාඨය.

ආදර්ශ පිටපත් = 1. පැරණි පොතක් ශුද්ධ-කිරීමේ දී සසඳා බැලීම පිණිස ගන්නා පිටපත්. 2. ගොඩනැගිලි ආදිය තැනීමට කලින් ඒ හැඩහුරු කම් හා ප්‍රමාණයන් දක්වෙන සේ අඳින සැලැස්මවල්.

ආදර්ශ භිත්ති = 1. කැටපතින් කළ භිත්ති. 2. සම්මුඛවූවන් ගේ පිළිබිඹු පෙනෙන පමණට ඔප තැබූ බිත්ති.

ආදර්ශමත් = 1. ගුරු කමකට ගතහැකි. 2. ආදාශමත්.

ආද්‍ය = 1. පළමු වැනි.

ආද්‍ය ධාතුව = 1. මුල් ධාතුව.

ආද්‍යන්ත = 1. මුල හා අග.

ආද්‍ය බීජය = 1. මුල් හේතුව.

ආද්‍ය = 1. ආයුෂ දෙන. (ආයු වැඩි කරන)

ආද්‍ය කබලු = 1. ආයුෂ වැඩි කරන රොටි වෙසෙසක්.

ආදාන = 1. ගැනීම කරන. (ආදානය කරන)

ආදාන = 1. ගැනීම. 2. රෝග නිදානය හෝ රෝග ලක්ෂණය.

ආදාන ලකුණු = 1. රෝග ලක්ෂණ.

ආදාශ = 1. නෙත.

ආදාතබ්බ = 1. ගතයුතු. 2. ගතයුතු දෙය.

ආදායම් = 1. අයවන දෙය. 2. ලැබෙන ධනය.

ආදාර = 1. ආධාර. 2. උපකාර.

ආදාළ = 1. උපකාර වූ. 2. අඩංගු වූ.

අදාළ මේධි = 1. දත්ත ගස.

ආදාලි = 1. සුදු දුරු.

ආදාස = 1. කැටපත; මූණ බලන කන්නාඩිය. (කැඩපත)

ආදාහනය = 1. දැවීම. 2. මිනී දැවීම.

ආදාහන පූජා = 1. උතුමන් ගේ මළ සිරුරු දැවීමේ දී කරන පූජෝත්සවය. 2. දවා තුන්වැනි දින කරන පූජෝත්සවය.

ආදි = 1. පුරාණ. 2. මුල. 3. පළමු 4. ආරම්භය. 5. ප්‍රධාන 6. ඒ ආකාර.

ආදි කප් = (ආදි කල්ප) 1. ලෝකය ඇති වූ මුල් කාලය.

ආදි කම්මික = 1. පළමුවෙන් කළ අය. 2. යමක් ඉපද වූ අය.

ආදි කල්පික = 1. කල්පාරම්භයෙහි වූ.

ආදි කල්‍යාණ = 1. ආරම්භයෙහි යහපත්,

ආදි කාරණය = 1. මුල් හේතුව. 2. පූර්ව නිමිත්ත.

ආදිකාලය = 1. පුරාතන කාලය.

ආදි කාලීන = 1. පුරාණ කාලයට අයත්.

ආදි කොට = 1. පළමුකොට. 2. වෙත.

ආදි කෝටි = 1. මුල් කොණ.

ආදි ගහණ = (ආදි ග්‍රහණ) 1. ආදි යත්ත ගැනීම හෝ යෙදීම. 2. පළමු ගැනීම.

ආදික් නදන = 1. දෙවියෝ.

ආදිත්‍ය = (ආදිත්) 1. දේව. 2. සූර්‍ය.

ආදිත්‍ය පුෂ්පිකාව = 1. සූර්‍ය කාන්ති මල.

ආදිත්‍ය බන්ධු = 1. බුදුන් වහන්සේ.

ආදිත්‍ය වංශය = 1. සූර්‍ය වංශය.

ආදිත්‍ය වර්ණ = 1. ඉර මෙන් දිලිසෙන.

ආදිත්‍ය වල්ලි = 1. කොබෝවක්කා.

ආදිත්වය = 1. පැරණි කම.

ආදිපාද = 1. ඇපා. 2. අධිපතියා. 3. රාජකීය ශ්‍රෙෂ්ඨයෙක්.

ආදි පුරුෂ = 1. පළමු පුරුෂයෝ. 2. මුතුන් මිත්තෝ.

ආදිම = 1. පළමු වැනි. 2. මුල් වූ 3. ආදියෙහි වූ.

ආදි මග්ග = 1. පළමු මාර්ගය.

ආදිමත් = 1. ආදියක් ඇති.

ආදි මධ්‍යාවසානය = 1. මුල මැද අග.

ආදි මධ්‍යාන්ත කල්‍යාණ වූ = 1. මුල මැද අග යහපත් වූ.

ආදිෂ්ට = 1. දක්වන ලද. 2. අණ කරන ලද. 3. කියූ.

ආදිය = 1. ඉහත කාලය. 2. යනාදි වෙනත් දේ.

ආදීනවය = 1. දෝෂය. 2. අනිෂ්ට විපාකය. 3. විපත. 4. අනතුර. 5. ප්‍රතිඵල.

ආදීප්ත = 1. ආලෝක වූ. 2. ඇවිලුණු. 3. ගිනිගත්.

ආදෘත = 1. ආදරය කළ. 2. පිළිගත්.

ආදර්ශ = 1. ගුරුකම. 2. උදාහරණය. 3. මෝස්තරය. 4. අච්චුව. 5. සැලැස්ම.

ආදේය = 1. ඇතුළු කළ යුතු. 2. ගත යුතු.

ආදෙය්‍ය = 1. ගත යුතු. 2. බාර ගත යුතු.

ආදේව = (ආදේවනා) 1. වැලපීම.

ආදේශ = 1. අවවාදය. 2. ආඥාව. 3. (ව්‍යාකරණ යෙහි) අකුරක් වෙනුවට අනෙක් අකුරක් යෙදීම.

ආදේසනා = (ආදිසනා) 1. ප්‍රකාශ කිරීම. 2. දක්වීම.

ආදේසනාපාටිහාරිය = 1. ඔවුනොවුන්ගේ සිත් පවත්නා පරිදි කියන ප්‍රාතිහාර්‍යය. 2. අනුන්ගේ සිතිවිලි ප්‍රකාශ කිරීම.

ආදේශ්‍ය = 1. මාරු කළ හැකිවූ.

ආද = 1. ප්‍රීතිමත්.

ආඥ = 1. එනම් මාලුවා.

ආද්‍ර = 1. තෙත.

ආර්ද්‍ර = 1. තෙමුණු. 2. දිය සහිත. 3. හවැනි චන්ද්‍රතාරකාව හෙවත් නැකත.

ආර්ද්‍රකර = 1. තෙත් කරන.

ආර්ද්‍රක = 1. අමු ඉඟුරු.

ආධමාත = 1. හුළඟින් පිරුණු.

ආධ්‍යාත්මික = 1. ඇතුළු. 2. සිතට අයිති වූ. 3. සිතෙහි පවත්නා.

ආධ්‍යානය = 1. සිහි කිරීම.

ආධ්‍යාපකයා = 1. ගුරුවරයා.

ආධ්‍යාපනය = 1. ඉගැන්වීම.

ආධ්‍යාශය = 1. අදහස.

ආධාන = 1. තැබීම. 2. දැරීම. 3. ගැබ් පිහිටුවීම. 4. දරණුව. 5. අඩිය. 6. ආධාරකය.

ආධානය = 1. ගැනීම. 2. උකස. 3. ඇපය.

ආධාන ගාහි = 1. අත් නොහැර අල්වා ගන්නා. 2. සිය අදහසම සැබෑ යයි දැඩි සේ සිතා ගන්නා.

ආධාර = 1. පිහිට. 2. උපස්තම්භය. 3. යමක් දරණ දෙය.

ආධාරක = 1. කුඩා මේසය 2. කනප්පුව. 3. පාත්‍ර අඩි ආදිය.

ආධාරකයා = 1. ආධාර කාරයා. (උදව් කාරයා)

ආධාර විභක්තිය = 1. ආධාරාර්ථය පැවසීමට යෙදෙන විභක්තිය.

ආධාවන = 1. දිවීම. 2. අධික දිවීම.

ආධික්‍යය = 1. අධික බව. 2. වැඩිපුර දේ. 3. වැඩිපුර පංගුව

ආධිපත්‍ය = 1. අධිපති භාවය. 2. බලය.

ආධුනනගීතිකා = 1. සිත් කම්පා කරනසුලු අශ්‍රෝතා ගීතිකා.

ආධූත = 1. කම්පිත වූ. 2. ඉවත් කළ.

ආධුනික = 1. නවක. 2. ළඟදී පැමිණි. 3. අළුත්. 4. අමුතු. 5. බාල. 6. අළුත් ගෝල.

ආධුනිකතාව = 1. අළුත් කම.

ආධෘෂ්‍ය = 1. ගැටිය යුතු. 2. පහර දියයුතු.

ආධේය = 1. පිහිටි 2. අඩංගු.

ආධෙය්‍ය = 1. අයත්. 2. දැරියයුතු. 3. තැන්පත් කළ යුතු.

ආප = 1. ජලය. 2. වතුර.

ආපක්ව = 1. භාගයක් පැසුණු.

ආපගා = 1. නදිය; ගඟ. 2. ඔය

ආපණ = (ආපණික) 1. වෙළෙඳ. (වෙළෙඳම්) 2. කඩය.

ආපණය = 1. ආපණ ශාලාව. 2. සාප්පුව. 3. කඩය.

ආපණිකයා = 1. වෙළෙන්දා. 2. කඩකාරයා.

ආපතන = 1. වැටීම.

ආපතන්ත = 1. වැටෙන. 2. වැටෙමින්.

ආපත්තිය = 1. ආපදාව. 2. විපත. 3. පැමිණීම. 4. ඇවැත. 5. දෝෂය.

ආපත්ති දේශනා = 1. ඇවැත් දෙසීම. (උප සම්පන්න භික්ෂු නමක් දේසනා ගාමිනී ආපත්තියකට පැමිණි විට ඒ බව අනෙක් උපසම්පන්න භික්ෂු නමකට සැළ කර නැවත එබන්දකට නො පැමිණෙන බවට පොරොන්දු වීම)

ආපත්ප්‍රාප්ත = 1. විපතට පැමිණි.

ආපද් = (ආපද) 1. විපත. 2. අනතුර.

ආපන්න = 1. පැමිණි. 2. විපතට පත්. 3. ඇතුලට වැදුණු.

ආපන්නසත්ත්වා = 1. දරු ගැබ් ඇත්තී.

ආපරාහ්නික = 1. අපරාහ්නයෙහි. (පස්වරුවෙහි)

ආපලාපක = 1. ශරීරයෙහි මර්මයක්.

ආපස් = 1. වතුර. 2. ජලය.

ආපසු = 1. ආපහු. 2. පෙරළා. (පසු පසට හැරීම)

ආපසු එනවා = 1. ආපහු එනවා. 2. පෙරළා ගමන් කරනවා.

ආපසු මඳු = 1. එනම් බෙහෙත් පැළෑටි වර්ගය.

ආප්ත = 1. සුදුසු. 2. ලබාගත්. 3. වැඩි හිටි. 4. දැනුමැති. 5. දක්ෂ. 6. විශ්වාස. 7. සත්‍ය වාදී. 8. පිළිගත්.

ආප්ත උක්ති = 1. ආප්තයන්ගේ කීම. 2. ඒත්තු ගන්නා ලද කියමන. 3. තර්කානුකූලව ගෙනහැර දක්වන කාරණය.

ආප්ත උපදේශ = 1. සුදුසු අවවාද. 2. පිළිගත් උපදෙස්.

ආප්තයා = 1. පැරණියා. 2. දැනුමැත්තා.

ආප්ප = 1. පිටි - පැණි ආදිය මුසු කොට සාදන කැවිලි වෙසෙසක්.

ආප්‍ය = 1. දිය. 2. දියාරු. 3. දිය පිළිබඳ. 4. පැමිණිය හැකි හෝ යුතු. 5. ලැබිය හැකි හෝ යුතු.

ආප්‍යායන = (ආප්‍යායිත) 1. සතුටු වූ. 2. තෘප්තිමත්.

ආප්‍යායනය = 1. ලැබී ඇතිවූ බව. 2. වැඩි බව.

ආප්ලවය = 1. නෑම. 2. පාවීම.

ආපාකය = 1. කුඹල් උදුන.

ආපාතය = 1. හදිසියෙන් වැටීම. 2. බිම හෙළීම. 3. මොහොත. 4 මාර්ගය.

ආපාතගත = 1. ඉදිරියට පැමිණි.

ආපාථ = 1. මාර්ගය 2. ගොදුර. 3. ඉදිරිය.

ආපාණ = 1. ප්‍රශ්වාසය. (පිටකරන හුස්ම)

ආපාණ කෝටික = 1. ජීවිතය කෙළවර කොට ඇති.

ආපාදක = 1. පෝෂ්‍යය කරන්නා. 2. ඇති දැඩි කරන්නා.

ආපදුව = 1. විපත. 2. දුක. 3. අනතුර.

ආපාදය = 1. කැම කැවීම. 2. පෝෂ්‍යය කිරීම. 3. රක්‍ෂා කිරීම.

ආපාන = (ආපාන ශාලාව) 1. සුරා සැල; තැබෑරුම.

ආපායික = 1. අපායෙහි වූ. 2. අපායට නියම වූ.

ආපීඩ = 1. මුදුන් මල්කඩ.

ආපීත = 1. පානය කළ. 2. ටිකක් බීවා වූ.

ආපීන = 1. තර. 2. පිරුණු.

ආපුච්ඡන = 1. පිළිවිසීම. 2. ප්‍රශ්න කිරීම. 3. සුව දුක් විමසීම.

ආපුච්ඡිත = 1. විචාරණ ලද.

ආපූරණ = 1. පිරීම. 2. වැඩීම.

ආපූරිත = 1. පිරවූ.

ආපෝකසිණය = 1. ජල ධාතුව ගැන සිත යොමු කර භාවනා කිරීම.

ආපෝධාතුව = 1. ජල ධාතුව.

ආබද්ධ = 1. බැඳුණු. 2 එකට බැඳුණු. 3. සම්බන්ධ.

ආබරණය = 1. පළඳනාව. 2. ආයිත්තම.

ආබරණ පට්ටල = 1. රජ වාසලට අබරණ සැදූ කම්හල.

ආබන්ධන = 1. බැඳීම. 2. සම්බන්ධය.

ආබාණිකම = 1. මසුරුකම; ලෝබකම.

ආබාධ = 1. අසනීපය. 2. රෝගය.

ආබාධක = 1. පීඩා කරන. 2. රෝගාතුර.

ආඹිලික = 1. ඇඹුල්කම.

ආහත = 1. ගෙනෙන ලද.

ආභරණය = (අබරණය බලන්න)

ආභා = 1. ආලෝකය. 2. එළිය. 3. කාන්තිය.

ආභාස්සර = 1. බ්‍රහ්ම ලෝකයක්. (ආභස්සරය) 2. බබළන සුළු.

ආභාකර = 1. එළිය ඇති කරන්නා. 2. සූර්යයා.

ආභාභාසුර = 1. කාන්තියෙන් බබළන.

ආභාෂණ = 1. ඔවුනොවුන් කථා කිරීම. 2. ආමන්ත්‍රණය කිරීම. 3. ආලාපය.

ආභාෂය = 1. ගැඳිත්වීම. 2. පටන් ගැන්ම. 3. ආරම්භය.

ආභාෂිත = 1. ඉදිරිපත් කොට කියන ලද.

ආභාසය = 1. කාන්තිය. 2 ශෝභාව. 3. ප්‍රති-බිම්බය. 4. ආලෝකය. 5. ඡායාව 6. වැරදි වැටහීම. 7. අදහස. 8. ග්‍රන්ථ සඥපනය.

ආභිඥෙයික 1. පෙරදින භවයට අයත්.

ආභිධම්මික = 1. අභිධර්මයට අයිති. 2. අභිධර්මය පිළිබඳ. 3. අභිධර්මය දරන්නා.

ආභිමුඛ්‍ය = 1 අභිමුඛය. 2. ඉදිරිපිට.

ආභිසමාචාරික = 1. උසස් හැසිරීමට අයත්. 2. එක්ව හැසිරෙමින් මෙහෙකරන්නා.

ආභිෂෙකික = 1. අභිෂේකයට අයත්.

ආභිරයා = 1. ගෝපාලයා.

ආභුක්ත = 1. නැමුණු 2. වකුටුවූ.

අභුජන = 1. හැකිළීම. 2. නැමීම. 3. දරණ ගැසීම.

ආභුජිකා = 1. හැකිළී 2. දරණ ගසාගෙන.

ආභෝග = 1. සිතා බැලීම. 2. චේතනාව. 3. සම්පූර්ණකිරීම. 4. වෑයම. 5. නයිපෙණය. 6 භුක්තිය. 7. පැහිරීම.

ආම = 1. අමු. 2 අජීර්ණ. 3. නොපැසුණු ආහාර රසය. 4. රෝගය.

ආමඅජීර්ණ = 1. ආහාර නොදිරීමෙන් වන අජීර්ණය

ආමඅතීසාරය = 1. අතීසාර විශේෂයක්.

ආමආශය = (ආමාශය) 1. බඩේ අමු අහර තිබෙන බොක්ක.

ආමස්ථ = 1. ආමාශයෙහි වූ.

ආමක = 1. නොපිසූ. 2. නොමේරූ.

ආමකසුසානය = 1. අමු සොහොන.

ආමගන්ධ = 1. පිළීගඳ. 2. මස්මාලු. 3. දුගඳ.

ආමජාත = (ආමාජාත) 1. දාසයා.

ආමජ්වරය = 1. අජීර්ණ උණය.

ආමන්ත්‍රණ = 1. කැඳවීම. 2. අඬගැසීම.

ආමන්ත්‍රිත = 1. කැඳවන ලද

ආමඵලාම්ල = 1. අමු ගෙඩිවල ඇඹුල.

ආමන්ත්‍රණවිභක්තිය = 1. ඇලපත විභක්තිය.

ආමය = 1. අමු. 2. අජීර්ණය. 3. දුගඳ.

ආමරක්තය = 1. අතිසාරය.

ආමරණාන්තික = 1. මරණය දක්වා පවතින.

ආමරෝගය = 1. අජීර්ණ රෝගය.

ආමර්ෂණ = 1. ස්පර්ශ කිරීම. 2. අත පත ගෑම.

ආමර්ෂ = 1. ක්‍රෝධවූ. 2. කෝප වූ.

ආමලක = (ආමලකී) 1. නෙල්ලි ගෙඩිය.

ආමලකී මුතු = 1. නෙල්ලි ගෙඩි වැනි මුතු.

ආමවාතය = 1. අජීර්ණ වාතය.

ආමසන = 1. ස්පර්ශ කිරීම. 2. අතපත ගෑම.

ආමශූලය = 1. අජීර්ණ වාතයෙන් ඇතිවන බඩේ කැක්කුම.

ආම්බන් කරනවා = 1. හම්බන් කරනවා. 2. හිලෑකරනවා. 3. පුරුදු කරනවා. 4. මේච්චල් කරනවා.

ආම්ලය = (ආම්ලික) 1. ඇඹුල්කම.

ආම්ලා = (ආම්ලිකා) 1. සියඹලා.

ආමා = 1. කිරි අම්මා. 2. ආමන්ත්‍රණය කොට. 3. උදෙසා.

ආමාස = 1. ආමර්ෂණය කට හැකි.

ආමාශයිකව = 1. ගුරුවරී.

ආමාශය = 1. කෑම බොක්ක.

ආමාශයදාහය = 1. බඩදැවිල්ල.

ආමාශයික = 1. බඩට අයිති වූ.

ආමිෂ = 1. පරිභෝග කටයුතු දෙය. 2. පස්වා කාම වස්තු. 3. සිවුපසය 4. කෑම. 5 මස්. 6. ලාභ. 7. භුක්තිය. 8. අල්ලස 9. ඇම.

ආමිෂ ගරුක = 1. ආමිසයම ගරුකොට සලකන. 2. සිවුපසයටම ගරුකොට වසන.

ආමිෂදාන = 1. ආහාර ආදිය දන්දීම.

ආමිෂපටිසන්ථාර = 1. සිවුපසයෙන් සත්කාර ලැබීම.

ආමිෂසන්නිධි = 1. පසු දවසෙහි ප්‍රයෝජනය සඳහා ආහාර තැන්පත් කොට තැබීම.

ආළිඹය = 1. පෙරවදන; ප්‍රස්තාවනාව.

ආමුක්ත = 1. (රෙදි) අඳින ලද. 2. සත්තඩ. 3. විසිකර ගසන ලද. 4. පැලඳගත්.

ආමුක්ත ශඞ්ඛ සූත්‍ර = 1. බැඳි පූත නූල ඇති.

ආමුඛ = 1. පටන් ගැන්ම. 2. හැඳින්වීම. 3 ආරම්භය. 4. ප්‍රස්තාවනාව. 5. ප්‍රාරම්භ කථාව.

ආමුෂ්මික = 1. පරලොවට අයිති. 2. පර-ලෙව්හි වූ.

ආමූලාග්‍ර = 1. මුල සිට අග තෙක්.

ආමෘෂ්ට = 1. ආමර්ශණය කළ.

ආමෙෂ්ඩිත = 1. එක් වචනය දෙතුන් වරක් කීම.

ආමෝද = 1. සුවඳ. 1. සතුට.

ආමෝදන = 1. සතුටුවීම.

ආමෝදිත = 1. සතුටු කළ 2. සුවඳ කැවූ.

ආම්නාය = 1. ආගමය. 2. අභ්‍යාසය. 3. වංශය. 4. ගුරු පරපුරින් එන සදුපදෙශය.

ආම්පන්න = (අම්පත්ත) 1. ආඩ පත්ත. 2. උපකරණ. මෙවලම්.

ආම්‍ර = 1. අඹ.

ආම්‍රෙඩිතය = 1. එක් වචනය දෙතුන් වරක් කීම. 2. නැවත නැවත කීම.

ආය = 1. ඉපදීම. 2. ආදායම. 3. ඇතුලට ඒම. 4. අභිවෘද්ධිය. 5. ජන්ම පත්‍රයේ එකොළොස් වැනි ස්ථානය

ආය කම්මික = 1. ආදායම එකතු කරන්නා. 2. අය කැමියා.

ආය කොසල්ල = (ආය කෞශල්‍ය) 1. අභි-වෘද්ධියෙහි දක්ෂ බව. 2 ආදායම් ඉපදවීමේ දක්ෂ බව.

ආයත = 1. දික් වූ; දිගටි 2. දිග පැතිර.

ආයත ක්ලේශ = 1. බොහෝ කල් පවත්නා පීඩා හෝ එය ඇති.

ආයත චතුරශ්‍රය = 1. හරි මූලු ඇති පැති එක හා සමාන නූවූ හතරැස් කොටුව.

ආයත්ත = 1. හිලෑ වූ 2. යටත් වූ 3. අයිති වූ.

ආයතන = 1. උත්පත්ති ස්ථානය. 2. වාසස්ථා-නය 3. රැස්වන තැන. 4. කාරණය. 5. ඇස ආදි ඉන්ද්‍රියය. 6. හේතුව. 7. පූජාස්ථානය.

ආයත තුල්‍ය චතුරශ්‍රය = 1. එක හා සමාන පැති ඇති වූ මුලු හරි මුලු හතරැස් කොටුව.

ආයත පණ්හි = පරිපූර්ණ දික් විළුම් ඇති.

ආය තැන් = 1. විහාරස්ථාන 2. විහාරස්ථාන වල ප්‍රධානීහු. 3. ප්‍රධාන විහාරවලට අයිති ගම්.

ආයති = 1. අනාගතය. 2. දීඝී බව. 3. නැවැත්වීම. 4. උසස් බව.

ආයතික = 1. මතු කාලයට අයත්.

ආයතිකා = 1. ජල නළය. 2. පීල්ල.

ආයති කාල = 1. අනාගත කාලය.

ආයති භව = 1. අනාගත උත්පත්තිය.

ආයම = 1. ලුණු බද්ද.

ආයම්පළ = 1. ලුණු බද්ද අයකරන තැන.

ආයමුඛ = 1. ආදායම් උපදින මාගී

ආය ව්‍යය = 1. අය වැය.

ආයස = 1. යකඩින් කළ.

ආයස්ත = 1. කිලුටු කරන ලද. 2. විනාශ කරන ලද. 3. මුවාන කරන ලද. 4. ඉවත දමන ලද. 5. කෙළහන ලද.

ආයා = 1. රජාවිට ළමයකු රැක බලා ගන්නා තැනැත්තී. 2. කුල කාන්තාවන් ගේ මෙහෙකාරිය.

ආයාග = 1. පරිත්‍යාගය. 2. දීම.

ආයාචක = 1. ඉල්වන්නා. 2. ඉල්ලුම් කාරයා.

ආයාචන = 1. ඉල්ලීම. 2. අයැදීම.

ආයාචිකා = 1. ඉල්වන්නී.

ආයාචිත = 1. ඉල්ලූ. 2. ඉල්ලූ දෙය. 3. යාච්ඤා කරන ලද.

ආයාත = 1. පැමිණී. 2. ආවා වූ

ආයාමය = 1. දිග. 2. ප්‍රමාණය. 3. මැඩ-පැවැත්වීම. 4. මඳක් නැවැත්වීම.

ආයාසය = 1. පරිශ්‍රමය. 2. වෙහෙස. 3. මහන්සිය. 3. කරදරය. 5. විඩාව. 6 අධික උත්සාහය.

ආයි= 1. ආදි. 2. නැවත.

ආයිබෝන් = (ආයුබෝවන් බලන්න.)

ආයික්කම් = 1. සැරසිල්ල. 2. වස්ත්‍රාභරණ. 3. පලඳනා.

ආයික්කා = 1. (කළුකට හබලන) කුරුල්ලෙක්.

ආයිමත් = (ආයෙම්මත්) 1. නැවතත්. 2. ආයෙත්.

ආයු = 1. ආයුෂ. 2. වයස.

ආයුක්ත = 1. නියුක්තව සිටින. 2. යෙදී සිටින.

ආයුක = 1. වයස් ඇති.

ආයුකප්ප = (ආයු කල්ප) 1. ආයුෂ ප්‍රමාණය. 2. පරමායුෂ.

ආයුක්ඛය = 1. ආයුෂ ගෙවීයාම.

ආයුක්ත = 1. යෙදුණු. 2. සම්බන්ධ කළ.

ආයුක්තක = 1. අනිකකු වෙනුවෙන් පෙනී සිටින්නා. 2. නියෝජිතයා.

ආයුද = (ආයුධ) 1. ආවුද. 2. උපකරණ. 3. කඩු - දුනු ආදිය.

ආයුධ සණ සෙඩීම = 1. ආයුධ මුවහත් තැබීමේ ක්‍රමයක්.

ආයුධාගාරය = 1. යුධ ආයුධ තබන ස්ථානය.

ආයුධිකයා = 1. හේවායා.

ආයු බල = 1. ආයුෂ බලය. 2. බොහෝ කල් ජීවත්වීමේ වාසනා ශක්තිය.

ආයුබෝවන් = (ආ ඉබෝවන්) 1. බොහෝ කාලයක් ජීවත් වේවා; සැරද.

ආයුබේද = 1. ආයුර්වේදය.

ආයුව = 1. ජීවිතය. 2. ජීවිත කාලය. 3. හුළඟ.

ආයු වළඳනවා = 1. අයුෂ ලබනවා. (ජීවමානව සිටිනවා) 2. ජීවත් ව සිටිනවා.

ආයු සංස්කාරය = 1. ජීවිතයේ වයස කාලය. 2. ආයුෂය පැවැත්මට ඇති ශක්තිය. 3. ජීවන ශක්තිය.

ආයුසංවත්තනික = 1. ආයුෂ පිණිස පවතින. 2. ආයු වැඩි වීමට හේතුවන

ආයුසය = 1. වයස.

ආයුස් කල්පය = 1. ජීවිත කාලය.

ආයුශ්ශ්‍රීය = 1. ආයුෂ නමැති සම්පත.

ආයුඃ ක්ෂය = 1 ආයුෂ ගෙවී යෑම. 2. ජීවිත කාලය ගෙවී යෑම.

ආයූහනය = 1. රැස් කිරීම. 2. උත්සාහ කිරීම. 3. පිනීම. 4. කල්පනා කිරීම.

ආයූහිත = 1. රැස්කළ; උත්සාහ කළ.

ආයෙත් = (ආයෙම- ආයේ-ආයෙම්මත්-ආයිත්) 1. යළිත්; නැවතත්. 2. තවත් වරක්.

ආයෝග = 1 යෙදීම. 2. උත්සාහය. 3. නැවත-නැවත යෙදීම. 4. පිළිපැදීම. 5. උරහිසේ යමක් එල්ලීමට යොදන පටිය.

ආයෝජන = 1. යෙදීම. 2. උත්සාහය. 3. රැස් කිරීම. 4. ගෙන ඒම.

ආයෝධන = 1. යුද්ධය. 2. යුධ භූමිය.

ආර = 1. ඔය. 2. නියර. 3. ඉදිකටුව. 4. ආකරය. 5. ආකාරය. 6. සැත්කම් සඳහා ගන්නා අවියක්. 7. කොන. 8. වේගය. 9. පරම්පරාව. 10. අභගරුවා. 11. මිලල්-කඳ.

ආර අග්‍ර = 1. ඉදි කටු අග.

ආර කුක්කා = 1. සපීයෙක්.

ආර කූට = (ආර කූටක) 1. පිත්තල.

ආරක්ඛක = 1. ආරක්ෂා කරන්නා. 2. රකින්නා.

ආරක්ඛාව=1. රැකීම. 2. රැකවල. 3. පරෙස්සම. 4. අනතුරෙන් බේරීම.

ආරක්ඛිත = 1. ආරක්ෂා කරන ලද.

ආරක්ඛය = 1. පරෙස්සම්වීම. 2. අලියාගේ හිස මුදුන්හි වල. 3. ඇතා ගේ මතුපිට හම.

ආරග්වධ = 1. ඇහැල ගස.

ආරච්චි = (ආරච්චිල - ආරච්චි රාල) 1. ගම්-මුලාදෑනියෙක්. 2. කාර්‍යාල සේවකයෙක්.

ආරච්චි වසම = 1. ආරච්චි ගේ රාජ කාර්‍යයට අයත් ප්‍රදේශය.

ආරංචිය = 1. ප්‍රවෘත්තිය. 2. (දන්වන) තොරතුර 3. සෙවීම. 4. හෝඩුවාව.

ආරඤ්ඤක = 1. වනයෙහි උපන්. 2. වනයෙහි වසන.

ආරඤ්ඤකත්ත = 1. වනයෙහි වසන බව.

ආරත = 1. වෙන්වූ. 2. ඉවත්වූ.

ආරනවා = 1. මහත් වෙනවා; තර වෙනවා 2. මෝරනවා.

ආරනුල් = 1. මැණික් වෙසෙසක්.

ආරණිය = 1. සුළිය.

ආරණ්‍යය = 1. වනාන්තරය. 2. කැලෑව 3. මුකලාන.

ආරණ්‍යක = 1. වනවාසියා; වෙනෙහි වසන්නා.

ආරණ්‍යකාංගය = 1. වනගත සේනාසනයන්හි විසීම නමැති ධූතාංගය.

ආරණ්‍යජ = 1. වනයේ උපන්. 2. වනයේ හටගත්. 3. වනචර.

ආරණ්‍යරාශිය = 1. සිංහ රාශිය.

ආරතිය = 1. නැවතීම. 2. වෙන්වීම. 3. ඉවත්වීම.

ආරපථ = 1. ඉදිකටු පාර.

ආර බාර වෙනවා = 1. බාරභාර වෙනවා. 2. (දෙවියන්ට) භාර වෙනවා. 3. පොරොන්දු වෙනවා.

ආරබ්ධ = 1. පටන්ගත්. 2. ආරම්භ කළ. 3. සම්පූර්ණ බව

ආරභටය = 1. උත්සාහය. 2. බුහුටිකම.

ආරම්භය = 1. පටන්ගැන්ම. 2. ප්‍රාරම්භය.

ආරම්භක = 1. පටන් ගැන්මට අයිති. 2. මුල්වූ.

ආරම්භධාතු = 1. මුල්ධාතුව. 2. ප්‍රථම වීර්‍යය.

ආරම්භවත්ථු = 1. වීර්‍යාරම්භයට හේතුවන කරුණු.

ආරමණය = 1. ප්‍රීතිවීම. 2. නැවතීම. 3. නැවතුම් පළ.

ආරම්මණය = 1. අරමුණ. 2. අදහස් කරනදේ. 3. සිත පිහිටීමට උපකාරවන රූප-ශබ්ද ආදිය.

4. නියර. 5. ඉදිකටුව.

ආරලියා = 1. එනම් මල්ගස.

ආරව = 1. නාදය.

ආරස්සා = 1. ආරක්ෂාව.

ආරවුල = 1. සංඩුව. 2. අරෝව. 3. පැටලිල්ල.

ආරස්‍ය = 1. රස නැති බව. 2. කිවුල් රස.

ආර්ක්ෂශ = 1. තරුව.

ආර්ජව = 1. ඍජු බව. 2. කෙළින්. 3. අවංක.

ආර්ත = 1. පීඩිත. 2. දුඃඛිත.

ආර්තස්වර = 1. බැගෑපත් හඬ.

ආර්තව = 1. ඍතුවෙහි වූ. 2. ඔසප් ලේ.

ආර්තව = 1. ඍතු ඇති බව. 2. මල්වරය

ආර්ය = 1. බුදුන් වහන්සේ. 2. සෝවාන් ආදි මාර්ග ඵලයන්ට පැමිණි උතුමෝ. 3. උතුම්. 4. ආර්ය ජාතියට අයත්. 5. ස්වාමියා. 6. ගුරුවරයා. 7. උසස්. 8. පූජ්‍යයා. 9. බෞද්ධයා.

ආර්ය අෂ්ටාංගික මාර්ග = 1. බුද්ධාදි ආර්යයන්ට අයත් සම්‍යක් දෘෂ්ටි - සම්‍යක් සංකල්පනා ආදි අංග අටක් ඇති මාර්ගය.

ආර්ය ඊර්යාපථ = 1. ආර්යයන් ගේ ඉරියව්ව. 2. බ්‍රහ්ම විහාරයන්ගෙන් යුක්තව විසීම.

ආර්ය උපවාද = 1. ආර්යයන්ට ආක්‍රෝශ පරිභව බිණීම.

ආර්ය ගණය = 1. උත්තම සමූහය.

ආර්ය ගමක = 1. ආර්ය මාර්ගය.

ආර්ය ගීති = 1. සංගීත තාලයක්. 2. වෘත්තයක්.

ආර්ය ජන = 1. බෞද්ධ ජනයා

ආර්ය ධන = 1. ශ්‍රද්ධාදි ආර්ය ධනය.

ආර්ය ධර්ම = 1. ශ්‍රේෂ්ඨ ධර්මය.

ආර්ය පුද්ගල=1. සෝවාන් ආදි මාර්ග ඵලයන්ට පැමිණි පුද්ගලයා.

ආර්ය රත්න = 1. සෘෂියා. 2. රහතුන් වහන්සේ.

ආර්ය විහාර = 1. උත්තම වාසය. 2. සතර බ්‍රහ්ම විහරණ.

ආර්ය වර්තය = 1. උත්තමයන් ජීවත්වන ස්ථානය.

ආර්ය වංශය = ආර්ය පරම්පරාව.

ආර්ය ශ්‍රාවක = 1. මාර්ග ඵල ප්‍රාප්ත බුද්ධ ශ්‍රාවකයා.

ආර්ය සත්‍යය = 1. උසස් සත්‍යය,

ආර්යා = 1. උත්තම ස්ත්‍රී. 2. "නයිට්" යන ගරු නාමය ලත් උත්තමයෙකුගේ භාර්යාව හෝ "ලේඩි" යන ගරු නාමය ලත් කාන්තාව.

ආර දූල් = 1. ගොප් රුනැන් ආදිය යොදා සාදන දූල් වෙසෙසක්.

ආරනවා = 1. මහත් වෙනවා; පුෂ්ටිමත් වෙනවා.

ආරා = 1. විදින කටුව. 2. බුරුම කටුව. 3. දුරින්. 4. දුරෙහි වූ.

ආරාචාරය = 1. සුචරිත කම.

ආරාචාරී = 1. දුරින් හැසිරෙන්නා.

ආරාති සේනා = 1. සතුරු සමූහය.

ආරාධක = 1. සිත් ගන්නා. 2. සතුටු කරවන. 3. ආරාධනා කරන.

ආරාධනා = 1. කැඳවීම. 2. සිත් ගැනීම; ඉල්ලීම

ආරාධනා ගල = 1. සුමන සාමණේරයන් වහන්සේ ධර්මශ්‍රවණය පිණිස එන ලෙස දෙවියන්ට ආරාධනය කිරීමට නැගුණු ගල.

ආරාධනීය = 1. ආරාධනා කටයුතු. 2. ලබා ගත යුතු. 3. සිත් ගත යුතු.

ආරාධිත = 1. සිත් ගත්. 2. සතුටු කළ. 3. ආරාධනා ලැබූ.

ආරාම = 1. මල් හෝ පලතුරු වත්ත. 2. විහාරය. 3. වනය.

ආරාම දූෂක = අරම් දූෂණය කරන්නා.

ආරාම පාල = 1. ආරාමය රකින්නා.

ආරාමික = 1. ආරාමයෙහි (මැඩ සඳහා) නියුක්ත අය.

ආරාලික = 1. අරක්කැමියා.

ආරිය = 1. ආර්යය. 2. උතුම්.

ආරුක්කු = (ආරික්කු) 1. අඩි කවාකාරව උණ ලී ආදියෙන් කරන සැරසිල්ල.

ආරුනූල් = 1. ඇතුළතින් රේඛා සයක් මෙන් කාන්තිය විහිදෙන මැණික් වෙසෙසක්.

ආරූඪ = 1. නැගුණු.

ආවර් = 1. වර්ගය. 2. පවුල. 3. පරම්පරාව.

ආරේවත = 1. ඇසල ගස.

ආරෝග්‍ය = 1. නීරෝගී. 2. ලෙඩ නැති,

ආරෝග්‍යතා = 1. නීරෝගී බව.

ආරෝග්‍ය මද = 1. නිරෝගී බව නිසා උපදනා මානය හෙවත් දර්පය.

ආරෝග්‍ය ශාලා = 1. ගිලන් හල 2. ඉස්පිරිතාලය.

ආරෝග්‍ය සම්පත්ති = 1. ආරෝග්‍යය නමැති සම්පත.

ආරෝචනය = 1. දැනුම් දීම. 2. හැළකිරීම. 3. ප්‍රකාශ කිරීම.

ආරෝදන = 1. හැඬීම.

ආරෝධන = 1. (හුස්ම) අවුරන්නා වූ.

ආරෝපණය = 1. හිටවීම. 2. පිහිටුවීම. 3. නැංවීම. 4. තැබීම. 5. පැවරීම. 6. උඩ තැබීම.

ආරෝපිත = 1. නැංවූ. 2. උඩ තැබූ. 3. හිටවන ලද. 4. පවරන ලද.

ආරෝහ = 1. නැගීම. 2. උස. 3. වැඩීම. 4. ආරෝහකයා.

ආරෝහක = 1. නගින්නා. 2. (අශ්ව ආදි පිට) නැග යන්නා.

ආරෝහණ = 1. නැගීම. 2. ඉහළ යාම. 3. ඉණිමඟ. 4. පඩි පෙළ.

ආරෝහ පරිණාහ = 1. උස මහත. 2. ශරීරයේ ලස්සන. (නිසි උස සහ මහත)

ආරෝහය = 1. උඩ නැගීම. 2. සතුන් පිට යාම. 3. කන්ද. 4. උඩහු කම. 5. කාන්තාවකගේ උකුල. 6. දිග.

ආල = (ආලය) 1. නිවාසය. 2. ප්‍රේමය.

ආල කමන්දුව = 1. වෙසවුණුගේ රාජධානිය

ආලඞ්කාරික = 1. අලඞ්කාර දන්නා.

ආලක්ෂිත = 1. දුටු 2. මඳක් දක්නා ලද.

ආලක්ෂ්‍ය = 1. මඳක් දක්ක හැකි.

ආලංගා = 1. මල් වර්ගයක්. 2. කැවිලි වර්ගයක්.

ආලග්න = 1. ඇලුණු. 2. ගිලුණු. 3. එරුණු.

ආලත්ති = 1. රජු යන විට දෙපස සිට සතුන් කියන ආශීර්වාද. 2. පූජාව. 3. මංගල්‍යය. 4. ආගන්තුක සත්කාරය. 5. රජුගේ උපස්ථායකයා. 6. පෙරහැරවල උතුමන් ඉදිරියෙහි ආශීර්වාදාත්මකව වැනූ තෙල් පහන් - කහදිය - කසාවත් අහර පිඬු යන ද්‍රව්‍ය.

ආලත්ති අම්මා = 1. රජු යන විට ආශීර්වාද කරන ස්ත්‍රිහු

ආලත්ති බැම් = 1. දෙවොල් දොරටුවල ස්ත්‍රීන් සිට නෙත තෙල් පහන් වනමින් 'ආයුබෝවේවා' යි කියමින් කරන පූජාව.

ආලපන = 1. ඇමතීම. 2. ආමන්ත්‍රණය.

ආලපන විභක්තිය = 1. ආමන්ත්‍රණය සඳහා යොදන විභක්තිය.

ආලපනා = 1. නැවත නැවත කථා කිරීම.

ආලසන්න = 1. අඩු වැඩිය. 2. මෙවලම්. 3. උපකරණ.

ආලම්බ = 1. එල්ලීම. 2. පිහිට. 3. අරමුණ. 4. එල්ලීමට උපකාර වන දෙය.

ආලම්බන = 1. එල්ලීම. 2. පිහිට. 3. අරමුණ (ආරම්මණය.)

ආලම්බනය = 1. ලඹ කැටේ.

ආලම්බන ඵලක = ගේත්තුවෙන ලෑල්ල.

ආලම්බන මන්ත්‍ර = 1. සර්පයන් ඇල්ලීම සඳහා ජප කරන මන්ත්‍ර.

ආලම්බර = 1. ගැට බෙරය. 2. හැරසීම.

ආලය = 1. ආදරය. 2. ප්‍රේමය. 3. ගෙය. 4 ආශාව. 5. ලෝභය. 6. සෙනහය.

ආලවක = 1. බලවත් යක්ෂයෙක්.

ආලවට්ටම් = 1. කෞරව වංශිකයන්ගේ අවමඟුල් පෙරහැර ආදියෙහි ගෙන යන උපකරණ විශේෂයක්.

ආලපිනී = 1. තුරඞ්ග භාණ්ඩයක්. 2. වීණා විශේෂයක්.

ආලවාලය = 1. තෝ කැත්ත. 2. පාත්තිය. 3. ගස් වැල් ආදිය අවට දිය නවතිනු සඳහා කළ කානුව.

ආලසිය = 1. අලස බව.

ආලස්‍ය = 1. අලස භාවය. 2. අලසක නම් විසූචිකා රෝගය.

ආලාන = 1. ගව ආදි සතුන් බැඳ තබන කණුව. 2. ඇතුන් බඳින ටැඹ.

ආලාප = 1. කථාව. 2. වචනය. 3. කීම.

ආලාපනය = 1. පළමු කරන කථාව 2. සමගි කථාව.

ආලාපාලු කරනවා = 1. වයසනවා. 2. පාලු-කරනවා.

ආලාබු = 1. ලබු වර්ගයක්.

ආලාරිකයා = 1. කෝකියා (අරක්කැමියා)

ආලම්බනීය = 1. රෙදිවලින් තැනූ අවාන.

ආලාහනය = 1. සොහොන

ආලි = 1. නියර. 2. වැව් බැම්ම 3 මී මැස්සා 3. පෙළ 4. සන්තතිය. 5. මිතුරී.

ආලිඞ්ග = මිහිගුබෙර වෙසෙසක්.

ආලිඞ්ගන නැටුම් = 1. ස්ත්‍රී පුරුෂයන් වැළඳ ගෙන කරන නැටුම.

ආලිඞ්ගනය = 1. වැළඳ ගැනීම.

ආලින්දය = 1. පිල. 2. ඉස්තෝප්පුව. 3. පිට බරාඳය.

ආලිප්ත = 1. ආලේප කරන ලද. 2. ගාන ලද. 3. ගිනි දල් වූ.

ආලිප්පලවනි = 1. පුරාණ වස්ත්‍ර වර්ගයක්.

ආලිම්පන = 1. ගෑම. 2. තැවරීම. 3. ගිනි තැබීම.

ආලිය = 1. නියර. 2. පෙළ. 3. මිතුරී.

ආලිස්සම් = 1. අනාදර කිරීම. 2. කම්මැලි. 3. අගෞරව සහිත. 4. මධ්‍යස්ථ. 5. විහිළු-තහළු. 6. ආඩම්බර සහිත.

ආලු = 1. අල.

ආලුම්පකාර = 1. ගුළි ගැසීම. 2. කබා වෙන් කිරීම.

ආලුළිත = 1. කලඹන ලද. 2. අවුල් කළ.

ආලෙස්සම් = 1. ආලිස්සම. 2. නො සැලකිල්ල. 3. කම්මැලි.

ආලේ = 1. කැමැත්ත. 2. ආශාව. 3. ඇල්ම.

ආලේප = 1. ගෑම. 2. තැවරීම.

ආලේපන = 1. ගෑම. 2. ගෑ යුතු දෙය.

ආලේඛනය=(ආලේඛ්‍යය) 1. ලිවීම 2. පින්තූර ඇඳීම. 3. සිතියම.

ආලේඛ්‍ය සම්මය = 1. සිතියම් කළ චිත්‍රය.

ආලේඛරණ = 1. සිතියම 2. පින්තූරය.

ආලෝක = 1. දැකීම. 2. එළිය 3. දීප්තිය.

ආලෝකද = 1. එළිය දෙන.

ආලෝකනය = 1. දැකීම. 2. බැලීම.

ආලෝක සන්ධි = 1. ජනේලය. 2. කවුළුව.

ආලෝකිත = 1. බලන ලද. 2 ඉදිරිය බැලීම.

ආලෝචන = 1 දැකීම 2. පරීක්ෂා කිරීම. 3 බැලීම. 4. කල්පනා කර බැලීම.

ආලෝපය = 1. අහර පිඩ. 2. එක වරකට කටට ගන්නා ආහාර ප්‍රමාණය. 3. ගුළිය. 4. කැබැල්ල. 5. වෙන්කිරීම 6. ගම් පැහැරීම. 7. කොල්ලකෑම.

ආලෝපන = 1. කොල්ල කෑම 2. උදුරා ගැනීම.

ආලෝල = 1. චඤ්චලය. 2. කැළඹීම. 3. කළ බලය.

ආලෝලන = 1. කලබල. 2. කැලඹීම.

ආවජ්ජන = 1 මෙනෙහි කිරීම. 2. සිතා බැලීම. 3. සිත අරමුණක යෙදවීම.

ආවජ්ජිත = 1. මෙනෙහි කළ. 2. සිතා බැලූ.

ආවීමංසනා = 1. විමසා බලන; විමසා බලමින්.

ආවට = 1. වැසූ. 2. කනගනම් කළ.

ආවට - ගීයාට = 1. වැනි සැලකිලි නැතිව.

ආවට්ට = 1. දිය සළාව. 2. සුළිය. 3. රවුම. 4. කැරකීම.

ආවට්ට ගඞ්ගා = 1. අනවතප්තවිල පැදකුණු කර ගලාබස්නා නදිය.

ආවට්ටන = 1. ආවර්තනය. 2. පෙරළීම. 3. ආවේශවීම. 4. වශග කිරීම.

ආවඩනවා = 1. ආයුෂ වැඩි වේවායි පතනවා. 2. "ආයුබෝවේවා"යි කියනවා.

ආවඩන මුරේ ගෑණු = 1. රජු යනවිට ආලත්ති බැම කරන ස්ත්‍රීහු.

ආවන් = 1. අනතුර.

ආවත් = 1. ආයුෂ්මත්. 2 ආපදාව. 3. උවදුර.

ආවතේව = 1. වැඩපතිවුඩ ආදිය. 2. සේවය. 3. මෙහෙය. 4. වතාවත්. 5. ඇප උපස්ථාන.

ආවරණ = 1. වැස්ම. 2. මුවාව. 3. ඇවිරීම. 4. පරෙස්සම් තැන. 5. වැළැක්ම.

ආවරණීය = 1. ආවරණ කටයුතු.

ආවරමෙවර = 1. වැඩපල 2. කටයුතු මෙහෙය.

ආවර්ජනය = (ආවර්ජනාව) 1. සිහිකිරීම. 2. කල්පනා කරබැලීම. 4. දිවැස් කීම. 3. සිත අරමුණක යෙදවීම.

ආවර්ත = 1. සුළිය. 2. පෙරළීම. 4. කරකැවීම.

ආවර්තනය = 1. කැලැත්තීම. 2. කැරකීම. 3. හැරවීම. 4. පෙරළීම

ආවර්තනමාසා = 1. හරවා ගැනීමට ඉවතල් වන මායාව.

ආවර්තනි = 1. ආවර්තනය කරන.

ආවර්තනීය = 1. කෝවය.

ආවර්තමාන = 1. කැරකැවෙන.

ආවර්හිය = 1. උදුරා දැමීම.

ආවලිය = 1. පෙළ. 2. (මුතු ආදියේ) වැල 3. සමූහය.

ආවශ්‍ය = 1. අතිශයින් වුවමනා. 2. සැලකිය යුතු. 3. වැදගත්.

ආවසථ = 1. ගෙය. 2. වාසස්ථානය. 3. තානායම.

ආවසථික = 1. අවස්ථාවට යෝග්‍ය. 2. තැනට සුදුසු.

ආවහ = 1. එළවන. 2. ගෙනදෙන. 3. පමුණුවන

ආවහන = 1. ගෙනදීම. 2. එළවීම. 3. පැමිණවීම.

ආවහනක = 1. ලබාදෙන. 2. ගෙනැවිත්දෙන. 3. උපුලන.

ආවාට = 1. වළ. 2. හිල.

ආවාපන = 1. රෙදි වියන අළුව. 2. රෙදි වියන යන්ත්‍රය.

ආවාපය = 1. වැපිරීම. 2. උදුන. 3. භාජනය. 4. පෝරණුව.

ආවාස = 1. වාසස්ථානය. 2. ගෙදර. 3. ජීවත් වන ස්ථානය. 4. විසීම. 5. භික්ෂූන් වැඩ වසන ගෙය.

ආවාසික = 1. (විහාරයක) නිත්‍යවාසි වූ. 2. ආවාසයෙහි වසන.

ආවාහ = 1. භාර්යාවක් ගෙන ඒම. 2. සරණ පවා ගැනීම.

ආවාහන = 1 භාර්යාවක් පාවාදීම. 2. ගෙන දෙන. 3. පමුණුවන.

ආවාහික = 1. ආවාහ කරන. 2. භාර්යාවක ගෙනෙනු කැමති.

ආවැඩුම = 1. දීර්ඝායුෂ ප්‍රාර්ථනා කිරීම.

ආවි = 1. ආයුෂ. 2. ඉදිරියෙහි. 3 ප්‍රකට ලෙස.

ආවිකරණ = 1. ප්‍රකට කිරීම.

ආවිඤ්ජ = 1. කලතිරීම. 2. කම්පාවුණු.

ආවිඤ්ඡන = 1. කරකැවීම. 2. ඇදීම. 3. වටේ යාම.

ආවිඤ්ඡනඡිද්ද = 1. දොරේ ඇතුල් පොල්ල ඉවත් කිරීම පිණිස දැමූ ලණුව අදින තැන.

ආවිඤ්ඡන රජ්ජු = 1. දොරෙහි අගුල අදින ලණුව.

ආවිද්ධ = 1. විදිනලද. 2. වකුටු. 3. ගැටක් කරනලද.

ආවිය = 1. වයස.

ආවිර්භවන = 1. ප්‍රකටවීම.

ආවිර්භාවන = 1. ප්‍රකට කිරීම.

ආවිර්භාවිත = 1. පහළ වූ.

ආවිල = 1. බොරවූ. 2. කැත. 3. කැළඹුණු. 4. අපිරිසිදු.

ආවිස = 1. ජීවිත කාලය. 2. වයස.

ආවිෂ්ට = 1. ඇතුළුවූ. 2. (යක්ෂාදීන්) ආවේශවූ

ආවී = 1. ආ ස්ත්‍රී.

ආවුණ = 1. අමුණන ලද. 2 වැසූ (ආවෘත)

ආවුද = (ආවුධ) 1. ආයුධ. 2. උපකරණ. 3 ශස්ත්‍රය.

ආවුණනය = 1. ඇමිණීම.

ආවෘත = 1. වැසුණු. 2. වටකරන ලද. 3. වෙළන ලද.

ආවෘතාවරණය = 1. ගෙඩියේ පතුර.

ආවෘත්ත = 1. වටකර ගිය. 2. ආපසු ගිය. 3. හැවතුණු. 4. පෙරළුණු. 5. කරකැවුණු.

ආවෘත්ත ගමන = 1. වටකර යෑම.

ආවෘත්තය = 1. වක්‍රය. 2. චක්‍රාකාර ගමන.

ආවෘත්ති = 1. කරකැවීම. 2. පෙරළීම. 3. වාරය. 4. කාව්‍යාලඞ්කාරයක්. 5. නැවත නැවත පැවැත්ම හෝ යෙදීම.

ආවේග = 1. සිතෙහි කලබලය. 2. කැළඹීම. 3. ඉක්මන්කම.

ආවේඨන = 1. වටවීම 2. වෙළීම. 3. පටලැවීම

ආවේණික = 1. ප්‍රවේණි වූ. 2. උරුම වූ. 3. පරම්පරාවෙන් පැවත එන්නාවූ. 4. විශේෂ වූ 5. හිතවත්.

ආවේණිකධර්ම = 1. බුදුන් වහන්සේට ම විශෙෂවූ ධර්ම අටළොස.

ආවෙල = 1. රළි.

ආවේලා = 1. මුදුන් මල්කඩ. 2. මාලාදාමය.

ආවෙල්ලිත = 1. කැරකී ගිය.

ආවේලි = 1. මල්දම් පැලඳගත්.

ආවේශ = 1. වැදීම. 2. පිවිසීම. 3. (යක්ෂාදීන්) වැහීම. 4. උඩඟුකම. 5. තද කෝපය.

ආවේශනය = 1. ඇතුළුවීම. 2. (යක්ෂාදීන්) ආවේශවීම. 3. වැඩ පට්ටලය. 4. ගෘහය.

ආවේෂ්ඨනය = 1. වෙළීම. 2. වට කිරීම.

ආශ = (ආශ්) 1. අහස.

ආසක්ත = 1. ඇලුණු. 2. බැඳී කටයුතු කරන. 3. ලාභවූ.

ආසඞ්කාව = 1. සැකය: 2. අනුමානකම.

ආසක්තිය = 1. ඇල්ම. 2. සංසර්ගය. 3. ලාභය. 4. ආලය.

ආසන = 1. හිඳීම. 2. හිඳගන්නා ස්ථානය. 3. කඳවුරු බැඳීම.

ආසනය = 1. පුටුව. 2. ජීවත්වන ස්ථානය.

ආසන දෙව්මැදුර = 1. මහ පල්ලිය.

ආසන කුඩුව = 1. පිරිත් මණ්ඩප මතුවෙහි (කොටසක් කරකැවෙන ලෙස) සාදනු ලබන විසිතුරු මහ ඔටුන්නක් වැනි සැරසිල්ල.

ආසන ශාලා = 1. අසුන්හල. 2. භෝජන ශාලාව. 3. අම්බලම. 4. විශ්‍රාම ශාලාව.

ආසන්දි = 1. දික් පුටුව. 2. සනීප පුටුව. 3. දික් හගලා පුටුව.

ආසන්න = 1. ළඟ. 2. අමාරු. (ආසාධ්‍ය)

ආසක්ති = 1. සංසර්ගය. 2. ලාභය.

ආසභ = 1. වෘෂභයා. 2. ශ්‍රේෂ්ඨයා. 3. ශ්‍රේෂ්ඨවූ වෘෂභයකුට අයත්.

ආසය = 1. පුටුව 2. අළු. 3. දුන්න. 4. වාසස්ථානය. 5. අභිප්‍රාය. 6. ශරීරයේ පහත කොටස.

ආසව = 1. රහමෙර. 2. සැරව. 3. පැසෙමින් තිබෙන දෙය. 4. ඖෂධ වර්ග පල්කොට සාදනු ලබන බෙහෙත් වෙසෙස. 5. කාමාදී ආශ්‍රව. 6. මල් පැණි. 7. නිර්වාණය.

ආසවක්ඛය = 1. කෙලෙසුන් නැසීම.

ආස්තරණය = 1. ඇතිරිල්ල. 2. පලස. 3. ඇතුන් පිට දමන වැස්ම.

ආස්තික = 1. පරලොව හා කර්ම විපාක ඇතැයි සලකන.

ආස්තෘත = 1. අතුරණ ලද. 2. වැසුණු.

ආස්ථා = 1. බලාපොරොත්තුව. 2. ආදරය.

ආස්ථානය = 1. සභාව. 2. විවේක ගන්නා ස්ථානය. 3. කුමාරයා.

ආස්ථාන භයින් = 1. සබ කෝලය ඇතිව. (සභාවට භයින්)

ආස්ථානභූමි = (ආස්ථාන මණ්ඩප - ආස්ථාන ශාලා) 1. රාජ සභාව. 2. රජ අමුත්තන් පිළිගන්නා ශාලාව.

ආස්ථාව = (ආස්ථා) 1 රුකුල. 2. ශ්‍රද්ධාව. 3. පිහිටීම.

ආස්ථිත = 1. නොපිහිටි.

ආස්පදය = 1. ආධාර ස්ථානය. 2. තනතුර. 3. කටයුත්ත. 4. කාරණය. 5. බලය 6. උතුම් බව.

ආස්ඵාලන = 1. සෙලවීම. 2. වැනීම.

ආස්ඵොපනය = 1. මල පැහැරීම.

ආස්ඵෝටනය = 1. පිපීම. 2. වැසීම. 3. වෙවුලුම. 4. අත්පිඩි ගැසීම. 5. පෙළීම.

ආස්ඵාලනය = 1. පැළීම. 2. අත්පිඩි ගැසීම.

ආස්ඵෝටන = 1. අත්පිඩි ගැසීම.

ආස්මි=(ආස්මෙ-ඈස්වද) 1. කැවිලි වෙසෙසක්.

ආස්‍ය = 1. මුඛය.

ආස්වාදන = (ආස්වාද) 1. රස. 2. රස විඳීම. 3. සැපය.

ආස්වාදනීය = 1. ආස්වාදනය කටයුතු.

ආස්වාදිත = 1. රස විඳින ලද.

ආස්වාස = (ආශ්වාස) 1. හුස්ම ඉහළට ගැනීම.

ආසාද = 1. ආසාව ඇති. 2. ආලය වූ.

ආසාරය = 1. කෑම. 2. තද වැස්ස. 3. ගැසීම.

ආසාළ්හ = 1. ඇසළ මාසය.

ආසී = 1. ආශිර්වාද. 2. හිත පැතුම. 3. සර්පදළය.

ආසිංසක = 1. බලාපොරොත්තු වන්නා.

ආසිංසන = 1. ආශංසනය; සුබ පැතීම.

ආසික්ත = 1. ඉසින ලද. 2. වක්කරන ලද.

ආසිඤ්චන = 1. ඉසීම. 2. වත්කිරීම.

ආසිඨ = 1. ආශිර්වාද ලත්. 2. බලාපොරොත්තු වූ.

ආසින්ත = 1. ඉසින ලද. 2. වත්කළ.

ආසියා = 1. එනම් මහා විපය.

ආසියාතික = 1. ආසියාව සම්බන්ධ. 2. ආසියාව උපන් බිම්කොට ඇති.

ආසිරි = 1. ආයුෂ හා ඓශ්වර්ය.

ආසිරිවාද = 1. ආශිර්වාදය.

ආසී = 1. සිද්ධවේවායි ප්‍රාර්ථනා කිරීම.

ආසීවාද = 1. සුබ පැතුම.

ආසිවිස = 1. සර්පයා.

ආසු = 1. වහා.

ආසේචන = 1. ඉසීම. 2. පුරුදු කිරීම. 3. ඇසුරු කිරීම. 4. සේවනය කිරීම.

ආසේවිත = 1. ආශ්‍රය කළ. 2. පුරුදු කළ. 3. නැවත නැවත කළාවූ.

ආශංකන = 1. සැක කිරීම.

ආශඞ්කාව = 1. භය. 2. සැකය. 3. ප්‍රශ්නය.

ආශංකිත = 1. සැක කරනලද.

ආශංසන = 1. සුබ පැතීම. 2. කැමැති දෙය පැතීම.

ආශංසා=1. නොලැබූ දෙයක් ලැබීමේ කැමැත්ත. 2. ඉෂ්ට වස්තුවක් බලාපොරොත්තුවීම.

ආශය = 1. යෝරුම. 2. උපකාරය. 3. නිවාසය. 4. අදහස. 5. භාජනය. 6. ඒ ඒ දෙය පවත්නා තැන.

ආශ්චර්ය = 1. හාස්කම් ඇති. 2 පුදුම. 3 අපූර්ව. 4. ස්වභාව ධර්මයට වෙනස් වූ. 5. අද්භූතය. 6. විසිතුර.

අශ්චර්යවත් = 1. පුදුම ගෙන දෙන (ආශ්චර්යමත්)

ආශ්චර්යාද්භුත = 1. පුදුමයෙන් පුදුම. 2. ඉතාමත් පුදුම.

ආශ්ලිෂ්ට = 1. ආශ්ලේෂ කළ. 2. පුරුදු.

ආශ්ලේෂණ = (ආශ්ලේෂ) 1. වැළඳ ගැනීම. 2. ඇලීම. 3. එක්සත්වීම.

ආශ්වය 1. අශව සමූහය.

ආශ්ව යුජය = (ආශ්විනය) 1. වප්මාසය.

ආශ්වත්ථ = 1. ඇසටු ගෙඩිය. 2 බෝ ගෙඩිය.

ආශ්වස්ත = 1. සැනසුණු. 2. අස්වැසුණු

ආශ්වාස = 1. හුස්ම ගැනීම.

ආශ්වාසනය = (ආශ්වාසය) 1. හුස්ම ඉහළට ගැනීම. 2. සැනසීම. 3. වැළැක්ම.

ආශ්වාස ප්‍රශ්වාස කරනවා = 1. හුස්ම ඉහළ පහළ අදිනවා.

ආශා = 1. යමක් ලබා ගැනීමේ කැමැත්ත. 2. ඇල්ම. 3. තෘෂ්ණාව. 4. දිශාව.

ආශාච්ඡේද = 1. බලාපොරොත්තු සුන් කර ගැනීම.

ආශාබන්ධය = 1. තද බලාපොරොත්තුව. 2. මකුළුදැල. 3. ආශාවෙන් ඇතිවූ බැඳීම.

ආශිත = 1. කෑවාවූ.

ආශිස් = 1. ආශංසාව. 2. අශීර්වාදය. 3. යහපත් ප්‍රාර්ථනාව.

ආශිර්වාද = 1. ශුභ ප්‍රාර්ථනා කරන වචන.

ආශ්‍රම = 1. පන්සල. 2. තාපසාරාමය. 3. අසපුව.

ආශ්‍රමපථ = 1. ආශ්‍රමයට යන මාර්ගය.

ආශ්‍රමපද = 1. අසපුව. 2. පන්සල. 3. තාපසාරාමය.

ආශ්‍රමික = 1. ආශ්‍රම සම්බන්ධ.

ආශ්‍රය = 1. භාජනය. 2. සේවනය. 3. ආවරණය 4. ආධාර ස්ථානය 5. එක්වී කටයුතු කිරීම. 6. පිහිට. 7. ගෘහය. 8. සතුරන් මැඩීම සඳහා ප්‍රබලයන් ආශ්‍රය කිරීම නමැති රාජ ගුණය.

ආශ්‍රයසම්පන්න = 1. සුදුසු ආශ්‍රයෙන් යුත්.

ආශ්‍රව = 1. කාමුක ආශා සහිත.

ආශ්‍රවක්ෂය = 1. ආශ්‍රවයන් ගෙවීම; නැතිකිරීම.

ආශ්‍රිත = 1. එක්ව කටයුතු කළ. 2. පුරුදු කළ. 2. සරණ ගිය.

ආෂාඪය = (ආෂාඪ මාසය.) 1. ඇසළ මස.

ආෂාඪාව = 1. පුවසළ. 2. උතුරු සළ.

ආස් = 1. නිපාතයකි (ආශ්චර්ය, ඛේද, දුඃඛ, පශ්චාත්තාප යන අරුත්හි.)

ආසච්ච = 1. හැපී. 2. ගැටී.

ආහච්ච පාදක = 1. විට්ටම හාරා වැද්දූපා ඇති. (ඇඳන් ආදිය.)

ආහට = 1. ගෙනෙන ලද.

ආහත = 1. ගැසූ. 2. හැපූ. 3. බෙදයටපත්. 4. (බෙර ආදිය.) තට්ටු කරන ලද. 5. තුවාල කළ.

ආහන්ති = 1 හප්පයි. 2. පහරදෙයි.

ආහනන = 1 හැප්පීම. 2. පහරදීම.

ආහරණ = 1. ගෙන ඒම. 2. පැමිණවීම. 3. අනුභවය. 4. ගැනීම. 5. අල්ලා ගැනීම.

ආහවය = 1. යාගය. 2. යුධය.

ආහවන 1. යාගකිරීම. 2. පිදීම.

ආහවනීය = 1. පිදිය යුතු.

ආහ්ලාදය = 1. ප්‍රීතිය.

ආහ්වානය = 1. කැඳවීම. 2. අඬගා කැඳවීම. 3. ඒම පිණිස අණ කොට යැවීම.

ආහාර = 1. කෑම. 2. පැවැත්මට උපකාරවන දෙය.

ආහාර ආශය = 1. ආහාර තිබෙන බොක්ක.

ආහාර ඛාද්‍යය = 1. කෑම වැලඳීම.

ආහාර ශාලාව = 1. කෑම කාමරය.

ආහාරට්ඨිතික = 1. ආහාරය නිසා ජීවත්වන.

ආහාර දායක = 1. කෑම දෙන.

ආහාර නාලය = 1. ගල නාලය. (ගෙල)

ආහාර පාන = 1. කෑම බීම.

ආහාර පූජා = 1. අහර පිදීම.

ආහාර්‍ය = 1. ගෙනෙන්නට යුතු වූ. 2. ආගන්තුකයා. 3. ගෙන යා යුතු ධනය.

ආහ්‍රියමාණ = 1. ගෙන යනු ලබන.

ආහිත = 1. ගෙනෙන ලද. 2. පිහිටි. 3. කරන ලද. 4. තබන ලද.

ආහිතුණ්ඩිකයා = 1. අහිගුණ්ඩිකයා.

ආහිණ්ඩන = 1. ඇවිදීම.

ආහිණ්ඩමාන = (ආහිණ්ඩනත.) 1. ඇවිදිමින්. 2. ඇවිදින.

ආහු = 1. කීහු.

ආහුත = 1. හෝම කළ.

ආහුති = 1. යාගය. 2. හෝම පූජාව.

ආහුන = 1. පූජාව. 2. පිදිය යුතු දෙය.

ආහුනෙය්‍ය = 1. පිදිය යුතු. 2. පූජාවට සුදුසු.

ආහූත = 1. කැඳවන ලද.

ආහුන්දරික = 1. සම්බාධවූ. 2. අවකාශ මඳවූ.

ආහෝ = 1. නිපාතයකි. (අපොයි.)

ආලක = 1. වෛශ්‍රවණයාගේ නගරය.

ආලහක = 1. ඇතුන් බඳින කනුව.

ආලම්බර = (භේරි.) 1. මහ කකුළු අඬුවකින් සෑදූ බෙරයක්. 2. මිහිඟු බෙරය.

ආලාහන = 1. මිනී දැවීම. 2. දවන තැන. 3. මිනී වළ.

ඇ

ඇකපට = 1. උතුරු සළුව.

ඇකය = 1. උකුල. 2. අංශය. 3. පැත්ත. 4. පක්ෂය. 5. උරහිස.

ඇක් = 1. අක්ෂය. 2. මෑ ඇට දෙක හමාරක බර. 3. ඒ තරම් බර ඇති රන්කාසියක්. 4. ඇත්ත.

ඇක්ම = 1. ඉලක්කම. 2. පැගීම. 3. (වර්ණ යෝජනයෙහිදී) මාත්‍රාංශයට අමුණන ලකුණ. 4. හයේ ඉලක්කම වෙනුවට ලියන ලිත් ඉලක්කම.

ඇක්මවා = 1. ආක්‍රමණය කරවා.

ඇක්මෙනවා = 1. පෑගෙනවා. 2. ආක්‍රමණය කරනවා.

ඇක්මුණු = 1. ආක්‍රමණය කළ.

ඇක්සුම = 1. සාපය. 2. සාප කිරීම.

ඇක්සුන් = 1. ආක්‍රොශය. 2. සාප කිරීම.

ඇකි = 1. හැකි; පුළුවන්. 2. ලකුණු කළ.

ඇකිලි = 1. දම්වැල්. 2. මාංචු.

ඇකිළි = 1. අකුලන ලද.

ඇකිලිය = 1. දම්වැල.

ඇකිණි = 1. දදු කැට.

ඇකිලවීම = 1. අකුලා ගැනීම.

ඇකිලෙනවා = 1. කුඩා වෙනවා. 2. කැරලි-ගැහෙනවා. 3. හැකිලෙනවා.

ඇකුණ් = 1. ආක්‍රමණය කළ. 2. පෑගූ.

ඇකුන් = 1. ගිය.

ඇකුම් = 1. ආක්‍රමණය. 2. පෑගීම. 3. පැරදවීම. 4. පැමිණීම.

ඇකුළුම් = 1. හැකිළීම. 2. වකුටුවීම. 3. ලුහුඬුවීම.

ඇකොස්ලි = 1. ආක්‍රෝශය.

ඇඟ = 1. තොරන් වෙසෙසක්.

ඇඟෂ = 1. බාන.

ඇගල දඹුලේනා = 1. පියාසර කරන දඹු ලේනෙක්.

ඇග් = 1. අගය කොට. 2. ගිවිස.

ඇගෑස්ස = 1. ගස් වෙසෙසක්.

ඇගෑ = 1. පහන. 2. තොරන් වෙසෙසක්. 3. පහන් වැට වෙසෙසක්. 4. දගැබ. 5. රුවනින් කළ සැරසිල්ලක්.

ඇගෑගේ = 1. ගඩොළු ආදියෙන් සෑදූ ඇගෑව.

ඇගි = 1. අග්‍ර. 2. ශ්‍රෙෂ්ඨ. 3. වටිනාකම්-ඇති. 4. කෙළවර.

ඇගිඹි = 1. අඩක් බොල් වූ වී.

ඇගිනි = 1. කළු ඉංගිරියාව.

ඇගිළිය = 1. අගල.

ඇග්ම = 1. හයේ ඉලක්කම සඳහා යොදන ලිත් ඉලක්කම.

ඇඟ = 1 ශරීරය. 2. අඞ්ගය. 3. ශරීරාවයව.

ඇඟම ගන්නවා = 1. බාර ගන්නවා. 2. පිළිගන්නවා.

ඇඟදු = 1. අඞ්ගදූහය.

ඇඟ පත = 1. ශරීරය. (අඞ්ග ප්‍රත්‍යඞ්ග.)

ඇඟ පසැඟ = 1. අඞ්ග ප්‍රත්‍යඞ්ග. 2. ශරීරයේ කොටස්.

ඇඟ බද්ද = 1. ශරීර බද්ද. (වයස 21ට වැඩි පිරිමින් ගෙන් අයකළ බද්දක්.) 2. පාර බද්ද.

ඇඟ බඳිනවා = 1. "මෙතුවක් කල් මෙසේ විසිය යුතුය"යි අධිකරණයෙන් චරිත ශෝධනය පිණිස යමෙකුට අණ කරනවා.

ඇඟ මස් = 1. ශරීර මාංස.

ඇඟ මැලි = 1. කම්මැලි. 2. අසලකම.

ඇඟමැලි කඩනවා = 1. ඇනුම් ඇරීම; අත්-පා දිගු කිරීම් ආදියෙන් මැලි ගතිය මගහරිනවා.

ඇඟවීම = (ඇඟවුම.) 1. දැන්වීම. 2. ඉඟිකිරීම. 3. අවබෝධ කිරීම.

ඇඟැලි = 1. සෙනහවත්. 2. සම්බන්ධ.

ඇඟැලුම් කම = 1. සෙනහය. 2. සම්බන්ධකම.

ඇඟි = 1. අදහස. 2. කල්පනාව. 3. අග්‍ර. 4. ශ්‍රේෂ්ඨ. 5. අගනා. 6. කසාදුකය.

ඇඟිණි = 1. කළු ඉංගිරියාව. 2. ඉඟිති ඇට.

ඇඟිලි = 1. (අංගුලිය.) අතේ කොටසක්. 2. කොළයකින් දික්ව වැඩුණු කොටස. 3. මුත්තේ කොහු කැරලි බෙදූ තිබෙන කොටස්.

ඇඟිලි අල = 1. හිඟුරල.

ඇඟිලි ගහනවා = 1. ඇඟිලි ඔබනවා. 2. සෙංයා බලනවා. 3. උපන්දුවක් දක්වනවා.

ඇඟිලි කර = 1. ඇඟිලි දෙකක් අතර පෙදෙස.

ඇඟිලි පරුව = 1. (ඇඟිලි පුරුක - ඇඟිලි-සන්ධිය - ඇඟිලි වර.) ඇඟිලි දෙකක් අතර ඉඩ හැරුණ කොටස.

ඇඟිලි මුදු = 1. ඇඟිල්ලෙහි පලඳින මුදු.

ඇඟුණු = 1. හැඟුණු. 2. අවබෝධවූ. 3. දැනුණු.

ඇඟෙනවා = 1. දැනෙනවා. 2. තේරෙනවා.

ඇච්චා = 1. පනත් අයකුට අමතන විට කියන වචනයක්. 2. තක්කඩියා. 3. මාලුවෙක්.

ඇජ = 1. ඇද.

ඇජර = 1. ඇදුරා. 2. ගුරුවරයා. 3. ආචාරය.

ඇජර තෙර = 1. ආචාර්ය ස්ථවිර. (ගුරු-හාමුදුරුවො.)

ඇජර පරපුර = 1. ආචාර්ය පරම්පරාව.

ඇජර මත = 1. ආචාර්ය මතය.

ඇජර වත් = 1. ගුරුහට කලමනා වතාවත්.

ඇජරොල් = 1. ගුරු පරපුර. 2. ආචරිය කුලය.

ඇජැනෑ = 1. අජානීයයා.

ඇජුරු = 1. ආචාර්යයා. 2. ගුරුවරයා.

ඇජ් අත් = 1. අධ්‍යාත්මය හෝ ශරීරය ඇතුළ.

ඇජිලි = 1. අඤ්ජලිය. (ඇඳිලි බැඳීම.)

ඇට = 1. ශරීරයෙහි මසින් වැසී තිබෙන දැඩි කොටස. 2. තද. 3. ගෙඩිවල ඇට. 4. මදය. 5. අණ්ඩය. 6. වී ආදි ධාන්‍ය-ඇට.

ඇට ඇඳිරි = 1. තද කළුවර.

ඇට කාටු = 1. ඇට හා කටු.

ඇට කඹය = 1. තදින් වෙළී කවා ඇඹරු-මහත කඹය.

ඇට කිරිල්ල = 1. ගස් වගීයක්.

ඇට කුහුඹියා = 1. කුඩා කුහුඹු වෙසෙසක්.

ඇට කෙහෙල් - 1. ගෙඩියෙහි බෙහෙවින් ඇට ඇති කෙහෙල්.

ඇට ගැහෙනවා = 1. (ඇඟ.) කෙට්ටු වෙනවා. 2. (පැලය.) තිසරු වෙනවා.

ඇට ගෙමඩියා = 1. මැඩි වෙසෙසක්.

ඇට තලනවා = 1. වැරෙන් පහර දෙනවා.

ඇට පන් = පැළෑටි වෙසෙසක්.

ඇට පම = 1. ඇට වැල.

ඇට පතර = 1. ඇට රැස.

ඇට පල = 1. ඉත්තෑවා.

ඇට පිටි = 1. රැළත්.

ඇට බිජු = 1. පැලවෙන ඇට වගී.

ඇටඹ = 1. අඹ වගීයක්.

ඇට මඳයා = 1. ගොනා. 2. උගරු නාම්බා.

ඇට මැඳිරි = 1. සිරුරෙහි ඇට කූඩුව.

ඇට මැසි = 1. ඇට මැස්සා.

ඇට මිඳුළු = (ඇට මුල් - ඇට මොළ.) 1. ඇට මධ්‍යයෙහි ඇති ලොඳ වැනි දේ.

ඇට මුරුත්තාව = 1. පමණට වඩා ආහාර ගැනීමෙන් අතිවන මූර්ච්ඡාව.

ඇටය = 1. ශරීරයේ ඇට. 2. ගෙඩියක ඇටය. 3. මදය. 4. වී ආදි ධාන්‍ය ඇටය. 5. වැලි ඇටය.

ඇට රඹ = 1. ඇට කෙහෙල්.

ඇට වරං = (ඇටෝරං.) 1. තෘණ විශේෂයක්. 2. මත්ස්‍ය ජාතියක්.

ඇට වලු = 1. තද. 2. මුහුදු මසුන් වෙසෙසක්.

ඇට වැරැල්ලා = 1. පඳුරු වගීයක්.

ඇට වැල = 1. ඇට පට. 2. පබලු ආදියෙන් කළ ගෙල බඳින ආභරණයක්. 3. ඇට ජාති අමුණා කළ මාලය.

ඇට වීම = 1. (උගුලක්.) මැනීම. 2 (උගුලක්.) තැබීම.

ඇට වෙනවා = 1. (පැළයක්.) හොවැඩී පවතිනවා. 2. කොඩ ගැහෙනවා.

ඇට සගල = 1. අටසි සඞ්ඝාටය. (සිරුරෙහි වූ තුන්සියක් ඇට.)

ඇට සන්ධිය = (ඇට හන්දිය.) 1. ශරීරයෙහි ඇට පැහුණු තැන.

ඇට සැකිල්ල = 1. මළ සිරුරෙහි ඉතිරි වූ ඇට කූඩුව. 2. ශරීරයේ ඇට රාශිය.

ඇට සැකිලි මස = 1. ඇට සැකිල්ලෙන් හටගත්.

ඇට්ට කුණාවීම = 1. හරිආකාර නොතැම්බීම.

ඇට්ට බුරු = 1. ගස් වෙසෙසක්.

ඇට්ටර = 1. මූරණ්ඩු. 2. ඇට්ටේරිය ගස්.

ඇට්ටඹ = 1. මල පනකොට පිරිසිදු කර නොගත්තා.

ඇට්ටඹ රාළ = 1. රජුගේ ආවතේව කාරයෙක්

ඇට්ටේරියා = 1. එනම් මල් ගස්.

ඇට්ට තිඹිරි වෙළා = 1. කැමෙන් බඩ හොඳටම පිරී.

ඇට්ටමුරා = 1. පඳුරු වගීයක්.

ඇට්ට මුරුන්තාව = 1. වැඩි වූ තෘප්තිය. 2. යමක් ගැන අධික සතුටට පැමිණීම. 3. දුස් ලෝභයෙන් යමක් වුවමනා ප්‍රමාණට වැඩියෙන් ප්‍රයෝජනයට ගැනීම.

ඇටිකිත්තා = 1. කුඩා මැඩියා.

ඇටි කුළා = (ඇටි කුළු) 1. ඇටි කුකුළා.

ඇටි කුකුළු = 1. පක්ෂි විශේෂයක්.

ඇටිපල = 1. ඉත්තෑවා. 2. කබල්ලෑවා.

ඇටිස්සා = 1. මුදු මාලු වෙසෙසක්.

ඇටියෙල් පෑණි = (ඇටියෙල් පතු) 1. ඇටි කෙහෙල් ගෙඩි මිරිකා පෙරාගත් පැන්.

ඇටුන = 1. ගස් වෙසෙසක්.

ඇඹුඹන = 1. ගසක හැදෙන හිල. 2. ගස් බෙණය.

ඇඹුඹම් = 1. කෝන් ආදි ගස්හි මුලින් පිටතට නෙරූ කොටස.

ඇඩලීම් = 1. හැඩලීම්. 2. කුකුළු ආදි සතුන් ගේ නාද කිරීම්.

ඇඬීම් = 1. ශෝක වේදනා ආදිය ප්‍රකාශවන මාර්ග. 2. වැලපීම්.

ඇණය = (ඇණේ) 1. යමක් සවි කිරීමට යොදන උල්වූ කටුව. 2. නියෝගය. (අණ)

ඇණ ආචාරියා = 1. ඇණ සාදන ආචාරියා.

ඇණ ගන්නවා = 1. ඇණ තියාගෙන ඉන්නවා. 2. (පුටු ආදියක් නොමැතිව) කකුල් දෙකට කයේ බර දී හිඳ ගන්නා ක්‍රමයක්.

ඇණ උලුක්කු = 1. ඇණුම් - කෙටුම්. 2. ඇණුම් පද.

ඇණ ගසනවා = 1. ඇණ සවිකරනවා.

ඇණවනවා = 1. අණ කරනවා.

ඇණඩි = 1. කඩුව.

ඇණිග් = 1. දර අගුරු බුරුල් කරන යකඩ කූර.

ඇණිය = 1. නැවක හෝ ඔරුවක ඉස්සරහ කොටස. 2. (බළු) හමුදුව. 3. කඳවුර. 4. ඉතා සවල්පය.

ඇණි කුඹය = 1 නැවක හෝ ඔරුවක ඉදිරියේ සවිකරන කුඹ ගස.

ඇණි අවල = 1. යාත්‍රාවේ ඉදිරිපස සිට අදින (හබල) අවල.

ඇණිගය = 1. සුළු පාපය.

ඇණි ලා ගුත් = 1. (බත්) සෙන් රැස් කොට ගෙන උත්තා වූ.

ඇනා සිටිනවා = 1. නවත්වනවා. 2. (වැඩේ) නතර වෙනවා.

ඇන්ද = 1. පුටු - ඇඳන් ආදියේ පැත්තෙන් සවිකොට තිබෙන කොටස. 2. දත් පේළිය. 3. (සිතියම්) ඇන්දවූ. 4. (ඇඳුම්) ඇන්දවූ.

ඈන්න = 1. රැගෙන.

ඈන්නවීම = 1. යමකින් අත්තවත බව.

ඈන්නෑ = 1. හිරිහැර. 2. කරදර. 3. වටිනා-කමක් නැති.

ඈන්නෑව = 1. අතඩුව. 2. කරදර සහිත වැඩය.

ඈනි ඈම්මෙම් ඈන්නා = 1. ඇති තරම් ගැහුවා. 2. තදින් පහර දුන්නා.

ඈත = (ඇති) 1. තිබෙනවා. 2. සිටිනවා. 3. තිබෙතොත්. 4. උරහිස. 5. ඇතුළත. 6. ජනපදය. 7. මිට.

ඈතංගුතු = 1. මිට.

ඈතක්‍ෂරා = (ඇතජරා) 1. ඇත්ගොව්වා.

ඈතඳ = 1. ඇති තමුන්. 2. ඇතිවත්.

ඈතඹ = (ඇතැම්) 1. සමහර

ඈතරෑවා = (ඇතුරවා) 1. ඇතා පිටින් යන්නා.

ඈතවස් = 1. වස් කාලය ඇතුළත. 2. වර්ෂය ඇතුළත.

ඈතඹුරෑ = 1. අන්තඃ පුරය.

ඈතස් = (ඇත් + අස්) 1. ඇතුන් හා අශ්වයන්.

ඈත් - 1. හස්තියා. 2. ඇතුළ. 3. අන්තය. 4. ඇතුන්ට අයිති. 5. මහත්. 6. මිට. 7. තිබෙන.

ඈත් අඩි = 1. පොල් ගස් අසල වැවෙන පැලෑටි වෙසෙසක්.

ඈත් අරෑවා = 1. හස්ත්‍යාරෝහකයා. (ඇතුන් පිට යන්නා).

ඈත් අහර = 1. ඇතුන් යන මග.

ඈත් ඈණිය = 1. හස්ති සේනාව.

ඈත් ඈඳුරෑ = 1. හස්ත්‍යාචාර්යයා. (ඇතුන් හික්මවන්නා).

ඈත් ඉලන්ති = 1. ඇත් බෙටි.

ඈත් එඹිරා = 1. ඇතුන් රැක බලා ගන්නා.

ඈත් කබුව = 1. අඩකුශය. (හෙණ්ඩුව)

ඈත් කන් = 1. හබරල. 2. කැල ගස.

ඈත්කඳ ලිහිණියා = 1. රාජාලියා.

ඈත් කන් වැන්න = 1. හබරල.

ඈත් කඳ = 1. හස්ති ශරීරය. 2. ඇතාගේ පිට.

ඈත් කුණප = 1. ඇත් මළ කඳ.

ඈත් කුඹු = ඇතාගේ හිසේ උස් කොටස. 2. ඇතාගේ හිස මත තෙරා තිබෙන මස් පිඩු.

ඈත් කෙඹි = මහත් වූ කර්ණිකාව.

ඈත් කෙළි = ඇතුන් පොර කෙටවීම. (ඇතුන් ලවා සෙල්ලම් කරවීම).

ඈත් කොහොල් = (ඇත් කෝල්) 1. අඩකුශය.

ඈත් ගම් = 1. ඇතුළුගම.

ඈත් ගාල = 1. අලි - ඇතුන් ඇල්ලීම පිණිස වනාන්තරයේ සාදන විශාල කොටුව. 2. ඇතුන් තබා තිබෙන තැන.

ඈත් ගිජු ලිහිණි = 1. (පුරාතනයේ සිටි බැව් කියන) ගිජු ලිහිණි වර්ගයක්.

ඈත් ගොබු = 1. ඇතුන්ගේ පිට දෙපැත්තේ එල්ලූ ඝණ්ඨා. (මිණි ගෙඩි)

ඈත් ගොව්වා = 1. ඇතුන් රැක බලා ගන්නා.

ඈත්ත = 1. සත්‍යය. 2. සැබෑවූ දේ.

ඈත්තල = ඇතුන් තබන ස්ථානය. 2. ඇත් හලෙහි නියුක්තයා.

ඈත්තලයා = 1. ඇත්ගොව්වා.

ඈත්තා = 1. අයිති කාරයා 2. තැනැත්තා. 3. ඇති තැනැත්තා.

ඈත් තිප්පිලි = 1. ගජ තිප්පිලි.

ඈත්තී = 1. අයිතිකාරි. 2. තැනැත්තී. 3. ඇති තැනැත්තී.

ඈත්තෝර = 1. එනම් ගස් වර්ගය.

ඈත්තෝල = 1. ඇත්තාහුය.

ඈත්දත් = (ඇත් දළ) 1. ඇතුන්ගේ දත්.

ඈත්දම - 1. අලි ඇතුන් බඳින දම්වැල.

ඈත් දෙඹ = 1. එනම් ගස් වෙසෙස.

ඈත්පල් = (ඇත් පලු - ඇත්පල්ලා - ඇත්-පතික්කයා) 1. (හස්ති පාලකයා) ඇත්-ගොව්වා).

ඈත් පන්තිය = 1. ඇතුන් රංචුව.

ඈත් පහ = 1. ඇතුළු ප්‍රාසාදය.

ඈත් පවුරෑ = 1. හස්ති රූප සහිත ප්‍රාකාරය.

ඈත්පුර = 1. අන්තඃ පුරය.

ඇත්පොව්වා = 1. ඇත් පැටියා.

ඇත් බඳ = 1. හස්ති ශරීරය.

ඇත් බෙම් = 1. හස්ති වර්චස්.

ඇත්මස් = 1. හස්ති රූපාකාර මත්ස්‍ය විශේෂයක්.

ඇත් මද = 1. ඇතුන්ගේ කන ලඟින් පිටවෙන ඕජාව.

ඇත් මැඩ = 1. (හස්තිමෙණ්ඩයා) ඇත්ගොව්වා.

ඇත් මිනි = 1. ඇත් මල කඳ.

ඇත්යාන් = (ඇත්යහන්) 1. යෑමට උපකාර වන ඇතා (හස්ති වාහනය). 2. පුමන දිව්‍ය රාජයා.

ඇත් රැව් = 1. ඇත් ගොව්වා.

ඇත් රිපු = (ඇත් රුපු) 1. ඇතාගේ සතුරා (සිංහයා.)

ඇත්රුවන් = 1. හස්ති රත්නය. (ශ්‍රේෂ්ඨ ඇතා)

ඇත්වරණය = 1. හෙංඩුව. 2. උතුම් ඇතා.

ඇත්වග 1. හස්ති වගීයා.

ඇත්වග පුල් = 1. ගජ තිප්පිලි.

ඇත්වටු = 1. මහ වටු වගීයක්.

ඇත්වසු = 1. ඇත් පොව්වා.

ඇත්වාහන = 1. හස්ති වාහනය.

ඇත්වෙද = 1. ඇතුන්ට වෙදකම් කරන වෛද්‍යයා.

ඇත්වෙහෙර = 1. එනම් විහාරය. 2. ඇතුළු වෙහෙර.

ඇත්සැමිය = 1. ඔසු වෙසෙසක්.

ඇත්සිවුරුගැබ = 1. සිවුරු ගැබ ඇතුළත.

ඇත්හල් = 1. ඇත්ගාල.

ඇත් හොඬ = 1. ඇතාගේ සොඬවැල.

ඇතා = 1. දළ ඇති අලියා.

ඇතැන් = 1. වෙනත්.

ඇතැණිය = 1. (ඇත් + ඇණිය) ඇත් සේනාව.

ඇති = 1. තිබෙන. 2. විද්‍යමාන. 3. වසන. 4. සෑහෙන තරම් තිබෙන.

ඇතිඇත්තේ = 1 ඇති ඇති දේ. 2. මූළු වස්තුව.

ඇතිකරනවා = 1. (සතුන්) බෝ කරනවා. 2. (ලමයින්) ඇති දැඩි කරනවා.

ඇතිකි = (ඇතින්න - ඇතින්නී) ඇතාගේ ගැණු සතා.

ඇතිනිමුළු = 1. හස්තිනී සමූහය.

ඇතිපදම් = 1. ඇති පමණ. 2. ඇතිතාක්.

ඇතිමට්ටම් = 1. ඇති තරම්.

ඇතිරි = 1. ඇතිරිල්ල. 2. වැස්ම.

ඇතිරිකඩ = 1. ඇතිරිලි කැබැල්ල.

ඇතිරිලි = 1. ඇඳ ආදියෙහි අතුරන වස්ත්‍ර.

ඇතිරීම = 1. අතතුරු බව. 2. එලීම.

ඇතිරෙනවා = 1. විහිදෙනවා. 2. දිග ඇරෙනවා.

ඇතිලිය = 1. භාජන වෙසෙසක්. 2. කට පලල් උයන බඳුන. 3. කබල.

ඇතිල්ලෙනවා = 1. එකට ගැවෙනවා.

ඇතිවීම = 1. ඉපදීම. 2. ගැබ්ගැනීම. 3. සෑහීම.

ඇතිවෙලං = 1. සෑහී. 2. එපාවෙලා.

ඇතිහැටිය = 1. තිබෙන තත්වය. 2. තියම තත්වය.

ඇතුම = 1. ශරීරය. 2. ආත්මය.

අතුරුවා = 1. එලුවා. 2 දිගහැරියා. 3. විසුරුවා.

ඇතුල් = 1. අභ්‍යන්තරය. 2. ඇතුලේ තිබෙන.

ඇතුල්කම්මල = 1. විහාරයක ඇතුළෙහි කරන මෙහෙය. 2. එසේ මෙහෙ කරන පිරිස.

ඇතුල්කරනවා = 1. අඩංගු කරනවා. 2. ඇතුළට ගෙනයනවා.

ඇතුල් නුවර = 1. නගරයේ ඇතුල් කොටස.

ඇතුල්පක් = 1. ආහාර අනුභවයට හෝ පිටි හැලීමට ගන්නා වට්ටියක් වැනි උපකරණය. 2. කෙහෙල් කොළ පත.

ඇතුල්පුරය = 1. ඇතුල් නුවර. 2. ස්ත්‍රීන් ජීවත්වන කාමරය.

ඇතුල්වෙනවා = 1. පසාරු කරනවා 2. ඇතුළට යනවා.

ඇතුව = 1. තිබී. 2. සමඟ.

ඇතුළු වහන් = 1. ඇතුන්ගේ පයෙහි යොදන වහක්.

ඇතුල = (ඇතුළත) 1. ඇතුළේ කොටස. 2. අභ්‍යන්තරය.

ඇතුළක් කරනවා = 1. අඩංගු කරනවා. 2. ඇතුළු කරනවා.

ඇතුළු = 1. අභ්‍යන්තරය. 2. ඇතුළේ තිබෙන. 3. අඩංගු වූ.

ඇතුළු කුස = 1. බඩ ඇතුළ.

ඇතුළුගබ් = (ඇතුළු ගබ් - ඇතුළු ගැබ්) 1. අන්තර් ගර්භය. 2. කාමරය ඇතුළ.

ඇතුළුගම = 1. ගමේ ප්‍රධාන කොටස. 2. ප්‍රාකාරාදියකින් වට වූ ගම.

ඇතුළු නුවර = 1. නගරයේ ඇතුල් කොටස. 2. ප්‍රාකාරාදියකින් වට වූ නගරය.

ඇතුළු වසෙසිම = 1. වස් කාලය ඇතුළත.

ඇතුළු වටන = 1. තිරයෙන් ඇතුළත 2. අභ්‍යන්තර ප්‍රදේශය. 3. ඇතුළේ හැසිරෙන.

ඇතුළු සමවත් = 1. සමාපත්තිය ඇතුළත. 2. සමාපත්තිය පවත්නා කාලය තුළ.

ඇතුළුවලි = 1. වලි මාගීයෙහි උඩින් පිහිටි මුදුවක් වැනි කොටස.

ඇතුළු සියන = 1. රටි පියස්ස. 2. පියස්ස ඇතුළත.

ඇතොර = (ඇතොවුර) 1. අන්තඃපුරය.

ඇතොවුර = (ඇතොවුරු) 1. අන්තඃපුර ස්ත්‍රී.

ඇතෝතින් = 1. ඇතනොත්. 2. තිබෙතොත්.

ඇද = 1. කෙළින් නැති. 2. වක්වූ. 4. ඍජු නොවූ. 4. නැමුණු. 5. ඇදලා. 6. සරදම්. (විහිළු) 7. අවලස්සන. 8. වරද.

ඇද අරිනවා = 1. වරද හරිගස්සනවා.

ඇද කරනවා = 1 (වැඩය) අවලක්ෂණ කරනවා. 2. (අත්-පා ආදිය දිගු කිරීමෙන්) විහිළු කරනවා.

ඇද කියනවා = 1. වැරදි දක්වනවා
ඇද කුද හරිනවා = 1. වැරදි තැන් හරි ගස්සනවා. 2. පලුදු අරිනවා.

ඇද කුද ඇරගන්නවා = 1 දුර්වලකම් මගහැර ගන්නවා.

ඇද ගන්නවා = 1. අදිනවා. 2. බාරගන්නවා.

ඇද ගහනවා = 1. ඇද වෙනවා.

ඇද දමනවා = 1. ඇදලා දමනවා. 2. ඉවත ලනවා.

ඇද හැකි = 1. ආධ්‍යාත්මික.

ඇද හිල්ල = 1. භක්තිය. 2. විශ්වාසය. 3. ශ්‍රද්ධාව 4. ආගම. 5. ඇදහීම.

ඇදහිලි ක්‍රමය = 1. ඇදහීමේ මාගීය.

ඇද හෙලනවා = 1. පහතට ඇද දමනවා. 2. ඇද දමනවා.

ඇද්ද = 1 ප්‍රමාණවත්ද. 2. ඇතිවේද. 3. ඉන්නවාද.

ඇද්දෙනවා = 1. ගැවෙමින් තිබෙනවා.

ඇදූරිය = (ඇදූරිය) 1. ඔසු වෙසෙසක්.

ඇදූරුම් = (හැදූරුම්) 1. ඉගෙන ගැනීම්.

ඇදි = 1. අදින ලද. 2. කන ලද. 3. ඉදිමීම.

ඇදිලි = 1. අඤ්ජලිය. 2. ඇදීම්.

ඇදීම = (ඇදුම) 1 මූත රෝගය. 2. ඇදගැනීම. 3. ආකර්ෂණය.

ඇදුරු = 1. ආචාර්යයා. 2. පණ්ඩිතයා. 3. ආදරය. 4. පුරුෂයා. 5. ගෞරවය. 6. යකැදුරා.

ඇදුරුඉඳු = 1. වෘහස්පති.

ඇදුරුකඩ = 1. ගුරුකම. 2. ආදර්ශය.

ඇදුරුතෙර = 1. ආචාර්ය ස්ථවිර. (ගුරු-හාමුදුරුවෝ)

ඇදුරුබැළ = 1. ගුරු පඬුරු. (ගුරුවරයාට දියයුතු ගාස්තුව).

ඇදුරුවත් = 1. ගුරුවරුන්ට කටයුතු වතාවක්.

ඇදුරෙල් = 1. ගුරු පරපුර (ආචාර්ය කුලය.

ඇඳ = 1. නිදා ගැනීමට සූදානම් කොට ගත් ආසනය.

ඇඳ ගන්නවා = 1. ඇඳුම් අඳිනවා.

ඇඳි = 1. අඳින ලද 2. පින්තාරු කළාවූ 3. (පුටු) ඇන්ද. 4. (දත්.) ඇන්ද. 5. ගරාදි වැට 6. (පියා පත්)ඇන්ද.

ඇඳින ගන්නවා = 1. හඳුනා ගැනීම. 2. දැනගන්නවා.

ඇඳි පුටු = 1. හේත්තුවීමට පැති සවිකළ පුටුව.

ඇඳි මලකඩ = 1. මිය යන විට ඇඳ සිටි රෙදි.

ඇඳිරි = 1. අන්ධකාරය. 2. ඇස් නොපෙණීම. 3. අඳුරු වැටීම.

ඇඳිරිගෙය = 1. හිරගේ 2. අඳුරු කාමරය.

ඇඳිලිය = 1. ඇඟිල්ල. 2. දෙ අත් එක් කොටගැනීම.

ඇඳිලිකම = 1. එක් කොට ගත් දෙ අත් ඔසවා වැඳීම.

ඇඳීම් = 1. සිතුවම් කිරීම්. 2. ඇඳුම් ඇඳ ගැනීම්.

ඇඳුනුම් වෙනවා = 1. දැන ගැනීමට සිදු වෙනවා.

ඇඳුම් = 1. සිතුවම් කිරීම්. 2. රෙදි ආදිය. 3. ලිවීම්. 4. (රෙදි ආදිය) ඇඳගැනීම්. 5. චිත්‍ර කර්ම. 6. අඳින දේ.

ඇඳුම් ආයිත්තම් = 1. ඇඳුම් පැලඳුම්. (අඳින රෙදි හා පලඳින ආභරණ ආදිය)

ඇප = 1. ("මෙය මෙසේ වුනි නම් මෙසේ කරමි" යි) කරගන්නා ගිවිසුම. 2. බාරවීම. 3. බාරවීමට දෙන දේ. 4. පොරොන්දුව.

ඇපලුපකාර = 1. උදව් පදව්. 2. ආධාර.

ඇප උකස = 1. ඇපයක් මෙන් තබා ගැනීමට දෙන උකස.

ඇපකාරයා = 1. ගිවිසුම ඉටුකරන බවට පොරොන්දුවන්නා.

ඇප කැප වෙනවා = 1 ගිවිසුමට මැදිහත් වෙනවා.

ඇප නූල් = 1. ලෙඩ සුවවූ විට යකුමක් කරන බවට ගිවිසුම් දී බඳින නූල්.

ඇප හැරණය = 1. තෝක් අඩුව. 2. චෝදනාව.

ඇපා = (ඇපා) 1. ආදි පාදයා. 2. රජ පවුලේ ප්‍රධාන කුමාරයා.

ඇපල = 1. ගස් වර්ගයක්.

ඇප් = 1. අල්ප. (ටික) 2. අපි. 3. කුඩා.

ඇපෑල් = 1. බැවිල වගීයට අයත් කුඩා ගසක්. 2. පලතුරු වගීයක්.

ඇපෑල් ගන්නවා = 1. නඩු තීන්දුවක් වෙනස් කරන ලෙස ඉහළ උසාවියෙන් ඉල්ලා සිටිනවා.

ඇපි = 1. අපි.

ඇපිල්ලීම = 1. (රෙදි) සෝදා පිරිසිදුකිරීම.

ඇපිල්ලුවා = 1. (රෙදි) සෝදා පිරිසිදු කළා. 2. තදින් පහර දුන්නා.

ඇපිස් = 1. අල්පේච්ඡ.

ඇපිළි = 1 හැපුණු. 2. ගැසුණු.

ඇපුළු = 1. ඇපුල්ලූ. (රෙදි සොදා පිරිසිදු කළ.)

ඇපෙළුම් = 1. අත්පිඩි ගැසීම්.

ඇප්ෂෙන = 1. අසනයට යාම; බැස යාම.

ඇපෝපකාරය = 1. උදව් - පදව් වීම.

ඇබ = 1. මුඩිය. 2. පොරොප්පය.

ඇබ්බැහි වීම = 1 පුරුදුවීම. 2. බැල්ම නෙළීම. 3. සම්බන්ධතාවයක් ඇතිකර ගැනීම. 4. අදන් වීම.

ඇබැද්දිය = 1. වැරැද්ද. 2 අයහපත 3. (බලා-පොරොත්තු රහිතව පැමිණි) විපත. 4. හානිය.

ඇබෑර්තුව = 1. රක්ෂාවක් හෝ තනතුරක් පුරප්පාඩු වීම. 2. ඇතුල්වීමට ඉඩ තිබීම.

ඇබි = 1. අඹුව.

ඇබිණි = 1. ඉතා ටික.

ඇබින්ත = 1. ටික. 2. කුඩා ප්‍රමාණය.

ඇබිත්තයා = 1. භික්ෂුන්ගේ ආවතේව කාරයා (අභියුක්තයා).

ඇබින්ද = 1. ඉතා ටික. 2. ස්වල්පය. (ඇබිංදු)

ඇබිස්ස 1. ඉතා ටික. 2. ස්වල්පය.

ඇබ්බෑසි = (ඇබ්බැහි) 1. අභ්‍යාසය ; පුරුද්ද.

ඇබේ = 1 ඇබය. 2. මූඩිය.

ඇඹණියෝ = (ඇඹෙණි) 1. අඹුව ; භාර්‍යාව.

ඇඹරි = 1. ඇඹරුණු. 2. කරකැවුණු.

ඇඹය = 1. ඇති පමණ.

ඇඹරෙනවා = 1. කරකැවෙනවා. 2. එතෙනවා. 3. පැකිලෙනවා. 4. දෙපොටක් එක් වී කැරකෙනවා.

ඇඹල = 1. දිමියා වැනි කුඩා සතෙක්. 3. සියඹලා. 3. සුදු තෙළුම්. 4. ඔලු.

ඇඹලයා = 1. එනම් සතා. 2. කැදරයා.

ඇඹලල = 1. ඇම්බරැල්ල.

ඇඹලැඹුල = (ඇඹල + ඇඹුල) කුහුඹුවන්ගෙන් ලබාගත් ඇඹුල්.

ඇඹැරැල්ල = එතම් ගස්.

ඇඹැරුම් = 1. වෙළු හෝ ලනු එකට එතීම. 2. කරකැවීම.

ඇඹැල්ල = 1. එතම් ගස්.

ඇඹවීම් = (ඇඹීම්) 1. එලවා දැමීම්. 2. හැඩහුරු කමට අනුව (මැටි - හුණු ආදියෙන්) සෑදවීම.

ඇඹිල්ල = 1. එතම් ගස් වෙසෙස.

ඇඹිඹිපු = 1. කැවුම් වෙසෙසක්.

ඇඹිඹිය = 1 දියමිත්ත. (ඇඹිටිල්ල)

ඇඹිඹිලි = (ඇඹිටිල්ලා) 1. මී පැටියා. 2. කුඩා මීයා. 3. කොස්ඇට මීයා.

ඇඹුන = 1. උකුල.

ඇඹු මිනිස් = 1. සත්‍රිය.

ඇඹුම් = 1 ඇඹීම. 2. රූප තැනීම.

ඇඹුම් කවි = 1. බලි රූප අඹන ක්‍රමය දැක්වෙන කවි.

ඇඹුල = 1. ඇඹුල් ද්‍රව්‍ය. 2. වැන්ජන පිසින ක්‍රමයක්. 3. කුමුදු. 4. තෙල්ලි.

ඇඹුලට උයනවා = 1. එලවුළු වලින් ඇඹුලක් සාදනවා.

ඇඹුල් = 1. එතම් රස. 2. කාඩි. 3. හෙලුපුල්. 4. අම්බලම. 5. කැම. 6. පලස.

ඇඹුල් ඇඹිලිය = 1. පැලෑටි වෙසෙසක්.

ඇඹුල්කර ගන්නවා = 1. (මූණ) අසතුටු ගතියක් පාතවා.

ඇඹුල්දෙඩම් = 1. දෙඩම් වෙසෙසක්.

ඇඹුල් පක් = 1. තෙල්ලි ගෙඩිය.

ඇඹුල් බිජුවට = 1. තෙල්ලි ඇට හෝ ඹලු ඇට.

ඇඹුල් අඹු = 1. ඇඹුල් කැඳ.

ඇඹුල් කසාය = 1. තෙල්ලි කසාය.

ඇඹුල් කාඩි = 1. ඇඹුල් රසැති කාඩිදිය. 2 විනාකිරි.

ඇඹුල් පස්වග = 1. ඇඹුල් ජාති පස. (දෙහි-දෙඩම්-ගොරකා-නස්නාරං-අගඩා යන පස)

ඇඹුල් මෝරු = 1. ඇඹුල් රසැති කිරි මෝරු. 2. විනාකිරි. 3. කාඩි.

ඇඹුලු = 1. ඹලු. 2. තෙල්ලි. 3. ඇඹුලු අල. (ඔළු හෝ හෙළම් අල)

ඇඹුල් වයස = 1. තරුණ වයස. 1. පැහිරි වයස.

ඇඹුල් වේ = 1. ගොරකා

ඇඹුල් හොඹර වාලු = (ඇඹුල් හොරණ වාලු) 1. කෙසෙල් වෙසෙසක්.

ඇඹුලැඹිලිය = 1. එතම් පැලෑටි වෙසෙස.

ඇම = 1. සෑම. 2. නිතර. 3. මසුන් ඇල්ලීමේදී බිලි කටුවෙහි අමුණන දේ. 4. අල්ලස.

ඇම ඇදුරා = (ඇම ඇදුරු) 1. සියල්ලන්ගේ ගුරුවරයා. 2. බුදුන් වහන්සේ.

ඇමති = (ඇමතියා - ඇමැත්තයා) 1. රට පාලනය ගැන රජුට උපදෙස් දෙන්නා. 2. රාජපුරුෂයා. 3. රාජ්‍ය සභිකයා. 4. රට පාලනයට බෙදා තිබෙන දෙපාර්තමේන්තුවක් භාරව සිටින්නා.

ඇමති ගණ = 1. අමාත්‍ය සමූහයා.

ඇමති දූ = 1. අමාත්‍ය දුහිතෘව. 2. අමාත්‍යයාගේ භාර්යාව.

ඇමති මඩුල්ල = 1. අමාත්‍ය මණ්ඩලය.

ඇමතීම = 1. ආමන්ත්‍රණය කිරීම. 2. කල්පනා කිරීම. 3. බලාපොරොත්තුව. 4. කැඳවීම.

ඇමතුම = 1 කැඳවීම.

ඇමදීම = (ඇමදුම) 1. අතුගෑම.

ඇම්ගොටනවා = 1. ටික ටික හපා කනවා.

ඇම්නියා = (ඇමියා) 1 ආහාර නොපැසවීම. 2. ආම රෝගය.

ඇම්බැට්ටයා = 1. කරනැවැමියා.

ඇම්බබණ්ඩියාව = 1. අඹුව; භාර්යාව.

ඇම්ම = 1. බඩේ, පපුවේ හෝ පිටේ වරින් වර ඇතිවන ඉතා දරුණු වේදනාව. 2. තද රුදාව.

ඇම්මුන = 1. ඉවහුවොත්.

ඇම්මුන් = 1. කෙසෙල් වර්ගයක්.

ඇම්මෙනවා = 1. ඉවසනවා. 2. තවතිනවා. 3. බලාපොරොත්තුව සිටිනවා.

ඇඹුරු = 1. බලාපොරොත්තුවීම. 2. තැවතීම.

ඇඹැට්ටි = (ඇඹරැට්ටි) 1. උලුක්කු (වීම)

ඇඹිල්ලා = 1. කුඩා මී වෙසෙසක්.

ඇඹිනිල්ල = 1. ඇඹිනීම. 2. සපිකිරීම.

ඇඹියාව = (අඹියාව) 1. අජීර්ණය.

ඇඹිම = 1. පිඹීම.

ඇය = 1. ඈ. 2. ඒ ස්ත්‍රී. 3. පසුගිය කාලය.

ඇයද = (අයැද) 1. ඉල්ලා.

ඇයැදුම් = 1. ආයාචනය. 2. ඉල්ලීම.

ඇයි = මොකද කියා ප්‍රශ්න කිරීම. 2. කිම. 3. ඔයි.

ඇයි හොඳයි කම = 1. හාදකම. 2. මිත්‍රකම. 3. හිතවත්කම.

ඇයුම = 1. ඇනුම් ඇරීම. 2. කට ඇරගෙන ඉඳීම.

ඇයුම් = 1. ආකර්ෂණය. 2. ඇදීම.

ඇයෙමින් = (ඇයෙමිනි) 1. අදිනු ලබමින්.

ඇර = 1. එකොළොස. 2. කැලඹීම. 3. මගුල් රථය. 4. හැර. 5. විවෘතකර. 6. යවා. 7. ඉදිරිපත්කර.

ඇර ගන්නවා = 1. වැස්ම අරිනවා. 2. හක්කවා. 3. පොර බදනවා.

ඇරත් = 1. ඒ හැර. 2. තවත්.

ඇර දමනවා = 1. අත් හරිනවා. 2. වැස්ම ඇර තබනවා.

ඇරඹ = 1. ආරම්භය. 2. පටන් ගැන්ම. 3. ඒ නිසා.

ඇරඹූ = 1. පටන්ගත්.

ඇරයුම = (ඇරියුම) 1. ආරාධනය. 2. ඉල්ලීම. 3. යැදීම.

ඇරයූ = 1. ඉල්ලූ. 2. ඇරඹූ.

ඇරලනවා = 1. කැටුව යනවා. 2. අත් හැර දමනවා.

ඇරවීම = 1. අරින්නට සැලැස්වීම.

ඇරවුම (ඇරියුම) 1. ඉල්ලීම. 2. යැදීම.

ඇරැ = 1. ඈ.

ඇරිඝුම = 1. සෙවීම. 2. ඉල්ලීම. 3. ආරාධනය.

ඇරීම = (ඇරුම) 1. හැරීම. 2. විවෘත කිරීම. 3. යැවීම.

ඇරුම් = 1. ඇරීම. 2. ආරාමය.

ඇරෙජු = 1. ආරෝචනය කළ. 2. දූත්වූ.

ඇරෙනවා = 1. විවෘත වෙනවා. 2. අත්හැර දමනවා. 3. අස්කරනවා 4. හමාරවෙනවා.

ඇල = 1. කුඩා දිය පාර. 2. ඇල වී (තැම්) තිබීම. 3. අංශය. (පැත්ත) 4. වතුර බසින මාර්ගය. 5. ඇලපත. 6. ඇද. 7. ජලාස දෙකක් සම්බන්ධ කරන දියපාර

ඇල අතු = 1. සිවුරෙහි දෙපැත්තෙහි තිබෙන අතු.

ඇල ඇට = 1. ඉල ඇටය.

ඇල කරනවා = 1. පැත්තකට නමනවා.

ඇලගෑම් = 1. උලා ගැනීම.

ඇලදිව් = 1. බඩදිව; පිලාව.

ඇලපත = 1. ශරීරයේ පැත්තක්. 2. ඇලය.

ඇලසිල්ල = 1. අකුරකට අගින් යොදන (ා) ලකුණක්.

ඇලසිම = (ඇලපුම) 1. කැඳවීම. 2. ආලපනය. 3. සිතීම. 4. බලාපොරොත්තුවීම.

ඇල මුලාන් = 1. ඇලක ඉස්මත්ත. 2. උඩුනොය.

ඇලල = 1. කම්පාවීම.

ඇලලීම = (ඇලලුම) 1 කැලඹීම. 2. වක්‍රවලය.

ඇලලු = 1. ප්‍රසිඩ දේ.

ඇලවන = 1 ඇලවෙන්නාවූ. 2. (පැත්තකට) නැමෙන්නාවූ.

ඇලවනවා = 1. අලවනවා.

ඇලවුන් = 1. ඇතුන් බඳින කණුව.

ඇලවුම් = 1. ආමන්ත්‍රණය. 2 කථා කිරීම්. 3. ඇතුන් බඳින කණුව. 4. කැඳවීම්.

ඇලහ බඩ = 1. ඇල අසල.

ඇල් = 1. සිසිල්. 2. හිල්. 3. අලුත්. 4. හැල් ගොයම්. 5. ඇල් හාල් හෝ වී.

ඇල් අඹු = 1. සිසිල් දිය.

ඇල් කාණ්ඩය = 1. ඇලේ ඉවුර.

ඇල්කල් = 1. ශීත කාලය.

ඇල් කසඹිලියා = 1. එනම් ඖෂධය.

ඇල් කෙත = 1. ඇල් වී වපුරන බිම 2. ගොඩ කුඹුර.

ඇල් කොකා = 1. කොක්කු වර්ගයක්.

ඇල් කොබොඩි = 1. පක්ෂි විශෙෂයක්. (බට ගොයා)

ඇල් ගෙවී = 1. ශාලි ගෝපිකාව (ඇල් කෙත් රකින්නී)

ඇල් ගෙවිලිය = 1. ඇල් ගොයම් බලා සිටින ස්ත්‍රිය. (ඇල් කෙත් රකින්නී)

ඇල් ගොඩියා = 1. ඇල් හේන් වපුරන්නා

ඇල ගොවු = 1. ශාලි ගෝපකයා (ඇල් කෙත් රකින්නා)

ඇල් දා = 1 ශීතල දවස.

ඇල් දිය = 1. සිහිල් දිය.

ඇල් නල = 1· සිසිල් සුළඟ.

ඇල් පැන් = 1. සිසිල් දිය.

ඇල් බෝ = 1. 'රවි හංස' නම් පක්ෂියා.

ඇල්ම = 1. ආසාව. 2. ඇලුම් කම. 3. ආදරය.

ඇල්මරණවා = 1. උණුවතුර නිවා ගන්නවා.

ඇල්මා = 1. කුඩා උකුණා.

ඇල් මුල් = 1. ඖෂධ වෙසෙසක්.

ඇල්මෙලනවා = 1. වෙන් කරනවා.

ඇල්ල = 1. උස් තැනකින් වතුර ඇද හැලෙන තැන.

ඇල් වතුර = 1. සිහිල් දිය.

ඇල් වැසි = 1. පාණ වැස්ස.

ඇල් වී = 1 ගොඩ ගොවිතැනින් උපදවන වී. 2 ඇල් වර්ගයට අයත් වී.

ඇල් සහල් = 1. ඇල් වී හාල්.

ඇලි = 1. සුදු 2. සමූහය. 3. දිය වැටෙන තැන. 4. ගහ. 5. ලෝහය. 6. සිසිල. 7. අඤ්ජලිය. 8. ඇදය.

ඇලි ඇතා = 1. සුදු පැහැති ඇතා.

ඇලි දුගී = 1 කඳුවලින් දිය ඇද හැලෙන තැන් නිසා යාමට අපහසු තැන්.

ඇලික් = 1. සිතියම. 2· පිංතූරය.

ඇලි කිඹුලා = 1. කිඹුල් වර්ගයක්.

ඇලිය = 1. ආලය.

ඇලි වඳුරා = 1 සුදු පැහැති වඳුරා.

ඇලීම = 1. ඇලෙන බව.

ඇලුණු = 1. ඇලුනා වූ. 2 සැහවුණු.

ඇලුප් = 1. (ආලාපය)වචනය. 2. කුඩා 3· සිහින්. පිංචි.

ඇලුම් = 1. ඇල්ම 2. ආදරය. 3. ආසාව. 4. සෙනෙහස. 5· බණ. 6. සුවඳ.

ඇලෙන = 1. ඇලීම වෙන. 2. බැඳී පවත්නා. 3. නිතර වසන හෝ හැසිරෙණ.

ඇලෙන සුලු = 1. ඇලෙන ගතිය ඇති.

ඇඹ = 1. ඇම. 2. කැම.

ඇවටීම = 1. දූවටීම. 2 පෙරළීම. 3 කරකැවීම.

ඇවරි = 1. (කෙසෙල් කැන් ආදී) පොකුර. 2 ආරක්කු 3. ගොස් රැස්. 4. ආවරණය. 5. ගස් වෙසෙසක්.

ඇවරිකණු = 1. පිදේනි හෝ පහන් තබන කණුව.

ඇවැත් = 1. සුළු වරද. 2. ආපත්තිය. 3. දෝෂ. 4. ආයුෂ්මත්.

ඇවැත්නි = 1. ආයුෂ්මත් තැනැත්තෙනි. 2. පින්වතුනි. 3. භික්ෂූන් වහන්සේට කථා කිරීමට යොදන වචනයක්.

ඇවැතා = (ඇවැත් බලන්න)

ඇවැද = 1. ආපත්තියට පැමිණ.

ඇවැර = 1. වෛරය.

ඇවැස්ස = 1. අවශ්‍ය. 2. ඒකාන්ත. 3 ඉතා සම්බන්ධ. 4. කිට්ටු.

ඇවැස්ස නෑකම = 1 සහ ලේ නෑකම. 2. කිට්ටු නෑකම.

ඇවැස්සී = 1. නෑනා.

ඇවෑම = 1. ගෙවීම. 2. ගතවීම. 3. අපවත්වීම. 4 මරණය.

ඇවෑමෙන් = 1. අභාවයෙන් පසු. 2. අත්වීමෙන් පසු.

ඇවි = 1. ආයුධය.

ඇවිජන = 1. ඇවිදින ; හැසිරෙන.

ඇවිටි = 1. ආවේශ වීම. 2. අතුළුවූ. 3. චුවමනාව 4. ආශාව 5. හුරතල් කරන්නාවූ 6. සමච්චල් කරන්නාවූ.

ඇවිටිල්ල = 1. ඉල්ලා සිටීම. 2. පෙරැත්තය.

ඇවිටි කරනවා = 1. ඉල්ලනවා.

අවිටිය = (ඇවිටුව) ආසාව. 2. ඕනෑකම.

ඇවිටිසල් = 1 කපුරු. 2. වල්.

ඇවිටිලිය = (ඇවිටිල්ල) 1. පෙරැත්ත කිරීම. 2. පෙලඹීම. 3 උත්සාහ කරගෙන යාම

අවිටු = 1. කැමැත්ත. 2. ඕනෑකම.

ඇවිණ = 1. කඩේ. 2. සල්පිල. 3. අමුණනලද.

ඇවිණ දෙර = 1. වෙළෙඳම් පොල. 2. සල්පිල.

ඇවිණ ලකර = 1. අමුණනලද ආභරණය. 2. මුතුවැල. 3. ඇටවැල.

ඇවිණුම - 1. ඇමිණීම.

ඇවිත් = (අවුත්) 1. පැමිණ; ඇවිදින්; අවුදින්.

ඇවිදින = 1. ගමන්කරන. 2. හැසිරෙන.

ඇවිදිලි = (ඇවිදීම්). 1. හැසිරීම්.

ඇවිදු = 1. අවිද්‍යාව.

ඇවිදුනා = 1. හැසිරෙණ.

ඇවිදුවා = 1. කරකවා. 2. සිසාරා.

ඇවිය = 1. පැතුරුණු 2 භූතාදීන්ගේ ආවේශ.

ඇවිරිද්ද = 1. අවුරුද්ද.

ඇවිරි = 1. පැලලි. 2. ආවරණ.

ඇවිරිදි = 1. අවුරුදු ඇති

ඇවිරිල්ල = 1. ඇහිරිල්ල. 2. ආවරණය. 3. බිත්තිය. 4. වැසීම.

ඇවිරීම = 1. වැස්ම. 2. මුවාව. 3 ආවරණය.

ඇවිලි = (ඇවිල්ල) 1. සාපකිරීම. 2. අවැඩ බස්.

ඇවිලි අවනවා = 1. දොස් තබනවා.

ඇවිලිච්ච = 1. ඇවුලුණු. 2. පැවලුණු.

ඇවිලිල්ල = 1 දැම. 2. ශරීරයේ ඇනුමක් වැනි වේදනාව.

ඇවිලිලි = 1. අවුලා ගැනීම. 2. එකතුකර ගැනීම. 3. පටලැවීම. 4. ශරීරයෙහි ඇතිවන දරුණු වේදනාවක්. 5. සිඟාගැනීම.

ඇවිලිලි අහර = 1. සිඟමනෙන් ලැබුණු කෑම.

ඇවිලෙන = 1. දැල්වෙන.; දැවෙන; පත්තු වෙන.

ඇවිස = 1. ඇවිස්සීම. 2. නොසන්සුන් කම. 3. කිපීම. 4. බෙදා. 5. කියා.

ඇවිස්සෙනවා = 1. කලබල වෙනවා. 2. උනන්දුවෙනවා.

ඇවිසී = 1. බෙදූ 2. ආවිෂ්ටවූ.

ඇවිසිනා = 1. බෙදන.

ඇවිසුණු = 1. අවුල්වූ. 2. කලබලවූ. 3. නොසන්සුන්වූ

ඇවිස්නී = 1. බෙදන්නී.

ඇවිළි = 1. ඇවිළුණු. 2. පටලැවුණු.

අවිළිම් = 1. එකතුකිරීම. 2. සිඟමන.

ඇවිළුවූ = 1. පත්තුකළ;. දැල්වූ.

ඇවිණු = 1. ග්‍රන්ථනය කළ. 2. අමිණූ. 3. ගෙතූ.

ඇවීම = 1. ශාපකිරීම.

ඇවුණුම = 1. ගෙතීම. 2. ඇමිණීම.

ඇවුරුම = 1. මුවාව. 2. වැසීම. 3. ආවරණය කිරීම.

ඇවූ = 1. ශාප කළ.

ඇස් = 1. නේත්‍ර. 2. අක්ෂය. 3. කඳුළු. 4. සිදුර. 5. කොන් ඇති. 6. බෙර-ආදියෙහි මුහුණ. 7. පැළ නොවන.

ඇස් ඇඳිරිය = 1. ඇස් අඳුර.

ඇස් කණ්ණාඩි = 1. ඇහේ දමන කන්නාඩි.

ඇස්කන් පාවේ = 1. අඳුරු වැටෙන්නට කලින්. 2. රෑ බෝවන්ට කලින්.

ඇස් කබ = 1. ඇස් වලින් වැගිරෙන මල.

ඇස් කිසි - 1. උසාවියෙන් කරන නියෝග විශේෂයක්.

ඇස් කුලී = 1. නැතිවූ වස්තුවක් සොයා දුන් අයට ගෙවන කුලී.

ඇස් කෙළි = 1. ඇසට පෙණෙන තරම් දුර.

ඇස් කොළ = 1. බුලත් හුරුල්ලෙහි උඩින් තබන ලොකු බුලත් කොළය.

ඇස් ගහනවා = 1. බලනවා. 2. හොරෙන් බලනවා.

ඇස් ගුල්ලා = 1. පලා පණුවා. 2. සපි විශේෂයක්.

ඇස් ගුළිය = 1. ඇස් ගෙඩිය.

ඇස් පිඟිනි = 1. ඇස් ගුළිය.

ඇස් නාඩසේය = 1. ඇස් නැතිවූ බව.

ඇස් කසිලම = 1. ඇස් අඳුන.

ඇස්ත මේන්තු = 1. යම් වැඩකට මෙතෙක් වැයවේයයි කලින් ගණන් දෙන ගණන.

ඇස්කරුක්ක = 1. ලියවිල්ලක පිට පත. 2. තොරතුරු විස්තරය.

ඇස් දහර = (ඇස් දුර) 1. කඳුළු (නේත්‍රාම්බු.)

ඇස් දහස් = 1. ශක්‍රයා; ඉන්ද්‍රදේවයා.

ඇස් දූ = 1. ඇසෙහි දූහය.

ඇස් දූල් = 1. ශක්‍රයා.

ඇස් දිෂ්ටිය = 1. මසැසට පෙණෙන තෙක් මානය.

ඇස් පත් = 1. ඇස් කණ්ණාඩිවල වීදුරු. 2. අන්ධයා.

ඇස් පත = 1. යතුරු කඩ වැස්ම.

ඇස් පන් = 1. අන්ධයා. 2. කණා.

ඇස් පදමා = 1. කණා.

ඇස් පිය = (ඇසිපිය) 1. ඇස්හි තිබෙන උඩු-යටි පියන්.

ඇස් පිය ගහනවා = 1. ඇස් පිහාටු ගහනවා 2. ඇසිපිය හෙළනවා.

ඇස්නි = 1. ඇස් කොණින් බැලීම. 2. අපාංග දර්ශනය. (කටාක්ෂය.)

ඇස්පිල් = 1. මොනරුන් ගේ සඳැස් පිල්; ඇස් වැනි ලකුණු ඇති මොනර පිහාටු.

ඇස් පිහාටුව = 1. ඇස් පිහාටුව. 2. ඇසේ වැස්ම.

ඇස්පොල = 1. ඇසේ සෑදෙන රෝගයක්. 2. මල්පොල. 3. ඇසේ සලකුණු.

ඇස් බැන්දුම = 1. මායා ශාස්ත්‍රය 2. ඉන්ද්‍ර-ජාලම. 3. විජ්ජාව.

ඇස්බැම = 1. ඇසට උඩින් ලොමින් වැසුණු. කොටස.

ඇස්මුසුව = 1. පහන; ප්‍රදීපය.

ඇස් මොරය = 1. ඇස් ගුළිය.

ඇස් රුඳුම = 1. ඇස් රදය; ඇසේ වේදනාව.

ඇස්රෝ = 1. ඇස් රෝගය.

ඇස්ව = 1. කාමාදි ආශ්‍රව.

ඇස්වඩය = 1. කකුලේ විලුඹට උඩ හන්දිය අසල ඇටය.

ඇස්වට්ටිය = 1. සිදුරු සහිත වට්ටිය.

ඇස්වතුර = ඇස් රෝගීන්ගේ ඇස්වලට දමන බේත් වතුර.

ඇස්වර = 1. ක්ෂණය. 2. ඇසිපිය හෙළන තරම් සුළු කාලය.

ඇස් වහ වතුර = 1. ඇස් වහ දෙසට මතුරන පැන්.

ඇස්වළ = 1. ඇස පිහිටි වළ.

ඇස් වහ = 1. විපත් ගෙන දෙන බැල්ම. 2. අනතුරු දායක බැල්ම.

ඇස් වහගන්නවා = 1. ඇස් පියාගන්නවා. 2. විපත් ගෙනදෙන ලෙස බැලුම් හෙළනවා.

ඇස්වැද්දුම = (අස්වැද්දීම) 1. ගොවිතැන් කරවීම. 2. කුඹුරු ගොවිතැන.

ඇස් වෙදා = 1. ඇස් ලෙඩට පිළියම් කරන්නා.

ඇස් වෙනවා = 1. දළු දමනවා. 2. ඉකිරි අදිනවා. 3. ඇහිරෙනවා.

ඇස්ස = 1. කුරුම්බාවක නැට්ට ළඟින් කපන කොටස. 2. පොල් ගෙඩියේ ඇස් තිබෙන පැත්තෙන් කපන කුඩා කොටස.

ඇස්සගල = 1. ඇස්දෙක.

ඇස් සමුවෙහි = (ඇස් හමුවෙහි) 1. ඇස් ඉදිරියේ. 2. අභිමුඛයෙහි. 3. එළි පිටම.

ඇස් සහස් = 1. ශක්‍රයා.

ඇස්සුනු = (ඇස්වුණු) 1 ඇහුරුණු 2. වැසුණු.

ඇස් සයන = 1. ඇස් ඇදගන්නා.

ඇස = 1. ඇනෑ. 2. කපා. 3. සිඳ. 4. සිදුර. 5. කඳුළු. 6 බෙර ආදියෙහි මුහුණ.

ඇස කරනවා = 1. වඳ කරනවා.

ඇසතු = 1. ඇසතු (අශ්වත්ථ) 2. ඇහැටු ගස.

ඇසළ = (ඇහැළ) 1. එනම් ගස් වර්ගය. 2. එනම් මාසය.

ඈසල කලා = 1. ඊශ්වරයා.

ඈසල කෙළි = 1. එකම ක්‍රීඩාව. 2. සැණ කෙළි වෙසෙසක්.

ඈසල පැණි = 1. පැණි වෙසෙසක්.

ඈසල පෙරහැර = 1. ඈසල මාසයෙහි පැවැත්වෙන පෙරහැර. 2. (දළදා කරඬුව වඩමවන) නුවර පෙරහැර.

ඈසා = 1. ඈහැවූ. 2. නරක්වූ.

ඈසි = 1. ඇස. 2. පාර්ශ්වය. 3 පොල් ගෙඩියෙහි ඇස් තිබෙන පැත්ත. 4 ඇස්ස. 5. ශ්‍රවණය කළ.

ඈසිකිණි = 1. ඇස් ගුළිය. 2. කළු ඉංගිරියාව. 3. මස් දළු (අර්බුද) වැනි ඇස් ලෙඩක්.

ඈසින් = 1. පුරුදුකළ. 2. නුලෙත්.

ඈසිපිය = 1. ඇසෙහි පියන්. 2. ඇස් පිහාටු.

ඈසිපිය හෙළනවා = 1. ඇස් පිහාටු ගසනවා.

ඈසිය = 1. අසන්නට. 2. විචාරන්නට.

ඈසියවි = (ඈසිය + අවි) 1. අසන්නට කැමැති.

ඈසියා = (අසියා - ඈසි - අසි) 1. සර්පයා 2. සතුරා.

ඈසිරි = 1. ආශ්චර්යයි. 2. ආශ්‍රිත 3. පුදුම දේ.

ඈසිරු = (ඈසිර) 1 එක්සත්වූ. 2. (සතුරු රජුන්ගෙන් පීඩා ඇති කල්හි බලවත් රජුන් සේවනය කිරීමවන) ආශ්‍රය නම් රාජ ගුණය. 3. ආශ්‍රය කළ.

ඈසිරවීම = 1. ඈහිරීම. 2. හැසිරවීම. 3. පිළියෙළ කරවීම.

ඈසිරුණු = 1. හැසුරුණු.

ඈසිරෙන = 1. ආශ්‍රය කරන.

ඈසිල්ල = 1. මොහොත. 2. ඇසි පිය හෙළන තරම් ඉතා සුළු කාලය. 3. ක්ෂණය. 4. අසුරු ගසන තරම් සුළු වේලාව.

ඈසිල්ලෙන් ඈසිල්ල = 1. විටින් විට. 2. වරින්වර. 3. මොහොතින් මොහොත.

ඈසිලි = 1. ඇසීම. 2. සුළු කාලය 3. ක්ෂණය.

ඈසිවස් = (ඈසිවැස) 1. ආශීර්විෂයා. 2. සර්පයා. 3. නයා.

ඈසීම් = 1. ශ්‍රවණය කිරීම්. 2. ඈසුම්. 3. ප්‍රශ්න කිරීම්.

ඈසුරු = 2. ආශ්‍රය කළ. 2. තියුණු (මුවහත්.)

ඈසුරු කරනවා = 1. ආශ්‍රය කරනවා. 2. සේවනය කරනවා.

ඈසුම = 1. ආදි සුබය. 2. ඈසුවොත්.

ඈසූ = 1. ශ්‍රවණය කළ. 2. විචාළ. 3. ප්‍රශ්නකළ.

ඈසූපිරූ = (ඇසූ පිරිවූ) 1. ශ්‍රවණය කොට ධාරණය කොටගත්. 2. ශ්‍රවණය කරපාඩම් කළ. 3. අසා පාඩම් කළ.

ඈසූවිරූ = 1. අසා පුරුදු 2. පෙර ඇසූ.

ඈසෙනවා = 1. අසන්නට ලැබෙනවා.

ඈසේවල = 1. (ඈස් වල බලන්න)

ඈසෙස් = 1. සියල්ල.

ඈසෙල් = 1. ඇහැළ ගස.

ඈහෑ = 1. ඇස. 2. සිදුර. 3. දැල. 4. දැල් තච්ච. 5. ඈහිරීම.

ඈහෑ ඈරෙනවා = 1. (නින්දෙන්) පිබිදෙනවා. 2. අවදි වෙනවා.

ඈහැ කරනවා = 1. වද කරනවා.

ඈහැකන් පාමේ = 1. අඳුරු වැටෙන්නට පළමු. 2. ඇහැ පෙණෙන වෙලාවේ.

ඈහැකි = 1. හැකි; පුළුවන්.

ඈහැටු = (ඇසටු බලන්න).

ඈහැඹුල්ලා = 1. සර්ප විශේෂයක්.

ඈහැඹුලා = 1. සර්ප වර්ගයක්.

ඈහැලි = 1. සිංහල කාව්‍ය බන්ධනයෙහි වෘත්තයක්.

ඈහැල්ල = 1. සිත් පිනවීම.

ඈහැල්ලි = 1. සිත් පිනවන්නී.

ඈහිඳිනවා = 1. අවුලා ගන්නවා.

ඈහිපිල්ල = 1. ආවරණය. 2. සිදුරු ඇති තැන් වැසීම.

ඈහීම = 1. ශ්‍රවණය කිරීම. 2. ප්‍රශ්න කිරීම.

ඈහුම්කන් දීම = 1. අසා සිටීම. 2. ඇසීමට කන් යොමු කිරීම.

ඈහුරුම් පැවතුම්කම = 1. සුරක්ෂිත ගතිය. 2. සුවිනීත ගතිය.

ඇල = 1. පැත්ත. 2. පැත්තකට හැමුණු. 3. ඔය.

ඇල ඇමය = 1. ඉල ඇටය.

ඇලපත = (ඇලය) 1. ශරීරයේ පැත්ත.

ඇලක් = 1. පාර්ශ්වය. 2. පැත්ත.

ඇලලනවා = 1. වතුර පාරක් ඇති කරනවා.

ඇලලු = 1. ආලෝලනය කළ 2. කැලඹු.

ඇලඹුන = 1. අලි බඳින කණුව.

ඇලඹුම = 1. අඩ ගැසීම. 2. කැඳවීම.

ඇළි = 1. සුදු. 2. ලෝහය. 3. ඇළු. 4. ආශාව.

ඇළි ඇතා = 1. සුදු ඇතා.

ඇළි මිනිහා = 1. හම සුදුවූ මිනිහා.

ඇළි වඳුරා = 1. සුදු වඳුරු වෙසෙසක්.

ඇළිනා = 1. සායම් ගාන්නන්ගේ ප්‍රධානයා.

ඈ

ඈ = 1. ඇයන්නෙහි දීඝී සවරූපය. 2. ආදිය. 3 කබැල්ලෑවා 4. 'උඟ' නම් සජී නාමයේ ස්ත්‍රී ලිඞ්ගික වචනය. 5. ආයසීයා. 6. ආඥාව. 7. ආදි (කාල) ය. 8. ඒ ස්ත්‍රී. 9. යම්කිසි කොටසක් කියා සෙස්ස ඉතිරි බැව් දක්වීමට යොදන නිපාතයක්.

ඈකාන්සාව = 1. ඇහැකන්සා රෝගය

ඈඟි = 1. ආකාර. 2. සමාන. 3. ආදි ආකාර.

ඈගුල් = 1. කබැල්ලෑවාගේ බෙන.

ඈත = 1. එපිට. 2. වැසූ අත 3. හැකුලූ අත. 4. මිට. 5. ඒ අත (ඒ පැත්ත).

ඈනවිලි = (ඇනීම්-ඇනුම්) 1. ඇනුම් ඇරීම. (කට ඇර වාතය ගැනීම).

ඈඳනවා = 1. එකකට එකක් සම්බන්ධකරනවා. 2. එකට යාකරනවා.

ඈඳි ගැනීම = 1. කිඳ ගැනීම. 2. වාඩිවීම.

ඈඳි = 1. හැකිල්ල. 2. දම්වැල 3. බැඳි. 4. ඈඳු 5. එකට ගැලපීම.

ඈඳිය = 1. අලින් බඳින දම්වැල.

ඈඳුන්න = 1. ආඳන ලද දෙක හෝ දෙදෙන.

ඈඹුරු = 1. හුවඳ පැලෑටි වර්ගයක්.

ඈපා = 1. රජ බව හිමි කුමාරයා 2. ආදි පාදයා. 3. දෙන් පිලිප් ද සිල්වා ඈපා අප්පුහාමි. ජ්‍යොතිශ්ශාස්ත්‍රඥයෙකි. ඈපා පංචාංග ලියෝ ආරම්භක කර්තෘවරයාය.

ඈපා කල් = 1. ආදි පාද කාලය; කුමාරව සිටි කාලය.

ඈපනා දඩු = 1. කොස් වර්ගයක්.

ඈසොකු = කබල්ලෑ පොතු.

ඈයා = 1. කබැල්ලෑවා.

ඈයකි = 1. අයිති දෙය.

ඈරීම = 1. ස්ථූල වීම; මහත්වීම.

ඈලිය = 1. ඔසු වෙසෙසක්.

ඈලියා = 1. අජීර්ණ රෝගයක්. 2. විනාශය.

ඈලියාව = 1. කැදර කම. 2. මජරකම.

ඈලියාවා = 1. කැදරයා.

ඈවරයි = 1. (වෙත්දේසියේ ගණන නිස්චූ කරන්නට කලින් කියන වචනයක්) එක වරයි.

ඈසා = 1. ඇහැවූ. 2. පැළ නොවන 3. තරක්වූ.

ඉ

ඉ = 1. ඉතා. 2. බොහෝ. 3. අති යන උපසර්ගයෙහි සිංහල රූපයක්. 4 කාම දෙවියා.

ඉක් = 1 උක් ගස් 2. රසාල.

ඉක්කා පතුර = 1. හතස්සේ බූවල්ල සවි වන කොටස.

ඉක්කාව = 1. ඉක්කා ගැසීම.

ඉක්බිති = 1. එවිට. 2. ඉන්පසු. 3. ඊ ළඟට. 4. දෙවනු.

ඉක්ම = 1. පසු කිරීම 2. පැරදවීම. 3. හොස් 4. පනුවී.

ඉක්මන = 1. හදිස්සිය. 2. කඩිනම. 3. පමා නොවීම. 4. වේගය.

ඉක්මවනවා = 1. පසුකර යනවා. 2. ප්‍රමාණයෙන් පිට යනවා.

ඉක්ෂ්වාකු වංශය = 1. ඔක්කාක වංශය. 2. සූර්‍ය වංශය.

ඉක්ෂු = (ඉක්‍ෂුක) 1. උක්ගස.

ඉක්ෂු විකාර = 1. උක්සකුරු. 2. උක්සිනි.

ඉක්ෂු ගන්ධ = 1. ගොකටු.

ඉක්ෂු මේහය = 1. දියවැඩියාව.

ඉකෑවූ = 1. උකාගත්. 2. ඇදගත්. 3. උඩරණය කළ.

ඉකි = 1. ඉක්කා; හික්කා. 2. ශෝකය නිසා මුවින් නිකුත්වන හඬ.

ඉකිත = 1. අතික්‍රමණය කළ.

ඉකි ගැසීම = (ඉකිබිඳීම) 1. 'ඉකි' යන හඬ නැගීම. 2. ශෝකය නිසා මුවින් 'ඉකි' යන හඬ නගමින් හැඬීම.

ඉකිණි = 1. උකුණාගේ ගැණු සතා.

ඉකිරි = 1. නීරමුල්ලිය ගස්. 2. පැලෑටි වෙසෙසක්.

ඉකිරිය = 1. රිකිල්ල. 2. අංකුර.

ඉකිරියා = 1. මාළු වර්ගයක්.

ඉකිළිය = 1. උකුල. 2. කලවයෙහි මුල. 3. භාජනය. 4. දියේ සැදෙන ගස් වර්ගයක්. 5. බෙර වෙසෙසක්.

ඉකුළ = 1. භාජනයක්.

ඉකුත් = 1. පසුගිය. 2. මැරුණු.

ඉකුත් කල් = 1. අතීත කාලය.

ඉකුත් දා = 1. ඊයේ.

ඉකුත් දෑ = 1. පසුගිය ජන්මය; පූර්ව ජාතිය.

ඉකුත්ව = 1. අතික්‍රාන්තව. (පසුව)

ඉකුත්වත් = 1. අතීත කථාව 2. පසුගිය ජාතියේ කථාව.

ඉකුත්වූ = 1. ඉක්මගිය. 2. පසුගිය. 3. මැරුණු.

ඉකුත් වෙනවා = 1. පසු වෙනවා. 2. මැරෙණවා.

ඉකුත් සයුරු = 1. සාගරය ඉක්ම වූ.

ඉකුත = 1. ඉක්මවූවොත්.

ඉකුම් = 1. ඉක්මීම.

ඉකොන = 1. උතන. (දිය ඇතුල්වන)

ඉගන ගන්නවා = (ඉගෙන ගන්නවා) 1. යමක් කිරීමට දැන ගන්නවා. 2. ශාස්ත්‍රය හදාරණවා. 3. පාඩම් කරනවා.

ඉගිල්ලීම් = 1. උඩරණය. 2. උඩට ඇදීම. 3. අස්ව යාම.

ඉගිළි වූ = 1. පනකළ. 2. උගුල්ලන ලද.

ඉගිළීම් = 1. පනවීම්. 2. උඩට නැගීම්. 3. වෙන්වීම්.

ඉගු = 1. උක්. 2. රසාල. 3. ශීඝ්‍ර.

ඉගුදුනු = 1. උක් දුන්න. 2. අනංගයා

ඉගුසැවු = 1. අනංගයා.

ඉගු සැවුගුරු = 1. අනංගයාගේ පියා. 2. විෂ්ණු.

ඉංගිතය= 1. ලකුණ 2. අදහස. 3. ඇනුම් පදය.

ඉංගිරිශාව = 1. ඇසේ කළු හෝ සුදු ඉංගිරියාව.

ඉංග්‍රිසි = 1. එනම් ජාතිය. 2 එනම් භාෂාව.

ඉගිලෙනවා = 1. පියාසර කරනවා. 2. අහසින් යනවා.

ඉගිල්ලෙනවා = 1. පියාසර කරනවා. 2. (පතුරුමෙන්) ගැලවෙනවා. 3. (මුලින්) ඉදිරෙනවා.

ඉඟ = 1. ඉඟටිය. 2. ඉන වටය.

ඉඟි = 1. අභිප්‍රාය. 2. අදහස. 3. ඉඟි කිරීම. 4. බැම නැටවීම. 5. සංඥව.

ඉඟි කරනවා = (ඉඟිමරණවා.) 1. ලකුණක් කර දන්වනවා. 2. බැම නැටවීම් ආදියෙන් අදහස දන්වනවා.

ඉඟිබරුව = 1. ඇස් කොණකින් බැලීම. 2. බැම නටවමින්.

ඉඟිනි = 1. එනම් ගස්. 2. ජලය පිරිසිදු කිරීමට යොදන එනම් ඇට.

ඉඟිත = (ඉඟිතත්) 1. ලකුණ. 2. ඇනුම් පදය.

ඉඟිය = 1. අදහස. 2. ලකුණකින් දැන්වීම.

ඉඟිරිශාව = 1. ඇස් ගෝලය.

ඉඟිලැස් = 1. අනුරාගය. 2. ස්නේහය. 3. ආදරය.

ඉඟිලි මල = 1. පාෂ යෂ්ටි. 2. මල පුබු සහිත රිට.

ඉඟු = 1. උක්ගස. 2. සුරි 3. ඉක්මන්.

ඉඟුරා = 1. එනම් කුඩා මාළුවා.

ඉඟුරු = 1. බෙහෙතට ගන්නා එනම් අල.

ඉඟුරු දොසි = 1. සීනි ආදිය මිශ්‍රකොට දොසි වර්ගයක් මෙන් සකස් කළ ඉඟුරු.

ඉඟුරු පියලි = 1. එනම් ඔසු වෙනෙස.

ඉඟුල් = 1. සාදිලිංගම්; හිඟුල්.

ඉඟුල් පත් = 1. ඉඟුල් ගෑ කොළය.

ඉඟුල්පළු = (ඉඟුල්පත්)

ඉච්චාව = 1. රුවටිල්ල 2. බොරු වර්ණනාව.

ඉච්චිසා = 1. තද මසුරු මිනිහා.

ඉච්ඡා = 1. රුචිය; ආශාව 2. කැමැත්ත.

ඉච්ඡාචාර = 1. කැමති සේ හැසිරෙන. 2. ආශාවන්ගෙන් පිරුණු.

ඉච්ඡාදන් = 1 යාචකයන් ගේ සිත් පුරා දෙන දානය.

ඉච්ඡාපර = 1. ඉච්ඡාවට යටත්.

ඉච්ඡා රෝග = 1. ආශාව නමැති ලෙඩේ.

ඉච්ඡාවතී = 1. ආශා ඇත්තී. 2. කාමුක ස්ත්‍රී.

ඉච්ඡා විඝාතය = 1. ආශාව විනාශ කිරීම.

ඉච්ඡානුරූප = 1. කැමැත්ත අනුව; රුචියට ගැලපෙන.

ඉච්ඡිත = 1. රුචිකළ. 2. කැමැති වූ.

ඉච්ඡිතබ්බ = 1. කැමති විය යුත්ත.

ඉජ්ජාව = 1 පූජාව. 2. දානය. 3. එක්සත් වීම.

ඉජ්ඣෝරුවා = 1. ශාස්ත්‍රානුකූලව කර්මාන්ත පිළිබඳ අවබෝධයක් ඇත්තා. 2. ශිල්පයෙහි විශෙෂඥයා.

ඉඥයා = 1. ගුරුවරයා 2. බුදු හාමුදුරුවෝ.

ඉජින = 1. සමෘද්ධ වන්නාවූ.

ඉජිය = 1. ඉදින්; ඉතින්.

ඉජ්‍යා = 1. යාගය. 2. දානය. 3. සඞ්ගමය.

ඉඤ්චි කුලම්බු = 1. ඉඟුරු යුෂ ආදිය මිශ්‍රකොට සාදනු ලබන බෙහෙතක්.

ඉඤ්ජන = 1. කම්පාවීම.

ඉඤ්ජිත = 1. කම්පාව. 2. හෙල්ලීම.

ඉඤ්ජිත = 1. කම්පාවූ 2. හෙල්ලුණු.

ඉඤ්ජු = 1. බල්ලන්ට ආදර වශයෙන් අමතන වචනයක්.

ඉට = 1. ප්‍රිය වූ. 2. යහපත් වූ. 3. ඉෂ්ට වූ.

ඉටන් = 1. අධිෂ්ඨානය. 2. තමන් කැමැති ලෙස වේවායි සිතීම.

ඉටනා = 1. තදින් අදහස් කර ගැනීම.

ඉටම්මා = 1. පැතීම. 2. මෙසේ වේවායි සිතීම.

ඉට මිතුරා = 1. යහපත් මිත්‍රයා. 2. හිත මිතුරා. 3. කල්‍යාණ මිත්‍රයා.

ඉටා = 1. අධිෂ්ඨාන කොට. 2. මෙසේ වේවයි පතා.

ඉටානිටු = 1. ඉෂ්ටානිෂ්ට. 2. හොඳ නොහොඳ.

ඉටා සමාධිව = 1. ඉතා සතුටුව.

ඉට්ටකය = 1. උළු.

ඉට්ඨම = 1. නිදහස් කිරීම.

ඉටි = 1. ඇලෙවෙන ද්‍රව්‍යයක්. 2. දෙබර - බඹර - කනවේ - දඬුවැල් බෑ යන මෙයින් හෝ හොර - කැකුණ ගස් ආදියෙන් හෝ ලැබෙන ලාටු.

ඉටි ගේ = 1. ඉටි රෙද්දෙන් කළ ගේ (ඉටි රෙදි කූඩාරම)

ඉටිපඳමට = 1. අතේ ඇලෙන පමණට.

ඉටිපන්දම් = 1. ඉටියෙන් කළ විලක්කු.

ඉටි රූපය = 1. ඉටි පිළිමය.

ඉටිරෙද්ද = 1. ඉටි ගෑ වස්ත්‍ර.

ඉටිසෝරු = 1. කඩ චෝරු. 2. ඉඳුල් ආහාර; ඉටි චෝරු.

ඉටි හකුරු = 1. සකවූ පැණි; ලාටු තරමට උණුවූ පැණි.

ඉටිම් = (ඉටුම්) 1. අධිෂ්ඨානය. 2. ප්‍රාර්ථනාව.

ඉටු = 1. ශුභ. 2. මඟුල. 3, යහපත්. 4. ඉෂ්ට. 5. ආශාවූ. 6. රිසි ලෙස වේවායි පැතූ.

ඉටු අත් = 1. ඉෂ්ටාර්ථය. 2. කැමැති කරුණ.

ඉටු අනිටු = 1. හොඳ නරක 2. ඉෂ්ටානිෂ්ට.

ඉටු ඇවිටු = 1. යහපත් ලෙස ආශාකරන.

ඉටුකරනවා = 1. ඉෂ්ටකරනවා 2. සිදු කරනවා. 3. සලස්වනවා.

ඉටුදෙවියා = 1. ආරක්ෂා කරන දෙවියා. 2. තම දියුණුව සලස්වනැයි අදහන දෙවියා.

ඉටුම = 1. අධිෂ්ඨානය.

ඉඹුරු මිතුරු = 1 යහපත් මිත්‍ර. 2. කල්‍යාණ මිත්‍ර. 3. හිත මිත්‍ර.

ඉඹුලයෝන් = හොඳ අකුරු ජාති.

ඉම්බි = 1. තෝමරය. 2. ලංසය.

ඉෂ්ට = 1. මනොඥවූ. 2. සිතට ප්‍රිය වූ.

ඉෂ්ටකා = (ඉටිකා) 1. උළු. 2. ගඩොල්.

ඉඩ = 1. අවකාශය. 2. අවස්ථාව. 3. වාරය.

ඉඩ අරිනවා = 1. ඉඩ දෙනවා. 2. අවකාශ දෙනවා.

ඉඩකඩ = 1. අවකාශ (ඉඩ පාඩු)

ඉඩකඩම් = 1. වතු පිටි. 2. වතු කුඹුරු. 3. ගෙවල් වතු ආදිය.

ඉඩගය = 1. වම් නාසා සිදුර.

ඉඩපාඩුව = 1. ඉඩකඩ. 2. අවකාශය.

ඉඩ ප්‍රස්තාව = 1. යමක් කිරීමට ලැබෙන පහසුව.

ඉඩම = 1. වත්ත.

ඉඩමගාවක් = 1. ඉඩක්; අවකාශයක්.

ඉඩවර = (ඉඩෝර) 1. නියඟ. 2. වැස්ස නැති කාලය.

ඉඩවාඩ = 1. අවකාශය.

ඉඩහ = 1. වම් නාසා පුඩුව.

ඉඩා = 1 වම් නාසා සිදුරෙහි පවත්නා වාතය.

ඉඩිත්තු = කලබල. 2. කුපිත. 3. බියපත්.

ඉඩිප්ප = 1. ජාලපූප. 2. ඉඳි ආප්ප.

ඉඬ = 1. අවකාශය.

ඉඩිත්ති = 1. බෙර වෙසෙසක්.

ඉඩෝර = (ඉඩවර බලන්න)

ඉඩොක් = 1. ගමයන් ගේ දණිස් ඇටය.

ඉඩොක් කෙළි = 1. ඉඩොක්කයෙන් කරන සෙල්ලම.

ඉණ = 1. ඉඟටිය.

ඉණංග = 1. සුදුසු. 2. ප්‍රමාණ වලින් ගැළපෙන.

ඉණ ඉණ = 1. ඇඳි පැළඳි දේ. 2. ඇඟෙහි තිබෙන වස්තුව.

ඉණකඩ = 1. අඳින ඇඳුම. 2. රෙද්ද.

ඉණ කිලුටු වීම = 1. මැස් ශුද්ධිය.

ඉණගහණ = 1. ණය ගැනීම.

ඉණක්කරනවා = (එත්තක් කරනවා) 1. රෝග වැළැක්වීමට ශරීරයට බෙහෙත් විදිනවා.

ඉණම = 1. අඩු ජන්මය.

ඉණබු = 1. මිදුල.

ඉණසැඳ = 1. (යුධයෙහි) ඉන වසා බඳින සන්නාහය. (ඉනහඳ) 2. නටන්නන් ඉනවට බඳින රැලි පටි.

ඉණහැඳේ = 1. රා මදින්නන් ඉනවට බඳින කැති මල්ල.

ඉන් = 1. එයින්.

ඉන්ගෙන් = 1. කැමැත්තෙන්.

ඉන් අණිද්ද = (ඊන් අනිද්ද) 1. අදින් තුන් වැනි දින. 2. අනිද්දට පසුවද.

ඉන්ගම = (ඉන් ගත්) 1. මාගිම් ආදිය.

ඉන්නැන් = 1. උපකාර භාජනය.

ඉන්නිස් = 1. (මුහුනීග) මොහොත.

ඉන්ද = 1. අධිපතියා. 2. ප්‍රධානයා. 3. ශක්‍රයා.

ඉන්දබිල = 1. එළිපත්ත.

ඉන්ද බන්ධු = 1. දේ දුන්න.

ඉන්දනීල = 1. නිල් මැණික.

ඉන්දයව = 1. කෙළිඳසාල්.

ඉන්දවනවා = 1. වාඩි කරනවා 2. සිටුවනවා. 3. තබනවා.

ඉන්දවාරුණි = 1. නියඹරා.

ඉන්දසාල = 1. ඉඳු සල්ගස.

ඉන්දියාව = 1. එනම් රට.

ඉන්දිර = 1. බමරා.

ඉන්දීවර = 1. නිල්මානෙල්. 2. හාතාවාරිය. 3. ඇසළ ගස.

ඉන්දු = 1. චන්ද්‍රයා.

ඉන්දු කාන්තිය = 1. සඳ එළිය.

ඉන්දු විනාශ = 1. එනම් රට.

ඉන්ද්‍ර ජාල = 1. ඉන්ද්‍රජාලය. 2. විජ්ජාව. ඇස්බැන්දුම. 4. මායාව.

ඉන්ද්‍රජාලික = 1. විජ්ජාකාරයා. 2. මායාකාරයා.

ඉන්ද්‍ර පුත්‍රයා = 1. චන්ද්‍රයාගේ පුතා. 2. බුදහු.

ඉන්ද්‍ර = 1. ශක්‍රයා 2. ඉන්ද්‍ර දෙවි. 3. ප්‍රධානයා.

ඉන්ද්‍ර අග්නි = 1. හෙන ගින්න.

ඉන්ද්‍ර අරි = 1. අසුරයා.

ඉන්ද්‍ර ආයුධ = 1. දෙව් දුන්න.

ඉන්ද්‍ර කාන්ත = 1. දෙට නැකත 2. චන්ද්‍රකාන්ත මාණික්‍යය.

ඉන්ද්‍රකීල = (ඉන්ද්‍රඛීල) 1. මන්දර පර්වතය. 2. එළිපත්ත. 3 මායිම් කණුව. 4. නුවර දොරටුව ඉදිරියෙහි සිටුවූ ශක්තිමත් කණුව.

ඉන්ද්‍ර ගුරුළුඩ = 1. ගණිත ක්‍රමයක්.

ඉන්ද්‍ර ගෝප = (ඉන්ද්‍ර ගෝපක) 1. රැ බදුල්ලා. 2. කතමැදිරියා.

ඉන්ද්‍ර චාප = 1. දේ දුන්න.

ඉන්ද්‍ර ජාක = 1. මහ සයුර.

ඉන්ද්‍ර ජාලා = (ඉන්ද්‍ර ජාල බලන්න.)

ඉන්ද්‍ර ජාලික = (ඉන්ද්‍ර ජාලික බලන්න)

ඉන්ද්‍ර ජාල යණ්ඩය = 1. විජ්ජාකාරයා ගේ කෝටුව.

ඉන්ද්‍ර ජිත් = 1. පෙරදිග ජයගත්? 2. රාම-රාවණ යුද්ධයෙහි යෙදුණු වීරයෙක්.

ඉන්ද්‍රත්ව = 1. ප්‍රධානත්වය. 2. අධිපතිකම.

ඉන්ද්‍ර දිශ = 1 ඉන්ද්‍ර දෙවියා ගේ පාලනයට අයත් දිසාව. 2. නැගෙනහිර.

ඉන්ද්‍ර ධනු = 1. ඉන්ද්‍රදෙවියාගේ දුන්න 2. දෙව්දුන්න.

ඉන්ද්‍ර නීලමාණික්‍යය = 1. කිරෙහි ලූ විට කිරි ද නිල්වන් කරන මැණික.

ඉන්ද්‍ර පුර = 1. තව්තිසා දෙව්ලොව. 2. ශක්‍රපුරය.

ඉන්ද්‍ර බීජ = 1. කෙළිඳ සහල්.

ඉන්ද්‍රමන්ත්‍රී = 1. වෘහස්පති.

ඉන්ද්‍ර බෝලි = 1. කුඹුක් ගස.

ඉන්ද්‍ර ලුප්ත = 1. ඔලුවේ ඉස කෙස් නැතිකම. 2. උඩු ගොච්වන් ඉසකේ කැම.

ඉන්ද්‍ර ලුප්තකයා = 1. උඩුගොච්වා.

ඉන්ද්‍රවල්ලි = 1. පෙතෙලවැල්. 2. තෙලනිටුල්. 3. යක්කොමඩු.

ඉන්ද්‍රවජ්‍ර = 1. ශක්‍රයාගේ විදුරුවිය. 2. හෙනය.

ඉන්ද්‍ර වජ්‍රා = 1. මාත්‍රා එකොළසකින් යුත් කවි පදය. 2. (වෘත්තයක්.)

ඉන්ද්‍ර වංශා = 1. මාත්‍රා දොළසකින් යුත් කවිපදය (වෘත්තයක්.)

ඉන්ද්‍ර වස්ති = 1. කෙණ්ඩාවෙහි මැද කොටස.

ඉන්ද්‍ර වෘක්ෂ = 1. කෙළිඳ ගස් වෙසෙසක්.

ඉන්ද්‍ර වාණි = 1. ශක්‍රයාගේ දේවිය.

ඉන්ද්‍ර වාරුණී = 1. තිඹරා.

ඉන්ද්‍ර සාල = 1. ඉඳුසල් ගස.

ඉන්ද්‍ර ශත්‍රු = 1. වෘත්‍ර නම් අසුරයා

ඉන්ද්‍රාණී = 1. ඉන්ද්‍ර දෙවියාගේ භාර්යාව. 2. ශක්‍ර ප්‍රියාව. 3. පුරාණ වස්ත්‍ර වර්ගයක්.

ඉන්ද්‍රායුධය = 1. ඉන්ද්‍ර දෙවියාගේ ආයුධය. 2. වජ්‍රායුධය. 3. හෙන පහර.

ඉන්ද්‍රිය = 1. දැනීම ලැබීමට උපකාර වන ශරීර අවයවයක්.

ඉන්ද්‍රිය කාර්‍යය = 1. ඉන්ද්‍රිය ක්‍රියා කිරීම.

ඉන්ද්‍රිය ගෝචර = 1. ඉන්ද්‍රියයන්ට අරමුණුවන. 2. දැනෙන

ඉන්ද්‍රිය ඥාන = 1. දැනීම.

ඉන්ද්‍රිය ක්ෂීණය = 1. ඉඳුරන් පිහවීම.

ඉන්ද්‍රිය දමනය = 1. ඉඳුරන් හික්මවීම. ඉඳුරන් මැඩපැවැත්වීම.

ඉන්ද්‍රිය පරිපාක = 1. ශ්‍රධාදී ඉන්ද්‍රිය මේරීම.

ඉන්ද්‍රියබද්ධ = 1. ඉන්ද්‍රිය හා බැඳුණු. 2. ප්‍රාණවත්.

ඉන්ද්‍රිය බුද්ධිය = 1. දැනීම.

ඉන්ද්‍රිය මස්තුලුංගය = 1. ඉන්ද්‍රියයන්ට ප්‍රධාන වූ ස්ථානය.

ඉන්ද්‍රිය වෛකල්‍ය = 1. ඉන්ද්‍රියයන්ගේ විකල භාවය

ඉන්ද්‍රියවිකාරය = 1. චක්ෂුරාදිය වෙනස්වීම.

ඉන්ද්‍රිය විජය = 1. ඉඳුරන් හික්මවීම හෝ දිනීම.

ඉන්ද්‍රිය සංවර = 1. ඇස් ආදී ඉඳුරන් හික්මවා ගැනීම.

ඉන්ද්‍රිය සංවර ශීල = 1. ඉන්ද්‍රිය දමනය කිරීමට පුරුදුවීම.

ඉන්ද්‍රිය සංප්‍රයෝජය = 1. ඉන්ද්‍රියකින් දැනීම ලැබීමට උපකාරවන වස්තුව.

ඉන්ද්‍රිය ස්නායු = 1. ඉන්ද්‍රිය හා සම්බන්ධ නාඩි.

ඉන්ද්‍රියාගෝචර = 1. (ඉන්ද්‍රිය + අගෝචර) 1. ඉඳුරන්ට නොදැනෙන.

ඉන්ද්‍රායතන = 1. ඉඳුරන් පිහිටි තැන. (ශරීරය)

ඉන්ධන = 1. දර.

ඉන්න = 1. වැට ආදියට සිටවන ලීය.

ඉන්නල = (ඉත්තහල) 1. ඉනි අල.

ඉන්නවා = 1. ජීවත්ව සිටිනවා. 2. පැමිණ සිටිනවා. 3. සිටිනවා

ඉන්නා = 1. හමේ සැදෙන ගැට වෙසෙසක්.

ඉන්නියර = 1. මායිම. 2. නියර.

ඉන්නිසා = 1. ඒ හේතුවෙන්. 2. එබැවින්.

ඉන්දීවර = 1. නිල් මානෙල් මල්.

ඉන්දීම = 1. සිටුවීම. 2. පැළකිරීම.

ඉන්පසු = 1. ඊට පසු. 2. ඉක්බිති.

ඉන්මුල = 1. මුල් දේ.

ඉන්සළු = (ඉන්සල්) 1. ඉන්ද්‍රශාල වෘක්ෂය.

ඉනි = 1. ඒ නිසා. 2. ඒ හේතුවෙන්. 3 වැට වල් වලට සිටුවන ලී. 4. ලිහිම. 5. මිදීම.

ඉනිකුණා = 1. පුදු උකුණා.

ඉනිම = 1. ක්‍රීඩා වාරය. 2. ඒ නිසා.

ඉනිමඟ = 1. උඩනැඟීමට තට්ටු සහිතව සැදූ උපකරණය.

ඉනිශා = 1. අනුකම්පා සහිත වචනය

ඉනීම = 1. (දිය) කාන්දුවීම. 2. (දිය)උල්පත් වලින් උඩට ඒම. 3. ගලායාම.

ඉනුම = (ඉනීම) 1. උල්පත. 2. ලිහිම.

ඉනෙනවා = (දිය) කාන්දු වෙනවා 2. ගලායනවා. 3. උඩ නගිනවා. 4. ලිහෙනවා. 5. වෙන්වෙනවා.

ඉණ = 1. ඉඟටිය. 2. ණය. (පසුව දෙනු පිණිස) ඉල්ලාගත් දෙය.

ඉණඉහ = 1. ඇඟේ තිබෙන රෙදි පිළි ආදිය. 2. ඇඳි පැළඳි දෙය.

ඉණකඩ = 1. ඉඟටිය වටේ එතූ රෙද්ද. 2. ඉඟට අඳින රෙද්ද.

ඉණ කිළුටුවීම = 1. මාස් ශුඩිය. (සෘතුවීම)

ඉණ ගහණ = 1. ණය ගැනීම,

ඉණ දසී = 1. ගත් ණය වෙනුවට දාසවියට පැමිණි ස්ත්‍රිය.

ඉණපලිබෝධ = 1. ණයවීම නමැති කරදරය.

ඉණබඩ = 1. ඇඳුම් හා ආහාර.

ඉණහැදය = (ඉණ හැදය - ඉණ හැදේ) 1. හවඩිය. 2. ඉණවට බැම්ම. 3. ඉණවට බඳින ආභරණය.

ඉණහැද = 1. නැටුමට අඳින ඇඳුමක් 2. වෙස් මූණ.

ඉණවලු = 1. ඉණකඩ.

ඉණා = 1. බේත් කැවීම් ආදියෙන් අන්‍යයන් ගේ සිත් ගැනීම.

ඉණාබෙහෙත් = 1. අන්‍යයන්ගේ සිත් ගැනීම සඳහා කවන බෙහෙත්.

ඉණාසික = 1. ණය ගැතියා. 2. ණයවූ.

ඉණි = 1. සෝපානය. 2. තරප්පුව 3. ඉණිමග

ඉණිඉස = 1. පඩි පෙළේ මුදුන.

ඉණිපෙති = 1 ඉණි මං පෙලි. (ඉණි මගේ පා තබන ලී කැබෙලි.)

ඉණිකුණා = 1. එනම් සත්වයා. 2. පුදු උකුණා.

ඉණිමග = 1. උඩනැගීමට පෙලි බැඳ සැදූ උපකරණයක්.

ඉණිමං පෙත්ත = 1. ඉණි මගේ පෙල්ලක්. 2. ඉණිමං තට්ටුවක්.

ඉත = 1. මිත්‍රවූ. 2. හිතවත්. 3. සුදුසු 4. මතක් වූ

ඉතකම් = 1. හිතවත් කම.

ඉතණ = 1. ඊ තණ.

ඉතර = වෙන. 2. අනෙක්. 3. ඉතිරි වූ. 4. අනිකා 5 ඉතිරිය.

ඉතහිත = 1. හිතාධ්‍යාශය, 2. හිතවත්කම. 3. මිත්‍රහිත. 4. වැඩ කැමති සිතිවිල්ල.

ඉත්ත = 1. පොකුර. 2. ගසක අත්තකින් කොටස. 3. ඉත්තැවැල්.

ඉත්තක් = 1. කටකලියාව.

ඉත්තා = 1. දැම් ක්‍රීඩාවට ගන්නා කැට වෙසෙසක්.

ඉත්තෑවා = 1. එනම් සත්වයා.

ඉත්තෑ කුරු = 1. ඉත්තෑවා තැති ගැනුණු විට උගේ ඇඟෙන් තිකුත්වන කුරු වෙසෙසක් (ඉත්තෑවාගේ ඇගේ තිබෙන කුරු)

ඉත්ථම්භූත = 1. මෙසේ වූ.

ඉත්ථාගාර = 1. රජුන් ගේ හෝ ධනවතුන් ගේ ස්ත්‍රීන් සමූහය හෝ ඇලා වසන ගෙය. 2. අන්තඃපුරය.

ඉත්ථි = 1. ස්ත්‍රිය; වනිතාව.

ඉත්ථිධුත්ත = 1. ස්ත්‍රීන් කෙරෙහි ලොල් අය.

ඉත්ථිලිංග = 1. ස්ත්‍රීභාවය. 2. ස්ත්‍රී නිමිත්ත. 3. යෝනිය.

ඉත්වර = 1. ලාමක 2. ඉතා සවල්ප.

ඉතා = 1. අතිශයාර්ථ වාචී අව්‍යය පදයක්. 2. බොහෝ.

ඉතා ගෑටවා = 1. බොහෝ ප්‍රයෝග සහිත වූ.

ඉතාලිය = 1. එනම් රට.

ඉති = 1. ප්‍රකාශාර්ථ හඟවන නිපාතයක්. 2. මෙසේ. 3. ස්ත්‍රිය. 4. පස ඇටය. (දාදු කැටය) 5. දැම් ක්‍රීඩාවට ගන්නා කැට. 6. හේවායා. 7. රෙදි වියන යන්ත්‍රයේ දික් නූල් අතරින් හරස් නූල යවන ඉද. 8. කුඩා අතු කැබෙලි. 9. වැදි අඟන. 10. පුතු.

ඉතිඅත් = 1. 'ස්ත්‍රී' යන අර්ථය.

ඉති අරුත් = 1. ස්ත්‍රී අර්ථය.

ඉතිබව් = 1. ස්ත්‍රී භාවය. 2. මෙසේ බව.

ඉතිවුත්තක = 1. කුදුගොත් සඟියට අයත් එක් බණ පොතක්.

ඉතිසත් = 1. ස්ත්‍රී සංඥ. 2. පුවඟු ගස.

ඉතිහාස = 1. පුරා වෘත්තිය. 2. අතීත ප්‍රවෘත්තිය.

ඉතින් = (ඉතිකින්) 1. මෙතැන් සිට. 2. ඉක්බිත්තෙන්. 3. දැන්. 4. මෙසේ 5. ඒ නිසා. 6. මෙපමණකින්. 7. එහෙයින්. 8. මින්පසු. 9. එසේ නම්. 10. එසේ කල්හි.

ඉතිබූ = 1. මෙසේ වූ. 2. මේ ආකාර.

ඉතිරා = 1. උතුරා.

ඉතිරි = 1. 1. අධික. 2. භාර්යාව. 3. ස්ත්‍රිය. 4. ඉතුරු. 5. උතුරායිය.

ඉතිරිතර = 1. එකඑකාට අයිති.

ඉතිරිබව් = 1. ස්ත්‍රී භාවය.

ඉතිරිලිඟු = 1. ස්ත්‍රී ලිංගය.

ඉතිරිය = 1. එතෙර වන්ට. 2. ඉක්මවන්ට.

ඉතිරීම = 1. පිරී පිට යාම. 2. උණුවී උතුරායාම.

ඉතිරෙනවා = 1. ගලා යනවා. 2. තැම්බීමෙන් පිටයනවා. 3. උතුරායනවා.

ඉතු = 1. (වසන්ත ශරදාදි) ඍතු.

ඉතු ලේ = 1. ඍතු ලෝහිත (මල්වර ලෙය.)

ඉතුරු = 1. යමක් ගත් පසු ඉතිරිවී තිබෙන කොටස. 2. ඉතිරිවා.

ඉතුරුවා = 1. ඉතුරු දේ.

ඉතුව = 1. ඍතුව.

ඉද = 1. හෘදය. 2. ඉදිකටුව. 3. දැල් බැමට ගන්නා උපකරණයක්. 4. රෙදි විවීමේදී හරස් නූල යොදන ඉත්තා.

ඉද මත්ථෙහි = 1. මේය යන අර්ථයෙහි.

ඉදල = 1. වියළුණු අත්ත. 2. මුස්ත. 3. වැටුණු කොළ ඇති ඉපල.

ඉදවනවා = 1. පැසෙන්නට සලස්වනවා. 2. මුහුකුරායන්ට සලස්වනවා.

ඉදවීම = 1. අවමන් කිරීම.

ඉදුල් ඉරිඟු = 1. ඉරිඟු වෙසෙසක්.

ඉද්ද = 1. විවීමට නූල් ඔතන පොල්ල. 2. මල් වෙසෙසක්. 3. මලිගිය ගස.

ඉද්දර = 1. ඇඳ ඉහ. 2. උඩු කොටස. 3. හිස පැත්ත.

ඉද්දී = රිදීම.

ඉද්දෙනවා = 1. ගෙඩියක් හෝ තුවාලයක් පැරී රිදෙනවා.

ඉද්දෙකි = 1. ඉහළින්.

ඉදි = 1. සෘඬිය. 2. ඉදි කටුව. 3. (කපු කටින) ඉද්ද. 4. ඇද නැති (සෘජු). 5. සම්පාදනය. 6. දොර පොල්ල. 7. එකෝල්ල. 8. සෑදූ.

ඉදිකඩ්ඩ = (ඉදි කටුව) 1. මැහීමට ගන්නා වානේ කූර.

ඉදිකටු කුලාව = 1. ඉදිකටු දමන තලය.

ඉදිකටු මල = 1. ඉදිකටුවේ නූල දමන සිල (ඉදිකටු තච්ච).

ඉදි කඩුල්ල = 1. වැටකින් ඇතුල්වන තැන තිබෙන පොලු දැමූ දොරටුව.

ඉදි කඳ = 1. ඉදිකටු කුලාව.

ඉදි කරනවා = 1. ගොඩ නගනවා. 2 සාදනවා.

ඉදිච්ච = 1. විළිකුත්. 2. පැසුණු.

ඉදිදොර = 1. ඉදි කඩුල්ල.

ඉදින් = 1. ඉතින්. 2 පසුව. 3. එසේනම්. 4. යම් ලෙසකින්.

ඉදිනි = 1. ලිප.

ඉදින්නරු = 1. හිදිකුම්බ වැල්?

ඉදි පිළිවෙත් = 1. සෘජු වූ අෂ්ටාඞ්ගික මාර්ග ප්‍රතිපත්තිය.

ඉදි බුවා = 1. ඉබ්බා. 2. කැස්බා

ඉදි මෙනවා = 1 මහත් වෙනවා. 2. උඩට-මස් තෙරා එනවා.

ඉදිය = 1. සෘජුව.

ඉදි යෙදුම්කාරයා = 1. ගොඩ නැගිලි සම්බන්ධ ශාස්ත්‍රඥයා.

ඉදිරි = 1. අභිමුඛය. 2. අනාගතය. 3. විරුඬ.

ඉදිරි කඳ = 1. රෙදි වියන්නාගේ අසුනට උඩින් ඉස්සරහ පැත්තේ කණු දෙකක සවිකළ ලීය.

ඉදිරි කරනවා = 1. ඉදිරියේ තබනවා. 2. පෙර-මුණට ගන්නවා.

ඉදිරිකාරයා = 1. එදිරිකාරයා 2. විරුඬ කාරයා.

ඉදිරි දොර = 1. ඉස්සරහ දොර. 2. නැගෙනහිර පැත්තෙහි දොරටුව 3. ප්‍රධාන දොරටුව.

ඉදිරි පසු = 1. මුල අගට අග මුලට ඇති.

ඉදිරි පිට = 1. අභිමුඛය. 2. ඉස්සරහ.

ඉදිරිය = 1. එදිරිය. 2. නරකව. 3. ඉදිරි පිට කොටස.

ඉදිරි සෙන = 1. ඉගිලෙන හෝ පැලෙන.

ඉදිරී = 1. උදුරාගැනීම. 2. ඉගිල්ලීම.

ඉදිරෙනවා = 1. මුල් ගැලවී වෙන් වෙනවා.

ඉදිව = 1. සෘජුව. 2. අවංකව. 3. ඇද නැතිව.

ඉදිවරදිය මහන් = 1. මුදු යන අය ගොඩින්-තබා ගන්නා (කදු ගස් ආදි) සලකුණු.

ඉදි වැල = 1. විවීමට නූල් ඔතා තිබෙන පොල්ලෙන් ඇදගන්නා නූල.

ඉදිවුර = 1. ඉදුරා.

ඉදීම = 1. පැසීම. 2. මුහුකුරායාම.

ඉදු = 1. සෘඬිය. 2. පුදුම ක්‍රියාව. 3. සෘජු. 4. අවංක. 5. කෙළින්. 6. ලුණුවරණගස. 7. සමෘඬ.

ඉදුකිරිය = 1. සෘජු ක්‍රියාව.

ඉදුකිල = 1. පඩි කද. 2. එළිපත්ත.

ඉදුණු = 1. පසුණු. 2. සමෘද්ධ.

ඉදුබු = 1. ඉබ්බා 2. කැස්බා.

ඉදුබු පිටු = 1. ඉබ්බාගේ පිට .

ඉදුමත් = 1. සෘද්ධිමත්.

ඉදුම් = 1. පැකිලීම.

ඉදුර = (ඉදුරු) 1 ශුක්ල. 2. නැගෙනහිර දිශාව.

ඉදුවැල = 1. පෙනෙල වැල.

ඉදුඹ = 1. ජේලිය.

ඉදුහ = 1. සෘඬිය. 2. පුදුම ක්‍රියාව.

ඉදෙනවා = 1. පැහී මෘදු වෙනවා. 2. කැම පිණසනවා.

ඉදෙපති = 1. ඉදෙත් ගොතන පටි.

ඉදෙලු = 1. ඊද්දෙලාව. 2 පල්ලැක්කිය (ඉදෙලි.)

ඉද = 1. නිද ගෙන. 2. වාඩිවී. 3. සිට.

ඉද ගන්නවා = 1. වාඩි වෙනවා.

ඉද ලොලු = 1. හතු වර්ගයක් (ඉඳ වලු).

ඉද හිට = 1. ඉඳ හිටලා. 2. සමහර විට.

ඉදෑ = 1. මෙන්න. 2. මෙනී වරෙක්. 3. මේ ගනුව.

ඉඳි = 1. තාල වර්ගයට අයත් එනම් ගස. 2. දෙර පොල්ල. 3. ඉඳිකටුව.

ඉඳිආප්ප = 1. ජාලපූප. 2. ඉඹිපු. 3. පිටිවලින් සාදන කැවිලි වෙසෙසක්.

ඉඳි කැන් = 1. ඉඳි ගෙඩි වලු.

ඉඳි කඩ = 1. කඩුල්ල.

ඉඳිනවා = 1. ඉන්නවා.

ඉඳිපත් නුවර = 1. දඹදිව පැරණි නගරයක්.

ඉඳිපත් රටාව = 1. ඉඳි අත්තක් ලෙසට කරන විසිතුරු වියමන.

ඉඳි බඩ = 1. ඉඳිගස්වල බඩය.

ඉඳියප්පම් = 1. ඉඳි ආප්ප.

ඉඳිර = (ඉඳිරා) මීමැස්සා.

ඉඳිරි = 1. ඉන්ද්‍රිය.

ඉඳිවර = 1. ඉඳිකඩුල්ල 2. නිල් මානෙල්. 3. දෙරට දමන හරස් දණ්ඩ.

ඉඳී = 1. ඉඳිති. 2. හැටගැනී.

ඉඳු = 1. ශක්‍රයා. 2. කපුරු. 3. නෙතය. 4. හඳ. 5. ක්ෂත්‍රියයා. 6. නික. 7. ප්‍රධාන 8. සත්‍යා සත්‍රී. 9. උත්තමාර්ථ වාචී නිපාත පදයක්.

ඉඳු උපුල = 1. ඉන්ද්‍ර නීල මාණික්‍යය.

ඉඳු කාන්තාව = 1. චන්ද්‍රයා. 2. ශක්‍රයාගේ භාර්යාව. 3. රාත්‍රිය.

ඉඳුකිල = 1. (ඉන්ද්‍රකීලය) එළිපත්ත.

ඉඳු ගජ = 1. ශක්‍රයාගේ ඇතා. 2. ඓරාවණයා.

ඉඳු ගොවුවා = 1. ඉන්ද්‍ර ගෝපක නම් පණුවා. 2. පලගැටියා. 3. රතබදුල්ලා. 4. කනමැදිරියා.

ඉඳුද = 1. නෙතය.

ඉඳුදද = (ඉඳුදුනු) 1. දේ දුන්න.

ඉඳුදල = 1. ඉන්ද්‍රජාලය. 2. විජ්ජාව.

ඉඳුදස් = 1. නැගෙනහිර දිශාව.

ඉඳුනල = 1. නැගෙනහිරින් හමන සුළඟ.

ඉඳුනිල් = 1. ඉන්ද්‍රනීල මාණික්‍යය.

ඉඳුනිල්ම = 1. ඉන්ද්‍රනීල මාණික්‍යමය.

ඉඳුනිල්මිණි අකල = 1 ඉන්ද්‍රනීල මාණික්‍යමය ගල්තලාව.

ඉඳුනිල්මිණි බුබා = 1. ඉන්ද්‍රනීල මාණික්‍යමය.

ඉඳුපරපුරු = 1. චන්ද්‍රවංශය.

ඉඳුපා = 1. චන්ද්‍ර රශ්මි.

ඉඳුපුත් = 1. චන්ද්‍රයාගේ පුත්‍රයා. 2. බුදහු.

ඉඳුම = 1. ඉඳීම.

ඉඳුම් හිඳුම් = 1. නවාතැන්. 2. නැවතී සිටීම.

ඉඳුමිණ = 1. නිල්පාට මැණික.

ඉඳුර = 1. ඉඳුරන්. 2. නැගෙනහිර.

ඉඳුරත් = 1. (රූප-ශබ්දාදි) ඉන්ද්‍රියාර්ථ.

ඉඳු රක්නය = 1. මුතු ඇටය.

ඉඳුරසන = 1. ශක්‍රයාගේ ආසනය.

ඉඳුරන් = 1. ඉන්ද්‍රියයන්. 2. ඇස්-කන් නාසාදිය.

ඉඳුරා = 1 මනාව. 2. හොඳහැටියේ. 3. නොවරදවා. 4. ඍජුව. 5. සපිරලෙස.

ඉඳුරු = 1. ගස් වර්ගයක්. 2. ඉන්ද්‍රිය 3. ශක්‍රයා. 4. නැගෙනහිර දිශාව. 5. ශුක්‍රධාතුව. 6. සුලඹියා. 7. විජ්ජාකාරයා. 8. උත්තමාර්ථ වාචී නිපාතයක්.

ඉඳුරුකොනා = 1. කරවැල් කොනා.

ඉඳුරුගජ = 1. අභ්‍රමාතඞ්ගයා. 2. ඓරාවණයා. 3. ශක්‍රයාගේ ඇතා.

ඉඳුරුදලි = 1. ඉන්ද්‍රජාල දන්නා. 2. විජ්ජාකාරයා.

ඉඳුරුදික්පති = 1 පූර්ව දිශාධිපතියා. 2. ශක්‍රයා.

ඉඳුරුදිශ = (ඉඳුරු දෙස) 1. නැගෙනහිර පැත්ත.

ඉඳුරුපුර = 1. ශක්‍රපුරය.

ඉඳුරුසඳ = 1. උත්තම ශක්‍රයා.

ඉඳුරුසෑබු = 1. ඉන්ද්‍රචාපය. (දේදුන්න)

ඉඳුරු සැවුරු = 1. ඉන්ද්‍රිය සංවරය.

ඉඳුල් = 1. අපිරිසිදුවූ. 2. කා ඉතිරිකල (කෑම)

ඉඳුල් කටක් = 1. කෑම ස්වල්පයක්. 2. බත් පිඩක්.

ඉඳුල් කටගෑම = 1. ළදරුවකුට හා හා පුරායයි බත් කැවීම.

ඉඳුල්කඩ = 1. අත - කට පිසදමන රෙදි කෑබෙල්ල. 2. ආහාර අනුභව කරන විට පහත ඇඳුම මතුයෙහි එලාගත්තා රෙදි කෑබෙල්ල.

ඉඳුල්කෑම = 1. අනුන් කා ඉතිරි වූ කෑම.

ඉඳුල්කරනවා = 1. කෑමක් සෑදුවාට පසු පළමුවෙන් කනවා.

ඉඳුල්ගේ = 1. අන්‍යයන් විසින් පරිභෝග කරන ලද ගෙය.

ඉඳුල් කොළු = 1. ආහාර වැළඳූ තලිය.

ඉඳුල්දිය = (ඉඳුල්පැන්) 1. ආහාර මිශ්‍රවූ ජලය. 2. ඉඳුල් මිශ්‍ර ජලය.

ඉඳුල් පා = 1. ආහාර වැළඳූ පාත්‍රය.

ඉඳුල් හුළු = 1. කෑම කෑ භාජනවල ඉතිරිවන බත් ඇට.

ඉඳුල = 1. කා ඉතිරි වූ කෑම.

ඉඳුවනවා = 1. ඉන්දවනවා. 2. වාඩි කරවනවා. 3. සිටුවනවා.

ඉඳුවර = 1. දෙරපොල්ල. 2. නිල් මහනෙල්.

ඉඳුවැල් = 1. පෙතෙල වැල්.

ඉඳුසල් = 1 හල්ගහ.

ඉඳුසතර = 1. සතර සෑදි පාදය.

ඉඳුසැව් = 1. ශක්‍රධනුව. 2. දේදුන්න.

ඉඳුසිදුරු = 1. ඓරාවත හස්තියා. 2. ශක්‍රයාගේ ඇතා.

ඉඳුසෙණ = 1. වජ්‍රායුධය. 2. හෙණය.

ඉඳෙනී = 1. ඇතිවන. 2. හටගැනෙන.

ඉඬෙල = 1. (ඉඬෞලුව) 1. ඬෞලාව.

ඉඬෙලොලු = 1. හතු වගීයක්.

ඉඬෞ = 1. ගව ආදීන්ට අඬ ගැසීමෙහි යෙදෙන ශබ්දය.

ඉපදවීම = 1. සෑපයීම. 2. ඇතිකිරීම

ඉපදවූ = 1. ඇතිකරන ලද. 2. උපදවන ලද.

ඉපදීම = 1. කිහිවීම. 2. පටිත්ගැනීම. 3. ඇතිවීම.

ඉපනෑල්ල = 1. නොයම් කපා ඉතුරුවූ මුල්.

ඉපල් = 1. කෝට්ටු. 2. වේවැල් ආදිය. 3. කොළ හැලිගිය කුඩා අතු

ඉප්පාන = 1. පිල. (ආලින්දය)

ඉප්සුම් = 1. උස්වීම. 2. එසවීම.

ඉප්සෙන = 1. අහසයට යෑම.

ඉපැජ = 1. ඉපදී.

ඉපැක්ම = 1. ඉපදීම.

ඉපැද්දීම = 1. ඉපදවීම.

ඉපැන් = 1. උපන්. 2. ඉපදුණු.

ඉබි = 1. වවල උපදින සුදු පැහැති ඉතා කුඩා මැසි වගීයක්. 2. තලාවෙහි පිඹින පැත්තේ සවිකොට ඇති (තල්කොළ ආදියෙන් සෑදූ) පියලි. 3 දැල්වලට සවිකොට ඇති දිය මත පාවෙන සැහැල්ලු ලී කෑබෙලි. 4. ලා දළු වැසී තිබෙන සිවිය. 5. කොස් ඇටයෙහි අවට තිබෙන මොළොක් සිවිය. 6. පහුර.

ඉපිට = 1. එපිට. 2. ඈත. 3 දුර.

ඉපිදැ = 1. ඉපදී. 2. ඇතිවී.

ඉපිර = 1. ඉගිලී.

ඉපිල = 1. ඉල්පී. 2. ඉගිලී.

ඉපිලවනවා = 1. නගිනවා. 2. උනන්දු වෙනවා.

ඉපුලී = 1. නැගීසිටි. 2. ඉල්පුණු. 3. මතුවූ.

ඉපිලෙනවා = 1. පාවෙනවා. 2. උඩනගිනවා. 3. මතුපිටට එනවා.

ඉපිල්ල = 1. පාවෙනදේ. 2. කොල්ලෑව.

ඉපිල්ලා = 1. මාළු වෙසෙසක්.

ඉපුල් = 1. උපුල්. 2. මානෙල්.

ඉබ = (ඉබු) 1. ඉබ්බා. 2. අලියා.

ඉබ්බා = 1. කැසුබු වගීයට අයත් එනම් සතා. 2. දෙර අගුල් වගීයක්.

ඉබාගාතේ = 1. නියම තැනක් නැතිව ආගිය අතේ (යාම) 2. නන්නත්තාරේ. 3. වැඩක් හෝ අරමුණක් නැතිව.

ඉබී = 1. ඉබ්බා.

ඉබියතුර = 1. අගුල් වෙසෙසක්. 2. යතුරු වගීයක්.

ඉබු = 1. ඇතා. 2. ඉබ්බා.

ඉබේ = 1. නිරායාසයෙන්. 2. නිරුත්සාහයෙන්. 3. අහම්බෙන්. 4. යමක සම්බන්ධයක් නැතිව.

ඉබෝ = 1. ඉතා බොහෝ.

ඉභ = 1. ඇතා. 2. ඇත්හොව්වා.

ඉඹිනවා = 1. ගඳ සුවඳ බලනවා. 2. ආදරයට තොත්තු දෙනවා.

ඉඹුරු = 1. තණකොළ වර්ගයක්.

ඉඹුල් = 1. කපු වෙසෙසක්. 2. කොට්ට පුළුන් ගස.

ඉඹුල් කිරිබත් = 1. පුළුන් ගෙඩි සේ ගුලි කළ කිරිබත්. 2. මැදට පැණි පොල් තබා සාදන කිරිබත් ගෙඩි.

ඉඹුල්පුළුන් = 1. කොට්ට පුළුන්. 2. ඉඹුල් ගෙඩිවල පුළුන්.

ඉඹුල් මැලියම් = 1. ඉඹුල් ගසෙහි ලාටු.

ඉඹුල්වන = 1. ඉඹුල් ගස්වලින් ගහනවූ වනය. 2. කාමයෙහි වරදවා හැසිරීමේ පාපයට දුක් දෙන (කටු ඉඹුල්) නරකය.

ඉම = 1. සීමාව. 2. මායිම. 3. කොණ. 4. අග.

ඉමහත් = 1. ඉතාමහත්. 2. අතිමහත්.

ඉම් ඛාණුව – (ඉම්ටැඹ) 1. මායිම ලකුණු කරන කණුව.

ඉම්ගල – 1. මායිම දක්වන ගල.

ඉම්නියර = (කුඹුරු වල-කොටස් වෙන් කිරීමට බඳින) සීමා නියර.

ඉම්පහණ = (ඉම්ගල බලන්න)

ඉමි = 1. තමන්ගේම.

ඉමිහිරි = 1. ඉතා මිහිරි.

ඉය = 1. ඊය. 2. ඔහු වෙසෙසක්. 3. එන්ට

ඉයවි = 1. එන්ට කැමැති.

ඉය සුඹුළු = 1. ඉය ගසෙහි සුඹුළු.

ඉයළුර = (ඉයදුර – ඉයොර) 1. ඊ කොපුව.

ඉයක්තුව – 1. අවස්ථාව. 2. සුදුසු වේලාව. 3. සුදුසු මොහොත. 4 සුදුසු තැන.

ඉයනම් = 1. ගොවිතැන් ආදියට වුවමනා උපකරණ. 2. හූනියම් කරන මන්ත්‍ර.

ඉයඹ = 1. බලාපොරොත්තු වීම.

ඉර්යාපථය = 1. ඉරියව්ව.

ඉය්යේ = 1. ඉකුත්වූ දින. 2. අදින් පෙර දවසේ.

ඉර = 1. රේඛාව. 2. සූර්යයා. 3. ක්‍රීඩාවාරය.

ඉර අව්ව = සූර්ය තාපය. 2. ඉරු රශ්මිය.

ඉර අව් කා = 1. ඉර අව්ව තැප.

ඉරපි = 1. මසුන් ඇල්ලීමට ඉරටු වලින් සැදූ උපකරණයක්.

ඉර බමු තරුව = 1. ඉර බැස යන විට අහසෙහි දක්නට ලැබෙන (සිකුරු) තරුව. 2. දව හත් තරුව.

ඉරටුව = (ඉරටය) 1. පොල් කොළය මැද පිහිටි තද නාරටිය.

ඉරටා මූස්න = 1. ඉදල.

ඉරට්ට = (ඉරට්ටෙ) 1. ඔත්ත නොවූ ගණන. 2. දෙකින් බෙදිය හැකි ගණන. 3. දෙගුණ 4. ඉරට්ටය.

ඉරට්ට ගෙඩිය = 1. එකට සම්බන්ධවූ (කෙසෙල් ආදී) ගෙඩි දෙක.

ඉරපිය = 1. මාළු මැරීමට ගන්නා කූඩයක්.

ඉරබුම්බිය = 1. ඉලපත.

ඉරණම = 1. වියයුත්ත. 2. දෛවය. 3. වෙන්නට තිබෙනදේ.

ඉරනවා = 1. කියනෙන් කපා වෙන් කරනවා· 2. තීරු කරනවා.

ඉරමඬුලු = 1. සූර්ය මණ්ඩලය.

ඉරමසු = (ඉරමුසු) 1. ඉරිමුසු නම් පැළෑටි වර්ගය.

ඉරමුදුන = 1. මධ්‍යාහ්නය (ඉරමුදුන් වේලාව).

ඉරමුදුන්රල්ල = 1. දවල් දොළහට පමණ පායන අව්ව.

ඉරමුදුන් සමයම = 1. රීරි යකාගෙන් ඇති වූ උවදුරු වළක්වාලීම පිණිස මධ්‍යාහ්නයෙහි කරන තොවිලයක්.

ඉරරාජ = 1. ඔහු වෙසෙසක්.

ඉරවළු = 1. හැමට කොටස් වෙන් කරනු වස් නගුලින් ගසන දික් හී විටි. 2. කුඹුරක එසේ වෙන් කළ කොටස.

ඉර හඳ පවත්නාව = 1. ඉර හා හඳ පවත්නා තෙක් පවතින සේ.

ඊර සඳ හිමි = 1. ඉර හා සඳ සීමා කොට ඇති.

ඊරශේවය = 1. ශ්‍රී පාදයට නමස්කාර කරන්නාක් මෙන් හිරු කිප වරක් උඩට යටට යන්නාක් මෙන් (ඉර පායන මොහොතෙහි දී සමනල කන්දේදී) දක්නට ලැබෙන දර්ශනය.

ඊර්ධි = 1. ධ්‍යානබලය. 2. හාස්කම.

ඊරා = 1. අතිශයාර්ථවාචී අව්‍යය පදයක්. 2. දෙපළු කොට. 3. භූමිය. 4. වචනය.

ඊරූ = 1. කම්පා කොට. 2. හරවා.

ඊරි = 1. රේඛා. 2. ජේළිය. 3. කොස් මදුලට පිටින් තිබෙන හින්තිරු. 4. ලජ්ජාව. 5. පැළීම. 6. පඩකතිය.

ඊරිඋදය = 1. සූර්‍ය්‍යෝදය (ඉර පායන වේලාව). 2. පාන්දර. 3. ඉරිමා උදේ.

ඊරිකාච්චි = 1. පැරණි රෙදි වෙසෙසක්.

ඊරිකෝරෝස් = 1. මහ තැබිලිය.

ඊරිගහනවා = 1. ඉරි අඳිනවා. 2. පැළී ඉරි ඇතිවෙනවා.

ඊරිඟු = 1. ධාන්‍ය විශේෂයක්.

ඊරිච්ච = 1. ඉරුණු.

ඊරිබි ලිහිණි = 1. ලිහිණි විශෙෂයක්.

ඊරිතැළිම = 1. පුපුරා ඉරි මතුවීම. 2. සියුම් ලෙස පැළීම.

ඊරිතු = 1. ඍතුව. 2. කාල ගුණය.

ඊරිදා = 1. ඉරුදින.

ඊරිදි = 1. ඍධිය. 2. හාස්කම.

ඊරිජු = 1. ඍජු. 2. ඇදනැති. 3. අවංක

ඊරිජ්ජු = 1. ලීයෙහි කපන අලුව. 2. කත්තුව.

ඊරිමට්ටම් = 1. වඩු කෝදුව.

ඊරිමදය = 1. ගස් ඉරණවිට ලෑලි වල දක්නට ලැබෙන සිපුරුම් ආදි පලුද්ද. 2. ගසක එලයේ හෝ අරටුවේ දක්නට ලැබෙන පලුද්ද.

ඊරිමාඋදය = 1. පාන්දර. 2. ඉර උදාවන්නට කලින් වේලාව.

ඊරියච්ච = 1. ඉඳින කිරිත පිළිවෙල.

ඊරියාපථ = 1. ඉරියව්. 2. ඉඳුම් - සිටුම් ආදි ක්‍රියා.

ඊරිමේරිය = 1. බෙහෙත් පැළෑටි වර්ගයක්.

ඊරීම් = 1. උරාගැනීම්. 2. පලුකිරීම්.

ඊරු = 1. සූර්‍ය්‍යා. 2. තීරුව. 3. දෙක. 4. හිරු මඬල. 5. ඉරතලද. 6. පලුකල.

ඊරුතු = 1. ඍතුව.

ඊරුදින = 1. ඉරිදා දවස.

ඊරුජු = 1. ඍජු.

ඊරුදේවි = 1. සූර්‍ය්‍ය නමැති දෙවියා.

ඊරුජ්ජු = 1. ඉරිජ්ජුව.

ඊරුම = 1. ලී ආදිය ඉරීම. 2. (කාසයට) තෙල් ආදිය ඉරීම.

ඊරුමඬල = 1. සූර්‍ය්‍යමණ්ඩලය.

ඊරුම්කාට්ටය = 1. (ලීයේ) ඉරීමෙන් ඇතිවුණු විවරය.

ඊරුම් කාරයා = 1. ලී ඉරන්නා.

ඊරුම්සට්ටලය = 1. ඉරීම පිණිස ලී කඳන් තබන මැස්ස.

ඊරුරාජ = 1. ගස් වෙසෙසක්.

ඊරුරැස් = 1. සූර්‍ය්‍ය රශ්මිය.

ඊරුව = 1. (පුස් කොල) පොතක කොලය. 2. (දුම්කොළ) දෙපලු කල කොටස. 3. දෙකෙන් පංගුව.

ඊරුවාරදය = 1. (ඉරුවා රුජාව) 1. ඉර පායන විට පටන් ගන්නා හිස කැක්කුම.

ඊරුවේ = 1. ඍග් වේදය.

ඊරෙනවා = 1. ඉරියනවා. 2. වෙන්වී කැඩෙනවා.

ඊරේෂ = 1. වරුණයා. 2. රාජා. 3. විෂ්ණු. 4. වචනාධිපතියා.

ඊර්ද්ධි = 1. ඍධිය. 2. හාස්කම.

ඊර්ෂි = 1. ඍෂියා; රුසියා.

ඊල = 1. කොලය. 2. මල පුඩුව. 3. ඉල ඇටය. 4. ඉලයා නම් මිරිදිය මාළුවා. 5. එකපිට එක තැංවූ වලත් ගොඩ.

ඊලංගම් = 1. තැටුම් උගන්වන සථානය. 2. කඩුහරඹ ආදිය උගන්වන සථානය.

ඉලංගම් මඩුව = 1. කඩුහරඹ-නැටුම් ආදිය උගත්තවුන් පළමුවරට ඒවා ප්‍රසිද්ධියේ දක්වන මඩුව. 2. සලඑළි මඩුව.

ඉලක්ඛය = 1. විදින හෝ වෙඩි තබන අරමුණ. 2. මුල් කරගත් අරමුණ 3. කුරුමානම. 4. වැටුප්; වියදම්.

ඉලක්ඛම් = 1. ගණන් හැඳින්වීමට යොදන ලකුණු 2. අඞ්ක.

ඉලක්කි = 1. ඉලක්කය.

ඉලක්තම්බුව = 1. බුලත් තබන පිත්තල බඳුන.

ඉලක්ඛිය = 1. ඇත්, අශ් ආදීන්ගේ බෙටි.

ඉලදළුව = 1. ඉල ඇටය.

ඉලන්ද = 1. මසන්ගස.

ඉලන්දලයක් = 1. මදිපුංචිකමක්. 2. නින්දාවක්.

ඉලන්ද ලාකඩ = 1. මසන්ගස්වල හැදෙන ලතු.

ඉලන්දුමියා = 1. තරුණයා.

ඉලපත = 1. ඉරටුමිටිය. 2. අතුගෑමට ඉරටු වලින් සාදාගත් උපකරණය.

ඉලය = 1. ඉල ඇටය.

ඉලවඟ = 1. කුරුඳු. 2. කරාබු

ඉලව්ව = 1. විපත. 2. අවමඟුල. 3. කනගාටුව.

ඉලව්ගෙය = 1. මලගෙදර.

ඉලව්බෙර = 1. මලබෙර.

ඉල් = 1. ඉල්මස. 2. පොළොව. 3. සීතල. 4. කැලය. 5. අේලාව.

ඉල්තණ = 1. පුතාගේ භාර්‍යාවගේ පියා හෝ දුවගේ පුරුෂයාගේ පියා. (මාමණ්ඩි)

ඉල්පණුවා = 1. ඉල්මාසයෙහි ගස්වල බෝවන පණු වෙසෙස.

ඉල්පවනවා = 1. උඩ පාවෙන්නට හරිනවා. 2. මතුකරනවා.

ඉල්පැන් = 1. සිහිල් දිය.

ඉල්පීම = 1. මතුවීම. 2. පාවීම.

ඉල්පුණු = 1. පාවුණු. 2. ඉදිමුණු.

ඉල්මරද = 1. තොමේරූ. 2. ලා.

ඉල්මස = 1. කාර්තික මාසය. 2. නොවැම්බර දෙසැම්බර මාස අතර වන්‍ද මාසය.

ඉල්මි = 1. පොළොව.

ඉල්ලනවා = 1. අයදිනවා. 2. යමක් ඕනෑ බව කියා සිටිනවා.

ඉල්ලම = 1. මිනිරන් ආදි ලෝහ වර්ග හෝ මැණික් පිහිටා තිබෙන පස් තට්ටුව.

ඉල්ලම්කූර = 1. ඉල්ලම් පෑදූ ගැනීමට ගන්නා යකඩ ඉන්න.

ඉල්ලාගන්නවා 1. ලබාගන්නවා.

ඉල්ලීම = (ඉල්ලුම) 1. දෙන්නටයයි කියා සිටීම. 2. අයැදීම.

ඉල්ලුම්පත්‍රය = 1. අයැදුම් පත.

ඉලිත්තියා = 1. මාලු වර්ගයක්.

ඉලිප්ප = 1. සියඹලා ගස.

ඉලිප්පවනවා = (ඉල්පවනවා) 1. පාවෙන්නට සලස්වනවා

ඉලිප්පීම = 1. පාවීම. 2. මතුවීම.

ඉලිප්පුම = 1. ඉදිරියට නෙරීම. 2. ඉදිමීම. 3. ප්‍රධානකම.

ඉලිප්පෙන = 1. ඉල්පෙන. 2. පාවෙන.

ඉලියන = 1. සොයන.

ඉලියා = 1. විවෘරා.

ඉලිව්ලි = 1. ඇවිලිල්ල.

ඉලු = 1. වනය. 2. සමූහය. 3. ඉලුමුවා.

ඉලුක් = 1. එනම් තෘණ විශෙෂය.

ඉලුක්කෝලය = 1. කිරිච්චිය. 2. කුඩා කඩුව. 3. සිරිය. 4. තෝමරය.

ඉලුප් = 1. එනම් තෘණ විශෙෂය. 2. ඉලුක්

ඉලුමුවා = 1. කැලෑමුවා. (ඕලුමුවා?)

ඉලුව = 1. කැලෑව.

ඉලෙයා = 1. ඉලයා නම් මිරිදිය මාළුවා.

ඉලෙ = 1. ඇලය. 2. පැත්ත.

ඉළු = (ඉළුව) 1. සමූහය. 2. කැලෑව.

ඉව = 1. ආඝ්‍රාණය. (නැහැයෙන් දැනීම) 2. ඉඹ පාර දැනීම. (තිරිසනුන් කෙරේ පවත්නා ඉඹීමෙන් යම් කිසිවකු හැඳින ගැනීමේ ශක්තිය.)

ඉවක් බවක් නැතිව = 1. අපරීක්ෂාකාරීව. 2. විචාරයක් නැතිව.

ඉවකරනවා = 1. ඉව අල්ලනවා. (ඉඹ බලනවා)

ඉවබව් = 1. සැලකිල්ල. 2. පරීක්ෂාව.

ඉවත්ව = 1. දුරුව. 2. තොරව. 3. වෙන්වී. 4. අහකට වී. 5. පැත්තකට වී.

ඉවතරට = 1. පිටරට.

ඉවද = 1. අති උඩයන්. 2. බෙහෙත් ද්‍රව්‍යයක්.

ඉවරකරනවා = 1. අවසන්කරනවා. 2. හමාර කරනවා. 3. නිත්දු කරනවා. 4. තොර කරනවා.

ඉවර්ණ = 1. "ඉ - ඊ" යන අකුරු.

ඉවස් = 1. දුන්න.

ඉවසනවා = 1. කමාකරනවා. 2. උසුලා සිටිනවා. 3. කෝප නොවී කටයුතු කරනවා. 4. පිළිගන්නවා.

ඉවසුම් = 1. පිළිගැනීම. 2. වේදනාදිය දරාගැනීම.

ඉවසූ = 1. පිළිගත්. 2. ඉවසාගත්. 3. භාරගත්.

ඉවහල් = 1. උපකාරවූ.

ඉවැසි = 1. ඉවසිය හැකිබව.

ඉවිලි = (ඉවිල්ල) 1. වැයම. 2. පිසීම.

ඉවීම = 1. කැම් පිසීම. 2 (පොතු) ගැලවීම.

ඉවුර = 1. අසින. 2. ගඟ අද්දර. 3. තීරය.

ඉවුරැඅස් = 1. ඉවුර ළඟ.

ඉවුරැබිම් = 1. තීර භූමිය.

ඉවූ = 1. උයන ලද.

ඉස = 1. ඔලුව. 2. ඉච්ඡාව. 3. සේවනය කර. 4. ඉසීම කර. 5. උඩ කොටස. 6. විසුරුවා.

ඉස ඇම්ම = (ඉසිඇම්ම) 1. ඉස කැක්කුම.

ඉසඛඩ = 1. හිස වැස්ම. 2. හිසෙහි බඳින වස්ත්‍රය. 3. තලප්පාව.

ඉස කරකැවිල්ල = 1. හිසේ ලෙඩක්.

ඉසකුඩිච්චිය = 1. මොළය සිසිල් වීමට හිසෙහි බෙහෙත් ගැල්වීම. 2. ඉස ගැල්ලුම.

ඉසකේ = (ඉසකෙයියා-ඉසකෙස්) 1. හිසේ දිගට වැවෙන ලොම්.

ඉසකෙස්වැටිය = 1 කේශ කලාපය

ඉසකේපත් = 1. ඉස කෙස්වැටිය.

ඉසගහනවා = 1. හිස කපාදමනවා.

ඉසගැල්ලුම = 1. ඉස කුඩිච්චිය.

ඉසටිය = 1. හෙල්ලය. 2 ඔලුව කැල්ල. (ඉහටිය)

ඉසදියටයාම = 1. විවාහයකින් පසුදින මනාලියගේ පාර්ශ්වයෙන් (කාන්තාවන්) කීපදෙනෙක් මනාලයාගේ නිවෙසට ගොස් පවත්වන චාරිත්‍රයක්.

ඉසඳෑස් = 1. ඉච්ඡාව නමැති ද්වේෂය.

ඉසපලඳනාව = 1. හිසේ පළඳින ආභරණයක්.

ඉසපියන = 1. විසුරුවන. 2. ඉසින.

ඉසපියා = 1. විසුරුවා හැර.

ඉසබඳකම් = 1. ඊෂ්‍යා ගතිය.

ඉස බඳිනා කරච්චිය = 1. තලප්පාව. 2. යුධයට දමන තොප්පිය.

ඉසමරූ = 1. ශිරෝමෘත්‍යු නම් රෝගය.

ඉසමල = 1. කරමලේ.

ඉසමුඩු = 1. ඔලුවේ ඉස කෙස් නැතිබව.

ඉසමුඩුකිරීම = 1. ඉස කෙස් ගා දැමීම. 2. ඉස බූගා දැමීම.

ඉසරද = (ඉසරැජාව) 1. ඉසකැක්කුම.

ඉසලූ අත් = 1. හිස හැරුණු දිශාව.

ඉසව්ව = 1. තැන. 2. ප්‍රදේශය.

ඉසගු = 1. යකාබැඳිවැල්.

ඉසත් = 1. ඉස් අත. 2. ඉහළ.

ඉස් = 1. ඔලුවට අයිති. 2. ඉච්ඡාව. 3. හිස. 4. ඉස්ම.

ඉස් ඉස්සරියෙන් = 1. හා - හා පුරායයි 2. මුලින්. 2. පළමුවරටම.

ඉස්බලියල් = 1. තළුවත්ගේ බෙර යෝ වයන්නන්ගේ තලප්පාව. 2. පෝරුවේ සිටුවන මනමාලියගේ මාමාට මනමාලයා විසින් දෙනු ලබන වස්ත්‍රය.

ඉස්කබල = 1. මොළය වසා පිහිටි ඇටය.

ඉස්කබල් සිව්ය = 1. ඉස් කබලේ නම.

ඉස්කර = 1. ඔලුව හා බෙල්ල.

ඉස්කරඓරිය = 1. කුඩා ලී පෙට්ටි වර්ගයක්. (ඉස්කර තෝරිය?)

ඉස්කාකරය = (ඉස්කාගරය) 1. අරක්කු පෙරන තැන.

ඉස්කුරුප්පු = 1. කරකවා සවිකරන ඇණ වර්ගයක්.

ඉස්කුරුප්පුනියන = 1. ඉස්කුරුප්පු ඇණ සවිකිරීමට හා ගැලවීමටද ගන්නා නියන.

ඉස්කෙඳි = 1. සතුන්ගේ ඔලුවේ කෙඳි.

ඉස්කෝප්පය = 1. පොළොව හෑරීමට ගන්නා උපකරණයක් 2. කබදාසි කුට්ටමේ කොළයක ලකුණක්.

ඉස්කෝලය = 1. පාඨශාලාව.

ඉස්ගහනවා = 1. ඉස් කපා දමනවා.

ඉස්ගෙඩි = 1. මාලු පැටියකු වැනි මැඩි පැටියා. 2. බෙංගියා.

ඉස්තන = 1. ස්තනය. (පයෝධරය)

ඉස්තම්බනය = 1. ස්තම්භනය. (තදකිරීම - කැටිකිරීම.)

ඉස්තිරාදිගණය = 1. අස්වැන්න ආදිකොට ඇති ඖෂධ ගණය.

ඉස්තරම් = 1. ප්‍රධාන. 2. ඉතා උසස්. 3. ඉස් පමණවූ.

ඉස්තාලය = 1. අශ්වයන් ආදි සතුන් බඳින ස්ථානය.

ඉස්තිර = 1. ඒකාන්ත. 2. සතිර (ස්ථිර).

ඉස්තිරික්කය = 1. රෙදි මදින උපකරණයක්.

ඉස්තිබායෑම් = (එදෙස) බලා යෑම.

ඉස්තෙල් = 1. මුලින්ම පෙරාගන්නා (කලවම් රහිත) හොඳ තෙල්. 2. හිසෙහි ගාන තෙල්.

ඉස්තෝප්පුව = 1. ගෙයක ඉස්සරහ කොටස. 2. ආලින්දය.

ඉස්ටුල = 1. තර; පුෂ්ටිමත්.

ඉස්දෙර = (ඉද්දර) 1. ඉස පැත්ත.

ඉස්දෙර දසා = 1. ඉස තිබෙන දිශාව.

ඉස්න = 1. ඉසින. 2. සේවනය කරන. 3. කැමැති වන.

ඉස්නස්නි = 1. ගම් සූරිය ගස්.

ඉස්පසිය = තොප්පිය. 2. හිස් වැස්ම.

ඉස්පරුස = 1. ස්පර්ශය.

ඉස්පිටිතාල = 1. ආරෝග්‍ය ශාලාව.

ඉස්පල්ල = 1. තැමේදී පහතට වැටෙන දිය.

ඉස්පාසුව = 1. ඉඩ. 2. විවේකය. 3. අවකාශය.

ඉස්පිල්ල = 1. අකුරක මුදුනට යෙදීමෙන් ''ඉ'' ශබ්දය උපදවන පිල්ලමක්. 2. අකුරු මත යෙදෙන ඇඳවූ රේඛාව.

ඉස්බ = 1. බඹ නිස්පතක දුර හෝ දිග ප්‍රමාණය.

ඉස්බිම්ලීම් = 1. හිස යටිකුරු කිරීම.

ඉස්බුම් = 1. විවේක ගැනීම; විශ්‍රාමය. 2. නිදා ගැනීම.

ඉස්බෙන = 1. විශ්‍රාම ගනිතොත්.

ඉස්බේවා = 1. රඳවා. 2. වෙයේවා. 3. සැත පේවා.

ඉස්බොළු = 1. ඉස්කබල.

ඉස්බොල්ල = 1. ආයුධ විශේෂයක්.

ඉස්ම = 1. යුෂ. 2. යම්කිසි පලතුරු ආදියක් මිරිකා ලබාගන්නා දියර.

ඉස්මන් = ඉස්මත්.

ඉස්මතු = 1. ඉහළ. 2. උසස්.

ඉස්මත්ත = 1. ඉහළ කොටස.

ඉස් මුදුන = 1. හිසේ මුදුන.

ඉස්මුල් = 1. මොළය. 2. ගොර්ද.

ඉස්මොළය = 1. ඉස්මොළේ. 2. මොළය.

ඉස්රන් = 1. ඉස් හෝ මිනිසුන් ගණනට අය කරන බදු මුදල.

ඉස්ලාම්ධර්මය = 1. මහමත් තුමාගේ ඉගැන්වීම.

ඉස්වට = 1. ඉස තිබෙන උස පමණ.

ඉස්වැටිය = 1. තලප්පාව.

ඉස්වැටීම් = 1. ඉස සෙලවීම.

ඉස්වැස්ම = 1. හිස වැසීමට යොදන දෙයක්.

ඉස්සර = 1. ආදි කාලයේ; පුරාතනයේ 2. මුලින්.

ඉස්සර කරනවා = 1. ඉස්සරහට දමනවා. 2. පෙරමුණ ගෙන යනවා.

ඉස්සර ජන = 1. ධනවත් හෝ බලවත් ජනයා.

ඉස්සරහ = 1. ඉදිරිපිට. 2. ඉදිරියේ. 3. පෙරමුණ.

ඉස්සා = 1. එනම් මාලුවා (නල මීනයා)

ඉස්සරිය = 1. සම්පත. 2. ඓශ්වර්යය. 3. ආධිපත්‍යය.

ඉස්සෙනවා = 1. උඩට යනවා.

ඉස්සොරි = හිසෙහි හැදෙන හොරි. 2. හිසෙන් ගැලවී වැටෙන කුඩා හම් කැබෙලි.

ඉසා = 1. ඊර්ෂ්‍යාව. 2. තවත්. 3. සහ.

ඉසාන = 1. උතුරට හා නැගෙනහිරටත් අතර අනුදිශාව.

ඉසානකොණ = 1. ඉසාන පැත්ත; ඉසාන දිශාව.

ඉසාව = 1. ඊර්ෂ්‍යාව.

ඉසි = 1. සිවදෙවියා. 2. ඍෂියා. 3. තාපසයා. 4. ඉස්සා. 5. ඊර්ෂ්‍යාව. 6. කැමැත්ත. 7. ඉසින ලද. 8. විසුරුවන ලද.

ඉසිකා = 1. ගොබය. 2. කාණ්ඩය. 3. පුරුක.

ඉසිගිලි = 1. එනම් පර්වතය.

ඉසිපතනාරාමය = 1. බුදුන් වහන්සේ ධර්ම චක්‍රය දෙසූ එනම් විහාරය.

ඉසිනවා = 1. (ලුණු ආදිය) ඉහිනවා. 2. (පැන් ආදිය) ඉහිනවා.

ඉසින්කණින් = (ඉහින්කනින්) 1. මුළු ඇගේම.

ඉසිනු = 1. කැමැතිවීම. 2. ඉසීම. 3. විසිරීම.

ඉසිපැවිජි = (ඉසි පැවිදි) 1. ඍෂි ප්‍රව්‍රජ්‍යාව.

ඉසිමත් = 1. ඊර්ෂ්‍යා ඇති.

ඉසිමු = 1 නලමීනයා. (ඉස්සා)

ඉසිය = 1. ඊර්ෂ්‍යාව. 2. සතුට.

ඉසියා = 1. සිව දෙවියා. 2. ඍෂියා.

ඉසිර = 1. වස්තුව. 2. තේජස. 3. ඓශ්වර්යය.

ඉසිරකුල = 1. ඊශ්වර කුලය.

ඉසිරි = 1. ඓශ්වර්යය.

ඉසුරු = 1. උච්චාරණය කළ (ශබ්දකොට කී).

ඉසිරෙනවා = 1. පැතිරයනවා. 2. විසිදියනවා. ඉතිරී යනවා.

ඉසිලිම = 1 උහුලා සිටීම. 2. ඉවසාගෙන ඉදීම.

ඉසිවත් = 1. ඊර්ෂ්‍යාවන්ත. (ඊර්ෂ්‍යා ඇති)

ඉසිවර = 1. ඍෂිවරයා.

ඉසිවරණ = 1. ශ්‍රෙෂ්ඨ ඍෂියා. 2. බුදුන් වහන්සේ.

ඉසිවාත = 1.ඍෂීන්ගේ හෝ භික්ෂූන්ගේ ඇගේ හැපී හමන සුළඟ.

ඉසිවෙස් = 1. තාපස වේශය.

ඉසු = 1. ඊර්ෂ්‍යාව.

ඉසුණු = 1. වැටුණු. 2. ඉහුණු. 3. විසිවුණු.

ඉසුඹු = 1. බඹ තිස්පහක දිග හෝ දුර ප්‍රමාණය. 2. සත්රියන් යෂ්ටි විස්සක දිග 3. විශ්‍රාමය

ඉසුඹු ලන හල් = 1. විශ්‍රාම ගන්නා ශාලා. 2. අම්බලම්.

ඉසුඹු ලමින් = 1. විශ්‍රාම ගනිමින්.

ඉසුඹු = 1. විඩාහැරීම. 2. විශ්‍රාම ගැනීම. 3. ඉස්බ.

ඉසුම් = 1. ඉසීම. 2. තද ආසාව. 3. යාච්ඤාව.

ඉසුර = 1. සම්පත.

ඉසුරු = (ඉසුරා) 1. ඊශ්වරයා. 2. වස්තුව. 3. ප්‍රධාන. 4 ඓශ්වර්යය. 5. ධනවතා. 6. ස්වාමියා. 7. වසන්ත කාලය. 8. උච්චාරණය කළ. (ශබ්දකොට කී) 9. උත්තම.

ඉසුරුකල් = 1. උමයඬගනාව. (ඊශ්වරයාගේ භාර්යාව.)

ඉසුරු කෝවිල = 1. ඊශ්වර දේවාලය.

ඉසුරුගිරි = 1. කෛලාස පර්වතය.

ඉසුරුදන = (ඉසුරු ජන) 1. පොහොසත්තු. 2. ප්‍රධානීහු. 3. අධිපති ජනයා.

ඉසුරුමත = 1. ඊශ්වර මතය. (පතඤ්ජලීහු විසින් කරන ලද යෝග දර්ශනය.)

ඉසුරුමත් = 1. ධන ඇති. 2. වස්තු ඇති. ඓශ්වර්යයෙන් මත්. 4. සැප පහසුවෙන් පිරිගිය.

ඉසුරුමදය = 1. වස්තුව නිසා ඇතිවන උඩඟුකම.

ඉසුරුව = 1. උච්චාරණය කළොත්.

ඉසුරුසඳ = 1. ලක්ෂ්මී (විෂ්ණුගේ භාර්යාව).

ඉසුලුම් = 1. උහුලාගෙන ඉදීම. 2. දැරීම.

ඉසුළු 1. දරු.

ඉසෙනවා = 1. ඉහෙනවා. 2. විසිරෙනවා.

ඉසේරදය = 1. හිස කැක්කුම.

ඉසොරා = 1. යසෝධරා දේවිය.

ඉෂු = 1. ඊය.

ඉෂ්ට = 1. ආශාවූ. 2. ප්‍රිය. 3. රුචිකළ. 4. අභිමත. 5. ශුභ. 6. ධර්මිෂ්ට.

ඉෂ්ටකරනවා = 1. ඉටුකරනවා. 2. සිද්ධකරනවා.

ඉෂ්ටඅර්ථ = 1. අභිමත කාරණය.

ඉෂ්ට ආලම්බන = 1. අදහස් කරන ලද අරමුණ.

ඉෂ්ට ආශංසන = 1. අභිමත දෙය පැතීම. 2. ශුභ ප්‍රාර්ථනාව.

ඉෂ්ටකා = 1. උළු 2. ගඩොල්.

ඉෂ්ටකාඡදන = 1. උළුවහල.

ඉෂ්ටකාමී = 1. යහපත කැමති. 2 දියුණුව පතන.

ඉෂ්ටකාල = 1. අභිමත හෝ වුවමනා කාලය.

ඉෂ්ටකාලය = 1. යහපත් වේලාව. 2. උළුගෙය.

ඉෂ්ටක්‍රියා = 1. යහපත් ක්‍රියාව. 2. හිතවැඩ

ඉෂ්ටගන්ධ = 1. සුවඳ.

ඉෂ්ටදර්ශන = 1. යහපත සලස්වන. 2. රිසිදෙය දෙන.

ඉෂ්ටදේවතාවා = 1. ඉටුදෙවියා. 2. යම් කිසි ශුභ විපාකයක් සිදුකරන දෙවියා.

ඉෂ්ට නිමිත්ත = 1. ශුභයයි සම්මත ලකුණ.

ඉෂ්ටඵල = 1. යහපත් විපාක

ඉෂ්ටමිත්‍රයා = 1. හිත මිත්‍රයා. 2. කල්‍යාණ මිත්‍රයා.

ඉෂ්ටරූප = 1. යහපත් රූපය.

ඉෂ්ටවස්තු = 1. අභිමත දෙය.

ඉෂ්ටවිපාකය = 1. යහපත් ප්‍රතිඵල. 2. කුසලෙන් ලැබෙන යහපත.

ඉෂ්ටවෙනවා = 1. යමක් හොඳාකාර සිද්ධවෙනවා.

ඉෂ්ටානිෂ්ට = 1. හොඳ හා නරක 2. යහපත හා අයහපත.

ඉෂ්ටාර්ථය = 1. ශුභ සිද්ධිය. 2. කැමති දේ.

ඉෂ්ටාලම්බනය = 1. යහපත් අරමුණ.

ඉහ = 1. මෙහි. 2. හිස. 3. ඉසිම කොට.

ඉහආත්මය = 1. මේ ජාතිය.

ඉහඉද්දර = 1 ඇඳේ ඉස තබන පැත්ත. 2. ඉස ළඟ.

ඉහකල් = 1. මේ කාලය.

ඉහගහනවා = 1. උහුලා සිටිනවා. 2. දරාසිටිනවා 3. හිස තබනවා.

ඉහගහන්ට බෑ = 1. දරා සිටින්නට බෑ. 2. උහුලන්ට බෑ. 3. හිස (නිදහසේ) තබන්නට බෑ 4. වාසයකරන්ට බෑ.

ඉහපිය = 1. ඉස 2. මුදුන. 3. (මාළුන්ගේ) ඉහ කොටස.

ඉහඬ = 1. ඉහඳ. 2. මැස්සන්ගේ බිජුවට.

ඉහත = 1 ඉස්සර. 2. පුරාතන 3. මුල. 4. ඉහළ.

ඉහතකාලේ = 1. ආදි කාලයේ. 2. පුරාණ කාලයේ.

ඉහත් කරනවා = 1. උසස්කරනවා. 2. උස්සනවා.

ඉහත්කාල = 1. පසුගිය කාලය.

ඉහත්තෙන් = 1. දුම්මල ගස. 2. කලින්.

ඉහත්තබාගෙන = 1. අත් හිසේ තබාගෙන.

ඉහඳ = (ඉහඬ බලන්න)

ඉහමොළේ කනවා = 1. ඇති ඇති දේ සූරා ගන්නවා.

ඉහළ = 1. ඉස්මත්ත. 2. උඩ.

ඉහළඅත්තක් = 1. උඩ අත්තක්. 2. තමාට වඩා උසස් (පවුලක්) තැනක්.

ඉහළ ඇලපත් = 1. කුඹුරක වැව අද්දර තිබෙන කොටස.

ඉහළපහළ = 1. උඩ හා යට.

ඉහළබාග = 1. ගමක හෝ කුඹුරක උඩ කොටස.

ඉහලෝක = 1. මෙලොව.

ඉහාත්මභාවය = 1. මේ ජීවිතය

ඉහි = 1. සමග. 2. ප්‍රමාදය. 3. එහි 4. ඇතුළුව.

ඉහිකුඩු = 1. ඉස්සන් ආදි කුඩ මසුන්.

ඉහිදැල් = 1. ඉස්සන් අල්ලන දැල් 2. තුනී රෙදි වෙසෙසක්.

ඉඟිදුල්සැට්ටය = 1. ඉස්සත් අල්ලන දැලක මෙන් කුඩා සිදුරු සහිත කබාය. 2. තුනී රෙදි වලින් ඇඳූ සැට්ටය.

ඉඟිදුල්කස්ස = 1. මේස් බැනියම.

ඉඟිනල = 1. ඉස්සත්ගේ අඬු-පඬු ආදිය.

ඉඟිනවා = 1. පොද පොද ඉසිනවා. 2. දිය ඇදීමෙන් හිස් කරනවා. 3. ධාන්‍ය ආදිය විසුරුවිනවා.

ඉඟිරනවා = 1. විසුරුවනවා 2. දිය ආදිය භාජනයකින් හැලෙන්නට සලස්සනවා

ඉඟිරෙනවා = 1. (දිය ආදිය හැලෙනවා) 2 (ශෙඩිය) ඉහිරෙනවා 3. නැතිවී යනවා

ඉඟිල = 1. සම්බන්ධවීම.

ඉඟිලස් = (ඉඟිලැස්) 1. බුරුල් 2 බුරුල් අදහස. 3. ආදරය.

ඉඟිලැලි = (ඉඟිල්) 1. මොළොක්. 2. සිහින්. 3. බුරුල්. 4. සිතල.

ඉඟිල්රෙද්ද = 1. සිහින් රෙදි වෙසෙසක්.

ඉඟිලිම = (ඉඟිලුම) 1. උසුලන්ට හැකි බව. 2. ඉසිලීම. 3. ඉවසා සිටීම.

ඉඟිල් = 1. රති ක්‍රීඩාව. 2. බුරුල්. 3. මොළොක්. 4. ලිහුණු 5. ආදරය.

ඉල් = 1. වතය. 2. සමූහය.

ඉළි = 1. උලකලදුව. 2 ගැළවී.

ඉළිම = 1. ඇතිල්ලීම. 2. ගෑම. 3. පිරිමැදීම.

ඉළු = 1. වතය 2. සමූහය. 3 මුව වෙසෙසක්.

ඉළුමුව = 1. ඒණී මෘගයා (ඕලු මුවා?)

ඉළුක් = 1. තණ වෙසෙසක්. (ඉළුබ්)

ඊ

ඊ = 1. 'ඉ' යන්නෙහි දීර්ඝ රූපය. 2. ඊය. 3. ඒ. 4. එහි.

ඊලරය = 1. ඊ දමන කොපුව.

ඊකඩිමු 1 ඊ මිටිය 2 හියවුර.

ඊකත්තු = 1. ඊ මිටිය හෝ ඊ අමුණා ගනු ලබන (කරුවක් වැනි) උපකරණය.

ඊකාරය = 1. "ඊ" යන්න.

ඊක්ෂණය = 1 බැලීම 2. දැකීම. 3. ඇස.

ඊගස = 1. ඊය. 2. තැට්ටුවන් විසින් ලීකෝටුවක ගොක් කොළ බැඳ ඊයක් මෙන් සාදා ගනු ලබන්න.

ඊගාණේ = 1 ඒ ගණනේ.

ඊඝ 1 උපද්‍රවය.

ඊගාවං = 1. ඒ ළඟ.

ඊට = 1. එයට. 2 ඒ දේට.

ඊටිය = 1. හෙණ්ඩුව.

ඊතණ = 1. තෘණ විශෙෂයක්.

ඊතලය = 1. ඊයේ උල් කොණ. 2 ඊය.

ඊතැලි = 1. ඊයේ තලයට ගත හැකි පමණ. 2. කලන් හතක ප්‍රමාණය.

ඊති = 1. විපත. 2. අනතුර.

ඊ දඬු = 1. ඊගස.

ඊ දැවමෙනවා = 1. එහිම හැසිරෙනවා.

ඊදෘශ = 1. මෙබඳු.

ඊදෝලාව = (ඊ දෝළිය - ඊදෙළුව) 1. දෝලාව.

ඊකියා = 1. එබඳු. 2. ඒ ආකාර. 3. යහපත් 4. (ඇතැම් පදයක් වශයෙන්) කදිම - හරි - හැබෑ.

ඊනිසා = 1. ඒ නිසා.

ඊප්සා = 1. කැමැත්ත.

ඊප්සිත = 1. අදහස් කළ. 2. කැමැතිවන ලද.

ඊප්සිත අර්ථ = 1. කැමැතිවූ කරුණ.

ඊපිටින්ම = 1. එහෙම පිටින්ම; මුළුමනින්ම.

ඊම = 1. ඒම 2. පැමිණීම.

ඊය = 1. ඊ ගස. 2. ඊතලය.

ඊයම් = 1. එනම් ලෝහ වර්ගය.

ඊයම් බරු = 1 දැල කෙළින් තබා ගැනීම සඳහා මසුන් අල්ලන දැල්වල සවිකරන ඊයම් කැබලි.

ඊයේ = 1. අදට කලින් දවස. 2. ඉකුත් වූ දින.

ඊයේ වෑහිද = 1. ඊයේ (ඊය්යේ)

ඊර = 1. කම්පාවීම.

ඊරම්බු = 1. කපුනූලින් සෑදූ රෙද්ද. 2. ඇතිරිල්ල.

ඊෂී = 1. ඌරාගේ ගැණු සතා. 2. ඌරු දෙන.

ඊෂිය = 1. ගස් වර්ගයක්.

ඊර්ය්‍යාපථ = 1. සිටින ආකාරය. 2. ඉරියව්ව.

ඊර්ය්‍යාපථවිහාර = 1. ඉඳුම් - හිටුම් ආදිය.

ඊර්ෂ්‍යා = 1. අනුන්ගේ යහපතට අසතුටු බව.

ඊර්ෂ්‍යාලු = 1. ඊර්ෂ්‍යාව බහුල කොට ඇති

ඊෂිත = 1. අරිනලද.

ඊරුව = 1. දියකඩ විශේෂයක්. 2. ජල වේගය.

ඊල් = 1. අේළුව. 2. ඔත්විල්ලාව. 3. දෙර බඳින ලනුව. 4. සෑදලය 5. අසුන් බඳින වරපට. 6. සිහිල්.

ඊලඇදුම = (ඊලේ ඇදුම) 1. මුත්‍ර රෝගය.

ඊලිම් = (ඊලුම්) 1. ඇදීම. 2. එක්කොට බැඳීම.

ඊල්ල = 1. ගස් වර්ගයක්.

ඊලඟ = 1. ඒ ළඟට.

ඊෂුරය = 1. ඊතල පහර. 2. ඊයේ වේගය.

ඊශ = 1. ප්‍රධානයා 2. ඊශ්වරයා.

ඊශාධර = 1. මහ මෙර වටා පිහිටි කඳු පෙළක්.

ඊශාන = (ඊශානදිග) 1. උතුරටත් නැගෙන හිරටත් අතර අනු දිශාව.

ඊශ්වරයා = 1. ප්‍රධානයා. 2. ස්වාමියා. 3 මහ දෙවියා 4. මැවුම් කාරයා.

ඊශ්වරත්වය = 1. අධිපතිකම. 2. ස්වාමිකම.

ඊශ්වරකුල = 1. ප්‍රධාන කුලය. 2. ඉසුරු කුලය

ඊශ්වරජන = 1 ඉසුරුදන 2. ප්‍රභූජනයා.

ඊශ්වරතා = 1. ප්‍රධානත්වය. 2. වශීභාවය.

ඊශ්වරතාණ්ඩව = 1. ඊශ්වරයාගේ නැටුමක්.

ඊශ්වර නිර්මිත = 1. ඊශ්වරයා විසින් මවනලද.

ඊශ්වර භක්ති = 1. ඊශ්වරයා අදහන.

ඊශ්වරමිත්‍ර = 1. කුවේරයා.

ඊශ්වරවාද = 1. ලෝකය දෙවියකු විසින් මවන ලදැයි යන කථාව.

ඊශ්වරවිංශතිය = 1. ඊශ්වරයාට අයත් යයි (ව්‍යවහාරයෙහි පවත්නා) අවුරුදු විස්ස.

ඊශ්වරී = 1. ඊශ්වරයාගේ භාර්යාව වූ උමයාංගනාව. 2. උමයංගනාවගේ අවතාරයක් වූ දුර්ගාව. 3. සත්හඳ වැල.

ඊශ්වරේශ්වරයා = (ඊශ්වර + ඊශ්වරයා) 1. දෙවි-යන්ගේ දෙවියෝ 2. බුදුන් වහන්සේ.

ඊෂත් = 1. ස්වල්ප. 2. පහසුවෙන් කට හැකි.

ඊෂදුෂ්ණ = 1. මඳක් උණුසුම.

ඊෂදූන = 1. ටිකක් අඩුවූ.

ඊෂද්දර්ශනය = 1. කොට බැල්ම.

ඊහා = 1. ක්‍රියාව. 2. උත්සාහය.

උ

උ = 1. ඊශ්වරයා. 2. ඔහු. 3. උපසර්ගයක්.

උක = (උක්) 1. උග්ගස. 2. උක් පැණි

උකට = 1. කලකිරීම 2. උත්කෘෂ්ට. 3. ඉතා හොඳ. 4. උතුම්. 5. ආඩම්බරයෙන් උඩට නැගූ බෙල්ල ඇති.

උකට උවම = 1. උත්කෘෂ්ටොපමා දේශය. 2. ඉතා පහත් දෙයක් හා ඉතා උසස් දෙයක් සමාන කිරීම.

උකටපා = 1. උත්කෘෂ්ට පාත්‍රය.

උකටලී = 1. උනන්දුවක් නැති. 2. කලකිරුණු 3. කම්මැලි 4. අප්‍රිය.

උකබලිය = 1. ආඩම්බර ස්ත්‍රී 2. කලකිරුණු ස්ත්‍රී. 3. කලකිරිල්ල.

උකනවා = 1. ඔසවනව. 2. අහුලනවා. 3. ඉහිනවා. 4. එකතු කරනවා.

උකබින් = 1. උකහමින්. 2. කනමින්.

උකස = (උකස - උගස) 1. ණය ගැනීමේදී ඇප වශයෙන් තබන දේ.

උකස් ඔප්පුව = (උකස්කරය) 1. දේපළ උකස් තැබීමේදී ලියා ගනු ලබන ලියවිල්ල.

උකහ = 1. උකස (උගස)

උග්ගහත = 1. අධික කරන කල්හි 2. ඇද ගන්නා කල්හි.

උග්ගහන = 1. තනන. 2. වඩන.

උග්ගහට = (උගහට) 1. දුෂ්කර. 2. අමාරු.

උග්ගහා = 1. උදුරා. 2. ඔසවා. 3. ඇද 4. උරා 5. ගෙන 6 උපුටා.

උග්ගා = 1. ඔසවා. 2. නගා.

උග්ගාසි = 1. මොර ගස.

උග්ගාවස්රද් = 1. ඉක්ෂ්වාකු රජ.

උක් = 1. උක් ගස්. 2. උක් පැණි.

උක්කගන්නවා = 1. විරුද්ධ වෙනවා. 2. කඩා පැන කථා කරනවා.

උක්කගහනවා = 1. ඉකිබිඳ හඩනවා.

උක්කට්ඨ = 1. උත්කෘෂ්ට. 2. ශ්‍රේෂ්ඨ.

උක්කණ්ඨය = 1. කලකිරීම. 2. පසුබට වීම.

උක්කණ්ඨිත = කලකිරුණු.

උක්කණ්ණ = 1. ඔසවාගත් කන්ඇති.

උක්කන්තන = 1. උදුරා දැමීම.

උක්කා = 1. ගිනිහුල. 2. පන්දම. 3. රන් කරුවාගේ ගිනිඋදුන. 4. අහසෙහි උල්කාපාතය.

උක්කාචනා = 1. උසස්කොට හැඳින්වීම. 2. බොරුවෙන් උසස්කොට කීම. 3. පැහැදිලි කිරීම.

උක්කාර = 1. කසල 2. අශුචි 3. අපවිත්‍රදෙය 4. සත්ව මල.

උක්කාචිත = 1. තපුරා ආශ්‍රය කළ.

උක්කිරි = 1. ඇට්ටකුණා. 2. දළක් කිරි. 3. දියාරු නුවූ කිරි.

උක්කුජ්ජ = උඩුකුරු වූ.

උක්කුජ්ජ පඤ්ඤ = 1. උඩුකුරු වූ බඳුනක් වැනි නුවණ ඇත්තා. 2. උගත් දේ හොඳින් දරන්නා. 3. ප්‍රාඥයා. 4. ධාරණ ශක්තිය ඇත්තා.

උක්කුටික = 1. අඩ දණිව හිඳීම.

උක්කුටුක = 1. උක්කුටිකය. 2. තට්ටම බිම ඇන හිඳීම.

උක්කුට්ඨි = 1. මහත් ඝෝෂාව. 2. ඔල්වර හඬ.

උක්කුස = 1. කබරුස්සා නම් පක්ෂියා.

උක්කූල = 1. උස්වූ පවුරු ඇති. 2. ප්‍රපාත ඇති

උක්කෙකමි = 1. උස්වූ කර්ණිකාව.

උක්කෝටන = 1. යුක්තිය යටපත් කිරීම.

උක්ඛලි = (උක්ඛලිකා) 1. හැළිය.

උක්ඛිත්ත = 1. එසවූ 2. ඔසවා දැමූ 3. සභාවෙන් පිට දැමූ

උක්ඛේප = 1. උඩදැමීම. 2. එසවීම. 3. ඉවත දැමීම.

උක්ඛේපක = 1. උඩ විසිකරන්නා. 2 ඉවත දමන්නා.

උක්ඛේපනීය = 1. සමාගමයෙන් ඉවත් කළයුතු.

උක්ත = කියන ලද.

උක්ත අනුක්ත = 1. කී නොකී.

උක්තප්‍රකාර = 1. කියූ ආකාරය.

උක්තිය = 1. කියමන.

උක්දුණු = (උක්දුනුවායා) 1. අතබඟයා.

උක්පිඬි = (උප්පිඬි) 1. ගොයම් මිටි.

උක්පිඬිකිරීම = 1. කැපූ ගොයම් මිටි බැඳීම.

උක්බෙරිය = 1. ගස් වර්ගයක්.

උක්මනු = 1. ඉක්මන්වීම. 2. ගෙවීම්.

උක්ලාප = 1. කසල.

උක්ලාපශුඞ් = 1. කුණු කුල්ල.

උක්ෂ = 1. වෘෂභයා.

උඛා = 1 හාරා. 2. අවුලා. 3. ඉස්සුවාවූ.

උඛාංශගන = 1. අවුලාගෙන. 2 හාරාගෙන. 3. පැහැරගෙන. 4. උරාගෙන.

උකාරය = 1. 'උ' යන්න.

උකැබෑ = 1. කලකිරී.

උකැටි = 1. කලකිරුණු. 2. කම්මැලි. 3. උනන්දු නැති.

උකැසැ = 1. කැසි කාරා.

උකැසි = 1. කැරීම. 2. උගුර පෑදීම.

උකු = 1. දියාරු නැති. 2. ඝනවූ. 3. ගොරවන ශබ්දය.

උකුතැළිම් = 1. හෙරවීම. 2. නාද කිරීම.

උකුෂදම = 1. බෙහෙත් පිසගන්නා පදමක්.

උකුඹු = 1. ඔල්වර හඬ 2 මහත් ඝෝෂාව.

උකුඹුකුල්හඬ = (උකුටු බලන්න)

උකුණා = 1. ඉසකෙස් අතර බෝවෙන කුඩා සතා. 2. කඩියා.

උකුණුගස් = 1. මඬින ගොයම් අවුස්සන කරුව සහිත දිග ලීය.

උකුණුදැති = 1. උකුණු ගසෙහි කරුව.

උකුණුලී = 1. පහතට බානා ලණුවේ අගට යෙදූ කරුව.

උකුණුවළ = 1. ගල වළව. 2. ඔලුවේ පිට පැත්තේ බෙල්ලට උඩින් වළ ගැහුණුතැන.

උකුනිල්ල = 1. රා මදින්නාගේ කොක්ක

උකුත් = 1. පහුගිය. 2. මියගිය.

උකුබානවා = 1. දෙස් පවරනවා. 2. බණිනවා.

උකුරු = 1. උසස් 2. උතුම්.

උකුල් = 1. ඉගටිය. කටිය; උකුල;

උකුල්ඇටය = 1. උකුලෙහි තිබෙන ඇටය. 2. ඉන ඇටය.

උකුල් දෙනුවන් = 1. ඉස්සීම. 2. ආධාර දීම.

උකුල්සන්ධිය = 1. ඉනේ හන්දිය

උකුස්සා = (උකුසා) 1. එනම් පක්ෂියා.

උකුසාවන්නම = 1 දසඅට වන්නමෙන් එකක්.

උකුසු = 1 එනම් ලිහිණියා. 2. උකුස්සා.

උකුළ = 1. උකුල 2. කලවය. 3. කුකුළා. 4. ඉකිළිය. 5. ඒරියෑ කඳ.

උකෙඩ = 1; අස්කිරීම.

උකෙඩනීකම = 1. උක්ඛෙපනීය කර්මය. 2. භික්ෂුවක් අස්කිරීමේ විනය කර්මයක්.

උග් = 1. උග්ගස්.

උග = 1. බඳුන් ආදිය එල්ලා ගැනීමට බඳින ලනුව. 2. පැස 3. මල්ල.

උගතමනා = 1. ඉගෙනගත යුතු.

උගත් = 1. ඉගෙනගත්. 2. දැනගත්.

උගන්වන = 1. ඉගෙනීම කරවන.

උගස = 1 උකස.

උගහ = 1. ඉගෙනීම හෝ ඉගැන්වීම. 2. උගස.

උගහට = 1. අමාරු. 2. අසීරු. 3. දුෂ්කර. 4. අපහසු.

උගහා = 1. ඉගැන්වීම.

උග්ග = 1. වදකන. 2. බලවත්. 3. දරුණු. 4. ක්ෂත්‍රියයාට දුව ශුද්‍ර ස්ත්‍රියගෙන් උපන් අය.

උග්ගත = 1. උස්වූ. 2. නැඟුණු 3. උය්ව නැඟි. 4. පහළ වූ.

උග්ගම = 1. නැඟීම. 2. ඉහළයාම 3. පහළවීම.

උග්ගමන = 1. උඩ නැඟීම. 2. මතුවීම.

උග්ගහ = 1. ඉගෙනීම. 2. පුරුදු කිරීම.

උග්ගහ නිමිත්ත = 1. බොහෝ වේලාවක් භාවනාවෙහි යෙදීමෙන් හොඳින් පුරුදු වූ අරමුණ.

උග්ගහණ = 1. ඉගෙනීම.

උග්ගහිත = 1. උඩින් වැටෙන දෙයක් අතරදී අල්ලා ගැනීම. 2. උගත්. 3. ඔසවාගත් දෙය. 4. වරදවාගත් දෙය

උග්ගාර = 1. තැලි නැගීම. 2. රාම තැල්ල.

උග්ගාහක = 1. ඉගෙන ගන්නා. 2. ඔසවන්නා.

උග්ඝෝෂණ = 1. උද්ඝෝෂණය කිරීම.

උග්ඝටිත = 1. විවෘත කළ. 2. වියළීවත්.

උග්ඝටිතඤ්ඤු = 1. සියුම් නුවණ ඇත්තා. 2. යම්තම්න් කරුණක් කියූ පමණින් සම්පූර්ණයෙන් අවබෝධකරගන්නා ප්‍රාඥයා.

උගානිමිත් = 1 උද්ග්‍රහ නිමිත්තය.

උගැහැනිමිත් = (උගානිමිත් බලන්න).

උගු = 1. උක්. 2. උගය.

උගුකිරි = 1. දළක්කිරි.

උගුඩුවා = 1. කැළෑ බළලා. 2. කලවැද්දා. 3. කොළ දිවියා.

උගුදණ්ඩ = 1 උක් දණ්ඩ.

උගුර = 1. නිකටත් බෙල්ලත් අතර කොටස. 2. වරකට කටට ගත හැකි දිය ප්‍රමාණය. 3. කණ්ඨනාලය.

උගුරට සොරා බෙහෙත් කෑම් = 1. අවශ්‍යයෙන් දතමනා අයටද නොදන්වා ක්‍රියා කිරීම.

උගුරැස්ස = 1. එනම් ගස් වෙසෙස. 2. එනම් පලතුරු.

උගුරුවළලු = 1. ගල තාළුය.

උගුල = 1 ප්‍රයෝගයකින් ඇල්ලීම. 2. මල පුඩුව. 3. හබක. 4. පාෂාණ යන්ත්‍රය.

උගුඩුමල = 1 උගුල් සඳහා යොදන මලපුඩු.

උගුසෑව්ගුරු = 1. විෂ්ණු. 2. අනඞ්ගයාගේ පියා.

උගුසැව් = (උගුයට සැව්) 1. අනඞ්ගයා. 2. උක් දණ්ඩකින් කළ දුන්නක් ඇත්තා.

උගුලනවා = 1. උදුරනවා. 2. පහකරනවා. 3. මුලින් උදුරා දමනවා.

උගෙන = 1. ඉගෙන ගෙන.

උගේ = ඌගේ.

උග්‍ර = 1. තද. 2. සැර. 3. තියුණු. 4. බලවත්. 5. දැඩි. 6. කටුක. 7. උත්කෘෂ්ට. 8. රෞද්‍ර.

උග්‍රගන්ධ = 1. තද සුවඳ ඇති ද්‍රව්‍යයක්. 2. වදකහ.

උඝොසනු = 1. උද්ඝෝෂණය කිරීම.

උච්ච = 1. උසස්. 2. උස්වූ. 3. ප්‍රධාන. 4. බලවත් වූ.

උච්චක්ෂෙත්‍ර = 1. සූර්‍ය්‍යාදි ග්‍රහයන්ගේ උසස් රාශිවූ මේෂාදිය.

උච්චතර = 1. ඉතා උසස්. 2. වඩා උස.

උච්චතරු = පොල්ගහ.

උච්චග්‍රහයා = 1. උසස්වූ ග්‍රහතරුව.

උච්චරාශි = 1. උච්චක්ෂෙත්‍රය. 2. ග්‍රහයෙකුගේ උසස් ගුණදෙන රාශිය.

උච්චාරණය = 1. ශබ්දකිරීම. 2. කීම.

උච්චකුල = 1. උසස් කුලය

උච්චාකුලික = 1. උසස් කුලයෙහි උපන්. 2. උසස් කුලයට අයිති.

උච්චාරූල්හ = 1. දුගැබ් මලු ආදියෙහි ඇතුන් ආදීන් පිටින් ගියවුන් පැසෙන නිරය.

උච්චාරය = 1. අශුචිය.

උච්චාවච = (උච්ච + අවච) 1. උසස් පහත්. 2. නන් වැදෑරුම්.

උච්චාසනය = 1. උස් ආසනය.

උච්චාසයන = 1. උස්වූ ඇඳ.

උච්චාටන = 1. සිය තැනින් අස්කිරීම. 2. සූසැට කලා ශිල්පයන්ගෙන් එකක්.

උච්චාර පස්සාව = 1. මල හා මූත්‍ර.

උච්ඡිට්ඨුව = 1. සිට්ටුව.

උච්ඡීර්ෂකය = 1. කොට්ටය.

උච්ඡංගය = 1. ඔඩොක්කුව. 2. උකුල. 3. ඇලපත.

උච්ඡාදන = 1. ඇඟ ඉලීම.

උච්ඡංඝ ප්‍රාඥතා = 1. යමක් හිතේ තබා ගැනීමට ධාරණ ශක්තිය නැත්තා.

උච්ඡිෂ්ඨ = 1. කෑ ඉතිරිකළ 2. ඉඳුල් කළ 3. ඉඳුල්.

උච්ඡිත = 1. ප්‍රසිධ. 2. උසස්කළ.

උච්ඡින්න = 1. ඉදුරු. 2. සිඳ දැමූ.

උච්ඡු = 1. උක් ගස.

උච්ඡුරස = 1. උක් පැණි. 2. උක් ගසේ යුස.

උච්ඡේද = 1. සිඳීම 2. නැවත නොඉපදීම.

උච්ඡේද දිට්ඨි = (උච්ඡේද වාද) 1. සත්වයා මේ භවයෙන් අවසන් වේයයි ඇදහීම.

උචිත = 1. සුදුසු.

උජ්වාසන = 1. හිංසාව. 2. මරණය.

උජ්ජාරිකාව = 1. විජාරිකාව; කිතිල්ලේ එක ගෙඩි වෙසෙසක්.

උජ්ජාරුව = 1. බොරු පොහොසත් කමක් හෝ බලවත් කමක් පෙන්වීම.

උජු = 1. ඍජු වූ 2. ඇද නැති. 3. අවංක.

උජුක = 1. ඇද නැති. 2. කෙළින් පිහිටි.

උජුගතා = 1. ඍජු බවට පැමිණි. 2. කෙළින් යාම.

උජුතා = 1. ඍජු බව. 2. අවංක භාවය.

උජුපටිපන්න = 1. ඍජුවූ ආර්‍ය්‍ය මාර්ගයට පිළිපන්.

උජුපිශඩි = 1. ඍජු ප්‍රතිපත්ති.

උජුන් = 1. උදුන. 2 ලිප.

උජුල් = 1. ඉඳුල්. 2. කෑ ඉතිරි කළ දේ.

උජෝ = 1. උසස්කම. 2. අගය.

උජෝබෑඩීම = 1. උසස්කම කියාපෑම. 2. ආසාකරවීම.

උජ්ජග්ඝිකා = 1. මහ සිනාව.

උජ්ජඞ්ගල = 1. නිසරු බිම 2. කාන්තාරය.

උජ්ජල = 1. දල්වෙන. 2 බබළන.

උජ්ජලන = 1. බැබළීම.

උජ්ජ්වලිත = 1. බැබළුණු.

උජ්ජෝත = 1. එළිය. 2. බැබළීම.

උජ්ඣාන = 1. දොස්කීම. 2. වරදගැනීම.

උජ්ඣාපන = 1. දොස් කියවීම.

උජ්ඣිත = 1. හැරදැමූ.

උඩුකම්බ = 1. උතුකට්ටුව. 2. පොල්කට්ටුව. 3. දකලතුකට්ට

උට්ඨාන = (උත්ථාන) 1. නැගිටීම. 2. උත්සාහය. 3. ඉපදීම. 4. අභිවෘද්ධිය.

උට්ඨානක = 1. උපදවන. 2. හටගන්නා.

උට්ඨානවන්තු = 1 වීර්යවත්. 2. කුසීත නොවූ.

උට්ඨාන විරිය = (උත්ථාන වීර්ය) 1. උත්සාහ වීර්යය; නොපසු බස්නා උත්සාහය.

උට්ඨාපන = 1. නැගිටුවීම.

උට්ඨාපනීය = 1 නැගිටවියයුතු

උට්ඨාපිතගණිතාරක = 1. නිරයක්.

උට්ඨහශ් = 1. නැගිට. 2. වීර්යකර.

උඩ = 1. උස් 2. ඉහළ. 3. මුදුනේ 4. පැරණි සිංහලයන් ඇඳි කොට් යට කලිසම; උඩේ.

උඩ අක්කෝ කැඩීම = 1. රැවටිලි බසින් හිත උනන්දු කරවීම. 2. බොරු වණ්ණනාවෙන් රවටා ගැනීම.

උඩඅළු = 1. ගස් කැපීමෙහිදී උඩින් කරන කැපුම.

උඩඇල්ම = (උඩුඇල්ම) 1. හුස්ම පහළ නෙළිමේ අපහසුව.

උඩඑළි = 1. උළුවස්සේ උඩ පඩිය (උඩෙළි-පත්ත)

උඩකබල = 1. ආප්ප ඉවීමේදී උඩින් තබන අඟුරු සහිත කබල.

උඩගන්නවා = 1. නංවා සිටුවනවා. 2. දියුණු කරනවා. 3. උස්සනවා.

උඩගම්පහ = 1. උඩගම්පය භාරව සිටි දෙවැනි අදිකාරම

උඩගු = 1. ආඩම්බර. 2. උඩුකුරුවූ අගඇති.

උඩගෙඩිදීම = 1. (කලහ ආදියට) උනන්දු කරවීම

උඩත් = 1. වඩා උඩ. 2. වඩා උස. 3. උඩ පැත්ත. 4. ප්‍රධාන.

උඩත් පිරිස = 1. උසස් අය. 2. වැඩි තරම.

උඩත් පිරිසෙකින් = 1. ඉතා වැඩි තරමින්. 2. වැඩි වශයෙන්.

උඩත් පිරිසේ = 1. උසස්ම පරිච්ඡේදය. 2. ඉහලම සීමාව.

උඩනා = (උඩනු) 1. අසත් පුරුෂයා 2. අඥානයා. 3. දික්වූ දත ඔබල ඇත්තා.

උඩනුවා = 1. දික් දණ ඇත්තා. 2. නපුරු මිනිහා

උඩ පඩි කද = 1. දොරේ උඩ එළිපත්ත.

උඩප්පරම් = 1. උඩගුකම (උඩප්පරත්)

උඩපැනීම = 1. ඉහල පැනීම 2. හමත්ගේ තරාතිරම ඉක්මවා උඩගුව ක්‍රියා කිරීම.

උඩබලු = 1. ඔසු වෙසසක් (පිට සුදු සාරණ)

උඩ බිම බලා වැඩකිරීම = 1. කල්පනා කොට කටයුතු කිරීම. 2. සිහියෙන් යුතුව පරීක්ෂා කොට වැඩකිරීම.

උඩබුබු = 1. උඩුමහල

උඩබුරලනවා = (උඩබුරැලනවා) 1. (බල්-ලන්ගේ) උඩබලාගෙන බිරීම.

උඩමාල = 1. උඩුමහල; උඩ තට්ටුව.

උඩය = (උඩේ) 1. පැරණි යටි කලිසමක්.

උඩරට = 1. කඳුරට 2. උඩහ. 3. පෘතුගීසි කාලයේදී සිංහල රජුට යටත් වූ ප්‍රදේශය.

උඩරවමින් = 1. නගාගනිමින්.

උඩල = 1. කුඹුරෙහි ඉහළ පැත්ත. 2. අල වෙසෙසක්.

උඩලිපත = (උඩෙලිපත) 1. උළුවස්සේ උඩ පඩිය.

උඩලිය = 1. උඩ එළිපත්ත.

උඩවැඩියා මල් = 1. ඉරිකෙහෙල් මල්. 2. පිළිල වෙසෙසක් (ඕකිඩ් නම් මල් වර්ගය)

උඩවැඩුණු = 1. උස්ව වැඩුණු.

උඩහ = 1. උඩරට. 2. උඩ පැත්ත.

උඩහල්ල = 1. එල්ලෙන රාක්කය. 2. භාජන ආදිය තැබීමට වේවැල් ආදියෙන් සෑදූ පිරි වැස්ස හෝ සාල්ල.

උඩස් = 1. උඩ කොටස.

උඩාවක් = 1. කුඹුරෙහි ඉහල කොටස.

උඩැක්කිය = (උඩැකිය) 1. එනම් බෙර වර්ගය.

උඩැස්බෙර = 1. මහ බෙර.

උඩින් = 1. ඉහළින්.

උඩු = 1. ඉහළ. 2. මුදුන. 3. වඩා උස් වූ 4. තාරකාව. 5. උඩ පැත්ත.

උඩුඅත = 1. උඩපැත්ත. 2. උඩු කුරු අත.

උඩුඅග්ලොම් = 1. උඩුකුරු අග ඇති ලෝම.

උඩුකාහ = 1. උඩ පැත්ත.

උඩුකුරු = (උඩුහුරු) 1. උඩට මූණලූ. 2. උඩ බලා පිහිටි.

උඩුගං = 1. ගඟේ ඉහළ.

උඩුගුරුහඬ = 1. බල්ලන්ගේ උඩබුරලන ශබ්දය.

උඩුතල = 1. උඩ තට්ටුව.

උඩුකල්ල = 1. මූඛය තුළ උඩ පැත්ත.

උඩුතොල = 1. මුඛය වැසෙන උඩ තොල

උඩුදූළි = 1. උඩු තොලේ රැවුල (උඩු රැවුල)

උඩුනු = 1. මෝඩයා.

උඩුප = (උඩුබ) 1. පහුර. 2 කුඩා කැව

උඩුපති = 1. තාරකාවන්ගේ ස්වාමියා 2. චන්ද්‍රයා.

උඩුපථ = (උඩුපථය) 1. තාරකා මාර්ගය. 2. අහස.

උඩුපතුල = 1. පයෙහි උඩ පැත්ත.

උඩුපය = (උඩුබය) 1. පහුර. 2. ඔරුව. 3. චන්ද්‍රයා.

උඩුපිල = 1. අං ඇදීම් ආදි ක්‍රීඩාවන්හි යෙදෙන පක්ෂ දෙකින් එකක්. 2. උඩ කොටස.

උඩුපෝ = 1. ගඟ ඉහළ.

උඩුබැලිහෝනා = 1. උඩුකුරුව නිදන.

උඩුබුරලනවා = (උඩබුරලනවා බලන්න)

උඩුමහල් = (උඩුමහාල් – උඩුමාල්) 1. ගෙයක උඩ තට්ටුව. 2. සොල්දරය.

උඩුමිකියාවුනා = 1. බියෙන් තැතිගෙන උඩ බැලූනා.

උඩුමුලු = 1. ගමක හෝ ඉඩමක ඉහළින් පිහිටි තුඩක් වැනිවූ කොටස.

උඩමුවවූ = 1. මූණ උඩ අතට හරවා ගත්තාවූ. 2. උඩුකුරු මූඛය ඇති.

උඩුමොළය = 1. මොළයේ උඩ කොටස.

උඩුයටියාවීම් = 1. පෙරළීම. 2. විපර්‍යාසවීම.

උඩුරැවුල = 1. උඩු තොලෙහි වැවෙන රැවුල.

උඩුව = 1. චන්ද්‍රයා සිටින ස්ථානයක්. 2. වතුර 3. තරුව.

උඩුවගු = 1. උඩ බලා පිහිටි.

උඩුවියන = 1. උඩ බඳින වියන.

උඩුසුළං = 1. සුළඟ හමා එන පැත්ත.

උඩුහුරු (උඩුකුරු බලන්න.)

උඩුහෝ = 1. උඩ ගඟ. 2. ගඟේ හෝ ඇලේ ඉහළ කොටස 3. උඩු හොය.

උණ්ඩ = 1. යට ඇඳුමක්.

උනග = 1. අනඞ්ගයා.

උනත = (උනතුස්) 1. උස්. 2. උසස් වූ. 3. උඩඟු.

උනඹර = 1. නිර්වස්ත්‍ර තාපසයා. 2. වැරදි ඇදහීම් ඇත්තා.

උනන = 1. මුදන. 2. ලිහන. 3. දිය ඇදී එන. 4. උඩට ගලන.

උනන්දු = 1. උත්සාහවත්. 2. ප්‍රාණවත්. 3. කඩිසර 4. උද්‍යෝගී.

උනහපුළුවා = (උනහපුළුවා) 1. එනම් සතා. 2 වඳුරු වර්ගයක්.

උනම්බර = (උනඹර බලන්න.)

උනස්න = 1. ඉදුම් ගත් ආසනය.

උන් = 1. හිඳගත් 2. ඌන, අඩු 3. ඔවුන්.

උන්ගා = 1. විෂ කටු සහිත කුඩා මාලුවෙක් (හුංගා) 2. කුඩා එකා.

උන්නඩශල = 1. උඩ එල්ලා තැබූ තගුල්ඇති.

උන්දැ = 1. උන්වහන්සේ. 2. එතුමා. 3 හෙතෙම.

උන්දුරයා = (උන්දුරුවා) 1. මීයා.

උන්නත = 1. උස්. 2. උසස්වූ. 3. උඩගු වූ.

උන්නතාවනත = (උන්නත + අවනත) 1. ඉහළ - පහළ. 2. නැඟීම් - බැසීම. 3. රැළ ආකාර (උස් පහත්වූ)

උන්නතිය = 1. නැඟීම. 2. වැඩි දියුණුව. 3. උසස් භාවය. 4. මාන්නය.

උන්නයනය = 1. උස්කිරීම. 2. වාදකිරීම. 3. උඩට නැංවීම..

උන්නාමල්‍රාධනෑ = 1. ඇඟි හොඳගියක් නෑ. 2. මගුල් උතුලාවලට නෑ.

උන්නැබ = 1. (උණ්ණනාභි) මකුළුවා.

උන්නැහේ = 1. ඒ තැනැත්තා. 2. එතුමා. 3. උන්නාන්සේ.

උන්නාදය = 1. මහත්වූ හඬ. 2. උස්හඬ.

උන්නාන්සේ = 1. උත්තම තැනැත්තා. 2. භික්ෂුන් වහන්සේ.

උන්මත් = 1. උන්මාද; උමතු. 2. අත්තන නම් ගස් වෙසෙස.

උන්මතු = 1. උන්මත්තක. (උමතු)

උන්මත්ත = 1. උමතු. 2. ඔල්මාද

උන්මදය = (උන්මාදය) 1. පිස්සුව. 2. ඔල්මාදය.

උන්මාන = 1. උඩින් මැනීම. 2. ප්‍රමාණ කිරීම.

උන්මාර්ග = 1. වැරදි මග 2. නොමග 3. දුශ්චරිත

උන්මාර්ගගාමී = 1. නොමග යන.

උන්මාර්ජන = 1. අතගෑම. 2. පිරිමැදීම. 3. පරීක්ෂාකිරීම.

උන්මීලනය = 1. ඇස් විවෘත කිරීම. 2. පුබුදුවීම

උන්මීලිත = 1. ඇස් ඇරියාවූ.

උන්මුඛ = 1. උඩුකුරුකළ මුඛය ඇති. 2. උඩ බලා සිටින්නාවූ 3. සූදානම්.

උන්මූලනය = 1. මුලින් උදුරා දැමීම.

උන්මේෂය = 1. ඇස් ආදිය විවෘත කිරීම. 2. මදක් ප්‍රකාශය 3. විකාශ කර දැමීම.

උන්වමින් = 1. පැළ කරමින්. 2. හිඳුවමින්.

උන්වහන්සේ = 1. එතුමා. 2. උත්තම තැනැත්තා. 3. භික්ෂුන් වහන්සේ.

උන්වාලු = 1. ඉන්දවන ලද.

උන්ෂිෂ = 1. ඔටුන්න. 2. හිස.

උනා = 1. ලිහා. 2. හටගෙන. 3. මුදා.

උනු = 1. අඩු; අසම්පූර්ණ. 2. ඌනවූ.

උනුඅනූ = 1. අසූ නවය.

උනුඅසූ = 1. හැත්තෑ නවය.

උනුකොළලයා = 1. ගැරඩියා.

උනුන් = 1. ඔවුනොවුන්.

උනුකු = 1. ගස් වෙසෙසක්.

උනුතිස් = 1. විසිනවය.

උනුමත් = 1. ඌනමාත්‍රය. 2. සැකසැකය.

උනුමුව = 1. පිට්ටනිය.

උනුවිලඹු = 2. එනම් ගී වෘත්තය.

උනුවිසි = 1 දහ නවය.

උනුසඳ = 1. ඡන්දසක්.

උනුසැලි = 1. එනම් වෘත්තය.

උනොරු = 1. පාන්දර එළිය. 2. සූර්ය සාරථි. 3. අරුණ.

උණ = 1. උණරෝගය. 2. උණ ගහ. 3. රණ බට 4. උෂ්ණත්වය.

උණ අතිසාරය = 1. එනම් රෝගය; උණ සහිත අතිසාර රෝගය.

උණකසුරු = (උණ මකුළු) 1. උණගස තුළ ඇතිවන සුදු හෝ කසාවන් ද්‍රව්‍යය.

උණකිලිල් 1. නොමේරූ උණගොබය.

උණකුලල් = 1. උණ ලී තලාව.

උණකොසිල = 1. උණ ගොබය.

උණගන්නවා = 1. උණ හැදෙනවා.

උණගහ = 1. උණලිය.

උණගෙඩි = 1. විෂම ජ්වරයෙන් ඇතුම් රෝගීන්ගේ උදරයෙහි හටගන්නා ගෙඩි වෙසෙසක්.

උණපතු = 1. උණපතුර.

උණපුපුළු = 1. උණකපුළුවා.

උණසීනතු = 1. උණ හා එසිත් ඇතිවන කුඩා ගඩු හෝ වෙවුලුම.

උණහපුළුවා = (උණපුපුළු බලන්න)

උණිහිස = 1. තලල.

උණළු = 1. උණුඅළු.

උණ්දබිජු = 1. ඔලිඳ ඇට.

උණු = 1. උණුහුම්. 2. රජසය ඇති.

උණ්ඩ = 1. වෙඩි තැබීම සඳහා තුවක්කුව තුළ දමන ලෝහ ගුලි. 2 පතරොම්.

උණ්ඩිය = 1. ගුලිය. 2. බෝලය.

උණ්ඩි බෙර = 1. බෙර වෙසෙසක්.

උණ්ඩිය රාළ = 1. පත්සලක ලිපිකරුවා.

උණ්හිස = 1. තලල් පට. 2. තලප්පාව. 3. ඔටුන්න. 4. තලල. 5. තොප්පිය.

උණ්හිසධාතු = 1. ලලාට ධාතුව.

උණ්ණලොම්ද = 1. ඌර්ණ රෝම ධාතුව.

උත් = (උද්) 1. වැඩි. 2. උඩට නගන ලද. 3. කිසු.

උත්කට = 1. කුරුඳු පොතු. 2. අධික.

උත්කතු = 1. උක්ත කතෘ.

උත්කම් = 1. උක්ත කර්ම.

උත්කණ්ඨා = 1. උඩුකුරු ගෙල ඇති බව. 2. තැවීම. 3. ආඩම්බර සක්‍රිය. 4. බලාපොරොත්තුවීම.

උත්කණ්ඨිත = 1. කලකිරුණු.

උත්කම්පා = 1. චඤ්චලවීම.

උත්කර්ෂ = 1. උසස් 2. ශ්‍රේෂ්ඨත්වය. 3 අධිකත්වය.

උත්කර්ෂවත් = 1. ශ්‍රේෂ්ඨත්වය 2. අධික.

උත්කලන = 1. බුරුල් කිරීම. 2. ලිහීම.

උත්කාර = 1. කසළ.

උත්කාරගෘහ = 1. වැසිකිළිය.

උත්කිරණ = 1. රශ්මිය.

උත්කීර්ණ = 1. සෑදූ. 2. විදින ලද. 3. විසුරුවන ලද. 4. ඉහිරුණු.

උත්කුටක = 1. උඩබලා හාන්සිවූ 2. උඩුකුරුවූ.

උත්කුණ = 1. උකුණ. 2. මකුණ.

උත්කෘති = 1. අකුරු විසි හයකින් යුත් කවි පාදය

උත්කෘෂ්ට = 1 ඉතා උසස්. 2. ශ්‍රේෂ්ඨ.

උත්ක්‍රමය = 1. අතියම් කම. 2. ඇදය. 3. කඩකිරීම. 4. පිළිවෙළ ඉක්මවීම

උත්ක්‍රුෂ්ට = 1. වැරදි සහිත.

උත්ක්ෂිප්ත = 1. එසෙවූ. 2. බැහැරකළ. 3. වමාරණ ලද.

උත්ඛාත = 1. මුලින් උපුටන ලද. 2 හරණලද.

උත්ගත = 1. උඩටනැගි. 2. හටගත්.

උත්ග්‍රහණ = 1. ඉගෙන ගැනීම.

උත්තංසමාලය = 1. ඉසේ පළඳින මල් මලාව.

උත්තංසය = 1. කඩුක්කම. 2. මුදුන් මල්කඩ.

උත්තප්ත = 1. තැවූ 2. ගිනියම් කළ.

උත්තම = 1. උතුම්. 2. උසස් 3. උත්කෘෂ්ට.

උත්තමාංගය = 1. හිස. 2. උතුම් අවයවය.

උත්තමාංගරුහ = 1. හිසකේ.

උත්තමපුරුෂ = 1. ශ්‍රේෂ්ඨ පුරුෂයා. 2. (ව්‍යාකරණයෙහිදී) "මම-අපි" යන පද දෙක.

උත්තමෝපස්ථායකයා = 1. උසස් ලෙසින් උපස්ථාන කරන්නා.

උත්තර = 1. උතුම්. 2. වඩා යහපත් 3. මතු කාලය. 4. උතුර. 5. ප්‍රශ්නයකට දෙන පිළිතුර. 6. ප්‍රධාන.

උත්තර අස්තරණ = 1. ඇඳ පුටු මත්තෙහි එලන ඇතිරිලි.

උත්තරඅයන = 1. සූර්යයාගේ උතුරෙන් ගමන හෝ ගමන් කරන හය මාසය.

උත්තරඅරණී = 1. ගිනිගානා දඬු දෙකින් උඩ දණ්ඩ.

උත්තර අර්ධ ගෝලය = 1 පෘථිවියේ උතුරු භාගය. 2. පෘථිවියෙහි නිරක්ෂ රේඛාවෙන් උතුරු කොටස.

උත්තරකුරුද්වීප = 1. උතුරු කුරු දිවයින.

උත්තරක්‍රියා = 1. භූමදාන කටයුතු.

උත්තරංග = වතුරට යටවූ.

උත්තරංගය = 1. දොරේ ආරුක්කුව.

උත්තරච්ඡදය = උඩු වියන.

උත්තරණය = 1. එතරවීම. 2. තරණය කිරීම. 3. පිනීම. 4. ඉතිරීම.

උත්තරතර = (උත්තරීතර) 1. ඉතා උසස්. 2. අතිශ්‍රේෂ්ඨ.

උත්තරදාතව්‍ය = 1. පිළිතුරු දිය යුතු. 2. වගකියයුතු.

උත්තරදායක = 1. පිළිතුරු දෙන්නාවූ 2. වගකියන්නාවූ

උත්තරදිග්භාගය = 1. උතුරු දිශාව.

උත්තරදිශාධිපති = 1. කුවේරයා. 2. උතුරු දිශාවට ප්‍රධානයා.

උත්තරධ්‍රැවය = 1. පොළොවෙහි උතුරු කොණ.

උත්තරපක්ෂය = 1. චන්ද්‍රයා වැඩෙන සති දෙක 2. පුර පක්ෂය.

උත්තරපදය = 1. පරපදය.

උත්තරපථ = 1. දඹදිව උතුරෙහි පිහිටි රටක්.

උත්තරඵල්ගුණිය = 1. දෙළොස් වැනි චන්ද්‍ර නැකත.

උත්තරය = 1. පිළිතුර.

උත්තර සාගරය = 1. මහ මෙරට උතුරෙන් පිහිටි සාගරය.

උත්තරසාටකය = 1. උතුරු සළුව.

උත්තරඞ්ග = 1. තැඟි රැළ ඇති.

උත්තරණ = 1. එතෙරවීම. 2. තරණය කිරීම.

උත්තරමන්ත්‍රී = 1. 'සැනෙට්' නම් මන්ත්‍රණ සභාවේ සභිකයා.

උත්තරමන්ත්‍රිණී = 1. 'සැනෙට්' මන්ත්‍රණ සභාවේ සාමාජිකාව.

උත්තරමන්ත්‍රණසභාව = 1. 'සැනෙට්' සභාව.

උත්තරසඞ්ග = 1. තනි පට සිවුර.

උත්තරිතර = 1. ඉතා ශ්‍රේෂ්ඨ. 2. ඉතා උතුම්.

උත්තරීය = 1. උතුරුසළුව.

උත්තරේශාන = 1. උතුරු ඊශාන.

උත්තරෝත්තරය = 1. උත්තරයට දෙන උත්තරය.

උත්තාන = 1. උඩුකුරු. 2. ගැඹුරු නැති. 3. ප්‍රකට. 4. විස්තර නැති.

උත්තානශෙය්‍යක = 1. උඩුකුරුව හෝනා (ළදරුවා).

උත්තානීකම්ම = 1. පැහැදිලි කිරීම.

උත්තාපය = 1. ග්‍රීෂ්මය. 2. තැවීම. 3. පසු-තැවිල්ල.

උත්තාරණ = 1. එතෙර කිරීම.

උත්තාස = (උත්‍රාස) 1. තැති ගැන්ම.

උත්තාසන = 1. උලතැබීම. 2. ඇමිණීම. 3. තැති ගැන්වීම.

උත්තිණ = 1. තණකොළ නැති.

උත්තිණ්ණ = 1. එතෙරවූ.

උත්තුඞ්ග = (උත්තුඟු) 1. ඉතා උස්වූ. 2. ඔසවාපු.

උත්තේජන = 1. තියුණු කිරීම. 2. රත් කිරීම. 3. දල්වීම. 4. ඉක්මන් කිරීම. 5. උනන්දු කිරීම. 6. යැවීම.

උත්තේජිත = 1. උත්තේජනය කළ.

උත්තෝලනීය = 1. උස් කළ යුතු. 2. එසවිය යුතු.

උත්‍යක්ත = 1. උඩ විසිකරන ලද. 2. අත්හරින ලද.

උත්‍රස්ත = 1. තැතිගත්.

උත්‍රාස = 1. ඇඟ කිලි පොලා උපදනා බිය. 2. ලොමු දැහැගැනෙන බිය. 3. තැතිගැන්ම.

උත්‍රාසිත = 1. තැතිගන්වන ලද.

උත්ථානය = 1. නැඟිටීම. 2. ක්‍රියාකාරීවීම. 3. යුද්ධය. 4. ඉහළ පැනීම. 5. සිතාව.

උත්ථානවීර්‍යය = 1. ක්‍රියාරම්භ කිරීමේ උත්සාහය. 2. නැඟීසිටි වීර්‍යය.

උත්ථිත = 1. නැඟීසිටි. 2. උපන්. 3. වැඩුණු 4. ඉදිරිපත්වූ. 5. සිඩවූ. 6. පැමිණසිටි.

උත්පටිපාටිය = 1. පිළිවෙළ කැඩීම.

උත්පතන = 1. උඩයන. 2. උඩපැනීම. 3. නැගීම.

උත්පතයා = 1. කුරුල්ලා.

උත්පතිත = 1. උඩට නැගුණු.

උත්පත්ති = 1. ඉපදීම. 2. හටගැනීම.

උත්පත්ති නිමිත්ත = 1. ඉපදීමට නිමිතිවන කාරණය.

උත්පත්තිස්ථාන = 1. උපදනා තැන්.

උත්පථ = 1. නොමඟ.

උත්පද්‍යමාන = 1. උපදින.

උත්පන්න = 1. උපන්.

උත්පරිපාටි = 1. පිළිවෙළ කැඩීම.

උත්පරිපාටික දෝෂ = 1. පිළිවෙළ කැඩීමේ දෝෂය (උපිළිවෙළ දොස)

උත්පල = 1. උපුල්. 2. නිල් මානෙල්. 3. සිද්ධාර්ථ කුමාරයන්ගේ සතර මහා නිධානයෙන් එකක්. 4. සංඛ්‍යාවක්.

උත්පලගන්ධය = 1. මානෙල් මල් සුවඳ.

උත්පලපත්‍ර = 1. එනම් අවිය.

උත්පලවර්ණ දිව්‍යරාජ = 1. උපුල්වන් දෙවි. 2. විෂ්ණු දෙවි. 3. ලංකා බුද්ධ ශාසනය භාරව සිටිතැයි සැලකෙන දෙවි.

උත්පලගන්ධිකය = (උත්පල ගන්ධිකය) 1. සුවඳ සඳුන්.

උත්ප්ලවන = 1. උඩට පැනීම. 2. උඩ ඉල්පෙන.

උත්පාටන = 1. ඉදිරීම. 2. පැළීම.

උත්පාටිත = 1. ඉදිරූ. 2. පැළූ.

උත්පාත = 1. අනතුර. 2. නිමිති. 3. කම්පාව. 4. චන්ද්‍රසූර්යග්‍රහණය.

උත්පාත = 1. උල්කාපාත - භූමි කම්පා ආදි මහා භූත විකාර.

උත්පාද 1. උඩුකුරු පා ඇති. 2. සරභ මෘගයා. 3. ඉපදීම.

උත්පාදක = 1. උපදවන. 2. උඩුකුරු පා ඇත්තා.

උත්පාදනය = (උත්පාදය) 1. ඉපදවීම.

උත්පාදිත = 1. ඉපදවූ.

උත්පාද්‍යමාන = 1. ඉපදෙන.

උත්ප්‍රසවය = 1. ගප්සාවීම.

උත්ප්‍රාසනය 1. විසිකිරීම. 2. අපහසමෙන් සරදම් කිරීම.

උත්ප්‍රේක්ෂාව = 1. උදාහරණය. 2. උපමාකිරීම. 3. එක් ලෙසකින් පවතින්නක් අනෙක් අයුරකින් සැලකීම.

උත්ප්ලවනය - 1. පාවීම. 2. උඩට ඉල්පීම 3. ගැලීම.

උත්ඵුල්ල = 1. පිපුණු. 2. මහත්වූ.

උත්සඞ්ග = 1. ඉණ. 2. උකුල.

උත්සඞ්ගප්‍රාඥ = 1. ධාරණ ශක්තියක් නැති නැනැත්තා.

උත්සඞ්ගය = 1. ඔඩොක්කුව.

උත්සද = 1. අතික්‍රමය.

උත්සදනරක = 1. ඔසුපත් නිරය.

උත්සදවර්ණ = 1. අධික වර්ණය.

උත්සන්න = 1. වැඩිවීම. 2. අධික. 3. බලවත්. 4. උනන්දු. 5. මහලු.

උත්සර්ගය = 1. තෑග්ග. 2. නිරාලයව දුන වස්තුව දීම. 3. මලමූත්‍ර පහකිරීම. 4. විශේෂ විධියෙන් පිට සාමාන්‍ය විධිය.

උත්සර්ජනය = (උත්සර්ග බලන්න)

උත්සර්පිණී යුග = 1. මනුෂ්‍යයන්ගේ ආයුෂ දස අවුරුද්දෙහි පටන් ක්‍රම - ක්‍රමයෙන් අසංඛ්‍යය දක්වා වැඩෙන කාලය.

උත්සව = 1. උළෙල. 2. මංගලය. 3. සැණ-කෙළිය. 4. ප්‍රීතියෙන් කරන ක්‍රීඩාදිය.

උත්සවක්‍රීඩා = 1. සැණ කෙළිය.

උත්සාරණය = 1. බැහැර කිරීම. 2. පැත්තකට කිරීම.

උත්සාහය = 1. වෑයම. 2. උනන්දුව. 3. වීර්යය.

උත්සාහවත් = 1. උනන්දුව ඇති 2. උත්සාහ සහිත.

උත්සාහන = 1. උත්සාහවත් කිරීම.

උත්සාහික = 1. උත්සාහවත් කරවූ.

උත්සික්ත = 1. උඩඟු 2. වැඩිවූ 3. වැඩුණු.

උත්සීම = 1. සීමාව ඉක්මවූ. 2. ඉතාඅධික.

උත්සුක = 1. උත්සාහවත්. 2. උහන්දුව යොමු කිරීම.

උත්සෘෂ්ට = 1. දෙනලද. 2. අත්හරින ලද. 3. දුරුකළ.

උත්සේක = 1. ඉසීම.

උත්සේධ = 1. උස.

උත = 1. අගතා. 2. උත්කෘෂ්ට.

උතර = උත්තර.

උතරපස = 1. උතුරු පැත්ත.

උතැගිකොට = 1. උඩුකුරු කරවා; උඩට හරවා.

උතැණි = (උත්තාන බලන්න.)

උතිරික = 1. (උත්තරීක) තනිපට සිවුර.

උතිරී = 1. උතුරු සළුව.

උතු = 1. කියන ලද. 2. සෘතුව. 3. පොල් - ජිවුල් ආදි ගෙඩිවල කටුව. 4. උත්තම. 5. කිලි. 6. තරාදි තට්ටුව. 7. හැඳි තලය. 8. ඡන්දසක්. 9. උත්කෘෂ්ට.

උතු අඟුරු = 1. පොල් කටු අඟුරු.

උතුඅරුත් = 1. කියන ලද අර්ථ ඇති.

උතුකටු = 1. පොල්කටුව. 2. දණ උතු කටුව.

උතුකබල = 1. පොල්කටුව.

උතුකඩ = 1. ලොඳ. 2. වැවරයක (සවිතැති) පොල්කටුව. 3. සමීප මාර්ගය.

උතුගැම් = 1. උතු කටුවක් ගා මැදීම.

උතුනියාම = 1. ශීතෝෂ්ණ ගුණයෙන් ඇති වන සෘතුන්ගේ තත්වය.

උතුනියර = 1. කී ආකාරය.

උතුනී = 1. මල්වරවූ ස්ත්‍රී. 2. වැඩිවිය පැමිණි තරුණිය.

උතුපු = 1. කැවුම් වෙසෙසක්.

උතුමං = 1. සෘතුලේ නික්මෙන මඟ. 2. යෝනිය

උතුමඟ = 1. ස්ත්‍රී යෝනිය. 2. හිස (උත්තමාංගය)

උතුමඩල = 1. දණ හිස; දණ ඉහ.

උතුමල් = 1. ඔසප්වීම.

උතුමා = 1. උත්තමයා.

උතුමාණන්වහන්සේ = 1. ආණ්ඩුකාර තුමා. 2. උතුම් උත්වහන්සේ

උතුර = 1. උතුරු දිග. 2. ප්‍රතිවාක්‍යය; උත්තරය.

උතුර දකුණ කොල්ලන්ට බෑ = 1. ගණුදෙනු වකට මුණ පාන්න බැරි තරම් ණයයි.

උතුරා = 1. ඉතිරී ගොස් 2. ඉම පසුකොට. 3. උත්තරව.

උතුරු = 1. ප්‍රතිවාක්‍ය. 2. උත්තර. 3. උතුරු දිශාව. 4. උත්කෘෂ්ට 5. උතුම්. 6. උසස්.

උතුරුකන් = 1. උත්තර කෝණය. 2. උතුරු දිග.

උතුරුකන් හුළඟ = 1. උතුරු දෙසින් හමන හුළඟ (ඊශාන දිග මෝසම් හුළඟ)

උතුරුකර – 1. උතුරු පැත්ත.

උතුරුකරා = 1. උතුරු වෙරළ.

උතුරුකුරු = 1. පැරණි ග්‍රන්ථයන්හි දක්වෙන සතර මහා ද්වීපයන්ගෙන් එකක්.

උතුරුතර = 1. උත්තරීතර.

උතුරුකෙසුල් = 1. ප්‍රතිවචන. 2. උත්තර.

උතුරු දික් = (උතුරු දිගු) 1. උතුරු දිශාව.

උතුරු දිගිඳු = 1. උත්තර දිශාපතියා 2. කුවේරයා.

උතුරු දිගිඳු පුර = 1. ආලකමන්ද රාජධානිය.

උතුරුදිගුනා = 1. වෙසවුණු රජ.

උතුරුදිව් = 1. උතුරු කුරු දිවයින.

උතුරුදෙරගම් = 1. උතුරු දොරටුව අසල පිහිටි ගම.

උතුරුනල = (උතුරු මරු - උතුරු පවන්) 1. උතුරු දිගින් හමන හුළඟ·

උතුරුපට = 1. උතුරු සළුව.

උතුරුපල්ගුනා = 1. (උත්තර පාල් ගුනී) 1. රාශි චක්‍රයෙහි දොළොස්වැනි නැකත.

උතුරුපසතුරු = 1. උත්තර ප්‍රත්‍යුත්තර.

උතුරු පුවුපය = 1. එනම් නැකත.

උතුරු මිනිස් දම් = 1. (බුද්ධ සමය පිළිබඳ) මාර්ග ඵලාධිගම. උත්තරි මනුෂ්‍ය ධර්ම.

උතුරුමුවා = 1. සීත රටවල මුව වෙසෙසක්.

උතුරුමුහුණු = 1. උතුරු පැත්ත.

උතුරුමුහුද = 1. උත්තර සාගරය. 2. පිළිතුරු තැමැති මුහුද.

උතුරු මුළු = 1. පෙර පැවති "උත්තර මූල" භික්ෂු පරම්පරාව.

උතුරු සයුරු = 1. උත්තර සාගරය. 2. මුහුදේ උතුරු පැත්ත.

උතුරුසල = 1. නම් නැකත.

උතුරුසළුව = 1. ඇඳුමට උඩින් කරේ ලන වස්ත්‍රය. 2. ඔසොරිය.

උතුරුවන = 1. ඉතිරීම කරවන.

උතුරු සිඳු = 1. උත්තර සාගරය.

උතුරුමුළු = 1. උත්තර මූලනම් භික්ෂු පරම්පරාව

උතුව = සෘතුව. 2. මල්වරවීම.

උතුවදන = 1. තෙල්ලි.

උතුල = 1. ඉතිරී ගිය. (උතුරා ගිය)

උතුලායෙහි = 1. උත්සවයෙහි. 2. අවමඟල යෙහි.

උත්තරායන් = පැරණි වස්ත්‍ර වර්ගයක්.

උත්තල බිඳුම් = 1. බඩෙහි වාතය පිරීම (උත්තිල)

උත්‍රසල නැකත් = 1. උතුරු සල නැකත.

උත්සා = 1. උත්සාහය.

උද = 1. පැන්. 2. මාංසය. 3. උදය.

උදක් = 1. තනිකර. 2 ශුඩ. 3. බෙහෙවින්.

උදක = 1. ජලය. 2. උදක රාක්ෂසයා.

උදක අවගාහ = 1. දියෙහි ගැලීම 2. නෑම.

උදක ආවර්ත = 1. දිය සුළිය.

උදක ආසිඤ්චන = 1. දිය ඉසීම; පැන්ඉසීම.

උදක උක්ඛේප = 1. දිය ඔසොවා ඉසීම. (දියෙහි එසවීම)

උදක උක්ඛේප සීමා = 1. සංඝ කර්ම සඳහා නදී ආදියෙහි උදකුක්ඛේපයෙන් තනා ගත් සීමාව.

උදක ඔඝ = 1. සැඩ දිය පාර.

උදකකාක = 1. දියකාවා.

උදකකෘත්‍ය = 1. ජලයෙන් කට යුතු මල සේදීම් ආදිය.

උදකතාරකා = 1. දිය බුබුල.

උදකතුම්බ = 1. ඛබරාව. 2. කෙණ්ඩිය. 3. පොකුණට දිය එන නළය.

උදකනිෂේක = 1. දිය ඉසීම.

උදක පතන = 1. දියවැටීම.

උදකධාරා = 1. ජලධාරාව. 2. වැහෙන දියකඳ.

උදක ප්‍රසාද = 1. දිය පිරිසුදු කරන. 2. ඉඟිනි ඇට.

උදක ප්‍රසාද මාණික්‍යය = 1. දිය පිරිසිදු කරණ මැණික.

උදක පප්පට = 1. රොන් මඩ වියලී පැළුණු කබල්.

උදක පරම්පරා = 1. ජලධාරාව.

උදක පුසිත = 1. දිය බින්දුව.

උදක බුබ්බුළ = 1. දිය බුබුල.

උදකභය = 1. ජලයෙන් ඇතිවෙන භය.

උදක මණික = 1. දිය තබන මහ සැළිය.

උදක මේහය = 1. දියවැඩියාව. 2. එනම් ප්‍රමේහ රෝගය.

උදක රාක්ෂස = දිය රකුසා.

උදක ලසිකා = 1. දිය මතුපිට හැදෙන දූල්ල.

උදක වාහක = 1. දිය ගෙන යන.

උදක ශකුණ = 1. දියකාවා.

උදකසෝතස් = 1. දිය පහර.

උදකසර්ප = 1. දියනයා.

උදකස්කන්ධය = 1. දිය කඳ.

උදකසාක්ෂිකිරීම් = 1. දායකයා විසින් ලබන්නාගේ අතෙහි පැන් වත්කොට දීම.

උදකසේතු = 1. ගං-ඔය ආදියෙහි තනන ඒදඬු පාලම් ආදිය.

උදකලා = 1. එකකී. 2. තනිවූ.

උදකසාටිකා = 1. නානකඩ. 2. නානවිට අඳින වස්ත්‍රය.

උදකායතිකා = ජලනළය.

උදකාවගාහ = (උදක + අවගාහ) 1. දියෙහි ගැලීම. 2. නෑම 3. දියට බැසීම.

උදකාසේක = 1. දිය ඉසීම.

උදකුක්ඛෙප = (උදක උක්ඛෙප බලන්න).

උදකුම්භ = 1. දිය කලය.

උදකෝඝ = (උදක + ඕඝ) 1. දිය පහර.

උදකෝදරය = 1. ජල උදර රෝගය.

උදක් = 1. බොහොමයක්.

උදගයනය = 1. සූර්යයාගේ උතුරු ගමන.

උදගසල් = 1. සූර්යයා.

උදග්ග = (උදග්‍ර) 1. ඉතා ප්‍රීති ඇති. 2. උසස්. 3. ලොකු. 4. ඔදවැඩුණු

උදඤ්චන = 1. දිය ගන්නා කුඩා බඳුනක්.

උදත්ත = 1. උදාත්තාලඞ්කාරය.

උදද්ද = 1. ශීත ශරීරයෙහි හැදෙන ගඩු. 2. හිරිගඩු.

උදදි = (උදධි- උදදිනිඳු) 1. මුහුද 2. කලය.

උදධි = 1. ජලය දරන්නා. 2. සමුද්‍රය.

උදධිමල = 1. මුහුදු පෙණ.

උදන = (උදන්) 1. ප්‍රීති වාක්‍යය 2. උදානය- ප්‍රීතියෙන් හෝ සංවේගයෙන් කියූ තෙපුල්. 3. මදුන් ඇමිණූ වැල.

උදන්අනනවා = 1. ප්‍රීතිය ප්‍රකාශ කරනවා. 2. ප්‍රීති වාක්‍යය කියනවා.

උදන්වැකි = 1. ප්‍රීති වාක්‍යය.

උදනු = 1. ප්‍රීති වාක්‍ය පැවැත්වීම.

උදපාදි = 1. පහලවිය. 2. හටගත්තේය.

උදපාන = 1. ළිඳ. 2. බොන පැන්. 3. පැන් බක්කිය.

උදබිඳු = 1. දිය බිඳුව.

උදම් = 1. ඔද වැඩුණු. 2 උඩඟු. 3. උස්. 4. උද්දාම. 5. දරුණු. 6. සතුටු. 7. උමතු. 8. බැම්දුරුකල..

උදම්කරනවා = 1. ප්‍රීතිකරනවා. 2. ඔද වඩවනවා.

උදය = 1. නැගීම. 2. අභිවෘද්ධිය. 3. හටගැන්ම. 4. ලාභය. 5. උදෑසන. 6. ඉපදීම. 7. පාන්දර. 8. මතුවීම.

උදයග = (උදය + අග) 1. උදය පර්වතය.

උදයආදි = (උදයාදි) 1. දිනාරම්භයේ පටන්කොට ඇති.

උදයකාල = 1. දිනාරම්භය. 2. අභිවෘද්ධිකාලය.

උදයගිරි = 1. උදය පර්වතය. 2. උදාගිර.

උදයන = 1. උදාවීම.

උදයපර්වතය = 1. ඉර පායන තැන ඇතැයි පෙර කවීන් විසින් සලකන ලද පර්වතය.

උදයභාගය = 1. උදේ කාලය. 2. පෙරවරුව.

උදයවැයනැණ = 1. ඇතිවීම හා නැතිවීමද දැනගන්නා නුවණ.

උදයව්‍යය = 1. ඇතිවීම හා නැතිවීම.

උදයසන්ධ්‍යාරාග = 1. උදෑසන හා සවසද ඇතිවන රත් පැහැය.

උදර = 1. බඩ. 2. එනම රෝගය (ඔජරය) 3. ඇතුළ. 4. කුහරය. 5. කුක්ෂිය. 6. ආමාශය.

උදරගිනි = 1. බඩගින්න.

උදරගුල්මය = 1. ගුල්ම, ඇලදිව. 2. ගුල්ම රෝගය.

උදරපටල = 1. ආමාශයේ සම්වැටිය. 2. බඩවසා සිටින සම්මස්.

උදරබන්ධනය = 1. බඳ පටිය.

උදරපෝෂණ = 1. බඩ රැක ගැනීම.

උදරම්භරි = 1. සවකීය උදරය පමණක් රැක-ගන්නා. 2. ආත්මාර්ථ කාමියා.

උදරාග්නි = (උදර + අග්නි) 1. බඩගින්න. 2. කුසගින්න.

උදරිණී = 1. දරුවකු ලැබෙන්නට ඉන්නා ස්ත්‍රී. (ගැබිණි)

උදරාවේෂ්ටයා = 1. බඩ පණු වෙසෙසක්.

උදරිය = 1. ආමාශයෙහි නොපැසුණු අහර.

උදර්දය = 1. බෝවෙන හොරි වෙසෙසක්.

උදුලු = 1. උදුලු 2. බිම් කෙටීමට ගන්නා එනම් උපකරණය.

උදුලුකොට්ය = 1. මිට කොටවී නලය ගෙවී ගිය උදුල්ල.

උදලුකොළු = 1. උදැල්ලෙහි මිට සවි කරන වලල්ල වැනි කොටස.

උදලුකලය = 1. උදැල්ලෙහි ලෝහමය කොටස.

උදලුතැබ්බිදමන් = 1. උදැල්ලෙහි තලය සිදුරු වනසේ ඊයෙන් විදීම.

උදවසිත = 1. ගෙය.

උදබ්බය = 1. මිනිස්සු. 2. ඇත්තෝ. 3. අය. 4. උදයව්‍යය (ඉපදීම් මැරීම්)

උදවිකොට = 1 සපයා. 2. පිළියෙළකොට.

උදව්ව = 1. උපකාරය. 2. පිළියෙළකිරීම.

උදව්පදව් = 1. උදව් උපකාර.

උදස් = 1. උඩව්වය.

උදහ = 1. උඩට නැගීම. 2. කෝපය. 3. ඉස්සීම.

උදහවෙනවා = 1. උස්සනවා. 2. උඩ දමනවා.

උදහන = 1. උඩට නඟන. 2. උඩට විහිදෙන.

උදහමින් = 1. කංවමින්

උදහස = 1. කෝපය. 2. ද්වේෂය.

උදහස්වැදුරීම් = 1. කෝපය දක්වීම.

උදහාගිය = 1. උඩගුවූ.

උදහාරක = 1. දිය ගෙනෙන්නා. 2. කානු කපන්නා.

උදහාරිකා = 1. දිය ගෙනෙන්නී.

උදහාරිය = 1. දිය ඇදීම.

උදූහැන = 1. උදූසන.

උදූහැනැක්කෙ = 1. උදයෙන්ම.

උද්ගණ්ඩ = 1. නඟන ලද සුවඳ ඇති. 2. මතා සුවඳ ඇති.

උද්ගත = 1. උඩට නැගී. 2. වමාරන ලද. 3. උපන්. 4. අධික. 5. නැගුණු.

උද්ගමනය = (උද්ගමය - උද්ගතිය) 1. උඩට යෑම.

උද්ගාඪ = 1. ඉතා බොහෝ.

උද්ගාරය = 1. වමනය. 2. ඔක්කාරය. 3 ශබ්දය

උද්ගිරණ = 1. වැමෑරීම.

උද්ග්‍රහණ = 1. ඉගෙනීම. 2. අවබෝධ කිරීම.

උද්ඝට්ත = 1. විවෘත කළ.

උද්ඝටිතඥ = 1. තියුණු නුවණ ඇති පණ්ඩිතයා.

උද්ඝාටනය = 1. ශ්‍රීදෙන් පැන නඟන යන්ත්‍රය. 2. ගලවා දැමීම. 3. දිය අදින බාල්දිය. 4. විවෘත කිරීම. 5. ඉගිලවීම.

උද්ඝාත = 1. පටන් ගැන්ම. 2. පැකිලීම. 3. මරන ලද. 4. උස්වූ.

උද්ඝාතය = 1. පටන් ගැන්ම. 2. ලිස්සීම. 3. ආයුධය.

උද්ඝෝෂණය = 1. මහා ඝෝෂාව. 2. උනන්දු කරවන හඬ.

උද්දණ්ඩ = 1. කාමර තැති එක් දොරක් ඇති දිසී ශාලාව.

උද්දනවා = 1. රිදවනවා 2. තුවාලකරනවා.

උද්දානය = 1. වඩබා ගින්න. 2. බැඳීම.

උද්දෘෂ = 1. ප්‍රාකාරයෙහි පිටතින් තිබෙන පදනම. 2. පවුර.

උද්දුම = (උදම් බලන්න)

උද්දූල = 1. එනම් බමුණා.

උද්දූලක = 1. ලෝලු ගස. 2. ඇසල ගස.

උද්දූලන = 1. ගලවා දැමීම.

උද්දිෂ්ට = 1. දක්වන ලද. 2. විස්තර කරන ලද 3. කියූ.

උද්දීපක = 1. දල්වන. 2. තියුණු කරන. 3. එළියවූ.

උද්දීපන = 1. දැල්වීම. 2. තියුණු කිරීම. 3. ප්‍රකාශය. 4. විස්තර කිරීම. 5. බැබළවීම.

උද්දේශ = 1. මාතෘකාව. 2. කියාදීම. 3. සෙවීම 4. ඉගෙනීම. 5. ප්‍රාති මෝක්ෂයෙහි පරිච්ඡේද.

උද්දේශික = 1. උදෙසා. 2. කිසිවකු උදෙසා කළ.

උද්දේශික චෛත්‍ය = 1. බුඩාදීන් උදෙසා කළ පිළිම.

උද්දේස = 1. පෙළ කියවාගෙන පුහුණු කිරීම 2. උදෙසීම. 3. කියාදීම. 4. කොට විස්තරය.

උද්දේස ආචරිය = 1. පෙළ කියවන නෝ උගන්වන ගුරුවරයා.

උද්දෙස්සන් = 1. අනුබල.

උද්දේහක = 1. උඩට නඟන.

උපහැලි = 1. වෘත්ත විශේෂයක්.

උප්පජ්ජන = 1. ඉපදීම. 2. හටගැන්ම.

උප්පටිපාටි = 1. වැරදි පිළිවෙළ.

උප්පණ්ඩනා = 1. කවටකම් කිරීම.

උප්පත = 1. බුලත් කොළය.

උප්පතන = 1. උඩ නැගීම.

උප්පත්ති = 1. ඉපදීම. 2. හටගැන්ම.

උප්පරිවෙට්ටිය = 1. උපාය. 2. උගුල; ප්‍රයෝගය.

උප්පල = 1. උපුල්. 2. මානෙල්. 3. එනම් නරකය.

උප්පලවණ්ණා = 1. එනම් රහත් මෙහෙණින් වහන්සේ.

උප්පාටන 1. ගලවා දැමීම. 2. විනාශ කිරීම.

උප්පාදය = 1. ඉපදීම.

උප්පැන්නය = 1. ඉපදීම. 2. උපත. 3. උපන් දවස ලියා පදිංචි කළ සටහන.

උප්පැන්න සහතිකය = 1. උපන් දින වකවානුව ලියා පදිංචි වී තිබෙන බවට දෙන සහතික ලිපිය.

උප්පිඩ = 1. ගොයම් මිටිය.

උප්පලිනී = 1. මානෙල් විල හෝ පොකුණ.

උපා = 1. උපාය. 2. මාර්ගය. 3. නුවණ.

උපාඤාණ = 1. උපායඥානය.

උපාංග සූත්‍රය = 1. දෙවෙනි සූත්‍රය. 2. සුළු නීතිය.

උපාගත = 1 එළඹුණු. 2. ළඟට ආ. 3. සිඩ වූ.

උපාගම = 1. ළඟට ඊම. 2. පැමිණීම.

උපාගුරු = 1. අවවාද කරන්නා.

උපාංග = 1. ශාඛා වූ. 2. ප්‍රධාන නුවූ කොටස.

උපාචාරණ = 1. හැසිරීම.

උපාචාර්‍ය = 1. අප්‍රධාන ගුරුවරයා.

උපාදක්ෂතා = 1. ප්‍රයෝගයෙහි සමර්ථයා. 2. නුවණ මෙහෙයා යම් කිසිවක් කිරීමෙහි සමර්ථා.

උපාදානය = 1. දැඩි සේ ගැන්ම. 2. කිසිවක පැවැත්මට උපකාර වන දෙය. 3. තෘෂ්ණා-දෘෂ්ටි ආදිය. 4. හේතුව.

උපාදානස්කන්ධ = 1. මගේ යයි ඇලීම කරගත් ස්කන්ධය.

උපාදානීය = 1. උපාදානයන්ට අරමුණුව උපදින. 2. තෘෂ්ණා-දෘෂ්ටි ආදීන්ට ගොදුරු වන.

උපාදාය = 1. දැඩි සේ ගෙන. 2. නිසා. 3. උපමා කොට හෝ සමාන කොට.

උපාදි = 1. උපාදානයක් විසින් ගනු ලබන පඤ්චස්කන්ධය. 2. ස්කන්ධයන් පැවැත්මේ හේතුව.

උපාදිශේෂ = 1. ස්කන්ධයන් පැවැත්මේ හේතුව ඉතිරිව ඇති.

උපාදිශේෂ නිර්වාණ = 1. පඤ්චස්කන්ධය ඉතිරිව තිබිය දී අවබෝධවන නිවණ.

උපාදින්න = (උපාදින්නක) 1. ගන්නා ලද. 2. තමාගේ යයි සිතාගත් තෘෂ්ණාදීන් විසින් ගන්නා ලද.

උපාදියමාන = 1. ගනු ලබන.

උපාධ්‍ය = 1. ගුරුවරයා.

උපාධිපතියා = 1. උප ප්‍රධානයා 2. උප සභාපතියා.

උපාධිය = 1. රැවටිල්ල. 2. කපටිකම. 3. පටබැඳි නාමය. 4. ගරු නාමය. 5. වෙස් ගැනීම. 6. යහපත් කල්පනාව.

උපාධිධාරී = 1. ගරු නම් දරන්නා.

උපාධ්‍යාය = 1. වරද නිවරද දක්වා අවවාද කරන්නා. 2. ගුරුවරයා. 3. ධර්මාදිය උගන්වන්නා.

උපාධ්‍යායක් = 1. උපාධ්‍යායන් වහන්සේට කටයුතු වත් පිළිවෙත්.

උපාධ්‍යායී = 1. උපාධ්‍යාය භික්ෂුණිය.

උපාන්තය = 1. අසළ. 2. සීමාව. 3. අන්තයාගේ සමීපය.

උපාමාරුව = 1. වෙස් ගැනීම. 2. ප්‍රයෝගයෙන් රැවටීම.

උපාය = 1. පිළිවෙළ 2. ආකාරය 3. සුදුසු මාර්ගය. 4. නුවණ. 5. උපකරණ. 6 ප්‍රයෝගය. 7. උපක්‍රමය. 8. අභිවෘද්ධි කාරණය. 9. යුක්තිය. 10. කාරණය.

උපාය ඍද්ධිපාද = 1. උපාය නමැති සෘද්ධි පාදය.

උපාය කුසල = 1. අභිවෘද්ධි කාරණයෙහි දක්ෂවූ.

උපාය කෝසල්ල = 1. උපායෙහි දක්ෂ බව.

උපාය කෞශල්‍ය ප්‍රඥා = 1. ඒ ඒ කටයුතු සිදු කිරීමෙහි දක්ෂ භාවය නමැති ස්ථානෝචිත ප්‍රඥාව.

උපාය ප්‍රඥා = 1 උපාය දන්නා නුවණ.

උපාය ශක්ති = 1. උපක්‍රමයෙහි සමර්ථ භාවය.

උපායන = 1. තෑග්ග. 2. තුටුපඬුර.

උපායාස = 1. දැඩි වෙහෙස. 2. තද ශෝකය. 3. සිත් තැවුල.

උපාරක = 1. වැළැක්ම.

උපාරම්භය = 1. පටන් ගැනීම.

උපාර්ජන - 1. රැස් කිරීම. 2. ලබා ගැනීම.

උපාලම්භය = 1. බැණුම. 2. නින්දා කිරීම.

උපාලි = 1. අසූමහා ශ්‍රාවකයන් වහන්සේ අතුරින් විනයෙහි අධිපති මහ රහතන් වහන්සේ. 2. ශ්‍යාමෝපාලි මහා නිකාය පිහිටුවීමට වැඩමකළ සියම් ජාතික මහා නායක හිමි.

උපාලි වංශය = 1. උපාලි හිමියන් විසින් ඇතිකරන ලද නිකාය.

උපාසක = 1. භක්ති වන්තයා. 2. ශාන්ත ගති-ගුණ ඇති ගිහියා. 3. ගිහි ශ්‍රාවකයා 4. එළඹෙන්නා.

උපාසකම්මා = 1. උපාසිකාව.

උපාසක බලලා = 1. සත්පුරුෂ ගුණය පෙන්වන කපටි පුද්ගලයා.

උපාසන = 1. සේවනය කිරීම.

උපාසිකා = 1. උපාසිකා වූ ස්ත්‍රී. 2. ගිහි ශ්‍රාවිකාව.

උපාසිත = 1. සේවිත වූ. 2. උපස්ථාන ලැබූ.

උපාහන = 1. වහන්. 2. සෙරෙප්පු.

උපැත් = 1. උත්පත්තිය.

උපැක්ම = 1. ඉපදුම.

උපැද = 1. ඉපිද.

උපෑ = 1. උපත්. 2. උඩට නැඟීම. 3. නපුර සිදුවීම. 4. රළ ඉතා ඉහළ නැඟීම.

උපැනි කැමි = 1. පුරාණ විහාර සම්බන්ධ මෙහෙයන යෙදුණු මෙහෙකරුවෙක්.

උපැස් = (උප + ඇස්) 1. ඇස් කන්නාඩි.

උපැස් යුවල = 1. ඇස් කන්නාඩි කුට්ටම.

උපිළිවෙළ = 1. උත්පරිපාටිය. 2. පිළිවෙළ කැඩීම.

උපිළිවෙළ දොස් = 1. කාව්‍ය බන්ධනයෙහි දී දක්වෙන පිළිවෙළ කැඩීම නමැති දෝෂය.

උපුම = 1. ඉදිරීම.

උපුටනවා = 1. ඇදගන්නවා. 2. යම් කිසි පොත පතකින් කොටසක් පිටපත් කොට ගන්නවා. 3. මුලින් උදුරනවා.

උපුරනවා = 1. උපුටනවා. 2. උගුල්ලනවා.

උපුල් = 1. උපල; ගල්. 2. මානෙල්.

උපුල් කොළ = 1. කොට්ටම්.

උපුල්වන් දෙවි = 1. උත්පල වර්ණ දේවයා.

උපුල් සොබ = 1. මානෙල් විල.

උපුල්වන = 1. ඔසොවන. 2. මතුකරන. 3. පොළඹවන.

උපුළ = 1. ඉගිල්ලූ.

උපෙක්ඛක = 1. මධ්‍යස්ථ ස්වභාව ඇති. 2. මැදහත්.

උපෙක්ඛ = 1. ආමාශයෙහි වසන පණු කුලයක්.

උපෙක්ඛා = 1. උපේක්ෂාව, මැදහත් බව.

උපේ = 1. උපේක්ෂාව. 2. උත්ප්‍රේක්ෂාව.

උපේලකර = 1. උත්ප්‍රේක්ෂාලංකාරය.

උපේත = 1. යුක්ත වූ.

උපේක්ෂක = 1. උපේක්ෂා කරන.

උපේක්ෂා = 1. පක්ෂයක් නොගන්නා වූ. 2. මධ්‍යස්ථ. 3. උදාසීන භාවය. 4. උතන් දුවන් නැති. 5. සැලකිල්ලක් නොදක්වන.

උපේක්ෂා පාරමිතාව = 1. උපේක්ෂාව නමැති බෝසත් කම.

උපේන්ද්‍ර = 1. විෂ්ණු.

උපේන්ද්‍ර වජ්‍රා = 1. වෘත්තයක්.

උපෝෂණය = 1. කෑම නො කෑම.

උපෝසථ = 1. පෝය දවස. 2. අටසිල්. 3. භික්ෂූන් ගේ පාමොක් උදෙසීම. 4. උපවාසය.

උපෝසථ අගාර = 1. පොහෝ ගෙය.

උපෝසථ කුල = 1. ඇත් කුලයක්.

උපෞෂධශීල = 1. අෂ්ටාඞ්ග ශීලය.

උපෞෂධ = 1. උපෝසථය.

උබ = 1. දෙක.

උබබස් = 1. දෙබස.

උබය = 1. උභය. 2. දෙපක්ෂය. 3. දෙකටම අයිති. 4. යුවල.

උබය ලෝ = 1. මෙලොව හා පරලොව. 2. දෙ ලොව.

උබර = 1. කුඹුර.

උබ්බහන = 1. දුරීම. 2. එසවීම. 3. ඉදිරීම.

උබ්බාහිකා = 1. පේරීම.

උබ්බාල්හ = 1. කරදරයට පැමිණි.

උබ්බිග්ග = 1. තැති ගත්.

උබ්බිජ්ජනා = 1 තැති ගැන්ම.

උබ්බෙග = 1. තැති ගැන්ම. 2. සංවේගය.

උබ්බෙධ = 1. උස. 2. උසැති.

උබ්බෙරිය = 1. ගස් වර්ගයක්.

උබ්භත = 1. හරණ ලද. 2. උද්ධරණ ලද. 3. උඩට ගත්.

උබ්භව = 1. හටගැනීම.

උබ්භාර = 1. ඉදිරීම. 2. ඉවත් කිරීම

උබ්භිද = 1. කෑමට ගන්නා ලුණු. 2. උල්පද. 3. පැලවෙන දෙය.

උභ = (උභය) 1. දෙක. 2. දෙදෙන.

උභතෝ = 1. වටිට. 2. දෙපසින්.

උභතෝකෝටික = 1. තීරණ දෙකකින් යුත්. 2. කොන් දෙකක් ඇති 3. දෙපැත්-තෙන් කැපෙන.

උභතෝ කෝටික ප්‍රශ්නය = 1. කෙලෙසකින් වත් බේරුමක් නැති ගැටලු ප්‍රශ්නය.

උභතෝධාරා = 1. දෙපැත්තෙහි ම තිබෙන මුවාත.

උභතෝවඩ්ඪනය = 1. මැද පටන් දෙ කෙළවර දක්වා වැඩීමේ ක්‍රමය.

උභය කුලය = 1. මවු පිය කුල දෙක.

උභය භාෂාව = 1. දෙබස.

උභය ලෝක = 1. දෙ ලොව. 2. මෙලෝ පරලෝ දෙක.

උභය වාමනක = 1. පා හා සිරුර ද ලුහුඹු වූ මිටි අය.

උභයවංශ = 1. වත වංශ, ශ්‍රාම වංශ යන දෙක.

උභයාංශ = 1. අංශ දෙක. 2. උර දෙක. 3. දෙ පක්ෂය.

උභයාර්ථ = 1. තෝරුම් දෙකක් ඇති.

උඹ = 1. යුෂ්මතා. 2. තොප.

උමි = 1. රැළ.

උමඟ = 1. පොළොව යටින් සෑදූ මාර්ගය.

උමං = 1. උමඟ. 2. ජේකාව. 3. බිත්තියෙහි කළ සිදුර.

උමං කණිනාවා = 1. පසාරු කර යෑමට සිදුරු කරනවා. 2. සොරකම් සඳහා ගෙවල් බිඳිනවා.

උමංදාව = 1. උම්මග්ග ජාතකය.

උමංදොර = 1. උමඟයේ දොර.

උමංලිය = 1. පරාලය.

උමංසොරා = 1. ගෙවල් බිඳින සොරා.

උමතු = 1. පිස්සුව. 2. අපස්මාරය. 3. අත්තන ගස.

උමතු ගී = 1. එයම් වෘත්තය.

උමන් = 1. පරාල අතර බඳින හීන් ලී කෝටු.

උමපල = 1. අළු පුහුල් ගෙඩිය.

උමයඟනා = 1. උමාව.

උමයඟනා දුරු = 1. ඊශ්වරයා.

උමයංගනා = 1. උමාව.

උමයංගනාව = 1. ඊශ්වරයාගේ භාර්‍යාව. 2. උමාකාන්ත. 3. උමාදේවී. 4. පාර්වතී. 5. දුර්ගා නම් දෙවඟන.

උමසලාව = 1. දිය සුළිය. 2. දියරැළ 3. දියරැල්ල.

උමසුත = 1. ගණ දෙවියා.

උම්බලකඩ = 1. වේළවාවූ මාළු වෙසෙසක්.

උම්මග්ග= 1. උමඟ. 2. දෝනාව. පොළොව යටින් යන පාර. 4. වැරදි මඟ.

උම්මග්ග ගඞ්ගා = 1. උමංගඟ.

උම්මග්ග ජාතකය = 1. එනම් ජාතක කථාව.

උම්මත් = 1. පිස්සුව

උම්මත්ත =1. අත්තන ගස. 2. උමතු. 3. සිහි විකල් වූ. 4. රෝමකූපාදිය ඇසුරු කළ පණු කුලයක්.

උම්මත්තක =1. උමතු වූ·

උම්මත්තිකා = 1. උමතු ස්ත්‍රිය.

උම්මා =1. ධාන්‍ය වර්ගයක්.

උම්මාද = 1. ඔල්මාද. 2. පිස්සු·

උම්මාදන = 1. සිහි විකල කිරීම.

උම්මා පුප්ඵ =1. නිල් මල් වර්ගයක්.

උම්මාර = 1. එළිපත්ත.

උම්මි = 1. රැළය.

උම්මිලන = 1. ඇස් හැර බැලීම.

උම්මුක = 1. ගිනිපෙනෙල්ල.

උම්මුඛ =1. උඩකුරු මුහුණු ඇති.

උම්මූලන = 1. මුලින් ඉදිරීම.

උමාධව = 1. උමයඟනගේ ස්වාමියා. 2. සිව.

උමාපති (උමාහිමි) 1. උමයංගනාවගේ හිමියා. 2. සිව.

උමාශර = 1. උමයංගනාව.

උමාසුත = 1. උමයංගනාවගේ පුත්‍රයා. 2. ගණ දෙවියා.

උමැනි =1. උමතු ස්ත්‍රී.

උමුතු = 1. උන්මුක්ත; ලිහුණු.

උමුඛ = 1. උඩුකුරුවූ මුඛ ඇති. 2. කටුස්සා.

උයන =1. පිට්ටනිය. 2. උද්‍යානය. 3. වත්ත. 4. පිසීම් කරන.

උයන් කෙළිය =1. උද්‍යාන ක්‍රීඩාව.

උයන් ගොවු = 1. උයන රැකබලාගන්නා.

උයන් පල් = 1. උද්‍යාන පාලකයා.

උයන් වල් = 1. උද්‍යාන වනය.

උයනල = 1. අල වර්ගයක්.

උයල =1. කිරි බදු අල. 2. අල වෙසෙසක්.

උයින් =1. ඔහුන්.. 2. ඔහුද.

උයු =1. ඍතුව.

උය්‍යාන =1. උයන. 2. මල් වත්ත. 3. කැලය. 4. ගමන.

උය්‍යාන කීළා =1. උයන් කෙළිය.

උය්‍යාන භූමි =1. උයන් බිම.

උය්‍යාම =1. උත්සාහය.

උය්‍යෝගය =1. උද්‍යෝගය.

උය්‍යෝජනා = 1. යෙදීම. 2. උත්සාහවත් කිරිම.

උය්‍යෝජිත =1. යොදවන ලද. 2. පිටත්-කරවන ලද.

උය්‍යෝධික =1. යුද බිම. 2. බොරු යුද්ධය.

උර =1. උරයට අයිති. 2. සිත. 3. හදවත. 4. ළැපැත්ත. 5. සර්පයා. 6. කර. 7. ප්‍රාකාරය. 8. උරගල්. 9. (කොට්ට) උර. 10. දෑලි පිහිය.

උර ඇට =1. කරෙහි තිබෙන ඇටය.

උර හිස =1. කර.

උර-උරා =1. ඉරීම කරමින්. 2. උරමින්.

උරග = 1. බඩ ගා යන සතා. 2. සර්පයා. 3. පසුවෙන් ගමන්කරන.

උරග ආලින්ද = 1. මහමෙරෙහි නාගයන් වසන ප්‍රදේශය.

උරග ඉඳු = 1. (අනන්ත) නාගරාජයා.

උරග පිය = 1. හඳුන්.

උරගල =1. රත්රන් ආදි ලෝහවල මාත්තු බලන ගල.

උරගින්ද්‍ර = 1. උරගේන්ද්‍රයා. 2. (අනන්ත) නාගරාජයා.

උරවක්‍ර මාලාව = 1. කරෙහි ලූ කල කපාගෙන බස්නා ආයුධයක්. 2. පපුව මත තැබූවිට කැරකෙමින් කැපෙන ආයුධයක්. 3. වද ඇති කරන මාල පළඳනාවක්.

උරඬ්ඩි කරනවා = 1. උලනවා. 2. මදිනවා.

උරච්ඡද = 1. පපුව වැසෙන පළඳනාවක්. 2. උරවැස්ම 3. භටයකුගේ පපු වැස්ම.

උරණ = 1. තරඟ. 2. කෝපය. 3. එළුවා.

උරණවා = 1. උරා බොනවා.

උරත = 1. පපුව. 2. උරයෙහි.

උරතල = 1. පපුව. 2. උරතලය.

උරද = 1. පුත්‍රයා.

උරපක් = (උරපා) 1. සපීයා.

උරපත්ත = 1. උරහිස් තලය.

උරනා = (උරපති) 1. අනන්ත නාග රාජයා.

උරසි = 1. සඳුන්. 2. කපුරු.

උරසිය = 1. සඳුන් ගස.

උර සුරා ඇඳි = 1. දුනුදිය දකුණු උරහිස ළඟට ම ඇදීම.

උරබිහ = 1. බැටළුවා.

උරබාහු = 1. උරහිස. 2. උරය හා අතේ උඩ කොටස. 3. ආම වාත රෝගය.

උරබින් = 1. මහොඟු වූ ළපැත්ත.

උරබිසි = 1. තණ බිබලි.

උරමඬල = 1. ළැපැත්ත.

උරමල් = 1. පපුව දක්වා එල්ලෙන මාලය.

උරමාඩ = 1. උරය වසා පොරවන රෙද්ද.

උරමාල = 1. තලප්පාව 2. පපුවේ එල්ලෙන සේ පලඳින මාලය.

උරයා = 1 නයා.

උරමිය = 1. පළල්වීම. 2. පොරොන්දුව. 3. විස්තරය.

උරරී = 1. සම්පාදනය කිරීම. 2. විස්තර කිරීම.

උරරීකෘත = 1. සම්පාදනය කළ. 2. විස්තර කළ. 3. පොරොන්දු වූ.

උරරිපු = (උරරුපු) 1. ගුරුළා. 2. උරගුන්ගේ සතුරා.

උරලෝ = 1. නාග ලෝකය.

උරඩම = 1. උරහිස.

උරඩා = 1. සවිකරවා.

උරසක් මල් = (උරවක්‍ර මාලාව බලන්න) 1. කරපලඳනාව?

උරසඳ = (උරසැද) 1. යුධ ඇඳුම. 2. කරවිය නම් යුධාභරණ විශෙෂයක්. 3. සන්නාහය.

උරස්තල = 1. පපුව. 2. ළැපැත්ත.

උරසිචක්‍රය = 1. උර චක්‍ර මාලාව.

උරසිජ = 1. ළයෙහි හටගත් දෙය. 2. තනය.

උරස්‍යයා = 1. නීතියෙන් පිළිගත් පුත්‍රයා.

උරශ්ඡද = 1. සන්නාහය. 2. යුධ ඇඳුම.

උරසුරූ = 1. ළැපැත්ත නමැති සාගරය.

උරසරණ = 1. උර විල.

උරසූත්මාල = 1. උර සඳ පළඳනාව.

උරසෑද = 1. සන්නාහය. 2. යුධ ඇඳුම.

උරහර = 1. මෙහෙසුරු.

උරහරගිරි = 1. කෛලාස පර්වතය.

උරහරණ = 1. දිග මාලය.

උරහරයා = (උරාහාරයා) 1. සිව දෙවියා 2. පැරණි කුරුළු වර්ගයක්.

උරහිස = 1. උරඉහ.

උරඃ = (උරස්) 1. 'ළය'

උරඃක්ෂත = 1. ළයෙහි තුවාලය. 2. ක්ෂය රෝගය.

උරඃස්ථල = 1. ළැපැත්ත. 2. පපුව.

උර්වශී = 1. එනම් දෙවඟන.

උරා (උරාගරයා) 1. සපීනා. 2. කටට ඇදගෙන. 3. නෙත ඇදගෙන.

උරාසිය = 1. සඳුන්.

උරාබොනවා = 1. උරාගෙන බොනවා.

උරාරිපු = (උරාරුපු) 1. ගුරුළා. 2. සපීයන්ගේ සතුරා.

උරාහර = 1. සිව දෙවියා.

උරින්ද = (උරිඳු) 1. අනන්ත නාග රාජයා

උම්ඳු යහන් = 1. විෂ්ණු.

උම්ඳු ලොව = 1. නාග ලෝකය.

උමිර = උරිරු – උරිරු රද. 1. ලේ.

උමිරුෂා = 1. ලේ බොන්නා. 2. රාක්ෂයා.

උරු = 1. මහත්. 2. ලොකු. 3. කලවය 4. උර ා 5. පපුව. 6. උසස්. 7. ලුණුකරබිම.

උරුක් කරනවා = 1. තර්ජනය කරනවා.

උරුක්කු = 1. වෘතේ. 2. තර්ජනය.

උරුච්චු = 1. සියුම් කැටයම්. 2. කෝපය. 3. හුරුබුහුටිකම.

උරුනු = (උරුණු) 1. කියන. 2. කකියන. 3. උණු කල.

උරුදී = 1. ඒකාන්ත. 2. නිශ්චිත. 3 සැබවින්ම.

උරුදීය = 1. සහතික වීම.

උරුදු = සෘජු. 2. ඇදනැති. 3. අවංක.

උරුබ = (උරුබුක) 1. එරඹු ගස.

උරුම = 1. අයිතිය. 2. හිමිබව. 3. පරම්පරා සතුව එන ලැබීම.

උරුමක්කාරයා = 1. හිමියා.

උරුමකරදෙනවා = හිමිකර දෙනවා.

උරුමවාසි = 1. අයිති බව.

උරුලෑවා = 1. එනම් සතා.

උරුලෑ සච්චම් = 1. උරුලෑවාගේ පසු කොට- සෙහි වූ මස් පිඩු.

උරුලුවම්බානවා = 1. හුරුලෑ පිඹිනවා. සිවුරු හඬලනවා. 2. තාලයක් අනුව කටින් ශබ්දයක් පිට කරනවා.

උරුව = 1. පපුව. 2. කලවය. 3. උරය.

උරුවන් = 1. හුරුලෑ පිඹීම.

උරුවල් = 1. මහාවනය.

උරුවිසි = 1. ඌර්වශී නම් දෙවගන.

උරුවෙල් = 1. නෙරඤ්ජන ගඟ අසල එනම් ජනපදය·

උරුවෙස් = 1. උර්වශිය.

උර්වි = 1. පොළොව.

උරෙසිඳ = 1. තමාටම ජාතවූ. 2. තමන්ගේ ම දරුවා.

උරෙසිඳ = (උරෙයි ද බලන්න.)

උරෝජාත = 1. උරද. 2. පුත්‍රයා.

උරෙන්උර ගෑවී = 1. එක්සත්ව. 2. සහයෝග- තාවෙන් යුක්තව.

උරෙසිඳ මසිල් = 1 මවගේ සහෝදරයා.

උල = 1. උල්වූ උපකරණය. 2. තියුණු තුඩ. 3. පෙර වරද කළවුන්ට දඬුවම් දීමට ගත් උපකරණයක්. 4. තියුණු තඩ ඇති ලී ආදිය. 5. පොල් (ඔයත) ලෙලි අරින උපකරණය.

උලකා = 1. අනසින් ගිනි කඩා වැටීම. 2. විලක්කු.

උලක්කුව = 1. හැළිලෙන් හතරෙන් පංගුව. 2. පත.

උලඟ = 1. ආදරය. 2. ගෞරවය.

උලඟිය = (උලැගය) 1. නැඟීම. 2. ඉක්මවා යෑම.

උලඝන = 1. උල්ලඞ්ඝනය.

උලතබනවා 1. උලක හිඳුවා මරණයට පත්කරනවා.

උලදඬුවම = 1. උල හිඳුවා දඬුවම් කිරීම.

උලනවා = 1. අතුල්ලනවා.

උලමා = 1. උලලේනා. 2. බස්සන් වර්ගයක්. 3. යක්කුරුල්ලා.

උලමුක = 1. අඟුරු.

උලරු = 1. මහත්.

උලලිකිණියා = 1. උලම්මුවා. 2. කොක් වෙසෙසක්.

උලවු = 1. කනගාටුව.

උල් = උල්වූ. 2. තියුණු අගක් ඇති. 3. පෙර වරද කළවුන්ට දඬුවම් දීමට ගත් උපකරණයක්. 4. තියුණු තුඩ ඇති ලී ආදිය. 5. පොල් (ඔයත) ලෙලි අරින උපකරණය.

උල්කමු = 1. පුස් කොළ ලිවීමට ගන්නා පන්හිඳ වෙසෙසක්.

උල්කරනවා = 1. කොන තියුණු කරනවා. ඉස්සරහට දික්කරනවා.

උල්කාගල = 1. තරුගල.

උල්කාවා = 1. වැටෙන තරුව. 2. ගිනිහුළ. 3. අහසින් වැටෙන රේඛාකාර තේජෝ-රාශිය. 4. උල්පන්දම.

උල්කා ආලෝක = 1. හුළු එළිය.

උල් ඛොත = 1. උල්වූ මුදුන් කොටස.

උල්කා පාත = 1. උල්කා වැටීම. 2. තරු වැටීම.

උල් කා මුඛ = 1. විලක්කුව.

උල් කිදි = 1. ගිනි හුල.

උල් පට්ඨු = 1. ප්‍රසිඬ.

උල් පන = 1. මතුරන.

උල්පත = 1. දිය උනන තැන. 2. කුඩා ඇල.

උල් පන්දම් = 1. ගිනි පෙණෙලි. 2. ඇවිස්සීම්. 3. අනුබල දීම්.

උල් පන්දම් දෙන්නා = 1. අවුස්සන්නා. 2. අනුබල දෙන්නා.

උල්පැන් ගේ = 1. නාන කාමරය.

උල් මාංසය = 1. මස් සහිත කොටස.

උල් මැස්සා = 1. මැසි වෙසෙසක්.

උල් මුඛය = 1. පන්දම. 2. ගිනි පෙණෙල්ල.

උල් යාජ්ජු = 1. ඉරමුසු.

උල්ලඞ්ඝන = 1. ප්‍රමාණය ඉක්මවා යෑම. 2. කඩ කිරීම. 3. පැන යාම.

උල්ලඞ්ඝනා = 1. පැනීම. 2. ඉක්මවීම. 3. කඩ කිරීම.

උල්ලඞ්ඝිත = 1. කඩ කරනලද. 2. පනින ලද. 3. ඉක්මවන ලද.

උල්ලාඝ = 1. සනීප වෙන. 2. දක්ෂ. 3. වාසනාවන්ත. 4. පිරිසුදු.

උල්ලාසය = 1. ප්‍රීතිය. 2. කැදවීම. 3. ග්‍රන්ථ පරිච්ඡේදය. 4. ප්‍රකාශය.

උල්ලෙල = 1. රළ. 2. නදින් සෙල්ලෙන. 3. කැළඹීම.

උල්ලේඛණ = හැරීම. 2. උච්චාරණය.

උල්ලෝගම් = 1. අක්කාරම්

උල්ලෝචය = වියන.

උල්ලෝරු ලේන්සු = (උල්ලූරු ලේන්සු.) 1. මල් - ලියකමින් හෙබි ලොකු ලේන්සු වර්ගයක්.

උල්ලෝල = 1. රළ.

උල්වර = 1. කටුකරඹු.

උල් වාරම = 1. හිරමනය. 2. ඇස් ලෙඩක්.

උල් වැරණිය = 1. පැළැටි වෙසෙසක්.

උලාර = (උළාර) 1. මහත්. 2. උසස්. 3. ප්‍රසිඬ. 4. ශ්‍රෙෂ්ඨ.

උලැඟි = 1. කඩ කිරීම. 2. ඉක්මවීම. 3. මූවා. 4. උඩින් පැමිණීම. 5. පමණ ඉක්මවා යන.

උලුක් කරනවා = 1. (තර්ජනාත්මකව) අත ඔසවනවා.

උලුක්කුව = 1. පන. 2. අත් - පා ආදිය අම්බරුට්ටි වීම.

උලු කැන් = 1. කැද.

උලු සියා = 1. මුදු ඌරා.

උලුප්පනවා = 1. මදය ගලවනවා. 2. පා වෙන්නට අරිනවා. 3. මතු කිරීම.

උලුල = 1. (උලුල්) 1. උක්කුටිකයෙන් ඉඳීම. 2. ඇණ තියා ඉඳීම.

උලුල්ල = 1. උඩ බලා ඉඳීම. 2. උඩු පැල්ලෙන් හිඳීම.

උලූක = 1. බකමූණා.

උලු අතුරූ ඇසවා = 1. ගඩොල් අතර කුස්තුර පුරවා.

උලෙල = 1. උත්සවය. 2. අධික සෙලවීම. 3. රළ.

උලෝල = (උලෝලය.) 1. රළ.

උළරු = (උලාර) 1. මහත්. 2. උසස්. 3. ප්‍රසිඬ. 4. ශ්‍රෙෂ්ඨ.

උළඳු = 1. තරු. 2. ගඩොල්.

උළිඳු = (උළු රජ.) 1. චන්ද්‍රයා.

උළිඳු සිළුමිණි = 1. සිව දෙවියා. 2. සඳ සිළුමිණ කොට ඇත්තා.

උළුඅස්ස = 1. උළු වස්ස.

උළු = 1. තරුව. 2. (මහලවල් සෙවිලි කරන) උළු කැට.

උළු කැන = 1. තාරකා රාශිය.

උළු කැන් = 1. කැද. 2. කැවුම් ආදිය. 3. කාඩි.

උළුක් කරනවා = 1. (තර්ජනාත්මකව) අත ඔසවනවා.

උළුක්කු වෙනවා = 1. (අත්-පා ආදිය) ඇමැට්ටි වෙනවා; ඇම්බරැට්ටි වෙනවා.

උළුඳු = 1. උඳු 2. ධාන්‍ය වර්ගයක්.

උළුප්පනවා = 1. මදය උගුල්ලනවා. 2. මතු කරනවා.

උළුපැන් ගෙය = 1. නාන කාමරය.

උළු රජ = (උළු රද) = 1. තාරකාවන්ගේ අධිපතියා. 2. චන්ද්‍රයා.

උළු රිළු = 1. තාරකා සමූහය.

උළුල = 1. ඇණ තියා ඉදීම.

උළුලුව = 1. ඇණ තියා ඉදීම.

උළු වඩුවා = 1. උළු සාදන්නා. 2. කුලු පොත්තා? 3. පෙදරේරුවා.

උළුවා = (හාල්) 1. කෑම රස කිරීමට දමන ඇට වර්ගයක්.

උළු සුණු = 1. රතු මැටි. 2. ගඩොල් කුඩු.

උළුළු = 1. ගස් වර්ගයක්.

උව = 1. උප. 2. උපකාරවූ. 3. දිය සුළිය. 4. ළඟ. 5. දුන්න. 6. උපාය. 7. උපමාව. 8. වී නම්. 9. වුනොත්.

උවකම් = 1. උපකාරය.

උවකුම් = 1. උපක්‍රමය.

උවකෙලෙස් = 1. උප ක්ලේශ

උවග = 1. උප ඝාතය. 2. බාධාව.

උවඟ = 1. උපාඞ්ගය. 2. ප්‍රධාන අඞ්ගයන්හි පිහිටි ඇඟිලි ආදිය.

උවටන් = (උවටැන්.) 1. උපස්ථාන.

උවටන් හල් = 1. උපස්ථාන ශාලාව.

උවටා = (උවටු - උවට.) 1. උපස්ථායකයා

උවඨන් = 1. උපස්ථානය.

උවතඹ = 1. උපස්තම්භය. 2. උපකාරය.

උවත් = 1. වුවත්. 2. සිදු වුනත්.

උවදන = 6. පඹුර.

උවඳු = 1. උප ජාති නම් වෘත්තය.

උවදුර = 1. අනතුර; උපද්‍රවය.

උවදෙස = 1. අවවාදය.

උවන = (උවත් - උවනත) 1. මුහුණ.

උවනිස = 1. උපනිඃශ්‍රය.

උවබෝ = 1. උපභෝගය. 2. කෑම - බීම. 3. සම්පත්තිය.

උවම = 1. උපමාව.

උවමනා = 1. වුවමනා. 2. ඕනෑවූ. 3. ඕනෑ දේ. 4. අදහස.

උවමෙ = 1. උපමේයය. 2. උපමාවට සමාන කරන දේ.

උවරණ = (උවාරණ.) 1. උපකරණ.

උවලොවුන් = 1. අවලෝකනය. 2. බැලීම.

උවස = 1. ආදරය.

උවිස් = 1. සැපය. 2. සනීපය.

උවසම් කළ = 1. දමනය කරන ලද.

උවසරය = 1. ගෞරවය. 2. ආදරය. 3. සේවය කිරීම.

උවසා = (උවසු - උවස්) 1 උපාසකයා.

උවා = 1. උපාය. 2. ඔසොවා. 3 විසුරුවා.

උවාමි = 1. උපමාව. 2. ආදර්ශ කථාව.

උවාර = 1. උපකාරය.

උවාරණ = 1. උපකරණ.

උවැසි = 1. උපාසිකාව.

උව වඳ වෙනිකම් = 1 උප පද්‍ය වේදනීය කර්ම.

උවිනාවූ = 1. සුදුසු.

උවිඳ = (උවිඳු.) 1 විෂ්ණු.

උවිඳු කත = 1. ලක්ෂ්මී. 2. ශ්‍රී කාන්තාව.

උවිඳු බෑ = 1. බල භද්‍රයා. (විෂ්ණුගේ සහෝදරයා.)

උවිඳු ශහන් = 1. විෂ්ණු සැතපෙන ස්ථානය. 2. අනන්ත නම් නාග රාජයා.

උද්දේශිකා = 1. වේයා.

උද්දේසිත = 1. රථ ආදිය තබන ශාලාව.

උද්ද්‍යෝත = 1. ප්‍රකාශය. 2. බැබළීම.

උඩ = 1. උස්තැන්හි වූ. 2. උඩ.

උඩඟ = 1. අඟ උඩට හැරුණු.

උඩඟම = 1. උඩට යන.

උඩච්ච = 1. ආඩම්බර. 2. නොහික්මුණු. 3. නොසන්සුන්.

උඩන = (උඩත) = 1. නොසන්සුන්. 2. එසවූ. 3. උඩඟු.

උඩත = 1. උඩටනැගී. 2. මහත්. 3. උඩඟු. 4. එකාහනුවූ.

උඩරණය = 1. උදුරා ගැනීම 2. එසවීම. 3. ගොඩනැගීම. 4. (පොතකින්) කරුණු උපුටා දැක්වීම.

උඩර්ෂණය = 1. අධික ප්‍රීතිය. 2. මයිල් කෙළින් සිටීම.

උඩර්ෂය = 1. ප්‍රීති උත්සවය.

උඩාර = 1. ඉදිරීම. 2. ණය.

උඩුමාත = 1. ඉදිමුණු.

උඩුමාතක = 1. ඉදිමුණු දෙය.

උඩුත = 1. සෙලවූ. 2. එසවූ. 3. ඔසවන ලද.

උඩෘත = 1. උදුරාගත්. 2. උපුටාගත්

උඩෘතඵල = 1. උඩරණය කළ අණ්ඩ ඇති. 2. කප්පාදු කළ.

උඩෘතභාගය = 1. උපුටාගත් කොටස.

උද්බධ්‍යමාන = 1. කර වැල්ලා එල්ලනු ලබන.

උද්බන්ධන = 1. (බෙල්ලෙන්) එල් ලා මැරීම.

උද්භව = 1 ඉපදීම. 2 හටගැනීම.

උද්භාවන = 1. කල්පනාව. 2. සැලකවීම.

උද්භිජ = 1. පැළවෙන.

උද්භිද = 1. පැළවෙන්නාවූ. 2. ගස් කොළන් ආදියට අයිති. 3. එනම් ලුණු වර්ගය.

උද්භිද්ජාති = 1. ගස් කොළන්.

උද්භිද්ලවණ = 1. යවකාර ලුණු.

උද්භිද්විද්‍යාව = 1. ගස් - වැල් ආදිය ගැන උගන්වන ශාස්ත්‍රය.

උද්භින්න = 1. බිඳුණු. 2. හටගත්.

උද්භූත = 1. උපන්. 2. හටගත්. 3. පහළවූ.

උද්යත = 1. උද්‍යොගී. 2. සූදානම්.

උද්යම = 1 වීර්‍යය. 2. උත්සාහය.

උද්යානය = 1. උයන. 2. වත්ත.

උද්යානක්‍රීඩා = 1. උයන් කෙළි (උයන්වල කරන සෙල්ලම්)

උද්යානපාල = 1. උයන් පල්ලා.

උද්යානප්‍රයුක්ත = 1. උයන්වල සේවයෙහි යෙදුණු අය.

උද්යෝග = 1. උත්සාහය. 2. උනන්දුව.

උද්වරණ්ඩය = 1. උඩුමහලේ බරාඳය.

උද්වහන = 1. උසුලන. 2. දරණ.

උද්වර්ත = 1. අධික.

උද්වර්තන = 1. ඇඟ ඉලීම.

උද්වාහය = 1. කසාද බැඳීම.

උද්වාන්ත = 1. වැමෑරූ.

උද්විග්න = 1. උනන්දුව අඩුවූ. 2. කලකිරුණු. 3. බියෙන් කම්පිත. 4. තැති ගැනුණු.

උද්වෘත්ත = 1. නරක පැවතුම් ඇති. 2. කැලඹුණු 3. අධික.

උද්වේග = 1. වේගවත්.

උද්වේගය = 1. එකෙණෙහිම ලොමු දැහැගන්නා භය. 2. කලකිරීම. 3. තද බලාපොරොත්තුව. 4. උසස්වූ වේගය ඇති. 5. හිරිහැරය. 6. පුවක්.

උද්වේග ප්‍රීතිය = 1. ප්‍රීති වේගයෙන් ඉල්පීයාම.

උදා = 1. උදාවීම. 2 උදය පර්වතය. 3. අභිවෘද්ධිය. 4. උසස්වීම. 5 හොඳ, දමා.

උදාකල = 1. උදය කාලය.

උදාගල් = 1. සූර්‍යයා.

උදාගල = (උදාගිරි - උදාගිර = උදා පව්ව) 1. උදයගිරි පර්වතය.

උදාගුරු = 1. බෘහස්පති පහළ වීම.

උදාත්තය = 1. හෘදය. 2. ශ්‍රේෂ්ඨ. 3. උසස්. 4. විශේෂ ශබ්දය.

උදාත්ත අලඞ්කාර = 1. සම්පත් ආදියෙහි උසස් බව වැණීම නමැති අලංකාරය.

උදාත්ත ස්වර = 1. උත්පත්ති ස්ථානයන්ගේ උසස් තැනින් උපදින ස්වර.

උදාන = 1. ප්‍රීති වාක්‍යය. 2. සතුට පළවෙන වචන. 3. වැදගත් කීම.

උදානය = 1 ප්‍රීතිමත්කම. 2. හුස්ම. 3. කුදු-ගොත් සඟියට අයත් එනම් පොත. 4. බොටුවෙහි පවත්නා වායුව.

උදාන වා = 1. උදාන වාතය.

උදා මිහිඳුරු = 1. උදයගිරි පර්වතය.

උදාර = (උදාරතර) 1. උසස්. 2. මහත්. 3. උඩඟු. 4. උතුම්.

උදාර භෝගකුල = 1. මහත් වස්තු ඇති කුලය.

උදාරම් = (උදාරම් කම) 1. උඩඟු කම. 2. තද ආඩම්බරය.

උදාව = 1. පහත්වීම. 2. එළිවීම. 3. (හිරු) උදාවීම. 4 උදය පර්වතය.

උදාවර්තය = 1. ඔක්කාරය.

උදාවිය = 1. ඉපදීම හා නැසීම. (උදයව්‍යය)

උදාවෙනවා = 1. පායනවා. 2. නගිනවා. 3. පහත් වෙනවා.

උදාස = 1. නොසැලකිලි.

උදාසන = (උදෑසන) 1. පාන්දර.

උදාසනක් සේ = 1. උදයෙන්ම.

උදාසීන = 1. නොසැලකිලි. 2. උනන්දුව නැති. 3. මධ්‍යස්ථ.

උදාසීනයා = 1. අමුත්තා.

උදාහරණය = 1. උපමාව. 2. කරුණක් පැහැදිලි කිරීමට දක්වනු ලබන නිදසුන.

උදාමිහිඳුරු = 1. උදාගිරි පර්වතය.

උදාහිර = 1. ඉර උදාවීම.

උදාහිස = 1. උදයගිරි පර්වතයේ මුදුන.

උදාහෘත = 1. කියන ලද. 2. උදාහරණ කරන ලද. 3. කියූ; ගෙන ඇර දැක්වූ.

උදාල්ල = 1. පොළොව කෙටීමට ගන්නා එනම් ආයුධය.

උදාහුම් = 1. එසෙවීම.

උදාහන් = 1. උදය.

උදීච්ච = 1. උතුරෙහි වූ.

උදීච්ච බ්‍රාහ්මණවංශ = 1. උතුරෙහි වූ (උසස්) බමුණු කුලය.

උදිත = 1. කියන ලද. 2. පහළ වූ. 3. උදාවූ. 4. වැඩුණු. 5. සමෘද්ධ.

උදිතෝදිත = 1. අතිශයින් වැඩුණු 2. බොහෝ ප්‍රසිද්ධ වූ.

උදීචි = 1. උතුර.

උදීරණ = 1. කීම. 2. ප්‍රකාශය. 3. පිටකිරීම.

උදීරිත = 1. කියන ලද.

උදීර්ණ = 1. මහත්. 2. උසස්. 3. අධික. 4. කැලඹුණු.

උදු = 1. ඍජු. 2. කෙළින් 3. අවංක. 4. මාංසය. 5. ශුභ.

උදුන = 1. ළිප. 2. පෝරණුව. 3. උල්කාව. 4. අඟුරු කබල.

උදුම්බර = (උදුඹර) 1. දිඹුල්, අට්ටික්කා.

උදුරණ = 1. උදුරා දමන. 2. උගුල්ලන

උදුරම් = 1. උද්දකාරාම තාපසයා.

උදුරයා = 1. මීයා.

උදුරාගන්නවා = 1. පැහැරගන්නවා. 2. බලෙන් ගන්නවා.

උදුරාපියන = 1. උගුල්ලන. 2. ගලවන.

උදුල - 1. බැබළීම. 2. දීප්තිය. 3. යහපත.

උදුලබැව් = 1. ශෘංගාරය. 2. රාගය. 3. බැබළීම.

උදැසු = 1. උඩට නැගුණු. 2. ඉකිලුණු.

උදුළු ඇස් = 1. උඩින් යෙදූ සිදුරු.

උදෙකලා = 1. ඒකාකී. 2. තනිවූ.

උදෙසන = 1. දෙසන. 2. කියන. 3. දක්වන. 4. තමාගේ යයි කියන.

උදෙස් - 1. උද්දේසය, පාලිය. 2. ඉගනීම. 3. කීම. 4. මාතෘකාව.

උදෙසා = 1. කියා. 2. අපේක්ෂාකොට. 3. වෙනුවට.

උදේනි = පුරාණ නගරයක නමක්. 2. රජෙක්.

උඳු = 1. එනම් ධාන්‍ය වර්ගය. 2. වැලි සහිත බිම.

උඳුකැරඹිඩි සූ = 1. උඳුපිටියෙන් කළ කැවිලි විශේෂයක්.

උඳුකැට = 1. උඳු ඇට තරම් කුඩා ගල්.

උඳු කැරලි = (උඳු කැටුම්) 1. උඳු පිටියෙන් සැදූ කැවිලි වර්ගයක්.

උඳු ගොච්චා = 1. හිසකෙස් විනාශ කරන සත්ව විශේෂයක්.

උඳුන = (උදුන) 1. ළිප.

උඳුපියලි = 1. උඳු ඇටවල පියලි. 2. එනම් කුඩා පැලෑටි වෙසෙස.

උඳු පූ = (උඳු කැරලි බලන්න)

උඳුබත් = 1. තැම්බූ උඳු.

උඳුරූ = 1. මීයා.

උඳුවඩ = 1. එනම් කැවිලි වෙසෙස.

උඳුවප් = 1. එනම් මාසය.

උඳුවන් = 1. සිහින් ගල් ඇති බිම.

උඳුවැල් = (උඳු පූ බලන්න.)

උඳුහැකිලිය = 1. තෙතවැලි පොළොව. 2. උඳු ඇට වැනි කුඩා ගල් සහිත බිම.

උද්‍යක = 1. වමනය. 2. ඔක්කාරය.

උධසය = 1. කිරි බුරුල්ල.

උධත = 1. උඩඟු. 2. නොසන්සුන්. 3. එසවූ.

උධන = 1 උදුන. 2 ළිප.

උප = 1. දෙවෙනි. 2. සහකාර. 3 උපකාර සහිත. 4. මත්ත. 5. ළඟ. 6. වැඩිවූ. 7. අනුගතිය. 8. පසුබව. 9. පිදීම. 10. සමාන. 11. පහත් බව. 12. ඉක්මීම. 13. දීම. 14. දොස්කීම. 15. පූජ්‍ය කම්ය. 16. නිදර්ශනය. 17. බොහෝ බව. 18. උත්සාහය.

උපකච්ඡ = 1. කිසිල්ලට සමීප තැන. 2. කිසිල්ල.

උපකණ්ඨ = 1. සමීපය.

උපකණ්ණක = 1. අනුන්ගේ කථාව ඇසෙන තරමේ දුර තැන.

උපකප්පන = 1. ලැබීම. 2. පැමිණීම.

උප කථාව = 1. අප්‍රධාන කථාව. 2. අතුරු කථාව.

උපකරණ = 1. උපකාරවන දෙය. 2. මෙවලම්. 3. අවශ්‍ය බඩු. 4. වැඩට ගන්නා ආයුධ ආදිය.

උපකන්‍යා = දෙවෙනි කන්‍යා.

උප කලමනාකාරයා = 1. දෙවෙනි අධ්‍යක්ෂයා.

උපකල්පන = පිළියෙල කිරීම. 2. යෙදීම.

උපකාර = 1. පිහිට. 2. උපස්ථම්භය. 3 උදව්ව. 4. සහායවීම.

උපකාරක = 1. උපකාර කරන. 2. උපස්ථම්භ වන.

උපකාරිකා = 1 උපකාරකරන්නී. 2. කොටු බැම්මේ මුල ශක්තිමත් කරන බැම්ම.

උපකාරිණී = 1. උපකාර කරන්නී.

උපකාරී = 1. උපකාර කරන්නා. 2. වස්ත්‍රයෙන් සැදූ රාජ යෝග්‍ය වූ ගෘහය හෝ කුඩාරම. 3. බලකොටුව.

උපකාරී නුවර = 1. සේනාව නැවැත්වීමට තාවකාලික වශයෙන් සැදූ කුඩාරම් සහිත නගරය. 2. කඳවුරු බැඳගත් නගරය.

උපකාර්‍ය = 1. උදව් කළ යුතු.

උපකාර්‍යා = 1. ගමන් මාලිගාව. 2. කුඩාරම.

උපක්‍රමය = 1. උපාය. 2. ක්‍රියා මාර්ගය. 3. වික්‍රමය.

උපක්‍රියා වචනය = 1. ක්‍රියා පදයට උපකාර වශයෙන් යොදන ක්‍රියා පදය.

උපකුල = 1. තිප්පිලි.

උපකුශ = (උපකුසා) 1. මුඛ රෝගයක්.

උපකූජන = 1. හැඬීම. 2. පක්ෂියාගේ ප්‍රීති නාදය.

උපකූජිත = 1. හැඬූ. 2. පක්ෂි නාදයෙන් යුත්.

උපකෘත = 1. උපකාර කළ.

උපකෘති = 1. උපකාරය.

උපක්කුඨ = 1. දෝෂාරෝපණය කළ. 2. බොහෝ නින්දා කළ.

උපක්‍රෝශය = 1. නින්දා කිරීම. 2. අවනම්බු කිරීම. 3. බැණීම.

උපක්ලිෂ්ට = 1. කෙලෙසුණු.

උපක්ලේශය = 1. සුළු පාපය.

උපග = 1. එළඹ. 2. ළඟට පැමිණි

උපගණ්හන = 1 ලංකරගැනීම.

උපගත = 1. එළඹුණු. 2. ළඟට පැමිණි. 3. පොරොන්දු වූ.

උපගණ්ඩය = 1. හුවඳ.

උපගමන = 1. ලඟට යෑම.

උපගුරු = 1. ගුරුහුගේ සමීපය. 2. දෙවැනි ගුරුවරයා. 3. අප්‍රධාන ගුරුවරයා.

උපගූහණය = 1. වැලඳ ගැනීම. 2. අල්ලා ගැනීම.

උපගුළ්හ = (උප ගුල්හ) 1. මුවහ වූ 2. සැඟවුණු.

උප ග්‍රන්ථය = 1. ග්‍රන්ථයක අගට එකතු කළ වැඩි කොටස. 2. ඌනපූරණය.

උපග්‍රහයා = 1. ග්‍රහයකු වටේ කරකැවෙන ග්‍රහයා. 2. රාහු කේතු ආදී අප්‍රධාන ග්‍රහයෙක්.

උපඝාත = 1. හැපීම. 2. නැසීම. 3. අනතුර. 4. රෝගය. 5. විනාශය. 6. පහර.

උපචය = 1. රැස්කිරීම. 2. ගොඩ. 3. වැඩීම. 4. දියුණුව. 5. උසස්වීම. 6. පළමු ඉපදීම.

උපචරිත = 1. සේවය කළාවූ. 2. පැමිණි 3. හැසුරුණු. 4. පිදූ.

උපචර්‍යාව = 1. වෙදකම. 2. සේවය කිරීම.

උපච්ඡේද = 1. සිඳීම.

උපචාරය = 1. ලංව හැසිරීම. 2. දෙලොස් රියනක් ඇතුළත කොටස. 3. සත්කාරය. 4. පූජාව. 5. මෙහෙකිරීම. 6. පුරුදු කිරීම. 7. පිළියම් කිරීම. 8. ක්‍රියාරම්භයට පළමුව කටයුතු පූජාව. 9. කෑටසක් අත් ඇරීම. 10. යම් වස්තුවක් ඒ ඒ හේතු නිසා අනෙක් වස්තුවකට ලංකර සැලකීම. 11. ගොඩ නැගිල්ලක අවට පෙදෙස.

උපචිකා = 1. වේයා.

උපචිත = 1. රැස්කළ.

උපචිත් = 1. රැස්කරන ලද. 2. අධික. 3. මී නුග ගස්

උපචින්න = 1. රැස්කළ. 2. පුරුදු කළ.

උපච්ඡේදක = 1. සිඳ දමන.

උපජන = 1. උපදින.

උපජනීයමාන = 1. උපදවනු ලබන.

උපජ්නා = 1. උපදින.

උපඣත = 1. උපත්.

උපජාති = 1. ඉපදීම. 2. වෘත්ත විශෙෂයක්. 3 වර්ගයකින් බෙදීගිය වර්ගය.

උපජීවන = 1. කිසිවකු ආශ්‍රයකොට ජීවත්වීම. 2. ලංව ඇසුරු කරමින් ජීවත් වීම.

උපජීවී = 1. සේවකයා.

උපජිහ්වය = 1. උඩුදිව (උප ජිව්හාව) 2. එනම් රෝගය.

උපඨාන = 1. මෙහෙකිරීම. 2. ළඟ සිටීම. 3. වැටහීම. 4. උවටැන් කිරීම.

උපඨාන සාලා = 1. (ආගන්තුකාදීන්ට) සත්කාර කරන ශාලාව.

උපඨාපන = 1. පැමිණවීම. 2. මෙහෙකරවීම 3. ගෙනැවිත් දෙවීම.

උපඨිත = 1. එළඹ සිටි.

උපත = 1. පටන් ගැනීම. 2. ඉපදීම. 3. ආරම්භය.

උපතාරාපති = 1· දෙවැනි තාරාපති.

උපතාප = 1. තැවීම. 2. රස්නය. 3. පසුතැවීම 4. වේගය.

උපතාපන = 1. තැවීම. 2. කරදරකිරීම.

උපතාලය = 1. සංගීත තාලයට එක්ව යන තාලය.

උපතැණි = 1. අත්තිකාරම.

උපදංශය = 1. එනම් රෝගය. 2. හපා කෑම. 3. රුචිය.

උපදන් = 1. උපධානය, කොට්ටය.

උපදන = 1. උපදින්නාවූ.

උපදර්ශන = 1. දැක්වීම.

උපදර්ශිත = 1. දැක්වූ

උපදස් = 1. කැවිලි. 2. රෝගයක්. 3. ව්‍යංජන.

උපදිෂ්ට = 1 කියූ. 2. දැක්වූ.

උපදශික = (උපදර්ශික) 1. මූරකාරයා.

උපදෘනය = 1. පඹුර.

උපදීක = 1. නීතිය.

උපදිතොත්තින් = 1. උපදිතොත්.

උපදෙස් = 1. උපදේශය. 2. අවවාදය.

උපද්දව = 1. උපද්‍රව. 2. පීඩා. 3. අනතුර.

උපද්‍රුත = 1. උපද්‍රුකළ. 2. පොළු. 3. පීඩිත වූ.

උපද්දවනවා = 1. සපයනවා. 2 උපදවනවා.

උපධානය = 1. කොට්ටය. 2. වස. 3. කාරුණ්‍යාව 4. අතධාරකය.

උපධා = 1. ශබ්දයක අන්තිම අකුරට මුලින් වූ අකුර.

උපධාතු = 1. ප්‍රධාන ධාතුන්ට අනුගතවූ කිරි, ඩහදිය, දත් ආදිය. 2. මීරත්-හිරියල්-ගල් සෙවෙල්-ලෝකඩ ආදිය.

උපධාරණ = 1. භාජනය. 2. භාජන අඩිය. 3. සලකා බැලීම. 4 දූරීම. 5. සිතට ගැනීම 6. රුකුල් දීම.

උපධි = 1. ශරීරය 2. නැවත ඉපදීමට හේතුව. 3. අඹු-දරු ධන ආදිය.

උපධිසම්පත් = 1. පෙර පිනින් ලැබෙතියි සල කන රූප ශෝභාඅලංකාර අඞ්ග ප්‍රත්‍යඞ්ග ඇති බව.

උපධිශේෂ = 1. පඤ්චස්කන්ධයෙන් කිසිවක් ඉතිරි නොවූ.

උපනත = 1. නැමුණු. 2. ළඟට පැමිණී. 3. ළංවූ.

උපනය = 1. පැමිණවීම. 2. උපනයනය. 3. නික්මවීම.

උපනමන = 1. නැමීම. 2. අවනතවීම.

උපනයන = 1. සමීපයට ගෙන ඒම. 2. (බ්‍රාහ්මණයන්ගේ) පූනනූල දැමීම. 3. අතපොත් තැබීම. 4. නිලයකට පත්කිරීමේ කටයුත්ත.

උපන් = 1. ඉපදුණාවූ 2. හටගත්.

උපන්වනින්ම = 1. ඉපදුණු හැටියටම.

උපන්හඳවියක = 1. කිසි කලක. 2. උපන්නාට පසු. 3. කවදුවත්.

උපනාඩගම = 1. නාඩගමකට එකතු කළ කොටස.

උපනාද = 1. සංගීතයකට අනුව පවත්වන නාදය.

උපනාමය = 1. ප්‍රධාන නොවන නම. 2. දෙවනි නම.

උපනාහය = 1. පැලැස්තරය. 2. බද්ධ වෛරය. 3. වෙළීම.

උපනාහී = 1. වෛරය ඇත්තා.

උපනිධානය = (උපනිධිය) 1. උකස 2. ආරක්ෂාවට තැබීම.

උපනිධි = 1. උපමා කිරීම. 2. සමාන කිරීම.

උපනිභ = 1. සමානවූ.

උපනිසා = 1. හේතුව. 2. කිට්ටු බව.

උපනිසින්න = 1. ළඟ වාඩිවූ.

උපනිසීදිත්වා = 1 ළංව හිඳ.

උපනිසෙවන = 1 ළංව ආශ්‍රය කිරීම.

උපනිස්සය = 1. හේතුව. 2. ප්‍රතිෂ්ඨාව. 3. මූලාධාරය.

උපනිශ්‍රය = 1. බලවත් හේතුව. 2. ආශ්‍රය. 3. සැපත.

උපනිශ්‍රිත = 1. සම්බන්ධවූ.

උපනිෂද් = 1. වේදයට සමීප කොට නිපදවූ වේදාන්ත ශාස්ත්‍රය. 2. හින්දු ආගමේ ධර්ම පොත් පන්තියක්.

උප නිෂ්ක්‍රමණය = 1. වීදිය. 2. මහපාර.

උපනිෂන්න = 1. ළංව හුන්

උපනීත = 1. ළඟට පැමිණවූ. 2. පත්වූ. 3. පුරන ලද. 4. එළවූ.

උපනීය = 1. ළංකොට. 2. කෙළින් නොකියා ළංව යනසේ කියා.

උපනීයමාන = 1. ළඟට පමුණුවනු ලබන. 2. පත්වෙන.

උපනුපන් = (උපන් + උපන්) 1. ඉපදුණු ඉපදුණු.

උපනේත්‍ර = 1. ඇසේ ළඟ කන්නාඩි.

උපනේය = ළඟට පැමිණවිය යුතු.

උපන්ලප = 1. උපදිද්දීම ඇඟේ ඇතිවී තිබෙන ලකුණු.

උපන්‍යාස = 1. (වාක්‍යය) පටන් ගැනීම. 2. මාතෘකාව. 3. විවරණය. 4. ළං කොට තැබීම. 5. උපදේශක.

උපපති = 1. දෙවෙනි හිමියා. 2. හොර හිමියා.

උපපත්ති = 1. පැමිණීම. 2 ඉපදීම. 3 හේතුව. 4. යුක්තිය. 5. එක්වීම. 6 උපාය. 7. සිද්ධිය.

උපපන්න = 1. යුක්තවූ. 2. උපන්.

උපපත්‍ර = 1. කොළයට සම්බන්ධවූ කුඩා කොළය.

උපපරික්ඛණ = 1. පරීක්ෂාව. 2. විමසා බැලීම.

උපපද = 1. නාමයකින් පරව යෙදෙන 'ගෝමින්' යනාදි උපාධි. 2. ගෞරව නාම. 3. උපසර්ග 4. පෙරටුව උපසුරුවනු ලබන ශබ්දය.

උපපජ්ජ = 1. ඊළඟ. 2. අනෙක් ජීවිතයට අයිති

උපපජ්ජවේදනීයකම්ම = 1. දෙවැනි ආත්මයේ විපාක දෙන කර්මය.

උපපාදුක = 1. ඕපපාතිකව පහළවීම; ඉබේ ඉපදීම.

උපපන්න = 1. පැමිණි. 2. උපන්. 3. අටගත් 4. සුදුසු.

උපපරීක්ෂණ = (උපපරික්ඛණ බලන්න)

උපපාපය = 1. මහත් අපරාධය.

උපපාරමිතා = 1. ප්‍රධාන නුවූ පාරමිතා.

උපපැරුම් = 1. උප පාරමිතා.

උප පිළ = 1. උප පීඩක කර්මය. 2. කළ දේ පල දෙන.

උප පීඩක = 1. කළ දේ පල දෙන. 2. පෙළන.

උපපීඩිත = 1. පෙළන ලද.

උපපුරය = 1. උප නගරය.

උපපෙරුම් = (උප පාරමිතා බලන්න)

උපප්‍රධාන = 1. දෙවැනි ප්‍රධානයා.

උපප්ලව = 1. උපද්‍රවය. 2. භය.

උපබ්‍රෑහන = 1. වැඩිකිරීම. 2. අභිවෘද්ධියට පැමිණවීම.

උපබූළ්හ = 1. රැස්කළ. 2. ලංවූ. 3. පිළියෙළවූ.

උපභාර්යාව = 1. අනියම් බිරිඳ. 2. හොර අඹුව.

උපභුඤ්ජක = 1. අනුභව කරන්නා 2. වළඳන.

උපභෝග = 1. කෑම් පීම් ආදියට ගන්නාදේ. 2. වැළඳීම. 3. පාවිච්චි කිරීම. 3. ආභරණ ආදිය.

උපභෝග සපු = 1. උපභෝග සම්පත්තිය.

උපභෝගී = 1. පාවිච්චි කරන්නා.

උපභෝග වස්තු = 1. පාවිච්චි කරන ආභරණ පිඟන් - කෝප්ප ආදිය.

උපභෝග සපු = 1. උපභෝග සම්පත්තිය.

උපම = 1. සමානවූ. 2. උපමා ඇති.

උපමණ්ඩිය = 1. පිට තැරිය.

උපමවු = 1. දෙවැනි මවු. 2. කිරිමවු.

උපමාව = 1. සමාන භාවය. 3. සමාන කිරීම. 3. උදාහරණය. 4. උපමා කථාව. 5. උපමා ලංකාරය.

උපමාන = 1. (අනිකක් හා) සමාන කිරීම. 2. වස්තුවක සමානත්වය දැක්වීමට ඉවහල් වන අනික් වස්තුව.

උපමා ව්‍යාඛ්‍යය = 1. සමකර කියන කථාව.

උපමා විෂය = 1 උපමා කරන ලද දේ.

උපමිති = 1. උපමාව. 2. සමානකම.

උප මූලාදූනියා = 1. දෙවෙනි මූලාදෑනියා.

උපමේය = 1. උපමා කටයුතු. 2. උපමා කරන ලද දේ. (උපමෙය්‍ය)

උපයනවා = 1. සපයනවා.

උපයමය = 1. කසාද බැඳීම.

උපයාචක = 1. ඉල්ලන.

උපයාගපාට = 1. කුඹුරක වැවකට ඉතා ලංවූ කොටස.

උපයුක්ත = 1. යෙදුණු. 2. සුදුසු.

උපයෝග = 1. යෙදීම. 2. සම්බන්ධ කිරීම.

උපයෝගී = 1. යෙදෙන. 2. ගැළපෙන. 3. සුදුසු.

උපරක්ත = 1. පාට ඇති. 2. රතු වූ 3. පීඩිතවූ.

උපරජ = (උපරාජ) 1. දෙවෙනි රජ. 2. යුවරජ.

උපරජ්ජ = 1. යුවරජ කම.

උපරත = 1. වෙන්වූ. 2. ඉවත් වූ. 3. මළ. 4. වැළකුණු.

උපරති = 1. ආශාව තුරන් කිරීම. 2. වැළකී සිටීම.

උපරම = 1. වැළකීම.

උපරමන = 1. නො ඇලීම. 2. වෙන්වීම.

උපරාගය = 1. විපත. 2. ග්‍රහණය.

උපරාජ = 1. යුවරජ 2. රාජ්‍යය ලැබීමට සුදුස්සා.

උපරි = 1. මත්තෙහි. 2. උඩ. 3. උඩින්.

උපරිගත = 1. උඩට නැඟුණු.

උපරිගමන = 1. උඩට යාම.

උපරිභාග = 1. උඩ කොටස.

උපරිඨ = 1. මත්තෙහි හෝ මුදුනෙහි පිහිටි.

උපරි පාසාද = ප්‍රාසාදයක උඩුතට්ටුව.

උපරි මුඛ = මුහුණ උඩට හරවාගත්.

උපරිම = 1. මත්තෙහි වූ.

උපරිමභාග = 1. තැබෙන් උඩ කොටස.

උපරුධ = 1. වැළැක්වූ. 2. බාධාකරන ලද. 3. හිරකළ.

උපරුන්ධන = 1. වැළැකීම.

උපරුවනවා = (උපුරුවනවා) 1. උදුරනවා.

උපරෝධ = 1. වැළැකීම. 2. විනාශය.

උපල = 1. ගල.

උපලකුණු = 1. සමූහයක් හැඳින්වීමට ලකුණක් වශයෙන් යෙදෙන ශබ්දය.

උපලක්ඛණ = (උපලක්‍ෂණ) 1. උප ලකුණු බලන්න.

උපලක්ඛණා = 1. වෙනස සලකා බැලීම.

උපලක්ඛිත = 1. යුක්තවූ. 2. ලකුණු කළ. 3. විශෙෂයෙන් ලකුණු වූ.

උපලද්ධ = 1. ලැබූ. 2. අවබෝධ කළ. 3. ප්‍රත්‍යක්‍ෂ කළ.

උපලද්ධි = 1. ලැබීම. 2. දැනය 3. ඇඳිහිල්ල. 4. මතය. 5. අවබෝධ කර ගැනීම.

උපලබ්භමාන = 1. ලැබෙන.

උපලාපන = 1. චාටුබස් කීම. 2. පෙළඹවීම.

උපලාලන = 1. හැළවීම. 2. පෙළඹවීම. 3. සනසන.

උපලාලිත = 1. හළවන ලද.

උපලිත්ත = 1. ආලේප කළ. 2. ගාන ලද.

උප ලිපිකාරුවා = 1. සුළු ලිපිකරුවා.

උපලිම්පන = 1. ගෑම. 2. තැවරීම.

උපලුත්ත = 1. ලොප්කළ. 2. නැසූ.

උපලේප = 1. තැවරීම. 2. ගාන දෙය.

උප ලේකම් = 1. දෙවෙනි ලේකම්.

උප ලේඛනය = 1. ලියවිල්ලකට සම්බන්ධවූ සුළු ලියමන.

උපවජ්ජ = 1. දොස් ලැබිය යුතු.

උපවත්තන = 1. සමීපයෙහි පවත්නා.

උපවදන් = 1. අපවාදය. 2. චෝදනාව.

උපවධූ 1. අනියම් භාර්යාව.

උපවන = 1. සමීප වනය. 2. ගෙවල් අසල පිහිටි කැලෑ රොද. 3. ගම්බද වනය.

උපවස් = 1. උපවාසය. 2. ගුණයක් රැකීම සඳහා ආහාර නොගැනීම.

උපවසනක 1. පිළිපදින.

උපවාද = 1. දොස් කීම. 2. චෝදනාව.

උපවාදක - 1. දොස් කියන.

උපවාසග = (උපවස් බලන්න)

උපවාසන = 1. සුවඳ කැවීම.

උපවිස = 1. අබින්-ඔලිඳ ඇට-අත්තන-අරළිය මුල්-නියඟලා-දළුක් කිරි යන අප්‍රධාන විෂ.

උපවීණ = 1. වීණා දණ්ඩ.

උපවීණා = 1. වීණා දුන්න. 2. වීණා ලීය.

උපවීත = 1. පූන නූල.

උපවිසිට්ඨා = 1. වැඩි වී.

උපවුත්ථ = 1. විසූ. 2. රක්‍ෂා කළ.

උපවේදය = 1. වේදය අනුව ඇති කළ වේද.

උපවේශන = 1. හිඳ ගැනීම.

උපශමන = 1. සංසිඳීම. 2. සුවකිරීම. 3. දමනය කිරීම. 4. කෙළවර වීම.

උපශමිත = 1. සන්හිඳ වූ. 2. සුවකළ.

උපශය 1. සගනය. 2 ලඟ නිදාගැනීම.

උපශල්‍යය = 1. අසල ස්ථානය.

උපශාන්ත = 1. සන්හුන්.

උපශාන්තිය = 1. නිශ්චලකම. 2. ශාන්තිය.

උපශෝභිත = 1. සොබුණු. 2. සැරසුණු. 2. ඉතා ලස්සන 4. අලංකාර කරන ලද.

උපශ්ලිෂ්ට = 1. සම්බන්ධවූ. 2. වැළඳගත්.

උපසංහරණ = 1. පමුණුවන.

උපසංහාර = 1. සමාප්තිය 2. එකතැන් කිරීම. 3. පැමිණවීම.

උපසඟ = 1. උපසගී.

උපසංග්‍රහය = 1. උපකාර කිරීම. 2. සත්කාර කිරීම. 3. රැකබලා ගැනීම.

උපසංක්‍රමණය = 1. ළඟට පැමිණවීම. 2. කිට්ටු වීම.

උපසංක්‍ෂෙපය = 1. සාරාංශය. 2. කෙටි අදහස දක්වෙන ලිපිය.

උපසඞ්ගාහික = 1. එක්කළ.

උපසත් = 1. උපශාන්ත.

උපසක්කාර = 1. උපස්ථාන. 2. උදව්-පදව්. 3. උවටැන්. 4. සැලකිලි.

උපසන් = (උපසන්න) 1. ළඟාවූ.

උපසපන් = 1. උපසම්පන්න. 2. උපසම්පදාවූ.

උපසපු = 1. උපසම්පදාව.

උප සභාපති = 1. දෙවෙනි සභාපතියා.

උපසම = 1. සන්හුන් බව. 2. සන්සිඳීම.

උපසමසිරි = 1. සංවරයෙන් ඇතිවූ ලස්සන; ශාන්ත දාන්ත සවභාවය.

උපසම්පදාව = 1. භික්‍ෂු ශීලය. 2. පැමිණීම. 3. ලබාගැනීම.

උපසම්මති = 1. සන්සිඳේ.

උපසමන = 1. සන් සිඳවීම.

උපසම්පදාමාලක = 1 උපසම්පදාව කරනසිමාව

උපසර = 1. උපකාර. 2. මෙහෙකරු.

උපසරණ = 1. පැමිණීම.

උපසරය = 1. ළඟාවීම. 2. සංවාසය.

උපසගී = (උපසග-උපසග්ග) 1. වචනයකට මුලින් එකතු කරන ප-පර ආදි අකුරු. 2. විපත. 3. නිමිත්ත. 4. රෝග විකාරය.

උපසර්ජන = 1. අත්හැරීම. 2. උපද්‍රවය. 3. අප්‍රධානය. 4. විශෙෂණය.

උපසර්පන = 1. පැමිණවීම.

උපස්තම්භ = (උපස්තම්භක) 1. උපකාරවූ.

උපස්තම්භන = 1. රුකුල් දීම.

උපස්ථාන = 1. උපකාර කිරීම. 2. සේවය.

උපස්ථායක = 1. උපස්ථාන කරන.

උපස්ථායිකා = 1. උපස්ථාන කරන්නී.

උපස්ථිත = 1. ළඟට පැමිණි. 2. පැමිණ සිටි.

උපශාන්ත = 1. සන් සුන්. 2. සතුටු කරන.

උපසාරය = 1. යහපත් හැසිරීම.

උපසික්ත = 1. ඉසින ලද. 2. තෙමන ලද.

උපසිත් = 1. උපවිඥතය, එළිදරව් නුවූ සිත, වැඩි වූ.

උපසුස්සන = 1. වියළීම.

උපසුෂීකය = 1. ඉර වටේ තිබෙන රශ්මාලාව.

උපසිඳ = 1. විපාක දෙන බලවත් කර්මය.

උප සේනාපතියා = 1. දෙවෙනි සේනාපතියා.

උපසේවන = 1. ආහාර රසවත් කිරීමට වක්කළ යුතු දෙය.

උපසේවනා = 1. ආශ්‍රය කිරීම. 2. පුරුදු කිරීම. 3. පාවිච්චිය.

උපසේවිත = 1. නිතර ආශ්‍රිතවූ. 2. පුරුදු කළ.

උපසේවී = 1. ආශ්‍රය හෝ අනුභවය කරන්නා.

උපසෝභිත = 1. ඉතා ලස්සන. 2. ඉතා සුදුසු. 3. යුක්තවූ. 4. සරසන ලද.

උපසට්ඨ = 1. පීඩිත වූ.

උපස්සය = 1. වාසස්ථානය.

උපහච්ච = 1. හැපී. 2. ගැටී. 3. විනාශකොට.

උපහත = 1. දුරු කිරීම. 2. පීඩිතකම. 3. නැසූ. 4. පහරදුන්. 5. පළුදු කරගත්.

උපහන්තෘ = 1 ගෙන දෙන්නා. 2. ලබාදෙන්නා.

උපහරති = 1. එළවයි. 2. ගෙනදෙයි.

උපහරණ = (උපහැරණ) 1. උපමාව. 2. උපමා කථාව. 3. නිදර්ශනය.

උපහසිත = 1. උරහිස් සොලවමින් කරන සිනාව. 2. විහිළුකළ.

උපහාර = 1. පූජාව. 2. පඬුර. 3. තෑග්ග. 4. ගෙනැවිත් දීම.

උපහාර බලි = 1. ළඟට පමුණුවා කරනු ලබන ආහාරාදි පූජාව.

උපහාසය = 1. ඇනුම් පද සහිත වැකිය. 2. සමච්චල් කථාව. 3. නින්දා සුවකසිනාව.

උපහැරණ = 1. උපමාව. 2. උපමා කථාව. 3. නිදර්ශනය.

උවිඳු සුත = 1. කාම දෙවියා. 2. විෂ්ණු ගේ පුත්‍රයා.

උවේ = වැයම.

උස = 1. උඩට නැගී තිබෙන බව.

උසක් මිටියක් = 1. වග විභාගයක්. 2. සෙවීමක්. 3. මිත්‍ර කමක්.

උසබ = 1. උත්තම.

උසභ = 1. ගොනා. 2. වං ඇපල (ආඩතෝඩා.) 3 උතුම්. 4. රියන් 140 දිග.

උසභ රජ = 1. වෘෂභ රාජයා.

උසභ = 1. එතම් දුර ප්‍රමාණය. 2. සප්ත ස්වරයෙන් එකක්. 3. වෘෂභයා; ගොනා; (ගව රැලක ප්‍රධාන ගොනා)

උසවශා = 1 උත්තමයා.

උසසුන = (උස් + අසුන.) 1. උස් ආසනය.

උසස් = 1 ශ්‍රේෂ්ඨ. 2. උතුම්. 3. ප්‍රභූ. 4. උස්වූ.

උස් = 1. උඩට නැගුණු. 2. උස. 3. ඉහළ.

උස්න දර = 1. සුගන්ධියා.

උස් කැන්න = 1. කඳු තලාව.

උස්මුරුතාව = (උස් මුරුත්තාව.) 1. අඩස්සිය. 2. අධික භෝජනය නිසා බඩ පුරවා දුම්මෙන් හුස්ම ගත නොහැකි වීම.

උස් වෙනවා = 1. උය ඇතිවෙනවා.

උස්සනවා = 1. දරා ගන්නවා. 2. ඔසවනවා. 3. උඩට ගන්නවා.

උස්සන්න වෙනවා = 1. නැගී එනවා. 2. උග්‍ර වෙනවා. 3. ඉතා බහුල වෙනවා.

උස්සද = 1. බහුල වූ. 2. පිරුණු. 3. කෙලෙස්. 4. ඔසුපත් නිරය.

උස්සන්නතා = 1. අධික බව.

උස්සව = 1. උත්සවය. 2. නැකත් කෙළි, සැණකෙළි ආදිය.

උස්සහ = 1. වීර්‍යය. 2. මහන්සිය.

උස්සහන = 1. උත්සාහ කිරීම.

උස්සා = 1. උකුස්සා.

උස්සාව = 1. පිති; පිත්ත.

උස්සාඩ බිඳු = 1. පිති බිඳුව.

උස්සාහ = 1. වීර්‍යය. 2. මහන්සිය.

උස්සිත = 1. ඔසවන ලද. 2. නැගූ 3. ඉස් සුඩාවූ.

උස්සුක = 1. උත්සාහවත්.

උස්සූර = 1. හිරු උඩ නැගීම.

උසා = 1. උත්සාහය.

උසාගනිය = 1. රාත්‍රිය.

උසාවි = 1. අධිකරණ ශාලාව. 2. විනිශ්චය ශාලාව. 3. සාකච්ඡා හෝ කල්පනා කිරීම.

උසින් = 1. මහන්සිය. 2. වීර්‍යය.

උසි = 1. අනුබලය. 2. උනන්දු කරවීම.

උසි ගන්වනවා = 1 බල්ලන් උනන්දු කරනවා.

උසිර = 1. සැවැන්න.

උසිරන් = (උසිරණ) 1. සාන්දම් වෙනෙසක්.

උසු = 1. උස්සද; අධික. 2. ඊය.

උසුඛාරයා = 1. ඊගස් සාදන්නා.

උසුඹු = 1. විසුරුවන ලද. 2. කුණු කසළ.

උසුන් = 1. කපාදැමූ.

උසුන් මුල් = 1. සිඳි මුල් ඇති.

උසුම් = 1. උෂ්ණය. 2. ඩහදිය.

උසුරු = 1. කීම. 2. ශබ්ද කිරීම.

උසුරුවන = 1. කියන. 2. උච්චාරණය කරන.

උසුරුවීම = 1. කීම. 2. ශබ්ද කිරීම.

උසුලනවා = 1. දරා සිටිනවා. 2. උත්සාහයෙන සිටිනවා. 3. ඉවසා සිටිනවා.

උසුලු විසුලු = 1. උහුළු විහිළු. 2. කවටකම්. 3 විහිළු තහළු.

උසුව = 1. උත්සාහය.

උසුවනවා = 1. ඔසවනවා.

උසූයා = 1. ඊර්ෂ්‍යාව.

උෂසාලි = 1. වැයම. 2. උත්සාහය.

උශීර = 1. සැවැන්න; සැවැන්දරා.

උෂව = (උෂ්ට්‍රයා) 1. ඔටුවා.

උෂ්ණ = 1. උණුසුම. 2. ග්‍රීෂ්මය. 3. දුර්ගන්ධය. 4. දහය.

උෂ්ණ ආහාර = 1. උණුසුම් කෑම.

උෂ්ණ උදක = 1. උණු දිය.

උෂ්ණ ඍතුව = 1. ග්‍රිෂ්ම කාලය.

උෂ්ණ කලාපය = 1. පෘථිවියේ උණුසුම් කොටස.

උෂ්ණ ජනක = 1. උණුහුම ඇතිකරන. 2. ග්‍රිෂ්මය උපදවන.

උෂ්ණ ජලාකරය = 1. උණුදිය පොකුණ. 2. උණුදිය උල්පත.

උෂ්ණතාව = උණුසුම් කම.

උෂ්ණමානක = (උෂ්ණ මාපක) 1. උණුහුම මනින.

උෂ්ණරශ්මි = 1. උණුසුම් රශ්මිය ඇති. 2. හිරු.

උෂ්ණවක් = 1. රත්වූ. 2. උෂ්ණත්වය ඇති.

උෂ්ණ වලාහක = 1. උෂ්ණ වූ වලාකුළුවලට අධිපති දෙවි.

උෂ්ණවාත = 1. උෂ්ණ වූ සුළඟ. 2. එනම් රෝගය.

උෂ්ණ වාරණය = 1. කුඩය.

උෂ්ණාංශු = 1. සූර්යයා.

උෂ්ණාගමය = 1. උණුසුම් ඍතුව.

උෂ්ණාගාරය = 1. උණුසුම් කාමරය; උණුසුම් ගේ.

උෂ්ණීෂය = 1. තලප්පාව. 2. තලල්පට. 3. මකුටය.

උෂ්ණීෂ සට්ඨය = 1. තලල්පට.

උෂ්ණෝත්පාදක = 1. උණුහුම උපදවන.

උෂ්ම = 1. උෂ්ණය.

උෂ්ම අක්ෂර = 1. උණුසුම් වාතය නිකුත් කරමින් උපුරුවන (ශ-ෂ-ස-හ යන) අකුරු.

උෂ්ම කලාප මයඛීව = 1. පෘථිවියෙහි උණුහුම් කොටසේ මැනීම.

උෂීර = 1. සැවැන්දරා.

උහ = 1. උස.

උහස = 1. උස්ගස. 2. උස්තැන.

උහල් = 1. ඉතා උස්වූ.

උහලුවා = 1 උස් මිනිහා.

උහාගන්නවා = 1. උස්සා ගන්නවා.

උහාදමනවා = 1. තල්ලුකර දමනවා. 2. උතත්දු කරනවා.

උහාපානවා = 1. උස්සා පෙන්වනවා

උහු = 1. ඔහු.

උහුලනවා = 1. උසුලනවා. 2. ඉවසනවා. 3. දරා සිටිනවා.

උළ = 1. උරන ලද. 2. පාතය කළ.

උළනු = 1. ඇඟ උලන උපකරණය.

උළියක්කාර = 1. ඇතැම් කුලයක පහත් යයි සම්මත කොටසක්. 2. වාලා. 3. ඇේලා උසුලන්නා.

ඌ

ඌ = 1. උයන්නෙහි දිඝී රූපය. 2. ඒකා (ඒ සතා) 3. ඔහු; ඒ අය.

ඌකා = 1. උකුණා. 2. යව ඇටයෙන් $\frac{1}{8}$ පමණ දිග.

ඌකා ශිෂී = 1. උකුණු හිස.

ඌදු = 1. ඉදිමීම. 2. පුදුමැලි ගතිය. 3. පිප්ප ගතිය.

ඌන = 1. අඩු.

ඌනතා = 1. අඩුබව.

ඌන අධික = 1. අඩු වැඩි.

ඌන පූර්ණය = 1. අඩුව පිරවීම.

ඌන මාත්‍රය = 1. අඩුවූ ප්‍රමාණය. 2. අඩුවූ මාත්‍රාව.

ඌන වර්ෂ = 1. අඩුවූ අවුරුදු ගණන ඇති.

ඌන විංශති = 1. දහ නවය.

ඌන වෙනවා = 1. අඩු වෙනවා.

ඌනාතිරේකය = 1. අඩු වැඩි කම.

ඌමිශා = 1. ගොළුවා· 2. නිශ්ශබ්දව සිටින්නා.

ඌෂී = 1. රළුය.

ඌර්මි වේග 1. රළ වේගය.

ඌරු කැම 1. මැටියෙන් සාදාගත් ශ්‍රිං වළලු.

ඌරගක් = 1. ගැලු.

ඌරල = 1. අල වර්ගයක්. 2. බිම්තල් අල.

ඌරල් = 1. (කරවල ආදිය) කුණුවූ 2. තරක්වූ. 3. කඩු වැටියක්.

ඌරල් රස = 1. (කරවල ආදියෙහි) කුණු රස.

ඌරාකබල් = 1. ඌර කැටය.

ඌරට්ඨි= (ඌරස්ථි) 1. කලවා ඇටය.

ඌරු = 1. කලවය. 2. සූකරයා 3. ගතිය; සවභාවය. 4. ඇතිවීම. 5. පල්වීම හෝ පදම්වීම. 6. වර්ණය. 7. විශාල.

ඌරු ඇල් = 1. ඇල් වී වෙසෙසක්.

ඌරු කඩි = 1. ඌරු රළ.

ඌරු කලක් අල = 1. අල වෙසෙසක්.

ඌරු කේන්ති කාරයා = 1. ඉක්මනින් කිපෙන්නා.

ඌරු ගෙඩ = 1. පලා වර්ගයක්. 2. ගෙඩ වෙසෙසක්.

ඌරුජ = 1. කලවයෙන් උපන්.

ඌරු ජිලා = 1. ආභරණ විශෙෂයක්.

ඌරු තෙල් = 1. ඌරු මසින් ගන්නා තෙල්.

ඌරු පබ්බ = 1. දණ සන්ධිය.

ඌරු බද්ධාසන = 1. අරමිණිය ගොතා හිඳීම.

ඌරුබල = 1. පාදයෙහි ශක්තිය.

ඌරු බිම් = 1. ලුණුකර බිම්. 2. එලදාව නැති ඉඩම්.

ඌරු මී = 1. එතම් ලොකු මී වර්ගය.

ඌරු මුවයා = 1. බකමූණු වර්ගයක්.

ඌරු යුගය = 1. කලවා දෙක.

ඌරු ලිං = 1. ඌර කැටවලින් සෑදූ ලිං.

ඌරු ස්තම්භ = 1. එතම් රෝගයක්. 2. උකුල් ඇටය අසල රුදාව.

ඌරු හන්දෙනවා = 1. හුරුලූ පිඹිනවා.

ඌර්ණ = 1. ඉසකේ. 2. ලොම්; එළු ලොම්.

ඌර්ණජ = 1. නළල

ඌර්ණනාභ = 1. මකුළුවා.

ඌර්ණරෝම = (ඌර්ණලෝම) 1. පශ්චිම භවික බෝධිසත්වයන්ගේ හා සක්විති රජුන්ගේ ද නළල මැද තිබෙන රෝමය.

ඌර්ණමය = 1. කෙස්වලින් සෑදූ. 2. ලොම් වලින් සෑදූ.

ඌර්ණායුධ = 1. කම්බිලිය.

ඌර්ණායුවා = 1. එළුවා

ඌර්ධ්ව – 1. උඩ. 2. වඩා උස. 3. මත්ත. 4. උස්.

ඌර්ධ්ව කාය=1. නැබෙන් උඩ සිරුර; උඩුකය.

ඌර්ධ්ව ක්ෂෙපන = 1. උඩට දැමීම.

ඌර්ධ්ව ගත = 1. උඩු අතට ගිය. 2. උඩට නැගුණු.

ඌර්ධ්ව ගාමි = 1. උඩු අතට යන.

ඌර්ධ්ව ජානු = 1. කලවය.

ඌර්ධ්ව පාද = 1. උඩුකුරු පා ඇති.

ඌර්ධ්ව මුඛ = 1. උඩුකුරු මුහුණු ඇති.

ඌර්ධ්වබ මානකය = 1. උස මැනීම.

ඌර්ධ්ව මාර්ග = 1. උස්වූ බෝක්කු පාර.

ඌර්ධ්ව ලෝක – 1. දෙව් ලොව.

ඌර්ධ්ව විතාන = 1. උඩු වියන.

ඌර්ධ්ව ශබ්දය = 1. ශබ්දය නංවාකීම.

ඌර්ධ්ව ශ්වාසය = 1. පණ ඇදීම.

ඌර්ධ්ව සතරය = 1. උඩ තට්ටුව.

ඌර්ධ්වස්ථ =1. ඉහළින් පිහිටි. 2. උඩ පිහිටි.

ඌර්ධ්වාශ්‍රය = 1. මුදුන.

ඌර්ධ්වාංග = 1. පපුව.

ඌර්මි = රළ.

ඌර්මිමත් = රළ ඇති. 2. සයුර.

ඌර්මි මාලිය = 1. සයුර.

ඌර්වශී = 1. එතම් දෙවඟන.

ඌල් = 1. උල්පත. 2. මුත්‍ර 3. උල්පත් දිය. 4. රළ.

ඌල්සිඹු = 1. ගඟගා පටන් ගන්නා තැන.

ඌලාවා = 1. එතම් මාළුවා.

ඌලියක්කාරයා = (උලියක්කාර බලන්න).

ඌලියම = 1. රාජකාර්යය. 2. වැඩේ.

ඌලූකයා = 1. බකමූණා.

ඌස = 1. දරුවන් ප්‍රසූත කරන කාලය.

ඌසිකාන්දම් = 1. කාන්දම් වෙසෙසක්.

ඌසකාදිගණය = 1. ඖෂධ ගණයක්.

ඌෂය = 1. පාත්දර. 2. ඉරිමා උදය. 3. බඹ මොහොත 4 ලුණු මිශ්‍ර මැටි. 5. ලුණුකර බිම.

ඌෂ්ණ = 1 උණුසුම්.

ඌෂ්මාක්ෂර = (උෂ්ම අක්ෂර බලන්න)

ඌහන = 1. තර්කණය. 2. කල්පනා කිරීම. 3. අඩු අකුරු සම්පූර්ණ කිරීම. 4. රැස්කිරීම.

ඌහා = 1. විතර්කය. 2. කල්පනාව. 3. පරීක්ෂණය. 4. අධ්‍යාහාරය 5. හිමාලය කන්දෙන් ගලා බස්නා ගඟක්.

ඍ

ඍ = 1. වේද ආරක්ෂා කිරීම.

ඍක්ථය = 1. වස්තුව.

ඍග්වේදය = 1. ඉතා පුරාණවූ ද පූජිත වූ ද වේදය.

ඍච් = 1. ඍග් වේදය.

ඍජු = 1 කෙළින්. 2. අවංක. 3. ඇද නැති.

ඍජුආලම්බ = 1. ලඹයට හරිවූ.

ඍජු කෝණය = 1. අංශක අනූවක මුල්ල.

ඍජු චතුරශ්‍රය = 1. ඍජු කෝණ ඇති හතරැස් කොටුව.

ඍජු ප්‍රතිපක්ෂ = 1. කෙළින් ම විරුද්ධ.

ඍජුබුද්ධි = 1. අවංක බුද්ධි ඇති.

ඍජුමාර්ගී = 1. ඇද නැති පාර. 2. නියම මාර්ගය.

ඍජු රේඛාව = 1. කෙළින් ඉර.

ඍජු විපක්ෂ = (ඍජු ප්‍රතිපක්ෂ බලන්න)

ඍණය = 1. ණය. 2. බලකොටුව. 3. අඩු කිරීමේ ලකුණ. 4. ජලය.

ඍණජ = 1. ඍණයෙන් උපන්.

ඍණදාන = 1. ණයදීම.

ඍතු = 1. ශීත උෂ්ණ ගුණය. 2. වර්ෂයක් බෙදනු ලබන හේමන්ත - ගිම්හාන - වස්සාන යන කොටස් තුන හෝ හේමන්ත - සිසිර - වසන්ත - ග්‍රීෂ්ම - වර්ෂා - සරත් යන කොටස් හය 3. ඔසප් ලේ.

ඍතු කාලය = 1. ඍතුව සතු සඛ්‍යාත කාලය. 2. ඔසප් කාලය. 3. දරුවකු පිළිසිඳීමට යෝග්‍ය සොළොස් දවස. 3. ගැබ් ගන්නා කාලය.

ඍතුජ = 1. ශීතෝෂ්ණ ගුණයෙන් උපන්

ඍතු පරිවර්තන = 1. ඍතු පෙරළීම හෝ මාරුවීම.

ඍතුමතිනි = (ඍතුමතී) 1. මල්වර වූ ස්ත්‍රී.

ඍතුමද = 1. ඍතුව නිසා ඇති වූ මදය හෝ සුවඳ.

ඍතු මාර්ගය = 1. මූත්‍ර කරන ස්ථානයේ සිට දරු බොක්ක දක්වා මාර්ගය.

ඍතුරාජ = 1. වසන්ත කාලය.

ඍතු විපර්යාස = 1. ඍතු වෙනස් වීම.

ඍතු සන්ධි = 1 ඍතු දෙකක් අතර යෙදෙන දෙසතිය.

ඍද්ධි = 1 වස්තුව. 2. සමෘද්ධිය. 3. රහතුන් වහන්සේ වැනි උතුමනට ඇති විශේෂ බලය. 4. ප්‍රාතිහාර්යය.

ඍද්ධිඥාන = 1. ඍද්ධි ප්‍රාතිහාර්ය කිරීමට ඉවහල් වන නුවණ.

ඍද්ධි නිර්මාණ = 1. ඍද්ධි බලයෙන් කරන මැවීම

ඍද්ධිපාද = 1. ඍද්ධියට මුල්වන ඡන්ද - චිත්ත - විරිය - විමංසා යන සතර.

ඍද්ධිපූජා = 1. ඍද්ධි ප්‍රාතිහාර්ය නමැති පූජාව.

ඍද්ධිපෙරහර = 1. ඍද්ධි ප්‍රාතිහාර්යය.

ඍද්ධි ප්‍රතිලාභ = 1. ඍද්ධිය ලැබීම.

ඍද්ධිමත් = 1. ඍද්ධි බලයෙන් යුතු.

ඍද්ධිමය = ඍද්ධියෙන් නිපන්.

ඍද්ධි විෂය = 1. ඍද්ධියෙන් කළහැකි දෙය. 2. ඍද්ධියට ගෝචර වන දෙය.

ඍද්ධිවේගය = 1. ඍද්ධිය පිළිබඳ ජවය.

ඍද්ධිසම්පන්න = 1. ඍද්ධි බලයෙන් යුතු.

ඍෂභ = 1. ඉතා උතුම්. 2. එනම් ඖෂධය. 3. ගොනා. 4. සංගීතයෙහි සප්ත ස්වරයන් අතුරින් දෙවැනි ස්වරය.

ඍෂභධ්වජයා = 1 ගොනෙකුගේ රූව සහිත කොඩියක් ගත් සිවදෙවියා.

ඍෂභය = 1. සිසිල් කරන බෙහෙත් වෙසෙසක්

ඍෂි = 1. ශුඬ ජීවිතයක් ගතකරන තාපසයා. 2. ඥාන බලයෙන් සසරින් එතර වීමට ක්‍රියා කරන ශිලවන්තයා. 3. ශාස්ත්‍රයක පාරප්‍රාප්තයා. 4. ශාස්ත්‍රයක් නිපද වූ උත්තමයා.

ඍෂිපතනය = 1. සෘෂින්ගේ නගරය. 2. ඉසිපතනය.

ඍෂි ප්‍රව්‍රජ්‍යාව = 1. තවුස් පැවිද්ද.

ඍෂි ප්‍රෝක්ත = 1. සෘෂින් විසින් කියන ලද.

ඍෂි භාෂිත = 1. සෘෂීන්ගේ කියමන. 2. සෘෂීන්ගේ ඉගැන්වීම.

ඍෂිවර = 1. උතුම් සෘෂියා. 2. සෘෂීන් වහන්සේ.

ඍෂිවේශ = 1. තාපස වේශය.

එ

එ = 1. විෂ්ණු දෙවි. 2. ඉදිරියෙහි නැති දෙයක් ගැන කීමේ දි හෝ කලින් කීවක් නැවත කීමේ දී හෝ යෙදෙන ශබ්දය.

එක = 1. පලමු වැන්න. 2. ගණන් කිරීමේ දී ප්‍රථම අංකය. 3 එකක් වූ. 4. අසහාය. 5. කාරණය. 6. දෙය.

එක අත් = 1. එක ආත්මය.

එක එකා = 1. එක් එක් අය.

එක එල්ලේ = 1. එක කෙළින්. 2. සම්පූර්ණයෙන් ම. 3. වහාම

එක කතෘ ක්‍රියා = 1. එකම කර්තෘ කෙනෙකුත් ඇති ක්‍රියා.

එකග = 1. විරුඬ මත නැති 2. සියලු දෙනාම අනුමත කළ. 3. 4විරුඬනුවූ. 4. ඒකාග්‍රතාව. 5. එක් අරමුණක් ඇති. 6 අනුකූල. 7. එක් අඩගයක් ඇති. 8. කැමති.

එකග බව = 1. සමෘධිය.

එකටෙක = (එකට + එක) 1. (පළිගැනීමේ අදහසින්) කළ දේට විරුඬව කරණ දේ හෝ කියන වචන.

එකඩ = (එක් + අඩ) 1 එක් අඩිය. 2. භාගයක්වූ.

එකඩමස = 1. මාස භාගය.

එකෙණෙහි = 1. ඒ ක්ෂණයෙහි. 2. එ වේලේම.

එකත් = 1. එක පෝරුමක් ඇති. 2. එක වචනය. 3. පුනරුක්තිය. (කී දේ නැවත කීම) 4. එක් අත; එක පැත්ත. 5. ඒකාන්ත. 6. එක් සත්. 7. එක ආත්මය. 8. එක්.

එකත්පස = 1. එක පැත්ත.

එකත පසු = 1. ඒකාන පත්‍ර; එක් සත්.

එකතරම් = 1. සම පමණ.

එකතාක්තුව = 1. එක තාලය.

එකතාල = 1. එකාකාර.

එකතැන් කිරීම = 1. එකතු කිරීම.

එකතු = 1. රැස. 2. එක් තැනක වූ. 3. එක් සත් වූ.

එකතු කිරීම = 1. එක්කාසු කිරීම. 2. එක් තැන් කිරීම.

එකතුරු = 1. එකක් අධික.

එක තුල් = 1. එක හා සමාන. 2. එක් වැනි.

එක දත් = 1. ගණ දෙවියා.

එක දා = 1. එකම දින. 2. උදකලාව. 3. එක දවල්ලක් ඇති.

එක දෙස = 1. එක් කොටස. 2. භාගය. 3. ස්වල්පය.

එක දෙහ = 1. තනි වූ. 2. හොඳ හැටි ශරීරය සැදුනා වූ. 3. බුදුහු.

එක නිනාද = 1. ඒක නිත්නාදය. 2. නොනැවතී පවතින ඝෝෂාව.

එක පලලෙ = 1. සම වයසේ. 2. එක තරමේ.

එ කපා = 1. එක් පයක් ඇති. 2. එක් කණ්ණුවක් ඇති.

එක පැහැර = 1. එක විට. 2. එක වර.

එක පිම්මට = 1 එක වරට.

එක බඳ = 1. ඒකාබඩ. 2. එකට බැඳුණු..

එක බඳු = 1. එක හා සමාන. 2. එක් වැනි.

එක බස = 1. එකම වචනය. 2. (ව්‍යාකරණ යෙහි) ඒක වචනය. 3. එක භාෂාව

එක බුදතුර = 1. එක බුධාන්තරයක්. 2. බුදු වරයින් දෙනමක් අතර කාලය.

එකම = 1. එම එකම.

එකම කම = 1. එකක් බව.

එකමත් = 1. එක්තරා.

එක මිතුරු = 1. අසහාය මිත්‍රයා; එකම යහළුවා.

එකමුතු = 1. එක්සත්. 2. සමගි. 3. ඒක මතික.

එකමුතුකම = 1. සමගි කම. 2. එක් සත් භාවය.

එකයුත් = 1. සමාන.

එක යුරු = (එකරඟ) 1. එකාකාර. 2. එක සමාන.

එකරත = 1. එකාකාර. 2. නිතර.

එකරුත් = 1. ඒකාර්ථය. 2. ඒක වචනය.

එකල = 1. එකල්හි. 2. එවිට.

එකලස් = 1. එකතු කරන ලද. 2. අස් කරන ලද.

එකලා = 1. තනියම. 2. උදකලා. 3. ඒකකි.

එකලාසයක් = 1. බේරුමක්. 2. නිදහසක්. 3. නිරවුලක්.

එකලාස් = 1. එක කුරුණිය. 2. එකකු.

එකලු = 1. එකම ආලෝක ඇති. 2. ඒකා ලෝක වීම. 3. බැබළීම.

එක ලෙස = 1. එකාකාරයෙන්. 2. එක හැටියට

එකවට = 1. එක්වර. 2. රියනක වටප්‍රමාණය.

එක වරක් = 1. එක් වාරයක්.

එකවිටක් = 1. එක් වරක්.

එක වෙනවා = 1. එකක් වෙනවා.

එකසත් = 1. එක් සත්. 2. සමගියෙන් එක්වූ. 3. එක ආණ්ඩුවක් යටතේවූ.

එක සම = 1. එක සමාන.

එකසර = 1. ඒක වාරි; තනිව හැසිරෙන.

එක සරි = 1. එක සමාන.

එකසැරහුම් = 1. එක හැටියට සැරසුණාවූ. 2. එකසේ ඇඳි-පැළඳි

එකසිරු = 1. එකාකාර. 2. පරෙස්සම් සහිත.

එකස් = 1. එක පැත්තකට වූ.

එකස් කරනවා = 1. එක පැත්තකට ගොඩ ගසනවා 2. පැත්තකට වෙන් කරනවා. 3. ඒකාංශ කරනවා.

එකස් බෙරය = (එකැස් බෙරය) 1. බෙර වෙසෙසක්.

එකහමාර = 1. එකක් හා භාගය.

එකහස් = 1. එකාකාර.

එකහී = 1. එක සේ. 2. එකවර.

එකහෙලා = 1. මුළුමනින්. 2. එක වාගේ ම. 3. එකාකාරයෙන්. 4 එක වරටම.

එකහෙළි = 1. ඒකාලෝක.

එකළා = 1. ඒකලා. 2. තනි.

එක හළු = 1. එක සමාන. 2. සමානත්වය.

එකන් = 1. එතෙර. 2. ඒ පැත්ත.

එකරුතු = 1. ඔබොක්කුව. 2. අල්ල.

එකරුතු පට = 1. ඔබොක්කුව. 2. ඔබොක්-කුවේ රෙදි පොට.

එකවුරුතු = 1. ඔබොක්කුව.

එක් = 1 එක. 2. අසහාය. 3. ගණන් කරන විට පළමුවැනි අංකය. 4. එක්තරා.

එක් අත් = 1. එක ආත්මය හෝ ශරීරය.

එක් එළි = 1. එක ම මලුව.

එක්ක = (එක්ව) 1. සමඟ. 2. කැටුව. 3. එක හා සමඟ.

එක්කරනවා = 1. එකතු කරනවා. 2. කැටි කරනවා.

එක්කල = 1. එක කාලය. 2. කැටුව. 3. හා සමඟ.

එක් කාලෙක = 1. එක් කාලයකදී.

එක්කස්ස = 1. ගවයන් තණ කවන පොදු තණ බිම.

එක්කගු කිරීම = 1. එක්කාගු කිරීම. 2. එකතු කිරීම.

එක්කෙනා = 1. එක් අයෙක්. 2. සැමියා හෝ අඹුව. (ගෙදර එක්කෙනා)

එක් එක්කෙනා = 1. එකා බැගින්. 2. එකෙකුට පසු එකෙක්.

එක්කෙළිපිට = 1. ඉදිරිපිට.

එක්කොම = 1. ඔක්කොම. 2. සියල්ලෝම.

එක්කෝ = 1. නැතිනම්. 2. නොහොත්.

එක්තරම් = 1. එක පමණ.

එක්තරා = 1. අන්‍යතර. 2. යම් කිසි. (එකමත් එක)

එක්තරාක් = 1. එක්තරා එකක්.

එක් තලය = 1. එක මතු පිට. 2. එකැස් බෙරය.

එක්තැන්සමු = 1. එක ස්ථාන සම්මුඛය. (එකම රාජ සභාවේ අභිමුඛය)

එක් තිස් = 1. තිස් එක.

එක් තෙර = 1. එක් ස්ථවිර. 2. එක්තරා.

එක්දඬු ඔරු = 1. එක ම ගසින් කොටූ ඔරුව.

එක් දත් = 1. ගණ දෙවියා.

එක්දරුමා = 1. එක් වරක් වැදූ ස්ත්‍රී.

එක් දහස් = 1. එක දහස් (දහ) 2. සමාන අදහස් ඇති.

එක් දූ කළු = 1. මූළුමනින් කළුවූ.

එක් දෙක් = (එක් දෙක) 1. ක්‍රමය. 2. පිළිවෙළ.

එක් දෙස් = 1. එක් කොටස. 2. සවල්පය.

එක් දෙසි = 1. ඒකාන්ත. 2. නිශ්චිත. 3. නියත.

එක්පට වහන් = 1. එක සම් පොටකින් යුත් සෙරෙප්පු.

එක් පමු = 1. කැසපට.

එක් පැහැර = 1. එක් වර. 2. එකවිට.

එක් පියවර = 1. පියවර එකක්. 2. එක පදික මාර්ගය. 3. එක අඩිය. 4. අඩිපාර. 5. පටු මඟ.

එක්පෙති පියුම් = 1. එල මානෙල්. 2. සුදු නෙළුම්.

එක් බඳු = 1. එක හා සමාන.

එක් බැඳි = 1. එකට බැඳුනාවූ. 2. ඒකාබද්ධ.

එක් බව් = 1. ඒකීභාවය. 2. සමාන භාවය.

එක් බා = 1. එක භාගය හෝ අඩිය.

එක් බෑ ලූනු = 1. එක බිකක් ඇති ලූනු වර්ගය.

එක් බික්තෙණි = 1. ඉක්බිති. 2. ඊට පසු.

එක් බිජු = 1. කරඳ ගස.

එක් බුමු = 1. එක් මහල් තලයකින් යුත්.

එක් මැසි = 1. එක් මසක් වයස ඇති.

එක් යලක් = 1. එක් වරක්.

එක් රජ = 1. අසහාය නරේන්ද්‍රයා.

එක් රස = 1. එකම රසය. 2. සමාන රසය.

එක් රැස් කිරීම = 1. එකතු කිරීම.

එක්ව = 1 එකතුවී. 2. රැස්වී. 3. සමඟ.

එක්වට = 1. එක්වර.

එක් වත් = 1. නිතර 2. සමාන. 3. එක විධියක්. 4. නොකැඩී පවත්නා.

එක් වන් = (එක්මැති) 1. එකාකාර.

එක්වා දහස් = 1. අවුරුදු එක්දහස්. 2. අවුරුදු දහස.

එක් වැඩිය = 1. එහම් ආභරණ 2. එකපට මාලය.

එක් වැනි = 1. ඒකාකාර.

එක් වැල = 1. එකම වෙළුමක් ඇති රැහැන.

එක් විසි = 1. විසි එක.

එක් වෙණ = 1. එකම ගතිය. 2. එකාකාර හැඩහුරුකම.

එක්සත් = 1. සමගිව එක්වූ. 2. එකම ජේසතකට යටත්.

එක් සමනාව = 1. එක හා සමානකම.

එක් සමයෙක්හි = 1. එක් කලෙකදී.

එක් සර = 1. ඒකවාරී. 2. තනිව හැසිරෙන.

එක් සැබි = 1. එක හා සමාන.

එක් සැක් = (එක්සත් බලන්න)

එක්සිය = 1. එක සියය. 2. සියය.

එක් සිත්වූ = 1. එකාකාරවූ සිත් ඇති. 2. එක් සත්. 3. එකමුතු.

එක් සිය සතිස් නරක = 1. අපාය 136.

එක් සේ = 1. සමාන. 2. එක වාගේ.

එක්හළු = 1. එක සමාන.

එක්හෙල = 1. නොවැසුණු. 2. එළිදරව්වූ.

එක්හෙළි = 1. එකසේ එළි පහළි වූ.

එක් හොරු නැව් = 1. එකම ඔරුවූ යාත්‍රාව.

එකා = 1. ඒ අය.

එකාකාර = 1. එක හා සමාන.

එකාඛගණ = 1. එක මිදුල.

එකාචාරකම = 1. එක්සත්කම. 2. සමගියෙන් විසීම.

එකානු = 1. අනු එක.

එකාවන් = 1. එකාකාර. 2. නිතර පවත්නා.

එකාවන්ව = 1. එක පුද්ගලයෙකු මෙන්. 2. එකාමෙන්; එකාකාරව.

එකාවැල = (එක වැලිය) 1. එකාවැල් මාලය. 2. පුනනූල.

එකාවේරිය = 1. ගස් වර්ගයක්.

එකැටි = 1. එක් ඇටයක් ඇති.

එකැති = 1. ඒකාන්ත. 2. සත්තක. 3. නියත. 4. නියම.

එකැස් බෙරය = 1. එක් ඇසක් ඇති බෙරය.

එකැවර = 1. එක් වරටම.

එකිනෙක = (එකින් + එක) 1. එකින් එක. 2. එක බැගින්.

එකිනෙකා = (එකින් + එකා) 1. එක්කෙනා බැගින්. 2. එක් එක්කෙනා.

එකී = 1. ඒ සත්‍රි. 2. ඒ කියන ලද.

එකුතුරු = 1. එකක් අධික.

එකුතුරුපට = 1. කැසපට.

එකුන් = 1. එකක් අඩු.

එකුන් අනූ = 1. අසූ නවය.

එකුරුතු = 1. ඔඩොක්කුව.

එකුරුපට = 1. ඔඩොක්කුව.

එකුළු කුළු = 1. ඔසු වෙසෙක්.

එකෙකි = 1. එක එක. 2. එක් එක්.

එකෙණෙහි = 1. ඒ ක්ෂණයෙහි. 2. එවේලෙහි.

එකේල්ලේ = (එක එල්ලේ) 1. එක කෙළින්

එකේළි = 1. එකහෙළි. 2. සෘජු. 3. ඇද නැති.

එකොඳි = 1. එකඟ සිත් ඇති.

එකොළොස් = 1. එනම් ගණන. 2. දහයත් එකත්.

එකොළොස් ගිනි = 1. ගිනිත වැනි රාග-ද්වේෂ - මෝහ - ජාති ජරා - මරණ - ශෝක -පරිදේව-දුඃඛ-දෞර්මනස්‍ය-උපායාස යන එකොළොස

එකොළොස් මෙත් අනුහස් = 1. මෛත්‍රී භාවනාවෙන් ලැබෙන එකොළොස් විධ ආනිශංස.

එකොළොස්වක් = 1. පක්ෂයෙහි එකොළොස් වැනි තිථිය

එකෝලියම් = 1. ඉදල; මුස්න.

එකොඩ = 1. අනෙක් ඉවුර. 2. ජලාසයෙන් එතෙර. 3. ඒ ගොඩ. (ඒ සමූහය)

එන්ගලන්තය = 1. එනම් රට. 2. ඉංග්‍රීසීන් ගේ රට.

එඛිණ් = 1. එකක්ෂණික.

එග්බිති = (එක්බිති බලන්න)

එච්චර = 1.එපමණ. 2. එතරම්.

එට්ටුව පෙරළීම = 1. පාඩුවීම. 2. බලාපොරොත්තු සුන්වීම.

එඩි = 1. දර්පය. 2. ආඩම්බරය. 3. තදගතිය. 4. නිර්භීත ගතිය. 5. ගර්වය. 6. ධෛර්යය. 7. නොපසු බස්නා ගතිය.

එඩිතර = 1. අහංකාර. 2. මෙල්ල නොවන. 3. නිර්භීක. 4. ධෛර්ය සම්පන්න.

එඩිදඤ් = 1. ගර්වය. 2. යටත් නොවන. 3. පසු බට නොවන.

එඬරු = 1. එරබු ගස්. 2. වල් එරබු (එඬුරු)

එඬිෂු = 1. ඉදිආප්ප

එඬේරා = 1. ගව ආදී සතුන් රැක බලාගන්නා.

එතකලට = (එතකල්) 1. ඒ වනතුරු.

එතකින් = එතෙකින්) 1. එපමණකින්.

එතකුදුවුවක් = 1. එසේ වූ නමුත්

එතකොට = 1. එවිට. 2 ඒ කාලයේදී.

එතන = (එතැන) 1. ඒ ස්ථානය.

එතනා = 1. උඩරට ඇතැම් කුලවල ස්ත්‍රීන්ට ආමන්ත්‍රණය කිරීමේදී ව්‍යවහාරකරන නාමයක්. 2. ළමා එතනී.

එතණින් = 1. ඒ ස්ථානයෙන්.

එතර = 1. ඒ කාලය. 2. එතෙර.. 3. එගොඩ.

එතවීම = 1. ඔතවන්නට සිඩකිරීම.

එතා = 1. ඒ තාක්. 2. ඒදක්වා. 3. සියල්ල.

එතැන්පටන් = 1. ඒ ස්ථානයේ සිට. 2. ඒ මොහොතේ සිට.

එතියෝපියා = 1. අප්‍රිකාවේ පුරාණ නාමය. 2. අප්‍රිකාවේ කොටසක්.

එතීම = 1. එතුම. 2. ඔතන බව.

එතු = 1. එතනක. 2. මෙපමණ.

එතුණු = 1. වටේට සම්බන්ධවූ. 2. වටේට බැඳුණු.

එතුම = 1. එතීම. 2 ඒ උතුමා.

එතුම = (එතුමා) 1. ඒ උත්තමයා.

එතුමිය = 1. ඒ උතුම් කාන්තාව.

එතුවක් = 1. එපමණ. 2. එතරම්.

එතුවක් කල් = 1. එතරම් කාලයක්.

එතෙක් = 1. ඒවනතුරු. 2. එතරම්.

එතෙකින් = 1. එපමණෙකින්.

එතෙනවා = 1. වටේට බැඳෙනවා.

එතෙම = 1. හෙතෙම 2 උන්නැහේ. 3. ඒ තැනැත්තා. 4 උන්නාන්සේ.

එතෙර = 1. එගොඩ; අනෙක් තීරය.

එද = 1 එයද. 2. එයත්. 3. කිරියෝදය.

එදනවා = (ඒදනවා) 1. මිශ්‍රකරනවා. 2. යොද නවා.

එදවස = 1. ඒ දවස.

එදා = 1. ඒ දවස.

එදිනෙදා = 1. දවසින් දවස. 2. දවස් පතා.

එදිරි = 1. විරුද්ධ. 2. හතුරු.

එදිරිකම = 1. විරුද්ධභාවය.

එදිරිකාරයා = 1. විරුද්ධකාරයා 2. හතුරා.

එදිරිපිට = 1. ඉදිරිපිට. 2. අභිමුඛයෙනි. 3. හමුවෙහි.

එදිරි පිරිමහනවා = 1 පලිගන්නවා. 2. විරුද්ධව වැඩ කරනවා.

එදිරිය = 1. තරහව. 2. හතුරුකම,

එදිරිවාදිකම් = 1. විරුද්ධකම්.

එදෙස් = 1. ඒ දේශය. 2. ඒ පැත්ත.

එදෙස් - මෙදෙස් = 1. එහා-මෙහා. 2. එතෙක් - මෙතෙක්.

එන = 1. එන්නාවූ. 2. පැමිණෙන.

එනකල් = 1. මතු පැමිණෙන කාලය. 2. අනාගතය.

එනම් = 1. ඒ නමින් යුත්. 2 ඒ කෙසේද යත හොත්.

එනවා = 1. ඊම කරනවා. 2. පැමිණෙනවා.

එනමුත් = 1. එන්නමුත්.

එන්නක්කාම්බි = 1. පුරාණ වස්ත්‍ර විශේෂයක්.

එන්තරවාසි = 1. අලාභ ආදිය ඉල්වා නීතිඥයකු ලවා යවන ලියමන.

එන්නක් කරනවා = 1. බෝවෙන ලෙඩ වැළැක්වීමට බෙහෙත් විදීම.

එන්නා = 1. එන තැනැත්තා.

එන්සාල් = 1 එනම් ඖෂධ විශෙෂය. 2. සුවඳ ඇති කුඩා ඇට වර්ගයක්.

එපමණ = 1. ඒ තරම.

එපවත් = 1. ඒ පුවත. 2. ඒ ආරංචිය.

එප්සනවා = 1. උඩට තයිනවා.

එපා = 1. ඕනෑ නෑ. 2. අනවශ්‍යයි. 3. තහනම්.

එපැලග = 1. ඒ ආකාරය.

එපාකරනවා = 1 ප්‍රතික්ෂේප කරනවා.

එපිට = 1. ඒ පැත්ත. 2. ඈත.

එබ = 1. හෙබ. 2. ගැඹුරු දිය වළ.

එබන්දක් = 1 එවැනි දෙයක්.

එබඳු = 1. ඒහාවන. 2. අතික.

එබව = 1. ඒ බව. 2. ඒ කාරණය.

එබැවින් = 1. ඒනිසා. 2. ඒ හේතුවෙන්.

එබිකන් = (එබිකම්) 1. එබීබැලීම. 2. හොරෙන් බැලීම.

එබිමෝ = 1. එබිනෙමු.

එබීම = 1. එබුම. 2. මෘදු ගතිය. 4. පහතට එබෙන බව. 4. යටට යෑම. 5. එබිකම් කිරීම.

එබූ = 1. ඔබන ලද.

එබූපිය = 1. ඔබන ලද පාදය. 2. පියවර.

එබෙනවා = 1. පහත්වෙනවා. . 2. එබූවිට (ගෙඩියේ ලෙල්ල) යටට යනවා.

එම = 1. ඒ 2. ඒකම. 3. එමෙන්ම.

එමට = 1. ඕනෑ තරම්. 2. සුලභව. 3 බොහෝ සෙයින්.

එමදදිවූ = 1. මඳ කලක් ජීවත්වන.

එමසඳ = 1. ඒ කාලයෙහි.

එම්ප්‍රදෝරු = 1. අධිරාජ.

එම්බල = (එම්බා) 1. බොල. 2. පින්වත. 3. ආමන්ත්‍රණය කිරීමෙහිදී යොදන වචනයක්.

එය = 1. ඒක. 2. ඒදෙය.

එයාකාර = 1. ඒ ආකාර. 2. එවැනි.

එයාවර = (එයැවර) 1. එකල

එසි = 1. හෙයි; හැකිවේ.

එසින් = 1. ඒද. 2. ඒ දේත්. 3. ඒ අයත්.

එසිදු = 1. ඒ දේත්. 2. ඒ අයත්.

කොසිහමියේද = 1. කොතැනද.

කොසිකැමි තමුන් = 1. කෙයේ තමුන්, කොහොම තමුන්.

කොර = 1. අත් - පා වලංගු නැති. 2. හරි-හැටි ගමන් කළ නොහැකි. 3. කොටවූ හෝ පණනැති අත් - පා. 4. ලුහුඬු - මිටි. 5. පොරය. 6. (මාළුන්ගේ) කොරපොතු.

කොරකම = 1. අත් - වලංගු නැති බව.

කොරකහ = 1. ගස් වර්ගයක්.

කොරගහනවා = 1. කොර ගසමින් යනවා. 2. අමාරුවෙන් පය තබනවා.

කොරවා = (කොරටූ) 1. සිවලා; නරියා.

කොරටු = 1. කොටුව. 2. වැටකින් වට කළ තැන.

කොරඬ = 1. සංක්ෂිප්ත; ලුහුඬු. 2. විස්තර නැති.

කොඩාබත් = 1. දිය සහිත කිරිබත්.

කොරඬු = 1. කොට කිරීම. 2. හැකිළීම.

කොරනෙල් = 1. හදිසි මරණ පරීක්ෂක නිලධාරියා.

කොරපොතු = 1. මාළුන්ගේ ඇඟේද, මාන්දම් ආදි රෝගීන්ගේ ඇඟේද ඇතැම් අයගේ හමේද ඇතිවන පොතු වෙසෙසක්.

කොරපොල් = 1. පොර පොල්; පොර පොල් ගැසීම සඳහා ගන්නා කටුව ඉතා තද පොල් වර්ගයක්.

කොර පොල් පොළිය = 1. පොර පොල් ගැසීමේ ක්‍රීඩාව.

කොරඹුරුවා = 1. කුඩා මාළු වර්ගයක්.

කොරමරු = 1. පෙනේරය.

කොරල් = 1. පබළු.

කොරලි = 1. එනම් මැලූ වර්ගය.

කොරවක් = 1. කොරවකා නම් පක්ෂියා; කෙරවකා.

කොරවක් ගල් = 1. පියගැට පෙළවල් දෙපස සවිකළ කැටයම් සහිත ගල් වර්ගයක්.

කොරස = 1. කර්කශ. 2. රළු. 3. කොරහැඩි. 4. කොරහ. (කටලොකු විශාල මැටි භාජනයක්)

කොරසැඩි = 1. රළු. 2. පොතු හෝ කොර-වලින් ගහනවූ. 3. ගොරහැඩි.

කොරහ = 1. එනම් මැටි භාජනය.

කොරහන = 1. ගල්කැට වලින් යුත් ස්ථානය.

කොරහන් = (කොරාන්) 1. කුරාන් පොත; මහම්මත් ආගමේ ඉගැන්වීම් සඳහන් පොතක්.

කොරල = 1. කොරපොතු සහිත.

කොරලාවා = 1. මුදු මාළුවෙක්.

කොරලියා = 1. මිරිදිය මාළුවෙක්.

කොරවක්ගල් = 1. පුරාණ මාලිගා ආදියෙහි යොදා තුබුණු කළුගල් වෙසෙසක්.

කොරා = 1. අත් - පා කොරවූ අය. 2. ඇවිදීමට නොහැකි නැතැත්තා. 3. අබ්බාගාතයා.

කොරාසානි = 1. ඔසු වෙසෙසක්.

කොරි = 1. ඉතා කුඩා. 2. වකුටු.

කොරු = (කොරුවා) 1. නරියා.

කොරේ පිට ඔරේ = 1 කරදර නවත් වැඩිවීම (එක් කරදරයකින් සිටිනවිට ඊට වඩා කරදරයක් ඇතිවීම.)

කොරෝඬ = 1. (කොරඬු බලන්න)

කොරෝස් = 1. රළු. 2. සැර. 3. තපුරු. 4. කර්කශ. 5. කොරහ. 6 තද රශ්මිය. 7. කොරස වැල්.

කොරෝසැනි = 1. කොරසැඩි. 2. ගොරෝසු.

කොල = 1. බොල; එම්බල. 2. ගැරඩියා. 3. ශාඛාව. 4. පත්‍ර. 5. වෙරළ. 6 වස්ත්‍ර. 7. කඩදාසි.

කොලඅතු = 1. කොළ හා අතු. 2. ගසේ අතු.

කොලකම් = 1. රළුකම්. 2. පිටිසර කම්.

කොලකැඳ = 1. කොළ යුෂ යොදා පිසූ කැඳ.

කොලකැළ = 1. පත්‍ර සමූහය.

කොලගොන්න = 1. පත්‍ර රාශිය; කොළ අහුර.

කොලගොයම = 1. නො පිදුණු ගොයම.

කොලගෝවා = 1. ගෝවා වර්ගයක්.

කොලතු = 1. අත්තන ගස. 2. පලා අත්ත. 3. කොළ හා අතු. 4. ගසේ අතු.

කොලනිය = 1. අලුතෙන් ඉදිකළ ජනපදය.

කොලනිල් = 1. කොළ යුසින් සෑදූ නිල්පාට.

කොලද්දම් = තැටුම් විශේෂයක්.

කොලඹ = 1. කොලොම් රුක්.

කොලඹු = 1. දම් ගෙඩිය.

කොලම = 1. (මුද්‍රණ ශිල්පයෙහි) ඇමුණු පත්‍ර තීරය.

කොලමුරුවා = 1. මුදු මාළුවෙක්.

කොලමුඛ = 1. ශාඛ නම් මෘගීයා.

කොලව = 1. වැල් පාලම.

කොලරාව = 1. ජලසන්නි රෝගය; විසූචිකාව.

කොලහලය = 1. සංඝුව. 2. අරගලය. 3. ඝෝෂාව.

කොල් = 1. ගංතෙර. 2. මුදුතෙර. 3. කුලය. 4. කුන්තායුධය. 5. අඩයටිය. 6. සෙන්-කෝලය. 7. කට 8. කට කොළවර.

කොල්ලම් = 1. ගස් වෙසෙසක්.

කොල්ල = 1. මංකොල්ල කෑම. 2. මංපැහැරීම. 3. අසාධාරණය. 4. අධික ලාභයට ගැනීම. 5. විනාශය.

කොල්ල කෑම = 1. මංපැහැරීම. 2. බලහත්-කාරයෙන් ගැනීම. 3. මංකොල්ල කෑම.

කොල්ලා = 1. බාලයා. 2. තරුණයා.

කොල්ල කාගත් = 1. බලයෙන් අල්ලා ගත්. 2. උදුරාගත්. 3. අයුතු ලෙස ලබාගත්.

කොල්ලෑව = 1. ඔරුව හෝ පෙරලෙනු සඳහා (ඔරුවේ අංශයකින්) වියල් දෙකක ආධාරයෙන් ඔරුවට යාකරන දඬුකඩ. 2. කුඩා ඔරුව.

කොල්ලෑ ගස් = 1. පතුක් ගස.

කොල්ලු = 1. ධාන්‍ය වර්ගයක්.

කොල්වර = 1. ප්‍රීති ඝෝෂාව.

කොළු = 1. කොල්ලා. 2. බාලයා. 3. පැලගස්. 4. දූතයා.

කොළු කම = 1. වයසින් අඩුකම. 2. තොමේරූ බව.

කොළු මෙහෙ වර = 1. වහල් මෙහෙය.

කොලොප්පු කියනවා = 1. හුණුකපලාරුව හොඳින් මදිනවා.

කොළුවා = 1. කොල්ලා. 2. බාලයා.

කොලෙල් අතු = 1. ඇලක දෙතෙර ගස් සම්බන්ධ කොට සෑදූ පාලම.

කොලො = (කොලව බලන්න).

කොලොප්පම් = 1. කවටකම්. 2. කෝලාහල. 3. විගඩම්.

කොලොබ = 1. කදඹ.

කොලොම් = 1. බක්මී ගස; බකිනි ගස (බම්බි ගස). 2. රතට හුරු රත් පැහැති මල් වෙසෙසක්. 3. පලොල් ගස.

කොලොඹු = 1. කොලොම්බුව. 2. යමක් තබා කැපීමට ගන්නා ලීකඳ. 3. දම්ගෙඩිය. 4. මිටි බංකුව

කොලොවු = 1. කුලූ පග.

කොලොස් = 1. කැකුණ මැලියම්.

කොළ = 1. පත්‍රය. 2. වස්ත්‍රය. 3. ගොයම් ගොඩ. 4. ගොයම් ගස. 5. කට කෙළවර. 6. ශාඛාව. 7. කිලිටි.

කොළ අතු = 1. පත්‍ර ශාඛා.

කොළඇඳුම = 1. කොළවලින් සෑදූ ඇඳුම. 2. කොළ ඇඳීම.

කොළ කැඳ = 1. බෙහෙත් කැඳ. 2. කොළ යුෂ යෙදූ කැඳ.

කොළ කැපි = 1. කොළගොඩ. 2. කැපූ ගොයම් එක්රැස් කොට තබන ගොයම් ගොඩ.

කොළකුර = 1. දළුව.

කොළගඳ = 1. කොළ තැම්බෙන විට (වියළෙන විට) ඇතිවන ගඳ.

කොළ'ග් = 1. ශාඛාග්‍රය.

කොළගේ = 1. කොළ වලින් සාදන ගේ. 2. ගස්වල අතු එක්වී ගෙයක් මෙන්වූ තැන.

කොළකුරු = 1. අතු අතර.

කොළක්ත = 1. අග්ත.

කොළ තැම්බීම = 1. කැඩු පොල් පදම්වීම සඳහා දෙසතියක් පමණ තැබීම.

කොලදිවියා = 1. කොළයා. 2. උගුඩු වගීයේ සතෙක්.

කොලන = 1. තලන. 2. කොටන. 3. විකන.

කොලන මුගුරු = 1. තලන පොල්ල.

කොල නැබුව = 1. කොළේ නැට්ට.

කොල නුවර = 1. කෝළිය නගරය.

කොල නෙලනවා = 1. (ගොයම් අතරේ) වල් පැලෑටි උදුරනවා.

කොලපත = 1. පතක් වශයෙන් ගත්තා කොළය. 2. පුවක් කෙළය. 3. තෙළඹ කොළය; අල කොළය හෝ කෙසෙල් කොළය.

කොල පරාඩියා = 1. එනම් මිරිදිය මාළුවා; පරාටි විශේෂයක්.

කොල පාගනවා = 1. කමතේ ගොයම් මඩිනවා.

කොල පාට = 1. පලාශවර්ණ; පලාවන් පැහැය (මොනර නිල් පාට සහ කහ පාටක් එක්වීමෙන් සෑදෙන පැහැය.)

කොලපු = 1. තාල වගීයේ ගස්වල මල් මොට්ටුව වැසී තිබෙන කොටස. 2. මල් කොපුව. 3. බදුම ඔප දැමීම සඳහා තලප පදමට දියකරගත් අළුහුණු.

කොලපෝර = 1. කොළ වලින් සෑදූ පෝර.

කොලබොක්ක = 1. උදරයේ පිහිටි බොක්කක්.

කොලඹ = 1. කොළඹ නගරය. 2. නැව් තොට; වරාය. 3. කොළෙම් ගස. 4. අසුත (කොළෙම්බුව?) 5. කුටුම්බය. 6. ගෘහගයා.

කොලඹු = 1. දඹුසබ.

කොල මඩිනවා = 1. ගොයම් පාගනවා.

කොල මඩු = 1. ශාඛා මණ්ඩපය; කොළ අතු සෙවිලිකළ ගෙය.

කොල මුරුවා = 1. එනම් මෑළුවා.

කොල මුසුන් = 1. කොළ අතු වලින් සෑදූ මුස්න.

කොලය = (කොළේ) 1. පොතක පිටු දෙකකින් යුත් කොටස. 2. කබදැහිය. 3. ගසේ පත.

කොල යතු = 1. ඒදණ්ඩ.

කොලයා = 1. කොළ දිවියා; උගුඩු වගීයට අයත් එනම් සතා. 2. ගැරඩියා 3. දිවියා.

කොලරාව = 1. එනම් වසංගත රෝගය; ජලසන්නිය.

කොල රූක් 1. සුළඟ හමන විට හඩ නගන සිදුරු සහිත දිරාගිය ගස.

කොල වැද්ද = 1. විලිවසා ගැනීම සඳහා කොළඅතු අඳින වැද්දා.

කොලහලය = 1. කලහය 2. සණ්ඩුව.

කොල හිඹුල් = 1. කටු ඉඹුල් ගස.

කොල හිඹුල් වන = 1. කටු ඉඹුල් නරකය.

කොලි = 1. ශාඛාව.

කොලිහ = (කොලක) 1. ගසේ මුදුන.

කොළු = 1. කුඩා පිරිමි ළමයා. 2. කුඩුබටු ගස. 3. ලණු දෑලේ බඹ 40 ක ප්‍රමාණය. 4. කුඩු වෙලඟි නම් ඖෂධ වෙසෙස. 5. අනුන්ගෙන් උදව් ලබන්නා. 6. කතිර සිටින සේ එකට බැඳි දඬුකුන.

කොළුදු = 1. මුහුදු වෙරළ; වෙරළ.

කොළු පැංචා = 1. කුඩා කොළුවා.

කොව් = 1. කෝපය; තරහව.

කොවන = 1. කෝපකරන; කුපිත කරන. 2. වෙනස් කිරීම.

කොවා = 1. කුපිතකර; අවුස්සා. 2. වෙනස් කරවා.

කොව්වර = 1. කොච්චර. 2. කොතරම්.

කොවිද = (කෝවිද) 1. දක්ෂවූ. 2. පණ්ඩිත.

කොවු = 1. කෝපය. 2. කොබෙයියා.

කොවුන් = (කුහක) 1. කුහක.

කොවුල = 1. (දළුකොටු ආදියට හිටුවන) ශූණි වෙසෙසක්. 2. ගසේ එලය හෝ ඇතුළතින් දිරීම. 3. දිරූ ගස.

කොවුල් = 1. කෝකිල පක්ෂියා; කොවුලා. 2. ගස්වල එලය. 3. දිරූ ගස.

කොවුල් සුවඳ = 1. එලයෙහි සුවඳ.

කොවුලු = 1. කොවුලා. 2. කොවුල්ලා; කෝකිලයා.

කොළෙව = 1. කුඩා වීපිය. 2. පටු පාර.

කොසඹ = 1. කොහොඹ ගස. 2. කොහු අඹ.

කොසඹ උල් = 1. වරද කළවුන්ට දඬුවම් දීම පිණිස යොදාගෙන තුබුණු කොසඹ ලීයෙන් සෑදූ තියුණු උල.

කොසඹතෙල් = 1. කොහොඹ ඇටවලින් පෙරා ගත් තෙල්

කොසඹද = 1. කොහොමද.

කොසඹ පොළඟා = 1. සර්ප විශේෂයක්.

කොසලි පලා = 1. කොහිල දළු

කොසවිල = 1. කොහිල ගස; කොහොවිල ගස.

කොසු = 1. කොහු; මුසුන් වෙසෙසක්. 2. පොල් ආදියෙහි කෙඳි. 3. සමූහය. 4. කොපුව.

කොසේ = 1. කොස් ගෙඩිය.

කොසොල් = 1. එනම් රට. 2. එනම් රජ.

කොසොල් නැළි = 1. ධාන්‍ය ආදිය මනින මිම්මක්.

කොස් = 1. එනම් ගස. 2. කොස් ගසෙහි ගෙඩි. 3. කොපුව. 4. භාණ්ඩාගාරය. 5. කෝෂ කාව්‍යය. 6. කොස්වා ලිහිණියා. 7. කුණු රොඩු.

කොස් ඇට = 1. කොස් ගෙඩියෙහි ඇට.

කොස් ඇට බුරුමය = 1. එනම් විදිනා කටුව.

කොස් ඇට මීයා = 1. (කොස් ඇටයක් තරම්) කුඩා වූ මීයා.

කොස් ඇට වවුලා = 1. කුඩා වවුලන් වර්ගයක්.

කොස් ඉඟි = 1. කොස් මදුලු වලට පිටින් පිහිටි නූල් වැනි කොටස.

කොස් කටු = 1. කොස් වටා පිහිටි කටු. 2. කොස් ගෙඩියේ පිට පතුරු.

කොස් කිරි = 1. කොහොල්ලෑ.

කොස් කුරුල්ලා = 1. එනම් කුඩා කුරුල්ලා.

කොස් ගොන්නා = 1. එනම් ගස.

කොස්තාපල් = 1. පොලිස් භටයා.

කොස් දෙල් = (දෙල් කොස්) 1. කොස් වෙසෙසක්.

කොස්නා = 1. කොඤ්චනාදය; කුඤ්චනාදය.

කොස්තැපැල් = (කොස්තාපල්, 1. පොලිස් භටයා

කොස් පඩු = 1. සිවුරු පාට කිරීම පිණිස ගන්නා කොස් මුල් වෙසෙසකින් සෑද ගන්නා කහට දිය.

කොස් පැණි = 1. ඉදුණු වැල-වරකා මදුලු වලින් බේරෙන රසවත් දියර.

කොස් පොතු = 1. කොස් කටු. 2. කොස් ඇටයේ පිට ලෙලි.

කොස් මදුලු = 1. කොස් ගෙඩි ඇතුලෙහි තිබෙන කෑ හැකි කොටස.

කොස් මහලු = 1. කොස් මදුලු ව්‍යංජනය.

කොස් මිදුලු = (කොස් මදුලු බලන්න)

කොස් රෝද = 1. කොස් ලීයෙන් කළ ලී රෝදය. 2. කොස් ලීයේ පාට ඇති ලී යෙන් කළ, නූල් ඔතා ඇති රෝදය.

කොස්ලා = 1. කොස් කිරි, කොහොල්ලෑ.

කොස් ලිහිණියා = 1. කොස්වා ලිහිණියා.

කොස් වහලු = 1. කොස් ගෙඩියේ මිදුලු වලට මැදිව තිබෙන තද කොටස.

කොස්වා ලිහිණි = 1. නිතර පෙඳය සොලවන ලිහිණි වර්ගයේ කුරුල්ලෙක්.

කොස් සිඹිඩි = 1. කොස් ඇටය වටා පිහිටි කොපුව. 2. කොස් ඇටයට හා මදුලට අතරෙහි ඇති සිවිය.

කොස්ස = 1. වණ-පිළියල් ආදියේ තරක් වූ මස්-ලේ-සාරේ ආදිය. 2. ඇමදීමට ගන්නා කොහු කෙඳි වලින් සෑදූ උපකරණය; මුස්න. 3. යමක් ගැමට ගන්නා හෝ පිස දැමීමට ගන්නා දෙයක්. 4. වැරැද්ද. 5. අවුල.

කොස්සක් කිවියා = 1. වරදක් ඇති වූනා. 2. (වැබෙ) වැරදුනා.

කොස්සා = 1. එනම් මුදු මාලුවා. 2 එනම් මැස්සා.

කොස් සත් = 1 'කොක්-කොක්' යන හඬ; කොක් හඬ.

කෝෂ්ඨය = 1. කොටුව.

කෝෂ්ඨාගාරය = 1. ගබඩා ගේ.

කොහල් = 1. කුඩ වෙසෙසක්. 2. සැඟවී තිබෙන දෙයක්.

කොහා = 1. එනම් කුරුල්ලා. 2. කොවුලන් වෙසෙසක්? 3. කොතැන.

කොහාටද = 1. කොතැනකට ද. 2. කොයි බටද.

කොහිල = 1. මඩ සහිත බිම්වල වැවෙන කටු සහිත ගස් වෙසෙසක්.

කොහිල අල = 1. කොහිල ගහේ අල.

කොහි = 1. කොතැන්හි?

කොහිල කැඳ = 1. කොහිල අල යුෂ යෙදූ කැඳ.

කොහු = (කොහු බලන්න)

කොහු මුණා = 1. (වැඩේ) නරක් වුනා.

කොහු දෙවරැද්දිහි = 1. වී වර්ගයක්.

කොහු ලනු = 1. කොහුවලින් ඇඹරූ ලනු.

කොහෙන් = 1. කොයිබින්. 2. කොතැනින්.

කොහෙන්ම = 1. මුළුමනින්ම. 2. ස්වල්පයක්වත්.

කොහේ ද = 1. කොතැනද.

කොහේ නමුත් = 1. මොනයම් තැනක නමුත්. 2. කොහේ හරි.

කොහො = 1. කොස්.

කොහොට = 1. කොටස. 2. පංගුව.

කොහොන් = 1. කුහක.

කොහොඹ = 1. කොහොඹ ගස.

කොහොඹයා = 1. කුඹුරු ආදියට අරක් ගත් අමනුෂ්‍යයෙක්; කොහොඹ යකා.

කොහොම = 1. කෙසේ. 2. කොයි ආකාරය කින්.

කොහොම් = 1. කොසඹ ගස. 2. එනමින් නම් වෘක්ෂය.

කොහොමද = 1. කෙසේද. 2. කොයි ලෙසද.

කොහොල = 1. ගොරෝසු උල. 2. හුදකලා ස්ථානයක්.

කොහොලම් කාම = 1. කෝලම. 2. විගඩම. 3. විරූපාකාරය.

කොහොල් = 1. රූක්ෂ. 2. ලජ්ජා ඇති. 3. කෝලම. 4. කැඩුම් බිඳුම්. 5. රහස් ස්ථානය. 6. ලංසය. 7. අංකුශය. 8. දිරායාම. 9. ගල් මුල් ආදියෙන් ගැව හුණු ඉඩම. 10. ජය ස්ථානය.

කොහොල්ලෑ = කොස් ලාටු.

කොහොල = 1. රස.

කොහොලාන් = 1. කුසලාන්; පින් ඉඩම.

කොහොඹිල = 1. කොහිල.

කොහොල = 1. රහස.

කොහෝ = 1. කොස්වා ලිහිණියා.

කෝ

කෝ = 1. කෝපය 2. කොහා. 3. කෝව. 4. කුඩා. 5. ප්‍රශ්න ඇසීම සඳහා යොදන නිපාතයක්.

කෝ අග = 1. කෝපය නමැති ගින්න.

කෝකනද = 1. රත් පියුම. 2. හෙල පියුම. 3 කොකනද වීණාව.

කෝ ඇඳ = 1. සියල්ල?

කෝක = 1. කොකිළුකා 2. වෘකයා.

කෝකි = 1. අරක්කැමියා; කෑම පිසන්නා

කෝකිල = 1. කොවුලා.

කෝ ගිනි = 1. කෝපය නමැති ගින්න.

කෝද්‍රිවිය = 1. දුම්රිය. 2. රට විශේෂයක්.

කෝෂ = 1. කොටුව.

කෝටර = 1. රුක් සිදුර; ගස් බෙණය.

කෝට්ටය = 1. බල කොටුව. 2. ජයවර්ධන පුරය.

කෝට්ටේ නිකාය = 1. සියම් නිකායේ කොටසක්?

කෝටිය = 1. ලක්ෂ සියය. 2. කෙළවර. 3. අග. 4. මුදුන. 5. ඉතා මහත් සංඛ්‍යාව. 6. හතලිහ?

කෝටික = 1. කොණක් ඇති.

කෝටි ප්‍රකෝටිය = 1 විශාල සංඛ්‍යාවක් (1000000000000000000000)

කෝටි ප්‍රාප්ත = 1. කෙළවරට පැමිණි.

කෝටියක් සංවර ශීල = (උප සම්පන්න භික්ෂු නමකගේ) ඉතා මහත් සංඛ්‍යාවක් සංවර ඇති ශීලය.

කෝටිල්ල = 1. කුටිල බව. 2. වඞ්ක බව.

කෝට සිඹලි = 1. කටු ඉඹුල් ගස.

කෝටි ශත = 1. දැති පෝරුව.

කෝටු = 1. සිහින් ලීය.

කෝටුකිතසියා = 1. ඇගේ ඇට පෑදුණු දුබලයකුට කියන සරදම් වචනයක්. 2. මහදූතමුත්තාගේ ගෝලයන්ගෙන් එක් කෙනෙක්.

කෝටු මස් කිරීම = 1. කෝටුවෙන් හෝ වේවැලෙන් තැළීම.

කෝටුම්බර = 1. තූර්ය භාණ්ඩයක්. 2. වස්ත්‍ර විශේෂයක්.

කෝටුවෙ රජ්ජුරුවො = 1. ධර්මාධිකරණ නායක. 2. නායක විනිශ්චයකාරයා.

කෝට්ට = 1. කෝට්ටුව. 2. ප්‍රාකාරය. 3. කෝෂ්ඨය. 4. කොටුව.

කෝට්ඨකය = 1. බල කොටුව. 2. අටුව. 3. ඇතුළු ගෙය.

කෝඩ = 1. වැහිකළුව; තද වළාකුල. 2. කුනාටුව. 3. බලාපොරොත්තු රහිත කරදරය.

කෝඩයක් වැදිලා = 1. කරදරයක් ඇතිවෙලා

කෝඩි = 1. විස්ස.

කෝඩු = 1. පළමු; මුල්. 2. නුපුරුදු. 3. මුලින්.

කෝඩුකාර = 1. පළමුවෙන් කරන. 2. හා-හා පුරා කරන. 3. ශ්‍රීපාද වන්දනාවට පළමු වතාවට යන්නා.

කෝඩු අග්ගලා = 1. කෝඩුකාරයා වෙනුවෙන් වන්දනා කාරයන්ට දෙන ලොකු අග්ගලා ගෙඩිය.

කෝන් = 1. ගස් වර්ගයක්.

කෝන්තරය = 1 විරුද්ධකම; එදිරිය.

කෝන්තර ඇසීම = 1. උසාවියේදී නීතිඥයන් විසින් කරනු ලබන හරස් ප්‍රශ්න ඇසීම.

කෝණ = 1. කොණ. 2. දිශාව. 3. මුල්ල. 4. කෙළවර. 5. වීණාවේ අවයවයක්. 6. අවුරුද්දේ අග. 7. අළුත් අවුරුදු දිනය.

කෝණ බහුල = 1. බොහෝ මුලු සහිත.

කෝණංගියා = 1. නාට්‍යයෙහි විහිළු කාරයා. 2. බහු බූතයා. 3. කෝලම්කාරයා.

කෝණම = 1. අමුඩය. 2. නානකඩ. 3. කිලිටි රෙදි කඩමාල්ල; වැරහැලි.

කෝණමස්ස = 1. අමුඩය ඇතුළත.

කෝණම්සේල = 1. කෝණම් රෙදි.

කෝණය = 1. කොණ. 2. පැති හෝ ඉරි දෙකකින් සෑදෙන මුල්ල

කෝතූහල = 1 විස්මය. 2. දැනගැන්මේ ආශාව. 3. කුහුල.

කෝතුහල මඞ්ගලික = 1. සුබ නිමිති හා පෙර නිමිති ගැන විශ්වාස කරන්නා.

කෝදණ්ඩ = 1. දුන්න.

කෝද = 1. ක්‍රෝධය.

කෝදුව = 1. දිග මැනීමේ මිම්මක්; වඩු කෝදුව.

කෝද්‍රව = 1. අමු නම් ධාන්‍ය.

කෝදුරුවා = 1. එනම් කුඩා මැස්සා.

කෝධ = 1. ක්‍රෝධය.

කෝධන = 1. කිපෙන සුලු. 2. ක්‍රෝධ බහුලවූ.

කෝපය = 1. කිපීම; තරහ. 2. ක්‍රෝධය.

කෝපනෙය්‍ය = 1. කෝප උපදවන දෙය.

කෝපි = 1. එනම් ගස, ඒ ගසේ ඇට, ඒ ඇට බැද චූර්ණීකරගත් කුඩු හෝ ඒ කුඩු තම්බා සෑදූ පානය.

කෝපි කාලේ වැඩ = 1. ආදි කාලේ වැඩ කටයුතු.

කෝපි කඩේ = 1. කෝපි-තේ හා කැවිලි වර්ග විකුණන වෙළඳ පොළ.

කෝපීන = 1. රහසඟ. 2. ස්ත්‍රී පුරුෂ නිමිති.

කෝපීන ස්ථාන = 1. (ලජ්ජාව) කුපිත කරන තැන්; (ලජ්ජාව) අවුස්සන තැන්.

කෝප්පය = (කෝප්පේ) 1. දිය බීමට ගන්නා බඳුන.

කෞප්‍ය = 1. වෙනස් කළ හැකි 2. නිසි සේ සම්පූර්ණ නොවූ 3. කුපිත.

කෞමල = 1. මෘදු; මොළොක්.

කෞමල කේශතා = 1. මෘදුවූ හිසකෙස් ඇතිබව.

කෞම්බිට්ටු = 1. වැලිකෙළියේදී ළමයින් විසින් සාදන බොරු පිට්ටු.

කෞම්බ = 1. ඇතුළත දිය හා මද නැති කබල. 2. (මී-වවුල් ආදි සතුන් විසින් කා හෙළූ) ඇට්ටි-කුරුම්බා 3. (පණුවන් කෑ) කුහර සහිත දත. 4. පැත්තක් කැපූ හිස් පොල් ගෙඩිය.

කෞමාර = 1. ළදරුවන් පිළිබඳ.

කෞමාර බ්‍රහ්මචර්යා = 1. ළදරු කල සිට රැකි බඹසර.

කෞමාරිකා = 1. (පඳුරු වශයෙන් වැවෙන) එනම් කුඩා ගස.

කෞමුදී = 1. සඳරැස. 2. ඉල් පසළොස්වක.

කෞරක = 1. කුඩා මොට්ටුව. 2. දළුව. 3. කැකුළ. 4. සුවඳැති කුඩා ගෙඩි වර්ගයක්. 5. මල් කැකුළ.

කෞරල = 1. කොරල නම් මාලුවා; කොරලියා.

කෞරළ = 1. ජනපදය; දිස්ත්‍රික්කයකින් කොටසක්. 2. විශාල ප්‍රදේශයක්. 3. කෝරළයක් පාලනය කරන නිලධාරියා.

කෞරව්‍ය = (කෞරව්‍ය) 1. කෞරව වංශය. 2. කුරු රටට අයත්.

කෞරා = 1. සහල් වර්ගයක්.

කෞරාළ = 1. කෝරළයක් භාරව දිසාපති යටතේ රාජකාරි කරන නිලධාරියෙක්.

කෞරාසානි = 1. බෙහෙත් වර්ගයක්.

කෞල = 1. ලජ්ජාව. 2. උළුවාහල්. 3. කලං එකහමාර 4. තනිවූ ස්ථානය. 5. රළු උල. 6 පිස්සුව. 7. ඩෙබර ගෙඩිය. (මසන්)

කෞලක = 1. ගම්මිරිස්. 2. තකුල්. 3 තිප්පිලි 4. කුළුබඩු. 5. සුවඳ වර්ගයක්.

කෞලක්කාර = 1. කෝණංගියා.

කෞල ගිනිශම් = 1. හෙම්බිරිස්සාව හා වේළුම

කෞලට්ඨි = 1. ඩෙබර ඇටය.

කෞල ඵල = 1. ඩෙබර ගෙඩිය.

කෞලම්බ = 1. මහකැළිය. 2. බඳුණිය. 3. කොළඹ

කෞලම = 1. විහිලුව. 2. විහිලු සහිත පෙන්නුම. 3. නැටුමක්

කෞලම් කරනවා = 1. විකාර කරනවා. 2. විගඩම් කරනවා.

කෞලම් නැටීම = 1. එනම් පැරණි නාට්‍ය දර්ශනය.

කෞලම්බකය = 1. වීණා කඳ. 2. ලොකු වතුර භාජනය.

කෞලය = 1. ආයුධයක්. 2. සෙන්කෝලය? 3. උකුළ. 4. පහුර. 5. ලජ්ජාව. 6. උත් සන්නවූ රෝගය. 7. කලිඟු රට. 8. වැළඳ ගැනීම. 9. කුළු බඩු වර්ගයක් 10. මිකිරක්. 11. සෙම් හිරවීම.

කෞලයා = 1. සෙනසුරු ග්‍රහයා. 2. ඌරා 3. පිට වහලා.

කෞල වල්ලි = 1. ගජ තිප්පිලි.

කෞල සන්නිය = 1. සෙම් හිරවීම. 2. දහ අට සන්නියෙන් එකක්.

කෞල ස්වර = 1. වීණාවක්.

කෞල් = 1. කුන්තායුධය. 2. ලංසය. 3. ඉවුර. 4. ලජ්ජාව.

කෞල් බඩ = 1. ඉවුර අද්දර.

කෞල් මුර ඝොත් = 1. පත්තිනි දේවිය හා ඇගේ හිමියා වූ පාලඟ ද පිළිබඳ විස්තර ලියූ පොත

කෞලාෂ = 1. බෙණ සහිත වියළි කොටුල.

කෞලාරු = 1. 1. ඕනෑකම. 2. හිඟකම.

කෞලාහල = 1. සණ්ඩුව, 2. දබරය. 3. මහත් ශබ්දය 4. යුද්ධය.

කෞලි = 1. තිප්පිලි. 2. ඩෙබර ගස. 3. සිවිය.

කෞලිකුම්භු = 1. කෙසෙල් වර්ගයක්.

කෞලිය = 1. ශාක්‍ය වංශිකයන්ගේ කොටසක්.

කෞලෙට ගිනිල්ලා = 1. උණ විකාරයට ගිනිල්ලා. 2. රෝගය උත්සන්නවී.

කෞලෙය්‍යක = 1. කුලයකට අයත්. 2. වංශවත් බල්ලා.

කෝළල් = 1. ලජ්ජාව. 2. රෝගයේ දරුණු අවස්ථාව. 3. බිය-සැක බව.

කෝව = 1. ඖෂධ හළම කිරීම්-ලෝහ උණු කිරීම් ආදියට ගන්නා භාජනය.

කෝවංගු = 1. මැණික් ගල්වල පළුදු.

කෝවක්කා = 1. එනම් වැල් වර්ගය; එහි ගෙඩි; බිඹුපල.

කෝවිද = 1. දක්ෂවූ. 2. පණ්ඩිතවූ. 3. උගත්.

කෝවිදාර = 1. සරුවල ගස් වර්ගයක්

කෝවිල් = 1. දේවාලය.

කෝවේ = 1. කුඩා වීථිය; පටු පාර.

කෝවිළාර = 1. කොබෝලීල ගස.

කෝස = 1. අණ්ඩ කෝෂය. 2. දුනු පන්සියයක් දුර. 3. බඹ පන්සියයක දුර 4. කොපුව. 5. ධනාගාරය?

කෝසක = 1. කුඩා කොපුව. 2. කෝප්පය. 3 (මත්) පැන් බොන බඳුන.

කෝසජ්ජ = 1. කුසීත බව; කම්මැලි කම.

කෝසඵල = 1. වැට කොළු. 2. කපුකිනිස්ස. 3. පෙතෙල.

කෝසඵල = 1. සාදික්කා.

කෝසම්බ = 1. කොහොඹ.

කෝසම්බි = 1. කොසඹෑ නුවර.

කෝසල = 1. අයෝධ්‍ය පුරය. 2. එනම් රට. 3. එනම් රජ.

කෝසල මල්ලිකා 1. කොසොල් රජුගේ මල්ලිකා නම් අග බිසව.

කෝසල්ල = 1. දක්ෂ බව.

කෝසාතකී = 1. වැටකොළු වැල.

කෝසික = (කෝසිය) 1. බස්සා. 2. ශක්‍රයා.

කෝසිය = 1. කොපුව. 2. (දැල් වල පල්ලේ -මඩිය මසුන් ගෙන් පිරුණු විට) මඩිය ආරක්ෂාවට දමන කොපුව.

කෝසිනාරක = 1. කුසිනාරාවෙහි උපන්.

කෝසී = 1. කඩු කොපුව.

කෝසෙය්‍ය = 1. පණුවන්ගේ කෝෂවලින් ලැබෙන පටනූල් 2. පට වස්ත්‍ර විශේෂයක්.

කෝසෝහිත = 1. කොපුවක බැහූ.

කෝශ = (කෝස) 1. රත්රන්. 2. සපත්තුව. 2. බිත්තරය.

කෝශශේද්‍යය = 1. කප්පාදු කිරීම.

කෝශය = (කෝෂය) 1 කොපුව. 2. බිත්තරය 3. අණ්ඩ හෝ එය දරණ හම 4 භාණ්ඩාගාරය 5. අකාරාදිය 6. කැකුළ 7. කුහරය 8. සිවිය; ආවරණය. 9. පටපණු කූඩුව. 10. පියන. 11. නිසණිටුව. 12. කරඬුව. 13. කෝප්පය 14. කාමරය. 15. දරු බොක්ක.

කෝශාකෘති = 1. කොපුවක් ආකාර.

කෝශේය = 1. පට වස්ත්‍ර ජාතියක්.

කෝෂකාය = 1. බිජුව; අණ්ඩය.

කෝෂකාරි = 1. පට පණුවා.

කෝෂකාව්‍ය = (නොයෙක් කරුණු ඇතුරු කර) 1. අන්‍යොන්‍ය සම්බන්ධයක් නැතිව රචිත පද්‍යයන්ගෙන් යුක්ත කාව්‍යය.

කෝෂගෘහී = 1. කෝෂය ඇතුළ 2. මල්ල. 3. අණ්ඩකෝෂය.

කෝෂඵල = 1. ගෙඩි වර්ගයක්.

කෝෂය = (කෝෂක) 1. අණ්ඩ කෝෂය 2. බිජුව. 3. අකාරාදිය 4. දළුව.

කෝෂ්ඨාගාරය = 1. ගබඩාව. 2. අටුව.

කෝෂ්ඨාග්නිය = 1. බඩගින්න.

කෝෂාතක = 1. වැල. 2. කෙස්.

කෝෂාතකී = 1. පිපිඤ්ඤ වර්ගයක්. 2. රාත්‍රිය.

කෝහලස්වර = 1. තලාවක්.

කෞ

කෞකෘත්‍ය = 1. කුකුස 2. නපුරු ක්‍රියාව.

කෞක්ෂපාදිකයා = 1. ගොළුබෙල්ලන් මෙන් බඩගාගෙන යන සතා;

කෞටිකයා = 1. කපටියා. 2. මෝදිම්යා. හරක් ආදි සතුන් මරන්නා. 3. දඩයක්කාරයා.

කෞතුක = 1. කුහුල. 2. ආශා ඇති වූ. 3. ආශ්චර්යය. 4. කවුතුකය. 5. යමක් දැනගැනීමට ආශාවූ 6. ප්‍රීතිය 7. උත්සවය. 8. සෙල්ලම 9. ඉවසීම නැති කම. 10. හිතවත් ලෙස පිළිගැනීම. 11. පැරණි දුර්ලභ දේ.

කෞතුකාගාරය = (කෞතුක + අගාරය) 1 කටුගේ. 2. දුර්ලභ වස්තු ප්‍රදර්ශනය කරන තැන. 3. විවාහක යුවලක් පළමු වැනි රෑය ගතකරන කාමරය.

කෞතුහල = 1. ආශා ඇති. 2. යමක් දැන ගැනීමට ආශා ඇති.

කෞද්‍ර = 1. මී පැණි.

කෞබේර = 1· වෙසමුණි. 2. යක්ෂයන්ගේ රජ.

කෞමුද = 1. සුදු නෙළුම්; 2. කුමුදු.

කෞමුදබන්ධු = 1. හඳ පාන.

කෞමුදිය = 1. පසළොස්වක පොහොදින. 2. හඳ එළිය.

කෞමුදිවෘක්ෂය = 1. පනත් කද.

කෞමාරරූප = 1. කුමාර රූපය.

කෞමුද = 1. හෙළු පුල් 2. මාසයක නමක්.

කෞරය = 1 බූ ගැම.

කෞරව = 1. කුරු වංශය; කුරුවේ ගෝත්‍රය.

කෞෂිකයා = 1. ඇම්බැට්ටයා; පනික්කියා.

කෞල = 1. උසස් කුලයක උපන්.

කෞලාලක = 1. මැටියෙන් කළ.

කෞලීන = (කෞලේය) 1. වංශවත්.

කෞශල්‍ය = 1. දක්ෂ භාවය. 2. ප්‍රඥාව. 3. වාසනාවන්ත. 4. යහපත් තත්වය.

කෞශල්‍යා = 1. රාම කුමාරයාගේ මවු.

කෞශික = 1. ආලය. 2. සුවඳ වර්ගයක්.

කෞශිකායා = 1. ඉන්ද්‍ර දෙවියා. 2. අහි-ගුණ්ඩිකයා; නයි අල්ලන්නා 3. අකාරා-දියක් ලියන්නා 4. බකමූණා

කෞශේය = (කෝසෙය්‍ය බලන්න)

කෞශේය අංශු = 1. පටනූල් කෙඳි.

කෞසුම්භ = 1. වකුප්; හෙන්දිරික්කා ගස.

කෞස්තුභ = 1. විෂ්ණුගේ පපුවේ පළඳින මැණික. (මෙය කිරිමුහුද කලඹන විට පහළ වූවකැයි සැලකේ.) 2. ක්‍රිෂ්ණගේ පපුවෙහි පළඳින මැණික.

කෞස්තුභවක්ෂස් = 1. විෂ්ණු දෙවි.

ක්‍ර

ක්‍රකච = 1 කියත.

ක්‍රකචදන්තක = (ක්‍රකච දන්ත) 1. කියත් දත්.

ක්‍රකචදන්තක සඤ්ජීය = 1. කියතේ දත් සමූහය.

ක්‍රකචාදනය = තුන් පැති විදුරුව.

ක්‍රකර = 1. කොරවකා.

ක්‍රන්දන = 1. හැඬීම. 2. විලාප කීම. 3. විරුඬ වීම.

ක්‍රම = 1. පිළිවෙළ. 2. මාර්ගය.

ක්‍රම ආගත = 1. පිළිවෙළින් පැමිණියාවූ.

ක්‍රමඋල්ලඞ්ඝනය = 1. පිළිවෙළ කැඩීම.

ක්‍රමශඃ = 1. ක්‍රමානුකූල. 2. ටිකින් ටික.

ක්‍රමක්‍රමයෙන් = 1. ටිකින් ටික. 2. පිළිවෙළින්

ක්‍රමණ = 1. යැම. 2. අඩිය.

ක්‍රමානුක්‍රම = (ක්‍රමානුක්‍රමාගත) 1. එකකට පසු එකක් එන

ක්‍රමානුයාත = 1. පිළිවෙළින් පැමිණි.

ක්‍රමික = 1. පිළිවෙළක් ඇති.

ක්‍රමුක = 1. පුවක්.

ක්‍රමේලකයා = 1. ඔටුවා.

ක්‍රමෝන්නත = 1. ක්‍රමයෙන් උස් වූ.

ක්‍රය = 1. මිලදී බඩු ගැනීම.

ක්‍රයපත්‍ර = 1. විකුණුම්කරය. 2. සින්නක්කර ඔප්පුව.

ක්‍රයවික්‍රය = 1. වෙළඳාම; මිලදී බඩු ගැනීම හා බඩු දී මුදල් ගැනීම.

ක්‍රව්‍යය = 1. මස්. 2. අමු මස්.

ක්‍රාන්ත = 1. ආක්‍රමණය කළ. 2. හැඟුණු.

ක්‍රාන්ති = (ක්‍රාන්තික-ක්‍රාන්ති මණ්ඩල) 1. සූර්යයාගේ මාර්ගයට අයිති. 2. යැම. 3. මාරුවීම.

ක්‍රාන්ති පථ = 1. සූර්යයා යන මාර්ගය.

ක්‍රාඤ්චා = 1. කුරුල්ලා.

ක්‍රාබු = 1. කරාබුකැටි. 2. කර්ණාභරණ විශේෂයක්. 3. මල් වර්ගයක්.

ක්‍රාමය = 1. ගෙවල් බිඳින්නන් විසින් පාවිච්චි කරනු ලබන එක් කොණක් වක්වූ යකඩයක්. 2. කරාමය.

ක්‍රි - ක්‍රී - ක්‍රු - ක්‍රූ - ක්‍රෝ - ක්‍රෞ

ක්‍රකර = 1. සිවදෙවියා. 2. ආහාර දිරවීමට වුවමනා කරන වාතය. 3. ජඨරාග්නි වාතය.

ක්‍රිමි = 1. පණුවා 2. පණු රෝගය. 3. කුඩා සතා

ක්‍රිමි කර්ණ = 1. කණෙහි පණුවන් ඇතිවීම.

ක්‍රිමි කුල = 1. පණු ජාති. 2. පණු සමූහය.

ක්‍රිමි දන්ත = 1. එකම් දත් රෝගය.

ක්‍රිමි නාශක = 1. පණුවන් නසන.

ක්‍රියා = 1. කිරීම 2. කරන දෙයට අයිති. 3. ක්‍රියා පද. 4. ආරම්භය.

ක්‍රියා ආදි දීපක = 1. දීපකාලඞ්කාරයෙහි ප්‍රභේදයක්.

ක්‍රියා කල්ප = 1. කාව්‍යලක්ෂණ ප්‍රකාශක ශාස්ත්‍රය.

ක්‍රියා කාරක පද සම්බන්ධය = 1. කර්තෘ - කර්ම - ක්‍රියා ආදි කාරකයන් ගැලපීම.

ක්‍රියාකාරකම = 1. කල් කිරියාව.

ක්‍රියා කාරයා = 1. කරන්නා.

ක්‍රියාකාරී = 1. ක්‍රියා කරන සුලු.

ක්‍රියාධිකාරයා = 1· කළමනාකරු.

ක්‍රියානුරූප = 1. ක්‍රියාවට සුදුසු.

ක්‍රියාත්මක = 1. ක්‍රියා කරන; වැඩ කරන.

ක්‍රියාපද = 1. ක්‍රියාවන් ප්‍රකාශවන පද; ක්‍රියාව දක්වන පදය.

ක්‍රියාපර = 1. උද්යෝගී. 2. කඩිසර. 3. උනන්දුව ඇති.

ක්‍රියා මධ්‍ය දීපක = 1. දීපකාලඞ්කාරයෙහි භේදයක්.

ක්‍රියේන්ද්‍රිය = 1. ක්‍රියා කිරීමට උපකාරවන ශරීරයෙහි අවයවය.

ක්‍රියාවාදී = 1. පින් පව් වල විපාක ඇතැයි කියන.

ක්‍රියා විරෝධ = 1. ක්‍රියාවෙහි වරද.

ක්‍රියාවිශේෂණ = 1. ක්‍රියා පද වලට යෙදෙන විශේෂණ.

ක්‍රිස්තියානි කාරයා = 1. ක්‍රිස්තියානි ආගම අදහන්නා.

ක්‍රීඩා = 1. සෙල්ලම්.

ක්‍රීඩා කාරයා = 1. සෙල්ලක් කාරයා 2. ක්‍රීඩා කරන්නා.

ක්‍රීඩනය = 1. සෙල්ලම.

ක්‍රීඩා කෙළි = 1· කෙළි සෙල්ලම්.

ක්‍රීඩා දශකය = 1. ක්‍රීඩාකරන අවුරුදු දහය; එකොළොස් වැනි අවුරුද්දෙහි පටන් විසි වැනි අවුරුද්ද දක්වා ඇති කාලය.

ක්‍රීඩා භවන = 1. ක්‍රීඩා කරන ගෙය

ක්‍රීඩාභාණ්ඩ = 1. සෙල්ලම් බඩු.

ක්‍රීඩා භූමිය = 1. සෙල්ලම් පිට්ටනිය.

ක්‍රීඩා මණ්ඩලය = 1. ක්‍රීඩා භූමිය

ක්‍රීඩාශීලී = 1. ක්‍රීඩාවන්හි (නිතර) ඇලුණු.

ක්‍රීත = 1. මිලේට ගත්. 2. මිලයට ගත් දේ.

ක්‍රීතයා = (ක්‍රීතකයා) 1. මිලයට ගත් අය, 2. ඇතිකරගත් දරුවා.

ක්‍රූකලාස = 1. හූනා. 2. කටුස්සා.

ක්‍රූච්ඡ්‍ර = 1. ශරීරයෙහි වේදනාව. 2. ආගමෙන් දෙන දඬුවම.

ක්‍රුක්තික = 1. සඳුගෙන් කුස් වැත්තා.

ක්‍රුද්ධ = 1. කිපුණු.

ක්‍රූර = 1. රෞද්‍ර. 2. දරුණු.

ක්‍රූරකර = 1. ඉතා රෞද්‍ර. 2. බිහිසුණු.

ක්‍රූර ලෝචනය = 1. නපුරු පෙනීම. 2 සෙනසුරා.

ක්‍රූර ආකෘතිය = 1. බිහිසුණු රූපය.

ක්‍රෝධ = 1. වෛරය. 2. කෝපය.

ක්‍රෝධ අග්නි = 1. ක්‍රෝධය නමැති ගින්න.

ක්‍රෝධ අරති = 1. ක්‍රෝධය හා අරතිය.

ක්‍රෝධකාර = 1. තද කෝපයෙන් යුත්; වෛර (ක්) කාර.

ක්‍රෝධන = 1. ක්‍රෝධකරන.

ක්‍රෝධී = ක්‍රෝධ ඇති.

ක්‍රෝශ = 1. කෑගෑම. 2. දුනු පස් සියයක දුර.

ක්‍රෞඤ්චරාජ = 1. බුදුන් වහන්සේගේ ශ්‍රී පාදයෙහි පිහිටි ලක්ෂණයක්. 2. ප්‍රධාන කොස් ලිහිණියා.

ක්‍රෞර්යය = 1. ක්‍රූර භාවය.

ඛ

ඛ = 1. ස්වර්ගික. 2. දිව්‍යමය. 3. අහස 4. දෙව්ලොව 5. ශූන්‍යය. 6. ඉන්ද්‍රිය.

ඛග = (ඛගයා) 1. ආකාශචාරියා; අහසින් යන්නා. 2. සූර්‍ය්‍යයා. 3 කුරුල්ලා. 4. දෙවියා. 5. සුළඟ. 6. පලඟැටියා 7. ඊය.

ඛග්ග = 1. කඩුව. 2. කඟවේණා.

ඛග්ගකෝෂ = 1. කඩු කොපුව.

ඛග්ගගාහක = 1. රජුගේ කඩුව ගෙනයන්නා; කඩු කාරයා.

ඛග්ග තල = 1. කඩු තලය.

ඛග්ගධර = 1. කඩු දරණ. 2. කඩු පැලඳ ගත්

ඛග්ගමිග = 1. කඟවේණා.

ඛග්ගවිසාණ = 1. කඩුවක් වැනි අඟක් ඇති සතා; කඟවේණා.

ඛගේශ්වරයා = 1. අහසේ ප්‍රධානයා. 2. ගුරුළා.

ඛගෝල = 1. ගෝලාකාරව පෙණෙන අහස.

ඛචිත = 1. (මැණික් ආදිය) ඔබ්බන ලද.

ඛජ්ජ = 1. කඩා කෑ යුතු දෙය. 2. ඛාද්‍ය; කැවිලි.

ඛජ්ජක = 1. ඛාද්‍ය; කැවිලි.

ඛජ්ජන්තර = 1. කැවිලි වර්ග.

ඛජ්ජු = 1. කුෂ්ටය. 2. කැසීම.

ඛජ්ජූරි = 1. ඉඳි ගස.

ඛජ්ජුර = 1. කජු.

ඛජ්ජෝත = (ඛජ්ජෝපත) 1. කණ මැදිරියා.

ඛඤ්ජ = 1. කොරා.

ඛඤ්ජන = 1. කොර ගැසීම 2. ආසිත්තියා? 3. පක්ෂියෙක්.

ඛඤ්ජනයා = (ඛ‍ ‍ රිටයා) 1. වෙරළ වටුවා.

ඛඤ්ජාව = 1. කවි විශේෂයක්.

ඛට්වා = 1. ඇඳ.

ඛඩ්ග = 1. කඩුව. 2. කඟවේණා අඟ.

ඛඩ්ග පට්ට = 1. කඩු තලය. 2. කඩු පත.

ඛඩ්ග පත්‍ර = 1. කඩුපත.

ඛඩ්ග මාලා = (ඛඩ්ග කම්) 1. වධ්‍ය. කඩුවෙන් පෙනගසා මාලාවක් මෙන් කරන වධය.

ඛඩ්ග මේලාව = 1. කඩු පටිය.

ඛඩ්ග යෂ්ටි = 1. රිටක් වැනි දිග කඩුව.

ඛඩ්ග ශිල්ප = 1. කඩු ශිල්පය; කඩුවෙන් සටන් කරන හැටි උගන්වන ශාස්ත්‍රය.

ඛඩ්ග හස්ත = (ඛග්ග හත්) 1. කඩු ගත් අත් ඇති.

ඛඩ්කාව = 1. රටහුණු.

ඛඩ්ගමත්ස්‍යයා = 1. තලපතා.

ඛණ = 1. ක්ෂණය. 2. මොහොත. 3. තත්පරය. 4. අවස්ථාව.

ඛණන = 1. සෑරීම.

ඛණකයා = 1. හාරන්නා. 2. මීයා. 3. ගෙවල් බිඳින්නා. 4. පතල් හාරන්නා.

ඛණ සම්පදා = 1. ක්ෂණ සම්පත්තිය.

ඛණනන = 1. කනමින්. 2. සාරමින්.

ඛණික ප්‍රීති = 1. ක්ෂණික ප්‍රීතිය.

ඛණ්ඩ = 1. කොටස. 2. කැබෙල්ල. 3. කැඩීම. 4. බිඳීගිය. 5. කැඩීගිය.

ඛණ්ඩ කාව්‍ය = 1. සර්ගාදි පරිච්ඡේද රහිත කාව්‍යය.

ඛණ්ඩ ගණන = 1. ඛාගා ගණන.

ඛණ්ඩ ගුඩ = 1. සුකිරි.

ඛණ්ඩ දන්ත = 1. කැඩුණු දත් ඇති. 2. වැටුණු දත් ඇති.

ඛණ්ඩන = 1. කැඩීම. 2. බිඳීම. 3. විරුද්ධ තර්කයන් පහකිරීම.

ඛණ්ඩනීය = 1. කැඩිය යුතු.

ඛණ්ඩ පරශුවා = 1. කුඩා කැබලිවලට කපන්නා. 2. සිව දෙවියා. 3. පරශුරාම 4. රාහු.

ඛණ්ඩ ඵුල්ල = 1. කැඩුණු දේ. 2. (ගොඩ-කැගිල්ලක) කැඩුණු පිපුරුණු තැන්.

ඛණ්ඩ ඵුල්ල ප්‍රතිසංස්කරණ = 1. කැඩුම්-බිඳුම් සෑදීම.

ඛණ්ඩ භාව = 1. කඩවීම.

ඛණ්ඩ ලවණ = 1. කළු ලුණු. 2. ආකාර ලුණු.

ඛණ්ඩය = 1. කැබෙල්ල. 2. කොටස. 3. පරිච්ඡේදය. 4. කැඩුම.

ඛණ්ඩ ශර්කරා = (ඛණ්ඩ සිතා) 1. සුකිරි; ගල් කණ්ඩු.

ඛණ්ඩහාර = 1. මෝරු.

ඛණ්ඩාදි භාව = 1. (දත්) වැටීම් ආදිය. 2. කඩ කිරීම.

ඛණ්ඩිත = 1. කඩන ලද. 2. බිඳින ලද. 3. ඡේදයට පැමිණවූ.

ඛණ්ඩිතල = 1. දෙපස මුවාත ඇති අවියක්.

ඛණ්ඩ්‍ය = 1. කැඩිය හැකි. 2. විනාශ කළ හැකි.

ඛන්ධ = 1. කඳ කුමරු. 2. උස් ඉස්ම. 3. යහපත් ගතිය. 4. උරහිස. 5. රාශිය. 6. සමූහය. 7. ශරීරය. 8. ගසක කඳ. 9. පඤ්චස්කන්ධයෙන් එකක්.

ඛන්ධක = 1. පරිච්ඡේදය. 2. විනය පිටකයේ කොටසක්.

ඛන්ධ පඤ්චක = 1. රූප වේදනාදි සමූහ පස.

ඛන්ධාවාර = 1. කඳවුර. 2. යුධ හමුදාවේ තාවකාලික නවාතැන.

ඛන්ධබීජ = 1. කඳ පැළවන ගස් ජාති.

ඛනිජ = 1. ආකරයෙහි උපන්. 2. ලෝහ.

ඛනිය = (ඛනී) 1. ආකාරය; පතලය.

ඛත = 1. සාරණලද. 2. උදුරණ ලද. 3. තුවාලවූ.

ඛත්ත = 1. රාජ්‍ය පාලන ධර්මය. 2. ක්ෂත්‍රිය ධර්මය.

ඛත්ති = (ඛත්තිය) 1. ක්ෂත්‍රියයා. 2. යුධ කරන්නා.

ඛත්තිය කඤ්ඤා = 1. රාජ කුමාරිය.

ඛත්තිය කුල = 1. රාජ වංශය.

ඛත්තිය මහාසාල = 1. ඉතා ධනවත් ක්ෂත්‍රියයා.

ඛත්තිය මායා = 1. රාජ වංශිකයන්ගේ රහස්.

ඛත්තියා = (ඛත්තියානි) 1. රාජ වංශික කාන්තාව.

ඛත්තු = 1. රථාචාර්යයා 2. රජුගේ අභ්‍යන්තර උපදේශකයෙක්. 3. දොරටු පාලයා.

ඛදිර = 1. ඉන්ද්‍ර දෙවියා. 2. කිහිරිගස. 3. හඳ 4. කතරගම දෙවි.

ඛදිර දේහලී = 1. කතරගම දෙවි. 2. විෂ්ණුගේ ඇතා.

ඛදිරඞ්ගාර = (ඛදිර + අඞ්ගාර) 1. කිහිරි අඟුරු.

ඛන්ති = 1. ක්ෂාන්තිය 2. ඉවසීම. 3. කැමැත්ත.

ඛන්ති බල = 1. ඉවසීමේ බලය.

ඛන්ති මන්තු = 1. ඉවසීම ඇති.

ඛන්තු = 1. ඉවසන්නා.

ඛඳුදුක් = 1. පඤ්චස්කන්ධ දුඃඛය.

ඛඳු = 1. ස්කන්ධ.

ඛඳු පිරිනිවන් = 1. ස්කන්ධ පරිනිර්වාණය.

ඛඳු ලෙව් = ස්කන්ධ සංඛ්‍යාත ලෝකය.

ඛප්පරය = 1. දිය කොතලය. 2. හරිශ්චන්ද්‍රගේ නගරය.

ඛම = 1. ඉවසන. 2. උහුලන. 3. සමර්ථ.

ඛමණීය = 1. අහස් මැණික. 2. සූර්යයා.

ඛමන්ත – 1. ඉවසන. 2. සමාවෙන.

ඛමන = 1. ඉවසීම. 2. රුචිවීම.

ඛමා – 1. ඉවසීම.

ඛම්භ = 1. නුන තහුන කෝටිය. 2. නුන තහුන සිය.

ඛම්භකත = 1. දෙ අත් තුනටියෙහි ගසාගත්.

ඛය = 1. ක්ෂයවීම. 2. විනාශය. 3. ගෙවීයාම. 4. අහස. 5 ඉන්ද්‍රිය.

ඛය වය = 1. ක්‍රමයෙන් නැසීම හා එක් පැහැර නැසීම.

ඛර = 1. රළු. 2. කර්කශ. 3. කොටළුවා. 4. සැර. 5. කහට. 6. තියුණු. 7. නපුරු. 8. උණු. 9. බූරුවා. 10. කපුටා 11. කොකා. 12. තණ කොළ වර්ගයක්. 13. තද.

ඛරත්ත = (ඛරතා) 1. රළු බව.

ඛර නාදය = 1. බූරු හඬ.

ඛර සත්‍ර = 1. ධාන්‍ය වර්ගයක්. 2. ශත්ක්ක ගහ. 3. භාජන විශේෂයක්.

ඛර ස්පර්ශ = 1. රළුවූ පහස.

ඛර ස්වර = 1. රළු හඬ.

ඛරලෝම = 1. යක්ෂයෙක්.

ඛර ලෝමන් = 1. නාග රාජයෙක්.

ඛරලෝහ = 1. පිත්තල.

ඛරස්කන්ධ = 1. ඉඳි ගස.

ඛල = 1. කලවිට. 2. ගොයම් මඩින තැන. 3. දුර්ජනයා. 4. නීච.

ඛලග්ග = 1. ගොයම් පෑගීමට පටන් ගැන්ම.

ඛලපූ = (ඛලපූවා) 1 අමදින්නා; අතුගාන්නා.

ඛල මණ්ඩලය = 1 කමත; කලවිට. 2. ගොයම් මැඩීම සඳහා සකස්කළ මණ්ඩලාකාර භූමිය.

ඛලන්ත = 1. පැකිලෙන; පැකිලෙමින්.

ඛල්ව = 1. කොල්ලු.

ඛලාධාරා = 1 කැරපොත්තා.

ඛලිනා = 1. ගම්මිරිස්.

ඛලිත = 1. පටලැවුණු. 2. හැපුණු. 3. වැරදුණු. 4· පරාජය.

ඛලිත්වා = 1. හැපී. 2. පැකිළී.

ඛලි = 1. තලප.

ඛලින = 1. (අශ්වයාගේ) කටකලියාව.

ඛලු = 1. ඒකාන්තයෙන් (පද පූරණයෙහිත් යෙදේ)

ඛලුංකාශ්ව = 1. නීච ජාතික අශ්වයා.

ඛලෝක්තිය = 1. ගැරහීම. 2. රළු වචන කීම. 3. පුරුෂ වචන කීම.

ඛලෝඩි = 1. සැළිය. 2. භාජන විශේෂයක්.

ඛ්‍යාත = 1. කියන ලද. 2. ප්‍රසිද්ධ.

ඛ්‍යාති = 1. ප්‍රසිද්ධිය.

ඛ්‍යාපනය = 1. කීම. 2. ප්‍රකාශය. 3. කියාදීම. 4. තේරුම් කරදීම.

ඛාජ = 1. කද.

ඛාජික = 1. බැදපු 2. පොරි.

ඛාණුක = 1. කණුව. 2. උල.

ඛාණුක මාර්ග = 1. කණු හෝ උල් ගසා එහි බැඳි රැහැන් ආදියෙහි එල්ලී යායුතු මාර්ගය.

ඛාත = 1. හාරණ ලද.

ඛාතක = 1. හැරුවළ. 2. හතරැස් පොකුණ.

ඛාදක = 1. කන්නා; කන.

ඛාදන = 1. කෑම. 2. සපා කෑම.

ඛාදනීය = 1. කෑ යුතුදෙය. 2. රස කැවිලි. 3. සපා කෑ යුතු.

ඛාදාපන = 1. හපා කැවීම.

ඛාදික = 1. කන ලද.

ඛාදිකා = 1. කන්නී.

ඛාදී = 1. කන්නා.

ඛාද්‍ය = 1. කෑයුතු. 2. කැවිලි.

ඛාද්‍ය භෝජ්‍ය = 1. කැවිලි හා සූප ව්‍යඤ්ජන.

ඛාරී = 1. ද්‍රෝණ සතර.

ඛාණු = 1. උල. 2. කණුව.

ඛාර = 1. අළු. 2. ලුණුමුසු පස්. 3. කරමැටි 4. බුසල් තුන. 5. මල.

ඛාරක = 1. අළුත් මොට්ටුව. 2. ඉඳු සල් ගස·

ඛාරරස = 1. ලුණුකාරම් රසය.

ඛාරාපතච්ඡික කම්ම = 1. වෑ ආදියෙන් සැස ලුණු කාරම් ආදිය දැමීමෙන් කරන වධය.

ඛාරි = 1. ඛාරි සතර. 2. කුරුණි දහසය. 3. බුසල් තුන. 4. උරිය. 5. සහල්ල.

ඛාරිකාජ = 1. සහල්ල හා කත්ලිය.

ඛාරිභාණ්ඩ = 1. පිරිකර බඩු හෝ පිරිකර කද.

ඛාරිවිධ = 1. සහල්ල හා කත්ලිය.

ඛාරික = 1. කර රස. 2 කර රසැති.

ඛාරෝදිකා = 1. කාරම්දිය ඇති නියරක්.

ඛිඩ්ඩා = 1. ක්‍රීඩාව; සෙල්ලම.

ඛිඩ්ඩාදශක = 1. ක්‍රීඩා දශකය. 2. බාල්‍යකාලය.

ඛිඩ්ඩාරති = 1. ක්‍රීඩාවෙහි ආශාව.

ඛින්න = 1. දමන ලද. 2. පීසිකළ.

ඛිත්ත චිත්ත = 1. උමතු සිතැති.

ඛිත්ත දේහ = 1. මහන්සි වූ ශරීරය.

ඛිප = 1. ඉස්මක්. 2. කෙමින. 3. මසුන් අල්ලන කරක් ගෙඩිය.

ඛිපන = 1. ඉවතට දැමීම. 2 වීසි කිරීම. 3. දණ්ඩ ගැසීම. 4. හෙළීම.

ඛිප්ප = 1. ඉක්මන්. 2. වහා සිදුවන.

ඛිප්පං = 1. වහාම. 2. ඉක්මන්.

ඛිල = 1. සිතේ කිලුට. 2. බාධාව. 3. අස්වද්දා නැති. 4. හිස්.

ඛීණ = 1. ක්ෂයවූ. 2. ගෙවීගිය. 3. විනාශ කළ.

ඛීණබීජ = ක්ෂයවූ උත්පත්ති හේතු ඇති.

ඛීණාසව = 1. ආශ්‍රවයන් ක්ෂය කළ. 2. රහතුන් වහන්සේ.

ඛීයන = 1. ගෙවීයාම. 2. නුගුණ හෝ දොස් කීම.

ඛීයමාන = 1. ක්ෂයවෙන. 2. ගෙවෙන. 3. දොස් නගන.

ඛීර = 1. කිරි.

ඛීරණ්ණව = 1. කිරි මුහුද.

ඛීරපක = 1. කිරි බොන.

ඛීරපාසාන - 1. කිරි පැහැති මොළොක් ගල.

ඛීරමාලී = 1. කිරි වැනි දිය ඇති මුහුදක්.

ඛීරිකා = 1. කිරිපලු ගස.

ඛීරෝදන = 1. කිරිබත.

ඛීල = 1. කණුව. 2. උල. 3. කොක්ක

ඛුජ්ජ = 1. කුදු. 2. කුදා.

ඛුජ්ජා = 1. කුදී; කුදු ස්ත්‍රී.

ඛුදා = 1. බඩගින්න.

ඛුංසන = 1. නින්දා කිරීම. 2 කුලමල කීම.

ඛුද්ද = 1. කුඩා. 2. සුළු. 3. කණාමී මැස්සන්ගේ පැණි.

ඛුද්දක = 1. කුඩා. 2. මහත් නොවූ.

ඛුද්දක නිකාය = 1. කුඩා වූ ධර්මස්කන්ධ සඞ්ග්‍රහ කොට කළ මහා ග්‍රන්ථය. 2. සූත්‍ර පිටකයේ කුඩා පොත් වලින්යුත් සඟිය.

ඛුද්දක පාඨ = 1. ඛුද්දක නිකායෙහි මුල් පොත.

ඛුද්දක ප්‍රීතිය = 1. ඇගේ ලොම් කෙළින් සිටීමෙන් වන ප්‍රීතිය.

ඛුද්දා = 1. කණාමීමැස්සා.

ඛුද්දානුඛුද්දක = 1. කුඩාවූත් ඉතා කුඩාවූත්.

ඛුප්පිපාසා = 1. බඩගින්න හා පිපාසය.

ඛුප්පිපාසික = 1. සා පිපාස දෙකින් පෙළෙන ප්‍රේත කොටස.

ඛුර = 1. (සිවුපාවුන්ගේ) කුරය. 2. දැලිපිහිය. 3. (සක්තැබ) බෙත් වර්ගයක්.

ඛුරකෝස = 1. දැලිපිහි කොපුව.

ඛුරග්ග = 1. හිසකෙස් බාන (ගෙය) තැන.

ඛුරසම්පාත = 1. කුරගෑවීම·

ඛුරචක්ක = 1. උරචක්‍රය.

ඛුරධාරා = 1. දැලිපිහියා මුවහත.

ඛුරණාසා = 1. පැතලි නාසයක් ඇති.

ඛුරප්ප = 1. ඊතලය.

ඛුරභණ්ඩ = 1. හිස බෑමට ගන්නා දේ.

ඛුරමුණ්ඩ = 1. මු ගෑ හිසැති.

ඛුරාකාති = 1. කුරයක් වැනිවූ.

ඛෙචර = 1. අහසේ යන. 2. සිවදෙවියා. 3. මන්ත්‍ර බලය ඇති ගුලියක්. 4. ගම. 5. පළිහ. 6. රසදිය.

ඛේට = 1. පළිහ. 2. කඵ. 3. දඩයම. 4. නීච. 5. සුළඟ. 6. හද. 7. ඊ ගහ. 8. කුරුල්ලා. 9. වලාකුල. 10 ග්‍රහතාරකාව.

ඛේටක = 1 පළිහ. 2. ගම. 3. ගම්බද. 4. බලරාමගේ පොල්ල. 5. සෙම. 6. දඩයම.

ඛෙත්ත = 1. කෙත. 2. කුඹුර. 3. යෝග්‍ය-තැන. 4. යමක් උපදනා භූමිය.

ඛෙත්තකම්ම = 1· කුඹුරු වැඩ.

ඛෙත්තගෝපක = 1. කුඹුරු රකින්නා.

ඛෙත්තසාමික = 1. කුඹුරේ අයිතිකාරයා

ඛෙත්තාජීව = 1. ගොවියා.

ඛේද = 1. කනගාටුව. 2. කලකිරීම. 3. දුක. 4. වෙහෙස. 5. බැගෑපත් බව. 6. සංවේගය

ඛේදජනක = 1. සංවේගය උපදවන.

ඛේදවාචකය = 1. සංවේග දායක කථාව; දුක් ගෙනදෙන පුවත.

ඛේදාන්විත = 1. දුක් සහිත. 2. ගිරිහැරයෙන් යුත්.

ඛේප = 1. දැමීම. 2. විසිකිරීම.

ඛේපන = 1. ගතකිරීම. 2. ගෙවා දැමීම.

ඛේපිත = 1. ගතකළ. 2. ගෙවූ. 3 ක්ෂය කළ.

ඛේම = 1. නිර්භයවූ. 2. හිතේ ප්‍රීතිය. 3. වාසනාව. 4. ආරක්ෂා සහිත. 5. අභය ස්ථානය. 6. නිවන. 7. ප්‍රීතිය. 8. ක්ෂේමය.

ඛේමඞ්කර = 1. ක්ෂේමය කරන.

ඛේමප්පත්ත = 1. නිර්භය ස්ථානයට පැමිණි. 2. නිවනට පැමිණි.

ඛේමභූමි = 1. ක්ෂේම භූමිය. 2. උවදුරු නැති පෙදෙස.

ඛේමී = 1. ක්ෂේම ඇති. 2. නිර්භය ස්ථානයට පැමිණි.

ඛේය = 1. අගල.

ඛේළ = (ඛේළෝ) 1. කෙළ. 2. ආරක්ෂා ස්ථානය.

ඛේළධාරා = 1. වැල නොකැඩී වැටෙන කෙළපාර.

ඛේළමල්ලක = (ඛේළමාල) 1. පඩික්කම.

ඛේළනා = (ඛේලාව-ඛේලා) 1. ක්‍රීඩාව; සෙල්ලම.

ඛේලය = 1. කවටකම. 2. ආරක්ෂාව.

ඛේළි = 1. ගීතිකාව. 2. ඊගහ. 3. ඉර. 4. සතා. 5. කුරුල්ලා.

ඛේලාසිකා = 1. කෙළතොල්ලා 2. කෙළ ගිලින්නා.

ඛෝ = 1. වනාහි (පද පූර්ණයෙහිත් වේ.)

ඛෝඩ = 1. (ඛෝර) 1. කොර; හොන්ඩි.

ඛෝභ = 1. කැලඹීම.

ඛෝභන = 1. කැලැම්බීම.

ඛෝම = 1. කොමු පිළී. 2. පට්ටාවලින් වියූ.

ඛෝමදුස්ස = 1. කොමුපිළිය.

ඛෝලක = 1. ඇතිළිය. 2. යුධ තොප්පිය. 3. පුවක් ලෙල්ල. 4. තුඹස. 5. තාච්චිය.

ග

ග = 1. ගමන. 2. ගණදෙවියා. 3. ගීතය.

ගං = 1. ගම්. 2. ගංඟා. 3. අහස්ගඟ. 4. ගඟානදිය.

ගං අරන් = 1. ගඟ අසබඩ කැලය

ගං අස = 1. ගඟ සමීපය.

ගං අසබඩ = (ගං අහබඩ) 1. ගඟ අද්දර. 2. ගං ඉවුර.

ගං ඉවුර = 1. ගඟ අද්දර; ගංතෙර.

ගංකනයා = 1. මාළු වර්ගයක්.

ගංකන්ද = (ගංකඳු) 1. ගඟ දෙපස තිබෙන උස් බිම් තීරය.

ගංකොටු = 1. කෙත. 2. කුඩා ගම.

ගංගරුවා = 1. ඉස්සා.

ගංගා = 1. ගඟ. 2. ගංගා නම් ගංගාව.

ගංඝාත් = 1. යම් කිසි ඉඩමකදී වල් සතෙකු මැරුවහොත් ඒ ඉඩමේ අයිතිකාරයාට අයිති යයි සම්මත ඒ සතාගේ පස්සා ගාත් දෙකින් එකක්. 2. ගම් කොටසට අයිති ගාතය.

ගංගාතීර = 1. ගං ඉවුර.

ගංගාදේවී = 1. පාර්වතී; උමාදේවි

ගංගාවාර = 1. ගං මුවදොර; මෝය.

ගංගාධාරය = 1. ගඟ ගලායන භූමිය. 2. ගඟෙන් ජලය ලැබෙන ප්‍රදේශය.

ගංගාධාරයා = 1. ගංගාව උසුලන්න. 2. සිව දෙවියා. 3. මහ මුහුද.

ගංගාප්‍රවාහය = 1. ගංවතුර ගැලීම.

ගංගාසෝත = 1. ගඟේ සැඩ පහර.

ගංගෙය්‍ය = 1. ගංගානම් ගඟට අයිති. 2. ඇත් කුලයක්.

ගංගොඩ = 1. ගම; ගම්මානය. 2. ගඟ අද්දර.

ගංගෝදය = 1. ගංගා නම් ගඟේ ජලය.

ගංචු = (ගාංචු) 1 ඉතේ බඳින පටිවලට අල්ලා තිබෙන ලෝහමය උපකරණයක්.

ගංජන = 1. සුදු ලූනු.

ගංජා = 1. කංසා. 2. දුම්බීමට සකස් කොටගත් කංසා කොළ

ගංතෙර = 1. ගංගා තීරය; ගංඉවුර.

ගංතොටු = 1. ගඟේ තොටුපල.

ගංතල = (ගංතලා) 1. කුඩා ආදිය විවීමට ගන්නා (බට) ගස් ජාතියක්.

ගංනිල = 1. රාජකාරිය කරන තෙක් භුක්ති විඳින කුඹුර.

ගංපඩුරු = 1. වගා කරන ඉඩම සඳහා ඉඩම් හිමියාට දෙන බද්ද.

ගංපල්ල = 1. ගඟේ පතුල.

ගංපවුර = 1. ගඟේ බැඳි මැසි වර්ගයක්.

ගංපිටු = 1. ගඟ මත්ත.

ගංබඩ = (ගඟබඩ) 1. ගඟ අසල; ගංතෙර.

ගංභිත්ති = 1. ගං ඉවුර.

ගංමුවදොර = (ගං මෝදර) 1. ගංමෝය; ගඟ මුහුදට වැටෙන තැන.

ගංරන් = 1. ගඟේ වූ රත්රන්.

ගංවක් = 1. ගඟෙහි වංගුව.

ගංවතුර = 1. ගඟේ වතුර. 2. ගඟ ගලා එන දිය කඳ.

ගංවිල්ල = 1. ගඟේ ජලය පිටාරයේ නොයාම සඳහා බඳින බැම්ම.

ගංසබා = 1. ගම්වාසීන්ගේ ආරාවුල් නිරවුල් කිරීම සඳහා පැවැත්වෙන සභාව. 2. ගම් කායයී සභාව.

ගංසබා උසාවිය = 1. ගම්කායයී සභාවලට අයත් ප්‍රදේශ වාසීන්ගේ සුළු නඩු විසඳන අධිකරණ ශාලාව.

ගංසිලිල් = 1. ගඟේ දිය.

ගංහෝ = 1. ගංගා, ඔයවල්.

ගගඳු = 1. දුම්මල.

ගගන = 1. අහස. 2. සීනුව; මිණිගෙඩිය.

ගගනඅඞ්ගණ = 1. අහස නමැති මලුව. 2 චන්ද්‍රිකාතලය.

ගගන උදර = 1. අහස් කුස. 2. අහස් ගැබ.

ගගනගංගා = 1. අහස් ගඟ.

ගගනතල = 1. අහස් තලය.

ගගනයාත්‍රා = (ගගන යාන) 1. අහස් යාත්‍රා.

ගගනෝදර = (ගගන + උදර) 1. අහස් කුස.

ගගා = 1. ගාමින්; තවරමින්. 2. ගායනා කරමින්.

ගග්ගර = 1. ගිගුරුම. 2. ඝෝෂාව.

ගග්ගරී = 1. මයින හම.

ගඟ = 1. විශාල දිය පාර. 2 ගඞ්ගාව.

ගඟා = 1. ගඞ්ගා නම් ගඟ. 2. උමාදේවී.

ගඟාදර = 1. (අහස් ගඟ සවකීය ජටාවෙන් දරතැයි කියනු ලබන) ඊශ්වරයා.

ගඟට හේදමට = 1. ගඟ සමග ඇති අමනාපය නිසා. 2. ගඟෙන් පළිගැනීම පිණිස.

ගඟබඩ = 1. ගඟ අයිනේ; ගඟ අසල.

ගඟරෝහණ = 1. ගඞ්ගාරෝහණ.

ගඟහැලි = 1. එනම් සිංහල වෘත්තය.

ගඟලෝ = 1. රසකිඳ.

ගඟුල = 1. ගඞ්ගාව පටන් ගන්නා උල්පත. 2. කඳු හෙල් ආදියෙන් ඇද වැටෙන දිය ඇල්ල.

ගඟුලැල්ල = 1. ඇල්ල; දිය ඇල්ල.

ගඟුල්හැලි = 1. දිය ඇල්ල.

ගච්ඡ = 1. පඳුර. 2. කුඩා ගස. 3. පැලෑටිය.

ගජ = 1. ඇතා. 2. විශාල. 3. ඡන්දසක්. 4. ගොඩැල්ල. 5. තිප්පිලි වෙසෙසක්. 6. මැණික් පතලය. 7. දෙරියන.

ගජඅත = (ගජකර-ගජත්කර) 1. ඇත් සොඬය.

ගජඅරි = 1. ඇතාගේ සතුරා. 2. සිංහයා.

ගජආරෝහණ = 1. ඇතුන් පිට නැඟීම.

ගජඉන්ද්‍ර = 1. නායක හස්තියා; මහ ඇතා.

ගජකුම් = (ගජකුම්භ) 1. ඇතාගේ නළල. 2. කුම්භස්ථලය.

ගජකුඹු = 1. ඇත් කුඹ. 2. දෙහි ගස.

ගජකොපොල = 1. ඇතුන්ගේ කපෝලය.

ගජකෝවිලාර = 1. කොබෝලීල වර්ගයක්.

ගජගැජුම් = 1. ඇතුන්ගේ ගජිතය. 2. කුඤ්ච නාදය.

ගජගැමි = 1. එනම් සිංහල වෘත්තය. 2. ඇතු මෙන් යන්නා.

ගජඝොෂ = 1. ඇතුන්ගේ හඬ.

ගජඝටා = 1. හස්ති සමූහය.

ගජචක්‍රය = 1. ඇත් රැළ.

ගජචර්ම = 1. ඇතුගේ සම. 2. එනම් කුෂ්ට රෝගය.

ගජතා = 1. අලි රංචුව.

ගජතිප්පිලි = 1. එනම් තිප්පිලි වර්ගය.

ගජදත = (ගජ දන්තය) 1. ඇත් දත.

ගජදන්තඵල = 1. තැකිරි වෙසෙසක්.

ගජදන්තාස්‍ය = 1. ගණ දෙවියා.

ගජදල = 1. ඔසු වෙසෙසක්.

ගජනත් = 1. ඇත් හොඬය.

ගජනා = 1. තුවක්කු. 2. ගර්ජනා කරන.

ගජනායක = 1. ඇතුන්ගේ නායකයා.

ගජනායකනිලමේ = 1. ඇතුන් පිළිබඳ කටයුතු භාර නිලධාරියා.

ගජනිමිලන = 1; ඇතුන් බැලීම. 2. ඇතකු මෙන් මඳක් නෙත් විදහා බැලීම.

ගජපරතා = 1. ඔලිඳ ඇට.

ගජපඤ්ජර = 1. කවුළු වර්ගයක්.

ගජපිප්පි = 1. පොලොව. 2. ඇත් උරහිස.

ගජපුට = 1. ලොකු වළ. 2. ඖෂධ වර්ග භස්ම කිරීම සඳහා රියනක් ගැඹුරට හෑරූ වළ. 3. බෙහෙත් පුටදීමේ ක්‍රමයක්.

ගජපොතු = (ගජපෝතකයා) 1. ඇත් පැටවා.

ගජප්‍රිය = 1. කෙසෙල්.

ගජබලා = 1. සිංහයා 2. බැබිල.

ගජබාරජ = 1. සිංහල වීර නරපතියෙක්. (මෙතුමා නීලමහා යෝධයාගේද උපකාර ඇතිව සොළීරට සොළීන් සමග යුද්ධ කොට සිංහල වර්ගයාට ජය අත්කොට දුන්නේය.)

ගජ බින්නශ = 1. විශාල මුසාවාදය; ලොකු බොරුව.

ගජමද = 1. ඇතුන්ගෙන් ගිලිහෙන ද්‍රවයක්. 2. ඇත් මද. 3. සිංහයා.

ගජමුත්‍ර = 1. ඇතුන්ගේ දළ වල හටගන්නා මුතු වෙසෙසක්. 2. ඇතුන්ගේ හිසෙහි හටගන්නා මුතු?

ගජමුඳුන = 1. කුම්භස්ථලය.

ගජමේ = 1. හස්ති නමැති මේසය.

ගජමෝටනයා = 1. ඇතුන් බිය වද්දන්නා. 2. සිංහයා.

ගජඹ = 1. ගඬම්බා; ගායනය කරන්නා.

ගජ රාජ = 1. හස්ති රාජයා; මහ ඇතා.

ගජරූ = 1. ඇතුන් පිට යන්නා.

ගජරූ = 1. ඇතුන්ගේ රූප.

ගජලීය = 1. ගහ

ගජවක් = 1. ඇත් මුහුණ. 2. ඇත් මුහුණක් ඇත්තා; ගණදෙවි.

ගජ වදන = 1. ඇත් මුහුණ. 2. ගණදෙවි.

ගජ වලා = 1. ඇතා නමැති වලාකුළ. 2. මහ වලාකුළ.

ගජ වීථි = 1. චන්ද්‍ර - සූර්‍ය්‍යයන් ගේ ගමන් මාර්ගයක්.

ගජ සම් = 1. ඇත් හම්. 2. (ඇත් සමකින් සැරසුණු) සිව දෙවි.

ගජසමානකාමතා = 1. ඇතුට සමාන ගමන් ඇති බව. 2. අනු ව්‍යඤ්ජනයක්.

ගජ සිව් = 1. පොළොව.

ගජ සිංහ = 1. සිංහ විශෙෂයක්.

ගජා = 1. මඩම. 2. පැල. 3. තැබෑරුම.

ගජා ජීව = 1. ඇත් හොව්වා.

ගජානන = 1. ඇත් මුහුණ. 2. ගණ දෙවි.

ගජාරියා = (ගජ අරි බලන්න.)

ගජා සන = (ගජා දන) 1. බෝ ගස. 2. ඇතුන් ගේ ආහාර.

ගජේන්ද්‍රයා = 1. ඉන්ද්‍ර දේවියාගේ ඇතා. 2. නායක හස්තියා.

ගජේරූ = 1. ඉතා සිත්කළු. 2. සපත්.

ගජය = (ගජ) 1. රත්නාකරය. 2. ඔලිඳ ඇට. 3. ගවගාල. 4. භාණ්ඩාගාරය.

ගඩ = 1. කළය. 2. රාශිය. 3. සට්ටනය; ගැටීම. 4. ඔහදිය ගත්වන පිඩියක්.

ගඩන = 1. සට්ටනය කරන; එකට හප්පන.

ගඩනවා = 1. එකට හප්පනවා. 2. ස්පර්ශ කරනවා. 3. අකුල්ලනවා.

ඝඩ = 1. ගඩේ; සිරුරෙහි හැදෙන ගෙඩිය. 2. බාධාව. 3. ගල. 4. යමක් වැළැක්වීමට උපකාරවන දේ. 5. හක්ක. 6. වැස්ම. 7. කලකිරීම. 8. අගල 9. මූවාව.

ඝඩ ගෙඩිය = 1. හමේ හටගන්නා ගෙඩි වෙසෙසක්; විසප්පු ගෙඩිය.

ඝඩ පිළිකා = 1. ගෙඩිය මස්තෙහි හැදෙන පිළිකා විශෙෂයක්.

ඝඩ මාල = 1. විසප්පු ගෙඩියක්.

ඝඩබු = 1. කොටළුවා.

ඝඩකා = 1. මසුන් වර්ගයක්.

ඝඩ විසල = 1. ලේ ගෙඩිය. 2. ගඩ ගෙඩිය.

ඝඩා ගෙඩි = 1. පලතුරු ජාති. 2. ගෙඩි වර්ග.

ඝඩා දෙසි = 1. එනම් දෙසි වර්ගය.

ඝඩි = 1. හොර කම්මැලියා.

ඝඩු = 1. ඇගේ හැදෙන බිබිලි. 2. හක්ක. 3. හොර බළලා. 4. කපටියා. 5. දිය බුබුළු. 6. භය - ලජ්ජා - කිපී - සතුටු ආදී යෙහිදී ද; ඇඟ කිලිපොලා යාමෙන් හා ශීතල සුළං වැදීමෙන් ද ඇගේ මතුවන (හිරි) ගඩු.

ඝඩුගුඩාව = 1. දුම් කෝවේ නළයක් දිය බඳුනක ලා ඒ නළය මැදින් එන දුම උරණු පිණිස සකස්කොට ගත් උපකරණයක්.

ඝඩු මුහුණු = 1. ගෙඩියෙහි මුඛය.

ඝඩුර = (ගඩුල) 1. හැමුණු. 2. කුදු.

ඝඩුල = 1 ඇද. 2. මොල්ලියක් ඇති.

ඝඩු වැල් - 1. මූදේ පාවෙන විෂ සහිත (වැලක් වැනි) දෙයක්.

ඝඩුළු = 1. ගඩොල්.

ඝඩොල් = 1. බිත්ති බැඳීම සඳහා සකස් කොට ගන්නා දිගප් හතරැස් මැටි පිඩු

ඝඩොල් උඳුන = 1. ගඩොල් පුළුස්සාගන්නා පෝරණුව.

ඝඩොල් පඩිපලඟ = 1. ගඩොල් සකස් කරන කම් හල.

ඝඩ = 1. කම්මුල.

ඝඩුබු = 1. කොටළුවා. 2. ගස් වර්ගයක්.

ඝන = 1. ඝනවූ. 2. අතර නැති; සිදුරු නැති 3. මේඝය; වැස්ස. 4. කයිතාලම. 5. ගී කියන. 6. කලාදුරු අල. 7. නිතර. 8. වලාකුල් සහිත දවස.

ඝන අඳුරු = 1. ඝනාන්ධකාරය; තද කළුවර.

ඝන කඩ = 1. ඝොරෝප්පු රෙද්ද. 2. ඉතා ඝන වූ

ඝනකඩබොල් = 1. ඉතාමත් ඝන වූ.

ඝන කනා = 1. ඝන රත්රන්; ගන රන්.

ඝන කල් = 1. මේඝ කාලය; වර්ෂා කාලය.

ඝන කලඹ = 1. වලාකුළු රාශිය.

ඝන කුළු = 1. ඝන වලාකුළු.

ඝන ඝනනවා = 1. ඔකනවා. 2. ඝන කරනවා.

ඝන ගැජුම් = 1. මේඝ ගර්ජනාව; අහස ගෙරවීම.

ඝන ගිගුම් = (ගන ගුම්) 1. ගන ගැජුම්.

ඝනාග = 1. ගණ දෙවි.

ඝනාඳුර = (ඝනඳුරු) 1. ඝනාන්ධකාරය; තද කළුවර.

ඝන දල = (ඝනඹු - ඝන රස) 1. වැහි වතුර.

ඝන පුප් = 1. ඝනවූ මල් ඇති. 2. යක්බේරිය.

ඝන පුෂ්ප = 1. මල් සහිත ලොම් රෙදි.

ඝන පොද = 1. වැහි පොද; වැහි බින්දු.

ඝනාභ = 1. ඝන වලාකුළ.

ඝනාඹු = 1. වැහි වතුර.

ඝන බහල = 1. ඉතා ඝන.

ඝනාඝ = 1. වලාකුළ. 2. අත්තාලම; කයිතාලම.

ඝනාඝා = 1. සමූහය.

ඝනාරන් = 1. තනි රත්රන්; ඝන රත්රන්.

ඝනාරන් මුවා = 1. තනි රනින් කරන ලද.

ඝනාරස = 1. වැහි වතුර.

ඝන රැස = 1. වලාකුල් සමූහය.

ඝන රිපු = 1. වලාකුළුවලට හතුරා. 2. සූර්යයා. 3. සුළඟ.

ඝනාවකල = 1. විසිරී ගිය. 2. ඈතට විහිදුණු.

ඝන වල් = 1. ඝන කැලෑව.

ඝන සමා = 1. වර්ෂා ඍතුව.

ගන සර = 1. ඝන සාර; කපුරු.

ගනසා = 1. ඝනවූ ශාඛා ඇති. 2. අතු පතරින් වැසුණු. 3. ඝන සෙවණ.

ගන සැජේම = 1. ඉතා බෙහෙවින්. 2. ඉතා අධික ලෙස.

ගන සීත = 1. අධික ශීතල.

ගන හඬ = 1. වර්ෂා හඬ. මෙඝ ගර්ජනාව.

ගන් ඌරා = 1. ඇතිකරනු ලබන ඌරා; ගම් ඌරා.

ගන් කුකුළා = 1. ගම් කුකුළා.

ගන්න = 1 අරගන්න.

ගන්ධම්බ වෘක්ෂ = 1. අඹරුක් වෙසෙසක්.

ගන්ථ = 1. ග්‍රන්ථය. 2. අකුරු දෙතිසකින් යුත් පද්‍යය.

ගන්ධ = 1. ඝ්‍රාණෙන්ද්‍රියයට ගෝචරවන දෙය. 2. සුවඳ. 3. දුගඳ. 4. ගෙන්දගම්. 5. ඇතුන් වෙසෙසක්. 6. ගස් වර්ගයක්. 7. අසල් වැසියා 8. කුඩා ප්‍රමාණය.

ගන්ධ ආයතන = 1. ආයතනයක් වූ ගන්ධය.

ගන්ධක = 1. ගෙන්දගම්. 2. මුරුංගා.

ගන්ධකජ = 1. ගෙන්දගම් වලින් තැනූ.

ගන්ධකරණ්ඩක = 1. සුවඳ පෙට්ටිය.

ගන්ධකාම්ල = 1. ගෙන්දගම් අම්ලය.

ගන්ධකාර = 1. සුවඳ බඩු සාදන්නා.

ගන්ධ කාෂ්ඨය = 1 සුවඳ ලී. 2. හඳුන්.

ගන්ධකුටි = 1. ගඳ කිළිය. 2. සුවඳ ගෙය. 3. සුවඳ ද්‍රව්‍යයක්. 4. බුදුන් වහන්සේ වැඩ විසූ ගෙය.

ගන්ධ කුල = 1. ඇත් කුලයක්.

ගන්ධ ගජ = 1. ගන්ධ හස්තියා.

ගන්ධචූර්ණ = 1. සුවඳ කුඩු.

ගන්ධජාත = 1 සුවඳ වර්ගය.

ගන්ධඥ = 1. නාසය. 2. ගඳ දැනගන්නා තැනැත්තා.

ගන්ධතෛල = 1. සුවඳ තෙල.

ගන්ධ දාම = 1. මල් දම. 2. සුවඳ කල්ක ගුළි වලින් සෑදූ මාලය.

ගන්ධ ධූප = 1. සුවඳ දුම්.

ගන්ධ ධූලි = 1. කස්තුරි; මුවමද.

ගන්ධනය = 1. දැන්වීම. 2. වේදනා කිරීම. 3. මැරීම. 4. අනතුර.

ගන්ධනීලශා = 1. සත් පෙති ද සමන් මල්.

ගන්ධෂාල = (ගන්ධපාලා සිකා) 1. සහ. 2. ඉඟුරු පියලි.

ගන්ධ පාෂාණ = 1. ගෙන්දගම්.

ගන්ධ පුෂ්ප = 1. හඳුන්. 2. හඳුන් මල්.

ගන්ධ පූති = 1. දුගඳ. 2. කුණු ගඳ.

ගන්ධබ්බ = 1. ගන්ධර්වයා; තූර්‍ය්‍ය වාදකයා. 2. තූර්‍ය්‍ය වාදනය. 3 අන් තැනක ඉපදීමට යෝග්‍යව සිටින්නා.

ගන්ධ බන්ධු = 1. අඹ ගස.

ගන්ධමය = 1. ගඳින් නිපන්. 2. සුවඳ බහුල.

ගන්ධ මණ්ඩල මාලය = 1. ගඳ කිළි පෙදෙස.

ගන්ධ මාදන = 1. එනම් පර්වතය; හිමාලය පර්වතයෙහි උස් මුදුනක්.

ගන්ධමාදනයා = 1. වඳුරන් ගේ ප්‍රධානියෙක්. 2 බමරා.

ගන්ධමාලා = 1. සුවඳ මල් දම.

ගන්ධ මූෂිකා = 1. හික්මීයා.

ගන්ධ මෘග = 1. කස්තුරි මුවා. 2. උරුලෑවා.

ගන්ධ යුක්ත = 1. සුවඳ ඇති.

ගන්ධ රසය = 1. සුවඳ ලාටු. 2. ගෝප රසය.

ගන්ධරාජ = 1. හඳුන්. 2. සුවඳ මල් වෙසෙසක්.

ගන්ධර්ව = 1. සංගීතය කරන දේව විශේෂයක්. 2. අශ්ව වර්ගයක්. 3. මුව විශේෂයක්. 4. සූර්‍ය්‍යයා. 5. කොවුලා 6. නැටුම්-ගැයුම් වැයුම් කරන්නා. 7. සිවුසැට කලා අතුරින් එකක් වූ සංගීතය. 8. අමනුෂ්‍ය වර්ගයක්.

ගන්ධර්ව නිකාය = 1. ගන්ධර්ව දේව සමූහය.

ගන්ධර්ව පූජා = 1. සංගීතයෙන් පිදීම.

ගන්ධර්ව බ්‍රාහ්මණ = 1. සංගීතය කරන බමුණා.

ගන්ධර්ව ලෝක = 1. ගන්ධර්ව දෙවිවරුන්ගේ වාස භවනය; චාතුර් මහාරාජික දිව්‍ය ලෝකය.

ගන්ධර්ව විද්‍යාව = (ගන්ධර්ව වේදය) 1. සංගීත ශාස්ත්‍රය.

ගන්ධවරා = 1. කපුරු.

ගන්ධවහය = 1. වාතය. 2. සුළඟ.

ගන්ධවාහා = 1. කස්තුරි මුවා. 2. උරු ලෑවා?

ගන්ධවාරි = 1. සුවඳ පැන්.

ගන්ධශාලි = සුවඳැල් වී.

ගන්ධසාර = 1. සඳුන් ගස. 1. සඳුන් සාරය.

ගන්ධ හස්තිකා = 1. සුවඳ ඇතා. 2. මදයෙන් යුත් ඇතා.

ගන්ධාඛුවා = 1. සික්මීයා.

ගන්ධාපණ = 1. සුවඳ වර්ග විකුණන සල්පිල.

ගන්ධාර = 1. ගන්ධාර රට. (මෙකල 'කන්ද හාර්' යයි කියත්) 2. වීණා වාදනයෙහි ලැබෙන සප්ත ස්වරයන්ගෙන් එකක්. 3. එළුවාගේ හඬ. 4. සින්දූරම.

ගන්ධාරි = ගන්ධාර දේශයට අයත්. (විද්‍යාව)

ගන්ධාශ්මන් = 1. ගෙන්දගම්.

ගන්ධාෂ්ටක = 1. සුවඳ අටක් මුසුවූ සුවඳ.

ගන්ධික = 1. ගන්ධකාරයා. 2. සුවඳැති. 3. සුවඳ වෙළෙන්දා. 4. සුවඳ දුම් අල්ලන්නා. 5. ගෙන්දගම්.

ගන්ධිනී = 1. සුවඳැති වෘක්ෂයක්.

ගන්ධී = 1. සුවඳැති. 2. සුවඳ වෙළෙන්දා.

ගන්ධෝත්තමා = 1. මුද්‍රික පානය. 2. රා.

ගන්ධෝදක = 1. සුවඳ කළ පැන්.

ගන්ධෝලි = 1. හකු පාඩාව. 2. කැකිරි වෙසෙසක්. 3. කලාඳුරු. 4. බඹරා.

ගන්නවා = 1. අත්කර ගන්නවා. 2. ගැනීම කරනවා. 3. බාර ගන්නවා.

ගන්තිලේ = 1. ගම් මුලාදෑනිකම.

ගන්මාලු = (ගම්මාලු) 1. ලේ වැනි කිරි ඇති රුකක්.

ගන්ලද්ද = 1. ගම් බිම් ලබාගත් අය.

ගන්වසම = 1. ගම්පාලන. 2. ආණ්ඩුවෙන් ලබාගත් ඉඩම් අයිතිව තබා ගැනීම

ගන්හන් = 1. දුම්මල.

ගනිච්චිය = 1. සැලකීම. 2. තිච්චිය. 3. වන.

ගනුදෙනුකිරීම = 1. වෙළඳාම් කිරීම. 2. හුවමාරු කිරීම.

ගනුව = (ගනු) 1. ගායනාව. 2. ගැනීම.

ගණ = 1. සමූහය; සමුදාව. 2. ගණදෙවි. 3. ගණයට හෝ විහාරයට අයත්. 4. එක් නමකට වැඩි පස් නමකට අඩු (භික්ෂු) පිරිස. 5. රැස්වීම. 6. දේවගැතියා; කපුවා. 7. සුවඳ කොට නම් ඔසුව. 8. භික්ෂු නම. 9. භික්ෂු සංඝයා. 10. රිය විසි අටකින් යුත් හමුදාව. 11. ඊශ්වරයාගේ සේවක පිරිස. 12. වර්ගය; කාණ්ඩය. 13. ගිණුම. 14. පඞ්ක්තිය. 15. වලාකුළ. 16. සහකම. 17. කාර්‍ය කාරී මණ්ඩලය. 18. කලාඳුරු. 19. අකුරු තුණකින් යුත් වර්ණ පඞ්ක්තිය. 20. මාත්‍රා තුන සිට සය දක්වා ඇති (කවිසමයේ) ගණ පූරණයට වුවමනා අකුරු පෙළ. 21. ඇවිටිය. 22. දිය මිදෙල්ල. 23. වලාකුල්වලින් ඉර වැසී තිබෙන දවස. 24. ගන්ධර්ව සේනාව. 25. කෞර ගතිය. 26. විහාරය; සංඝාවාසය.

ගණ ආකීර්ණ = 1. සමූහයා ගැවසුණු.

ගණ ආචාර්ය = 1. සමූහයාට ගුරුවූ. භික්ෂූන්ට ගුරුවූ.

ගණ ඇඳුරු = 1. ගණාචාර්ය.

ගණ ඉඳු = (ගණිඳු) 1. ගණ දෙවි. 2. ඊශ්වරයාගේ පිරිසට අධිපති.

ගණ ඉසුරු = (ගණේශ්වර-ගණිසුරු) 1. ගණ දෙවි.

ගණ ජෙෂ්ඨ = 1. ගණ ජ්‍යෙෂ්ඨයා. 2. මෙහෙකරු පිරිසෙහි ප්‍රධානයා.

ගණක = 1. ගණින්නා. 2. නැකැත් කාරයා. 3. ගණන් තබන්නා. 4. කණක්කයා. 5. අය වැය ලියන්නා. 6. කටයුතු විධාන කරන්නා.

ගණක අධිකාරී = (ගණකාධිකාරී) 1. අය වැය ගණන් ආදිය පරීක්ෂාකරන්නන්ගේ ප්‍රධානයා.

ගණක ඇමති = 1. ගණන් හිලව් බාර ඇමතියා.

ගණ කුලය = 1. කෛලාස පර්වතය.

ගණ තැන් = (ගණ තෙර) 1. සමූහ ප්‍රධාන තෙරුන් වහන්සේ.

ගණ දෙටු = 1. සඞ්ඝනායක. 3. විහාරාධිපති. 3. සභාපති. 4. සේනාධි පතියා.

ගණදෙව් = 1. නුවණට අධිපති යයි සැලකෙන දෙවියා.

ගණ දේවතා = 1. තව් තිසා දෙව් ලොව සමූහ වශයෙන් උපන් දෙවියෝ. 2. සමූහ වශයෙන් සිටින දේවතාවෝ.

ගණන = 1. කොපමණද යනබව. 2. ප්‍රමාණය. 3. සංඛ්‍යාව. 4. ගණිත ප්‍රශ්නය.

ගණනායකා = 1. නායක හාමුදුරුවෝ.

ගණනාව = 1. ගණන. 2. සංඛ්‍යාව. 3. අංකය.

ගණනීය = 1 ගණන් කළ හැකිවූ.

ගණන් = 1. ගිණීම. 2. කොපමණද යන බව. 3. ප්‍රයෝගය. 4. 5. සංඛ්‍යාව. 6. ලියා තබන ගනුදෙනු.

ගණන් අදිනවා = 1. රැවටීමට උපා යොදනවා. 2. රැවටිලි වචන කියනවා.

ගණන්කරනවා = 1. ගණිනවා. 2. (ගණන්) එකතු කරනවා. 3. ගැන බලනවා.

ගණන්කාරයා = 1. ගනුදෙනු ගැන ගණන් ලියන්නා. 2. ප්‍රයෝගකාරයා. 3. බල පුළුවන් කාරයා. 4. වණ්ඩියා.

ගණන්ගන්නවා = 1. සලකනවා; නකනවා. 2. ගණනට එකතු කරනවා. 3. සොයා විස්තර දැනගන්නවා.

ගණන්දෙනවා = 1. විස්තර දන්වනවා. 2. ගණන් සකස්කොට බාරදෙනවා.

ගණන්නැති = 1. ගණනාවක් නැති. 2. අප්‍රමාණ. 3. සැලකිය යුතු නුවූ.

ගණන්පත්‍රය = 1. සංඛ්‍යා ප්‍රමාණය. 2 ගණිතය. 3. සංඛ්‍යා පත්‍රය.

ගණන් පියවනවා = 1. ගණන් බේරනවා. 2. ගණන් හිලව්වූ සකස්කොට පොත් පුදනම් කරනවා.

ගණන් බලනවා = 1. ලාභ-පාඩු පරීක්ෂාකොට බලනවා. 2. එකතුකර බලනවා. 3. ගනුදෙනු සෝදිසි කරනවා.

ගණන් බහිනවා = 1. මිල අඩුවෙනවා. 2. තත්ත්වය පහත් වෙනවා.

ගණන් බේරනවා = 1. ගනුදෙනු බලා ගෙවනවා.

ගණන් බේරා ගන්නවා = 1. ලාබ නැතිව ගිය වියදම් ලබාගන්නවා.

ගණන් යනවා = 1. මිල වැඩිවෙනවා.

ගණන් ශාස්ත්‍රය = 1. ගණිතය පිළිබඳ විද්‍යාව; ගණිතය.

ගණන්හිමි = 1. ගණන් මතක නැති නොවනු පිණිස ගසන ඉරි.

ගණනැඹියා = 1. ගණ දෙවියා. 2. සභාපති. 3. නායක හිමි. 4. ඊශ්වරයා. 5. සේනාධිපතියා.

ගණපූරණය = 1. ගණන සම්පූර්ණ වීම. 2. නියමිත සංඛ්‍යාව පැමිණීම.

ගණපූරක = 1. භික්ෂූන් වහන්සේලා ගණන සම්පූර්ණ වන්නාවූ.

ගණබ = 1. වැහිවලාකුළ. 2. වැහි වතුර.

ගණය = 1. සමූහය. 2. අඟිය. 3. (කවිසමයේ) අකුරු තුනකින් යුත් පේළිය හෝ මාත්‍රා තුන සිට සය දක්වා ඇති ගණය සම්පූර්ණ වීමට වුවමනා අකුරු පෙළ. 4. පඞ්කතිය. 5. පන්සල.

ගණයා = 1. සමූහයා.

ගණරූප = 1. බෙහෙත් පැළෑටි වෙසෙසක්.

ගණවැස්සන් = 1. පැවිද්දන්; භික්ෂූන්.

ගණ සංගණිකාය = (ගණසංගණිය) 1. භික්ෂූන්ගේ රැස්වීම. 2. සංඝ සභාව.

ගණහාසක = 1. සුවඳ වෙසෙසක්. 2. සමූහයා ප්‍රීතියට පත් කරවන්නා.

ගණ්ඩි = 1. ගැටය. 2. ගස්හි අතු හටගත් තැන. 3. පාසයක දැමිය හැකි බොක්කම වැනි දේ. 4. ගැටලුදේ. 5. මලපුඩුව. 6. උණපුරුක. 7. ශරීරයෙහි පිටකට තෙරූ තැන. 8. සිවුරෙහි කොණක අමුණන තුල් ගැටය 9. පාත්‍ර ආදියෙහි වූ සිදුරු වැසීමට යොදන ගොන්න. 10. දුණ්ඩ සංඝය.

ගණ්ඨික = 1. දුර්බෝධ ස්ථාන සහිත.

ගණ්ඨිකා = 1. මොල්ලිය. 2. ගැටය. 3. පුරුක. 4. හිස ගසාදැමීම සඳහා තබන ලී කොටය.

ගණ්ඨිස්ථාන = 1. තේරුම් ගැනීමට අපහසු තැන.

ගණ්ඨිකර = 1. ඉතා ගැටලු.

ගණ්ඨිපද = 1. ගැටපදය 2. අමාරු පද තේරීම. 3. දුර්බෝධ පදය.?

ගණ්ඩ = 1. ඇඟේ හැදෙන ගඩුව. 2. පිළිකාව. 3. ගඩතෙඩිය. 4. කපෝලය; කම්මුල. 5. බිබිල. 6 ලපය. 7. ලකුණ. 8. ග්‍රහ තාරකා සම්බන්ධ කාලයක්.

ගණ්ඩ උපසාද = 1. ගැඩවිලා. 2. ශරීරයෙහි වෙසෙන පණු වෙසෙසක්.

ගණ්ඩක = 1. කඟවේණා.

ගණ්ඩකාය = 1. බාධාව. 2. නැකැත් ශාස්ත්‍රය. 3. හතරෙන් හතර ගණන් කිරීම. 4. වෙන්වීම.

ගණ්ඩකාලි = 1. තිදිකුම්බ ගස්.

ගණ්ඩකුසුම = 1. ඇත්මද.

ගණ්ඩමාංස = 1. කම්මුලෙහි මස.

ගණ්ඩමාල = 1. ගෙල වටෙහි මාලයක් මෙන් හැදෙන ගෙඩි; ගල ගණ්ඩය (කණ්ඩමාලය)

ගණ්ඩානනය = 1. කම්මුලේ කෙළවර.

ගණ්ඩාලජී = 1. කපෝල රෝගයක්.

ගණ්ඩිකා = 1. ඝණ්ඨාවක් මෙන් ශබ්ද කිරීම පිණිස ලීයෙන් තැනූ ගෙඩිය.

ගණ්ඩිරයා = 1. වීරයා.

ගණ්ඩි = 1. ගඩු ඇති. 2. සතුන් මරන්නාගේ ලී කොටය; (රැස්වීම සඳහා ගසන) ඝණ්ඨාව; ගෙඩිය.

ගණ්ඩූපදයා = 1. ගැඩ පණුවා; ගැඩවිලා.

ගණ්ඩූස = 1. කට පුරවා ගැන්ම. 2. දිය ආදියෙන් කට පිරවීම.

ගණ්ඩූෂ = 1. කොපුල් පිරු

ගණ්හන්ත = 1. ගනිමින්; ගන්නාවූ.

ගණ්‍ය = 1 ගණන් කළ හැකිවූ. 2. ගිණියයුතු. 3. ගණයෙහිවූ.

ගණාචාර්ය = (ගණ ආචාර්ය බලන්න.)

ගණාධිප = (ගණාධිපති) 1. ගණදෙවි.

ගණි = 1. ගණය ඇති. 2. සමූහය.

ගණි = (ගණිකා) 1. වෛශ්‍යාව. 2. ඇතින්න. 3. ගෝනා. 4. සේපාලිකා.

ගණිච්චිය = 1. වග – විචාරය. 2. නිතව්ව. 3. සැලකීම. 4. අනුම්කත් දීම.

ගණිත = 1. ගණන් පිළිබඳ ශාස්ත්‍රය. 2. ගණන් කළ. 3. ගැණ බැලීම – ගැනීම, 4. සූ සැට ශිල්පයන්ගෙන් එකක්. 5. දෛවඥයා; නැකැත් කියන්නා.

ගණිත ආචාර්ය = 1. නක්ෂත්‍ර පාඨකයා.

ගණිත ඇදුරු = (ගණිත ආචාර්ය බලන්න)

ගණිත ශකීය = 1. ගණන් පිළිබඳ චක්‍රය.

ගණිතයා = 1. නැකැත් කියන්නා. 2. බෙර දවුල් වයන්නා.

ගණිතව්‍ය = 1. ගණන් කළ හැකිවූ.

ගණිතශාස්ත්‍රය = 1. ගණන් ශාස්ත්‍රය.

ගණින්නාන්සේ = 1. උපසම්පන්න භික්ෂූන් නැතිවූපසු ඉතිරිව සිටි හෙරණ පැවිද්දන්ට කියූ නම. 2. භික්ෂූන්ට ගරුසරු නැතිව, හෝ සැලකිලි ලෙස කියන වචනය.

ගණිසුරු = 1. (ගණ + ඉසුරු) ගණදෙවි.

ගණුක් = 1. ගණිතොත්.

ගණුදෙනු = 1. ගැනීම හා දීම. 2. බඩු මිලයට ගැනීම හා දීම.

ගණුතැන් = 1. වෙළඳම්පල; කඩය.

ගණෙරු = 1. ඇතින්න. 2. ගණිකාව.

ගණේශ = 1. ගණදෙවි.

ගත (ගත්) = 1. ගාත්‍රය. 2. ශරීරය. 3. ග්‍රන්ථය. 4. ඉහ. 5. කවිය. 6 සමූහය. 7. ගනකුර; ව්‍යඤ්ජනාක්ෂරය. 8. ශ්ලෝකය. 9. සිත ඇලුණු දෙය. 10. ගන්නා ලද. 11. ශබ්දය. 12. ගිය. 13. ගතහොත්. 14. පසුගිය.

ගතඅවිදු = 1. යුධ ඇඳුමෙන් සැරසුණු.

ගතකරනවා = 1. කල් යවනවා. 2. ජීවත් වෙනවා.

ගතකුරු = 1. ග්‍රාන්ථාක්ෂර; ව්‍යංජනාක්ෂර.

ගතකුරුලොප්සඳ = 1. ග්‍රාන්ථාක්ෂර ලෝප සන්ධිය.

ගතපච්චාගතිකාවත් = 1. යන, නැවත පෙරළා එන භික්ෂූහු විසින් පුරණ වත.

ගතප්‍රත්‍යාගතනය = 1 ගොයම් ඇපසු එත්තනු පිළිබඳ ක්‍රමය.

ගතමනා = 1. ගතයුතු.

ගතයුතු = 1. ගැනීමට සුදුසු. 2. සැලකියයුතු.

ගත ලකුණු = 1. ශරීරයේ ලක්ෂණ.

ගත්කරු = 1. ග්‍රන්ථ කර්තෘ.

ගත්ත = 1. පැමිණිල්ල. 2. ගැරහීම. 3. අපහාසය. 4. දෝෂාරෝපණය.

ගන්කරු = 1. මනුෂ්‍ය ජාතියක්. 2. කුලයක්.

ගත්තා = 1. අරගත්තා; ග්‍රහණය කළා.

ගත්තෑණි = 1. හිතුවක් කරන.

ගති = 1. ක්‍රමය. 2. ආකාරය. 3. ඉපදීම. 4. යෑම. 5. උපදින තැන. 6. සිරිත. 7. පෙරහැර. 8. පෙළ පාළිය. 9. නුවණ. 10. මිනිස් - දෙව් - නිරා - තිරිසන් - අසුර යන පස. 11. උපාය. 12. ආශාව. 13. ශමන. 14. ජීවිත කාලය. 15. පාඩම් කර ගැනීමෙහි ශක්තිය. 16. ඔබු වණ. 17. ගමන. 18. ජීවත්වන ස්ථානය. 19. විපාකය. 20. නැව. 21. වාලා. 22. උපකාරය. 23. පුනරුත්පත්තිය. 24. පුරුදුවීම. 25. මාගීය. 26. තත්වය.

ගති අඤ්ඤ = 1. යෑම අධිකොට ඇති. 2. යෑමය යන අර්ථය.

ගති නිමිත්ත = 1. කර්ම නිමිත්ත; මැරෙණ මිනිසෙකුට ඔහු උපදින තැන පෙන්වීමේ ලකුණ.

ගති භේද = 1. මනුෂ්‍ය ලෝකාදි ගතීන්ගේ ප්‍රභේද.

ගති මත් = 1. පාඩම්කර ගැනීමෙහි සාමර්ථ්‍යය ඇති.

ගතිමනා = 1. ගතයුතු.

ගතිය = 1. තත්වය. 2. සවභාව. 3. ගතිගුණ. 4. උත්පත්තිය. 5. හැසිරෙන අන්දම.

ගති විපත්ති = 1. අයහපත්වූ ගතිය; නරක ඉපදීම.

ගති සම්පත්ති = 1. යහපත්වූ ගතිය; දිව්‍ය මනුෂ්‍ය යන ගති දෙක.

ගතු = 1. කේලම්. 2. වැරදි. 3. දොස්කීම. 4. ගැනීම. 5. පැමිණිලි කරන්නාවූ.

ගතු කාරයා = 1. කේලම් කියන්නා. 2. දූනුම් දෙන්නා.

ගතෙක් = 1. ශරීරයේ අවයවයක්. 2. ග්‍රන්ථයක්.

ගද = 1. අසනීපය. 2. ආයුධය. 3. කථාව. 4. ක්‍රිෂ්ණගේ බාල සහෝදරයා. 5. දරු බොක්ක. 6. පීඩාව.

ගදඹ අත් = (ගද බත්) 1. එරඬු ගස.

ගදඹ සතර = 1. සංගීත ශාස්ත්‍රය.

ගඳඹ = 1. ඔටුවා. 2. ගායනකාරයා. 3. සංගීතඥයා. 4 බෙර ගසන්නා. 5. දිව්‍ය ගායකයා.

ගදය = 1. පීඩාව. 2. රෝගය. 3. කථාව.

ගදව් = 1. පද්‍ය වශයෙන් රචනා නොකළ වාක්‍යය; ගද්‍යය.

ගද්ගද = 1. හොන ගැසීම. 2. වික්කලු ගැසීම.

ගද්‍ය = (ගදව් බලන්න)

ගද්‍රභ = 1. කොටළුවා.

ගදා = (ගදාව) 1. මුගුර. 2. ලෙඩ. 3. ආයුධය. 4. ගණදෙවි. 5. වෙසමුණුගේ ආයුධය. 6. පොල්ල. 7. පලොල් ගස. 8. මල් වෙසෙසක්. 9. අබයටිය.

ගදා ආයුධ = (ගදා යුධ) 1. යකඩ පොල්ල; මුගුර.

ගදා ගදෞ = 1 දිව්‍ය වෛද්‍යවරු දෙදෙනෙක්.

ගදාධරයා = 1. බල පොල්ල උසුලා සිටින්නා. 2. විෂ්ණු. 3. ක්‍රිෂ්ණ.

ගඳුබු = 1. කොටළුවා.

ගඳ = 1. සුවඳ. 2. දුගඳ. 3. නාසයට දැනෙන දේ. 4. ගෙන්දගම්.

ගඳ ඇත් = 1. ගන්ධ හස්තියා.

ගඳ ඇඹුලු = 1. සුවඳ තෙල්ලි. 2. ගස් වෙසෙසක්.

ගඳකාරු = 1. සුවඳ බඩු සාදන්නා.

ගඳ කලල් = 1. සුවඳ කල්ක. 2. සුවඳ කුඩු?

ගඳකඹ = 1. සුවඳැති පඬු.

ගඳකිළි = 1. බුදුන් වහන්සේ වැඩ වසන සුවඳින් යුත් කාමරය. 2. සුවඳ ගේ.

ගඳ කුළු = (ගඳ කෙළි) ගඳකිළි බලන්න.

ගඳ ගජ = 1. ගන්ධ හස්තියා; මදමත් ඇතා.

ගඳ ගහනවා = 1. තරක ගඳක් එනවා; දුගඳ හමනවා.

ගඳ ගිජිඳු = 1. මහා ගන්ධහස්තියා.

ගඳතණ = 1. සුවඳ ඇති තණ වෙසෙසක්.

ගඳදුම් = 1. සුවඳ දුම්.

ගඳ’පණ = 1. සුවඳ විකුණන කඩය.

ගඳ පසඟුල් = 1 සුවඳ තවරන ලද අඟිලි පස

ගඳපාන = 1. පැළැටි වර්ගයක්.

ගඳ බක් = 1. එරඬු.

ගඳබ = 1. ගන්ධර්ව.

ගඳබ අක් = 1. එරඬු ගස.

ගඳබ’ස් = 1. ගන්ධර්වයාගේ අශ්වයා.

ගඳ මඳන් පවු = (ගඳ මහන් පවු) 1. ගන්ධමාදන පර්වතය.

ගඳ මල් = 1. සුවඳ මල්.

ගඳ මහන = 1. ප්‍රධාන වඳුරා. 2. බමරා. 3. ගන්ධමාදන පර්වතය.

ගඳමුවා = 1. ගන්ධමය.

ගඳවත් = 1. ගන්ධ වස්තු; දුගඳ දෑ.

ගඳවණ් = 1. සුවඳ සුණු.

ගඳ වහන් = 1. ගන්ධමාදන පර්වතය?

ගඳවි = 1. ගායනය (ගන්ධර්වය)

ගඳවං = (ගඳවි) 1. ගන්ධර්ව.

ගඳවියා = 1. ගායකයා; ගායනා කාරයා.

ගඳ විලවුන් = 1. සුගන්ධ විලේපන; සුවඳ ආලේප වර්ග.

ගඳ සාරය = 1. සඳුන් සාරය.

ගඳ සුණු = 1. සුවඳ කුඩු; පුයර?

ගඳ හැල් = 1. සුවඳැල් ප්.

ගඳැතා = (ගඳැත්) 1. ගන්ධ හස්තියා; මදමත් ඇතා.

ගඳැත් මුළු = 1. මද වැහෙන ඇත් රැළ.

ගඳෙව් = 1. ගන්ධර්ව; ගායකයා. 2. ගායකය.

ගඳෙව් කුලය = 1. ගායකයන්ගේ කුලය.

ගඳෙව් ගළ = 1. ගන්ධර්ව ලෝකය.

ගඳෙව් මඬල = 1. සංගීතකාර සමූහය.

ගඳෙව් මුවා = 1. ගන්ධර්වමය. 2. සඞ්ගීතයෙන් පිරුණු. 3. සංගීතයෙන් අගතැන් පැමිණි.

ගඳෙළු = (ගඳෙළු) 1. ගඳකිළි බලන්න.

ගඳෙළු පිහිවෙන් = 1. ගඳකිළිය වූ පන්සල.

ගප = (ගප්) 1. බඩ. 2. කුහරය. 3. දරු ගැබ. 4. ඇතුළත. 5. කාමරය.

ගප්සා = 1. ගර්භස්‍රාවය; ගබ්සාවීම.

ගබ = 1. බඩ. 2. ගර්භය. 3. ගර්වය. 4. කුස. 5. කාමරය. 6. ඇතුළත්. 7. පිළි සිදීම.

ගබගේ = 1. ඇතුළු ගේ. 2. කාමරය. 3. වදන ගෙය.

ගබඩා = 1. භාණ්ඩාගාරය. 2. ද්‍රව්‍ය රැස් කොට තබන කාමරය. 3 මීය.

ගබඩා කරනවා = 1. රැස්කොට තබනවා.

ගබඩාගම = 1. රජුට අයත් ගම.

ගබඩානිලමේ = 1. වස්තුව භාරව සිටින නිලධාරියා. 2. භාණ්ඩාගාරිකයා.

ගබදල = 1. කොලපුව.

ගබ පෙරහර = 1. මවු කුසෙහි උපන් දරුවාගේ ආරක්ෂාව පිණිස කළයුතු ශාන්ති කර්මාදිය; ගර්භපරිහාරය.

ගබබ = 1. අභිමානය; සිතෙහි උඩඟු බව.

ගබමල = 1. මවු කුසෙහි මැරුණු. 2. ගැබින් නික්මෙන අපවිත්‍ර දෙය. 3. වදු මහ.

ගබබුබුහන් = 1. ගර්භව්‍යුත්ථානය; දරු ප්‍රසූතිය.

ගබසිරුඹ = 1. කලල රූපය.

ගබ් = 1. දරු ගැබ; කුසෙහි උපන් දරුවා. 2. ඇතුළත. 3. කාමරය. 4. ගර්භය. 5. කුහරය.

ගබ්ගත් = (ගැබ්ගත්) 1. දරු ගැබක් සහිත. 2. ගර්භණී වූ.

ගබ්ගත් මඟුල් = 1. මවුකුසෙහි පිළිසිඳ ගැනීම පිළිබඳ උත්සවය.

ගබ්ගැන්වීම් = 1. ඉපදවීම.

ගබ් ගෙය = 1. ඇතුළු කාමරය.

ගබ්දෙර = 1. කාමරයෙහි දෙර.

ගබ්බ = 1. ගර්වය; උඩගු බව.

ගබ්බිත = 1. ගර්විත; උඩගු.

ගබ්බර = 1. ගැබ්බර. 2. දරු ගැබෙහි බර.

ගබ්බරින් = 1. ගැබ්බරිත්; ගැබිගෙන.

ගබ්භ = 1. කුස. 2. දරු ගැබ. 3. කාමරය. 4. කුහරය.

ගබ්භ ගත = 1. කුසට පැමිණි 2. පිළිසඳට පැමිණි. 3. කාමරයට පැමිණි.

ගබ්භ පරිහරණ = (ගබ්බ පරිහාර.) 1. දරු ගැබ රැකීම.

ගබ්භ පාතන = 1. දරු ගැබ හෙළීම.

ගබ්භර = 1. ගුහාව.

ගබ්භ වුට්ඨාන = 1. දරුවා බිහිවීම.

ගබ්භාසය = 1. කුසෙහි දරු ගැබ ඇතිවන කෝෂය.

ගබ්භිණී = 1. බඩ දරු ස්ත්‍රී.

ගම්භීර = 1. ගැඹුරු. 2. ගම්භීර.

ගබ්භාශය = 1. බඩෙහි හෝ කුසෙහි ලෙඩ.

ගබ්ලි = 1. ගංගාව.

ගභස්තියා = 1. ආලෝකය දෙන්නා 2. සූර්යයා

ගම = (ගම්) 1. ග්‍රාම; නගරයෙන් පිට මිනිසුන් වසන පෙදෙස්. 2. ඉඩම. 3. නින්ද ගම. 4. ගමන. 5. ක්‍රියා විශේෂණයක්. 6. ගම් වැසියා. 7. ගමරාළ.

ගමක = 1. ඇවිදින්නා. 2. අවබෝධ කරවන. 3. ග්‍රාමය.

ගමක් = 1. ග්‍රාමය. 2. ග්‍රාමාන්තය.

ගමවතීනායා = 1. පාදඩයා.

ගමථය = 1. මාර්ගය; පාර.

ගමථයා = 1. ගමන් කරන්නා.

ගමන = 1. යාම. 2. ඇවිදීම.

ගමන අඥ = 1. යැම යන තේරුම් ඇති.

ගමන ආගමන – (ගමනාගමන) 1. යැම් ඊම්.

ගමන් කාරයා = 1. ගමන් යාමෙහි දක්ෂයා.

ගමන් බිමන් = 1. ගමනාගමන. 2. ඇවිදුම්.

ගමනාගන = 1. ගමනට වුවමනා බඩු.

ගමනාවසර පත්‍රය = 1. රටින් රට යැමට වුවමනා අවසර පත්‍රය.

ගමනී = 1. මගියා; ගමන් කරන්නා.

ගමනීය = 1. යා යුතු. 2; යා හැකි.

ගම්බිම = (ගම් බිම්) 1. ගමේ ඉඩම්. 2. ඉඩ කඩම්.

ගම්බු = 1. ගමේ ස්ත්‍රී.

ගමයා = 1. ගමරාළ. 2. ගම් ප්‍රධානයා.

ගම්වෙනෙහි = 1. ගමෙහි හා වනාන්තරයෙහි.

ගම් අතුරු = 1. අනෙක් ගම.

ගම් ඌරා = 1. ඇතිකරන ඌරා.

ගම් කාඩවර = 1. වරය වශයෙන් ලැබුණු ගම් කොටස.

ගම් කොක් = 1. ගම් පිහිටි තැන.

ගම්කොට = 1. තොටුපල.

ගම් දරු = 1. ගමෙහි වැසි ළමයි.

ගම් දෙටු = 1. ගමෙහි ප්‍රධානයා.

ගම් දොර = 1. ගමට ඇතුළුවන ස්ථානය.

ගම් නියම් ගම් = 1. සුළු ගම් හා මහ ගම්.

ගම් පංගු = 1. ඉඩම් කොටස.

ගම් පහරනවා = 1. ගම් වැසියන්ගේ බඩු බලයෙන් ගෙනයනවා.

ගම් පඹුරු = 1. ඉඩමක් වගා කිරීමේදී ඉඩම් හිමියාට දෙන බද්ද.

ගම් පත්‍ර = (ගම්පත්කඩ) 1. ඉඩමක් අත් සතු කිරීමේදී ලියන ඔප්පුව.

ගම් පමුණු = 1. ප්‍රවේණි ඉඩම්.

ගම්පැල් = 1. ගම් අසල.

ගම් පැල් වෙහෙර = 1. ගම් අසල වූ විහාරය.

ගම් පැලැස්ස = 1. ගම්මානය. 2. පැලක් වප සරිය ඇති ඉඩම්ද?

ගම් පිඩි = 1. ගම් මුදලියාට ගෙවිය යුතු කොටස.

ගම් පෙරළිය = 1. විශාල කලබලය. 2. ගම කැලඹෙන ක්‍රියාව. 3. එනම් පොත.

ගම් බද = 1. නගරයෙන් පිට ගම්මානය. 2. පිටිසර. 3. ගම්වලට අයත්.

ගම්බාර දෙවි = 1. ගම් පැලැස්සට අධිපති දේවතාවා 2. සූනියම් දේවතාවා.

ගම් බෑස්සා = 1. ගමට ගියා. 2. (වෙළඳාමෙන්) පාඩු වී කඩේ වැසුවා.

ගම් බිම් = 1. ඉඩ කඩම්.

ගම් බිම් භාරයෝ = 1. ඉඩම් හිමියෝ. 2. ධන පතියෝ.

ගම් බොඩ = 1. ගඟ බඩ; ගඟ අසල.

ගම් භාරය = 1. මන්ත්‍රය. 2. හෙළුම්. 3. සිදුරක්.

ගම්භීර = 1. ගැඹුරු. 2. සියුම්. 3 දුර්බෝධ.

ගම්භීරතාව = (ගම්භීරතර) 1. ගැඹුරු බව. 2. සියුම් බව.

ගම්භීර නය = 1. ගැඹුරුවූ න්‍යායය.

ගම්භීරෝදර = 1. ගැඹුරු මහත්. 2. උත්තම ප්‍රමාණයෙන් ගැඹුරුවූ.

ගම්මහේ = 1. ගමරාළ. 2. ගමේ ප්‍රධානයා.

ගම්මානය = (ගම්මානේ) 1. ගම් පැලැස්ස. 2. ගම්බද. 3. ගම්මුන් වසන ප්‍රදේශය.

ගම්මැද්දේ = 1. ගංගොඩේ. 2. ගමේ එහෙ-මෙහෙ.

ගම් මැදි හැල්ල = 1. ගමේ ගොඩේ කථාව.

ගම්මිරිස් = 1. එනම් ඇට වෙශෙස.

ගම්මු = 1. ගම් වැසියෝ.

ගම්මුදලියා = 1. ගම්මුලාදෑනියා. 2. ගමේ ප්‍රධානයා. 3. රටනායකයා. 4. ග්‍රාම භෝජ-කයා.

ගම්මුදල් = 1. ගම් පඬුර. 2. ගෙඩිම.

ගම්‍ය = 1. ලඟාවිය හැකිවූ. 2. සුදුසු. 3. යායුතු. 4. තේරුම් ගත හැකි 5. යා හැකි.

ගම් රකාවල් = 1. ගම් ආරක්ෂකයා. 2. පොලිස් භටයා?

ගම්ලදු = 1. ගම ලැබූ අය. 2. ගම් ලද්දා. 3. ගම්මුදලියා?

ගම්ලද්නායක = 1. ගම් ලැබූවන්ගේ ප්‍රධානයා.

ගම්වරය = 1. නින්දගම. 2. කළ සේවයක් උදෙසා රජුගෙන් ලැබුණු ඉඩම.

ගම්වසම = 1. රජුගෙන් හෝ රජයෙන් ගම්-ඉඩම් ලබා ගැනීම.

ගම්වාස = 1. ග්‍රාම වාසය.

ගම්වැසි = 1. ගම් වැසියා; ගමේ පදිංචිකාරයා. 2. ග්‍රාම්‍ය

ගම්වින්නි = 1. ඉඩම් හඩුව.

ගම්සබාව = (ගම් සබේ) 1. ගම් සභාව; ගම් න්‍යායී සභාව.

ගම් සැලැසුම් = 1. ගමෙහි ආකාරය දක්වන සිතියම.

ගම් සූරිය = 1. එනම් ගස.

ගම් හිඹි පැඹි = 1. ගම් ඌරු පැටි දෙන.

ගම් හූරු = (ගම් ඌරා බලන්න.)

ගමික = 1. ගමෙහි වූ. 2. ගමන් කරන්නා. 3. යායුතු 4. යන.

ගමිකදාන = 1. ගමන් යන භික්ෂූන්ට දෙන දානය.

ගමික වත් = 1. දුර ගමනක් යන්නකු විසින් කළයුතු දෙය.

ගමිනා = 1. අකුලෙන් වැසී තිබෙන පාර. 2. ඇතුන් යාමෙන් සෑදුණු මඟ.

ගමිසුරු = 1. ගමරාළ.

ගමී = (ගමික බලන්න.)

ගමු = 1. ග්‍රාමය.

ගමේගොඩේ = 1 ගම්මානයේ; ගම්මැද්දේ.

ගමෝ = 1. ගණිමු.

ගය = 1. ගීය. 2. ගාථාව. 3. පද්‍යය,

ගයක = ගායනා කරන.

ගයනුකිත්ත = 1. අකුරක අගට එකතුකරන "ෟ" ලකුණ.

ගයා = 1. ධුවරක කමක්. 2. දඹදිව පැරණි තපස් බිමක්. 3. නායනය කොට.

ගසිරූක = 1. සිවස්ගුරු.

ගර = 1. ගෙය. 2. අසනීපය. 3. විෂවගී. 4. ප්‍රතිවිෂය.

ගරනවා = 1. (ඇස් වට්ටියෙන් මැණික් ආදිය) වෙන්කර ගන්නවා. 2. පොලනවා. 3. (සහල් ආදිය) කොරක-නැඹිලිය ආදි උපකරණයක් ගේ උපකාරයෙන් ශුද්ධ කොට ගන්නවා.

ගරඬියා = (ගැරඬියා) සපී විශෙෂයක්.

ගරද = 1. විෂ සහිත. 2. සනීපයට අවසිර ගෙන දෙන.

ගරබ = (ගරබා- ගරබො - ගරබෝවා) 1. ගැරඬියා.

ගරහරණ = 1. ගැරඬියා.

ගරභග = 1. ගභීය. 2. ගැබේ දරුවා.

ගරලග = 1. විෂ. 2. සපී විෂ. 3. (පිදුරු හෝ තණ) කට්ටය. 4. මිම්ම.

ගරවරණ = (ගරවරණා-ගරවරද-ගරවිලා-ගර සිතා) 1. ගැරඩියා.

ගරවස් = 1. ගෘහ ජිවිතය. 2. ගිහිගෙයි විසුම.

ගරවිල් = ගැරඩියා; ගරවිලා· 2. පිඹුරා?

ගරවිස = 1. විෂරහිත ද්‍රව්‍යයන්ගේ එකතු වීමෙන් සැදෙන විෂ.

ගරවෘෂක = 1. ගෙට අධිපති දෙවියා.

ගරසික් = 1, ගැරඩියා.

ගරහ = 1. ගර්හාව; නින්දාව; අවනම්බුව. 2. පිළිකුල් කිරීම.

ගරහ උවමි = 1. නින්දොපමාව.

ගරහනවා = 1. නින්දා කරනවා.

ගරගවස් = (ගරවස් බලන්න)

ගරහා = (ගරහ බලන්න)

ගරගුණ්ඩි = 1. ගුණ්ඩුකර හිම.

ගර් = 1. ගෘහය 2. කාරමි?

ගර්ගරාඩි = 1. ගුරුලේන්තුව.

ගර්ගරී = 1. දිය බඳුන. 2. කලය. 3. දීකිරි මතන ගාන බඳුන.

ගර්ගලක = 1. ගර - ගර යන හඬ.

ගර්ජනා = 1. නාදය. 2. ඇතාගේ හඬ. 3. තද ශබ්දය. 4. අහස ගෙරවීම. 5. සිංහ ආදීන් ගේ ගෙරවීම.

ගර්ජනා මේඝය = 1. අකුණු වලාකුළ.

ගර්ජිත = 1. නාදය. 2. ගිගුරුම. 3 ගොරවන ලද.

ගර්ජිතයා = 1. මදමත් ඇතා.

ගර්ත = 1. ළිඳ. 2. වළ. 3. නට්ටමේ වළ.

ගර්දභ = 1. කොටළුවා. 2. බූරුවා 3. ඔටුවා. 4. සුදු නෙළුම්. 5. ගඳ. 6. පුවඳ විශෙෂයක්.

ගර්දභී = (ගර්දභිකා) 1. කොටළු දෙන. 2. (හමේ ඇතිවන) දදය. 3. කුරුමිනියා.

ගර්ධනය = 1 ධන ලෝභී.

ගර්බය = උඩඟු කම. 2. දරු ගැබ.

ගර්භ = 1. කුස. 2. ගැබ පිළිබඳ. 3. මවු කුස සිටින දරුවා. 4. ඇතුළත· 5. කාමරය.

ගර්භ අගාර = 1. ඇතුළු කාමරය. 2. වදනගේ.

ගර්භ අන්තර = 1. ගර්භය ඇතුළ.

ගර්භ ආශය = 1. ගර්භය පිහිටන තැන.

ගර්භ කෝෂ = 1. ගර්භාශය. 2. ගැබ.

ගර්භ ගත = 1. මවු කුස පිළිසිඳුණු.

ගර්භ ග්‍රහණය = 1. ගැබ් ගැනීම. 2. පිළිසිඳ ගැනීම.

ගර්භ චුතිය = 1. ගප්සාව.

ගර්භ ධාරණය = 1. ගැබ් දැරීම. 2. බඩදරු බව.

ගර්භ පරිපාක = 1. ගැබ මේරීම.

ගර්භ පාත = දරුගැබ වැටීම.

ගර්භ ඝාතක = 1. ගැබ් හෙළන. 2. ඖෂධ වර්ගයක්.

ගර්භ පාතන = 1. ගැබ හෙළීම.

ගර්භ ප්‍රති ග්‍රහණය = 1. පිළි සිඳ ගැනීම.

ගර්භ ප්‍රතිෂ්ඨාපනය = 1. ගප්සාවීම වැළැක්වීම.

ගර්භ ප්‍රාතිහාර්යය = 1. ගැබ් පෙරහැර.

ගර්භ මල = 1. ගැබෙහි තිබෙන කුණු. 2. වැදෑ මස.

ගර්භ මූඪ = 1. මූඪ ගර්භය; අයථා ක්‍රමයෙන් පිහිටි දරුගැබ; ප්‍රසව කල නොහැකියේ දරු ගැබ හරස් වීම.

ගර්භය = 1 කුස. 2. බඩ. 3. කලල රූපය. 4. කුහරය.

ගර්භරාග = 1. ගැබෙහි විසීමෙන් වූ පැහැය.

ගර්භවතී = 1. දරු ගැබ ඇත්තී.

ගර්භ විපත්ති මූලක දුඃඛය = 1. ගර්භයට වන විපත් මුල් කොට ඇති දුක.

ගර්භ ශය්‍යා = 1. ගැබෙහි විසීම.

ගර්භ ශ්‍රාව = 1. ගබ්සාවීම; දරුගැබ වැටීම.

ගර්භාගාරය = 1. ඇතුළු කාමරය.

ගර්භාධානය = 1. ගැබ් ගැනීම.

ගර්භ ශය්‍යාව = 1. දරු ගැබ; ගැබ.

ගර්භාශය = 1. ගැබ. 2. වැදෑමස.

ගර්භොක් ක්‍රමන = 1. කුසයෙන් උපත්.

ගර්මී = 1. ඝර්මී; ග්‍රීෂ්ම.

ගර්විත = (ගර්විත) 1. උඩඟු. 2. පාරට්ටු කාර.

ගර්වය = 1. උඩඟුකම.

ගර්වර = 1. උඩඟු. 2. උතුම්.

ගර්හණය = 1. නින්දා කිරීම.

ගර්හා = 1. නින්දා කිරීම.

ගර්හිත = 1. නින්දිත.

ගරා = 1. ගෙය. 2. ගිල ගැනීම. 3. යක්ෂයෙක්.

ගරාදිය = 1. උණකටුව; (උණ බැලීමේ උපකරණය) 2. රබර්-අරක්කු ආදිය සෝදිසි කිරීමට ගන්නා උපකරණය. 3. පිය ගැට පෙළෙහි පසෙකින් හෝ වටක සවි කරන ලීපටි. 4. රෝදයෙහි දැති.

ගරායකා = 1. ගෙවලයා; ගෙවල යකා.

ගරාදි යක්ක = 1. යකු වෙසෙසක්.

ගරාදි වෑට = 1. ගරාදි පටි සවි කළ වැට.

ගරාවැටෙනවා = 1. දිරුම්පිටවැටී කැඩියනවා. 2. තඩා ගැලෙනවා.

ගරි = 1. ඔලු වෙසෙසක්.

ගරී = 1. තෘණ විශේෂයක්.

ගරීයස් = 1. අති ගෞරවාර්හ

ගරු = 1. ගුරුවරයා. 2. ගරුකටයුතු. 3. වටිනා කමින් වැඩි. 4. බරවූ; බරපතල. 5. ආදරය. 6. උතුම් කම. 7. දෙමා පියෝ.

ගරුක = 1. බරවූ; බරපතල. 2. වැදගත් 3. දීර්ඝාක්ෂරය.

ගරුකටයුතු = 1. ගෞරව කළයුතු. 2. නම්බු කළයුතු.

ගරුකම = 1. ගරුත්වය. 2. වටිනා කම; මහඟු බව. 3. නම්බුව.

ගරුකම්ම = 1. බරවූ කම්. 2. බරපතල කුසල් හෝ බරපතල අකුසල්.

ගරුකාපත්තිය = 1. තද බල පාපය.

ගරුකාර = 1. ගෞරව කිරීම.

ගරුගබ්භා = 1. දරු ගැබ ඇත්තී.

ගරු ගම්භීර = 1. ඉතා ගරු. 2. විශිෂ්ට; ශ්‍රේෂ්ඨ.

ගරු ගර්භිණී = 1. ගැබ්බරවූ ස්ත්‍රී.

ගරුඩ = 1. ගුරුළා.

ගරුඩධ්වජ = 1. ගුරුළු කොඩි ඇත්තා; විෂ්ණු දෙවි.

ගරුඩ පාෂාණ = 1. කිරිගරුඬ විශේෂයක්?. 2. මරකත මිණි. 3. පච්ච ගල්.

ගරුඩ භවන = 1. ගුරුළන් වසන ලෝකය.

ගරුඬ = 1. කිරිගරුඬ ගල්.

ගරුඩ රාජ = 1. පැලෑටි වර්ගයක්.

ගරුඩා = 1. පත්තෑයා.

ගරුනාම = 1. ගෞරව නාම; යමෙකුට බුහුමන් වශයෙන් රජයෙන් හෝ සංඝ සභා ආදියෙන් පිරිනැමෙන නම්.

ගරුනාම්බු = 1. සැලකිලි. 2 ගරු බුහුමන්.

ගරුතර = 1. ඉතාගරු 2. ගරු කටයුතු.

ගරුත් = 1. අත්තටුව; අත්තැත්ද.

ගරුත්වය = 1. ගරුකම. 2. සැලකියයුතු බව. 3. උසස් බව.

ගරු බඩු = 1. ගරු භාණ්ඩ; වටිනා බඩු. 2. සාංඝික දේ.

ගරු භාර = 1. ගැබ්බර.

ගරුභාවය = 1. ගරුකම. 2. උසස්බව.

ගරු භාවනීය = 1. ගෞරවනීය.

ගරුමන් = 1. ගෞරවය හා මානය.

ගරුමාන්නය = 1. ගෞරවය හා මාන්නය. 2. සැලකිලි සහිත ගරුකම.

ගරුවාස = 1. ගුරුන් යටතෙහි විසීම.

ගරු සරු නැති = 1. සැලකිලි ගෞරව නැති.

ගරුල = 1. ගුරුළා.

ගරුහා = 1. ගර්හාව.

ගල = 1. ගිලිහුණු. 2. බෙල්ල. 3. සවි-තද ද්‍රව්‍යයක්. 4. ගැලුවාවූ. 5. උගුර. 6. මිශ්‍ර. 7. රන් ගාන ලද කුඩිම්බිය. 8. සංගීත භාණ්ඩයක්. 9. පර්වතය.

ගලකඩ = 1. ගල කම්බලය; ගලස්තනය; තැලි පොළ (තැල්ල). 2 ගොනුන්ගේ තැලිපට.

ගල කඹ = 1. ගවයන් ගේ කරේ බඳින කඹය.

ගලග් = 1. කඳු මුදුන.

ගල ගණ්ඩ = 1. ගණ්ඩමාල රෝගය.

ගල ග්‍රහය = 1. උගුරෙහි හැදෙන රෝගයක්. 2. බෙල්ලෙන් අල්ලා ගැනීම. 3. බෙල්ල-මිරිකීම.

ගලග්‍රහ රාක්ෂසයා = 1. ගලෙන් තෙලූ රූ වෙසෙසක්.

ගලනවා = 1. උතුරා යනවා. 2. වතුර ගලායනවා.

ගලන හුරි = 1. ගලන ලේ.

ගලනාල (ගලනාල, ගලනැල). 1. ගලනාලය. 2. උගුරු දණ්ඩ.

ගලනීය = 1. දියකළ හැකි.

ගලන = 1. ගලන කල්හි.

ගලනනවා = 1. එකතු කරනවා. 2. සම්බන්ධ කරනවා. 3. මිශ්‍ර කරනවා.

ගල තල = 1. ගල් තලාව. 2. ගලේ මතුපිට. 3. ලෑල්ලක් මෙන් සමතලා ගල.

ගලනා = 1. කලවම් කොට; මිශ්‍ර කොට.

ගලනාංශු = 1. විස්මිතව ගල් ගැහීම;

ගලපටලය = 1. එතම් බෝවෙන රෝගය. 2. උගුරෙයි හැදෙන රෝගයක්.

ගලපනවා = 1. සම්බන්ධ කරනවා. 2. යොදනවා. 3. සුදුසු පරිදි සකස් කරනවා.

ගල ශන්තිය = 1. සිදුරුවලින් වතුර යෑම නැවැත්වීම.

ගල බඩ = 1. පර්වත සමීපය; කන්ද අසල.

ගලබන්ධන = 1. උගුරේ රෝගයක්.

ගල බිල = 1. උගුරු සිදුර.

ගල මුවා = (ගල් මුවා) 1. ශෛලමය; ගලින් තෙලූ. 2. මුව වෙසෙසක්.

ගල මුතු මාලා = 1. ගෙල පලඳින ආභරණයක්.

ගලම්බලාව = 1. කර බඳින පටිය හෝ නූල. 2. මාලය.

ගලය = 1. උගුර. 2. තලාව. 3. දුම්මල. 4. බටලීය. 5. ලණුව.

ගලරැව් = 1. ග්‍රීවාරාවය. 2. සිහින් කෙඳිරියක්. 3. පරෙවියා. 4. කුකුළා. 5. උගුරෙන් නිකුත්වන සිහින් හඬක්.

ගල රූපු = (ගල්රූපු) 1. පරෙවියා.

ගලවනවා = 1. බේරනවා. 2. නිදහස් කරනවා.

ගල වළු = 1. උකුණු වළ. 2. පිටිකර. 3. බෙල්ලේ පිටිපස්ස.

ගල වාටක = 1. ගලවළව. 2. බෙල්ලේ වළ.

ගලවාට සන්ධිය = 1. උගුරු හන්දිය.

ගල විදුලි = 1. රෝගයක්.

ගල සර = 1. ග්‍රීවාව.

ගල සිනි = 1. පල්මාහික්කම.

ගල සුණ්ඩිකා = 1. මුඛරෝගයක්.

ගල සුණ්ඩිකාව = 1. උඩුදිව; රහදිව.

ගලහර ඇම = (ගලයර ඇට) 1. අකු ඇටය

ගල් = 1. තද ද්‍රව්‍ය වර්ගයක්. 2. ශෛලය. 3. පර්වතය. 4. මැණික්. 5. දුඹු දේ.

ගල් අගුරු = 1. රට අඟුරු. 2. ගිනි දැල්විය-හැකි අඟුරු වැනි ද්‍රව්‍යය.

ගල් අන්නාසි = 1. අන්නාසි වර්ගයක්.

ගල් අතල = 1. ගල් තැටිය. 2. ගල් තලාව.

ගල් අද්ද = 1. ආචාරියා. 2. මැණික් කපන්නා.

ගල් අලු = 1. අල්ලක් මෙන් සෑදූ ගල; ගල් පෙණිය.

ගල් අල්ලනවා = 1. ආභරණ ආදී යෙහි ගල් බඳිනවා. 2. බිත්තිවල ගල් බඳිනවා. 3. ගලින් වසනවා. 4. වැටියෙහි පෙළට ගල් තබනවා.

ගල් ඉබ්බා = 1. ඉබි වෙසෙසක්.

ගල් එරෙජ්ජු = 1. අශ්මරි රෝගයක්.

ගල් කබු = 1. ගල් කඩින කටුව. 2. ගල් කපන ආයුධය.

ගල් කඩයා = 1. මාලු වර්ගයක්.

ගල් කණේඩු = 1. සූකිරි.

ගල් කරු = 1. ගලින් වැඩකරන්නා. 2. ගල් කපන්නා. 3. ගල් කඩන්නා.

ගල් කාෂ්ඨකයා = 1. තදහිත් ඇත්තා. 2. කපටියා. 3. චණ්ඩියා.

ගල්කාශයා = 1. ප්‍රයෝගකාරයා. 2. චණ්ඩියා. 3. තදහිත් ඇත්තා.

ගල්කැබ = 1. කුඩා ගල් කැබලි. 2. බොරලු කැට ආදිය.

ගල් කැස්බා = 1. කැස්බ විශේෂයක්.

ගල් කුළු = 1. ශෛල කූට; කඳු මුදුන්. 2. උස් ගල් පර්වතය.

ගල්කුරු = 1. පැලැටි වර්ගයක්. 2. ගල්ලෑලි වල ලිවීම සඳහා ගල්ලෑලි වර්ගයෙන්ම සෑදූ කූරු.

ගල්කුරුසියා = 1. ගල් මාළු වර්ගයට අයත් මාළුවා.

ගල්කෙම = 1. ගල් පොකුණ. 2. ගල්වළ. 3. ගලෙහිවූ පොකුණ.

ගල්කොඳු = 1. කුඩා ගල්කණු.

ගල් කොරලියා = 1. එනම් මාලුවා.

ගල් කොස්සා = 1. මාලු වර්ගයක්.

ගල් ගසනවා = 1. ගල්වලින් ගහනවා. 2. යමක් දෙසට ගල් විසිකරනවා.

ගල් ගැහුනා = 1. බියවීම් - ශෝකවීම් ආදිය නිසා ගලක් මෙන් නිසල වූනා. 2. ගල් මෙන් තදවෙනවා.

ගල් ගුළු = 1. මත්ස්‍යයෙක්; ගල් ගුල්ලා.

ගල් ගුහාව = 1. ගලේ බෙණය. 2. ගල් කුහරය. 3. ගල්ගේ.

ගල් ගෙඩිය = 1. ගල් කැටය.

ගල්ගේ = 1. ගල් ගුහාව. 2. ගලින් කළ ගෙය.

ගල් ටැඹ (ගල් ටැම්) 1. ගල් කණු.

ගල් නාගා = 1. සර්ප විශේෂයක්.

ගල් නාහර = 1. ඖෂධ වර්ගයක්. 2. තුවරලා?

ගල්නැව = 1. ගල් ඔරුව.

ගල්තල = (ගල් තැලි) 1. ගල් තලාව; ලෑල්ලක් මෙන් සමතලාවට පිහිටි ගල.

ගල්තහඩුව = 1. ගල් පොත්ත

ගල් තංගුවෙනවා = 1. ගල් ගැහෙනවා.

ගල්තැළුම = 1. ගල්වල හැපීමෙන් පයෙහි ඇතිවන පිළිකාව.

ගල්තුඹයා = 1. මාලු වර්ගයක්.

ගල් දූඳුල් = 1. කඳුහෙල් ආදිය ගහන පෙදෙස.

ගල් දූන්නා = 1. ගල් විදින දුනු වර්ගයක්.

ගල් දෙණී = 1. ගලින් තෙල්ලු ඔරුව.

ගල් පඩිය = 1. ගල් ගැසීමට යොදාගත් උපකරණයක්.

ගල් පතහ = 1. විශාල ගල් වළ.

ගල් පතුර = 1. තුනී ගල් කැබැල්ල. 2. ගලින් ගැලවුණු පතුර.

ගල් පසක් = 1. ශෛල ප්‍රාන්ත; කඳු පාමුල.

ගල්පවු = 1. ගල් කන්ද.

ගල් පවුර = 1. ගල් තාප්පය; ගලින් කළ ප්‍රාකාරය.

ගල් පහුර = 1. ගලින් කළ පහුර (දෙවොල්-දෙවි ගල් පහුරකින් ලක්දිවට ලඟාවීයයි ඇතැමෙක් කියති.) 2. තෙරඃ තිබෙන ගල් තීරය.

ගල් පාත් = 1. කඳු පාමුල.

ගල් පාවර = 1. ගල් වළක් ඇති ස්ථානය.

ගල් පාවිඩි = 1. කඳු පාමුල.

ගල් පාසි = 1. ගල් පෙඳ.

ගල් පිශලි = 1. ගල් මදු.

ගල් පුළුන්නා = 1. මාළු වර්ගයක්.

ගල් පෙණ = 1. අල්ලක් මෙන් සෑදූ ගල.

ගල් පෙදෙස = 1. කඳුකර රට.

ගල් පොකුණු = 1. ගලෙහි වූ පොකුණ.

ගල් පොත්ත = 1. ගලේ මතු පිට. 2. ගල් තලාව.

ගල් පොහිය = 1. අත්ගල. 2. දුරු-මිරිස් ආදිය අඹරන දරු ගල.

ගල් පෝරුව = 1. ගල් තලාව; ගල්ලෑල්ල.

ගල් බඩ = 1. ගල අසල.

ගල් බිල = 1. ගල් ගුහාව.

ගල් බෙයද = 1. පර්වතයක්හි බිඳී ගිය තැන.

ගල් බොරලු = 1. කුඩා (කබොක්) ගල් කැට.

ගල් මද = 1. එතම් ඖෂධ වර්ගය. 2. දුම්මල වෙසෙසක්?

ගල් මල = 1. මූදු හත්ත. 2. මූදේ ගල් වල සෑදෙන (මල් වැනි) හතු වර්ගය.

ගල් මිඩි = 1. ඔසු වෙසෙසක්.

ගල් මී = 1. දුම්මල වර්ගයක්.

ගල් මුරය = 1. ගල් රැසක් ගැසීම.

ගල් මූසලයා = 1. කාලකන්නියා. 2. අහේතු වන්තයා.

ගල් මිසු = (ගල් රුපු) 1. පරෙවියා.

ගල්ල = 1. ගල් සහිත ඉඩම.

ගල්ල නවා = 1. ගල්වනවා. 2. තවරනවා; ගානවා.

ගල් ලඳු = 1. රත් කරුවා.

ගල් ලන්නම = 1. කුඩා ගම.

ගල්ලෑල්ල = 1. ලෑල්ලක් මෙන් සෑදූ ගල.

ගල් ලියා = 1. මුදු මාළුවෙක්.

ගල් ලිම් = 1. ශිලා ලේඛනය.

ගල්ලෙන = 1. ගල් ගුහාව.

ගල් වඩුවා = 1. ගලින් රූප ආදිය තෙලන්නා.

ගල්ඩිනාඩා = 1. ගානවා. 2. තවරනවා. 3. ගිල්ලුවනවා.

ගල්ඩිත = 1. ගල්වන කල්හි. 2. නැව පිටි පස බැඳ ගෙන යන ඔරුව.

ගල් වර්ෂාව = 1. ගල් වැස්ස.

ගල් වල් = 1. පර්වතයෙහි වූ ආරණ්‍යය

ගල් වල් රට = 1. කඳු රට. 2. මලය දේශය.

ගල් වළ = 1. ගල් පතලය; ගල්පතන.

ගල් වාඩිය = 1. වියමනෙන්ම රෙද්දේ ඇති වූ වාටිය.

ගල් වැඩිය = 1. පේළියට ඇතුරූ ගල් පවුර.

ගල් විත් = 1. ගල් දුඹු පසුම්බිය.

ගල් වෙඩි = 1. ගල් පිපිරවීම සඳහා යොදන වෙඩි.

ගල් වෙනවා = 1. තද වෙනවා. 2. ගල් ගැසෙනවා.

ගල් වෙරෙජ්ජු = 1. තද පිළිකාව. 2. අශ්මරී රෝග භේදයක්?

ගල් සන්නස් = 1 ගල්වල කොටූ ලියවිලි.

ගල් සියඹලා = 1. එතම් සියඹලා වර්ගය.

ගල් සීනක්කාරම් = 1. ඖෂධ වර්ගයක්.

ගල් සෙල = 1. ගල් කන්ද.

ගල් සෙවෙල් = 1. එතම් ඖෂධය.

ගල් හල් = 1. රථ තබන ශාලාව.

ගල් හරඹය = 1. ගල් වලින් ගහ ගැනීම.

ගල් හේ = 1. ගල් ඒදණ්ඩ. 2. ගලින් තැනූ පාලම.

ගලා = 1. තද හිත් ඇති තැනැත්තා. 2. කිහිරි ගස. 3. දේව වේසාව. 4. ගැලීම කොට.

ගලාගෂාවා = 1. පිරී උතුරා යනවා. (වතුර ආදිය ගහගෙන යනවා)

ගලිත = 1. වැගුරුණු. 2. ගිලිහුණු. 3. දියවූ 4. ඉගිල්ලී වැටුණු.

ගලින් = 1. කහට ගස. 2. පතුක්. 3. ගල් කරඳ.

ගලු = 1. ගල. 2. ගස්-වැල් හෙවුණු තැන.

ගලු ගුළුවා = 1. පක්ෂි වර්ගයක්.

ගල්බණ්ඩාර = 1. ලක් රජය ලබාගන්නට ගොස් ඇමතියන්ගේ උගුලකට අසුවී ඇතුගලින් පහතට වැටී මිය ගිය කුමාරයෙක්.

ගලොචිකා = 1. කිඳිමැල.

ගල = 1. සමූහය. 2. පඩසාහිය. 3. රෞද. 4. ගිලිහුණු. 5. ගහනය. 6. ඝන.

ගලදෛර = අන්තඃ පුරය. 2. ඇතුළු නුවර. 3. ස්ත්‍රී නිවාසය.

ගලන = 1. ගිලිහෙන. 2. වැගිරෙන. 3. ගිලිහීම.

ගලපනවා = 1. එකතු කරනවා. 2. සම්බන්ධ කරනවා. 3. සාස්සනවා. 4. සකස් කර නවා. 5. යොදනවා.

ගල රැවි = 1. (ගල රැවි බලන්න)

ගලවනවා = 1. නිදහස් කරනවා. 2. බේරනවා. 3. ඇණ ආදියකින් සවිකොට තිබෙන දෙයක් උගුල්ලනවා. 4. ඇඳුම් ආදිය ඉවත් කරනවා.

ගළු = 1. ගැළු. 2. වැගුරුණු.

ගළුෑවි = 1. රසකිඳ.

ගව = 1. හරකා. 2. ගවයන් සම්බන්ධ. 3. වෘෂභ රාශිය.

ගව ඔරුව = 1. හරකුන්ට කෑම දෙන (භාජනය) ස්ථානය.

ගවර = 1. කිරිඑළ දෙනුන්ගේ කිරි.

ගවගන = 1 ගව දෙන. 2. සුරභිධේනුව.

ගවද = (ගවජ) 1. ගව විශෙෂයක්. 2. ගවරා. 3. ගව ගාල.

ගවදරු = 1. වස්සෝ. 2. හරක් පැටව්.

ගවන = 1. හරක්; ගවයන්.

ගවනා = 1. විෂ්ණු.

ගවනානදි = 1. ආකාශ ගඞ්ගාව.

ගවපල් = (ගවපලු) 1. විෂ්ණු. 2. ගොපල්ලා.

ගව පලු ලිය = 1. ගොපලු ස්ත්‍රී.

ගවපාන = 1 එළ කිරෙන් සාදන රසවත් බීමක්? 2. ගිතෙල්-වෙඬරු-දී-කිරි-මෝරු යන පස් ගෝ රස පානය. 3· පැන් නුමුසු කිරි බත.

ගව ශාලු = 1. සරයෝ පැටවා.

ගව බන්ධි = 1. ගොපාලකම; ගෝපාලකම.

ගව මහිෂ = 1. එළ ගොන් හා මී ගොන්.

ගවය = 1. ගවරා 2. වඳුරු වෙසෙසක්?

ගවයන් = 1. හරකුන්. 2. ගොනා නමැති වාහනය. 3. ගොනා වාහනය කොට ඇත්තා. 4. ඊශ්වරයා.

ගවයහන් = 1. ගොනා නමැති වාහනය. 2. ගොනා වාහනය කොට ඇත්තා. 3. ඊශ්වරයා.

ගවර = 1. මී හරකා වැනි සිවුපාවෙක්. 2. කන වේණා? 3. කුණු. 4. පිළිකුල් දේ. 5. ගොම; ගව එළ මුත්‍ර.

ගවර කුළු = 1. 1. ගවර රැළ.

ගවර පිනි = 1. ගොම පිරුණු.

ගවර වළ = 1. කුණු දමන වළ

ගව රූප = 1. ගෙරි; හරක්. 2. ගවයන් ගේ රූප.

ගවරහං = 1. තලා වර්ගයක්.

ගවලය = 1. මී හරක් අඟ.

ගවලයා = 1. කුළු මී හරකා.

ගව වසූරිය = 1. වසංගත රෝගයක්.

ගවසනවා = 1. සවිකරනවා. 2. සරසනවා. 3. සත ගේ යොදනවා. 4. මිශ්‍ර කරනවා.

ගවසම්පත = 1. කිරි එළදෙනුන් හා ගවයන් බොහෝ දෙනෙකුට හිමිකාරයා වීම නමැති සම්පත.

ගවසා = 1. සරයා. 2. සත ගේ යොදු.

ගව්ඩ = 1. එනම් දේශය.

ගව්ව = 1. සැතපුම් හතරක දුර ප්‍රමාණය.

ගව්‍ය = 1. ගවයන් හට අයිති.

ගව්‍යය = 1· දුන්නේ ලණුව. 2. හිරියල්.

ගවා = ගායනා කරවා. 2. ගස්වා; ගටා.

ගවාක්ෂ = 1. ගවයකුගේ මෙන් ඇස් ඇති. 2. වටකුරු ජනේලය. 3. සිදුරු ඇති.

ගවාක්ෂය = 1. ගවඇස්. 2. කවුළුව; සිදුර.

ගවාක්ෂයා = 1. නායක වානරයා. 2. ලොකු ඇස් ඇති වඳුරා.

ගවාක්ෂජාල = 1. දැල් කවුළු.

ගවාදනා = 1. තණ; ගවයන්ගේ ගොදුර.

ගවාදනිය = 1. තණ ඔරුව.

ගවාලූකයා = 1. ගව වර්ගයක්.

ගවි = 1. ගිතෙල්.

ගවින = 1. වෙඩරු.

ගවු = 1. සැතපුම් සතරක දුර ප්‍රමාණය.

ගවුම = (ගවොම) 1. කාන්තා පක්ෂයේ ඇඳුමක්.

ගවුම්ජ් පාසාණ = 1. පාසාතම් වර්ගයක්. 2. එතම් විෂ ද්‍රව්‍යය.

ගවේරුක = 1. සිවංගුරු. 2. රතු කිරිමැටි.

ගවේෂ = 1. කුණු පිරුණුවල. 2. සෙවීම.

ගවේෂක = 1. සොයන්නා.

ගවේෂණ = 1. සෙවීම.

ගවේෂිත = 1. සොයන ලද.

ගවේෂී = 1. සොයන්නා.

ගවෝදක = 1. ගවයන්ගේ මූත්‍ර.

ගස = 1. ගහ. 2. පැළය. 3 ගසව; පහර දෙව.

ගසගෑසි = 1. ලොකු කුඩා ගස්.

ගසනවා = 1. පහර දෙනවා. 2. සවි කරනවා.

ගස් = 1. කුඩා පැළෑටි. 2. වෘක්ෂය. 3. ගැටීම. 4 පහර.

ගස්කාසබිලිය = 1. කසබිලිය වෙසෙසක්

ගස්කෑලිය = 1. එතම් ගස. 2. නාගබලා?

ගස්කොළන් = 1. ගස් හා පැළෑටි.

ගස්ගෙඩියා = 1. ගස් යන මිනිහා.

ගස් ගෙම්බියා = 1. ගස්වල ගැවසෙන ගෙම්බා

ගස්ගෝනා = 1. දෑවැන්ත සිරුරක් ඇති කම්මැලියාට කියන සරදම් වචනයක්.

ගස්පණුවා = 1. ගස්වල හදිගන්නා පණුවා.

ගස්පෙණෙල = 1. එතම් ගස.

ගස් බිල = 1. ගස් බෙනය. 2. බෙලි ගස.

ගස්බෙන = 1. රුක් සිදුර; ගස් බිලය.

ගස් මදිනවා = 1. පොල් – තල් – කිතුල් ආදි ගස්වල මල්වලින් ඕජාව ලබා ගන්නවා.

ගස් මන්ද = 1. රොඩී මිනිසුන්ගේ ප්‍රධානයාට කියන ගරුනාමයක්.

ගස් මීයා = 1. ගස්වල ගැවසෙන මී වෙසෙසක්.

ගස් සමන් = 1. පිච්ච ගස.

ගසාකනවා = 1. අයුතු ලෙස පල ලබනවා' 2. උදුරා කනවා. 3. කොල්ල කෑම.

ගසාගන්නවා = 1. අයුතු ලෙස ගන්නවා. 2. රවටා ගන්නවා.

ගසාදමනවා = 1. ගසා හෙළනවා.

ගසිරි = 1. මඟුල් කරඬ.

ගහ = 1. ගස. 2. ගෙය. 3. ග්‍රහයා. 4. ගොවියා. 5. තාරකාව.

ගහඹිරනවා = 1. කඩාකප්පල් කරනවා, 2. සමඟිය නැතිකරනවා; හෙද කරනවා

ගහකාරක = 1. ගෙය සාදන්නා.

ගහකෝල = 1. ගස් හා පැළෑටි. 2. ගස් හා අතු. 3. වගාකොට තිබෙන වැවිලි.

ගහගණියනවා = 1. සුළඟින් හෝ වතුරෙන් ගසාගෙන යනවා.

ගහගන්නවා = 1. සංඩු කරනවා; දබර කරනවා.

ගහගණිත = 1 ග්‍රහයන්ගේ ගමන් ආදිය සම්බන්ධ කරුණු දැනගැනීමට ඉවහල්වන ගණිත ක්‍රමය.

ගහ ගෑමුණු = 1. ග්‍රහයන්ගේ ප්‍රධානයා; සූර්යයා.

ගහගෙඩියා = 1. ගොවියා. 2. ගෙදර ස්වාමියා.

ගහට = 1. හිරිහැර. 2. හැප්පීම 3. පීඩාව. 4. සටන. 5. සමාකතාවය. 6. දුක. 7. කවට කම.

ගහන = 1. ඝනවීම. 2. බෙහෙවින් තිබීම. 3. පඳුරු සහිත. 4. ගැවසීගත්. 5. බහුල. 6. ඝන වනය.

ගහනඅඳුරු = 1. ඝනාන්ධකාරය.

ගහණත් = (ගහණ + අත්) 1. ගණදෙවි. 2. නාසය අතවූ නැතැත්තා.

ගහමග = 1. ආකාශය.

ගහන්සිඛු = 1. නාසා සතරක් ඇත්තා; මහා බ්‍රහමයා.

ගහන් = 1. ආකාශය. 2. තාරකා. 3. වනය. 4. දෙව්ලොව.

ගහණ = 1. ග්‍රහණය; අල්වා ගැනීම. 2. ප්‍රමාණ විශේෂයක් 3. භාජනය.

ගහණව = 1. බහුල වශයෙන්. 2. විසුරුණු.

ගහණී = 1. ග්‍රහණිය.

ගහතරඟ = 1. තාරකා පඞ්ක්තිය.

ගහතරු = 1. ග්‍රහ තාරකා.

ගහපති = 1. ගෙදර ප්‍රධානයා; ගෘහ පතියා. 2. පවුල් කාරයා.

ගහපති මහාසාල = 1. ධනවත් ගෘහ පතියා.

ගහපතානි = 1. ගෙයි ස්වාමිදුව. 2. ගෘහිණිය

ගහමග = 1. අහස; ග්‍රහයන්ගේ මාර්ගය.

ගහමැණි = (ගහමිණ) 1. ග්‍රහතාරකාවන්ගේ මැණික; සූර්යයා.

ගහමූල = 1. ගසේ මුල. 2. ගස යට.

ගහය = 1. ගෙය. 2. ග්‍රහ තරුව.

ගහරජ = 1. ග්‍රහයන්ගේ රජ; සඳ.

ගහරුස = 1. තරු රැස.

ගහල = 1. අල වර්ගයක්.

ගහළු = 1. එනම් කුලය (මේ කුලයෙහි වූවෝ රජඅණ ලෙස වධ්‍යයන්ට වධ දීමත් කුණු අතු ගා පිරිසිදු කිරීම හා අශුචි බැහැර කිරීමත් කළහ. 2. අලුගෝසුවා. 3. සමූහය. 4. කසළ.

ගහලසම්බන්ධයා = (ගහලයා බලන්න.)

ගහවෙසෙසස් = 1. සිතුරා.

ගහසර = 1. ග්‍රහචාරය.

ගහසෙට්ඨ = 1. ශ්‍රේෂ්ඨ ග්‍රහයා; සූර්යයා

ගහ්වරය = (ගහ්වරිය) 1. ගුහාව. 2. උඩඟුකම. 3. කපටිකම. 4. අතු පත්දලම. 5. ඇඹිම.

ගහෘ = 1. ගැටීම. 2. නැපීම.

ගහිත 1. ගන්නා ලද. 2. අල්වාගත්.

ගහිතභාව = 1. ගන්නා ලද බව. 2. අල්වා ගත් බව.

ගෙසාණීය = 1. හේමකද වනන විසිතුරු රෙද්ද. 2. සරසනලද රෙදි වැස්ම.

ගළ = 1. සටාව; පඞ්ක්තිය. 2. රොද. 3. ඝන. 4. ගහනය. 5. ගිලිහුන.

ගළඳෙර = 1. අන්තඃපුරය.

ගළවස් = 1. බොහෝ ජනයා වසන.

ගා

ගා = 1. ගාථාව. 2. ගැමකොට. 3. ගායනා කොට. 4. ශුක්‍ර ධාතුව. 5. කැක්කුම. 6. ශක්තිය. 7. රෝගය.

ගාංගානිය = 1. ගඞ්ගානම් දෙව්දුව.

ගාඞ්ගෙය = 1. ගඟින් උපන්. 2. රන්. 3. ක්‍රිෂණා. 3. කාර්තිකේය.

ගාසමුව = 1. යමක් සවි කිරීමට හෝ ඇමිනී-මට යොදන උපකරණයක්.

ගාමනවා = 1. පැටලෙමින් හෙමින් යනවා.

ගාඪ = 1. ගැම. 2. දැඩි. 3. සේවනය කරන. 4. ඉරීම. 5. තද.

ගාඩිය = 1. දූත්ත. 2. ගොන් කරත්තය.

ගාඩියා = 1. රොඩී මිනිහා.

ගාඩිගෙය = 1. රතින්කළු.

ගාඩිව = 1. අර්ජුන රජුගේ දුන්න.

ගාඪ = 1. ඉතා දැඩි. 2. තද. 3. බෙහෙවින්. 4. දුර්බෝධ බව. 5. සේවනය කරන ලද.

ගාඪ අන්ධකාර = 1. තද කළුවර.

ගාඪ නිද්‍රා = 1. තද නින්ද.

ගාන = 1. ගී කීම. 2. ගායනය. 3. ගායනා කරන. 4. ශබ්දය. 5. ගැම කරන.

ගානඩා = 1. අතුල්ලනවා. 2. උලනවා. 3. තවරනවා 4. නාදකරනවා.

ගානා = 1. (වීණා) වාදන කරන 2. ගායනා කරන. 3. ගැමකරන.

ගාන්ධර්ව = 1. ගාන්ධර්වයා. 2. තූර්ය වාදකයා. 3. සංගීතය. 4 සංගීත ශාස්ත්‍රය. 5. ගාන්ධර්ව විවාහය (උත්සව ආදියෙන් තොරව ආලය මුල්කොට ගෙන කරන විවාහය) 6. දිව්‍ය සංගීතකාරයා.

ගාන්ධාර = 1. වීණාවෙහි ලැබෙන ස්වරයක්. 2. ගාන්ධාර දේශය. 3. සාදිලිංගම්. 4. සුවඳ වර්ගයක්.

ගාන්ධාර ප්‍රතිමා = 1. ගාන්ධාර දේශයේ ක්‍රමයට කෙළෑ පිළිම.

ගාන්ධාරවිද්‍යා = 1. මන්ත්‍ර ශාස්ත්‍ර ප්‍රභේදයක්.

ගාන්ධාරී = 1. දුර්යෝධන රජුගේ මවු.

ගාන්ධි = 1. මෝහන්දාස් කරම්චන්ද් ගාන්ධි තුමා (මෙතුමා අවිහිංසා සටන මෙහෙයවමින් භාරත දේශයට නිදහස ලබාදුන් වීර වරයාය.)

ගාණිය = 1. ගායනය කළයුතු. 2. සංගීත.

ගාණ්ඩීව = 1. දුන්න.

ගාත = 1. අත් හා කකුල්. 2. සිවුපාවකුගේ කලව.

ගාතු = 1. තරග වූ.

ගාතුයා = 1. ගීතිකා කරන්නා. 2. කෝකිලයා. 3. බඹරා. 4. දිව්‍ය ගීතිකා කාරයා.

ගාත්‍රය = 1. ශරීරය. 2. ශරීරාවයව.

ගාත්‍රා අක්ෂර = 1. ගතකුරු; ව්‍යඤ්ජනාක්ෂර.

ගාථක = 1. ගායනා කරන්නා. 2. ගී කියන්නා.

ගාථා = 1. පාලි භාෂාවෙන් ලියූ පද්‍යය.

ගාථාඅඩ = 1. ගාථාවෙන් අඩ; ගාථාවෙහි දෙපදයක්.

ගාථාපද = 1. ගාථාවේ පාදය හෙවත් හතරෙන් කොටස.

ගාථාබන්ධන = 1. ගාථා රචනාව.

ගාධ = 1. ගැඹුර. 2. ස්ථානය. 3. පතුල. 4. ස්ථිර භූමිය. 5. ග්‍රහණය 6. ගැම.

ගාම = 1. ගම.

ගාමක = 1. කුඩාගම.

ගාමඝාත = 1. ගම් පැහැරීම.

ගාමන්ත = 1. ගම අසල. 2. ගම් කෙළවර.

ගාමනිගම = 1. ගම් නිගම් ගම්.

ගාමණී = 1. ගැමුණු රජ. 2. උතුම්. 3. ගම් ප්‍රධානයා.

ගාමදාරක = 1. ගම් දරුවා.

ගාමදාරිකා = 1. ගම්දැරිය.

ගාමද්වාර = 1. ගම්දොර.

ගාමධම්ම = 1. මෛථුන සේවනය.

ගාමසීමා = 1. ගම්ඉම.

ගාම්භීර = =. ගම්භීර. 2. ගැඹුරු. 3. බැරෑරුම්. 4. බරපතල.

ගාමී = 1. ගත.

ගාමිනී = 1. ගත සුලු. 2. පමුණුවන.

ගාය = 1. රෝගය. 2. දඟ. 3. අසනීප. 4. කලබල සහිත බව.

ගායක = 1. ගායනා කරන්නා.

ගායන = 1. ගී කීම. 2. ගීතය.

ගායිකා = 1 ගී කියන්නී.

ගායත්‍රිය = 1. ආගමික ගීතය. 2. මන්ත්‍රය. 3. මාත්‍රා හයකින් යුත් කවි පේළිය.

ගාරව = 1. ගෞරවය. 2. සැලකිල්ල.

ගාරවතා = 1. ගෞරව ඇතිබව.

ගාරුප්පුව = 1. ගැරුප්පුව. 2. ආහාර ගැනීම් ආදියෙහිදී යෙදෙන හැඳි වෙසෙසක්.

ගාර්ද්ධි = 1. මුරකරන්නා. 2. මුර කිරීම.

ගාර්භිණ = 1. ගැබිණියන්ගේ සමූහය.

ගාරුඩය = 1. විෂ බස්සන මන්ත්‍රය. 2. රත්රන්. 3. කොළපාට ගල; මැණික් වෙසෙසක්.

ගාල = 1. ගොනුන් බඳින ස්ථානය. 2. හරක් පට්ටිය. 3. සමූහය. 4. වගාව (දුම්ගාල) 5. රංචුව (ඇත්ගාල)

ගාල් = 1. සිවුපාවුන් ඇතිකරන තැන. 2. හරක්පට්ටි.

ගාල් කරනවා = 1. රංචුපිටින් අල්ලනවා. 2. ගාලට ඇතුල් කරනවා.

ගාල්කඩ = 1. ගාලෙහි ඉදිකඩ.

ගාල්දොර = 1. ගාලෙහි දොරටුව.

ගාලගෝට්ටිය = 1. සංඩු-දබර ඝෝෂාව. 2. කන් කරච්චලය.

ගාලි = 1. දෝෂය.

ගාව = 1. අද්දර, 2 ළඟ. 3. ගැටිය.

ගාවනවා = 1. ගෑම කරනවා. 2. ඇගේ අතුල්ලවනවා.

ගාවා = 1. හප්පා. 2. ගෑම කරවා. 3. අතුල්ලවා. 4. ළඟ.

ගාවටම = 1. ළඟට; සමීපට

ගාවි = 1. ගවදෙන; එළදෙන.

ගාවිනා = 1. වේදනාව. 2. පීඩාව. 3. මී මැසි ආදීන් ඇනීම.

ගාවුත = 1. ගව්ව.

ගාවුතික = 1. ගව්වක් පමණ ඇති.

ගාස්තුව = 1. කුලිය. 2. ගෙවිය යුතු මුදල. 3. වැටුප.

ගාහ = 1. ගැනීම. 2. ඇල්ලීම. 3. වෘත්තයක්. 4. කම්පාවීම. 5. බැසගැනීම. 6. වැදීම; ගැලීම.

ගාහක = 1. ගන්නා. 2. අල්වන්නා. 3. ගෙන යන්නා. 4. උගුලන්නා. 5. දහ අට වන්නම් අතුරින් එකක්.

ගාහන = 1. බැස ගැන්ම.

ගාහිනවා = 1. වගුරනවා. 2. වක්කරනවා.

ගාහී = 1. ගන්නා. 2. අල්වන්නා. 3. බාර ගන්නා.

ගාළ්හ = 1. දැඩි. 2. බලවත්.

ගැ

ගැ = 1. ගීත.

ගැගුල = 1. ගවමූත්‍ර.

ගැජුම = (ගැජුම්-ගැජුන්) 1. ගෙරවීම 2. මේඝ ගජිතාව.

ගැට = 1. නොපැහුණු. 2. ලා. 3 ගැටය. 4. ගෙතීම; බැම්ම. 5. තැලීම. 6 කොන්ද; කුඩා පැළය. 7. පුරුක් වෙන්වූ තැන සන්ධිය. 8. පහර වැදීම් ආදියෙන් ගෙඩි ගැසුණු තැන. 9. දුර්බෝධ ස්ථානය. 10. ගස්හි උස්වූ තැන. 11. තරුණයා හෝ ගැටවරයා. 12. බැම්මක් එකට බඳින තැන. 13. නොමේරූ දරුගැබ.

ගැට අංකුඩුසු = 1. කටුසු වෙසෙසක්.

ගැට ආකාර = 1. ගැට මෙන්.

ගැට එලනවා = 1. ගබ්සා කරනවා.

ගැට කපනවා = 1. අයිතිකාරයාට නොදැනෙන සේ සාක්කුවලින් මුදල් පසුම්බි ආදිය සොරාගැනීම.

ගැට කපන්නා = 1. ගැට කපන සොරා.

ගැට කරවලා = 1. සර්ප විශෙෂයක්.

ගැටකිඹුල් = 1. ඇඟෙහි ගැට තිබෙන කිඹුලා.

ගැටකොස් = 1. ගැට සහිත කොස් ගස. 2. පොලස; පොලොස් ගැට.

ගැට ගසනවා = 1. ගැට ගහනවා; ගැටයකින් බඳිනවා. 2. උගුලක් අටවනවා. 3. උපායක් යොදනවා.

ගැට ගැන්වීම = 1. සිවුරෙහි ගණ්ඨිය පාසයෙහි යෙදීම.

ගැටතැන් = 1. ග්‍රන්ථි ස්ථාන; තේරුම් ගැනීමට අමාරුතැන්.

ගැට තිඹිරි = 1. ගස් වර්ගයක්.

ගැටකුඹ = 1. පැළෑටි වර්ගයක්.

ගැට තෝඩු = 1. බුලත්.

ගැට නිඹුල් = 1. ගස් වර්ගයක්.

ගැටනිඹුල් = (ගැට තිඹුල්) 1. හැරගුම්.

ගැට නිඹුල් හර = 1. මාල වර්ගයක්.

ගැට පටහ = 1. බෙර වෙසෙසක්.

ගැටපත් = 1. පත් වර්ගයක්.

ගැටපස් = 1. සිවුරෙහි ගණ්ඨිය අමුණන තැන අල්ලන රෙදි කැල්ල.

ගැටපද = 1. තේරුම් ගැනීමට අපහසු වචන.

ගැටපද විවරණය = 1. දුර්බෝධ පදයක්ගේ අර්ථ දක්වෙන පොත.

ගැටපටිකා = 1. ගැට හා පැළීමෙන් වූ පතුරු.

ගැට පහබු බෙර = 1. බෙර වෙයෙසක්.

ගැට පිච්ච = 1. පිච්ච මල් වෙසෙසක්.

ගැට පොළඟා = 1. සර්ප විශේෂයක්.

ගැටබාන් = 1. ගැට සහිත ලණු.

ගැටබෙර = 1. බෙර වර්ගයක්.

ගැටඹෙර = 1. (අත්තාසි ආදිය විෂවීමෙන් සැදෙන) ලෙඩක්.

ගැටමුසු = 1. ගැට සහිත. 2. තේරුම් ගත නොහැකි. 3. අමුල් සහිත. 4. පැටලිලි සහිත.

ගැටමුසුන් = 1. ගැට කපන හොරා?

ගෑමග = 1. නොපැහුණු ගෙඩිය. 2. බැම්මෙ ගැටය. 3. බොත්තම. 4 උපාය. 5. පුරුක.

ගෑමෂා = 1. කොලුවා. 2. තරුණයා.

ගෑමලනු = 1. ගැට බාන. 2. ගැටලීම. 3. ගැට සහිත වට්ටිය.

ගෑඟලීය = 1 ගල් කණු මුල්හි සාරන කැටයම් විශේෂයක්.

ගෑමුළු = ගැට මුඳු 2 හෝරුම් ගැනීමට අපහසු

ගෑමඬිනු = 1 සිවුරේ බොත්තම ඇමිණීමට යොදගත් සිදුර 2 සිවුරෙහි අල්ලන නූල් ගුළිය වූ ගණ්ඨිය.

ගෑමඬිනු ගෑත්ඹීම = 1 දෙවුර වසා සිවුර ඇඳීම. 2. සුපටිච්ඡන්න ලෙස සිවුරු පෙරවීම.

ගෑමවරයා = (ගැටියා බලන්න)

ගෑමවරා = 1 නොමේරූ ගෙඩි.

ගෑමවනුමල් = 1. ගැට හටගත් මල්.

ගෑමවිහකම = 1. පරෙස්සම.

ගෑමවං = 1. ප්‍රයෝග සහිත. 2 ගැට කපන හොරා, 3. කෛරාටිකයා.

ගෑමසරවි = 1. ගැට මැහුම්.

ගෑමසු = (ගැටහු) 1. නූල් ගොතන්නා. 2. සොරා.

ගෑමහු = 1. ගැට ගැසුණු නූල්. 2. (නූල් වලින් ගෙතූ) ගෙලෙහි පලඳනා ආභරණයක්.

ගෑව්ම = 1. හැලි වලන් ආදියෙහි කට 2. ළිඳේ බැම්ම. 3. වැවේ අද්දර.

ගෑවී = 1. ගලපන ලද. 2. මැටි භාජන ආදියෙහි කර හෝ කට. 3. ගැටීම. 4. ළිං ආදියෙහි වට බැම්මේ කට.

ගෑවිය = 1. ගැට්ට. 2. අද්දර.

ගෑඹිස්සා = 1. කොල්ලා. 2. ඉස්සන් වර්ගයක්.

ගෑවිස්සී = 1. පැටික්කි; තරුණ සත්‍රී.

ගෑඩීම = 1. වැදීම. 2. ඇතිල්ලීම. 3. සට්ටනය වීම. 4. හැප්පීම. 5. අමාරුව. 6. කිරිහැරය.

ගෑඬෙනාවා = 1. හැපෙනවා. 2. වදිනවා. 3. සටනට වෙනවා.

ගෑඩපණුවා = 1. ගැඩවිල් පණුවා; ගැඩවිලා. 3. ගැඩවුල් පණුවා.

ගෑඩඹීය = (ගැඩුම්බ=ගැඩවි) 1. අර්ජුනගේ දුන්න.

ගෑඩඹිල් = (ගැඩවුල් - ගැඩහුල්) 1. ගැඩවිලා; පොළොව යට සිටින දිග පණු වර්ගයක්.

ගෑඩබු = 1. බූරුවා.

ගෑඩුබු = 1. ගැඩිඹ ගස; ගැඩුඹු ගස. 2 කොටලුවා.

ගෑඩෙඹි = 1. කුරුලෑව.

ගෑඩොළු = 1 ගඩොල්.

ගෑණ = 1 සඳනා 2. සිත්න. 3. තිසා.

ගෑත්ම = 1. දුෂ්කර අවස්ථාව. 2. වැටී සිටි අමාරු තත්වය. 3 ගැනීම; අත්කරගැනීම.

ගෑත්ඹීම = 1 ගන්නට සැලැස්වීම.

ගෑනුම් කාරයා = 1. මිලයට ගන්නා තැනැත්තා

ගෑණ = 1. ගණන් කර. 2. සඳනා.

ගෑණී = 1. ගණකයා.

ගෑණීම = (ගැණුම) 1. ගණන් කිරීම.

ගෑණේණ = 1. ගනු ලබන.

ගෑඩවිල් = 1. ගැඩවිල් පණු.

ගෑඩහුල් යෝනි = 1. ගැඩවිල් ජාතිය·

ගෑඩුඹු = 1. ගැඩුඹ ගස. 2. කොටළුවා. 3. ගැඩවිල් පණු

ගෑක්ෂේතී = 1. අයිතිය; අයිති එකකි.

ගෑති = 1 අයිති. 2. දූසයා. 3. සේවක වූ 4. ගත්තා ලද.

ගෑති මෙහෙ = (ගැති මෙ) 1· දූස වැඩ.

ගෑතියා = 1. ගැත්තා. 2. වැඩ කාරයා. 3. සේවයට කැපවූ තැනැත්තා.

ගෑෂ = (ගැප්-ගැබ්) 1. කුසය; බඩ. 2. දරු ගැබ. 3. කුහරය. 4. (මුහුදෙහි) රළ නැගෙන පෙදෙය.

ගෑප්ගත් = (ගැබිගත්) 1. බඩදරු. 2. කුස පිළිසිඳ ගත් දරුවකු සහිත.

ගෑප් ගෙණ = 1. දරුවකු කුස පිළිසිඳ ගෙන.

ගෑප් ගේ = (ගැබිගේ) 1. ගබඩාව· 2. ඇතුළු කාමරය. 3. චිඳහ ගේ.

ගෑබ = 1. ගැබෙහි සිටින දරුවා. 2. කුසය; බඩ. 3. කුහරය. 4. දරු ඔබ්නොත්ත.

ගෑබ්ඳුනු = 1. පිළිසිඳීම.

ගැබපණු = 1. බඩ පණුවා.

ගැබපෙරහර = (ගබ පෙරහර) 1. කුස ඔත් දරුවාගේ ආරක්ෂාවට පවත්වන උත්සව පූජාව.

ගැබමල = 1. වැදුමහ.

ගැබර = 1. කුසේ දරුවා.

ගැබලි = 1 පුස; ඉජ්ම.

ගැබසිරි = 1. කුසයෙහි හටගත් දරු සම්පත.

ගැබ සිරු = (ගබසිරු) 1. කලල රූපය.

ගැබ්ගත් = (ගැජ්ගත් බලන්න.)

ගැබ්සා වැමෙණවා = 1. ගජ්සා වෙහවා.

ගැබිණි = (ගැබිලි) 1 ගර්භිණිය; බඩදරු ස්ත්‍රිය

ගැබු = 1. ගර්භය 2. කාමරය.

ගැඹුර = 1. ගැඹුරු 2 ජඹුර 3 දුර්බෝධ.

ගැඹුරුවල් = 1 ගමින් ඈත්වූ සහ කැලෑ.

ගැඹුරුහඬ = 1. ගොරෝසු ශබ්දය.

ගැමි = 1. ගම්. 2. ගමෙහි වූ 3. පිටිසර 4. ගම්බද.

ගැමිඅරුත් = 1. ග්‍රාම්‍යාර්ථය. 2. අසභ්‍ය අර්ථය.

ගැමිදම =1 ගමේ සිරිත. 2. මෛථුන සේවනය.

ගැමිදුද = 1. ගම කථාව.

ගැමිදෙස් = 1. ග්‍රාම්‍යාර්ථ දෝෂය.

ගැමිබස = 1. ග්‍රාම්‍ය භාෂාව. 2 අශිෂ්ට වචන.

ගැමියා = 1. ගම් වැසියා. 2. පිටිසරයා.

ගැමුණු රජතුමා = 1. ලංකාවේ උපන් ශ්‍රේෂ්ඨ සිංහලයා (මෙතුමා දශ මහා යෝධයන් හා කඩොල් ඇතුගේ ද සිංහල සේනාවේද උපකාර ඇතිව දෙමළුන් පරදවා ත්‍රි සිංහලය එක්සත් කොට මෙක ලක් රජය කෙළේය. රුවන්මැලි මහසෑය ඇතුළු වෙහෙර-විහාර රැසක් කරවා රට වැසියාගේ දියුණුවද සැලසුවේය.)

ගැසීම = (ගැයුම) 1. ගායනය කිරීම.

ගැරඬියා = 1. විස රහිත එතම් සර්පයා.

ගැරඬිදෙන් = 1. ගැරඬියාගේ ගෑණු සතා.

ගැරඬිල් = 1. ගැරඬියා. 2. පණු වෙසෙසක්.

ගැරහිණි = 1. ගෘහිණිය.

ගැරහීම = (ගැරහුම) 1. නින්දා කිරීම.

ගැරූහිණි = 1. ගෘහිණිය; ගෑණි.

ගැරුම් කාරයා = 1. (මැණික් ආදිය) ගරන්නා.

ගැලුම්ත = 1. කරත්තයේ ඒරිය කද.

ගැලකීම = (ගැලතුම) 1. සම්බන්ධකිරීම.

ගැල් = 1 කරත්තය. 2. යාල; කරත්තයක පැටවිය හැකි ප්‍රමාණය. 3. කරත්ත අලවංගුව.

ගැල් අකුර = 1. කරත්තයක අලවංගු සිදුර.

ගැල්බුර 1 ඒරිය කද.

ගැල් නැබ = (ගැල්නාබිය) 1. බොස් ගෙඩිය.

ගැල් පැදවීම = 1. රථය නමන් කරවීම; කරත්තය දක්කීම.

ගැල්මග් = 1. කරත්ත පාර.

ගැල්ම = 1. ගැලීම 2. කාලතුර ගැලීම.

ගැල්ලුම් = 1 ගැලපීමට ගන්නා දේ 2. හිස ගැල්ලුම්

ගැල් ඕය = 1. වීය ගස

ගැල් ගොඩ = 1 කරත්ත රෝදය.

ගැල් සකාව = 1. කරත්තය.

ගැල් සාක්කු= 1. බඩු පැටවූ ගැල. 2. කරත්ත සමූහය.

ගැල් හිස = 1. ඒරියකඳෙහි අග.

ගැලි = 1. කරත්තගාරයා. 2. හරක් ගාල. 3. ශවිල්ල. 4. අශ්වශාලය. 5. මුද්‍රණ අකුරු බහාලන තැටි වෙසෙසක්.

ගැලි පෙළ = 1. රථ පංක්තිය.

ගැලී = 1. තෙත් සිව. 2. ගිලී.

ගැලීම = 1. ගිලීම. 2. (වතුර) ගලායාම.

ගැලුණු = 1. ගිලුණු.

ගැලුම = (ගැලොම) 1. බෝතල හයක මිම්මක්.

ගැලූ = 1. ගිල්වූ.

ගැලෙනා = 1. එරෙණ. 2. ඇලෙන. 3. කිඳ බසින.

ගැල = 1. චුතවී. 2. ගැලවී.

ගැලතුම = 1. ගෙන්ක් බාන. 2. ඇදීම. 3. කුඹුරු වැඩ සඳහා පෙළට ඇඳි හරක් කීප දෙන.

ගැළපීම = 1. රචනා කිරීම. 2. යෙදීම. 3. සම්බන්ධ කිරීම. 4. සංයෝජනය.

ගැලපිල්ල = 1. මිදීම. 2. බේරීම.

ගැල වීම = 1. නිදහස් වීම. 2. බේරීම. 3. සවි කොට තිබෙන දෙයක් ගලවා ගැනීම.

ගැලවුම් කාරයා = 1. නිදහස් කර ගන්නා. 2. ආරක්ෂකයා.

ගැල වූ = 1. මිදූ. 2. ලිහූ.

ගැළි = 1. යානය. 2. කරත්තය.

ගැළියා = 1. තදබදවීම. 2. පිරීම.

ගැවසිගත් = 1. බෙහෙවින් ඇත්තාවූ. 2. ආකීර්ණවූ. 3. විසිරිගිය.

ගැවසීම = 1. නිතර - නිතර හැසිරීම.

ගැවුරු = 1. ගෞරවය. 2. ආදරය.

ගැස්ම = 1. වෙවුලුම. 2. පටන් ගැන්ම.

ගැස්සිකැලඹී යාම = 1. කඩිසර ලෙස ගමන් කිරීම.

ගැස්සීම = 1. හෙල්ලීම. 2. හදිසියෙන් පැන ඒම.

ගැසිනි = 1. ගැටීම.

ගැසීම = (ගැහීම-ගැසුම) 1. පහර දීම. 2. වැදීම. 3. වෙවුලුම. 4. ඉරිතැළීම. 5. සපන්දනය.

ගැසුම් = 1. පහරදීම. 2. පැකිළීම.

ගැසෙන = 1. හැපෙන.

ගැහැට = 1. කරදරය. 2. හිරි හැරය. 3. හිංසාව. 4. ඝට්ටනය. 5. සංඩුව.

ගැහැවැති = 1. ගෘහපතියා. 2. ගෘහ මූලිකයා. 3. ගොවියා. 4. වෙහෙසන; විඩාව.

ගැහැණි = 1. ගැටූ. 2. වෙහෙසවූ. 3. වැදීලා.

ගැහැපී = 1. තදවී.

ගැහැමියා = 1. පිටිසරයා.

ගැහැවු = 1. හිරිහැර වූ. 2. ඝර්ෂණය කළ.

ගැහැණි = (ගැණී) 1. ස්ත්‍රිය. 2. වෙහෙස වූ.

ගැහැණි වෙනවා = 1. ස්ත්‍රියක් වෙනවා. 2. වෙහෙස වෙනවා.

ගැහැණු ආභරණ = 1. ස්ත්‍රීන් පළඳනා ආභරණ.

ගැහැදෙන = 1. හැලෙන. 2. වැටෙන.

ගැහැට් = 1. පීඩාව. 2. වෙහෙස. 3. නින්දුව.

ගැහැවි = 1. ගොවියා. 2. ගෙදර ප්‍රධානයා.

ගැහැවි දූ = 1. ගෘහපති කන්‍යාව.

ගැහැවි මහසල් කුල = 1. ගෘහපති මහාසාර කුලය.

ගැහිච්ච = 1. පැළුණු. 2. පිපුරුම් සහිත. 3. ඉරි තැළුණු.

ගැහිණිගින්නක් = 1. කරදරයක්. 2. දුකක්. 3. පීඩාවක්.

ගැහිල්ල = 1. පහරදීම. 2. සංඩුව.

ගැහීම = 1. පහරදීම. 2. ගෑම. 3. තැවරීම.

ගැහුණු = 1. හත ගලෙහි ඇල්ලූ. 2. මුවාත තැබූ. 3. ඝියුණු කළ. 4. ගාන ලද.

ගැහෙනි = 1. කරදරය.

ගෑ

ගෑ = 1. ගෑවූ; ගාලනය කළ. 2. තැවරූ.

ගෑඹනවා = 1. සෙමින්-සෙමින් පැකිලෙමින් යනවා. 2. රංචු ගැහෙනවා.

ගෑණු = (ගෑනු) 1. ස්ත්‍රිය.

ගෑණු බාල = 1. තරුණ ස්ත්‍රිය.

ගෑණු බෑය = 1. දෙපලු කළ පොල් ගෙඩියක ඇස් තුන සහිත බෑය.

ගෑම = 1. ඇතිල්ලීම.

ගෑණු මිනිස් - 1. ස්ත්‍රිය.

ගෑණු මූනු = 1. ඇත්තා; ඇච්චි.

ගෑවී = 1. ගැහැවියා.

ගෑවීම් = 1. තැවරීම. 2. වැදීම.

ගෑ වෙනවා = 1. සෙමින් තට්ටු වෙනවා. 2. වැදෙනවා. 3. තැවරෙනවා.

ගෑස් = 1. වායු විශේෂයක්.

ගෑස් කාරයා = 1. ආඩම්බර කාරයා.

ගෑස් පරය = (ගෑස් බරය) 1. ගාංචුව. 2. ගාංචුව සහිත පටිය.

ගෑහුම = 1. කිඟුරුම් දීම.

ගි

ගි = 1. උපමාව. 2. ගිතෙල්.

ගිඛ = 1. ලියතඟලා අල.

ගිගිරි = 1. ශබ්දය. 2. සියුම් හඬ. 3. ගජිතාව. 4. හඬ නැගෙන වළලු වෙසෙසක්. 5. ගෙජ්ජි.

ගිගිරි තජ්ජු = 1. (අශුන් පිට තබා වයන) වාද්‍ය භාණ්ඩයක්.

ගිගිරි නාද = 1. ගිගිරි වළලු සෙලවීමෙන් නැගෙන හඬ.

ගිගිරීම = (ගිගිරුම-ගිගිළිය-ගිගුම) 1. ගජිතාව. 2. ගෙරවීම. 3. හෙණ හඬ.

ගිගුම් = 1. ගිගුරුම. 2. ගෙරවීම.

ගිගුරු = 1. ග්‍රීවා රාවය; ගල රැව්; උගුරු හඬ.

ගුගුරු = 1. ගුගුළ.

ගිගිරි = 1. (විරුඬ) උද්ඝෝෂණය.

ගිජ් = 1. ගිජු බව; ලොල් බව.

ගිජ්ඣ = 1. උළු. 2. ගිජු ලිහිණියා.

ගිජ්ඣකූට = 1. (රජ ගහ නුවර අසල) එනම් පර්වතය.

ගිජා = 1. දුර්ගා; සිව දෙවියාගේ භාර්යාව.

ගිජිඳු = (ගිජිඳු) 1. ප්‍රධාන හස්තියා; ලොකු ඇතා.

ගිජු = 1. කෑදර. 2. දැඩි ලොල් බව.

ගිජුකුළු පව්ව = 1. (ගිජ්ඣ කූට බලන්න.)

ගිජුලිහිණි = 1. එනම් පක්ෂි විශේෂය.

ගින් = උණුසුම්. 2. ආකාරයෙන්.

ගින්දර = (ගිනි) ගින්න.

ගින්නඩි = 1. මුදු මාළු වර්ගයක්.

ගිනි = 1. දවන ශක්තියෙන් යුක් තේජෝ ධාතුව. 2. ගින්දර 3. බඩගින්න. 4. ගිනි දෙවියා. 5. රුපියල් දහයකුත් සත පණහක මුදල. 6. ගිනි කොණ. 7. රත්-නිටොල්. 8. ගිනි කොණට අධිපති දෙවියා. 9. ගින්නෙන් කරන දැවීම. 10. සිවිය.

ගිනි අඟුරු = 1. ගිනිගත් දර කැබලි.

ගිනි අළු = 1. ගින්නෙන් රත් වූ අළු.

ගිනි උදුන = 1. ළිප.

ගිනි උණ්ඩ = 1. ගිනි බෝලය. 2. ගිනි වෙඩි වෙසෙසක්.

ගිනි කඤ්ජ = 1. බඳින ලද කඤ්ජ මද.

ගිනි කණ = 1. තද ආලෝකයක් එකවර ඇහැට වැටීමෙන් ඇහැ නොපෙණීයාම. 2. ගිනි පපුර.

ගිනි කඩුව = 1. ගිනි අවුස්සන කූර. 2. ගිනි උපදවන කටුව.

ගිනි කබල = 1 දුම් කබල; දුම් ඇල්ලීම පිණිස ගන්නා යකඩ තැටිය හෝ මැටි බඳුන. 2. ගිනි අඟුරු සහිත කබල. 3. ගිනි දල්වන භාජනය.

ගිනි කන්ද = 1. ගිනි අළු - ලෝදිය ආදිය විහිදෙන කන්ද.

ගිනි කඳ = 1. ගිනි ගොඩ; ගිනි මැලය.

ගිනි කම්බා = 1. තද රතු පාට කම්බා වර්ගයක්.

ගිනි කරඬ = 1. මැටි භාජන පිළිස්සීමේදී ගින්නෙන් ඇතිවන ඉරි තැළීම.

ගිනිකලඹ = 1. ගිනි ගොඩ.

ගිනිකුකුළු = 1. කුකුළු විශේෂයක්.

ගිනිකුරුළු = 1. කුරුළු වෙසෙසක්; රුවන් කොණ්ඩයා.

ගිනි කූරු = 1. ගිනි දැල්වීමට උපකාරවන පැත්තක වෙඩි බෙහෙත් සහිත ලී කූරු.

ගිනිකෙළි = 1. මල් වෙඩි - පොල් වෙඩි - නිලා - කච්චකු ආදිය. 2. කලහය; අවුල.

ගිනි කොණ = 1. නැගෙනහිර හා දකුණ අතර වූ දිශාව.

ගිනි ගණන් = 1. අධික බඩු මිල.

ගිනි ගන්නවා = 1. ගිනි ඇවිළෙනවා; පත්තු-වෙනවා.

ගිනි ගල් = 1. ගිනි ඉපදවීමට ගන්නා ගල් වෙසෙසක්.

ගිනි ගහනවා = 1. ගිනි ඇතිකරනවා.

ගිනි ගහන උණ = 1. තද උණ.

ගිනි ජල් = (ගිනි ජාලාව) 1. ගිනි මැලය. 2. ගිනි දැල්.

ගිනි තබනවා = 1. ගිනි තියනවා. 2. ගිනි අල්ලවනවා.

ගිනි දණ්ඩ = 1. එකට ඇතිල්ලීමෙන් ගිනි ඇතිකරන ලීය.

ගිනි දල = 1. උඩට නැගෙන ගිනි සිළු.

ගිනි දිග = 1. අග්නි දිශාව; ගිනිකොණ.

ගිනි දිව = 1. මයිල ගස. 2. ලියතඹලා.

ගිනි දෙවි = 1. ගින්නට අධිපති දෙවියා 2. ගින්න නමැති දෙවියා.

ගිනි දෙවොල් = 1. ගිනි දෙවියන් පුදන. දේවාලය.

ගිනි නූල = 1. ගිනි හෝ වෙඩි පත්තු කරන නූල.

ගිනි පවුරු = 1. අග්නි ප්‍රාකාරය.

ගිනි පස = 1. මුරුවා, ඇඹුලැඹිලිය, රත්නිටුල්, කිඹාරං; හිරස්ස යන පස.

ගිනි පාන්දර = 1. අලුයම් කාලය; ඉතා පාන්දර.

ගිනි පැල් = 1. ගිනි පත්තු කිරීමට සැදූ පැල.

ගිනි පිරිත = 1. අග්ගි පරිත්තානය; එනම් පිරිත.

ගිනි පුපුරු = 1. ගින්නෙන් විසිවන කුඩා කැබලි.

ගිනි පුලිඟු = 1. ගිනි පුපුර.

ගිනි පුළුන් = 1. ගිනි මොළවන්ට ගන්නා පුළුන්.

ගිනිපූ = 1. කැවිලි වෙසෙසක්.

ගිනි පූජා = 1. ගිනි දෙවියා පිදීම.

ගිනි පෙන්ද = 1. මාළු වෙසෙසක්.

ගිනි පෙනෙල්ල = 1. ගිනි ගත් දර කැබැල්ල.

ගිනි බත්වීම = 1. ගින්නට අසුවීම; ගින්නෙන් විනාශවීම.

ගිනි මඩුව = 1. දේව පූජා සඳහා පැවැත්වෙන යාග විශේෂයක්.

ගිනි මල් = 1. ගිනි පුපුර; ගිනි දැල්ල.

ගිනි මල් පුද = 1. මල් වෙඩි පූජාව; ගිනිකෙළි පූජාව.

ගිනි මැලය = (ගිනි වුලුව.) 1 ගිනි ගොඩ. 2. දැල් වෙමින් තිබෙන දර ගොඩ.

ගිනි මැස්ස = 1. ගිනි කට්ටුව.

ගිනිමිටිය = 1. තුවක්කුවේ කොකා.

ගිනි මුඛ = 1. ලියතඹලා.

ගිනි මොළවනවා = 1. ගින්දර අවුලුවනවා.

ගිනියම් = 1. උණු සුම; ගින්නෙන් රත්වීම.

ගිනියම් ලෙඩ = (ගිනියම් බැරිකම) 1. රහස් රෝග විශේෂයක්.

ගිනි රතු = 1. ඉතා රත් පැහැ ඇති.

ගිනි රැස = 1. විහිදෙන රශ්මිය.

ගිනි රොන් = 1. ගිනි පුපුර.

ගිනි ලනවා = 1. ගිනි තබනවා.

ගිනි වල = 1. ගිනි ගුශ්‍රිග.

ගිනි වතුර = 1. විෂබීජ විනාශ කරන දියරක්. 2. ගැවුනු විට දවන ජලය.

ගිනි වන් = 1. ගිනි දැල්ලේ පාට.

ගිනි වැල = 1. ගින්නෙන් කළවැට. 2. ඇවිළුණු ගිනි මැල සමූහය.

ගිනි වෙස් = 1. ඊශ්වර දෙවියා.

ගිනි සපු = 1. ගස් වෙසෙසක්.

ගිනි සළා = 1. ගිනි පුළි.

ගිනි සූර්ය = 1. ගිනි වේගය. 2. ගිනි උණ්ඩය.

ගිනි සූගි = 1. ගිනිමැලය.

ගිනි සිළු = 1. උඩට නැගෙන ගිනි දැල්ල 2. ලියතඹලා. 3. මයිල ගස.

ගිනි සිසිල් මන්ත්‍ර = 1. ගින්නෙහි උණුසුම නැතිකරන මන්ත්‍ර.

ගිනි සුග = 1. මඳ ගින්න.

ගිනි හුළ = (ගිනි හුළු) 1. ගිනි සහිත තණමිටිය හෝ පොල් කොළ මිටිය. 2. හුළු අත්ත.

ගිනිහක්කාලම = 1. විශාල කලබලය. 2. ගම් පෙරළිය.

ගිනි හල = 1. ග්‍රීෂ.

ගිනි හල් ගෙය = 1. කුස්සිය; ගිනි දල්වන ගෘහය.

ගිනි හැලි = 1. ගස් වර්ගයක්; කැවිට තොල් රතුවන ද්‍රව්‍යයක්.

ගිනි හිරිය = 1. ගස් ජාතියක්.

ගිණි හුළ = 1. ගිනි හුළ, පත්දම.

ගිණි හොරා = 1. එකම් පක්ෂියා.

ගිණ්ම = (ගිණුම) 1. ගණන් කිරීම.

ගිණී = 1. ගණිකාව.

ගිණුම = 1. තැකත. 2. අල්ලා ගැනීම.

ගිණු = 1. ගණන්කළ.

ගිතෙල් = 1. එළ හරකුන්ගේ කිරෙන් සෑදූ ගන්නා තෙල්.

ගිදු = 1. කෑදර.

ගිද්ධ = 1. ගිජු වූ. 2. ඉතා ලෝභී වූ. 3 කෑදර.

ගිම = (ගිමන්) 1. ග්‍රීෂ්ම කාලය.

ගිම් = 1. ග්‍රීෂ්මය 2. ගිනියම්. 3. පොල් පැල වැනි ගස් වර්ගයක්.

ගිම් උතුව = 1. ග්‍රීෂ්ම සෘතුව; ග්‍රීෂ්ම කාලය.

ගිම් කල් = 1. ග්‍රීෂ්ම කාලය.

ගිම් කැලුම් = 1. හිර.

ගිම් දා = 1. ග්‍රීෂ්ම දවස.

ගිම් රැස් = 1. සූර්යයා. 2. වරාගය. 3. ගිනි රශ්මිය.

ගිම් සමා = 1. ග්‍රීෂ්ම සමය.

ගිම්හ = 1. උෂ්ණය. 2. උෂ්ණ කාලය.

ගිම්හාන = 1. ග්‍රීෂ්ම කාලය.

ගිය = 1. ගියාවූ. 2. ගිතෙල්. 3. ඉකුත්වූ 4. ගීය.

ගිර = 1. පර්වතය; කන්ද. 2. වැමැරීම.

ගිරඬ = 1. දළුව. 2. ලා බුලත් දළු.

ගිරවා = 1. එකම් කුරුල්ලා. 2. මුහුදු මාළුවෙක්.

ගිරඹ = 1. අඹ වෙසෙසක්.

ගිරය = 1. පුවක් ආදිය කපන උපකරණයක්.

ගිරා = 1. එකම් පක්ෂියා. 2. වචනය 3. කිල් පාට. 4. ග්‍රහයා.

ගිරාඅපල = (ගිරහ අපල) 1. ග්‍රහයන්ගෙන් ඇතිවන දෝෂ.

ගිරා අඹ = 1. අඹ වර්ගයක්.

ගිරා කෑකී = 1. ගිරය.

ගිරාකෑඩුම = 1. කැවිලි වර්ගයක්.

ගිරා කුරුල්ලා = 1. කොළ පැහැති කුරුළු වෙසෙසක්.

ගිරා සණ්ඩිකසෝර් = 1. උම්මග්ග ජාතකයෙහි සඳහන් වන ඥානවන්ත ගිරවා.

ගිරාඵලා = 1. පැළෑටි වර්ගයක්.

ගිරා පෝතකයා = 1. ගිරා පැටියා

ගිරාමල්ලිච්චි = 1. එකම් කුඩා කුරුල්ලා.

ගිරාමිණ = 1. මරකත මැණික.

ගිරාව = 1. කොළපාට. 2. වචනය.

ගිරා වන් = 1. කොළ පාට ඇති.

ගිරාවලගා = 1. මාළු වර්ගයක්.

ගිරාහැල් = 1. ඇල් වී වෙසෙසක්.

ගිරි = 1. පර්වතය. 2. ගෞරවණීය. 3. බෙල්ල. 4. උගුරු තලය. 5. මහගල.

ගිරිඅතල = 1. ගල් තලාව.

ගිරිඳු = 1. පර්වත රාජයා. 2. මහමෙර.

ගිරිඋල් = 1. කඳු උල්පත.

ගිරිකන් = 1. කටරොළු.

ගිරිකණ්ටක = 1. ඉන්ද්‍රදේවියාගේ හෙණ පහර.

ගිරිකන්දරය = (ගිරි කඳුර) 1. පර්වත ගුහාව. 2. පර්වත විවරය. 3. කන්දක දියපාරක් ගලා බැසීමෙන්වූ හැරුම. 4. පර්වතයකින් හැලෙන දියපාර.

ගිරිකර්ණිකා = 1. කටරොළු වැල

ගිරිකාණයා = 1. කණා.

ගිරිකාඩා = 1. මීයා.

ගිරිකැම = 1. ඖෂධ විශේෂයක්.

ගිරිකුළ = 1. පර්වතය.

ගිරිකුළු = 1. කඳු මුදුන.

ගිරිකූට = 1. උස් පර්වතය.

ගිරි කොළඩල = 1. ගස් වර්ගයක්.

ගිරිගහන = 1. කැලෑවෙන් වැසුණු පර්වතය. 2. කඳුවලින් ගැවසීගත්.

ගිරිගබ්භර = (ගිරිගහ්වර) 1. පර්වත ගුහාව. 2. ගල් ගුහාව.

ගිරිගිජ් = 1. ගැරඬි ආදී සතුන් පලවා හැරීම, පිණිස කියන වචනයක්.

ගිරිගුරු = 1. අගස්ති ඍෂියා.

ගිරිගුහා = 1. ගල්ලෙණ. 2. කඳුවල තිබෙන ගුහා.

ගිරිජ = 1. කන්දෙන් උපන්.

ගිරිජයා = 1. කඳුරට වැසියා.

ගිරිජා = 1 පාර්වතී; දුර්ගා. 2. කඳුරට ස්ත්‍රී.

ගිරිජාම්ල = (ගිරිජ + අම්ල) 1. අම්ල ද්‍රව්‍යයක් (තලාතු මිතිරන්?)

ගිරිජාව = 1. කඳුවල උපදින දේ. 2. බොරළු. 2. යකඩ.

ගිරිජ්වරය = 1. හෙණ පහර.

ගිරිතලා = 1. කන්දෙහි තැනිතලාව; ගල්තලාව (ගිරි අතල) 2. උස්ව පිහිටි සමතලා භූමිය.

ගිරිතිය = 1. යටි උගුල. 2. කරදරය.

ගිරිතිල්ල = 1. වැල් වර්ගයක්.

ගිරිදර = 1. ගමක නමක්. 2. මහකන්ද?

ගිරිදුදුළු = 1. කඳු ගහන පෙදෙස. 2. කඳුඅතර ගැඹුරු තැන.

ගිරිදුර්ග = 1. කඳු නිසා යාමට අපහසු මාර්ගය.

ගිරිදු = 1. හිමාලය පර්වතයෙහි දුව ලෙස සැලකෙන උමාව.

ගිරිදුහිමි = 1. උමාවගේ ස්වාමිපුරුෂයා; සිව දෙවි.

ගිරිඳු = (ගිරි + ඉඳු) 1. මහමෙර. 2. පර්වත රාජයා. 3. සිවදෙවි.

ගිරිනිල්ල = 1. කටරොළු. 2. ගිත්තේරිය.

ගිරිනිවෙස් = 1. මෙහෙසුරු.

ගිරිපා = 1. කඟවේණා. 2. කන්ද අසබඩ.

ගිරිපාද = 1. කඳු අගබඩ.

ගිරිපුෂ්පක = 1. ගල් කිල්.

ගිරි මානශ = 1. මහ ඇතා.

ගිරි මෘත = 1. සිවංගුරා; රතු කිරිමැටි.

ගිරි මෙඛුල = 1. කන්දේ බැවුම් කොටස.

ගිරිමෙඛුල් = (ගිරිමේඛලා) 1. වසවතුගේ ඇතා. 2. විශාල හස්තියා. 3. පර්වත මධ්‍යය.

ගිරීශ = 1. බෙල්ල 2. උගුර. 3. කන්ද

ගිරිය සුජ්ඣනවා = 1. බෙල්ල මහත් කරනවා. 2. සෝෂා කරනවා.

ගිරියා = 1. මියා.

ගිරිරද = (ගිරිරාජ) 1. පර්වත රාජයා. 2 මහමෙර.

ගිරිලෙන = 1. කඳු ගුහාව.

ගිරිවස් = 1. සිංහයා. 2. කන්දේ ජීවත්වෙන්නා. 3. ඊශ්වර දෙවි.

ගිරි සඳුරු = 1. කඟවේණා.

ගිරිසාරය = 1. යකඩ. 2. බෙලෙක්.

ගිරිශිඛර = 1. කඳු මුදුන. (ගිරි ශිඛරය)

ගිරිශිරස = (ගිරිහිස) 1. කඳු මුදුන.

ගිරිසුතා = 1. පර්වත දුහිතා; දුර්ගා.

ගිරිශ = 1· කන්දෙහි සැතපෙන්නා. 2. ඊශ්වර දෙවි.

ගිරිශෘඞ්ගය = 1. කඳු මුදුන.

ගිරිශෘඞ්ගයා = 1. ගණ දෙවි.

ගිරි හඬුව = 1. පාලු ස්ථානය.

ගිරිහඬු පූජා = 1. එනම් පූජාව.

ගිරිහි = 1. කන්ද.

ගිරිඳු = 1. බුලත් දළුව?

ගිරින්ද = 1. කිප්පිලි.

ගිරිවා = 1. බෙල්ල. 2. එනම් පත් ගුව; (ජන පදය.) 3. කන්ද අසබඩ.

ගීර් = 1. කන්දෙහි. 2. හිරය; එනම් ආයුධය.

ගිල = 1. ගිල්ලාවූ.

ගිලශන්හාවා = 1. ගිලිනවා. 2. කාන්තිකරනවා.

ගිලානා = 1. රෝගියා; ලෙඩා.

ගිලන් = 1. ලෙඩවූ. 2. මහලු කමින් ලෙඩවූ.

ගිලන් උවටා = 1. ලෙඩවූවන්ට උපස්ථාන කරන්නා.

ගිලන්ගේ = 1. ආරෝග්‍ය ශාලාව.

ගිලන් පස = (ගිලම්පස) 1. ගිලනුන්ට උපකාර වන බෙහෙත් ආදිය. 2. භික්ෂුවක් විසින් ඉර බැසුණාට පසු බොන දේ.

ගිලන්වත් = 1. ගිලනුන්ට කළයුතු මෙහෙය.

ගිලන් සැල් = (ගිලන්හල්) 1. ආරෝග්‍ය ශාලාව.

ගිල්ම = 1. පරිහාව; නගරය හෝ බලකොටුව වටා පිහිටි දිය අගල.

ගිල්මැලි = 1 බෙලි ගස.

ගිල්ලවනවා = 1. යටට බස්සනවා. 2. බහනවා. 3. දියෙහි ගට වෙන්නට සලස්වනවා.

ගිල්වනවා = 1. දිය යටට දමනවා. 2. බහනවා.

ගිලාන = 1. රෝගාතුර; ලෙඩවූ.

ගිලානපච්චය = (ගිලාන ප්‍රත්‍යය) 1. ගිලනාට උපකාරවන දෙය. 2. බෙහෙත. 3. ලෙඩුන්ගේ කෑම. 4. භික්ෂූන් විසින් ඉර අවරට ගිය පසු වැළඳිය යුතු දේ.

ගිලාන භක්ත = 1. රෝගීන්ට පිළියෙල කළ බත.

ගිලාන ශාලා = 1. ආරෝග්‍යා ශාලාව; ගිලන් හල.

ගිලා බැසීම = 1. පොළොව යටට කිඳා බැසීම 2. නාය යෑම.

ගිලිත = 1. ගිලින ලද. 2. ගිලින කල්හි.

ගිලිනවා = 1. උගුරෙන් පහතට යවනවා.

ගිලිහෙන = 1 චුතවන. 2. ගිලිහෙන.

ගිලිහුණු = 1. මැවුණු.

ගිලිහෙනවා = 1. වෙන්වී වැටෙනවා 2. ගැලවී වැටෙනවා.

ගිලී මැරෙනවා = 1. දියේ ගිලී මියයනවා.

ගිලු = 1. ගිල්ලා වූ.

ගිලුම් = 1. ආහාර ගැනීම. 2. ගිලීම. 3. අඹුණු බැහුම.

ගිලූ = 1. කෑ

ගිළෙනවා = 1. දියේ කිඳා බසිනවා 2. උගුරෙන් පහතට බසිනවා.

ගිළෙල් ගන්නවා = (ගිළෙල් ගැහෙනවා) 1. උගුරේ හිරවෙනවා.

ගිළි = 1. ගැලවී වැටුණු.

ගිව් = 1. ග්‍රීවාව; බෙල්ල.

ගිව්බරණ = 1. ග්‍රීවාභරණය; මාලය; කර පටිය

ගිවිසි = 1. පොරොන්දු වූ. 2. පිළිගත්.

ගිවිසීම = 1. පිළිගැනීම. 2. කැමති වීම.

ගිවිසනවා = 1. පොරොන්දු වෙනවා. 2. පිළිගන්නවා.

ගිවිසුම = 1. ප්‍රතිඥාව; පොරොන්දුව.

ගිවිසුම්පත = 1. පොරොන්දු පත්‍රය.

ගිවු = 1. බෙල්ලව ; බෙල්ල.

ගිවුල් = (ගිවුලු - ගිවුල්) 1. එනම් ඵල විශේෂය; ජිවුල්; දිවුල්.

ගිසි = 1. සාහසාව; පැමිදි කුඩු.

ගිහි ගුදුරු = 1. ගිහි ඇසුන.

ගිහිකම = 1. ගෘහස්ථ භාවය.

ගිහිකිස = 1. ගිහි කටයුතු.

ගිහි ගෙයි වසනවා = 1. විවාහ ජීවිතයක් ගත කරනවා.

ගිහිනි = (ගිහිණි) 1. ගැබණ වූ. 2. අබිංගු වූ.

ගිහිපටිසංයුක්ත = 1. ගිහියන් පිළිබඳ.

ගිහිපිරිත = 1. ගිහියන් විසින් කියනු ලබන පිරිත.

ගිහිබන්ධනය = 1. ගෘහ බැඳීම; විවාහය.

ගිහි මිහිත් = 1. ගෘහස්ථයා; ගිහියා.

ගිහිවැසි = 1. ගිහියා.

ගිහිවිනය = 1. ගිහියාගේ ජීවිතය. 2. ගිහියන් විසින් පැවතියයුතු ක්‍රමය දක්වෙන සිගාලෝවාද සූත්‍රය.

ගිහිගෙහ් = 1. ගෘහ ගේහය; ගිහි ආකාරය.

ගිහිසතු = (ගිහි සතු) 1. ගිහියන්ට අයත් සම්පත්තිය.

ගිහිසභාගී = 1. ගෘහස්ථ ස්වභාවය ඇති.

ගී

ගී = 1. ගිතෙල්. 2. ගීතය. 3. එළිවම නොකොට බැඳි සිංහල පද්‍යය. 4. එකම වෘත්තය. 5. ගෙය. 6. මැසී.

ගී ගීම = 1. ගීයක ආරම්භ. 2. ගයනවා.

ගී ගනවා = 1. පන්සියයි දේවාලයේ ගී ගයන කාන්තාව.

ගීතය = 1. ගීය. 2. සින්දුව.

ගීතාලම්බ = ආලම්බනයේ විශේෂයක්.

ගීතවත් = 1. සංගීතයෙන් යුත්; මිහිරි.

ගීතස්වර = 1. ගීතිකා නාදය.

ගීතාව = 1 සිඳුකීම 2. සිඳුව.

ගීතිකාව = 1. ක්‍රිස්තියානීන්ගේ ගායනා විශේෂයක්. 2. සිඳුව.

ගීනිමිත් = 1. ගති නිමිත්ත.

ගී රස = 1. ගීත රසය.

ගීරාගම් = 1. ගීත රාග.

ගී සින්දු = 1. ගී හා සිඳු.

ගීතු කියවනා = 1. පැමිණිලි කරණවා.

ගීර්වාණ = 1. දෙවියෝ.

ගීෂ්පතිහා = 1. පණ්ඩිතයා. 2. වෘහස්පති; දෙවියන්ගේ ගුරුවරයා.

ගු

ගුගුම් = 1. ඝෝෂාව.

ගුගුරණ = 1. ඝොෂා කරන. 2. ගොරවන; හෙණහඬ පතුරන. 3. තර්ජනාත්මකව ඝෝෂා කරන.

ගුගුල් = 1 එනම් බෙහෙත් වර්ගය (සුවඳ දුම් ගැස්වීමට ද මෙය ගනී)

ගුගුල්දෙනා = 1. සෙලවෙන. 2. දඟලන.

ගුග්ගුල = 1. ගුගුල්.

ගුගුළ = 1. ගර්ජනා කළ 2. තර්ජනාත්මකව ඝෝෂාකළ.

ගුගුළු = 1. ගර්ජනා කළ.

ගුච්ඡය = 1. පොකුර. 2 පඳුර· 3. බිඩැල්ල. 4. මාලය. 5. පොදිය.

ගුච්ඡාකාර = 1. පොකුරු මෙන් සෑදුනාවූ.

ගුඤ්ජනා = 1. රතුළූනු.

ගුඤ්ඡ = 1. පොකුර. 2. මල් පොකුර.

ගුර්ජර = 1. ගුර්ජර නම් දේශය.

ගුජා = 1. ඔලිඳ. 2. පිත්තල බෙර වෙසෙසක්.

ගුඤ්ජා = 1. ඔලිඳවැල; එම ඇට; හුනිද. 2. මෙහෙනි කිරීම.

ගුටි = 1 (මිට මොලවා අනින) පහර. 2. ගුලිය. 3. පිඩ.

ගුටිකාව = 1. ගෝලය. 2. ගුලිය.

ගුටිබැම = 1. පහර; ගුටි.

ගුඩ = 1. උක් සකුරු. 2. සිසි. 3. කට.

ගුඩතෘණ = (ගුඩදුරු - ගුඩමූල) 1. උක්ගස.

ගුඩය = 1 ගෝලය. 2. කාටට ගන්නා ප්‍රමාණය 3 බෝලය.

ගුඩ්ඩයා = 1. මෝඩයා. 2. තද මසුරා.

ගුඩා = 1. කුඩු

ගුඩු = 1. ඉතා වියලුණු. 2. (වක් ගුඩු - කල්ලි ආදී සිංහල ක්‍රීඩාවන්හෙන් පැරදුණු පක්ෂය විසින් නොනවත්වා කියන) ගුඩු කීම. 3. ඇකුළුණු.

ගුඩුකජු = 1. වියලී මදය ලෙල්ලෙන් වෙන්වී සෙලවෙන කජු ඇටය.

ගුඩුගෙඩිය = 1. ගුඩුවූ (වියලී යාමෙන් දිය සිඳුණු) පොල් ගෙඩිය.

ගුඩු ගුඩාව = (ගඩු ගුඩාව) 1. දුම්බීම සඳහා තනාගත් පොල් කැටය.

ගුන්දිරා = (කුන්දිරා) 1. මාල දිවයිනට අයිති.

ගුණ = 1 හොඳගති. 2 ද්‍රව්‍යයන් ආශ්‍රයකොට පවත්නා නිල් - කහ ආදී ගති. 3. වාර ගණන. 4. ගතිය 5. ආකාරය. 6. කොටස. 7. ලනුව 8. දුනුදිය. 9. නූල. 10. ශ්‍රීය. 11. විශේෂණය. 12. (ලෙඩකින්) සුවය ලැබීම. 13 වැඩි - අධික. 14. ඉන්ද්‍රියය.

ගුණඅංග = 1. යහපත් ගුණ. 2. ගුණ නමැති අවයවය

ගුණඅංශු = 1. ස්වල්ප ගුණය.

ගුණ අගුණ = 1. ගුණ හා අගුණ.

ගුණ අතිරේක = 1. ශ්‍රේෂ්ඨ ගුණය.

ගුණ අනුරාග = 1. ගුණයෙහි ඇල්ම. 2. ගුණය හා අනුරාගය.

ගුණ ආකාර = 1. ගුණයන්ට උත්පත්ති ස්ථානයක් වැනි.

ගුණ ආඛ්‍යාන = 1 ගුණකීම.

ගුණ ආභරණ = 1. ගුණ නමැති පළඳනා.

ගුණාධාරණවා = 1. වැඩි කරනවා

ගුණකාය = 1. වැඩිකරන ගණන

ගුණකාය = 1. ගුණ සමූහය.

ගුණ කීර්තනය = 1. ගුණකීම.

ගුණගණ = 1. ගුණ සමූහය.

ගුණදොස් = 1. හොඳ ගති හා නරක ගති.

ගුණදායක = 1. ගුණ ගෙනදෙන.

ගුණධර්ම = 1. යහපත් ගති. 2. ගුණ නමැති සවභාව.

ගුණනඳුන් = (ගුණ නිදන්) 1. ගුණයන්ට නිධානයක් වැනි; නානාගුණයෙන් යුක්තවූ.

ගුණනිධි = (ගුණනදන් බලන්න) 1. විෂ්ණු දෙවි.

ගුණ පාලිත = 1. ගුණයෙන් පාලනය කළ

ගුණ ප්‍රබන්ධය = 1. ගුණරාශිය. 2. අතරක් නැතිව බැඳී පවත්නා ගුණ සමූහය.

ගුණ ප්‍රිය = 1 ගුණයන්ට ප්‍රිය කරන.

ගුණ මකු = 1. කෙළෙහි ගුණ නොසලකන; අකෘතඥ. 2. ගුණයන් මකන.

ගුණ මහත්තතා = 1. ගුණයන්ගේ මහත් බව.

ගුණ මුවා = 1. ගුණයෙන් ම නිපන්. 2. බොහෝ ගුණ ඇති.

ගුණය = 1. ගතිය. 2. හොඳ ගතිය. 3. (රෝගයකින්) සුවය ලැබීම. 4. නහ. 5. ලනුව. 6. ඉන්ද්‍රියය.

ගුණ යෝග = 1. ගුණයන් හා එක්වීම.

ගුණ රත්න = 1. ගුණ නමැති රුවන්.

ගුණ රුක් = 1. නැවෙහි කුඹ ගස.

ගුණ ලව = 1. ගුණ අඩුකම. 2. ස්වල්ප වූ ගුණය.

ගුණ වචන = 1. ගුණයන් ප්‍රකාශ වන වචන. 2. ගුණ පද; විශෙෂණ පද

ගුණ වත් = 1. ගුණ වනත. 2. යහපත් ගුණ ඇති.

ගුණ වර්ධන වාසල මුදලි = 1. ඩබ්ලිව් ඇfජ්. ගුණවර්ධන වාසල මුදලි තුමා; එළු, පාලි, සංස්කෘත, ද්‍රවිඩ, ඉංග්‍රීසි, තෙළිඟු යන ෂඩ් භාෂාවක විශාරදයෙකි. දක්ෂ පරිවර්තකයෙකි. ව්‍යක්ත දේශකයෙකි. ග්‍රන්ථ කර්තෘවරයෙකි.

ගුණ වර්ණ = 1. ගුණ නමැති පැහැය.

ගුණ වර්ණනා = 1. ගුණ පිළිබඳ විස්තරය.

ගුණ විශිෂ්ට = 1. ගුණයෙන් විශේෂ වූ.

ගුණ විශේෂ = 1. විශිෂ්ට වූ ගුණය.

ගුණ වෘද්ධ = 1. ගුණයෙන් වැඩිහිටි.

ගුණ ශරීර = 1. ගුණ නමැති ශරීරය

ගුණ ශිරස් = 1. ගුණ නමැති හිස.

ගුණ ෂණ්ඩ 1. ගුණ සමූහය.

ගුණ සද = 1. ගුණයක් ප්‍රකාශවන නීල පීත ආදි ශබ්ද

ගුණ සර = 1. ගුණයෙන් සාර.

ගුණ සාගර = 1. ගුණයන්ට සාගරයක් වැනි

ගුණ සාර = 1. යහපත් කමින් යහපත්-කම. 2. ගුණ නමැති හරය.

ගුණසේකර වාසලමුදලි = 1. ඒ. මැන්දිස් ගුණසේකර වාසල මුදලි තුමා; පෙරදිග භාෂාවන්හි මෙන් ම ඉංග්‍රීසි භාෂාවෙහිද විශාරදයෙකි, ග්‍රන්ථ කර්තෘවරයෙකි, නිශ්චල පණ්ඩිතයෙකි.

ගුණසේන = 1. ඇම්. ඩී. ගුණසේන මහතා; (බෙලිදිව මහ පොත්හල ආරම්භ කළ මහා ව්‍යාපාරිකයෙකි. සැදැහැවත් බෞද්ධයෙකි)

ගුණාංශ = 1. වැඩි කරනු ලැබූ ගණන.

ගුණාභිශය = 1 ගති ගුණ.

ගුණාකර = 1. යහපත් කමින් පිරුණු.

ගුණාගුණ = 1. හොඳ නරක.

ගුණ සිරුරු = 1. ගුණ ශරීරය.

ගුණ ස්කන්ධ = 1. ගුණ සමූහය.

ගුණාන්විත = 1. ගුණවත් වූ.

ගුණාපවාදය (ගුණ + අපවාදය) 1. අගුණකීම.

ගුණී = 1. ගුණැති. 2. නූල් ඇති.

ගුණිත = 1. වැඩි කරන ලද. 2. එකතු කරන ලද.

ගුණු = 1. නූල. 2. ලනුව. 3. දුනු දිය. 4. අමාවක් දවස.

ගුණු කලෑ = 1. ඉක්ම ගිය කල්හි.

ගුණුපේත = 1. ගුණයෙන් යුත්.

ගුණ්‍ය = 1. ගිණිය යුත්තා. 2. වැඩි කළ යුත්ත.

ගුණ්ඩිකා = 1. ගුළිය. 2. කුඩා ගුළිය.

ගුණ්ඩිත = 1. ගුළි කරන ලද. 2. වෙළන ලද.

ගුත් = 1. ගුප්ත.

ගුප්ත = 1. රකින ලද.

ගුප්ත චර = 1. රැකී (ඇස් කන් ආදි) දෙරට්ටු ඇති.

ගුප්තිකා = 1. ආරක්ෂකයා; රකින්නා

ගුද = 1. අධෝමාර්ගය; මල මග. 2. අපාන වායු නික්මෙන මාර්ගය.

ගුද ඇට = 1. ගුදයෙහි අස්ථිය.

ගුද ඔෂ්ඨ = 1. ගුදයෙහි මුල.

ගුද කීලය = 1. අර්ශස් රෝගය.

ගුද ග්‍රහණ = 1. බඩ පිළ ලීම.

ගුද පිච්ඡ = 1. ගුද ප්‍රදේශය; මලමාගී ස්ථානය.

ගුදපෙරළුම = 1. බඩවැල මෑත්වීම.

ගුදභ්‍රංශ = 1. ගුදය බැහැරවීම; බඩවැල මෑත් වීම.

ගුදම = 1. බඩු ගබඩාව. 2. හිස් ඇති ගබඩාව.

ගුදිදිකෘදාය = 1. ගුදිරිය; (කුදිරිය.)

ගුන්ද්‍ර = 1. පම්මුණ. (කලාදුරු අල)

ගුජ්ඣ = 1. රහස්. 2. එළිදරව් නොකරන. 2. සැඟවුණු.

ගුජ්ඣවිත්ථ = 1. එළිදරව් නොවූ ශාස්ත්‍රය. 2. රහස් ගුරුකම්.

ගුජ්ඣාවී = 1. සැඟවුණු තේරුම්.

ගුබ්බැයම = 1. කැල. 2. රෝගීන්ගේ කුප්පායම. 3. හැබැරුම්

ගුම = 1. පඳුර. 2. සෝභාව. 3. ලන්ද ගුම.

ගුම්බ = 1. ගොමුව; පඳුර; ලැහැබ. 2. සෝභාව. 3. කාදුය. 4. ගැඹුරු කාදුය. 5. මේඝ ගජිතය.

ගුම් බිඳු = 1. යාඥ කරන කාඩගය

ගුමන = 1. ගුමු - ගුමු නාද කරන.

ගුම්බ = 1. පඳුර. 2. රංචුව. 3. සමූහය.

ගුඹු = 1. ගස් සමූහය. 2. ගුල්මය. 3. පතර; තැළීම.

ගුය්හ ධාරණ = 1. සැඟවීම.

ගුය්හ = 1. සැඟවිය යුතු. 2. රහස් වූ. 3. රහස්‍ය.

ගුය්හ සන්ධක = 1. ශරීරයේ රහස් අවයව.

ගුර = 1. ඇදී කියවෙන අකුර. 2. දීඝී මාත්‍රාව.

ගුරණය = 1. උත්සාහය. 2. හඬ බරකර කීම.

ගුරං 1. බෙර වයන්නා

ගුරිල = 1. ගස් වඳුරෙක් (මෙයි මුල් දත්-මැදීමට ගන්නා බැව් කියති.)

ගුරු ජුර = (ගුරුජුර) 1. තුම්ලී හා තෙල් එකතුවීමෙන් හැදෙන මඩ (කරත්ත අලවංගු ආදියෙහි බැඳෙන මණ්ඩි).

ගුරිකාරය = 1. ඇදී කියවෙන අකුර.

ගුරිණී = 1. දරු ගැබ් ඇත්ති.

ගුරු = 1. ගරු කටයුත්තා. 2. ගුරුවරයා. 3. දිග. 4. බර. 5. මව. 6. පියා. 7. මවුපියෝ. 8. ලොකු. 7 සැලකිය යුතු. 8. බෘහස්පති. 9. කඳ කුමරු. 10. සුවස්-ගුරු. 11. ඇදී කියවෙන අකුර. 12. ආගමික ජීවිතයක් ගතකරන සන්නාසි වෙසෙසක්. 13. ආඩි මිත්‍රයා. 14. දේවාලයකට සේවකයෙක්. 15. මිසුසා විශිෂ්ටයෙක්.

ගුරු අකුරු = 1 ඇදී කියවෙන අකුරු. 2. ගෝලයාට ඒ බලමින් ඇඳීම පිණිස ගුරුවරයා විසින් ලියාදුන් අකුරු පෙළ.

ගුරු අඬක්කම = 1. ගුරු මුෂ්ටි.

ගුරු අත්පොත = 1. ගුරුවරයා විසින් සකස් කර ගන්නා ලද මුල් පිටපත 2. අත්-පොත.

ගුරු උපදේශ = 1 ගුරුවරයාගේ අවවාදය. 2. ගුරුහරුකම්.

ගුරු උපාධ්‍යාය = 1. ගුරුවූ උපාධ්‍යායයා.

ගුරුක = 1. බර. 2. විශාල.

ගුරුකම = 1. පාඩම. 2. ගුරු පදවිය. 3. අනු ශාන්ති කළයුත්ත.

ගුරු කුම = 1. සුවස්ගුරු

ගුරු කුල = 1. ආචාර්යයන්ගේ ගෘහය. 2. පාසැල.

ගුරු ගල් = 1. රතු මැටි. 2. පුවක්ගුරු.

ගුරු ගින්න = 1. ලොකු ගිනි ගොඩ.

ගුරු ගිහිණි = (ගුරුගිහි) 1. භාර්යාව.

ගුරු ගුරු = 1. අගස්ති ඍෂිවරයා.

ගුරුන්නාන්සේ = 1. ගුරුවරයා; ගුරුන් වහන්සේ. 2. කැකෑස් බලන්නා 3. බෙර වයන්නා?.

ගුරු දක්ෂිණා = 1. ගුරුවරයාට දියයුතු ධනය.

ගුරු පඬුරු = 1. ගුරුවරයාට දෙන තෑගි.

ගුරු ප්‍රසාදි ඩ්‍රශා = 1. කතෝලික දේව ගැති වරයා.

ගුරු පූජා = 1. ගුරුන් පිදීම.

ගුරු පොත් = 1. බලාගෙන ලියන්නට ගන්නා මුල් පොත.

ගුරුණු = 1. දිගවීම.

ගුරුත්වය = 1. බර බව.

ගුරු තාරුව = 1. බෘහස්පති තාරකාව.

ගුරුතැන් = 1. ආචාර්ය ස්ථානය.

ගුරුදක්ෂිණා = 1. ගුරු පඬුර.

ගුරුදින = 1. බ්‍රහස්පතින්දා.

ගුරුබඩු = 1. ගරු භාණ්ඩ.

ගුරුභාවය = 1. වැදගත් කම.

ගුරුමලා = 1. මැටි භාජනය. 2. ගුරු පැහැති භාජනය (ගුරුලේන්තුව)

ගුරුමැටි = 1. රතුමැටි; පුවක්ගුරු පැහැති මැටි.

ගුරුමුෂ්ටි = 1. ගුරුවරයා ප්‍රත්‍යක්ෂ කොටගත් අධ්‍යාපනයෙහි සාරවත් දේ (ගුරු අඩස් - සම් - ආචාර්ය මුෂ්ටි)

ගුරුල්ලා = 1 පඳුර. 2. එනම් ගස 3. පැලෑටි වර්ගයක්.

ගුරුවර = 1. උතුම් ආචාර්ය වරයා. 2. ඉගැන් වීම කරන්නා.

ගුරුලේන්තුව = 1. මැටියෙන් කළ දිග කරක් ඇති දිය වත්කරන භාජනයක්.

ගුරුළා = 1. එනම් පක්ෂියා; ගරුඩයා (නයින්ට සතුරු වූ පක්ෂි විශෙෂයක්.)

ගුරුළු අඳු = 1. ගරුඩ රාජයා.

ගුරුළුකොඩි = 1. ගුරුළාගේ රූ සටහන සහිත කොඩිය.

ගුරුළුගෝමි = 1. ධම්ප්‍රදීපිකාව, අමාවතුර ආදී ග්‍රන්ථ සම්පාදනය කළ ආචාර්යවරයා.

ගුරුළුදද = 1. ගුරුළු කොඩිය. 2. විෂ්ණුදෙවි.

ගුරුළුසක්ක = 1. අහස් යාත්‍රාව.

ගුරුළුයානා = 1. ගුරුළා කමැති යානය.

ගුරුළුරද = 1. ගරුඩ රාජයා.

ගුරුවා = 1. මාළු වර්ගයක්. 2. විජ්ජා කාරයා.

ගුරුබෝ = 1. සිංහල හා මුස්ලිම් මිශ්‍රව ඇතිවූ මනුෂ්‍ය වර්ගයක්. 2. එනම් මාළු.

ගුරුභාරුකම් = 1. අවවාද. 2. උපදේශ.

ගුරුබිණි = 1. සොඳුර ප්‍රධාන කාන්තාව. 2. භාර්යාව.

ගුරුහෝරාව = 1. බෘහස්පති බලපාන වේලාව.

ගුරූපදේශය = 1 ගුරුවරයාගේ අවවාදය.

ගුර්ජර = 1. එනම් රට.

ගුල = 1. ගුහාව; පන්දුම. 2. සිදුර; බිලය. 3. වළ 4. පක්ෂියෙක්. 5. උක් සකුරු

ගුලන් = 1. මය යස් සහිත ප්‍රපාතය.

ගුලනඩා = 1 මඩිතවා.

ගුල්මය = (ගුල්ම) 1. වලප්‍රිකාර; ගොප් ඇටය.

ගුල්මස්ථාන = 1. සුවිස් ගය.

ගුල්ම = 1. (උදරයෙහි ඉත්තා) සෙණ්ඩු විශෙෂයක්. 2. බඩ දිවට ඇසිනි. 3. උදර රෝගයක්. 4. බඩේ වම් පැත්තේ තිබෙන මස් පිඩක්. 5. වන ලැහැබ; පඳුර.

ගුල්මගැට = 1. ගුල්ම රෝගය නිසා බඩේ හැදෙන ගුළියක්.

ගුල්මශෝභිය = 1. තෘණ පිළිකාය.

ගුල්මමූල = 1. ඉඟුරු.

ගුල්මය = 1. බඩදිව. 2. බඩදිව රෝගය. 3. සේනාංකයක්. 4. ගුඩසේනාව හැසිරවීම. 5 පඳුර; ලැහැබ. 6. කොට්ටුව. 7. පඩිපෙළ.

ගුල්මවායු = 1. ගුල්මයෙහි වාතය.

ගුල්‍යක = 1. පැණිරස.

ගුල්ලා = 1 සහල් - අටු කොස් ආදියෙහි හැදෙන කුඩා කෘමි විශෙෂයක්.

ගුලාමා = 1. පිළිවෙළක් නැති අපිරිසිදු පුද්ගලයා.

ගුල්කාලාවා = 1. එනම් මාළුවා.

ගුලු = 1. වැටුණු.

ගුලුකුඩු = 1. ගුල්ලත් විදීමෙන් ඇතිවන කුඩු.

ගුලුතම් = 1. ගුල්ලන් විදීමෙන් ඇතිවන හිල්.

ගුලුගුරුවා = 1. කුරුල්ලන් වර්ගයක්.

ගුවන = (ගුවන්) 1. අහස.

ගුවන් ගල = 1. උල්කා ගල.

ගුවන්තලය = 1. අහස.

ගුවන්මග = 1. අහස.

ගුවන්මිණි = (ගුවන් මැණ) 1. සූර්යයා.

ගුවන් යානය = 1. අහස් යාත්‍රාව.

ගුවනක් = 1. අහස.

ගුහ = (ගුහු) 1 කතරගම දෙවි.

ගුහ්‍ය = 1. රහස්; සැඟවුණු. 2. කපටි.

ගුහ්‍යක = 1. කුවේරයාගේ වස්තුව රකින්නා.

ගුහ්‍යකේශ්වරයා = 1. කුවේරයා.

ගුහ්‍යස්ථාන = 1. ශරීරයෙහි රහස්තැන්. 2. පුරුෂ ලිංගය.

ගුහන = 1. සොෂා කරන. 2. සඟවන.

ගුහා = 1. ගුහාව. 2. ලෙණ. 3. පුස්වැත්ත.

ගුහාශය = 1. හිත.

ගුහාශයා = 1. සිංහයා.

ගුහු = 1. කඳකුමරු. 2. භූතයා. 3. රකුසා.

ගුළ = 1. ගුළිය; බෝලය. 2. උක්සකුරු 3. නූල් පන්දුව.

ගුළකීලා = 1. බෝල කෙළිය; බෝල ගැසීම.

ගුළ පිණ්ඩය = 1. උක්හකුරු ගුළිය.

ගුළා = 1 පක්ෂි විශෙෂයක්.

ගුළි = (ගුළාව) 1. කුඩාගෝලය. 2. වටකුරු දෙය.

ගුළිකා = 1. ගුළිය.

ගුළිපසි = 1. අග්ගලා දුමු පසුම්බිය.

ගුළු = 1. ගැඹුර. 2. වැටුණු; ගිලිහුණු. 3. කොෂ්ඨාගාරය; කොටුව. 4. ගුල්ලා. 5. සැඟවුනාවූ. 6. යටට ගිය 7. බුළු. (ගෙඩිය)

ගුළු අරුත් = 1. සැඟවුණු තේරුම.

ගුළු ඇණය = 1. දෙර සවිවීමට උළුවස්සේ වද්දන ඇණය. 2. ජනෙල් කරකැවීමට උළුවස්සේ සවිකරන ඇණය.

ගුළුපණු = 1. ගුල්ලා.

ගුළුවඩිච්චිය = 1. කුරුබිලිය. (කොටු තාප්පයේ කුඩා දොර)

ගූ

ගූ = (ගුථ) 1. අසූචි.

ගූඪ = 1. රහස්. 2. සැඟවුණු. 3. නොපෙණෙන.

ගූඪචතුර්ථ = 1. ගුළු සතර; සැඟවුණු චතුර්ථ පාදය ඇති හෙවත් සතරවන පාදය ප්‍රථම පාද තුනෙහිම ඇතුලත් කොට බැඳි පද්‍යය.

ගූඪවර = 1. ඔත්තු බලන්නා. 2. චර පුරුෂයා.

ගූඪජ = 1. පියා කවුරුදැයි නොදත්.

ගූඪ පාදයා = 1. සර්පයා

ගූඪ පුරුෂයා = 1. චරපුරුෂයා; ඔත්තු බලන්නා.

ගූඪාක්ෂරය = 1. සැඟවුණු අකුර; රහස් අකුර.

ගූඪාංග = 1. කැස්බෑ.

ගූඪාර්ථය = 1. රහස් තේරුම; වාච්‍යාර්ථ සැඟ-වෙන සේ පද යෙදීම නමැති කාව්‍ය දෝෂය.

ගූඪප්‍රශ්න = 1. අර්ථය සැඟවුණු ප්‍රශ්න.

ගූථකූප = 1. වැසිකිළි වළ.

ගූථනිරකය = 1. එනම් නිරය.

ගූරණය = 1. උත්සාහය.

ගෘ

ගෘජන = 1. විස සහිත මස්.

ගෘධ්‍ර = 1. කැදර. 2. ගිජු ලිහිණියා.

ගෘහ = 1. ගෙය. 2. භාර්‍යාව. 2. ගෙදරට අයිති.

ගෘහ අඞ්ගන = 1. ගෙමිදුල.

ගෘහඋද්‍යාන = 1. ගෙ උයන.

ගෘහඋපකරණ = 1. ගෙට වුවමනා ඇඳ-පුටු ආදි දේ.

ගෘහකාරයා = 1. ගෙවල් සාදන්නා.

ගෘහ ගර්භය = 1. ගේ ඇතුළ. 2. ඇතුල් කාමරය.

ගෘහ ගෝධිකාවා = 1. හුණා.

ගෘහතටිය = 1. ගෙයි පටුවත; ආලින්දය.

ගෘහදීර්ඝිකා = 1. ගෙදිගුවිල; ගෙයි පොකුණ.

ගෘහදේවතා = 1. ගෙට අරක්ගත් දෙවියා. 2. ගෘහයෙහි දෙවි; මවු හෝ පියා.

ගෘහනාශනයා = 1. ගෙය නැති කරන්නා. 2. පරෙවියා.

ගෘහපතියා = 1. ගෙදර මූලිකයා; ගෙදර සවාමියා. 2. සිටුවරයා.

ගෘහපති මහසාර කුලය = 1. ඉතා අඩු තරමින් සතළිස් කෝටියක් වත් ධනය තැන්පත්ව ඇත්තාවූ ද. දිනපතා කහවනු පස් අමුණ බැගින් වියදම් වන්නාවූ ද ධනවත් සිටු කුලය.

ගෘහපති රත්නය = 1. සක්විති රජුන්ට පහළ වන ශ්‍රේෂ්ඨ සිටුවරයා.

ගෘහපරිග්‍රහ = 1. ගෘහය (අයිතිකර) ගැනීම.

ගෘහපරිවර = 1. ගෙයි වැසියෝ.

ගෘහප්‍රවේශ = 1. ගෙවදීම; අභිනව ගෘහයකට (නෑ නා පුරා) පදිංචිය සඳහා ඇතුල්වීම.

ගෘහබන්ධනය = 1. කසාද බැඳීම; ගෘහය (භාර්‍යාව) නමැති බැම්මෙන් බැඳීම.

ගෘහභංගය = 1. ගෙවල් කැඩීම. 2. පවුල හීනවීම.

ගෘහභාණ්ඩ = 1. ගෙයි බඩු. (ලී බඩු ආදිය)

ගෘහභූමි = 1. ගෙයි පහත.

ගෘහමයූර = 1.ගෙ මොනරා; ගෙයි ඇතිකරන මොනරා.

ගෘහමෘග = 1. බල්ලා.

ගෘහමූලිකයා = 1. ගෙදර ප්‍රධානියා.

ගෘහය = 1. ගේ. 2. ගොඩනැගිල්ල.

ගෘහරාජ = 1. ග්‍රහයන් ගේ රජ. 2. සූර්‍යයා. 3. චන්ද්‍රයා. 4. බෘහස්පතී.

ගෘහවස්තු = 1. ගෙබිම. 2. ගේ නැමැති වස්තුව.

ගෘහවාස = 1. ගිහි ගෙයි විසීම.

ගෘහවාසී = 1. ගිහියා. 2. ගෙයි වැසියා.

ගෘහසඞ්ගාශ්‍රිත = 1. ගෙය ඇසුරු කළ; කාම තෘෂ්ණා සහගත.

ගෘහස්ථ = 1. ගිහියා. 2. ගෙයි සිටින්නා. 3. ගෙදරට අයිති.

ගෘහස්ථශීල = 1. ගිහියන්ට නියමකළ පන් සිල් හා අට සිල්.

ගෘහසන්ධි = 1. ගෙවල් වලට හැරෙන මං සඳි

ගෘහ්‍යක = 1. හීලෑ; ගෙයි ඇතිකරන.

ගෘහාංගනාව = 1. ගෙයි ස්ත්‍රී.

ගෘහානුකූල = (ගෘහ + අනුකූල) 1. ගෙදරට අයිති. 2. පවුලට අයිති.

ගෘහාභිනිෂ්ක්‍රමණය = 1. ගිහි ගෙයින් නික්ම (තපසට) යාම.

ගෘහාරාමය = 1. ගෙට අයිති උයන; ගෙඋයන.

ගෘහාවස්ථිත = 1. ගෙදර තැන්පත්වූ.

ගෘහී = 1. ගිහියා.

ගෘහිණී = 1. ගෑහැණිය. 2. ගෙදර ස්ත්‍රී. 3. භාර්‍යාව.

ගෘහීත = 1. ගන්නා ලද. 2. අල්ලන ලද.

ගෘහෝද්‍යානය = (ගෘහ + උද්‍යානය) 1. ගෙඋයන.

ගෘහෝපකරණ = (ගෘහ + උපකරණ) 1. ගෙයි බඩු.

ගෘහ්‍යමාණ = 1. ගනු ලබන.

ගෙ = 1. ගෙය; වසන තැන. 2. ගායනා කළ.

ගෙඅඟන = 1. මිදුල.

ගෙඋසන = 1. ගෙවැස්සා.

ගෙකුස = 1. ගෙයි ඇතුළ.

ගෙකොබේ = 1. ගෙයි වසන පරෙවියා.

ගෙගනුගෑණි = 1. ගෘහ ස්වාමිනිය.

ගෙගිරි = 1. පහන.

ගෙගුණ = 1. කොටියා.

ගෙගොන් = 1. හීලෑ ගොනා.

ගෙගෝ = 1. ගෘහ ගෝධිකාවා; හුණා.

ගෙජ්ජි = 1. මිණිගෙඩි වෙසෙසක්.

ගෙඩි = 1. පලතුරු. 2. පහර. 3. සම විස. 4. ගඩුව. 5. සිතු. 6 තුඹා ඇණය.

ගෙඩිගෑසීම = 1. (පහරක් වැදුණු තැන ඇති වන) ඉදිමුම.

ගෙඩි ගෝවා = 1. ගෝවා වර්ගයක්.

ගෙඩිය පිපින්ම = 1. එහෙම පිටින්ම; මුළු මනින්ම; ඒ පිටින්ම.

ගෙඩි ගෙය = 1. හතරැස් තොරණ විශේෂයක්. 2. ආරුක්කු ආකාර සැරසිල්ලක්. 3. ලිඳ වටා බඳින තාප්පය. 4. විහාරාරාම ඉදිරිපිට සුණු පිරියම් කරන තොරණ.

ගෙඩිය = 1. එලය. 2. පහර. 3. ගඩුව. 4. ගුලිය. 5. සණ්ඨාව; සිතුව. 6 ඇලය. 7. සපිවිෂ. 8 ලියන්ට සකස් කළ පුස් කොළ මිටිය. 9. ගබොල්.

ගෙඩි ගන්වනවා = 1 බැට දෙනවා.

ගෙඩිදඹු = 1. සණ්ඨාවෙහි දිවක.

ගෙඩියතුර = 1. ඉතිඅතුර.

ගෙන = 1. අරගෙන.

ගෙන පානවා = 1. පෙන්වනවා. 2. ඉදිරියට ගේනවා.

ගෙනහැර දක්වනවා = 1. කාරණු කියනවා; තේරුම් කරනවා.

ගෙන් = 1. එතින්. 2. ගෙයින්.

ගෙන්ගෙඩ = 1. ගෙයින් ගෙට; ගෙයක් පාසා.

ගෙන්දගම් = 1. එකම් ද්‍රව්‍යය; ගන්ධක.

ගෙණ්ඩුක = 1. පන්දුව; බෝලය.

ගෙධ = 1. බලවත් ඇල්ම.

ගෙත්තම = 1. මැහුම් විශේෂයක්. 2. නූලෙන් කරන සැරසිල්ලක්.

ගෙත්තම්නූල = 1. මහන නූල්.

ගෙතූ = 1. ඇමුණූ. 2. නූලෙන් ගෙත්තම් කළ. 3. පොත් ලියූ. 4. කවිකළ.

ගෙදර = 1. වාසස්ථානය; ගෙය.

ගෙදර ඇත්තෝ = (ගෙදර ඇත්තී - ගෙදර ඇත්තො-ගෙදර එක්කෙනා) ගෘහිණිය; භාර්යාව.

ගෙදිගුමිල = 1. ගෙවල් අසල (මිදුලේ) තැනූ පොකුණ.

ගෙදෙවි = 1. ගෙට අරක්ගත් දෙවියා.

ගෙදොර = 1. ගෙය. ගෘහද්වාරය.

ගෙදොර දෙදෙරේ වැඩ = 1 ගෙදරට අයිති වැඩ.

ගෙඳ = 1. පැලෑටි වර්ගයක්. 2. සිහින්; තුනී.

ගෙඳසි = 1. තුනීසි; සිහින්ය.

ගෙපළ = 1 ගෘහය හැදූ බිම. 2. ගෙබිම.

ගෙපළ කපනවා = 1. ගෙයක් තනන භූමි භාගය සකස් කරනවා.

ගෙපිළි වෙළින් = 1. ගෙයින් ගෙට; ගෙයක් පාසා (උසින් පහත් ගෙදරක් සැඟිව සිටලුම ගෙවල් වලට යන ක්‍රමයෙන්).

ගෙබ = 1. ගැබ; කුහර.

ගෙබරැල = 1. විහාරයේ ගබඩාව භාරකාරයා.

ගෙබලන = 1. ගෙය රැකබලන.

ගෙබිත්තිය = 1. ගෙයි බිත්තිය.

ගෙබිම = 1. ගෙපළ; ගෙය තනන බිම. 2. ගෙයි බිම.

ගෙබිම් සාස්ත්‍රය = 1. ගෙවල් ඉදි කිරීමේ දී ප්‍රේත පාද, ග්‍රහවලට වැටෙන දොස් ඇතිවෙන් නොවෙන භූමිය (ගෙපළ) සකස් කර ගැනීම පිළිබඳ ශාස්ත්‍රය.

ගෙම්බා = 1. ගෙම්බා

ගෙම්බියා = (ගෙම්බිත්තා, ගෙම්බා, ගෙමැඹියා) 1. ගෙවල්හි සිටින ගෙම්බා.

ගෙමඹුව = 1. ගෙයි අඹුව; ගෙදර ස්ත්‍රී.

ගෙමිතුරු = (ගෙමිණ) 1. පහන.

ගෙමිදුල = 1. ගෙයි මලුව; ගෙයි (ඉදිරි පිට) මලුව.

ගෙමිගුරු = 1. ගිලූ මොනරා; ඇතිකරන මොනරා.

ගෙය = 1. ගෙදර.

ගෙයඟන = (ගේ + අඟන) 1 මිදුල.

ගෙසිඳු වඩාගක් = 1. ගෙදර හදු වඩාගත්.

ගෙයුම් = 1. නෙවීයාම. 2. උත්සාහය.

ගෙරවිලි = 1. අහස ගිගුරුම. 2. (සිංහ ආදි) සත්වයන්ගේ ගැඹුරු ශබ්දය. 3. තර්ජනය. 4. තද ඝෝෂාව.

ගෙරවීම = 1. තද ඝෝෂාව. 2. අහස ගිගුරුම. 3. උගුරෙන් ශබ්ද ඇතිවීම.

ගෙරි = 1. ගවයන් සම්බන්ධ. 2. කළු කුහුඹු විශේෂයක්. 3. හරක්. 4. ගවදෙන. 5. ගවරා.

ගෙරි ඇට = 1. හරකුන්ගේ ඇට.

ගෙරි කුණ = 1. හරකාගේ මළ කුණ. 2. නින්දා කටයුතු දෙය.

ගෙරි කොඩා = 1. කුරුළු වෙසෙසක්.

ගෙරි දත් = 1. ගවයන් දත්දීම.

ගෙරි පස් = (කළු කුහුඹු වෙසසක් වූ) ගෙරියන් විසින් හොඳ දමන ලද පස්.

ගෙරි පුවර = 1. හරක් පෝර; ගොම.

ගෙරි බාන් = 1. ගොන් බාන; ගොන් යුවල; ගොන් ඇඳුත්ත.

ගෙරි මස් = 1. හරක් මස්.

ගෙරි මුව = 1 ගවයා.

ගෙරි වග 1. ගොන් බාන.

ගෙරි හරක් = 1. දෙනුන් හා ගොන්නු.

ගෙරිහම = 1. හරක් හම.

ගෙරිහං = 1. හරක් අඟ.

ගෙල = 1. බෙල්ල. 2. උගුර; බොටුව.

ගෙල මුතු = 1. මාලය.

ගෙල් = 1. පහර.

ගෙලන් = 1. ගිලන් බව; රෝගී භාවය.

ගෙලකැඳ = 1. ගිලන් බව.

ගෙල්වා = 1. පහර.

ගෙලිදම් = 1. ග්‍රීවාභරණයක්. 2. ගෙල සරසන දම්යක්.

ගෙව = 1. ලජ්ජාව. 2. සත්‍රිය. 3. ක්ෂයවීම.

ගෙවතුපසණම් = 1. බදු කුලිය.

ගෙවදනා = 1. ගෙට වදිනා.

ගෙවදිනවා = 1. උත්සව සහිතව අළුත් ගෙයකට ඇතුළු වෙනවා. 2. ගෘහ ප්‍රවේශය.

ගෙවනවා = 1. (බඩුවක් මිලට ගෙන ඊට ගෙවිය යුතු) මුදල් ගෙවනවා. 2. කාලය ගතකරනවා. 3. යන්ට තිබෙන ණයක් ගෙවනවා.

ගෙවරණය = 1. බිත්තිය. 2. වහල.

ගෙවඩීම් = 1. පුර වැඩීම්; තැනැතට කුඹුරෙහි වැඩ කරනවා.

ගෙවන = ක්ෂයකරන

ගෙවලියා = 1. ගෙට වැගී සිටින ප්‍රේතයා. 2. ගෙට බැල්ම හෙලාගෙන සිටින්නා. 3. කැදරයා.

ගෙවල් ඉදුරවල් = 1. වතු-පිටි ගහ-කොළ ආදිය. 2. වතු හා ගෙවල්.

ගෙවල් බද්ද = 1. ගෙවල් කුලිය.

ගෙවල් මීයා = 1. ගෙවල් වල වාසය කරන මීයා.

ගෙවිටන් = 1. ගැල. 2. මිශ්‍ර.

ගෙවිල = 1. ගෙයි පොකුණ හෝ ගේ අසල පොකුණ.

ගෙවීම = 1. යන්නට තිබෙන මුදල් දීම. 2. ක්ෂයවීම්.

ගෙවුම් = 1. පහසු කිරීම්. 2. (නෙවිය යුතු මුදල්) ගෙවීම්. 3. තුනී කිරීම්. 4. ඉන්ද්‍රිය දමනය. 5. ක්ෂය වීම්.

ගෙඹුඩ = 1. හරක් වූ ආරුනුල් මැණික.

ගෙවුයන = (ගෙ + උයන) 1. ගේ අසල පිහිටි මල් වත්ත.

ගෙවෙනවා = 1. ක්ෂය වෙනවා. 2. තුනී-වෙනවා. 3. ගෑවී අඩුවෙනවා. 4. (කාලය) ගත වෙනවා. 5. ගෙවිය යුතු මුදල් දීම වෙනවා.

ගෙවෙසෙස් = 1. මාළිගාව.

ගෙසර = (ගෙසරස - ගෙසරසි) 1. ගේ අසල පිහිටි පොකුණ.

ගෙසිකියා = 1. නිලෑ මොනරා. 2. ඇතිකරන මොනරා.

ගෙසියන = 1. ගෙයි වහල.

ගෙසෙණි = 1. ගඩනගා කීම; ඝෝෂාව.

ගෙහඹු = 1. ගෘහිණිය; ගෙයි ස්වාමි ස්ත්‍රී.

ගෙහාශ්‍රිත = 1. ගේ ඇසුරු කරන ලද.

ගෙහිනි = 1. කාන්තාව.

ගෙහිමු = 1. ගෙයි මාහිම.

ගෙහිමඹු = 1. ගෙහිමි අඹු. 2. ගෘහ ස්වාමියාගේ භාර්‍යාව.

ගෙහිරි = (ගෙහිරු - ගෙහෙරි) 1. පහන; ලාම්පුව.

ගෙහු = 1. ඝෝෂණය කළ.

ගෙහෙඩි = 1. ගෙබිම හාරණ කුඩා කුඹල් මැසි වර්ගයක්. 2. කමකට නැති.

ගෙහෙඩිති = 1. ගේ කුරුල්ලා.

ගෙහෙඩියා = 1. නින්දිත පුරුෂයා. 2. අවලමා.

ගෙහෙනි = 1. කාන්තාව.

ගේ

ගේ = 1. ගෙදර. 2. ගෙට අයිති. 3. ගෘහිණිය; භාර්‍යාව. 4. බාන; ගුවල; ඇඳුත්ත (ගොත් ගේ)

ගේ කුරුල්ලා = 1. එනම් කුරුල්ලා.

ගේ කුරුළු ලේගියම් = 1. ගේ කුරුළු මස් යොදා සෑදූ ශක්ති ජනක ඖෂධයක්.

ගේ කුලී = 1. ගෙවල් කුලිය; තවාතැන් ගාස්තුව.

ගේදොර = 1. ගෙයි දොරකඩ. 2. ගෘහය. 3. ගෙදරට අයිති.

ගේධ = 1. කෑදර; ගිජුබව;

ගේනම = 1. වාසගම. 2. පවුලේ නම.

ගේන = 1. ගෙන එන.

ගේපත් = 1. පැල්පත. 2. කුඩා ගෙය.

ගේපල = 1. ගෙයි වහල.

ගේ පැල = 1. පැල්පත. 2. කුඩා ගෙය.

ගේවඹු = 1. වාසල; වාරය.

ගේය = 1. ගීතය; සින්දුව. 2. කාව්‍ය බන්ධන ශාස්ත්‍රය. 3. ව්‍යාකරණ සූත්‍ර හා සංයුක්ත නිකායයෙහි සගාථක වර්ගය.

ගේවෑඩු = 1. නැකතට වැඩ ආරම්භ කළ.

ගේය්‍ය = 1. ගායනා කටයුතු. 2. බෞද්ධ සූත්‍රයන්ගේ කොටසක්.

ගේරුක = 1. ගුරු ගල් වැනි රතු මැටි වර්ගයක්.

ගේලඤ්ඤ = 1. ගිලන් බව.

ගේ සරස = 1. ගෙයි හෝ ගෙය අසල පොකුණ.

ගේහ = 1. ගෙය; වාසස්ථානය.

ගේහසා = 1. ගණදෙවි.

ගේහ සූරයා = 1. ගෙයි වැඩට දක්ෂයා.

ගේහඩගණ = 1. ගෙමිදුල.

ගේහජන = 1. ගෙයි වැසියා.

ගේහට්ඨාන = 1. ගෙයක් සෑදීමට යෙදිය යුතු තැන; ගෙබිම. 2. ගෙයක් තිබුණු තැන.

ගේහ භාර = 1. ගෙදොර; ගෙයි දොරටුව.

ගේහ නිස්සිත = 1. පස්කම් සැප ආශ්‍රිතවූ.

ගේහසිත = 1. ලෞකික වැඩට සම්බන්ධවූ.

ගේහ සිත ප්‍රේම = 1. ගෙය ඇසුරු කළ ප්‍රේමය.

ගේ නිශ්‍රියා = 1. ගෙදර ප්‍රවාහය. 2. ගෙයි අයිතිකාරයා.

ගෛ

ගෛරිකා = 1. සුවත්ගුරු (සිවත් ගුරු; රතු මැටි.) 2. රත්රත්.

ගෛරිකා පරිකම්ම = 1. සුවත් ගුරු ආලේප කිරීම.

ගෛරිකා ප්‍රභා – 1. සුවත්ගුරු පැහැය (සිවත් ගුරු පාට;)

ගෛරිකා රස = 1. සුවත්ගුරු දිය.

ගෛරේය = 1. රතුමැටි. 2. ගලෙන් උපන් දෙය. 3. කීල්.

ගො

ගෝ = 1. ගවයා. 2. ගොයා. 3. දෙන. 4. සර සවි. 5. වෑඩ මනුෂ්‍යයා. 6. අනුවණ පුද්ගලයා.

ගො ඇට = 1. ගෙරි ඇට. (හරකුන් ගේ ඇට)

ගොකටු = 1. එනම් පැලෑටි වර්ගය; බොකුටු 2. හිත් තෙරෙංචි නම් පැලෑටි වෙසෙස 3. ගෙරි කටු.

ගොකන් = (ගොකණී) 1. ගෝනා. 2. ගොනා. 2. දේවතා විශෙෂයක්. 4. ඊශ්වර දෙවි.

ගොකුර = 1. ගවයාගේ කුරය.

ගොක් කොළ = 1. ළා පොල් කොළ.

ගොගණය = 1. ගව සමූහය.

ගොංගා = 1. කවඩි විශෙෂයක්; ලොකු කවඩියා.

ගොගා = 1. ලොකු කවඩියා. 2. ගොන් බෙල්ලා. 3. උගුරු ඇටය.

ගොහා නැටවීම = 1. හඬ ලෙලවා කීම.

ගොජ = 1. (බෙබද්දා ගේ) කටින් එන පෙණ 2. වමනය.

ගොජබ්බ = 1. කමකට නැති. 2. අනුවණ. 3. අලස.

ගොජුර = 1. ගොදුර.

ගොජුරුගම = 1. ගෝචර ග්‍රාමය; ගොදුරු ගම.

ගොටළුව = 1. පැල. 2. කුඩා දෙය.

ගොටු ගැහෙනවා = 1. (කොළය හෝ දළුව.) හැකිලෙනවා.

ගොටු = (ගොටුව) 1. කොළය හකුලා සාදාගත් භාජනය 2. සීනුව. 3. දෙමට. 4. කිරි මෝරු. 5. මල් කෙමිය. 6. එනම් පැලෑටි. 7. ඔඩම.

ගොටු අත්ත = 1. වැසි අව් ආදියෙන් මිදීමට ඉහලන තල අත්ත.

ගොටු පත් = 1. ගොටුවක් වැනි කොළය.

ගොඩ = 1. ගොඩ බිම. 2. (පොල් ආදිය) එක් රැස් කොට තැබූ සමූහය. 3. ඉවුර. 4. උරහිස. 5. පිටිසර.

ගොඩ ඇනෙනවා = 1. (ඔරු ආදිය) ගොඩ බිමෙහි වැදෙනවා.

ගොඩඇල් = 1. ඇල් වී වර්ගයක්.

ගොඩකර = 1. ගොඩබිම. 2. වෙරළ.

ගොඩ ගන්නවා = 1. දියෙන් ගොඩට ගෙනෙනවා. 2. (ලෙඩකින් හෝ විපතකින්) බේරා ගන්නවා.

ගොඩ ගැජේ = 1. වෙරළට කිට්ටුව රැල නගින ප්‍රදේශය.

ගොඩ ගැහෙනවා = 1. එකතුවීමෙන් එක් තැනක සමූහයක් වෙනවා; එක් රොක් වෙනවා.

ගොඩ නගනවා = 1. ගොඩනැගිලි සාදනවා; (ගෙවල් ආදිය) ඉදි කරනවා. 2. සවිකර සිටුවනවා.

ගොඩ නගිනවා = 1. උඩට එනවා.

ගොඩනැගිලි = 1. ගෙවල් (ආදිය)

ගොඩ නියමු = 1. සාර්ථ වාහකයා (බඩු-කරත්ත පෙළේ මූලික වෙළෙන්දා)

ගොඩනජේ = 1. ගොඩේ.

ගොඩසෙරකාඅරුවා = 1. නඩුවලට උපදෙස් දෙමින් නඩු කියන්නන්ගෙන් ගැපෙමින් උසාවියේ රස්තියාදු වෙන මිනිසා

ගොඩබඟිනවා = 1. (ජලයෙන්) ගොඩට එනවා 2. පැමිණෙනවා.

ගොඩබානවා = 1. ගොඩට ගේනවා.

ගොඩබිම = 1. ජලයෙන් යටනොවූ ප්‍රදේශය.

ගොඩමඩ = 1. වේළුණු පොළව හා මඩ පොළොව. 2. ගොඩ ඉඩම් හා (ජලාශ්‍රිත) කුඹුරු ඉඩම්.

ගොඩමන = 1. ගොඩැල්ල.

ගොඩමස් = 1. ගොඩ වාසය කරන සතුන්ගේ මස්.

ගොඩමානෙල් = 1. එනම් මල්ගස. 2. වල්ලූනු.

ගොඩයා = 1. පිටිසරයා. 2. එනම් මාලුවා.

ගොඩවාන් = 1. පිටාර යාම. 2. කුඹුරත් ගොඩ බිමත් අතරවූ දිය ඇළ.

ගොඩහමු = 1. අමුනම් ධාන්‍යය.

ගොඩැල්ල = 1. කුඩා කඳු ගැටය.

ගොඩිගලා = 1. යමක් පහසුවෙන් වටහා ගත නොහැකි මිනිහා. 2. යමකට නොනැමෙන තද සිතක් ඇත්තා.

ගොඩින් මඩින් = 1. ගොඩ ඉඩම් වලින් හා කුඹුරු වලින්.

ගොඩයනවා = 1. දියකින් ගොඩබිමට යනවා. 2. වැඩකින් පාඩුවී අත්හිටවනවා.

ගොනගුල් = 1. වඳුරා.

ගොනබුව = 1. පාර අද්දර තනා ඇති බංකුව. 2. අම්බලමේ බංකුව හෝ ලෑලි පෝරුව.

ගොන් = 1. ගවයන් පිළිබඳ. 2. මෝඩ.

ගොන්කපිල්ලා = 1. මාලු වර්ගයක්. 2. කටිගොංගා.

ගොන්කවඩියා = (ගොන් කවුඩා - ගොන් කවඩිච්චා) 1. මයිනා.

ගොන්කැකිරි = 1. කැකිරි වර්ගයක්.

ගොන්ගා = 1. මාලු වර්ගයක්. 2. කටිනොන්ගා 3. ලොකු කවඩියා.

ගොන්ගාලේ ගොඩ බණ්ඩා = 1. මාතලේ කැරැල්ලේ දී පුරන් අප්පු නම් කැරලි නායකයාගේ දෙවෙනියා වී සටන මෙහෙයවූ සිංහල වීරයා.

ගොන්ගාවා = 1. ලොකු කවඩියා.

ගොන්ගාව = 1. ගෝව රට?

ගොන්ගැවිලි = 1. නියරක හරකුන් පැන යාමෙන් කැඩුණු තැන්.

ගොන්ගෙය = 1. ගොන්බාන; ගොන් ඇඳූත්ත.

ගොන්ගෝරිය = 1 මොල්ලිය.

ගොන් තැඹිලි = 1. තැඹිලි වර්ගයක්.

ගොන්න = 1. ගොඩ; සමූහය (කොළ ගොන්න) 4. එනම් ගස.

ගොන්පා = 1. මෝඩයා. 2. වැඩකට නැති මිනිහා.

ගොන්පොර = 1. ගොනුන් ඇන ගැනීම.

ගොන්බඳු = 1. ගවයන් පිළිබඳ කටයුතු කරන්නා.

ගොන්බෙලිකොකා = 1. කොක්කු වර්ගයක්.

ගොන්බෙල්ලා = (ගොම් බෙල්ලා) 1. ගොලු බෙල්ලා.

ගොන්මාලු = 1. මහලු ගොනා.

ගොන්මැසි = 1. ගවයන්ගේ ඇගේ සිටින (ඇට) මැසි වර්ගයක්.

ගොන්රජා = 1. වෘෂභයා. 2. ප්‍රධාන ගවයා 3. ඉතා අනුවණ තැනැත්තා.

ගොනස් = (ගොනැස්) 1. වකුටු පරාලය. 2. පරාල. 3. නන.

ගොනාඩ = 1. නොර කොටු කෑමට යනු නොහැකි සේ ගවයන්ගේ ගෙලෙහි බඳින උපකරණය. 2. පෙල්ල?.

ගොණ = 1. නාසය. 2. සිඹ බැලීම. 3. ගණය; සමූහය. 4. ඌරා.

ගොණු = 1. මිටිය; ගොන්න.

ගොණු (නු) කරනවා = 1. නිරවුල් කරනවා 2. එකලාසයක් කරනවා. 3. එකතු කරනවා; මිටියක් කරනවා.

ගොත = (ගොත්) 1. ගෝත්‍රය; වංශය. 2. ගොළුවා. 3. කථාවේදී ශබ්දය ඇනහිටීම

ගොතගහනවා = 1. වචනය හරිහැටි කියා ගත නොහැකිව නතනතනවා. 2. වචන කඩ මින් ශබ්දකරනවා; කථාවේදී ශබ්ද ඇන හිටවනවා.

ගොතනවා = 1. රචනා කරනවා. 2. නූල්වලින් (පටි ආදියෙන්) ගෙතීම කරනවා; එකින් එක පටලවා වියනවා.

ගොතසා = 1. ගොත ගසන්නා; චික්කලු ගසන්නා.

ගොත් = 1. ගෝත්‍රය. 2. ග්‍රන්ථය.

ගොත්ත = 1. ගෝත්‍රය.

ගොදුර = 1. ගෝචරය. 2. ආහාර. 3. කෑමට අල්ලා ගත් සතා.

ගොදුරු ගම් = 1. ගෝචර ග්‍රාමය. 2. ආහාර සපයන ගම.

ගොදුරු බිම් = 1. ගොදුරු තිබෙන භූමිය.

ගොපය = 1 ගොබය. 2. ළපටි කොළය හෝ ළපටි අත්ත. 3. නොවිහිදුණු පත් වැටිය.

ගොපලා = (ගොපල්ලා -ගොපල්) 1. ගොනුන් බලාගන්නා. 2. විෂ්ණු. 3. (ගවමඩු ආදියට) අරක්ගත් යකෙක්.

ගොප සඳුන් = 1. සුදු සඳුන්.

ගොප් = 1. ළපටි අත්ත. 2. ගොබය. 3. මෘදු. 4. බත් කෙණ්ඩ.

ගොප් ඇමය = 1. පාද සන්ධිය; බොලවය.

ගොප් කළ = 1. ගොබයක් මෙන් මෘදු කළ; මදින ලද.

ගොප් කොළ = 1. ගොක් අත්තේ කොළ; ළපටි පොල් කොළ.

ගොප් තණ = 1. ළා තණ.

ගොප් පත් = 1 ගොක් කොළ.

ගොප් මස = 1. බත් කෙණ්ඩ.

ගොප් රුන් = 1. ගොක් කොළ.

ගොපු = 1. ගුල්ඵය; බත් කෙණ්ඩ. 2. වස.

ගොපු ඇට = 1. බත් කෙණ්ඩෙහි ඇටය.

ගොපුර = 1. නගර වාරය; නුවර දොර 2. වාසල් දොර. 3. ගේට්ටුව. 4. රජ මාසල.

ගොපේ = 1. ගොබය.

ගොපොල්ලා = 1. හරක් බලන්නා. 2. ගොපලු යකා.

ගොබ් = 1. ගොබය. 2. නො විහිදුණු පත් වැටිය. 3. රිකිල්ල. 4. දළුව.

ගොබ්දඬු = 1. දණ්ඩක් වැනි ගොබය.

ගොබඩ = (ගොබ් බඩ) 1. තොමේරූ බඩ; හරය තොමේරූ.

ගොබඩු = 1. ළා; තොමේරූ 2. ළපටි ලී; අරටුව නැති ලී.

ගොබය = (ගොබේ) 1. රිකිල්ල. 2. තොමේරූ අත්ත.

ගොබ් කොළය = 1. නොක් කොළය; ගොක් අත්ත.

ගොබ්බයා = 1. කෙම්බා. 2. මෝඩයා. 3. වැඩකට නැති මිනිසා.

ගොබළු = 1. (කනතුරු) ළපටි පොල් ගෙඩිය.

ගොබොල්ල = 1. ඇට්ටිය; කුරුම්බාවක් වෙන්නට ප්‍රථම තත්ත්වයේ පොල් ගෙඩිය. 2. ළපටි ගෙඩිය.

ගොම = 1. ගව බෙටි.

ගොමලණ්ඩි = 1. ගොම ගුළි.

ගොම කබදූසි = 1. කබදූසි වර්ගයක්; එළිය පෙට්ටිවල කැටයම් කපන්නට ගන්නා (කළු පාටට හුරු) කබදූසි වෙසෙසක්.

ගොම කුරුල්ලා = 1. වෙරළු වටුවා. 2. කැට කුරුළු පක්ෂියා.

ගොම කුරුමිණියා = (ගොම කුරුවැණියා) 1. ගොම ගොඩේ ඉපදී ගොම කමින් ජීවත් වන සත්ත්වයෙක්.

ගොම ගෑම = 1. ගෙබිමෙහි ගොම (පිරිබඩලීම) තැවරීම.

ගොම ගෑවීයාම = 1. විනාශවී යාම.

ගොමඩල = 1. හරක් ගාල; හරක් පට්ටිය.

ගොමතැම්බ = 1. ගොම බෙට්ට; හරකෙකු වරකට හෙලන ගොම ගොඩ.

ගොමනිල්ලා = 1. එතම් මාලුවා.

ගොමපණු - 1. ගොම කුරුමිණියා.

ගොම පිරිබඩලනවා = 1. ගොම තවරනවා; ගොම ගානවා.

ගොමරිති = (නොමරිති) 1. වියලි ගොම රොටි.

ගොමවැරටි = 1. වියලි ගොම ගුළි.

ගොමහක්ක = 1. ගොමගොඩවල හැදෙන හතු.

ගොමසුණු = 1. වියලි ගොම කුඩු.

ගොමස්කඩ = 1. ඉරුණු වැරහැලි. 2. හරක් මස්කඩ?

ගොම් = 1. ගෝතම. 2. ඉරු රශ්මිය. 3. ගල.

ගොම්බෙල්ලා = 1. ගොළු බෙල්ලා.

ගොම්මං වේලාව = 1. ගවයන් නිවෙස් බලා එන වේලාව. 2. සවස් කාලයේ දින සන්ධි වේලාව. 3. මළ ඉර වේලාව. 4. ඇඳිරි වැටෙන වේලාව.

ගොමු = 1. ගුල්මය; ලැහැබ. 2. ගවයාගේ මූත්‍ර.

ගොමුව = 1. පඳුර. 2. ලැහැබ. 3. බරාඳය.

ගොමුත් = 1. පද්‍ය බන්ධන විශේෂයක්.

ගොයම = 1. ශස්‍ය; වී ගස්.

ගොයම් කපනවා = 1. මේරූ වී සහිත ගොයම් ගස් කපා ගන්නවා.

ගොයම් කරවනවා = 1. ගොවිතැන් කරවනවා.

ගොයම් කුරුල්ලා = 1. වී කමින් ගොයම් අතර ගැවසෙන කුරුළු වෙසෙසක්. 2. වීකුරුල්ලා.?

ගොයම් කොල = 1. කපා එක්තැන් කළ ගොයම් ගොඩ; ගොයම් ගොඩ. 2. වීගස්වල කොළ.

ගොයම්ගෙය = 1. ගොයම් තබන ගෙය.

ගොයම්මිඩිය = 1. කුඹුරෙන් කපාගත් වී ගස් පොදිය.

ගොයම් මැස්සා = 1. කුඹුරේ වී කරල්වල යුෂ බොමින් ජීවත්වන මැසි වර්ගයක්. 2. ඉපි වෙසෙසක්.

ගොයම්බත් = 1. ගොයමින් ලැබෙන බත. 2. ගොවිතැන.

ගොයා = 1. තල ගොයා.

ගොයි = 1. වැපිමට සම්බන්ධවූ. 2. ගොවියා. 3. ගොයා.

ගොයිකම් = (ගොවිකම්) 1. ගොවි කර්මාන්තය; කෘෂි කර්මය.

ගොයිකුල = 1. ගොවි කුලය.

ගොයිගම = (ගොයිගොම) 1. ගොවි කුලය.

ගොයිතැන = 1. කෘෂි කර්මය.

ගොයිපල = (ගොයිබිම) 1. ගොවිතැන් කරන ඉඩම.

ගොයිවසම 1. වැපිමේ රක්ෂාව.

ගොයිගානවා = 1. වැපිරීමට පොළොව සමතලා කරනවා. 2. සානවා.

ගොයියා = 1. ගොවිතැන් කරන්නා. 2. සාදයා; පුද්ගලයා.

ගොයියෝ = 1. ගොවිතැන් කරන්නෝ; ගොවිරාළලා. 2. මිත්‍රයන්හට ආමන්ත්‍රණය කිරීමට යොදන වචනයක්.

ගොයුම් = 1. ගෞතම බුදුන් වහන්සේ. 2. ගොයම.

ගොයුම්ගොත් = 1. ගෞතම බුදුරජ. 2. ගෞතම වංශයට අයිති.

ගොයුම්ගොත = 1. ගෞතම බුදුන් වහන්සේ. 2. ගෞතම වංශය.

ගොයුම්සාල් = 1. වියෙන් ලැබෙන හාල්.

ගොයුම්හිමියා = 1. ගෞතම බුදුන් වහන්සේ.

ගොයුම = 1. පුල්ලිය.

ගොයුමා = 1. වහලා.

ගොර = 1. නපුරු; ඝෝර. 2. ගෞරවණීය. 3. සුද.

ගොරඅදිනවා = 1. උගුරෙන් හඩ නිකුත් කරමින් නිදනවා.

ගොරක = එනම් ගස. 2. ගොරක ගසේ ගෙඩි. 3. (ගොරක ගෙඩි වියලා සකස් කර ගන්නා) ව්‍යඤ්ජන රසවත් කිරීමට යොදන ඇඹුල් රසැති ද්‍රව්‍යය. 4. කිඹුලා 5. කුඩා දරුවා. 6. කපටියා.

ගොරකද = 1. නම්බු කිරීම.

ගොරතර = 1. අතිඝෝර; ඉතා නපුරු.

ගොරද = 1. ගෝරෝචන.

ගොරොද්ද අදිනවා = 1. ගොර අදිනවා බලන්න.

ගොරදයා = 1. නපුරු මිනිසා. 2. කිඹුලා.

ගොරබා = 1. පරෙවියා.

ගොරබිරම් = 1. ඝෝරවූ භයංකරවූ; ඉතා භයානක.

ගොරවනවා = 1. අහස ගුගුරනවා. 3. තර්ජනය කරනවා. 3. (තිත්දේදී) උගුරෙන් ශබ්ද නිකුත් කරනවා.

ගොරහැඩි = 1. ගොරෝසු. 2. මොළොක් නොවූ; රළු. 3. නපුරු.

ගොරී = 1. සුදු ස්ත්‍රී.

ගොරෙක් = 1. වදන ගේ; තිඹිරිගේ.

ගොරොක් = 1. මහලු. 2. වැදගත්; ගරුක. 3. ගෞරවය. 4. පරණ. 5. බරවූ. 6. සුරගුරු. 7. දයාව. 8. ගැඹුරු.

ගොරොක්මුත් = 1. උපන්; 2. බරින් නිදහස්වූ.

ගොරෝස = (ගොරෝසු) 1. රළු. 2. සත. 3. මොළොක් නොවූ.

ගොල = 1. තරාදිය. 2. පලම් සියය. 3 (බෙහෙත් කිරීමේදී යෙදෙන) කුරු හන ලිහක බර. 4. කළු ඉංගිරියාව (අක්ෂි ගෝලය.) 5. පහර. 6. දුක.

ගොලගැබ = 1. කැවිලි වෙසෙසක්. 2. ඇතුළත ගුළිය. 3. හරිහැටි නොපිසූ කැවුම. 4. (පිට්ටු සෑදීමට) කැට කළ පිටි ගුළි.

ගොලහැල = 1. ලොකු මඩවළ.

ගොල්ල = 1. (ඒ) උදවිය. 2. නෑදෑයෝ.

ගොල්ල වෙලා යනවා = 1. නෑදෑ ගෙවල්වලට යනවා.

ගොලා – 1. ගොලුබෙල්ලා.

ගොලෑ = 1. ලපටි. 2. ඉතා ලපටි පුවක් ගෙඩි.

ගොලු = 1. සමූහය. 2. ලෑහැබ. 3. කථා කළ නොහැකි. 4. මිටි. 5. නිශ්චල.

ගොලොව = 1. පැරණි ලාම්පු විශේෂයක් (ඇතුළත වීදුරු භාජනයක් තුළ පොල් තෙල් හා දියවත්කොට පහන දල්වා විශාල වීදුරු ගෝලයක් තුළ බහා උඩ එල්ලන ලාම්පුවකි.) 2. ගෝලාකාර වීදුරු වැස්ම.

ගොවඳ = (ගොවුද) 1. හරක් ගාල.

ගොව්වා = 1. රැක බලා ගන්නා. 2. මූරකාරයා.

ගොවිඳු = 1. සමූහය. 2. ඉරු රැස්.

ගොවනෑස් = 1. පරාලය.

ගොවැර්නමේන්තුව = 1. අණ්ඩුව; රජය.

ගොවැර්නදෙරු = 1. අණ්ඩුකාරයා.

ගොවි = 1. සීසෑම් ආදී කුඹුරු වැඩවලින් ජීවත් වන්නා. 2. වැපීම සම්බන්ධවූ.

ගොවිකම = 1. කෘෂිකර්මය.

ගොවිකුලය = 1. ගොවිතැන් බත් කිරීමෙන් දිවිපෙවෙත කරන කුලය. 2. ගොයිගම කුලය.

ගොවිඳු = 1. විෂ්ණු දෙවි (ගෝවින්ද)

ගොවිඳුකාන = (ගොවිඳු කාල් - ගොවිඳු සඳ) 1. විෂ්ණු දෙවියන්ගේ භාර්යාව; ශ්‍රීකාන්තාව

ගොවුද්ද = 1. ගවගාල. 2. සමූහය.

ගොවුදිකඩ = 1. ගවයන් යන කඩුල්ල.

ගොවුන් = 1. ගවයන්.

ගොවොනෑස් = 1. පරාලය.

ගොස (ගොස්) 1. ඝෝෂාව. 2. මේඝ ගර්ජනාව. 3. ගමන් කොට

ගොසකුර = 1. ඝෝෂාක්ෂර; ශබ්ද වන අකුරු.

ගොසකාර = 1. ඉරිඟු කරල.

ගොසඳුන් = 1. අංජනකූට. 2. සුදු හඳුන්.

ගොස් = 1. ඝෝෂාව. 2. ගිගිල්ලා.

ගොස්මින් = 1. ඝොෂාකරමින්.

ගොසින් = 1. ඝොෂාවෙන්. 2. ගිගින්; ගොගින්

ගොහ = 1. ගුහාව.

ගොහනා = 1. ඝෝෂා කරන; හඬ නගන.

ගොහාලෙ = (ගොහාලය) 1. ලීයෙන් කළ මැස්සක්.

ගොහිමින් = 1. ඝෝෂණය කරමින්; හඬ නගමින්.

ගොහොණ = 1. ගෝණා. 2. ගෝලාකාර දේ. 3 මිට්ටා.

ගොහොණය = (ගොහොන්) 1. නාසය 2. සිඹ බැලීම.

ගොහොදු = 1. අවුලෙන් අවුල්වූ. 2. මඩ හා දිය සහිත තැන.

ගොහොරණ = (ගොහොනා) 1. ගෝණා. 2. අශ්වයාගේ නාසය.

ගොහොන් = 1. අශ්වයාගේ නාසය.

ගොහොදු වැඩ = 1. කමකට නැති වැඩ. 2. කැත වැඩ.

ගොහොදුවෙනවා = 1. කැතවෙනවා. 2. සවුත්තු වෙනවා.

ගොහොරු = 1. මඩ හා දිය සහිත තැන.

ගොහො ලිහිණි = 1. ලිහිණි වර්ගයක්.

ගොළ = 1. ගෝලාකාර දෙය. 2. ගුටිය. 3. පහර.

ගොළු = 1. කථා කළ නොහැකි. 2. නෝඵයා; මිට්ටා. 3 නිශ්චල?

ගොළුකම = 1. කථාකළ නොහැකි බව. 2. නිශ්ශබ්ද භාවය.

ගොළුපිළි = 1. ගොළුවා කොහොන් ගොළු කොරා.

ගොළු මුහුද = 1. ගෝළු සමුද්‍රය; ඉන්දියන් සාගරය. 2. ගැඹුරු නැති මුහුද.

ගොළුවුන් = 1. මූග ව්‍රතය; ගොළුවකු මෙන් කථා නොකර සිටීම; නිහඬව සිටීම.

ගොළුසන්නිය = 1. කථා කිරීමට නොහැකිව ගොළු බවට පත් වන සන්නි රෝගය. 2. සන්නි යකාගේ අවතාරයක්.

ගෝ

ගෝ = 1. ගොයා. 2. ගවයා. 3. ගවයන් පිළිබඳ 4. ඉන්ද්‍රියය. 5. රශ්මිය. 6. ගස් වෙසෙසක්. 7. ඝෝෂය.

ගෝඇම = 1. ගෙරි ඇට; ගෙරි කටු.

ගෝකණ්ටක = 1. ගොකටු. 2. ගවකුරය.

ගෝකණ්ණ = 1. ගෝනා.

ගෝගණ = 1. ගවසමූහය.

ගෝකුණ = 1. ගෙරිකුණ; ගවයාගේ මළසිරුර.

ගෝකුර = 1. ගවයාගේ කුරය.

ගෝකුල = 1. ගව රැළ; ගවගාල.

ගෝඝාතක = 1. හරක් මරණ.

ගෝක්ෂා = 1. උක්දඬු.

ගෝචර = 1. රූපාදී අරමුණු. 2. ගොදුර; ආහාරය. 3. පුරුදු තැන. 4. ගවයන් හැසිරෙන තැන. 5. ග්‍රහයෙකුගේ ගමනෙහිදී සිටින තැන.

ගෝචර ගාම = 1. ගොදුරුගම; ගෝචර ග්‍රාමය. 2. ඒ ඒ විහාරස්ථානයේ ළඟක ගම.

ගෝචර්මය = 1. හරක්හම.

ගෝටවිය = 1. පුත්කාතම.

ගෝච්ඡිය = 1. ඝෝෂාව. 2. කල බල ඇති කරන ශබ්දය. 3. කරච්චලය.

ගොච්ඡ = 1. ගාල.

ගෝඨ = 1. මිටි.

ගෝඨසිම්බර = 1. ගැමුණු රජ තුමාගේ දසමහ යෝධයන් අතුරින් එක් යෝධයෙකි.

ගෝධා = 1. අරක්කු පෙරීමේදී ඉතිරිවන රා මණ්ඩි.

ගෝඩිම්බර = 1. නොරෝසු. 2. හැඩි දූෂි.

ගෝණ = 1. ගෝ කණ්ණ මෘගයා; ගෝනා.

ගෝණ අං = 1. ගෝනාගේ අඟ.

ගෝණක = 1. සතරඟුල් පමණ දිග ලොම් ඇති පලස;

ගෝනද = 1 ගෝනා.

ගෝනඞ්ගී = 1. සොකී; ගෝකදියා; කොකා.

ගෝනල = 1. අළු වන්නක්

ගෝනසයා = 1. පොළඟා.

ගෝනාසයා = 1. ගොන් නාසයක් ඇත්තා.

ගෝනැස = 1. පරාලය; වකුටු පරාලය.

ගෝනි = 1. එනම් මාළු වෙසෙස. 2. ගස් වර්ගයක්.

ගෝනි සාබ්‍ර = 1. ගෝනි මළු ආදිය මැසීමට ගන්නා ලොකු ඉදිකටු වර්ගයක්.

ගෝනිකාඩ = 1. ගෝනි රෙද්ද.

ගෝනි බර = 1. බඩු කිරීමේදී ගෝනිය වෙනු වෙන් අත්හරින බර ප්‍රමාණය.

ගෝනිලවැල් = 1. වැල් වර්ගයක්; නිල් වැල්.

ගෝනුස්සා = 1. එනම් සතා; වෘශ්චිකයා.

ගෝනකාරුමෙ = 1. හිරි හැර සහිත වැඩේ. 2. වේදනාවෙන් පසුවීම.

ගෝතම = 1. ගෞතම ගෝත්‍ර ඇති. 2. ගෞතම බුදුන් වහන්සේ.

ගෝතමී = 1. මහා ප්‍රජාපතී ගෝතමී (සිද්ධාර්ථ කුමාරයන්ගේ සුළු මවු) 2. ගෞතම ගෝත්‍ර ඇත්තී. 3. ගෝරෝචන.

ගොත්ත = (ගෝත්‍රය) 1. වංශය. 2. කුල පරම්පරාව.

ගෝත්‍රජ = 1. (යහපත්) ගෝත්‍රයක උපන්.

ගෝත්‍රනාමය = 1. වාසගම. 2. ගෙයි නම.

ගෝත්‍රභූ = 1. ගෝත්‍රයෙහි වන. 2. මාර්ග සිතට පළමුවෙන් උපදනා සිත.

ගෝදන්ත = 1. සිරියල්.

ගෝදාරණය = 1. උදැල්ල 2. නගුල.

ගෝදුව = 1. කමකට නැති වැඩේ. 2. කරදර සහිත වැඩේ.

ගෝද්‍රම = 1. එනම් වර්ගය; තිරිඟු

ගෝධනය = 1. හරක් රැළ. 2. හරකුන් ධනය කොට ඇති.

ගෝධා = 1. ගොයා; කලගොයා.

ගෝධාව = 1. දුනුවායාගේ වම්තේ ලන පලිහ.

ගෝධූම = (ගෙ-ධූම) 1. තිරිඟු. 2. දොඹ ගෙඩිය.

ගෝධූලී = 1. ගවසියන්ගේ කුරවලින් නැගුණු දූවිලි.

ගෝපක = 1. රකින්නා. 2. මුරකරන්නා. 3. ගෝපනය කරන්නා. 4. ගොව්වා 5. පලාත් මූලාදෑනියා.

ගෝපක්ෂ්ම = 1. ගව වස්සකුගේ වැනි ඇස් පිහාටු ඇති. 2. එනම් ලක්ෂණය.

ගෝපනය = 1. රැකීම. 2. පාලනය. 3. සඟවා තැබීම.

ගෝපතියා = 1. පොළොවට අධිපතියා. 2. සිවදෙවියා. 3. රජා. 4. සූර්යයා. 5. ඉන්ද්‍රදෙවියා. 6. වෘෂභයා.

ගෝපසියා = 1. කිත්තුලු වෙසෙසක්. 2. හරක් කිත්තුල්ලා.

ගෝපරස = 1. සුවඳ ජාතියක්.

ගෝපානසී = 1. ගොණැස්ස. 2. වහලේ යොදන වක්වූ යටලීය.

ගෝපාල = 1. ගොපල්ලා. 2. ගවයන් බලා-ගන්නා. 3. කෘෂ්ණ.

ගෝපාව = (ගෝපාලිකා) 1. කිරි දෙවිත්නී. 2. ගවයන් බලා ගන්නා ස්ත්‍රිය.

ගෝපික = 1. ගවයන් සම්බන්ධ.

ගෝපිත = 1. රකින ලද. 2. ගෝපනය කළ. 3. සඟවන ලද.

ගෝපී = 1. ගොපලු ස්ත්‍රිය.

ගෝපුර = (ගෝපුර වාරය) 1. දොරටු ගෙය. 2. නුවර දොර. 3. පූජ්‍ය ස්ථානයක දොරටුව.

ගෝපුරීෂ = 1. ගොම.

ගෝපේන්ද්‍රයා = (ගෝප + ඉන්ද්‍රයා) 1. ගොප-ලූන්ගේ ප්‍රධානයා. 2. කෘෂ්ණා.

ගෝබර = 1. ගෝමර; ඇහෙහි හැදෙන කැලැල් වෙසෙසක්.

ගෝභවස = 1. ගෝරෝචන

ගෝමණ්ඩලය = (ගෝමණ්ඩල) 1. ගව පට්ටිය. 2. භූ මණ්ඩලය.

ගෝමත් = (ගෝමි - ගෝමික) 1. පුරාණ තම්බු නාමයක්. 2. ගවයන් ඇති.

ගෝමය = 1. ගොම.

ගෝමර = 1 ගෝබර බලන්න.

ගෝමරයා = 1 පුල්ලි සහිත ගවයා

ගෝමසිටා = 1. කුරුළු වර්ගයක්.

ගෝමායු = 1. ගවයාගේ පිත.

ගෝමූල = 1. ගැට තුඹ.

ගෝමායුවා = 1. කැනහිලා. 2. ගාන්ධර්වයා.

ගෝමික = (ගෝමි) 1. ගවයන් ඇති; ගවයන් ඇත්තා.

ගෝමූ = (ගෝ මුත්ත - ගෝ මූත්‍ර) 1. ගවයන් ගේ මූත්‍ර.

ගෝමුඛ = 1. වාද්‍ය භාණ්ඩයක්.

ගෝමේදක = (ගෝමේද) 1. එනම් මැණික් වර්ගය. 2. විෂ වර්ගයක්. 3. ආලේපය.

ගෝමේධය = 1. එනම් යාගය. 2. ගව පූජාව.

ගෝ යුගය = 1. ගොන් ඇඳුන්න; ගොන් බාන.

ගෝයෝනිය = 1. ගොනකු මෙන් ඉපදීම හෝ දෙනකු මෙන් ඉපදීම.

ගෝර = 1. රෞද්‍ර. 2. දරුණු.

ගෝරක්ෂ = 1. පැණිදොඩම්.

ගෝරක්ෂයා = 1. ගවයන් රකින්නා.

ගෝරක්ෂා = 1. ගවපාලනය. 2. ගවයන් රැකීම

ගෝරංකුවා = 1. ජලචර කුරුළු වෙසෙසක්. 2. සිරකාරයා 3 නිර්වස්ත්‍ර මනුෂ්‍යයා.

ගෝරනාඩුව = 1. වචනයෙන් තර්ජනය කිරීම. ඝෝර නාදය. 3. බැණීම.

ගෝරස = 1. එළදෙනගෙන් ලැබෙන ආහාර වර්ග; පස් ගෝ රස.

ගෝර්දන = 1 ඉස්මොළය

ගෝරිපා = (ගෝරිපු - ගෝරූපු) 1. ගවයන්ගේ සතුරා; කොටියා.

ගෝරු = 1. නොහොරු; බොර.

ගෝරෝචන = 1. ගවයාගේ මොල්ලියෙන් ලබා ගන්නා එනම් බෙහෙත් ද්‍රව්‍යය.

ගෝල = (ගෝල) 1. වටකුරු. 2. බෝලයක් වැනි. 3. පලම් සිනය. 4. තුලාව. 5. ශිෂ්‍යයා.

ගෝලබාල = 1. ශිෂ්‍යයා.

ගෝලයා = (ගෝලයා) 1. ගුරුන්ගෙන් ඉගෙනීමෙහි නියුක්තයා. 2. මිට්ටා.

ගෝලාකාර = 1. වටකුරු හැඩයෙන් යුත්.

ගෝල්ලා = 1. මුහුදු මාළුවෙක්; බෝල්ලා.

ගෝලාංගූලයා = 1. කළු වඳුරා.

ගෝලිච්චා = 1. කරච්චලය; කරදර ගෙනදෙන ඝෝෂාව.

ගෝලෝමි = 1. වදකහ 2. ගණිකාව.

ගෝළු ගන්නවා = 1. කෝපයෙන් බැණ වදිනවා.

ගෝවජය = 1. හරක් ගාල.

ගෝවන් = 1. දුඹුරු පැහැය.

ගෝවා = 1. එනම් එළවළු වර්ගය.

ගෝවාඤය = 1. ගවරැළ. 2. ගවයන් ධනය කොට ඇති.

ගෝවිපි = 1. ගොම.

ගෝවින්ද = 1. විෂ්ණු දෙවි. 2. ගවපාලයන්ගේ ප්‍රධානයා. 3. ක්‍රිෂ්ණා. 4. බෘහස්පති.

ගෝසය = 1. සුවඳ වර්ගයක්.

ගෝසතර = 1. ගවයන් පිළිබඳ ශාස්ත්‍රය. 2. හරක් වෙදකම.

ගෝස්තනය = 1. (ගවදෙනගේ) බුරුල්ල. 2. මාලය. 3. පොකුර.

ගෝස්තනිය = 1. මිදි.

ගෝස්තනි ලතා = 1. මිදි වැල.

ගෝස්නාරය = 1. ආහාරය; කෑම.

ගෝස්මය = 1. හති දැමීම.

ගෝෂුඩ = 1. හුඟ. 2. බොහෝ සේ.

ගෝශාලය = 1. ගව පට්ටිය.

ගෝෂ්ඨි = 1. සභාව. 2. සාකච්ඡාව. 3. පාඨශාලාව. 4. කථාව.

ගෝෂා = 1. නද ශබ්දය.

ගෝෂාලවැල් = 1. වැල් වර්ගයක්.

ගෝෂීෂ = රත්වන් සඳුන්.

ගෝළ = (ගෝළක) 1 ගුළිය. 2. බෝළ.

ගෝළුගැනුම් = 1. සැරකිරීම. 2. බැණවැදීම.

ගෝහග = 1. හරක් අඟ.

ගෞ

ගෞ = 1. ගරුකටයුතු. (ගෞරවනීය යන්න වෙනුවට යොදන අකුර)

ගෞඩ = 1. එනම් දේශය; ඉන්දියාවේ පළාතක්.

ගෞතම = (සිද්ධාර්ථ) බුදුන් වහන්සේ. 2. වංශයක නාමයක්. 3. න්‍යාය ශාස්ත්‍රය නිපදවූ සෘෂිවරයා.

ගෞධාරයා = (ගෞධේයයා) 1. තලගොයා.

ගෞනච්ඡව = 1. විෂ.

ගෞර = 1. සුදු පැහැය. 2. මිරිසිඳු. 3. එළ. 4. එළ රතු.

ගෞරඞ්ගනා = 1. සුදු පැහැති ස්ත්‍රී; එළළු ස්ත්‍රී.

ගෞරය = 1. රත්රන්. 2. නෙළුම් නූල. 3. කහ.

ගෞරව = (ගෞරී) 1. කන්‍යාව. 2. ගුරුබව. 3. ආදරය. 4. සැලකිල්ල. 5. නම්බුව. 6. උතුම්කොට සැලකීම.

ගෞරවාන්විත = 1. ගෞරව සහිත; ගරුකටයුතු.

ගෞරවාහී = (ගෞරව + අහී) 1. ගෞරවයට සුදුසු.

ගෞලි = 1. හූනා.

ග්‍ර

ග්‍රථ = 1. ගෙතීම. 2. එතීම.

ග්‍රථන = 1. ගෙතීම; ගැටගැසීම.

ග්‍රථිත = 1. ගැට ගැසුණු. 2. ඇමුණුණු.

ග්‍රන්ථ = 1 ගැට ගැසීම. 2. බැඳීම. 3. පොත්. 4. රචනා කළ දෙය. 5. වාක්‍ය රචනාවට අයිති. 6. අකුරු දෙතිස්ක ප්‍රමාණය.

ග්‍රන්ථ ආරම්භ = 1. පොතෙහි පටන්ගැනීම.

ග්‍රන්ථ කර්තෘ = 1. පොත් සකස් කරන්නා.

ග්‍රන්ථකාරක = 1. පොත් සකස් කරන.

ග්‍රන්ථකාරයා = 1. පොත් සකස් කරන්නා.

ග්‍රන්ථකුටිය = 1. පොත්ගුල. 2. කත්තෝරුව.

ග්‍රන්ථගෞරව = 1. පොත මහත්වීම.

ග්‍රන්ථචෞරයා = 1. අනුන්ගේ පොත්වල කරුණු ගෙන තමන්ගේ මෙන් පළ කරන්නා.

ග්‍රන්ථධුර = 1. බුද්ධ ධර්මය ඉගෙණීම. 2. ධර්මය පොත පතින් අනුන්හට කියාදීම.

ග්‍රන්ථනය = 1. ගෙතීම. 2. රචනාව. 3. පිළිවෙළට යෙදීම. 4. පොත්-පත් ආදිය සකස් කිරීම. 5. බැඳීම.

ග්‍රන්ථ පරීක්ෂකයා = 1. පොත්-පත් පරීක්ෂා කොට ගුණ දොස් දක්වන්නා.

ග්‍රන්ථ ප්‍රකාශක මණ්ඩලය = 1. අධ්‍යාපන දෙපාර්තමේන්තුව විසින් පොත් පත් විවේචනය කිරීම පිණිස පත්කරන ලද මිනිසුන් සමූහයට ව්‍යවහාර කරන නම.

ග්‍රන්ථය = 1. පොත. 2. ගැටය. 3. රචනා කළ දෙය.

ග්‍රන්ථි = 1. පුරුක. 2. ගැටය. 3. ගෙතූ. 4. දුර්බෝධ.

ග්‍රන්ථිකා = 1. සුවඳ. 2. දුම්මල වෙසෙසක්.

ග්‍රන්ථිත = 1. රචනාකළ.

ග්‍රන්ථිපද = 1. ගැටපද; අමාරු වචන.

ග්‍රන්ථි පද විවරණය = 1. අමාරු වචන විස්තර කොට දක්වෙන පොත.

ග්‍රන්ථිභේදක = 1. ගැට කපන සොරා.

ග්‍රන්ථිස්ථාන = 1. ගැටළු තැන්.

ග්‍රස = 1. ඇල්ලීම. 2. කෑම. 3. විනාශ කිරීම. 4. ගිලීම.

ග්‍රස්ත = 1. අල්ලන ලද. 2. යටපත් කළ. 3 ගන්නා ලද. 4. කන ලද.

ග්‍රහ = 1. ගැනීම. 2. ග්‍රහ ලෝක. 3. අල්ලා ගැනීම. 4. චන්ද්‍රග්‍රහණ ආදිය.

ග්‍රහ ගණිතය = 1. ග්‍රහයන්ගේ ගමනාගමනය දැන ගන්නා ගණිත ක්‍රමය.

ග්‍රහචාරය = 1. ග්‍රහයන්ගේ හැසිරීම; ග්‍රහයන්ගේ ගමනාගමනය.

ග්‍රහකාරකා = 1. ග්‍රහයන්යයි හැඳින්වෙන බුද සිකුරු ආදි තරු.

ග්‍රහණය = 1. ගැනීම. 2. ඉගෙණීම. 3. හඳ රාහු ඇල්ලීම හෝ ඉර රාහු ඇල්ලීම. 4. ආදරය. 5. නුවණ 6. අත. 7. සැලකීම.

ග්‍රහණි = 1. එනම් රෝගය. (කෑම නොදිරවීම, නිතර විරේචනය වීම, ඇඟ දිරවා යාම ආදි ලකුණු ඇති රෝගයකි.) 2. මාත්‍රදම් විශෙෂයක්. 3. රක්තාතිසාරය.

ග්‍රහපති = 1. ඉර. (ග්‍රහයන්ගේ ප්‍රධානයා.)

ග්‍රහබලිය = 1. ග්‍රහයන් උදෙසා කරන ශාන්ති කර්මය. (බලිය)

ග්‍රහයාග = 1. ග්‍රහයන් උදෙසා කරන ශාන්ති කර්ම. (ග්‍රහපූජා)

ග්‍රහස්ථ = 1. ගෘහස්ථ. (ගිහි ගෙයි වෙසෙන)

ග්‍රහීතව්‍ය = 1. ගතයුතු.

ග්‍රා

ග්‍රාම = 1. ගම. 2. ගම්බද. 3. පිටිසර. 4. ඉඩම. 5. නින්දගම

ග්‍රාමඅන්ත = 1. ගම් කෙළවර. 2. ගමෙහි වූ.

ග්‍රාමඝාතක = 1. ගම් නසන්නා.

ග්‍රාමජ්‍යෙෂ්ඨ = 1. ගමේ ප්‍රධානයා.

ග්‍රාමධර්ම = 1. මෙවුන්දම.

ග්‍රාමභෝජක = 1. ගම් මුදලියා. (ගමේ මූලාදෑනියා.)

ග්‍රාමණිකාව = 1. ගමේ ස්ත්‍රී.

ග්‍රාමණී = 1. ගමේ ප්‍රධානියා. (ගම් දෙටුවා) 2. ඇම්බට්ටයා. (පනික්කියා) 3. ගමේ වෛශ්‍යාව.

ග්‍රාමික = 1. ගමෙහිවූ; පිටිසර.

ග්‍රාමියා = 1. ගැමියා.

ග්‍රාමිණියා = 1. ගමේ වැසියා. 2. කපුටුවා. 3. බල්ලා.

ග්‍රාම්‍ය = 1. ගැමි; ගම්බද. 2. පිටිසර. 3. සභාවට නුසුදුසු. 4. අශිෂ්ට.

ග්‍රාම්‍යජනයා = (ග්‍රාම්‍යයා) 1. ගම්වැසියා. 2. යමක් නොදත් මිනිසා. (පිටිසරයා)

ග්‍රාම්‍යාශ්වයා = 1. කොටළුවා.

ග්‍රාසය = 1. අහර පිඬ 2. අල්ලා ගැනීම. 3. කෑම.

ග්‍රාහ = 1. ගැනීම. 2. සැලකීම. 3. දැනගැනීම. 4. අදහස.

ග්‍රාහක = 1. ගන්නා 2. මෝරා. 3. කිඹුලා.

ග්‍රාහවිකාර = 1. වියරුවූ අදහස.

ග්‍රාහි = 1. ගන්නා සුළු.

ග්‍රාහ්‍ය = 1. ගතයුතු.

ග්‍රී – ග්ලා

ග්‍රීක් = 1. එනම් මනුෂ්‍ය වර්ගය. 2. එනම් භාෂාව. 3. ග්‍රීසිය නම් රටට අයත්.

ග්‍රීවය = (ග්‍රීවාව) 1. බෙල්ල. 2. උගුර.

ග්‍රීවා භරණ = 1. ගෙල පළඳනා මාල.

ග්‍රීවාච්ඡේද = 1. ගෙල සිඳීම.

ග්‍රීවානාඩිය = 1. උගුරු දණ්ඩ.

ග්‍රීවාධාතු = 1. බුදුන් වහන්සේගේ ග්‍රීවාවෙහි ඇටය.

ග්‍රීවාපදිකයා = (ග්‍රීවා පාදිකයා) 1. බෙල්ලට බැඳුණු පා ඇති සතා.

ග්‍රීවාරාවය = 1. ගෙල රැව්.

ග්‍රීවාසංමහනය = 1. බෙල්ල හිරිවැරීම.

ග්‍රීවාස්ථිය = 1. ගෙලෙහි වූ ඇටය.

ග්‍රීසිය = 1. එනම් රට. (ග්‍රීක් වර්ගයාගේ ජන්මභූමිය)

ග්‍රීෂ්ම = 1. උෂ්ණය. 2. එනම් සෘතුව.

ගූඪ = 1. ගැඹුරුවූ අදහස් ඇති. 2. සැඟවුණු. 3. තේරුම් ගත නො හැකි. 4. රහස්.

ග්ලාන = 1. ගිලන්; ලෙඩවූ.

ග්ලානප්‍රත්‍යය = 1. ගිලන් පස.

ග්ලානි = 1. ගිලන් බව.

ඝ

ඝං = 1. සීනුව. 2. කිංකිණි ශබ්දය.

ඝංඝන = 1. ගැටීම.

ඝන = 1. වනසන්නාවූ.

ඝට = 1. කළය. 2. ඇත්කුඹ. 3. හුස්ම අල්ලා සිටීම.

ඝටක = 1. කුඩා කළය. 2. ජෝකඩය. 3. ගසක මොල්ලිය හෝ ගැටය.

ඝටචේටිකා = 1. වෙශ්‍යාව. 2. කළ දැස්ස.

ඝටනය = 1. උත්සාහය 2. එකතු කිරීම.

ඝටනවා = 1. කලවම් කරනවා. 2. අඹරනවා. 3. ගැටීම කරනවා.

ඝටනා = 1. ගැළපීම. 2. පැස්සීම. 3. ගැටීම. 4. මිශ්‍රකිරීම.

ඝටමින් = 1. ඝට්ටනය කරමින්.

ඝටා = 1. ගටා. 2. සමූහය. 3. පෙළ. 4. ඇත්රළ 5. හප්පා.

ඝට්ටනය = 1. හැප්පීම. 2. කලහය. 3. ඇදීම.

ඝට්ටය = 1. තොට; තොටුපොළ.

ඝට්ටිත = 1. හප්පන ලද. 2. සොලවන ලද.

ඝටිකය = 1. තට්ටම.

ඝටිකයා = 1. ඔරුපදින්නා. 2. දිය සපයන්නා.

ඝටිකා = 1. පැය. 2. හෝරාව. (පැ දෙකහමාර) 3. මොල්ලිය. 4. ගුළිය. 5. කල්ලි ගැසීම. 6. කුඩා කළය. 7. ගැටය. 8. වළලුකර.

ඝටිකාකපාල = (ඝටිකා පාත්‍රය) 1. පැතැටිය.

ඝටිකායන්ත්‍ර = 1. පැතැටිය. 2. ඔරලෝසුව.

ඝටිත = 1. ගැළපූ. 2. සන්ධි කළ. 3. සෑදුණාවූ.

ඝටී = 1. කළය. 2. මුට්ටිය. 3. සීනුව. 4. කෙණ්ඩිය.

ඝටීකාර 1. වළන් සාදන්නා. (කුම්භකාරයා) 2. එනම් මහා බ්‍රහ්මයා.

ඝන = 1. තද. 2. ඝනකම. 3. ගොරෝසු. 4, බෙහෙවින් ඇති. 5. එක සමාන ඉලක්කම් තුනක් එකිනෙක වැඩි කිරීමෙන් ලැබෙන ඵලය. 6. මේඝය. 7. තුනී නොවූ. 8. ලෝහමය කයිතාලම. (පඤ්චතූර්යයී භාණ්ඩයන් අතුරෙන් එකක්) 9. යකඩ පොල්ල. 10. ගනනවූ. 11. වස්තුව.

ඝනඅඩිය = 1. දිගින් හා පළලින්ද උසින්ද අඩිය.

ඝන අන්ධකාරය = 1. තද අඳුර.

ඝනාගම = 1. වර්ෂාව ළඟාවීම (වර්ෂා සෘතුව)

ඝනකඩ මහබොල් = 1. ඉකාම්ප් ඝන.

ඝනාඝනා = 1. ජාති ඇත්තරක්.

ඝනාඝාඩ = 1. ගල් වැස්ස.

ඝනකාලය = 1. වැහි කාලය.

ඝනකෝණය = 1. පැති කීපයකින් යුත් මුල්ල.

ඝනගණන = 1. යම්කිසි ගණනක් ඒ ගණනෙන්ම තෙවරක් වැඩි කිරීමෙන් ලැබෙණ ගණන.

ඝනචතුරශ්‍රය = 1. එක හා සමාන පැති හයකින් යුත් පෙට්ටියක හැඩයෙන් යුත් දෙය.

ඝනචර්මසත්වයා = 1. ගොරෝසු හමකින් යුත් සතා.

ඝනච්ඡායා = 1. ඝනවූ සෙවනැල්ල.

ඝනතම = 1 දැඩි අඳුර, 2. ඉතා ඝනවූ.

ඝනතර = 1. ඉතා ඝන.

ඝනදර්ශක = 1. ඝනකම පෙන්වන්නාවූ.

ඝනපරාගධාර = 1. බෙහෙවින් රොන් ඇති.

ඝනප්‍රියශා = 1. මොනරා 2. වැහි ලිහිණියා.

ඝනපුෂ් = 1. ඝනවූ මල්.

ඝනපුෂ්ප = 1. බොහෝ මල් පෙන්වා වියූ ඇතිරිය.

ඝනබොල්වූ = 1. ඝනව පළල්වූ.

ඝනභාර = 1. ඝනවූ හා බරවූ.

ඝනමූලය = 1. ගණනක් ලබා ගැනීමට තෙවරක් වැඩි කරන එකම ගණන (8 ඝනයකි. එහි මූලය 2යි. 27 හි ඝන මූලය 3යි. සෙස්සද මෙසේය.)

ඝනරසය = 1. කසාය. 2. ඝනවූ යුස.

ඝනරූපය = 1. කලල රූපය (මවු කුස පිළිසිඳ ගන්නා දරුවාගේ පළමුව ඇතිවන රූපය.)

ඝනසාරය = 1. කපුරු. 2. ඝනවූ අරටුව. 3. රසදිය. 4. ජලය.

ඝනාකාරය = 1. වර්ෂාකාලය.

ඝනාගම = (ඝන + ආගම) 1. වර්ෂාකාලය

ඝනාඝන = 1. එකින් එක ගැසීම. 2. ඉන්ද්‍රදෙවි. 3. වජ්‍රයා.

ඝනීභූත = (ඝනීභූත) 1. මිදුනාවූ. 2. උකුවූ. 3. තදවූ.

ඝනෝපල = 1. පාණ වැස්ස. (මිදී දිය කැට වැස්ස.)

ඝනෝර්ඩිය = 1. අපායෙහි කොටසක්.

ඝණ්ටා 1. සීනුව. 2. මිණි ගෙඩිය.

ඝණ්ටාකාර = 1. ඝණ්ටාවක හැඩහුරුකම ඇති (දුගැබ් සැලැස්මක්)

ඝණ්ටාරය = 1. ලොකු සීනුව. (ඝණ්ටාව)

ඝණ්ටාරාවය = 1. සීනු හඬ.

ඝණ්ටාලෝලාව = 1. සීනුදිව.

ඝණ්ටාසනමහය = 1. ඝණ්ටාවක් එල්වීමට සාදන කණුව. (සීනුකණුව)

ඝණ්ටිකාව = 1. උඩුදිව.

ඝත = 1. ගිතෙල්.

ඝතාසන = 1. ගිතෙල් කන්නා. 2. ගින්න.

ඝතෝදන = 1. ගිතෙල් මුසු බත.

ඝතසික්ත = 1. ගිතෙල් වත්කළ.

ඝම්ම = 1. ග්‍රීෂ්මය. (උෂ්ණය) 2. උෂ්ණ කාලය.

ඝම්මජල = 1. ඩහදිය.

ඝම්මාභිතත්ත = 1. ග්‍රීෂ්මයෙන් තැවුණු.

ඝර = 1. ගෘහය.

ඝරගෝළිකා = 1. හූනා. 2. සිකනලා.

ඝරණී = 1. ගෙයි ස්වාමිනිය. (ගෘහිණිය – ගැහැණිය)

ඝරද්වාර = 1. ගෙදොර; ගෙයි දොරකඩ.

ඝර ප්‍රවේශ = 1. ගෙවැදීම.

ඝර බන්ධන = 1. ගිහි බැම්ම. 2. සරණ බන්ධනය.

ඝර මානුස = 1. ගෙයි මිනිස්සු.

ඝරමාගතා = 1. භාග්‍යවතා. (බුදුන් වහන්සේ)

ඝරවස = 1. ගෘහ වාසය.

ඝරවාසියා = 1. ගෙයි ජීවත්වන්නා.

ඝර වාස්තුරකයා = 1. ගෘහ දේවතාවා.

ඝරසප්ප = 1. ගරඬියා.

ඝඝ්ඝීරය = 1. කොඳුරන ශබ්දය.

ඝඝ්ඝරය = 1. සඳු පාර. 2. නාදය. 3. කවටකම. 4. දොරටුව.

ඝඝ්ඝරා = 1. කිකිණි පටිය. 2. ගිගිරි පටිය. 3. තුයඹි භාණ්ඩයක්.

ඝඝ්ඝරිකාව = 1. හඬ නගන බඳ පටියක්. 2. විලඳ 3. එනම් ගඟ.

ඝර්ම = 1. ග්‍රීෂ්මය. 2. ඩහදිය. 3. අව්ව.

ඝර්ම කලාපය = 1. උෂ්ණ කලාපය.

ඝර්ම කාලය = 1. උෂ්ණ කාලය.

ඝර්මාපහරණ = 1. ග්‍රීෂ්මය පහකරන.

ඝර්මාංශු = 1. උෂ්ණ රශ්මිය.

ඝර්මාභිතප්ත = (සම්මාභිතප්ත බලන්න.)

ඝර්ෂණය = 1. ඇඹරීම. 2. ඇතිල්ලීම. 3. ගෑවීම.

ඝර්ෂණී = 1. කහ.

ඝර්ෂිත = 1. ඇඹරූ. අතුල්ලන ලද.

ඝරාවාස = 1. ගිහිගෙයි වාසය කිරීම.

ඝෂ්මර = 1. කෑදර.

ඝස = 1. අනුභව කරන්නා.

ඝා – ඝෑ

ඝාටය = 1. පිටිකර.

ඝාටනා = 1. ගලවා දැමීම. 2. විවෘත කිරීම.

ඝාන = 1. නාසය. (නැහැය)

ඝාන විඤ්ඤාණ = 1. ගඳ දැන ගන්නා සිත.

ඝාතක = 1. නසන්නා. 2. පැහැර ගන්නා. 3. විනාශ කරන.

ඝාතන = 1. මැරීම; නැසීම.

ඝාතිත = 1. නැසූ. 2. පහර දුන්. 3. විනාශ කළ.

ඝාතිම = 1. නසන.

ඝාති = 1. සතුන් මරන්නා. (නසන්නා)

ඝාතස්ථානය = 1. ගව ආදි සතුන් මරන තැන.

ඝාතුක = 1. මැරවර. 2. නපුරු. 3. රිදවන සුළු.

ඝාණ = 1 ආඝ්‍රාණය.

ඝාස = 1. පිට්ටනියේ තණ. 2. කෑම. 3. සත්වාහාර.

ඝාසහාරක = 1. සත්ව කෑම ගෙනයන්නා. 1. ඝාස නම් තණකොළ ගෙනෙන්නා.

ඝෑපි = 1. සට්ටනයවී; හැපී.

ඝෑපීම් = 1. හැපීම.

ඝෑවුණු = 1. හැපුණු.

ඝෑපෙමින් = 1. හැපෙමින්.

ඝු – ඝූ – ඝෘ

ඝුට්ට = 1. ඝෝෂිත වූ. (දැනුම් දුන්)

ඝුට්ය = 1. වළලු කර. (බෝලට)

ඝුණ = 1. ලී පණුවා. 2. ගුල්ලා.

ඝුණ ප්‍රිය = 1. ලී.

ඝුණ්ඩයා = 1. බමරා.

ඝෘණාව = 1. අවමන් කිරීම. 2. අනුකම්පාව. 3. වෛරය.

ඝුණාක්ෂරන්‍යාය = 1. න්‍යාය රීතියක්. (ගුල්ලන් ලී හාරනවිට අහම්බෙකින් අකුරක් වැන්නක් ඇතිවන්නාක් මෙන් අහම්-බෙකින් ඇතිවන දෙයක් දක්වන රීතිය)

ඝූර්ණිත = 1. පෙරළූ. 2. කරකැවූ. 3 සුංකරන ලද.

ඝෘණි = 1. රශ්මිය. 2. ඉර.

ඝෘණි ශ්‍රේණි = 1. රශ්මි රාශිය.

ඝෘත = 1. ගිතෙල 2. බෙහෙත් කැවූ ගිතෙල. (ඖෂධ විශෙෂයක්) 3. දිය.

ඝෘත මණ්ඩ = 1. ගිතෙලෙහි සාරය.

ඝෘෂ්ටික = 1. කොටන. 2. අඹරන.

ඝෘෂ්ටිය = 1. පොරය.

ඝෝ – ඝ්‍රා

ඝෝටක = 1. කුළු අශ්වයා.

ඝෝටකාරි = 1 මීමා; (ඝොටක + අරි) අශ්වයාගේ සතුරා.

ඝෝනසයා = 1. සර්ප විශේෂයක්.

ඝෝණාව = 1. නාසය.

ඝෝර = 1. දරුණු. 2. රෞද්‍ර. 3. භයානක.

ඝෝරනාද = 1. භයානක ශබ්දය. 2. නද ගෙරවීම.

ඝෝර භීෂණ = 1. ඉතා රෞද්‍ර

ඝෝරාරි මර්දන = (ඝෝර + අරි මර්දිත) 1. භයානක සතුන් මඬින.

ඝෝරාව = 1. රාත්‍රිය.

ඝෝෂ = 1. ඝෝෂාව. 2. ශබ්දය. 3. කෑගැසීම. 4. ගොපල්ලු ගම.

ඝෝෂ අක්ෂර = 1. හෝඩියෙහි එනම් අකුරු කොටස. (අඝෝෂාක්ෂර හැර අනෙක් අකුරු)

ඝෝෂක = 1. පෙර සිටි සිටුවරයෙක්. 2. ශබ්ද-නගා දැනුම් දෙන්නා. 3. ප්‍රකාශකයා. 4. සපි විශේෂයක්.

ඝෝෂණය = 1. කෑගැසීම. 2. නද ඝෝෂාව.

ඝෝෂය = 1. තුත්තතාගම් 2. ගව ගාල.

ඝෝෂයා = 1. මදුරුවා. 2. ගෝපාලයා.

ඝෝෂා = 1. මහත් ශබ්දය. 2. ගෝට්ටිය.

ඝෝෂා බෙර = 1. බෙර වෙසෙසක්.

ඝෝෂාස්පද = 1. ඝෝෂාවට සාරුණු වූ.

ඝෝෂිත = 1. ඝෝෂා කළ.

ඝ්‍රාණ = 1. ආඝ්‍රාණය වීම; ඉඹීම. 2. නැහැය.

ඝ්‍රාණ ඉන්ද්‍රිය = 1. ඝ්‍රාණය නමැති ඉන්ද්‍රියය.

ඝ්‍රාණ තර්පණය = 1. සුවඳ. 2. නැහැය පිනවීම.

ඝ්‍රාණ ප්‍රසාද = 1. නැහැයේ සුවඳ දැනෙන ස්ථානය.

ඝ්‍රාණේන්ද්‍රිය = (ඝ්‍රාණ + ඉන්ද්‍රිය) 1. ශරීරයෙහි ගඳ සුවඳ දැනීමේ අවයවය.

ඝ්‍රාතිය = 1. නැහැය. 2. ගඳ, සුවඳ දැනීම.

ච

ච = 1. නිපාතයක්. 2. ඉර. 3. සඳ. 4. සොරා.

චංක්‍රමණය = 1. සක්මන් මලුව. 2 හෙමින් ඒ මේ අත සක්මන් කිරීම.

චංගෝටක = 1. කරඬුව. 2. කුඩාපෙට්ටිය.

චංචල = (චචල) 1. සෙලවෙන 2. වෙව්ලන. 3. ඒ මේ අත ගෙනයාහැකි. 4. විදුලිය.

චංචල දේපල = 1. නිශ්චල දේපල නොවන දේ. 2. ඒ මේ අත ගෙන යා හැකි දේ.

චඃ = 1. ගොනුන් මෙහෙයවීමේහිදී කියන්නක්. 2. අසතුට පළකරන වචනයක්. 3. බලාපොරොත්තු සුන් වූ විට කියන්නක්. 4. ශෝකය පළකිරීමේදී කියන්නක්.

චංචලාව = 1. ලක්ෂ්මී. 2. විදුලිය.

චඤ්චු = 1. කුරුළු හොටවලට අයිති. 2. එරඬුගස.

චඤ්චුමත් = 1. හොට ඇති.

චෙක් = 1. යමක් වැරදුණුවිට කියන වචනයක්.

චක්ක = 1. රෝදය. 2. චක්‍රය. 3. රවුම. 4. ආඥා බලය.

චක්කාඞ්කිත = 1. චක්‍ර ලක්ෂණයෙන් යුක්තවූ.

චක්ක පාණී = 1. විෂ්ණුදෙවි.

චක්ක යුග = 1. සක්යුවළ; රෝද දෙක.

චක්ක රතන = 1. සක්විති රජුට ලැබෙන අහසින් යා හැකි රථය.

චක්කවත්ති = 1. සක්විති රජ. 2. අණසක පවත්වන්නා.

චක්කවාක = 1. සක්වාලිහිණියා (ලිහිණි වෙසෙසක්).

චක්ක වාළ = 1. චක්‍රවාටය; සක්වළ (එක් සූර්යයකුගෙන් ආලෝකය ලබන ප්‍රදේශය යි.)

චක්ඛු = 1. ඇස. 2. සම්ඳ බුද්ධත්වය. 3. සිහිය නමැති ඇස.

චක්ඛු ඉන්ද්‍රිය = 1. ඉන්ද්‍රියයක්වූ ඇස. 2. පෙනීමේ අවයවය.

චක්ෂුද්වාරය = 1. ඇස නමැති දොර.

චක්ෂු පථය = 1. කෙළින් පෙනෙන දිසාව. 2. ඇසට පෙනෙන තෙක් මානය.

චක්ෂු ඵලය = 1. ඇසට පෙනෙන දේ. 2. ඇසට ප්‍රිය දේ.

චක්ෂුර් විඥානය = 1. දැක ඇඳින ගැනීම.

චක්ෂු විෂය = 1. ඇසට පෙණෙන දේ.

චක්ෂුෂ්‍යය = 1. ඇසට ප්‍රියකරන අඳුන. (රසාංජනය)

චක්ෂුඃ ශ්‍රවයා = 1. සර්පයා. 2. කනත් ඇසෙහිම පිහිටි සතා.

චකිත = 1. තැතිගත්. 2. කලබලවූ.

චකෝර = 1. ඇටිකුකුළා.

චක්‍ර = 1. රෝදය. 2. එනම් ආයුධය. 3. සමූහය. 4. ආඥාබලය. 5. මණ්ඩලය. 6. රවුම. 7. මුදුව. 8. සක්වල. 9. පක්ෂි වර්ගයක්. 10. (ගණිත) වක්‍රය.

චක්‍ර අර්ශය = 1. රෞද්‍ර ශරුඳිය.

චක්‍ර ආකෘතිය = 1. රෝදයක හැඩහුරු කම.

චක්‍ර ආවුධය = 1. රෝදයක හැඩහුරුකම ඇති අවියක්.

චක්‍ර කුබරය = 1. බොස් ගෙඩිය. 2. ඒරියකඳ.

චක්‍රඝාත = 1. රෝදය හැපිම.

චක්‍ර නාද = 1. රෝදයෙහි හඬ.

චක්‍ර නාභිය = 1. රෝදයෙහි මැද 2. බොස්ගෙඩිය.

චක්‍ර දන්ත = 1. රෝද දත්.

චක්‍ර දත්ත = 1. එනම් වෛද්‍ය ග්‍රන්ථය. 2. එනම් පණ්ඩිතයා.

චක්‍ර ධරයා = 1. රෝදයක් දරන්නා. 2 විෂ්ණු දෙවි. 3. සපියා.

චක්‍ර පරිධිය = 1. නේමිය.

චක්‍ර පාණී = 1. අතේ චක්‍රයක් ඇත්තා. 2. විෂ්ණු දෙවි.

චක්‍ර පාද = 1. වට වූ පාද ඇත්තා.

චක්‍ර පුෂ්ප = 1. කෝන්ගස.

චක්‍ර භාගය = 1. කවයකින් දෙකෙන් පංගුව.

චක්‍ර භ්‍රමණය = 1. රෝදයක් කැරකීම.

චක්‍ර මණ්ඩලය = 1. කවයකට ඇතුළත් වූ ප්‍රමාණය. 2. රථ සමූහය

චක්‍ර මාලාව = 1. දඬුවම් පිණිස දමක රෝද මාලය. 2. උරවක්‍ර මාලය.

චක්‍ර මුඛ = 1. ඌරා.

චක්‍ර යන්ත්‍ර = 1. කුඹල් සකක් වැනි යන්ත්‍රයක්.

චක්‍ර යානය = 1. රෝද කරත්තය.

චක්‍ර රත්නය = 1 (චක්ක රතන බලන්න.)

චක්‍ර ලක්ෂණ = 1. බුදුන් වහන්සේගේ ශ්‍රී පාද යෙහි පිහිටි රේඛා ලක්ෂණයක්.

චක්‍ර ලේඛණය = 1. තිංවිදනයක් වශයෙන් නිකුත්කරන ලියමන.

චක්‍ර වත් = 1. කවාකාරවූ.

චක්‍ර වර්ති = 1. සමස්ත ලෝකයෙහිම සවකීය ආඥාචක්‍රය පතුරුවන රජ.

චක්‍ර වර්ති කෝලාහල = 1. සක්විති රජකු ලොව පහළවීමට අවුරුදු සියයක් තිබියදී කාමාවචර දේවතාවෙක් ඒ පුවත ලොවට පළකිරීම.

චක්‍රවර්ති ව්‍රත = 1. සක්විති රජ පැවතිය යුතු පිළිවෙළ.

චක්‍රවාක = 1. දියෙහි හැසිරෙන කුරුල්ලෙක්. 2. ලිහිණි වෙසෙසක්.

චක්‍රවාට = 1. සක්වළ (එක් සූර්යයකුගෙන් ආලෝකය ලබන ප්‍රදේශය)

චක්‍රවාට පර්වතය = 1. සක්වළ ගල. 2. සක්වළ අවට පිහිටා ඇතැයි කල්පිත පර්වතය.

චක්‍රවාක = 1. සුළි හුළඟ. 2. කාල හංසයා. 3. ලිහිණි වෙසෙසක්.

චක්‍රවේධ = 1. හතරැස් කොටුවක මුලු සතරෙහි තිබෙන ඉලක්ක හතරට එකම හියකින් විදීමේ ක්‍රමය.

චක්‍රවේධනය = 1. යුධරථය. 2. යුධරථයේ සවිකොට ඇති කැපෙන තලයක්.

චක්‍රස්නායුව = 1. වටවූ මස් රොද.

චක්‍රහස්තයා = 1. චක්‍රයක් අතෙහි දරන්නා. 2. විෂ්ණු.

චක්‍රාකාර = (චක්‍රාකෘති) 1. රෝදයක ආකාරය ඇති.

චක්‍රාංග = 1. හංසයා. 2. රථය. 3. පාත්තයා.

චක්‍රාගාරය = 1. වටකුරු ගෙය.

චක්‍රාංගී = 1. පාත්තයාගේ ගැණු සතා.

චක්‍රායුධය = (චක්‍ර + ආයුධය) 1. විෂ්ණු දෙවි යන්ගේ අතෙහි ඇතැයි සැලකෙන එනම් ආයුධය. 2. මාරයාගේ අතෙහි ඇතැයි සැලකෙන එනම් ආයුධය. 3. උර චක්‍ර මාලාව.

චක්‍රි = 1. විෂ්ණු දෙවි. 2. කුම්භකාරයා. 3. තෙල් සාදන්නා. 4. පාත්තයාගේ ගැණු සතා. 5. මායාකාරයා. 6. අගරජ.

චක්ෂුර්ශ්‍රවශ් = 1. ඇහැයට අධිපති දිව්‍යාඞ්ගනාව. (සරස්වතී) 2. සක්විති රජුගේ බිසොව.

චටක = 1. ගේ කුරුල්ලා.

චටිකා = 1. ගේ කිරිල්ලි. 2. තිප්පිලි මුල.

චඩුල = 1. බෙල්ලන. 2. ලස්සණ. 3. සෙලවෙන.

චඤ්චලාව = 1. විදුලිය. 2. කාන්තාව.

චඤ්ඤ = 1. සඳ. 2. කැමැත්ත. (ඡන්දය)

චඤ්ඤමණ්ඩල = 1. සඳ හිඩිල

චන්දන = 1. සඳුන්. 2. කපුරු. 3. වඳුරු වෙසෙසක්.

චන්දනගන්ධ = 1 සඳුන් සුවඳ.

චන්දනසාර = 1. සඳුන් තෙල්. 2. සඳුන් අරටුව.

චන්දනශාලා = 1. හඳුන් ලියෙන් තැනූ ශාලාව.

චන්දනාදිය = 1. සඳුන් ආදි බෙහෙත් ද්‍රව්‍ය යොදා සාදනු ලබන කරකැවිල්ල ආදිය නසන තෙලක්.

චන්දනිකා = 1. ගවර වළ. 2. ගම් අසල අපිරිසිදු දිය එක්වන තැන. 3. කුණු කසළ දමන වළ.

චන්දනක්ඛාචි = 1. පැරණි රෙදි වර්ගයක්.

චන්දිකා = 1. සඳරැස.

චන්දිමා = 1. චන්ද්‍රයා.

චන්දිමන්තු = 1. චන්ද්‍රයා 2. ජලය. 3. දෙව් පුතකුගේ නමක්. 4. අරළු.

චන්ද්‍ර = 1. සඳ. 2. මුවසිරිස නැකත. 3. උතුම්. 4. අරළු. 5. කපුරු.

චන්ද්‍රඅඞගන = 1. සඳල්ල.

චන්ද්‍රආනන = 1. සඳ වැනි මුහුණ.

චන්ද්‍රආලෝක = 1. සඳ එළිය.

චන්ද්‍රඋදය = 1. සඳ උදාවීම.

චන්ද්‍රකය = 1. සඳ. 2. මොනරාගේ පිල් ඇස. 3. නියපොත්ත.

චන්ද්‍රකලාව = 1. හඳෙන් දහසයෙන් පංගුව.

චන්ද්‍රකාන්ත පාෂාණ = 1. දියකරිප්පු නම් මැණික් වර්ගය.

චන්ද්‍රකාන්තිය = 1. හඳ එළිය.

චන්ද්‍රකිරණය = 1. හඳපාන; හඳ එළිය.

චන්ද්‍රග්‍රහණ = 1. හඳ රාහු ඇල්ලීම.

චන්ද්‍රචක්‍ර = 1. අඩ කවයක් වැනි ආයුධයක්.

චන්ද්‍රදාර = 1. චන්ද්‍රයාගේ භාර්‍යාවෝ.

චන්ද්‍රපතනය = 1. හඳ අඩුවීම.

චන්ද්‍රපාර්ශ්ව = 1. පර්වතයක්.

චන්ද්‍රප්‍රභා = 1. හඳපාන. 2. හඳේපාට. 3. හඳ එළිය.

චන්ද්‍රප්‍රභාවටී = 1. එනම් ඖෂධ යෝගය.

චන්ද්‍රබිම්බ = 1. චන්ද්‍රයාගේ රූපය. 2. සඳමඬල.

චන්ද්‍රමණ්ඩල = 1. සඳ මඬල. 2. වටකුරුවූ සඳ. 3. හඳ වටා පිහිටි එළිය.

චන්ද්‍රමණි = 1. හඳමැණික.

චන්ද්‍රමරීචි = 1. සඳරැස්. 2. හඳපාන.

චන්ද්‍රමාස = 1. චන්ද්‍රයා ප්‍රධාන කොට සලකනු ලබන දවස් විසි අටේ මාස.

චන්ද්‍රමෞලි = 1. චන්ද්‍රයා හිසේ ඇත්තා. 2. සිවදෙවි; හඳ ආකාර ඉසකේ රොදක් ඇත්තා.

චන්ද්‍රය = 1 මොනර පිල් සඳැස. 2 මුතු ඇටය. 3. රත්රන්. 4. ද්වීප දහ අටෙන් එකක්. 5. ජලය.

චන්ද්‍රයා = 1. හඳ.

චන්ද්‍ර රශ්මි = 1. සඳ රැස්

චන්ද්‍ර රේඛාව = (චන්ද්‍ර ලේඛාව) 1. රේඛාවක් මෙන් පෙණෙන සඳ කැබැල්ල. 2. සඳ රැස් මඬල. 3 මාසේ පොහො දට පසු දක්නට ලැබෙන හඳේ ප්‍රමාණය.

චන්ද්‍ර ශාලාව = (චන්ද්‍රිකා ශාලාව) 1. හඳ පානේ සිටීමට තැනූ විනෝද ශාලාව. 2. චන්ද්‍රිකා තලය.

චන්ද්‍ර ශෘංගය = 1. අඩ හඳේ තුඩක්.

චන්ද්‍ර ශේඛර = 1. සිවදෙවියා. 2. චන්ද්‍ර ශේඛර අරමුදල පිහිටෙව් උතුමා 3. පර්වතයක නමක්.

චන්ද්‍රාතප = 1. වියන 2. සඳ රැස.

චන්ද්‍රාලෝකය = 1. හඳ පාන. 2. සඳ එළිය

චන්ද්‍රාස්තය = 1. හඳ බැසීම.

චන්ද්‍රිකා = 1. මොනර පිලෙහි තිබෙන ඇස වැනි කොටස. 2. සඳ රැස්. 3. එනම් ඡන්දස

චන්ද්‍රිකා තලය = (චන්ද්‍ර ශාලාව බලන්න.)

චන්ද්‍රිකායමාණ = 1. සඳ රැස් වැනි.

චන්ද්‍රිකාව = 1. උතුම් කාන්තාව. 2. සඳ රැස. 3. ආකාශ ගංගා විශේෂයක්.

චන්ද්‍රෝත්පල = 1. චන්ද්‍ර කාන්ත මැණික. 2. සුදු මානෙල්.

චණ්ඩ = 1. කපුරු 2. තො දමුණු. 3. සිරුරෙහි වෙසෙන පණු කුලයක්.

චණ්ඩයා = 1. යක්ෂයා. 2. කපුරා.

චණ්ඩාංශු = 1. තියුණු රශ්මිය ඇත්තා. 2. හිරු.

චණ්ඩාල = 1. රොඩියා. 2. නීච. 3. තක්කඩි.

චණ්ඩි = 1. රෞද්‍ර පුද්ගලයා. 3. මැරවරයා. 3. නීචයා. 4. තක්කඩියා.

චතු = 1. සතර.

චතුක්ක = 1. සතර මං සැඩිය.

චතුක්කණ්ණ = 1. කන් සතරකට සීමා වූ කථාව. 2. දෙදෙනකු අතර ඇති වූ කථාව. 3. කොන් සතරක් ඇති.

චතු කෝණ = 1. හතරැස්. 2. මුළු හතරක් ඇති.

චතුග්ගුණ = 1. සතර පටක් ඇති. 2. සතර ගුණයක් වූ.

චතුජ්ජාති ගන්ධ = 1. කොකුම්. 2. යොත්පුප්. 3. තුවරලා. 4. තුරුක් තෙල් යන සුවඳ සතර වගය.

චතු පටි සම්භිදා = 1. අත්‍ථ, ධම්ම, නිරුක්ති ප්‍රතිභාන යන (සිවු පිළි සිඹියා) රහතුන් විසින් ලබන සිව්‍රු වැදෑරුම් ඥානය.

චතුද්දිසා = 1. සතර දිශාව.

චතු පච්චය = 1. සිවුපසය. (සිවුරු, ආහාර, සෙනසුන්, බෙහෙත් යන සතර)

චතුප් පාද = 1. සිවුපාවා.

චතු භූමක = 1. තට්ටු හෝ භූමි සතරකින් යුක්තවූ.

චතු මධුර = 1. ගිතෙල්, වෙඩරු, මීපැණි, හකුරු යන සතර හෝ ගිතෙල්, මී පැණි, උක් හකුරු, තලතෙල් යන සතර හෝ මී පැණි, වෙඬරු, හකුරු, මිදි ඵල යන සතර.

චතුර = 1. සමත්‍ථ. 2. ඥාන ශක්තිය ඇති. 3. කිමෙහි බිණීමෙහි දක්ෂ. 4. නිපුණ වූ.

චතු රංශ = 1. හතරැස්. 2. පැති හතරක් ඇති.

චතු රංග = 1. අංග සතරකින් යුත්.

චතු රංගික = 1. කොටස් සතරක් ඇති.

චතු රඞ්ගිනී සේනාව = 1. (ඇත්, අස්, රිය, පාබල යන) කොටස් සතරකින් යුත් සේනාව.

චතුරඞ්ගුල = 1. අඟල් සතරක් දිගැති. 2. ඇසළ ගස.

චතු රස්ස = 1. සතරැස්.

චතුරන්ධ්‍ර = 1. බිල් සතරකින් යුත්.

චතුරශ්‍ර = 1. හතරැස්.

චතුරශ්‍රාංගනය = (චතුරශ්‍ර + අංගනය) 1. හතරැස් මිදුල.

චතුර් = 1. හතර

චතුර් අංශ = 1. හතරැස්; පැති සතරකින් යුත්.

චතුර් උපාය = 1. රජවරුන්ගේ සාම, දාන, භෙද, දණ්ඩ යන රාජ්‍ය පාලනයට ඉවහල් වන උපාය සතර.

චතුර් පාදිපාද = 1. පාදි පාද සතර.

චතුර් ගතියා = 1. ගති සතරකින් යුත් සතා; ඉබ්බා.

චතුර් ගුණ = 1. සතර වාරයකින් වැඩිවීම, හතර පංගුවක්වීම.

චතුර් ජාත = 1. කුරුඳු පොතු, එන්සාල්, කොල්ලන් කොළ, නාමල් රේණු යන සතර වර්ගය.

චතුර් ජාති ස්වර්ණ = 1. ජම්බු නාද, ශෘඞ්ගි, චාමීකර, ශාත කුම්භ යන ජාති හතරෙහි රන්.

චතුර් ජාති ගන්ධ = 1. කුංකුම, යවන මල්, තගර, තුරුක්ක යන සුවඳ සතර හෝ හඳුන්, කපුරු, කොකුම්, තුවරලා යන සතර හෝ කොකුම්, යොන්පුප්, තුවරලා, තුරුක් තෙල් යන සතර.

චතුර් චක්‍ර = 1. රෝද සතරක් ඇති.

චතුර් ධාතු = 1. ආපෝ, තේජෝ, වායෝ, පඨවි යන ධාතු සතර.

චතුර් භුජ = 1. විෂ්ණු දෙවි. 2. අත් සතරකින් යුත්.

චතුර් මුඛ = 1. මහා බ්‍රහ්මයා. 2. සිවු දිශට දෙරටු සතරක් ඇති.

චතුර් වර්ග = 1. ධර්ම, අර්ථ, කාම, මෝක්ෂ යන සතර.

චතුර් වර්ණ = 1. පාට සතර. 2. රජ, බමුණු, වෙළඳ, ගොවි යන සිවු කුලය.

චතුර් වර්ණයන් = 1. කුල සතරට අයත් වූවන්.

චතුර්ථ = 1. සතර වැනි.

චතුර්ථ ජ්වරය = 1. ගැහෙන උණ විශේෂයක්.

චතුර්ථ ධ්‍යානය = 1. භාවනාවේ සතර වැනි තත්වය.

චතුර් දශ = 1. දත හතර.

චතුර් දිශාව = 1. උතුර, දකුණු, නැගෙන හිර, බස්නාහිර යන සතර පැත්ත.

චතර් විධ = 1. සිවු වැදෑරුම්.

චතුර් වේද = 1. වේද සතර (ඍග්, යජුර්, සාම, අථර්)

චතුර් වෛශාරද්‍ය = 1. බුදුන් වහන්සේට තුබුණු සිවු වැදෑරුම් නුවණ වෙසෙසක්.

චතුර් හස්ත = 1. අත් සතරක් ඇති. 2. විෂ්ණු-දෙවි. 3. රිලවා.

චතුරාර්යසත්‍ය = 1. ආර්යයන් විසින් අවබෝධ කරනු ලබන දුඃඛ, සමුදය, නිරෝධ, මාර්ග යන සැබෑ හතර.

චතුරානන = 1. මූණු සතරක් ඇත්තා. 2. මහා බ්‍රහ්මයා.

චතුරාශ්‍රව = 1. අකුසල් කිරීමට හිත් දෙන කරුණු සතර; (ලෝභය, ක්‍රෝධය, උඩගු-කම, මෝහය)

චතුරූපාය = (චතුර් + උපාය) 1. සාම, දාන, භෙද, දණ්ඩ යන රාජ ධර්මයේ දැක්වෙන උපාය සතර.

චතුරෝඝ (චතුර් + ඕඝ) 1. (ලෝභ, ක්‍රෝධය, උඩගුකම, මෝහය යන) දියපාර සතර.

චතුස්සත්‍ය = (චතුරාර්ය සත්‍ය බලන්න.)

චතුස්සර = 1. ශබ්ද හතරකින් යුත්.

චතුස්සාගර = 1. සතර දිශායෙහි පිහිටි සයුරු.

චතුෂ්ක = 1. සතර. 2. සතර බැගින් ඇති සමූහය.

චතුෂ්ක සන්ධි = 1. හතර මං හන්දිය.

චතුෂ්කර්ණ = 1. කන් සතරක් ඇති. 2. කොන් සතරක් ඇති.

චතුෂ්කර්ණ මන්ත්‍රණ = 1. කන් සතරකට ඇසෙන සේ ඇතිවන කථාව. (දෙදෙනකු අතර කථාව)

චතුෂ් කෝණාකාර = 1. සතරැස්.

චතුෂ්ටය = 1. හතර. 2. කොටස් සතරක් ඇති.

චතුෂ්පථය = 1. හතර මං හන්දිය.

චතුෂ්පද = (චතුෂ් පාද) 1. සිවුපාවා. 2. සිවුපද; පද සතරක් ඇති.

චතුෂ් පදිකා = 1. සිවුපාවා.

චතුෂ් පර්ණ = 1. කොළ සතරක් ඇති.

චතුෂ් පාරි ශුද්ධි ශීලය = 1. සංවර ශීල සතර. (ප්‍රාති මෝක්ෂ සංවර ශීලය, ඉන්ද්‍රිය සංවර ශීලය, ආජීව පාරි ශුද්ධි ශීලය, ප්‍රත්‍යය සන්නිශ්‍රිත ශීලය යන සිල් හතර.)

චතුෂ් ෂෂ්ටි = 1. හැට හතර.

චන්චත්පුට = 1. සංගීත ශාස්ත්‍රයෙහි දැක්වෙන තාලයක්.

චක්ත = 1. අත්හැරි; පරිත්‍යාග කළ.

චත්තාලීස = 1. හතළිහ.

චත්වාරිංශත් = 1. හතළිහ.

චඳන = 1. පියස්ස. 2. වහල.

චප = 1. බුරුද ගස.

චපල = 1. ස්ථිර නැති. 2. වෙව්ලන. 3. වැනෙන. 4. ස්ථිර වචන නැති. 5 නියම නැති. 6. තිව්වි නැති. 7. ක්ෂණික. 8. මෝඩ.

චපලතා = 1. අස්ථිර බව. 2. එක වචනයක නො පිහිටීම. 3 විදුලිය. 4. දිව.

චපලාය = 1. තිප්පිලි.

චපලාව = 1. විදුලිය. 2. දිව. 3. ලක්ෂ්මී. 4. එක් හිමියකු නොපතන ස්ත්‍රී.

චපු - චපුකාර= 1. අනුභව කිරීමේදී "චපු, චපු" යයි ශබ්ද නැගීම.

චප්පවෙනවා = 1. සුණු විසුණු වී යනවා.

චප්පා = 1. සප්පයා. 2. ගල් ආදිය පෙරළන විට අලවංගුව යටට තබන අඩය.

චමත්කාර = 1. සතුට හා පුදුමය. 1. මවිත කරවන.

චමත්කාර ජනක = 1. ප්‍රීතිය හා විස්මය ගෙනදෙන.

චමර = (චමරී) 1. සෙමෙර මුවා. 2. ටිබැට් රටේ වසන ගවයා.

චමර වාලධි = 1. සෙමෙරා ගේ වලග.

චමූ = 1. සේනාව. 2. භට හමුදව.

චමූපති = (චමූනාථ) 1. සේනාපතියා.

චම්පක = 1. සපු ගස. 2. සපු 3. හෙරලි ගෙඩියේ කොටසක්.

චම්පය = 1. කළුවර ලී.

චම්පෙය්‍ය = 1. සපු ගස.

චම්ම = 1. සම.

චම්මකාර = 1. සම් පදම් කරන්නා.

චම්පා = 1. එනම් පැරණි නුවර (දැන් "භගල්පූර්" යයි කියති.)

චම්පූකාව්‍යය = 1. ගද්‍ය පද්‍ය මිශ්‍රව රචිත කාව්‍යය.

චමූෂ = 1. පළිහ.

චමූරුවා = 1. මුව වෙසෙසක්.

චය = 1. රැස්කිරීම. 2. හොඩ. 3. (බැම්මක්) බැඳීම. 4 පදනම.

චයනපීඨිකා = 1. ගඩොලින් බැඳි වේදිකාව.

චයාව = 1. ඡායාව; සෙවනැල්ල.

චර = 1. හැසිරෙන. 2. ඇවිදින. 3. ඔත්තු බලන්නා. 4 චර පුරුෂයා.

චරක = 1 හැසිරෙන්නා. 2. නූල් කටින යන්ත්‍ර විශේෂයක්. 3. ආයුර්වේද වෛද්‍ය ග්‍රන්ථයක්. 4. ඒ ග්‍රන්ථය ලියූ පණ්ඩිතයා.

චරණ = 1 හැසිරීම. 2. පැවැත්ම. 3. පාදය. 4. මූල. 5. ආරක්ෂාව.

චරණආයුධ = 1. කුකුළා; පා අවිය කොට ඇත්තා (චරණායුධ)

චරණගත = (චරණපතිත) 1. පාමුල වැටුණු.

චරණතල = 1. පතුල.

චරණධර්ම = 1. උතුම් ශීල්‍ය ආදි පසළොස් ධර්මයක්.

චරණනඛ = 1. පයේ නියපොතු.

චරණපතනය = 1. පාමුල වැටීම.

චරණාම්බුජ = 1 පා නමැති නෙළුම් මල.

චරණයුගල = 1. පා දෙක.

චරපති = 1. විෂ්ණු දෙවි.

චරපුරුෂයා = 1. රහස් ඔත්තුකාරයා. 2. යුධ භටයා. 3. සේවකයා.

චරම = 1. අන්තිම. 2. බටහිර.

චරයා = 1. හැසිරෙන්නා. 2. වෙරළු වටුවා. 3. ගොම කුරුල්ලා. 4. අඟහරු ග්‍රහයා. 5 ඔත්තුකාරයා.

චර්චා = 1. සඳුන් ආදිය ඇඟ ගෑම. 2. විචාරණය.

චර්චිත = 1 ආලේප කළ; තැවරූ.

චර්දි = 1. වමනය; (ඡර්දි)

චර්ම = 1. හම.

චර්මකාය = 1. එක පිට තැබූ සම් රැස.

චර්මකාරයා = 1. සම් පදම් කරන්නා. 2. හම් වැඩ කරන්නා.

චර්මකීල = 1. හමෙහි හට ගන්නා ගැටය. 2. ඉන්නා 3. අර්ශස් රෝගය.

චර්මඛණ්ඩ = 1. සම්කඩ. 2. පත් කඩය.

චර්මච්ඡේදනය = (චර්ම ඡේද්‍යය) 1. සුන්නත් කිරීම. (පුරුෂ ලිංගයේ හම්කොණ කැපීම.)

චර්මදල = 1. කුෂ්ට රෝගයක්.

චර්මදූෂිකාව = 1. හමේ රෝගයක්.

චර්මපාත්‍රාචං = 1. වවුලා.

චර්ම පරිකර්ම ශිල්පය = 1. හම් පදම් කිරීම. 2. හම් සකස් කිරීම.

චර්මපාදුකා = 1. පාවහන් වෙසෙසක්.

චර්මප්‍රසේවකයා = 1. මයිනහම.

චර්මප්‍රසේවිකා = (චර්ම භස්ත්‍රා) 1. සම් පසුම්බිය.

චර්මභූතිය = 1. සිවි සැදීම.

චර්මීය = 1. සම. 2. පළිහ.

චර්මශෝධ = 1. සම් සන්නාහයෙන් සැරසුණු යුද්ධභටයා.

චර්මරෝග = 1. හමේ හටගන්නා දද, කුෂ්ට ආදි ලෙඩ.

චර්මසාර = 1. හැරව. 2. දේහ රසය. 3. දිය ඕජස.

චර්මාශ්‍රය = 1. ලිංගය අගින් තිබෙන හම.

චර්මාසනය = (චර්ම + ආසනය) 1. පත්කඩ.

චර්‍යා = 1. චරිතය. 2. ගමන් කිරීම. 3. ස්වභාවය. 4. පිළිවෙළ. 5. පුරුදුවීම. 6. හැසිරීම

චර්‍යා අනුකූල = 1. චරිතයට එකඟවූ.

චර්වණ = 1. හැපීම 2. විකීම.

චර්වණදන්ත = 1. විකන දත්.

චර්විත = 1. විකන ලද.

චරාචර = (චර + අචර) 1. චඤ්චල නිශ්චල. (ජංගම ස්ථාවර)

චරමාන = 1. හැසිරෙන

චරිත = 1. හැසිරීම. 2. ජීවන චරිතය. 3 හැසිරීම පිළිබඳ. 4. ප්‍රවෘත්තිය. 5. ක්‍රියාව 6. ගතිගුණ. 7. ජීවත්වීම. 8. ස්වභාවය. 9. සිරිත.

චරිතබන්ධය = 1. මතා හැසිරීම් පිළිවෙළ.

චරිතය = 1. පුරුද්ද. 2. ඉතිහාසය. 3. ජීවිත කථාව. 4. යැම. 5. හැසිරීම.

චරිතබ්බ = (චරිතව්‍ය) 1. හැසිරිය යුතු.

චරිත්‍රය = 1. පැවත එන සිරිත. 2. ඉතිහාසය. 3 ලීලාව. 4 කථාන්තරය. 5. හැසිරීම් ස්වභාවය. 6. පුරුද්ද.

චරිම = 1. අන්තිම; අවසන්. 2. පසුවූ.

චරියා = 1 හැසිරීම. 2 පිළිපැදීම.

චල = 1. සෙලවෙන. 2. වෙවුලන. 3. ලෙලදෙන. 4. ගමන්කරන. 5. චඤ්චල 6. රළ.

චලක = 1. සෙන්පතියා.

චලචිත්ත = 1. චපල සිත.

චලන්ත = (චලමාන) 1. සෙලවෙන; සෙලවෙමින්.

චලක් = 1. චඤ්චලවන.

චලදල = 1. ඇසතු (බෝ) ගස.

චලන = 1. වෙව්ලන 2. සෙලවෙන. 3 ලෙල දෙන. 4. කම්පාවෙන. 5. චඤ්චලවීම.

චලිත = 1. සෙලවුණු. 2. කම්පිතවුණු. 3. චපල

චවන = 1. මරණය. 2 චුතවීම. 3. පහවීම. 4. වෙන්වීයාම. 5. ගිලීහීම.

චවන්ත = (චවමාන) 1. චුතවන. 2. මැරෙන.

චවික = 1. සිවිය; විෂ්ණුක්‍රාන්තිය.

චවර්ග = 1. ච - ඡ - ජ - ඣ - ඤ යන අකුරු පස.

චවිතුකාමතා = 1. චුතවීමෙහි ආශාව.

චවිත්වා = 1. චුතවී.

චෂකය = 1. බීම බොන භාජනය. 2. උකස.

ච්‍යුත = 1. ගිලිහුණු. 2. පහවුණු.

චා

චාළනා = (චාවුනා) 1 සවුත්තුවුනා. 2. තන්ත්‍රයෙන් පිරිහුනා.

චාක්ෂුෂ = 1. ඇස පිළිබඳ.

චාග = 1. ත්‍යාගය. 2. පරිත්‍යාගය. 3 දීම. 4. අත්ඇර දැමීම.

චාගානුස්සති = 1. පරිත්‍යාගය සිහිපත්කිරීම.

චාගී = 1. පරිත්‍යාග කරන්නා.

චාට = 1. රැවටිලි සහිත.

චාටයා = 1. හොරා. 2. රැවටිලිකාරයා.

චාටි = 1. සැළිය.

චාටු = 1. රැවටිලි බස.

චාටුකම්‍යතා = 1. ඉච්චා බස් කීමට කැමැත්ත. 2. යටත්ව පවත්නා බව.

චාටුකාර = 1. රැවටිලිකාර. 2. චාටු බස් කියන. 3. ඉච්චා කියන.

චාටුකරනවා = 1. බොරුවෙන් රවටනවා.

චාන් = (චාම්) 1 ආඩම්බර. සැරසිලි ආදිය රහිත. 2. සරල. 3. නිහතමානී. 4. විය පැහැදත් අඩු.

චාන්ද්‍ර = 1. සඳ පිළිබඳ.

චාන්ද්‍රයා = 1 චන්ද්‍රයාගේ පුත්‍රයා. (බුදහු)

චාණ්ඩාල = 1. චණ්ඩාල කුලයට අයිති. 2. තක්කඩි. 3, නීච.

චාණ්ඩාලිකාව = 1. වීණා වර්ගයක්; කින්නාරම

චාතක = 1 කැදෑත්තා.

චාතුද්දසී = තුදුස්වක; චන්ද්‍රමාසයේ 14 වැනිදා.

චාතුද්දිස = (චාතුද්දිසක) 1. සිවු දිසාවට අයත්.

චාතුද්දීප = (චාතුද්දීපක) 1. මහා ද්වීප සතර පිළිබඳ.

චාතුම්මහාරාජික = 1. සිවුවරම් රජුන් පිළිබඳ දෙව්ලොව.

චාතුර්ථකය = 1. හතරවැන්න; 2. හතර වැනි දින උණ.

චාතුර්ජාත සුගන්ධ = (චතුර් ජාති ගන්ධ බලන්න.)

චාතුර්දශ = 1. තුදුස්වක.

චාතුර්දිශික = 1. සතර දිශාවට අයිති

චාතුර්ද්වීපික = 1. මහා ද්වීප හතරට අයිති.

චාතුර්මහාරාජික = (චාතුම්මහාරාජික බලන්න.)

චාතුර්වර්ණ = 1. රජ, බමුණු, වෙළෙඳ, ගොවි යන කුල හතරට අයිති.

චාතුර්ය 1. දක්ෂ බව.

චාතුර්ය්‍ය = 1. චතුර භාවය; දක්ෂ බව.

චාප = 1. දුන්න.

චාපාකාරය = (චාප + ආකාරය) 1. දුන්නේ හැඩය.

චාපරාශිය = 1. ධනු රාශිය.

චාපල්ල = (චාපල්‍ය) 1. චපල භාවය. 2. අස්ථිර බව.

චාම් = (චාන් බලන්න.)

චාමට = 1. ඇරසිලි ආදි විස්තර වැඩ රහිතව.

චාමර = 1 සෙමෙර වලිග. 2. චාමරය. 3. පවන් සලන උපකරණයක් 4. අවන් විශේෂයක්

චාමරග්‍රාහිණී = 1. චාමරයෙන් පවන් සලන කාන්තාව.

චාමරපුෂ්ප = 1. සෙමෙර වල්ගයක් වැනි මල

චාමරය = 1. පවන් සැලීමේ උපකරණයක්. 2. අවාන. 3. ගිනිකෙළි වෙසෙසක්. 4. සෙමෙර වලිගයෙන් තැනූ අවාන.

චාමීකර = 1. රත්රන්.

චාර = 1. හැසිරීම. 2. රහසිගතව හැසිරෙන ඔත්තුකාරයා. 3. තැවිටුවා. 4. හිත සතුට ගෙන දෙන. 5 හැසිරිය යුත්ත.

චාරක = 1. හසුරුවන. 2. සිරගෙය.

චාරකය = 1. බැම්ම. 2. විලංගුව.

චාරකයා = 1 සහකාරයා. 2. අසරුවා.

චාරණ = 1. හැසිරවීම.

චාරය = 1. ගමන 2 යෑම. 3. පිළිවෙළ. 4. විලංගුව. 5. හැසිරීම. 6 චක්‍රවලය.

චාර්වාක = 1. එනම් දෙවියෙක්. 2. එනම් ධර්මය

චාර්වාකශාස්ත්‍රය = 1. චාර්වාකගේ ධර්මය.

චාරිකාව = 1. ගමන. 2. සක්මන. 3. ඇවිදීම 4. සැරිසැරීම. 5 සචාරිය.

චාරිත්‍ර (චාරිත්‍ර) 1. සිරිත 2. හැසිරිය යුත්ත. 3 උත්සව සහිත. 4. පවත්වා ගෙන එන පිළිවෙළ. 5. යුතුකම.

චාරී = 1. හැසිරෙන්නා. 2. පිළිපදින්නා.

චාරු = 1. මනොඥ. 2. සිත්කළු. 3. ලස්සන. 4. යහපත්.

චාරු දර්ශනය = 1. මහා පෙණුම; ලස්සන පෙණුම.

චාරු දර්ශන = (චාරු දර්ශනය බලන්න.)

චාරුතික = 1. පල්මාතික්කම්.

චාරු ලෝචන = 1. ලස්සන ඇස් ඇති.

චාරු ශිලාව = 1. මැණික් ගල.

චාල = 1. හෙල්ලීම. 2. කම්පාව.

චාලක = 1. සෙලවීම.

චාලනය = 1 පෙනේරය. 2. පෙරහන් කඩය. 3. පෙලඹවීම.

චාවනා = 1. තුඹුණු සැටියෙන් ඉවත් කිරිම.

චි

චිඃ = 1 පිළිකුල හැඟවීම පිණිස කියන වචනයක්.

චිකම්පිෂති = 1. සෙලවීමට කැමැති.

චික්ඛල්ල = 1. මඩ. 2. මඩ වතුර.

චිකිත්සා = 1. වෙදකම. 2. බෙහෙත් ක්‍රමය. 3. පිළියම.

චිකිත්සකයා = 1. වෛද්‍යයා; වෙදරාළ.

චිකිත්සාකාර = 1. වෙදකම් කරන්නා.

චිකිත්සා ග්‍රන්ථය = 1. වෙද පොත.

චිකිත්සාව = 1. ප්‍රතිකාර ක්‍රමය.

චිකිත්ස්‍ය = 1. පිළියම් කටහැකි.

චිකිල = 1. මඩ.

චිකුර = 1. මැරවර. 2. ඉවසිලි නැති.

චිකුරයා = 1. භික්මීයා. 2. සජීයා.

චිච්චිටාව = 1. "චිට් - චිට්" යන සිහින් හඬ.

චිඤ්චා = 1. ඔලිඳ. 2. සියඹලා. 3. එනම් මානවිකාව.

චිඩා = 1. ඇඹුල්.

චිණ්ණ = 1. පුරුදු කළ. 2. රැස්කළ

චිනපිෂ්ට = 1. හිඟුල්; රත් සිරියල්.

චින්න = 1. සිඳින ලද. 2. කපන ලද.

චින්තක = 1. සිතා බලන.

චින්තනය = 1. සිතීම. 2. කල්පනාව. 3. සිතුවිල්ල.

චින්තනීය = 1. සිතිය යුතු.

චින්තාකුල = 1. පැටලුණු සිත් ඇති.

චින්තාපර = (චින්තාවත්) 1. කල්පනා සහිත.

චින්තාපරවශ වීම = 1. කනගාටුවීම.

චින්තා මාණික්‍යය = 1. සිතූ දෙයක් ලබාදෙන මැණික.

චින්තාව = 1. කල්පනාව. 2. කල්පනා කිරීම.

චින්තිත = 1. සිතන ලද.

චින්තිතාශය = 1. සිතූ අදහස.

චිනේලය = 1. පාවහන් වර්ගයක්.

චිත = 1 රැස්කළ 2. වැසුණු. 3. පිරිපුන්. 4. චිත්තය.

චිතක = 1. දරසෑය. 2. ගොඩ. 3. චෛත්‍යය. 4. සෑය.

චිතකා රෝපණ = 1. මෘතශරීරය දර සෑයෙහි තැබීම.

චිතඞ්ගුලිතා = (චිත + අඞ්ගුලිතා) 1. පිරිපුන් ඇඟිලි ඇතිබව.

චිත්ත = 1. සිත. 2. සිතුවිල්ල. 3. චිත්‍රකර්මය. 4. හෘදය. 5. බක් මස. 6. විඥානය. 7. සිතුවම.

චිත්ත අභිනීහාර = 1. සිත හැරවීම.

චිත්ත අභ්‍යන්තර = 1. සිත ඇතුළ.

චිත්ත ආකර්ෂණ = 1. සිත ඇද ගන්නා.

චිත්ත ඉද්ධිපාද = 1. සිත නමැති ඉද්ධිපාදය.

චිත්තක = 1. නළලේ තබන තිලකය. 2. විසිතුරු වූ 3. නානා විධ.

චිත්තකත = 1. සිතින් කළ. 2. සැරසූ. 3. විසිතුරු කළ.

චිත්ත කථික = 1. විසිතුරු කථා ඇත්තා.

චිත්ත කම්ම = 1. චිත්‍ර කර්මය. 2. සිතියම් කිරීම. 3. චිත්‍රය. 4. විසිතුරු වැඩ.

චිත්ත කාර = 1. චිත්‍ර ශිල්පියා. 2. සිත්තරා; චිත්තරා.

චිත්ත ක්ෂෝභය = 1. සිත පෙරළීම. 2. උමතුව

චිත්තතා = 1. විසිතුරු බව.

චිත්තර්ධිය = 1. සිතේ බලයෙන් යමක් කිරීමේ බලය.

චිත්ත මුදුතා = 1. සිතෙහි මෘදු බව.

චිත්තලහුතා = 1. සිත සැහැල්ලු බව.

චිත්ත වාස = 1. සිතෙහි පිහිටි.

චිත්ත විකාරය = 1. සිතෙහි වෙනස්වීම.

චිත්ත විභ්‍රමය = 1. සිහි විකලය. 2. සිහිමුළා බව.

චිත්ත විවේකය = 1. සිතෙහි විවේකය. 2 සිත නිදහස. 3. සිතෙහි කෙලශයන් විෂ්කම්භණයට හේතුවන සමාධිය.

චිත්ත විශුද්ධි = 1. සමාධිය.

චිත්ත ශක්තිය = 1. සිතේ බලය. 2. ඥාන ශක්තිය.

චිත්ත සන්තාප = 1. සිතේ තැවීම. 2. සිත් තැවුල.

චිත්ත සමථ = 1. සිත තැන්පත් කිරීම.

චිත්ත සඞ්කල්පනා = 1. සිතේ අදහස. 2. ප්‍රාඥතාව.

චිත්ත සන්තාන = 1. චිත්ත පරම්පරාව. 2. සිත්තුල.

චිත්ත සන්තෝෂ = 1. සිතෙහි සතුට.

චිත්තසංහතිය = 1. සිතුවිලි රාශිය.

චිත්තසමාදාන = 1. සිතින් කරන සමාදන්වීම හෝ දැඩිව ගැනීම.

චිත්තසමාධි = 1. සිතෙහි එකඟ බව.

චිත්තස්ථාපනය = 1. සිත යොමු කිරීම.

චිත්තසමුත්ථාන = 1. සිතින් උපදනා.

චිත්තාකර්ෂණ = 1. සිත ඇදෙන. 2. සිත සතුට ගෙනදෙන.

චිත්තාගාර = 1. සිතුවම් තැන්පත් කොට තිබෙන ගෙය.

චිත්තාචාර = 1. සිතේ පැවැත්ම.

චිත්තානුපස්සනා = 1. සිතේ පැවැත්ම සලකා භාවනා කිරීම.

චිත්තාභෝග = 1. සිහි ඇති බව. 2. මෙනෙහි කිරීම. 3. දැනීම.

චිත්තාරාධනාව = 1. සිත පිනවීම.

චිත්තාස්වාදය = (චිත්ත + ආස්වාදය) 1. සිතෙහි සතුට.

චිත්තත්‍රාස = 1. සිතෙහි භය. 2. සිතෙහි තැති ගැන්ම.

චිත්තීකාර = 1. ගෞරව ලැබීම.

චිත්තුජ්ජුකතා = 1. සිතෙහි ඍජුබව.

චිත්තුත්‍රාස = 1. සිතෙහි තැති ගැන්ම.

චිත්තුප්පාද = 1. සිතුවිල්ල.

චිත්‍යය = 1. චෛත්‍යය.

චිත්‍රාග්නිය = 1. දරසෑය.

චිත්‍ර = 1. සිතියම. 2. අද්භූත. 3. ආකාශය. 4. විසිතුරු. 5. තත් වැදෑරුම්. 6. කබුරුවන් පැහැය 7. බක්මස.

චිත්‍රආස්තරණ = 1. විසිතුරු ඇතිරිලි.

චිත්‍රක = 1. තිත්. 2. නළලේ තබන තිලකය. 3. නානාවිධ.

චිත්‍රකණ්ඨ = 1. විසිතුරු බෙල්ලක් ඇත්තා. (බෙල්ල ලස්සණ තැනැත්තා)

චිත්‍රකථික = 1. විසිතුරු කථා ඇති.

චිත්‍රකර්ම = 1. සූසැට කලා අතුරින් එකක්. 2. රූප ආදිය ඇඳීම. (චිත්‍ර කර්මාන්තය)

චිත්‍රකාරයා = 1. සිත්තරා; සිතුවම් අඳින්නා. 2. දිවියා.

චිත්‍රකූර = 1. පැත්සලය. 2. තෙලිකූර; පින්සලය.

චිත්‍රකූට = 1. හිමාලය කන්දේ උස් මුදුනක්.

චිත්‍රකෘත = 1. පාට කළාවූ. 2. පින්තාරු කළාවූ

චිත්‍රගතකිරීම = 1. සිතුවම් පටට ගැනීම. 2. චිත්‍රයට නැඟීම.

චිත්‍රගන්ධ = 1. සිරියල්.

චිත්‍රගුප්ත = 1. යමරජ.

චිත්‍රග්‍රීව = 1. ලස්සණ බෙල්ලක් ඇත්තා.

චිත්‍රතණ්ඩුල = 1. වලඟසාල්.

චිත්‍රණී = 1. පද්මිනී ආදී උත්තම කාන්තාවන් සිවුදෙනා අතුරින් එක් කාන්තාවක්.

චිත්‍රපට = 1. සිතියමින් දැක්වෙන කථා ප්‍රවෘත්තිය. (සිනමාව) 2. සිතියම් ඇඳි වස්ත්‍රය.

චිත්‍රපතංගයා = 1. සමනලයා.

චිත්‍රභානු = 1. සූර්යයා. 2 ගින්න. 3. සිවදෙවි. 4. රත්නිටුල්. 5. වරාගස.

චිත්‍රමණ්ඩප = 1. විසිතුරු මඩුව.

චිත්‍රරථයා = 1. පාට කරන ලද රියක් ඇත්තා. 2. සූර්යයා. 3. ගාන්ධර්වයා.

චිත්‍රලතා = 1. දෙව්ලොව උයනක්. 2 තත් පැහැති වැල. 3 බෙහෙත් වර්ගයක්.

චිත්‍රලිඛිත = 1. විසිතුරු ලෙස ලියන ලද. 2. විස්තර කරන ලද.

චිත්‍රලෝචනා = 1. විසිතුරු ඇස් ඇත්තී.

චිත්‍රවධ = 1. තත් වැදෑරුම් වධ

චිත්‍රශාලා = 1. සිතියම් ඇඳි ශාලාව හෝ සිතියම් තබා ඇති ශාලාව.

චිත්‍රශාස්ත්‍රය = (චිත්‍ර ශිල්පය) 1. පින්තාරු කිරීමේ ශාස්ත්‍රය. 2. රූප ආදිය ඇඳීමට උගන්වන විද්‍යාව.

චිත්‍රශිඛණ්ඩිජයා = 1. බෘහස්පති.

චිත්‍රශිඛණ්ඩිනයෝ = 1. සත් දිත්ත, එනම් තරු සත.

විත්‍රාංග = 1. විසිතුරු සිරුරක් ඇති. 2. ඇඟේ ලප ඇති.

විත්‍රාචාර්‍ය = (චිත්‍ර + ආචාර්‍ය) 1. චිත්‍ර කර්මය උගන්වන්නා.

චිත්‍රා = 1. ශක්‍රයාගේ භාර්‍යාවක්. 2. එනම් දෙවඟන. 3. ලංකාවේ රාජ කුමාරියක්. 4. තාරකාවක්. (සිත නැකත)

චිත්‍රීකෘත = 1. විසිතුරු කරන ලද. 2. ගරු-බුහුමන් කරන ලද.

චිත්‍රික = 1. බක්මස.

චිත්‍රිත = 1. අලඞ්කාර කරන ලද 2. සිතුවම් අඳින ලද.

චිජ්-චිජ් = 1. බලු ආදී සතකු පලවාහැරීම පිණිස කියන වචනයක්.

චිජ්ජා = 1. විසප්පු වර්ගයක්.

චිබුක = 1. නිකට.

චිර = 1. දීර්ඝ කාලය 2. බුරුද.

චිරාත් = 1. දීර්ඝ කාලය.

චිරආගත = 1. බොහෝ කලක පටන් පැවතඑන.

චිරආයුෂ්ක = 1. දීර්ඝ ආයුෂ ඇති.

චිරකාරී = 1. ප්‍රමාද.

චිරකාල = 1. දීර්ඝ කාලය.

චිරටඨිතික = 1. දිගු කලක් පවත්නා.

චිරජීවි = 1. බොහෝ කල් ජීවත්වන.

චිරජීවින් = 1. බෝරුක. 2. කපුටා. 3. ඉඹුල් ගස. 4. කදුම්බ.

චිරන්තන = 1. පැරණි; පුරාතන.

චිරභාක්ත = 1. බොහෝ කල් පැසුණු. 2. බොහෝ කාලයක් ඉක්ම ගිය.

චිරප්‍රසිද්ධ = 1. ඉතා ප්‍රසිද්ධවූ. 2. බොහෝ කලක පටන් ප්‍රකට වූ.

චිරරාත්‍රය = 1. ඉතා දීර්ඝ කාලය. 2. රාත්‍රි බොහෝ ගණනකින් යුක්තවූ කාලය.

චිරරාත්‍රඥ = 1. ඉතා පැරණි තොරතුරු දන්නා. 2. බොහෝ කලක රාත්‍රීන් දන්නා.

චිරස්ථායී = 1. බොහෝ කල් පවත්නා සුළු.

චිරස්ථිත = 1. බොහෝ කලක් පැවතුණු.

චිරස්ථිතිය = 1. බොහෝ කලක් පැවැත්ම.

චිරස්මරණීය = 1. බොහෝ කාලයක් සිහි කටයුතු වූ.

චිරාත් = 1. දීර්ඝ. 2. බොහෝ.

චිරාත් කාලය = 1. දීර්ඝ කාලය.

චිරායන්ත = 1. කල්ගත කරන්නේ.

චිරායුෂ්ක = 1. බොහෝ දීර්ඝ ආයුෂ ඇත්තාවූ. 2. බොහෝ කලක් තුළ ජීවත්වූ.

චිරාවරෝධය = 1. වැටලීම.

චිරේන = 1. බොහෝ කලකින්.

චිල්ලී = 1. කැරැස්සා. 2. කුරුළු ගොයා.

චිලි = 1 සලල ගස.

චිලිචිම්යා = 1. හාල්මැස්සා.

චිලිම්කා = 1. පාපිස්නා වෙසෙසක්.

චිහ්න = 1. ලකුණ. 2. කොඩිය. 3. ලාඤ්ඡනය. 4. මුද්‍රාව.

චී

චී = 1. පිළිකුල හැඟවීමේදී කියවෙන වචනයක්

චීන = 1. එනම් රට. 2. එනම් මනුෂ්‍ය වර්ගය.

චීනඅල = 1. (බෙහෙත් සෑදීම පිණිස ගන්නා) එනම් අල වර්ගය.

චීනාක්ෂන්නාඩිය = 1. දුර බලන කන්නාඩි වර්ගයක්.

චීනගුණ්ඩු = 1. මල් වෙනි වර්ගයක්.

චීනතඹ = 1. තුත්තනාගම්.

චීනදේශය = 1. එනම් රට.

චීනපට = 1. චීන දේශයෙන් ගෙනෙන රෙදි වෙසෙසක්.

චීනපටස් = 1. පොංග්‍රොවේ ගැසීමෙන් හඬ නංවන වෙනි වර්ගයක්.

චීනපිටක = 1. රත් සිරියල්.

චීනමුල් = (චීන අල බලන්න.)

චීන්න = 1. රෙදි වර්ගයක්

චීර = 1. වැහැරි. 2. සිවුරු.

චීර = (චීරක) 1. පොතු ආදියෙන් සෑදූ නූල්; පටිය; හින් තීරුව.

චීරකාමාසික = 1. පුරාණ වතයක්.

චීරය = 1. පොත්ත. 2. රෙද්ද. 3. මල්මාලය.

චිණ්ණවසිතා = 1. පුරුදු කළ වසඟ බව.

චීරී = 1. රැහැයියා.

චීවර = 1. සිවුර; කසාවත.

චීවරකණ්ණ = 1. සිවුරු කොණ.

චීවරකම්ම = 1. සිවුරු කැපීම්, මැහීම් ආදිය.

චීවරගබ්භය = 1. සිවුරු ගැබ; සිවුරෙන් වැසුණු කොටස.

චීවරදාන = 1. සිවුරු පිදීම.

චීවරදුස්ස = 1. සිවුරු මැහීමට ගන්නා වස්ත්‍ර.

චීවරරජ්ජු = 1. සිවුරු දමන වැල.

චීවරය = 1. ඉරාපු රෙද්ද-සිවුර.

චීවරවංස = 1. සිවුරු දැමීම පිණිස යෙදූ උණ ලීය 2. සිවුරු දමන කඹය.

චු

චුක්ක = 1. ඇඹුල්.

චුඤ්ජුම්බා = 1. හික්මීයා.

චුචුකදන්තාහසඞ්ඛියා = 1. තන පුඩු වැනි දත් ඇති ඇතා.

චුචුක = 1. ස්තනාග්‍රය; තන පුඩුව.

චුඤ්චුජිය = 1. ඇටවලින් කරනු ලබන ක්‍රීඩාවක්.

චුට්ටි = (චූටි) 1. ඉතා කුඩා.

චුණ්ණ = 1. සුණු. 2. කුඩු. 3. චූර්ණ 4. ඇඟ, කත් ආදිය ඇසුරු කොට වෙසෙන පණු කුලයක්. 5. දූලි 6. කුඩු කරන ලද.

චුණ්ණක = 1. වත්සුණු; මූණේ ආලේප කරන කුඩු.

චුණ්ණ විචුණ්ණ = 1 සුණුවිසුණුවූ.

චුණ්ණිත = 1. කුඩු කරන ලද

චුත = 1. මළගිය. 2. ගිලිහුණු. 3. තුරන්වූ 5. විනාශවුණු.

චුතචුතා = 1. විනාශවූහා 2. බාල්දුවූහා. 3. කෙලෙසුහා.

චුති = 1. පහවීම. 2. ගිලිහීම. 3. මරණය.

චුති උපපත්ති = 1. චුතිය හා උත්පත්තිය.

චුති කිච්ච = 1. මරණය.

චුති චිත්තය = 1. මැරෙන මොහොතෙහිදී ඇතිවන සිත.

චුති ක්ෂණ = 1. මැරෙණ ඇසිල්ල; මරණ මොහොත.

චුදිත = 1. චෝදනා කරන ලද.

චුදිතක = 1. චෝදනා ලැබූ; දෙස් තගන ලැබූ අය; විත්තිකාරයා.

චුද්දස = 1. දහ හතර.

චුදිතයා = 1. විත්තිකාරයා.

චුන්දකාර = 1. ලියන වඩුවා.

චුම්බක = 1. සිඹින 2. කාන්දම් සහිත.

චුම්බට = (චුම්බටක) 1. දරණුව 2. ආධාරයට තබන කුඩා කොට්ටයක් වැනි දෙයක් 3. සුඹුළුව.

චුම්බන = 1. සිඹීම.

චුම්බිත = 1. සිඹින ලද.

චුල්ල = 1. කුඩා; සුළු 2. පැහැදිලිව නොපෙනෙන.

චුල්ල අන්තේවාසික = 1. අතවැසි බාලයා.

චුල්ල පිතු = 1. සුළුපියා; බාප්පා.

චුලුක = 1. ඔබම; බොහ බඳුන.

චූ

චූඩා = 1. සිළුව; හිසේ අවටින් කපා මැදින් ඉතිරිකළ කෙස් රොද; කුඩුම්බිය. 2. මුදුන.

චූඩා මණි = (චූඩා මාණික්‍ය) 1. සිළුමිණ; ඔටුන්නෙහි මුදුන් මැණික. 2. චෛත්‍යයක පළඳවා කොතෙහි මුදුනට ඇල්ලූ මැණික. 3. අතිශ්‍රේෂ්ඨ.

චූඩාල = 1. කොණ්ඩයක් ඇති. 2. මුදුන් මැණික් ආභරණයක් ඇති.

චූඩාලය = 1. හිස.

චූත = 1. අඹ ගස.

චූත කාය = 1. කුඩා ශ්‍රිද.

චූතඵල = 1. අඹ ගෙඩි.

චූරණ = 1. චූර්ණය ; බෙහෙත් කුඩු.

චූර්ණ = 1. බෙහෙත් කුඩු. 2. හුණු. 3. අළුහුණු

චූර්ණක = 1. බැඳ කුඩු කරගත් ධාන්‍ය. 2. පිටි.

චුණ්ණඛාණීය = 1. හුණු කුර.

චුණ්ණීකර = 1. කුඩුකොට; හුණු කොට.

චුණ්ණීකාරයා = 1. හුණු පුළුස්සන්නා.

චූර්ණිකා = 1. මාත්‍රා පසින් – පන විරාමය ඇති ගද්‍යවාක්‍ය විශෙෂයක්. 2. හාල් පිටි. 3. මංගල උත්සවයන්හිදී කරන දේශනය.

චූල = 1. කුඩා. 2. සුළු.

චූල උපසථායක = 1. කුඩා උවටැන් කරන්නා.

චූලණී = 1. උම්මග්ග ජාතකයෙහි සඳහන් බ්‍රහ්මදත්ත රජතුමා.

චූලවංශය = 1. මහසෙන් රජුගේ පටන් මෑතට ලියවුණු ඉතිහාස කථාව.

චූලා = 1. ඔටුන්න.

චූලාංච = 1. කුඩුම්බිය. 2. උඩුමහල් කාමරය.

චූලිකාච = 1. නාට්‍ය වේදිකාව. 2. ඇත් කනේ මුල.

චූෂණ = 1. ඉරීම. 2. (ඉස්ම) උරා බීම. 3. ඝාතන පාතය.

චූෂාච = 1. උරාගැනීම. 2. (යුෂ ආදිය) උරා බීම.

චූලා = 1. කුඩුම්බිය. 2. හිස මුදුනේ කොණ්ඩය.

චූලාමණී = 1. (චූඩාමණි බලන්න.)

චූළිකා = 1. කුඩුම්බිය ; කුඩා කොන්ඩය.

චෙ – චේ

චෙට = 1. සළු. 2. සේල.

චේට = (චේටක.) 1. කොල්ලා. 2. සේවකයා. 3. දාසයා.

චෙටිකා = 1. දාසිය; මෙහෙකාරිය.

චෙත = 1. සිතිවිල්ල; සිත.

චෙ = 1. ඉදින්; ඉතින්.

චේතනා = 1. කල්පනාව. 2. සිතිවිල්ල.

චේතනා ශක්තිය = 1. ඥාන ශක්තිය. 2. කල්පනා කිරීමේ ශක්තිය.

චේතයිත = 1. සිතන ලද.

චේතස = 1. සිත් ඇති.

චේතස් = 1. සිත.

චේතසික = (චෛතසික.) 1. සිතේ හටගත්.

චේතිය = 1. චෛත්‍යය. 2. එනම් රජ.

චේතිය අඞ්ගණ = 1. දාගැබ් මළුව.

චේතියගිරි = 1. සෑගිරිය.

චේතෝ = 1. චේතස්.

චේතෝඛිල = 1. සිතට කරදර පමුණුවන දෙය

චේතෝපණිධි = 1. ප්‍රාර්ථනාව; සිත පිහිටුවීම.

චේතෝපරියඤාණ = 1. අනුන්ගේ සිත් දන්නා නුවණ.

චේතෝපසාද = 1. සිතේ පැහැදීම; සතුට.

චේතෝරසායන = 1. සිත ඔද වඩවන.

චේතෝවිමුක්ති = 1. සිත නිදහස්වීම; සිත නිසා ක්ලේශාදියකින් මිදීම.

චේතෝසමථ = 1. සිත සන්සිඳුවීම.

චේල = 1. වස්ත්‍රය. 2. උතුරු සළුව. 3. නරක. 4. නීච 5. ඇඳුම.

චේලආයුධ = 1. උතුරු සළුව නමැති ආයුධය.

චේලඋක්ඛේප = 1. පිළිගිසසිසැරීම; (ප්‍රීතිය-කදී) වස්ත්‍ර ඔසවා වැනීම.

චේලක = 1. යුධ කොඩිය රැගෙන පෙරමුණ යන්නා.

චේලවිතාන = 1. රෙදිවලින් බැඳි වියන.

චේලාවුධ = 1. එනම් ආයුධය. 2. අඩයටිය.

චේලිකාව = 1. චෝලිය.

චේලුක්ඛේප = (චේල උත්ක්ෂේප බලන්න.)

චේෂ්ටා = 1. ක්‍රියාව. 2. ක්‍රියාත්මක. 3. කඩිසර.

චේෂ්ටික = 1. ක්‍රියාකළ.

චෛ

චෛතන්‍යය = 1. බුද්ධිය. 2. ආත්මය.

චෛතසික = 1. හිතෙහි ඇතිවන ස්වභාව විශෙෂ. 2. හිතට සම්බන්ධවූ.

චෛත්‍ය = 1. දාගැබ.

චෛත්‍ය අඞ්ගණ = 1. දාගැබ් මළුව.

චෛත්‍ය ආකාර = 1. දාගැබක හැඩහුරුකම.

චෛත්‍යගෘහ = 1. වටදාගේ; චෛත්‍යය වැසෙන සේ කළ ගෙය.

චෛත්‍ය වෘක්ෂ = 1. බෝ ගස. 2. බොහෝ දෙනා විසින් පුදනු ලබන රුක.

චෛත්‍යස්ථාන = 1. පූජනීය ස්ථානය.

චෛත්‍රකාය = (චෛත්‍රය - චෛත්‍ර මාසය) 1. බක්මස.

චෛත්‍රමාස = 1. බක් මස.

චෛචඞ්ගුලං = 1. කපුරු.

චො - චෝ

චෝච = 1. කෙසෙල් (ගෙඩි) 2. ඇට කෙසෙල්.

චෝචකය = (චෝචය) 1. කොටසක් කා තිබෙන ගෙඩිය 2. ඇට කෙසෙල්. 3 පොත්ත. 4. භාගයක් අනුභව කොට විසිකරන කොටස.

චෝචපාන = 1. ඇට කෙසෙල් ගෙඩි මිරිකා සෑදූ පානය.

චෝපිය = 1. යට සාය.

චෝඩය = 1. පොකුණ.

චෝදක = 1. චෝදනා කරන්නා. 2. දෙස් තඟන්නා; පැමිණිලි කාරයා 3. මෙහෙයන.

චෝදනාව = 1. දෙස් පැවරීම. 2. විරුද්ධව දක්වන කරුණ. 3. වරද දැක්වීම. 4. අණකිරීම. 5. ප්‍රශ්නය.

චෝදිත = 1. දෙස් තැබූ. 2. චෝදනා ලැබූ. 3. චුදිත. 4. මෙහෙයූ.

චෝදියමාන = 1. චෝදනා කරනු ලබන.

චෝදේතෘ = 1. චෝදනා කරන්නා. 2. පැමිණිලි කාරයා.

චෝද්‍ය = 1. චෝදනා කටයුතු. 2. ප්‍රශ්නය.

චෝෂන = 1. සෙලවීම.

චෝර = 1. සොරා. 2. වංක.

චෝරකථා = 1. සොරුන් පිළිබඳ කථාව. 2. දෙතිස් කථාවෙන් එකක්.

චෝරකාන්තාර = 1. සොරබිය පවත්නා පෙදෙස.

චෝරගේහ = 1. දඟගෙය; හිරගේ.

චොරඝාතක = 1. සොරුන් මරන්නා.

චෝරභාර්යා = 1. දුෂ්ට භාර්යාවන් සත්දෙනා අතුරින් එකියක්; හිමියා උපයන දේ සිය කැමැත්ත සේ වියදම් කරන බිරිඳ.

චෝරවල්ලභ = 1. සොර සැමියා.

චෝරුපද්දව = (චොර + උපද්දව) 1. සොරුන් ගෙන් වන උවදුරු.

චෝරිකා = 1. සොරකම.

චෝරී = 1. හෙර; හොර ස්ත්‍රිය.

චෝළ = 1. වස්ත්‍රය; රෙද්ද. 2. එනම් රට.

චෝළක = 1. කුඩා වස්ත්‍රය. 2 රෙදි කැබැල්ල.

චෝළරට්ඨ = 1. සොළිරට.

චෝළකය = 1. පොත්ත. 2. පපුව වැසෙනසේ අඳින යුධ ඇඳුමක්.

චෝළිය = 1. සට හැට්ටය. 2. කාන්තාවන්ගේ යට ඇඳුමක්.

චෞ - ච්‍ය

චෞර = 1. හොර; හොරා. 2. කපටි; ප්‍රයෝග කාර. 3. වංක.

චෞර කර්මය = 1. සොරකම. 2. මං පැහැරීම.

චෞර කාන්තාර = (චෝර කාන්තාර බලන්න.)

චෞර්යය = 1. හොරකම. මං පැහැරීම.

චෞරකාකයා = 1. හොර කපුටා.

චෞල = 1. කුඩුම්බිය. 2. ශිඛාව.

චෞලකර්මය = 1. හිසමුඳුනේ කෙස් රොදක් ඉතිරිවන සේ ඉසකේ කැපීම.

ච්‍යවමාන = 1. මැරෙන්නාවූ.

ච්‍යුත = 1. ගිලිහුණු. 2. මැරුණු. 3. වැටුණු.

ඡ

ඡ = 1. සය.

ඡ: = 1. යමක් වැරදීමකදී, අමතකවීමකදී හෝ යමක් ගැන පිළිකුල් ගතිය පෑමේදී කියන වචනයක්.

ඡක්ක = 1. සයේ සමූහය; ෂට්කය.

ඡකණ = (ඡකනක.) 1. සතුන්ගේ මල 2. අස්බෙටි ආදිය

ඡකලක = (ඡගලක.) 1. එළුවා.

ඡගණ = 1. වියළි ගොම.

ඡජ්ජ = 1. "ෂඩ්ජ" නම් වීණා ස්වරය. 2. නාසය. 3. බෙල්ල. 4. කල්ල. 5. දත. 6. දිව.

ඡජ්ජ ග්‍රාම = 1. ෂඩ්ජ ග්‍රාමය.

ඡට්ඨ = (ඡට්ඨම.) 1. සවැනි.

ඡට්ඨ සඞ්ගායනා = 1. බුරුමයෙහි පැවැත්වුණු සවැනි මහා සඞ්ගායනාව.

ඡට්ඨී = 1. සවැනි ස්ත්‍රිය හෝ විභක්තිය.

ඡටා = 1. සුළිය; 2. සළාව. 3. බැබලීම.

ඡටාව = 1. සුළිය. 2. දීප්තිය. 3. මුළු එකතුව. 4. කෙළින් ඉර.

ඡඩ්ඩක = 1. ඉවත දමන්නා; විසි කරන්නා

ඡඩ්ඩන = 1. ඉවත දැමීම.

ඡන්ද = 1. කැමැත්ත. 2. ආශාව. 3. අදහස. 4. පක්ෂපාත භාවය.

ඡන්දඅගති = 1. පක්ෂපාත භාවය නිසා කරන අයුත්ත.

ඡන්ද රාගය = 1. තද ඇල්ම. 2. ආලය.

ඡන්දදායකයා = 1. කැමැත්ත දෙන්නා; ඡන්දය දෙන්නා.

ඡන්දශ්ශාස්ත්‍රය = 1. වෘත්තයකට අනුව කවියක මාත්‍රා ගණ පිහිටුවීමේ ක්‍රමය උගන්වන ශාස්ත්‍රය.

ඡන්න = 1. වැසුණු. 2. එනම් ඇමතියා.

ඡන්න පථ = 1. සැඟවුණු මාර්ගය.

ඡන්දාපෙක්ඛකයා = 1. කැමැත්ත බලා පොරොත්තු වන්නා.

ඡණ = 1. උත්සවය.

ඡණක්‍රීඩාව = 1. සැණ කෙළිය,

ඡත්ත = 1. ඡත්‍රය; කුඩය; හිරවරණ. 2. (චෛත්‍යයක) කොත.

ඡත්ත කාර = 1. කුඩ සාදන්නා.

ඡත්ත ගාහක = 1. අනෙකකුට කුඩය අල්වන්නා.

ඡත්ත නිභ = 1. කුඩයක් වැනි.

ඡත්ත පාණී = 1. කුඩයක් ගත් අත් ඇති; කුඩයක් අතේ ඇත්තා.

ඡත්ත මඞ්ගල = 1. ඡත්‍ර එසවීමේ (සේසත් නැගීමේ) නොහොත් රාජ්‍යය පැවරීමේ මඞ්ගලය. 2. කොත් පැළඳවීමේ උත්සවය.

ඡත්‍රය = 1. කුඩය. 2. කොඩිය. 3. ගත්ත.

ඡත්‍ර ධර = 1. කුඩේ දරන්නා.

ඡත්‍ර ඡායා = 1. පිළිහුඩුවා.

ඡත්‍ර පත්‍ර = 1. රුක් අත්තන ගස.

ඡත්‍ර භංගය = 1. පාලන ක්‍රමය (ආණ්ඩුව.) බලයෙන් වෙනස්කිරීම.

ඡත්‍ර මණ්ඩල = 1. කුඩයෙහි මණ්ඩලාකාර කොටස.

ඡත්‍ර දණ්ඩ = 1. කුඩය අල්ලන.

ඡත්‍රසලාකා = 1. කුඩ කන.

ඡත්‍රී = 1. ඡත්‍ර ඇති.

ඡද = 1. කුරුළු පියාපත්.

ඡදන = 1. වැස්ම. 2. වහල. 3. පියස්ස. 4. කොළය. 5. පියාපත. 6. කොප්පුව. 7. පත්‍ර සමූහය.

ඡද්දන්ත = 1. දළ සයක් ඇති. 2. එනම් උසස් ඇත් කුලය.

ඡද්දිකා = 1. වමනය.

ඡළඞ්ගික = 1. ඇස, කන ආදී සදෙර හා සම්බන්ධවූ.

ඡද්මය = 1. වෙස් මාරු කිරීම. 2. රැවටිල්ල.

ඡද්මවේශඇති = 1. වෙස් වලා ගත්.

ඡප්පද = 1. පා සයක් ඇත්තා; බමරා; මීමැස්සා.

ඡබ්බණ්ණ = 1. වර්ණ සයක් ඇති.

ඡබ්බිධ = 1. සයාකාර.

ඡමා = 1. මහපොළොව. 2. බිම.

ඡම්භි = 1. තැතිගන්නා; භයවෙන්නා.

ඡර්දි = 1. වමනය.

ඡර්දකා = 1. විෂ්ණුක්‍රාන්තිය.

ඡල = 1. ව්‍යාජය. 2. ප්‍රයෝගය 3 චතුරුකම.

ඡල්ලිම = 1. හම. 2. ලෙල්ල. 2. පොත්ත

ඡව = 1. මලමිනිය. 2. නීච. 3. ලාමක 4. පහත්. 5. මැරුණු. 6. මිනී දවන්නා.

ඡවකය = 1. මළකඳ.

ඡවකුටි = (ඡවකුටිකා.) 1. මිනී තබන පැල.

ඡවඩාහක = 1. මිනී පුලුස්සන්නා.

ඡවි = 1. හම. 2. ඇගේ උඩහම. 3. වැස්ම. 4. සිවිය. 5. එළිය. 6. ලක්ෂණ.

ඡවිකල්‍යාණිය = 1. හමේ යහපත් පැහැය. 2. කොකැලැල් හම.

ඡවිවණ්ණ = (ඡවිවර්ණ) 1. සිවියේ පැහැය.

ඡවිකා = 1. සිවිය නම් බෙහෙත. 2. සිවිය; ඇගේ හම.

ඡවිවිභූෂණ = 1. හම සැරසීම.

ඡවිසම්පත = 1. හමේ වර්ණය නමැති සම්පත.

ඡළඞ්ග = 1. කොටස් හයක් ඇති.

ඡා

ඡාගලා = 1. එළුවා.

ඡාන්දස = 1. ඡන්දස් ශාස්ත්‍රයට අයිති

ඡාත = 1. බඩගිනි ඇති; සාගිනි ඇත්තා. 2. කැපුණු. 3. දුර්වල.

ඡාතක = 1. දුර්භික්ෂය.

ඡාතතා = 1. බඩගිනි බව.

ඡාත්‍ර = 1. ශිෂ්‍යයා; ගෝලයා.

ඡාදන = 1. වැසීම. 2. පියන. 3. සැඟවීම. 4. වහල. 5. කොලය

ඡාදනීය = 1. වැසිය යුතු.

ඡාදිත = 1. වැසූ.

ඡාප = (ඡාපක) 1. පැටියා; පෝතකයා. 2. ළදරුවා.

ඡායා = 1. සෙවනැල්ල. 2. සෙවන 3. සූර්යයාගේ භාර්යාව. 4. සමානත්වය.

ඡායාඋදක = 1. සෙවන හා දිය (පහසුව ඇති)

ඡායාගෘහ = 1. සෙවනැල්ල නමැති ගෙය.

ඡායාපථ = 1. ආකාශ ධාතුව. 2. අහසේ උඩ කොටස.

ඡායාසුත්‍ර = 1. සූර්ය දේවියගේ පුත්‍රයා

ඡායාක්‍රාන්තකය = 1. උපච්ඡායාව. 2. (ප්‍රධාන ඡායාව වටා පිහිටි) බාල සෙවනැල්ල.

ඡායාමිත්‍ර = 1. කුඩය.

ඡායායන්ත්‍රය = 1. සෙවනැල්ලෙන් කාලය මනින යන්ත්‍රය; සූර්ය ඝටිකා යන්ත්‍රය.

ඡායාරූපය = 1. චිත්තුරය; ප්‍රතිරූපය.

ඡායාවෘක්ෂය = 1. සෙවන දෙන රුක.

ඡායාසුත = 1. සූර්ය දේවියගේ පුත්‍රයා. 2. සෙනසුරා.

ඡාරිකා = 1. අළු.

ඡාහ = 1. සය දවස.

ඡි – ඡු

ඡික්කනය = (ඡික්කාව) 1. කිවිසීම; කිඹුහුම.

ඡිග්ගල = 1. සිදුර.

ඡිජ්ජමාන = 1. සිදුණු ලබන.

ඡින්න = 1. කපන ලද 2. කඩන ලද. 3. ඉරුණු. 4. සිදුණු.

ඡින්නආධාර = 1. සිඳුණු වල.

ඡින්නඉරියාපථ = 1. සුන් ඉරියව් ඇත්තා; පිළුං.

ඡින්නභින්න = 1. කැඩුණු බිඳුණු.

ඡින්නරූහ = 1. රසකිඳ.

ඡින්නස්වර = 1. කටහඬ නරක් වුණු; ස්වර භේදය වූ.

ඡින්දක = 1. කපන. 2. කඩන.

ඡින්දිත = 1. කපන ලද. 2. කඩන ලද.

ඡින්නනාස = 1. කැපූ නාසා ඇති.

ඡින්නභක්ත = 1. සුන් බත්වූ.

ඡින්නාස = 1. කඩවූ බලාපොරොත්තු ඇති.

ඡින්නිරියාපථ = (ඡින්න ඉරියාපථ බලන්න.)

ඡිද්ද = 1. සිදුර. 2. සිදුරු සහිත. 3. දෝෂය

ඡිද්දක = 1. සිදුරු සහිත.

ඡිද්දගවේසී = 1. සිදුරු සොයන්නා 2. දොස් සොයන්නා.

ඡිද්‍ර = 1. සිදුර. 2. දෝෂය. 3. පලුද්ද.

ඡිද්‍රගවේෂක = 1. සිදුරු සොයන. 2. දොස් සොයන.

ඡිද්‍රගන්ථය = 1. සිදුරු සහිත සිවිය

ඡිද්‍රමණ්ඩලිකා = 1. මණ්ඩලාකාර සිදුර.

ඡිද්‍රමුඛලක්ෂණ = 1. බුදුන් වහන්සේගේ ශ්‍රීපාදයෙහි පිහිටි ලකුණක්.

ඡුරිකා = 1. කිරිච්චිය; සිරිය.

ඡෙ

ඡේක = 1. දක්ෂ. 2. උගත්. 3. පණ්ඩිත.

ඡේකතා = 1. දක්ෂ බව.

ඡේකප්‍රයෝග = 1. දක්ෂයන්ගේ යෙදුම්; උගතුන්ගේ යෙදුම්.

ඡේකෝක්ති = 1. පණ්ඩිත කථාව.

ඡේත්තෘ = 1. කඩන්නා. 2. කපන්නා.

ඡේද = 1. කැඩීම. 2. කැපීම. 3. බෙදීම. 4. විනාශ කිරීම.

ඡේදක = 1. කපන්නා. 2. කඩන්නා. 3. සිඳින්නා.

ඡේදකාර ප්‍රාණියා = 1. දත්වලින් කපා කන (මී ආදී) සත්වයා.

ඡේදනය = 1. බෙදීම. 2. විනාශ කිරීම. 3. කැපීම. 4. කැඩීම.

ඡේදනාව = 1. කපන ආයුධය.

ඡේදනීය = 1. සිඳිය යුතු.

ඡේදපන = 1. කැප්පවීම. 2. කැඩවීම.

ඡේදි = 1. කපන.

ඡේදිකාය = 1. වේවැල.

ඡේද්‍ය = 1. සිඳිය යුතු. 2. සිඳිය හැකි. 3. සිඳීම.

ජ

ජ = 1. ඉපැද්දූ 2. නිපදවූ.

ජංගම = 1. තැනින් තැන ගෙන යා හැකි. 2. චංචල. 3. ගමන් කරන.

ජංගල = 1. කැලෑව. 2. නිසරු භූමිය.

ජංගලාමාංස = 1. දඩ මස්.

ජංඝා = 1. කෙංඩය; බත් කෙංඩය.

ජංඝාලය = 1. නියර 2. මායිම; සීමාව.

ජංගුල = 1. විෂ.

ජංඝ = කෙණ්ඩය. 2. පය.

ජංඝ මාර්ග = 1. තවලම් ගෙන යා හැකි මඟ.

ජංඝා = 1.කෙංඩය; කකුල.

ජංඝා චක්‍ර = 1. පාද හරණයක්.

ජංඝා බල = 1. ඇවිදීමට ශක්තිය.

ජංඝවලලු = 1. පා වළලු.

ජංඝාල = 1. ඉක්මන්.

ජංඝාවිහාර = 1. සුඛ විහරණය පිණිස ඇවිදීම. 2. සක්මන් කිරීම.

ජංජාලය = 1. වරද. 2. අමාරුව. 3. කරදරය.

ජඝ = 1. කෙණ්ඩය. 2. බැඳ.

ජගෝ = 1. සිරගෙය.

ජගන්නාථ = 1. ලෝකයෙහි ස්වාමියා. 2. බුදුන් වහන්සේ.

ජගණ = 1. දෙපස ලඝු දෙකක් හා මැද ගුරුක්ද ඇති අකුරු තුන; එනම් ගණය.

ජගත් = 1. පොළොව 2. ලෝකය. 3. ජලය. 4. වාතය 5. සිව දෙවි.

ජගත්ගුරු = 1. ලෝකයෙහි ආචාර්යවරයා.

ජගත්‍රය = 1. ස්වර්ග, මර්ත්‍ය, පාතාල යන තුන් ලොව.

ජගත්පතියා = 1. ලෝකයෙහි ප්‍රධානයා. 2. රජ. 3. දෙවි.

ජගති = 1. පොළොව. 2. ලෝකය.

ජගදග්‍ර = (ජගත් + අග්‍ර) 1. ලෝකයට ප්‍රධාන.

ජගදන්තර = (ජගත් + අන්තර) 1. ලෝකය තුළ.

ජගද්හිත = 1. ලොවට හිතවූ. 2. ලෝවැඩ දයකවූ.

ජගදානන්ද = 1 ලෝකයාගේ සන්තෝෂය.

ජගදානන්දකර = 1. ලොව සතුටු කරවන.

ජගදානන්ද ලෝචන = (ජගත් + ආනන්ද ලෝචන) 1. ලොව පිනවන ඇස.

ජගදායු = (ජගත් + ආයු) 1. ලෝකය පවත්නා කාලය.

ජගදීශ්වර = (ජගද් + ඊශ්වර) 1. ලෝකයෙහි අග්‍රයා. 2. බුදුන් වහන්සේ. 2. විෂ්ණුදෙවි.

ජගද්‍යෝනි = 1. බ්‍රහ්ම. 2. විෂ්ණු. 3. මහේශ්වර. 4. කතර ගම දෙවි. 5. පොළොව.

ජඝර = 1. පටලැවිල්ල. 2. යුද්ධ ඇඳුම.

ජඝල = 1. මත් පැන් පෙරීමට ගන්නා ද්‍රව්‍යයක්.

ජඝලක් = 1. තොප්පි වර්ගයක්. 2. රත්කම් කළ රෙද්ද.

ජග්ගන = (ජග්ගනා) 1. රැකීම. 2. පෝෂණය. 3 පිළියෙළ කිරීම. 4. ප්‍රතිසංස්කරණය

ජග්ඝනා = 1. සිනාසීම.

ජඝන = 1. උකුළ. 2. තුනටිය.

ජඝන ස්ථලය = 1. උකුලු ප්‍රදේශය.

ජඝන්‍ය = 1. නින්දිත. 2. අන්තිම. 3. බාල. 4. අල්ප. 5. ශූද්‍ර.

ජච්ච = 1. ජාති ඇති. 2. ඉපදීම් ඇති.

ජච්චන්ධ = 1. උපන් අන්ධයා; ජාත්‍යන්ධයා.

ජජ්ජර = 1. දිරා ගිය 2. මහලු වූ; ජරපත් වූ.

ජජ්ජරිත = 1. දිරුම් පිට වැටුණු. 2 දුර්වල වූ.

ජට = (පිහි ආදියේ) 1. මිට.

ජටා = 1. හැඩපලු ගෙතුණු හිසකෙස්. 2. අවුල. 3. ගෙතුම. 4. තෘෂ්ණාව. 5. කුඩා මුල් 6. තලප්පාව.

ජටාකලාප = 1. ජටා රාශිය.

ජටාධාරයා = 1. හැඩපලු ගෙතුණු ස කෙස් ඇති තවුසා.

ජටාධර = 1. ජටිලයා. 2. හැඩපලු ගෙතුණු හිස කෙස් සහිත තාපසයා. 3. සිව දෙවියා.

ජටාබන්ධ = 1. ජටා බැඳි තැනැත්තා.

ජටාමකුට = 1. ජටාව නමැති ඔටුන්නක් ඇති. 2. හැඩපලු සහිත කොණ්ඩය ඇති.

ජටාමණ්ඩල = (ජටා මඬුලු) 1. ජටා කලාපය; ජටා රාශිය.

ජටාමාංස = (ජටා මාංස) 1. එනම් ඔසු වෙසෙස. 2. සුවඳ තෙල් වර්ගයක්?

ජටා මාලාව = 1. ඉස මුදුන්හි ජටා සමූහය. 2. හැඩපලු ගෙතුණු කෙස් වැටි සමූහය.

ජටායුධ = 1. තකුල්. 2. ගුගුල් නම් ඔසු වෙසෙස.

ජටාව = 1. හැඩපලු හිසකෙස් වැටිය. 2. තලප්පාව. 3. පොකුර. 4. අවුල. 5. ගැටේ.

ජටිලයා = 1. හැඩපලු හිසකෙස් සහිත තවුසා. 2. වදකයා. 3. සිංහයා.

ජටිත = 1. ගෙතූ. 2. අවුල්.

ජටිලාව = 1. තිප්පිලි. 2. වදකහ.

ජඨර = 1. ආමාශය; බඩ. 2. තද. 3. බැඳි

ජඨරාග්නිය = (ජඨර + අග්නිය) 1. ආහාර දිර වීමට උපකාරවන ගින්න; බඩ ගින්න.

ජඩ = 1. හිස් වූ. 2. තපුරු. 3. නීච. 4. යුතු; අයුතු කම් නොදන්නා 5. ගොළුවා. 6. ශෝලම්.

ජඩයා = 1. ජඩකම් කරන්නා. 2. පුහු මිනිහා. 3. නින්දිත මනුෂ්‍යයා 4. හොඳ; නොහොඳ නොදන්නා.

ජන = 1. මිනිසුන්හට අයිති; ලෝකයා පිළිබඳ. 2. ලෝකයා. 3. මහා ජනයා. 4. මනුෂ්‍ය වර්ගයා.

ජනක = 1. උපදවන. 2. ප්‍රතිසන්ධි ජනක කර්මය. 3. පියා. 4. පුරාණ රජෙක්; ජානකී (සීතා) ගේ පියා.

ජනක කර්මය = 1. ඉපදවීම. 2. ප්‍රතිසන්ධිය දෙන කර්මය.

ජනකථා = 1. මුඛ පරම්පරා ගතව පැවතෙන ගම්බද කතාන්තර ආදිය. 2. පරන්නන් ගේ කතන්දර.

ජනකයා = 1. පියා.

ජනක්ෂය = 1. ජනයා නැති වී යාම.

ජනකාය = 1. ජන සමූහයා.

ජන ගණනය = 1. රට වැසියන්ගේ ගණන. 2. මනුෂ්‍ය සමූහය.

ජනතා = 1. ප්‍රවෘත්ති පත්‍රයක්. 2. මනුෂ්‍ය ජාතිය. 3. ජන සමූහය. 4. ලෝ වැසි. 5. පිරිවර.

ජනන = 1. ඉපදවීම. 2. උපදවන. 3. ජාතිය.

ජනනයන = 1. ජනතාවගේ ඇස්.

ජනනී = 1. උපදවන්නී. 2. මවු.

ජනනු = 1. දිනීම. 2. පැරදවීම.

ජනපදය = 1. දනව්ව. 2. මනුෂ්‍ය වාසය. 3. මිනිසුන් වෙසෙන පෙදෙස; ජනාවාසය. 4. රට. 5. රටක ඇතුළත් ප්‍රදේශයක්.

ජනපදකල්‍යාණී = 1. රටකින් තෝරනු ලබන රූප රැජිණිය. 2. එනම් පුරාණ උත්තමාව.

ජනපද චාරිකා = 1. දනව් සැරි සැරීම; පළාත කින් පළාතකට ඇවිදීම.

ජනපද රෝගය = 1. එනම් භයානක රෝගය. 2. වසංගතයක්.

ජනපදිකය = 1. පළාත.

ජනප්‍රවාදය = 1. කටින් කට පවත්නා ආරංචිය. 2. මුඛ පරම්පරානුයාත කථා ව්‍යවහාරය.

ජනප්‍රිය = 1. මහා ජනයාගේ සිත් දිනාගත්. 2. ජනයාට ප්‍රිය වූ.

ජනබහුල = (ජන බහුලය) 1. ජනාකීර්ණ; ජනයාගෙන් ගැවසීගත්.

ජනමහලේ = 1. යුධකටයුතු පිළිබඳ මහ-ලේකම්.

ජනයා = 1. මනුෂ්‍යයෝ; රට වැසියෝ.

ජනයිතා = 1. උපදවන්නා; පියා.

ජනයිත්‍රී = 1. උපදවන්නී; මවු.

ජනරංජනය = 1. ජනයා සතුටු කිරීම. 2. හොඳින් රට වැසියන් පාලනය කිරීම. 3. වැසියන්ගේ සිත් දිනා ගැනීම.

ජනරාල් = 1. ක්‍රියාකාරී මණ්ඩලයක ප්‍රධානයා. 2. යුධ හමුදාවේ ප්‍රධානයා.

ජනලේඛනය = 1. ජනතාවගේ ගණන හා ඔවුන්ගේ තරාතිරම්, ආදියෙහි සම්පූර්ණ විස්තර සඳහන් ලිපිය.

ජනවී = 1. ජනපදය. 2. මනුෂ්‍ය වාසය.

ජනවනවා = 1. උපදවනවා.

ජනවනී = 1. උපදවන්නී.

ජනවය = 1. ජනපදය.

ජනවාදය = 1. ආරංචිය. 2. කට කතාව.

ජනවාරි = 1. එනම් මාසය.

ජනවී = 1. ජනපදය.

ජනවූ = 1. ඉපද වූ. 2. හටගත් වූ. 3. උප්පත්තිය.

ජනශූන්‍ය = 1. මනුෂ්‍යයන්ගෙන් තොර වූ.

ජන ශ්‍රැතිය = 1. කට කතාව. 2. ආරංචිය.

ජන සංගණිකාව = 1. මහාජන රැස්වීම. 2. රැස්වූ සමූහය.

ජන සන්නිපාතය = 1. මිනිසුන්ගේ රැස්වීම.

ජන සම්බාධ = 1. මිනිසුන්ගෙන් පිරුණු.

ජන සමූහය = 1. ජනකාය. 2. මිනිසුන් රැංචුව.

ජනසම්මද්ද = 1. මිනිසුන් රැස්වී තෙරපීම.

ජනසාම්‍යතාව = 1. මිනිසුන්ගේ සම බව.

ජනහිත = 1. ජනතාවගේ දියුණුව සලසන. 2. පොදු යහපතට කැමැති.

ජනහිත නිරත = 1. පොදු කටයුතුවල නිතර යෙදී සිටින.

ජන්තාඝර = 1. ගිනිහල් ගෙය. 2. කුස්සිය. 3. ගිනි තැපීමට සෑදූ ගෙයක්?

ජන්තු = 1. මිනිසා. 2. සත්වයා. 3. අට්ටික්කා.

ජන්තුක = (ජන්තු) 1. සතා. 2. පණුවා.

ජන්නා = 1. දන්නා.

ජන්ම = 1. උත්පත්තිය. 2. ජාතිය. 3. සහජ ගතිය. 4. කුලය.

ජන්ම අන්තරගත = 1. අනෙක් ජන්මයකට ගිය; මියගිය; අනෙක් ආත්මයකට ගිය.

ජන්ම පත්‍රය = 1. කේන්ද්‍රය. 2. හඳහන.

ජන්ම ප්‍රවේණිය = 1. මවු පිය උරුමය. 2. ජන්මයෙන්ම උරුමවූ දෙය.

ජන්ම භූමිය = 1. මවු බිම. 2. උපන් රට.

ජන්ම භේදය = 1. ජාතිය හෝ වංශය බිඳීම.

ජන්මය = 1. සහජ ගතිය. 2. වංශය. 3. ජාතිය. 4. උත්පත්තියෙන් පිහිටි ගතිය.

ජන්මලාභය = 1. උත්පත්තිය.

ජන්මවත් = 1. උතුම් කුලයකට අයත් වූ.

ජන්ම සාඵල්‍යය = 1. ජීවිතය සඵලකරගැනීම; ජීවිතයේ ඵලය ලබාගැනීම.

ජන්මාන්ධ = (ජාත්‍යන්ධ බලන්න.)

ජනමින් = 1. දනිමින්. 2. ප්‍රාණියා 3. සත්වයා.

ජන්වා = 1. දන්වා.

ජනානන්දකර = (ජන + ආනන්දකර) 1. මිනිසුන් සතුටු කරවන්නා.

ජනානුරාගය = (ජන + අනුරාගය) 1. ලෝ-වැසියන්ගේ ඉල්ලීම හෝ ඕනෑකම.

ජනාධිප = (ජනාධිපති) 1. ජනනායක 2. මහා ජනයාගේ ප්‍රධානයා. 3. සමූහ ආණ්ඩුවක් ඇති රටක ප්‍රධානයා.

ජනාප්‍රිය = (ජන + අප්‍රිය) 1. ජනයන් අතර අප්‍රසිද්ධියට පැමිණි. 2. මහාජනයාට අප්‍රියවූ.

ජනාදින = 1 මිනිසුන් විසින් වඳිනු ලබන තැනැත්තා. 2. විෂ්ණුදෙවි.

ජනාවතංස = (ජන + අවතංස) 1. ජනතාවගේ මුදුන් මල්කඩ.

ජනාවාස = (ජන + ආවාස) 1. ජනපද. 2. ගම.

ජනාශ්‍රය = 1. මහාජනයා සමග හැසිරීම.

ජනිකා = 1. මවු.

ජනිත = 1. ඉපද වූ; උපදවන ලද.

ජනිත වෙනවා = 1. උපදිනවා.

ජනිතා = 1. පියා.

ජනිතෘ = 1. පියා.

ජනිත්‍රී = මවු.

ජනී = 1. මවු. 2. කාන්තාව.

ජනීජන = 1. මහාජනයා. 2. ගැණු පිරිමි

ජනු = 1. දන්නා.

ජනෙන්ත = 1. උපදවන; උපදවමින්.

ජනෙන්ති = 1. මවු.

ජනෙල් = (ජනේල) 1. කවුළුව; වාතායනය.

ජනේශ්වරයා = 1. රජ; ජනයන්ගේ ප්‍රධානයා.

ජන්‍ය = 1. උපදින. 2. උපදවන.

ජන්‍යශ = 1. ආරංචිය. 2. යුද්ධය. 3. පියා. 4. ශරීරය. 5. ප්‍රීතිය.

ජන්‍යශා = 1. පියා.

ජන්‍යාව = 1. අම්මා.

ජතු = 1. දුනගස්. 2. ලාකඩ.

ජතු = (ජතුක) 1. ලාකඩ. 2. පෙරුන් කායම්.

ජතුකා = 1. වවුලා.

ජත්‍රුව = 1. අකුව; ග්‍රීවාව.

ජත්‍රු = 1. දසරැ ඇටය; උර ඇටය.

ජප = 1. මැතිරීම. 2. නැවත - නැවත කීම. 3. කෙමින් (මන්ත්‍ර ආදිය) කීම.

ජපක = (ජපා) 1. සපත්තු මල; වද මල.

ජපකරනවා = 1. මතුරනවා. 2. කෙමින් - කෙමින් මන්ත්‍රාදිය කියනවා.

ජපන = 1. ජපකරන.

ජපන් = 1. එනම් රට. 2. එනම් මනුෂ්‍ය වර්ගය. 3. ලී බඩු ඔපලන තෙල් වර්ගයක්.

ජපමාලාව = 1. නවගුණ වැල. 2. අක්ෂ මාලාව. 3. කොන්තය.

ජපා කුසුම = 1. වදමල; සපත්තු මල; බඳු වදමල. 2. චීන රෝස මල?

ජප්පා = (ජප්පනා) 1. කීම. 2. තෘෂ්ණාව.

ජබාදු = 1. කස්තුරි. 2. කට්ටකුමංජල්. 3. උරුලෑ සට්ටම් වලින් සාදන සුවඳ ජාතියක්.

ජබාදුවා = 1. උරුලෑවා.

ජම්බුනද = 1. දඹරන්රන්.

ජම්බුක = (ජම්බුක) 1. හිවලා; නරියා.

ජමනාරම් = 1. එනම් නාරම් වර්ගය.

ජම්පතියෝ = 1. අඹු සැමි දෙදෙන.

ජම්බල = 1. එනම් පලතුරු වර්ගය, ජම්බෝල.

ජම්බාරය = 1. විශාල මිටි වර්ගයක්; පොළොව යටට ලී කණු බැස්සවීම සඳහා කණුවේ උඩ කෙළවරට ගසන උපකරණය.

ජම්බාලි = 1. ගවර වළ; අපිරිසිදු දේ එක්වන වළ.

ජම්බීර = 1. දොඩම් ගස.

ජම්බු = 1. දඹ ගස. 2. එනම් පලතුරු.

ජම්බුක = 1. හිවලා; නරියා.

ජම්බුද්වීප = 1. දඹදිව.

ජම්බුද්‍රෝණි = 1. දඹදෙණිය නුවර.

ජම්බුපන්න = 1. (ඉදුණු) දඹ ගෙඩිය.

ජම්බුපෙෂ්සි = 1. දඹ ගෙඩිය.

ජම්බෝනද = 1. ජම්බු නදියෙහි හටගත් රත්.

ජම්බෝල = 1. එනම් පලතුරු. 2. මහ නාරම්.

ජම්ම = 1. ජන්මය; උත්පත්තිය. 2. ඉගුරු. 3. පහත්. 4 ජීව. 5. ජාතික. 6. ස්වාභාවික

ජම්මය = 1. සහජය. 2. කුලය. 3. වංශය. 4. ස්වාභාව.

ජම්මාවරණය = (ජන්ම + ආවරණය) 1. ස්වභාවයෙන්ම පිහිටි.

ජම්මගතිය = 1. උපත්ගෙයි සිරිත. 2. සහජ ගතිය.

ජන්මදේශය = 1. උපත් රට. 2. මවු බිම.

ජන්මභාෂාව = 1. උපන් ජාතියට අයත් භාෂාව; මව්බස; ස්වභාෂාව.

ජය = 1. දිනීම; ජයගැන්ම. 2 ජයවේවා යන සුපැතුම. 3. සඵලවීම. 4. විෂ්ණු දෙවි. 5. ජාතිය.

ජයඅකුසු = 1. ජය දක්වන හෙංඩුව; ජය ග්‍රහණයට හේතුවන අංකුශය.

ජයකඳවුර = 1. ජයගැනීම පිණිස නැවතුණු තැන.

ජයකාහල = 1. දිනීම හැඟවීම පිණිස පිඹින තලාව.

ජයකුඩ = 1. ජයග්‍රහණය ඇඟවීමට ඉසලන කුඩ.

ජයකේතු = 1. ජයකොඩි.

ජයකොත් = 1. ජය කොඩිය.

ජය කොන්ත = 1. ජය හඟවන යෂ්ටිය; දිනීමට හේතුවන කුන්තායුධය.

ජයග්‍රාහක = 1. දිනන

ජයඝොෂා = 1. ජයග්‍රාහකයන්ගේ ප්‍රීති ඝොෂාව.

ජයඪක්කාව = 1. ජයඩැක්කිය; තඹ බෙර වෙසෙසක්.

ජයන්තයා = 1. ඉන්ද්‍ර දෙවියාගේ පුතා. 2. චන්ද්‍රයා. 3. සිවදෙවි. 4. වීරයා.

ජයන්ති = 1. ඉන්ද්‍ර දෙවියාගේ දුව; දුර්ගා.

ජයතුරාසක් = 1. ජයග්‍රාහක භාවය ඇඟවීම පිණිස පිඹින තලාව; ජය සඞ්ඛය.

ජයදද = (ජය ධ්වජ) 1. ජය කොඩි.

ජයනාද = (ජයනාද) 1. ජය පිළිබඳ ඝෝෂාව.

ජයපරාජය = 1. දිනුම හා පැරදුම.

ජයපතාකා = 1. ජයකොඩි.

ජයපර්යඞ්කය = 1. බුදුන් වහන්සේට පස්මරුන් දිනීමට උපකාර වූ මහාබෝධි පර්‍ය්‍යඞ්කය.

ජයපාන = 1 යුද්ධයකින් ජයගෙන කරන (සුරා බීමේ) උත්සවය; දිනීම නිමිති කොටගෙන බොන සුරා.

ජයපාල = 1 විරේකය ඇතිකරන බෙහෙත් ඇට විශේෂයක් 2. ජයග්‍රාහකයා. 3. විෂ්ණු දෙවි. 4. එනම් මැති.

ජයබිම = 1. ජය භූමිය; ජය අත්කොට දෙන ස්ථානය.

ජයබෙර = 1. ජය ග්‍රහණය ප්‍රකාශකොට වයන බෙර.

ජයභූමි = (ජයබිම බලන්න.)

ජයමඞ්ගලගාථා = 1. මඞ්ගල උත්සව ආදියෙහි ගැයෙන ගාථා අටකින් යුත් සුපැතුම් කාව්‍යය.

ජයමඟුල් = 1. ජයග්‍රහණය පිළිබඳ මඞ්ගලය.

ජයමද = 1. ජයග්‍රහණයෙන් සිතේ හටගන්නා අහඞ්කාරය.

ජයම්පති = 1. භාර්‍ය්‍යාව හා ස්වාමි පුරුෂයා. 2. ඔක්කාවස් රජතුමාගේ බාල පුත්‍රයා.

ජයවස්තු = 1. ජයග්‍රාහකයාට දෙන වස්තුව.

ජය සක = 1. ජයග්‍රහණයේ ප්‍රීතිය දක්වීම පිණිස පිඹින සක්ගෙඩිය හෝ තලාව.

ජයසනාමගය = 1. ජයග්‍රහණය සිහිකරණු වස් බැඳි කණුව. 2. දිනුම් කණුව.

ජයස්මාරණ = 1. දිණුම සිහි කරන.

ජයසිරි = 1. දිනීමෙන් වූ ශෝභාව. 2. දිනීමෙන් වූ ප්‍රීතිමත් ගතිය.

ජයසිරිමහබෝ = 1. ජයමහ බෝධිය. 2 ජය මහ බෝධියෙහි දකුණු ශාඛාවවූ (අනුරාධ පුරයෙහි) ජයසිරි මහ බෝරුක.

ජය සුමන = 1. බඳුවද (මල්)

ජයශ්‍රී (ජයසිරි බලන්න)

ජයා = 1. සිවදෙවියාගේ භාර්යාව; දුර්ගා 2. ගණ; තිත්තත්. 3. කොඩිය.

ජර = 1. ජරාව. 2. දුර්වලවූ. 3. දිරූ. 4. පරණ වූ.

ජර ධර්ණි = 1. ජරාව නමැති යකින්න.

ජරණය = 1. දුර්වල බව. 2. ලුණු වර්ගයක්. 3. පරණකම.

ජරතා = 1. ජරාව.

ජරත් = 1. පරණ. 2. තාකි වූ. 3. දිරූ.

ජරත්ගව = 1. මහලු ගවයා.

ජර පත් = 1. ජරාවට පැමිණි; මහලු වූ.

ජර හම් = 1. දිරූ හම ඇති; මහලු වයසට ගිය.

ජර්ජරය = 1. ශක්‍රයාගේ ආයුධයක්. 2. දිරා යාම.

ජර්මනිය = 1. එනම් රට. 2. එරට මිනිහා.

ජරාප්‍රේත = 1. ප්‍රෙතයකු මෙන් කැතවූ; රූප ලක්ෂණ රහිතවූ.

ජරාවාස = 1. දිරාගිය. 2. ගරාවැටුණු.

ජර්ජර = 1. පැලුණ. 2. සිදුරු වූ.

ජල = 1. දිය; ජලය. 2. දිලිසුනු. 3. ගිනි සිළුව.

ජලඅවගාහ = 1. දියෙහි ගිලීම.

ජලආවර්ත = 1. දිය සුළිය.

ජලඋදර = 1. උදරයෙහි දිය රැඳීමෙන් හට-ගන්නා එනම් උදර රෝගය; ජලෝදරය.

ජලඹිස = 1. ගලාබස්නා දියපාර. 2. දියවැල.

ජලකඩුත්තුව = 1. තදින් දිය ගැලීම.

ජලකඳ = 1. දියකඳ; දියරැස.

ජලකපියා = 1. එනම් සත්වයා.

ජලකරංකය = 1. දිය බඳුන. 2. නෙළුම් මල. 3. ශංඛය; හක්ගෙඩිය. 4. වලාකුළ.

ජලකාංක්‍ෂ = 1. දියකාවා.

ජලකිරු = 1. එනම් වායුව.

ජලකූපිය = 1. දිය බඳුන. 2. දිය සලාව. 3. පොකුණ.

ජලක්‍රීඩාව = 1. ජලයෙහි කරන සෙල්ලම්; දියකෙළි.

ජලගැල්ම = 1. වතුර ගැලීම.

ජලගුල්මය = 1. දිය සුළිය; දිය සලාව.

ජලගුල්මප්‍රවාහය = 1. ගලාබස්නා විශාල දියවැල. 2. උතුරු අත්ලන්තික් සාගරයේ ජල ශ්‍රෝතය හෝ සැඩපාර.

ජල සම්භා යන්ත්‍රය = 1. පැතැවිය (කුඩා සිදුරක් සහිත පොල්කටුවක් ක්‍රම ක්‍රම-යෙන් දියෙහි ගිලෙන්නට සැලැස් වීමෙන් වේලාව බලාගන්නා උපකරණය)

ජලංග = 1. දිය ඇති.

ජලචක්‍රය = 1. දිය රෝදය.

ජලචර = 1. දියෙහි හැසිරෙන. 2. මත්ස්‍යයා.

ජලජ = 1. දියෙහි හටගත්. 2. පියුම. 3. මත්ස්‍යයා.

ජලජධූම = 1. මීදුම. 2. වාෂ්ප.

ජලජාසන = (ජලජ + ආසන) 1. නෙළුම් ආසනය. 2. බ්‍රහමයා.

ජලනිලය = 1. පැතිර සිටි දියකඳ.

ජලතලා = 1. දිය මතුපිට. 2. තෝතැන්න.

ජලත්‍රාසය = 1. ජලභීතික රෝගය; පිස්සු බල්ලන් සපා කෑමෙන් හැදෙන ලෙඩේ.

ජල ද = 1. දියදෙන්නා. 2. මේඝය; වැසිවලා කුළ. 3. කපුරු. 4. කොංගිය.

ජල දර = 1. මේඝය. 2. කලාඳුරු.

ජල ද්වාරය = 1. දියදොර. 2. සොරොව්ව.

ජල දාගම = (ජලද + ආගම.) 1. වර්ෂා කාලය.

ජල දායක = 1. දිය දෙන්නා. 2. වලාකුළ.

ජල දිනි = 1. සමුද්‍රය; මුහුද.

ජල දුර්ගය = 1. ජලය නිසා යාමට අපහසු ස්ථානය.

ජල දෙවි = 1. ජලයට අධිපති දෙවියා. 2. වරුණ දෙවි.

ජල ධරය = 1. මේඝය; වලාකුළ. 2. දියදරා සිටින්නා. 3. සමුද්‍රය.

ජල ධාරාව = 1. වැල නොකැඩී ගලන දියපාර.

ජල ධි = (ජලනිදි) 1. මුහුද.

ජල ධිජා = 1. මුහුදෙන් උපන්. 2. ශ්‍රී කාන්තාව.

ජල න = 1. බැබලීම. 2. දැල්ලීම.

ජල නකුලයා = 1. දියබල්ලා.

ජල නල = 1. දියබස්සන පයිප්ප.

ජල නිග්ගම = (ජල නිගීම.) 1. දිය බැස යන සොරොව් ආදිය.

ජල නිධි = 1. සමුද්‍රය.

ජල නිර්ගමය = 1. දිය බැස යන මාර්ගය.

ජල නීලා = 1. දිය සෙවෙල. 2. දියපරඬලා

ජල පති = 1. ජලයට අධිපති දෙවියා; වරුණ. 2. මුහුද.

ජල පඞ්ක දුර්ග = 1. දිය හා මඩ නිසා යාමට අමාරු ස්ථානය.

ජල පාංශු සහිත = 1. දිය ගොඩ සහිත.

ජල පෘෂ්ඨ = 1. ජලතලය.

ජල පොකළාව = 1. පොළොවට යටින් ඇති ජලකඳ.

ජල ප්‍රවාහය = 1. ජලගැල්ම. 2. කඳින් ගලා යන දියපාර.

ජල ප්‍රාකාරය = 1. දිය වළල්ල. 2. ජල පවුර.

ජල ඵලය = 1. පොල් ගෙඩිය.

ජල බුද්බුද = 1. දිය බුබුළ.

ජල බින්දු = 1. දිය බින්දු; දිය පොද.

ජල භරිත = 1. දිය පිරුණු; දියෙන් බරවූ.

ජල භීතිකා රෝගය = (ජල ත්‍රාසය බලන්න.)

ජලභ්‍ර = 1. දිය සුළිය.

ජල මග = (ජල මාර්ගය.) 1. දියපාර. 2. ඇළ

ජල මට්ටම = 1. ජලයෙහි සමතලාව. 1. ජල යෙහි උස්-පහත් ප්‍රමාණය.

ජල මල = 1. මූත්‍ර සහ අසූචි.

ජල මල අධස්සිය = 1. මල මූත්‍ර හිරවීම.

ජල මාන = (ජලනාන) 1. දැල්වෙන. 2. දිලිසෙන.

ජල මාපක යන්ත්‍රය = 1. දිය මනින යන්ත්‍රය.

ජල යන්ත්‍රය = 1. දිය සපයන යන්ත්‍රය. 2. දිය විහිදුවන යන්ත්‍රය.

ජල යන්ත්‍රිකා = 1. දිය නඟන යන්ත්‍රය.

ජල යාගු = 1. දියාරු කැඳ.

ජල යාත්‍රා = 1 දියෙහි යන යාත්‍රාව.

ජල රංකයා = (ජලරංකුවා) 1. කොකා.

ජල රාක්ෂස = 1. ජලාශයකට අරක්ගත් රකුසා; උදක රාක්ෂසයා.

ජල රාජ = 1. යශෝධරා මෙහෙනින් වහන්සේ කළ සෘද්ධිමය පූජාවක්.

ජල රාජි = 1 දියෙහි ඇඳි ඉර; ජල රේඛාව.

ජල රේඛා = 1. දියෙහි ඇඳි ඉර. 2. දිය වැදී මෙන් වූ රේඛාව.

ජල ලම්බ = 1. දිය පිරුණු; 2. දිය එල්බෙන.

ජල වාක = 1. පසළොස්වක හෝ මාසේ පෝය දවසින් සිවුවැනි දවස; හතරවැනි තිථිය.

ජල වන් = 1. නෙළුම් අල.

ජලවා = 1. ශරීරයෙහි පණු කුලයක්.

ජල වාහන = 1. දියවාහනය; ඔරු,පාරු ආදිය. 2. වතුර බැස්ම.

ජල වාහිනිය = 1. වතුර ඇල.

ජල වැඩියා = 1. දිය වැඩියා රෝගය.

ජලාවුල් 1. දැල් සහිත කවුළුව. 2. දිය තැවරුණු; දියෙන් ගැවසීගත්.

ජල වේගය = 1. ජලය ගලාබස්නා ශක්ති ප්‍රමාණය

ජල ව්‍යාලයා = 1. දිය නයා.

ජල ශාටිකා = 1. නානකඩය; දියරෙද්ද.

ජල ශාන්ති = 1. පැන් ඉසීමෙන් කරන එනම් ශාන්ති ක්‍රමය.

ජල ශුක්තියා = 1. දැල්ලන් වර්ගයට අයත් මාලුවෙක්.

ජල ශ්‍රෝතය = 1. සැඩපාර.

ජල සන්නිය = 1. කොලරා රෝගය; අධික වමනය හා විරේකයද ඇතිවීමේ ලෙඩේ.

ජල සජීකා = 1. දියකාකා.

ජලස්කන්ධය = 1. දියකඳ; ජලරාශිය.

ජලස්තම්භය = 1. වතුරමල. 2. මන්ත්‍ර ක්‍රමයක්.

ජලස්ථයාන = 1. දිය මතුයෙහි යන නැව් ආදිය.

ජල ස්නාන = 1. දිය නෑම.

ජල හරෞෂධය = 1. දියපිට කරන ඖෂධ.

ජල සිඳු = 1. මුහුද.

ජල හෝරායන්ත්‍රය = (ජල ඝටිකා යන්ත්‍රය බලන්න.)

ජල් = 1. දැල්.

ජල්ප = 1. මන්ත්‍ර පිරවීම. 2. ජපකිරීම. 3. කථාව.

ජල්පක = 1. මතුරන. 2. ජපකරන. 2. කොඳුරන.

ජල්පන = 1. ජපකිරීම.

ජල්පාක = 1. ගී කියන. 2. දොඩවන.

ජල්ල = 1. (ඇඟේ) ගැලවී යන කුණු තට්ටුව.

ජල්ලිකා = 1. ගැලවී යන පතුර. 2. කුණු තට්ටුව.

ජල්ලි = 1. තරඟ ක්‍රීඩාවකදී දිනූ පක්ෂය කරන ජය ඝෝෂාව. 2. කැවිලි විශේෂයක්. 3. දුවන.

ජල්වීම = 1. මාලු ආදිය දැලි තරක්වීම.

ජලාංගනාව = 1. මූහුදු කිඳුරි.

ජලාංජලිය = (ජල + අංජලි) 1. දිය දෝත.

ජලාකරය = 1. උල්පත.

ජලාචූෂණ යන්ත්‍රය = 1. දිය ඇදගන්නා උපකරණයක්.

ජලාටන = 1. දියෙහි හැසිරෙන. 2. කොක්කු වර්ගයක්.

ජලාටනියා = 1. පූඩාවා; කුඩැල්ලා.

ජලාඪ්‍ය = 1. දිය සහිතවූ; බෙහෙවින් ජලය ඇති.

ජලාධානය = 1. දිය වත්කොට තබන බඳුනක්.

ජලාධාරය = 1. වැව. 2 පොකුණ. 3. වතුර ටැන්කිය.

ජලාබු = 1. ගර්භාශය; දරුබොක්ක. 2. වැදෑමහ.

ජලාබුජ = 1. ගර්භාශයෙහි උපන්; මව් කුසින් උපන්

ජලාර්ණවය = 1. සමුද්‍රය. 2. වැසි කාලය.

ජලාවගාහ = (ජල + අවගාහ) 1. දියෙහි ගිලීම. 2. දියට බැසීම.

ජලාවනීය = (ජල + ආවනීය) 1. දිය සුළිය.

ජලාලය = (ජලාශය) 1. දිය රැඳීමට ආධාරවූ වැව්, පොකුණු ආදිය.

ජලාශ්‍රිත = 1. ජලය ආශ්‍රය කරන. 2. දියට ආසන්න.

ජලිත = 1. ගිනි දැල් ඇති. 2. දිලිසෙන. 3. දැල්වුණු.

ජලූකාවා = (ජලෞකාවා) 1. කුඩැල්ලා. 2. කන් වැයා.

ජලේශ්වර = (ජල + ඊශ්වර) 1. සමුද්‍රයට අධිපතියා; ජලයට අධිපතියා; වරුණදෙවි.

ජලේරුහ = 1. නෙළුම් වෙසෙසක්.

ජලෝඝ = (ජල ඕඝ බලන්න.)

ජලෝදර = (ජල උදර බලන්න.)

ජව = 1. වේගය. 2. ඉක්මන්.

ජවන = 1. දිවීම. 2. ජවන් සිත. 3. වේගවත්.

ජවනයා = 1. වේගයෙන් දුවන අශ්වයා. 2. වේගයෙන් දුවන්නා.

ජවන හංසයා = 1. ඉතා වේගයෙන් යන හංසයා.

ජවන හංස ගති = 1. ඉතා වේගයෙන් යන හංසයාගේ ගමන.

ජවන්ත = (ජවමාන) 1. දුවන. 2. දුවමින්.

ජවන් සිත = 1. අරමුණෙහි දුවන මනෝ විඥානය. 2. දුවන සිත.

ජවනාරම් = 1. නාරම් විශේෂයක්.

ජවනිකා = 1. තිරය. 2. මදුරු දැල. 3. චිත්‍ර පටයේ කොටසක්. 4. කඩතුරාව.

ජවබල = 1. වේග ශක්තිය.

ජව සම්පන්න = 1. ඉතා වේගයෙන් දිවීමේ ශක්තිය ඇති. 2. ජවාධික.

ජවා = 1. පුණු කුලයක්.

ජවාධිකායා = ඉතා වේගයෙන් දුවන අශ්වයා.

ජවිස = 1. අතිළඹයක්; එනම් බෙහෙත් වර්ගය.

ජසරා = 1. ඉබේ හැදුණු විලු; ස්වාභාවික විල.

ජහ = 1. දුරුකරන.

ජහන්ත = 1. දුරුකරන; හැරදමමින්.

ජහිත = 1. දුරුකළ. 2. හැරදමූ.

ජ්

ජ්වර = 1. උණ.

ජ්වරාන්තක = (ජ්වරනාශක) 1. උණ නසන.

ජ්වරාග්නිය = 1. ජ්වර දැහය; උණ දැවිල්ල.

ජ්වරාතුරයා = 1. උණ ලෙඩා.

ජ්වරිත = 1. උණ ඇති; උණ සහිත.

ජ්වරෞෂධය = (ජ්වර + ඖෂධය) 1. උණට දෙන බේත.

ජ්වල = 1. දිලිසෙන. 2. දැල්වෙන.

ජා

ජා = 1. ජාත; උපන්. 2. පෙර චරිතය පිළිබඳ කථාව; ජාතකය. 3 ජාතිය. 4. කිරිමව. 5. භාර්යාව. 6. එනම් මනුෂ්‍ය වර්ගය.

ජාංගල = 1. කැලෑබද. 2. පිටිසර. 3. අව් සුළං බොහෝ වූ වියළි ප්‍රදේශය.

ජාංගල මාංශ = 1. වන මෘගයන්ගේ මස්.

ජාංගල = 1. වලි කුකුළා.

ජාංගලවා ශෑනීම = 1. අතට පාඩුවක් නොලබා වැඩේ බේරාගැනීම.

ජාංගලියා = (ජාංගුලියා) 1. අහිගුණ්ඨිකයා; නයින් අල්ලන්නා. 2. සර්පවෙදා.

ජාගර = 1. පිබිදී සිටින. 2. නොනිදා සිටින; නිදිවැරීම. 3. උනන්දුවීම.

ජාගරණ = 1. නිදිවැරීම; නොනිදා සිටීම.

ජාගරී = (ජාගරූක) 1. නිදිවරණ.

ජාගරිය = 1. නිදි වැරීම.

ජාගරියානුයෝග = 1. නිදි වැරීමෙහි යෙදීම.

ජාඩි = 1. ලුණු හා ගොරක දමා පදම් කළ මාළු; ලුණු මාළු.

ජාඩ්‍ය = 1. ජඩ භාවය.

ජාණු = 1. දණහිස.

ජහන = 1. හැරීම; දුරුකිරීම.

ජහානකාශ = 1. ලෝකය විනාශ කාලය.

ජළ = 1. ජටාව. 2. ගිනිගෙය. 3. අඥාන වූ. 4. ජඩ වූ.

ජළමඬුලු = 1. ජටා මණ්ඩලය.

ජ්

ජ්වලන = 1. ගිනි දෙවියා. 2. දැවීම. 3. දිලිසීම.

ජ්වලය = 1. ගිනිදළුව. 2. උනන්දුව.

ජ්වලිත = 1. දැවෙන 2. බැබළෙන.

ජ්වාල = දැවෙන. 2. ඇවිළෙන.

ජ්වාල පඞ්ක = 1. අග්නි හුබරය; ගිනිකන්ද.

ජ්වාලා මුඛ = 1. ගිනි කන්ද. 2. ගිනිකන්දේ කට.

ජ්වාලය = 1. ගිනි දැල්ල 2. ආලෝකයෙන් විසිතුරු කළ.

ජා

ජාණු මණ්ඩලය = 1. දණමඬල; දණහිස් ඇටය.

ජාත = 1. උපන්. 2. හටගත්. 3. ඉපදවූ. 4. සමූහය.

ජාතඋරුම = 1. ඉපදීමෙන්ම උරුමවූ.

ජාතක = 1. උත්පත්තිය. 2. හටගත්. 3. උපන්. 4. ජාතක කථාව. 5. උපන් වාරය.

ජාතකර්ම = 1. උපන් වේලාවේ කරන කටයුතු.

ජාතක වෙනවා = 1. දරු වෙනවා; ඔහු පියා කොටගෙන උපදිනවා.

ජාතක කථා = 1. ජාතක පොතට ඇතුළත් කතාන්තර.

ජාතකපොත = 1. බෝධිසත්වයන් වහන්සේගේ ජාතක කථා 550ක් ඇතුළත් පොත.

ජාතක භාණක = 1. ජාතකයන් දේශනා කරන්නා.

ජාතකුලය = 1. ජන්මය.

ජාතත්ත = 1. උපන් බව.

ජාතදිවස = 1. උපන් දවස.

ජාත පත්‍රාව = 1. දරුවකු ඇත්තා; මවු.

ජාත පුර 1. උපන් නුවර.

ජාත මුහුර්ත = 1. උපන් මොහොත.

ජාතය = 1. ජීවිතය. 2. උත්පත්තිය. 3. වර්ගය. 4. වංශය. 5. කුලය.

ජාතරූප = 1. රත්රන් හෝ රිදී.

ජාතවේද = 1. ගින්න. 2. රත්රන්.

ජාතස්සර = 1. ස්වාභාවික විල; ඉබේ සෑදුණ විල.

ජාති = 1. වර්ගය. 2. කුලය. 3. ඉපදීම. 4. උපදින තැන. 5. දෑ සමන්. 6. සාදික්කා. 7. පරම්පරාව. 8. සහජය.

ජාතික = 1. ජාතියට අයිති; වර්ගයට අයත් වූ 2. ජන්මයට අයිති.

ජාතිකා = 1. දෑ සමන්; පිච්චමල්.

ජාති කාන්තාර = 1. උත්පත්තිය නමැති කාන්තාරය.

ජාති කෝර = 1. පිලා.

ජාති කෝෂය = (ජාති ඵලය) 1. සාදික්කා ගෙඩිය; වසාවාසි.

ජාති ක්ෂය = 1. ඉපදීම නැති කිරීම.

ජාති ගෝත්‍ර = 1. ජාතිය හා වංශය.

ජාතිත්ථද්ධ = 1. කුලය නිසා උඩඟු වූ.

ජාති දුඃඛ = 1. ඉපදීම නමැති දුක.

ජාති ධර්ම = ඉපදීම ස්වභාවකොට ඇති බව.

ජාති නපුංසක = 1. උත්පත්තියෙන්ම නපුංසකවූ.

ජාති නිරෝධ = 1. ඉපදීම නැතිවීම.

ජාති පත්‍රී = 1. වසා වාසි.

ජාතිපුෂ්ප = 1. දෑ සමන් මල්.

ජාති ඵල = 1. සාදික්කා.

ජාති ඵලික = 1. පළිඟු ගල.

ජාති බධිර = 1. උත්පත්තියෙන්ම බිහිරි වූ.

ජාති භය = 1. ඉපදීම නමැති බිය; සසර බිය.

ජාති භේදය = 1. කුල භේදය. 2. ජාති විශේෂ. 3. ජාති මිශ්‍ර වීම.

ජාති මත් = 1. වංශවත්; උසස් කුලයකට අයත්වූ.

ජාති මද = 1. කුලය නිසා ඇතිවන අහංකාරය.

ජාති මමත්වය = 1. ජාත්‍යාලය; තමන් උපන් ජාතියට තද ඇල්මකින් යුතුබව.

ජාති මහත්වය = 1. කුලයෙහි උසස් බව.

ජාති මූක = 1. උත්පත්තියෙන්ම ගොළුවූ.

ජාති මූලක = 1. ජාතිය මුල් කොට ඇති.

ජාති රඞ්ග මාණික්‍යය = 1. පළිඟුව. 2. මැණික. 3. ඔප දැමීම් ආදියක් නැතිව ස්වභාවයෙන්ම බබලන මැණික.

ජාති රත්රන් = 1. අමිශ්‍ර හොඳ රත්රන්.

ජාති ලිංග = 1. සාදිලිංගම්.

ජාතිවාද = 1. කුලමල කීම.

ජාති වාණ = 1. ඉතා හොඳ වාණේ.

ජාති වෛරය = 1. පෙර ආත්මභාවයක පටන් පැවත එන බද්ධ වෛරය.

ජාති සම්පන්න = 1. වංශවත්; උසස් කුලැති.

ජාති සම්පදාව = 1. ශුභ උත්පත්තිය.

ජාති සම්භේද = 1. කුල මිශ්‍ර වීම.

ජාති සෛන්ධව = 1. උසස් කුලයෙහි උපන් අශ්වයා.

ජාති සෝද = 1. ජයපාල.

ජාතිස්මරණඥාන = 1. ඉකුත් ජීවිත සිහි කරන නුවණ.

ජාති සුමන = (ජාතිසුමනා) 1. දෑ සමන් මල්.

ජාතිස්මර = 1. පූර්ව ඉපදීම් සිහි කරන.

ජාති සුවර්ණ = 1. ජාති රත්රන්.

ජාති ශබ්දය = 1. (ව්‍යාකරණයෙහි) වර්ගයක් හැඳින්වීමට දී තිබෙන නාමය.

ජාති හිඞ්ගුලක = 1. රත් සිරියල්.

ජාතු = 1. ඒකාන්තයෙන්.

ජාතුක = 1. හිංගු; පෙරුම් කායම්.

ජාත්‍ය = 1. උතුම්. 2. සතුට ගෙන දෙන. 3. වංශවත්.

ජාත්‍යන්තර = (ජාති + අන්තර) 1. අනෙක් ජාතිය.

ජාත්‍යන්ධ = (ජාති + අන්ධ) 1. උත්පත්තියෙන්ම ඇස් නොපෙණෙන.

ජාත්‍යාලය = (ජාති + ආලය) 1. තමන් උපන් ජාතිය කෙරෙහි පවත්නා ඇල්ම.

ජානකී = 1. සීතා දේවී. 2. සිව දෙවියා.

ජානකීහරණ = 1. සීතා දේවිය ගෙනයාම පිළිබඳ සංස්කෘත මහා කාව්‍යය.

ජානන = 1. දැනීම. 2. දැන ගැන්ම.

ජානනක = 1. දැනගත්තාවූ. 2. දත්තා.

ජානමාන = 1. දැනගනිමින්.

ජානනීය = 1. දැන ගත යුතු.

ජානපද = (ජානපදික) 1. ජනපදයෙහිවූ. 2. පිටිසර මිනිසා.

ජානි = 1. පිරිහීම. 2. හානිය. 3. විපත්තිය. 4. භාර්‍යාව.

ජානිපති = 1. අඹු සැමි දෙදෙන.

ජාප්‍ය = 1. ජපකිරීම. 2. මන්ත්‍ර හෝ යාඥා කිරීම. 3. කොඳුර කොඳුරා කීම.

ජාපාල = 1. එනම් ගස් වර්ගය.

ජාබාලය = 1. බැටළු ගාල.

ජාබාලයා = 1. (බැටළු) එඬේරා; බැටළු ගොව්වා.

ජාම = 1. යාමය; (සිංහල) පැය දහයක කාලය. (දවසකට සිංහල පැය හැටකි.)

ජාමාතා = 1 සුගන්ධිකා නම් මල. 2. වදමල. 3. ස්වාමි පුරුෂයා. 4. දුවගේ පුරුෂයා (බෑණා.)

ජාමාතෘ = (ජාමාතා) 1. බෑණා. 2. දුවගේ සැමියා.

ජාමි = 1. උතුම් කාන්තාව. 2. වංශවත් කාන්තාව. 3. සොහොයුරිය.

ජාම්බවය = 1. ජම්බු. 2. රත්රන්.

ජාම්බූනද = (ජම්බොනද) 1. ජම්බු නදියෙහි හටගත් රත්රන්. 2. දඹරත්රන්. 3. පිරිසිදු රත්රන්.

ජාම්බූනදිය = 1. මහාමේරු පර්වතයෙන් ගලා බසින ගඟක්.

ජායා = 1. භාර්‍යාව.

නාඹුල් ඵල = 1. නාඹුල් ගෙඩි. 2. පළමු හටගත් ඵලදාව.

නාබුඩ = 1. මැණික් ආදිය ගරාගත් පසු ඉතිරි වන බොර.

නාභිය = 1. නැබ; පෙකනිය. 2. බොස් ගෙඩිය. 3. කස්තුරි.

නාභිජයා = 1. පෙකනියෙන් උපන් නැනැත්තා; බ්‍රහ්මයා.

නාභි නාලාව = 1. නාභි නැඹිය; පෙකණි වැල.

නාභි මණ්ඩලය = 1. පෙකණිය. 2. පෙකණිය වටා ඇති රවුම.

නාභිලය = 1. පෙකණි වළ.

නාභිකා = 1. නේත්‍රාඤ්ජනය; රස අඳුන.

නාම = 1. නම. 2. ඒ ඒ දෙයට තබනලද සංඥාව. 3. චිත්ත චෛතසික ධර්ම. 4. පස් වැදෑරුම් නාම ශබ්ද.

නාමකරණ = 1. නම් තැබීම. 2. නමක් දීම.

නාම ගහණ = 1. නමක් ගැනීම.

නාම ගෝත්‍රය = 1. නම හා කුල ගෝත්‍ර තරාතිරම් ආදිය.

නාම ඝෝෂක = 1. නම්කියා අඬ ගසන්නා.

නාම ධාරියා = 1. නමක් දරන්නා. 2. උසස් නමක් දරන්නා.

නාමධේය = 1. නාමය. 2. නමැති.

නාම පත්‍රය = 1. නම සඳහන් කොළ කැබැල්ල.

නාමපදය = 1. වර නඟන ලද නාමය. 2. නාම වචනය.

නාම ඵෝරුව = 1. නම ලියා ඇති ලෑල්ල.

නාම මාත්‍රය = 1. නම පමණක් ඉතිරිවීම.

නාම මාලා = 1. නම් වැල. 2. නම් සමූහය. 3. නාම වරනැඟීම.

නාම යෝජනා පත්‍රය = 1. යම් කිසි කාර්යයක් සඳහා නාමය යෝජනා කොට ඇති ලියවිල්ල.

නාම රූපය = 1. නාමය හා රූපය. 2. චිත්ත චෛතසික හා රූපය.

නාමලේඛන = 1. නම් ලැයිස්තුව.

නාම වට්ටෝරුව = 1. නාම ලේඛනය; නම් ලැයිස්තුව.

නාම ශේෂ = 1. නම පමණක් ඉතිරිවූ.

නාම්බා = 1. තරුණ සිවුපාවා.

නාමාවලිය = 1. නම් වැල. 2. නම් ලැයිස්තුව.

නාමෑණ = (නාමිණ) 1. නායක මාණික්‍යය. 2. ප්‍රධාන මැණික.

නාමුව = 1. මුව වර්ගයක්.

නාමෙමෙණ්ඩිය = 1. නාග කන්‍යාව.

නාමොපලක්ෂිත = (නාම + උපලක්ෂිත.) 1. නාමයෙන් යුක්තවූ.

නායක = 1. ප්‍රධානයා. 2. පිරිසක් හසුරුවන්නා. 3. මග පෙන්වන්නා.

නායකකම = 1. ප්‍රධානත්වය.

නායක විනිශ්චයකාරයා = 1. ධර්මාධිකරණ නායකයා.

නායයෑම = 1. කඳු යටින් ජල මං ඇතිවීම නිසා කඳු ගිලා බැසීම. 2. තද වැස්ස නිසා කඳු වලින් ගල් පස් කඩා හැලීම.

නායහන් = 1. නයකු අහුත කොට ඇත්තා. 2. විෂ්ණු දෙවි.

නායිකා = 1. ප්‍රධාන ස්ත්‍රී. 2. මග පෙන්වන්නී. 3. කාව්‍යයෙන් වර්ණනා ලබන කාන්තාව.

නාසුරාඩි = 1 කරල්හැබ.

නාර = 1. ජලය.

නාරං = 1. එනම් ගස. 2. එනම් ගෙඩි.

නාරංගා = (නාරංග) 1. දොඩම් විශේෂයක්. 2. ඓරාවත හස්තියා. 3. ගම්මිරිස් ඉස්ම.

නාරඟු = 1. නාරං 2. නාරං ගෙඩියෙහි ලෙල්ල.

නාරඩග = 1. නාරන් ගස.

නාරංඩිඩ සුමනාසාර ශිම් = 1. ගරාවැටී තුබුණු රුවන් මැලි මහ සෑය ප්‍රතිසංස්කරණය කිරීමට පටන් ගත් වීරයාණන් වහන්සේ.

නාරකය = 1. අපාය; නරකාදිය.

නාරකිකයා = 1. නිරයෙහි උපන්නා. 2. නිරි සතා.

නාරජ = 1. නාග රාජයා.

නාරඞ්ග = (නාරටුව.) 1. කොළයක මැදින් නහරයක් මෙන් ඇති තද කෙන්ද. 2. පොල් අතු ආදියේ මැද කොටස.

නාරණ = 1. විෂ්ණු; නාරායණ.

නාරද = 1. ඍෂිවරයෙක්. 2. දේව නිකායක්. 3. බ්‍රහ්මයාගේ පුත්‍රයෙක් 4. අනන්ත නාග රාජයා.

නාරම = 1. නාරං ගෙඩිය. 2. ඓරාවණ හස්තියා.

නාරාචය = 1. යකඩ හුල. 2. ඊතලය. 3. නාරාසතය. 4. අලවංගුව.

නාරාචිය = 1. නරාදිය.

නාරායණ = විෂ්ණු දෙවි.

නාරායණ අල = 1. ආනාවාරිය අල.

නාරායණ සොන = 1. අනංගයා. 2. විෂ්ණුදෙවියන්ගේ පුත්‍රයා?

නාරායණ බල = 1. බුදුන් වහන්සේගේ කාය ශක්තිය.

නාරායණී = 1. ලක්ෂ්මි. 2. දුර්ගා?

නාරාසනය. = 1. අලවංගුව. 2. යකඩ හුල.

නාරි = 1. ස්ත්‍රිය. 2. මුනපියා.

නාරිකේර = (නාරිකේල) 1. පොල් ගස.

නාරිකේර උද්‍යානය = 1. පොල් උයන; පොල් වත්ත.

නාරි ගණ = 1. ස්ත්‍රී සමූහයා.

නාරිපු = (නාරුපු) 1. නයින්ගේ සතුරා. 2. ගුරුළා. 3. මුගටියා.

නාරි ලතා = 1. කාන්තා රූපයක් මෙන් ඇතට පෙණෙන මල් හටගන්නා වැල් වෙසෙසක්. 2. එනම් මල්.

නාරු = 1. ගෙඩිවල කොඳි.

නාරෙරාන් = 1. නාමල් රේණු.

නාලය = 1.නලය. 2. සිරියල්.

නාලාගිරි = 1 බුදුන් වහන්සේ මරණු සඳහා එවනු ලැබූ එනම් හස්තියා.

නාලි = 1. නලය. 2. නැලිය. 3. නගර.

නාලිකය = 1. සෙළුම්. 2. මිනිත්තු විසිහතරක කාලය. 3. කලය. 4. ඊතන. 5. හෙල්ලය; තෝමරය.

නාලිකායා = 1. මිතුරකා.

ණාලිකාව = 1. බෝතලය. 2. බෝතලය මෙන් සාදගත් උණ පුරුක. .3 හෝරා යන්ත්‍රය. 4. කත් විදින කටුව. 5. නැළිය.

ණාලිකේර = (නාරි කේර බලන්න.)

ණාලිය = 1. නලය. 2 බුලත් වල. 3. ඇතින්න. 4. නාදළ 5. හැපින්න. 6. නාග ස්ත්‍රිය.

ණාලිය දූවිමු = 1. නාගලතා නම් වැලේ දඬු වලින් සාදගත් දූහැවිය.

ණාලි = 1. නා ගසේ ලී.

ණාලොව = (නාලෝ) 1. නාග ලෝකය.

ණාල = 1. නැළිය. 2. නහර. 3. නාඩි. 4. නළ.

ණාලි පට්ට = 1. තොප්පිය.

ණාලි මත්ත = 1. නැළියක් පමණ.

ණාවන = 1. නැවීම කරවන.

ණාවා = 1. නැව. 2. ගස් වර්ගයක්.

ණාවාතිත්ථ = 1. නැව්තොට; වරාය.

ණාවා පට්ටා = 1. නාවා ගසේ පට්ටා.

ණාවා පට්ටා තොප්පි = 1. නාවා පට්ටා වලින් සෑදූ තොප්පි.

ණාවෑසියා = 1. ඇත් ගොව්වා.

ණාවි = 1. විෂ ඇති මුල් වර්ගයක්. 2. වච්චනාවි. 3 කරනැවැමියා; පතික්කයා. 4. කරල් හැබ.

ණාවික = 1. නැව්කාරයා. 2. නැව් පදවන්නා. 3. නැවෙහි නියුක්ත අය. 4. නැවියා.

ණාවිකී = 1. නැවෙහි නියුක්ත ස්ත්‍රිය

ණාව්‍ය = 1. නැව්වලට අයිති.

ණාවුක = (නාවික බලන්න.)

ණාවුක හමුදාව = 1. යුධ නැව්වලට අයත් හට සේනාව.

ණාවුකා = 1. නැව.

ණාවුත්තික = 1. අනුවක් වයසැති.

ණාවු මුවා = 1. නාමුවා; මුව වෙසෙසක්.

ණාස = 1. විනාශය. 2. මරණය. 3. නැහැය.

ණාසන = 1. නෙරපීම. 2. විනාශ කිරීම.

ණාසය = 1. නැහැය.

ණාසා = 1. නාසිකාව; නැහැය. 2. නොඅසා; ඇසීම නොකොට.

ණාසාපුට = 1. නාස් පුඩුව; නාසා රන්ධ්‍රය; නාස් සිදුර.

ණාසාරජ්ජු = 1. නාස් ලණුව.

ණාස්නා පහණ = 1. උරගල.

ණාස්තිය = 1 පාඩුව; අලාභය. 2. විනාශය; නැතිවී යාම.

ණාස්තික = 1. ධර්මයක් නැතැයි කියන. 2. විනාශය ගෙන දෙන.

ණාස්ති කාරකා = 1. දේපල විනාශ කරමින් වියදම් කරන්නා.

ණාස් දණ්ඩ = 1. නාස් පොල්ල; නාස් කඳ.

ණාස් පොල්ල = 1. නාස්දණ්ඩ.

ණාස් ලනුව = 1. ගොනුන්ගේ නැහැය විද දමන ලණුව.

ණාසිකාව = 1. නැහැය. 2 ඇත් හොඬය.

ණාසිකා මල = 1. සොටු

ණාසිකා ක්ෂරණ = 1. නැහැයෙන් හටගන්නා අකුර.

ණාසිකා ස්වරණ = නැහැයෙන් උපදනා හඬ.

ණාසේ = (නාසේ) 1. නැහැය.

ණාශ = 1. විනාශය. 2. මරණය.

ණාශක = 1. විනාශ කරන්නා.

ණාශන = 1. නැසීම. 2. විනාශ කිරීම.

ණාශ්‍ය = 1. නැසියයුතු. 2. විනාශ කළ යුතු.

ණෑ

ණෑ = 1. නෑන; නෑනා.

ණෑංගුරම =(නෑංගෝරම.) 1 අංකාරය. 2 සීනිය.

ණෑංගු = 1. නැඟුම 2. වංගුව. 3. නැමුණු තැන.

ණෑ ඇත් = 1. ඇත් හොඬ. 2. ගණ දෙවි.

ණෑකත = 1. ග්‍රහ තාරකාව. 2. සුබ මොහොත. 3. චන්ද්‍රයා ඒ ඒ නැකතට පැමිණි තිථිය.

ණෑකතියා = 1. නැකැත් කියන්නා. 2. ගණිතයා. 3. බෙර වයන්නා.

නැකැත් කැඹු = 1. එනම් මල් වෙඩිල්ල.

නැකැත් කෙළි = (නකත් කෙළි බලන්න.)

නැකු මුව = 1. මුව වර්ගයක්.

නැක්මණ = 1. නෛෂ්ක්‍රම්‍ය; ගිහි සැප අත් හැර පැවිදි වීම හෝ නික්මයාම.

නැගනය = 1. නගනය; ඇස් පිහාටුවෙහි ගඩුව

නැගණි = 1. නංගි.

නැගම් = 1. අනාගාමි.

නැගි = 1. නැගුණු.

නැගිටිනවා = 1. නැගිට සිටිනවා. 2. අවදි වෙනවා; (නින්දෙන්.) පිබිදෙනවා. 3. දියුණු වෙනවා.

නැගුම් = 1. මතුවීම. 2. වැමැරීම. 3. උඩට ඒම. 4. එසෙවීම.

නැගුරුවන් = 1. පිරිසිදු කළ රන්.

නැඟෙනවා = 1. මතුවෙනවා. 2. වමාරනවා. 3. එනවා. 4. එසවෙනවා.

නැඟෙන හිර = 1. හිර පායන දිශාව.

නැටවීම = 1. නැටුම් කරවීම.

නැට්ට = 1. නටුව. 1. වලිගය.

නැටුවා = 1. නළුවා; නටන්නා.

නැටුක් කාරයා = 1. නටන්නා; නළුවා

නැටුක් කාරි = 1. නළඟන; නටන්නී. 2. නොහික්මුණු ස්ත්‍රී. 3. රොඩීස්සියට කියන නම්බු නමක්.

නැඩ = 1. නෑඹි-දූඹි. 2. මිනන දෙගෙන ඇති. 3. තරබාරු

නැඩය = (නැඬේ.) 1. (ශ්‍රී පාද වන්දනාව ආදී) වන්දනාවක යන කණ්ඩායම.

නැඩුඹ = 1. නැළිය.

නැන = (නැණ) 1. ඥානය; නුවණ.

නැනග = 1. ගණ දෙවි.

නැන්දණි = 1. නැන්දා.

නැන්දම්මා = 1. ස්වාමි පුරුෂයාගේ හෝ භාර්යාවගේ මව. 2. පියාගේ සහෝදරී. 3. මාමාගේ භාර්යාව.

නැන්දා = 1. පියාගේ සහෝදරී. 2. මාමාගේ භාර්යාව.

නැණ = 1. ඥානය. 2. නුවණ.

නැණග = 1. ගණ දෙවි.

නැණවත් = 1. ඥානවන්ත; නැණසර; පැනසර.

නැණැති = (නැණ + ඇති) 1. ඥාන වන්ත.

නැත = (නැත්) 1. නොමැත. 2. නොවේ. 3. නැහැ. (නැතහොත්.)

නැතහොත් = 1. නොවේනම්.

නැතක් = 1. බොහෝ. 2. නිමක් නැති. 3. බෙහෙවින්.

නැත්නම් = 1. නැතහොත්. 2. එසේ නොවේනම්.

නැත්ත = 1. නැති දේ 2. බොරු.

නැත්මය = 1. නැත්තේමය.

නැති = 1. නොමැත. 2. නොවේ. 3. නැහැ.

නැති කරනවා = 1. නාස්ති කරනවා. 2. විනාශ කරනවා.

නැති වාදම = 1. දිළිඳු කම. 2. නැති බැරි කම ගැන කීම.

නැති වෙනවා = 1. නාස්ති වෙනවා. 2. විනාශ වෙනවා. 3. නොපෙනී යනවා.

නැදබට = 1. මඞ්ගල ලක්ෂණයක්.

නැද්ද = 1 නොමැත්තේද?

නැද විගති = 1. නාද කරවනු කැමති.

නැදි = 1. බැම්ම. 2. නැන්දා.

නැදි මයිල් = 1. නැන්දා සහ මාමා. 2. ස්වාමි පුරුෂයාගේ හෝ භාර්යාවගේ දෙමාපියෝ.

නැදිවට = 1. මඞ්ගල ලක්ෂණයක් 2. නන්ද්‍යා වර්තය.

නැදී = 1. බැඳීම. 1. බැම්ම.

නැදුන් = 1. එනම් ගස්වර්ගය.

නැදුජ් = 1. ඉතා කුඩා.

නැපිය = (නැපියු) 1. අහක දමන 2 දුරුකරන.

නැඹුල් = 1. කුඩා දෙය.

නැබ = 1 නාභිය. 2. පෙකණිය 3. බොස්ගෙඩිය.

නැබ සියුම = 1. විෂ්ණු දෙවියන්ගේ පෙකණියෙන් හටගත් නෙළුම් මල.

නැබ මඩුල්ල = (නැබ මඩල-නැබ මඬුලු.) 1. පෙකණිය. 2. පෙකණිය වටේ කොටස. 3. බොස් ගෙඩිය. 4. මකුළු දැලේ මැද.

නැබිළු = (නැබුළු.) 1. මහත්.

නැබුරු = 1. නැඹුරු. 2. නැමුණු.

නැබුළු = 1. විශාල.

නැඹ = 1. බොක් ගෙඩිය. 2. නැබ.

නැඹුරු = (නැබුරු බලන්න.)

නැඹුළු = 1. විශාල.

නැමති = 1. නමැති. 2. නම් ඇති.

නැමතුණ් = 1. නිමන්ත්‍රණය.

නැමද = 1. නමස්කාර කොට.

නැමදුම් = 1. වැඳීම; නැමදීම.

නැම්ම = 1. ඇදවූ තැන; නැමුම. 2. මඟුල් මේසයෙහිදී ඉඳුල්නොවැටීම පිණිස, හිඳගත්තවුන්ගේ ඔඩොක්කුවේ එලන සුදු රෙද්ද.

නැමි = 1. නැමුණු.

නැමි පණා = (නැවි පණා) 1. හිස සරසන පතාවක්. 2. හිසේ පලඳින වක්වූ පණාව. 3. කැස්බෑ ලෙලිවලින් හෝ රිදියෙන් කළ හිසේ ගසන නැමුණු පණාව.

නැමියම් = 1. නමන්නට කැමැති.

නැමුඹු = 1. ලුණුවරණ ගස.

නැමුණු = 1. යටනත්වූ. 2. හැරුණු. 3 වක්වුණු.

නැමුම් = 1. හැරවීම. 2. වැඳීම.

නැමුම් දෙන = 1. නැමෙන.

නැමුම් පට = 1. රෙද්ද නැමුණු තැන; නැවුම්පට.

නැමූ = 1 නමස්කාර කළ. 2. හරවා නැමූ. 3. නැමුණාවූ.

නැමෙන සුළු = 1. නැවිය හැකි.

නැයි = 1. නොවේද. 2. නැද්ද.

නැයිනි = 1. නාග ස්ත්‍රිය; හැපින්න.

නැරඹීම = (නැරඹුම) 1. බැලීම.

නැරඹූ = 1. බැලූ.

නැරළු = (නෙරළු) 1. පොල්.

නැල්ලා = 1. මාළු වර්ගයක්.

නැල්ල බඹුවා = 1. එනම් වටු වර්ගය.

නැළවිල්ල = 1. නැළවීම. 2. සුරතල් කිරීම. 3. නින්ද පිනවීමට කවි ගී ආදිය කීම.

නැළි = 1. එනම් මිම්ම. 2. පත හතර. 3. මනා දෙක. 4. කුරුණියෙන් හතරෙන් කොටස. 5. තලය. 6. පොල්.

නැළි තෙල් = 1. පොල් තෙල්.

නැව = 1. දියෙහි යාත්‍රාකරන විශාල ජල යාත්‍රා විශේෂයක්.

නැවත = (නැවතත්, නැවතා) 1. යළිත්. 2. ආයෙත්. 3 නැවතී; ගමන් නොකොට. 4. ඉක්බිති. 5. ආපසු.

නැවතිල්ල = 1. නැවැත්වීම.

නැවතීම = 1. නොයා සිටීම. 2. නතරවීම.

නැවතෙන් = 1. නවතිනු.

නැවැණි = (නැව් + ඇණි.) 1. නාවුක සේනාව.

නැවැමි = 1. නව කාර්මිකයා. 2. යකඩ වැඩ කරුවා. 3. පතික්කයා.

නැව් කඳ = 1. නැවේ කඳ.

නැව් කාරයා = (නාවික බලන්න)

නැව් කප්පිත්තා = 1. නැවේ ප්‍රධානයා.

නැව් නගිනවා = 1. නැවට නගිනවා. 2. නැවකින් විදේශයකට යනවා.

නැව් තරු = 1. නාවුකයනට උතුරු දිශාව දැනගැනීමට උපකාරවන ධ්‍රැව තාරකාව.

නැව් තොට = 1. වරාය. 2. නැව් ආදී ජල යාත්‍රා නතරකරන ස්ථානය.

නැව් පතියා = 1. නැවේ ප්‍රධානයා. 2. කප්පිත්තා.

නැව් හම්බන් = 1. නැව් හා ජල යාත්‍රා; නැව් හා හුලුප්පු ආදිය.

නැවි = 1. නැමුණු; නැවුණු 2. නාවුකයා.

නැවියා = 1. නාවුකයා. 2. නැව් කාරයා.

නැවිපණා = (නැමි පණා බලන්න.)

නැවී = 1. නැව් පදින්නා. 2. කප්පිත්තා. 3. නැවේ ප්‍රධානයා

නැවුම් = 1. අළුත්. 2. ගින්නෙහි පුළුස්සා ගත්. 3. කෝඩු.

නැවුම් කළය = 1. ගින්නෙන් රත් කොට ගත් කළය.

නැවුම් කිතිය = 1. අළුත් පෙම්වතියක් තුළ ඇතිවන ලජ්ජා ගතිය. 2. කෝඩුකම.

නැවුම්රණ = 1. නැවුම් කළුරේ හැඩුණු දිශයෙහි රස.

නැවුම් එතුර = 1. අළුත් කලයේ දිය. 2. ලිපේ තවා පුළුස්සාගත් කලයේ දිය.

නැවුරන = 1. කොළොම් ගස.

නැස = 1. නැසීම. 2. මුවාව. 3. සැඟවීම.

නැසල = 1. උපත් ගෙයිම කොරා.

නැසිණි = 1. සැඟවුණු කාන්තාව.

නැසිනි = 1. දිය සොරොව්ව.

නැසුණු = 1. මැරුණු. 2. නැතිවුණු. 3. සැඟවුණු.

නැසුම් = 1. සැඟවීම. 2. මැරීම. 3. වැසීම. 4. නැවීම. 5. විනාශය.

නැසෙනවා = 1. මැරෙනවා 2. විනාශ වෙනවා.

නැහැ = 1. ආශ්වාස, ප්‍රශ්වාස කරන ඉන්ද්‍රියය. 2. නැති; නොමැති.

නැහැ ඔරු = 1. නාසයට බෙහෙත් වත්කරන උපකරණය; නස්‍ය කුලාව?

නැහැඹු = 1. නාසයෙහි ලොම් උගුල්ලන අඬුව.

නැහැපට = 1. නැහැයෙහි බැඳි ලණුව.

නැහැපුඩ = 1. නාශ් පුඩුව; නාසයේ සිදුර; නැහැ බිලය.

නැහැම් = 1. නැම.

නැහැමින් = 1. යහමින්.

නැහැඹි = 1. නැම්බි.

නැහැය = 1. නාසය.

නැහැරුම = 1. නැටුම. 2. පිළිකුල් දෙය.

නැහැලණු = 1. නාස්ලණුව; ගව ආදී සිවුපා වුන්ගේ නාසය විද දමන ලණුව.

නැහැරෙනවා = 1. නොහැරෙනවා.

නැහැල = (නැසල) 1. උපත් කොරා

නෑ

නෑ = 1. නැහැය. 2. ඥතියා; නෑදෑයා. 3. නැවාවූ. 4. නැව. 5. නැසිය හැකි. 6. නැන යන අරුත්ය.

නෑ අත් = 1. ගණදෙවියා.

නෑකම් = 1. නෑකම; ඥති භාවය.

නෑ කුල = 1 නෑ ගෙදර.

නෑනා = 1. මාමාගේ දුව. 2. නැන්දගේ දුව. 3. භාර්‍යාවගේ සහෝදරී 4. ස්වාමි පුරුෂයාගේ සහෝදරී.

නෑනන්ඩි = (නෑනා බලන්න.)

නෑදෑ = 1. ඥති. 2. නෑකමින් බැඳුණු.

නෑබි = (නැම්බි) 1 තරුණ එලදෙන. 2. තරුණ ගැණු සතා

නෑබිලිය = 1. හාල් ගරන මැටි භාජනය.

නෑම = 1. ස්නානය කිරීම; ශරීරය ජලයෙන් පවිත්‍ර කර ගැනීම.

නෑඹ = (නැම්බි, නැඹි) 1. තරුණ ගැණුසතා. 2. තරුණ එලදෙන.

නෑමුවා = 1. මුව වර්ගයක්.

නෑය = 1. න්‍යාය; ක්‍රමය. 2. යුක්තිය.

නෑණ = 1. නැ ලණුව; නාස් ලණුව.

නෑයා = 1. ඥතියා; නෑදෑයා.

නෑර = 1. අත් නොහැර. 2. එක්වම; නැටුවම

නෑරුහැන් = 1. නාස්ලණුව.

නෑලී = 1. නොඇලී.

නෑවැඩ = 1. ඥතීන්ගේ දියුණුවට කටයුතු දේ.

නෑ සමාම් = 1. ඥතීන්ගේ සමාගමය.

නෑසි = 1. දියසොරොව්ව.

නෑසිය = 1. සවකීය ඥතියෝ. 2. ඥතී වූ සවකීයයෝ. 3. ලේදරා නෑයෝ. 4. ඥති මිත්‍රාදීහු.

නෑසුණු = 1. නොඇසුණු.

නෑහිමි = 1. නෑවේ ස්වාමියා.

නි

නි = 1. ප්‍රතිෂේධ; වැළැක්වීම. 2. නැති. 3. අභාව. 4. පිට. 5. තුළ. 6. සැකය. 7. ඇතුළත් බව. 8. ගඹගාව. 9. දීම. 10. නුවණ. 11. විඳීම. 12. නිශ්චය. 13. බැඳීම. 14. සමීපය. 15. මාත්‍රය. 16. කාන්තාර මාර්ගය.

නිංශිරාව = 1. නිත්දුව.

නිඃක්ෂිප්ත = 1. එපායැයි අස්කළාවූ. 2. ඉවත දැමූ.

නිඃක්ෂේපණ = 1. ඇපය. 2. ඒපා කිරීම.

නිඃශේෂ = 1. ශේෂයක් නැතිව. 2. සම්පූර්ණයෙන්.

නිඅලම්බ = 1. එල්ලීමක් නැති.

නිකා = 1. එතම් ගස් වර්ගය.

නිකට = 1. සමීපය. 2. යටිතල්ලේ ඉදිරි කොටස.

නිකන්ති = 1. බලවත් ආශාව. 2. තෘෂ්ණාව.

නිකම්ම = 1. කරුණක් නැතිව. 1. වියදමක් නැතිව.

නිකම් = 1. ක්‍රියාවක් නැති. 2. වැඩක් නැති. 3. ඉබේ. 4. හේතු රහිතව. 5. සාමාන්‍ය.

නිකර = 1. සමූහය. 2. රාශිය. 3. මදය. 4. සාරය. 5. සුදුසු තෑග්ග. 6. ධනය. 7. රශ්මිය.

නිකරණ = (නිකරුණ) 1 නිෂ්කාරණ. 2. කරුණක් නැති. 3. හේතු රහිත.

නිකරුණේ = 1. නිෂ්කාරණේ.

නිකර්ෂණය = 1. මිදුල.

නිකස = 1. හණගල. 2 උරගල.

නිකසල = 1. කිලුටු නැති. 2. නිර්මල.

නික් = 1. කලන් පසළොස්ක බර. 2. කලන් විසි පහක බර. 3. රන් කාසියක්.

නික්කඞ්ඛ = 1. සැක නැති.

නික්කඩ්ඪන = 1. නෙරපීම.

නික්කණ්ටක = 1. කටුනැති. 2. සතුරු විසවුල් නැති.

නික්කුජ්ජිත = 1. උඩු පිට යටට පෙරළුණු. 2. පෙරළුණු. 3. යටි කුරු කළ.

නික්කුහ = 1. රැවටිලි නැති 2. කුහක නොවූ

නික්කෝධ = 1. ක්‍රෝධ රහිත. 2. තරහ නැති.

නික්ඛම = 1. නික්ම යෑම.

නික්ඛේප = 1. දැමීම. 2. බහා තැබීම.

නික්ම = (නික්මී) 1. පිටවී. 2. පිටත්ව.

නික්ම යාම = 1. පිටත්ව යාම.

නික්ලේශී = (නික්ලේශ) 1. නිකෙලෙස්; කෙලෙස් රහිත. 2. අකාම; නිර්මල.

නිකා = 1. සමූහය. 2. ඇතුන් බඳින දම්වැල.

නිකාම = 1. රාග සිත් නැති 2. කෙලෙස් රහිත.

නිකාමනා = 1. ආශා කිරීම.

නිකාය = 1. සමූහය. 2. පක්ෂය. 3. සමානවර්ගය. 4 ගෙය. 5. රැළ. 6. ලබ්ධිය. 7. කොටස.

නිකායික = 1. නිකායට අයත්.

නිකාරණය = 1. මරා දැමීම.

නිකාරය = 1. අසතුර. 2. නිග්‍රහය.

නිකාස = 1. සමීපය. 2. සමාන

නිකැලල් = 1. කැලැල් රහිත.

නිකිණි = 1. පස්වැනි චන්ද්‍ර මාසය. 2. සොයාගත නොහැකි දේ සෙවීම ගැන උපමාවක්.

නිකිට්ඨ = 1. ලාමක. 2. පහත්.

නිකුඤ්ජ = 1. ලැහැබ. 2. වැල්වලින් මුවාවූ ස්ථානය. 3. ලිය ගොමුව.

නිකූජිත = 1. පක්ෂි නාදය. 2. පක්ෂි නාදයෙන් යුක්ත වූ.

නිකුට = (නිකුටු) 1. නිකෘෂ්ට.

නිකුරුම් = 1. අනර්ඝ.

නිකුත් = 1. පිටත්ව ගිය. 2. නික්මුණු. 3. මැරුණු.

නිකුත් කරනවා = 1. පිටකරනවා. 2. යවනවා.

නිකුම්භ = 1. කුම්භකර්ණ ගේ පුත්‍රයා.

නිකුඹ = 1. දන්ත. 2. කියන් දත. 3. කොල්ලන් ගස.

නිකෘත = 1. වංක. 2. රැවටුණු. 3. පහකරනලද.

නිකෘෂ්ට = 1 අධම. 2. පහත්. 3. නීච.

නිකෙලෙස් = 1. කෙලෙස් නැති.

නිකේත = (නිකේතන) 1. වාසස්ථානය; ගෙය.

නිඛාත = 1. හැරූ.

නිඛාදන = 1. නියන. 2. හාරන ආයුධය.

නිඛිල = 1. සමස්ත. 2. සියලු. 3. මුළු.

නිග = (නිගන්-නිගා) 1. නින්දාව.

නිගම = 1. නිගණ්ඨයා; නග්න තාපසයා.

නිගඩ = 1. හැකිල්ල; විලංගුව.

නිගණ්ඨ = 1. නිර්වස්ත්‍ර තාපසයා. 2. ජෛන දිගම්බරයා.

නිගණ්ඨ නාථ පුත්‍රයා = 1. නිගණ්ඨයන්ගේ ඥාත පුත්‍ර නමැති ශාස්තෘවරයා.

නිගණ්ඨි = 1. නිසණ්ඨ ස්ත්‍රිය.

නිගත = 1. අපහාස කරන ලද.

නිගදය = 1. මැතිරීම. 2. කථා කිරීම.

නිගම = 1. නියම් ගම; වෙළඳම් පොළවල් සහිත විශාල ග්‍රාමය. 2. නිශ්චය; තීරණය. 3. වෙළඳම. 4. මාගීය. 5. වේදය.

නිගමනය = 1. තීරණය. 2. විනිශ්චය. 3. අවසන්හි කියන දෙය.

නිගම ග්‍රාම = 1. නියම් ගම.

නිගම වාසියා = 1. නුවර වැසියා.

නිගය = 1. සැපය.

නිගරණය = 1. උගුර. 2. ආහාර.

නිගරු = 1. අවනම්බු.

නිගල = (නිගළ) 1. විලංගුව. 2. අලින් බඳින දම්වැල. 3. බෙල්ලේ බඳින පටිය.

නිගළ = 1. ඇතුන් බඳින දම්වැල.

නිගහය = (නිගාව) 1. අපහාසය. 2. නින්දා කිරීම

නිග්ගත = 1. නික්මුණු. 2. පිටතට ගිය.

නිග්ගම = (නිර්ගමන) 1. පිටවීම. 2. නික්මයාම.

නිග්ගය්හ = 1. නින්දා කොට.

නිග්ගහ = 1 දෝෂාරෝපනය. 2. නින්දාකිරීම.

නිග්ගහීතය = 1. නිග්‍රහ ලැබූ 2. බිංදුව. (ං)

නිග්ඝෝස = 1. තද ඝෝෂාව. 2. ගාලගෝට්ටිය.

නිග්ගුම්බ = 1 පඳුරු හෝ අවුල් රහිත.

නිග්ගුණ්ඩි = 1. නික ගස.

නිඝාදය = (නිගදය බලන්න.)

නිගූඪ = 1. සැඟවුණු.

නිගුව = 1. හිත. 1. සිහිය.

නිගුල්හ = (නිගූඪ) 1. ඉතා ගැඹුරු. 2. නොපැහැදිලි.

නිගූඪ තාව = 1. ගාඪතාව. 2. ගම්භීරතාව. 3. සැඟවුණු බව.

නිගාහණීය = 1. මැඩපැවැත්විය යුතු. 2. මැඩපැවැත්විය හැකි.

නිඝාහිතය = 1 නැසිරවීම. 2. මඳක් නැවැත්වීම. ගමන් කිරීමේ නිදහස අඩු කිරීම.

නිඝෝෂ = (නිඝොස්) 1. ප්‍රතිරාවය. 2. ඡේං කාරය. 3. ගාලා ගෝට්ටිය. 4. ඇඬීම. 5. ඇඬලීම.

නිග්‍රහ = 1. නින්දා. 2. දෝෂාරෝපනය. 3. යටත් කරගැනීම. 4. ගණන් නොගැනීම; නොසැලකිල්ල. 5. නියම තත්වය නොදීම. 6. හරසර නොදැක්වීම.

නිග්‍රහණ = 1. අතාථ.

නිග්‍රා = 1. කඳුළු; ඇස්දහර.

නිග්‍රාහය = 1. ශාප කිරීම.

නිග්‍රාහ්‍ය = 1. නින්දා කටයුතු.

නිග්‍රෝධය = 1. බඹය. 2. නුග ගස.

නිග්‍රෝධ පක්ක = 1. ඉදුණු නුග ගෙඩිය.

නිග්‍රෝධ පරිමණ්ඩලය = 1. දණ දක්වා වැටෙන අත් ඇති. 2. මහතට ගැලපෙන උස ඇති.

නිඝණ්ඩුව = (නිඝණ්ඩුව) 1. කෝෂ ග්‍රන්ථය. 2. නාමාවලිය.

නිඝණ්ඩු කෝෂය = 1. වචන පොත. 2. අකාරාදිය. 3. ශබ්ද කෝෂය.

නිඝත = 1. මෙහෙකාර. 2. වසඟ. 3. පරාධීන; අනුන්ගෙන් ජීවත්වන්නාවූ.

නිඝංස = 1. ඉලීම. 2. උරච්චිකිරීම.

නිඝංසන = (නිඝර්ෂන) 1. එකට ගැටීම. 2. එකට ඉලීම.

නිඝාත = 1. නැසීම. 2. මැඩලීම.

නිචය = 1. රාශිය. 2. රැස් කිරීම. 3. කැටිකිරීම.

නිච්ච = 1. නිත්‍ය; ස්ථිර; සදාකාලික. 2. නිතරම.

නිච්චය = (නිච්චිය) 1. දැනීම. 2. වැටහීම. 3. ස්ථිරත්වය. 4. මතක.

නිචිත = 1. රැස්කළ. 2. සම්පූර්ණ.

නිචුල = 1. මිදෙල්ල ගස.

නිචුලකාය. = 1. ලය වැස්ම. 2. පපුව වැස්ම.

නිචෝලය = 1. වැස්ම. 2. දිය කබා.

නිජ = 1. ස්වකීය. 2. තමා අයත්. 3. සදාකාලික.

නිජ්ජර = (නිර්ජර) 1. ජරාව නැත්තා .2 දෙවියා. 3. නොදිරන.

නිජ්ජීවංග = 1. වලි කුකුළා.

නිජ්ජීව = 1. ප්‍රාණය නැති.

නිජ්ඣරය = 1. දිය ඇල්ල.

නිජ්ඣායන = 1. පසු තැවිල්ල.

නිජ්ඣාම තණ්හික = 1. ප්‍රේත නිකායක්.

නිට = 1. වටිනා. 2. අහගි.

නිටකිට = 1. අහසී?

නිටලය = 1. නළල.

නිටුල් = (නිටොල්) 1. ගස් වර්ගයක්.

නිට්ටා = 1.ඇට්ටේරියා ගස.

නිට්ඨා = (නිට්ඨා, නිෂ්ඨාව)1. අවසානය. 2. තමාර වීම. 3. නිත්දුව. 4. සම්පූර්ණ වීම. 5. නැතිවීම.

නිඨාන = 1. අවසන් වීම.

නිඨිත = 1. අවසන් කරන ලද.

නිඨාපිත = 1. නිමාවට පැමිණවූ. 2. අවසන් කළ.

නිඩ්ඩ = 1. වාසස්ථානය. 2. කුරුළු කූඩුව.

නිනද = (නිනාද) 1. හඬ. 2. ප්‍රතිරාවය. 3. නාදය.

නිනච්ච = 1. නිච්චිය. 2. සිහි-කල්පනාව. 3. මතක.

නින්න = 1. පහත්වූ 2. නැඹුරුවූ. 3. ගැඹුරුවූ. 4. පහත් බිම. 5. ගැඹුරු වළ. 6. නැමුණු.

නින්නගා = 1. ගඞ්ගාව.

නින්නතා = 1. පහත් බව. 2. නැඹුරු බව.

නින් නහුතය = 1. එනම් ගණන.

නින් නාදය = 1. ශබ්දය. 2. ඝෝෂාව. 3. ගාලා ගෝට්ටිය.

නින්නාදී = 1. මහත් නාද කරන. 2. සවර අවෙන් එකක්.

නින්ද = 1. සැතපීම; නිදීම.

නින්ද ගම = 1. අයිති කාරයා විසින් ගම ගම් කොන්දේසි ඇතිව ගම් වැසියකට බාර කොට තිබෙන ගම හෝ ඉඩම.

නින්දන = 1. නින්ද කිරීම.

නින්දා = 1. අපහාසය. 2. අවමන් කිරීම; නින්දුව.

නිඤ්ඤත = 1. අවමන් ගෙනදෙන. 2. ලාමකවූ. 3. අවනම්බු සැලසෙන.

නින්දේම = 1. නිදා සිටියදීම. 2. අයිති කරගෙන.

නිතම්බ = 1. තුනටිය. 2. තට්ටම. 3. පර්වත පාර්ශ්වය.

නිතම්බිනී = 1. ලස්සන උකුලක් ඇත්තී. 2. කාන්තාව.

නිතඹ = 1. උකුල. 2. තුනටිය.

නිතර = (නිතරම) 1. සැම වේලේම; හැම තිස්සෙම; සදහටම.

නිතරංග = 1. තරංගයක් නැති.

නිතල = 1. පතුලක් නොපෙනෙන තැන. 2. අපායක නමක්.

නිත් = (නිත්‍ය) 1. සදා කාලික; නිතර පවත්නා; නිරන්තර.

නිත්ත = (නිත්‍ය) සදා කාලික. 2. නොකඩවා පවත්නා.

නිත්තණ්හ = 1. තණ්හාව නැති.

නිත්තිණ්ණ = 1. එතරවූ. 2. පසු කොට ගිය.

නිත්තේජ = 1. තේජස් නැති.

නිත්තෝජන = 1. රාජකයා. 2. පිරිසිදු. 3. අවමන් කුවූ.

නිතැත් = 1. නිරුත්සාහ; උත්සාහ නැති.

නිතැතින් = 1. පහසුවෙන්; නිරුත්සාහයෙන්.

නිති = (නිතින්, නිත්තෙන්) 1. නිරන්තරයෙන්; නිතොරම; නිතරම.

නිතිනි = 1. පැණිරස.

නිතිනින්ද = 1. එකම.

නිතිප්‍රභා = (නිතිලෙස) 1. නිතරම. 2. දවස ගානේම.

නිතෙජ = (නිත්තේජ) 1. තේජස් රහිත.

නිත්තොන්ම = 1. නිතරම. 2. ඒකාන්තයෙන්ම.

නිතොර = 1. තොරතොවූ. 2. නිතරම.

නිතොරව = 1. නොනැවතී. 2. තොරතොවී.

නිත්‍යජීවී = 1. නිතර ජීවත්වන

නිත්‍යපලාශ = 1. නිතරම අමු කොළ ඇති.

නිත්‍යඵල = 1. නිතර ඵලදාව ඇති.

නිත්‍යයෙන් = 1. නිතරම; නිත්‍යයෙන්.

නිත්‍යානිත්‍ය = (නිත්‍ය + අනිත්‍ය) 1 සදාකාලික වූද සදාකාලික නොවූද; නිතර පවත්නා වූද නිතර නොපවත්නාවූද

නිදන = 1. නිධානය. 2. නිදන්නාවූ. 3. නිර්ධනවූ; දිළිඳුවූ

නිදනයා = 1. දිළින්දා. 2. අනාථයා.

නිදනවා = 1. නිදාගන්නවා; සැතපෙනවා.

නිදන්කරනවා = 1. පොළොව යට වස්තුව තැන්පත් කොට තබනවා.

නිදන්වඩුල = 1. නිදන් පිළිබඳ විස්තර ලියා ඇති පොතක්.

නිදර = (නිජර බලන්න)

නිදරදී = 1. ණය නැති.

නිදරණ = 1. සමූහයකින් එකක් තෝරා ගැනීම.

නිදර්ශකය = 1. උදාහරණය.

නිදර්ශන මාර්ගයෙන් = 1. උදාහරණ වලින්

නිදය = 1. ආදරය. 2. බැල්ම.

නිදස් = 1. නිදහස්.

නිදස්සන = 1. නිදර්ශනය. 2. උදාහරණය 3. පෙන්වීම.

නිදසුන = 1. නිදර්ශනය. 2. උදාහරණය.

නිදහස = (නිදහස් කම, නිදහස්කාර කම) 1. දාස භාවයක් නැති. 2. වහල් බවක් නැති. 3. යටත් කමක් නැති. 4. මිදීම.

නිදහස් කාරයා = 1. වරදක් නැති තැනැත්තා 2. නිවැරදි කාරයා.

නිදහස්කාරය = 1. නිදහස් කිරීමට දෙන ලියවිල්ල.

නිදාඝ = 1. උෂ්ණය. 2. උෂ්ණ කාලය; ග්‍රීෂ්ම කාලය.

නිදාඝකර = 1. උෂ්ණය ඇතිකරන්නා; සූර්යයා

නිදාන = 1. හේතුව. 2. මුල් කාරණ. 3. අවස්ථාව. 4. කාරණය. 5. මුල් බැස්ස. 6. කල් යාමෙන් ශරීර ගතවූ. 7. නිධානය.

නිදානකථා = (බුදුන් වහන්සේ පිළිබඳ කාල තුනක්) 1. බෝධිසත්ව කාලය. 2. බුදුබව ලබන ආත්මයේ බුදුබව ලබනතුරු කාලය. 3. බුඩත්වයට පැමිණි පසු කාලය.

නිදානය = 1. පොළව යට සැඟවුණු වස්තුව. 2. මුල් කාරණ. 3. රෝගය හට ගැනීමට මූල.

නිදාලන් = 1. නිදාගත්.

නිදාවැටෙනවා = 1. නින්ද යනවා; නිදි කිරනවා. 2. නිදිමතින් ඉන්නවා.

නිදූලි = 1. ලජ්ජා රහිත.

නිදූල්ලේ = 1. ඉබාගාතේ. 2. දඩාවතේ. 3. ලජ්ජා නැති සේ 4. නිදහස් ලෙස.

නිදූස් = 1. ඇතා.

නිදි = (නිදි) 1. නින්දිත. 2. නින්ද 3. නිධානය. 4. නීවභාවය.

නිදිලවම් = 1. නින්‍ද්‍යෝපමාව.

නිදිකාරනවා = 1. නිදාගන්ට සලස්සනවා.

නිදිකිරනවා = 1. නිදාවැටෙනවා. 2. නිදිබර ගතියෙන් හිස සලනවා.

නිදිකුම්බා = (නිදිකුඹ) 1.එනම් වැල.

නිදිගෑම = 1. නින්ද නමැති බැම්ම. 2. නිදිමත ගතිය.

නිදිග්ධ = 1. ගාන ලද. 2. තවරන ලද.

නිදිද්දි = 1. කටුවැල් බටු.

නිදිපසස් = 1. නින්දා ප්‍රශංසා.

නිදිපරහ = 1. නින්දේදී කොට්ටය හරිහැටි නොතැබීමෙන් බෙල්ලේ ඇතිවන උළුක්කුව.

නිදිපෙර = 1. නින්දට පළමු.

නිදිපොලගා = 1. පොළොන් වර්ගයක්.

නිදිබර = 1. නිදිමත ගතිය.

නිදිමත = 1. නිදාවැටෙන සවභාවය. 2. නිදිබර නිසා ඇතිවන මත්ගතිය.

නිදියන්ත්‍ර = 1. නිදිගන්වන මන්ත්‍ර විශෙෂයක්.

නිදි මරනවා = (නිදි වරනවා) 1. නිදා නොගෙන සිටිනවා.

නිදි මැලි = 1. නිදිබර ගතිය නිසා ඇතිවන කම්මැලි ගතිය.

නිදි ම් පොලගා = 1. එනම් සර්පයා.

නිදිම් = 1. දිව නැත්තා 2. ගොළුවා.

නිදිෂ්ට = 1. අණකරන ලද. 2. තේරුම් කරන ලද. 3. අවවාද කරන ලද.

නිදිසුව = 1. සැතපුණු. 2 නින්ද නමැති සුවය.

නිදු = 1. නින්ද. 2. නීචයා. 3. සොරා.

නිදු = (නිදු) 1. සමුද්‍රය. 2. ප්‍රධානයා. 3. නින්ද. 4. නීචයා.

නිදු අවරයා = 1. සොරා. 2. නිදි වරන්නා 3. මං පහරන්නා.

නිදුකා = 1. දුක් නැත්තා.

නිදුක් කරනවා = 1. දුක් නැති කරනවා 2. සුවපත් කරනවා.

නිදුව = 1. නින්ද.

නිදෙස් = . නිර්දේශය 2. විස්තරය.

නිදොස් = 1. දොස් රහිත; නිර්දෝෂ.

නිද්දය = 1. කරුණා නැති.

නිද්දර = 1. දුක නැති. 2. කෙලෙස් තැවීම නැති.

නිද්දූ = 1. නිද්‍රාව; නිදීම.

නිද්‍රව = 1. තෙත් නැති. 2. වියලුණු.

නිද්‍රා = 1. නින්ද

නිද්‍රා ජනක = 1. නින්ද ඇතිකරන; නිදි කරවන.

නිද්‍රාපන්න = (නිද්‍රා + ආපන්න) 1. නින්දට පිවිසි.

නිද්‍රාලු = 1 නිදි බර. 2. අලස.

නිද්‍රාව = 1. නින්ද. 2. අලසකම.

නිද්‍රාශීලී = 1. නිදියනසුලු; ස්වභාවයෙන්ම නිදන.

නිද්‍රොපගත = (නිද්‍රා + උපගත) 1. නින්ද ගිය.

නිද්‍රොප ගමනය කරනවා = 1. නිදා ගන්නවා.

නිධන = 1. නිර්ධන; දිළිඳු. 2. නැසීම.

නිධනය = 1. මරණය. 2. නාතිය. 3. වංශය.

නිධනප්‍රාප්ත = 1. මැරුණු.

නිධාන = 1. තැන්පත් කිරීම. 2. පොළොව යට සඟවා තැබූ ධනය. 3. වස්තුව.

නිධිය = (නිධි) 1. ධනය; වස්තුව. 2. නිධානය. 3. සාගරය. 4. භාණ්ඩාගාරය. 5. ප්‍රධානයා.

නිදි කුම්භ = 1. නිධානය බහාලූ කළය; නිදන් කළය.

නිධිපති = 1. කුවේරයා; වෛශ්‍රවණ.

නිධ්‍යානය = 1. දර්ශනය. 2. කල්පනා කිරීම. 3. අවබෝධය.

නිප = (නීප) 1. ගස් වර්ගයක්.

නිපක = 1. දක්ෂවූ. 2. බුද්ධිමත්.

නිපච්ච = 1. වැටී 2. බිම වැටී.

නිපජ්ජ = 1. හොවැ 2. ලැග. 3. නිදා. 4. දිග ඇදී.

නිපඨන = (නිපාඨන) 1. (පොත්) කියවා බැලීම.

නිපනකා = 1. මත්ස්‍යයා.

නිපන් = 1. නිෂ්පන්න; උපන්න. 2. හටගත්. 3. (ව්‍යාකරණයෙහි) ස්වකීය භාෂාවෙහිම හටගත් වචන.

නිපන්න = 1. හොත්. 2. ලැගි. 3. නිදාගත්.

නිපන = (නිපැන්, නිෂ්පත්තිග) 1. හටගත්. 2. සිඳවූ. 3. ඉපදීම.

නිපතන = 1. වැටීම.

නිපත් = 1. ඉපදීම.

නිපතිත = 1. වැටුණු.

නිපද = 1. උපද්දා; උපදවන ලද.

නිපය = 1. උප්පැත්තය.

නිපරමාදි = 1. පමා නැති.

නිප්පක්ඛ = 1. කකාරවන ලද.

නිප්පපඤ්ච = 1. ප්‍රමාද නැති. 2. කෙලෙස් නැති.

නිෂ්පභ = 1. එළියක් නැති.

නිප්ඵල = 1. ඵල රහිත; ගෙඩි නැති.

නිපා = 1. නිපාතය.

නිපාන = (නිපානග) 1. පාන ඔරුව; බිමට දිය ගන්නා ඔරුව. 2. වතුර බොන ස්ථානය. 3. ළිඳ. 4. ගොඩුක් පැන් බොන වල ගොඩ ඔරුව. 5. නිර්දේශිත භාජනය. 6. බිම්

නිපාත = 1. වැටීම. 2. හැලීම. 3. බැසීම. 4. පොතක ඒක නිපාතාදි කොටසක්. 5. (ව්‍යාකරණයෙහි) විභක්ති නැති, වරනැගිය නොහැකි ශබ්ද කොටස.

නිපාතනය = 1. හෙළීම. 2. බැස්සවීම.

නිපාතිත = 1. හෙළන ලද.

නිපාතී = 1. වැටෙන්නා. 2. නින්දට යන්නා.

නිපුණ = 1. පුහුණු වූ. 2. දක්ෂ වූ. 3. උගත්. 4. පලපුරුදු වූ.

නිපුණභාවය = 1. දක්ෂ භාවය. 2. පල පුරුද්ද.

නිපුණ වෙනවා = 1. පුහුණු වෙනවා.

නිපුස් = 1. වැඩිවියට පැමිණුණු ගැණු ළමයා. 2. නපුංසක.

නිපොල් = 1. කටුව සවිනැති පොල් ගෙඩිය; කුරුම්බාව. 2. පොරපොල් ගැසීමටගන්නා සාමාන්‍ය පොල් ගෙඩිය.

නිබ = (නිඹ) 1. කොහොඹ.

නිබඳ = 1. සම්බන්ධ භාවය. 2. ඇලුණු ගතිය. 3. බැඳීම.

නිබද = 1. නිතරම.

නිබද්ධ = 1. නිතර බැඳුණු. 2. නිරන්තර. 3. වෙන්වීමක් නැති. 4. ස්ථිර අදහස.

නිබන්ධන = 1. බැඳීම. 2. ප්‍රබන්ධය. 3. ඇලුම. 4. ඇවිටිල්ල.

නිබන්ධිත = 1. බැඳි. 2. වෙන් වීමක් නැති. 3. ප්‍රබන්ධ කරන ලද.

නිබම = 1. නිම්වළල්ල. 2. රෝද පට්ටම.

නිබ්බත්ත = (නිබ්බත්ති) 1. උපන්. 2. හටගත්. 3. සිඩ වූ.

නිබ්බත්තක = 1. උපදවන.

නිබ්බත්තන =. ඉපදීම. 2. හට ගැනීම.

නිබ්බාන = 1. නිර්වාණය; නිවණ. 2. නිවීම. 3. සැනසීම.

නිබ්බාන සම්පත්ති = 1. නිවන් සැප.

නිබ්බාපන = 1. නිවීම. 2. සිහිල් කිරීම.

නිබ්බාහන = 1. ඉවත් කිරීම.

නිබ්බිද = 1. කල කිරීම. 2. සංවේගය.

නිබ්බුත = 1. නිවුණු. 2. සත්පුන්. 3. නිවනට පැමිණි.

නිබ්බුත පද = 1. සත්පුන් වචන.

නිබ්බුති = 1. නිවන. 2. නිවීම.

නිබ්බෙඨන = 1. වෙළුම් ඉවත්කිරීම. 2. ලිහිල් කොට විස්තර කිරීම.

නිබ්බෙධ = 1. නියුණු අවබෝධය. 2. විනිවිද යාම.

නිබොරු = 1. බොරුනොවූ; සැබෑ.

නිබ්භය = 1. භය රහිත.

නිබ්භොග = 1. ප්‍රයෝජන ගත නොහැකි; නිෂ්පල.

නිබුල්ලු = (නිඹුල්ලු) 1. මව්කුසේ එකට ඇතිවූ දරුවෝ.

නිඹ = 1. කොහොඹ ගස.

නිඹ බිජු = 1. කොහොඹ ඇට.

නිඹුළ් = 1. නෙළුම් මල්.

නිබෝ = 1. සියලු.

නිස = 1. සමානවූ.

නිභා = 1. බැබලීම. 2. එළිය.

නිභය = 1. වංචාව.

නිභාත = 1. යටහත්. 2. පහත්. 3. නියාලු.

නිම = 1. නිමාව; අවසානය. 2. නීත්දුව. 3. සීමාව. 4. නිම් වළල්ල.

නිම කරනවා = 1. අවසන් කරනවා.

නිමග්න = 1. ගිලුණු. 2. දියේ ගිලිණු.

නිමජ්ජනය = 1. නැම.

නිමන = 1. රාජ ධනය. 2. උපදින. 3. ආදායම ලැබෙන. 4. නිමවන.

නිමනවා = 1. අවසාන කරනවා. 2 (ශිති) නැති කරනවා.

නිමන සුන් වන් = 1. උපදින අයබදු.

නිමනැති = 1. කෙළවරක් නැති 2. සීමාවක් නැති.

නිමන්තන = (නිමන්ත්‍රණය) 1. කැඳවීම. 2. ආරාධනය. 3. පැවරීම.

නිමන්තිත = (නිමන්ත්‍රිත) 1. කැඳවනු ලැබූ. 2. ආරාධිත වූ.

නිමන්ත්‍රක = 1. කැඳවන්නා; ආරාධනා කරන්නා.

නිමය = 1. ගනුදෙනුව.

නිමල = 1. නිර්මල. 2. නිර්දෝෂ. 3. පිරිසිදු. 4. රත් හිරියෙල්.

නිමවනවා = 1. අවසන් කරනවා; සමාප්ත කරනවා.

නිමස් = 1. මස් නැති.

නිමහන් = 1. අවසාන වූ බව හඟවන ලකුණ. 2. නේත්‍රා පිහිටුවීම.

නිමි = 1. සීමා.

නිම්න = 1. පහත්. 2. ගැඹුරු. 3. නැමුණු.

නිම්නතාව = 1. පහත්බව. 2. ගැඹුරුබව.

නිම්න භූමි = 1. පහත් බිම. 2. මිටියාවත.

නිම්නගා = 1. පහත් බිම. 2. ගංගාව.

නිම් නොන්නත = (නිම්න + උන්නත) 1. උස් පහත්. 2 සමතලා නැති.

නිම්බ = 1. කොහොඹ ගස.

නිම්බ බීජ = 1. කොහොඹ ඇට.

නිම්ම = (නිම්මාව) 1. අවසානය. 2. තීරණය.

නිම්මතුව = 1. කෙළවර; අවසානය; සම්පූර්ණ වීම.

නිම් වළල්ල = 1. රෝද පට්ටම.

නිමා = 1. රෝද පට්ටම. 2. අවසානය. 3. සීමාව.

නිමාම් = 1. කෙළවර; අවසානය.

නිමාව = 1. කෙළවර. 2. සීමාව. 3. තීන්දුව.

නිමි = 1. පැරණි රජෙක්. 2. අවසානය.

නිමිච්ච = 1. නිවිච්ච; නිවුණු. 2. සිහිල් වූ. 3. ශාන්ත වූ ගති පැවතුම් ඇති.

නිමිජ = 1. කුරුල්ලෙක්.

නිමිත = (නිමිත්ත) 1. නැකැත් බැලීම. 2. කාරණය. 3. ශුභාශුභ ලක්ෂණ. 4. ඇඳින ගැනීමට යොදන ලකුණ. 5. පූර්ව ලක්ෂණය. 6 මුල. 7. හේතුව. 8. අරමුණ.

නිමිත් = 1. හේතුව. 2. නැකැත්. 3. නිමිත්ත.

නිමිත්ත ග්‍රහණය = 1. රූපයක් දුටු අසවල් අවයව ග්‍රහණය ආදී වශයෙන් සිතට ගැනීම.

නිමිත්ත පාඨක = 1. නිමිති කියන්නා. 2. ශුභාශුභ විපාක කියන්නා.

නිමිත්ත මාත්‍රයා = 1. කළමනා කාරයා.

නිමිතිගල = 1. සීමා ගල.

නිමියක් = 1. අවසන් වූ. 2. කෙළවර.

නිමියන=1 කෙළ පැමිණි. 2. නිමවා ඉගෙනගත්.

නිමීලන = 1. ඇසිපිය; ඇස් පියාවූ. 2. ඇසිපිය වැසීම. 3. බැලීම.

නිමිසය = (නිමේස, නිමේෂය) 1. ඇසිල්ල. 2. මොහොත. 3. ඇසි පිය හෙළීම.

නිමිලිත = 1. ඇස් පියාගත්.

නිමුග්ග = 1. ගිලුණු. 2. දිය යටට ගිය.

නිමුජ්ජන = 1. දියෙහි ගිලුම. 2. කිමිදීම.

නිමුඩු = (නිමුඩ්ඩ) 1. නිවුඩු; වීකුඩු.

නිමුඩු බත = 1. නිවුඩු සැලින් පිසූ බත.

නිමුන = (නිමූනන, නුමුත් මිටි) 1. තගුල් මිට

නිමුන් = 1. නිඹුල්ලු.

නිමෙනවා = 1. සමාප්ත කරණවා 2. සම්පූර්ණ කරනවා.

නිමෙස් = 1. ඇසිපියක් හෙළීමට ගනුවන කාලය. 2. ඇසිපිය හෙළීම.

නිමේෂ = 1. ඇසිපිය හෙළීම. 2. මල් පරවීම.

නිමේෂානන්තර = (නිමේෂ + අන්තර 1. ඇසිල්ල.

නිමොක = (නිමොක්) 1. සපී හැවය. 2. මෝක්ෂය. 3. මිදීම. 4. සන්නාහය. 5. අහස.

නිය = 1. නීතිය. 2. ක්‍රමය. 3. න්‍යායය. 4. ඥනය. 5. නියපොත්ත. 6. රියන. 7. ආකාරය. 8. කාන්තාර මාර්ගය. 9. තුවරලා. 10. නුවණැති. 11. දුම් වර්ගයක්. 12. පැලෑට්ටක්.

නියං = (නියඝ) 1. ග්‍රීෂ්ම කාලය; පැවිල්ල. 2. වැස්සනැති කාලය.

නියං කුරුල්ලා = 1. පක්ෂියෙක්.

නියං වැසි = 1. නියං සමයෙහි ඇතිවන වැස්ස. 2. අකල් වැස්ස.

නියං සාය = 1. නියඟ නිසා ඇතිවූ සාගතය. 2. දුර්භික්ෂය.

නියක = 1. තමා අයත්. 2. සවකිය.

නිය කැන් = 1. තඹ රශ්මිය.

නියග = (නිය + අග) 1. නිය පොත්තේ කෙළවර. 2. තද ග්‍රීෂ්ම කාලය.

නියඟ = 1. වැසි නැති කාලය. 2. ග්‍රීෂ්ම කාලය.

නියගලා = 1. විෂ සහිත අල ඇති වැල් වර්ගයක්.

නියඹුහුරු = 1. සුසුම්; මුඛය උඩුකුරුකර පවත්වන වාතය.

නියන = 1. ලී හාරන ආයුධය. 2. පමුණුවන.

නියන් ගම = (නියම් ගම) 1. වෙළෙඳුම් පොලවල් සහිත විශාල ග්‍රාමය.

නියතරඟ = 1. ඥාත නමැති තරඹගය.

නියත = 1. ඒකාන්තවූ. 2. නියම වශයෙන් සිදුවන. 3. නිශ්චිත.

නියත විවරණය = 1. අනාගතයෙහි සිදුවන දෙයක් ගැන කියන ස්ථිර ප්‍රකාශය.

නියතිය = 1. ඉරණම. 2. නියමය.

නියඳ = 1. තණ වර්ගයක්.

නියඳ පැදුර = 1 නියඳ තණ වලින් වියූ පැදුර.

නියපිටින් පහර = 1. නිය පොත්තෙන් ගසන පහර.

නිය පිරික්සා කැම = 1. නිය පොතු කුණු වන ලෙඩක්. 2. නිය පොතු කන පණුවා.

නිය පොත්ත = 1. ඇඟිලි අග තිබෙන ඝන පොත්ත.

නියබලා = (නියඹලා) 1. හෙරලි ආදී වැංජන උයන ක්‍රමයක්.

නියම = (නියම්) 1. නියම කළ ක්‍රමය. 2. ස්ථිර වූ. 3. සැක රහිත. 4. ව්‍යාකරණ විධියක්. 5. ආඥාව. 6. ආකාරය. 7. නිගම ග්‍රාමය.

නියමන = 1. නියම කිරීම.

නියඹුතු = 1. නගර වාසිකයා.

නියඹල් = 1. නිය නමැති මල්. 2. නිය පොතු වල හැදෙන සුදු පැහැති පුල්ලි.

නියම්ගම = 1. වෙළඳ පොලවල් සහිත විශාල ග්‍රාමය.

නියම්‍ය = 1. නියම කළ. 2. ක්‍රමානුකූලවූ.

නියමු = (නියමුවා) 1. නියමිත. 2. නැව් පද වන්නා. 3. සාක්තු නායකයා? 4. නියාමකයා.

නියමු ශාස්ත්‍ර = 1. නැව් පැදවීම පිළිබඳ ශාස්ත්‍රය.

නියර = 1. වේල්ල. 2. වතුර නොගැලීමට බඳින බැම්ම. 3. ක්‍රමය. 4. ගොඩ.

නියරස් = (නියරැස්) 1. තඹ රශ්මිය; නිය පොතුවල ඔපය. 2. ඥානය නමැති ආලෝකය.

නියම් = 1. නගරවැසිකයා.

නියම්ය = 1. පසල් දනව්ව. 2. නගරය.

නියලි = 1. නිතර ඇලුනාවූ. 2. යෙදුණු.

නියලිය = 1. ජීතිය නමැති වැල.

නියලුම = (නියලුම්) 1. ඇල්ම. 2. දුක 3. විපත්තිය.

නියවන = 1. සරදම් වශයෙන් දත් පෙන්වන. 2. විරිත්තන.

නියව්ත් = 1. ඥානවන්තයා.

නියසන් = 1. නියෙන් දෙන සංඥාව; නියෙන් කළ ලකුණ.

නිය සැබා = 1. බොජ්ගෙඩිය.

නිය සැත් = 1. නිය පොතු කපන පිහිය.

නියහ = 1. අත්‍යයන්.

නියහතු = 1. නිය මල්.

නියා = 1. න්‍යායය; ක්‍රමය. 2. වැනි; ආකාර.

නියාම = 1. නියමිත පිළිවෙළ.

නියාමක = 1. නියාමකයා; නැව් පදවන්නා. 2. කළමනාකරු?

නියාම්කා = 1. ස්ථිර ස්වභාවය.

නියාය = 1. ක්‍රමය. 2. අත්දම. 3. තත්වය. 4. සම්බන්ධකම.

නිශාලු = 1. නිහාලු. 2. දුඹුලු. 3. පහත් තැනය. 4. දිළිඳු.

නිශාව = 1. හැටිය. 2. තත්වය. 3. සම්බන්ධකම.

නිශැලි = 1. සම්බන්ධවූ. 2. ඇලුම්වූ. 3. උකත්දුවූ. 4. වෙහෙසුණු.

නිශු = 1. මුවහත්වූ. 2 තගුල. 3. පමුණුවනලද.

නිශුක්ත = 1. යෙදුණු. 2. පත්කළ. 3. බැඳී සිටින.

නිශුක්තිය = 1. යෙදී සිටීම. 2. උකත්දුව. 3. අවසරය.

නිශුඩු = 1. නිවුඩු.

නිශුත = 1. ලක්ෂය. 2. දශ ලක්ෂය.

නිශුක්ත = (නියුක්තක) 1. යෙදී සිටින්නා. 2. නියෝජිතයා.

නිශුධ = 1. මුෂ්ටි ප්‍රහාරය; අතින් ගහගැනීම.

නිශුරු = 1. යුක්තිය. 2. සාධාරණය. 3. අධිකරණය.

නිශුළු = 1. දුක. 2. වේදනාව.

නිශෝ = (නියෝගය) 1. නීතිය. 2. අණ. 3. අවවාදය. 4. නියමය.

නිශෝජකයා = 1. නියම කරන්නා; අණ කරන්නා.

නිශෝජනය = 1. යෙදවීම. 2. අණ කිරීම.

නිශෝජ්‍ය = 1. නියෝජනයවූ. 2. යෝග්‍ය.

නිශෝජිතයා = 1. යොදන ලද්ද. 2. පත් කරන ලද තැනැත්තා. 3. යම් කිසි රටක් වෙනුවෙන් හෝ පුද්ගලයෙක් වෙනුවෙන් හෝ පෙනී සිටින්නා. 4. තානාපතියා? 5. යමක් බාරකරනලද තැනැත්තා.

නිශ්‍යාත = 1. ගෙන ගිය. 2. නික්මවන ලද.

නිශ්‍යාතන = 1. බාරදීම. 3 පාවාදීම.

නිශ්‍යාතු = 1. ගෙනයන්නා. 2. නායකයා.

නිශ්‍යාන = 1. නික්මයාම.

නිශ්‍යාණික = 1. සසරින් නිදහස දෙන. 2. නික්මීම ගෙනදෙන. 3. නිවණට පමුණුවන.

නිශ්‍යාමක = 1. කප්පිත්තා. 2. නැව් පතියා.

නිශ්‍යාස = 1. ලාටු. 2. ගස්වල කිරි.

නිර = 1. නරකය; අපාය.

නිරංගණ = (නිරජන) 1. කෙලෙස් නැති.

නිරක්ෂ = 1. අක්ෂයක් නැති.

නිරක්ෂය = (නිරක්ෂ රේඛාව) 1. භූ කක්ෂාව; භූ පරිධිය. 2. පොළොවේ හරි මැදින් වැටී ඇතැයි සලකන රේඛාව.

නිරකුර = (නිර කුරු) 1. අකුරු නැති. උඟුරු හඬ. 3. බෙල්ලේ පළඳින ආභරණය.

නිරඟල = 1. බාධා නැති. 2. අගුල් රහිත. 3. හින්දු ආගමේ ප්‍රධාන පිදීම් හතරෙන් එකක්.

නිරග්නික = (නිරග්නක) 1. ගිනි නැති.

නිරගුළු = 1. අගුල් රහිත. 2. නොවැලකීම. 3. අමුත්තා. 4. නොවැළැක්විය හැකි.

නිරබාධ = 1. බාධා නැති. 2. වැළැක්විය නොහැකි.

නිරන්න = 1. කෑම නැති. 2. නිස්බඩ. 3. සාමත්වූ.

නිරන්තර = 1. නොකඩවා පවතින. 2. අතරක් නැති. 3. නිතර.

නිරන්ධ්‍ර = 1. සිදුරු රහිත.

නිරනුකම්පක = 1. දයා නොකරන; අනුකම්පා රහිත.

නිරනුකම්ප්‍ය = 1. දයාව නොලැබිය යුතු.

නිරනුකාංක්ෂිත = 1. නො ඉල්ලන ලද. 2. ඇඳී නැති.

නිරනුකූල = 1. අනුකූල නොවූ. 2. එකඟ නැති. 3. නුසුදුසු.

නිරනුක්‍රමික = 1. පිළිවෙළක් නැති.

නිරනුඥාත = 1. අවසර නැති.

නිරනුමාන = 1. අනුමාන නැති.

නිරනුමිතිය = 1 කිසි දේවලින් ඔප්පු නොවන එකක්.

නිරනුමේය = 1· අවජානක. 2. පිළිවෙළින් සිද්ධ නොවන

නිරනු ශාසිනී = 1. තර්කානුකූල නොවූ.

නිරනු රූප = 1. නොගැළපෙන. 2. නුසුදුසු වූ.

නිරනු ෂංගික = 1. කිසි සාක්ෂ්‍යවලින් ඔප්පු නොවන.

නිරනු සූත්‍ර = 1. නියමයට විරුඬවූ. 2. පණතට විරුද්ධවූ.

නිරණ = 1. නිර්ණය. 2. සැක රහිත බව. 3. තීරණය.

නිරත = 1. ඇලුණු. 2. ආශා ඇති. 3. නියුක්ත. 4. යමක යෙදීසිටින. 5. හිස්වූ.

නිරත භාව = 1. උනන්දුව. 2, යෙදී සිටින බව.

නිරත්ථ = 1. අර්ථරහිත; තේරුමක් නැති. 2. හිස්. 3. බොල්. 4. වඳ.

නිරතුර = (නිරතුරු) 1. නිතොර; නිතර.

නිරද = (නිරදය) 1. සමුද්‍රය. 2. සඳුරුළිය.

නිරපරාධ = (නිරපරාදේ) 1. අපරාධයක් නැතිව. 2. වරදක් නැති. 3. අහිංසක. 4. නිදොස් වූ.

නිරපුළු = 1. අනෙකා. 2. අමුත්තා.

නිරපේක්ෂක = 1. බලාපොරොත්තු නැති.

නිරබ්බුද = 1. අවුල් රහිත. 2. අර්බුද නැති. 3. දොස් නැති. 4. විශාල ගණනක්. 5. අපායක නමක්.

නිරය = 1. අපාය; නරකාදිය.

නිරර්ගල = 1. අගුල් රහිත. 2. බාධා නැති.

නිරර්ගලයඥ = 1. යාගයක නමක්.

නිරර්ථක = 1. අර්ථ සුන්‍යවූ; තේරුමක් නැති. 2. ප්‍රයෝජනයක් නැති; නිෂ්ඵල.

නිරලංකෘත = 1. අලඞ්කාර නොකළ. 2. සැරසිලි නොකළ.

නිරලම්බ = 1. එල්බෙන තැනක් නැති. 2. නිදහස්. 3. සපිර නැති. 4. ආධාර රහිත.

නිරලම්බය = 1. කඳු පල්ලම. 2. ප්‍රපාතය.

නිරවග්‍රහ = 1. හිතුවක්කාර.

නිරවනත = 1. නොහැමුණු. 2. කෙළින්. ඇද නැති.

නිරවද්‍ය = 1. වරද නැති. 2. නිදොස්. 3. පිරිසිදු.

නිරවබෝධිත = 1. අඥාත. 2. යමක් අවබෝධ කරගැනීමෙහි සමත් නොවූ.

නිරවයව = 1. අවයව රහිත.

නිරවරෝධ = 1. බාධා නැති.

නිරවශේෂ = 1. ඉතුරුවක් නැති. 2. මුළුමනින්.

නිරවසාන = 1. අවසන් නැති.

නිරවුල් = 1. අවුල් රහිත.

නිරස = 1. රස නැති.

නිරසනය = පහකිරීම. 2. බාරනොගෙන හැරීම. 3. තනතම් කිරීම. 4. නැතකම.

නිරස්ත = 1. විදිනලද (ඊය) 2. අත්හැර දැමූ. 3. විසිකළ.

නිරස්ථ = 1. හිස්. 2. නැති. 3. අත්හැරුණු.

නිරස්ථි = 1. ඇට නැති.

නිරහංකාර = 1. උඩඟු නැති. 2. නිහතමානී.

නිර් = 1. නැති.

නිර්ණේජන = 1. රජකයා 2. පිරිසුදු.

නිර්ගත = 1. නික්ම ගිය. 2. නිකුත්වූ. 3. පහවූ.

නිර්ගන්ධ = 1. ගඳ සුවඳ නැති. 2. සුවඳ නැති.

නිර්ගමය = 1. දියපාර. 2. සොරොව්ව.

නිර්ගමනය = (නිර් ගමය) 1. පිටවීම. 2. නික්මීම.

නිර්ගුණ = 1. ගුණ නැති. 2. අගුණ.

නිර්ගුණ්ඩි = 1. නික ගස.

නිර්ගුම්බ = 1. අවුල් රහිත. 2. පටලැවී නැති.

නිර්ග්‍රන්ථයා = 1. තාපසයා.

නිර්ඝාත = 1. හෙණ පහර. 2. සැඩ සුළඟ.

නිර්ඝෝෂය = 1. මහා ඝෝෂාව. 2. ප්‍රතිරාවය.

නිර්ජට = 1. පැටලිලි රහිත. 2. අවුල් නැති.

නිර්ජන = 1. මිනිසුන් නැති. 2. පාළු.

නිර්ජර = 1. ජරාවක් නැති. 2. දෙවියා.

නිර්ජරය = 1. දිව්‍ය භෝජනය.

නිර්ජරයා = 1. දෙවියා.

නිර්ජල = 1. ජලය නැති.

නිර්ජීව = 1. ජීවය නැති.

නිර්ඣරය = 1. ඇල්ල. 2. කන්දකින් ගලා වැටෙන දියපාර.

නිර්ඣරධාරා = 1. කන්දකින් ඇදහැලෙන දියපාර.

නිර්ඣරිය = 1. ගඟ.

නිර්නාථ = 1. ස්වාමියෙක් නැති.

නිර්නාථතාව = 1. වැන්දඹුකම;

නිර්නාමක = 1. නමක් නැති.

නිර්ණය = 1. නිශ්චය. 2. තීරණය. 3. ඒකාන්ත බව. 4. ස්ථිරත්වය. 5. සම්පූර්ණ කිරීම.

නිර්දය = 1. දයා නැති.

නිර්දශ = 1. දශාවක් නැති.

නිර්දශන = 1. දත්රහිත.

නිර්දුස = 1. දුස භාවයක් නැති. 2. නිදහස්.

නිර්දිෂ්ට = 1. දක්වන ලද. 2. කියූ.

නිර්දේශ = 1. තෝරුම් කිරීම. 2. විස්තර කිරීම. 3. දැක්වීම.

නිර්දෝෂ = 1. නිදොස්; දොස් නැති. 2. නිදහස්.

නිර්ද්‍රව = 1. දියාරු නුවූ. 2. වියළි

නිර්ධන = 1. දිළිඳු. 2. ධනය නැති.

නිර්ධනික = 1. ධනය නැති.

නිර්ධර්මී = 1. අසාධාරණ. 2. අයුක්තිය.

නිර්ධාරණ = 1. සමූහයකින් එකක් වෙන් කිරීම. 2. ස්ථිරව සිතාගැනීම. 3. නියම කිරීම.

නිර්ධූත = 1. පහකරන ලද. 2. නැසූ. 3. සොලවා ඉවත් කළ. 4. ගසාදැමූ.

නිර්බන්ධ = 1. දැඩි ආශාව. 2. පැරුත්ත කිරීම. 3. අල්ලා ගැනීම 4. ඇවිටිල්ල.

නිර්බුද්ධි = 1. බුද්ධිය නැති; 2. නුවණ නැති.

නිර්භය = 1. භය නැති. 2. නිර්භීත.

නිර්භවය = 1. නොපැවැත්ම.

නිර්භර = 1. ඉතා වැඩි 2. මහත්වූ 3. අතිශය. 4. පැහැල්ලු වූ.

නිර්භර්ත්සිත = 1. සම්පූර්ණයෙන් පිරුණු.

නිර්භාග්‍යවන්ත = 1. භාග්‍යවන්ත නොවූ; පින් නැති.

නිර්භින්න = 1. බිඳුණු. 2. පිපුරුණු. 3. භින්න නොවූ.

නිර්භීත = 1. බිය රහිත; භය නැති.

නිර්භෞමික = 1. පොළොවට අයිති නැති. 2. මෙලොවට අයත් නොවූ.

නිර්මත = 1. කල්පනා නැති. 2. හාස ජනක; විකිළි.

නිර්මථන = 1. මැඩීම.

නිර්මර්දන = 1. මැඩීම.

නිර්මල = 1. පිරිසිදු. 2. පව් නැති. 3. වරද රහිත.

නිර්මලකම = 1. පිරිසිදු බව.

නිර්මාණය = 1. මැවීම. 2. සෑදීම. 3. දිව්‍ය ලෝකයක නාමයක්. 4. නිපදවීම. 5. රචනාව.

නිර්මාණරති = 1. එනම් දිව්‍ය ලෝකය.

නිර්මාණ ශක්තිය = 1. නිපදවීමේ බලය. 2. රචනා කිරීමෙහි ශක්තිය.

නිර්මාල්‍ය = 1. පිරිසිදු.

නිර්මිත = 1. සාදන ලද. 2. මවන ලද.

නිර්මිතාකාරය = (නිර්මිත + ආකාරය) 1. සාදන ලද අන්දම.

නිර්මිතිය = 1. සෑදීම.

නිර්මුක්ත = 1. මිදුණු.

නිර්මූල = 1. මුල් නැති. 2 අසත්‍ය.

නිර්මූලන = 1. මුලින් උපුටාලීම. 2. මුලින් සිඳ දැමීම 3. පැරදවීම.

නිර්මෝක = 1. සර්පයාගේ හැවය. 2. නිදහස් කිරීම.

නිර්මෝක්ෂය = 1. නිදහස් කිරීම 2. සර්ප හැවය. 3. යුද්ධ ඇඳුම.

නිර්යාතන = 1. පාවා දීම. 2. භාරගස්නා දීම.

නිර්යාස = 1. ලාටු. 2. දුම්මල.

නිර්යාසක = 1. පැසුණු.

නිර්යාස තෛල = 1. දුම්මල තෙල්.

නිර්යාසය = 1. ලාට්ටු; මැලියම් 2. දුම්මල. 3. කසාය. 4. සාරය.

නිර්යාස විශේෂය = 1. මැලියම් ගස.

නිර්යූහය = 1. දොරටුව. 2. ලී ඇණය. 3. කසාය. 4. මාලාව.

නිර්ලජ්ජා = (නිර් ලජ්ජා) 1. ලජ්ජා නැති.

නිර්ලෝභ = (නිර් ලෝභී) 1. ලෝභ නැති.

නිර්වචන = 1. නිශ්ශබ්ද. 2. වචන නොකරන. 3. නිරුක්තිය.

නිර්වර්ණ = 1. පාටක් නැති.

නිර්වර්තන = 1. නිපදවීම.

නිර්වර්තිත = 1. නිපදවන ලද; සාදන ලද.

නිර්වස්ත්‍ර = 1. රෙදි නොඇඳි; විලි වසා නොගත්.

නිර්වාකාර = 1. වෙනස් නොවන්නාවූ.

නිර්වාන්ත = 1. වැමෑරූ. 2. වැගුණු.

නිර්වාණ = 1. 'වාන' නම්වූ. තණ්හා බැම්මෙන් මිදුණු මෝක්ෂය. 2. නිවණ; සංසාරයෙන් මිදීම.

නිර්වාණ සම්පත්ති = 1. නිවණ නමැති සම්පත.

නිර්වාත = 1. සුළං නැති.

නිර්වාද = 1. ලෝක අපවාදය.

නිර්වාපන = 1. නිවීම. 2. සිසිල් කිරීම.

නිර්වාපිත = 1. එවන ලද.

නිර්වාර = නොවැළැක්වූ. 2. නැවැත්වූ;

නිර්වාසන = 1. නගරයෙන් පිටුවහල් කිරීම 2. මරණය. 3. පීඩා කිරීම.

නිර්විකල්ප = 1. නොවෙනස්. 2. නොපෙරළුණු.

නිර්විකාර = 1. වෙනසක් නැති.

නිර්විණ්දන = 1. කලකිරීම. 2. සංවේගයට පැමිණීම.

නිර්විෂ = 1. විෂ රහිත.

නිර්විශේෂ = 1. වෙනසක් නැති 2. සමාන. 3. එකාකාර.

නිර්වීර්ය = 1. උත්සාහ නැති.

නිර්වෘති = 1. සැපීම. 2. නැවතීම. 3 නිවණ. 4. දිව්‍ය ලෝකය.

නිර්වේෂ්ටන = 1. වෙළුම් වෙනස් කිරීම. 2. අවුල් හැරීම.

නිර්වේද = 1. වේදයට වෙනස්වූ. 2. කලකිරීම.

නිර්වේදය = 1. වේදයට වෙනස් වීම. 2. ගටහස් කම. 3. තමන්ම පහත්කොට සලකාගැනීම.

නිර්වේශය = 1. වැටුප් මුදල 2. ප්‍රාප්තිය; පඩිවීම. 3. භුක්තිය.

නිර්වේෂ්ටනය = 1. මුදා හැරීම. 2. නිදහස් කිරීම. 3. දිගහැරීම.

නිර්ව්‍යඤ්ජන = 1. ව්‍යඤ්ජන නුවූ; අපණ්ඩිත. 2. නුගත්.

නිර්ව්‍යාකූල = 1. අවුල් නොවූ; නිරවුල්.

නිර්ව්‍යාජ = 1. බොරු නොවූ. 2. තොරවටන සුළු. 3. සත්‍යවූ.

නිර්ව්‍යාධි = 1. ලෙඩනැති.

නිර්හරණ = 1. ඉවතට ගෙනයාම. 2. බැහැර කිරීම.

නිර්හාර = 1. ගොඩ නැගීම. 2. මල මූත්‍ර පහකිරීම.

නිරාකරණය = 1. නිරවුල් කිරීම. 2. නිශ්චය කිරීම.

නිරාකාර = 1. නිරූප; රූප ශරීරයක් නැති.

නිරාකීර්ණ = 1. ආකීර්ණ නුවූ. 2. ගහණ නැති.

නිරාකූල = 1. පැටලිලි නැති 2. අවුල් නැති.

නිරාකෘත = 1. අහකදැමූ. 2. එපා කළ. 3. වළක්වන ලද.

නිරාග් ශිඛ = 1. අපාගෙහි ගින්න.

නිරාචාර = 1. ආචාර ශීලී නොවූ. 2. අශිෂ්ට. 3. වනචර.

නිරානන්ද = 1. ප්‍රීති නැති.

නිරාලම්බ භාවය = 1. පැලහයක් නැති බව; ආලම්බනයක් නැතිබව.

නිරාබාධ = 1 රෝග නැති.

නිරාභාස = 1. රාගීන.

නිරාදර = 1. ආදරය නැති; දයා නැති; අනුකම්පාවක් නැති.

නිරා දුක = 1. අපායෙහි දුක.

නිරා දොර = 1. අපායෙහි දොරටුව.

නිරා පලු = (නිරා බලු) 1. යමපල්ලා. 2. නිරය පාලනය කරන්නා.

නිරාබාධ = 1. වැළැක්වීමක් නැති. 2. නීරෝගි.

නිරාමන්ත්‍රිත = 1. ඇමතීමක් නොකළ. 2. කැඳවනු නොලැබූ.

නිරාමය = 1. නීරෝගි. 2. සනීප.

නිරායාස = 1. ආයාසයක් නැති; වෙහෙසක් නැති. 2. පහසු.

නිරායාසයෙන් = 1. පහසුවෙන්. 2. වෙහෙසක් නැතිව.

නිරායුධ = 1. ආයුධ නැති.

නිරාරක්ෂිත = 1. රැකවල් නොකරන ලද.

නිරාර්ථක = 1. නිෂ්ඵල. 2. තේරුමක් නැති.

නිරාලම්බ = (නිරා ලම්බන) 1. එල්ලීමක් නැති. 2. නිදහස්. 3. ස්වකීය බලයෙහි පිහිටියාවූ. 4. එල්ලීමට දෙයක් හෝ ආධාරවන දෙයක් නැති.

නිරාලය = 1. ආශා නැති; ඇල්මක් නැති.

නිරාව = 1. නරකාදිය.

නිරාවරණ = (නිර් + ආවරණ) 1. වැස්මක් නැති; ආවරණයක් නැති. 2. පැහැදිලිව පෙණෙන.

නිරාවළ = 1. නිරය නමැති වළ.

නිරාශ = 1. ආශා නොවන; ආශා නැති. 2. අසරණ.

නිරාශ්වාස = 1. හුස්ම නොගන්නා.

නිරාශංක = 1. සැක නැති.

නිරාශංස = 1. බලා පොරොත්තු නැති.

නිරාහාර = ආහාර නැති; කෑමක් නොගත්.

නිරැ = 1. නරකාදිය.

නිරි = 1. නරකාදියට අයිති. 2. නරකයෙහි උපන්නා. 3. දුකින් පෙළෙන. 4. තිරිසන්. 5 හරි හැටි නොහැඹුණු. 6. නිරි හැල්. 7. වස්ත්‍ර නැති; රෙදි නැඳින.

නිරි කුණු = 1. ඉතා කැත සහිත. 2. තද දුක් දෙන. 3. කැතකුණු සහිතව තිබීම.

නිරි ගිය = 1. නිරය.

නිරිත = 1. දකුණට හා බස්නාහිරටත් අතර වූ දිශාව.

නිරිත දිශ = (නිරිත කොණ) 1. නිරිත දිශාව.

නිරින්ද්‍රිය = (නිරින්ද්‍රියවත්) 1. ඉන්ද්‍රිය අඩු. 2. අබ්බාගාත. 3. සකස් වීමක් නැති.

නිරිඳු = (නිරිදු) 1. රජ.

නිරිය = 1. දෙවැනි පලදුව.

නිරි වැද්ද = 1. වස්ත්‍ර නොහඳින වැද්ද.

නිරි වැල් = 1. පැලෑටි වර්ගයක්.

නිරි සතා = 1. අපාගතයා. 2. නරකාදියෙහි ජීවත් වෙන්නා.

නිරිස්සුම = 1. නුරුස්සන බව. 2. ප්‍රිය නොකරන බව.

නිරිසුරු = 1. නරේශ්වරයා; රජ.

නිරීක්ෂණය = 1. බැලීම.

නිරීක්ෂ්‍ය = 1. බැලිය යුතු.

නිරීහ = 1. නිරුත්සාහ; උත්සාහ නැති.

නිරු = 1· නරකය; අපාය.

නිරුක්ත = 1. කියන ලද. 2. විස්තර කරන ලද.

නිරුක්තය = (නිරුක්තිය) 1. ශබ්ද ධාතු විස්තරය. 2. ගැටපද විවරණය. 3. ශබ්දයන්ගේ ප්‍රභවය.

නිරුචිත = 1. සුදුසු නුවූ. 2. නොහොබනා.

නිරුජ්ඣන = 1. නිරුද්ධවීම; නැතිවීම.

නිරුත්තර = 1. උත්තර නැති. 2. තමාට වඩා ශ්‍රේෂ්ඨයකු නැති.

නිරුත් = 1. නිරුක්ති ශාස්ත්‍රය. 2. නිරිත දිශාව.

නිරුක්ති = 1. ශබ්දයන්ගේ ප්‍රභවය ප්‍රකාශ කරන ශාස්ත්‍රය.

නිරුත් මරු = 1. නිරිත දෙසින් හමන සුළඟ.

නිරුත්සාහ = 1. උත්සාහ නැති. 2. අලස.

නිරුදක = 1. ජලය නැති. 2. වියළි.

නිරුදක කාන්තාරය = 1. ස්වල්ප වශයෙන්වත් ජලය නැති කාන්තාරය.

නිරුද්ධ = 1. පැවැත්ම නැවතුණු. 2. නැතිවූ 3. විනාශ වූ. 4. නිවුණු.

නිරුපද්‍රව = 1. උවදුරු නැති.

නිරුපද්‍රිත = 1. උවදුරු නුවූ.

නිරුපධි = 1. උපධි නම් කෙලෙස් නැති. 2. නිර්ව්‍යාජ.

නිරුපධි ශේෂ = 1. කෙලෙසුන් නැසීම. 2. රහතුන් වහන්සේගේ පිරිනිවන් පෑම.

නිරුපධි ශේෂ නිර්වාණය = 1. උපාධි ශේෂ යක් නැති නිවණ.

නිරුපම = (නිරුපමාන) 1. උපමා නැති 2. අසමාන.

නිරුපශමනීය = 1. සුව කළ නොහැකි; අසාධ්‍ය.

නිරුවන් = 1. අපාංගත.

නිරුවත් = 1. නිර්වස්ත්‍ර.

නිරුවදුරු = 1. උවදුරු නැති.

නිරූප = 1. හැඩහුරු කමක් නැති. 2. අශරීරික. 3. අවලක්ෂණ.

නිරූපණය = 1. පෙනුම. 2. අනුමානය. 3. විභාග කිරීම. 4. නිශ්චය කිරීම.

නිරෙහි කෙළිනවා = (නිරෝහි කෙළිනවා) 1. ප්‍රීතිය පිණිස පොදු ක්‍රීඩා පවත්වනවා.

නිරේන්ද්‍රයා = (නරේන්ද්‍රයා) 1. රජ.

නිරොජ = 1. ඕජස නැති.

නිරොද = 1. බල නැති 2. ඕජස් නැති. 3 මරණ 4. නිවණ.

නිරොද්ධ = 1. නිරෝධය.

නිරොව සස් = 1. නිරෝධ සත්‍යය.

නිරෝ = 1. ලෙඩ නැති.

නිරෝග = (නීරෝගී) 1. ලෙඩ නැති.

නිරෝගී කම = 1. සුවසේ විසීම. 2. ලෙඩ නැතිකම.

නිරෝජ = 1. ඕජස් නැති.

නිරෝධ = 1. කෙලෙසුන් වැනසීම. 2. නිර්වාණය. 3. නැවැත්ම. 4. නිදහස් 5. විනාශය. 6. සාරය නැති. 7. වියලි.

නිරෝධ ධම්ම = 1. විනාශවන ස්වභාව ඇති.

නිරෝධ මාර්ගය = 1. නිවන් මග.

නිරෝධ සමාපත්තිය = 1. නිවන් සැපත. (ස්කන්ධයන් නිබියදීම) අනුභව කිරීම.

නිරෝෂණ = 1. තරඟ නැති. 2. ශාන්ත.

නිරෝහි කෙළිනවා = (නිරෙහි කෙළිනවා බලන්න.)

නිරෞෂධ = 1. බෙහෙත් නැති.

නිල = 1. නිල් පැහැය. 2. තනතුරු. 3. නිවාසය. 4. නිල් මැණික. 5. ශරීරයෙහි ඒ ඒ ගාත්‍රා; මර්මස්ථානාදිය. 6. නියමය. 7. රැකවල 8. කළු පැහැය.

නිලංකාර = 1. ඇස් අඳුරුකරන. 2. පෙනීම පැට ලෙන සුලු.

නිල ඉනි = 1. ධූලා.

නිලකට = 1. නීලකණ්ඨයා; ඊශ්වරයා.

නිල කරනවා = 1. අණ කරනවා. 2. නිලයක් දරනවා.

නිල කාරයා = 1. නිලයක් දරන්නා. 2. නිල පංගුවක හිමියා.

නිල කාර ප්‍රවේණි ක්‍රමය = 1. වැඩ වසම් ක්‍රමය. 2. අනුන්ගේ ඉඩම් බුක්ති විඳීමේ ක්‍රමයක්.

නිල ගල = (නිලගලයා) 1. මොනරා. 2. නිල් පැහැති ග්‍රීවයක් ඇත්තා. 3. ඊශ්වරයා.

නිල ගුරු = 1. නුගත් නැතැත්තා. 2. ඇතා.

නිලග = 1. සෙනසුරා. 2. විෂ්ණුදෙවි. 3. විලංගුව. 4 නීල කොබෙයියා.

නිලග දින = 1. සෙනසුරාදා.

නිලන = 1. නිල්වන් වන. 2. නීලවර්ණය. 3. දළ දැමීම.

නිලන්තර = 1. නිතර.

නිල තල = 1. තනතුරු. 2. තාන්න මාන්න. 3. රාජ කාර්‍ය. 4. පදවි.

නිල තල ආයිත්තම් = 1. නිල තල හඳුනා ගැනීමට අඳින ආයිත්තම්.

නිල තුර = 1. නිරතුර; නිතර.

නිල තුරඟ = 1. කළු අශ්වයා

නිලඹර් = (නිලධාරී) 1. නිලයෙහි අයිතිකරුවා. 2. මුලාදැනියා.

නිල පංගුව = 1. රාජ කාර්යය සඳහා දුන් ඉඩම. 2. ඉඩමක් වගාකරදීමේ මෙහෙය සඳහා හෝ අන් කිසි මෙහෙයක් කිරීමේ ගාස්තුව වශයෙන් දුන් ඉඩම.

නිල පට = 1. නිල් රෙද්ද.

නිල පලාව = (නිල පාළුව) 1. යම් කිසිවෙකු විසින් රාජ කාර්යය සඳහා බුක්ති විඳ-ගෙන ආවුත් ඔහුගේ අභාවයෙන් රාජ සන්තක වන ඉඩම.

නිලඹ = 1. නිල් වලාකුල. 2. කළු වලාකුල.

නිල ඹර = 1. (නිලඹර) නිල් වලාකුල. 2. නිල් අහස.

නිල බලයෙන් = 1. තනතුර නිසා ඇතිවූ බලයෙන්.

නිලම =නිලයක් දරන්නා.

නිලමක්කාර = 1. නිලධාරියා. 2. ගම්මුලා-දැනියා.

නිල මැස්සා = (නිලයා) 1. එනම් මැස්සා.

නිලමේ = 1. උසස් නිලධාරියෙක්. 2. රදල පවුල් වල පිරිමින්ට ගරු වශයෙන් අමතන වචනයක්.

නිලය = 1. ස්ථානාන්තර; තනතුර. 2. ධර්මස්ථා-නය. 3. නිවාසය. 4. බලය. 5. රාජ කාර්යය. 6. පදවිය.

නිලයා = 1. නිල මැස්සා.

නිල වරිය = 1. නිල් කටරොළු.

නිල වසම = (නිල පංගුව බලන්න.)

නිලස් = 1. අත ලස්; කඩිසර.

නිල් = 1. නිල් පැහැය. 2. කළු පැහැය. 3. නිල්වන් මැණික. 4. කොළපැහැණු. 5. නිල් පැහැති වස්ත්‍රය. 6. දිය සෙවෙල්. 7. රෙදි සේදීමේදී හා බිත්ති හුණු ගෑමේදී යොදන කුඩු වර්ගයක්.

නිල් අග = 1. විෂ්ණු දෙවි. 2. සෙනසුරු.

නිල් අඹ = 1. නීලාම්බර; කළු වලා කුල. 2. නිල් පැහැති අඹ.

නිල් අඹර = 1. බලභද්‍රයා. 2. නිල් අහස. 3. නිල් රෙද්ද.

නිල් අවරිය = 1. එනම් ගස් වර්ගය.

නිල් කම = 1. නීල කණ්ඨයා; ඊශ්වරයා. 2. මොනරා.

නිල් කඩ = 1. නිල් රෙද්ද.

නිල් කාන්තාඩියෙන් බැලීම = 1. යමක් පක්ෂ ග්‍රාහීව බැලීම.

නිල් කැටය = 1. නිල් මැණික. 2. රෙදි සේදීමේදී ගන්නා නිල් කැබෙල්ල. 3. පානදුරේටත් කළුතරටත් අතර මුහුදේ දිය යට පිහිටි එනම් ගල.

නිල් කිඹුණු = 1. නීල කසිණය.

නිල් කොබොලු = 1. බුලත්.

නිල් ගල = (නිල ගල බලන්න.)

නිල් ගෙලු = 1. මොනරා. 2. ඊශ්වරයා.

නිල් දුලා හෝ = 1. නිල් පාට ජලය ඇති ගඟ. 2. නේරංජරා ගඟාව.

නිල් පට = 1. නිල්රෙද්ද. 2. නිල් පැහැති පට රෙද්ද.

නිල් පරාබිඩා = 1. එනම් මාලුවා.

නිල් පාට = 1. නීල වර්ණය; නිල් පැහැය.

නිල් බඳ = 1. විෂ්ණු දෙවි.

නිල් මල් = 1. දිය බෝලිය; දිය මෙරලිය.

නිල් මහනෙල් = 1. නිල් මානෙල්; නිල් උපුල්.

නිල් මැලි = 1. බෙලි ගස.

නිල් මිණි = 1 නිල් පැහැති මැණික; ඉඳු නීල මාණික්‍යය.

නිල් මේ = 1. කළු වලා කුල.

නිල් රාජ කුරුල්ලා = 1. එනම් පක්ෂියා.

නිල්ල = 1. නිල් පැහැය. 2. ගස් කොළන් ආදිය.

නිල් ලනවා = 1. නිල් ලා පාට කරනවා.

නිල් වන රේඛාව = 1. නිල් පැහැති කැලෑ කොටස.

නිල් වන් = 1. නීල වර්ණය.

නිල් වදුල් = 1. නිල් පාට කැලෑ රොද. 2. නිල් වලා කුල.

නිල් වරි = 1. නිල් කට රොළු.

නිල් වලා = 1. එයාම් ගහ.

නිල් වලාව = 1. නිල් වලාකුළ.

නිල් වසන = (නිල් වසන්) 1. බල භද්‍රයා. 2. නිල් රෙද්ද. 3. නිල් පැහැති ඇඳුම් ඇඳ ගත් තැනැත්තා.

නිල් වැලි = 1. බෙලි ගස 2. බෙලි

නිල් සවඩි = 1. ආභරණ විශේෂයක්.

නිලා = 1. මල් වෙඩි වර්ගයක්.

නිලැස් = 1. කුවේරයා. 2. අතලස්.

නිලි = 1 නීල වර්ණ වූ. 2. සෙවෙල. 3. වැහි අඳුර. 4. ඇලුතු. 5. ඝන වනාන්තරය

නිලිකා = 1. සෙවෙල. 2. ශේපාලිකා විශේෂයක්.

නිලි ගත් = 1. නිල් පැහැති. 2. අඹු.

නිලි ගත් සක්‍රම = 1. අඹු කොළය.

නිලින = 1. සැඟවුණු.

නිලින ස්ථානය = 1. සැඟ වෙන තැන; ආරක්ෂා සහිත ස්ථානය.

නිලි පුල් (නිලුපුල්) 1. නිල් මානෙල්.

නිලි පුලැසී = 1 නිල් උපුල් වැනි ඇස් ඇත්තී; නිල් ඇස් ඇත්තී.

නිලි පුල් වන් = 1. නිල් මානෙල් පැහැති. 2. විෂ්ණු දෙවි.

නිලිය = (නිලි) 1. සෙවල. 2. හීදත්. 3. වැහි අඳුර. 4. නීල වර්ණය.

නිලිය = 1. ලක්ෂ්මී.

නිලීන = 1. සැඟවුණු. 2. වටකර තිබෙන. 3. රහස්. 4. අඛංගු.

නිලීන ස්ථානය = 1. සැඟවෙන තැන; ආරක්ෂා සහිත ස්ථානය.

නිලු පුල = (නිලු පුල්) 1. නිල් මානෙල්.

නිලුඹු = 1. නෙළුම්

නිළි = (නිළී, නිළිය) 1. නළඟන; නැට්වුක්කාරි.

නිවට = 1. නිහාලු. 2. නිසණ්ඨයා. 3 නීච. 4. නුගතා. 5. අසමර්ථයා. 6. කම්මැලියා.

නිවටුවා = (නිවට) 1. නිසත්ථයා. 2. නිර්වස්ත්‍ර තාපසයා. 3. නූගතා. 4. මෝඩයා.

නිවන = 1. නිර්වාණය.

නිවනවා = 1. ආලෝකය නැති කරනවා. 2. රස්නය නැති කරනවා. 3. සිසිල් කරනවා.

නිවත් = (නිවත) 1. දිළිඳු. 2. ඉපදුම. 3. පැවතීම. 4. කතරගම දෙවි. 5. නිර්වස්ත්‍ර. 6. ගිරවා. 7. තැණැති.

නිවතා = 1. දුප්පතා.

නිවරණය = 1. බාධාව. 2. හංවඩුගැසීම.

නිවරණ කරනවා = 1. හංවඩුගසනවා.

නිවරදි = 1. වැරදි නැති.

නිවර්තනය = 1. (ඉර) ආපසු හැරී ඒම. 2. නැවතීම. 3. නැවත දීම.

නිවරාව = 1. කන්‍යාව.

නිවසථය = 1. ගම.

නිවසනය = (නිවස්නය) 1. ගෙය. 2. නවාතැන.

නිවහ = 1. සමූහය. 2. රාශිය.

නිවහන = 1. ගෙය. නැවතුම් පොල. 3. චිත්‍රයක අවශ්‍යන වශයෙන් ගාන සායම් පාර.

නිවහල් = 1. වහල් නොවූ. 2. යටත් නොවූ. 3. අනාථ. 4. දීන.

නිවාඩු = 1. විවේකය. 2. වැඩ නැති බව. 3. හිස්. 4 විශ්‍රාම.

නිවාඩු කරනවා = 1. හිස් කරනවා.

නිවාඩු ගන්නවා = 1. විශ්‍රාම ගන්නවා 2. විවේක ගන්නවා.

නිවාන = 1. සුළං නොවදින. 2. මුවාවූ.

නිවාන තැන = (නිවාතය) 1. සුළඟින් මුවාවූ තැන. 2. ආරක්ෂා ස්ථානය.

නිවාත = 1. වාතය නැති තැන; සුළඟින් පරෙස්සම් වූ තැන. 2. සුබ සැට්වය.

නිවාතක = 1. සුළඟ නැති තැන. 2. අවකාශ ඇති තැන.

නිවාප = 1. සතුන් ගේ කෑම.

නිවාපනය = (නිවාපය) 1. ත්‍යාගය. 2. පිදවිල්ල. 3. ගෝදුර. 4. දෙමා පියන් උදෙසා දෙන දන.

නිවාරණ = 1. වැළැක්වීම. 2. බාධාව. 3. ආවරණය. 4. තහනම් කිරීම.

නිවාරිත = 1. වැළැක් වූ. 2. බාධා කළ.

නිවාරිය = 1. වැළැක්විය යුතු. 2. වැළැක්විය හැකි.

නිවාස = 1. ගෙය 2. වාසස්ථානය. 3. වාසය කිරීම.

නිවාසන = 1. වස්ත්‍රය. 2. යට ඇඳුම. 3. ඇඳීම.

නිවාසික = (නිවාසි) 1. වාසය කරන්නා. 2. වාසය කරන; නිවැසි.

නිවි = 1. ගොවියා. 2. නිවුනු. 3. සිසිල්.

නිවිට්ඨ = 1. විසූ; පදිංචි වූ. 2. ඇලුණු. 3. පිළිසෙළ කළ.

නිවිත්ත = 1. නිමිත්ත. 2. ලකුණ.

නිවිති = 1. එනම් පලා වර්ගය.

නිවිති කාරයා = 1. නිමිති කියන්නා; ලකුණු අනුව ශුභ අශුභ විපාක කියන්නා.

නිවිශේෂ = 1. විශෙෂයක් නැති. 2. එක සමාන.

නිවිෂ්ට = 1. ඇතුළු වූ. 2. පිහිටි. 3. වාඩි වූ.

නිවී = 1. සැනසී. 2. සන්සිඳී. 3. වෙලඳම. 4. වෙලඳ බඩු. 5. ගොවියා. 6. තරු. 7. නෙරිය. 8. කුඹුර.

නිවීම = 1. සිසිල් කිරීම. 2. සන් සිඳීම.

නිවී හැන හිල්ලේ = (නිවි හැනේ) 1. හෙමින්-හෙමින්. 2. ඉවසුම් සහිතව.

නිවු ශෙඩියා = 1. අභිගුණ්ඨිකයා. 2. සජීවෙදු.

නිවුඩු = (නීමුඩු බලන්න.)

නිවුන්නු = 1. නිඹුල්ලු.

නිවුණ = (නිමුණ) 1. සිහිල් වූ. 2. නැති වූ. 3. සන්සිඳුණු. 4. නිවන් දුටු.

නිවුල් = 1. මිදෙල්ල ගස.

නිවෘත = 1. වටවී තිබෙන. 2. සැඟවී තිබෙන.

නිවෘතය = 1. තිරය. 2. නාටකය. 3. වැස්ම.

නිවෘතන = 1. නැවතුණු.

නිවෘතකි = 1. නැවතීම. 2. වැළකීම.

නිවෘස අඩස්සිය = 1. පිටතට යා නොදී ගෙදරම සිර බාරයේ තැබීම.

නිවෙස = (නිවෙන්) 1. නිවාසය; ගෙය. 2. කඳවුර. 3. ඇතුළුවීම. 4. වාසය කිරීම.

නිවෙස සුර = 1 සුර නිවෙස; දෙව්ලොව.

නිවෙච්ඡනය = 1 වෙළුම් ඇරීම. 2. එළිදරව් කිරීම.

නිවේදක = 1. දැනුම් දෙන්නා.

නිවේදන = 1. දැනුම්දීම. 2. ප්‍රකාශය. 3. කියමන. 4. කථාව.

නිවේදිත = 1. දැනුම් දෙන ලද. 2. කියන ලද.

නිවේද්‍ය = 1. දැන්වියයුතු.

නිවේශනය = 1. වාසස්ථානය. 2. යුද කඳ වුර.

නිවේශය = 1. ඇතුළුවීම. 2. වාසය කිරීම. 3. වසස්ථානය.

නිවේශාභ්‍යන්තරය = 1. ගෙයි ඇතුළත.

නිවේශිත = 1· වාසය කර වූ.

නිව්‍යාපාර = 1. වැඩක යෙදී නැති; වැඩක් නැති.

නිස = 1. රාත්‍රිය. 2. උපකාරය. 3. මුහුණ. 4. ප්‍රති රාවය. 5. සාමණේර නමක් උපසම්පදාව ලැබ අවුරුදු පහක් ගෙවී අවශ්‍ය බණ දහම් උගන්නා තුරු ගුරු හිමියෙකු යටතේ විසීම. 6. ඇසුරු කිරීම.

නිසංගය = 1. සමාගම. 2. රැස් වීම.

තත් = 1. තප්ත; රත්වූ. 2. වීණා ලණුව. 3. ඒ; එය. 4. තත්වය. 5. තාපස. 6. රැස.

තත් කබල = 1. ගිනියම් කළ කබල.

තත් කථා = 1. එහි කථා.

තත් ක්ෂණ = 1. ඒ මොහොත.

තත් කඩහනවා = 1. ලණුව තද කරනවා.

තත්කාරයා = 1. වඩුවා.

තත් කාලය = 1. ඒ කාලය.

තත් කාල සහෝරය = 1. ඒ කාලයට යෙදෙන හෝරාව.

තත් කාලීන 1. ඒ කාලයට අයත්.

තත්කස = (තත්සන) 1. පිපාසය.

තත්කාශි දූනු = 1. දුනු වෙසෙසක්.

තත්සඩ අල්ලලා = 1. පිපාසය හැදිලා.

තත්ඩය = 1 ස්වභාවය; ගතිය. 2. අවස්ථාව. 3. ඕහමයා.

තත්භාව = 1 ස්වභාවය. 2. විධිය. 3. ආකාරය. 4. ඇති තතු.

තත්පර = 1. (යම් කිසි කටයුත්තක) යෙදුණු. 2. තත්පර; විනාඩියෙන් හැටෙන් පංගුව. 3. කඩිසර. 4. ඇලුණු.

තත්පර කම = 1. නියුක්ත වීම. 2. ඇලුණු බව.

තත්පරය = 1. විනාඩියෙන් හැටෙන් පංගුව.

තත්පර වෙනවා = 1. යෙදී සිටිනවා.

තත්පරායන = 1. යමකට තදින් බැඳුණු. 2. යමක ඇලුණු.

තත් සදිදී = 1. ඒ හැටියට..

තත් පුරුෂ සමාස = 1. විභක්ති සමාසය.

තත් පුරුෂයා = 1. ඒ මිනිසා.

තත් ප්‍රභව = 1. එයින් හටගත්.

තත්‍ර = 1. එහි. 2. එතැන.

තත් ලෙස = 1. ඒ හැටියට. 2. තත්වූ පරිද්දෙන්.

තත්ව = (තත්භාවය) 1. ස්වභාවය. 2. ආකාරය. 3. ඒ බව. 4. සත්‍යය.

තත්වඥ = 1. තත්වය දන්නා. 2. ඒ බව දන්නා.

තත්ව විචාර = 1. ඇති සැටි.

තත්වාකාරයෙන් = 1. නියම හැටියෙන්; ඇති සැටියට.

තත්වාවබෝධ = 1. නියම අර්ථය ඇති සැටි දැන ගැනීම.

තත් සදෘශ = ඊට සමාන.

තත් සත් = 1. තත්වල හඬ.

තත් සම = 1. ඒ හා සමානවූ.

තත් ස්වභාව = 1. එහි නියම ගතිය. 2. ඇති හැටි.

තතිය = 1. තුන් වැනි. 2. තුන් දවසකට වරක් ගැනෙන උණයක්.

තතියංසි = 1. තුන් වැනි වත්.

තතියක = 1. තුන් වැනි කොට ඇති.

තතියජ්ඣාන = 1. තෘතීය ධ්‍යානය.

තතු = 1. වගතුග. 2. තත්වය. 3. නියම ආකාරය. 4. තැවුණු. 5. පරමාර්ථය. 6. සත්‍යය.

තතුරු = 1. තනාත්‍රාය. 2. තනාත්‍රිය.

තතුඹේ = 1. දුනු දිය; දුන්නේ ලණුව.

තථ = 1. සත්‍යය.

තථතා = 1. සත්‍ය භාවය.

තථත්ත = 1. එබඳු බව.

තථ ධම්ම = 1. චතුරාර්‍ය්‍ය සත්‍යය.

තථ නිඃශ්‍රිත = 1. සත්‍යය ඇසුරු කළ.

තථ වචන = 1. සත්‍ය වචන ඇති.

තථ ස්වභාව = 1. ඇති සැටි.

තථා = 1. එසේ. 2. ඒ ආකාරයෙන්. 3. තථාගත 4. ඒ හා සමාන.

තථාකාරී = 1. එසේ (කී සැටි) කරන්නා.

තථාගත = 1. එසේ පැමිණි. 2. එසේ ගිය. 3. බුදුන් වහන්සේ.

තථාගත ඕවාද = 1. බුදුන් වහන්සේගේ අවවාදය.

තථාගත ඕරස = 1. බුද්ධ පුත්‍රයා; භික්ෂූන් වහන්සේ.

තථාගත බල = 1. බුදුන් වහන්සේගේ ඥාන බලය.

තථාගත සාවක = 1. බුද්ධ ශ්‍රාවකයා.

තථා රූප = 1. එබඳු; එවැනි.

තථ්‍ය = 1. සැබෑ.

තද = 1 දැඩි. 2. සවි. 3. තදබල. 4. දැඩි ලෙස ගත්.

තදකම = 1. දැඩි බව.

තදකරනවා = 1. ඔබනවා. 2. මිරිකනවා. තදින් බඳිනවා. 4. තදින් පටලනවා.

තදඞ්ග = 1. ඒ කොටස. 2. තාවකාලික? 3. එය ප්‍රධානකර ගැනීම.

තදනන්තරව = 1. ඊට අනතුරුව; ඊ ළඟට. 2. ඊට පසු.

තදනුගත = 1. එක්වත්.. 2. එයාකාර.

තද පද = 1. දුර්බෝධ වචන.

තද බද = 1. අනවකාශ. 2. තදින් බැඳුණු.

තද බල = 1. දැඩි ශක්තිය. 2. ඉතා බලවත්.

තද වෙනවා = 1. වේගය වැඩිවෙනවා. 2. තදින් බැඳෙනවා.

තද් = 1. එම. 2. ඒක.

තද් අඞ්ග = 1. ඒ අවයවය.

තද් අධිගම = 1. එය අවබෝධ කිරීම.

තද් අනුරූප = 1. ඊට සුදුසු.

තද් අන්ත = 1. එහි අන්තය.

තද් අභිප්‍රාය = 1. එහි අදහස.

තද් ආශ්‍රිත = 1. එය ඇසුරු කළ.

තද් උත්පත්ති = 1. එහි ඉපදීම.

තද් ගුණ = 1. ඒ හා සමාන ගුණ.

තද් හිත = (තද්+හිත) 1. ඊට හිතවූ. 2. නාමයක් කෙරෙහි යෙදෙන ප්‍රත්‍යය.

තද් භව = 1. අන් බසකින් බිඳී ආ ශබ්දය.

තද් විරුද්ධ = 1. ඊට ප්‍රතිපක්ෂවූ.

තදා = 1. එකල්හි 2. එදා; එදින.

තදානීන්තන = 1. ඒ කාලයෙහි වූ

තදින් = (තදේට) 1. දැඩි ලෙස 2. වැරෙන්.

තදීය = 1. එයට හෝ ඔහුට අයත්.

තදුපිය = 1. ඊට ප්‍රමාණ වූ.

තදුපේත = 1. එයින් යුක්ත වූ.

තදුල = 1. යහපත් දෙය.

තප = 1. තැවීම. 2. කනගාටුව. 3. තපස. 4. සීලය.

තපශ්චර්‍යා = 1. තපස් රැකීම.

තපන = 1. බැබළීම. 2. තැවීම. 3. උෂ්ණය. 4. සූර්‍යයා. 5. නරකයක නමක් 6. දුක්-හිරිහැරය.

තපනාකර = 1. සූර්‍යයා.

තපනිය = 1. ගෝදාවරී ගඞ්ගාව.

තපනීය = 1. පසු තැවිලි ගෙනදෙන. 2. තැවිය-යුතු. 3. බබළන. 4. රත්රන්. 5. උණුසුම් කළයුතු.

තපය = 1. ග්‍රීෂ්ම කාලය. 2. දුක. 3. පව් ගෙවීමට කරගන්නා දඬුවම. 4. දුක් කරදර.

තපල් = (තැපැල්) 1. ලියුම් යැවීමේ මාර්ගයට අයත්.

තපල් කන්තෝරුව = 1. ලියුම් පිළිබඳ කාර්‍යාලය.

තපල් කෝච්චිය = 1. ලියුම් ගෙන යන වාහනය.

තපල් ගාස්තුව = 1. තැපැල් දෙපාර්තමේන්තු-වට (ලියමන සම්බන්ධයෙන්) ලැබිය යුතු මුදල.

තපල් මුද්දරය = 1. ලියමනේ කවරයේ ගෙවීමට අලවන රාජ මුද්‍රාව.

තපල = 1. ලියුම් පොදිය; ලියුම් මල්ල.

තපස = (තපස්) 1. කෙලෙස් තැවීම. 2. මෙලොව සැප අත්හැර හුදකලා ජීවිතයක් ගතකිරීම. 3. පරිව්‍රජ්‍යාව. 4. දුෂ්කර ක්‍රියාව. 5. වතගතව සිල්රැකීම.

තපස් තේජස් = 1. තාපස භාවය නමැති තේජය. 2. තපසින් ඇතිවූ අනුභාවය.

තපස් රකිනවා = 1. තාපස ශීලය ආරක්ෂා කරනවා.

තපස්චරයා = 1. තාපසයා.

තපස්විනී = (තපස්සිනී) 1. තපස් කම් කරන ස්ත්‍රී; තාපසිය.

තපස්වී = 1. තාපසයා.

තපස්‍ය = 1. තවම් මස.

තපස්‍යාව = 1. තාපසකම.

තප් = 1. තාපය; තැවීම. 2. දැවීම. 3. ගොනුන් පොර ඇනගන්නට ප්‍රථමයෙන් කරන ශබ්දය? 4. උණුසුම. 5. අපායක නමක්. 6. පීඩාව; දුක් හිරිහැරය.

තප්ත = 1. දැවුණු. 2. තැවුණු. 3. තැකැරෙන ලද. 4. පීඩාවින්ද. 5. තවන ලද. 6. රත්වූ.

තප්පණය = 1. ලද පමණින් සතුටුවීම?

තප්පබ්භාර = 1. යම් කිසිවකට ඉතා බරවූ.

තප්පර = 1. එහිම යෙදුණු.

තප්පාලි = 1. තර; තර බාරු.

තප්පිත = 1. තෘප්තියට පැමිණවූ.

තප්පිය = 1. තෘප්තියට පමුණුවා; තර්පණය කොට.

තප්පු = 1. එනම් බෙර වෙසෙස.

තප්පු ලනවා = (තපුල්ලනවා) 1. ගවයන්ගේ ශෝභාවක්.

තප්පේම = 1. යමක් කෙරෙහි ආදරයෙන් ඇලී සිටීම?.

තපිනවා = 1. යමක් බලා පොරොත්තුවෙන් රස්තියාදු වෙනවා. 2. ගිනිමැලයකින් ඇඟ උණු සුම් කරගන්නවා.

තපෝ ගුණය = 1. තාපස ගුණය. 2. සිල්වත්කම.

තපෝ ධනය = 1. තාපස භාවය නමැති ධනය.

තපෝ වටය = 1. තාපසයන් වාසය කරන ප්‍රදේශය.

තපෝ වනය = 1. තාපසාරාමය. 2 තපසුන් වෙසෙන වනගත ප්‍රදේශය.

තපෝ වත = 1. තාපස ව්‍රතය. 2. තපසුන්ගේ පැවතුම.

තපෝ වෘත්තිය = 1. තාපස ජීවිතය.

තපෝ වෘද්ධ = 1. තපසින් වැඩිහිටි. 2. බොහෝ කල් පුරුදු කරන ලද තපස්කම් ඇති.

තබක්ක = 1. තඹ හා රත්රන් මිශ්‍ර ලෝහයක්.

තබන = 1. තැබිම.

තබන තැන් = 1. සල්පිල?.

තබනවා = 1. තියනවා. 2. තැන්පත් කරනවා.

තබා ගන්නවා = 1. (තමන් වෙත) තියා ගන්නවා. 2. පරෙස්සම් ලෙස තැන්පත් කරනවා.

තඹ = 1. ලෝහ විශේෂයක්. 2. ඇත් කුලයක්. 3. තැලිපොල. 4 ඇතුන් බඳින කණුව. 5. ගවතැල්ල.

තඹකරුවා = 1. තඹ වැඩ කරන්නා. 2. ලෝකරුවා

තඹක්ක = (තබක්ක බලන්න)

තඹකාසි = 1. තඹවලින් සෑදූ කාසි.

තඹ කුෂ්ට = 1. එනම් කුෂ්ට රෝගය.

තඹ නඛයා = 1. තඹවන් නිය ඇත්තා.

තඹ දූලි = 1. රන් පැහැති රැවුල.

තඹ දිය = 1. රතු ජලය.

තඹ දුළුල් = (තඹ දුලුල්) 1. ජ්වරයා.

තඹ තගඩුව = 1. තඹ පත. 2. තඹ පත්තිරුව.

තඹය = 1. වටිනාකමින් ඉතාම අඩු තඹ කාසිය. 2. ශත භාගය; තඹ සල්ලිය.

තඹපළු = 1. රතු දළු.

තඹපිල් = 1. පොල් ගස.

තඹමේ = (තඹමුවා) 1 තඹමය; තඹින් කළ.

තඹර = 1. රත් නෙළුම්. 2. රන් පැහැය.

තඹරකර = 1. නෙළුම් විල. 2. සූර්යයා.

තඹරිලු = (තඹර + ඉලු) 1. නෙළුම්මල් සමූහය. (නෙළුම් විල) තඹර අරණ;

තඹරුවන = 1 නෙළුම් කැලය (නෙළුම් විල)

තඹශරීර = 1. පියුම ඇතුල.

තඹල = 1. අල වර්ගයක්.

තඹලයා = 1 එනම් මාලුවා.

තඹලවණි = 1. තඹවන් තොල් ඇති; රතු තොල් ඇති.

තඹලේරුව = 1. දිග බොත විදුරු භාජනය.

තඹලෝ = 1. එනම් ලෝහ වර්ගය.

තඹවන් = 1. තඹ පැහැය; තඹ පාට.

තඹවතුරු = 1. තඹ පාට ගංවතුර. 2. තඹ පාට වස්ත්‍ර. 3. අළුත් වතුර.

තඹඩුලු = 1. ගෝනා. 2. මුවා.

තඹ සල්ලිය = 1. තඹ කාසිය. 2. සත බාගය.

තඹසිළු = 1. කුකුළා; තඹවන් සිඛාවක් ඇත්තා.

තඹු = (තඹුවා) 1. කිවලා. 2. නෝනාඹුවා. 3. මාළුවෙක්.

තඹහොළ = 1. කුරුල්ලෙක්.

තඹනොල් = 1. පොල් වර්ගයක්.

තඹුරු = 1. රත් නෙළුම්. 2. තඹ. 3. රත්රන්.

තඹුරු කැකුළු = 1. නෙළුම් මොට්ටු.

තඹුරුවන = 1. නෙළුම් සමූහය; නෙළුම් විල.

තඹපන් දිව = 1 තාම්බපණ්ණිදීපය. 2. ලංකාව.

තම = 1. අඳුර. 2. තමාගේ. තමාම. 4. මෝහය. 5. තණ. 6. පාපය. 7. අවිද්‍යාව.

තමඝන = 1. අඳුරු රැස; ඝනඳුර.

තමකි = 1. එකෙමෙකි.

තමල් = 1. කොල්ලම්. 2. බුලත්. 3. පැලෑටි වර්ගයක්.

තමලු = 1. තමාල.

තමලුලිය = 1. තමාල ගස.

තමස් = (තම) 1. අන්ධකාරය. 2. නොදත් කම. 3. වැරදීම. 4. මූර්ඡාව. 5. රාහු. 6. නැමැත්ත. 7. ශෝකය.

තමස්කෝම = 1. කළු කළුවර; අඳුරු රැස.

තමස්විනිය = 1. රාත්‍රිය.

තම් = 1. තඹ 2. ඇතැම් පෙරදිග තැටුම් තාලයක පදාරම්භයේදී කියන්නක්. 3. වත්තමක ඇරඹුම.

තම්පලං = 1. පැලෑටි වර්ගයක්.

තම්පාව = 1. එළදෙන.

තම්බ = 1. තඹ. 2. තඹ පැහැති; රත් පැහැති. 3. ඇත් කුලයක්. 4. තැම්බීම කරව.

තම්බක = 1. තම්පලං.

තම්බකේස = 1. තඹවන් හිස කෙස් ඇති.

තම්බචූළ = 1. කුකුළා.

තම්බනවා = 1. කැම පිසිනවා 2. ලිපේ තබා රත්කරනවා.

තම්බපණ්ණිදීප = 1. ලංකාද්වීපය.

තම්බි = 1. මරක්කල මිනිසා. 2. මල්ලී.

තම්බිම් = 1. තැම්බීම.

තම්බඩුවැල් = (තම්බොටු වැල්) 1. වේවැල් වර්ගයක්.

තම්බූල = 1. බුලත් (කොළ)

තම්බූල පසිබ්බක = 1. බුලත් මල්ල.

තම්බෝරුව = 1. දවුල. 2. ලොකු බෙරය.

තම්මැට = (තම්මැට්ටම) 1. බෙර වර්ගයක්.

තම්මැන්නා = 1. ගස් වර්ගයක්? 2. මන්නාරම් පළාත. 3. පුරාණ රාජධානියක්. 4. තම්බ පණ්ණි?

තමා = 1. තෝ; නුඹ. 2. තමයි. 3. තමෝ ගුණය. 4 මෝහය.

තමාම = 1. තමුන්ම.

තමාල = 1. කොල්ලන් කොළ. 2. පැළෑටි වර්ගයක්. 3. බුලත් වැල.

තමාල පත්‍රය = (තමාලය) 1. තිලකය. 2. කොල්ලන් කොළ.

තමිය = (තමී) 1. රාත්‍රිය.

තමිස්‍රය = 1. අන්ධකාරය. 2. අවර පක්ෂය.

තමිස්‍රාව = 1. ගනදුර. 2. කළුවර රාත්‍රිය.

තමුන් = 1. තමුන්ම, 2. ඔවුන්.

තමුන්නාන්සේ = 1. ආමන්ත්‍රණයෙහිදී යොදන ගරු වචනයක්. 2. ඔබ වැනි උතුමා; උතුම් වූ ඔබ.

තමුන්නෑහේ = 1. යුෂ්මතා. 2. ඔබ. 3. තමුන්නාන්සේ ?

තමුසේ = 1. යුෂ්මතා. 2. ඔබ.

තමෝ ගුණය = 1. මෝහ ගතිය; මූලාව. 2. අඳුර.

තමෝනුද = 1. මෝහාන්ධකාරය දුරුකරනා. 2. බුදුන් වහන්සේ.

තමෝනුදය = 1. කළුවර දුරුකරන්නා. 2. සූර්යයා. 3. චන්ද්‍රයා. 4. ගින්න. 5. ප්‍රදීපය.

තය = 1. තුනේ සමූහය. 2. ත්‍රිකය.

තයම් = 1. ඇගේ ගුලිය. 2. ශබ්දය. 3. කූට උපාය; තායම. 4. ඉවුර. 5. ව්‍යාජ. 6. කෘතිම.

තයි = 1. තාගේ.

තයි = (තයා) 1. තී කෙරෙහි; තී සමග.

තයිල = 1 තෙල්.

තර = 1. මහත්. 2. සපුල. 3. ශක්තිමත්. 4. තද. 5. දැඩි. 6. එතරකරන. 7. ඔරුව. 8 රශ්මිය. 9. වේගය. 10. තරුව. 11. අතිශයාර්ථ ප්‍රත්‍යයක්. 12. ඇස්ගුලිය. 13. තොටුපළ.

තරංකය = (තරංගය) 1. දොර අගුල.

තරංගය = 1. රළ. 2. පැනීම.

තරංගිත = 1. රළ සහිත; රළ ආකාර.

තරක = 1. තර්ක. 2. විවාද කථාව.

තරක් කරනවා = 1. විරුද්ධව කටයුතු කරනවා; 2. තරග කරනවා. 3. දිනන්නට වෑයම් කරනවා.

තරක්ෂුඩා = 1. බලු දිවියා.

තරගය (තරඟය) 1. එකට එක කිරීම. 2. වාදය. 3. තරකය. 4. ක්‍රීඩා සටන. 5. රළ.

තරගෙය = 1. සිරගෙය; හිරගෙය.

තරඞ්ග = 1. රළ; දියරැළ. 2. තර්කය. 3. වාදය.

තරඞ්ගක = 1 දෙදෙනෙකුගේ හෝ දෙපක්ෂයක පොරය. 2. වාදය.

තරඞ්ග කරනවා = (තරඟ කරනවා බලන්න.)

තරඞ්ගමාල = 1 තරඞ්ග පඞ්ක්තිය. 2. එනම් වෘත්තය.

තරඟිල්ල = 1. දඹර ඇඟිල්ල.

තරච්ඡ = 1. කළුහිස් වලසා.

තරණ = 1. එතෙර වීම; එතෙර කිරීම. 2 ඉක්මවා යාම 3. ගොඩවීම. 4. පහුර. 5. ගස් වර්ගයක්.

තරණය කරනවා = 1. එතෙර වෙනවා.

තරණිය = (තරණි) 1. රශ්මිය 2. සූර්යයා. 3. එතෙර වීම. 4. පහුර. 5. නඹ. 6 යාත්‍රාව; නැව.

තරණී පථ = 1. අහස.

තරදින් = (තරදිනි) 1. දඹර ඇඟිල්ල.

තරප්පිය = (තරප්පුව) 1. ලෑලි වලින් කළ ඉණිමඟ 2. කොල්ලදරයකට යන ලෑලි පඩිපෙළ. 3. පියගැට පෙළ. 4. සෝපානය.

තරබාරු = 1. තර. 2. පුෂ්ටිමත් 3. මහත-දෙහෙත ඇති.

තරම = 1. ප්‍රමාණය. 2. විතර. 3. සමාජ තත්වය. 4. ස්වාභාව.

තරමකට = 1. ප්‍රමාණයකට.

තරම ගහනවා = 1. හිස ගහ දමනවා.

තරම් = 1. යොග්‍ය; නිසි. 2. වටිනාකම ඇති.

තරමාන = 1. එතෙරවෙන. 2. ඉක්මවමින්.

තරමෑණ = 1. වඳුරා.

තරය = 1. එතෙර - මෙතෙර වීම. 2. ශක්ති-මත් භාවය. 3. යාත්‍රාව. 4. පාර.

තරසේ = 1. සවිර ලෙස. 2. ශක්තිමත් ලෙස 3. හොඳින්. 4. බෙහෙවින්.

තරල = 1. අස්ථිර. 2. චපල. 3. වෙව්ලුම. 4 දියාරු. 5 (මුතු) මාලයෙහි මැද මැණික

තරලමණි = 1 විෂ්ණු දෙවියන්ගේ කෞස්තුභ මාණික්‍යය. 2. (මුතු) මාලයෙහි මැද මැණික.

තරලය = 1. ඇටමෑල. 2. මාලය.

තර්ජිත = 1. තර්ජනය. 2. තර්ජනාත්මක.

තාරණ = 1. එතෙර කරවීම.

තරවිශාඛතුර්‍ය = 1. චතුර් වේදයෙන් එකක්වූ අථර්වන් වේද කන්ත්‍රය.

තරවනවා = 1. තවරනවා. 2. ගානවා. 3. යම් තම් ආලේප කරනවා. 4 එතෙර කරනවා.

තරව්ව = (තැරැව්ව) 1. උපායෙන් යමකු රවටා ගැනීම 2. අයථා මාර්ගයෙන් යමක් කරවා ගැනීම (පන්දම් ක්‍රමයෙන් යම්-යම් දේ කරවා ගැනීම. 3 බඩු ගන්නා හා බඩු දෙන්නා අතර අදහස් හුවමාරු කර ගැනීම පිණිස අනෙකකු පත්කර ගැනීම.

තරව්වු කාරයා = 1. තැරැව්ව කරන්නා. 2 අයථා මාර්ගයෙන් කටයුතු කරවා දෙන්නා. 3. බඩුගන්නා හා බඩු දෙන්නා අතර අදහස් හුවමාරු කරන්නා.

තරසනා = (තරසන්) 1. මේඝ ගර්ජනාව. 2. ගිගුරුම.

තරසර = 1. සවිර සාරවූ. 2. සවිබලවූ.

තරස් = 1 වලසා 2. මෘගයා. 3 කුඩ අල්ලන්නා. 5 කරබාන වලසා. 5. රෝගය. 6. වේගය. 7. වාහරයා 8. තීරය.

තරස්ථානය = 1. තොටුපල.

තරස් දණ්ඩ = 1. (රෙදි වියිමට ගන්නා) නඩාව.

තරසා = 1. වලසා. 2. දිවියා.

තරහ = 1. කෝපය.

තරහ ඇවිස්සුවා = 1. කෝප ඇතිකළා.

තරහ ගියා = 1. කෝපවූනා.

තරහල්ලා = 1. රජකරුවා.

තරහල් දෙමුවා = 1 ප්‍රධාන රජකරුවා.

තරළ = 1. චඤ්චල. 2. මාලයේ මැද මැණික. 3. උකුසැද.

තරහ වෙනවා = 1. කෝප ඇතිකරගන්නවා; විරුද්ධවෙනවා.

තර්ක = 1. න්‍යාය ශාස්ත්‍රය. 2. වාදකිරීම. 3 විචාරණ. 4. කාරණ කථාව. 5. සැකය. 6. තර්ක ශාස්ත්‍රය. 7. තරඟය.

තර්ක අනුකූල = 1. තර්කයට ගැළපෙන.

තර්ක කරනවා = 1. විවාද කරනවා; වාද කරනවා.

තර්ක කාරයා = (තාර්කිකයා) 1. තර්ක- කරන්නා; වාදකරන්නා.

තර්කණ = 1. කල්පනා කිරීම.

තර්කුපීඨ = 1. කපු කටින ඉද්ද.

තර්ජන කරනවා = 1. සැරවෙනවා. 2 තරවටු කරනවා 3. භය ගස්වනවා. 4. බණිනවා.

තර්ජනාංගුලිය = (තර්ජන + අංගුලිය). 1. තර්ජනය කිරීමට ගන්නා ඇඟිල්ල. 2. දබරඇඟිල්ල (තර්ජනීය).

තර්ණකයා = 1. වස්සා.

තර්පණය = 1. සනහය. 2. පිනවීම. 3. සතුට. 4. සංසිඳීම 5. සුවඳ ද්‍රව්‍ය. 5. මියගිය අයට පින්දීම. 7. අග්ගුණු.

තර්ෂය = 1. පිපාසය. 2. ආශාව.

තර්ෂණ = 1. ආහාර.

තරා ශල = 1. සඳ. 2. සැලාව.

තරාතිරම = 1. තත්වය. 2. වටිනාකම. තනතුර.

තරාදිය = 1. බර ප්‍රමාණය දැනගැනීමේ උපකරණය; තුලාව.

තරාදිකඳ = 1. තරාදියේ තැටිවු දෙක එල්වන උපකරණය; පලම් දණ්ඩ.

තරාව = 1. රශ්මිය. 2. හිරු රැස්.

තරාලා = 1. රන් කරුවා.

තරිඳු = 1. වඳුරා

තරිය = 1. තොට. 2. ඔරුව; බෝට්ටුව. 3. පහුර.

තරික = 1. එතරවූ

තරි = 1. එතෙර කරවන්නී. 2. නැව. 3 ඔරුව.

තරු = 1. තාරකා. 2. ගස් 3. ඇස් ගුළිය. 4 නොමේරු පලතුරු. 5. බෙබද්දා.

තරුගණ = තාරකා සමූහය.

තරුගිලසුමිණිකා = 1 ප්‍රයෝග කාරයා.

තරුණ = 1. මාදුවූ. 2. බාලවූ. 3. නොමේරූ. 4. මහලු නොවූ.

තරුණජ්වර = 1. සතියක් නොඉක්මවූ උණය.

තරුණකර = 1. අතිශයින් ළපටිවූ.

තරුණවුණ = 1. අළුත් වණය.

තරුණාර්ක = (තරුණ + අර්ක) 1 උදේ හිරු.

තරුණාවස්ථාව = (තරුණ + අවස්ථාව) 1. තරුණ වයස.

තරුණාස්ථි = (තරුණ + අස්ථි) 1. ළපටි ඇට.

තරුණිය = 1. සොළොසැවිරිදි කාන්තාව. 2. වැඩිවිය පත්, අවිවාහක ස්ත්‍රිය.

තරුභුජ් = 1. වඳුරා.

තරුජ්ජුව = 1. මැණික් වලියක්.

තරුමිජ්ජා = (තරු මජ්ජන) 1. මැලියම්; ලාටු.

තරුපෙනෙනවා = 1. තාරකා දර්ශනය වෙනවා. 2 අන්දුන් කුන්දුන් වෙනවා. 3. කිසැස්සෙනවා.

තරුපෙළ = 1. තාරකා පඞ්ක්තිය.

තරුකොනා = 1. වැවර ගෙඩිය; කුරුම්බාව.

තරුරජ = (තරුරද) 1. චන්ද්‍රයා.

තරුව = 1. සාරකාම. 2. මාංසය. 3. ඇස්ගුළිය.

තුරුවර = 1. විශාල වෘක්ෂය. 2. උතුම් ගස.

තරුමූල = 1. තාරකා සමූහය.

තරුෂණ්ඩ = 1. ගස් සමූහය.

තල = 1. මට්ටම් පොළොව. 2. සමූහය. 3. තාලය. 4 ප්‍රදේශය; භූමිය 5 ගස්වගීයක්. 6. පැලැටි විශේෂයක් 7 ඇටැටි පත් වගෙන් එකක්. 1. අඟුරියතක උස ප්‍රමාණය. 9. පිහියා ආදියේ තලය. 10. කට්ටුව. 11. තැළීම. 12. කඩුමිට. 13. පිලකය. 14. තෙල්. 15. තලාදය. 16. වාරය. 17. කස් ආදියෙහි සළල් කොටස. 18 සවරූපය 19 අට 20. ස්වභාවය. 21. කරාදිය. 22. මුතුපිට. 23 තන්තානි ආදියේ මූණත.

තලක් = 1. තල් ගසක්.

තලක් කඩිබුව = 1. මුදුන. 2. මුදුන් වහල. 3 තලප්පාව?

තලකෑළු = (තල කැලල) 1. හමේ ඇතිවන කුඩා පුල්ලිය; කළු ලප.

තලකැරලි = 1. තල වලින් සාදන කැවිලි විශේෂයක්.

තල කිරින්තා = 1. එනම් පක්ෂියා; වාෂ නම් පක්ෂියා?

තලගුලි = 1. තල හා සකුරු මුසු කොට සාදන කැවිලි වෙසෙසක්.

තලඝෝ = (තලගොයි) 1. හූණුවර්ගයට අයත් සතෙක්; තලගොයා.

තලඝාතක = 1. ඇතුල් පහර දීම.

තලචක්‍රය = 1. ක්ෂිතිජය; අහස පොළොව එකතුවූවාක් මෙන් ඇත පෙනෙන ඉර

තලධෙක් = 1. බර ප්‍රමාණයක්.

තලන = 1. පරාලය. 2. හරස් ලීය.

තලන්ගහනවා = 1. හරහට පරාල දමනවා.

තලනි = 1. පතුරු වලින් සැදූ රෙදි. 2. පට-වස්ත්‍ර?

තලන් = 1. බලභද්‍රයා.

තලන්තානි = (තලතුනා) 1. වැඩිහිටි 2. පලපුරුදු ඇති. 3 තැත්පත්. 4. මහලු වයසේ පිහිටි. 5. ගරු කළයුතු.

තලනා දේවි = 1. ඉතා නැණවත් බිසොවක්. 2. චූලණි බඹදත් රජුගේ මවු.

තලතෙල් = 1 තල ඇටවලින් ගන්නා තෙල්.

තලප = 1. පිටිවලින් සාදන එනම් කෑම වර්ගය.

තලපත = 1 තල් කොළය. 2. තල්කොළයේ (පුස්කොළයේ) ලියූ ලියවිල්ල.

තලපනා = 1. එනම් මුදු මාළුවා.

තලප්පක්කි = 1 කුරුක්කන් තලප ඉව්මට ගන්නා භාජනයක්.

තලප්පර = 1. වාද්‍යභාණ්ඩයක්; තප්පුව.

තලප්පරවින්දම් = 1. තප්පු ගැසීම.

තලප්පාව = 1. ජටාව. 2. උෂ්ණීෂය; හිසෙහි බඳින රෙද්ද.

තල ප්‍රහාරය = 1. අතුල් පහර.

තලමල = 1. තලගසේ හටගන්නා මල.

තලමුරු = (තල මූරුවට) 1. තල පුස්තක්කු.

තලය = 1. සමූහය. 2. සමතලා බිම. 3. පිහි- ආදියේ සමතලා කොටස. 4. ගොඩබිම. 5. අල්ල,

තල වඩි = අරක්කු පදමක්. 2. අරක්කු සාරය

තලවලේ = 1. මාදැලේ මඩිය අමුනා ඇති ලනු දැල.

තලම්බ = 1 පාරක නැළි පහත්වූ කොටස. 2. යමක් තිබීමෙන් ඇතිවුණු ලකුණ (පාර). 3. සමතලා උස් තැන.

තලම්බෙනවා = 1. දිගාවෙනවා. 2. තැවෙනවා. 3. හේත්තු වෙනවා.

තල සකලම = 1. තල ඇටය හා හාල් ඇටය.

තල් = 1. එනම් ගස.

තල් ඉරටු = 1. තල් අත්තේ ඉරටු.

තල් කෑන් = 1. තල් ගෙඩි වල්ල.

තල් කොළු = 1. නාඹ තල් ගස.

තල් පත් = 1. තල් කොළය.

තල් පැන්පල = 1. තල් වැවරය.

තල් පී = 1. තල් පැළ මදය.

තල් පුනාටු = 1 තල් හකුරු.

තල් මහ = 1. එනම් මුදු මාළුවා; තල් ගස වැනි මහා මත්ස්‍යයා.

තල්ල = 1. මුව තුළ උඩ හෝ යට පැත්ත.

තල්ල මරණවා = 1. තළු ගහනවා.

තල්ලය = 1. තටාකය; විල.

තල්ලිකාඩ = 1 යතුර.

තල්ලු කරනවා = 1. ඔබනවා. 2. තද කර එපිටට දමනවා.

තල් වාකර = 1. අරක්කු පෙරා ගැනීමේදී ඇති වෙන පදමක්.

තල් වට = (තල් වැට) 1. වට අත්ත. 2. තල් පවන් පත. 3. වටා පත.

තලා = 1. එනම් ගස. 2. තැන්න. 3. තෝ තැන්න. 4. වෙරළ. 5. ඉවුර. 6. සමතලාව. 7. වෘත්තයක්. 8. හෙළ. 9. කකුළුවා 10. ඇසළ ගස. 11. තිලකය. 12. මතු පිට. 13 තෙළඹ විල. 14 තල් ගෙඩිය. 15. ගොඩ බිම. 16 පහර දී. 17. කඳු අතර සමතලා බිම. 18. ගෙඩි පදනම; අත්තිවාරම.

තලාක්ත = 1. තල් අත්ත. 2. තල් අත්තෙන් සෑදූ කුඩය.

තලාතු මිනිරන් = (තලාතු මීරන්) 1. මිනිරන් ජාතියක්.

තලාඳ = (තලාණ) 1. වරිච්චි බිත්තිය නෑදී පැවැත්මට දමන ලී (පරාල) 2. බාල්කය.

තලා වෙනවා = 1. මුණින් වැටෙනවා. 2 දිගා වෙනවා.

තලි = 1. තැටිය. 2. පැතලි භාජන. 3. මුට්ටිය; හට්ටිය.

තලිසාව = 1. කටකලියාවේ එක් පටියක්.

තලිස් සතුරු = 1 තාලිස පත්‍ර නම් ඔසු වෙශෙස.

තලු = 1. තල්ල. 2. තලිය. 3. මහ ගලකින් පිටතට නෙරා සිටි කැබැල්ල.

තලු ගහනවා = 1 කෑම කන විට උඩු තල්ලෙහි දිව ගසා ශබ්දයක් කිරීම. 2. රස බලනවා?

තලුන = 1. තරුණ.

තලු තැම්ශ = 1. තලිය. 2. දිය පෙරන බඳුනක්.

තලු මරණවා = 1. කොලෙන් තොල ගානවා.

තලන = 1. වාදනය කරන. 2. ගසන.

තලනවා = 1. පහර දෙනවා; ගහනවා.

තලා = 1. තඩාගය; පොකුණ.

තලාක = (තලාකය) 1. පොකුණ.

තලි = 1. තැටිය. 2. තැල්ල.

තව = 1. තපස්කම. 2. ව්‍රතය. 3. ඇදහීමක් අනුව ශරීරයට දුක් ගැනීම. 4. වෙනත්. 5. වැඩිපුර 6 තවම; මෙතුවක් කල්. 7. අධික; ඉතා. 8. තැවන. 9. තාගේ.

තවනවා = 1. පොට්ටනි ආදියකින් තැවීම කරනවා; තෙපුල් දෙනවා.

තවන් කරනවා = 1. පැලවෙන්ට සලස්වනවා.

තව තවත් = 1. වැඩි - වැඩියෙන්.

තවත් = 1. වැඩි දුරටත්. 2. වැඩි.

තවද = 1 වැඩි දුරට.

තව සැල = 1. තාපසාරාමය. 2. පන්සල.

තවම = 1. මෙතුවක්.

තවරන = 1. ගෑම කරන. 2. අතුල්ලන.

තවලම = 1. ඔටු, අස්, ගව, බූරු ආදි සිවුපාවුන් පිට බඩු පටවාගෙන යාම. 2. බඩු හුවමාරු කර ගන්නා ස්ථානය.

තවල්ල = 1 වැව්, පොකුණු ආදිය අසබඩ ගොවිතැන් කරන තැන.

තවලු = 1 කුඩා වැව

තවසර = 1. තාපසයා; තපස්කම් කරන්නා.

තව්තිසා දෙව්තලාව = 1. ශක්‍ර දේවේන්ද්‍රයාගේ දෙව් ලෝ දෙකින් එකක්.

තව් මැරෙනවා = 1. සැර ගතිය අඩු වෙනවා. 2. මැලි වෙනවා.

තව්ව = 1. සිදුර.

තවාන = 1. රෝපනය කරන තුරු පැල තැන්පත් කොට තිබෙන බිම.

තවුර = 1. තද. 2. ශක්තිමත්. 3. සවි.

තවුරු = 1. ඒකාන්ත. 2. ස්ථිර. 3. තැවරීම.

තවුස් = 1. තාපසයා.

තස = 1. ත්‍රාසය; තැති ගැන්ම. 2. චංචලවන. 3. තැති ගන්නා.

තසඳ කරු = 1. ත ශබ්ද කාරකය.

තසම = 1. තත් සම; මුල් වචනය හා සමාන වන.

තසර = 1. නූල් දිග් යසා බඳින ලීය. 2. තරස් දණ්ඩ; තඩංව.

තස්කරා = 1. හොරා.

තස්කරී = 1. සෙර.

තස්නාව = 1. තෘෂ්ණාව; තද ආශාව.

තසිත = 1. තැති ගත්, පිපාසිතවූ.

තසික්වා = 1. තැතිගෙන.

තසිතතාව = 1. පිපාසිතයකු මෙන්.

තසිනා = 1. තෘෂ්ණාව.

තහංචිය = 1. තහනම. 2. බාධා කිරීම; තහනම.

තහන්චි කවි = 1. බාධා කිරීමේ කවි; තහනම් කිරීමේ කවි.

තහඩු = 1. පතුර. 2. පෙත්ත.

තහඩු ගල = 1. තට්ටු වලින් යුත් ගල.

තහඩු මිණිරන් = 1. තලාතු මිනිරන්.

තහනම = 1 නිෂේධය කිරීම; එපාකිරීම.

තහත = 1. නිතර. 2. තගේ අත.

තහවුරු = 1. ස්ථිර 2. ප්‍රමෝදය.

තහළම් = 1. තාළම් නම් වාද්‍යය.

තළ = 1. උස් තැන. 2. තට්ට. 3. සමූහය; රංචුව. 4 තඹාගෙය.

තළන = 1. ගසන. 2. වාදනය කරන.

තළා = 1. තඩාගය. 2. කුඩා ඇල.

තළාක = 1. විල; පියුම් විල.

ත්වක් = 1. ගම 2. පොත්ත. 3. ලෙල්ල.

ත්වක් ක්ෂීරා = 1. උණ මකුළු; උණ කපුරු.

ත්වක් ශක්‍රිය = 1. පැණි දොඩම්.

ත්වග් දූෂණ = 1. හමේ රෝගය.

ත්වචය = 1. සම. 2. පොත්ත.

ත්වරිත = 1. ශීඝ්‍ර; ඉක්මන්.

ත්වාච = 1. බෝවෙන; වසංගත.

තා

තා = 1. මෙහි. 2. පමණ. 3. සියලු (යන අර්ථයන්හි) 4. 'තෝ' යන පදයේ කර්ම විභක්ති රූපය.

තාක් = 1. ඒ තාක් කල්. 2. තුරු. 3. මේ වක තුරු. 4. සීමාව.

තාක්කුව = 1. සනතය 2. සත් සිදීම.

තාගෝර් = 1. රවීන්ද්‍රනාත් තාගෝර් නම් භාරත මහා කවියා.

තාච්චි මුක්කු = 1. එනම් ක්‍රීඩාව.

තාච්චිය = (තාච්චුව) 1. ලෝහ වලින් කළ උයන භාජනයක්.

තාඩංකය = 1. තෝඩුව.

තාඩනය = 1. තැළීම.

තාඩනීය = 1. තැළිය යුතු.

තාඩනාත්ම බන්ධනය = 1. යක්ෂ ප්‍රේත ආදීන් බැන්දවීම.

තාඩිත = 1. තැළූ; ගැසූ

ත්‍රාණ = 1. ආරක්ෂාව; පිහිට; රක්ෂා ස්ථානය. 2 නිවණ.

තාණ්ඩව = 1. නාට්‍යය; නැටීම.

තාත = 1. පියා. 2. දරුවා.

තාත්තා = 1. පියා.

තාණ්ඩුව = 1. තාලය. 2. නැටුම.

තාත්පර්ය = 1. යෙදී සිටීම; තත්පර භාවය. 2. පුරුද්ද.

තාත්ස්ථ්‍ය = 1. එහි සිටින බව.

තාදර්ථ්‍ය = 1, අපේක්ෂාව; අදහස,

තාදාත්ම්‍ය භාවය = 1. එය ආත්මකොට ඇතිබව; එම ඇත්තාම වීම; එකක් බව.

තාදිස = (තාදිසු) 1. එබඳු වූ.

තාදෘශ = 1 එබඳු වූ.

තානම = 1. තාලය 2. තානායම.

තානය = 1. තලාව. 2. තාලය. 3. මූවාව. 4 විෂය.

තානය = (තානේ) 1. ස්ථානය; තැන.

තානව = 1. තුනී බව.

තාන් = 1. අළුත්. 2 තොගේද්ද අළුත් (රෙදි ආදිය.)

තාන්තුවාව = 1. උත්සවය. 2. තීරණයකට නොපැමිණීම. 3. හිත කලබල වීම.

තාන්තුවා වෙනවා = 1. අත්දූත් කුත්දූත් වෙනවා.

තාන්ත්‍රික = 1. යම් කිසි විද්‍යාවක් හොඳහැටි දන්නා.

තාන්ත්‍රිකයා = 1. යන්ත්‍ර, මන්ත්‍ර, තන්ත්‍රාදිය උගතා.

තාන්න මාන්න = 1. තම්බු තානායම්; කන-තුරු හා ශරුබුහුමන්.

තානාන්තරය = (ස්ථානාන්තරය) 1. පදවිය; තනතුර;

තානාපතියා = 1. යම් කිසි රටක් වෙනුවෙන් තවත් රටක පෙනී සිටින නිලධාරියා.

තානායම = 1. විශ්‍රාම ශාලාව. 2. කෑම්, බීම් ඇතිව හෝ නැතිව නවාතැන් දෙන ගෙය.

තාපෝච්ඡිත = 1. තැනට සුදුසු.

තාපනාශ = 1. තැවීම. 2. දැවීම. 3. ඇවිස්සීම. 4 සුනඛයා. 5. රාගය.

තාපනීය = 1. ඇවිස්සෙන. 2. දිලිසෙන.

තාපය = 1. තැවීම. 2. දුක. 3. උෂ්ණය. 4 අපායක නමක්.

තාපසයා = 1 තපස් රකින්නා. 2. ශිලයක් රකින්නා. 3 කෙලෙස් තවන්නා.

තාපසාරාමය = (තාපස + ආරාමය) 1 තපසුන් වෙසෙන අසපුව.

තාපස ප්‍රව්‍රාජ්‍යාව = 1. තවුස් පැවිද්ද.

තාපසී = 1. තපස්වරිය.

තාපහර = 1. තැවීම පහකරන. 2. සිසිල් කරන.

තාප්පය = (තාප්පේ) 1. ප්‍රාකාරය; කොට බිත්තිය.

තාප්ප මෝල = 1. ගෙබිම කොටා සමතලා කිරීමට යොදන ලීයෙන් කළ උපකරණය.

තාම = 1. තෝම. 2. තවම; මෙතුවක්.

තාමස = 1. භයානක දෙයක්. 2. වැරැද්ද. 3. කාන්සාව.

තාමර = 1. වතුර. 2. ගිතෙල්.

තාමර කුම්භ = 1. තාම්‍ර කුණ්ඩය.

තාමරක්ඛ = 1. රතු ලූනු.

තාමරස = 1. රත්රන්. 2. තඹ. 3. රතු නෙළුම්.

තාමස = (තාම සික) 1. කළුවර. 2. ක්‍රෑර; නපුරු.

තාමසඝ = 1. අඳුර.

තාමසී = 1. සිව දෙවියාගේ භාර්‍යාව; දුර්ගා නම් දෙවඟන.

තාම්බූල = 1. බුලත්.

තාම්බූලි = 1. බුලත් වැල.

තාම්‍ර = 1. තඹ. 2. රත් පැහැති. 3. රත්වන්පාට.

තාම්‍රකාරක = (තාම්‍ර කුට්ටයා) 1. තඹ වැඩ කරුවා.

තාම්‍රකුෂ්ඨ = 1. එනම් රෝගය.

තාම්‍රකූල = 1. ඇත් කුලයක්.

තාම්‍රචූඩ = 1. කුකුළා.

තාම්‍රපත්‍ර = (තාම්‍ර පත්‍ර) 1. තඹ තහඩුව.

තාම්‍රපර්ණී = 1. දකුණු ඉන්දියාවේ ගංගාවක් 2. (විජය කුමරු ලංකාවට ගොඩ බැස සිඩා සංසිඳුවා ගැනීම පිණිස මුදු වෙරළ අද්දර අත්ල පොළොවට ඔබ්බා ගෙන සිට අත්ල බැලූ විට ඒ තඹ පැහැයෙන් තුබුණු නිසා මෙරටට 'තාම්‍ර පර්ණී' යයි කියැවුණු) ලංකාවේ නාමයක්. 3. මැව 4. ඉන්දියාවේ දිස්ත්‍රික්කයක්. 5. තඹ පැහැති අල්ල.

තාම්‍ර පල්ලව = 1. තඹ පැහැති දළු. 2. අසෝක ගස.

තාම්‍රලෝහ = 1. තඹ.

තාම්‍රවර්ණී = තඹ පැහැය.

තාම්‍රසාර = 1. රත් හඳුන් සාරය. 2. රත්හඳුන් ගස.

තාම්‍රශිඛියා = 1. කුකුළා

තාම්‍රාක්‍ෂ = 1. තඹපාට.

තායම් = 1. කපටි බස්. 2. ප්‍රයෝග.

තායම = 1. මායාව; ප්‍රයෝගය.

තාර = 1. කිල්. 2. තරු. 3. නාවිකයා. 4. දීප්තිමත්. 5. පැහැදිලි. 6. හොඳ. 7. පිරිසුදු. 8. ඉතා උස්. 9. ගල් අඟුරු තෙල්. 10. උස් දිස් හඬ.

තාරකා = 1. තරු. 2. නාවිකයා. 3. ලංකාවේ පුරාණ අධිපතියෙක්. 4. දේව වර්ගයක්.

තාරකාපති = 1. චන්ද්‍රයා.

තාරකාය = 1. එතෙරවීම. 2. පහර.

තාරකයා = 1. රැකවලා; ආරක්ෂකයා. 2. මඟ පෙන්වන්නා. 3. යක්ෂයෙකුගේ නමක්.

තාරකා = 1. තරු. 2. කැකෑන් තරු. 3. තරු-පිළිබඳ. 4. ගස් වර්ගයක්.

තාරකාව = 1. තරුව. 2. කැකෑන් තරුව. 3. ඇස. 4. කළු ඉංගිරියාව.

තාරකාධිපති = 1. චන්ද්‍රයා.

තාරකාසමූහය = 1. තරු සමූහය; තරුපෙළ.

තාරකාවලෝකිත = 1. තරු එළිය ඇති.

තාරකාස්තය = 1. තරු බැසීම.

තාරකා ශාස්ත්‍රය = 1. තරකා ගැන උගන්වන ශාස්ත්‍රය; ජ්‍යොතිශ් - ශාස්ත්‍රය.

තාරකිත = 1. තරුවලින් ගැවසීගත්.

තාරකේශ්වරයා = 1. තරුවලට ප්‍රධානයා; චන්ද්‍රයා.

තාරණය = (තාරය) 1. එතෙරවීම.

තාරය = 1. (සංගීතයෙහි) උස් දික් හඬ. 2. රිදී 3. ඇටසැකිල්ල. 2 ඉතා දිලිසෙන මුතු.

තාර්ක්‍ෂධ්වජයා = 1. ගුරුළුකොඩි ඇත්තා; විෂ්ණු දෙවි.

තාර්කික = 1. තර්කයට අයිති. 2. තර්ක ශාස්ත්‍රය දන්නා.

තාරා = 1. තාරකාව. 2. බෘහස්පතීගේ භාර්‍යාව. 3. දුර්ගා නම් දෙවඟන 4. අවලෝකි-තේශ්වර බෝධි සත්ත්වයන්ගේ භාර්‍යාව?

තාරාපති = 1. තාරකාවන්ගේ ප්‍රධානයා; චන්ද්‍රයා. 2. සිව දෙවියා. 3. බ්‍රහස්පතී.

තාරාව = 1. තරුව. 2. තාරා නම් දෙවඟන. 3. ඉංගිරියාව.

තාරුණ්‍යය = 1. තරුණ භාවය.

තාර්ක්ෂ්‍ය = 2. පක්ෂි කුලයක්.

තාල = 1. තල්ගසට අයිති. 2. තල් ගස. 3. අල්ල. 4. තාලය. 5. මං පටගිල්ල හා දබරගිල්ල අතර කොටස. 6. අත් පොලසන් දීම. 7. කයිතාලම.

තාලක = 1. තාලිය.

තාල පඞ්ක්තිය = 1. තල් ගස් පෙළ.

තාල පත්‍රය = 1. තල් කොළය; තල් පත.

තාල පර්ණ = 1. තල්කොළ. 2. පුස්කොළ.

තාල වෘන්ත = 1. තල්වැට; වටාපත; විජිනිපත.

තාල පොත = 1. පැරණි කවි තාල ආදිය ලියා තබන පොත.

තාලම් = 1. තාලය; වෘත්තය. 2. කයිතාලම.

තාලම් සබ = 1. කයිතාලම් වර්ගයක්.

තාල වබුව = 1. පවත් පත; අවාන.

තාලව්‍ය = 1. තාලුජ, තල්ලෙන් උපදින.

තාලව්‍යාක්ෂර = 1. තල්ලෙන් උපදින අකුරු.

තාලාංක = 1. බලරාම; ක්‍රිෂණගේ සහෝදරයා.

තාලාංකාජීක = 1. බලරාම පැරැද්දූ අය; කාර්තිකේය.

තාලාබ = 1. යතුරු වර්ගයක්.

තාලි = (තාලිය) 1. තැල්ල. 2. තලිය. 3. තැටිය 4 කල්දරම.

තාලීස් = 1. තලීස් පතුර.

තාලු = 1. තල්ල; මුඛයෙහි උඩු යටි කොටස්.

තාලුජ = 1. තල්ලෙන් උපදිනා අකුරු

තාලුජිහ්ව = 1. තල්ලම දිවකොට ඇති සතා; කිඹුලා.

තාව = 1. ඒතාක්. 2. එතෙක් කල්. 3. එපමණ. 4. නුවණ?

තාවකාලික = 1. ටික කලකට සීමාවූ. 2. දිගු-කලක් නොපවතින. 3. ඒ කාලයට පමණක් අයිති.

තාවත් = 1. ඒතාක් 2. සියලු.

තාවතිංසය = 1. තව් තිසා දෙව් ලොව.

තාවර = (තාවුරු) 1. ස්ථාවර; ස්ථිර. 2. නිශ්චල. 3. ශක්තිමත්.

තාවරකරනවා = (තාවුරු කරනවා) 1. ප්‍රමාද කරනවා. 2. කල්දමනවා.

තාවරය = 1. දුනුදිය; දුන්නේ ලණුව. 2. වතු පිටි ආදිදේ.

තාවලු = 1. වැවක ඉහළ වගාකරන කොටස.

තැ — තෑ

තැක් = 1. කිරිමෝරු. 2. සැකය.

තැකිච්ලි = 1. තැකුම; සැලකුම්; ගරුබුහුමන.

තැකීම = 1. සැලකීම. 2. තම්බු විසිරීම. 3. විශ්වාස කිරීම.

තෑකු = 1. සැලකූ; තකන ලද.

තෑබම්ල්ල = 1. තැත්කිරීම. 2. වේගය ගැනීම.

තෑම් = 1. කෑම කන බඳුන. 2. රා බොන බඳුන. 3. ශබ්දවාහිනී යන්ත්‍රවල ශබ්දය පතුරුවන පිහානක් බඳු දෙය.

තැටිගතකිරීම = 1. ශබ්දවාහිනී යන්ත්‍රවල තැටි වලට (සින්දු ආදිය) ගැනීම.

තැටිය = 1. පැතලි භාජනය.

තැටිලි = 1. තැටිය. 2. උදලු තලය.

තැටිලිපත් = 1. පාත්‍රය තබන ලෑල්ල.

තැඩැල්ලා = 1. එතම් මාළුවා.

තැන = 1. ස්ථානය. 2. (යම්කිසි) තනතුරක් දරන්නා. 3. තැනැත්තා.

තැනන = 1. ගර්ජනාව. 2. ගොඩ ගෙරවීම.

තැනන් වහන්සේ = 1. උන් වහන්සේ; එතුමා.

තැන් = 1. ස්ථානය. 2. පදවිය. 3. ස්ථවිර.

තැන්න = 1–සමතලා ගොඩ බිම.

තැන්තැන්හි = 1. නොයෙක් - නොයෙක් ස්ථානයන්හි.

තැන්පත් = 1. ස්ථාන ප්‍රාප්ත. 2. සන්සුන්. 3. එක්කාසුකිරීම. 4. අල්ලාසිටින. 5. හොඳින් හික්මුණු.

තැන්පත්කිරීම = 1. පරෙස්සම් ලෙස තබනවා. 2. එක්කාසු කරනවා. 3. වළලනවා.

තැනැති = 1. තැනැත්තා.

තැනැත්තා = 1. පුද්ගලයා; (ඒ) පුරුෂයා.

තැනැත්තී = 1. (ඒ) ස්ත්‍රී.

තැනි = (තැනිතලා) 1. සමතලා ගොඩබිම.

තැනිවරය = 1. තැන්න; සමතලා ඉඩම.

තැනීම = (තැනුම) 1. සෑදීම. 2. වෙවුලුම.

තැනූ = 1. සාදන ලද.

තැත = (තැත්) 1. උත්සාහය. 2. වීණාවේ තුල.

තැතනුම් = 1. මේඝ ගර්ජනාව; ගෙරවීම. 2 කෙඳිරිගෑම. 3. වෙවුලුම.

තැත්ඇති = 1. උත්සාහවත්

තැත්කරනවා = 1. වෑයම් කරනවා.

තැත්තවනවා = 1. දුන්නේ ලණුව අදිනවා.

තැති = 1. ත්‍රාසය; භය; බියෙන් වෙවුලුම.

තැතිගන්නවා = 1. ගිලන් ගැහෙනවා; බියපත් වෙනවා; භයෙන් වෙව්ලනවා.

තැටිල්ල = 1 උදලු තලය.

තැදි = 1 තැති; භය.

තැදිය - 1. බැම්ම. 2. ගිවිසුම.

තැප = 1. තැපිම කොට; ශරීරය උණුසුම් කොට. 2. බලාපොරොත්තුවෙන් සිට වෙහෙසට පැමිණ; තැවී.

තැපල = 1. චපල 2. සෙලවෙන.

තැප්පෙනවා = 1. රත්වෙනවා. 2. පැහී - පැහී තිබෙනවා.

තැප්පුලනවා = 1. (හරකුන්) කෑගසනවා; තපුල්ලනවා.

තැපෑල = 1. ලියුම් යැවීමේ මාර්ගය.

තැපැල්කන්තෝරුව = 1. ලියුම් බාරගන්නා ස්ථානය.

තැපැල්භාරයා = 1. ලියුම් බෙදන්නා.

තැපැල්ගාස්තුව = 1. ලියුමකට ඇලවියයුතු මුද්දරවල වටිනාකම.

තැපැල්පල = (තැපැල් කන්තෝරුව බලන්න.)

තැපැල්මුද්දරය = 1. ලියුමකට ඇලවිය යුතු ගාස්තුව සඳහන් සටහන.

තැබෑරුම = 1. රා-අරක්කු විකුණන ස්ථානය.

තැබීම = තැබුම.

තැඹ = 1. කණුව, ටැඹ.

තැඹිඹි = 1. (ලා) කජු ඇට.

තැඹිලි = 1. පොල් වර්ගයක්.

තැම්බීම = 1. රත්වීම. 2. පිසීම.

තැරදෙන = 1. මිරිකෙන.

තැරලි = 1. කෑම වර්ගයක්.

තැරඹෙනවා = (තැවරෙනවා) 1. ගැවෙනවා

තැරැව්ව = 1. පගාව. 2. යම් වැඩක් කරදී මුදල් ලබන ක්‍රමයක්.

තැරුසුම් = 1. තරාසවීම; කිපීම.

තැසිය = 1. පොල් කෙඩි ආදියෙහි නැට්ට හා කෙඩිය හාකරන කොටස. 2. මලේ නැට්ට අසල කොටස.

තැල් = 1. වැල්වර්ගයක්.

තැල්ම = 1. තැලීම 2. ඇගේ මස් ලේ තැලීම.

තැල්ල = 1. කාන්තාවන්ගේ ග්‍රීවාභරණයක්. 2. යතතුරක් හැඟවීමට පලඳින පදක්කම. 3. ගව ආදීන්ගේ නිකටෙන් එල්ලෙන කොටස.

තැලි = 1. මාදු; බුරුල්. 2. ඔක්කාරය. 3. තලිය. 4. ග්‍රීවාභරණයක්. 5. තලය. 6. හැඹිලි.

තැලිපට = 1. ගවයන්ගේ බෙල්ලෙන් එල්ලෙන කොටස.

තැලිපොල = 1. ගලකබ; තැල්ල.

තැලි පිළි = 1. මනමාලියගේ බෙල්ලේ පලඳවන මාලය හා අන්දවන රෙදි.

තැළිය = 1 පැතලි භාජනය. 2. කාන්තාවන්ගේ ග්‍රීවාභරණයක්.

තැලිවල = 1. පපුවේ වළ.

තැලිවැල = 1. තැළිය.

තැළිඹුව = (තැළඹුව) 1. තැල්ම.

තැළීම = 1. පහරදීම; ගැසීම. 2. පොඩි පට්ටම්වීම.

තැළිසම = 1. හම.

තැවරීම = 1. ගෑම; ආලේපකිරීම. 2. එකට හැපීම. 3. අතගෑම.

තැවරූ = 1. තවරන ලද.

තැවි = 1. තැවීම; කනගාටුව.

තැවිල්ල = 1. පොට්ටනි ආදියෙන් තැවීම. 2. කනස්සල්ල. 3. හිරිගැර විදීම.

තැඹු = 1. පසුතැවිල්ල. 2. රත්කළ 3. උණුවතුරෙන් උණුසුම් කළ.

තැඹුණු = 1. රත්වුණු. 2. කනගාටුවූ.

තැඹුරූ = 1 තඹවුරු; සපිර. 2. සවි.

තැඹුල් = 1. තැවුලිය. 2. අව්ව. 3. පශ්චාත්-තාපය. 4. හිරිහැර විදීම.

තැඹුලි = 1. තැවීම. 2. පසුතැවිල්ල.

තැඹුව = 1. ගොරෝසු මතු පිටක් ඇති.

තැස් = 1. ධාන්‍ය කුඩු.

තැළූ = 1. පහර දුන්; ගැසූ. 2. පොඩිකළ.

තෑගි = 1. ත්‍යාග ගුණය ඇති. 2. ආදර ගෞරවය නිසා දෙන දෙය.

තෑගිකරය = 1. තෑගි ඔප්පුව; තෑගි පත්‍රය.

තෑගිබෝග = 1. තෑගි ආදිය.

තෑගිවන්ත = 1. පරිත්‍යාග කරන.

තෑග්ග = 1. පරිත්‍යාග කරන දෙය.

තෑන්තය = (තැන්දය) 1. ඇඳන්වල වියන් තට්ටුව.

තෑල = 1. සරුව පිත්තල කොළ.

ති – තී

ති = 1. තැන.

තික = 1. තුනේ සමූහය; ත්‍රිකය.

තිකටු = (තිකටුක - ත්‍රිකටුක) 1. කුළු බඩු තුන් වර්ගය; ඉඟුරු, ගම්මිරිස්, තිප්පිලි යන තුන.

තික් = 1. තියුණු. 2. මුවහත්. 3. දැඩි. 4. උණුසුම්. 5. සැර ඇති. 6. පුල්ලි සහිත; තිත් සහිත.

තික්ඛ = 1. තියුණු; සියුම්.

තික්ත = 1. තිත්ත. 2. අඹිහිරි.

තික්තා = 1. ඉඟුරු, ගම්මිරිස් හා තිප්පිලි මිශ්‍රය.

තික්පොළඟා = 1. තිත් පොළඟා; එනම් සර්පයා.

තික්මෙරජ = (තික් මෙරද) 1. සූර්යයා.

තික්රැස් = 1. සූර්යයා.

තික්හෙලිශා = 1. කොරා.

තිකිච්ඡක = 1. පිළියම් කරන්නා; වෛද්‍යයා.

තිකිච්ඡා = 1. පිළියම; වෙදකම.

තිකිත්සාව = 1. චිකිත්සාව; රෝගයක නිදාන පූර්වරූපාදිය පරීක්ෂා කිරීම. 2. වෙදකම.

තිකූල = (තිකුළ) 1. මහමෙර පිහිටා තිබෙන පර්වත තුන.

තිකුළු = 1. ත්‍රි කූට පර්වතය. 2. ඉඟුරු, ගම්මිරිස් හා තිප්පිලි.

තිඛිණ = (තිඛිණ) 1. තියුණු; මුවහත්; සියුම්.

තිගඳ = 1. සඳුන්, අගිල්, කපුරු යන තුන.

තිග්ම = 1. රත්වූ. 2. කහට. 3. සැර.

තිග්මාංශු = 1. චණ්ඩ රශ්මි ඇති. 2. ·භයානක. 3. සූර්යයා.

තිගැස්සෙනවා = 1. තැතිගන්නවා. 2. බියෙන් ගැස්සෙනවා.

තිගුණ = 1. ගුණ තුන.

තිගුරුස් = 1. තද අව්ව.

තිචීවර = 1. තුන් සිවුරු. (අඳනය, පොරෝනය හා දෙපට සිවුර.)

තිට = 1. තී හට.

තිඩි = 1. තුටු වූ.

තිඩිග = 1. ගස් වර්ගයක්.

තිනයන = 1. ඊශ්වරයා.

තිතරඳ = 1. තල්.

තින්ත = 1. තීන්ත; ලිවීමට හෝ පාට කිරීමට ගන්නා ද්‍රව්‍යය.

තින්තිඩිකා = (තිත්තිඹි) 1. තෙල්ලි.

තින්තිණි = 1. සියඹලා ගස.

තින්දු = (තින්දුක) 1. තිඹිරි.

තිනිඳුම = (තිඳුම) 1. කම්පාව; සෙලවීම.

තිනිඳෙන = 1. සෙලවෙන.

තිනෙත = (තිනෙත්) 1. ඇස් තුනක් ඇත්තා; ඊශ්වරයා.

තිනෙත්පුත් = 1. ඊශ්වරයාගේ පුත්‍රයා; කාර්තිකේය.

තිනෙත්රිපු = (තිනෙත්රුපු) 1. ඊශ්වරයාගේ හතුරා; කාමදෙවියා.

තිණ = 1. තණකොළ. 2 තුන.

තිණඩ = 1. තුනට අඩකින් අඩු; දෙකහමාර.

තිණයිසි = 1. තණකොළ බුදිරිය.

තිණව = 1. බෙර ජාතියක්.

තිණසූල = 1. බෝලිද්ද.

තිණහාරක = 1. තණකොළ ගෙනෙන.

තිණාගාර = 1. තණ සෙවිලි ඇති ගෙය.

තිණ්ණ = 1. එතෙර වූ. 2. ගොඩ ආ.

තිත = 1. කැලල. 2. තැවතීමේ ලකුණ.

තිත් = 1. පැල්ලම්; කැලැල්. 2. තිත්ත. 3. තෘප්තිය; සෑහීමකට පැමිණීම. 4. තීර්ථකයා. 5. තීර්ථය. 6. මිථ්‍යාදෘෂ්ටිය. 7. බොරු. 8. ලප.

තිත්තිණි = 1. සියඹලා

තිත්ත = (තික්ත) 1. අමිහිරි රසක්.

තිත්ත අඹින් = 1. එනම් බෙත.

තිත්ත අරිනවා = 1. තිත්ත පහකරනවා.

තිත්තපැටියා = 1. කුඩා දරුවා. 2. කුඩා පැටියා.

තිත්තයා = 1. එනම් කුඩා මාළුවා.

තිත්තවෙනවා = 1. එපා වෙනවා.

තිත්ති = 1. තෘප්තිය; සෑහීම. 2. ආශාව. 3. සතුටට පැමිණීම.

තිත්තිර = 1. වටුවා. 2. තිත් වටුවා.

තිත්ථ = 1. තොට 2. නැව්තොට. 3. ශුද්ධ ස්ථානය. 4. දෘෂ්ටිය. 5. ගුරුවරයා. 6. විශ්වාසය.

තිත්ථකර = 1. ආගමක් සාදන්නා. 2. වැරදි ඇදහිලි ඇතිකරන්නා.

තිත්ථායතන = 1. ආගමක මූලික දෙය.

තිත්පොළඟා = (තිත් පොළඟා බලන්න.)

තිත්කුඩම් = 1. සැරසිලි වෙසෙසක්. (මල් තොරන්.)

තිථිය = (තිථිය) 1. පසළොව. 2. චන්ද්‍ර මාසයේ දවස. 3. සපිරව පිහිටීම.

තිදස = 1. තව්තිසා දෙව්ලොව. 2. දෙවියෝ.

තිදස ඉසුරු = 1. ශක්‍රයා.

තිදසපුර = 1. තව්තිසා දෙව්ලොව.

තිදසාලය = 1. දෙව්ලොව.

තිදස් = 1. දෙව්ලොව. 2. දෙවියෝ. 3 ශක්‍රයා.

තිදස්රජ = 1. ශක්‍රයා

තිදස්රද අවිය = 1. දෙව් දුන්න; දේ දුන්න. 2. ශක්‍රයාගේ ආයුධය.

තිදසිඳු = (තිදස් පති) 1. ශක්‍රයා.

තිඳුස් = 1. අශ්වයා.

තිදිව = 1. දෙව්ලොව.

තිදිවාධාර = 1. මහමෙර.

තිදොස් = 1. වා, පිත්, සෙම් යන තුන.

තිධා = 1. තුන් ආකාරයකින්.

තිපල් = 1. අරළු, බුළු, නෙල්ලි යන ගෙඩි ජාති තුන.

තිපල් කසාය = 1. අරළු, බුළු, නෙල්ලි යන ගෙඩි ජාති තුනේ සංයෝගය.

තිප්පිලි = 1. එනම් බෙහෙත් වර්ගය. (පිප්පලී)

තිප්පල = (තිප්පොළ) 1. තවාතැන් පොළ; වාසස්ථානය. 2. බෙණය. 3. ගුහාව. 4. ස්ථානය.

තිපාස = (තිබග) 1. පිපාසය.

තිපිටක = 1. ත්‍රිපිටකය (විනය, සූත්‍ර, අභිධම් යන පිටක තුන.)

තිපු = 1. ඊයම්.

තිපුමා = 1. ත්‍රස්තවාලු. (වැල)

තිබග = 1. පිපාසය.

තිබ්බටු = (තිබ්බොටු) 1. එනම් බටු වර්ගය.

තිබ්බා = 1. තැබුවා.

තිබිලි = 1. පණාබෙර.

තිබිලියා = (තිවිලියා) 1. බඩේ රැලි තුනක් වැටී තිබෙන්නා.

තිභුවන = 1. තුන් ලොව.

තිඹ = 1. ද්‍රෝණය; ලාස් සතර. 2. බුසල් බාගය?

තිඹිර = (තිඹිරි) 1. අන්ධකාරය; කළුවර. 2. තිඹිරි ගස.

තිඹිජ්ජ = 1. එනම් ගස. 2. එනම් ගෙඩි.

තිඹිරිගේ = 1. කළුවර කාමරය. 2. වදන ගේ.

තිඹිලි = 1. පණා බෙරය.

තිම = 1. වී.

තිමණ්ඩල = 1. නාභිය හා දෙදන.

තිමද = 1. කාම ආශා තුන. 2. ඇතුන්ගේ අවස්ථා වශයෙන් වැගිරෙන තුන් ආකාරවූ මද.

තිමි = 1. මුහුදෙහි වෙසෙන ඉතා විශාල මාළුවෙක්. 2. බිලග. 2. ක්ලාන්තය 4. මුහුද.

තිමිං = (තිමිංගල) 1. විශාල මත්ස්‍ය වර්ගයක්.

තිමිත = 1. තෙත. 2. සපිර. 3. සවි.

තිමිය = 1. වල. 2. ක්ලාන්තය. 3. මුහුද.

තිමිර = 1. අන්ධකාරය; කළුවර. 2. ඇස් ලෙඩක්.

තිමිරරිපු = (තිමිරරුපු) 1. අන්ධකාරයේ සතුරා. 2. ඉර. 3. හඳ.

තිමිසා = 1. දුඹු අඳුර.

තිමුඛ = 1. කුඹැල්ලා.

තිය = 1. තුන; ත්‍රය.

තිය ඇස් = 1. ඇස් තුනක් ඇත්තා; ඊශ්වරයා.

තියකුරු = 1. අකුරු තුනක්.

තියනවා = 1. තබනවා. 2. තිබෙනවා; තියෙනවා

තියනෙත් = 1. ඇස් තුනක් ඇත්තා; ඊශ්වරයා.

තියඹර = 1. තියඹලා නම් ව්‍යඤ්ජනය; කිරෙන් තැම්බා පිසීමක්.

තියඹරා = 1. එනම් කැකිරි වර්ගය.

තියමු = (තියම්, තියම) 1. යාම තුනකින් යුත් කාලය.

තියමු රැ = 1. තුන් යම් රාත්‍රිය; මුළු රාත්‍රිය.

තියවක = (තියවක්) 1. පක්ෂයෙහි තුන්වැනි තිථිය.

තියල් = 1. මාළු ඉවීමේ ක්‍රමයක්.

තියා = 1. තබා.

තියු = 1. සතුතිය; ප්‍රශංසාව.

තියුකරු = 1. සතුති කරන්නා; වන්දිභට්ටයා.

තියුගී = 1. සතුති ගීතය.

තියු ඝෝෂ = 1. සතුති ඝෝෂාව; සතුති රාවය.

තියුණු = 1. මුවහත්; සියුම්. 2. තුන්ගුණ.

තියුණුකර = 1. තද රශ්මිය. 2. සූර්යයා.

තියුම = 1. සතුට.

තියු වදන් = 1. සතුති වචන.

තිර = 1. කබතුරා; රෙදිවලින් සෑදූ ආවරණ. 2. ස්ථිර. 3. කල් පවතින. 4. තිර වූ; බැඳුණු. 5. නිශ්චය. 6. පොළොව.

තිරකරනවා = 1. ස්ථිර කරනවා. 2. නිශ්චය කරනවා.

තිරක්කාර = 1. අවමානය; අපහාසය.

තිරච්ඡ = (තිරච්ඡාන) 1. තිරිසනා; අපා, දෙපා, සිවු පාදි සත්තු. 2. කල්පනාව නැති. 3. ලාමක.

තීරණ = (තීරණ) 1 තීන්දුව.

තිරත්න = 1. බුද්ධාදී රත්න තුන.

තිරය = 1. කබතුරාව; රෙද්දෙන් සෑදූ වැස්ම.

තිරලියා = 1. මාළු වර්ගයක්.

තිරළුවා = (තිරෙළුවා) 1. බැටළුවා.

තිරසර = 1. ස්ථිර සාර; ඉතා නිශ්චල. 2. සත්තක. 3. ඒකාන්ත. 4. නොසෙල්වෙන.

තිරස් = 1. අන්තර්ධානය; නොපෙනීයාම.

තිරස්කරණීය = 1. මඩුමක් වටා බැඳි පිට මඩුව.

තිරස්කාර = (තිරක්කාර බලන්න.)

තිරස්කවාළු = 1. එතම් වැල් වර්ගය.

තිරශ්චීන = 1. තිරිසන්; මෘග. 2. ලාමක.

තිරීක් = 1. තිරිසන්. 2. හරහට. 3. වකුටු.

තිරීශ්ගතයා = 1. තිරිසනා.

තිරාකල් = 1. චිරාත් කාලය; බොහෝ කල්.

තිරි = 1. ත්‍රි; තුන. 2. ස්ත්‍රී. 3. ඇතිරිලි.

තිරි කටුක = 1. ඉඟුරු, ගම්මිරිස්, තිප්පිලි යන තුන.

තිරිංගය = 1. බර ඉස්සීමේ උපකරණයක්. 2. තදකිරීමේ උපකරණයක්. 3. අඹරවා ගැට ගසන බැම්මක්.

තිරිංග සොළු = 1. කරත්තවල රෝද වැඹිපුර නොකැරවෙන පිණිස යොදන ලීය.

තිරිකුඩම් = 1. මහ සැරසිල්ලක්.

තිරික්කල = 1. තනි ගොන් කරත්තය.

තිරිගු = 1. එතම් ධාන්‍ය වර්ගය.

තිරිත්තකම් = 1. නගපත් නැසිරීම; නොඳ මිළිලමේලු.

තිරික්කමකට = 1. ප්‍රමාණයානට.

තිරිවානා ගල් = 1. තිරිවානා ගල්.

තිරිසනා = 1. මෘගයා, අපා-දෙපා සිවුපාදී සත්තු.

තිරිසන් අපාය = 1. තිරිසන් ආත්මය.

තිරිහත් = 1. මහලුව සිට තරුණ වීම.

තිරිහත් බෙහෙත = 1. මහල්ලන්ට තරුණ ශක්තිය ගෙන දෙන බෙහෙත.

තිරිටක = 1. ගස් සුඹුළු; වස්ත්‍ර විවීමට ගන්නා ඇතුල් පට්ටා වර්ගයක්. 2. පොත්ත. 3. පතුර.

තිරු = 1. ස්ථිර; 2. තද. 3. තිර.

තිරුවා = 1. වැඩි තුවණ නැත්තා.

තිරුවාකනා = 1. තුවක්කුවේ කොකා.

තිරුවානා = 1. තිරිවානා ගල්.

තිරෙළුවා = 1. එළුවා. 2. බැටළුවා.

තිරේ = 1. තිරය. 2. කබතුරාව.

තිරොක්කාර = 1. හෙළා දැකීම.

තිරෝ = 1. රස. 2. සරස්ව.

තිරෝකරණී = 1. කබතුරාව. 2. මූවාව. 3. තිරය.

තිරෝධානය = 1. ආවරණය; වැසීම. 2. ජවනිකාව. 3. පියන. 4. නොපෙනීයාම.

තිරෝහිත = 1. වැසී තිබෙන. 2. නොපෙනීගිය.

තිල = 1. තල. 2. මදට ගණ. 3. ලපය.

තිලක = 1. සඳුන් ආදියෙන් නළල මැද තබන ලකුණ. 2. ගස් වර්ගයක්. 3. තල-කැලල. 4. උතුම්. 5. රුහුණු, මායා, පිහිටි යන ත්‍රිසිංහලය. 6. කළුලුණු.

තිලකක්ක = 1. තල අඹරා සෑදූ කල්කය.

තිලකාභරණ = 1. නළලේ පළඳින ආභරණ-යක්. 2. තිලකය නමැති ආභරණය.

තිලකාය මාන = 1. තිලකයක් වැනි.

තිලකාළු = 1. තල කැලල.

තිලකුණු = 1. අනිත්‍ය, දුඃඛ, අනාත්මය යන ලකුණු තුන.

තිලකාභ = (තිලක + ආභ) 1. තිලකයක් වැනි.

තිලජ = 1. තල තෙල්.

තිල තණ්ඩුල = 1. න්‍යායයක නමක්.

තිල තයිල = 1. තලතෙල්.

තිලන් = 1. බලභද්‍රයා.

තිල පර්ණී = 1. තල කොළ. 2. රත්සඳුන්.

තිල පුෂ්ප = 1. තල මල්.

තිලි = 1. මෙට්ටය; කුලිච්චම. 2. තලිය. 3. ඇතිරිය.

තිලිංගික = 1. ලිංග තුනට අයිති.

තිලිච්ච = 1. පොලඟා.

තිලින = 1. තැග්ග; සතුටු පඬුර. 3. දූතය.

තිලින් = 1. එයින්. 2. මෙයින්.

තිලින් = 1. තෙල; තෙලෙ. 2. මෙයින්.

තිලි = 1. එහි. 2. අර පෙනෙන තැන.

තිලොව = 1. තුන්ලොව. (දිව්‍ය, මනුෂ්‍ය, නාග යන තුන්ලොව.)

තිලො ඇදුරු = 1. තුන් ලොවට ගුරුවරයා; බුදුන් වහන්සේ.

තිලෝනා = 1. තුන් ලොවට නායකයා; බුදුන් වහන්සේ.

තිවංක = 1. වක් තුනක් ඇති; තුන් තැනකින් වක්වූ.

තිවග = 1. ඉඟුරු, ගම්මිරිස්, තිප්පිලි.

තිවට = 1. මහා බ්‍රහ්මයා. 2. විශ්වකර්මයා. 3. ලෝකයෙහි ඇතිවීම, පැවැත්ම, විනාශය යන තුන.

තිවටහන් = 1. මහා බ්‍රහ්මයා.

තිවන = (තිවණ, තිවන්) 1. පාට තුනක්-ඇත්තා; ගිරවා.

තිවනා = 1. ගිරවා.

තිවිලි = 1. බඩේ රැලි තුන.

තිවු = 1. ස්තුතිය; ප්‍රශංසාව.

තිවුණු = 1. තියුණු; මුවහත්.

තිසක් = 1. යුධයට සරසන ලද අශ්වයාගේ ළණු පටිය.

තිසත් = 1. විකුම්, ප්‍රභූ, මන්ත්‍ර යන ත්‍රිවිධ ශක්තිය. 2. තියුණු. 3 කහට.

තිසර = 1. හංසයා. 2. ආභරණයක්. 3. මැඩියා. 4. උතුම්. 5. මුතු මාල.

තිසරණ = 1. බුදුන්, දහම්, සඟුන් යන සරණ තුන.

තිසරපට = 1. හංස රූපසහිත ආභරණය.

තිසර පෙරලිය = 1. ගස් වර්ගයක්.

තිසර පෙළ = 1. හංස පෙළ. 2. මුතුවැල.

තිසර හර = 1. මුතුවැල.

තිසරා = 1. හංසයා.

තිස් = 1. තිහ.

තිස් නාමක් = 1. භික්ෂූන් තිස් දෙනෙක්.

තිස්පැය = 1. (සිංහල) පැය තිහ.

තිස්ස = 1. කුමාරයෙක්. ගමක්.

තිස්සෙම = 1. නිතරම.

තිහුන් = (තිහුම්) 1. සතුට; ප්‍රීතිය.

තිහු = 1. සතුටුවූ.

තිහිණි = 1 තීක්ෂණ; තියුණු.

තිහිරි = 1. ගස් කෙඳිවලින් සෑදූ පට රෙදි.

තිහිරි අතරණ = 1. පට ඇතිරිල්ල.

තිහිරි හූ = 1. පට නූල්.

තිළි = 1. කුලිච්චම. 2. ඇතිළිය; බඳුන. 3. සතුට.

තිළින = 1. තැග්ග; සතුටු පඬුර.

තී = 1. තා යන්නෙහි ස්ත්‍රී ලිංගික වචනය.

තීක්ෂණ = 1. තියුණු. 2. හානක. 3. නපුරු.

තීක්ෂණ ගන්ධා = (තීක්ෂණ ගන්ධී) 1. අබ.

තීක්ෂණ ඵල = 1. කොත්තමල්ලි.

තීක්ෂණ මරීචි = 1. තියුණු රශ්මිය. 2. සූර්යයා.

තීක්ෂණ ලෝහ = 1. වානේ.

තීන්ත = 1. ලිවීමට ගන්නා කහට දියර. 2. පාට කිරීමට ගන්නා ද්‍රාවයක්.

තීන්දුව = 1. තීරණය. 2. විපාකය. 3. විනිශ්චය. 4. අවසානය; නමාරය.

තීයල = 1. ඉස්ම නැති වන ලෙස ඉවීමේ ක්‍රමයක්; මලවා ගැනීම?

තීර = 1. දිගට වෙන් කළ කොටස. 2. දික් පිටිය. 3. ඉවුර. 4. වෙරළ.

තීරණය = 1. නිශ්චය. 2. තීන්දුව. 3. යමක් විසඳා ලබාගත් නියමය. 4. හමාරවීම. 5. නිසැකය.

තීර දස්සි = 1. ඉවුර දකින්නා.

තීර ස්ථානය = 1. තොටු පළ.

තීර්ථ = 1. තොටුපළ. 2. මිථ්‍යා දෘෂ්ටි. 3. ශුද්ධවූ. 4. දෙවියන්ට කැපවූ.

තීර්ථ ආයතන = 1. තීර්ථක ශාසනය.

තීර්ථක ගුරු = 1. තීර්ථකයන්ගේ ගුරුවරයා.

තීර්ථක ශාසන = 1. තීර්ථකයන්ගේ සසුන.

තීර්ථකයා = 1. මිථ්‍යා දෘෂ්ටික තාපසයා.

තීර්ථකර = 1. මිථ්‍යා දෘෂ්ටිය ඇති කරන්නා.

තීර්ථ දූෂණය = 1. ආගමේ ශුබ යයි පිළිකුල් දේ කෙළසීම.

තීර්ථය = 1. ආගමේ ශුබ වස්තූන් යයි සම්මත දේ. 2. ශුබ ස්ථානය. 3. තොටු පළ. 4. ශිත්ත. 5. යාගය. 6. නිධානය 7. බ්‍රාහ්මණයා. 8. පූජාව. 9. උපාය.

තීර්ණ = 1. නිමවූ. 2. තීන්දුවූ. 3. නිශ්චයට පැමිණවූ. 4. තීරණය කළ.

තීරුව = 1. රේගුවේ ගාස්තුව. 2. ආණ්ඩුවෙන් බඩුවලට අය කරන බද්ද. 3. හීන් පටිය. 4. දිගට වෙන් කළ කොටස.

තීව්‍ර = 1. තියුණු. 2. ඉවසිය නොහැකි 3. සැර. 4. උග්‍ර.

තීව්‍ර අන්ධකාර = 1. තද කළුවර.

තීව්‍රා = 1. කළු අබ.

තු – තූ

තු = 1. නිඳිත.

තුංග = 1. උස්වූ. 2. උසස්වූ. 3. පර්වතය. 4. පොල් ගස.

තුංග තර = 1. ඉතා උස.

තුංගනඛ = 1. උස් වූ නිය.

තුංග නාසික = 1. උස් නාසයක් ඇති.

තුඟී = 1. වේලා ගස.

තුඟු = 1. උස්. 2. උසස්. 3. දෙඹ ගස.

තුගුල = 1. මාහෙල් අල. 2. ඔලු අල.

තුක් = (තුක් පිටි) 1. උණ කපුරු.

තුච්ඡ = 1. හිස්. 2. හරයක් නැති. 3. නිෂ්ඵල. 4. නීච. 5. පිළිකුල් කටයුතු.

තුච්ඡ ධාන්‍යක = 1. පිදුරු.

තුච්ඡ පත්‍රය = 1. එරබු; එබරු. 2. නිඳිත ලියවිල්ල.

තුච්ඡයා = 1. නීචයා.

තුජ = 1. අන්තරායකර; අනතුරු සහිත.

තුජතාව = 1. අනතුරු සහිත බව.

තුට = 1. සතුට; ප්‍රීතිය.

තුට්ටුව = 1. සත එකහමාර; පනමකින් හතරෙන් කොටස.

තුටු කඳුළු = 1. සතුට නිසා ඇතිවන කඳුළු.

තුටුකරනවා = 1. ප්‍රීති කරනවා; සතුටට පමුණුවනවා.

තුටු ඝෝෂ = 1. ප්‍රීති ඝෝෂාව.

තුටු පහටු = 1. ඉතා සතුටු වූ.

තුටු රැව් = 1. ප්‍රීති ඝෝෂාව.

තුටු සැණ = 1. සතුට නිසා කරන උත්සවය;

තුට්ඨ = 1. සතුටු වූ 2. පැහැදුණු.

තුට්ඨ චිත්ත = (තුට්ඨ මානස) 1. සතුටු සිත් ඇති.

තුට්ඨි = 1. ප්‍රීතිය; සතුට.

තුණ්ඩ = 1. මුඛය. 2. හොට. 3. සියුම් කොණ. 4. මූණ. 5. ආයුධ මුණය.

තුඩ කළුවා = 1. පක්ෂි වර්ගයක්.

තුඩාවේ පණ්ඩිත = 1. තුඩාවේ දෙන් අන්දිරිස් ද සිල්වා පණ්ඩිත ගුණවර්ධන මුහන්දිරම් මැතිතුමා. (මහා කවියෙකි.) පරෙවි සන්දේශය, කුසදා වත, මුවදෙව්දා වත, කාව්‍ය ශේඛරය ආදී ග්‍රන්ථ රාශියක් සංශෝධනය කොට ප්‍රසිද්ධ කරවූයේය.)

තුඩැල්ලා = 1. එනම් මාළුවා.

තුඩු කරනවා = 1. යමක් කිරීමට මානනවා. 2. මුවහත් කරනවා. 3. (පාත් දුල්ල) ඉදිරියට අදිනවා.

තුඹු පත = 1. තල් කොළයේ ලියූ රාජාඥාව හෝ පරිත්‍යාග ලියා තැබූ සටහන.

තුඩුව = 1. කොණ. 2. මුහුදට නෙරා තිබෙන බිම් කොටස.

තුඩ = (තුණ්ඩ) 1. තුඩ. 2. කට. 3. ඇත්හොඩ. 4. මූණ. 5. ඉදිරිය.

තුන = (තුණ) 1. එනම් ගණන. 2. තූල.

තුනැඟිල්ල = 1. මැඩිය වැල.

තුනමිය = 1. පිටි කොන්ද; කටිය; ඉඟටිය.

තුනබු = 1. බුලත්.

තුන් = 1. එනම් ගණන. 2. උතුම්.

තුන් ඇස් = 1. පැති තුනක් ඇති.

තුන් ඍතු = 1. හේමන්ත, ග්‍රීෂ්ම, වස්සාන යන සෘතු තුන.

තුන් කඹුවා = 1. එනම් මාළුවා.

තුන් කන = 1. හායසීංවත් තිදෙනෙක් ඇත්තා; ඊශ්වර දෙවි.

තුන් කල් = 1. අතීත, වර්තමාන, අනාගත යන කාල තුන.

තුන් කැලලි = 1. ඊශ්වර දෙවි

තුන් කොත් මාල = 1. ආභරණයක්.

තුන් කොණ = 1. කොන් තුන.

තුන් ගුණ = 1. සත්ව, රජස්, තමස් යන මනුෂ්‍ය ගුණ තුන.

තුන් ඡත්‍ර = 1. කුඩ තුන.

තුන්නකා = 1. තුන් නිකාය.

තුන්නවාශා = 1. මසන්නා.

තුන් නෙත් = 1. නෙත් තුනක් ඇත්තා; ඊශ්වර දෙවි.

තුන්තරා = 1. තුන් වැදෑරුම්; තුන් ආකාර.

තුන්තරා බෝධිය = 1. බුදු, පසේ බුදු, මහරහත් යන තුන් කැන.

තුන් තල = 1. ලෝක තුන.

තුන් තලෙක් = 1. බර ප්‍රමාණයක්; හමුවෙක්; විඳටකින් තුනෙන් පංගුව.

තුන්සිස් හැඟෙන් = 1. (සිංහල) සිස් පැය ක්‍රමයක්.

තුන් කෝරවිළි = 1. ප්‍රහේලිකා විශේෂයක්.

තුන් දල = 1. මිදෙල්ල ගස. 2. එරබදු ගස?

තුන් දිශ = (තුන් දිය) 1. බඩ.

තුන් දා = 1. තුන් දවස.

තුන් දා උණ = 1. තුන් දිනකින් මිය යන උණ රෝගයක්.

තුන් දෑ = 1. ජාති තුන.

තුන්දෑ ගඳ = 1. සුවඳ තුන් වර්ගය; කුරුඳු පොතු, එන්සාල්, කොල්ලම් කොළ යන තුන.

තුන්දූමාව = 1. ලොකු ගෙඩියකින් හා කුඩා ගෙඩි දෙකකින් යුත් පොකුර.

තුන් දුසිරිත් = 1. කාය දුශ්චරිත, වාග් දුශ්චරිත හා මනෝ දුශ්චරිත යන තුන.

තුන්දොර = 1. දොරටු තුන; සිත, කය, වචනය යන තුන.

තුන්දොස් = 1 වා, පිත්, සෙම් යන තුන. 2. රාග, ද්වේෂ, මෝහ යන තුන.

තුන්දොස් උණ = 1. සන්නිපාත උණය; තුන්-දොස් කිපීමෙන් ඇතිවන උණ.

තුන් දොස් බැන්දවීම = 1. භූතියම් ක්‍රමයක්.

තුන් නිකාය = 1. මහාවිහාර, ජේතවන, අභය-ගිරි යනවිහාර තුන මුල් කොටගෙන පැවැති භික්ෂු පරම්පරාව. 2. සියම්, අමරපුර, රාමඤ්ඤ යන තුන් කොටස.

තුන්නෙත් = 1. නෙත් තුනක් ඇත්තා; ඊශ්වර දෙවි.

තුන්පත් = 1. කුරුඳු ගස.

තුන්පත් රටාව = 1. පැදුරු විවීමේ ක්‍රමයක්.

තුන්පනේ වැඩ = 1. නුවණට හුරු නැති වැඩ.

තුන්පිටකය = 1. සූත්‍ර, අභිධර්ම, විනය යන තුන් පිටකය.

තුන් පුණ්‍ය ක්‍රියා වස්තු = 1. පින් කිරීමට ආධාරවන දාන, ශීල, භාවනා යන තුන.

තුන්පුතුමා = 1. මව හා දරු දෙදෙනාද යන තිදෙන.

තුන්බුම් = 1 තුන් මහල්; තට්ටුතුනක් ඇති.

තුන්බෝ = බුදු, පසේ බුදු, මහරහත්. 2. දුහැඹි, මහබෝ, පිළිම. 3. අත්තන පැලය.

තුන්බෝ අක්තන = 1. මාල තුනකින් යුත් මල් සහිත අත්තන.

තුන්භවය = 1. කාම භවය, රූප භවය හා අරූප භවය.

තුන් භය = 1. දුර්භික්ෂ භය, රෝග භය හා ආයුධ වලින් ඇතිවන භය.

තුන්මං = 1. මාර්ග තුන.

තුන්මං සන්ධිය = 1. මාර්ග තුනක් එක්වන හන්දිය.

තුන් මංසල් = 1. තුන් මං සන්ධියෙහි තැනූ ශාලාව.

තුන්මඩුල්ල = 1. පෙකණිය හා දණහිස් දෙක.

තුන්මද = 1. ඇතුන්ගේ අවස්ථා වශයෙන් වැහෙන තුන් ප්‍රකාරවූ මද.

තුන් යම් = 1. යාමතුන; පෙර යම, මැදයම හා අලුයම යන කාල තුන.

තුන් යම් රෑ = 1. රෑ තුන්යාමය; මුළු රාත්‍රි-කාලය.

තුන්යලක් = 1. තුන් විටක්.

තුන් රත්නය = 1. බුදුන්, දහම්, සඟ යන ත්‍රිවිධ රත්නය.

තුන් ඍතු = ඍතු තුන; (ග්‍රීෂ්මාන, වස්සාන හා හේමන්ත).

තුන් ලෙව් = (තුන්ලොව) 1. තුන් ලෝකය; දිව්‍ය, මනුෂ්‍ය, නාග යන ලෝක තුන.

තුන්වට = 1. තුන් වර.

තුන්වන් මිමු = 1. තුඹ කරිවිල.

තුන්වයස = 1. බාල, තරුණ, මහලු යන වයස් තුන.

තුන් විතක් = 1. කාම විතර්ක, ව්‍යාපාද විතර්ක, විහිංසා විතර්ක යන තුන.

තුන් විලි = (තුන්වලි) 1. බඩේ රැලි තුන.

තුන් වේදනා = 1. සුඛ වේදනා, දුඃඛ වේදනා; උපේක්ෂා වේදනා යන තුන.

තුන් සරණ = 1. සරණ තුන; බුඩ, ධම්, සංඝ යන තුන.

තුන් සරණේ = 1. තුන් සරණය. 2. එනම් කවි පොත.

තුන් සසුන් = 1. පර්‍යාප්ති, ප්‍රතිපත්ති, ප්‍රති වේධ යන ශාසනත්‍රයය.

තුන් සැන්දෑ = (තුන් සැඳෑ) 1. පෙරවරු, පස්වරු, රිවිමුදුන යන දිනය. පිළිබඳ සන්ධ්‍යා තුන.

තුන්සිත = 1. යම් කිසි ක්‍රියාවක් කරන්නට ඉස්සරත් කරන විටත් කිරීමෙන් පසුවත් පවත්නා සිත.

තුන් සිඹුරු = 1. දෙපට සිදුර, නහිපට සිවුර, අඳනය යන තුන.

තුන්සි = 1. තුන් වන ගී හැම.

තුන් සුසිරි = 1. කාය සුචරිත, වාක් සුචරිත, මනඃ සුචරිත යන තුන.

තුන් හබුල් = 1. කොටස් කාරයන් තුන්-දෙනෙක් ඇති.

තුනා = 1. සක්නාලියා; මහන්නා.

තුනා කම් = 1. මැහිම.

තුණි = 1. අවරිය ගස.

තුනිංචි = 1. ප්‍රීතිය. 2. සෙල්ලම් බඩුව.

තුනි = 1. සිහින්. 2. මාදු. 3. ඉහිඳුල්.

තුනි වතේ = 1. තුනී ලෙස; ඝන නොවන ලෙස.

තුනු = 1. ශරීරය. 2. තුනී. 3. කුඩා. 4. සිහින්. 5. හෙල්ලුණු. 6. තුන. 7. පැහැදිලි. 8. සැලබල වූ. 9. කෘශ; කෙට්ටු

තුනු අඟ = 1. සිහින් සිරුරක් ඇත්තී. 2. කාන්තාව. 3. අනංගයා.

තුනු කෙසරු = 1. ශරීරයෙහි ලෝම. 2. රෝම රාශිය. 3. නාභිය ළඟ පිහිටි ලොම් සමූහය; වයාරොද

තුනු තඹ = 1. ඇට්කුළා; ඇට්කුකුළා.

තුනු මැද = 1. ඉඟටිය.

තුනු සොන් = 1. අනංගයා.

තුනුරුවන් = 1. තුන් රුවන්; බුඩ, ධම්ම, සංඝ යන මාණික්‍ය තුන.

තුනු ලිය = 1. ශරීරය නමැති වැල.

තුනු වග = 1. සිහින් ශරීරයක් ඇත්තී. 2. කාන්තාව. 3. අනංගයා.

තුනුවන = 1. තුන් වැනි.

තුනුවනා = (තුනුහිරු) 1. අනංගයා.

තුනුවිල = 1. ශරීරය නමැති විල.

තුනු සුන් = 1. උලුක්කු වූ.

තුණ = (තුන්) 1. මැහීම. 2. (ගිණිමෙහි) තුන.

තුණ දරුවා = 1. සත්තාලියා. 2. රෙදිවියන්නා. 3. රත්වැඩකරුවා?

තුණ්ඩුව = 1. කැබැල්ල. 2. ලියුම් කැබැල්ල.

තුති = 1. ස්තුතිය; ප්‍රශංසාව.

තුතු = 1. ලෝහ උණුකරන කෝව. 2. තරාදි තට්ටුව. 3. හෙණ්ඩුව. 4. කැබිලිත්ත. 5. ලෝහ බොර.

තුතු කරනවා = පුණු විපුණු කරනවා; කැබලි-කැබලි කරනවා.

තුත්ත = 1. හෙණ්ඩුව 2. තුත්තම් 3. කැඩුණු කැබැල්ල. 4. කෝව. 5. ලෝහ බොර.

තුත්තනාගම් = 1. ලෝහ වර්ගයක්.

තුත්තිරි = 1. එනම් තෘණ විශේෂය.

තුත්ථ = 1. පල් මාතික්කම්.

තුදන = 1. විදීම; ඇනීම. 2. පීඩා කිරීම.

තුදු = 1. සිතාව. 2. දහහතර.

තුදුර = 1. දහ හතර.

තුදුස = (තුදුස්) 1. දහහතර.

තුදුස්වක = 1. පසලොස්වක හෝ අමාවක පසු වූ 14. වැනි දවස.

තුදුස් ඛණ්ඩවක් = 1. මහවග, සුළු වග යන දෙපොතෙහි පණවා වදාළ වත් දහහතර.

තුදුස් චරිත = 1. රාග චරිතාදි චරිත දහහතර.

තුදුස් මහා සන්ධි = 1. ශරීරයෙහි තිබෙන ප්‍රධාන සන්ධි දහහතර.

තුදුස් හත් = 1. රියන් දහහතර.

තුප්පහි = 1. පෘතුගීසි කාරයා. 2. ලංසි මිනිසා 3. භාෂා පරිවර්තක.

තුප්පහි මුදලි = 1. භාෂා පරිවර්තනය කරන මුදලි තැන.

තුප් පොට්ටිය = 1. ඉණ වට බඳින රෙද්ද; උඩරට සිංහල ඇඳුම් විශේෂයක්. 2. ඇඳේ ඇතිරිල්ල. 3. කරේදමන තුවාය.

තුබු = 1. තැබූ 2. හිස් තිසරු දෙස. 3 වල්ගය. 4. ඉතුරු වූ.

තුබුනිය = 1. වැවීම; ගස් ආදිය සිටුවීම.

තුබුණ = 1. තිබුණ.

තුබුව = 1. තැබුවොත්. 2. වල්ගය. 3. සුළු-දෙයක්.

තුඹ = 1. ඊයම්. 2. තුඹ කරිවිල. 3. ධූපය. 4. ගැට තුඹ ගස.

තුඹ කරිවිල = 1. එනම් එලවුළු.

තුඹනිය = 1. වැටීම.

තුඹ පත් = 1. ඊයම් කොළය.

තුඹ මල් = 1. ගැට තුඹ මල්.

තුඹයා = 1. එනම් මුදු මාළුවා.

තුඹස = 1. තුඹහ; හුඹහ.

තුඹු = 1. අරුණ. 2. ධූපය. 3. ඊයම්. 4. ඊය; ඊගහ. 5. තඹපාට.

තුඹුපට = 1. තඹ පාට රෙද්ද.

තුඹුපට = (තුඹු පත්) 1. ඊයම් කොළය.

තුඹු පිපි = 1. ඊයම් කුඩු.

තුම = 1. ආත්මය; තෙමේ.

තුමනට = 1. උතුමන්ට. 2. තමන්ට.

තුමි = 1. උතුම්.

තුම්පත් කුරුඳු = 1. පඳුරු වර්ගයක්.

තුම්බ = (තුඹු) 1. පොල් ගෙඩියේ උල් වූ කොටස. 2. පස්ස.

තුම්බරශ = 1. සංගීත භාණ්ඩයක්.

තුම්බුරි = (තුම්බුරු) 1. කොත්තමල්ලි.

තුමා = 1. උත්තමයා; උතුමා.

තුමා සිරි = 1. තමාගේ ශ්‍රියාව; තමාගේ ලස්සණ.

තුමුට = (තුමුටු) 1. ශීඝ්‍රව.

තුමුටුව = 1. ප්‍රීතිය. 2. මල් කේසරය.

තුමු තුමු = 1. තම-තමන්.

තුමුල = (තුමුල්) 1. මහත්. 2. උසස්.

තුර = 1. ගස. 2. ඇතුළ 3. වේගය. 4. අතර. 5. ඉක්මන්. 6. මධ්‍යම.

තුරඟ = 1. අශ්වයා. 2. දේශයක්. 3. ඉක්-මනින් ගමන් යන්නා.

තුරඞ්ගමය = 1. අසුන්ගෙන් උපන්; අසුන්ගෙන් හටගත්. 2. අසුන් ගැවසුණු.

තුරඞ්ගම = 1. අශ්වයා.

තුරඟ = 1. අශ්වයා.

තුරඟය = (තුරංගයා) 1. හිත.

තුරඟ රඟ = 1. එනම් වෘත්තය. 2. අශ්වයන්ගේ නැටුම්.

තුරඟවක් = 1. අශ්ව මුහුණක් ඇති දෙවියා 2 අශ්ව මුහුණක් ඇති කිඳුරා.

තුරඟ හල් = 1. ඉස්තාලය; අශ්වයන් බඳින ශාලාව.

තුරඟම් = 1. අශ්වයා.

තුරන් වෙනවා = (තුරන්දු වෙනවා) 1. දුරු වෙනවා. 2. වෙන්වෙනවා. 3. මැරෙනවා. 4. අත්හැර යනවා.

තුරල් = 1. විරල. 2. අඩු.

තුරස = (තුරුස්) 1. ණය.

තුර්කිය = 1. එනම් රට.

තුර්කියා = 1. තුර්කි රටේ මිනිසා.

තුර්කි තොප්පිය = 1. මරක්කල තොප්පි විශේෂයක්.

තුරා = 1. තුරු.

තුරා සහස් = 1. වේගය ඉවසන්නා; ඉන්ද්‍රයා.

තුරා ෂාඩ් = 1. ශක්‍රයා 2. ඉන්ද්‍රදේවියා.

තුරි = 1. තඩාව. 2. රෙදි විවීමේදී වුවමනා උපකරණයක්.

තුරිත = 1. ඉක්මන්; කඩිසර.

තුරිත්ති = 1. ගලා සිටින වතුර.

තුරි කාලුවා = 1. හැල්මේ දුවන්නා.

තුරිය = 1. තූර්ය භාණ්ඩය; බෙර-තලා ආදිය.

තුරිසි = 1. පල්මාංතික්කම්.

තුරු = 1. ගස්. 2. තාරකාව. 3. සතුට. 4. කනේරු ගස. 5. කුරුල්ලා. 6. තූර්යය. 7. ණය. 8. ඇස. 9. නාදය. 10. උතුරු දෙස. 11. නැතිකල. 12. තරණය කල. 13. තෙක්.

තුරුකස් = 1. කුරුල්ලෙක්.

තුරුක් = 1. තුවරලා නම් සුවඳ වර්ගය.

තුරුක්ම = 1. තුරුක් නම් සුවඳ වර්ගය. 2. තුර්කි රටට අයත්.

තුරුක් තෙල් = 1. සුවඳ තෙල්. 2. තුරුෂ්ක නම් සුවඳ වර්ගය.

තුරු ඝොෂ් = 1. තූර්ය නාදය.

තුරු නල = 1. උතුරු දෙසින් හමන සුළඟ.

තුරු නා = 1. තාරකාවන්ට නායක; චන්ද්‍රයා.

තුරුණ = (තුරුණු) 1. තරුණ. 2. බාල; ළදරු. 3. අළුත්.

තුරුණු විය = 1. තරුණ වයස.

තුරු සඩ = 1. උතුරු සළුව.

තුරු පති = 1. චන්ද්‍රයා.

තුරුස්පුව = 1. තුරුම්පුව; කඩදාසි ක්‍රීඩාවේදී උසස්වූ කොළ වර්ගය.

තුරුෂා = 1. ගසේ මුල; ගස් සෙවණ. 2. සැඟවීම.

තුරු පිය = 1. වෘක්ෂය නමැති ප්‍රියයා

තුරු පෙළ = 1. ගස් පේළිය.

තුරු රාජ = 1. තාරකාවන්ගේ රජ; චන්ද්‍රයා.

තුරු වත් = 1. ගස මෙන්.

තුරු රැව් = (තුරු නඩ) 1. කුරුළු නාදය. 2. බෙර ශබ්දය.

තුරුල්ල = 1. වැළඳ ගැන්ම. 2. ළය. 3. උකුලේ තබා ගන්නවා.

තුරුල් කරගන්නවා = 1. වැළඳ ගන්නවා. 2. ඔඩොක්කුවේ තබා ගන්නවා. 3. උකුලේ තබා ගන්නවා.

තුරුලිය = 1. ගස් හා වැල්. 2. පිළිල.

තුරුළු = 1. වැළඳ ගැනීම. 2. ඔඩොක්කුවේ තබා ගැනීම. 3. ඇකයේ තබා ගැනීම.

තුරුවඳුල = 1. කොළ නැති ඉපැල් ආදිය.

තුරුවරය = 1. උතුම් ගස. 2. විශාල වෘක්ෂය; වෘක්ෂ රාජයා.

තුරුවා = 1. පක්ෂියා.

තුරු වැල = 1. තරු සමූහය.

තුරුස් = (තුරුසු) 1. ණය.

තුරු හඬ = 1. බෙර ශබ්දය.

තුරු හිමි = 1. චන්ද්‍රයා. 2. සූර්යයා. 3. වෘක්ෂ-තමැති ස්වාමියා.

තුල = 1. තුලාව. 2. සමාන. 3. ඉරිවේරිය.

තුලකල = (තුල කෙළ) 1. පයේ දමන ආභරණයක්; පාසලඹ?

තුල තල = 1. තරාදි තට්ටුව.

තුලන = 1. කිරා බැලීම; සමාන කිරීම.

තුලනා = 1. ප්‍රමාණ කිරීම; මැනීම. 2. සැසඳීම.

තුලනු = 1. තුල්‍ය නොවූ; සමාන නුවූ.

තුලදර = (තුලාදර) 1. රන් රිදී වැඩකරුවා. 2. වෙළෙන්දා.

තුලද ෂා = 1. ඉඹුල් ගස.

තුලසි = 1. මදුරුතලා ගස.

තුල් = 1. තුල්‍ය; සමාන. 2. ථූල; මහත්. 3. තෙල්. 4. ඇස් කබ. 5. කන් කලාදුරු. 6. කිතුල් ගස.

තුල් මස් = 1. සතමාංසය; හොඳ මස්.

තුල් සි කරණය = 1. සමකිරීම.

තුලා = 1. තරාදිය 2. එනම් රාශිය. 3. පලම් සියය 4 ලිංවලින් පැන් ගන්නා ආඩියා නම් උපකරණය. 5. තලාදය

තුලා කූට = 1. හොර තරාදියෙන් කිරීම. 2. හොර මැනීම.

තුලා කෝටිය = 1. පාදාභරණයක්. 2. දස කෝටිය. 3. තරාදියේ තට්ටු දෙක. 4. බර ප්‍රමාණයක්.

තුලා දණ්ඩ = 1. තරාදි කඳ.

තුලාදර = 1 රත්කරුවා.

තුලාධර = 1. තුලා රාශිය. 2. වෙළෙන්දා.

තුලාධාරය = 1. තරාදි පොල්ල. 2. තුලාරාශිය.

තුලාධාරයා = 1. තරාදිය අල්ලා සිටින්නා; වෙළෙන්දා.

තුලාන = (තුලාන්) 1. පලාත. 2. ගම් ආරච්චි කෙනෙකුගේ රාජකාරියට අයත් ප්‍රදේශය?

තුලා බර = (තුලා භාර) 1. සම බර.

තුලා භාර දාන = 1. තමන්ගේ බරට සම් බරක් රන් රුවන් ආදිය දන් දීම.

තුලාම් = 1. තලාද.

තුලාර = 1. රත් කරුවා.

තුලා රාශිය = 1. තුලා රස.

තුලා ලග්නය = 1. තුලා රාශිය.

තුලාව = 1. තරාදිය. 2. තුලා ලග්නය. 3 සමානකම. 4. මූලප්පරාලය. 5. පලම් සියයක බර.

තුලාවරු = (තුලාකරු, තුලාදරු)1. රත්කරුවා.

තුලි = 1. මෙට්ටය?

තුලිකාමා = 1. කුරුළු ජාතියක්.

තුලිත = කිරන ලද.

තුලිය = 1. තෙලිකුර; පින්සල. 2. දඹු ලේනා.

තුලු = 1. අර. 2. මේ. 3. ඔය. 4. මොහු.

තුළුල් = 1. ථූල. 2. මහත්.

තුල්‍ය = 1. සම; සමාන.

තුල්‍ය ඵල = 1. සමාන ප්‍රයෝජන ඇති.

තුල්‍යත්වය = 1. සමානතාව.

තුල්‍යාධිකරණ = 1. සම බල ඇති.

තුළ = 1. ඇතුළ.

තුකූල් = 1. සිහින් රෙද්ද.

තුඹුක් = 1. පෙරහන්කඩ; දිය පෙරන වස්ත්‍රය.

තුවක් = 1. කාල සීමාව දක්වීමෙහි (එතුවක්--ඒවනතුරු; මෙතුවක්- මේවන තුරු)

තුවක්කුව = 1. එනම් භයානක ආයුධය; වෙඩි තබන උපකරණය.

තුවක්කු කන = 1. නිපුල; තුවක්කුවේ එනම් කොටස.

තුවක්කු කොකා = 1. තුවක්කුව පත්තුවීම පිණිස ගස්වන උපකරණය.

තුවක්කු නලය = 1. තුවක්කු කාණ්ඩුව.

තුවක්කු බඳිනවා = 1. තුවක්කුවෙන් වෙඩි නිකුත් නොවීමට මන්ත්‍ර බඳින කිරීම.

තුවක්කු වල්ල = 1. තුවක්කු කඳ.

තුවටු = 1. තැවීට.

තුවර = 1. තෝර ගස. 2. තුවරලා නම් සුවඳ පැලෑටිය. 3. තෝර පරිප්පු. 4. කහට. 5. කට්ට කුමංජල්. 6. වේල්ල; නියර වෙසෙසක්. 7. උදු

තුවරලා = 1. සුවඳ පැලෑටි වර්ගයක්. 2. කට්ට කුමංජල්?

තුවාජ්‍ය = (තුවාය) 1. මුණ හෝ ඇඟ පිස-දමන වස්ත්‍රය.

තුවාංල = 1. ඇගේ නොරි වණ ආදිය. 2. ඇගේ කැපුණුතැන්.

තුවැඹි = 1. කටුව.

තුෂ = (තුස්) 1. දහයියා; වීපොතු 2. සතුට.

තුස්නා = 1. සතුටට පමුණුවන.

තුස්වා = 1. සතුටට පමුණුවා.

තුස්සන = 1. සතුටුවීම.

තුෂර = 1. පිනි. 2. හිම; මිදුණු දිය.

තුෂර කර = 1. චන්ද්‍රයා.

තුෂර සමය = 1. හේමන්ත සෘතුව; හිම වැටෙන කාලය; පිනි වැටෙන කාලය.

තුෂර හර = 1. පිනිබිඳු මාලය.

තුසිත = 1. එනම් දෙව් ලොව.

තුසිත කාය = 1. දිව්‍ය ශරීරය.

තුසිතපුර= (තුසිත භවනය, තුසීපුරය)1. තුසිත දිව්‍ය ලෝකය; හතරවැනි දෙව් ලොව.

තුෂ = 1. දහයියා; වීපොතු.

තුෂාර = 1. පිනි. 2. හිම.

තුෂ්ට = 1 සතුටු වූ.

තුෂ්ට රාවය = 1. ප්‍රීති ඝෝෂාව.

තුෂ්ටි = 1. ප්‍රීතිය; සන්තෝෂය

තුෂ්ටි ජනක = (තුෂ්ට ජනක; තුෂ්ටි දායක) 1. සතුට උපදවන; ප්‍රීතිය ඇතිකරන.

තුෂ්ටිමත් = 1. ප්‍රීතිමත්.

තුෂ්ටි දානය = 1. සතුටු කිරීම.

තුෂාර = 1. පිනි 2. හිම; මිදුණු දිය.

තුෂාර පාතය = (තුෂාර පතනය) 1. හිම හෝ පිනි වැටීම.

තුහින = 1. හිම. 2. පිනි.

තුහිනාංශු = 1. සිසිල් රශ්මිය ඇත්තා; චන්ද්‍රයා.

තුළ = 1. ඇතුළ. 2. අතුරණ ලද.

තුළාර = 1. රත්කරුවා.

තුළුල් = 1. ඝෘණ බහුල. 2. දුහුල් රෙද්ද. 3. පෙරහන්කඩ. 4. ස්ථූල; ඉදිමුණු.

තූ = 1. පිළිකුල හෝ ගැරහීම ඇඟවීමට කියන වචනයක්.

තූටික්කා = 1. සූටික්කා නම් කුරුල්ලා.

තූණ = (තූණාව, තූණී, තූණීර) 1. හියවුර; ඊ කොපුව.

තූ තූ කරනවා = 1. සුණු-විසුණු කරනවා; කඩා බිඳ දමනවා. 2. එපා කරනවා.

තූතුව = 1. කැබිලිත්ත.

තූප්ප = 1. හිසකෙස් පීරීමේ ක්‍රමයක්; කොණ්ඩයෙහි රැල්ලක් තබා උඩට පීරීම.

තූම්බ = (තුම්බෙ) 1. මිනී ගෙනයන මැස්ස.

තූර = 1. ඊ කොපුව? 2. වේගය. 3. වහා.

තූරල් කරනවා = 1. වැහි පායනවා.

තූරිය = 1. තූර්ය.

තූර්ණ = 1. තුරිත; වහා; ඉක්මන්.

තූර්ය = 1. සංගීත භාණ්ඩ; බෙර-දවුල්, තළා ආදිය.

තූර්ය පූජා = 1. තූර්ය වාදනය කිරීමෙන් කරන පූජාව.

තූර්ය නාදය = (තූර්ය රාවය) 1. තූර්ය වාදනයෙන් ඇතිවන හඬ.

තූර්ය භාණ්ඩ = 1. බෙර-දවුල්, තලා, වීණා, කයිතාලම් ආදිය.

තූල = 1. පුලුන්.

තූල = (තූලක) 1. පුළුන්. 2. සුදු ඊතණ කුඩු.

තූලපිචු = 1. කපු පුළුන්.

තූල් පට්ටය = 1. තාසයට උරන දුම්කුඩු මූල.

තූලිකා = 1. පුළුන් මෙට්ටය.

තූලිකා = 1. තෙලිකූර; පින්සලය. 2. පුළුන් මෙට්ටය.

තූලිකා තූලි = 1. තෙලි කූර.

තූලිකාශ මාන = 1. තෙලිකුරක් බඳු.

තූවරය = 1. කහට.

තූවරී = 1 හුවඳ පස්.

තුෂ්ණීම් භාව = 1. නිශ්ශබ්ද භාවය.

තුෂ්ණීම්භූත = 1. නිශ්ශබ්ද වූ.

තුෂ්ණී ශීලී = 1. නිශ්ශබ්ද භාවය.

තෘ

තෘණ = 1. තණ කොළ.

තෘණ උල්කා = 1. තණ හුළු; ගිනි හුළු; හුළු එළිය.

තෘණ කාෂ්ඨ = 1. තණ කොළ හා දර.

තෘණ කුටි = 1. තණ සෙවිලි ගෙය.

තෘණ ගෝචරය = 1. තණ කෑම.

තෘණ කේතු = 1. තල් ගස. 2. උණ ගස.

තෘණ ගෝධාවා = 1. කටුස්සා.

තෘණ පත් = 1. තණ කොළ.

තෘණපුරුෂ = 1. තණ කොළ ආදියෙන් සෑදූ රූපය; පඹයා.

තෘණ භූමිය = 1. තණ බිම.

තෘණ තලාව = 1. තණ පිට්ටනිය.

තෘණ රාජ = 1. තල් ගස. 2. පොල් ගස. 3. කිතුල් ගස.

තෘණ රූපය = 1. පඹයා.

තෘණ වෘක්ෂය = 1. තාල වර්ගයේ ගස.

තෘණ සංස්තරය = 1. තණ කොළ ඇතිරිය.

තෘණ සිංහ = 1. සිංහ විශේෂයක්. 2. තණ කන සිවුපාවා.

තෘණාදි විද්‍යාව = 1. ගස් වැල් ආදිය සම්බන්ධව උගන්වන ශාස්ත්‍රය.

තෘණාස්තරණය = (තෘණ + ආස්තරණය) 1. තණ කොළ එලා සාදගත් ඇතිරිල්ල.

තෘණෝදකය = (තෘණ + උදකය) 1. පින්න.

තෘණෝල්කාව = (තෘණ + උල්කාව) තෘණ උල්කා බලන්න.

තෘතීය = 1. තුන් වැනි.

තෘතීය ජ්වරය = (තෘතීයක ජ්වරය) 1. උණ රෝගයකි.

තෘතීය ධ්‍යානය = 1. තුන්වැනි ධ්‍යානය.

තෘතීය ධ්‍යාන භූමි = 1. තුන්වැනි ධ්‍යානයේ විපාකයෙන් උපදවන බ්‍රහ්ම ලෝක තුන.

තෘතීයා = 1. තුන් වැනි චන්ද්‍ර දිනය.

තෘතීයාවරණය = (තෘතීය + ආවරණය) 1. තුන්වැනි ආවරණය.

තෘතීයා විභක්තිය = 1. තුන් වැනි විභක්තිය; කර්තෘ විභක්තිය.

තෘප්ත = 1. පිනාගිය. 2. සෑහුණු.

තෘප්ති = (තෘප්තිය) 1. සෑහීම; සතුටට පත්වීම.

තෘප්තිකර = 1. තෘප්තිය ඇති කරන.

තෘප්තිමත් = 1. සතුටට පැමිණි. 2. සෑහීමකට පැමිණි.

තෘ ඵල = (ත්‍රි ඵල) 1. තිපල; අරළු, බුළු, නෙල්ලි.

තෘෂ්ණා = 1. තද ආශාව. 2. පිපාසය. 3. (ආහාර) රුචිය. 4. තණ්හාව.

තෘෂ්ණාක්ෂය = 1. තෘෂ්ණාව නැසීම. 2. නිවණ.

තෘෂ්ණා ශ්‍රෝතස් = 1. තෘෂ්ණාව නමැති සැඩ දිය පහර.

තෘෂ්ණා සංඝාටය = 1. තණ්හාව නමැති ගිනි වලල්ල.

තෙ – තේ

තෙ = 1. තුන.

තෙ ඇස් = 1. නෙත් තුන. 2. ඊශ්වරයා. 3. තුන් හුලස්; තුන් පැත්තකින් යුත්.

තෙ කල් = 1. අතීත, වර්තමාන, අනාගත යන කාල තුන.

තෙක් = 1. තුරු. 2. දක්වා. 3. තාක්.

තෙ කෙළ = 1. කෝටි තුන; තුන් කෝටිය.

තෙ ගුණ = 1. තුන් ගුණය; තුන් පංගුව. 2. සත්ව, රජස්, තමස්, යන ගුණ තුන.

තෙජ = 1. තර්ජනය; බැණීම. 2. තේජස. 3. රශ්මිය. 4. ආඩම්බර.

තෙජ කිසුණු = 1. තේජෝ කසිනය.

තෙජනු = 1. තර්ජනය කිරීම.

තෙජාත = (තෙජාතක) 1. කුරුඳු, එත්සාල්, කොල්ලන් කොළ.

තෙන = 1. තනය. 2. තැන. 3. පුත්‍රයා.

තෙනනු = 1. සොරකම.

තෙන් = 1. තැන.

තෙන් කෙළිනවා = 1. දුව පැන සෙල්ලම් කරනවා; පෙම් කෙළිනවා?

තෙනැක්නී = 1. ස්ත්‍රී

තෙනුම් = 1. වංචාව. 2. සොරකම.

තෙනෙක් = 1. ඇස් තුනක් ඇත්තා. ඊශ්වරයා.

තෙත = (තෙත්) 1. තෙමුනු.

තෙතමන = 1. තෙත් ගතිය.

තෙත මාත්තු කරනවා = 1. තෙත් ගතිය දුරු කොට වියලා ගන්නවා.

තෙත් කඩදාසිය = 1. තීන්ත උරන කොළය.

තෙත්තිශම් තියනවා = 1. කියන පිරෙත් ගා කියත් දත් සකස් කොට ගන්නවා.

තෙත්තු = 1. අභිකරු කම. 2. කුඩා දරුවා.

තෙත් පොවනවා = 1. තෙත් කඩදාසියට තීන්ත උරනවා.

තෙද = 1. තේජස. 2. බලය. 3. රශ්මිය. 4. සූර්යයා. 5. ගින්න.

තෙදණ = (තෙද + අණ) 1. තේජස හා ආඥව.

තෙදිසත = 1. තුන් ලොව.

තෙපල = 1. වචනය; කීම. 2. බස.

තෙපලන = 1. කියන කල්හි.

තෙපලූ = 1. කියූ.

තෙප් = 1. දඩයම් කිරීමට ගන්නා හෙල්ල. 2. තොප.

තෙප් උල = 1. උල් වූ ඉන්න.

තෙප්පම = 1. පහුර.

තෙප්ල = 1. කීම, 2. වචනය.

තෙප්ලුම් = 1. කථා කිරීම.

තෙපි = (තෙප්) 1. තොපි.

තෙපින්න = (තෙප් + ඉන්න) 1. උල් වූ ලීය. 2. යවුල; අලවංගුව.

තෙපුල = (තෙපුල්) 1. වචනය. 2. කථාව. 3. ඇස හෙමින් - හෙමින් තැවීම.

තෙපෙළ = 1. ත්‍රි පිටකය.

තෙබ = 1. ලී හෙල්ල. 2. දඩයමට ගන්නා හෙල්ල.

තෙබු = 1. ගස් වර්ගයක්.

තෙබුමු = 1. කාම, රූප, අරූප යන භූමි තුන. 2. තුන් මහල්.

තෙබේ = 1. ප්‍රභේද තුන.

තෙම = 1. 'තම' ශබ්දයෙහි ප්‍රථමා විභක්ති ඒක වචනය හැඟවීමට යොදන ප්‍රත්‍යය.

තෙමන = 1. තෙත් කරන. 2. දිය ඉසින. 3. ප්‍රශංසා කරන.

තෙමඩුලු = 1. මඩලු තුන; පෙකනිය හා දන ඉස් දෙක.

තෙමල් කඩ = 1. පුරාණ රජවරු බුදුන් වදින විට ඇඳි වස්ත්‍රයක්?

තෙම්පරාදුව = 1. තෙලින් තම්බනවා; ඉවීමේ ක්‍රමයක්.

තෙමි = 1. තෙත්වූ.

තෙමියයි = 1. තෙමෙනු කැමති.

තෙමී = (තුන් මද බලන්න.)

තෙමීම = 1. තෙත් වීම.

තෙමුම් = 1. තෙත් වීම. 2. ප්‍රශංසාව.

තෙමුව = 1. පූඩාවා; කුඩැල්ලා.

තෙසුම = (තෙසුම) 1. හොරකම.

තෙර = 1. වෙරළ. 2. ඉවුර. 3. උප සම්පදා වෙත් අවුරුදු දහයක් පිරුණු භික්ෂු නම. 4. මහල්ලා. 5. පූජනීය. 6. අවශාතය; කොළවර. 7. දහතුන.

තෙර නම් = 1. "ස්ථවිර" යන නම.

තෙර පදවි = 1. ස්ථවිර පදවිය.

තෙර පා = 1. ස්ථවිර පාදයෝ.

තෙරපනවා = 1. තල්ලු කරනවා; තද කරනවා.

තෙරවර = 1. උතුම් තෙරුන් වහන්සේ.

තෙරිඳු = (තෙර + ඉඳු) 1. තෙරුන් වහන්සේ; උපසම්පන්න පූජනීය භික්ෂූන් වහන්සේ.

තෙරි = 1. භික්ෂුණී. 3. වෙන් කිරීම; කැපීම.

තෙරුගා = 1. ථේර ගාථා නම් පොත.

තෙරුන්නාන්සේ = 1. ස්ථවිරයන් වහන්සේ.

තෙරුවන් = 1. බුඩ, ධම්ම, සංඝ යන රුවන් තුන.

තෙල = 1. අර; ඈත පෙණෙන. 2. ඔය (හමුවෙහි තිබෙන.) 3. (පොල් - තල ආදී) තෙල්. 4. (මත් බීම) අරක්කු. 5. විසේ

තෙල කිරිෂ = 1. එනම් ගස් වර්ගය.

තෙල ගහනවා = (තෙල දමනවා) 1. මත් පැන් බොනවා.

තෙලඹු = 1. ගස් වර්ගයක්.

තෙල වැඩි වෙලා = 1. විකාර වැඩිවී. 2. විසේ වැඩි වී. 3. මේද තෙල් වැඩි වීම.

තෙල් = 1. තල තෙල්, පොල් තෙල් ආදිය. 2. ලාම්පු තෙල්, පැට්‍රල් ආදිය. 3. සතුන්ගේ තෙල්.

තෙල් කඩාරං = 1. තෙල් කටාරම; තෙල් බඳුන.

තෙල් කඩ = 1. තෙල් ගෑල්වූ රෙද්ද.

තෙල් කරවලා = 1. එනම් සපියා.

තෙල්කා = 1. තෙල් සිඳීමේදී භාජනය පතුලෙහි ඉතිරිවන මණ්ඩි.

තෙල් කැල්ල = 1. තෙල් සහිත මස් කැබැල්ල.

තෙල් කුලාව = 1. තෙල් කුප්පිය හෝ තෙල් දමන කුඩා භාජනය.

තෙල් කූඹියා = 1. කුහුඹු වර්ගයට අයත් එනම් කුඩා සතා.

තෙල් ගාර = 1. ඇඹරූ නූල විශේෂයක්.

තෙල් දිනි = 1. තෙල් කුහුඹුවා; තෙල් බූවා.

තෙල් ගානවා = 1. තෙල් අතුල්ලනවා. 2. තෙල් ගල්ලනවා.

තෙල් ධාතුව = 1. ශරීරයේ තිබෙන තෙල්.

තෙල් නළ = 1. තෙල් වත්කරන උණ පුරුක. 2. තෙල් පයිප්ප.

තෙල් සූ = 1. තෙල් බීවාවූ. 2. කැවිලි වෙසෙසක්.

තෙල් බූ = 1. තෙල් කුහුඹුවා. 2. ගෝනුස්සා, 3 කැරපොත්තා.

තෙල් යත් = 1. තෛල යන්ත්‍රය; සෙක්කුව.

තෙල්ල = 1. තෙලි කූර; පින්සලය.

තෙල් වළ = 1. හිසෙහි මැදු සථානය. හිසෙහි වළ ගැසුණු තැන.

තෙල්වළේ හුස්ම තිබෙන තුරු = 1. පණ තිබෙන තුරු.

තෙල් සණ = 1. ආයුධ මුවාත් තබන තෙල් ගල.

තෙල් සායම් = 1. තෙලින් දියකර අඳින සායම්.

තෙල් සිත = 1. තෙල් හිත්තා; තෙල් කුහුඹුවා.

තෙල් හිඳීම = 1. තෙල් සෑදීම.

තෙල් හිරිය = 1. ගස් වර්ගයක්.

තෙල් හූරුමස් = 1. තෙල් සහිත ඌරුමස්.

තෙලි = 1. තෙලි කූර. 2. රත් කරුවා. 3. තෙලියා නම් මාළුවා, 4. තෙල් සහිත. 5. තල් ගසින් උපන්.

තෙලිකා = 1. තෙල්කා බලන්න.

තෙලි කූර = 1. පින්සලය.

තෙලිජ්ජ = (තෙලි දිය) 1. කිතුල්, තල් ආදී යෙන් ලබා ගන්නා මීරා.

තෙලින්ත = 1. තෙල් බිංදුව.

තෙලි පත් = 1. තෛල පාත්‍රය.

තෙලියත = 1. සෙක්කුව; තෙල් මිරිකා ගන්නා උපකරණය.

තෙලියා = 1. එනම් මාළුවා. 2. රත් කරුවා.

තෙලි සජ් = 1. නයා. 2. සර්පයා.

තෙලිසම = (තෙලි හම) 1. ආයුධ මුවාත් කිරීමට ගන්නා හම.

තෙලෙ = 1. මේ. 2. ඔය.

තෙලෙන්විය = 1. පෙරළිය. 2. විසේ.

තෙලෙස = (තෙළෙස) 1. දහතුන.

තෙලෙස් ධුතඟ = (තෙළෙස් ධුවඟ, තෙළස් ධුතඟ) 1. පාංසු කූලිකාංගය, පිණ්ඩපාතිකාංගය ආදී ධුතාංග දහතුන.

තෙලෙස්වනා = 1. පක්ෂයෙහි දහතුන් වැනි තිථිය.

තෙළු = (තෙළුන්) 1. වසු පැටියා; වස්සා.

තෙවග = 1. තුන් ජාතිය.

තෙවළා = (තුන් පිටකය බලන්න.)

තෙවිකුම් = 1. ත්‍රි වික්‍රම; විෂ්ණු දෙවි.

තෙවිට = 1. තුන් වරක්.

තෙවිද = 1. ත්‍රි විධ; තුන් ආකාර.

තෙවිදු = 1 ත්‍රි විද්‍යාව. 2. ඍග්, යජුර්, සාම යන වේද තුන.

තෙවුන = (තෙවුනා) 1. බබළන. 2. පවතින. 3. යුක්තවූ.

තෙවුනාව = 1. පැසසුම; සතුතිය.

තෙවුනාවූ = 1. බබළන්නාවූ 2. යුක්තවූ.

තෙවුරු = 1. අන්තඃපුරය.

තෙවෙනි = 1. තුන් වැනි.

තෙසක් = 1. ත්‍රි ශක්තිය; මහත්වය; උත්සාහය; මන්ත්‍රණය යන බල තුන.

තෙසරණ = 1. බුදු සරණ, දම් සරණ, සඟ සරණ යන තුන.

තෙස්තමෙන්තුව = 1. සංහිතාව; ගිවිසුම් පත්‍රය; අන්තිම කැමති පත්‍රය.

තෙසු = 1. සෙසු 2. ඉතිරි.

තෙසුම = 1. හොරකම.

තෙසුව = 1. වචනය. 2. කතාව.

තෙහෙට්ටු = 1. වෙහෙස. 2. මහන්සිය. 3. ඇගේ කෙඩෙත්තුව.

තේ = 1. එනම් ගස. 2. එනම් දළු වියලා, අඹරා සකස් කොට ගත් කුඩු.

තේ කෝප්පය = 1. තේ කුඩු තම්බාගත් දිය සහිත කෝප්පය.

තේ පෝච්චිය = 1, තේ වතුර වක්කරන භාජනය.

තේවතුර = 1. තේ කුඩු තැම්බූ ජලය.

තේක්ක = 1. එනම් ලී වර්ගය.

තේචීවරිකාංගය = 1. තුන් සිවුර පමණක් පරිභෝග කිරීම නමැති ධුතාංගය.

තේජ = 1. ගින්න. 2. තේජස. 3. බලය. 4. ආනුභාවය.

තේජඃස්කන්ධ = 1. ගිනි කඳ.

තේජකා = (තේජනා) 1. ඉඟුරු, ගම්මිරිස්, තිප්පිලි මිශ්‍රණය.

තේජ කසිණ = 1. තේජෝ කසිණය.

තේජනය = 1. දීප්තිමත් කිරීම. 2. මුවාත් කිරීම. 3. දුන්න. 4. ඊය; ඊතලය.

තේජය = (තේජ) 1. තේජස. 2. උණුසුම. 3. උග්‍රතාව.

තේජවන්ත = (තේජවත්) 1. තේජස් ඇති.

තේජස = (තේජස්) 1. බැබළීම. 3. රශ්මිය. 3. පරාක්‍රමය. 4. නිර්භීත භාවය.

තේජානුභාවය = 1. තේජස හා බලය. 2. බල පරාක්‍රමය.

තේජිත = 1. මුවාත් කළ. 2. තියුණු කළ. 3. රත් කළ; උණුසුම් කළ.

තේජෝ = 1. තේජස්.

තේජෝ කසිණ = 1. භාවනා කිරීම සඳහා ගිනිතෙන් සාදා ගනු ලබන මණ්ඩලය; භාවනා කිරීමට ගින්න අරමුණු කර ගැන්ම.

තේජෝ කසුණු = 1. තේජෝ කසිණය.

තේජෝධාතු = 1. මූලික දෙයක් වූ ගින්න. 2. අග්නි දීපනයේ බලය: කෑම දිරවීමේ ශක්තිය. 3. පිත.

තේජෝමය = 1. ගින්නෙන් සැදුණු.

තේඩංව = 1. කඹය; බාන; රැන.

තේන් පාන් = 1. වුවමනාවට වඩා මෝස්තර. 2. වුවමනා නැති සත්කාර.

තේ භූමක = 1. කාම, රූප, අරූප යන භූමි තුන.

තේම = 1. තෙත් ගතිය.

තේ මන = 1. තෙම්ම. 2. තෙත් කිරීම.

තේමනය = 1. තෙමීම. 2. ව්‍යඤ්ජන රස කරන දෙය.

තේමිත = 1. තෙමූ. 2. තෙමුණු.

තේරවිල්ල = 1. ප්‍රහේලිකාව, පැටලිලි සහිත ප්‍රශ්නය.

තේරස = 1. දහතුන.

තේරිච්ච = 1. තේරුණු.

තේරිච්ච මිනිහා = 1. කපටියා.

තේරී = 1. භික්ෂුණී. 2. වැල් කැප්පිටිය..

තේරීම = 1. විසඳීම. 2. යමක් පහදා දීම. 3. අවබෝධ කිරීම. 4 වෙන් කිරීම; තෝරා ගැනීම.

තේරූ = 1. තේරුම් කළ. 2. විස්තර කළ.

තේරූම = (තේරුම්) 1. අර්ථ; අදහස විස්තර කිරීම.

තේරුම් ගන්නවා = 1. වටහා ගන්නවා; අවබෝධ කරගන්නවා.

තේල = 1 තෙල්. 2. තල තෙල්.

තේල කටාහ = 1. තෙල් කටාරම.

තේල කටාහ ගාථා = 1. තෙල් කටාරමකදී කියන ලද ගාථා.

තේල ඝට = 1. තෙල් කළය.

තේල පදීප = 1. තෙල් පහන.

තේල මක්ඛන = 1. තෙල් ගැල්වීම; තෙල් ගෑම.

තේලික = 1. තෙල් වෙළෙන්දා.

තේව = 1. සේවාව; සේවය.

තේව කරනවා = 1. පූජා පවත්වනවා.

තේවා හෙවිසි = 1. පූජා වශයෙන් පවත්වන හේවිසි ගැසීම. 2. උදේ සවස විහාර ස්ථානයන්හි වාදනය කරන හෙවිසි.

තේළස = 1. තෙළෙස; දහතුන.

තෛ

තෙක තිලසා = 1. කහවේණා.

තෛජේ පටල = 1. තාඩියක්.

තෛල = 1. තෙල.

තෛල කටාහ = 1. තෙල් කටාරම; තෙල් කල්දේරම.

තෛලං = 1. ශුධ කරන ලද අබිත්. 2. බෙහෙත් වර්ගයක්.

තෛලකය = 1. තෙලිත්ත; තෙල් ටික.

තෛල කිට්ට = 1. පුනක්කු; පුන්නක්කු.

තෛලජ = 1. තෙලින් හටගත්.

තෛල ජාම්ල = (තෛලජ + අම්ල) 1. තෙල් ඇඹුල් කම.

තෛල පර්ණී = 1. සුදු හඳුන්. 2. තුවරලා.

තෛල ප = (තෛල පායා; තෛල පායිකාවා) 1. තෙල් බොන්නා. 2. කැරපොත්තා.

තෛල පාෂාණ = 1. තෙල් ගල.

තෛල ඵල = 1. තල ඇට.

තෛලය = 1. ගාන තෙල්.

තෛලි = 1. තෙල් මිශ්‍රවූ.

තෛලිනය = 1. තල ඉඩම.

තො – තෝ

තො = 1. ජලය 2. දහයියා; වී පොතු. 3. කැඳන්නා. 4. තොප.

තොංගල = (තොංගල්) 1. කොණ. 2. තුඩ. 3. අග. 4. එල්ලෙන කෙලවර 5. අයින.

තොක = 1. පොත්ත. 2. පතුර. 3. සිවිය.

තොක් කුට = 1. ඉඩම.

තොගය = 1. ඇති ප්‍රමාණය එහෙම පිටින්. 2 ගොඩ. 3 රාශිය.

තොට = 1 තට. 2. ගංතෙර. 3. තොටුපළ. 4. වරාය. 5. වාරය; වතාව.

තොට කුලිය = 1. තොටුපල් ගාස්තුව.

තොට පියලි = 1. සේදීමේදී කැඩියන රෙදි කැබලි.

තොට මුණ = 1. කැව්තොට. 2. කැව්තොට අසල පළාත

තොච්ඡිය = 1. සුදු වෙල්ලංගිරිය ගස.

තොට් වෝ = 1. තොටු වෝ; තීර්ථකයෝ.

තොටියා = 1. තොටුපළේ ඔරු පදින්නා; තොටුපළෙන් එතර කරන්නා.

තොම්ල = 1. එනම් ගස.

තොවිල්ල = 1. ළදරුවකු තබා පද්දවන දහය.

තොටු = 1. ගංතෙර. 2. තොටු පළ; ගඟෙහි එතෙර වන තැන; ගඟෙහි නාන තැන. 3. තීර්ථකයා

තොටු පළ = 1. ගඟෙහි නාන තැන. 2. ඔරු ගොඩකරන තැන; එතෙරවන තැන.

තොණ්ඩාක්කුව = 1. ගොනුන්ගේ කැස්ලණුව. 2. නාසයේ නාස්ලණුව දමන හිල?. 3. බාධාකරන දෙය.

තොණ්ඩයා = 1. එනම් මාළුවා.

තොණ්ඩුව = 1. මල පුඩුව; සතුන් ඇල්ලීමට දමන කඹ වටිය; පාශය.

තොක්කුව = 1. චුම්බනය; සිඹීම.

තො තැණි = (තෝ තැනි) 1. වක්කරන ජලය ගලා නොයනු වස් ගස්වැල් අවට බැම්මක් දමා සාදන ඇළ. 2. පොකුණ?.

තොනු = 1. හෙල්ල. 2. පලිහ.

තොප = 1. තා.

තොප්පිය = 1. හිස් වැසුම් වර්ගයක්. 2. උගුළ; රුවට්ටිල්ල.

තො පෙට්ටි = 1. කුරුළු කූඩුව?

තොම = ධාතු විශේෂයක්.

තොමෝ = 1. තෙම නම් වචනයේ ස්ත්‍රී ලිංගය.

තොමනු = 1. සතුති කරන.

තොමර = (තෝමර) 1. කුන්තායුධය; එක් උලක් ඇති අනිත ආයුධය. 2. ඇතුන්ගේ පාමුලට විදින කටුව.

තොම්බ = 1. හොම්බ.

තොමුරු = 1. තෝමරය.

තොය = 1. ජලය. 2. තොටියා; ඔරු පදින්නා.

තොයි = 1. බොල්. 2. දහයියා.

තොයින්තෙන් = 1. නගරයෙහි ජලය පිටකරන කාණුව.

තොයික් = 1. තෝ ද.

තොයිලය = (තොයිලේ, තොවිලේ) 1. යාග විශේෂයක්. 2. යකුන් පුදනු සඳහා කරන නැටුම.

තොර = 1. වෙන්. 2. අහක්. 3 නැවතීම. 4. දුරුවීම. 5. වෙනස.

තොර කරනවා = 1. දුරුකරනවා. 2. වෙන් කරනවා. 3. නවත්වනවා.

තොරණ = (තොරන්) 1. ගෙඩිගෙය. 2. වාසල; දොරටුව. 3. උත්සවයන්හිදී කෙසෙල් ගස් වලින් හෝ පුවක් ගස් වලින් කරන සැරසිල්ලක්.

තොරතුරු = 1. ආරංචි. 2. විස්තර. 3. කාරණය.

තොර පනය = (තොරපනේ) 1. ලී විදින කටුව.

තොරලියා = 1. මුහුදු මාළුවෙක්.

තොර වෙනවා = 1. දුරුවෙනවා. 2. අහක්-වෙනවා. 3. අත්හිටවනවා; නවතිනවා.

තොරොම්බල් පෙට්ටි = 1. තැනින් තැන ඇවිදිමින් බඩු විකුණන වෙළෙන්දා බඩු ගෙනයන පෙට්ටිය.

තොරා = 1. බෙදා; වෙන් කොට.

තොල = 1. මුඛයේ දත් වසා පිහිටි මස් වැදල්ල.

තොලබෝ = 1. එනම් ගස.

තොල බෝ බීන = 1. තොල බෝ මලෙහි ගොටුවක් වැනි සිවිය. 2. තොල බෝ කොළ ගොටුව?

තොල්පට = 1. තොල.

තොල්ල = 1. පිටට නෙරා තිබෙන කොටස. 2. මාළු කරමල වසා සිටි කොටස.

තොලිල් = 1. රක්ෂාව; මෙහෙය; වැඩේ.

තොලු = 1. තොල. 2. ගවයන්ගේ හොම්බ.

තොලු සක් = 1. තොල.

තොලු ගානවා = 1. චිකින් - චික කනවා. 2. ලෙවකනවා. 3. තණ කනවා.

තොවැල්ල = 1. වැල් පෙනෙල.

තොවිලය = 1. යැකුම්; යකුන් පිදීම.

තොවිල් කාරයා = 1. යකැදුරා; තොවිල් නටන්නා.

තොවිල් පවිල් = 1. බලි, තොවිල් ආදිය.

තො වුරු = 1. අත්තඃ පුරය.

තොෂ = (තොස්) 1. ප්‍රීතිය; සන්තෝෂය.

තොෂි = 1. සතුටු.

තොස්නා = 1. සතුටු. 2. සතුටු වීම.

තොස් වමින් = 1. සතුටු කරමින්.

තොස්වා = 1. සතුටු කොට.

තොසිසොක් = 1. කැදූත්තා.

තොහල = (තොහල්, තොහොල්) 1. කුඹය.

තොහො = 1. දහයියා; වී පොතු.

තොළු = 1. වෙරළ,

තෝ = 1. තා. 2. ජලය. 3. දහයියා; වී පොතු. 4. බොල්.

තෝං = 1. සුදු පිටිය පවත්වන්නා අයකරන මුදල.

තෝංගැනීම = 1. සුදු සාරයන්ගේ තෝං කාසි අය කිරීම.

තෝංලණුව = 1. ගැල බැඳි ගවයා හසුරුවනු සඳහා නාස් ලණුවට ඇඳ ඇති රැන; ගවයාට මඟ පෙන්වන ලණුව.

තෝංවිය = 1. පරක්කුව. 2. ප්‍රමාදය. 3. අවකාශය.

තෝක = 1. අඩු 2. ටික.

තෝකුඩු = 1. දහයියා.

තෝ කෙළි = 1. දිය කෙළිය.

තෝටක = 1. එනම් වෘත්තය.

තෝටකාරයා = 1. මල්වත්ත හෝ ගෘහෝද්‍යානය රැක බලා ගන්නා සේවකයා.

තෝඩුව = 1. අරුංගලය; කණාභරණයක්.

තෝන්තුව = 1. විඩාව. 2. ක්ලාන්ත ගතිය. 3. කරකැවිල්ල. 4. කනගාටුව. 5. බුග්ගල්වීම. 6. ත්‍රස්තවීම.

තෝතැන්න = 1. පාත්තිය. 2. තෙත්බිම; දියසීරාව ඇති තැන.

තෝත්‍රය = 1 හෙංඩුව. 2. කෙවිට.

තෝදනය = 1. වේදනාව; පීඩාව. 2. කෙවිටි ආදියෙන් ඇනීම.

තෝණිදන් = 1. සාගරය.

තෝප්පු කඩුව = 1. තිල් විදීමට ගන්නා කටුවක්.

තෝප්පු හැලි = 1. තෝප්පුවේ සාදන හැලි වර්ගයක්.

තෝම = 1. කුරුදු පොතු.

තෝමර = (තොමර බලන්න.)

තෝම්බුව = 1. මිනිසුන්ගේ නම්, ගම්, උපත්, මරණ, වත්කම් ආදී විස්තර ලියා තබන පොත. 2. ඇස්තැරැක්කය?

තෝමාල = 1. රත්සිරියල්.

තෝය = 1. ජලය.

තෝයද = 1. මේඝය; වැසි වලා කුළ.

තෝය ප්‍රසාදනය = 1. දිය පිරිසිදු කරන්නා; 2. ඉඟිනි.

තෝර = 1. එනම් ගස් වර්ගය. 2. එනම් මාළු වර්ගය.

තෝරනවා = 1. යමක් පරීක්ෂා කරනවා. 2. යමක් වෙන්කොට ගන්නවා. 3. තේරුම් කරනවා. 4. තෝරා පත් කරනවා.

තෝරණ = (තොරණ බලන්න.)

තෝරමල්ලි = 1. මැණික් වර්ගයක්.

තෝල = (තෝලා) 1. බෙහෙත් කිරීමේ බර ප්‍රමාණයක්; ඔලිඳ ඇට අසූවක බර.

තෝල්කයා = 1. භාෂා පරිවර්තකයා; එක් බසකින් කී දෙයක් අනෙක් බසකට පෙරළන්නා.

තෝල්ක මුදලි = 1. උසාවියේ භාෂා පරිවර්තනය කරන්නා

තෝලිය = 1. තුලාව. 2. සිකුරු තරුව.

තෝවැල්ල = 1. වැල් පෙතෙල.

තෝෂ = 1. සන්තෝෂය; ප්‍රීතිය.

තෞ – ත්‍ය – ත්‍ර

තෞර්‍යය = 1. සංගීත.

තෞර්‍යත්‍රිකය = 1. ත්‍රිවිධ සංගීත සංයෝගය; නැටීම, ගී කීම හා වාදනය යන තුනේ එකතුව.

තෞලය = (තෞලිය) 1. තුලාව; තරාදිය.

තෞලිනා = 1. තුලාව. 2. සිකුරු තරුව.

ත්‍යක්ත = 1. අත්හරින ලද. 2. ත්‍යාගකළ.

ත්‍යාජන = 1. අත්හැරීම.

ත්‍යාගය = 1. තෑග්ග; දීමනාව.

ත්‍යාගවන්ත = (ත්‍යාගශීලි) 1. තෑගිවන්ත; දනට පිනට දෙන.

ත්‍යාජ්‍ය = 1. අත්හළ යුතු.

ත්‍ර = (ත්‍රි) 1. තුන; තුන්.

ත්‍රංකය = (තරංකය) 1. අගුල.

ත්‍රපා = 1. ලජ්ජාව. 2. කුල සිරිත් අනුගමනය කරන්නී.

ත්‍රපාන්විත = 1. ලජ්ජා සහිත.

ත්‍රපු = 1. සුදු ඊයම්.

ත්‍රපුෂ = 1. කැස්තිර; බෙලෙක්.

ත්‍රය = 1. තුන. 2. තුන් දෙනෙකුගේ එක්වීම.

ත්‍රයස්ත්‍රිංශත් = (ත්‍රයස්ත්‍රිංශත්) 1. තිස්තුන. 2. තව්තිසා දෙව්ලොව.

ත්‍රයීශ = 1. වේද තුන.

ත්‍රයෝදශ = 1. දහතුන.

ත්‍රසරය = 1. (රෙදි විවීමේ) නඩාව; නූල් ඉද 2. විවීම.

ත්‍රසරේණු = 1. පරමාණු සය? 2. පරමාණු තිහක ප්‍රමාණය?

ත්‍රස්ත = 1. තැතිගත්; බියපත්

ත්‍රස්තවාලු = 1. තිරස්සවාලු නම් වැල් වගීය.

ත්‍රාණය = 1 ආරක්ෂාව; රැකීම.

ත්‍රාණන්කී = 1 ආරක්ෂාකාරී.

ත්‍රාසය = 1. බිය; තැතිගැන්ම. 2 කෝවංගුව.

ත්‍රාසජනක = 1. භයානක; බිය ගෙනදෙන.

ත්‍රෙ – ත්‍රෛ – ත්‍රො

ත්‍රේතාග්නි = 1. පිය, මව්, ගුරු යන ගිනි තුන.

ත්‍රේතායුග = 1. කල්පයක (දෙවැනි) හතරෙන් කොටසක් වූ දීර්ඝ කාලයක්.

ත්‍රෛ = 1. තුන.

ත්‍රෛකාලික = 1. කාල තුනට අයිති.

ත්‍රෛතල = 1. තුන් ලොව.

ත්‍රෛ භූමක = 1. තුන් මහල්. 2. කාම, රූප, අරූප යන ලෝක තුන.

ත්‍රෛරාශික = 1. රාශි තුනකින් යුත්.

ත්‍රෛලෝක්‍ය = 1. තුන් ලොව. 2. තුන් ලොවට අයිති.

ත්‍රෛලෝක්‍යතිලකභූ = 1. තුන් ලොවට තිලකයක් වැනි වූ.

ත්‍රෛවික්‍රමාතික්‍රම = 1. තුන් ශක්තිය ඉක්මවන බලය.

ත්‍රෛවිද්‍ය = 1. ත්‍රි විද්‍යාව ඇති; වේද තුන දන්නා.

ත්‍රෝටන = 1. සිවු සැට කලාවන්ගෙන් එකක්.

ත්‍රෝත = 1 පාරා වලල්ල.

ත්‍රි – ත්‍රී

ත්‍රි = 1. තුන; තුන්.

ත්‍රිංශතක = 1. තිහ.

ත්‍රිඅඞ්ගික = 1. අඞ්ග තුනකින් යුත්.

ත්‍රික = 1. තුනකින් යුත්. 2. තුන් දෙනෙකුගේ රාශිය.

ත්‍රිකටුක = 1. කුළු බඩු තුන; ඉඟුරු, ගම්මිරිස්; තිප්පිලි.

ත්‍රිකණ්ටකයා = 1. කටු (කුරු) තුනකින් යුත් මාළුවා.

ත්‍රිකකය = 1. ත්‍රිත්වය; තුන්දෙනෙකුගේ සමූහය.

ත්‍රිකාල = 1. අතීත, වර්තමාන, අනාගත යන කාලතුන.

ත්‍රිකාලඥ = 1. තුන් කල් දන්නා. 2. බුදුන් වහන්සේ.

ත්‍රිකාලවර්ති = 1. තුන් කල්හිම පවත්නා.

ත්‍රිකාලික = 1. තුන් කාලයට අයත්.

ත්‍රි කිරීට ධාරී = 1. ඔටුණු තුනක් දරණ.

ත්‍රි කිරීටය = 1. ඔටුණු තුනකින් යුත් ඔටුන්න.

ත්‍රිකූට = 1. තිකුළු; පර්වත තුන.

ත්‍රිකූර්චක = 1. ශල්‍ය කර්මයට ගන්නා ආයුධයක්.

ත්‍රිකෝණ = 1. මුලු තුනකින් යුත්.

ත්‍රිකෝෂ්ඨි = 1. කොලවරවල් තුන.

ත්‍රිගණ = 1. දේව, මනුෂ්‍ය, රාක්ෂස යන ගණ තුන.

ත්‍රිගන්ධ = 1. සුවඳ වර්ග තුන.

ත්‍රිගුණ = 1. තුන් ගුණයක් වූ; තුන් පංගුව.

ත්‍රිචක්‍රකය = 1. රෝද තුනේ රථය.

ත්‍රිජටා = 1. අවුල් කෙස්වැටි (ජටාමඩුලු) තුනක් ඇති රාක්ෂසයා.

ත්‍රිජන්ම = 1. උපන් නැකත හා 10, 19 වන නැකැත්.

ත්‍රිජාති = 1. සාදික්කා, කරබු නැටි, වසාවාසි යන කුළුබඩු තුන.

ත්‍රිජ්‍යා = (ත්‍රිජ්‍යාකාර) 1. රැස් විහිදෙන.

ත්‍රි නයන = 1. ඇස් තුනක් ඇත්තා; ඊශ්වර දෙවි.

ත්‍රිනාඩිකා = 1. නාරටි තුනකින් යුත්.

ත්‍රිනේත්‍ර = 1. ඊශ්වර දෙවි.

ත්‍රිත්වය = 1. පිය, පුත්, ශුද්ධාත්ම යන ත්‍රිත්වය. 2. ත්‍රි මූර්තිය; (බ්‍රහ්ම, විෂ්ණු, මහේශ්වර.)

ත්‍රිදන්ත = 1. දත් තුනක් ඇති.

ත්‍රිදණ්ඩ = 1. කාය, වාක්, මනඃ යන දණ්ඩ තුන.

ත්‍රිදශ = 1. තිහක් ඇති. 2. තව්තිසා වැසි දෙවියෝ.

ත්‍රිදශපුර = 1. තව්තිසා දෙව් ලොව.

ත්‍රිදශාධිපති = 1. ශක්‍රයා.

ත්‍රිදශාලය = 1. දිව්‍ය ලෝකය.

ත්‍රිදේශ = 1. ජාංගල, අනූප, සාධාරණ යන තුන් වැදෑරුම් දේශ.

ත්‍රිදෝෂ = 1 තුන් දොස් (වා, පිත්, සෙම්)

ත්‍රිධා = 1. තුන් ආකාර.

ත්‍රිපත්‍ර = 1. තුන් පෙති.

ත්‍රිපද = 1. පද තුනක් ඇති. 2. පියවර තුන.

ත්‍රිපදවික්‍රම = 1. පියවර තුනකින් යාම.

ත්‍රිපර්ණිය = 1. කොළ තුනකුත් යුත් කොළය.

ත්‍රිපරිවර්ත = 1. එක් එක් ආර්ය සත්‍යය පිළිබඳවූ සත්‍යඥාන, කෘත්‍යඥාන, කෘතඥාන යන පෙරළුම් තුන. 2. වස්තුව, සැප, ජීවත්වීම යන මූලාකාරන ආශා තුන?

ත්‍රිපාද = 1. පාද තුනකින් යුත්. 2. පාද තුන තැබීමෙන් විෂ්ණුදෙවි කළ වික්‍රමය.

ත්‍රිපිටක = 1. සූත්‍ර, අභිධර්ම, විනය යන ත්‍රිවි ධර්මයේ කොටස් තුන.

ත්‍රිපිටකධර = (ත්‍රිපිටකධාරි) 1. තුන් පිටකය දරණ; තුන්පිටකය උගත්.

ත්‍රිපුට = 1. මෑ වර්ගයට අයත් (මුං, බෝංචි, කොල්ලු ආදි) ඇට.

ත්‍රිපුටකය = 1. ත්‍රිකෝණය; තුන් හුලස්.

ත්‍රිපුටය = 1. වෙරළ. 2. රියන.

ත්‍රිපුටාට = 1 දෙවිදුව; දේවතාවි.

ත්‍රිපුර = 1. නගර තුන 2. ප්‍රදේශයක නමක්. 3. රාවණ.

ත්‍රිපුෂ්පධාරී = 1. මල් තුනක් දරන.

ත්‍රිඵලා = 1. අරළු, බුළු, නෙල්ලි, (තිපල)

ත්‍රිභව = 1. කාම, රූප, අරූප යන භව තුන.

ත්‍රිභුජ = 1. අත් තුනකින් යුත්. 2. තුන් මුලු.

ත්‍රිභුවන = 1. තුන් ලොව.

ත්‍රිභුවනේශ්වර = 1. තුන්ලොවට අධිපති.

ත්‍රිභුවනචූඩාමාණික්‍යවූ = 1. තුන් ලොවට සිළුමිණක්වූ.

ත්‍රිභුවනාචාර්ය = 1. තිලෝගුරුවූ බුදුන් වහන්සේ.

ත්‍රිභේද = 1. භේදත්‍රය; තුන් ආකාර බෙදීම.

ත්‍රිමණ්ඩල = 1. දෙදන හා නාභිය යන තුන් තැන;

ත්‍රිමද = 1. ඇතුන්ගේ අවස්ථා වශයෙන් වැහෙන තුන් ප්‍රකාරවූ මද

ත්‍රිමධු = 1. ගිතෙල්, සකුරු, මී පැණි.

ත්‍රිමූර්ති (ත්‍රිත්ව බලන්න)

ත්‍රිරත්න = 1. බුදුන්, දහම් සඟ යන රුවන් තුන.

ත්‍රිරාත්‍රි = 1. රෑ තුනක්. 2. දවස් තුනක්.

ත්‍රිලක්ෂණ = 1. සංස්කාරයන්හි ඇති අනිත්‍ය දුඃඛ අනාත්ම යන ලක්ෂණ තුන.

ත්‍රිලක්ෂණ භාවනා = 1. ශරීරය අනිත්‍ය දුඃඛ අනාත්ම වශයෙන් සලකා කරන භාවනා.

ත්‍රිලෝචන = 1. ඇස් තුනක් ඇත්තා; ඊශ්වරයා

ත්‍රිලෝකය = 1. තුන්ලොව.

ත්‍රිලෝකේශ = 1. තුන් ලොවට අධිපති. 2. බුදුන් වහන්සේ. 3. සූර්යයා. 4. විෂ්ණු දෙවි. 5. ඊශ්වර දෙවි.

ත්‍රිලෝහ = 1. ලෝහ තුන (රන් - රිදී - තඹ)

ත්‍රිවංක = 1. නැමීම් තුනක් ඇති.

ත්‍රිවංකගේ = 1. ත්‍රිවංක ප්‍රතිමාව ඇති විහාරය.

ත්‍රිවචන = (ව්‍යාකරණයෙහි) ඒකවචන, විවචන, බහුවචන යන තුන.

ත්‍රිවර්ග = 1. වර්ග තුන. 2. ධර්ම, අර්ථ, කාම යන තුන.

ත්‍රිවික්‍රම = විෂ්ණු දෙවි.

ත්‍රිවිද්‍යාව = 1. වේද තුන. 2. පෙර විසූ කඳ පිළිවෙළ දක්නා නුවණ, දිව ඇස, ආශ්‍රව යන් ක්ෂය කරන නුවණ යන තුන 3. අනිත්‍ය, දුඃඛ අනාත්ම යන තුන?

ත්‍රිවිධ = 1. තුන් ආකාර.

ත්‍රිවිධඅකුසලමූල = 1. පව් කිරීමට මුල්වන ලෝභ, වෙෂ, මෝහ යන තුන.

ත්‍රිවිධකල්ප 1. මහා කල්ප, අසංඛ්‍ය කල්ප, අනන්ත කල්ප යන තුන.

ත්‍රිවිධකාව්‍ය = 1. ගද්‍යකාව්‍යය, පද්‍යකාව්‍යය, චම්පුකාව්‍යය යන තුන.

ත්‍රිවිධකාව්‍යමුඛ = 1. කාව්‍යයක ආරම්භයේදී කරන ආශිර්වාද, නමස්කාර, වස්තු නිර්දේශ යන ක්‍රම තුන.

ත්‍රිවිධ කුසල = 1. දාන, ශීල, භාවනා යන තුන.

ත්‍රිවිධගෝරස = 1. (ගවයන් ගෙන් ලැබෙන) කිරි දී මෝරු යන තුන් ආකාර රස.

ත්‍රිවිධචේතනා = (තුන්සිත බලන්න.)

ත්‍රිවිධචෛත්‍ය = 1. ශාරීරික, පාරිභෝගික, උද්දේශික යන චෛත්‍ය තුන.

ත්‍රිවිධතෘෂ්ණා = 1. කාම තෘෂ්ණා, භව තෘෂ්ණා විභව තෘෂ්ණා යන තුන.

ත්‍රිවිධ තෛලපාක = 1. බෙහෙත් තෙල් සිඳ ගැනීමේ පදම් තුන; මෘදු පාකය, සම පාකය, ඛර (කර) පාකය යන තුන් පදම.

ත්‍රිවිධද්වාර = තුන්දොර; සිත කය වචනය යන තුන.

ත්‍රිවිධනිධාන = 1. දුරේ නිදන අවිදුරේ නිදන සන්තිකේ නිදන යන තුන.

ත්‍රිවිධ ධර්ම = 1. සූත්‍ර, අභිධර්ම' විනය යන බුද්ධ ධර්මයේ කොටස් තුන? 2. පර්යාප්ති, ප්‍රතිපත්ති, ප්‍රතිවේධ යන තුන් ආකාර ධර්මය.

ත්‍රිවිධ ධූර්ත = 1. අක්ෂධූර්ත, සුරාධූර්ත, ස්ත්‍රී ධූර්ත යන තුන්දෙන.

ත්‍රිවිධ පුණ්‍ය ක්‍රියා වස්තු = 1. කුසල ක්‍රියාවන්ට ආධාර වන දාන, ශීල, භාවනා යන තුන.

ත්‍රිවිධ පුද්ගල = 1. තුන් ආකාර සත්වයෝ.

ත්‍රිවිධභව = 1. කාම භව, රූප භව, අරූප භව යන තුන.

ත්‍රිවිධ ප්‍රාඥ්ඥ = 1. නිවන අවබෝධ කරන තුන් ආකාරය.

ත්‍රිවිධ බුද්ධ = 1. සර්වඥ බුද්ධ, ප්‍රත්‍යේක බුද්ධ, චතුස්සත්‍ය බුද්ධ යන තුන් ආකාර බුදුවරයෝ.

ත්‍රිවිධ බෝධි = 1. බුද්ධ බෝධි, ප්‍රත්‍යේක බෝධි, චතුස්සත්‍ය බෝධි යන තුන.

ත්‍රිවිධභය = 1. පරානුවාද භය, දණ්ඩ භය, දුර්ගති භය යන තුන.

ත්‍රිවිධභව = 1. කාම භව, රූප භව, අරූප භව යන තුන.

ත්‍රිවිධ මංගල = 1. දිට්ඨ මංගල, සුත මංගල, මුත මංගල යන තුන.

ත්‍රිවිධමද = (තුන්මද බලන්න.)

ත්‍රිවිධමාර = 1. ක්ලේශමාර, අභිසංස්කාරමාර, වශවර්ති මාර යන මාරයෝ තුන් දෙන.

ත්‍රිවිධරත්නය = 1. බුද්ධ, ධර්ම, සංඝ යන රත්න තුන.

ත්‍රිවිධරික්කා = 1. ජලවක, නවවක, තුදුස්වක යන රිට්ටා තුන.

ත්‍රිවිධලෝක = 1 දිව්‍ය, මනුෂ්‍ය, නාග යන තුන් ලෝකය.

ත්‍රිවිධවන්දනා = 1. කාය, වාග්, මනස් යන තුනින් කරන වැඳුම.

ත්‍රිවිධවිතක් = 1. කාම විතක්, ව්‍යාපාද විතක්, විහිංසා විතක් යන තුන් ආකාර විතක්.

ත්‍රිවිධවිවේක = 1. කාය, චිත්ත, උපධි යන විවේක තුන.

ත්‍රිවිධශක්තිය = 1. රාජ බල තුන (තේජස, උත්සාහය, මන්ත්‍රණය.)

ත්‍රිවිධශයන = 1. දෙ ඇලයෙන් හා උඩුකුරුව යන තුන් ආකාර නිදීම.

ත්‍රිවිධශාසන = 1. නියම් සිරිත, දැන ගැනීම, පිරිසිදු ජීවිතය යන තුන? 2. පර්‍යාප්ති ප්‍රතිපත්ති, ප්‍රතිවේධ යන තුන.

ත්‍රිවිධශික්ෂා = 1. තුන් වැදෑරුම් හික්මීම. (අධිශීල, අධි චිත්ත, අධි ප්‍රඥ)

ත්‍රිවිධසමාදාන = 1. තුන් වැදෑරුම් සමාදන්වීම.

ත්‍රිවිධසම්පත්ති = 1. දිව්‍ය සම්පත්ති, මනුෂ්‍ය සම්පත්ති, නිර්වාණ සමාපත්ති යන තුන? 2. ශ්‍රාවක සම්පත්ති, ප්‍රත්‍යෙක බුඩ සම්පත්ති, සම්‍යක් සම්බුඩ සම්පත්ති, යන තුන.

ත්‍රිවිධසුචරිත = 1. කයින්, බසින් හා සිතින් සිදුකරන සුචරිත.

ත්‍රිවිධාග්නිය = 1. රාග, ද්වෙෂ, මෝහ යන තුන් ආකාර ගින්න.

ත්‍රිවේද = 1. වේද තුන.

ත්‍රිසන්ධ්‍යා = (තුන් සැන්දෑ බලන්න.)

ත්‍රිෂ්ණාව = 1. තෘෂ්ණාව; තද ආශාව. 2. (ආහාර) රුචිය.

ත්‍රිස්වර = 1. (ස්වර) අකුරු ශබ්ද තුනකින් යුත්.

ත්‍රිසිංහලය = 1. ලංකාවේ පුරාණ බෙදීම් තුන; රුහුණු, මායා, පිහිටි.

ත්‍රිසුගන්ධ = 1. සුවඳ වර්ග තුන. (කුරුඳු, එන්සාල්, කොල්ලම්කොළ)

ත්‍රිශක්තිය = (තෙසක් බලන්න.)

ත්‍රිශිඛය = (ත්‍රිශූලය) 1. උල් තුනකින් යුත් ආයුධයක්.

ත්‍රිශෘඞ්ගවත් = 1. අං තුනකින් යුත්.

ත්‍රී = 1 තුන.

ත්‍රිවෘතා = 1. සුදු තිරස්සවාලු.

ත්‍රෛවේද = 1. වේද තුන.

ත්‍රීශක්ති = (තෙසක් බලන්න.)

ත්‍රීශංඛ = 1. රන් හග්ගෙඩිය, රිදී හග්ගෙඩිය, දකුණට කරකැවුණු හග්ගෙඩිය යන තුන.

ත්‍රීශූල = (ත්‍රි ශිඛය බලන්න.)

ත්‍රීසන්ධ්‍යා = (තුන් සැන්දෑ බලන්න.)

ත්‍රීසිංහල = (ත්‍රි සිංහලය බලන්න.)

ත්‍රිහේතුක = 1. අලෝභ, අද්වෙෂ, අමෝහ යන හේතු තුන ඇති.

ත්‍ර්‍ය – ත්ව

ත්‍ර්‍යංශ = 1. පැති තුනක් ඇති.

ත්‍ර්‍යංශභූෂණය = 1. පංගු තුනක් ඇති ආභරණය. 2. තුන් පංගු ඇති සැරසිල්ල?

ත්‍ර්‍යක්ෂර = 1. අකුරු තුනක් ඇති.

ත්‍ර්‍යස්‍රය = 1. ත්‍රිකෝණය; තුන් පැත්තකින් යුත් උපකරණය.

ත්‍රෛ්‍යක = 1. ත්‍රි ඒක; ත්‍රයාත්මක.

ත්වක් = 1. හම. 2. සිවිය. 3. පොත්ත. 4. ලෙල්ල.

ත්වක්පඤ්චකය = 1. හම පස්වැනි කොට ඇති පස; කේශ, ලෝම, නඛ, දන්ත, හම යන ශරීරයේ කොටස්.

ත්වක්ක්ෂීරා = 1. උණමකුළු.

ත්වඞ්ගන්ධය = 1. පැණි දොඩම්.

ත්වග්දෝෂය = 1. හමේ රෝගය; කුෂ්ට රෝගය.

ත්වච = (ත්වක් බලන්න)

ත්වරා = 1. ඉක්මන.

ත්වරිත = 1. වහා ඉක්මන්.

ත්වාච = 1. බෝවෙන; වසංගත.

ත්විෂාම්පති = 1. සූර්යයා.

ථ - ථා - ථි - ථී - ථු - ථූ - ථෙ - ථෝ

ථකන = 1. වැසීම. 2. පියන.

ථඤ්ඤ = 1. තන කිරි.

ථන = 1. තනය. 2. තන කිරි.

ථනග්ග = 1. තන පුඩුව.

ථන පා = 1. කිරි බොන ළදරුවා.

ථනිත = 1. මේඝ නාදය; අහස ගිගුරුම.

ථබක = 1. කනුව. 2. මල් පොකුර; වල්ල.

ථම්භ = 1. කණුව. 2. කුළුණ. 3. සිතේ තද ගතිය. 4. ගොයම් එක් කොට බැඳි මිටිය.

ථරු = 1. කඩු ආදියේ මිට.

ථල = 1. ගොඩ බිම.

ථල කුසුම = 1. ගොඩ හටගන්නා මල්.

ථලජ = 1. ගොඩ හටගත්.

ථලට්ඨ = 1. ගොඩ බිමෙහි පිහිටි.

ථලපථ = 1. ගොඩ මඟ.

ථලයානා = 1. ගොඩබිම යන රථ ආදිය

ථලසණ්ඨානය = 1. සමතලා තැන.

ථව = 1. ස්තුතිය.

ථවන = 1. ස්තුති කිරීම.

ථවිකා = 1. පසුම්බිය.

ථාම = 1. වීර්යය. 2. බලය.

ථාමක = 1. බලය ඇති.

ථාල = 1. තලිය. 2. පිඟාන; තැටිය.

ථාලක = (ථාලිකා) 1. කුඩා තැටිය.

ථාලි = 1. තලිය. හැළිය.

ථාවර = 1. ස්ථාවර; ස්ථිර. 2. ශක්තිමත්.

ථාවරිය = 1. ස්ථිර බව; නොසෙල්වන බව.

ථිර = 1 ස්ථිර වූ. 2. නොසෙල් වෙන.

ථිරතා = 1. ස්ථිර බව

ථී - ථී = 1. ස්ත්‍රිය. 2. භාර්යාව.

ථීන = 1. නොහැකිලීම. 2. ශරීර දුර්වලත්වය 3. අරමුණු ගැන්මෙහි සිතෙහි මැළි ගතිය.

ථුති = 1. ස්තුතිය; ප්‍රශංසාව.

ථුති පාඨක = 1. තුති ගී කියන්නා.

ථුල්ල = 1. ස්ථූල. 2. මහත්; තරවූ. 3. ඝනවූ.

ථුල්ල කුමාරි = 1 විවාහයක නොගොස් වැඩුණු තරුණිය.

ථුස = 1. ධාන්‍ය පොතු; දහයියා.

ථුසග්ගි = 1. දහයියා ගින්න.

ථූණ ථූණා = 1. කණුව. 2. යාග පිණිස සිටවූ කණුව.

ථූප = 1. ස්තූප; චෛත්‍යය. 2. තුඹස.

ථූපිකා = 1. කොත; මුදුන. 2. ගොඩක මුදුන.

ථූල = 1. ස්ථූල; තරවූ; වැඩි මහත්වූ. 2. ඝන. 3. ශක්තිමත්. 4. දළවූ; දෘඪවූ.

ථූල සාටක = 1. දළ වස්ත්‍රය.

ථේන = (ථේනක) 1. සොරා.

ථේනන = 1. සොරකම.

ථේනෙත්වා = 1. සොරකම් කොට.

ථෙය්‍ය = 1. සොරකම.

ථෙය්‍ය චිත්ත = 1 සොර සිත.

ථෙය්‍ය සංවාසක = 1. තමාම සිවුරු පොරවා භික්ෂු වේශය ගෙන සැබෑ භික්ෂුවක් මෙන් ලොව රවටන සොරා.

ථේර = 1. තෙරුන් වහන්සේ. 2. ස්ථවිර. 3. මහලු; දස වස් පිරුණු භික්ෂුව.

ථේරවාද = 1. ලංකාව, සියම, බුරුම යන රටවල පවත්නා බුද්ධාගම; ස්ථවිර වාද බුද්ධ ධර්මය.

ථේරී = 1 ස්ථවිරිය; භික්ෂුණිය. 2. මහලු ස්ත්‍රිය.

ථේව = 2. දිය බිඳුව.

ථෝක = 1. ස්වල්පය; ටික.

ථෝමන = 1. ස්තුතිය; ස්තුති කිරීම.

ථෝමෙන්තා = (ථෝමයමාන) 1. ස්තුති කරන; ස්තුති කරමින්.

ද

ද = 1 ප්‍රශ්න ඇසීමේදී වචනයක අගට යොදන නිපාතයක්. 2. නොයෙක් වචන එකතු කිරීම පිණිස යොදන්නක්. 3. 'ත්' යෙදිය යුතු තැන්හි යොදන්නක්.

දංශ = 1. හිර කොට තැබීම. 2. බත් කෙණ්ඩ. 3. දම් වැල.

දංශ ශෝධිය = 1. මිස් ලොඹුව; හිස් ගසා දැම්මට නියම් වූ අපරාධ කාරයන් ගේ හිස් තබා කපන කොලොම්බුව.

දංශ = 1. ඩ.හෑ ලේ බොන ඇට මැස්සා.

දංෂ්ට්‍රා = 1. දළය.

දංෂ්ට්‍රා ධාතු = 1. බුදුන් වහන්සේ ගේ දන්ත ධාතුව.

දක = 1. ජලය. (උදක – හා සමානය)

දඛණ = 1. දකුණ. 2. දකුණු අත පැත්ත.

දඛණ පවන් = 1. දකුණු දෙසින් හමන වාතය.

දඛණ ලක = 1. රුහුණ; දකුණු පළාත.

දකරක්ඛස = 1. දිය රකුසා.

දක්ඛනාවා = 1. එළවාගෙන යනවා. 2. පෙන්වනවා.

දක්ඛ = 1. සමත්. 2. බුහුටි.

දක්ඛක = 1. දකින්නා.

දක්ඛිණ = 1. දකුණට අයත්.

දක්ඛිණා = 1. දකුණු දිශාව. 2. පරිත්‍යාගය; දානය. 3. පූජාව. 4. දකුණට කරකැවීම; ප්‍රදක්ෂිණාව?

දක්ඛිණපථ = 1. ඉන්දියාවේ නර්මදා ගඟෙන් දකුණු ප්‍රදේශය? 2. දූත් 'ඩැකෑන්' යයි කියන ප්‍රදේශය? 3. දකුණු දෙසට යන වෙන් මාර්ගය

දක්ඛිණායන = 1. සූර්යයාගේ නිරක්ෂ රේඛා- දකුණේ ගමන.

දක්ඛිණාරහ = 1. පූජාවට සුදුසු; දන්දීමට සුදුසු

දක්ඛිණාවට්ට = (දක්ඛිණාවත්ත) 1. දකුණට කැරකී ගිය.

දක්ඛිණෙය්‍ය = 1 දක්ෂිණාගීවූ; දන්දීමට සුදුසු; පූජාවට සුදුසුවූ.

දක්ඛිණෙය්‍යතා = 1. දක්ෂිණාගී බව.

දක්නා = 1. දකින.

දක්වන = 1. පෙන්වන.

දක්වා = 1. දර්ශනය කරවා; පෙන්වා. 2. තුරු; තෙක්.

දක්ෂා = 1. මිදි.

දක්ෂ = 1. සමර්ථ. 2. සුරු බුහුටි. 3. සුදුසු.

දක්ෂ කථිකයා = 1. කථාවෙහි සමර්ථයා; චතුර කථිකයා.

දක්ෂා = 1. සමර්ථ ස්ත්‍රී.

දක්ෂිණ = 1. දකුණ. 2. සමත්.

දක්ෂිණ අයන = (දක්ඛිණායන බලන්න.)

දක්ෂිණ දිග්භාගය = 1. දකුණු දිග.

දක්ෂිණ ධ්‍රැවය = 1. පොළොවේ දකුණු කෙළවර.

දක්ෂිණපථ = 1. දකුණු දෙසින් පිහිටි.

දක්ෂිණා = 1. දකුණ. 2. දානය. 3. පූජාව.

දක්ෂිණාර්ධ ගෝලය = 1. පොළවේ දකුණු භාගය.

දක්ෂිණාගී = 1. පිදිය යුතු; පූජාවට සුදුසු.

දක්ෂිණාව = 1. පූජාව.

දක්ෂිණාවර්ත = 1 දකුණට කැරකැවුණු.

දක්ෂිණාවර්ත සංඛය = 1. දකුණට කැරකැවුණු හක් ගෙඩිය.

දක්ෂිණ විශුද්ධිය = 1. දානයෙහි පිරිසිදු බව. 2. පූජාව ලබන්නාගේ පිරිසිදු බව?

දක්ෂිණීය = 1. දීමට සුදුසු; පූජාගී බව.

දක්ෂිණෙය්‍ය = 1. (දක්ඛිණෙය්‍ය බලන්න).

දක්ෂිණෝදක = 1. දන් පිළිගැන්වීමට මත් තෙන් ප්‍රතිග්‍රාහකයන්ට පිළිගන්වනු ලබන පැන්. 2. අත පැන් වත්කර දෙන දීමනාව.

දකිණු ගිරි = 1. දක්ෂිණ ගිරිය.

දකුණත = (දකුණු + අත) 1. දකුණු පැත්ත. 2. සුරත; දකුණු අත.

දකුණෑලය = (දකුණු + ඇලය) 1. ඇගේ දකුණු පැත්ත.

දකුණු = 1. දකුණු දිශාව. 2. දානය; පරිත්‍යාගය.

දකුණු අක් සවු = 1. බුදුන් වහන්සේගේ දකුණත පැත්තෙන් සිටින අගසවු තම; සැරියුත් මහ රහතන් වහන්සේ.

දකුණු දස = (දකුණුදිග) 1. දකුණු පැත්ත.

දකුණුදස හිමි = (දකුණු දෙස හිමි) 1. දකුණට අධිපතියා; යම රජ.

දකුණු දෙස පල් = 1. දක්ෂිණ දිශාරක්ෂකයා; යම රජ.

දකුණු සක = (දක්ෂිණාවර්ත ශංඛය බලන්න)

දකුණු පුල = 1. දකුණු තාස් පුඩුව.

දගණ = 1. ජගතය.

දගර = 1. පිඹුරා.

දගවන = 1. පෝෂණය කරවීම; රැකීම.

දග්ධ = 1. මෝඩ. 2. දැවුණු.

දග්ධමාන = 1. දැවෙන.

දග්ධාව = 1. රස්නය ඇති දිශාව; දැවෙමින් පවත්නා දිශාව. 2. සුවඳ තණ වර්ගයක්.

දග්ධිකා = 1. දං කුඩ.

දග්ධෝදන = 1. බත්. 2. කරවූ බත්; දංකුඩ?

දග්නා = 1. පෝෂණය කරන; රකින.

දග = (සකුලේ) කෙණ්ඩය. 2. බැඳීම; හිර කිරීම. 3. පෙරළිකාර. 4 ඇවිදීම. 5. ඇතුන් බඳින දම්වැල 6. අවුල. 7. කපටි. 8. ඇඹරීම.

දගකාර = 1. අභිකරු; මුරණ්ඩු 2. පෙරළිකාර; මැරවර. 3. කපටි. 4. කලබල කරන.

දගකැවීම = 1. අඹරීම; වෙළු කැවීම.

දගගෙය = (දග ගේ) 1. හිර ගෙය.

දගන = 1. රත් තිවුල්.

දග දමනවා = 1. වෙළු කවනවා; අඹරනවා.

දගය = 1. පෙරළිය 2 කලබලය. 3. ප්‍රයෝගය. 4. කෙණ්ඩය. 5. ඇතුන් බඳින දම්වැල. 6. අවුල. 7. ගැටය.

දගර = 1. මායම්. 2. කොලොප්පම්. 3. දරණුව. 4. ඇඹරීම; වෙළුම.

දගර කරනවා = 1. පෙරළි කරනවා; කොලොප්පම් කරනවා. 2. මායම් පානවා.

දගර කරවලා = 1. එනම් සර්පයා.

දගළුහාවා = 1. හැකිලෙනවා. 2. ඇඹරෙනවා. 3. ශරීරය වංචල කරමින් වෙනෙසෙනවා.

දග වැළඳනවා = 1. වෙළු කැවී (කඹ, ලනු ආදිය) එකෙනවා.

දජ = 1. ධවජ; කොඩි.

දඩා = 1. අනර්ඝ දේ. 2. ඉතා උසස්. 3. උත්තම; ජ්‍යෙෂ්ඨ.

දඩ = 1. කැලෑව; වනය; වනගත; වල්; 2. දඬුවම 3. දඩ ගැසූ මුදල්. 4. වත්දි; කළ වරදට ගෙවිය යුතු අලාභය. 5. දඩමස. 6. අඩවිය.

දඩ ඇත් = 1. වල් ඇතා.

දඩකලක් = 1. වල් කඩල? 2 මස්වැත්ත?

දඩ කෙළිය = 1. සතුන් දඩයම් කිරීම. 2. වන යෙහි කරන ක්‍රීඩාව.

දඩ කොහෙල් = 1. කැලෑ කොහෙල්; වල් කොහෙල්.

දඩ ගහනවා = 1. දඩ මුදල් ගෙවන්නට නියම කරනවා.

දඩ ගොන් = (දඩ ගෝණ) 1. වල් හරකා. 2. ගෝණා.

දඩ බිම = 1. දඩයම් කරන ප්‍රදේශය.

දඩමස = 1. වල් සතුන්ගේ මස්. 2. උඟුරුමස්.

දඩමී = 1. වල් මීමා; වල් මී හරකා.

දඩමීමා = 1 දඩයම් පිණිස ගෙන යන මීමා?

දඩය = (දඩේ) 1 අරණ්‍යය; වනය; අඩ විය. 2. දඩ ගැසූ මුදල්. 3. දඬුවම.

දඩයක්කාරයා = 1. වල් සතුන් විද හෝ වෙඩි තබා මරන්නා.

දඩයම = 1. වල් සතුන් මැරීම.

දඩයම් දන = 1. යමක් ඉරා ගැනීමට උපකාර වන දත.

දඩාවත = 1. කැලෑ පාර.

දඩාවතේ = 1. තැනින් තැන ඇවිදින; ඉබා ගාතේ යන. 2. බලා ගැනීමට කෙනෙකු නැතිව යන. 3. නො බැඳ ලිහා යන.

දඩැතා = (දඩැත්) වල් ඇතා.

දඩි = 1. දඬුවම. 2. දඬු. 3. තද. 4. ලොකු. 5. ගොරෝසු.

දඬි = 1. ලීය, පොල්ල; කෝටුව. 2. ගමයා. 3 දඬු කඳ. 4. දඬුවම. 5. උපාංග සතරින් එකක්; දණ්ඩනය.

දඬුඅඬුව = 1. කම්මල්වල හා වඩු පට්ටල්වල ඇති විශාල අඬුවක් වැනි උපකරණය.

දඬු ඇඳ = 1. අත් පා විලංගු දැමිය හැකි ඇඳ.

දඬුකඳ = 1. අත් පා විලංගු දැමීම පිණිස සාදා ඇති කොටස් දෙකකින් යුත් ලී උපකරණය.

දඬුකම = 1. දඬුවම.

දඬුකොට්ට = 1. ඉස තබන දඬු කඩ.

දඬුදෙණි = 1 ලී ඔරුව.

දඬුපත් = 1 ලෑලි. 2. ගෘහෝපකරණ. 3. ලී දඬු.

දඬුපහන = 1. පන්දම. 2. ඉටිපන්දම් එළිය?

දඬු පහුරු = 1. ලී පහුරු; දඬුවෙන් කළ ප්‍රාකාරය?

දඬු මැසි = 1. ලීයෙන් කළ මැසි; ලෑලි ඇඳ?

දඬු මුවා = 1. ලීයෙන් කළ.

දඬුමොනර = 1. ලීයෙන් සෑදූ මොනරකු වැනි පුරාණ අහස් යානා විශේෂය.

දඬුයෙල් බෑ = 1. දඬුවැල්බැය; ගස් අතුවල බැඳි මීය.

දඬු රියන = 1. ලී මැනීමේ රියන.

දඬුලිහිණි = (දඬු මොනර බලන්න.)

දඬුලේනා = 1. මහ ලේන් වර්ගයක්.

දඬුවඩු = 1. ලී වඩුවා.

දඬුවම් = 1. වරද කළ වුනට දෙන අවවු හා වන්දි ගැනීම් ආදිය.

දඬුවල්ලා = 1. මුහුදු මැළුවෙක්.

දඬුවැල් බැය = (දඬුයෙල් බැය බලන්න.)

දඬුවැට = 1. ලොකු ලී සිටුවා සෑදූ වැට. 2. පන්දම.

දඬුවැට සහාන් = 1. පන්දම්.

දඬුවැල් පැණි = 1. දඬුවැල් බෑ පැණි.

දඬුහම් = (දඬුවම් බලන්න)

දඬුහර = 1. ලී අරටුව.

දඬුහල = 1. ලී මඩුව. 2. වඩු මඩුව.

දන = 1. ධනය; වස්තුව. 2. ජනයා. 3. පිළිස් සෙන; දැවෙන. 5. දැවිල්ල ගන්නා; වේදනාව ඇති කරන. 5. ජය ගැනීම. 6. සෙනේ ගය. 7. දණ මඬල; දණ ඉස. 8. පරිත්‍යාග කරන දෙය. 9. ඉපදීම.

දන අදිප = 1. වස්තුවට (ධනයට) අධිපති; වෙසමුණි රජ.

දන අදිප පුර = 1. වෙසමුණි රජුගේ රාජධානිය; ආලකමන්දා පුරය.

දන ඇති = 1. ධනවතා; ධනපතියා. 2. වස්තුව ඇත්තාවූ.

දන ඉඳු = 1. රජ. 2. ජනයන්ගේ ප්‍රධානයා; ජන නායක. 3. වස්තුවට අධිපති.

දන ඉහ = 1. දණ ඉස; කකුලේ සන්ධි ස්ථානය.

දන උතුඹුව = 1. දන ඉහේ ඇටය.

දනකල් = 1. ජන කාන්ත නම් කාව්‍ය ප්‍රාණය.

දන ගස්සනවා = 1. දනෙන් ඉන්දනවා.

දනගානවා = 1. දන ගගා යනවා.

දනනා = 1. යුධය. 2. ජය ගත්තාවූ.

දනනු = 1. ජය ගැනීම. 2. ඉපදීම.

දනතා = 1. ජනතාව; ජන සමූහය.

දනද = (දනද) 1. වෙසමුණි රජ. 2. වස්තුව දෙන්නා.

දනපතියා = 1. පොහොසතා; ධනවතා.

දනපද = 1. ජනපදය.

දනබුල = 1. කන්ද. 2. හාල්පාන දිය.

දන මඬල = (දන මඬුල්ල.) 1. දණ ඉහ.

දනඩන = 1. දණ නැමීම.

දන වට = 1. දත් වැට.

දන වටක් = 1. දණ ඉහ දක්වා. (දණ ඉහ දක්වා ජලයෙන් වැහුණු.)

දනවන = 1. උපදවන. 2. අට ගත්වන. 3. ජය ගත්වන.

දනවත් = 1. පොහොසත්.

දනවි = (දනවී, දනවු) 1. ජනපදය; රට.

දනවා = 1. පත්තු වෙනවා; පිළිස්සෙනවා; ගිනි ගන්නවා.

දනව් = 1. ජනපදය; දනව්ව.

දනඹු = 1. ජනපදය. 2. රති ක්‍රීඩාව.

දනමු මිඬුලු = 1. ජනපද මණ්ඩලය; ජනපද රාශිය.

දන් = 1 දානය; පින් සලකා දෙන දේ. 2. නැයි. 3. දෙන ලද්ද. 4. උපාය සතරින් එකක්. 5. ඇතුන් ගෙන් වැහෙන මද. 6. වස්තුව. 7. දන ගැනීම 8. ධ්‍යාන ලාභයා?

දන් කඩ = 1. ඉදුල් කඩය.

දන් කද් = 1. දන් කද.

දන් කැමි = 1 දානය පිළිබඳ වැඩ කරන්නා.

දන් ගෙඬිය = 1. හිස ගසා මරණ වධය දීමේදී හිස තබන කොලොම්බුව. 2. යමක් කැපීමට තබන කොටය 3. දත් ගසේ ගෙඬිය.

දන් ගේ = 1. දාන ශාලාව; දන් පිළිගන්වන ශාලාව. 2. පන්සලේ දන් උයන තුන්සිය.

දන්ඩ = 1. ලීය. 2. නැට්ට. 3. ගොයම් ගසේ කඳ. 4. උඩගුකම.

දන්ඩ කුඩිච්චිය = 1. දඬු කඳ?

දන්ඩි = 1. කුඩා මාළු වර්ගයක්.

දන්න වනවා = 1. දැනුම් දෙනවා. 2. අඟවනවා.

දන්නවා = 1. දැනගන්නවා.

දන්න උදවිය = 1. වැඩිහිටි මිනිස්සු.

දන්ත = 1. දත්. 2. දැන්තවූ; දැමුණු; හික්මුණු; දමනය කළ.

දන්ත ආවරණ = 1. (දත් වසා සිටින.) තොල්.

දන්ත ඉන්ද්‍රිය = 1. දැමුණු ඉඳුරන් ඇති බව.

දන්ත කල්‍යාණය = 1. එකිනෙකට නුදුරුව පිහිටි සිදුරු රහිතවූ සුදු පැහැයෙන් බබලන දත් ඇති බව නමැති ලක්ෂණය. (පඤ්ච කල්‍යාණයන්ගෙන් එකක්.)

දන්ත කාෂ්ඨය = 1. දැහැටි කූර.

දන්ත කාර = 1. ඇත් දතින් කැටයම් වැඩ කරන්නා.

දන්තජ = 1. දතින් උපදනා ත වර්ගයේ අකුරු හා ල - ස යන අකුරු.

දන්ත ධාතුව = 1. බුදුන් වහන්සේගේ දත; දළදා වහන්සේ.

දන්ත ධාවනය = 1. දැහැටිය. 2. දත් මැදීම.

දන්ත නාඩි = 1. දත් ලෙඩක්.

දන්ත පන්ති = 1. දත් පෙළ.

දන්තමය = 1. ඇත් දතින් කළ.

දන්ත මල = 1. දත් මැලියම්.

දන්ත මාංසය = 1. විදුරු මස.

දන්තය = 1. දත. 2. දළය. 3. පර්වතය.

දන්ත රුජා = 1. දත්හි ඇතිවන වේදනාව.

දන්ත වලය = 1. දත් වලින් සෑදූ වළල්ල හෝ දරනුව.

දන්ත වෛද්‍යයා = 1. දත් වෙදා.

දන්ත ව්‍යසනය = 1. දත්වලට විපත් සිදුවීම. 2. දත් රිදීම.

දන්ත සට = 1. දෙඹම්. 2. දෙළුම්.

දන්ත සඨ = 1. දෙහි.

දන්ත ශංකු = 1. දත් උගුල්ලන අඬුව.

දන්ත ශෝධය = දත් මදින ද්‍රව්‍යය.

දන්ත හර්ෂය = 1. දත් හිරි වැටීම.

දන්තා කාර = 1. දත් වැනි (දැති ඇති.)

දන්තාගද = 1. දත් බෙහෙත.

දන්තා බල = 1. හස්තියා; ඇතා.

දන්තාර්බුදය = (දන්ත + අර්බුදය) 1. දත් ලෙඩේ. 2. විදුරුමගේ ගඩුව.

දන්තාවරණ = (දන්ත ආවරණ බලන්න.)

දන්තාවල = 1. ඇතා.

දන්ති = 1. දත් ඇති.

දන්තුර = 1. රළු ආකාර. 2. තල දතක් ඇති. 3. දැති ආකාර.

දන්තෝද් භේදය = (දන්ත + උද් භේදය) 1. දත් අට ගැනීම.

දන්තෝෂ්ඨාක්ෂරය = 1. දතින් හා තොලින් උපදනා අකුර.

දන්තෞෂ්ඨජ = 1. දතින් හා තොලින් උපන්.

දන් දෙනවා = 1· පින් පිණිස යමක් දෙනවා.

දන්ධ = 1. මෝඩයා; මෝඩවූ. 2. වහා ක්‍රියා කළ නොහැකි.

දන්ධතා = 1. මෝඩ බව. 2. අදක්ෂ බව.

දන් දෙල = 1. දත් දීමෙහි ආශාව.

දන් පත = 1. දාන පාත්‍රය; දන් බෙදූ පිඟාන.

දන්පිශාව = (දම් පියාව) 1. ධර්ම පදය නම් ග්‍රන්ථය.

දන්පියා අටුවාව = (දම් පියා අටුවාව.) 1. ධර්ම පද සන්නය.

දන් මහල් = 1. දන ශාලාව.

දන්රජ = (දම්රජ) 1 යම රජ.

දන්වට = (දත්වැට) 1. තොකඩව දෙත දනය. 2. දන්තෝපකරණ.

දන්වත් = 1. ධනවත්; පොහොසත්. 2. දශ දන වස්තු.

දන්වතුරු = 1. සිකුරා.

දන්වර = 1. වාර වශයෙන් කරන දන්දීම.

දන්වරුසෙන් කරනවා = 1. වාර වශයෙන් දන් දීමට නියම කරනවා.

දන්වසුන් = 1. දන් කද. 2. දන් සහිත බඳුන්.

දන්වහරෙ = 1. දනය නමැති වැස්ස.

දන්වා = 1. දනුම්දී. 2. අසුරයා. 3. රාක්ෂසයා.

දන්වා ඇදුරු = (දන්වා ගුරු) 1. සිකුරා.

දන්වාරි = (දන්වාරිපු, දන්වාරුපු, දන්වා සතුරු.) 1. දෙවියෝ. 2. ශක්‍රයා. 2. විෂ්ණු දෙවි.

දන්වැට = (දත් වට බලන්න.)

දන්වැල = 1. දම්වැල.

දන්සඳ = 1. දන් දීමෙහි ආශාව; දීමෙහි කැමැත්ත.

දන්සල = (දන්සැල) 1. දන්හල; දන ශාලාව.

දන්සුග = 1. දන් ටික.

දන්සොඬ = 1. දන් දීමෙහි ආශා ඇති.

දන්හල = (දන්සල බලන්න.)

දනා = 1. ජනයා. 2. කොත්තමල්ලි.

දනි = 1. දන ගන්නවා. 2. කොත්තමල්ලි. 3. කටුකරෝසන.

දනිත = 1. ධවනිතය; වර්ගයක්ගේ දෙවැනි. හතරවැනි අකුරු.

දනිඳු = (දන + ඉඳු) 1. ධනවතුන්ගේ ප්‍රධානයා; කුවේරයා.

දනිසුරු = (දන + ඉසුරු) 1. ධනේශ්වරයා; ධනපතියා.

දනු = 1. අසුරයන්ගේ මව. 2. තක්ෂගේ මව. 3. ධවනිය; කටහඬ. 2. දුන්න. 5. දනය. 6. නාදය. 7. ධනු රාශිය. 8. දන ගනුව. 9. දනීම. 10. බදුල්ල ගස.

දනුජ = 1. ධනුගේ පුතා; අසුරයා.

දනුතුඳු = 1. දන්නේ වී නමුත්. 2. දිනුවත්.

දනුමැති = 1. දනුම ඇති. 2. යමක් තේරුම් ඇති. 3. උගත්. 4. වැඩිහිටි.

දනුමැතිකම = 1. ගුරුකම. 2. ආදර්ශය.

දනුරුවේද = 1. ධනුර් වේදය.

දනුලග්නය = 1. ධනුව; ධනු රාශිය

දනුව = 1. දුන්න. 2 ශබ්දය; නාදය.

දනුවේ = 1. ධනුර් වේදය.

දනෝවන් = 1. සැරසීම

දණ = (දණ මඩල) 1. කකුලේ නවන හන්දිය.

දණඉස = (දණ ඉහ) දණ හිස.

දණ උතු කඹුව = (දණුතුකටුව) 1. දණ ඉහේ කටුව.

දණනාලිය = 1. දණ ඇටය.

දණමඩල = (දණමඬුලු) 1. වටකුරු වූ දණ.

දණගානවා = 1. දණින් යනවා; දණ අද්දා ගෙන ගමන් කරනවා.

දණනමනවා = 1. දණින් සිටිනවා; දණ ගහනවා.

දණවක = 1. දණ නමා සිටින.

දණසන්ධිය = 1. දණ ඉහේ හන්දිය.

දණහිස් = 1. දණ මඩල.

දණ්ඩ = 1. ලීය. 2. පොල්ල. 3. කෝටුව. 4. හැට්ට. 5. දඬුවම. 6. ගොයම් ගහේ කද. 7 දමනය. 8. වරද. 9. යමයා.

දණ්ඩ ආසන = 1. පුස්කොළ ලිවීමේදී පාවිච්චි කරන කුඩා මේසය.

දණ්ඩක = 1. දඹදිව මහා වනාන්තරයක්? 2. දණ්ඩ. 3. කාව්‍ය බන්ධන ක්‍රමයක්.

දණ්ඩකර්මය = 1. දඬුවම.

දණ්ඩන = 1. දඬුවම් කිරීම.

දණ්ඩනාගාරය = (දණ්ඩන + අගාරය) 1. හිර ගෙය; දඬගේ.

දණ්ඩනායකයා = 1. දඬුවම් නියම කරන්නා. 2. සේනාපතියා. 3. අග්‍රවිනිශ්චයකාරයා.

දණ්ඩනීය = 1. දඬුවම් කටයුතු.

දණ්ඩනීති = 1. රාජ නීතිය.

දණ්ඩධාරී = 1. දණ්ඩක් දරන.

දණ්ඩපාණී = 1. දඬුගත් අත් ඇති.

දණ්ඩපාතය = 1. දඬය. 2. දඬුවම.

දණ්ඩපාශිකයා = 1. වධකයා; අලුගෝසුවා.

දණ්ඩප්‍රදීපය = 1. පන්දම.

දණ්ඩභය = 1. දඬුවම නමැති භය.

දණ්ඩභීතිය = 1. දඬුවමට භයවීම.

දණ්ඩාඥාව = (දණ්ඩ + ආඥාව) 1. දඬුවම නියම කිරීම.

දණ්ඩාදාන = දඬුවම් දීම.

දණ්ඩාසන = (දණ්ඩ ආසන බලන්න.)

දණ්ඩී = 2. දඬු ඇති; දණ්ඩක් ඇතිව යන එන තාපස වර්ගයක්. 2. යමයා. 3. තුරුසි-යක්. 4. ගඟේ මාළු වර්ගයක්.

දණ්ඩිය = 1. ලී පට්ටලය. 2. ගොයම් පාගන පට්ටලය.

දණ්ඩියම = 1. ඉරීම සඳහා ලී තබන මැස්ස; ඉරුම් පට්ටලය.

දණ්ස් ඇමය = 1. දණ ඉහේ ඇටය.

දත = 1. දන්තය; දළය. 2. දූත්ත. 3. දූත-ගතොත්. 4. රෝද දත. 5. කුඤ්ඤය.

දතමනා = 1. දූතගත යුතු.

දත් = 1. දන්තය; දළය. 2; ඇත් දළය. 3. මුවහත්. 4. උරහිස. 5. දත්තාවු. 6. දූතගත්.

දත් ඇම = 1. දත් නමැති ඇට.

දත් කබුව = 1. දත් ශුද්ධකිරීමට ගන්නා ලෝහමය කූර.

දත්කඩ = 1. අංසකඩය.

දත්කැක්කුම = 1. දත්වල වේදනාව.

දත්කෑම් = 1. උඩයටි ඇඳිවල දත් එකට වද්දා කරන තර්ජනය; දත්මිටිකෑම්; දත්කුරුකෑම්.

දත් කුළු = 1. උරහිස.

දත් නියවනවා = (දත් විරින්නනවා) 1. දත් ඉදිරිපත්කර පෙන්වනවා.

දත්තාදර = 1. ආදර ගෞරව දක්වූ.

දත්පති = 1. දතින් කළ.

දත්බොළු = 1. බොල්ලෑ දත් සහිත.

දත්මල = 1. දත්වල හටගන්නා මැලියම්.

දත්මිටිකෑම = 1 දත්වලින් දත්හපා කරන තර්ජනය. 2 දැඩි උත්සාහයක් ගැනීම.

දත්මොහොල් = 1. දත් නැමැති මෝල්ගස්.

දත්රස = 1 දන්ත කාන්තිය.

දත්රූදු = (දත්රිපු, දත්රූපු, දත් සතුරු) 1. සිංහයා.

දත්මළුසිනා = 1. දත් පෙනෙන ලෙස හඬින් සිනාසීම.

දත්වෑයා = 1. දත් පණුවා.

දත්වෙද = 1. දත් රෝගයන්ට පිළියම් කරන්නා.

දත්හාරනවා = 1. දත් ශුද්ධකරනවා. 2. දත්වල බැඳුණු කුණු අස්කරනවා.

දත්හිස = 1. උරහිස.

දතෑඹි = 1. දූතගැනීමට කැමති.

දතු = 1. දූතගත්.

දතුවඳු = 1. දූතගත් නමුත්.

දද = 1. කොඩිය, ධ්වජය. 2. කුරුල්ලා. 3. මෝඩයා. 4. දත. 5. සමූහය. 6. බ්‍රාහම-ණයා. 7. කුෂ්ට රෝග විශේෂයක්. 8. පුරුෂ ලිංගය. 9. කලාව. 10. ශක්‍රයා. 11. හංසයා. 12. අනංගයා. 13. තොල්. 14. ලිහිණියා.

දදා, දදය = 1. හමේ ඇතිවන පණු කැවිලි ජාතියක්.

දදකෑන් = 1. කොඩි සමූහය.

දදකැල = 1. බ්‍රාහමණ සමූහය. 2. තාරකා සමූහය.

දදකිරිය = 1. මසු වෙසෙසක්.

දදකුල = 1.බ්‍රාහමණ වංශය.

දදගහා = 1. බිබිළි සහිත. 2. බුබුළු ආකාර?

දදතුරු = 1. තාරකා.

දද්දපල = 1. කොඩි පේළිය. 2. තාරකා පන්තිය. 3. කුරුළු රංචුව.

දද්දබැඳුම් = 1. ධවජ බන්ධනය. 2. කොඩියක හැඩය සිටින සේ කෙරෙන කාව්‍ය බන්ධනයක්.

දද්දභුජයා = 1. කුරුල්ලන් කන්නා.

දද්දමුවා = 1. ධවජයෙන් නිපන්; ධවජ ගනන.

දද්දමුවාව = 1. පාට වස්ත්‍රයෙන් කළ තිරය. 2. කොඩි තිරය.

දද්දය = 1. දත. 2. කොඩිය. 3. තාරකාව. 4. පුරුෂ ලිංගය.

දද්දයා = 1. බමුණා. 2. අඥානයා; මෝඩයා. 3. පක්ෂියා.

දද්දරද = (දද්දරජ) 1. තාරකා රජ. 2. චන්ද්‍රයා. 3. ගුරුළා. 4. හඳුන් ගහ.

දද්දරය = 1. මලානිකවීම. 2. දිරුම.

දද්දරයා = 1. මැඩියා.

දද්දවරණ = 1. (දත් වැසීම කරන) තොල.

දද්දහස් = 1. ලුණුවිල.

දදි = 1. දී කිරි; මිදුණු කිරි.

දදිඳු = (දද + ඉඳු) 1. ප්‍රධාන බ්‍රාහ්මණයා 2. චන්ද්‍රයා. 3. ගුරුළා.

දදිපල = 1. සිවුළු ගෙඩිය.

දදිමඩ = 1. දී පෙරළි දිය; දී කිරෙන් පෙරා ගත් ජලය; කිරිමෝරු.

දදු = 1 ලඹුවැල.

දදුන් = 1 මෝඩයන්. 2. බ්‍රාහ්මණයන්.

දද්දුර = (දද්දුර) 1. මැඩියා.

දද්‍රෑ = 1. දද; කුෂ්ඨරෝග විශෙෂයක්.

දධි = 1. දී කිරි; මිදුණු කිරි.

දධිඵමල = 1. දී කිරි ගොදය.

දධිජාම්ල = 1. කිරි ඇඹුල.

දධිමණ්ඩ = (දදි මඩ බලන්න)

දධිමුඛයා = 1. සුදු මුහුණක් ඇති වඳුරා.

දධිසාරය = 1. වෙඩරු.

දප = 1. ජපය; මැතිරීම. 2. ආඩම්බරය; උඩඟුකම.

දපනා = 1. ජපකාරක. 2. උඩුපැල්ලෙහි හාත්සිවෙන. 3. වසඟවන.

දපණ = 1. දර්පනය; කැඩපත; මුහුණ බලන කන්නාඩිය.

දපණ තල = (දපණ බලන්න.)

දපය = (දප) 1. උඩඟු කම. 2. එඩිය. 3. ජප කිරීම; මැතිරීම.

දප්ප = 1. එඩිය; ආඩම්බරය.

දප්පණ = 1. කැඩපත; කන්නාඩිය.

දබර = 1. කලහය. 2. ගැඹුරු වළවලින් දිය ඇදීමේ බාල්දිය බැඳි කඹය එතෙන ලිය. 3. දිය ඇදීමේ උපකරණයක්.

දබර ඇඟිල්ල = 1. මාපටැඟිල්ල ළඟ ඇඟිල්ල; තර්ජනය පිණිස පාවිච්චිකරන ඇඟිල්ල.

දබර කාරයා = 1. සණ්ඩුකාරයා; කලහ කරන්නා.

දබරය = 1. කලහය; සණ්ඩුව; අරගලය.

දබරාව = 1. කමණ්ඩලාව; තාපසයන්ගේ දිය බොන බඳුන.

දබ්බ = 1. නුවණැති. 2. ද්‍රව්‍යය. 3. වස්තුව. 4. ලිය. 5. ධනය. 6. කුසතණ.

දබ්බි = 1. හැන්ද.

දබ්භ = 1. කුසතණ.

දඹ = 1. ජම්බු 2. හීවලා. 3. ආභරණයක්. 4. රත්රන් වර්ගයක්.

දඹදිව = 1. ජම්බුද්වීපය.

දඹනද රන් = 1. ජාම්බුනද සවර්ණ.

දඹ රන් රන් = 1. රන් රන් වර්ගයක්; දඹ රන්

දඹල = 1. එනම් බෝන්චි වර්ගය.

දඹු = 1 හිවලා. 2. ආභරණ වර්ගයක්. 3. තරමක් පිළිස්සුණු 4. දම්කුඩ. 5. දූල්ලී; දැවුණු දෙය.

දඹු බත් = 1. දම්කුඩ.

දඹුවා = 1. ජම්බුකයා; හිවලා.

දම = 1 දමය; දම්වැල. 2. දඹුවම. 3. ධර්මය. 4. ආශාව දමනය කිරීම. 5. මාලය. 6. ඉන්ද්‍රිය සංයමය. 7 නුවණ. 8 උපවාසය.

දමක = 1 මැඩ පවත්වන්නා; හික්මවන්නා; දමනය කරන්නා.

දම් කාගවනු = 1. කගාවනු වර්ගයක්.

දම්න = (දමනය) 1. මැඩපැවැත්වීම; යටත්-කරගැනීම. 2. බටගස.

දමනවා = 1. ඇතුල් කරනවා. 2. කැත්පත් කරනවා. 3. තබනවා. 4. විසිකරනවා. 5. බලය අඩුකරනවා. 6. බිම දමනවා.

දමනිය = 1. තාඩ විශේෂයක්. 2. දමනය කළයුතු.

දමනු = 1. හික්මවීම.

දමක් = 1. නිශ්චල බව. 2. දමනය කරන කල්හි.

දමථ = 1. හික්මවීම. 2. මැඩීම.

දමථය = (දමථුව) 1. ආත්ම දමනය; සිත මැඩ පැවැත්වීම.

දමසිතා = 1. දමනය කරන්නා.

දම රක්ඛිත = 1. ධම්මරක්ඛිත.

දමසතුම = 1. සුරගුරු; වෘහස්පති.

දම් = 1. ධර්මය. 2. දම්වැල. 3. බුදුන් වහන්සේ. 4. මාලාව. 5. කුශලය. 6. දමය. 7. භාර්යාව. 1. දවුණු. 9. දුම. 10. දමනය කටයුතු.

දම් ඛඳ = 1. ධර්මස්කන්ධය; ධර්මරාශිය.

දම් කුඩ = (දඹුකඩ) 1 හැලි පල්ලේ රොස් වුණු බත්; දත්කුඩ.

දම්භේරිය = 1. ධර්මභේරිය; ආගමික චාරිත්‍ර සඳහා ගසන බෙරය. 2. හිස් ගසාදැමීමට නියමවූ අපරාධකාරයන්ගේ හිස් තබා කපන කොලොම්බුව.

දම්දා = 1. ධර්මධාතුව. 2. පුරාණ ග්‍රන්ථයක්?

දම් දෙසුම = 1. බණ කීම.

දම්නිය = 1. ධර්මන්‍යාය; ධර්ම ක්‍රමය.

දම්පතී = (දම්පතිහු) 1. අඹු සැමියෝ.

දම්පාට = 1. දත් ගෙඩියේ පාට; රතු හා නිල් එකතු වූ පාට.

දම්පසහිනා = 1. ධර්මය පිළිබඳ කටයුතු කරන ඇමතියා. 2. ශාසන ඇමති? 3. දළඳ සිරිතෙහි කතු කුමාට තුබුණු උපාධියක්.

දම්පියා = 1. ධර්මපදය නම් ග්‍රන්ථය.

දම්පියා අටුවාව = 1 ධර්මපදය නම් ග්‍රන්ථය විස්තරකොට ලියවුණු පොතක්.

දම්බ = (දබ්බ) 1. කුසතණ. 2 රුවටිල්ල.

දම්මැඳුම් = 1. දම්වැලින් බැඳීම; විලංගු දැමීම.

දම්මිල්ල = (ධම්මිල්ල) 1. කේශකලාපය; කොණ්ඩය.

දම්රජ් = 1. යමරජ.

දම්රද = 1. බුදුන් වහන්සේ.

දම්රුවන = 1. ධර්ම රත්නය.

දම්වැල = 1. ලෝහ පුරුක් ඇඳ සෑදූ දමය. 2. යාර විසිදෙකක දිග. 3. කඩදාසි පුරුක් ඇඳ කරන සැරසිල්ලක්.

දම්වැල් ගහනවා = 1. යකඩ දම්වැල් ගසා වැට කොටු සාදනවා.

දම්වැල් මාලය = 1. (රන් රිදී ආදී) ලෝහ පුරුක් අමුනා සෑදූ මාලය.

දම්වැල් මැස්ම = 1. දම්වැලක් සේ මැහෙනස මැස්ම.

දම්සක් = 1. ධර්ම චක්‍රය.

දම්සක් පවතුන් = 1. ධර්ම චක්‍ර ප්‍රවර්තනය.

දම්සඟා = 1. ධර්ම සංගායනාව.

දම් සඟුණු = 1. අභිධර්ම පිටකයේ ධම්ම සඞ්ගිණි නම් පොත.

දම්සබා = 1. ධර්ම සභාව.

දම්සබා මණ්ඩපය = 1. ධර්ම ශ්‍රවණය කරන පිරිස රැස්වන ශාලාව; ධර්ම ශාලාව; බණ ගේ.

දම් සරණ = 1. ධර්මයෙහි පිහිට. 2. එනම් පොත.

දම් සවන් = 1. ධර්ම ශ්‍රවණය; බණ ඇසීම.

දම් සහි = 1. ධර්මයට මඟ පෙන්වන්නා. බුදුන් වහන්සේ.

දම් සකිණි = 1. භක්තිවන්ත භාර්යාව. 2. පතිව්‍රතාව.

දම් සෙනෙවි = 1. ධර්ම සේනාපති. 2. ධර්මයට සේනාපතියකු වැනි සැරියුත් මහරහතුන් වහන්සේ.

දම්භ = 1. වංචාව. දුෂ්ටකම.

දම් හෝ = 1. සක්‍රිය.

දමාලා = 1. විසිකොට. 2. අත්හැර දමා.

දම්බු = 1. ධර්මිෂ්ට; ධර්මයට අනුව හැසිරෙන.

දමිත = 1. යටත්වූ 2. දමනය කළ. 3. හික්මවූ. 4. මැඩ පැවැත්වූ.

දඹිනි = 1. බොරළුදඹුතු නම් ගස් වර්ගය හෝ ගෙඩි 2. අෂ්ට විධ පාන වර්ග වලින් එකකට අයත් ගෙඩි; උගුරැස්ස?

දමිළ = 1. ද්‍රවිඩ; දෙමළ.

දම් = 1. ධර්මධරයා.

දමු = 1. දුවුණු. 2. ධර්මය. 3. දම් කුඩ.

දමු රුවන් = 1. ධර්ම රත්නය; ධර්මය නමැති මාණික්‍යය.

දමුනු = 1 දමනය. 2. හික්මවීම. 3. හෙලීම. 4. බොරළුදඹුතු ගස.

දමෝදර = (දමෝදරා) 1. විෂ්ණු දෙවි.

දම්‍ය = 1. දමනය කටයුතු; හික්මවා ගතයුතු.

දයා = 1. කරුණාව.

දයානුකම්පාව = (දයා + අනුකම්පාව) 1. කරුණාවෙන් යුතු අනුකම්පාව.

දයා පත් = 1. දයාවට පැමිණි. 2. දයාවට පාත්‍රයක් වැනි.

දයාපර = 1. දයාවෙන් යුතු. 2. කරුණාවන්ත. 3. දයාව ප්‍රධාන කොට ඇති.

දයාබර = 1. කරුණාවෙන් බරවූ; කරුණාවන්ත; දයාවෙන් බරවූ.

දයාලු = 1. කරුණා බහුලවූ; කරුණාවන්ත; දයාවන්තවූ.

දසිත = 1. කරුණා කරනු ලැබූ.

දසිතබ්බ = 1. කරුණා කළ යුතු.

දසිනා = 1. ස්ත්‍රිය; භාර්යාව.

දසිනාධීන = 1. භාර්යාවගේ අණට යටත්වූ.

දසිව = 1. දෛවය; භාග්‍යය; පින; වාසනාව.

දිය පරබල් = (දිය පරණලා) 1. දියෙහි හටගන්නා පැලෑටියක්.

දිය පානසි = 1. පැලෑටි වෙසෙක්.

දියපාර = 1. වතුර පාර; සැඩපහර.

දිය පැල් = 1. දිය බඳුන් තබන පැල.

දිය පැණ = 1. ජලය පුරවන පසුම්බි වර්ගයක්.

දිය පිය = (දිය පියං) 1 ලෝකයට පියා; බුදුන් වහන්සේ. 2. රජ.

දිය පෙළුම් = 1. දුන්නෝ ලණුවට තිය පිවින් ගැසීම.

දිය පොළොව = 1. ජල පොළොව; පොළොව යට වතුර තලය.

දිය බත් = 1. පෙර දින රෑ බත් දියෙහි දමා තබා පසුවදා උදෑසන පොඟිකොට පොල්-කිරි, රතුළූණු, ලුනු ආදිය දමා සකස් කොට ගන්නා බත.

දිය බඳ = 1. ලෝකයෙහි නැයා. විෂ්ණු දෙවි.

දිය බජ් = 1. ලෝකයට පියා; බුදුන් වහන්සේ.

දිය බරණ = 1. දිය බරියා. 2. දිනකයා

දිය බස්නාව = 1. දිය බැස යන ඇත්ත. 2. පහළින් ම පිහිටි ලියැද්ද. 3. දිය පාර.

දිය බල්ලා = 1. එනම් ජලචර සිවුපාවා.

දිය බැළ = 1. බැළ මෙනෙවරක් ලෙස දිය ඇදීම; කුළියට දිය ඇදීම. 2. දිය ඇදීමෙන් ලැබෙන කුලිය.

දිය බිඳු = 1. ජල බින්දුව. 2. වැහි පොද.

දිය බුං = (දිය බුක්; දියබොකු) 1. ජල ක්‍රීඩා විශෙෂයක්.

දිය බුබුළු = 1. දියෙහි ඇති වන බුබුල 2. කමේ සැදෙන බිබිල් වගීයක්.

දියබෙත්ම = 1. දිය බෙදුම. 2. දියෙන් බෙදී ගිය තැන. 3. කුඹුරුවල දිය බෙදීම.

දිය බෙදුම = (දිය බෙත්ම බලන්න.)

දියබෙරලිය = 1. පැලෑටි වගීයක්·

දිය බොන කෑම = 1. පැණි රස කැවිලි.

දියඹාර = 1. දිය හා මඩ.

දියඹ = 1. ගැඹුරු දිය; ජලයේ ගැඹුරු ස්ථානය.

දියමන්තිය = 1. එනම් මැණික.

දියමස් = 1. මත්ස්‍යයා. 2. තොවිල්වලදී දෙළ පිදේනි ආදියට ගන්නා මාළු හෝ කරවල.

දියමඟ = 1. පක්ෂි විශේෂයක්

දියමහන් = 1. ඈත මුහුදේ මසුන් මරන්නන් ගොඩබිමට පෙරළා ඊමට ලකුණු වශයෙන් තබාගන්නා කඳු ආදිය.

දියමහලේ = 1. ජය මහා ලේඛකයා; ජයමහ ලේනා; පැරණි ගරු නමක්.

දියමාරුව = 1. පරණ ජලය අස්කොට අළුත් ජලය ගැනීම. 2. කුඹුරක දිය බැසයාම.

දියමැඩියා = 1. දියමිටියා (මඩ වතුර පැහිමෙන් යටිපතුළු පා ඇඟිලිකරු ආදිය කසා වණවේ. එසේ වීමට හේතුව දියමිටියා නම් සතුන්වා යටිපතුළු, ඇඟිලිකරු ආදිය කෑම් යයි ව්‍යවහාරයෙහි පවතී.)

දියමැලි = 1. දිය ගෙවෙල්. 2. දිය පරඬල් ආදිය.

දියමැස්ස = 1. පැන් කළ ආදිය තබන මැස්ස.

දියමිණ = 1. ලෝකයේ මැණිකා; සූර්‍යයා.

දියමිත්ත = 1 එනම් වැල් වගීය.

දියමිදෙල්ල = 1 එනම් ගස් වගීය.

දියඹමරලිය = 1. පැලෑටි විශෙෂයක්. 2. දිය බෙරලිය?

දියමොණෝරිය = 1 පැලෑටි වෙසෙසක්.

දියයතුරු = 1. ජල යාත්‍රාව; ඔරු, පාරු නැව්, හම්බන් ආදිය. 2. ජල යානාය. 3. ජලයෙහි යාත්‍රා කිරීම; දියෙහි යෑම.

දියයන් = 1. ජල යානය; නැව්, හම්බන්, ඔරු පාරු ආදිය·

දියර = 1. ජලය; වතුර. 2. ඉස්ම. 3. දියාරු ගතිය.

දියරකුස් = 1. විල් පොකුණු ආදියට අරක්ගත් රාක්ෂස විශෙෂයක්.

දියරම් = 1 ඛතරටයි නම වරම් රජ.

දියරන් = 1. ගංගා ඇල දෙල ආදියෙහි වැලි අතර ඇති රන් වෙසෙසක්; දිය රත්රන්.

දියරළ = 1. ජල තරඟය; දියේ ඇතිවන රැල්ල.

දියරැස = 1. ජල සමූහය; මුහුද.

දියඹරදි = 1. නානවිට අඳින රෙදි.

දියරෝන = 1. පක්ෂි විශේෂයක්.

දියඹරාන් = 1. සියුම් දිය බිංදු.

දියලනුව = 1. ඉන වට බඳින හන හෝ කපුනූල; අමුඩය ගැසීමට ඉනේ බඳින නූල.

දියලබු = 1. ලබු වගීයක්. 2. දිය වක්කරන ලබු ගෙඩිය.

දියලිහිණි = 1. කුරුල්ලන් වගීයක්. 2. ජලයෙහි හැසිරෙන ලිහිණි වෙසෙසක්.

දියවක = (දියවක්) 1. සකලොස්වක හෝ මාගේ හෝ දිගයෙක් දෙවෙනි දුමණ.

දියවටන් = 1 මූත්‍ර මැයිය. 2. කොස නිත්‍රියා

දියවඩන නිලමේ = 1. දන්ත ධාතුන් වහන්සේට පූජා සත්කාර කිරීමට ජනයෙන් පත්කරගන්නා නිලධාරියා.

දියවතුරු = 1. ගලා උතුරා යන ජලය.

දියවදන් = 1. ජය ප්‍රාර්ථනය; ජයවේවා යනකීම.

දියවර = 1. ජල ධාරාව. 2. දියාරු.

දියවරණ = 1. ලෝකය ආරක්ෂා කරන්නා; රජ

දියවල්ලා = 1. මුහුදු මාළුවෙක්. 2. සරාටි විශේෂයක්.

දියවබුලා = 1. පක්ෂි විශේෂයක්.

දියවබුලෑම්බා = 1. ගස් වර්ගයක්.

දියවළු = 1. දිය සහිත වළ.

දියවැඩ = 1. ලෝවැසියන්ගේ සුබ-සෙත පිණිස කරන යහපත් කටයුතු.

දියවැඩියාව = 1. එනම් මූත්‍ර රෝගය; බහු මූත්‍ර රෝගය. 2. මධු මේහය.

දියවැල = 1. සැඩ දිය පහර; කදින් ඇදී යන වතුර පාර.

දියවිත = (දියවිත්) 1. දිය බඳුන; පැන් බඳුන; දිය ගොටුව. 2. වැව.

දියවිල් = 1. ජල කඩාහය; දිය පොකුණ.

දියවෙද = 1. දිය කුඹැල්ලා.

දියවෙනවා = 1. දියවී යනවා; වතුරට හැරෙනවා.

දියසක් = 1. ලොවට ඇසක් වැනි; සුගතියා. 2. ලෝකයේ ඇස. 3. බුදුන් වහන්සේ.

දියසක් = 1. ජය ධවජය; ජයකොඩිය.

දියසලා = 1. දිය සුළිය.

දියසලා මුඹය = 1. දිය සුළියේ මැද.

දියසැවුල් = 1. ජලය ආශ්‍රය කොටගෙන ඉන්නා කුකුළා.

දියසෑල = 1. දිය හැළිය.

දියසිළු = 1. වතුරපාර. 2. ගංවතුර.

දියසිරාව = 1. තෙත් ගතිය; බිමෙහි තෙත් ගතිය.

දියසෙවල් = 1. දියෙහි හටගන්නා තුඹා පැළෑටි වර්ගයක්. 2. දියෙහි හටගන්නා සෙවෙල.

දියසේනා = 1. එනම් කුමාරයා (බුඩ වර්ෂ 2500දී ලොව පහල වෙතැයි පැරකුම්බා සිරිතෙහි අනාවැකියකින් දැක්වුණු රජ)

දියහේරා = 1. ජලයෙහි හැසිරෙන පක්ෂි විශේෂයක්.

දියහකුරු = 1. අටෝලු, බල ආදි මිනුන්ගේ ලෙසින් (මාලදිවයින් වැසියන් විසින්) සාදනු ලබන කෑමක්.

දියහබරල = 1. එනම් පැළෑටි වර්ගය (මඩ සහිත සෙදෙස්වල හටගන්නා මේ පැළෑටි වර්ගයෙන් මැල්ලුම් ආදිය සකස් කොට ගෙන ආහාර පිණිස ගනිති.)

දියහවරිය = 1. දියෙහි සෑදෙන පැළෑටි වර්ගයක්.

දියහළුවා = 1. කොස් ආදියට දිය අදින අඳ. 2. රජකයා; රෙදි අපුල්ලන්නා.

දියහිමි = 1. ජගත් සවාමි; බුදුන් වහන්සේ. 2. රජ.

දියහිස = 1. ලෝකාභිවෘද්ධිය.

දියහෙබි = 1. දියවළ; ගැඹුරු දියවළ.

දියාබු = 1. දියෙහි පිහිටි.

දියාක පායනාව = 1. වතුර පැහැදිලිව තිබෙනවා.

දියාරු = 1. දිය ගතියෙන් යුක්; දියවීගිය.

දියාළුව = 1. ඔරුවෙහි වතුර හිස්කරන උපකරණය.

දියාළුවා = 1. වතුර අගල සාදන්නා. 2. කොස්-කැඹුරු ආදියට ඇල - දෙළින් වතුර සපයන්නා.

දියෑටි = 1. දීමට කැමති.

දියෑස = (දිය + ඇස) 1. ලෝකයෙහි ඇස. 2. බුදුන් වහන්සේ. 3. රජ. 4. සුගතියා.

දියුණා = 1. දියුණුකොට.

දියුණු = 1. දෙගුණ. 2. වැඩි හොඳ. 3. උසස්.

දියුල් = 1. දුකුලය; සියුම් වස්ත්‍ර වර්ගයක්.

දියෙකසක් = (දිය + එකසත්) 1. ලොව-එක්සත් කළ. 2. රජ. 3. චක්‍රවර්ති. 4. රාජාධිරාජ.

දියෙස් මෑණි = 1 ආහාර්ජී. දියෙන් මැණි අමුණන වීරයෙකි; දූත ඝනිගෙනි.

දියස් මැතිණිය = 1 ජෙරෙමියස් දියෙස් මැතිණිය (ත්‍යාගශීලි ධනවත් කාන්තා-වකි. කෝටි සංඛ්‍යාත සවකීය ධනයෙන් කොටසක් පොදුවැඩට පරිත්‍යාග කළාය.)

දිඝෝකා = 1. කුඩැල්ලා.

දිඝෝකු = 1. තාරකාව.

දිරච්ච = 1. දිරාගිය; ජරාවට ගිය.

දිරජ = (දිරද) 1. ඇතා.

දිරණ = 1. ජීර්ණවන; ජරාවට යන.

දිරාපත්වුණු = 1. ජරාවට ගිය. 2. දිරච්ච.

දිරි = 1. ධෛර්‍යය. 2. ඇල වූ. 3. ජීර්ණ වූ.

දිරි ගැන්වීම = 1. ධෛර්‍යය දීම.

දිරිතර = 1. ධෛර්‍යයෙන් සපිරවූ. 2. උත්සාහ වන්ත.

දිරිනි = (දිරිණි) 1. මැහැල්ල.

දිරිය = 1. ධෛර්‍යය 2. ශක්තිය.

දිරිය බල = 1 ධෛර්‍ය බලය; වෙර වැයම.

දිරූම = 1. දිරායාම

දිලි = 1 ජ්වලිත; බැබළුණු

දිලිඳා = 1. දුප්පතා.

දිලිඳු = 1 දුප්පත්.

දිලිසීම = (දිලීම) 1. බැබළීම. 2. ඔපය.

දිලිසෙත = 1 දිලිසෙන කල්හි.

දිලිසෙන = 1. දිලිසෙන; බබළන.

දිලිසෙමිනි = 1. බබළමින්.

දිලිර = 1. හත්ත; බිම්මල.

දිලිරජ = 1. හතුවලින් උපන්; හතුවලින් හටගත්.

දිලිර භක්ෂණ = 1. හතු කන.

දිලිරාකාර = (දිලිර + ආකාර) 1. හතුවල හැඩය ඇති.

දිලිරාම්ල = (දිලිර + අම්ල) 1. හතු ඇඹුල.

දිලුබ් = (දිලිබ්) 1 දුර්ලභ.

දිලුබු = 1. දුර්ලභ; අමාරු.

දිලුම් = 1. බැබලීම්; දිලිසීම්.

දිලෙන = 1. බබළන; දිලිසෙන.

දිළිඳු = 1. දුප්පත්.

දිව = 1. මුඛය තුළ පිහිටි සිරුරට රස දක්වන අවයවය. 2. දූපත. 3. දිව්‍ය ලෝකය. 4. දෙවියන් පිළිබඳ 5. ධාවනයකොට; දුව (අවුත්.)

දිව අඳුන් = 1. දිව්‍යමය අංජනය; දෙව් ලොව අඳුන්.

දිව අහර = 1. දිව්‍ය භොජනය; දෙවියන්ගේ කෑම.

දිව ඇස් = (දිවැස්) 1. දිව්‍ය චක්ෂුස. 2. ඥාන විශේෂයක්.

දිව ඉසි = 1. දිව්‍ය ඍෂිහු. 2. දිව්‍ය ඍෂීන් ලෙස සැලකෙන පුලස්ත, වශිෂ්ඨ ආදි ඍෂිවරුන් සත්දෙන.

දිව ඉසුරු = 1. දිව්‍ය ඓශ්වර්‍යය; දිව්‍ය සම්පත්.

දිව ඔසු = 1. දිව්‍යමය ඖෂධ.

දිව්‍ය ඕජස් = 1 දෙවියන්ගේ පිනෙන් පහළ වන ඕජස් විශේෂයක්.

දිවකන් = 1. දිව්‍ය ශ්‍රොත්‍ර ධාතුව. 2 දෙවියන්ගේ කන්.

දිව කිඳුරු = 1. කිඳුරු විශේෂයක්.

දිවකුරු මුනි = 1. දීපංකර බුදුන් වහන්සේ.

දිවඟ = (දිව + අඟ) 1. දිවෙහි කොළවර.

දිවගඳ = 1 දිව්‍යමය වූ සුගන්ධය; දෙව්ලොව ඇති සුවඳවගී.

දිවගඳබ = (දිව ගඳැව්) 1. දිව්‍යමය සංගීත කාරයා.

දිවඟනා = (දිව + අඟන) 1. දිව්‍යාංගනාව; දෙවඟන.

දිවගුරු = 1 දෙවියන්ගේ ගුරුවරයා. 2. බුදුන් වහන්සේ. 3. බෘහස්පති.

දිවගුරු බඳිනවා = 1. මන්ත්‍ර බලයෙන් ගොළු කරනවා.

දිවදුම් = 1. දිව්‍යමය (සුවඳ) දුම්.

දිවදුහුල් = 1 දිව්‍යමය සියුම් වස්ත්‍ර විශේෂයක්. 2. දිව සළු.

දිවනාගී = (දිව නා) 1. දිව්‍ය නාගයා.

දිවනාළ = 1. දිව්‍ය නාටිකා.

දිවනාළුවා = 1. දෙව් ලොව් නැටුවුවා.

දිවනිලමේ = (දිය වඩන නිලමේ බලන්න.)

දිවනක් = 1. දිව්‍යමය ඇස්; දිවැස්.

දිවත = 1. සිතුවේ දිව. 2. යතුරු දිව.

දිවඳ = 1. බකමූණා.

දිව පඬුරු = 1. දිව්‍යමය ත්‍යාගය.

දිව පනු = 1. දිව්‍යපානය. 2. අමෘතය ?

දිව පසහතුරු = 1. දෙවියන්ගේ පඤ්ච තූර්‍ය්‍යය.

දිව පහන් = 1. දෙවියන්ගේ පහන්; දිව්‍යමය ප්‍රදීප.

දිව පහස් = දිව්‍යමය ස්පර්ශය.

දිව බෙහෙද් = (දිව ඔසු බලන්න.)

දිව බොජුන් = (දිව අහර බලන්න.)

දිවමන් = 1. ජීවමාන; ජීවත්ව සිටින.

දිවමඳුරා = 1. දිව්‍ය ලෝකයෙහි ඇතැයි සැලකෙන මඳාරා වෘක්ෂය.

දිව මිහිඟු බෙර = 1. දිව්‍ය ලෝකයෙහි මෘදඞ්ග භේරිය.

දිවයින = 1. ද්වීපය; දූව.

දිවයුරු = 1. හිරු.

දිවයුරුමං = 1. අහස.

දිවයොන් = 1. දේව යෝනිය; දේව වර්ගය.

දිවරක = 1. දෙවියන්ගේ රථය; දිව්‍ය රථය.

දිව රෑ = 1. දවාල හා රාත්‍රි කාලය.

දිව වදන් = 1. දේව භාෂාව. 2. සංස්කෘත භාෂාව.

දිවවස = (දිවවස්) 1. දිව්‍ය වාසය; දෙව් ලොව.

දිවංගත = 1. ස්වර්ගස්ථවූ; දෙව්ලොවට ගිය; මැරුණු.

දිවවිමන් = 1. දිව්‍ය විමානය; දිව්‍ය මන්දිරය.

දිවවීම = 1. දූවත්තට සැලස්වීම.

දිවසක් = 1. දිව්‍ය චක්ෂුස; දිවැස.

දිවසක් ඤාණ = 1. දිව්‍ය චක්ෂුරභිඥානය.

දිව සක්විති = 1 දිව්‍යමය බලයෙන් යුක්ත වූ චක්‍රවර්ති රජ.

දිවසකර = 1. දවස ඇතිකරන්නා; සූර්‍ය්‍යයා. 2. වරාගස්.

දිවස භාගය = 1. දවල් කාලය.

දිවස මුඛය = (දිවස මුව) 1. දින මුව; උදය කාලය. 2. ඉරිමා උදය.

දිවසර = 1. දිව්‍යාප්සරාව; දෙව්දුව; දෙවඟන

දිව සවන් = (දිව සක් බලන්න)

දිව සළු = 1. දෙවියන්ගේ සළු.

දිවස් උල = (දිවිස්හුල) 1. මරණ දණ්ඩනයට නියම වූවත් නිදුවා මරණ උල

දිවස් එලි = 1. රජුගේ බැල්ම.

දිවස් කරුණ = 1. දිවැසින් බලා කරන කරුණාව; දෙව් පිහිට.

දිවස් කියනවා = 1 පේන කියනවා; අනාගතයෙහි සිදුවන දේ කලින් පැවසීම.

දිවස් පති = 1. දවසේ ස්වාමියා; සූර්‍ය්‍යයා.

දිවස් ලා = 1. දිවැසින් බලා.

දිවස්ලිම් = 1. බැලීම. 2. පැවසීම.

දිවසැප = (දිවසිරි) 1. දිව්‍ය සම්පත්තිය; දිව්‍ය ලොකයෙහි ඇති සැප.

දිවසින් = 1. දෙවියන් හට පෙණෙන්නාක් මෙන්.

දිවසිඳු = 1. දවසේ ප්‍රධානයා; සූර්‍ය්‍යයා. 2. දිව්‍ය ගඞ්ගාව.

දිවසුවඳ = 1. දෙව්ලොව ඇති සුවඳ.

දිවසෝ = (දිවසක් බලන්න)

දිවහොය = 1. අහස්ගඟ. 2. ගංගා නම් ගඞ්ගාව.

දිවි = 1. ශරීරයට රස දන්වන අවයවය; දිව. 2. ද්වීපය. 3 පහන. 4 ජීවිතය. 5. දෙවියා. 6. දෙව්ලොව. 7. අහස. 8. දවාල. 9. ජීවනය. 10. කැඩපත.

දිවිබව = (දිවොට) 1. දිව හා තොල්.

දිවිකැන් = 1. පහනේ කාන්තිය.

දිවිමිල = 1 මරණ දණ්ඩනයට නියම වූවෙකුට අභය දී ඒ වෙනුවෙන් ගන්නා දඩ මුදලක්.

දිවිහිමි = (දිවිහිමි) 1. ජීවිතය ඇතිතාක්; පණ තිබෙන තුරු

දිවා = 1. දවල් කාලය.

දිවා අන්ධ = 1 දවල් කාලයෙහි ඇස් නොපෙණෙන්නා; බකමූණා 2 දිය කුඩැල්ලා

දිවාකර = 1. සූර්‍ය්‍යයා

දිවාකාල = 1. දවල් කාලය,

දිවාඨාන = 1. දවල් වසන තැන.

දිවාකීර්තිකා = 1. චණ්ඩාලයා. 2. පණ්ඩිත්කියා. 3. බස්සා.

දිවාටනකා = 1. කපුටුවා.

දිවාතිතික = 1. දවල් කාලයෙහි.

දිවාභාගය = 1. දවල් කාලය.

දිවාභීත = 1. දවාලට බියවූ.

දිවාභීතකයා = 1. බස්සා. 2. හොරා. 3. වඳුරා. 4. දිය කුඹල්ලා.

දිවාමණි = 1. දවසේ මැණික; සූර්යයා.

දිවාමධ්‍යය = 1. ඉර මුදුන් වෙලාව; මධ්‍යාහ්නය

දිවාමාන = 1. දවල් කාලය.

දිවාමානය = 1. දින මැනීම.

දිවාරාත්‍රි = (දිවා රෑ) 1. දවාල හා රාත්‍රිය.

දිවාවිහාර = (දිවා විහරණ) 1. මධ්‍යාහ්න කාලයේ විවේක ගැනීම. 2. දවල්හි විසීම.

දිවාස්ථාන = 1. දවල් කාලයෙහි වසන තැන.

දිවාස්වප්න = 1. දවල් කාලයෙහි නිදීම. 2. දවල් කාලයෙහි දකින සිහින

දිවැ = 1. ධාවනය කොට.

දිවැස = 1. දිව්‍ය ඇස.

දිවි = 1. ජීවිතය. 2. ප්‍රාණය; පණ. 3. ජීවිකාව. 4. දිවියා, 5. දිවුරුම. 6. දූපත.

දිවිඅඩිය = 1. එනම් පැලෑටි වර්ගය.

දිවිඋපකරණ = 1. ජීවිකාවට අවශ්‍ය උපකරණ.

දිවිකඳුරු = 1. එනම් කඳුරු ගස් වර්ගය.

දිවිකල් 1. ජීවිත කාලය. 2. ආයුෂ.

දිවිගනුත් = 1. මැරීම.

දිවිතෙක්ම = 1. පණ තිබෙන තුරුම.

දිවිදළ = 1. දිවියාගේ දත්.

දිවිදෙන = 1. දිවියාගේ ගැණු සතා.

දිවිදෙස් = 1. බොරු දිවුරුම් ආදියෙන් ඇතිවන දෙස්. 2. දෙවියන්ගේ අමනාපයෙන් ඇතිවන කරදර - හිරිහැර; දේව සාප.

දිවිඳු = 1. බකමූණා.

දිවිපසුරු = (දිවිපහුරු) 1. එනම් ගස්.

දිවිපෙවෙත = 1 ජීවිකාව කර ගැනීම; ජීවිකාව පැවැත්වීම.

දිවිබා = 1. දිවියා.

දිවිමකුළුවා = (දිවිමකුණා)1. විෂ සහිත මකුළු වර්ගයක්.

දිවියා = 1. කොටි වර්ගයට අයත් (පුල්ලි සහිත) චණ්ඩ මෘගයෙක්.

දිවිරජ = 1 දිවියන් ගේ රජා.

දිවිරැක්ම = (දිවි වැටුම) 1. රක්ෂාව.

දිවිසිල්ල = 1. දිවුරුම.

දිවිලස් = 1. වියවුල; වියවුල් දෙය.

දිවිලෙන් = 1. දිවියා ඉන්නා ගුහාව.

දිවිවැටුප් = 1. ජීවිතය ආරක්ෂා කරගැනීමට දෙන වැටුප් මුදල.

දිවිහිම් = 1. ජීවිතය අවසානය දක්වා; පණ තිබෙනතුරු.

දිවිහිමියෙන් = 1. ජීවිත කාලය තුළ.

දිවු = 1. දිවුරුම. 2. වැටුප; පඩිය. 3. දිව්වාවූ. 4. දිවයින. 5. දෙවියා.

දිවුඇදුර = 1 දිව්‍ය ආචාර්ය; සුරගුරු; බෘහස්පති.

දිවුට = 1. සපථකොට; දිවුරා.

දිවුණකොන් = 1. දියුණු කරකොත්.

දිවුණස් = 1. දෙගුණයක්.

දියුණුවෙනවා = 1. අභිවෘද්ධියට පත්වෙනවා. 2. වඩා හොඳ වෙනවා. 3. වැඩි වෙනවා.

දිවුල් = 1. ගස් වර්ගයක්; ශ්‍රීල්ගස. 2. ඒ ගසේ ගෙඩි.

දිවුල්කිරි = 1. දිවුල් මද හා හකුරු - පැණි- පොල්කිරි ආදිය යොදා සාදාගන්නා මිශ්‍රණය.

දිවුල්ඵල = 1. දිවුල් ගෙඩි.

දිවුල් මැලියම් = 1. දිවුල් ගසේ ඇඳෙන ලාටු.

දිවුළ = 1. සපථ කළ; දිවුරූ.

දිවෙල = (දිවෙල්) 1. වැටුප; පඩිය. 2. ජීවිකාව 3. ජීවනෝපාය. 4. රක්ෂාව. 5. යම් කිසි (කාර්යයක්) මෙහෙයක් කරන්නෙකුට ජීවිකාව සඳහා දෙන ඉඩම.

දිංවෙල්ගම = 1. නින්දගම. 2. රාජකාරිය සඳහා දුන් ගම් ගෙත් ඉඩම්.

දිංවෙල්සන්නස = 1. දිංවෙල් ඉඩමක් සඳහා ලියවුණු ලියවිල්ල.

දිංවෙල්පුවේණි = 1. මෙහෙයක් සඳහා ලබාගත් පරවේණි ඉඩම.

දිව්‍ය = 1. දෙවියන්ට අයත්වූ; දෙවියන් පිළිබඳ 2. දෙවියා 3. දෙව්ලොව වූ. 4. සඳුන් වර්ගයක්. 5. කරාබුනැටි.

දිව්‍යඅක්ෂර = 1. කාව්‍යකරණයෙහිදී උතුම් යයි සැලකෙන අකුරු. 2. අපායාක්ෂර හා තරාක්ෂර හැර හෝඩියේ ඇති ඉතිරි අකුරු.

දිව්‍යඅඟද = 1. දිවබඩු.

දිව්‍යඅඞ්ගනා = (දිව්‍ය අප්සරා) 1. දෙවඟන

දිව්‍ය ආත්ම භාවය = 1 දිව්‍යමය ශරීරය; දෙව් සිරුර.

දිව්‍යඖෂධ = 1 දිව ඔසු.

දිව්‍යකන්‍යාව = 1. සුරංගනාව; දෙවඟන.

දිව්‍යකාම = 1. දිව්‍යලෝකයෙහි ඇති කාම සැපත.

දිව්‍යකාය = 1. දිව්‍යමය ශරීරය. 2. දිව්‍ය සමූහය.

දිව්‍යකින්නර = දේව ගති ඇති කිඳුරා.

දිව්‍යගරුඩ = 1 දිව්‍ය ලෝකයෙහි ගරුඩ පක්ෂියා.

දිව්‍යචක්ෂුරභිඥානය = 1. දෙවියන්ගේ ඇසින් පෙනෙන්නාක් මෙන් කරුණු අවබෝධ කොට ගන්නා විශිෂ්ට ඥානය.

දිව්‍යචාමර = 1. දෙව්ලොවට අයත් චාමර.

දිව්‍ය ධේනු = 1. සුරභි ධේනුව; කාම ධේනුව.

දිව්‍ය නදී = 1. අහස් ගඟ.

දිව්‍ය නාග = (දිව නයි බලන්න.)

දිව්‍ය නාටක = 1. දෙව් ලොව නළුවා.

දිව්‍ය නෘත්‍ය = 1. දෙව් ලොව නෘත්‍යය.

දිව්‍ය පථ = 1. දෙවියන්ගේ මාර්ගය; අහස.

දිව්‍ය පාන = 1. දෙවියන්ගේ බීම; අමාපැන්.

දිව්‍ය පුත්‍රයා = 1. දෙවියා. 2. තරුණ දෙවියා. 3. දෙවියෙකුගේ පුතා.

දිව්‍යපුරය = 1. දෙවියන්ගේ පුරය. 2. දෙව් ලොව.

දිව්‍ය භවනය = (දිව්‍ය විමානය) 1. දෙව් ලොව.

දිව්‍ය භාව = 1. දෙව් බව.

දිව්‍ය භාෂාව = 1. දෙවියන්ගේ භාෂාව. 2. සංස්කෘත භාෂාව.

දිව්‍ය භේරිය = 1 දෙවියන්ගේ බෙර; දෙව් ලොව බෙර.

දිව්‍ය මය = 1. දෙව් ලොවෙහි වූ. 2. දෙවියන්ගේ වූ. 3. දෙව් ලොව නිපන්.

දිව්‍යමය ශරීරය = 1. දෙව් සිරුර

දිව්‍ය මන්ත්‍රය = 1. දෙවියන්ගේ අනුභාවයෙන් කියන ලද්දක් මෙන් ගුණ දෙන බල සම්පන්න මන්ත්‍රය.

දිව්‍ය මන්දාර = 1. දෙව් ලොව මදාරා ගස.

දිව්‍ය මිථුන = 1. දෙව් යුවල.

දිව්‍ය රථ = 1 දෙව් ලොව ඇතැයි සැල කෙන රථ විශේෂය.

දිව්‍ය රාජයා = 1. ශ්‍රේෂ්ඨ දෙවියා. 2. දෙවියන් ගේ රජා; ශක්‍රයා.

දිව්‍යරූප = 1. දෙවියන්ගේ රූපය.

දිව්‍යර්ෂි = (දිව ඉසි බලන්න.)

දිව්‍ය ලෝකය = 1. දෙව් ලොව.

දිව්‍යාඞ්ගනාව = 1. දෙවඟන; දෙව් දුව.

දිව්‍යාක්ෂිය = (දිව්‍ය + අක්ෂිය) 1. දිව ඇස.

දිව්‍ය වීථිය = 1. දිව්‍ය පථය; දෙවියන්ගේ මාර්ගය; අහස.

දිව්‍ය වෘක්ෂ = 1. දෙව් ලොව ඇතැයි සැල කෙන කල්ප වෘක්ෂය. 2. මඳාර, පාරි ජාතක, සන්තාන, කල්පවෘක්ෂ, හරිචන්දන යන ගස්.

දිව්‍ය ශය්‍යා = 1. දෙවියන්ගේ ශයනාසනය; දෙවියන්ගේ ඇඳ.

දිව්‍ය ශාටක = 1. දිව සළු.

දිශ = (දිස්) 1. දිශාව. 2. පැත්ත. 3. අවකාශය. 4. දැකීම.

දිශතු = 1. තරුව. 2. කෙහෙතු.

දිශම්පති = 1. රජ.

දිශන්ත = 1. දිශාවන්ගේ කෙළවර.

දිස්නය = (දිස්නා) 1 දිප්තිමත් බව. 2 රශ්මිය.

දිස්නා = 1 දිලිසෙන. 2. කාන්තිමත්. 3. පෙනෙන.

දිස්මනු = 1. දෘශ්‍යමාන; පෙනෙන.

දිස්මින් = 1. දෘශ්‍යමානවෙමින්; පෙනෙමින්.

දිස්වත් = 1. දක්වන කල්හි.

දිස්විය = 1. බැල්ම. 2. ආරූඪවීම.

දිස්වි දමා ගෙනා යාම = 1. බර උසුලා ගෙන යාමේ ක්‍රමයක්.

දිස්ත්‍රික්කය = 1. පළාත. 2. කොට්ඨාශය.

දිස්ත්‍රික් උසාවිය = 1. ප්‍රදේශයකට ඇති විනිශ්චය ශාලාව.

දිස්වා = 1. දක්වා.

දිසාකාක = 1. (නැව් ගමනේදී) දිශාව දැන ගැනීමට යවන කවුඩා.

දිසාන්තරය = (දිසා + අන්තරය) 1. දිශාවන්ගේ අතර.

දිසානා = 1. දිශාවෙහි නායකයා.

දිසාපති = 1. දිශාවෙහි ස්වාමියා. 2. පළාතක ප්‍රධානයා. 3. දිසා මහත්මයා. 4. ආණ්ඩුවේ ඒජන්ත නම් නිලධාරියා.

දිසාපාමොක් = 1. දිශාවෙහි ප්‍රධාන.

දිසා පාමොක් ආචාරී = 1. දිශාවෙහි ප්‍රධාන ආචාර්යවරයා. 2. විශ්ව විද්‍යාලයක ප්‍රධානයා.

දිසාමූළ්හ = 1. දිසාව දැනගත නොහැකි වූ.

දිසාව = 1. ප්‍රදේශය. 2. කොට්ඨාශය. 3. පැත්ත. 4 දිශා පතියා. 5 උඩරට ප්‍රදේශයක් පාලනය කරන රටේමහත්මයා.

දිසාවනි = (දිසාවගේ) 1. දිසාව (දිසාපති යෙකු) විසින් පාලනය කරනු ලබන ප්‍රදේශය.

දිසි = 1. පෙනෙන. 2. සමාන පෙනුමින් යුත්. 3. දිලිසෙන.

දිශාභාගය = 1. ප්‍රදේශය; පළාත; දිස්ත්‍රික්කය.

දිශානුදිශා = (දිශා + අනු දිශා) 1. උතුර, නැගෙනහිර, දකුණ හා බස්නාහිර යන ප්‍රධාන දිශා සතර හා ඊශාන, ගිනිකොණ, නිරිත, වයඹ යන අනු දිශා සතර. (ප්‍රධාන දිශා සතර හා අනු දිශා සතර දැයි යන අට දිශාව.)

දිශා නායක = (දිසානා බලන්න)

දිශා භිත්ති = 1. දිශාව නමැති බිත්තිය. 2. දිශාවෙහි කෙළවර.

දිශාම්පති = 1. දිශාවෙහි ස්වාමියා; රජ.

දිශ්‍ය = 1. පිහිටි.

දිෂ්ට = 1. පෙනුන. 2. දක්වන ලද.

දිසා = 1. දිසාව; පැත්ත.

දිහි = 1. දී කිරි.

දිහි කිරි = 1. මිදුණු කිරි.

දිහිගුණ = 1. ද්විගුණ; දෙගුණ.

දිළිඳා = 1. දුගියා; දුප්පතා.

දිළිඳු = 1. දුප්පත්; දුගී.

දී

දී = 1. දී කිරි. 2. මිදුණු කිරි. 3. දිවයින. 4. දියකිරි. 5. දීම කර.

දීකිරි = 1. මිදුණු කිරි.

දීකැටි = 1. මිදුණු කිරි කැටි.

දීහෙළි = (දීතලි) 1 දී කිරි කළය. 2. දී කිරි තැටිය.

දී පෙරළි දිය = 1. දී කිරෙන් පෙරා ගත් දියර.

දීක්ෂා = 1. උපනයනය. 2. යාගය. 3. පූජාව.

දීක්ෂිත = 1. පේවූ.

දීගය = (දීගේ) 1. විවාහය. (කාන්තාවක් පුරුෂ යෙකුට පාවාදීම.)

දීගෙක්කර ගන්නවා = 1. කාන්තාවක් අවාහ කර ගන්නවා; කාන්තාවක් පාවාගන්නවා.

දීග දෙනවා = 1. කාන්තාවක් විවාහ කොට පුරුෂයෙකුට පාවාදෙනවා.

දීගයක් ගන්නවා = 1. කාන්තාවක් පාවා ගන්නවා.

දීග යනවා = 1. පුරුෂයකු සමග අතිනත් ගෙන ඔහුගේ නිවෙසට ලඟාවෙනවා.

දීඝ = 1. දිග; දික්වූ.

දීඝ නිකාය = 1. එනම් බණපොත. 2. බුද්ධ ධර්මයෙහි දික් වූ සූත්‍රාන්තයන් සංග්‍රහ කළ ග්‍රන්ථය; දික් සඟිය.

දීඝ භාණක = 1. දික් සඟිය දරා සිටින්නා.

දීඝඞ්ගුලී = 1. දික් ඇඟිලි ඇති.

දීඝතා = 1. දික් බව.

දීඝ දස්සී = 1. දුර දක්නා.

දීඝ ජාතික = 1. සර්පයා; දික් ශරීර ඇත්තා.

දීඝරත්තං = 1. දීර්ඝ කාලයක් මුළුල්ලේ.

දීඝ ලෝමක = 1. දික් වූ ලොම්වලින් යුත්.

දිධම් = 1. දෘශ්‍ය ධම්මය; දැන වන්නාව.

දිධිති = 1. ආලෝකය.

දීන = බැගෑපත්. 2 දිළිඳු 3. ශෝකාතුර පත්. 4. චිතරට. 5. දුක්ඛිත 6. හීන. 7. ඔට්ටුවා.

දීනතාව = 1. බැගෑ පත් බව.

දීන පුම්බුව = 1. හාත්සි වන ප්‍රට්ටුව.

දීන බල්ලා = 1. හීන බල්ලා. 2. කුසගින්නේ සිටින බල්ලා.

දීන මුඛ = 1. බැගෑ පත් මුහුණකින් යුත්. 2. මලානික පෙනුමක් ඇති.

දීනාර = 1. කාසියක් 2. බර ප්‍රමාණයක්. 3. රත්රන් පැලඳුම. 4. මුද්‍රාව.

දීනෝක්ඛිය = (දීන + උක්ඛිත) 1. යටත්-පහත් කථාව.

දීදග = 1. ඇතුන් බඳින දම් වැල.

දීධිතිය = 1. රශ්මිය.

දීප = 1. දිවයින. 2. පහන. 3. පිහිට. 4. නිර්වාණය 5. දිවි සමෙන් වසන ලද රථය. 6. පිහිටීම.

දීප අධිරාජ = 1. ද්වීපයෙහි ප්‍රධාන රජ.

දීප අන්තර = 1. ද්වීපයින් බැහැර වූ තැන්.

දීපංකර = 1. එනම් බුදුන් වහන්සේ. 2. ආලෝකය දෙන්නා.

දීපක = 1. දීප්තිය. 2. පෙන්වන. 3. ප්‍රකාශ-කරන. 4. බබලවන. 5. කාක. 6. සුදුරු. 7. කොකුම්. 8. පහන. 9. කාව්‍යා-ලංකාරයක්.

දීපකාය = 1. පහන. 2. උද්දීපනය.

දීපකකා = 1. දඩයම් බල්ලා. 2. අනංගයා. 3. කුරුළු ගොයා.

දීප ඛාභක = (දීප ස්ථම්භය) 1. එළිය ගේ (පහන් කණුව).

දීප ධ්වජ = 1. පහන් දූල්ල.

දීපන = 1. කුසගිනි වැඩීම. 2. ගින්න. 3. මොණර කුඹිම්බිය. 4. දැල්වීම. 5. දැක්වීම. 6. කොකුම්. 7. උත්තේජ කිරීම.

දීපනය = 1. එළියදීම. 2. කුසගින්න තියුණු කිරීම.

දීපන් බැජව් = 1. පහර දෙව. 2. ඉතා ඇත.

දීපනා = 1. ප්‍රකටකිරීම. 2. පැහැදිලිකිරීම.

දීපනී = 1. වණ්ණනාව; ටීකාව.

දීපනීය = 1. එළිය කළයුතු. 2. දුරු. 3. පෙරුංකායම්. 4. පෙලඹවීම කරන දෙයක්.

දීප පාදප = 1. පහන් කඳ.

දීප මාලා = 1. පහන් වැට; පහන් පෙළ.

දීප මූල = 1. පහන් අඩිය.

දීපශ = 1. පහන. 2. එළිය. 3. ද්වීපක.

දීප රුක්ඛ = 1. පහන් ගස.

දීප වාසී = 1. දිවයිනෙහි වාසය කරන.

දීප විලෝකන = 1. රටක් ගැන හෝ දිවයිනක් ගැන බැලීම.

දීප වෘක්ෂ = 1. පහන් කඳ; පහන්ගස.

දීප ව්‍යාප්ත = 1. දිවයිනෙහි පැතුරුණු; රටේ පැතුරුණු.

දීප ස්ථම්භ = 1. පහන් කණුව. 2. එළිය ගෙය.

දීප සිඛා = 1. පහන් සිළුව.

දීප්ත = 1. බැබළෙන; දිලිසෙන. 2. දීප්තිමත්. 3. ඇවිලෙන. 4. දල්වන ලද.

දීප්තකනක = 1. රත්රන්.

දීප්ත ජිහ්වා = 1. දිලිසෙන දිවක් ඇත්තා. 2. නරියා.

දීප්ත සාක = 1. රත්රන්. 2. හිංගු.

දීප්ත ලෝචනා = 1. දිලිසෙන ඇස් ඇත්ත. 2. බළලා.

දීප්තාක්ෂිකා = 1. දිලිසෙන ඇස් ඇත්තා. 2. මොණරා 3. බළලා.

දීප්ති = 1. කාන්තිය; දිලිසීම.

දීප්ති මත් = 1. දීප්තිය ඇති; දිලිසෙන.

දීප්ති සංඝාත = 1. එක්ව බැබලෙන.

දීප්‍ය = 1. ඇවිලෙන. 2. බැබලෙන. 3. දිව්දෙන.

දීප්‍යමාන = 1. බබලන.

දීප්‍යක = 1. කළුදුරු.

දීපාය මාන = 1. පහනක් වැනි.

දීපා ලෝක = 1. පහන් එළිය.

දීපි = 1. දිවියා. 2. සිංහයා.

දීපික = 1. දිවියා.

දීපිකා = 1. පන්දම. 2. ප්‍රකට කරන්නී. 3. වර්ණනාව. 4. විස්තරය. 5. සන්නය.

දීපිත = 1. දැක්වූ. 2, පැවසූ. 3. දීප්තිමත්. 4. එළිය කරන ලද. 5. විස්තර කළ. 6. දල්වූ. 7. ප්‍රකට කළ.

දීපිනී = 1. දිවි දෙන.

දීපිය = 1. දිවි හමින් වැසූ රිය.

දීපු = 1. දෙන ලද.

දී පෙරළිදිය = 1. මෝරු වතුර.

දීබත් = 1. මුදවාපු කිරි මිශ්‍ර බත්.

දීම = (දීමනාව) 1. තෑග්ග. 2 දානය කිරීම.

දීමනා = 1. දිය යුතු දෙය. 2. තෑග්ග.

දීය මාන = 1. දෙනු ලබන.

දීයොදේ = 1. මිදුණු කිරි යොදය.

දීර = 1. ධෛර්‍ය්‍යය. 2. නුවණ ඇති. 3. පරාක්‍රමය ඇති.

දීර විකුම් = 1. ධෛර්‍ය්‍යය හා වික්‍රමය.

දීර තෙදබලැති = 1. ධෛර්‍ය්‍යයෙන් හා තේජසින් හා බලයෙන් යුතු.

දීඝ = 1. දික්වූ; දිග ඇති. 2. මාත්‍රා දෙකකින් යුත් ස්වරය.

දීඝ අක්ෂි = 1. දික්වූ ඇස් ඇත්තී; දිගැසී. 2. කාන්තාව.

දීඝ අඞ්ගුලි = 1. දික් ඇඟිලි ඇති. 2. බුදුන්-වහන්සේ.

දීඝ ආයුෂ්ක = 1. දීඝායුෂ ඇති.

දීඝ කාල = 1. බොහෝ වූ කාලය; පුරාණ කල්.

දීඝ කණ්ඨකාශ = 1. කොකා.

දීඝ කරනවා = 1. දික් කරනවා.

දීඝ කාලාපගමය = 1 බොහෝ කලක් ගතවීම.

දීඝ ගණ්ඩි = 1 ගජ තිප්පිලි.

දීඝ ග්‍රීව = 1. දිග බෙල්ලක් ඇත්තා. 2. ඔටුවා.

දීඝ චතුරශ්‍රය = 1. සමාන්තර පැති වලින් යුත් සතරැස් කොටුව

දීඝ ජංඝ = 1. දික් පා ඇත්තා. 2. ඔටුවා. 3. කොකා.

දීඝ ජාති = 1. සපියා.

දීඝ ජිහ්වා = 1 දික්වූ දිවක් ඇත්තා; සපියා.

දීඝ දර්ශී = 1. ඈත පෙනෙන. 2. දුර බලන. 3. නුවණක්කාර. 4. අනාගතයෙහි ඇති විය හැකි විපාක දක්නා නුවණැති.

දීඝ නාද = 1. හක් ගෙඩිය.

දීඝ නිද්‍රාව = 1. දික් නින්ද 2. මරණය.

දීඝ නිකාය = 1. දීඝනිකාය නම් පාලි ග්‍රන්ථය.

දීඝ දර්ශියා = 1. නුවණැත්තා. 2. ගිජු ලිහිණියා. 3. වලසා.

දීඝ දෘෂ්ටි = 1. ඈත පෙනෙන්නා 2. පණ්ඩිතයා.

දීඝ පර්ණ = 1. දිග කොළ ඇති.

දීඝ පාදයා = 1. දිග පා ඇත්තා. 2. කොකා.

දීඝ පෘෂ්ඨා = 1. දිග පිටක් ඇත්තා. 2. සපියා.

දීඝ මණ්ඩූක = 1. මැඩි වගීයේ සතෙක්.

දීඝ මානක ක්‍රමය = 1. දිග මැනීමේ ක්‍රමය.

දීඝ මාරුතයා = 1. ඇතා

දීඝ රතයා = (දීඝ රදයා) 1. ඌරා.

දීඝ රසනයා = 1. සපියා

දීඝ රාත්‍ර = 1. දීඝ කාලය.

දීඝ රෝමයා = 1. දික් ලොම් ඇත්තා. 2. වලසා.

දීඝ සූත්‍ර = 1. දිග්ගස්සන. 2. පමා කරන. 3. පුහංගු.

දීඝායු = 1. බොහෝ කාලයක් ජීවත්වීම. 2. කපුටා. 3. සුළුන් ගස.

දීර්ඝිකා = 1. දිගු විල; දිග පොකුණ.

දීවර = (ධීවර) 1. මසුන් මැරීම.

දීවරයා = 1. මසුන් මරන්නා.

දීසි = 1. ඒනත් මැටි භාජන විශේෂයක්.

දු

දු =1. දුෂ්ට. 2. නින්දිත. 3. අපහසු. 4. නපුරු. 5. අභාව. 6. නොසතුටු. 7. අශෝභන. 8. ඊක. 9. අයහපත් අර්ථය ප්‍රකාශ කරන උපසර්ගයක්.

දුඃ = 1 නරක. 2. අසීරු. 3. අඩු.

දුඃඛ = 1. දුක. 2. නින්දිතවූ කිසි දෙය. 3. අප්‍රියවූ විඳීම.

දුඃඛ ආර්‍ය සත්‍යය = 1 (මේ ලෝව) දුක මිස සුවයක් නැතැයි යන ආර්‍ය සත්‍යය.

දුඃඛ ආලය = 1. දුකට නිවාසවූ.

දුඃඛ දායක = 1. දුක් ගෙන දෙන.

දුඃඛ නිරෝධ ආර්‍ය සත්‍යය = 1. දුක් නැති කිරීමට හේතුවන නිර්වාණය නමැති ආර්‍ය සත්‍යය.

දුඃඛ ජනක = 1. දුක් උපදවන.

දුඃඛ සත්‍යය = 1. (මෙ ලොව) දුකය යන සැබෑව.

දුඃඛ නිරෝධ ගාමිනී ප්‍රතිපදාර්‍ය සත්‍යය = 1. දුක් නැති කිරීමට පමුණුවන ප්‍රතිපදාව වූ ආර්‍ය අෂ්ටාංගික මාර්ගය නමැති ආර්‍ය සත්‍යය.

දුඃඛ ප්‍රබන්ධ = 1. දුක් පරපුර; දුක් පරම්පරාව.

දුඃඛ ප්‍රාප්ත = 1. දුකට පත්වූණු.

දුඃඛ සමුදය = 1. දුක් ඇති වීමට හේතුව.

දුඃඛ සමුදයාර්‍ය සත්‍යය = 1. දුක් ඇතිවීමට හේතුව වූ තෘෂ්ණාව නමැති ආර්‍ය සත්‍යය.

දුඃඛ සහගත = 1. දුක් සහිත.

දුඃඛිත = 1. දුකට පත්වූ; හටගත් දුක් ඇති. (දුක්ඛිත)

දුඃසාධ්‍ය = 1. සුවකරන්නට අමාරු. 2. කරන්නට අමාරු.

දුඃ ශීල = 1. දුසිල්; සිල් නැති.

දුක = 1. කනගාටුව. 2. අවාසනාව. 3. කිරි කැරය. 4. කරදරය. 5. දෙකේ සමූහය; ජෝඩුව; විකය.

දුකට = 1. දුෂ්කර.

දුකත = 1. වරදවා කළ. 2. නරක ලෙස කළා වූ.

දුකර = 1. කිරීමට අපහසු. 2. දුෂ්කර වූ. 3. අමාරුවූ.

දුක් = 1. ශෝකය; කනගාටුව. 2. පීඩාව.

දුක්ඛ = 1. දුක. 2. ශෝකය; කනගාටුව. 3. අප්‍රියවූ වේදනාව. 4. නින්දිතවූ කිසි දෙය.

දුක්ඛක්ඛය = 1. දුක් නැසීම; නිවණ.

දුක්ඛ නිරෝධ = 1. දුක් නැති කිරීම; නිවණ.

දුක්ඛෝපශම = 1. දුක් පහවීම.

දුක් දා = 1. දුඃඛ දායක; දුක් ගෙන දෙන.

දුක් පත් = 1. දුකට පැමිණි. 2. දිළිඳු.

දුක් පිළියම = 1. දුකට කරන ප්‍රතිකර්මය.

දුක් බතික = 1. දුකින් පිරුණු. 2. දුකින් පීඩිතවූ.

දුක් මුසු = 1. දුකින් මිශ්‍ර; දුක් සහිත.

දුක් මුළා = 1. දුක් හා හිරිගැර; දුක් කරදර.

දුක් ලකුණු = 1. දුඃඛ ලක්ෂණය.

දුක් විලාසය = 1. දුක් සහිත පෙනීම; දුඃඛ නාඩය.

දුක් සත් = (දුක් සස්) 1. දුඃඛ සත්‍යය.

දුක් හසුන් = 1. ශෝක ජනක පනිවුඩය; දුක් සහිත ලියමන.

දුකෑම = 1. දදු කැටය.

දුකි = 1 දුක් ඇති. 2. අමාරු. 3. දුප්පත්.

දුකියා = 1. දුප්පතා.

දුකු = 1. දුක.

දුකු මුහුදු = 1. දුක් සයුර; දුක් නමැති මුහුද.

දුකුල = 1. සියුම් කපු රෙදි. 2. පට රෙදි.

දුකුලාප = 1 දුක්ඛාලාපය; දුක් සහිත වචනය.

දුකුළු = 1; දුකුලය; වස්ත්‍රය.

දුකුළ = 1. දුක. 2. පීඩාව. 3. කන ඇඳුම.

දුග = 1. දුර්ගය.

දුගතිය = 1. අපාය. 2. නපුරු ගතිය.

දුගඳ = 1. දුර්ගන්ධය; නරක ගඳ.

දුග් = 1. දුක.

දුග් ගන්නා නිලමේ = 1. සිංහල රජුගේ ආව සේව කල නිලධාරියෙක්.

දුක් ගැනවිලි = 1. දුක් පුවත්. 2. දුක් කිරිගැර.

දුග්ධ = 1. නොමිදුණු කිරි.

දුගී = 1. දිළින්ද. 2. දුප්පත් කම.

දුගි = 1. දුර් ගතිය. 2. දිළිඳු.

දුගි අඳුරු = 1. දුර්ගතිය නමැති අන්ධකාරය.

දුගි සඹුරු = 1. ඉතා සුලු තැග්ග.

දුගී පුංගම = 1 දුගී බද්ද.

දුගු = 1 දුගීය; ලඟා වීමට අසීරු (කඳුකර) ස්ථානය. 2. බල කොටුව. 3 කඳු අසල පටු මඟ.

දුහුල = (දුකුල) 1. පට රෙදි 1 සියුම් කපු රෙදි.

දුච්චරිතය = 1 දුශ් චරිතය; දුසිරිත 2. නරක කල් කිරියාව 3. අවකල් කිරියාව.

දුජන = 1. දුර්ජන 2. අසත් පුරුෂ.

දුජිව්හ = 1 දිව දෙකක් ඇත්තා 2. සර්පයා.

දුජ් ජීවිත = 1. දුෂ්ට ජීවිතය; නරක ජීවිතය.

දුට = 1 (දුට්යා) 1 සතුරා 2 අසත් පුරුෂයා.

දුට = 1. දුටුවොත්. 2. දුටු කල්හි.

දුටගා = 1. නො වැදගත්.

දුටනට = 1. ඉඳ හිට. 2. කලාතුරකින්.

දුට්ඨ = 1 දුෂ්ට; නපුරු.

දුඨින් = 1. දශීතය කෙලෙන්.

දුටු = 1. දශීතය කල. 2. දක්නා ලද. 3. නපුරු. 4. දුෂ්ට.

දුටු දම් = 1. දුෂ්ට ධර්ම. 2. ඉහාත්මය පිළිබඳ; මේ ආත්මයේදී ම.

දුටුවිරි = 1. (දුටු විරු) 1. පෙරදුටු. දූක පුරුදු.

දුටු සතුටු = 1. එනම් පැලෑටිය. 2. එනම් මල් වෙසෙස.

දුටුවත් දුනිමි = 1. එකදෙයක් වේවා.

දුඩ්ඩා = 1. මහත මිනිහා.

දුන = 1. ඉපදීම. 2. පටන් ගැන්ම. 3. දුන කොට්. 4. දෙන්ට.

දුනමනා = 1. දීමට සැහෙන; දීමට සුදුසු; දිය යුතු.

දුන සුතාව = 1. දියණිය.

දුන් = 1. දෙන ලද; දුන්නාවූ. 2. උපන්. 3. හටගත්.

දුන් කබුළුව = (දුම් කබුළුව) 1. දුම් නිකුත් වීම පිණිස තබන ජනේලය. 2. දුම් පිට කරන සිදුර.

දුන් කබුද්වා = 1. එනම් කුරුල්ලා.

දුන් කුඩු = (දුම්කුඩු) 1. දුම් කොළ වලින් සැදූ (නාසයට උරන) කුඩු විශේෂයක්.

දුන් කොළ = (දුම් කොළ) 1. දුම් බීමට හා බුලත් විට කන්නට ගන්නා මත් ගතිය ඇති කොළ වර්ගයක්.

දුන් තෙල් = 1. ආහාර වශී තෙම්පරාදු කිරීමට ගන්නා තෙල් වර්ගයක්.

දුන්දුභි = 1. බෙරය. 2. දවුල. 3. වරුණ දෙවි.

දුන් දුමාර = 1 ගෙයි දුම.

දුන්න = 1. එනම් විදීමේ උපකරණය. 2. දුන්නාවූ; දෙන ලද

දුන් නිමිත්ත = 1. දුර් නිමිත්ත; අශුභ දර්ශනය; නරක නිමිත්ත.

දුන් නීත = 1. වැරදි සේ ගෙන ගිය; නපුරු සේ ගෙනූ.

දුන් ශොන් = (දුම් යොන්) 1 දුම් හටගන්නා තැන; ගින්න. 2. වලාපටලය; වලාකුල.

දුන් වත් = 1. දෙන ලද වස්තුව හෝ වස්ත්‍රඇති.

දුන් හිඳ = 1. ලංකාවේ ප්‍රසිද්ධ ඇල්ලක්.

දුනු = 1. දුන්නාවූ 2. දුන්න. 3. ඉපදීම. 4. පටන්ගැන්ම. 5. නිපුණුබව. 6. දීම. 7. දෙනලද 8 ධනු රාශිය. 9. ජාතක කල. 10 ජයගත්; දිනක ලද 11. වියත් නවයක දිග ප්‍රමාණය. 12. සිරියල්. 13. සඳරැස්.

දුනුකම් = 1. දුන්නෙන් කරන ක්‍රියාව; විදීම. 2. දුනුකාරයා.

දුනුකොපු = 1. දුන්න බහාලන කොපුව.

දුනුකරවලා = 1. එතමී සපීයා.

දුනුකාරයා = 1. දුනුකියත් කාරයා.

දුනුකියත = 1. ඉරීමේ උපකරණයක්.

දුනුකේ = 1. වැදිකේ වගීයට අයත් ගස් වගීයක්; දුනු කෙසියා.

දුනුකොළය = 1. ඔර්ලෝසු ආදියෙහි සවිකර තිබෙන වානේ පටිය.

දුනුතරාදිය = 1. තරාදි වගීයක්.

දුනුතුවක්කුව = 1 තුවක්කු ජතියක්.

දුනුකොන්ඩුව = (දුනුමල) 1 දුන්නකින් යුත් උගුල.

දුනුදිග = 1 දුන්නේ ලණුව; දුන්නේ සවිකර තිබෙන නූල

දුනුදෙව් = 1. දෙව්දුත්ත?

දුනුපසි = 1. දුන්න දමන කොපුව.

දුනුපිලාව = 1. දුන්නෙහි අග කෙළවර 2. කුඩා දුන්න.

දුනුපිඟිය = 1. තැවිය හැකි කුඩා පිඟි වගීයක්.

දුනුබල = 1. ධනුර්ධර සේනාව; දුන්නෙන් විදින යෝධ කණ්ඩායම.

දුනුමණ්ඩල = 1. දුන්නෙන් විදින භේවා කණ්ඩායම.

දුනුමිලාව = 1. ඊකොපුව.

දුනුමිටු = 1. දුන්න මැදින් ඇල්ලීම පිණිස ඇති තැන.

දුනුමුඩාව = 1 දුනු කෙළවර. 2. දුනුදිය ගැට ගසා තිබෙන කොණ.

දුනුරථය = 1. දුනු කරත්තය; තවා සවිකළ යකඩ පට්ටම් සහිත රථ විශේෂයක්.

දුනුවත = 1. පරණ රෙද්ද.

දුනුවා = (දුනුවායා) 1. දුන්නෙන් විදින්නා.

දුනුවේ = 1. ධනුර් වේදය; විදීමේ ශිල්පය. 2. දුනුවායා.

දුනුසිප් = 1. ධනුග් ශිල්පය; විදීමේ ශිල්පය.

දුනුසුක්‍රය = 1 දුන්නක් මගින් ක්‍රියා කරන උපකරණය.

දුනුසෙන් = 1. දුනුගත් සේනාව; ධනුර්ධර සේනාව.

දුනුහිය = 1. දුන්න හා ඊය.

දුණු = 1. දිරූ; ජරාවට ගිය. 2. මහල්ල.

දුණුසක් = 1. දිරූ රෙද්ද.

දුතග = 1. දුතාඞ්ග; භික්ෂූන් විසින් පිළිපැදිය යුතු ප්‍රතිපත්ති විශෙෂයක්.

දුත් = 1. ධූතීයා; සූදුව මත්පැන් බීම ආදි දුසිරිත්වල ගැලුණු තැනැත්තා 2. සොරා 3. සල්ලාලයා 4 පණිවුඩ කාරයා

දුතිය = 1. දෙවැනි.

දුතියිකා = 1. දෙවැන්නිය. 2 භාය්‍යාව.

දුතු = 1. ධූර්තයා.

දුතුරු = 1 අත්තන ගස 2. සල්ලාලයා.

දුදන = 1 දුර්ජනයා. 2. අසත්පුරුෂයා

දුද්දින = (දුර්දින) 1. අශුභ දවස. 2. නපුරු දවස. 3. වැහි අඳුරු සහිත දවස

දුදු = 1. කිරි. 2. මිදුණු කිරි.

දුදුගුබෙර = 1. බෙර වගීයක්.

දුදුරු = 1. ජර්ජර මාගීය; දිරූමඟ; අමාරු පාර. 2. කඳු අතර පාර 3. කාන්තාර පාර.

දුදුල් = 1. යාමට අමාරු (තැන)

දුදුලම = 1. යාමට අමාරු මාගීය.

දුදුල = 1. දිළිඳිම.

දුදුළු = 1. මාවත 2. කාන්තාරය. 3. චපල.

දුප = 1. සුවඳ දුම්.

දුප්පත් = 1. දිළිඳු.

දුප්පති = 1. දිළින්දා.

දුබල = 1. දුවීල.

දුබුල = 1. දුර්වල.

දුබා = 1. දෙපැත්ත. 2. පළු දෙක.

දුබික් = 1. සාගතය; දුර්භික්ෂය.

දුබුක් = 1. නොදිත් නොපැහුන. 2. පැහිගෙන එන.

දුඹුමු = 1. දුඹුරු දුමෙන් ඇතිවූ කළු කුඩු 2. දුමෙන් කළුවූ මකුළු දැල.

දුඹුරු = 1. දුම්පාට; දුඹුරු පාට.

දුඹුල් = 1. අට්ටික්කා. 2 මකුළුදැල්. 3 දුඹුළු. 4. ජරපත් මිනිසා 5. දුම.

දුඹුල් කවනවා = 1. දුම් වද්දවනවා. 2. දුම් දෙනවා.

දුඹුල්මෑම් = 1. කැටි ගැහුන දුඹුලු. 2. දුම් ගැසුණු මැට්ට.

දුඹුලුරස = 1. දුම් රස; දුඹුලු රහ.

දුඹුල්වතුර = 1. දුඹුලු වතුර.

දුඹුලා = 1. දුර්වල මහල්ලා. 2. ඔබලත් අය.

දුඹුලු රෝගය = 1. ගොයම් වලට සෑදෙන රෝගයක්.

දුම = 1. ගහ. 2. හුමාලය. 3. ගින්නෙන් පිටවී උඩ නගින දූමාරය. 4. ලිපට උඩින් තැනූ මැස්ස.

දුමග = 1. අමාරු පාර. 2. කඳු අතරවූ පාර.

දුමන = 1 දුක. 2. නපුරු හිත. 3, දුක් සහිත හිත. 4. දුම් දමන.

දුමන = 1. නපුරු අදහස. 2. තරහ හෝ වැරදි කල්පනාව.

දුමපල = 1. කොස්. 2. දෙල් ගහ. 3. කිතිහිරි.

දුමමින් = (දුමදුමා) 1. දුම් දමමින්; දුම් හරිමින්.

දුමරද = 1. බෝ ගහ.

දුමරිළු = 1. වෘක්ෂ සමූහය.

දුමස් = 1. කකුල් පතුලේ මස්වල ආබාධයක්.

දුම් = 1. හුමාලය. 2. ගින්නෙන් නගින දූමාරය. 3. ගස. 4. ගස්වගීයක්.

දුම්කවුළුව = 1. දුම් පිට කිරීමට සෑදූ සිදුර.

දුම්කවුළුවා = 1 කුරුල්ලෙක්.

දුම්කුඩු = 1. කුඩුකරන ලද දුම්කොළ. 2. නාසයට උරන දුම්කොළ කුඩු.

දුම්කෙහෙලිය = 1. වල්ගා තරුව. 2. ගින්න. 3. ගිනිදැල්ල.

දුම්කොළ = 1. දුම්බීමට ගන්නා කොළ වගීයක්; බුලත් විටට ගන්නා එකම් කොළ.

දුම්කෝව = 1. පයිප්පය.

දුම්ගහනවා = 1. දුම නගිනවා.

දුම්නලය = 1 දුම් පිට කරන දිග සිදුර.

දුම්නැව = 1. හුමාලයේ බලයෙන් දුවන නැව.

දුම්දෙනවා = 1. දුම් අල්ලනවා. 2. දුම් ගස්සනවා.

දුම් භාජනය = 1. සුවඳ දුම් ඇල්ලීමට ගන්නා බඳුනක්.

දුම්මල = 1. ගල් ආදී ගස්වල සෑදෙන මැලියම් වගීයක්. 2. ඉටි වගීයක්.

දුම්මැල්ල = 1. එනම් පැලෑටි වෙසෙස.

දුම්යොන් = 1. දුම් උපදින තැන; ගින්න. 2. මේඝය. 3. වලාකුල.

දුම්රිය = 1. දුමේ බලයෙන් යන රථය.

දුම්වක් = 1. දුම් ඇකී.

දුම්වද්දනවා = 1. දුම් ගහනවා.

දුම්වණ් = 1. දුම්පාට.

දුම්වැට = 1. සුරුට්ටු ආදියෙන් නගින දුම්. 2. සුරුට්ටු ආදිය.

දුම්සිළු = 1. ලහාවෙන්නට අමාරු. 2. තරක. 3 අවාසනාවන්ත. 4. දුම්දැල්ල.

දුමාරය = 1. දුම. 2. හුමාලය.

දුම්ඳු = 1. බෝගස.

දූර = 1. ධුරය. 2. නිලය. 3. ඈත.

දූරකතර = 1. ඈත. 2. වියගස.

දූරකබා = 1. කල් ඇතිව. 2. ඈත බලා.

දූරදිශ = 1. කරුනක ගොඳ තරක. 2. ඈත.

දූරදිශ බලා = 1. ඈත ගැන කල්පනා කොට; අනාගතය බලා

දූරදීම = 1. ඈතදීම.

දූරධිගම = 1. පත්වීමට හෝ ලබා ගැනීමට අමාරු. 2. තේරුම් ගැනීමට අමාරු.

දූරානු බෝධ = 1. තේරුම් ගැනීමට අපහසුවූ.

දූරණත මෝහ = 1. ඉතා මෝඩ.

දූර ප්‍රමාණය = 1. දුරවූ තරම.

දූර බැහැර = 1. ඈත. 2. පිට පළාතක වූ. 3. ඉතා ඈත.

දූරයා = 1. දෙලා අදින්නන්ගේ ප්‍රධානයා. 2 කුල විශේෂයකට අයත් තැනැත්තෙක්. 3. තණ කපන්නා?

දූරලනවා = 1 අත් හරිනවා. 2. ඉවත් කරනවා. 3. අහක දමනවා.

දූරලූ – 1. දුරු කරන ලද.

දූරවබෝධ = 1. තේරුම් ගැනීමට අමාරු.

දූරතර = 1. දුරවූ. 2. බොහෝ දුරවූ.

දුර් = 1 නරක. 2. අඩු. 3. අපහසු. 4. ඈත

දුර්ග = 1. ලඟා වෙන්නට අපහසු. 2. අසුරයකුගේ නමක්. 3. බල කොටුව. 4. ප්‍රපාතය.

දුර්ගන්ධ = 1. නරක ගඳ ඇති.

දුර්ගත = 1. දුප්පත්. 2. හිරිහැර ඇති වූ. 3. දිළින්දා.

දුර්ගති = 1. නරක ගති ඇති. 2. විපත. 3. සතර අපාය.

දුර්ගම = 1. පහුකර යෑමට අපහසුවූ. 2 ළඟට යන්නට අපහසුවූ.

දුර්ග මාර්ගය = 1. කඳු පාර. 2. කඳු අතරින් යන පාර

දුර්ගය = 1 බලකොටුව. 2. අමාරු පාර. 3. යන්නට අමාරු තැන.

දුර්ග සංචාරය = 1. කඳු අතර පටු පාරකින් යෑම.

දුර්ගස්ථානය = 1. යෑමට අමාරු තැන.

දුර්ගා = 1. සිව දෙවියාගේ භාර්යාව; උමයාංගනාව.

දුර්ගාවරෝධය = 1. වටලා ගැනීම.

දුර්ඝට = 1. දුෂ්කර. 2. නො ගැළපිය හැකි

දුර්ජන = 1. නපුරු. 2. දුෂ්ටවූ මනුෂ්‍යයා.

දුර්ජය = 1. දිනිය නොහැකි.

දුර්ජාති = 1 නීච උත්පත්තිය. 2. නරක ජාතිය.

දුර්ඥාන = 1. වැරදි නුවණ. 2. නපුරු සිතුම.

දුර්නය (දුර් නීතිය) 1. නරක නීතිය. 2. අනඩුව. 3. අසාධාරණ.

දුර්නාම = 1. අර්ශස් රෝගය.

දුර්නාමාඛා = 1. ආඳා.

දුර් නීතිය = 1. අයුතු කම. 2. අනඩුව. 3. නපුරු නීතිය. 4. අයුක්තිය.

දුර්දිම = 1. කෝලාහලය. 2. හීලෑ කිරීමට නුපුළුවන්.

දුර්දම්‍ය = 1. දමනය කරන්නට අමාරු.

දුර්දර්ශ = 1. බලන්නට අපහසුවූ. 2. ඇස් අඳිකාර කරවන.

දුර්දශාව = 1. නපුරු අවස්ථාව. 2. නරක කාලය. 3. අපල කාලය.

දුර්දර්ශක = 1. ඇස් පෙනීම අඩු. 2. නපුරු බැල්මක් ඇති.

දුර්දර්ශන = 1. අවලක්ෂණ. 2. හොඳට නො පෙනෙන.

දුර්දාන්ත = 1. හීලෑ නොකළ හැකි. 2 හීකරු කිරීමට නුපුළුවන්; නොහික්මුණු.

දුර්දින = 1. නරක දවස. 2. වලාකුළෙන් ගැවසී ගත් දිනය.

දුර්ද්‍රාව්‍ය = 1. උණු කිරීමට හෝ දිය කිරීමට අපහසුවූ.

දුර්ධර = 1. කඩන්නට නුපුළුවන්. 2. උසුලන්නට අමාරු.

දුර්ධී = 1 උඩඟු.

දුර්බල = 1. බලහීන. 2. දුබල; ශක්තිය නැති.

දුර්බුද්ධි = 1. මෝඩ. 2. නරක නුවණ.

දුර්බෝධ = 1. තේරුම් ගන්නට අමාරු.

දුර්භග = 1. අවාසනාවන්ත. 2. පින් නැති; කාලකණ්ණි. 3. දිළිඳු.

දුර්භර = 1. පෝෂණය කට නොහැකි. 2. බර පතළ. 3. ඉසිලිය නොහැකි.

දුර් භාග්‍ය = 1. අවාසනාව. 2. පාපය.

දුර්භාෂිත = 1. නරක ලෙස කියන ලද. 2. නරක භාෂාව කියූ.

දුර්භික්ෂය = 1. ආහාර නැති කාලය. 2. සාගතය.

දුර්මතය = 1. දුෂ්ට කල්පනාව. 2. වැරදි අදහස.

දුර්මනා = 1. හිතට හිරිහැර ඇතිවූ. 2. කනගාටු සහිත. 3. අමනාපවූ.

දුර්මාර්ග = 1. නරක පාර. 2. අමාරු පාර.

දුර්මුඛ = 1. නරක කටක් ඇති. 2. රවා බලන්නාවූ. 3. නොසතුටු මුහුණක් ඇති.

දුර්මුඛයා = 1. වඳුරන්ගේ ප්‍රධානයා. 2. නාගයා. 3. අශ්වයා.

දුර්මේධස් = 1. නුවණ නැත්තා. 2. මෝඩයා.

දුර්මෝචනීය = 1. මුදන්නට අමාරු.

දුර්යෝධන = 1. කෞරව වංශික කුමාරයෙක්.

දුර්ලබ්ධි = 1. වැරදි ඇදහීම ඇති. 2. මිථ්‍යා දෘෂ්ටික.

දුලීන = 1. ලබා ගැනීමට අපහසු.

දුර්ලභ දර්ශන = 1. කලාතුරකින් දක්නට ලැබෙන.

දුර් ලලිත = 1. අවලස්සණ; කැත. 2. අයහපත් ක්‍රියා ඇති.

දුර් වච = 1. අකීකරු. 2. නපුරු වචන ඇති.

දුර් වචන = 1. නරක වචන.

දුර් වර්ණ = 1. නරක පැහැය. 2. අවලක්ෂණ. 3. සායම් ගිය.

දුර්වල = 1. දුර්බල; ශක්තිය නැති.

දුර්වලී කරණ = 1. දුබල කරන.

දුර්විසහ = 1. දරිය නොහැකිවූ.

දුර්වාචය = 1. අපහාස කිරීම. 2. නරක භාෂාව.

දුර්වාර - දුර්වාරණ = 1. වලක්වන්නට නුපුළුවන්.

දුර්වාරමේඝ = 1. වැහි කළු ඇති දවසේ වලාකුළු.

දුර්වාසා = 1. සෘෂි වරයෙක්.

දුර්විඥෙය = 1. දැනගත නොහැකි.

දුර් විනීත = 1. නොහික්මුණු.

දුර්හෘදය = 1. නපුරුවූ හිත. 2. සතුරා.

දුරාක්‍රම = 1. ලඟාවීමට අපහසු. 2. ලබා ගැනීමට අපහසු.

දුරාගත = 1. නපුරු කොට පැමිණෙන ලද.

දුරාභ = 1. කුරුඳු දෙපාර්තමේන්තුවේ නිලධාරියෙක්.

දුරාචාර = 1. අශීලාචාර. 2. නපුරු හැසිරීම. 2. දූෂිත පැවැත්ම.

දුරාත්ම = 1. නපුරු සිත් ඇත්තා.

දුරාලභ = 1. කහඹිලියා.

දුරාලාප = 1. නපුරු වචන කීම.

දුරාවේ = 1. දුරාවේ කුලයේ අය.

දුර්වාවර් = 1. දුරින් දුර. 2. කලාතුරකින්. 3. අහම්බෙන්. 4. කලකට පසු

දුරාසද = 1. ඉවසිය නොහැකි. 2. ලබා ගැනීමට අපහසු

දුරීර = 1. අන් නැරියාවූ.

දුරීක්ෂණාව = 1. ඇස් වන.

දුරින් = 1. ඈතින්.

දුරිත = 1. අකුසල්. 2, අයහපත.

දුරු = 1. කුඩා ඇට වර්ගයක්. 2. පොළව. 2 කාන්තාව, 4. පවීතය. 5. ලඟ නොවන; ඈත.

දුරුකතර = 1. කාන්තාරය. 2. අමාරු පාර. 3. දුර්ගම මාර්ගය.

දුරු කරනවා = 1. අත් කරනවා. 2. පන්නා හරිනවා. 3. විසි කරනවා.

දුරුණු = 1. මහල්ලා.

දුරුත්ත = 1. චන්ද්‍ර මාසයක නමක්.

දුරුත්තර = 1. උත්තර දෙන්නට නුපුළුවන්වූ. 2. පසුකර යන්ට නුපුළුවන් වූ.

දුරුදු = 1. හේමන්ත සෘතුව; ශීත කාලය.

දුරු නෑ = 1. ඈත නෑයා.

දුරුපචාර = 1. සුව කරන්ට අපහසුවූ. 2. හසුරුවන්ට අමාරු.

දුරුපස්ථාන = 1. ලඟාවිය නොහැකි.

දුරුවා = 1. ද්‍යූත-දූත. 2. අත් දෙක එකතු කර වැඳීම.

දුරුපචාර = 1. නපුරු ආශ්‍රය.

දුරෝදරශ = 1. සූදු කෙළින

දුල = (දුල්, දුලු) 1. දිලිසෙන. 2. ජ්වලිත.

දුලද = 1. වැරදි ඇදහීමෙන් යුත්. 2. වැරදි ඇදහීම; මිථ්‍යා දෘෂ්ටිය.

දුලදුලා = 1. බබලමින්.

දුලනා = 1. බබලන.

දුල්ලභ = 1. ලබා ගැනීමට අපහසු; දුර්ලභ.

දුලු = 1. බැබළීම. 2. බැබළුණු.

දුලු = (දුළුල්) 1. නලප්පාව; ජටාව.

දුළුලු = 1. ජටිලයන්. 2. ගෙතූ හිස කෙස්; හැඩ පලු.

දුව = 1 දුහිතෘව 2 ධ්‍රැවය 3. ධ්‍රැව තාරකාව. 4. අශ්ව ශරීරයෙහි තිබෙන ලොම් සුළි. 5 ඒකාන්ත. 6. දෙක.

දුවක = 1. පූජක බමුණා.

දුවඟ = 1. ධුතාංගය.

දුවනවා = 1. වේගයෙන් යනවා; ධාවනය කරනවා.

දුවන් = 1. ඉකිළිය. 2. උකුළ; ජඝනය.

දුවණ = 1. නරක පාට ඇති. 2. දිවීම කරන. 3. පාටගිය. 4. උකුල. 5. පිදී.

දුවණි = 1. ගැනු දරුවා.

දුවත් = 1. අමාරු පාර.

දුවද = 1. අපහාස කිරීම. 2. දුෂ්ට කථාව.

දුසවහන් = 1. අයහපත් ලකුණු.

දුසස් = 1. නරක ගොයම.

දුස් = 1. දුක. 2. නින්දාව. 3. නපුරු.

දුස්කම = 1. පාපය; අකුසල.

දුස්සංස්ථානය = 1. නරක ගෙදුම. 2. නරක හැඩහුරුකම.

දුස්සාධ්‍ය = 1. සුවකිරීමට අපහසු.

දුස්සීල = 1 ශීලයක් නැති. 2. නපුරු ගති-ගුණ ඇති.

දුසිත = 1. නරක සිත් ඇති 2. නරක සිත.

දුසිම = 1 දොළහ; දොළහේ ගොඩ.

දුසිරි = (දුසිරිත) 1. නරක චාරිත්‍රය. 2. දුශ්චරිතය.

දුශ් = 1. කරන්නට අපහසු 2. නරක බව හඳුන්වන.

දුශ්චර = 1. දුගී මාගීය.

දුශ්චරිත = 1. නරක හැසිරීම.

දුශ්ශබ්දය = 1. අමිහිරි හඬ. 2. වැරදි පදය. 3. නරක හඬ.

දුශ්ශීලය = 1. දුෂ්ට ක්‍රියාව. 2. අවකල් ක්‍රියාව. සිල් නැති බව.

දුෂ්කර = 1. අමාරු.

දුෂ්කර ක්‍රියාව = 1. කරන්නට අමාරු ක්‍රියාව.

දුෂ්කරාශ්වාසය = 1. අමාරුවෙන් හුසම ගැනීම.

දුෂ්කුලීන = 1. අඩුජාතියේ වූ.

දුෂ්ඛ්‍යාත = 1. නරක ලෙස කරන ලද.

දුෂ්ක්‍රම = 1. හොඳ පිළිවෙලක් නැති. 2. ලඟාවීමට අපහසු.

දුෂ්ට = 1. නපුරු. 2. අනාචාර.

දුෂ්ටක්ෂණ = 1. පින්කළ නොහැකි අයහපත් කාලය.

දුෂ්ට ප්‍රකෘතිකය = 1. දුෂ්ට ගතිය.

දුෂ්ටමති = 1. නපුරු සිත් ඇති.

දුෂ්ටාත්මජ = 1. නපුරු පුතා.

දුෂ්ටාත්මය = 1. නපුරු ආත්මය.

දුෂ්ටාව = 1. නපුරු ස්ත්‍රී. 2. වේශ්‍යාව.

දුෂ්ට ව්‍රණ = 1. ඔඩු දිවූ වණය.

දුෂ්ත්‍රිත = 1. අලාභයට ගත්. 2. අලාභ වැඩි.

දුෂ්පථ = 1 නරක මඟ.

දුෂ්පූර = 1. පිරවීමට නුපුළුවන්. 2. තෘප්තකළ නොහැකි.

දුෂ්ප්‍රතිපත්ති = 1. වැරදි ප්‍රතිපත්තිය.

දුෂ්ප්‍රතිවේධ = 1. තේරුම් ගැනීමට අපහසු. 2. අවබෝධ කරන්නට අමාරු.

දුෂ්ප්‍රාඥ = 1. නුවණ නැති.

දුෂ් ප්‍රවෘත්ති = 1. නරක පැවැත්ම.

දුෂ් ප්‍රදර්ශකයා = 1. වැරදි ලෙස තේරුම් කරන්නා.

දුෂ්ප්‍රමාණ = 1. නිසි ප්‍රමාණයක් නැති.

දුෂ්ප්‍රයුක්ත = 1. පිළිවෙළ හොඳ නැති. 2. අයුතු.

දුෂ්ප්‍රයෝගය = 1. නුසුදුසු යෙදීම.

දුහද = 1. නපුරු සිතක් ඇති. 2. සතුරා.

දුහදයා = 1. නපුරා. 2. සතුරා.

දුහිතු = 1. දුහිතා; දුව.

දුහිතෘ = 1. දුව.

දුහු = 1. දුරුකළ. 2. වංචල. 3. වංචා කළ.

දුහුනා = 1. අළුතෙන් ඉගෙන ගන්නා අය.

දුහුඳු = 1. ගස් වර්ගයක්. 2. තෙල් වර්ගයක්. 3. සතුරු.

දුහුල් = 1. සියුම් රෙදි වර්ගයක්.

දුහුලි = 1. දූවිලි.

දූ

දූ = 1. දුව. 2. දදු කැටය. 3. දූතයා. 4. දූපත. 5. වවුලා.

දූපෙනි = 1. දුම් පෙනෙහි ඉත්තා.

දූ කැටය = 1. දදු කැටය.

දූකෙළිය = 1. සුදු කෙළිය. 2. ගංගා දෙකක සන්ධිය. 3. දදු ක්‍රීඩාව.

දූගල = 1. අත්ගල.

දූන්තෙල් = 1. මී කිරෙන් ලබා ගත් තෙල්. 2 තෙම්පරාදුවට ගන්නා තෙල්. 3. දුම්-තෙල්.

දූතයා = 1. පණිවුඩ කාරයා.

දූත ලක්ෂණ = 1 පණිවුඩකාරයා බලා ඔහු ආ කරුණ ගැන දත ගැනීම.

දූතවාක්‍ය = 1. පණිවුඩය.

දූත කාව්‍යය = 1. දූතයකු අත යවන කාව්‍යමය සන්දේශය.

දූ දරුවෝ = 1. දූ පුතුන්.

දූදු = 1. හතුරා. 2. වැල් වගීයක්. 3. තෙල් වගීයක්. 4. ජූජක බමුණා. 5. කිරි.

දූපත් = 1. දිවයින; ජලයෙන් වටවූ ගොඩබිම.

දූ පෝරුව = 1. දුම් ලෑල්ල; දූ කෙළිය කරන ලෑල්ල.

දූම = 1. විශාල වෘක්ෂය.

දූර = 1. ඈත; දුර.

දූරතර = 1. ඉතාදුර.

දූ රුවන් = 1. දුහිතෘ රත්නය; ශ්‍රේෂ්ඨ දුව.

දූරග = 1 දුර යන.

දූරතාව = 1. දුර.

දූර දර්ශක = 1. දුර පෙනෙන.

දූර දර්ශන ශාස්ත්‍රය = 1. දුර පෙනෙන දෙය ඇඳීමට උගන්වන ශිල්පය.

දූර දර්ශී = 1. දුර දකින. 2. කල්පනාකාර.

දූර දර්ශියා = 1. දුර දකින්නා. 2. ගිජු ලිහිණියා.

දූර දෘෂ්ටියා = 1 ගිජුලිහිණියා.

දූරමානක ශාස්ත්‍රය = 1. දුර මැනීමේ ශාස්ත්‍රය.

දූරස්ථ = 1. දුර. 2. දුරින් පිහිටි. 3. දුරස්තර.

දූරශබ්දන = 1. දුරසිට කරන ශබ්දය ඇසෙන.

දූරාතිදූර = 1. බොහෝ දුර.

දූරීකරණය = 1. පහකිරීම. 2. දුරු කිරීම.

දූරීභූත = 1 ඈත්වූ; දුරවූ

දූරේනිදානය = 1. බුදු බව පැතූ දින සිට බුදු බව ලැබීමට උපදින ආත්මය දක්වා.

දූල් = 1. කෙඳි සහිත පැලෑටි වගීයක්. 2. ඉතා සියුම්.

ධූලි = 1. දූවිලි.

දූව = 1. කුඩා දූපත.

දූවිලි = 1. දූවිල්ල. (රජස්)

දූෂක = දූෂණය කරන.

දූෂණ = 1. දෝෂය. 2. කිළුට. 3. අපවිත්‍ර කිරීම; නරක් කිරීම.

දූෂාකියනවා = 1. කෝලම් කියනවා.

දූෂ්මාණ = (දුසමාන) 1. සැක සහිත.

දූෂමාන ආරංචිය = 1. කටින් - කට එන සැක සහිත ආරංචිය. 2. අස්ථිර.

දූසාව = 1 නරක ගතිය. 2. කෝලම. 3. බොරු වරද තැබීම.

දූසිර = 1. වරද.

දූෂක = 1. නැක. 2. නරකයයි ප්‍රසිද්ධ.

දූෂනය = 1. අපරාධය. 2. අපවිත්‍ර කිරීම.

දූෂා = 1. බොරු දෙය. 2. කෝලම.

දූෂිකාව = 1. සෙම. 2. කබ. 3. තෙල්ල.

දූෂිත = 1. අපහාස කරනලද. 2. කිලුටුවූ 3. අශෝභන 3. නින්දිත. 5 දූෂ්‍ය කරන ලද.

දූෂ්‍ය = 1. නැත. 2. අපිරිසිදු; අපවිත්‍ර.

දූෂ්‍යය = 1. රෙද්ද. 2 නාඩාරම. 3. ඇතාගේ බඳ පටිය.

දෘ

දෘක් = (දෘග්) 1. පෙණෙන්නට පුළුවන්වූ.

දෘඪ = 1. දැඩි.

දෘඪග්‍රහණ = 1. දැඩිලෙස ගැනීම.

දෘඪතර = 1. ඉතා දැඩි.

දෘඪතරු = 1. සන ලී ඇති ගස.

දෘඪතාව = 1. දැඩිබව; දැඩිකම.

දෘඪදංශකා = 1. තද දත් ඇත්තා. 2. මෝරා.

දෘඪඵල = (දෘඪඵල) 1. පොල්; පොල්ගෙඩි.

දෘඪභක්ති = 1. තද භජනය. 2. දැඩි ඇල්ම.

දෘඪමිත්‍ර = 1. තද යහළුවා.

දෘඪසන්ධි = 1. තද ලෙස බැඳීම.

දෘඪාංග = 1. ශක්තිමත් ශරීරයක් ඇති.

දෘඪොත්සාහය = 1. තද උත්සාහය.

දෘශ්‍යමාන = 1. පෙණෙන.

දෘශ්‍යකාව්‍යය = 1. නාට්‍ය කවි කථාන්තරය. 2. නාට්‍යය; නාටකය.

දෘෂ්ට = 1. පෙනෙන. 2. දක්නා ලද.

දෘෂ්ට අනුගත = 1. දුටු දෙය අනුව යන.

දෘෂ්ටකූටය = 1. තේරවිල්ල.

දෘෂ්ටධර්ම = 1. දක්නා ලද ධර්මය (ඇත්ත) 2. ඉහාත්මය.

දෘෂ්ටගතික = 1. වැරදි ඇදහිලි ඇති. 2. මිථ්‍යා විශ්වාස ඇති.

දෘෂ්ටධර්මීය = 1. මේ ජීවිත කාලයේම විපාක පෙනීම. 2. ඉහාත්මයේදීම විපාක ගෙන දෙන.

දෘෂ්ටධර්මවේදනීයකර්ම = 1. මේ ජාතියේම විපාක දෙන කර්ම.

දෘෂ්ටධාර්මික සාම්පරායික = 1 මෙලොව පරලොව දෙකෙහිවූ.

දෘෂ්ටාන්තය = 1. උදාහරණය. 2. උපමාව. 3. ශාස්ත්‍රය.

දෘෂ්ටි = 1. පෙනීමට අයිති. 2. දැකීම. 3. ඇදහීම. 4. ඇස. 5. විශ්වාසය.

දෘෂ්ටිබිඹ = 1. දෘෂ්ටිය නැමති ඈබ පහර.

දෘෂ්ටිකෝණය = 1. පෙනෙන ප්‍රමාණයෙන් සෑදෙන කෝන.

දෘෂ්ටිගතික = 1. දෘෂ්ටිය අනුව ගිය.

දෘෂ්ටිගෝචර = 1. ඇසට පෙනෙන දෙය.

දෘෂ්ටිෂම්කාව = 1 ඇස් ගුලියට පස්සෙන් තිබෙන පෙනීමට උපකාරවන කොටස.

දෘෂ්ටිජාලය = 1. වැරදි ඇදහීම් නමැති දැල.

දෘෂ්ටිපාතය = 1. ඉක්මන් බැල්මක්.

දෘෂ්ටි මණ්ඩල චක්‍රය = 1. තල චක්‍රය; ක්ෂිතිජය.

දෘෂ්ටිමණ්ඩලය = 1. පෙනෙන ප්‍රමාණය. 2. කඳු ගස්කොළන් ආදිය පෙනෙන ප්‍රමාණය.

දෘෂ්ටිය = 1. දැකීම. 2. පෙනුම. 3. මතය. 4. ඇදහිල්ල.

දෘෂ්ටිවිෂ = 1. දැකීම පමණකින් විෂ ඇති කරන සර්ප වර්ගයක්.

දෘෂ්ටිශාස්ත්‍රය = 1. පෙනීම ගැන ශාස්ත්‍රය.

දෘෂ්ටීන්ද්‍රිය = 1 ඇස.

දෘෂ්ට්‍යනුගතික = 1. පෙනීමේ ආකාර. 2. වැරදි විශ්වාසය.

දෘෂ්ට්‍යාශ්‍රවය = 1. දැකීමෙන් ලබන ආශාව. 2. බැල්මෙන් ඇතිවූ තපුර. 3. වැරදි විශ්වාසය.

දෙ

දෙ = 1. දෙක.

දෙඅග්‍රශ්‍රාවකවෝ = 1. බුදුරජුන්ගේ ප්‍රධාන ගෝලයන් දෙදෙනා. 2. සැරියුත් මුගලන් දෙදෙනා වහන්සේ.

දෙඅත = 1. අත්දෙක. 2. දෙපැත්ත.

දෙඇල = 1. දකුණු පැත්ත සහ වම් පැත්ත; දෑල.

දෙ ඇස්බෙර = 1. දෙමුහුණතක් ඇති බෙරය.

දෙක = 1. එකත් - එකත් එකතු කළවිට ලැබෙන ගණන.

දෙකටු කරඹු = 1. කටුකරඹු දෙවර්ගය.

දෙකණ = (දෙකන්) 1. කන් දෙක. 2. කොන් දෙක.

දෙඛෂා = 1. කහ ජාති දෙක; කහ හා වදකහ.

දෙකොල = 1. කොන් දෙක.

දෙකෙලිස = 1. ගංගා දෙකක් එකතුවන ස්ථානය.

දෙකොලින් = 1. කට දෙකොනින්.

දෙකොණ විලක්කුව = 1. තැට්ටුවං කට දෙපසේම පත්දම් ගසා ගැනීම.

දෙගල් = 1. ගල් මද ගල් තහර යන දෙක.

දෙගල්ලස්ස = 1. ගල් දෙකක් අතර.

දෙගුණ = 1. එක සමාන ප්‍රමාණ දෙකක්වූ

දෙගුරු = 1. දෙමාපියන්.

දෙගිඩියාව = 1. තීරණයක් නැති බව.

දෙගෙන්මැද = 1. ගෙවල් දෙක මැද'

දෙගොඩ = 1. ගං ඉවුරු දෙක. 2. ගොඩවල් දෙක.

දෙගොඩහරි වයස = 1. මධ්‍යම ප්‍රමාණයේ වයස. (අවුරුදු පණහක් විතර ඇති.)

දෙගොමුව = 1. ගංගා දෙකක් එකතුවන තැන.

දෙගොල්ලා = 1. පක්ෂ දෙක. 2. දෙ පිරිස.

දෙට = 1. තැනතක නමක්. 2. මාළුවෙකුගේ නමක්.

දෙටු = 1. ප්‍රධාන. 2. වැඩි මහල්. 3. ජ්‍යෙෂ්ඨ.

දෙටුඅතවැසි = 1. ප්‍රධාන ශිෂ්‍යයා.

දෙටුපුත් = 1. වැඩි මහල් පුතා.

දෙට්ටා = 1. මාළු වර්ගයක්; දෙට මාළු.

දෙටුනා = 1. නායකයා. 2. ප්‍රධානයා.

දෙටුබෑ = 1. වැඩි මහල් සහෝදරයා.

දෙටුවන් = 1. වැඩි මහල්ලන්; ජ්‍යෙෂ්ඨයන්.

දෙඩ = 1. ප්‍රධාන. 2. දෙට තැනත.

දෙඩීම = (දෙඩුම) 1. නිෂ්ඵල කථාව; අර්ථයක් නැති කථාව.

දෙඩුබා = 1. දිග බරියා.

දෙණ = 1. ගැණු සතා. 2. මනුෂ්‍යයක්. 3. දෙන්නාවූ. 4. මිනී මැස්ස.

දෙනට = 1. තැනකක්.

දෙනඩා = 1. දකශ කරනවා. 2. දීම.

දෙන්නා = 1. දෙදෙනා.

දෙනා = 1. මිනිසුන්. 2. යම් කෙනෙක්.

දෙනානාකය = 1. ජේතවන නිකාය.

දෙනිකෙඩක් = 1. රස්රන් කලන් දෙකක බර; බර ප්‍රමාණයක්.

දෙනුවක් = 1. දීම කිරීමට.

දෙනෙක් = 1. දූතයක්. 2. ගැනු සතා. 3. සමූහය.

දෙනෙනා = 1 ජන සමූහය. 2. මිනිස් ජාතිය.

දෙනෝ = 1. ජයගත. 2. උපදී. 3. උපමාව.

දෙණිය = 1. කැම ඔරුව. 2. නාන බාල්දිය. 3. සමතලා ඉඩම.

දෙණිකඩ = 1. පාතාලය. 2. සමතලා ඉඩම.

දෙත = 1. දෙන කල්හි.

දෙතන = 1. තන්දෙක. (පයෝධර වය)

දෙතා = 1. මහත්.

දෙතිස් = 1. තිස් දෙක.

දෙතිස්කථා = 1. වැලකිය යුතු කථා තිස්දෙක; රාජ කථා, චෝර කථා ආදී කථා දෙතිස.

දෙතිස් කම්කාටෙලු = 1. වද තිස්දෙක.

දෙතිස් කුණප = 1. ශරීරයේ කුනප තිස්දෙක.

දෙතිස් ලකුණු = 1. දෙතිස් මහ පුරිස් ලකුණු.

දෙතෙල් = 1. ගිතෙල් හා මීතෙල් යන දෙක.

දෙදත = 1. දත දෙක.

දෙදරනා = 1. පැලෙන. 2. පුපුරන. 3 සෙලවෙන.

දෙදිය = 1. දිය දෙක. 2. අළුත් වතුර හා මුහුදු වතුර.

දෙදිවි = 1. දිව දෙකක් ඇති. 2. සර්පයා.

දෙදුමා = 1. දුව හා මව ද යන දෙදෙන. 2. කුඩා ගෙබිය හා මහ ගෙබිය.

දෙදරුමා = 1. දරුවන් දෙදෙනකු ගේ මව; දෙවරක් වැදූ ස්ත්‍රිය.

දෙදුඹාඩ = 1. බඳ ගෙඩි දෙක. 2. තරුණ මහළු දෙදෙන.

දෙදුරා = 1. මැඩියා.

දෙදුරු = 1. හුදුදුරු කළුදුරු යන දෙවර්ගය. 2 දුරු දෙවර්ගය.

දෙදෙක් = 1. කොඩිය; ධජයක්.

දෙදෙනාම = 1. දෙන්නාම.

දෙදෙලෙන = 1 දුන.

දෙදෙව්ලොව = 1. දිව්‍ය ලෝක දෙක. 2. චාතුර් මහා රාජිකය හා ත්‍රායස්ත්‍රිංශද් යන දිව්‍ය ලෝක දෙක.

දෙපංගුකරනවා = 1. දෙගුණ කරනවා. 2. දෙකට බෙදනවා.

දෙපට = 1. පට දෙක. 2; (මුතු ආදී) වැල් දෙක.

දෙපට සිවුර = 1. පටවල් දෙකක් ඇති අඳිනා සිවුර.

දෙපණස = 1. පණස් දෙක.

දෙපත් = 1. දෙපැත්තක් ඇති.

දෙපත්නායා = 1. ගජියන් වර්ගයක්.

දෙපත්කපාවැස්ස = 1. පාරේ දෙපැත්තේ (අගල් දෙක) උතුරා යන වැස්ස.

දෙපදය = 1 පද දෙක. 2. පාද දෙක.

දෙපළු = 1. පළු දෙකක් ඇති.

දෙපළුකරනවා = 1. දෙකට කපනවා. 2. පළු දෙකකට වෙන්කරනවා.

දෙපස = 1. දෙපැත්ත. 2. දෙ පිරිස. 3. පස් වර්ග දෙක.

දෙපාඇල = 1. කුඹුරක පස්කඩු දෙකක් අතරින් ගලන දිය පාර.

දෙපාකීමෙන්තුව = 1. නිලධාරියකු යටතේ ආණ්ඩුවේ කටයුතු කිරීමට වෙන්කර තිබෙන කොටස.

දෙපාදෙ සරොම = 1. දෙමුට්ටු සරොම

දෙපාර්ශවය = 1. පක්ෂ දෙක.

දෙපාව = (දෙපා වේල්ල) 1 කුඹුරක දිය පාරක් දෙපැත්තේ ඇති පස් කඩු දෙක.

දෙපැත්ත = 1. දෙපාර්ශ්වය; පැති දෙක. 2. කණ්ඩායම් දෙක.

දෙපිට = 1. හොඳපිට හා කනපිට. 2. දෙපැත්ත.

දෙපිට කපනවා = 1. දෙ පැත්ත මට්ටම් කරනවා. 2. දෙපැත්තෙන්ම ප්‍රයෝජන ගන්නවා.

දෙපිල = 1. පක්ෂ දෙක. 2. ක්‍රීඩාවෙහි යෙදුණු දෙ පැත්තක්.

දෙපුටුප = 1. පුව පුටුප උත්‍ර පුටුප යන නැකැත් දෙක.

දෙපුතු පිය = 1. පියා හා පුතා ද යන දෙදෙන.

දෙපෝය = 1. පෝය දවස් දෙක (පසළොස්වක හා අමාවක.)

දෙබටු = 1. බටු දෙවර්ගය; එළබටු හා කටුවැල්බටු

දෙබර = 1. මසන්. 2. එනම් මැසි වෙසෙස.

දෙබරය = 1. දෙබරුන්ගේ කූඩුව.

දෙබරල = 1. කිසි දෙය. 2. නිසරු දෙය.

දෙබරා = 1. මී මැසි වර්ගයේ සතෙක්.

දෙබල = 1. ගසක අතු දෙකක් එක් වූ ස්ථානය; කරුව.

දෙබස = 1. දෙදෙනෙකු අතර කථාව. 2 භාෂා දෙක. 3. සැබෑ, බොරු වචන දෙක.

දෙබැම = 1. ඇස් බැම දෙක.

දෙබෑ = 1. දෙපංගුවකින් යුත්. 2. දෙබෑයෝ (සොහොයුරු දෙදෙන.)

දෙබෑවුම = 1. දෙපැත්තට බෑවුම. 2. බෑවුම් දෙක.

දෙබිඩි ගෙඩි = 1. එකට සම්බන්ධ වූ ගෙඩි.

දෙබිඩි දරු = 1. එකට යා වූ දරු.

දෙබිගින්නා = 1. මවගේ සහෝදරී.

දෙබිගින්නෝ = 1. සහෝදර සහෝදරියක්.

දෙබිගිනි = 1. එක මවගේම දූවරු දෙදෙන. 2. අඹු සැමි දෙදෙන.

දෙබුඹු = 1. සොල්දර තට්ටු දෙක; දෙ මහල්.

දෙබෙරා = 1. දෙකට බෙදූ. 2. එනම් මැස්සා.

දෙබේ = 1. පංගු දෙක. 2. දෙකට බෙදීම.

දෙමංසල = 1. දෙමංසන්ධිය; පාරවල් දෙකක් එකතු වෙන ස්ථානය.

දෙමට = 1. එනම් ගස් වර්ගය.

දෙමයිල් = 1 මාමා හා බෑනා යන දෙදෙනා. 2. නැන්දම්මා හා මාමන්ඩි;

දෙමලිච්චා = 1. එනම් කුරුල්ලා.

දෙමවුපියෝ = (දෙමා පියෝ) 1. මවු පිය දෙදෙන.

දෙමහල් = 1. මහල් (සොල්දර තට්ටු) දෙක කින් යුත්.

දෙමහල්ලෝ = 1. වැඩිමහල් ජෝඩුව. 2. ස්ත්‍රී පුරුෂ දෙදෙනා.

දෙමළ = 1. ද්‍රවිඩ ජාතියට අයිති.

දෙමුණුබුරා = 1. මුණුබුරාගේ පුතා.

දෙමුවහත් = 1. පැති දෙකම මුවහත්.

දෙමුසුන් = 1. ජාති දෙකක් මිශ්‍ර වූ.

දෙමෝද = 1. අසමෝදගම්; කොරායාජි යන දෙවගීය.

දෙස = 1. යමක්. 2. යම් කරුණක්.

දෙසාකාර = 1. දෙවගීයක. 2. දෙවිදියක් වූ.

දෙසඳර = 1. තොල්දෙක.

දෙසබඳ = 1. දත් මෙන් දෙන දෙය.

දෙසාසු = 1. අසු දෙක.

දෙසිද්ද = 1. ඉද්ද වගී දෙක.

දෙසෑස් = 1. ඇස් දෙක.

දෙය්‍ය = 1. දිය යුතු දෙය.

දෙබරය = 1. දෙබර කුඩුව.

දෙබරාඳු = 1. දෙගුණයක්.

දෙරණ = 1. පොළොව. 2. පාතාලය. 3. නාග ලෝකය. 4. කුණ්ඩලාභරණය.

දෙරණ කෙණේ = 1. පොළවේ පුතා. 2. අඟහරුවා.

දෙරණෝර = 1. නාග ලෝකය.

දෙරණිසුරු = 1. ධරණීශ්වර; රජ.

දෙරණිය = 1. පොළව.

දෙරූ = 1. විඹ රූපය.

දෙරෑ මැද = 1. මධ්‍යම රාත්‍රිය.

දෙමි = 1. වාරය.

දෙමිසන මාලය = 1. සැරසිලි වලින් යුත් මාලය.

දෙමරන් = 1. පැහුණ හිස කෙස්.

දෙමරණ = 1. පොළොව. 2. භාර්යාව.

දෙල = 1. වතුර. 2. කොළය.

දෙල් = 1. එනම් වෘක්ෂ විශේෂය.

දෙල් කොට්ට = දෙල් ගෙඩි වෙසෙසක්.

දෙලෙන් = 1. ඔරුව.

දෙලෙනිඳු = 1. මුහුද.

දෙලෙව්නි = 1. දෙ ලොවෙහි; මෙලෝ පරලෝ දෙක්හි.

දෙලේ = 1. කොළ.

දෙලෙහෙනවා = 1. දිලිසෙනවා.

දෙළු = 1. ධුරය. 2. ජරාව.

දෙළුම = 1. දෙළුම් ගෙඩිය. 2. එම ගස.

දෙව = 1. සෝදා. 2. (කිරි) දෙවීම කොට.

දෙවග = 1. වගී දෙක; දෙවගේ.

දෙවගෙන් ආජ්ස = 1. හකුරු පිටියෙන් හා සුදු පිටියෙන් තැනූ ආජප.

දෙවගෝම = 1. දෙ ජාතියම.

දෙවඟන = 1. දෙව්දුව; දිව්‍යාංගනාව.

දෙවට = 1. පටුපාර. (වැටවල් දෙකක් අතර වූ අතුපාර;)

දෙවන = 1. දෙවැනි.

දෙවනක් කරනවා = 1. විනාශ කරනවා.

දෙවනවා = 1. දෙන්ට සලස්වනවා.

දෙවන් මිණි = 1. චින්තාමාණික්‍යය. (සිතූ පැතූ දේ පහළ කරවන මැණික.)

දෙවනුව = 1. දෙවැනිව. 2. නැවත.

දෙවනු කොට = 1. නැවත. 2. පසුවට.

දෙවක්වක් = 1. දෙවතොත්. පොහොසත්.

දෙවසින් = (දෙවසිල්) 1. දේවාලය.

දෙවර = 1. දෙපාරක්; දෙ සැරයක්.

දෙවරැ = 1. රෑ දවල්. 2. උදය වරුව හා හවස් වරුව.

දෙවරැද්දිනි = 1. වී වගීයක්.

දෙවරුව = 1. පෙර අපර යන වරු දෙක; උදේ වරුව හා සවස් වරුව.

දෙවතන් කිරීම = 1. ශාන්ති කිරීම. 1. විනාශ වන්නට ඉඩ දීම. 3. මුලින් පැවැති තත්වය වෙනස් කිරීම.

දෙවිලයක් = 1. දෙජාතියක්. 2. එක හා සමාන දෙකක්. 3. අනුමානය.

දෙවලිය = 1. දවස් දෙක.

දෙවි = 1. දෙවියා. 2. අහස. 3. වීපය. 4. රජ. 5. මේසය. 6. වලා කුළු. 7. සේදීම. 8. දීම. 9. දේවිය.

දෙවි අඟර = 1. දිව්‍යාප්සරාව; දෙවඟන.

දෙව් ගමන් මග = 1. අහස.

දෙව් තල = 1. අහස.

දෙව් තුරු = 1. කල්ප වෘක්ෂය.

දෙව් දර = 1. දේවදුර.

දෙව් ඉඳු = 1. ශක්‍රයා.

දෙව් කත් = (දෙව්කල්) 1. දෙවඟන.

දෙව් කුසුම් = 1. දිවමල්.

දෙව් කුඹු = 1. භද්‍රඝටය.

දෙව් නළුවා = 1. දිව්‍යලෝකයේ නාට්‍ය කාරයා.

දෙව් නිළිය = 1. දිව්‍යලෝකයේ නාට්‍ය ස්ත්‍රිය.

දෙව් නිවණ = 1. දිව්‍යලෝකය; දෙවියන් වසන තැන.

දෙව් දත් = 1. දේව දත්ත. 2. පරම භට්ටාරකයා.

දෙව් දුන්න = 1. දේදුන්න.

දෙව් දුරු = 1. දේවදුර ගස්. 2. දුරුවර්ගයක්.

දෙව් දූතයා = 1 දේවදූතයා.

දෙව් පුවර = 1. දෙවියන්ගේ නගරය; දෙවුන්දර.

දෙව් නී = 1. දේව නදිය; අහස් ගඟ.

දෙව් දූ = 1. දිව්‍යාංගනාව.

දෙව් පිරිස = 1. දේව සමූහය. 2. දෙවියන්ගේ සේවක පිරිස.

දෙව් පුත් = 1. දිව්‍ය පුත්‍රයා.

දෙව් බස = 1. දෙවියන්ගේ භාෂාව. 2. සංස්කෘත.

දෙව් මග = 1. අහස. 2. දෙවියන් යන පාර.

දෙව් මැති = 1. දෙවියන්ගේ අනුශාසකයා; වෘහස්පතී.

දෙව් මැඳුර = 1. දේවස්ථානය. 2. පල්ලිය.

දෙව් රද = 1. දෙවියන්ගේ රජ; ශක්‍රයා

දෙව්රම = 1. ජේතවනාරාමය.

දෙව් රුපු = 1. අසුරයා.

දෙව් ලිය = 1. දිව්‍ය ස්ත්‍රී; දෙවඟන.

දෙව් ලොව = 1. ස්වර්ගය; දෙවියන් වසන ලෝකය.

දෙව් සපු = 1. දිව්‍යසැප; දෙවියන්ගේ සම්පත්තිය.

දෙව් සර = 1. දේවතාවී; දිව්‍යාප්සරාව.

දෙව් සබ = 1. දෙවියන්ගේ සුධර්මා නම් සභාව.

දෙව් සැඩු = 1. දෙව්දුන්න.

දෙව් සෙනෙවි = 1. දිව්‍ය සේනාපති; කඳ කුමරු; කතර ගම දෙවි.

දෙව් හැකිලි = 1. දෙවියන්ගේ හැකිල්ල.

දෙවාරණය = 1. දෙවගස.

දෙව්බක් = 1. දෙවරක්; දෙව්බස්; දෙසැරයක්.

දෙව්නි = 1. සසාද බැඳපු ස්ත්‍රී.

දෙව් දුන්න = 1. දේ දුන්න.

දෙවිඳු = 1. දෙවියන්ගේ ප්‍රධානයා (දෙව් + ඉඳු) 2. බකමුණා.

දෙවිඳුසැව් = 1. දෙවියන්ගේ දුන්න; දේදුන්න.

දෙවියා = 1. දිව්‍ය බල ඇත්තා.

දෙවිනිමන = 1. දෙවියන් වාසය කරන ස්ථානය; දෙව්ලොව.

දෙව්සෙනෙවි = 1. දේව සමූහයේ සේනාධිපතියා; කතරගම දෙවි.

දෙවුර = 1. උරදෙක.

දෙවූ = 1. සේදූ 2. දෙන්නට සිඛකළ.

දෙවනඳවල් = 1. දහවල් කාලයේ; මද්දහන.

දෙවල = 1. පටවල් දෙක. 2. යුවල.

දෙවසර = 1. දිව්‍යාප්සරාව; දෙවඟන.

දෙවතුව = 1. දෙවෙනි වරට.

දෙවෙල = 1. දේවාලය.

දෙවොල්යකා = 1. යක්ෂයෙක්.

දෙවොල්මඩු = 1. දෙවියන් උදෙසා කරන මඩු.

දෙවේල = 1. වේල් දෙක.

දෙවොල = 1. දේවාලය.

දෙවොල් කියනවා = 1. නන් දොඩවනවා; විකාර වචන කියනවා. 2. සාප කරනවා. 3. දොස් කියනවා.

දෙවෙස් = 1. වෙස් දෙක. 2. වෙෂය. 3. වෛරය.

දෙස් = 1. දේශය. 2. කොටස. 3. සාක්ෂිය. 4. කථා කිරීම. 5. ශාපය.

දෙස්විරුද්ධ = 1. (කාව්‍ය සම්ප්‍රදායෙහි ඇති) දේශවිරෝධ නම් දෝෂය.

දෙසනුදෙස = 1. ප්‍රධාන දිසා හා අනු දිසා.

දෙසතර = 1. අට. 2. දේශාන්තරය.

දෙසඳුන් = 1. සුදු හඳුන් හා රත්හඳුන් දෙවර්ගය.

දෙස්තබනවා = 1. සාප කරනවා. 2. සාක්කි කියනවා.

දෙසන්තර = 1. දෙසතුර; අන්‍ය දේශය.

දෙස්ස = 1. දෙසි; දෙහි ගෙඩිය.

දෙසා = 1. සාක්ෂිය. 2. දේශනා කොට.

දෙසාබානවා = 1. බණිනවා. 2. දිගට කථා කරගෙන යනවා.

දෙසාළිස = 1. සතළිස් දෙක.

දෙසැට = 1. හැටදෙක.

දෙසැටදිට් = 1. මිථ්‍යාදෘෂ්ටි හැටදෙක.

දෙසැම්බ්‍ර = 1. මාසයක නමක්.

දෙසි = 1. දෙහි.

දෙසිඟ් ඇති = 1. සිඟ් දෙකක් ඇති. 2. ස්ථිර අදහසක් නැති.

දෙසෙනිඳු = 1. උතුරුකුරු දිවයින.

දෙහඳිස = 1. මුත්‍ර.

දෙහිඅල = 1. අල වර්ගයක්.

දෙහිඅඹලය = 1. දෙහි බෑය; දෙහි ගෙඩියෙන් පංගුව.

දෙහිකපනවා = 1. ගෝමයක් වශයෙන් අගුණ මගහැරවීමට දෙහි කපනවා. 2. බණිනවා. 3. දෙහි ගෙඩිය කපා වෙන්කරනවා.

දෙහිඹුල = 1. අච්චික්කා ගස.

දෙහිඹ = 1. කොහොඹ.

දෙහිම = 1. දෙ සඳුන්.

දෙහිරැඩා = 1. බඹරා; මී මැස්සා.

දෙහිය = 1. දෙවැනි වරට සී හෑම.

දෙහෙක් = 1. අවුරුද්ද.

දෙහෙකිලි = 1. කොක්ක.

දේ

දේ = 1. දෙය. 2. කාරණය.

දේනාං = 1, ජේතවනාරාමය.

දේදුනුවන් = 1. දේදුන්න වැනි පාට ඇති. 2. දේදුන්න ආකාර.

දේදුන්න = 1. දෙව්දුන්න.

දේපල = 1. අයිති බඩු. 2. බඩු මුට්ටු ආදිය.

දේයධර්ම = 1. දියයුතු ආහාර පානාදිය.

දේව, දේවකීය = 1. දෙවියන්හට අයිති. 2. දෙවියා. 3. රජතුමා. 4. මේඝය. 5. බුදුන් වහන්සේ.

දේව අතිදේව 1. දෙවියන්හටද දෙවි; බුදු රජ.

දේව උදහස = 1. දෙවියන්ගේ කිපීම.

දේවකී = 1. දෙව් දුවකගේ නමක්. 2. ක්‍රිෂ්ණ-ගේ මව.

දේවකී නන්දන 1. දේවකීගේ පුතා. 2. ක්‍රිෂ්ණ.

දේව කුසුම් = 1. දිව්‍ය මල්. 2. ලුණු. 3. කරාබු නැටි.

දේව කොඩි = 1. මුරුංගා ගස.

දේවඛාතකය, දේවඛාතය = 1. දේවාලයේ පොකුණ හෝ ගල් ගෙය. 2. කඳු අතර ගුහාව. 3. ජලාශය.

දේව ගන්ධර්වයා = 1 දිව්‍ය සංගීත ගායනාකරයා; පංච සිඛයා.

දේව ගන්ධික = 1. ඉටි වර්ගයක්.

දේව ශෘතිකා, දේව ජීවකයා = 1. දේව සේවයේ යෙදී සිටින්නා; පූජකයා. 2. කපුරාළ.

දේව ගුරු = 1. දෙවියන්ගේ ගුරුවරයා – බෘහස්පති.

දේව චාරිකා = 1. දෙව් ලොව සැරි සැරීම.

දේව දණ්ඩ = 1. දෙවියන් කරන දඬුවම.

දේව දත්තිය = 1. දෙවියන් දුන්.

දේවදාන = 1. දෙවියන්ට දීම.

දේවදාරු = 1. දේවදාර.

දේවතා = 1. දෙවියා. 2. බ්‍රහ්මයා.

දේවදූතයා = 1. දෙවියන් විසින් එවන ලද දූතයා.

දේවතාඩයා = 1. රාහු.

දේවතාදුව = 1. දේවතාවි. 2. සුරංගනාව.

දේවදත්ත = 1. දෙවියන් විසින් දෙනලද. 2. එනම් භික්ෂුව.

දේව දත්තයා = දෙව්දත්. එනම් භික්ෂුව.

දේවදාර = 1. ගස් වර්ගයක්.

දේවදාසි = 1. දෙවියන්ගේ මෙහෙකාරි. 2. දේවාලයන්හි දේව මෙහෙයෙහි යෙදෙන්නී.

දේව දුන්දුභි = 1. දිව්‍ය දවුල. 2. දෙවියන්ගේ බෙර වෙශෙසක්.

දේවදුරු = 1. දුරු වර්ගයක්. 2 දේවදාර.

දේව දූතයා = 1. දෙවියන්ගේ දූතයා. 2. දෙවි-යන්ට පනිවුඩ ගෙනයන්නා.

දේව දෘෂ්ටිය = 1. දෙවියන් ගැන විශ්වාසය.

දේවදේව = 1. දෙවියන්ගේ දෙවියා; බුදුන් වහන්සේ.

දේවද්‍රැම = 1. දිව්‍ය වෘක්ෂය; කල්ප වෘක්ෂය.

දේවද්‍රෝණිය = 1. දෙවියන්හට ගෞරව පිණිස කරන පෙරහැර.

දේවධර්මය = 1. දේවනීති ගැන ඉගැන්වීම. 2. පවට භය ලජ්ජා දෙකින් යුක්ත වීම.

දේවධර්මාචාර්යයා = 1. දේව ධර්ම උගතා.

දේවධූප = 1. දිව්‍ය සුවඳ දුම්. 2. කට්ට කුමංජල්.

දේව පංක්ති = 1. දෙවියන්ගේ භාර්යාව. 2. බතල.

දේව පථය = 1. අහස.

දේවනදී = 1. අහස් ගඟ.

දේව ප්‍රතිමාව = 1. දෙවියන්ගේ රූපය.

දේවපූජාව = 1. දෙවියන් පිදීම.

දේවභාෂා = 1. සංස්කෘත භාෂාව.

දේවභක්තිය = 1. දෙවියන් කෙරෙහි විශ්වාසය.

දේවභවන = 1. දිව්‍ය ලෝකය. 2. ඇසටු ගස.

දේව භෝජනය = 1. දෙවියන්ගේ කෑම. 2. අමෘතය; සුධා භෝජනය.

දේව මන්දිරය (දේව මාළිගාව) = 1. දේවාලය

දේව මෙහෙය = 1. දෙවියන් ඇදහීම.

දේවය = 1. වලාකුළ. 2. ඉන්ද්‍රියය.

දේවයා = 1. දෙවියා. 2. රජ. 3. එක්තරා කුලයකට අයත් පුරුෂයා.

දේවයන් වහන්සේ = 1. උතුමාණන් වහන්සේ 2. රජතුමන්.

දේව යෝනිකයා = 1. දේව මවකු හෝ පියකු ඇත්තා.

දේව රාජ = 1. දෙවියන්ගේ රජ-ඉන්ද්‍ර දෙවියා; ශක්‍රයා

දේව රාජානුශාසනය = 1. දේව ආංඥාව.

දේව රූපය = 1. දෙවියන්ගේ රූපය.

දේව ලෝකය = 1. දිව්‍ය ලෝකය.

දේව වක්ත්‍රය = 1. දෙවියන්ගේ කට 2. ගින්න. 3. ගිනිදෙවියා.

දේව වේද පුරාණය = 1. එනම් පොත.

දේවස්ථානය = 1. දෙවොල; දේවාලය. 3. පල්ලිය.

දේව සේනාපති = 1. දේව සේනාවේ ප්‍රධානයා. 2. කතරගම දෙවි.

දේවසමාධිෂ්ඨිත = 1. දෙවියන් අරක්ගත්.

දේව බැල්ම = 1. දෙවියන්ගේ අනුග්‍රහය. 2. දෙවියන්ගේ අනුකම්පාව.

දේවානාපිය = 1. දෙවියන්ට ප්‍රිය.

දේවාන් = 1. දේවායතනය.

දේවශ්‍රුතය = 1. දෙවියන් විසින් එළිදරව්කළ කරුණු.

දේවාග්නිකයා = 1. දෙවියන් හට ගිනි පුදන්නා.

දේවාගාරය = 1. දේවාලය.

දේවාගාරික = 1. කපුවා; පූජකයා.

දේවාත්මය = 1. දෙවියන්ගේ ආත්මය; දේව භාවය.

දේවානන්ද නාහිමි = 1. අම්බලම්ගොඩ දේවානන්ද උප සංඝරාජ මහා නායක ස්වාමින්ද්‍රයෝ.

දේවානං පියතිස්ස = 1. දෙවැනි පැතිස් රජ තුමා (ලක්දිව බුද්ධාගම පිහිටුවීමට උදව් දුන්නේ මෙතුමාය.)

දේවානමින්ද = 1. දෙවියන්ගේ ප්‍රධානයා-ඉන්ද්‍ර දෙවි; ශක්‍රයා.

දේවානුග්‍රහය = 1. දේව උපකාරය; දෙවියන්ගේ අනුකම්පාව.

දේවානුභාවය = 1. දෙවියන්ගේ බලය. 2. දෙවියන්ගේ අනුහස.

දේවානුරූප = 1. දෙවියන් මෙන්.

දේවානුශාසනය = 1. දේව ආණ්ඩුව. 2. දෙවියන්ගේ අවවාදය.

දේවාති දේව = 1. දෙවියන්ගේ දෙවියා; බුදු හාමුදුරුවෝ.

දේවාධිපත්‍ය = 1. දෙවියන්ගේ ප්‍රධානත්වය.

දේවා භක්ති = 1 දෙවියන් ගැන විශ්වාස කැති.

දේවාරක්ෂාව = 1. දෙවියන් විසින් ආරක්ෂා කිරීම.

දේවාලය = 1. දේවස්ථානය 2. කෝවිල.

දේවාල තල පත = 1. දෙරකඩ අස්න ආදිය ශ්‍රවණය කිරීම පිණිස දෙවියන්ට ආරාධනා කර යවන තල් පත.

දේවාල පුල්ලියා = 1. ඉතා කපටියා.

දේව වාසය = 1. දෙවියන් වසන ස්ථානය.

දේවාශ්වයා = 1. දෙවියන්ගේ අශ්වයා. 2. හුළඟ.

දේවී = 1. රජ බිසව. 2. උතුම් ස්ත්‍රී. 3. දෙව්දුව.

දේවින්නාන්සේ = 1. රජ බිසව; බිසොවුන් වහන්සේ.

දේවේන්ද්‍රයා, දේවේන්ද්‍ර = 1. දෙවියන්ගේ රජ; ශක්‍රයා.

දේශකයා = 1. දේශනා කරන්නා.

දේශාන්තර = 1. අන්‍ය දේශය.

දේශගුණය = 1. රටක පවත්නා ශීතෝෂ්ණාදී ගුණය.

දේශ ත්‍යාගය = 1. දේශය අත් හැරීම; රට හැර යාම.

දේශකාව = 1. යමෙකුගේ යහපතට නි දෙය. 2. යම් කරුණක් ගැන කළ කථාව. 2. නීති.

දේශය = 1. රට 2. පිටරට.

දේශාන්තරය = 1. පිටරට.

දේශ විරෝධය = 1. කාව්‍ය සම්ප්‍රදායට අයත් වූ දශ මහා දෝෂයන් අතුරින් එකක්.

දේශිකයා = 1. මඟියා. 2. යම් කිසි රටකට අයත්.

දේශ = 1. රට.

දේශකයා = 1. දේශනා කාරයා.

දේශචාරී = 1. ගමන් කරන. 2. රටින් - රට යන්නා

දේශජ = 1. ස්වදේශික. 2. රටෙහි උපන්.

දේශතුඩ, දේශතුඩුව = 1. පොළවේ මුහුදට නෙරා තිබෙන කොටස.

දේශ දර්ශනය = 1. රටේ පෙනුම.

දේශ බන්ධු = 1. රටවෙනුවෙන් දිවිපිදූ වීරයා.

දේශනා කරනවා = 1. අවවාද සහිත යමක් කියනවා.

දේශ මාමක = 1. රටේ දියුණුව සඳහා වැඩ කරන; සිය රටට ආදරය ඇති.

දේශය = 1. රට. 2. පළාත.

දේශ සන්ධිය = 1 පළාත් දෙකක් හෝ රටවල් දෙකක් එකතු කර තිබෙන පටු ඉඩම.

දේශ සීමාබද්ධ = 1. රටක මායිමට යාවූ කොටස.

දේශාන්තර = 1. පිටරට.

දේශාන්තර චාරියා = 1. පිටරටවල ගමන් කරන්නා.

දේශාන්තර්ගත = 1. රටට අඩංගු.

දේශාභ්‍යන්තර = 1. රට මැද වූ.

දේශිත = 1. දේශනා කරන ලද.

දේශීය = 1. දේශයෙහි වූ.

දේශීය = 1. රටකට හෝ පළාතකට අයිති; රටෙහි වූ.

දේහය = 1. ශරීරය.

දේහක්ෂය = 1. ක්ෂය රෝගය. 2. ශරීරය දිරායාම.

දේහගත, දේහාන්තර්ගත, දේහධාරී = 1. ශරීර ගත වූ.

දේහනික්ෂෙපස්ථාන = 1. ශරීරය තැන්පත් කරන ස්ථානය.

දේහ ත්‍යාගය = 1. මරණය.

දේහ දිය = 1. මූත්‍ර.

දේහ ධාරකය = 1. ශරීරය උසුලා සිටින දෙය- ඇට සැකිල්ල.

දේහම්භර = 1. කැදර.

දේහය = 1. ශරීරය.

දේහ යාත්‍රාව = 1. මරණය 2. ශරීර පැවැත්ම.

දේහ රූපය = 1. ශරීරය ආකාරයට සැදූ රූපය.

දේහ ලක්ෂණය = 1. ශරීරයේ පෙනුම. 2. ශරීරයේ ලකුණු.

දේහ ලාවණ්‍ය = 1. ශරීරයෙහි සුන්දරත්වය; රූප ලක්ෂණය.

දේහලිය = 1. එළිපත්ත.

දේහි = 1. ශාරීරික.

දේහිනිය = 1. ස්ත්‍රී; කාන්තාව.

දෛ

දෛනික = 1. දවස් පතා; දින පතා.

දෛත්‍ය, දෛත්‍යා = 1. රාක්ෂයයා. 2. අසුරයා.

දෛත්‍ය ගුරු = 1. සිකුරා; අසුර ගුරු.

දෛත්‍යාරියා = (දෛත්‍ය + අරියා) 1. රාක්ෂයන්ගේ (අසුරයන්ගේ) සතුරා. 2. විෂ්ණු දෙවි. 3. දෙවියා.

දෛන්‍ය = 1. දිළිඳුකම. 2. දීන භාවය. 3 පහත්කම.

දෛව = 1. පෙර පින. 2. භාග්‍යය. 3. දෙවියන්ගෙන් වූ.

දෛව කෝවිදයා = 1. දිවස් කියන්නා. 2. දෛවය ගැන දන්නා.

දෛවඥ = 1. ශාස්ත්‍ර කියන්නා. 2. නැකැත් කියන්නා.

දෛවතයා = 1. දෙවියා. 2. දේව රූපය. 2. දේව සමූහය.

දෛව දීපය = 1. දේව පහන. 2. ඇස.

දෛව සර = 1. පෙර නියම වූ.

දෛව යෝගය = 1. දෙවියන්ගේ මැදහත් වීම. 2. දෛවය නිසා වූ යෙදීම.

දෛව ලේඛක = 1. නැකැත් ලියන්නා.

දෛවී = 1. දෙවියන් හට අයිති.

දෛවෝපගත = 1. නපුරක් සිදුවෙන්නට නියමවූ. 2. පුරාකෘත කර්මයෙන් පහර දෙන ලද.

දෛශික = 1. රටට අයිති.

දෛෂ්ටිකයා = 1. නියම ලෙස යමක් සිදු- වෙනවායයි සිතන්නා.

දෛහික = ශාරීරික. 2. දේහය පිළිබඳ.

දො

දො = 1. දෙක.

දොරට 1. දෙරට.

දොඩ = 1. බස. 2. කථා කිරීම. 3. වචනය.

දොඩම් = 1. ගෙඩි වර්ගයක්.

දොඩන = 1. කථාකරන.

දොඩමලුකම = 1. දිගට කථාකිරීම; බොහෝ කථා කිරීම; මුකරි කම.

දොඩම් වෑන්න = 1. කුඩා ගස් වර්ගයක්.

දොන් = 1. පෘතුගීසින්ගේ ගරු නාමයක්. 2. මහත්මයා?

දොන් කුලප්පුව = 1. වුවමනා නැතිව ගන්නා කෝන්තිය.

දොදෙල් = 1. රස කැවිලි වර්ගයක්. 2. සවු- දොදෙල් ආදිය

දොඹ = 1. එනම් ගස්. 2. දියෙහි පිනුම.

දොඹකරය = 1. බර ඉසිලීමට ගන්නා යන්ත්‍රයක්.

දොඹය = 1. දිය ක්‍රීඩාවේදී උඩ සිට දියට පනින ලිය. 2. දොඹ ගෙඩිය.

දොම්නස = 1. කනගාටුව. 2. නොසතුට; අසතුට.

දොයිතුව = 1. පැන්සයෙන් දහසයෙන් පංගුව. 2. කුඩා කාසියක්.

දොයිසනවා = 1. නිදගන්නවා 2. නින්ද යනවා.

දොයිරාදු = 1. රත්තරන් විශේෂයක්.

දොර = 1 දොරකඩ. 2. ගෙට ඇතුළුවන තැන. 3. මිදුල. 4. දොර ලෑල්ල.

දොරකඩ අස්න = 1. පිරිත් පින් කමකින් පසු විශේෂ දේව දූතයකු ලවා දෙවියන්ට පින්දීම කරවන කියමන.

දොරට වඩනවා = 1. ඉර පෙන්වීම පිණිස හාපුරා යයි බිළිඳකු දොරට ගන්නවා.

දොරබුව = 1 පිටත සිට ගෙට ඇතුළුවීමට සාදා තිබෙන දොරකඩ.

දොරණ = 1. ගස් වර්ගයක්.

දොරණ තෙල් = 1. පාට සෑදීමට දොරණ ගසෙන් ලබාගන්නා තෙල් (චිත්‍ර-කර්මාන්තයේදී සායම් දියකරන තෙල්)

දොරදන් = 1. ගෙයිදොර අසලදී දෙන දානය. 2. දානය බෙදීමට ගත් උපකරණ ආදිය පවා සඟ සතු කොට දෙන දානය.

දොර පෝරුව, දොරපුවරි, දොරපුවරු,- දොර බිසලි = 1. දොර පළුව.

දොරළ = 1. රළ. 2. ගස් වර්ගයක්.

දොළ, දොළදුක = 1. තද ආශාව. යම් යම් දේ පිළිබඳව ගර්භිනියක් තුළ හටගන්නා ආශාව.

දොළ = 1. කුඩා ජලාශයක්. 2. යක්ෂ භූත ආදීන්ට දෙන කෑම ආදිය. 3. ලස්සණ වන පෙදෙස.

දොළ පාර = 1. කුඩා දිය පාර.

දොළනා = 1. ආශාකරන.

දොළස = 1. ද්වාදසය; දහයත් දෙකත් එකතුව. 2. දුසිම.

දොළසත් = 1. අත් දොළහක් ඇත්තා. 2. කතරගම දෙවි.

දොළො = 1. ආශාව. 2. දුක.

දොළොස = 1 දොළහ.

දොළොස් දහස් රට = 1. රුහුණු පළාතේ පිහිටි ජනපදයක් (ගිරුවා ජනපදය?)

දොළොස් පද සැහැල්ල = 1. සැහැලි විශේෂයක්.

දොවනවා = 1. සෝදනවා.

දොවනවා = (දෙවිනවා) 1. කිරි දෙවිනවා.

දොවින් සරණේරු = 1. සරනේරු වෙසෙසක්.

දොවින් ඇණය = 1. කුඩුම්බියක් ඇති ඇණ වර්ගයක්.

දොඹුන්දිය = 1. හාල් පාන වතුර.

දොස, දොස් = 1. වරද. 2. තාරකා ශාස්ත්‍රය. 3. පලුද්ද 4 මේෂය. 5. වාතාදි තුන්දොස.

දොස්තර = 1. බටහිර දිග ක්‍රම අනුව වෙදකම් කරන්නා.

දොහො = 1. දෙක.

දොහොත = 1. අත් දෙක.

දොහොර = 1. නොහොත් සැක සහිත අරුත්හි.

දොහොව = 1. ජෝඩුව.

දෝ

දෝ = 1. කාන්තිය; එළිය. 2. තරුව. 3. සුදු පැහැය. 4. සේදීම. 5. සුයාමීයා. 6. ගින්න. 7. දෙවීම. 8. පිරිසුදු 9 සැකසහිත අරුත්හි; අනුමාන.

දෝංකාරය = 1 ප්‍රතිරාවය.

දෝන = 1. ගැණුන්ගේ නම්වලට මුලින් යොදන පෘතුගිසි ගරු නාමයක්.

දෝනවා = 1. කිරි දෙවිනවා. 2. සෝදනවා.

දෝනාව = 1. පොළොව යට පතලයකින් යන උමඟ.

දෝණියන්දෑ, දෝණියෝ = 1. දූව.

දෝත = 1. අත් දෙක.

දෝතලු = 1. පුවක් වර්ගයක්.

දෝපොළ = 1. තාරකා පංක්තිය.

දෝම නස්ස = 1. කණගාටුව; දොම්නස.

දෞර = 1. ගලාගෙන යන දිය දහරාව. 2. රැලය.

දෞරද = 1. තාරකා රජ; හඳ.

දෞලාය මාන = 1 වැනෙන; ඔන්චිල්ලාවක් මෙන් වන.

දෞලං = 1. උන්චිල්ලාව. 2. පල්ලැක්කිය.

දෞලී = 1. දෞලාව.

දෝලි කුනම් = 1. දෝලාව.

දෝව = 1. තාරකාව. 2. පහන් කිම.

දෝවනය = 1. සේදීම.

දෞවාරික = 1. දොරටු පාලයා.

දෝෂ = 1. වරද. 2. පාපය. 3. ශරීරයෙහි වාතාදි තුන් දොස.

දෝසක් (දෝසතර) = 1. ජ්‍යොතිස්ශාස්ත්‍රය.

දෝසි = 1. රස කැවිලි වර්ගයක්.

දෝෂ = 1. වැරදි.

දෝෂ ආරෝපන = 1. දොස් පැවරීම; වරද කලැයි චෝදනා නැඟීම.

දෝෂඥ = 1. වරද පෙනෙන; දොස් දකින.

දෝෂත්‍රය = 1. වා, පිත්, සෙම්, යන තුන් දොස. 2. ලෝභ, ද්වේෂ, මෝහ යන තුන් දොස.

දෝෂපර = 1. දෝෂ ප්‍රධාන කොට ඇති.

දෝෂමල = 1. වැරදි නමැති කිලුට.

දෝෂය = 1. වරද. 2. වැරැද්ද.

දෝෂාකර = 1. සඳ. 2. දොස් උපදවන ආකාරය.

දෝෂාරෝපක = 1. වරද තබන.

දෝහදය, දෝහලය = 1. ආශාව. 2. දොළදුක.

දෝහනය = 1. (කිරි) දෙවීම.

දෝහල = 1. දොළදුක.

දෝහලික = 1. ආශා ඇති.

දෝහලිනී = 1 දොළදුක් ඇත්තී.

දෝහලවතී = 1. දොළදුකින් සිටින තැනැත්තී.

දෝහෝ = 1. එසේද. 2. නොහොත්.

දෞ – ද්‍යු

දෞවාරිකයා = 1. දොරටු පාලයා.

දෞශ්ශීල = 1. දුශ්ශීල බව.

දෞර්භාග්‍ය = 1. අවාසනාවන්ත; දුර්භාග්‍යය.

දෞර්මනස්‍යය = 1. කණගාටුව. 2. දොම්නස.

දෞහෘදය = 1. ආශාව. 2. දොළදුක.

දෞර්ජන්‍ය = 1. දුර්ජන බව.

දෞර්බල්‍ය = 1. දුබල බව.

ද්‍යූත = 1. සූදුව.

ද්‍යූතකාර = 1. සූදු කෙළින්නා.

ද්‍යුති = 1. කාන්තිය. 2 එළිය. 3. තේජස. 4. ලස්සණ.

ද්‍යුතිමත් = 1. කාන්තිමත්.

ද්‍යුපති, ද්‍යුමණී = 1. දවසේ ප්‍රධානයා. 2. ඉන්ද්‍ර දෙවියා. 3. සූර්යයා.

ද්‍යුව = 1. දිහ. 2. දවාල.

ද්‍යෝ, ද්‍යෞ = 1. අහස. 2. දිව්‍ය ලෝකය.

ද්‍යෝත = 1. ප්‍රකාශය. 2. අව්ව. 3. බැබළීම.

ද්‍යෝතිත = 1. ආලෝක වූ. 2. බැබළ වූ.

ද්‍ර – ද්‍රා – ද්‍රැ – ද්‍රෝ

ද්‍රගඩය = 1. පිත්තල බෙරය.

ද්‍රව = 1. වැගිරෙන දියර. 2. රසය. 3. ඉස්ම. 4. ගමන. 5. වේගය.

ද්‍රවන්තිය = 1. ගංගාව.

ද්‍රවණය = 1. වැස්සීම.

ද්‍රවය = 1. යාම. 2. පැනයාම. 3. දියවීම. 4. වැස්සීම.

ද්‍රවිඩ = 1. දෙමළ. 2. චණ්ඩාල.

ද්‍රවිණය. ද්‍රවිණ = 1. බලය. 2. වස්තුව. ස්රත්.

ය = 1. දියකිරීම.

ද්‍රවීභූත = 1. දියකළ – දිය වූ.

ද්‍රවේතර = 1. තද. 2. ඝන.

ද්‍රව්‍ය = 1. යම්-යම් දේ. 2. යමක් සෑදී තිබෙන ප්‍රධාන දෙය. 3. වස්තුව.

ද්‍රව්‍ය ධර්ම ශාස්ත්‍රය = 1. ද්‍රව්‍යබල ගැන උගන්වන ශාස්ත්‍රය.

ද්‍රාක්ෂා = 1. මිදි; මුද්දරප්පලම්.

ද්‍රාක්ෂා අරිෂ්ඨය = 1. මුද්දරප්පලම් ආදියෙන් සෑදූ අරිෂ්ටය.

ද්‍රාක්ෂාජ = 1. මුද්රප්පලම් වලින් හටගත්.

ද්‍රාක්ෂාරස = 1. මුද්‍රික පානය. 2. මිදියුස.

ද්‍රාක්ෂාරසාම්ල = 1. මිදි අම්ලය.

ද්‍රාක්‍ෂා ලතාව = 1. මිදි වැල.

ද්‍රාක්‍ෂාව = 1. මිදිඵල; මුද්දරප්පලම්.

ද්‍රාවකයා = 1. එළවන්නා. 2. කවටයා. 3. සල්ලාලයා.

ද්‍රාවකර = 1. යවකාර.

ද්‍රාවතාව, ද්‍රාවත්වය = 1. සුණු වී දියර වන ස්වභාවය.

ද්‍රාවණය = 1. උණුකිරීම. 2. එලවා දැමීම.

ද්‍රාවිඩ, ද්‍රවිඩ = 1. දෙමළ. (දමිළ)

ද්‍රාවිඩක = 1. හරංකහ. 2. හිඟුරු පියලි.

ද්‍රාවිඩී = 1. ගින් එන්සාල්.

ද්‍රාවිත = 1. මකන ලද. 2. දියකරන ලද.

ද්‍රාව්‍ය = (ද්‍රව්‍යවත්) 1. දියකළහැකි වූ; මැකෙන.

ද්‍රාව්‍යාංශය = 1. ලෝහ මකන උෂ්ණ ප්‍රමාණය.

ද්‍රුත = 1. සියුම් වූ. 2. පැනගිය. 3. ඉක්මන්.

ද්‍රුමනඛය = 1. කටුව.

ද්‍රුමය, ද්‍රුම = 1 ගස. 2. කුවේරයා. 3. බෝ ගස.

ද්‍රුමාශ්‍රය = 1. ගසමුදුනෝ.

ද්‍රුමාමය = 1. ලෙඩ. 2. ගස් රෝගය. 3. සත්ව යන්ගෙන් ලබාගන්නා සායම.

ද්‍රුමෝත්පල = 1. කිහිරි ගස. 2. කිණිහිරි ගස.

ද්‍රුහිණ = 1. බ්‍රහ්මයා; මහා බ්‍රහ්මයා.

ද්‍රෝණ = 1. ලාස්සතර. 2. නැළි සොළස. 3. එනම් බ්‍රාහ්මණයා. 4. කුරුණි සතර.

ද්‍රෝණ මුඛය = 1. වරාය. 2. පළාතක ප්‍රධාන නුවර. 3. ගම් 400 ට ප්‍රධාන ගම. 4. මහා නගරවලට අදායම ලැබෙන කුඩා නගර.

ද්‍රෝණි = 1. ඔරුව. 2. විල. 3. ගොහොරු ඉඩම. 4. දිග පෙට්ටිය.

ද්‍රෝණිකා = 1. අවරිගස්.

ද්‍රෝහ = 1. වෛරය.

ද්‍රෝහ චින්තන = 1. ද්‍රෝහී සිත් ඇති.

ද්‍රෝහි කාරයා = (ද්‍රෝහියා) 1. විරුඬ කාරයා; සතුරා.

ද්ව

ද්වඞ්ගුල = 1. අඟල් දෙක.

ද්වත්‍රිංශාකාර = 1. ආකාර දෙතිසක් ඇති.

ද්වන්ද්ව = 1. කුට්ටම් මෙන් ඇති. 2. දෙක.

ද්වන්ද්වය = 1. කුට්ටම. 2. එනම් සමාසය. 3. මිථුන රාශිය.

ද්වන්ද්වව = 1. දෙකක් වූ. 2. පිටපතක් වූ.

ද්වන්ද්ව ඛඩ්ගධාරයා = 1. කඩු හරඹ කරන්නා.

ද්වන්ද්ව යුද්ධය = 1. දෙදෙනෙකු අතර කරන යුද්ධය.

ද්වන්ද්ව පුරුෂ = 1. දෙදෙනෙකුගේ ලක්ෂණ ඇති පුරුෂයා.

ද්වන්ද්ව වෘතනය = 1. දෙදෙනෙකුට නියම තාලය.

ද්වන්ද්වාතීත = 1. සැප දුක් දෙකම නො සලකන.

ද්වන්ද්වාක්ෂර = 1. අකුරු දෙක. 2. කවියක අකුරු දෙක බැගින් එළිසමවන ලෙස යෙදීම.

ද්වය = 1. දෙක. 2. යුගල.

ද්වා = 1. දෙක.

ද්වාකාර = 1. දෙ වැ දෑ රුම්.

ද්වාචත්වාරිංශත් = 1. හතළිස් දෙක.

ද්වාත්‍රිංශත්, = 1. තිස්දෙක.

ද්වාදශ = 1. දොළොස්.

ද්වාදශ අංශක = 1. මේෂාදි රාශියකින් දොළොසින් පංගුව.

ද්වාදශකාර, ද්වාදශහස්ත = 1. අත් දොළසක් ඇත්තා-කතරගම දෙවි.

ද්වාදශ නේත්‍ර = 1. ඇස් දොළහක් ඇත්තා. 2. බරනෙත්; කතරගම දෙවි.

ද්වාදශ ලෝචනයා = 1. ඇස් දොළහක් ඇත්තා-කතරගම දෙවි.

ද්වාදශ කෝණ = 1. කොන් දොළහකින් යුත්.

ද්වාදශය = 1. දොළහ.

ද්වාදශාකාර = 1. දොළොස් ආකාරයකින් යුක්ත වූ.

ද්වාදශාත්මන් = 1 සූර්යයා.

ද්වාදශාත්ම = 1. සොළොස් දෙළහක් හෝ ආත්ම දෙළහක් ඇත්තා.

ද්වාදංශාංගුල, ද්වාදශාංගුල = 1. වියත-අඟල් දෙළහ.

ද්වාදශායුෂ් = 1. දෙලොස් අවුරුද්දක් වයස ඇත්තා; බල්ලා.

ද්වාපර යුගය = 1. තුන්වැනි යුගය.

ද්වාර අට්ටාල = 1. දොරටු මතුවෙහි තැනවූ අටල්ල.

ද්වාරය = 1. ගෙයකට ඇතුල්වන පිටවන තැන; දොරටුව.

ද්වාර කෝෂ්ඨ = 1. දොර කොටුව.

ද්වාරප = 1. දොරටුපාලයා.

ද්වාරත්‍රය = 1. තුන් දොර- (හිත, කය, වචන)

ද්වාර පාලයා = 1. දොරටු පාලයා.

ද්වාර පාලිකා = 1. දොරටු පාල ස්ත්‍රී.

ද්වාර බන්ධ = 1. දොර සවිකරන උළුවස්ස.

ද්වාර යන්ත්‍රය = 1. යතුරු තහඩුව.

ද්වාෂෂ්ටි = 1. හැටදෙක.

ද්වි = 1. දෙ. 2. දෙකකින් යුත්.

ද්වි අඞ්ගික = 1. අඞ්ග දෙකක් ඇති.

ද්වික = 1. දෙකක් හෝ දෙකක් සම්බන්ධ වූ.

ද්විකුහර = 1. කුහර දෙකකින් යුත්.

ද්වි කෝණ = 1. කෝණ දෙකකින් යුත්.

ද්විගුණ = 1. දෙගුණ.

ද්විගුණිත = 1. දෙකෙන් ගුණ කළ.

ද්විගුරුපදය = 1. දීර්ඝ මාත්‍රා දෙකක් ඇති වචනය.

ද්විචක්‍රකය = 1. රෝද දෙකේ රථය.

ද්විච්ඡේදනය = 1. දෙකට කැපීම.

ද්විජ = 1. දෙවරක් උපන් 2. බ්‍රාහ්මණයා. 3. කුරුල්ලා. 4. දත්.

ද්විජගණයා = 1. කුරුලු රැළ. 2. බ්‍රාහ්මණ පිරිස.

ද්විජමහාසාල = 1. බ්‍රාහමණ කුලයක්.

ද්විජමාංසය = 1. විදුරුමස.

ද්විජරාජ = 1. හඳ. 2. අනන්ත නම් නාගරාජයා. 3. ගුරුළා.

ද්විජාක්ෂර = 1. දෙතැනින් උපදින අකුරු.

ද්විජිහ්ව = 1. දිව දෙකක් ඇත්තා; දෙදිව්. 2. නාගයා.

ද්විජිහ්වයා = 1. නාගයා; සර්පයා. 2. දිව දෙකක් ඇත්තා. 3. කේලමා. 4. හොරා.

ද්විතීය = 1. දෙවැනි.

ද්විතීයිකා = 1. දෙවැන්නිය.

ද්විනාම = 1. නම් දෙකක් ඇති.

ද්විනාල = 1. නල දෙකකින් යුත්.

ද්විත්ත = 1. දෙගුණ.

ද්විත්ව = 1. දෙකක් බව.

ද්විත්වරූප සන්ධිය = 1. එනම් සන්ධිය.

ද්විධාකරනවා = 1. දෙකක් කරනවා.

ද්විතීයධ්‍යානය = 1. භාවනාවේ දෙවෙනි කොටස.

ද්විතීයව්‍යාඛ්‍යාන = 1. දෙවරක් ලියන ලද වචනය හෝ පොත

ද්විතීයා = 1. නාම විභක්තිය.

ද්විතීයාවර්ණනය = 1. දෙවැනි වැන්ම.

ද්විදශන = 1. දත් දෙකක් ඇති.

ද්විදේවද්‍රෂ්ඨිය = 1. දෙවියන් දෙදෙනෙකු ගැන විශ්වාසය.

ද්විධා = 1. දෙයාකාර.

ද්විධාකරනවා = 1. සම පංගු දෙකකට බෙදනවා.

ද්විධාගති = 1. ගති දෙකක් ඇති.

ද්විධාචක්‍ර, ද්විචක්‍ර = 1. රෝද දෙකක් ඇති.

ද්විධාච්ඡේදිත = 1. දෙකට බෙදුණු. 2. දෙයාකාරයකින් බෙදුණු.

ද්විධාවක්‍ර = 1. වංගු දෙකක් ඇති.

ද්විපත්‍රපුෂ්පික = 1. මල් පෙති දෙකකින් යුත්.

ද්විපද = 1. පා යුවලකින් යුත්.

ද්විපදයා = 1. පා දෙකක් ඇත්තා.

ද්විපයා = 1. දෙවරක් බොන්නා; 2. ඇතා; අලියා.

ද්විපර්ණි = 1. දෙකට බෙදුන. 2. කොළ දෙකක් ඇති.

ද්විපා, ද්විපාද = 1. පා දෙකක් ඇති.

ද්විපාදුත්තමයා = 1. පාද දෙකෝ සතුන්ගේ (මිනිසුන්ගේ) ප්‍රධානයා; බුදුන් වහන්සේ.

ද්විපායී, ද්විපායින් = 1. අලියා. 2. දෙවරක් බොන්නා.

ද්විපුරුෂතාව = 1. පුරුෂයන් දෙදෙනෙකු ඇතිබව.

ද්විප්‍රකාර = 1. දෙයාකාර.

ද්විභාෂා = 1. භාෂාදෙක.

ද්විභූමක = 1. මහල් දෙකක් ඇති.

ද්විමාස = 1. මාස දෙකකට වරක් සිද්ධවන. 2. මාසදෙක.

ද්විමුඛයා = 1. කට දෙකක් ඇති සතා; සර්පයා.

ද්විමූර්ධ = 1. හිස් දෙකක් ඇති.

ද්විමූලක = 1. මුල් දෙකක් ඇති.

ද්විරදකර = 1. හොඬවැල.

ද්විරද = 1. ලොකු දත් දෙකක් ඇත්තා; ඇතා.

ද්විරසනා = 1. දිව් දෙකක් ඇත්තා; සර්පයා.

ද්විරසඥ = 1. දිව් දෙකකින් රස විඳින්නා; සර්පයා.

ද්විරූප = 1. රූප දෙකකින් යුත්.

ද්විරේඵයා = 1. බඹරා.

ද්විලිංග = 1. ලිංග දෙකක් ඇති.

ද්විලිංග වාචකය = 1. ලිංග දෙකකටම අයිති.

ද්විවර්ණක = 1. පාට දෙකක් ඇති.

ද්විවර්ණජනක = 1. පාට දෙකක් උපදවන.

ද්විවර්ෂජීවී = 1. අවුරුදු දෙකක් පවතින.

ද්විවාචක = 1. දෙකක් ප්‍රකාශ කරන.

ද්විවිධ = 1. දෙයාකාර.

ද්විවිවාහය = 1. නීතියට විරුද්ධව දෙදෙනකු කසාද බැඳීම.

ද්විබීජ = 1. බීජ දෙකක් ඇති.

ද්විසප්තාහය = 1. සුමාන දෙක; සති දෙක.

ද්විසමත්‍රිභුජය = 1. එක හා සමාන පැති දෙකක් ඇති ත්‍රිකෝණය.

ද්විසහස්‍රාක්ෂයා = 1. ඇස් දෙදහසක් ඇත්තා. 2. නාගයන්ගේ රජා. 3. ඉන්ද්‍ර දෙවියා.

ද්විශඵ = 1. බෙදුණු කුරය.

ද්විශීර්ෂක = 1. හිස් දෙකක් ඇති.

ද්විශීර්ෂකයා = 1. හිස් දෙකක් ඇත්තා; අග්නි දෙවියා.

ද්විෂතා = 1. සතුරා.

ද්වීප, ද්වීපය = 1. දූපත. 2. දිවයින. 3. දිවිහම.

ද්වීපචක්‍රවර්ති = 1. දිවයිනෙහි ආඥා චක්‍රය පවත්වන.

ද්වීපියා = 1. දූපතක ජීවත් වෙන්නා. 2. දිවියා.

ද්විසූචී = 1. උල් දෙකක් ඇති.

ද්විහේතුක = 1. හේතු දෙකක් ඇති.

ද්වෛගතී = 1. ගති දෙකක් ඇති.

ද්වෛධා = 1. දෙයාකාර.

ද්වේෂ = 1. ක්‍රෝධය. 2. නරක.

ද්වේෂතාව, ද්වේෂය = 1. වෛරය.

ද්වේෂී = 1. වෛර කරන්නා.

ද්වේෂ්‍ය = 1. වෛෂ කටයුතු.

ද්වෛධ = 1. දෙයාකාර.

ද්වෛධීකරණය = 1. දෙකට බෙදීම.

ද්ව්‍යංශ = 1. දෙපට්ටම්. 2. දෙපැත්තට බෙදුණු.

ද්ව්‍යක්ෂර = 1. අකුරු දෙකක් ඇති.

ද්ව්‍යර්ථ = 1. තේරුම් දෙකක් ඇති; අර්ථ දෙකකින් යුක්තවූ.

ද්ව්‍යර්ථවාචකය = 1. අර්ථ දෙකක් ඇති කියමන.

ද්ව්‍යාකාර = 1. දෙයාකාර.

ධ

ධංසිත = 1. ගැලවුණු දෙය. 2. නැසෙන ලද්ද.

ධජ, ධජය = 1. කොඩිය. 2. ලකුණ.

ධජාහෘතා = 1. රටවල් ජයගෙන බලහත්කාර ගෙන් අල්ලා ගෙනවුත් භාර්යාව කරගත් ස්ත්‍රිය.

ධජාග්‍ර = 1. කොඩි මුදුන.

ධජග්ග = 1. (යුධ සේනාදියට අයත්) කොඩියේ මුදුන. 2. පිරිත් සූත්‍රයක්.

ධජධරයා, ධජධාරියා = 1. කොඩිය උසුලන්නා.

ධජපතාක = 1. කොඩි. 2. කොඩි වෙසෙසක්,

ධජාහට = 1. යුධයකදී අල්වා ගෙනෙන ලද.

ධඤ්ඤ = 1. කල පිනැති. 2. ධාන්‍ය.

ධඤ්ඤකරණ = 1. කමත.

ධටය = 1. තරාදිය. 2. තුලා රාශිය.

ධටිය, ධටිනිය = 1 පරණ රෙදිකඩ. 2. දිය ලණුව.

ධන = 1. ධනය; වස්තුව. (රන්-රිදී ආදිය) 2. ශ්‍රද්ධා, ශීල, හිරි, ඔතප්, ශ්‍රැත, ත්‍යාග, ප්‍රඥා යන සප්ත ආර්‍ය ධනය.

ධනඅධිප =1. ධනයට අධිපතියා. 2. වෛශ්‍රවණ.

ධනඅර්ථී = 1. ධනය කැමැති වන.

ධනඊශ්වර = 1. ධනේශ්වර. 2. ධනයට අධිපති; වෛශ්‍රවණ.

ධනක්කීත = 1 මිලයට ගත් වහලා.

ධනක්ෂය = 1. ධනය පිරිහීම.

ධනගර්විත = 1. වස්තුව ගැන උඩඟු වීම.

ධනඤ්ජය = 1. ගින්න.

ධනඤ්ජයා = 1. ගිනි දෙවියා. 2. අර්ජුන. 3. නාගයා.

ධනද = 1 ත්‍යාගවන්ත. 2. ධනය දෙන. 3. වෛශ්‍රවණයා.

ධනදණ්ඩනය = 1. දඩය. 2. දඩුවම් වශයෙන් වස්තුව ගැනීම.

ධනදර්පය = 1. වස්තුව ගැන උඩඟුවීම.

ධනදාක්ෂිය = 1. කුවේරයාගේ ඇස. 2. කුඹුරු ඇටය.

ධනදානුචර = 1. කුවේරයාගේ පිරිස. (ධනද + අනුචර)

ධනදානුජයා = 1. කුවේරයාගේ බාල සොහොයුරා-රාවණා රජ.

ධනදේවියෝ = 1. කුවේරයා-වස්තුවට අධිපති දෙවියා

ධනධාන්‍ය = 1. රන්, රිදී, මුතු, මැණික් ආදි වස්තු සහ වී මුං ආදි ධාන්‍ය.

ධනධාර = 1. වස්තුව නමැති වැස්ස.

ධනධාරී = 1. වස්තුව උසුලා සිටින්නා; පොළොව.

ධනපති, ධනපතියා, ධනාධිප = 1. කුවේරයා. 2. වස්තු කාරයා; ධනවතා.

ධනවන්තයා = 1. පොහොසතා; ධනපතියා.

ධනවිචාරය = 1. වස්තුව බලෙන් ගැනීම.

ධනසම්පත්තිය = 1. වස්තුව නමැති සැපත.

ධනසර්ප = 1. නිධානයක් රකින (සර්පයා) නයා.

ධනවෘෂ්ටි = 1. ධනය නමැති වැස්ස.

ධනස්වාමි = 1. ධන ස්වාමියා.

ධනසඤ්චයය = 1. වස්තු රාශිය.

ධනහරී = 1. සුවඳ වර්ගයක්.

ධන්වන්තරී = 1. එනම් ඍෂිවරයා (මෙතුමා ආයුර්වේදයෙහි ආදි කර්තෘවරයාය.)

ධනික = 1. ධනවතා. 2. ණයහිමියා. 3. භක්ති වන්ත. 4. උතුම්.

ධනී = 1. ධනවතා. 2. ධ්වනිය; නාදය.

ධනාධිපතියා = 1. වස්තු හිමියා,

ධනාර්ථී = 1. වස්තුව ඇත්තා

ධනාශාව = 1. වස්තුවට ඇති ආශාව.

ධනිකයා = 1. ස්වාමිපුරුෂයා. 2. ණයහිමියා. 3. ධනවතා.

ධනිකාව = 1. තරුණී. 2. යහපත් ස්ත්‍රී.

ධනිත = 1. ශබ්ද නගා කියන මහාප්‍රාණ (අක්ෂරය.)

ධනිෂ්ඨාව = 1. දෙනට නැකත-විසිහතර වැනි චන්ද්‍රසංඝාතය.

ධනී = 1 වස්තුකාරයා. 2. පොහොසතා

ධනීය, ධනීයක = 1. පොහොසත්. 2. භක්ති වන්ත. 3. උතුම්.

ධනු = 1. දුනු.

ධනුරාශිය = 1. ධනු ලග්නය; එනම් රාශිය.

ධනුර්ගුණය = 1. දුන්නේ ලනුව; දුනුදිය.

ධනුර්ධරයා = 1. දුනුවායා. 2. වැද්දා. 3. ධනු-රාශිය. 4. දුන්න දරන්නා.

ධනුර්දණ්ඩ = 1. දුනුලීය.

ධනුව = 1. දුන්න.

ධනුසත, ධනුශිල්පය, ධනුෂ්කර්මය = 1. දුනු විදීමේ ශිල්පය.

ධනුස් = 1. දුන්න. 2. දුනුවායා.

ධනුරාශි = 1. එනම් රාශිය.

ධන්‍ය = 1. ධනයට හිත, 2. පින්වත් 3. පැසසිය යුතු.

ධනුර්වේදය = 1. දුන්නෙන් විදීමේ ශාස්ත්‍රය.

ධනේශ = (ධනේශ්වර) 1. ධනයට අධිපතියා. 2. කුවේරයා.

ධනේශදිශ = 1. උතුරු දිග.

ධමක = 1. පිඹින්නා.

ධනෝපාර්ජනය = 1. වස්තුව සැපයීම.

ධමන = 1. නපුරු 2. කර්කශ. 3. කෲර. 4. පිඹීම.

ධමනාඤ්ඤසිර = 1. පිඹින නලය; නලාව.

ධමනි = 1. නහර. 2. නාඩිය.

ධම්ම = 1. බුඩ ධර්මය. 2. ඥානය. 3. යුක්තිය. 4. ස්වභාව. 5. සත්‍යය. 6. හේතුව. 7. ගුණය.

ධම්ම කම්ම = 1. නිවැරදි ක්‍රියාව.

ධම්මකරක = 1. පැන්පෙරහන.

ධම්මකාම = 1. යුක්ති ධර්මය කැමති.

ධම්මකාය = 1. ධර්මශරීරය. 2. ධර්ම සමූහය.

ධම්මචක්කාශ = 1. ධර්ම සමූහය. 2. දම්සක් පැවතුම් සූත්‍රය.

ධම්මචක්ඛු = 1. දහම් නමැති ඇස.

ධම්මචාරී = 1. ධර්මයෙහි හැසිරෙන්නා.

ධම්මජීවී = 1. ධාර්මික සේ ජීවත්වන්නා.

ධම්මභාණ්ඩාගාරික = 1. ධර්මය සම්පූර්ණයෙන් දරන්නා; ආනන්ද මහරහතන් වහන්සේගේ තනතුර.

ධම්මරාජ = 1. බුදුහාමුදුරුවෝ. 2. යමරජ.

ධම්මස්සාමී 1. බුදුහාමුදුරුවෝ.

ධම්මසේනාපති = 1. ආනන්‍ද හාමුදුරුවෝ.

ධම්මසභා = 1. ධර්මය ගැන කථාකරන සභාව; දම්සබා මණ්ඩපය.

ධම්මිල්ලය = 1 සැරසූ කොණ්ඩය. 2. කේශය.

ධර = 1. අල්ලා සිටින. 2. අයිතිව තිබෙන. 3. දරණ.

ධරණී = 1. පොළොව.

ධරණීධර = 1. පර්වතය.

ධරණීධරයා, ධරාධරයා = 1. පොළොව උසුලා සිටින්නා. 2. විෂ්ණු. 3. අනන්ත නම් නාගරාජයා. 4. ඉබ්බා.

ධරණීතල = 1. පොළෝතලය.

ධරණීපාල = 1. රජ.

ධරණී = 1. භූමිය. 2. පොළොව.

ධරණීශ්වර = 1. රජ.

ධරණීපූරය = 1. පොළවේ වැව; සාගරය.

ධරණීසුතාව = 1. පොළවේ දූව - සීතා.

ධරණීශ්වරයා = 1. පොළවට අධිපතියා - රජ.

ධරමාන = 1. ජීවත්ව සිටින්නා; ජීවමාන.

ධරා = 1. පොළොව.

ධරාධර = 1. පර්වතය.

ධරාත්මජයා = 1. අඟහරුවා.

ධරිත්‍රී, ධරාත්‍රී, ධරිත්‍රි = 1. පොළොව.

ධරුණය = 1. ස්වර්ගය. 2. වතුර. 3. පිළිසිඳ ගැනීම.

ධරුණයා = 1. බ්‍රහ්ම දෙවියා 2. බ්‍රහ්මයා.

ධර්ම = 1. සත්‍යය. 2. ආත්මය. 3. නීතියවූ. 4. ප්‍රඥව. 5. සුචරිතය. 6. බුඩභාෂිතය. 7. ආයඹිමාගීය. 8. කුසලය. 9. අකුසලය. 10. යමයා. 11. ස්වාභාව

ධර්මඅගාරය = 1. පොත්ගුල. 2. බණපොත් තබන ගෙය.

ධර්මඅධිකරණ = 1. යුක්තිය විසඳන විනිශ්චය

ධර්මඅධ්‍යක්ෂ = 1. විනිශ්චයකාරයා.

ධර්මඅනුකූල = 1. ධර්මයට අනුව පැවතෙන; ධර්මයට එකඟවූ.

ධර්මකථික = 1. දහම් දෙසන්නා.

ධර්මකාය = 1. ධර්මය නමැති ශරීරය.

ධර්මක්ෂේත්‍ර = 1. කුරු රට.

ධර්මගරුක = 1. ධර්මයට ගරුකරන.

ධර්මධ්වජ = 1. ධර්මය කොඩිය කොට ඇති.

ධර්මගුණය = 1. සුචරිතය.

ධර්මචක්‍රය = 1. ධර්මසමූහය

ධර්මචය්‍යා = 1 ධර්මයෙහි හැසිරීම.

ධර්මචාරිණී = 1. ධර්මයෙහි හැසිරෙන්නී.

ධර්මපර = 1. භක්තිවන්තන.

ධර්මපාල = 1. ධර්මය රක්‍ෂා කරන්නා. 2. අනගාරික ධර්මපාල නම් සිංහල වීරයා.

ධර්මප්‍රතිවේධය = 1. මනාකොට ධර්මය දැනීම.

ධර්මප්‍රදීප = 1. ධර්මය නමැති පහන.

ධර්මභාණ්ඩාගාරය = 1. ධර්මය එකතුකර තැබීම; ධර්මය නමැති බඩු ගබඩාව.

ධර්මය = 1. බුදුහාමුදුරුවන්ගේ ඉගැන්වීම. 2. බුද්ධධර්මය. 3. සාධාරණකම. 4. සුචරිතය.

ධර්මයා = 1. සාධාරණ අය. 2. යමරජ. 3. යහපත් ගතිය.

ධර්මරක්න ලක්ෂ්මණ් පහන් ගත්‍රා ත්‍රමා = 1. අභිධර්මයෙහි විශාරදයෙකි. බෞද්ධ පණ්ඩිතයෙකි. ව්‍යක්ත දේශකයෙකි. පත්‍රකර්තෘවරයෙකි.

ධර්මරත්නය = 1. ධර්මය නමැති මැණික. 2. බුදුන්වහන්සේගේ ඉගැන්වීම් නමැති මැණික.

ධර්මරජ්ජුරු = 1. දැහැමි රජ.

ධර්මරාජ = 1. සාධාරණ රජ. 2. බුදුහාමුදුරුවෝ. 3. යමරජ.

ධර්මරාජන් = 1. බුදුරජ.

ධර්මරාජ්‍යය = 1. ධර්මය නමැති රාජ්‍යය.

ධර්මරුචි = 1. එනම් භික්‍ෂුනිකාය.

ධර්මවත් = 1. සාධාරණ. 2. යහපත් 3. භක්ති මත්ත. 4. ධාර්මික.

ධර්මවාදි = 1. ධර්මය කියන.

ධර්ම විතර්කණය = 1. ආගම් වාදය.

ධර්ම විනය = 1. භික්‍ෂූන්ගේ හැසිරීම ගැන ඇති බුද්ධ දේශනාව.

ධර්මවේදි = 1. ධර්මය උගන්වන්නා. 2. ධර්මය දන්නා.

ධර්මවියෝග = 1. ධර්මයෙන් වෙන්වීම.

ධර්මව්‍යාඛ්‍යාන = 1. ධර්මය විස්තර කිරීම; බණකීම.

ධර්මශරීර = 1. ධර්මය නමැති ශරීරය.

ධර්මශාස්ත්‍ර = 1. ධර්මය හා ශාස්ත්‍රය. 2. ධර්මය උගන්වන ග්‍රන්ථ.

ධර්මශ්‍රවණය = 1. බණ ඇසීම.

ධර්මසංගායනාව = 1. සම්බුද්ධ ධර්ම පර්‍යායය. 2. ධර්මයට ඇතුලත් වූ වෛතුල්‍ය මතයන් බැහැරකරලීම සඳහා කරන සාකච්ඡාව.

ධර්මස්කන්ධය = 1. මුළු බුදුදහම.

ධර්මසභාව = 1. ධර්මය ඇසීමට එක්වූ සභාව.

ධර්මස්වාමි = 1. බුදුරජ.

ධර්මශාලාව = 1. බණමඩුව. 2. තඩුශාලාව. 3. අසරණ නිවාසය.

ධර්මශාස්ත්‍රය = 1. බුද්ධධර්ම ශාස්ත්‍රය. 2. නීති ශාස්ත්‍රය.

ධර්මශික්‍ෂකයා = 1. ධර්මය උගන්වන්නා. 2. ආගම උගන්වන්නා.

ධර්මශික්‍ෂාව = 1. ධර්මය ඉගැන්වීම. 2. බණ ඉගැන්වීම.

ධර්මශීල = 1. ධර්මිෂ්ඨ; යහපත්. 2. ධර්මයෙහි හැසිරෙන.

ධර්මාචාර්යයා = 1. ධර්මය ඉගැන්වීමේ ගුරුවරයා. 2. ආගම උගන්වන්නා

ධර්මාන්විත = 1. ධර්මයෙන් යුක්තවූ. 2. ධර්මානුකූලවූ.

ධර්මානුකූල - ධර්මානුගත = 1. ධර්මයට එකඟ; ධර්මාන්විත

ධර්මානුසාරය = 1. ධර්මයට එකතු බව. 2. ධර්මයට එකඟ.

ධර්මාධර්ම = 1. යුතු අයුතු. 2. ධර්මය හා අධර්මය.

ධර්මාධිකරණය = 1. ධර්මය විසඳන සභාව. 2. යුක්තිය පසිඳලීම; නඩු විසඳීම.

ධර්මාධිෂ්ඨාන = 1. ධර්මය අනුව ප්‍රාණිතාව.

ධර්මාධිපති = 1. බුදුරජ.

ධර්මාධිරාජවූ = 1. ධර්මයට සක්විති රජවූ; බුදුන් වහන්සේ.

ධර්මාධ්‍යක්‍ෂ = 1. ධර්මයට අනුව නඩු විසඳන්නා

ධර්මාභියෝගය = 1 ධර්මයෙහි හැසිරීම.

ධර්මාභිසමය = 1. ධර්මාවබෝධය.

ධර්මායතන = 1. ධර්ම නමැති ආයතනය.

ධර්මාරාම නාහිමි = 1. රත්මලානේ ශ්‍රී ධර්මාරාම නායක සවාමින්ද්‍රයෝ (විද්‍යාලංකාර පිරිවෙනෙහි ආදි කර්තෘවරයාවූ මුන්වහන්සේ සංස්කෘත භාෂාවෙහි විශාරදයෙකි. මහා ප්‍රාඥයෙකි ග්‍රන්ථ රාශියක් කලසේක.)

ධර්මාලම්බන = 1 ධර්මය නමැති අරමුණ.

ධර්මාමෘතය = 1. ධර්මය නමැති දිව්‍ය ආහාරය.

ධර්මාසනය = 1. දේශනාකිරීමේ ආසනය. 2. රජුගේ සිංහාසනය.

ධර්මික - ධාර්මික = 1. ධර්මයට අයිති. 2. සුචරිතයෙහි යෙදුනු.

ධර්මිෂ්ට = 1. සුචරිත. 2. යුතු.

ධර්මි = 1 ධර්මය ඇති.

ධර්මය = 1. සත්‍යය. 2 යුතුකම.

ධර්ෂිණී - ධර්ෂිතාව = 1. වංක ස්ත්‍රී. 2 සල්ලාල ස්ත්‍රී.

ධව = 1. කිහිරි ගස. 2. මනුෂ්‍යයා. 3. හොරා. 4. සවාමි පුරුෂයා.

ධවල = 1. සුදු. 2. ලස්සණ. 3. යහපත්.

ධවලච්ඡත්‍රය - ධවලාතපත්‍රය = 1 සුදුකුඩය; සේසත.

ධවලපක්ෂ = 1. චන්ද්‍රයාගේ එළිය වැඩිවෙන කාලය - පූර්වපක්ෂය; අමාවක් දිනසිට පසළොවක දිනය දක්වා ඇති කාලය.

ධවලකඩු = 1. කඩු වර්ගයක්.

ධවලාව = 1 සුදු එළදෙන.

ධවලෝත්පල = 1. සුදු මානෙල් මල්.

ධ්වජය = 1. කොඩිය. 2. ලකුණ.

ධ්වජපතාකය = 1. තුත්හුලස් කොඩි.

ධ්වජධාරියා = 1. කොඩිය ගෙනයන්නා.

ධ්වජ භඞ්ග = 1. නෂ්ට කාම රෝග විශේෂයක්.

ධ්වනිත - ධ්වනිතය = 1. ශබ්දය. 2. ශබ්දකර කියන අකුර.

ධ්වනිය = 1. නාදය. 2. ඝෝංකාරය.

ධ්වනි නාලය = 1. නලාව.

ධ්වනි වීණා = 1. වීණා වර්ගයක්.

ධ්වස්ත = 1. වැටුණු. 2. නැතිවුණු 3. නැසුණ.

ධ්වාන්ත = 1. කළුවර බව; අඳුර

ධ්වාන්තාරි = 1. ඉර. 2. හඳ. 3. ගින්න. (අඳුරෙහි හතුරා.)

ධා

ධානා = 1. බැදපු ධාන්‍ය - විලඳ.

ධානිය = 1. ගබඩාව; ධාන්‍ය ගබඩාව. 2. ගෙපළ.

ධානී = 1. පොහොසතා; ධනපතියා.

ධාන්‍ය = 1. වී ආදී ඇටවර්ග.

ධාන්‍යක = 1. කොත්තමල්ලි.

ධාන්‍යකෝෂ්ටකය - ධාන්‍යාගාරය = 1. ධාන්‍ය ගෙය. 2. වී කොටුව; වී අටුව.

ධාන්‍ය මාෂක = 1 ධාන්‍ය මනින්නා.

ධාන්‍යමය = 1. ධාන්‍යයෙන්ම සෑදූ.

ධාන්‍ය විකෘති = 1 ධාන්‍යයෙන් සෑදූ භෝජනය.

ධාන්‍ය ශීර්ෂකය = 1. ධාන්‍ය කරල.

ධාන්‍ය ශීර්ෂකාකාර = 1. ධාන්‍ය කරලක හැඩහුරුකම ඇති.

ධා ගබ් = 1. ධාතු ගර්භය.

ධාන්‍යාම්ල = 1. ඇඹුල් කැඳ. 2. කාඩි.

ධාන්‍යෝත්තම = 1. උත්තම ධාන්‍ය; හැල් වී

ධාතා - ධාතෘ = 1. දරන්නා. 2. උපුලායන්නා. 3. බ්‍රහමයා. 4. විෂ්ණුදෙවි.

ධාතු = 1. මූලික ද්‍රව්‍ය. 2 පඨවි, අප්, තේජස්, වායු යන සතර. 3. බුධාදීන්ගේ ධාතු.

ධාතුකරඬුව, ධාතුසමුද්ගය, ධාතුපෙළප්පුව = 1. ධාතු දමන භාජනය.

ධාතු අන්තර්ධානය = 1. ධාතු පරිනිර්වාණය.

ධාතුගර්භය - ධාතුඝර = 1. දාගැබ; ධාතු නිදන්කල තැන.

ධාතුගුණය = 1. ධාතුන්ගේ පැවැත්ම.

ධාතු නිධානය = 1. දාගැබ් ආදියෙහි ධාතු තැන්පත් කිරීම.

ධාතුපය = 1. ආහාර පෝෂ්‍යයට ආධාර කරන ශරීරයේ දියර.

ධාතු ප්‍රාතිහාර්‍ය = 1. ධාතුන්ගේ විස්මකම් දක්වීම; ධාතු ආස්චර්ය පෑම.

ධාතු මන්දිරය = 1. ධාතු තබන ගෙය. 2. සර්වඥ ධාතු ආදිය තැන්පත්කළ ගෘහය.

ධාතු පරිනිර්වාණ = 1. සර්වඥ ධාතු ලෝකයෙන් නැතිවීම.

ධාතු පූජා = 1. සර්වඥ ධාතූන් වහන්සේලාට කරන පූජාව.

ධාතු වාද = 1. සිවු සැට කලාවන්ගෙන් එකක්.

ධාතු විද්‍යාව = 1. ධාතූන් ගැන උගන්වන ශාස්ත්‍රය.

ධාතු විශෝධනය = 1. ධාතු වෙන් කිරීම; ධාතු වෙන් වීම.

ධාත්‍රී = 1. කිරි මව.

ධාතා = 1. පියා. 2. බ්‍රහ්මයා. 3. විෂ්ණු.

ධාම නිධිය = 1. එළිය භාණ්ඩාගාරය. 2. ආලෝකයෙහි නිධානය; සූර්යයා.

ධාමය = 1. ශරීරය. 2. රශ්මිය. 3. ගෙය. 4 උඩගුකම.

ධාමවත් = 1. දීප්තිමත් 2. උතුම්. 3. ඉතා හොඳ.

ධාරක = 1. දරන්නා.

ධාරණ = 1. උසුලන. 2. දරන 3 සිහිකරන. 4. දැරීම. 5. පාඩම් තබා ගැනීම.

ධාරණ ශක්තිය = 1. මතක තබා ගැනීමේ ශක්තිය. (කට පාඩම් කිරීම.)

ධෘත රාෂ්ට්‍ර = 1 හතරවරම් දෙවියන්ගෙන් කෙනෙක්.

ධාර්මික = 1. ජනපයා. 2. දැහැමි.

ධාර්මිකාපණ්ණක = 1. දැහැමි වෙළෙන්දා.

ධාර්ය = 1. ඉසිලිය යුතු. 2. අඩංගුවිය යුතු.

ධාරා = 1. වැස්සීම. 2. තද වැස්ස. 3. වතුර ගැලීම. 4. මුවාත. 5. වැල නොකැඩී වැටෙන වතුර ආදිය. 6. අසුගේ ගමන් වෙසෙසක්.

ධාරා ධර = 1. වැසි වලාකුළ. 2. කඩුව.

ධාරා කදම්බ = 1. වශ්‍රාව.

ධාරා නැඟීම = 1. මුවාත් තැබීම.

ධාරානිපාතය = 1. තද වශ්‍රාව; මොර සූරන වැස්ස.

ධාරි = 1. දරණ. 2. උසුලන. 3. ඇතුළත්වන; අඩංගුවන.

ධාරී = 1. දරන්නා. 2. තුන් පිටකය පාඩම් ඇත්තා

ධාවක = 1. දුවන්නා.

ධාවනය = 1. දිවීම. 2. පිරිසිදු කිරීම. 3 ගලා යෑම.

ධැරීම = 1. දැරීම. 2. ඉසිලීම.

ධැමි = 1. ධාර්මික.

ධැරූ = 1. දැරූ.

ධි – ධී

ධික් = 1. නින්දිත 2. නින්දා කිරීම; අවමන් කිරීම.

ධික්කාර = 1. හෙළා දැකීම. 2. අවතම්බු කිරීම.

ධික්කත = 1. නින්දිත වූ.

ධිග් = 1. නින්දාව. 2. හෙළාදැකීම.

ධිග් දණ්ඩ = 1. නින්දා කිරීම නමැති දඬුවම.

ධිති = 1. උත්සාහය. 2. දැරීම. 3. ධෛර්යය.

ධිෂණයා = 1. ගුරුවරයා. 2. වෘහස්පති.

ධිෂණාව = 1. ඥාන ශක්තිය.

ධිෂ්ණ්‍යපතියා = 1. තාරකා ස්වාමියා; හඳ.

ධිෂ්ණ්‍යය = 1. තාරකාව. 2. ගින්න. 3. බලය.

ධී = 1. නුවණ. 2. බුද්ධිය. 3. ප්‍රඥාව.

ධීතලිකා = 1. බෝනික්කා.

ධීන්ද්‍රිය = 1. බුද්ධි ඉන්ද්‍රිය.

ධීතු - ධීතෘව = 1. දුව; දුහිතෘව.

ධීමන්ත, ධීමාන් = 1. නුවණැත්තා. 2. වෘහස් පති. 3. පණ්ඩිතයා.

ධීමත් = 1. බුද්ධිමත්. 2. උගත්. 3. පණ්ඩිත.

ධීර = 1. පරාක්‍රමය ඇති. 2. නුවණ ඇති. 3. පණ්ඩිත. 4. බලවත්. 5. වීර්‍යවත්; උත්සාහ වන්ත. 6. ස්ථිර.

ධීර ගෝචර = 1. ධීරයන්ට විෂය වූ.

ධීරතා = 1. ස්ථිර භාවය.

ධීර පුරුෂයා = 1. වීර්‍යවන්ත පුද්ගලයා. 2. උත්සාහ වන්තයා.

ධීර සාර ව = 1. වීර්‍යවත්.

ධීරාව = 1. කහ.

ධීවර = 1. මුහුදු පිළිබඳ. 2. මත්ස්‍යයන් පිළිබඳ. 3. මසුන් මරන්නා.

ධීවරකා = 1. මසුන් මරන්නා.

ධීවර කර්මාන්තය = 1. මසුන් මැරීම. 2. මසුන් මැරීමේ රැකියාව.

ධීවරීය = 1. මස් මරන හෙල්ල. 2. මිස්පොල්ල?

ධු

ධුත් = 1. ධූතියා

ධුත = 1. සැලෙන ලද. 2. ඉවත් කළ. 3. කම්පාකළ. 4. කෙලෙස්නැසූ ආයසීයා. 5. කෙලෙස් නසන ධර්මය.

ධුතඞ්ග = 1. කෙලෙසුන් යටපත් කිරීම සඳහා පිළිපදින ව්‍රතය.

ධුත්ත = 1. සූදු කෙළින්නා. 2. කක්කඩියා.

ධුනු = 1. සෙලවෙන. 2. අත්හැරපු.

ධුතු ගුණය = 1. තමන්ගේ සැපයට වඩා අනුන්ගේ යහපත ගැන සලකන්නා වූ.

ධුතාංග = 1. කෙලෙස් නැසීමට උවහල්වන අංගය. 2, කෙලෙස් නැසුවහුගේ අංගය.

ධුර = 1. බර. 2. නිලය. 3. කළයුතු දෙය. 4. දුරිය යුක්ත. 5. කරත්තයේ වියගස.

ධුරන්ධර = 1. බර ගෙන යන. 2. නිලය දරණ. 3. තනතුර දරණ.

ධුරීණ = 1. ධුරය දරන. 2. බර ගෙන යන.

ධුර වහන = 1. වියගස ඉසිලීම. 2. බර ඉසිලීම. 3. වගකීම.

ධුර විහාර = 1. සමීප විහාරය.

ධ්‍රුව = 1. නියම. 2. ස්ථිර. 3. නිවන. 4. නිත්‍ය වූ. 5. ඒකාන්ත වූ.

ධ්‍රුවං = 1. ඒකාන්තයෙන්. 2. නිතර.

ධූ

ධූත = 1. සෙලවුණ. 2. අත්හැරපු. 3. විමසන ලද.

ධූනනය = 1 සෙලවීම. 2. වෙවුලුම.

ධූප = 1. දුම. 2. දුම්මල 3. සුවඳ දුම.

ධූපන = 1. තෙලින් බැදීම. 2. හෙම්පරාදු කිරීම. 3. සුවඳ දුම් දීම.

ධූප මාන = 1. සුවඳ දුම් දීම.

ධූපි කාව = 1. මීදුම.

ධූපිත = 1. දුම් ගැස් වූ. 2. තැවූ 3. තෙල් දමා බදින ලද.

ධූම = 1. දුම.

ධූම කේතු = 1. වල්ගා තරුව.

ධූම ග්‍රහ = 1. රාහු ග්‍රහයා.

ධූම ජාල = 1. දුම් රැස.

ධූම ධ්වජය = 1. දුම් කොඩිය; ගින්න. 2. දුම් කෙනෙලිය?

ධූම මහිෂී = 1. මීදුම.

ධූම මානක යන්ත්‍රය = 1. දුම් මනින යන්ත්‍රය.

ධූම මාලිම ශිල්පය = 1 දුම් නැව් ශිල්පය.

ධූම යෝනි = 1. වලාකුළ.

ධූම රථය = 1. දුම්රිය; දුම් කෝච්චිය.

ධූමල = 1. රත්නිල් 2. දම්පාට.

ධූම ශිඛාව = 1. ගිනිදැල්ල. 2. ගින්න. 3. නාග රාජයකු ගේ නම.

ධූමි කාව = 1. දූමාරය.

ධූම්‍යාට = 1. නීල කොබෙයියා.

ධූමෝර්ණා = 1. යමරජු ගේ භාර්යාව.

ධූම්‍යාව = 1. දුම් රාශිය. 2. දූමාරය.

ධූම්‍ර = 1. දම්පාට. 2. දුඹුරු පාට. 3. රත්, නිල් පාට.

ධූර්ය = 1. හෙල්ලීම. 2. ඒරිය කද. 3. බර. 4. තනතුර.

ධූර්ජට = 1. සිව දෙවියා; ඊශ්වරයා.

ධූර්ත = 1. දුශ්චරිත. 2. කැකගති ඇති. 3. කපටි. 4. සූදුකාරයා. 5. බේබද්දා.

ධූතීක = 1 සිවලා. 2. කක්කඩියා.

ධූතී මණ්ඩලය = 1. සුරා, සූදු ආදියෙහි ඇලුණු අයගේ සමාගම.

ධූතීකා = 1 සුදුකාරයා. 2. සල්ලාලයා. 3. බෙබද්දා.

ධූර්ධරයා = 1. බර උසුලන්නා. 2. බර ගෙන යන සතා.

ධූලි = 1. දූවිලි. 2. මල් රේණු. 3. ඉතා සියුම් වියලි පස්.

ධූලිධ්වජ = 1. වාතය-හුළඟ.

ධූසර = 1. අළු පාට. 2. මඳ පඬු පැහැය. 3. නො පැහැදුණු. 4. මඳ කසා පැහැය.

ධෘ

ධෘත = 1. අයිති වූ. 2. අඛංගු වූ. 3. පිළිගන්නා ලද. 4. දරණ ලද.

ධෘතරාෂ්ට්‍ර = 1. නාගයා. 2. වරම් දෙවියෙක්. 3. කෞරවවංශයේ රජෙක්. 4. හංසයා.

ධෘති=1. සතුට. 2. දැරීම. 3. ධෛර්යය. 4. යාගය.

ධෘතිමත් = 1. ස්ථිර. 2. සතුටු. 3. වීර්යවත්.

ධෘෂ්ට = 1. ලජ්ජා නැති. 2. ස්ථානයට නුසුදුසු ලෙස හැසිරෙන.

ධෘෂ්ටාව = 1. එක පුරුෂයකු නොපතන ස්ත්‍රී.

ධෙ – ධෛ – ධෝ – ධෞ – ධ්‍ය – ධ්‍රැ

ධේනු = 1. දෙන 2. කිරි පොවන්නිය. 3. තිරිසන්ගත ස්ත්‍රී සත්වයා

ධේනුකාය = 1. කිරි එළදෙනුන් රැසක්.

ධෙය = 1. දැරිය යුතු. 2. පෝෂණය. 3. වැඩීම.

ධෛර්යය = 1. ධීර භාවය. 2. උත්සාහය. 3. නිර්භීත භාවය.

ධෛවත = 1. සප්ත ස්වරයන් ගෙන් එකක්.

ධෝත = 1. පිරිසිදුකල 2. සේදූ.

ධෝතසඞ්ඛ = 1. පිරිසිදු හක්ගෙඩිය.

ධෝරණය = 1. වාහනය. 2. කරත්තය.

ධෝරණයා = 1. ඇත්ගොව්වා.

ධෝවනය = 1. පිරිසිදු කිරීම. 2. ඇපිල්ලීම.

ධෝරය්හ = 1. ධූරය හෝ ප්‍රධානත්වය ඉසිලීමට සමර්ථ වූ.

ධෞත = 1. පිරිසිදුකල. 2. සෝදන ලද.

ධෞත කෞශේය = 1. සුදුකල පටරෙද්ද.

ධෞරිතකය = 1. හැල්මේ යෑම. 2. බලු හැල්ම.

ධෞරේයයා = 1. අශ්වයා. 2. බරගෙනයන්නා. 3 බරගෙනයන සතා

ධ්‍යාන = 1. බලවත් චිත්තෛකාග්‍රතාව. 2 සිත එකඟ කිරීමෙන් ලබන ප්‍රථමාදී ධ්‍යාන සතර. 3. අරමුණ සිතීම. 4. භාවනාව.

ධ්‍යාන අඞ්ග = 1. ධ්‍යානයෙහි ඇතුලත් චෛතසික කොටස්.

ධ්‍යානතත්පර - ධ්‍යානපර - ධ්‍යානමාන = 1. භාවනා සහිත.

ධ්‍යානක්‍රීඩා = 1. ධ්‍යානයන්ට සමවැදීම.

ධ්‍යානලාභී = 1. ධ්‍යාන උපදවා ගත්.

ධ්‍යානරතී = 1. ධ්‍යානයන්හි ඇලීම.

ධ්‍යායී = 1. ධ්‍යාන වඩන.

ධ්‍රාජිය = 1. සැරසුළඟ. 2. සුළි හුළඟ.

ධ්‍රැව = 1. නිත්‍ය. 2. ස්ථිර. 3. නිශ්චල. 4. හක්ගෙඩිය. 5. විෂ්ණුදෙවි. 6. නිවන. 7. අහස.

ධ්‍රැව තාරකාව = 1. පොළොවේ උතුරු කොණෙහි පෙනෙන තරුවක්.

ධ්‍රැව රේඛා = 1. පොළොවේ උතුරු-දකුණු කොන්වල ඇන්ද රේඛා.

ප

ප = 1. දිළිසීම. 2. ගැනීම. 3. ලොකු. 4. අධිපති. 5. බොන්නා යන අරුත්හි. 6. ළදරු.

පංක - පඞ්ක = 1. මඩ. 2. පාපය. 3. කුණු.

පංකජ - පංකේරුහ - පඞ්කජ = 1. මඩෙන් උපන්; නෙළුම්.

පංකජනීය = 1. නෙළුම් පොකුණ.

පංක්තිය - පඞ්ක්තිය = 1. පේළිය 2. පොකුර 3. සමාගම. 4. වර්ගය.

පංඛාදු = 1. බොරු පෙන්වීම. 2. රැස්සණ 3. අනගි; වටිනා.

පංඛාරය = 1. නියර.

පංඛාව - පවංඛාව = 1. පවංගැසීමේ උපකරණයක්; පවන්ගැසීමට යොදගත් සූත්‍රයක්.

පංකිල = 1. ගොහොරු - මඩ වූ

පංගං = 1. නින්දාකිරීම. 2. බැණුම. 3. ගර්හාව.

පංගාඩම = 1. පත්කිරීම. 2. යොදගත් පිළිවෙල. 3. බාරකිරීම. 4. නියමය.

පංගාඩම් කරනවා = 1. පත්කරනවා. 2. බාර දෙනවා.

පංගාර්තුව = 1. සූදානම්වීම. 2. සාදගත් පිළිවෙල. 3. විධානය.

පංගු - පඞ්ගු = 1. කොර 2. අබ්බාගාත. 3. කොටස. 4. කෑම පංගුව.

පංගු කරනවා = 1. බෙදා කොටස් කරනවා.

පංගුතාව = 1. කොරවීසිටීම. 2. අබ්බාගාතකම.

පංගුල = 1. කොර වූ. 2. අත් පා කොර අය.

පංගුජේරුව = 1. තමන්ගේ කොටසට වැඩි නොවන. 2. අනුන්ගේ වැඩට සම්බන්ධ නොවන.

පංගුවේරාල = 1. පරම්පරානුගත ඉඩම් හිමියා.

පංචි = 1. එනම් කැවිලි. 2 එනම් ක්‍රීඩාව

පංචිපාවැඩ = 1. වුවමනා නැති විස්තර වැඩ

පංසු = 1. පස්.

පංසුකූලය = 1. මැරුණු කෙනෙකු නමට සංඝයාට පූදන රෙද්ද.

පංසුකූලිකාංගය = 1. පංසුකූල චීවරයම දැරීම නමැති ධූතාංගය

පංසුජ = 1. මඩෙන් උපන්; නෙළුම් මල.

පක = 1. එළු. 2. පැසුණු එල.

පකත = 1. කරන ලද. 2 සෑදූ.

පකතං = 1. බොහෝසෙයින් කරන ලද.

පක් = 1. පැසුණු ගෙඩිය. 2. ගෙඩිය. 3. කුරුල්ලා. 4. පිසූ.

පක්ෂි = 1. කුරුල්ලා; පක්ෂියා.

පක්තව්‍ය = 1. තැම්බෙන. 2. පැසෙන. 3. ජීර්ණවන.

පක්කුර - පක්කුරෑ = 1. බුලුගස

පක්ව = 1. තැම්බුණු. 2. පැසුණු. 3. ඉදුණු.

පක්වාශ = 1. අශූචි බොක්ක. 2. දිරූ ආහාර තිබෙන බොක්ක.

පක්ෂ = 1. පූර්වපක්ෂය හා අවපක්ෂය. 2. සමූහය. 3. කොටස. 4. ළැදි 5. පිහාටු. 6. පාර්ශ්වය 7. බලය. 8. ගෙය. 9. පැත්තකට අයිති.

පක්ෂඝාත = 1. පැත්තක් පණ නැතිවන වාත රෝගයක්. 2. අංසබාගය.

පක්ෂ ක්‍රමය = 1. පක්ෂ වශයෙන් බෙදී රට පාලනය කිරීම.

පක්ෂග්‍රහණය = 1. පැත්තක් ගැනීම.

පක්ෂච්ඡේද = 1. පිහාටු කැපීම. 2. පැත්තක් කැපීම.

පක්ෂතා = 1. පක්ෂබව. 2. අනුකූලබව. 3. එකඟ බව.

පක්ෂතාලදෙනවා = 1. අත්තටු ගසනවා; පියාපත් ගසනවා.

පක්ෂදින = 1. පක්ෂයෙහි අන්තිම දවස. 2. පොහෝ දවස.

පක්ෂපත්‍රය = 1 අත්තටුව; පියාපත.

පක්ෂපරිමාණය = 1. පක්ෂවාදිකම. 2. පක්ෂපාතකම.

පක්ෂප්‍රසාරණය - පක්ෂප්‍රහාරය = 1. පියාසර කිරීම; පියැඹීම.

පක්ෂසංග්‍රහණය = 1. එක් පක්ෂයක් ගැනීම. 2. පක්ෂයක් අනුව ක්‍රියා කිරීම.

පක්ෂභාගය = 1. පැත්ත. 2. ඇලය.

පක්ෂම = 1. නෙලුම් රේණු. 2. ඇස් පිහාටුව. 3 කුරුලු පිහාටු.

පක්ෂය = 1. පැත්ත. 2. යම් පිරිසක්. 3. පියාපත

පක්ෂවාදී = 1. ළැදි. 2. පක්ෂයක් ගත්. 3. පක්ෂයකට හිතවත්. 4. පක්ෂව කථාකරන.

පක්ෂවාත = 1. පියාපතින් නැගු සුළඟ.

පක්ෂවික්ෂේප = 1. පියාපත් ගැසීම.

පක්ෂී = 1 කුරුල්ලා. 2. පියාපත් ඇත්තා. 3. ලිහිණියා.

පක්ෂිණී = 1. පක්ෂිධේනුව.

පක්ෂිධේනුව = 1. කුරුළු වර්ගයට අයත් ගැණුසතා.

පක්ෂ්ම = 1. ඇස් ගෝලය. 2. ඇසිපිය.

පක්ෂිනිමිතක = 1. පක්ෂීන්ගෙන් ශාස්ත්‍රකීම.

පක්ෂිපංජරය = 1. කුරුළු කූඩුව.

පක්ෂිවිද්‍යාව = 1. පක්ෂිශාස්ත්‍රය; කුරුළු ශාස්ත්‍රය.

පක්ෂිස්වාමියා = 1. කුරුලු නායකයා - ගරුඬයා.

පක්ෂාංගනාව = 1. කිඳුරී.

පක්කඩ = 1. ද්‍රවිඩයන්ගේ මුරුක්කු වෙසෙසක්.

පක්කාපක්ක = 1. පැසුණු, කොපැසුණු ගෙඩි; ලා ගෙඩි හා මේරුගෙඩි.

පකු = 1. ලිහිණියා 2. කුරුල්ලා. 3. පිහාටුව.

පකුල = 1. රළ. 2. මුහුදේ රළ.

පගතිය = 1. පවුල. 2. පංගුව. 3. ඉදිරියට යෑම. 4. ප්‍රගතිය.

පගලි = 1. ඊ දූක්ක.

පගළු = 1. වියලි කිම.

පගාව = 1. අල්ලස. 2. පිට වාසිය

පගෝදියක් = 1. රත්රන් කාසියක්.

පඝණය - පඝණ = 1. වහලකින් යුත් සක්මන් මළුව.

පච = 1. බොරු.

පච - පචන = 1. පිසීම, ඉවීම.

පචක = 1. අරක්කැමියා; පිසින්නා.

පචනය = 1. පැසවීම; ඉවීම.

පචයා = 1. බොරුකාරයා

පචන් - පචඳුර = 1. වෙතිනැල්; වකුමැල්.

පච්ච = 1. කොළපාට. 2. අඹු. 3. මැණික් ගල් වෙසෙසක්.

පච්චක්ඛ = 1. ප්‍රත්‍යක්ෂ වූ. 2. ඇස් ආදී ඉන්ද්‍රිය යන්ට හමුවූ.

පච්චක්ඛාන = 1. දුරු කිරීම. 2. ඉවත් කිරීම. 3. අත්හැරීම.

පච්චකුරුල්ලා = 1. කුරුලු වර්ගයක්.

පච්ච කෙටීම = 1. සායම් වලින් ශරීරයෙහි ස්වරූප ආදිය කෙටීම.

පච්චගල = 1. කොළපාට මැණික්ගල

පච්චන්ත = 1. ප්‍රත්‍යන්තය; පිටිසර.

පච්චය = 1. ප්‍රත්‍යයය; උපකාරය. 2 සිවුරු ආදිය. 3. ප්‍රබන්ධ. 4. හේතුව.

පච්චවඩම් = 1 රතු රෙදි වර්ගයක්.

පච්චවෙක්ඛණ = 1. කල්පනා කිරීම. 2. ධර්මයක් ගැන සිහිකිරීම. 3. බැලීම.

පඤ්චසීනාක්කාරම් = 1. තුන්තත්.

පච්චි පත්ති = 1. පුස්වැත්ත.

පච්චුපකාර = 1. කළ උපකාරයට කරන උපකාරය.

පච්චුපට්ඨාන = 1. යම්කිසි කරුණක් සිතට වැටහෙන ආකාරය.

පච්චෙකමුනි = 1. පසේ බුදුන්වහන්සේ.

පචුර = 1. බොහෝවූ.

පච්ඡන්න = 1. වැසුණු. 2. සැඟවුණු. 3. අප්‍රකට.

පජ්ජෝත = 1. ප්‍රදීපය; පහන.

පච්ඡා = 1. පසුව.

පච්ඡානුතාප = 1. පසුතැවිල්ල.

පච්ඡාමිත්ත = 1. සතුරා; පසමිතුරා.

පච්ඡිම = 1. බස්නාහිර. 2. පස්ස පැත්ත 3. අන්තිම. 4. පසුව ඇති වූ.

පච්ඡිමක = 1. පසුවූ. 2. පස්සෙහි වූ.

පචිත්තිය = 1. ඇවැත් වෙසෙසක්. 2. වරද කළබව කියා සමා කොට ගතයුතු වරද.

පජාපති = 1. එනම් ස්වාමිවරයා. 2. රජු. 3. ශක්‍රයාට දෙවැනි දෙවියෝ. 4. බ්‍රහ්මයා.

පඤ්ච = 1. පස. 2. පසක් වූ.

පඤ්චඅඞ්ග = 1. අංග පසකින් යුක්තවූ. 2. මුල්, කොළ, මල්, ගෙඩි, පොතු යන පස.

පඤ්චක = 1. පස; පසේ සමූහය.

පඤ්චකකුදභාණ්ඩ = 1. රාජ්‍යයේ ලක්ෂණ වූ වල්විදුනාව, තලල්පට, මගුල් කඩුව, සේසත, රන්මිරිවැඩි සඟල යන බඩුපස.

පඤ්චකම් = 1. ශරීරය ශුද්ධකරන ක්‍රියා පස; වමන, විරේචන, නස්‍ය, නිරූහන, අනුවාසන යන පස.

පඤ්චකල්‍යාණ = 1. කේශ, මංස, අස්ථි, ඡවි, වයඃ යන ශරීර ලක්ෂණ පස.

පඤ්චගොපුගය = 1. හිත කිලුටු කරන කරුණු පස.

පඤ්චකාම = 1. ඉන්ද්‍රිය පසෙන් ලබන සැප පස්කම.

පඤ්චකෝෂ්ඨය = 1. පස්කොත් කොටුව.

පඤ්චකෝල = 1. කුළුබඩු පස් වර්ගය (තිප්පිලි, තිප්පිලිමුල්, සිවිය, රත්නිටුල්, සිද්දිගුරු යන පස.)

පඤ්චගති - පඤ්චමහාගති = 1. නැවත උපදින තත්ව පහ.

පඤ්චගව්‍ය = 1. එළදෙනගෙන් ලැබෙන ද්‍රව්‍ය පහ (කිරි, දී, ගිතෙල්,. ගොම හා මූත්‍ර යන පස)

පඤ්චගීතනාද = 1. සංගීත නාද පහ.

පඤ්චගුණ = 1. පස් ගුණයක් වූ.

පඤ්චගෝරස = (පඤ්ච ගව රස) 1. කිරි, දී කිරි ගිතෙල්, මෝරු හා වෙඬරු.

පඤ්ච චණ්ඩාල = 1. පහත් යයි සම්මත කුල පහ.

පඤ්චනාරීඝට = 1. ස්ත්‍රීරූප පසකින් කළයක හැඩහුරු කමට අඳින චිත්‍රය.

පඤ්චනීවරණ = 1. නිවන් මඟ අහුරන කාම ච්ඡන්ද, ව්‍යාපාද, ආදී පස.

පඤ්චනේත්‍ර = 1. මසැස, දිවැස, පැණඇස, බුදුඇස. සමතැස යන බුදුන් වහන්සේගේ ඇස්පහ.

පඤ්ච තන්ත්‍රය = 1. උපාය පහක්. 2. එනම් ග්‍රන්ථය.

පඤ්චතාරවීණාව = 1. තත් පහක වේණාව.

පඤ්චතූර්ය = 1. ආතත, විතත, ආතත විතත, ඝන, ශුෂිර යන අඞ්ග පසකින් යුත් තූර්යය.

පඤ්චදන්ත = 1. දති පහක් ඇති.

පඤ්චදශකෝෂ්ඨය = 1. පහළොස් කොත් කොටුව.

පඤ්චදශය = 1. පහළොව.

පඤ්චදුශ්චරිත = 1. පව්පස. (සතුන් මැරීම, හොරකම, කාමයෙහි වරදවා හැසිරීම, බොරුකීම, හා සුරාපානය.)

පඤ්චද්වාර = 1. දොරටු පහක් ඇති.

පඤ්චධන = 1. ශ්‍රද්ධාව, ශීලය, ශ්‍රැතය, ත්‍යාගය, ප්‍රඥාව යන පස.

පඤ්චපක්ෂි = 1. අ, ඊ, උ, ඒ, ඔ යන පහ හෝ භේරුණ්ඩා, පිංගල, කාක, කුක්කුට හා මයුර යන පස්දෙන.

පඤ්චපත්‍ර = 1. පෙති හෝ කොළ පහක් ඇති.

පඤ්චපද්ම = 1. නෙළුම් පස් වර්ගය.

පඤ්චපර්ණී = 1. කොළ පහකින් යුත්.

පඤ්චපාප = 1. පස් පව්.

පඤ්චපුංකේශර = 1. රේණු පහකින් යුත්.

පඤ්චපූර්වනිමිති = 1. දෙව්ලොවින් මිදෙන දෙවියන් හට ඇතිවන ලකුණු පහ; මල්මාලය පරවීම, සළු කිළුටුවීම, කිසිල්ලෙන් ඩහදිය ගැලීම, ශරීරය දුර්වර්ණ වීම හා ශයනාසනයෙහි නො ඇලීම යන පස.

පඤ්ච ප්‍රකාර = 1. පස් ආකාර.

පඤ්ච ප්‍රධාන = 1. අධිකාර, සෙනෙවිරත්, ඇපා, මාපා, මණ්ඩලික යන පස් දෙන.

පඤ්ච ප්‍රසාද = 1. ප්‍රීති පහ.

පඤ්ච ප්‍රහාන = 1. මිදීම් පහ.

පඤ්ච බල = 1. බල පහ.

පඤ්ච බාණ = 1. ඊ පහ. 2. අනඞ්ගයා. 3. අනඞ්ගයාගේ ඊ ලෙස සැලකෙන පියුම්, හෝපලු, මී අඹ, දෑ සමන්, නිලුපුල් යන මල් පස.

පඤ්ච බුද්ධ =1. කකුසඳ, කෝනාගමන, කාශ්‍යප, ගෞතම යන පස් බුදුන් වහන්සේ හා අනාගතයෙහි ලොව පහළවන මෛත්‍රී බුදුන් වහන්සේ.

පඤ්ච භූත = 1. මූලික ධාතු පහ.

පඤ්චභූමික = 1. පස් මහලක් ඇති.

පඤ්චම = 1. පස්වැනි.

පඤ්ච මධුර මාංස = 1. කඳ මස්. 2. ලමැඩි මස්. 3. අක්මා මස්, අතුණු මස් හා පපු මස් යන රසවත් මස් වර්ග පස.

පඤ්චමධ්‍යානය = 1. භාවනාවේ පස්වැනි තත්වය.

පඤ්ච මහා ගඞ්ගා = 1. දඹදිව පිහිටි ගංගා, යමුනා, අචිරවතී, සරභූ, මහී යන පස් මහ ගංගා.

පඤ්චමහා පරිත්‍යාග = 1. ඇස්, හිස්, මස්, ලේ, අඹුදරුවන් දන්දීම.

පඤ්චමහා පුරුෂයෝග = 1. ග්‍රහයන් එක්වෙන ප්‍රධාන යෝග පහ.

පඤ්චමහා භූතයෝ = 1. මූලික ධාතු පහ; පෘථිවි, අප්, තේජස්, වායු, ආකාශ යන පස.

පඤ්ච මහා විලෝකන = 1. බුදු බව අත්කර ගන්නා ආත්මයේ උපදින්ට පෙර බෝධිසත්වයකු විසින් බලන කරුණු පහ.

පඤ්ච මාර = 1. නිවන් ලැබීමට ඇති බාධා පහ.

පඤ්ච මුඛ = 1. මුහුණු පහක් ඇත්තා – සිව දෙවියා. 2. සිංහයා.

පඤ්චමූල = 1. මුල් පස් වර්ගය.

පඤ්චරන්ධ්‍ර = 1. සිදුරු පහක් ඇති.

පඤ්ච ලවණ = 1. ලුණු වර්ග පහ.

පඤ්චලෝහ = 1. ලෝහ වර්ග පහ; රන්, රිදී, තඹ, යකඩ, ඊයම්, යන පස.

පඤ්ච වක්ත්‍ර = 1. මුණු පහක් ඇත්තා – සිව දෙවියා.

පඤ්ච වර්ණ = 1. නිල්, රන්වන්, රතු, කළු, සුදු යන පාට පහ.

පඤ්ච වර්ග = 1. භික්ෂූන් පස් නමක් ඇති වර්ගය හෝ සඞ්ඝයා. 2. කොණ්ඩඤ්ඤාදි පස්වග තෙරුන් වහන්සේ.

පඤ්ච බාණ = 1. ඊ පස. 2. ඊ පහක් ඇත්තා. 3. අනඞ්ගයා.

පඤ්ච වායු = 1. ශරීරයෙහි පවත්නා වායු පහ; ප්‍රාණ, අපාන, උදාන, සමාන, ව්‍යාන යන වායු පස.

පඤ්ච වර්ණ පද්ම = 1. පස් පැහැයෙන් යුත් පියුම.

පඤ්ච විධ = 1. පස් ආකාර.

පඤ්ච විධ පද්ම = 1. උත්පල, පද්ම, පුණ්ඩරීක, රාජීව, සතපත්‍ර යන පස.

පඤ්චස්කන්ධ = 1. රූප, වේදනා, සඤ්ඤා, සංස්කාර, විඥාන යන පස.

පඤ්චස්තම්භ මන්දිරය = 1. කණු පහකින් යුත් ගොඩනැගිල්ල.

පඤ්චාංග = 1. කොටස් පහකින් යුත්.

පඤ්චාමෘත = 1. දධි, ක්ෂීර, මධු, ශර්කරා, ඝෘත යන පස.

පඤ්ච ශර = 1. ඊ පහ. 2. අනංගයා.

පඤ්ච ශාඛ = 1. අතු පහකින් යුත් දෙය; අත.

පඤ්ච ශික්ෂා පද = 1. පංච ශීලයෙහි දැක්වෙන ශික්ෂා පද පස.

පඤ්චශිඛ = 1. කොණ්ඩා පහක් ඇත්තා. 2. දිව්‍ය සංගීත කාරයා. 3. සිංහයා.

පඤ්චශීල – පඤ්චසීල = 1. පන්සිල්.

පඤ්චාංග ගුප්තයා = 1. කැස්බෑවා. 2. ඉබ්බා.

පඤ්චාංග ලිත = 1. නක්ෂත්‍රය සම්බන්ධ කරුණු ඇතුළත් ලිතක්.

පඤ්චාංගය = 1. පස් කොටසකින් යුත් දෙය. 2. නැකත් ලිත.

පඤ්චාංගික තූර්යනාද = 1. සංගීත නාද පහකින් යුත් නාදය; පඤ්චතූර්ය නාදය.

පඤ්චාංගුල = 1 ඇඟිලි පහ.

පඤ්චාංගුලි = 1. ඇඟිලි පහක් ඇති.

පඤ්චානන්තර්ය කර්ම = 1. මව, පියා, රහතුන් මැරීම යන තුණ හා බුදුන්ගේ ඇඟින් ලේ සෙල්වීම හා සංඝ භේදය යන කරුණු පහ.

පඤ්චනාරී ඝටය = 1. කාන්තාවන් පස් දෙනෙකුගේ රූපයෙන් ඇඳි කළය.

පඤ්චානන = 1. මුණු පහක් ඇත්තා. 2. සිව දෙවියා. 3. සිංහයා.

පඤ්චාභිඥා = 1. භාවනාවෙන් ලබාගන්නා ඥාන බල පහක්.

පඤ්චායුධය = 1. ආයුධ පහ ලකුණු කර තිබෙන බෙල්ලේ බඳින ආභරණයක්. 2. දුනු, මුගුරු, අඩයටි, පත් කොහොල්, පාරා වළලු යන ආයුධ පහ.

පඤ්ච සාර = 1. ගිතෙල්, කිරි, සකුරු, තිප්පිලි හා මී පැණි යන පස් වර්ගය.

පඤ්ච සුගන්ධ = 1. කපුරු, තකුල්, ලමඟ, කිරිපුල් හා කස්තුරි යන පස.

පඤ්චාල = 1. රටක නමක්. 2. රජෙකුගේ නමක්.

පඤ්චාවී = 1. සෙල්ලමක්. 2. කැවිලි වෙසෙසක්.

පඤ්චේන්ද්‍රිය = 1. ඉන්ද්‍රිය පහ.

පඤ්චාඞ්ගිකතූර්ය = 1. පස් ආකාර තූර්ය සිත්පිලි

පඤ්ජර = 1. කූඩුව.

පඤ්ඤා = 1. බුද්ධිමත්කමේ දී අනුන්ගේ කාරණයට මෙන් පෙනී සිටින්නා. 2. ප්‍රඥාව; නුවණ.

පඤ්ඤාචක්ඛු = 1. ප්‍රඥාව නමැති ඇස.

පට = 1. රෙද්ද. 2. වෙළීම. 3. එතීම. 4. සේද. 5. කොඩිය. 6. නලල් පට. 7. පටලය.

පට කච්චි = 1. පට රෙද්ද.

පටකාර = 1. රෙදි වියන්නා. 2. මහන්නා.

පටකුටි = 1. රෙදි ගේ. 2. ඉටි ගේ.

පටහ = 1. ඩක්කය; කියවීම.

පටන් = 1. එතන සිට. 2. ඒ කාලය තුල. 3. ආරම්භය; මුල. 4. පටුනුගම. 5. ආදි කොට.

පටන් ගන්නවා = 1. ආරම්භ කරනවා.

පට බඳිනවා = 1. නම්බු නාමයක් දෙනවා.

පට බැඳි රාජ = 1. කතතුරක් ලත් අය. 2. නම්බු නාම ධාරියෙක්.

පටල = 1. ඇස් රෝගයක්. 2. වැදල්ල. 3. වැසීම. 4. පළිත

පටලැවිලි = 1. වෙළීම. 2. කරදර; හිරිහැර.

පටලිය = 1. හැට්ට. 2. පළිත.

පටලිකා = 1. මල් නටගත් සහිත ඇතිරිලි විශේෂයක්.

පටවනවා = 1. බඩු ආදිය දමා තබනවා. 2. [illegible] 3. පුරවනවා.

පටවත් = 1. පට රෙදි.

පටහක = 1. [illegible] දුඹුරු 2. බෙර වෙසෙසක්.

පටිච්ච = 1. [illegible]; [illegible].

[illegible] = 1. [illegible].

පටහ = 1. ලුහු බෙරය. 2. බෙර වර්ගයක්

[illegible] = 1. පළිත. 2. දික බෙරය.

[illegible] = 1. [illegible]. 2. [illegible]. 3. එක් වීම.

පටිකාර = 1. [illegible] [illegible] ආභරණ [illegible]. 2. [illegible] [illegible] ආභරණයක්

පට්ටනම් = 1. නුවර. 2. රට. 3. මුහුදුබඩ නුවර.

පට්ට බන්ධනය = 1. සිය පටිය.

පට්ටම් = 1. ශරීරය වටේ වලල්ල. 2. පැත්ත; පැති. 3. නම්බු නාමය.

පට්ටම් කට්ටි = 1. නම්බු නාම ධාරියෙක්.

පට්ට = 1. රෙද්ද. 2. පටිය. 3. හිසකබ. 4. තහඩුව. 5. කෞශෙයය වස්ත්‍රය. 6. පතුර. 7. (පැණි ආදි) මුල.

පට්ට මිනිහා = 1. නාස්තිකයා..

පට්ටලය = 1. කම්හල 2. කම්මල් ශිත්ත. 3. වඩු වැඩ, යකඩ වැඩ ආදිය කරන ස්ථානය.

පට්ටපල්දර = 1. නිසරු කථාව. 2. අමන; ජඩ; ප්‍රයෝගකාර.

පට්ටා = 1. පාට කිරීමට ගන්නා පොතු වර්ගයක්. 2. පතුරු. 3. ගස් වලින් ගන්නා පට්ටා.

පට්ටාණි කබල = 1. මෑ ඇට වර්ගයක්.

පට්ටාව = 1. හිසේ බැම්ම. 2. බඳ පටිය.

පට්ටිය = 1, ගව, එළු ආදි සතුන් ලගින ස්ථානය. 2. ගව මඩුව. 3. සමූහය. 4. සත්ව සමූහය. 5. ගාල.

පට්ටෝඩම් = 1. ආභරණ විශේෂයක්.

පට්ටෝලි = 1. වස්ත්‍ර විශේෂයක්'

පටාකා = 1. කොඩි වර්ගයක්.

පටි = 1. ඉණේ බඳින පටිය. 2. දික් කොපලල් ලෑල්ල 3. මාලාව.

පටි කම්ම = 1. ප්‍රති කර්මය. 2. සංස්කරණය.

පටික් කුල = 1. පිළිකුල.

පටිග්ගහ = 1. පිළිගස්වා ගැනීම.

පටිච්ඡාදන 1. ප්‍රතිච්ඡාදනය.

පටිඝ 1. හිංසාව. 2. වෛරය. 3. ගැටීම. 4. ගැටීම.

පටිඝෝෂ = 1. ප්‍රති ඝෝෂාව. 2. ප්‍රතිරාවය; [illegible].

පටිච්ඡන්නක = 1. 1. වැහුණු. 2. සැඟවුණු.

පටිදණ්ඩ = 1. [illegible]. 2. [illegible] යෙදීම.

පටිබිම්බ = 1. පිළිමය.

පටිබාහුව = 1. බුදුහාමුදුරුවන් ගේ බඳ පටිය.

පටිපක්ඛ = 1. සතුරා. 2. විරුද්ධකාරයා. 3. විරුද්ධවූ.

පටිපත්ති = 1. ප්‍රතිපත්තිය.

පටිපන්න = 1. දැනගත්. 2. වැටහුණ. 3. අදහස් කළාවූ. 4. පැමිණ.

පටිපාටි = 1. පිළිවෙළ.

පටිපූජනා = 1. පිදීම. 2. ගෞරවය.

පටිබද්ධ = 1. වැදුණු; සම්බන්ධවූණු.

පටිභය = 1. භයානක දෙය.

පටිභානය = 1. බුද්ධිය. 2. සිහි නුවණ. 3. අති සමත් බව. 4. වැටහීම. 5. ප්‍රතිභානය.

පටිභූ = 1. ඇපය. 2. උකස.

පටිමා = 1. පිළිමය.

පටිය = 1. තීරය. 2. නූල. 3. කාය බන්ධනය.

පටියත්ත = 1. සූදානම්වූ.

පටිරාව = 1. ශබ්දයෙන් හටගන්නා හඬ; ප්‍රතිරාවය.

පටිලාභය = 1. නැවතත් ලැබීම. 2. ප්‍රතිලාභය. 3. තෑග්ග.

පටිලෝම = 1. ප්‍රතිලෝමය.

පටිවාත = 1. ඉදිරියෙන් හමන සුළඟ.

පටි විස්සජ්ජන = 1. පෙරළා විසඳීම.

පටිවේධ = 1. අවබෝධය.

පටි සංඛරණ = 1. ප්‍රතිසංස්කාරණය.

පටිසන්ථාර = 1. පිළිසඳර.

පටිසන්ධි = 1. පිළි සිඳ ගැන්ම.

පටිසම්භිදා ඥානය = 1. සියල්ල දත් කම.

පටිසල්ලාණ = 1. විවේක.

පටිසෝතගාමී = 1. දියපාරට විරුද්ධව යන. 2. ගඟ ඉහළට යන.

පටිසණ්ඨාන = 1 උත්සවයන්ට ගන්නා කැටයම් සහිත මිටකින් යුත් හෙල්ල.

පටිහත = 1. හැපුණු.

පටිහාරය = 1. දොරකඩ.

පටිහාරයා = 1. දොරටුපාලයා.

පටිබාහුක = 1. පටිබාහුව; බුදුන් වහන්සේ පාවිච්චි කළ පටිය; පටිද.

පටීර = 1. සඳුන්.

පටු = 1. සමත්. 2. පළල් නැති. 3. සැර. 4. සියුම්. 5. තියුණු. 6. දක්ෂ.

පටුකාර = 1. බෙල්ල.

පටුන = 1. පොතක තිබෙන කරුණු. 2. කුඩා නගරය.

පටුනක්කාර = 1. පාරට්ටුකාර.

පටුන්, පටුනුගම = 1. කුඩා නුවර. මුහුද අසල නුවර.

පටුතර = 1. ඉතා සමර්ථ. 2. ඉතා ඉක්මන්.

පටුත්ත, පටුත්වය, පටුතාව = 1. සමර්ථකම; දක්ෂතාව.

පටුභාර = 1. හරස් පාර. 2. පළල් නුවූ පාර.

පටුමා = 1. සමර්ථ.

පටෝල = 1. පතෝල 2. දුම්මැල්ල

පටෝලාදි ගණ = 1. දුම්මැල්ල ආදී ඖෂධ ගණයක්.

පඨනය = 1. පාඩම් කිරීම 2. කට පාඩම් කිරීම. 3. කියවීම. 4. ශබ්ද නගා කීම

පඨම = 1. ප්‍රථම; පළමු වැනි.

පඨම ජ්ඣාන = 1 ප්‍රථම ධ්‍යානය.

පඨමා = 1. පළමුවැනි විභක්තිය

පඨවී = 1. පොළොව 2. භූමිය

පඨවි කම්පන = 1. පොළොව සෙලවීම.

පඨවි කසිණ = 1 භාවනා කිරීම සඳහා අරමුණු වන් මැටියෙන් සාද ගත් මණ්ඩලය.

පඨවි නිස්සිත = 1 පොළොව ඇසුරු කළ

පඨවි ධාතුව = 1. පස් ගති වූ මුල් ධාතුවක්

පණිය = 1. කියු. 2. හදල.

පබ = 1. අබෝ මාගීයෙන් කියවෙන වාක්‍යය. 2. වැල් වර්ගයක්.

පබ්බතලක්ඛණ = 1. ජ්‍යොතිෂ්‍ය ග්‍රන්ථය. 2 කිසියම් වක්කාර මුරණ්ඩු ගතිය. 3. ගරු හරු නැති කම.

පබ්බජ = 1. බාරුව; තැව; යාත්‍රාව.

පඩි = 1. වැටුප්. 2. කුලිය.

පඩි ගන්නවා = 1. පඩි ලබාගන්නවා.

පඩි කඳ = 1. එළිපත්ත. 2. උළුවස්සෙහි යටි කඳ.

පඩික්කම = 1. කෙළ ගැසීමට තිබෙන භාජනය.

පඩිකාර නිලය = 1. මාලදිවයිනේ තානාපතියා පැමිණි විට ඔහු ගේ කටයුතු බාර කර සිටි නිලය.

පඩිකාරයා = 1. වැටුප් ලබන්නා.

පඩිකාර මුහන්දිරම් = 1. ආණ්ඩුවේ නිල ධාරියෙක්.

පඩිපෙළ = 1. පිය ගැට පඞ්ක්තිය.

පඩිමාව = 1. පිළිවෙල.

පඩිය = 1. අඩිය තබන තට්ටුව. 2. වැටුප් මුදල.

පඩියන් = 1. නිල් මැණික.

පඩියම = 1. නිල් කැටය. 2. මැණික් වෙසෙසක්.

පඬර = 1. සුදු නෙළුම්. 2. සුදු පාට. 3. ඇතුන් වර්ගයක්.

පඬි = 1. ශාස්ත්‍රවන්තයා. 2. උගතා. 3. පණ්ඩිතයා. 4. රටක්.

පඬ = 1. කහපාට සායම.

පඬු = 1. සිවුරු පාට ගැන්වීම සඳහා කොස් පොතු, බෝඹුකොළ ආදිය තම්බා සාදා ගන්නා කහට ජලය. 2. කහපාට. 3. සුදු මැලි. 4. පණ්ඩිතයා. 5. පාණ්ඩු රෝගය. 6. රත් පැහැය. 7. සුදු.

පඬුඔරුව = 1. සිවුරු පඬු පොවන ඔරුව.

පඬු ඇඹුලසුන = 1. ශක්‍රයාගේ ආසනය.

පඬු ගහනවා = 1. (සිවුරු) පඬු පොවනවා.

පඬුර = 1. තෑග්ග 2. ඔප්පු කරන දෙය 3. ආදායම.

පඬුරු = 1. පණ්ඩිත. 2. සුදු නෙළුම්. 3. සුදු. 4. තෑගි. 5. දෙවියන්ට කරන පූජාව.

පඬුරු පාක්කුඩම් = 1. තෑගි.

පඬුරු මිල = 1. දඩ මුදල. 2. ඔප්පු කරන මුදල. 3. ප්‍රධානයෙකුට ගෙවන මුදල.

පඬුරෙද්ද = 1. සිවුර. 2. කහ රෙද්ද.

පඬුවන් = 1. සුදට හුරු. 2. කහපාට. 3. පඬු පැහැය.

පණ්ඩර = 1. සුදු නෙළුම්; පුණ්ඩරීකය. 2. සුදු පාට.

පණ්ඩරඟ = 1. සිව දෙවියා.

පඬර ගිරි = 1. කෛලාශ පර්වතය.

පණනළ = 1. ජීවිතය.

පන = 1. පෙණ. 2. කොස් ගස. 3. වඩුවා. 4. නයි පෙණය. 5. සෙනේහය.

පනක් = 1. කඩය.

පනත් = 1. නියෝගය.

පනාකුව, පනාකු = 1. පාර.

පනාතුරු = 1. බුලු; එනම් ගස.

පනාදර, පනාවරා, පනාදූර = 1. වඩුවා. 2. ඔටුවා.

පනාදු = 1. පසුවදා. 2. දෙවැනි දවස.

පනාපනා = 1. නැවත - නැවත.

පනාපල = 1. බුළු ගෙඩිය.

පනම = 1. එනම් කාසිය; සත හයක වටිනා කම ඇති කාසිය.

පනම්කාසි = 1. එනම් වැල් වර්ගයෙහි කොළ. 2. මස් වැන්න? 3. පනමේ කාසි. 4. තඹ හෝ පිත්තල කාසි.

පන්නරණ = 1. ආයුධවල මුවාත.

පනර = 1. පසළොස්වක. 2. තෑග්ග. 3. පඬුර.

පන්නරයා = 1 පන් වියන්නා.

පනලිය = 1. වැල් පෙතෙල.

පනාවන = 1. පිළියෙළ කරන. 2. නියම කරන.

පනාවරයා = 1. වඩුවා. 2. ඔටුවා.

පනස, පනහ = 1. දහයේ ඒවා පහ.

පනාස, පනා = 1. කොස්. 2. බුලු.

පනිහෙළිය = 1. ගිනිපෙනෙල්ල.

පන් = 1. ගීත් දිග කොළ වර්ගයක්. 2. කොළය. 3. කතා. 4. ආයුධය; සිරිය. 5. කැරලිලි-වලට එල්ලන ගොක් කොළ ආදිය. 6. පඤ්චසංඛ්‍යාව. 7. කළු ඉංගිරියාව.

පන් කම = 1. විවීම. 2. පන් කර්මාන්තය.

පන්සරුවා = 1. පැදුරු වියන්නා.

පන්ගාව =. පවන් හැලීමේ උපකරණයක්.

පන්නම් = 1. පන් කර්මාන්තය.

පන්තිය = 1. පංක්තිය. 2. කොටස. 3. පේළිය.

පන්තිස = 1. තිස් පහ.

පන්තේරු = 1. එතම් උඩරට නැටුම් වෙසෙසක්.

පන්දම = 1. එළිය කිරීමට පත්තුකරන දෙයක්.

පන්දම්වල්ල = 1. එළි රාශියක්.

පන්ද රැල්ලා = 1. රතු දෙමළිච්චා.

පන්දල = 1. වැල්වලින් මුවාවූ මැස්ස.

පන්දලම = 1. මඩුව. 2. වැල්වලින් මුවාවූ මැස්ස.

පන්දු කෙළිය = 1. බෝලයකින් කරන සෙල්ලමක්.

පන්දුව = 1. බෝලය.

පන්නම් = (පන්කම්) 1. විවීම) 2. පන් වැඩ.

පන්නය = 1. හස්ත කර්මාන්තය. 2. උපකරණය.

පන්නයා = 1. තණ කොළ කපන්නා. 2. ඇත්-ගොව්වා. 3. පැදුරු ආදිය වියන්නා.

පන්නාඩා = 1. එතම් මාළුවා.

පන්සර = 1. ඊපය. 2. අනංගයා.

පන්සල් = 1. භික්ෂූන් වසන ස්ථානය. 2. කොළ අතු සෙවිලි කළ කුඩාගෙය.

පන් සාළිස = 1. හතළිස් පහ.

පන් සිඛා = 1. පංච සිඛ දිව්‍ය පුත්‍රයා; දිව්‍ය-ලෝකයෙහි වීණා වාදකයා.

පන් හිද = 1. පුස් කොළ ලිවීමට ගන්නා උපකරණයක්.

පන් ඩනවා = 1. එලව දමනවා; පන්නනවා.

පන්ඩා = 1. සර්පයා. 2. නාගයා.

පන් සිල් = 1. පංචශීලය.

පන් සිළු = 1. කොණ්ඩා පහක් ඇති - දිව්‍ය සංගීත කාරයා.

පන් සැර = 1. ඊ පහක් ඇත්තා - අනංගයා.

පන්හල, පන්හල් = 1. කුඩා ගෙය. 2. කොළ සෙවිලි කුඩා ගෙය. 3. තාපසාරාමය.

පනා = 1. කොස්. 2. හිසපීරන පනාව.

පනා කැබුම් = 1. කැවිලි වර්ගයක්

පනා බැඹිම = 1. සාප්ප වර්ගයක්.

පනා බෙරණ = 1. බෙර වර්ගයක්.

පනාමල් = 1. ඉතා කුඩා කොස් ගැටය.

පනා සව = 1. පොල් රා. 2. සුරාව.

පනාව = 1. හිස පීරන උපකරණය.

පනා දත්ත = 1. පනා දත.

පනික් කාලයා = 1. බෙරකාරයා.

පනික්කියා = 1. හිස - රැවුල් කපන්නා. 2. ඇතුන් අල්ලන්නා. 3. ඇතුන් බලන්නා.

පනික්කි මුදලි = 1. ඇතුන් බලන්නන් ගේ ප්‍රධානයා.

පනිට්ටුව = 1. දිය ඇදීමට ගන්නා භාජනයක්.

පනිලකා = 1. බූලන්.

පනු = 1. පැන්. 2. රසය.

පනුරු = 1. පඤ්ජරය. 2. හෙප්පුව.

පනේල් = 1. පනේලය.

පණ = 1. ප්‍රාණය-ජීවිතය. 2. ප්‍රාණියා. 3. තයි පෙණෙය. 4. පණුවා. 5. උකස. 6. ඔට්ටුව.

පණ අදිනවා = 1. මරණාසන්න වී හුස්ම-හෙලනවා.

පණකුර = 1. පණ ඇති අකුර; ප්‍රාණාක්ෂරය.

පණ ගම = 1. නයාගේ පෙණය.

පණ නල = 1. ප්‍රාණවාතය - හුස්ම.

පණනැති = 1. පණගතියක් නැති. 2. ජීවිතයක් නැති.

පණත = 1. ආඥාව. 2. නීතිය. 3. නියෝගය.

පණ තියනවා = 1. පණපොවනවා. 2. (ආයුධ) මුවාත් කරනවා;

පණ දරයා = 1. නයා.

පණ පිටින් = 1. ජීවත්ව සිටිමින් (ජීවමානව.)

පණ පොවනවා = 1. පණ තියෙනව (ආයුධ) ගිනියම් කොට දියේ ඔබා මුවාත දැඩි කිරීම.

පණම් = 1. සත හයේ කාසියක්. 2. කාසි; මුදල්.

පණය = 1. ආදරය. 2. විශ්වාසය.

පණ යනවා = 1. ප්‍රාණය නිරුද්ධවෙනවා. 2. මැරෙනවා.

පණයම = 1. කාන්තාවක් පෙළඹවීමට දෙන තෑග්ග; වෙසඟනක් පෙළඹවීමට දෙන තෑග්ග. 2. අල්ලස. 3. උකස.

පණර = 1. පසළොස්වක.

පණවම් = 1. වෙසඟන.

පණරද = 1. නාගරාජ. 2. අනන්තයා. 3. රාහු.

පණලිය = 1. වැල් වර්ගයක්.

පණව = 1. අනත - කුඹාබෙරය; පණාබෙරය.

පණවනවා = 1. නීති ඇතිකරනවා. 2. නියමකරණවා. 3. අණකරනවා. 4. අලුත් සූදානම් කරනවා.

පණස = 1. සියයෙන් දෙකෙන් පංගුව.

පණ්ඩකයා-පණ්ඩයා = 1. නපුංසකයා.

පණ්ඩර = 1. සුදු. 2. සිරිගෙල්. 3. ඇත්කුලයක නමක්.

පණ්ඩරංග = 1 සුදු ශරීර ඇත්තා. 2. ඊශ්වරයා. 3. ඇඟෙහි අළු තවරාගත්තා තාපස විශේෂයක්.

පණ්ඩිත = 1. උගත්. 2. ප්‍රාඥයා.

පණ්ඩිත බෝද්ධව්‍ය = 1. පණ්ඩිතයන්ටම විෂයවන.

පණ්ඩිත ප්‍රකාණ්ඩ = 1. ශ්‍රේෂ්ඨ පණ්ඩිතයා.

පණ්ඩිත ප්‍රතිරූපකයා = 1. උගතකු වැනි නූගතා.

පණ්ඩිතමානී = 1. උගත්කම ගැන උඩඟු. 2. තමා පණ්ඩිතයෙකැයි සලකන්නා.

පණ්ඩු = 1. පඬුපාට. 2. පළාත 3. එනම් රජ.

පණ්ඩු කම්බල = 1. ශක්‍රයාගේ ආසනය.

පණ්ඩු පලාශ = 1. ඉදී වැටුණු පඬුවන් කොළය.

පණ්ණ = 1. කොළය; පත්කරය.

පණ්ණ රසී = 1. පසළොස්වක.

පණ්ණාකාර = 1. යවන තෑගි.

පණි = 1. සර්පයා. 2. පණුවා.

පණිත = 1. තැම්බූ 2. පැසුණු. 3. හොඳින් සූදානම් කළ. 4. ප්‍රණීත. 5. රසවත්.

පණිතභෝජ්‍ය = 1. මිහිභෝජන.

පණී දිව = 1. ගෘහාචාරිය.

පණීන්ද්‍ර (පණී + ඉන්ද්‍ර) = 1. නාගරජ. 2. නයා. 3. රාහු.

පණියා = 1. සර්පයා. 2. නයා.

පණී වංශ = 1. මැරීම. 2· කෝලම.

පණිම්බය, පණ්බුඹය = 1. යමෙක් අතේ තියා හරින දෙය.

පණු = 1. පණුවා. 2. ප්‍රාණියා. 3. සර්පයා.

පණු කැවිල්ල = 1. හම කසා බිබිල් මතු වීමෙන් සෑදෙන කුෂට විශේෂයක්.

පණුභාග = 1. පණුවන් නිසා ඇතිවන උදරාබාධය.

පණුගෙඩි = 1. විදුරු මසේ සෑදෙන ගෙඩි.

පණුතෙලඩයා = 1. එනම් මාළුවා.

පණුදිය = 1. පණුවන් නිසා උනන කෙළ.

පණුබෙහෙත් = 1. පණුවන් වැනසීමට හෝ මැඩ පැවැත්වීමට දෙන බෙහෙත්.

පණුමුල් = 1. සපියෙක්; පලා ගුල්ලා.

පණ්‍යාජීවන = 1. වෙළහාකම.

පණ්‍යවීථිකාව = 1. කඩ වීදිය.

පණ්‍ය ස්ත්‍රී = 1. වෙසඟන.

පණ්‍ය ශාලාව = 1. සාප්පුව.

පත, පත් = 1. කොළය. 2. පොතක කොළය. 3. පැලුණුණු. 4. තැලියක් හතරෙන් පංගුව. 5. මාර්ග 6. පලම් හතර 7 හසුන් පත. 8. පියාපත. 9. විශාල. 10. පාදය.

පතංගමයා = 1. කණ ගිරවා. 2. කුරුල්ලා.

පතංග = 1. ඉර. 2. කුරුල්ලා. 3. පළගැටියා. 4. රසදිය.

පතංගිකාව = 1. මී මැසි වර්ගයක්.

පතංජලී = 1. ඉසිවරයෙකුගේ නාමයක්. 2. ව්‍යාකරණ පොතක නමක්.

පතාක = 1. වැටෙන.

පතාකය = 1. හැකෑත් ලිත. 2. වැඩෙන දෙය.

පතාකාව = 1. කාරන උළ. 2. ඊයෙහි පිහාපත බැඳි කොටස. 3. නගුලෙහි අවයවයෙක්.

පතඟ = 1. ඉර. 2. සෙනසුරා. 3. කුරුල්ලා.

පතඟ කිරණ = 1. හිරු රැස්.

පතඟ කුල = 1. සූර්ය වංශය.

පතඟි = 1. එනම් ගස. 2. ඒ ගසෙහි කරලෙන් ලබාගන්නා රතුපාට සායම් වර්ගය.

පතන = 1. වැටෙන. 2 ප්‍රාර්ථනා කරන. 3. ප්‍රපාතය. 4. තණ ආදිය වැවුණු තැනි තලාව. 5. කුඩා කන්ද.

පතනීය = 1. වැටිය යුතු.

පතනවා = 1. ප්‍රාර්ථනය කරනවා. 2. බලා පොරොත්තු වෙනවා.

පතඟා = 1. තර මීහිනා.

පතර = 1. මහත්. 2. ලොකු. 3. විසුරුණු. 4. පත්‍රය. 5. ඉලුක්කොළය. 6. සමූහය.

පතර කුරු = 1. වැඩකරුවා. 2. වංචා. 3. බුළු. 4. දූසයා.

පතරොම් = 1. තුවක්කු ආදියෙහි දමා වෙඩි තබන කැටය.

පතල, පතාක = 1. ලොකු ගැඹුරු වල. 2. යටින් හාරාගත වළ.

පතල = 1. අඩිය. 2. පාද තලය. 3. ආකරය.

පතළ = 1. ප්‍රසිද්ධ. 2. විහිදුනු. 3. ලොකු. 4. ප්‍රකට.

පතවරු = 1. වඩුවා.

පත් = 1. කොළ 2. පාත්‍රය. 3. මල්. 4 විජිනි පත. 5. කැලියෙන් හතරෙන් පංගුව. 6. පැමිණි. 7. ගසුන් පත.

පත් අංකුඹ්බා = 1. ගඟේ මාළු වර්ගයක්.

පත් අඹුව = 1. අඹු වර්ගයක්.

පත් ඇතිරි = 1. කොළවලින් යැදූ ඇතිරිල්ල.

පත්ඉර = 1. තෙරලි ගෙඩියේ ලකුණු වී තිබෙන ඉර.

පත් කුරුඩ = 1. පුස්කොළ පොතක කොළය; පොත්ලියක පත්‍රය.

පත්කඩ = 1. වැඳීමට ගන්නා හම හෝ ලේන්සුව. (රෙදි කෑබැල්ල) 2. ඊයෙහි යන කඩ. 3. අතු බණ්ඩය. 4. හිඳීමට ගන්නා කුඩා ඇතිරිල්ලක්.

පත් කරණ = 1. බත්පුව 2. ලියවිල්ල.

පත් කාවිල්ලා = 1. ගඟේ මාළුවෙක්.

පත් කඩිඹුඩ = 1. ලිවීමට සකස්කළ පුස්කොළ පත්කිරු අටක හෝ දහසයක මිටිය.

පත් කිරීම = 1. පැමිණ වීම. 2. නියම කිරීම. 3. පොතක් මෙස් කැබීම.

පත් කුඩය = 1. තල් අතු ආදියෙන් සාදගත් කුඩය; තල් අත්ත.

පත් ගොගොල = 1. ගොල්ල.

පත් ගොළ = 1. කොළ.

පත් ගහනවා = 1. පඩක් සලනවා.

පත් ගොඩහා = 1. එනම් මාළුවා.

පත්ත = 1. උල්ලිය. 2. පියාපත. 3. පාත්‍රය. 4. හැඳිගෑමට ගන්නා පැතලි ලී පතුර.

පත්තන්නා = 1. කෑකිරි වර්ගයක්. 2. කොමඩු වර්ගයක්?

පත්තස් = 1. මාළු වර්ගයක්.

පත්තනික්කුජ්ජන කර්මය = 1. දඩුවමක් මෙන් දස් නො පිළිගැනීමට පාත්‍රය අනෙක් පැත්ත හැරවීම.

පත්ත පිණ්ඩිකාංගය = 1. එකම පාත්‍රයක වැළඳීමේ පිළිවෙත.

පත්තයානා = 1. පියාපත් යනා කොට ඇති පක්ෂියා.

පත්තාණීක = 1. කඩු ආදී අවුධයක් පුරුෂයන් සතර දෙනෙක්.

පත්තානුමෝදනා = 1 පිං අනුමෝදන් වීම.

පත්තාසම = 1. ධාන්‍ය මඩුව. 2. බඩු ගබඩාව.

පත්තාධ්‍යක්ෂ ලේඛක = 1. ධාන්‍යාගාරයේ ලේඛක ඨානානායකය. 2. පැරණි කවියෙක්.

පත්තාරය = 1. ඔරුවක යටිකර තිබෙන ටැල්ල.

පත්තෑයා = 1. කකුල් රාශියක් ඇති විෂකුරු සතෙක්.

පත්ති = 1. පැමිණීම. 2. පාබල සෙනඟ 3. පිත. 4. වැටුප.

පත්තිදන = 1. පින්දීම.

පත් තිකා = 1. පයින් යන්නා. 2. කොටස් කාරයා; හවුල් ඇත්තා.

පත්තිනි = 1. එනම් දිව්‍යාංගනාව. 2. යහපත් භාර්යාව.

පත්ති දානය = 1. පින් දීම.

පත්තිනි = 1. යහපත් භාර්යාව. 2. පත්තිනි දෙවි දූ.

පත්තිනි දේවී = 1. පත්තිනි දෙවියෝ.

පත්තිනි හාමි = 1. පත්තිනි දේවාලයෙහි දේව කාර්යය කරන්නා

පත්තිය = 1. පැමිණීම. 2. පාබල සේනාව. 3. අරළු

පත්තියම් = 1. ලෙඩෙකුට හිත වූ ආහාර පාන වර්ග.

පත්තිරම් = 1. කුඩා කඩුව; සිරිය නම් ආයුධය.

පත්තිරිප්පුව = 1. මහා ජන ප්‍රදර්ශනය සඳහා රජු වැඩසිටින වේදිකාව.

පත්තිරුව = 1. පුස්කොළ පොතක කොළය.

පත්තුව = 1. කෝරළයෙන් කොටසක්. 2. අඹරා පිටින් ගාන බෙහෙත් පත්තුව.

පත්තුවෙනවා = 1. ගිනිගන්නවා; දැල්වෙනවා.

පත්නී = 1. යහපත් භාර්යාව. 2. පතිව්‍රතාව. 3. භාර්යාව.

පත්දලම = 1. මල මිහී තැබීම පිණිස ගේ දොරකඩ ඉදිකරන මණ්ඩපය; පත්දලම.

පත් තුකරනවා = 1. දල්වනවා; ගිනි දල්වනවා.

පත්තුරු = 1. බුළු ගස.

පත්පාඩගම් = 1. එබික් පැළෑටි වර්ගයක්.

පත් පෑණි = 1. උකු පැණි; උණ්ඩුකළ පැණි.

පත් පොත් = 1 පත්‍ර හා පොත්.

පත් බානවා = 1. වගලේ අනු සෙවිලි කරනවා.

පත් මෙණීය = 1. ගස් වර්ගයක්.

පත්මත් = 1. ශූරනීගා.

පත්ශිය = 1. කුරුළු වර්ගයක්. 2. පක්ෂියා.

පත්ල, පතුල = 1. අඩියේ පතුල.

පත්සලනවා = 1. පවත් ගසනවා 2. පොළනවා.

පතාක, පතාකා = 1. කොඩිය. 2. ලකුණ. 3. තුන්හුලන් කොඩිය.

පතාක යෝධ = 1. හරඹ පුරුදු යෝධයා. 2. සේනාවේ පෙරමුණේ යන බලසම්පන්න යෝධයා.

පතාකී = 1. කොඩිකාරයා. කොඩිය.

පතාගය = 1. සත හැත්තෑ පහක වටිනා නම ඇති රිදී කාසියක්.

පතාප = 1. ප්‍රතාපය. 2. තද උෂ්ණය. 3. දඹුවම. 4. උකන්දුව.

පතාපනය = 1. දැවීම. 2. නරකාදියක්.

පතුස් = 1. පතැස. 2. මහ සැරසිල්ලක්. 3. ලොකු වළවල්.

පති = 1. ස්වාමියා. 2. බද්ද.

පතිකාර = 1. ප්‍රතිකාරය; පිළියම.

පතිකුල = 1. ස්වාමි පුරුෂයාගේ ගෘහය.

පති දේවතා = 1. ස්වාමි පුරුෂයා දෙවියකු කොට සලකන්නී.

පතිට්ඨා = 1. ප්‍රතිෂ්ඨාව; පිහිට.

පතිනි = 1. යහපත් භාර්යාව. 2. පතිව්‍රතාව. 3. පත්තිනි දේවී.

පතිනිදම් = 1. පතිව්‍රතා ධර්මය.

පතිපූජා = 1. ස්වාමි පුරුෂයා පිදීම.

පතිපූජිකා = 1. ස්වාමියා පුදන්නී.

පතිබද්ධ = 1. බැඳි. 2. සම්බන්ධ.

පති බිම්බ = 1. ප්‍රතිබිම්බය; සමානරුව; පිළිමය.

පති බෝධ = 1. අවබෝධය.

පති මණ්ඩිත = 1 අලංකාර කරන ලද.

පතියා = 1. ස්වාමියා. 2. ස්වාමි පුරුෂයා

පතිරජ, පතිරාජයා = 1. රජකු වෙනුවෙන් ආණ්ඩුකරන රජ.

පතිරණ = 1. කාවින්‍ද ප්‍රධානියෙක්? 2. සේවා පත්‍ර කාරයන්ගේ ප්‍රධානයා.

පතිරන්නැහේ = 1. ගම්දෙටුවා.

පතිවිත දම = 1. එකකු පමණක් පතන විවාහ ජීවිතය.

පතිව්‍රතාව = 1. එකම පුරුෂයකු පතන කාන්තාව.

පති සල්ලාන = 1. තනි වූ. 2. සමූහයෙන් වෙන් වූ

පතු = 1. අතු. 2. උල්. 3. ලෑලි. 4. කොළය. 5. පතුර. 6. පියාසන.

පතුක් = 1. කටු සහිත ගස් වර්ගයක්.

පතුන්, පතුන=1. ඉල්ලීම. 2. මාගීය. 3. ප්‍රාර්ථනාව.

පතුර = 1. පොත්ත. 2. ලෙල්ල. 3. තහඩු ලෙස කැපුණු කොටස. 4. පට්ටය.

පතුරන = 1. ප්‍රසිද්ධ කරන.

පතුරු = 1. කොළය. 2. ලෑලි තීරුව. 3. විටප. 4. තහඩුව. 5. පට්ටය.

පතුල = 1. අඩිය. 2. යමක යට කොටස. 3 පාද තලය.

පතුල් = 1. පතුල; පාද තලය.

පතුල් කඹුරු = 1. පාද තල නමැති පද්මය.

පතුවෑල් = 1. සම්මල් කාරයා රත්කළ යකඩ-යට දිය ඉසින කොස්ස.

පතුළ = 1. විසුරුණු. 2. පැතුරුණු

පතුවගල = 1. අතු වැටුණු

පතෝල = 1. එළවුළු වර්ගයක්.

පත්‍ර = 1. ප්‍රවෘත්ති පත්‍ර. 2. කොළ. 3. වාහනය. 4. පරාල. 5. පියාපත. 6. වතල් සෙවිලි කරන කොළ.

පත්‍ර චෞරද = 1. සූ සැට ශිල්පයන් ගෙන් එකක්.

පත්‍ර ගන්ධ = 1. කොළ සුවඳ

පත්‍රතලය = 1. කොළයේ මතු පිට.

පත්‍ර දාන = 1. කැලෑ කොළ දීම.

පත්‍ර නාඩිකාව = 1. කොළයක නාඩිය.

පත්‍ර පුට = 1. කොළ ගොට්ටුව.

පත්‍ර ෂශ්‍යාව = 1. තළලේ කරන ලද කොළයක ලකුණ.

පත්‍ර පීත ද්‍රව්‍ය = 1. කොළ ඉදීමේදි කහපාට කරන ද්‍රව්‍ය.

පත්‍ර බාහුල්‍ය = 1. කොළ වැඩි.

පත්‍ර භංග = 1 පයෝදරාදියෙහි සඳුන් කල් කයෙන් අඳින කොළ වැනි චිත්‍ර 2. වසාවාසි. 3. කොළ බිඳීම.

පත්‍ර මුඛා = 1. වසා වාසි.

පත්‍රය = 1. කොළය 2. සියුම් තහඩුව. 3. ලියුම. 4. ප්‍රවෘත්ති පත්‍රය.

පත්‍ර යානශා = 1. කුරුල්ලා; පියාපත් යාන කොට ඇත්තා

පත්‍ර රඤ්ජනය = 1. පොත් පිටු අලංකාර කිරීම.

පත්‍ර ලේඛා = 1. ශරීරය සැරසීම. 2. කොකුම් ආදියෙන් මුණෙහි ඇඳි පත්‍රාකාර චිත්‍ර.

පත්‍ර වලලු = 1. එනම් ආභරණය.

පත්‍ර වෘන්තය = 1. කොළ නටුව.

පත්‍ර ශිලා = 1. තහඩු ගල.

පත්‍ර ශාඛා = 1. පලා කොළ.

පත්‍ර ශ්‍රේෂ්ඨ = 1. බෙලි කොළ.

පත්‍රාංකය = (පත්‍ර + අංකය) 1. පිටු නොම්මරය.

පත්‍රාංජනය = 1 දුම්මල තෙල්.

පත්‍රාකාර = 1. කොළවැනි. 2. තහඩු ආකාර.

පත්‍රි = 1. පක්ෂියා. 2. ඊ ගස. 3. කොළ ඇති.

පත්‍රිකාව = 1. ලියුම. 2. සුළු පොත. 3. මුද්‍රිත ලියවිල්ල.

පත්‍රෝර්ණ = 1. පටරෙදි

පථ, පථය = 1. පාර. 2. පෙනෙන දුර. 3. ප්‍රදේශය.

පථ දර්ශක = 1. මඟ පෙන්වන.

පථිකයා = 1. මගියා.

පථ්‍ය = 1. සනීපය ගෙන දෙන. 2. කෑමට ගුණ. 3. සුදුසු; යෝග්‍ය. 4. හිත.

පථ්‍යා පථ්‍ය = (පථ්‍ය + අපථ්‍ය) 1 සුදුසු නුසුදුසු.

පථ්‍යා වක්ත්‍ර = 1. එනම් වෘත්තය.

පථ්‍යාහාරය = (පථ්‍ය + ආහාරය) 1. ගුණ ඇති කෑම.

පද = 1. පද්‍යය. 2. පාදය. 3. තතතුර. 4. මාර්ගය. 5 පේළිය 6. පාබල සේනාව. 7. වැඩ; කණ්ඩුව 8. කරුව. 9. රශ්මිය 10. කාරණය 11. ස්ථානය. 12. පා සලකුණ.

පදක්ඛම = 1. තම්බුව හෝ තණ්ඩයක් ප්‍රකාශ කිරීමට පළදින ලකුණ.

පදක්ඛිණා = 1. ප්‍රදක්ෂිණාව.

පදගතාර්ථය, පදාර්ථය = 1. වචනයේ තේරුම.

පද ඟිල්ල = 1. කකුලේ ඇඟිල්ල.

පදච්ඡේද = 1. වගන්තියක පද වෙන් කිරීම.

පදන = 1. ප්‍රදානය. 2. දීම. 3. කෙලෙස් වැනසීම.

පදන = (පදන්) 1 ප්‍රදානය; තෑග්ග. 2. භාවනාව. 3. ප්‍රධාන. 4. උත්සාහ.

පදනම = 1. අත්තිවාරම. 2. අනුප්‍රාකාරය. 3. පවුර. 4 කයිරුව.

පදන්ඝර = (පදන්ගේ) 1. භාවනා කරන ගෘහය.

පදත් = 1. පදයක තේරුම; පදාර්ථය.

පද පූරණය = 1. වගන්තිය සම්පූර්ණ කරන වචනය 2. අඩු පදය පිරවීම.

පද පෙරළිය = 1. වචන මාරුකර යෙදීම; අගමුල පදයන් මාරුකර කීම.

පද බන්ධනය = 1. කවිපද බැඳීම; පද්‍ය බන්ධනය; කාව්‍ය රචනය.

පද බෙදනවා = 1. පද විභාග දක්වනවා; පද වෙන් කොට දක්වනවා

පද භාණ = 1. පදයක් පාසා නවත්වා කීම.

පද භේදනය = 1. වචන වෙන් කිරීම.

පදම් = 1 පිසිය යුතු තරම 2. ප්‍රමාණය. 3 සමකල ප්‍රමාණය. 4. වැටුප. 5. යෝග්‍ය

පදම් කරනවා = 1 තලා ශක්තිමත් කරනවා. 2. පදමට ගැනීම

පදම් කටාකය = 1. පදම් වල.

පදය = 1. වගන්තිය; වාක්‍යය. 2. වචනය. 3. පද්‍ය; කවිය. 4. අඩිය තැබීම. 5. අඩියෙහි ලකුණ. 6. නිර්මාණය. 7. පද්‍යයක පේළිය.

පදර = 1. පොළොවෙහි වළ. 2. ලෑල්ල. 3. පෝරුව. 4. ගුහාව.

පදරුත් = 1. පදාර්ථය. 2. වචනයෙහි තේරුම.

පදලස = 1. පාද ලාංඡනය; පා සලකුණ; අඩිලකුණ.

පදවර = 1. පියවර.

පද වික්ෂේපය = 1. අඩි තැබීම.

පද විති හාර = 1. පියවර; ගමන් කරන විට දෙපා අතර ඇති දුර ප්‍රමාණය.

පද විති හාරානිසංසය = 1. පුණ්‍යකර්මයක් සඳහා (පාතබා) ගමන් කිරීමෙන් ලබන අනුසස්.

පද විද්‍යාව = 1. වචන විස්තර දැනීම.

පදවිය = 1. තතතුර. 2. පාර.

පද විවරණය = 1. වාක්‍යයක් තේරුම් කිරීම. 2. අර්ථ කීම.

පද සන්න = 1. පදයන්ගේ තේරුම.

පද සා = 1. පයේ ඇඟිලි.

පද සිද්ධිය = 1. වචන සෑදීම. 2. වචන විස්තරය.

පද හරණ = 1. පයේ ආභරණ.

පද් = 1. පාදය. 2. රශ්මිය.

පද්ග = 1. පයින් යන්නා; පදිකයා.

පද්දනවා = 1. එහා මෙහා වැනෙන්නට සලස්වනවා.

පද්ම = 1. නෙළුම් මල. 2. එකම් ගණන.

පද්ම, පද්මක = 1. ඇතාගේ ඔළුවේ සහ හොඬේ තිබෙන පුල්ලි.

පද්මකර්ණිකා = 1. නෙළුම් බීජකෝෂය; පියුම් කෙමිය.

පද්මකා = 1. වැල්මදට.

පද්මකාෂ්ඨ = 1 සුවඳ ලී වර්ගයකින් සාදන බෙහෙතක්.

පද්මකේශර = 1. නෙළුම් රේණු

පද්මගන්ධි = 1. නෙළුම් හෝ මානෙල් සුවඳ ඇති. 2 බ්‍රහ්මයා.

පද්මශණ් = 1 නෙළුම් මලේ ඇතුළත කොටස. 2 එකම් විල.

පද්මනාභ = 1. විෂ්ණු දෙවි. 2. නෙළුම් මොට්ටුව.

පද්මනාල = 1. නෙළුම් නටුව; නෙළුම් දණ්ඩ.

පද්මිනී = 1. නෙළුම් මල 2. නෙළුම් මල් රැස. 3. නෙළුම් සුවඳින් යුත් උත්තම කාන්තාව. 4. නෙළුම් මල් (නෙළුම් මොට්ටු) වැනි ඇස් ඇති කාන්තාව. 5 උත්තම කාන්තා සතර වර්ගයෙන් පළමුවැනි වර්ගය.

පද්මබන්ධය = 1. නෙළුම් මල මෙන් අකුරු යොදා සෑදූ කවිය.

පද්මබන්ධු = 1. නෙළුමේ මිත්‍රයා. 2. ඉර. 3. මීමැස්සා.

පද්මභූ = 1. නෙළුමෙන් පැවතෙන. 2. නෙළුමෙන් උපන්.

පද්මය = 1. නෙළුම්. 2. මානෙල්. 3. වස්තුව.

පද්මමුකුල = 1. නෙළුම් මොට්ටුව.

පද්මයෝනි = 1. නෙළුමෙන් උපන්. 2. බ්‍රහ්මයා.

පද්මරාග = 1. රතු කැටය.

පද්මරාගමණි = 1. රත්න විශෙෂයක්; රතු කැටය.

පද්මරේඛා = 1 නෙළුම් මලේ රොන්.

පද්මලාඤ්ඡනය = 1. නෙළුම් ලකුණ ඇත්තා. 2. රජ. 3. ඉර.

පද්මවන = 1. නෙළුම් විල; පියුම් වනය.

පද්මසම්බෝධ = 1. නෙළුම් පිපෙන්නට සලස්සන්නා ඉර.

පද්මා = 1. සැපිත්ත 2. රතු සායම් සෑදීමට ගන්නා පැළෑටි ජාතියක්. 3 දිව්‍ය නාග දේවියක්. 4. ලක්ෂ්මී

පද්මාකර, පද්මාකරය = 1 නෙළුම් විල

පද්මාචරයා = 1 මීමැස්සා.

පද්මාලය = 1. නෙළුම් ගේ 2. ලක්ෂ්මී.

පද්මාවතී = 1. ගඟක නමක් 2 මනසානාග දිව්‍යාංගනාව. 3. එනම් කුමරිය.

පද්මාසන = 1. පියුම් නැමැති ආසනය; අරමිණියා ගොතාගත හිඳීම. 2. නෙළුම් මලින් (සැරසූ) සෑදූ ආසනය. 3. බ්‍රහ්මයා.

පද්මිනීකණ්ඨ = 1. ගඩු වෙසෙසක්.

පද්මිනීකාන්ත = 1. සූර්යයා; ඉර.

පද්මිනීවල්ලභ = 1. නෙළුම්හි ස්වාමියා; ඉර.

පද්මියා = 1. ඇතා.

පදාකාර = 1. පොත අනුව.

පදාන = 1. දීම. 2. ප්‍රදානය; තෑගි කිරීම.

පදානු = 1. පදය අනුව 2 ගිය අඩිපාරේ යන.

පදාංශය = 1. වචනයක හෝ වාක්‍යයක තේරුම. 2. වස්තුව.

පදාසනය = 1. පා පුටුව; පා තබන මිටි පුටුව.

පදැඟිල්ල = 1. පයේ ඇඟිල්ල (පද + ඇඟිල්ල)

පදිංචිකාරයා = 1. යම් තැනක ජීවත් වන්නා; වාසය කරන්නා.

පදික = 1. පාබල සේනාවට අයිති. 2. මග යනඑන්නා. 3. වේදිකාව.

පදිකවෙළෙන්දා = 1. මග දෙපස වේදිකාවන්හි බඩු තබාගත වෙළෙඳාම් කරන වෙළෙන්දා.

පදිනවා = 1. එහා මෙහා ඇද්දෙනවා. 2. ඔරු ආදිය පැදයනවා.

පදියම = 1 මැණිකක්. 2. නැවතීම; පදිංචිවීම.

පදියම් කරනවා = 1. පදිංචිකරනවා.

පදිරිකැකෑ = 1. ඉස අත් තබන පියා; පක්ෂියා.

පදී = 1. කාව්‍යය; පද්‍යය.

පදීප = 1 ප්‍රදීපය; පහන. 2. එළිය.

පදීපෙය්‍ය = 1 පහන් දැල්වීමට වුවමනාදේ

පදුට්ඨ = 1 ඉතා දුෂ්ටවූ. 2. ඉතා නරක්වූ; දූෂිතවූ.

පදුම = 1 පියුම; 2. නෙළුම් විල. 3. නරකයක නමක්. 4 විශාල ගණනක්.

පදුමකණ්ණිකා = 1 පියුම් කෙමිය; නෙළුම් මලේ බීජ කෝෂය.

පදුමකලාපය = 1. නෙළුම් මල් මිටිය.

පදුමරාජ = 1. මහ පියුම.

පදුමරාග = 1. පද්මරාගය; රතු කැටය; රතු මැණික.

පදුමසර = 1. පියුම් විල

පදුමී = 1 පදුම කුලයේ ඇතා. 2 පියුම් විල ඇත්තා.

පදුමුත්තර = 1, එනම් බුදුන් වහන්සේ,

පදුල = 1 ඉතා දීප්තිමත්.

පදෙස = 1. ප්‍රදේශය. 2. ස්ථානය 3. කොටස.

පදේසලක්ඛණ = 1. කොටසක දැනීම.

පද්‍යය = 1. කවිය 2. සිවුපදය. 3. නැවගතර පලම.

පද්‍ය බන්ධනය, පද්‍ය රචනය 1. = කාව්‍යය. 2. කවි තැනීම.

පද්‍යෝත්පත්තිය = 1. මවක උත්පත්තිය.

පඳුර = 1. පැලෑටි පොකුර. 2. කැලෑ කොටස.

පඳුරුකරු = 1. පතික්තියා.

පඳුරු වටුවා = 1. වටු විශේෂයක්.

පධන් = 1. කෙලෙස් නැවීම. 2. කෙලෙස් නැවීමෙහි වීර්යය.

පධාන = 1 ප්‍රධාන 2. ප්‍රමුඛ. 3 කෙලෙසුන් නැවීමේ වීර්යය.

පධාවන = 1 එහා-මෙහා දිවීම.

පපටිකාව = 1. තුනී ලී කැබැල්ල 2. ගල් පතුර. 3. ගැලවුණු පොත්ත.

පපන, පපන් = 1. අශ්වකෑගැය. 2. කටකලියාව.

පපා = 1. පැන් ශාලාව. 2. වතුර භාජන තබන තැන. 3. දක්වමින්.

පපතන = 1. වැටීම. 2. බෑසීම.

පපාතය = 1. ගැඹුරු ලෙස සිඳිනි ස්ථානය. 2. පල්ලම. 3. බෑවුම.

පපිතාමහ = 1. සීයාගේ පියා; මුත්තා.

පපිනිය = 1. එක්ව මත් පැන් බීම.

පපු = 1. පපුව. 2. කිරිමව. 3. ලපැත්ත. 4. කඳවත.

පපුකෑනෑක්ක = 1. හෘදය, පෙණහැලි ආදී කෑවුත්ත.

පපුක්ක = 1. මුණුබුරා.

පප්ඵාස = 1. පපුව. 2. හෘදය වස්තුවට පිටින් තිබෙන පපු මස.

පප්පඩම් = (පපඩම්) 1. උඳුපිටියෙන් සාදන කෑම වර්ගයක්.

පභා = 1. ආලෝකය; එළිය. 2. දිලිසීම. 3. ප්‍රභාව.

පභාඛන්ධ = 1. එළිය රාශිය; රැස් සමූහය.

පබන්ධ = 1. ප්‍රබන්ධය; කාව්‍ය රචනා ආදිය. 2. ප්‍රසිද්ධ. 3. සම්බන්ධ; අතරක් නැති. 4. ධාරාව; වැල නොකැඩී වැටෙන ජල ආදිය.

පබමණ්ඩල = 1. ප්‍රභා මණ්ඩලය; රශ්මි මාලාව.

පබල = 1. ප්‍රබල; ඉතා බලවත්. 2. පබළු. 3. දළුව.

පබලපත් = 1. ලාදළු.

පබළු, පබළු = 1. පබුළු.

පබුළුවැල = 1. පබළු ඇට අමුනා සෑදූ මාලය.

පබළුඇටය = 1. කොරල් ඇටය.

පබළුකඩ = 1. පබළු කැබෙල්ල.

පබළුමය = 1. කොරල් වලින් සෑදූ.

පබළුව, පබුළුව, පබළු = 1. ලා දළුව. 2. කොරල්.

පබළුසිඳු = 1 පබළු මුහුද.

පබවත් = 1 ආලෝක ඇති. 2. ප්‍රභාවතී දේවිය.

පබසර = 1. පාට පහ එක්වූ පාට. 2. කනට මිහිරි හඬ 3. බබළන.

පබ්බජන = 1. පැවිදිවීම.

පබ්බත = 1. පර්වතය.

පබ්බජිත = 1. තාපස. 2. පැවිදිවූ. 3. පැවිද්ද.

පබ්බාජන = 1. පැවිදි කිරීම. 2. පිටමං කිරීම.

පබ්භාර = 1 බෑවුම. 2 නැමීම. 3. කැඩීම. 4. කන්ද බිඳී ගාමෙන් සෑදුණු ගුහාව වැනි තැන.

පභාකර = 1. එළිය දෙන්නා-හිරු.

පභාව, පභා = 1. එළිය. 2. දීප්තිය. 3. පභාවතී දේවිය.

පභාතිසය = 1. එතම් අතිශාරය; ප්‍රවෘත්තිකාව.

පභු = 1 ප්‍රධාන. 2. පොහොසත්.

පභ = 1. කුඩා පැලෑටි වර්ගයක්.

පභියා = 1. යමකු පෙඟතය මෙන් සෑදූ විකට රූපය. 2. නෘණ පුරුෂයා.

පමුර්ද = 1. ගස් වර්ගයක්.

පභංගුර = 1. බිඳෙන සුලු.

පභව = 1. ප්‍රභවය; හටගැන්ම. 3. ආලෝකය. 3. බලය. 4. ඉපදීම. 5. පැවැත්ම. 6. උපදින තැන. 7. මුල් හටගැන්ම 8. හේතුව.

පභා = 1. ප්‍රභාව; ආලෝකය; එළිය. 2. රශ්මිය.

පභාකර = (ප්‍රභාකර) 1. සූර්යයා. 2. ආලෝකය දෙන්නා.

පභාත = 1. උදෑසන.

පභාව = 1 ප්‍රභාව; එළිය. 2. කාන්තිය. 3. තේජස. 4. බලය.

පභස්සර = 1. ඉතා බබළන 2. ඉතා පැහැදිලි.

පභාවිත = 1. වඩන ලද

පභාස = 1. ආලෝකය; එළිය.

පභාසිත = 1. බැබළුණු.

පභින්න = 1 බිදී ගිය. 2. විශේෂ විභාගයකට පැමිණි

පභු = 1. අධිපතියා; ප්‍රභුවරයා. 2. සමර්ථයා.

පභේද = 1. ප්‍රභේදය; වෙනස. 2 වෙනස් ඇති.

පභේදන = 1. බිඳීම. 2 කොටස් කිරීම.

පම = 1. පමාව 2. ප්‍රේමය. 3. ආලය.

පමණ = 1. ප්‍රමාණය; තරම. 2. විතර.

පමණ කරනවා = 1. ප්‍රමාණ කරනවා; කොටස් කරනවා.

පමණක් = 1. විතරක්.

පමුණු = 1. ප්‍රමාණය. 2. ප්‍රවේණි ඉඩම.

පමජ්ජන = 1 ප්‍රමාදවීම. 2. පිරිමැදීම; අතගෑම.

පමත්ත = 1. ප්‍රමත්ත; පමාවූ.

පමතන = 1. ප්‍රමථනය; මැඩීම.

පමත්ත = 1 මත්වූ 2. ප්‍රමාදයට පත්. 3. පිරිහෙන ක්‍රියාවන්හි යෙදුණු.

පමත්ත බන්ධු = 1. ප්‍රමාදවූවන්ගේ මිත්‍රයා. 2. මාරයා.

පමද = 1. ප්‍රමාදය.

පමදන = 1. ප්‍රමාදවන.

පමදවන = 1. රජ ගෙය අවට උයන.

පමදා = 1. ප්‍රමදාව; ස්ත්‍රිය. 2. ප්‍රීතිය. 3. වෑන්තයක්.

පමද්දන = 1. මැඩීම. 2. යටත් කිරීම.

පමද්දිත = 1. මඩින ලද. 2. යටත් කරන ලද.

පමා = 1. ප්‍රමාදය. 2. ප්‍රමාදව. 3. කලබන. 4. කිම් ගිමියා.

පමා කරනවා = 1. ප්‍රමාද කරනවා. 2. අතපසු කරනවා.

පමාතු = 1. මණින්නා; ප්‍රමාණ කරන්නා.

පමාද = 1. ප්‍රමාදය. 2. දුශ්චරිතය 3. වැරදීම. 4. නිතර සිහිය එළඹ නො සිටීම.

පමාද පාඨ = 1. වැරදී ලියවුණු වචනය.

පමාදන = 1. ස්ත්‍රී ජනයා. 2. විනෝදකාමි ජනයා.

පමාණ = 1. ප්‍රමාණය. 2. මැණීම. 3. මිම්ම. 4. උස මහත ආදිය.

පමාව = (පමා) 1. කලබන. 2. කාන්තාව. 3. ප්‍රමාදවීම. 4. සිහි මුළාව. 5. භාර්යාව. 5. පස්කම් සැපෙහි ඇලීම.

පමාලිය = 1 ප්‍රමාදය නමැති වැල.

පමාවන = 1. රජ උයන. 2. ප්‍රමදාවන් හා විනෝද ක්‍රීඩා ආදියෙහි යෙදෙන රාජකීය උද්‍යානය.

පමිණි = 1. ප්‍රමාණය.

පමු = 1. සවඩිග. 2. ලකුව.

පමුඛ = 1. ඉදිරිය. 2. ගෙයි ඉදිරිපස. 3. පිළ. 4 ප්‍රධාන. 5. ප්‍රමුඛවූ.

පමුච්ඡිත = 1. මූර්ජාවට පත්; මූසපත්වූ. 2. මුළාවූ.

පමුළු = 1. සිහි මුළාවූ; මතක නැතිවූ.

පමුදම් = 1. සවඩිය.

පමුණනු = 1. පැමිණිලි කිරීම.

පමුණු = 1. අගබඳු තෙව්න යුතු. 2. නැග්ග. 3. ප්‍රමාණය. 4. පරිවේණි ඉඩම. 5. සමාට අහිණි.

පමුණු කොටා = 1. අයිති කොට.

පමුණු ගම = 1. සමන් ගේ ගම; නින්දගම.

පමුණු ලදු = 1. ප්‍රවේනි ඉඩම් ලැබූ අය.

පමුණුවනවා = 1. එන්නට සලස්වනවා. 2. ගෙන එනවා.

පමුණු වත්ණි = 1. පමුණු වන ස්ත්‍රී.

පමුත්ත = මිදුණු. 2. වෙන්වී ගිය.

පමුදිත = 1. ප්‍රමුදිතවූ; ප්‍රීතිමත්වූ; සතුටුවූ.

පමොක්ඛ = 1. නිදහස. 2. මිදීයාම.

පමෝචන = 1. ලිහා දැමීම. 2. නිදහස් කිරීම.

පමෝද 1 සතුට. 2. මහත් ප්‍රීතිය.

පමෝදනා = 1. සතුටු වීම; ප්‍රීතිවීම

පමෝහන = 1. මුළා කිරීම. 2. පොළඹවන.

පම්පක = 1. උණ හපුළුවා.

පය = 1. අඩිය. 2. පාදය. 3 පාත්‍රය. 4. පූජ්‍ය. 5. අමුණක ප්‍රමාණය. 6. ජලය. 7. කිරි.

පයත = 1. පිරිසිදුවූ.

පයත් = 1. කඳු පල්ලම. 2. ප්‍රාන්තය; පාමුල.

පයත් දනව් = 1. පිටිසර පෙදෙස; පිටිහර ගම.

පයතන = (පයත්න) 1 ප්‍රයත්නය; උත්සාහය.

පය පියුන් = 1. පා පිස්න; පා පිස්ස.

පයස = (පයස්) 1 කිරි බත්. 2. කිරි.

පයස්‍ය = 1. කිරෙන් සෑදූ.

පයාග 1. ගංගා නම් ගඟේ ප්‍රයාග තීර්ථය. 2. යමුනා ගඟ හා ගංගා නම් ගංගාව එක්වූ තැන.

පයා ගඟ = 1. ප්‍රයාග තීර්ථය.

පයාත = 1. ගිය.

පයැපිරිසැරි = 1. පාද පරිචාරිකාව.

පසි = (පසිය) 1. කුඩා පසුම් බිය. 2. පුංලිංගය. 3. ඔලගුව.

පසිකඩ = 1. පසුම්බි රෙද්ද.

පසිරු පාසනය = (පයුරුපාසනය) 1. ආශ්‍රය කිරීම. 2. සේවනය. 3. සමාගම් නැබීම.

පයෝග = 1. යෙදීම. 2. උපාය. 3. උපක්‍රමය. 4. ප්‍රයෝගය. 5. ක්‍රියාව. 6. වියැසීය.

පයෝගචය = 1. ගල් වර්ෂාව.

පයෝජක = 1. යොදවන්නා.

පයෝජන = 1. යෙදවීම. 2. ප්‍රයෝජන.

පයෝදි = 1. මුහුද.

පයෝදිජ = 1. මුහුදු පෙන.

පයෝදධි = 1. මුහුද.

පයෝධර = 1. වලාකුළ. 2. (ස්ත්‍රීන්ගේ) තනය. 3. පොල් නෙඩිය. 4. උක් ගස.

පයෝධරපට්ට = 1. තන පට.

පය්‍යක = 1. සීයා ගේ පියා.

පර = 1. අන්‍යයා 2. නීචයා. 3. වෙනත්. 4. පිට. 5. ඝෝෂාව; හඬ. 6. මැලවුණු. 7 වෙනස්. 8 පිට රටකට අයිති. 9. සතුරු. 10. ජාතියෙන් පිට කළ. 11. ගස් වර්ගයක්. 12. මුහුදේ ලොකු ගල්. 13. ඉදුණු. 14. පසුවූ 15. ස්වකීය නොවූ.

පර අඟන = 1. පර ස්ත්‍රිය.

පර අජ්ජා = 1. පියා මැරුණු පසු මව විසින් පාවාගත් පුරුෂයා.

පර අම්මා = 1 තමන්ගේ මෑණියන් නොවූ පියාගේ භාර්‍යාව.

පර ඉතුන් = 1. අත් අඹුවන්.

පරකට = 1. ප්‍රසිඬ.

පරකත = 1. අනුන් විසින් කරන ලද.

පරක්කම = 1. පාරාක්‍රමය. 2. සුර වීර්‍ය බලය.

පරක්කුව = 1. ප්‍රමාදය 2. කල් අනපසු කිරීම. 3. වැස්ම.

පරකාර = 1. අනුන්ගේ ක්‍රියාව.

පරකාය = 1. අන්‍යයාගේ ශරීරය.

පර කාශස් = 1. ප්‍රසිද්ධිය.

පරකීය = 1. අනුන්ට අයත් වූ.

පරකුල් = 1. ඇතුන් බඳින දම්වැල.

පරගානවා = 1. කෙඳිරි ගානවා. 2. ඝෝෂා කරනවා.

පරංගි = 1 පෘතුගීසි දේශයෙන් පැමිණි ජනයා. 2. එනම් ව්‍රණ රෝගය.

පරංගියා = (පරංගි කාරයා) 1. පෘතුගීසි මනුෂ්‍යයා.

පර ගානි = 1. ශබ්ද පවත්වන්නී.

පරගනවා = 1. පෙරනවා.

පරඬුඹ = 1. පිටිපෑම. 2. ඉවතට යොමු කරන ලද මුණ ඇති.

පරචිත්ත විජානනය = 1. අනුන්ගේ සිත් දැන ගැනීම.

පරචිත්ත විඥානනාඥානය = 1. අනුන්ගේ සිත් දැනගන්නා නුවණ.

පර ජන්ම = 1. මේ ජාතියෙන් අන්‍ය ජාතිය.

පරට = 1. ප්‍රසිද්ධ. 2. පිදිය යුතු.

පරඹු = 1. පුරා බොහො - සුදු කෙලින අය.

පරම්ට = 1. නිත්දින. 2. දුෂ්ට පැවතුම් ඇති.

පරඬල් = 1. වියලි කොළ.

පරඬල් කුරුල්ලා = 1. රතු දෙමලිච්චා.

පර කතුරු = 1. අනුන්ට අයත්.

පර තිර = (පර තෙර) 1. අනෙක් ඉවුර. 2. ශිල්ප - ශාස්ත්‍රාදියෙහි කෙළවර.

පරන්තපය = 1. හිංසාකිරීම. 2. යටත් කිරීම.

පරනිර්මිතය = 1. සදිව්‍ය ලෝකයන් අතුරින් සවැනි දෙව් ලොව.

පරදර = (පර දර) 1. අනුන්ගේ භාර්‍යාව. 2. කාමයෙහි වරදවා හැසිරීම.

පරදර සේවනය = 1. කාමමිථ්‍යාචාරය.

පර දුක = 1. අනුන්ගේ දුක.

පර දේශ = 1. අන්‍ය රට; විදේශය.

පර දේශික = 1. අන් රටකට අයිති.

පර ද්‍රව්‍යය = 1. අන් සතු දෙය.

පර ධන = 1. අන් සතු වස්තුව.

පර ධන කිත ජේබා = 1. අනුන්ගේ ධනය ලබන්නට වාසනාව ඇති රේඛාව.

පරණ = 1. කල්ගිය. 2. පුරාණ. 3. ඉහත. 4. ආදිකාලයේ. 5. අනුන්ට අයත්. 6. මතදෙල; සිතේ ආශාව. 7. ප්‍රාණය. 8. පහර දීම. 9. දෙලදුක. 10. අනුන් අතින් රැකෙන්නා. 11 තැලීම 12. කොටන. 13. ගල්කැට.

පරණ කම = 1. පැරණි බව 2. කල් ගත වූ ප්‍රමාණය.

පරණ ගඩ = 1. කල් ගත වූ ගඩුව.

පරණාදිනඩ = 1. මාසය.

පරණ කම් = 1. ඉහතකාල අකුසල්; පූර්වකර්මය.

පරණලා = 1. වියලුණු කොළ.

පරණලා පත් 1. වියලි කොළ.

පරත = 1. ක්‍රමය. 2. පිළිවෙළ 3. අඹුදරුවන් නොතකා තමන් ජීවත්වීම.

පරතන්ත්‍ර = 1. අනුන් කෙරෙහි පිහිටි. 2. අනුන් අයත්වූ.

පරත්‍ර = 1. පරලොව. 2. පරාර්ථය; අනුන්ගේ යහපතට කටයුතු කරන.

පරදත්තූපජීවි = 1. අනුන් දුන් දෙයින් ජීවත් වන්නා.

පර පණ = 1. අනුන්ගේ ප්‍රාණය.

පර පදන් = 1. පසු පදය.

පර පුමු = 1. කොවුලා.

පර පුළු = (පර පුෂ්ට) 1. අනුන්ගෙන් පෝෂණය ලබා රැකෙන්නා. 2. කොවුලා. 3. හදාගත් දරුවා.

පර පුරුෂයා = 1. හොර හිමියා.

පර බලු = 1. අනුන්ට අයත් බල්ලා; පිට බල්ලා.

පර භක්ත = 1. අනුන්ගෙන් ජීවත් වන්නා.

පර භාගය = 1. ඉතිරි පංගුව.

පර භෘතයා = 1. අනුන්ගෙන් පෝෂණය ලබන්නා.

පරම = 1. ඉතා උතුම් 2. ඉතා වැදගත්.

පර මණ්ඩල = 1. පර දේශය.

පරමණ්ඩලේශ්වර = (පරමණ්ඩල + ඊශ්වර) 1. පර දේශාධිපති රජ.

පර මත = 1. අනුන්ගේ අදහස.

පර මල් = 1. පරවුණු මල්; මැල වුණු මල්.

පර මසා = 1. පරමාර්ථය. 2. උසස් බලා පොරොත්තුව.

පරම දර්ශනී = 1. ඉතා දකුම් කලු.

පරම දූත = 1. ඉතා උතුම් දූතය.

පරම පූජනීය = 1. පිදුමට ඉතා සුදුසු.

පරම රතිකාර = 1. ඉතා ඇලුම් ඇතිකරන.

පරම රමණීය = 1. ඉතා ලස්සන; ඉතා සිත්කළු.

පරමාණු = 1. පරමාණුය.

පර වස් = 1. අනුන්ගේ වස්තු

පර වාද = 1. බුදු දහමින් පිට වෙනත් ආගම්. 2. අන්‍යයන් හා කළ වාදය.

පර වාදී = 1. විරුද්ධ වාදියා.

පර වැඩ = 1. අනුන්ගේ යහපත ගැන කරන වැඩ. 2. නෑන වැඩ.

පරම විඥාන = 1. උසස්ම නුවණ.

පරම විඥානාර්ථ = 1. උසස්ම ඥානයට අයිති.

පරම හතුරා = 1. ප්‍රධාන විරුද්ධ කාරයා 2. කඳ හතුරා.

පරම්පරාව = 1. පරපුර. 2. පෙළපත. 3. පැවත එන පිළිවෙළ. 4. ක්‍රමය. 5. වංශය. 6. සන්තතිය; පෙළ.

පරම්පරා කථා = 1. කටින්-කට පැවත එන කථාව. 2. ආරංචිය. 3. පරම්පරාවේ ඉතිහාසය.

පරම්පරාගත = 1. පෙළපතින් පැවත එන. 2. පරම්පරාවෙන් පැවත එන (පරම්පරානුයාත)

පරම්පරානුගත = 1. පරම්පරා පිළිවෙළින් ගිය.

පරමාන්නය = 1 උතුම් ආහාරය. 2. කිරිබත්.

පරමාණු = 1. අණුවෙක් භින්නයෙන් කොටස. 2. ඉතාමත්ම සියුම් ද්‍රව්‍යය.

පරමාත්ම = (පරම + ආත්ම) 1. මහා බ්‍රහ්මයා. 2. ප්‍රධාන ආත්මය.

පරමාධ්‍යාශය = (පරම + අධ්‍යාශය) 1. උතුම් අදහස.

පරමායු = 1. ආයුෂයේ අන්තිම ගණන.

පරමු = 1. වෙන. 2. අනෙක්. 3. අන්‍යයා.

පරමුණු = 1. පරමාණුව.

පරමුද්ග = 1. තිරිඟු.

පර මුහුද = 1 මුහුදින් එතෙර 2. පිට මුහුද.

පරමේශ්වර = (පරම + ඊශ්වර) 1. බුදුන් වහන්සේ. 2. විෂ්ණු දෙවි. 3. ඊශ්වර දෙවි 4. මහා බ්‍රහ්මයා. 5. ප්‍රධානයා.

පරමේෂ්ඨ = 1. ඉතා උසස්.

පරය = 1. පියාලි හැළිගල. 2. ගල් කණුවක. 3 ඉන්ද්‍රිය.

පරයනා = 1. පරදවන.

පරයා = 1. නීචයා 2. ජාතියෙන් පිට කළ තැනැත්තා. 3. විදේශිකයා.

පරසින් = 1. පිහිට.

පර රට = 1. පිට රට.

පර රාජ = 1. අන් රජ; අනෙක් රටක රජ.

පර රූ = 1. පර රූපය; පසු පදයේ මුල අකුර ලෙස මුල් පදයේ අග අකුර යෙදීම.

පරලය = 1. ප්‍රලය; මන්ත්‍ර බලයෙන් සිහි නැතිකිරීම.

පරල වෙනවා = (පරලෙ වෙනවා) 1. ආවේශ වෙනවා, 2. කම්පා වෙනවා 3. කිපී, නොසන්සුන් වෙනවා.

පරලු = 1. පිටිවගීයක්; තිරිඟු කුඩු. 2. කැකිය.

පරලු පාන් = 1. පරලු පිටියෙන් සැදූ පාන්.

පර ලොව = 1. අනෙක් ලෝකය. 2. මරණින් පසු උපදින ලෝකය.

පරලෝක ප්‍රාප්ත = 1. මිය පරලොව ගිය; මිය ගිය.

පරලෝ සැපැත් = 1. ස්වර්ගස්ථ වූ; මිය ගිය.

පරව = 1. වැඳි හට්ටයා. 2 මලානිකව හැකුළුණු 3 (ඇඟිලි). පුරුක. 4. සන්ධිය.

පර වන = 1. අග අකුර.

පරවශ = 1. දුරු කිරීම.

පරවස් = 1. අනුන්ගේ වස්තුව.

පරවම් ගණය = 1. අනුන්ට නිස්ඳුකිරීම. 2. අනුන් පෙළා දැනීම.

පරවර=1. ප්‍රවර; ඉතා උසස්; ශ්‍රේෂ්ඨ. 2. දකුණු ඉන්දියාවේ රටක්. 3. මනුෂ්‍ය ජාතියක්.

පර වර්ගයා = (පරවරා) 1. පරවර ජාතිකයා.

පරමි = 1. පරාමි නම් මත්ස්‍යයා.

පර විෂක = 1. අන් වෙන. 2. වෙන් මාරු-කිරීම.

පර විග = 1. පරෙව්. 2. විහඟ.

පරවා = 1. පරාවි නම් මත්ස්‍යයා.

පරවි = (පරෙවි) 1. පාරාපත පක්ෂියා; පරෙවියා. 2. හතුරා.

පරවි සමොක්තම = 1. පරෙවි රැළ.

පරවිපි = 1. පරාඞ්මුඛය; අසම්මුඛය.

පරවිපිලි = 1. වියෝගය; වෙන්වීම. 2. මරණය. 3. පරම්පරාව.

පරවැඩ = 1. අනුන්ගේ වැඩ.

පරවුරු = 1. පරම්පරාව.

පරවෙණි = (පරවේණි) 1. පරම්පරාවට අයත්. 2. මවු පිය උරුමයෙන් ලැබුණු (වස්තුව.)

පරශත්‍රු = 1. අන් සතුරු.

පරශු = 1. පොරොව.

පරශු ධාරා = 1. පොරොවෙහි මුවහත.

පරශු රාම = 1. විෂ්ණු දෙවියන්ගේ අවතාර අතුරින් එකක්.

පරස = 1. පරහ. 2. වෙනස්කම. 3 නොගැලපීම.

පරස් පර = 1. අන්‍යෝන්‍ය; එකිනෙකා. 2. එකකට එකක් වෙනස්.

පරස්පර විරෝධි = 1. එකකට එකක් විරුද්ධවූ.

පරසතු = 1. අනුන්ට අයිති. 2. දෙව් ලොව වෘක්ෂයක්. 3. එම මල්. 4. තාමල්. 5. අබ

පරසමය = 1. අන්‍ය ආගම. 2. මිථ්‍යා දෘෂ්ටිය.

පරසර = 1. පර ස්වරය; පසු පදේ මුල් සවරය.

පර සරු = 1. පරාසර නම් නක්ෂත්‍ර ග්‍රන්ථය ලියූ ඍෂිවරයා. 2. ව්‍යාසගේ පියා.

පරස් දුව = 1. විවාහ මංගලය.

පරසාද = 1. ප්‍රසාදය; සතුට.

පරසිඳු = 1. ප්‍රසිද්ධ.

පරසිද්ද = 1. ප්‍රසිද්ධ. 2. ප්‍රකට.

පරසු = 1. පොරොව.

පරසුවෙ = 1. අතිද්දෑ.

පරහ = 1. වෙනස. 2. ඇදය. 3. පළුද්ද 4. වැරැද්ද.

පරහට = 1. අනුන්ට.

පරහන = 1. පෙරහන; දිය පෙරන උපකරණය; පෙරහන් කඩය. 2. පෙරණ.

පරසාද = 1. ප්‍රසාදය; පැහැදීම.

පරහස් = 1. ඉතා රහස්

පරහළ = 1. පරාලය.

පරහිත = 1 අනුන්ට හිත; අනුන්ගේ යහපත පතන.

පරහිත නිරතවූ = 1. නිතර අනුන්ගේ යහපත සලස්වන.

පරහේතු = 1. අනුන් පිණිස; අනුන් නිසා.

පර්ජන්‍ය = 1. මේඝය; වලාකුළ. 2. ඉන්ද්‍රයා.

පර්ණ = 1. කොළ. 2. පිහාටු. 3. ලිපිය. 4. ලිවීමට ගන්නා පත්‍රය. 5. පක්ෂියා (පිහාටු ඇත්තා.)

පර්ණකුටි = 1. කොළ සෙවිලි කළ පැල 2. අතු පැල.

පර්ණ ච්ඡදන = 1. කොළ සෙවිල්ල; කොළ සෙවිලිකළ පියස්ස.

පර්ණ පුට = 1. කොළ ගොටුව.

පර්ණ ශාලා = 1. පන්සල. 2. කොළ සෙවෙනි ඇති ගෙය

පර්ව = 1. පැසිලිය; පත්පොබගම්. 2. හතු.

පර්ශු = 1. අත්කරත්තය.

පර්යඞ්ක – 1. ආසනය; පුටුව. 2 අරමිතියා ගොතා හිඳ ගැනීම.

පර්යටනය = 1 ඉබාගාතේ යාම.

පර්යන්ත = 1. කෙළවර. 2. අන්තිම.

පර්යවදාත = 1. හාත්පසින් පිරිසුදු.

පර්යවසාන = 1. කෙළවර. 2. අන්තිම. 3. කොණ.

පර්යවසාන කෝටි = 1. අන්තිම කෙළවර.

පර්යාප්ත = 1. පැමිණෙන ලද. 2. සමර්ථ. 3. නැහෙන. 4. ලබාගත්. 5. සම්පූර්ණ. 6. කෘප්ත.

පර්යාප්ති = 1. ආරක්ෂාව. 2. ලබාගැනීම. 3. ත්‍රිපිටක ධර්මය. 4. ප්‍රගුණ කටයුතුදෙය.

පර්යාප්ති ධර = 1. ත්‍රිපිටක ධර.

පර්යාප්ති ධර්මය = 1. ත්‍රිපටක ධර්මය.

පර්‍යාප්ති ශාසනය = 1. ත්‍රිපිටක ධර්මය නමැති ශාසනය.

පර්‍යාය = 1. පිළිවෙළ. 2. ක්‍රමය. 3. සමානාර්ථ ඇති ශබ්දය. 4. ප්‍රස්තාව.

පර්‍යාය කථා = 1. අදහස කෙළින් නොකියා අනෙක් ක්‍රමයකින් කීම.

පර්‍යුදාස = 1. වැළැක්වීම.

පර්‍යුපාසන = 1. ආශ්‍රය. 2. සේවනය කිරීම.

පර්‍යේෂණ = 1. සෙවීම. 2. පරීක්ෂා කිරීම. 3. සෝදිසිය.

පර්‍යේෂණා = 1. පර්‍යේෂණය; පරීක්ෂාව.

පර්ව = 1. පුරුක. 2. ගැටය.

පර්වරේඛා = 1. පුරුකෙහි පිහිටි රේඛාව.

පර්වන = 1. අත්-පා පුරුක්; ඇඟිලි පුරුක්.

පර්වත = 1. කඳු.

පර්වත කූටාවලිය = 1. කඳු වළල්ල; කඳුපෙළ.

පර්වත ඛණ්ඩ = 1. කඳු ගැටය.

පර්වත ගහණ = 1. බොහෝ කඳු ඇති ප්‍රදේශය.

පර්වත ගුහා = 1. කන්දෙහි වූ ගල් ලෙන්

පර්වතච්ඡායා = 1. කඳුවල සෙවනැල්ල.

පර්වත ජාල = 1. වැල් ආදියෙන් වැසී ගිය පර්වත මධ්‍ය භාගය.

පර්වත දුර්ග = 1. යාම් ඊම් අපහසු කඳු නරහා යන පාර.

පර්වත පාද = 1. කඳු පාමුල.

පර්වත ප්‍රාන්තය = 1. පර්වත පාදය. 2. කඳු-පල්ලම; ප්‍රපාතය.

පර්වත රාජ = 1. මහා පර්වතය. 2. මහාමේරු පර්වතය.

පර්වත වලලු = 1. වලයාකාරයෙන් පිහිටි කඳු වැටිය.

පර්වත වාසී = 1. කඳුවල ජීවත්වන්නා.

පර්වත විවර = 1. කඳු ගුහාව.

පර්වත විහාරය = 1. කන්දෙහි වූ විහාරය.

පර්වත ශිඛරය = 1. කඳු මුදුන.

පර්වතාභ්‍යන්තරය = 1. කඳු අතර.

පර්වතාශ්‍රය = 1. කඳු අසල ජීවත්වීම. 2. කඳු ඇසුරු කොට වාසය කිරීම.

පර්වතීය = 1. කඳුකර.

පර්වයෝනිය = 1. උක්ගස. 2. බට. 3. වේවැල.

පර්ශුකාව = 1. ඉළ ඇටය.

පර්ශුව = (පරසුව) 1. පොරොව.

පර්ෂත් = (පර්ෂද්) 1. පිරිස. 2. රැස්වූ සභාව.

පර්ෂද් මණ්ඩල = 1. පිරිස් මඬුල්ල; පිරිස් සමූහය.

පරා = 1. පරාටියා නම් මාළුවා. 2. වයස; අවස්ථාව. 3. වැඩිවූ. 4. ජයගන්නා. 5. පෙරළුණු.

පරාංමුඛ = 1. පිටුපෑ. 2. ඉවත බැලීම. 3. නොසැලකිලිවූ.

පරාක්‍රමය = 1. බලය. 2. වික්‍රමය. 3. කාය ශක්තිය. 4. වීර භාවය. 5. අනුන් මැඩලීමේ බලය.

පරාකරණය = 1. නින්දාකිරීම.

පරාඝාත = 1. පහරදීම; තැළීම.

පරාග = 1. මල් රොන්; මල් රේනු. 2. දූවිලි. 3. සඳුන් කුඩු. 4. සුවඳකුඩු.

පරාගකෝෂ = 1. මල් රේණු කෝෂය.

පරාගවත් = 1. මල්රේණු ඇති.

පරාගධාර = 1. රොන් දහර.

පරාජය = 1. පැරදීම.

පරාජිත = 1. පැරදුණු; පරාජයට පත්වුණු.

පරාඨියා = 1. එනම් මාළුවා.

පරාදය = 1. පරාජය; පැරදීම.

පරාදිසය = 1. දෙව්ලොව.

පරාධිය = 1. දඩයම.

පරාධීන = 1. අනුන් අයත්වූ. 2. යටත්. 3. වසඟ.

පරාධීනතා = 1. අනුන් අයත්වූ පැවතුම් ඇත්තා. 2. වසඟවූ දිවි පෙවෙතක් ඇත්තා. 3. අනුන්ට යටත්වූ.

පරානන්දය = 1. මහත් සතුට.

පරාර්ථ = (පර + අර්ථ) 1. අනුන්ගේ කැම.

පරානුග්‍රහය = 1. අනුන්ට පිහිටවීම.

පරානුවාදය = 1. අනුන්ගේ දෙස්කීම. 2. බැණුම.

පරාපවාදය = 1. අනුන්ගේ දෙස්කීම. 2. කේලාම් කීම. 3. අපහාස කිරීම.

පරාපත = (පාරාපත) 1. පරෙවියා.

පරාභව = 1 පිරිහීම. 2. විනාශය.

පරාභවසූත්‍රය = 1. මනුෂ්‍යයා පිරිහීමට පත්වන කරුණු දක්වෙන සූත්‍රය.

පරාභූත = 1. පිරිහුණු.

පරාමර්ශ = 1. ස්පර්ශ කිරීම. 2. ගෑනීම. 3. අතගෑම; පිරිමැදීම.

පරාමර්ශනය = 1. පිරිමැදීම; අතගෑම.

පරාමාස = 1. ස්පර්ශ කිරීම.

පරායණ = 1 ඉතා ඇලුණු. 2. යමෙකුගෙන් උදව් ලැබීමට බලා ඉන්නා. 3. පිහිටකොට ඇති. 4. උතුම් ආශ්‍රමය.

පරායත් = (පරායත්ත) 1. අනුන්ට අයිති.

පරාර්ථ = 1. අනුන්ගේ යහපත. 2. අනුන්ගේ ධනය.

පරාර්ථකාමී = 1. අනුන්ගේ යහපත කැමති.

පරාර්ථකාමියා = 1. අනුන්ගේ යහපත කැමැත්තා. 2. අනුන්ගේ යහපත සඳහා වැඩ කරන්නා.

පරාර්ථදායකයා = 1. අනුන්ගේ යහපත ගෙන දෙන්නා.

පරාර්ථසාධකයා = 1. අනුන්ගේ යහපත සාදන්නා; අනුන්ගේ දියුණුව සලස්වන්නා.

පරාර්ථසිද්ධිය = 1. අනුන්ගේ දියුණුව සැලැස්වීම.

පරාල = 1. වහලෙහි රීප්ප ගැසීම පිණිස සවි කරන ලී.

පරාලඇම = 1. ඉල ඇට.

පරාලකුඩුව = 1. රීප්ප සවි කිරීමට ගැසූ පරාල තට්ටුව.

පරාලපතු = 1. ඉල ඇට.

පරාවර්තනය = (පරාවර්තය) 1. ආපසු හැරීම. 2. කරකැවී වැටීම. 3. ඡායාව වැටීම.

පරාවා = 1. පරාවියා.

පරාශ්‍රය = 1. අනුන්ගේ ආශ්‍රය.

පරාශර = 1. මහා ඍෂිවරයෙක්; ව්‍යාස ඍෂිවරයාගේ පියා.

පරි = 1. හාත්පස. 2. සම්පූර්ණ 3. වටේට. 4. බොහෝ. 5 පූර්ණ; පිරුණු. 6 ලස්සණ.

පරිකථා = 1. විස්තර කථාව. 2. නවකථාව. 3. ගෙතූ කථාව. 4. අර්ථ වර්ණනාව. 5. කෙළින් නොකියා අනෙක් හැටියකින් කීම. 6. කතාන්තරය. 7. වටපිට දේ ගැන කථාව.

පරිකප්ප = 1. අදහස. 2. සිතිවිල්ල.

පරිකප්පිත = 1. සිතාගත්. 2. සිතිවිල්ල. 3. අදහස.

පරිකර = 1. පිරිකර.

පරිකම්පන = 1. භය 2. තද වෙව්ලුම.

පරිකර්මය = 1. පළමුව කළයුතුදේ. 2. ලෑස්තිවීම. 3. පිරියම; පළමුව ගෑ සායම. 4. සැරසීම. 5. පිරිසිදු කිරීම. 6. පිළියම් කිරීම.

පරිකර්ෂණය = 1. ඔබ-මොබ ඇදීම.

පරිකල්ප = 1. කල්පනා කිරීම. 2. අදහස් කිරීම.

පරිකල්පනය = 1 සිතීම 2. අදහස් කිරීම. 3. සැලකීම.

පරිකල්පිත = 1. කල්පනා කළ. 2. සැලකූ.

පරිකම්ම = 1. භාවනා කිරීමට පළමුව කළ යුතු දේ

පරික්ඛාරට්ඨක = 1. අෂ්ට පරිෂ්කාර; අට පිරිකර.

පරීක්ෂක = 1. විභාග කරන්නා; සොයා බලන්නා; සෝදිසි කරන්නා

පරික්ෂය = 1. ගෙවීයාම. 2. දිරායාම. 3. විනාශය.

පරික්ෂිප්ත = 1. වටකළ.

පරික්ෂේප = 1. වටරවුම. 2. ප්‍රාකාරය; වැට. 3. වට කිරීම. 4. හාත්පස. 5. පිළිකාවක්.

පරිකිණ්ණ = 1. ගැවසීගත්.

පරිකීර්ණ = 1. පතළාවූ.

පරිකීර්තනය = 1. වර්ණනා කිරීම. 2. ප්‍රසිද්ධබව. 3. දීප්තිය; බැබළීම.

පරිකුපිත = 1. කිපුණු; කලබලවූ.

පරිකුඹය = 1. අගුළ 2. යමක් වැළැක්වීමට බැන්ද බැම්ම. 3. බාධාව.

පරිකාණ = 1. කාංගඩු; කොට්ටුවූ.

පරික්කමණය = (පරික්‍රමය) 1. ව්‍යායාම. 2. ඇවිදීම.

පරික්ලේශය = 1. කරදරය. 2. කිලුට. 3. බාධාව.

පරිඛණ්ඩ = 1. පුංචි කාණ්ඩ. 2. මොකවට සකස් කල කාණ්ඩ.

පරිඛා = 1 නගරයෙහි ආරක්ෂාවට අවට කැපූ දිය අගල 2. අගල.

පරිඛ්‍යාත = 1. ප්‍රසිඬ. 2. කීර්තිමත්.

පරිගණ්හනා = 1. පරීක්ෂා කිරීම; විමසීම.

පරිගත = 1. වටවී තිබෙන. 2. හාත්පස්හි ගිය. 3. යුක්ත. 4. දැනගත්. 5. සොයාගත් 6. වෙළුණු. 7. පිරුණු. 8. ලබාගත්.

පරිගමය = 1. වටකිරීම. 2. සෙවීම.

පරිගලිත = 1. ගිලිහුණු; වැටුණු. 2. දියවුණු.

පරිගුහනා = 1. සැඟවීම.

පරිගෘහීත = 1. පිළිගන්නා ලද. 2. අයිති කරගත්. 3. අරක් ගත්.

පරිග්‍රහ = 1. ගැනීම. 2. පිරිවර ජනයා. 3. බාර ගැනීම. 4. අඹුව. 5. කැමැත්තදීම. 6. පිළි-ගැනීම. 7. සේවනය කිරීම. 8. අයිතිය.

පරිග්‍රාහක = 1. අල්ලා ගන්නා; පිළිගන්නා

පරිඝ = 1. පොල්ල. 2. යෙල්ලය. 3. මැරීම. 4. වාසල් දොරටුව. 5. බාධාව. 6 දිය බඳුන.

පරිඝාතික = 1. පහර දෙන.

පරිඝෝෂාව = 1. ඝෝෂාව. 2. ගිගුරුම.

පරිචය = 1. පුරුද්ද.

පරිචර්යා = 1. මෙහෙය. 2. සේවාව.

පරිචාරක = 1. සේවකයා. 2. වැඩකාරයා. 3. ස්වාමියා අනුව යන්නා. 4. පිරිවරව හැසිරෙන්නා.

පරිචාරිකා = 1. භාර්යාව. 2. සේවිකාව.

පරිචාරිණී = 1. සේවිකාව; සේවය කරන්නී.

පරිචාරිත = 1. සේවය ලැබූ.

පරිචිත = 1. පුරුදු කල. 2. රැස් කළ. 3. හැඳින ගත්. 4. දැනගත්. 5. ආශ්‍රයෙන් දන්නා.

පරිචුම්බන = 1. සිඹීම.

පරිචුම්බිත = 1. හාත්පසින් සිඹින ලද.

පරිච්ඡවාශ = 1. පරිත්‍යාගය. 2. හැරදැමීම.

පරිච්ඡද = 1. වැස්ම. 2. පිරිකර. 3. පිරිවර. 4. වැසීමට ගන්නා වස්ත්‍රාදිය. 5. සිවුරඟ නෙතඟ.

පරිච්ඡන්න = 1. හාත්පසින් වසන ලද.

පරිච්ඡේද = 1. සීමාව. 2. වෙන් කිරීම. 3. බෙදීම. 4. (පොතක) පරිච්ඡේදය.

පරිජන = 1. පිරිස. 2. පිරිවර ජනයා. 3. සේවක පිරිස.

පරිජානන = 1. හාත්පසින් දැන ගැන්ම. 2. සම්පූර්ණ ලෙස දැන ගැනීම.

පරිජින්න = 1. පිරිහී ගිය. 2. දිරා ගිය.

පරිඥාත=1. සම්පූර්ණයෙන් දැනගත්; පිරිසිඳ දත්.

පරිඥෙය = 1. දැන ගත යුතු; පිරිසිඳ දත යුතු.

පරිඥා = 1. විශේෂ දැනීම.

පරිණත = 1. පැසුණු. 2. මේරූ; මුහුකුරා ගිය.

පරිණය = 1. විවාහය.

පරිණයන = 1. විවාහය; කසාද බැඳීම.

පරිණාම = 1. වෙනස් වීම. 2. මේරීම. 3. අන්‍යා කාරයකට පෙරළීම. 4. (ආහාර) දිරවීම.

පරිණාමන = 1. දීම. 2. මාරුකොට දීම. 3. නැමීම; පෙරළීම.

පරිණාමිත = 1. පිරිනැමූ; නියම කොට දුන්.

පරිණායක = 1. පාලකයා. 2. ප්‍රධානයා. 3. ස්වාමි පුරුෂයා. 4. අධිපතියා. 5. නායකයා.

පරිණායිකා = 1. මඟ පෙන්වන්නී; ප්‍රඥාව.

පරිණාහ = 1. පළල්. 2 විශාල. 3. මහත

පරිතාප = 1 රත් කිරීම. 2. උෂ්ණය. 3. දැවිල්ල. 4. දුක්දීම. 5. ශෝකය.

පරිතාපන = 1. හැම ලෙසින් තැවීම. 2. රත් කිරීම. 3. හිංසා කිරීම

පරිත්ත = 1. අල්පවූ; ටිකවූ. 2. ස්වල්පය. 3. පිරික.

පරික්ඛය = 1. පරමාණුව. 2. ඉතා ටික.

පරිත්ත ශුභ = (පරීත්තාභාශ) 1. බ්‍රහ්ම ලෝකයක්.

පරිත්ත සුත්ත = 1. පිරිත් නූල.

පරිත්තාණ = 1. ආරක්ෂාව.

පරිත්ති = 1 කපු ගස

පරිතුට්ඨ = 1. හැම ලෙසින් සතුටුවූ; ඉතා සතුටුවූ.

පරිතෝෂ = 1. සන්තෝෂය

පරිතෝ = 1. හාත් පසින්.

පරිතෝෂණ = 1. සතුටු කිරීම.

පරිත්‍රාණ = (පරිත්තාන) 1. ආරක්ෂාව. 2. පිරිත.

පරිත්‍යක්ත = 1. අත්හරින ලද; දුරු කරන ලද.

පරිත්‍යජ්‍ය = 1. අත් හැරිය යුතු.

පරිත්‍යාග = 1. තෑග්ග. 2. දීම. 3. අත් හැරීම.

පරිත්‍යාග ශීලි = 1. දෙන සුලු. 2. ත්‍යාගිවන්ත.

පරිදර = 1. දත් ලෙඩක්.

පරිදහන = 1. හැඳ ගැන්ම. 2. හාත්පසින් දැවීම.

පරිදහිත = 1. හැඳගත්.

පරිද්දව = 1. වැලපීම.

පරිදුන = 1. ගනු දෙනුව.

පරිදාහ = 1. හාත් පස දැවිල්ල. 2. ගින්නෙන් විනාශ වීම. 3. කෙලෙස් දැවිල්ල.

පරිදි = 1. ආකාරය.

පරිදීපක = 1. දක්වන. 2. ප්‍රකාශ කරන. 3. විස්තර කරන.

පරිදේව = 1. විලාප කීම; වැලපීම; හැඬීම.

පරිදේවනා = 1 විලාප කීම.

පරිධංසක = 1. විනාශ කරන්නා. 2. අගුණ කියන්නා

පරිධාන = 1. නැබින් යටට හඳින රෙද්ද. 2. යට ඇඳුම.

පරිධාවන = 1. හාත්පස දිවීම.

පරිධාවිත්වා = 1. හාත් පසින් දිවීම කොට.

පරිධි = 1. වටය 2. නිම් වළල්ල.

පරිධෝත = 1. පිරිසුදු කළ.

පරිනායක = 1. චක්‍රවර්ති රජුගේ පරිනායක රත්නය.

පරිනිබ්බාණ = (පරිනිර්වාණ) 1. පිරිනිවීම 2. රහතුන් ගේ මරණය. 3. සසර දුකින් නිදහස් වීම. 4. භවයෙහි නැවත නූපදින සේ වන චුතිය.

පරිනිබ්බායී = 1. පිරිනිවන් පාන්නා 2. සසරින් මිදෙන්නා.

පරිනිබ්බුත = 1. නිවණට පැමිණි; පිරිනිවුණු.

පරිනිෂ්ඨා = 1. සම්පූර්ණයෙන් නිමවීම.

පරිපක්ක = (පරිපක්ව) 1. මේරූ; මෝරා ගිය. 2. අභිවෘද්ධියට පැමිණි. 3 හොඳින් ඉදුණු. 4. පැසුණු.

පරිපක්ඛ = 1. පක්ෂයකට තදින් ඇලුණු.

පරිපඨන = 1. හැම ලෙසින් පාඩම් කිරීම හෝ කීම.

පරිපනාස = 1. අරමුදල.

පරිපන්ථ = 1. උවදුර. 2. අනතුර. 3. බාධාව.

පරිප්ලු = 1. එනම් ඇට වර්ගය.

පරිප්ලුවා = 1. පරිප්ලු නැමෙහි ගිජු මිනිසා. 2. වැඩකට නැති මිනිසා.

පරිපාක = 1. මේරීම. 2. සම්පූර්ණවීම.

පරිපාචන = 1. මෝරන්නට සැලැස්වීම; මේරවීම. 2. සම්පූර්ණ කිරීම.

පරිපාචිත = 1. මෝරවන ලද. 2. සම්පූර්ණ කළ.

පරිපාටි = 1. පිළිවෙළ.

පරිපාලක = 1. ආරක්ෂකයා. 2. සම්පූර්ණයෙන් පාලනය කරන්නා.

පරිපාලන = 1. සම්පූර්ණයෙන් ආරක්ෂා කිරීම. 2. හොඳින් පාලනය කිරීම.

පරිපාලිත = 1 රක්නා ලද. 2. සම්පූර්ණයෙන් ආරක්ෂා කරන ලද.

පරිපීඩිත = (පරිපීළිත) 1. හැම අතින් පෙළුණු. 2. වෙහෙසනු ලැබූ 3. බෙහෙවින් මඩින ලද.

පරිපුච්ඡක = 1. විමසන්නා. 2. ප්‍රශ්න අසන්නා.

පරිපුච්ඡා = 1. අර්ථ ඉගෙනීම. 2. විචාරීම. 3. අර්ථය. 4. ප්‍රශ්න කිරීම.

පරිපුණ්ණ = 1. සම්පූර්ණවූ. 2. පිරුණු. 3. සමෘද්ධවූ.

පරිපුණ්ණතා = 1. පිරුණු බව.

පරිපූරක = 1. පූරවන්නා. 2. සම්පූර්ණ කරන්නා.

පරිපූරණ = 1. පිරවීම. 2. පිරීම. 3. සම්පූර්ණ කිරීම.

පරිපූරිත = 1. පිරවූ. 1. සම්පූර්ණ කළ. 3. පිරූ.

පරිපුණ්ණ = 1. පිරුණු.

පරිබාහිර = 1. කිසිත් සම්බන්ධයක් නැති. 2. පිටත්හි වූ.

පරිබ්බූළ්හ = 1. ගැවසී ගත්. 2. පීඩිත.

පරිබ්‍රාජක = 1. තාපස වර්ගයක්. 2. බුදු සසුනෙන් පිට පැවිදි වෙසෙසක්. 3. සන්නාසියා. 4. ඇවිදින ශ්‍රමණයා.

පරිබ්‍රාජිකා = 1. පරිබ්‍රාජක ස්ත්‍රිය. 2. ඇවිදින මෙහෙණිය.

පරිබෝධය = 1. හානිය.

පරිභණ්ඩ = 1. බදම ගෑම. 2. ගොම මැටි ආදිය. 3. මේබලාව. 4. ආලේපය. 5. ආලින්දය.

පරිභණ්ඩකත = 1. බදම ආදිය ගාන ලද.

පරිභව = 1. නින්දාව. 2. අපහාසය. 3. හෙළා දැකීම. 4. කොච්චම්.

පරිභාවිත = 1. වඩන ලද. 2. පුරුදු කළ. 3. මිශ්‍ර කළ. 4. බෙහෙත් කැවූ.

පරිභාෂණ = 1. නින්දා කිරීම. 2. බැණීම. 3. නපුරු වචන කීම.

පරිභාෂා = 1. සම්පූර්ණයෙන් කීම. 2. නාත්පර්ති ව්‍යාජන සූත්‍රය.

පරිභාෂාව = 1. ශාස්ත්‍රාදියෙහි විශේෂ අර්ථ ඇතිව දෙන නම. 2. නින්දාව.

පරිභාස = 1. බැණීම. 2. අපහාසය.

පරිභුක්ත = 1. පරිභෝග කළ.

පරිභෝග කරනවා = 1. පාවිච්චි කරනවා.

පරිභෝග චෛත්‍ය = 1. බුදුන් වහන්සේ පරිභෝග කළ පූජ්‍ය වස්තුව.

පරිභෝජනීය = 1. පාවිච්චි කළයුතු.

පරිභ්‍රමණය = 1. කරකැවීම. 2. වටකර යාම. 3. හැසිරීම.

පරිමණ්ඩල = 1. කවය. 2. වටකුරු. 3. ගෝලාකාර දෙය. 4. චක්‍රය.

පරිමද්දන = (පරිමර්දන) 1. අතගෑම. 2. පිරිමැදීම. 3. මිරිකීම. 4 මැඩීම.

පරිමර්දිත = 1 මිරිකූ. 2. පොඩිකළ. 3 අතගෑ.

පරිමල = 1. මනා සුවඳ 2. උතතුන්ගේ සභාව.

පරිමාණ = 1. ප්‍රමාණය.

පරිමාර්ජන = 1. පිරි මැදීම. 2. පිස දැමීම.

පරිමාර්ශය = 1. ඇතිල්ලීම. 2. පිරිමැදීම

පරිමිත = 1. ප්‍රමාණකළ. 2. මණින ලද.

පරිමිතිය = 1. වට ප්‍රමාණය.

පරිමුච්චන= (පරිමුක්ති) 1. මිදීම. 2. නිදහස්වීම.

පරිමේය = 1. ප්‍රමාණ කට හැකි.

පරිමෝචන = 1. මිදවීම; නිදහස් වීම.

පරියත්ති = 1. දක්ෂභාවය. 2. උගත යුතු ධර්ම කොටස්ශය.

පරියත්ති ධර = 1. ධර්මය දරන්නා.

පරියන්ත = 1. කෙළවර; අග. 2. අවසන් කොට ඇති. 3. අන්තිම.

පරියාදාන = 1 ගැනීම. 2. ඉතිරි නොකොට ගැනීම. 3. විනාශ කිරීම.

පරියාදාය = 1. හාත්පසින් ගෙන. 2. මැඩගෙන.

පරියාපන්න = 1. ඇතුළත්.

පරියාය = 1. ආකාරය 2. පිළිවෙළ; ක්‍රමය. 3. සමානාර්ථ ඇති ශබ්දය. 4. මාරුවී එන වාරය. 5. කෙළින් නොකියා අන්‍ය වචනවලින් කීම. 6. චෛතයාම. 7. දහම් කොටස.

පරියාහත = 1. මඩින ලද. 2. තප්පන ලද.

පරියේසන = 1. සෙවීම.

පරියේසිත = 1. සෙවූ; සොයන ලද.

පරියේසනා = 1. සෙවීම. 2. විභාග කිරීම.

පරියෝදපන = 1. පිරිසිදු කිරීම.

පරියෝසාන = 1. අවසානය; අන්තිමය; කෙළවර; නිමාව.

පරිරක්ඛන = (පරිරක්ෂණ) 1. ආරක්ෂාකිරීම; රැකීම.

පරිරම්භ = 1. වැළඳ ගැනීම; බදා ගැනීම.

පරිරෝධන = 1. හැඬීම.

පරිරෝධ = 1. හිරිහැරය; බාධාව.

පරිලිකා = 1. මල වැසී තිබෙන කොපුව; කොළපුව.

පරිලිප්ත = 1. ගාන ලද. 2. හාත්පසින් ගෑ.

පරිවජ්ජන = 1. දුරු කිරීම. 2. හැර දැමීම.

පරිවට්ට = 1. චක්‍රය. 2. වටය; රවුම. 3. පරපුර පැවැත්ම.

පරිවත්ත = 1. පෙරළෙන.

පරිවත්තක = 1. පරිවත්තකයා; එක බසකින් වූවක් අනෙක් බසකට පෙරළන්නා. 2. පෙරළන්නා.

පරිවජ්ජන = 1. දුරු කිරීම. 2. හැරදැමීම.

පරිවර්තන = 1. පෙරළීම. 2. හැරීම. 3 මාරු කිරීම. 4. අන් බසකට නැගීම. 5. කැර කැවීම. 6. සැරි සැරීම. 7. පැන දිවීම. 8. හුවමාරු කිරීම. 9. පැවතීම.

පරිවත්තිත = 1. පෙරළූ. 2. අන් බසකට නැගූ. 3 මරු කළ 4. කරකැවූ. 5 හැරවූ.

පරිවාත = 1. හාත්පසින් හැමූ.

පරිවාදක = 1 පැමිණිලිකාර. 2 දොස් පවරන.

පරිවාදය = 1. දෝෂාරෝපනය. 2. අවලාදය. 3. බැණීම.

පරිවාදිනී = 1. තත් සතකින් යුත් වීණා විශේෂයක්.

පරිවාප = (පරිවාපනය) 1. කෙත් කැපීම. 2. පොකුණ. 3. විල.

පරිවාර = 1. පිරිවර. 2. පිරිස 3. ශ්‍රාවක පිරිස. 4. විනය පිටකයෙහි පස්වැනි පොත.

පරිවාර ජන = 1. පිරිවර ජනයා. 2. වහල් ජනයා.

පරිවාරන = 1. පිරිවැරීම.

පරිවාරිත = 1. පිරිවරා සිටින; පිරිවරාගත්; පිරිවරන ලද. 2. වට කරන ලද.

පරිවාස = 1. විනය කර්මයක්. 2. වෙන්ව විසීම.

පරිවාසිත = 1. සුවඳ හැමූ. 2. අඩංගු කරනලද.

පරිවාහන = 1. වතුර පාර. 2. කානුව.

පරිවිතක්ක = (පරිවිතර්ක) 1. අදහස. 2. කල්පනාව. 3 සිතිවිල්ල.

පරිවීත = (පරිවෘත) 1. වටකරන ලද.

පාටීරය = 1. කෙත. 2. වළාකුල. 3. බෙලෙක්. 4. පෙනේරය. 5. උණ මකුළු. 6. සෙරෙප්පුව.

පාටෝප = 1. බොරු අහංකාරයෙන් කරන වැඩ.

පාටෝව = 1. පාටවය; නික්මවීම.

පාට්ට = 1. බද්ද.

පාට්ටගම = 1. බදු ගත් ගම?

පාඨ = 1. වචනය. 2. වාක්‍යය. 3. පාළිය. 4. ගුරුන්ගෙන් අසාගෙන කීම 5. පාඩම. 6 අකුරු කියවීම. 7. අවබෝධ වීම.

පාඨ අර්ථ = 1. වාක්‍යයෙහි තේරුම.

පාඨක = 1. කියවන්නා 2. ප්‍රකාශ කරන්නා. 3. ගුරුවරයා. 4. විදුරු.

පාඨශාල = 1. පාඨශාලාව.

පාඨනය = 1. කියවීම. 2. විස්තර වශයෙන් කියාදීම.

පාඨය = 1. වාක්‍යය; වගන්තිය. 2. පෙළ. 3. කියවීම.

පඨපරීක්ෂණ = 1. පාඩම් විභාගය.

පාඨශාලාව = 1. ඉගැන්වීම කරන ශාලාව.

පාඨා = 1. දියමිත්ත.

පාඨාදිගණ = 1. දියමිත්ත ආදිකොට ඇති ඖෂධ ගණය.

පාඨීන = 1. පෙටියා. 2. දේශනාව උගන්වන්නා. 3. ගුගුල් ගස.

පාඩ = 1. පුල්ලි සහිත.

පාඩගම් = 1. පාසලඹ. 2. පයෙහි ලන වළල්ලක්.

පාඩම = 1. ඉගෙනීම. 2. අකුරු කීම. 3. ඉගෙන ගත් දේ.

පාඩසුව = 1. දුවිල්ල.

පාඩාවාසි = 1. වැරදිල්ල. 2. ප්‍රමාදය. 3. වටිනාකමක් නැති; බාල 4. රොඩු.

පාඩුව = 1. අලාභය. 2. හානිය.

පාඬි = 1. ලා කහ පාට. 2. මාළු වර්ගයක්. 3. වහතු රසක්. 4. එනම් රට; පඬිරට. 5. බිම් කුණ්ඩා.

පාඬිරට = 1. පාණ්ඩ්‍ය දේශය; මදුරට?

පාඬිරජ = 1. පාණ්ඩ්‍ය දේශයෙහි රජ.

පාඬු = 1. පාණ්ඩු රෝගය.

පාඬු පිලා = 1. පාණ්ඩු රෝගය නිසා මහත් වූ ප්ලීහය

පාන = 1. පහන. 2. පානය කළ යුතු දෙය. 3. බීම. 4. නෙතහැර දක්වන 5. රක්ෂාකිරීම. 6. පාට. 7. දක්වීම. 8. දියර. 9. ගල.

පාන ආගාර = 1. (රා) බොන ගෙය; තැබෑරුම.

පාන අවසර = 1. බොන වේලාව.

පානක = 1. (අඹ ආදිය මිරිකා සාදන) පානය; බොන දෙය

පාන කූපය = 1. ළිඳ.

පාන කුඹුවා = 1. එනම් මත්ස්‍යයා.

පාන පරයා = 1. බේබද්දා.

පාන පරාඹිකා = 1. එනම් මත්ස්‍යයා.

පාන පාත්‍රය = 1. බොන භාජනය.

පාන පූජාව = 1. දිය පූජාව.

පාන මණ්ඩලය = 1. මත් පැන් බීමට සැදූ මණ්ඩපය.

පානීය = 1. බීම.

පානය කරනවා = 1. බොනවා.

පානවා = 1. පෙන්වනවා. 2. ගෙනහැර දක්වනවා.

පාන ව්‍යසන = 1. බේබදු කම.

පාන ශෞණ්ඩයා = 1. බේබද්දා.

පාන් = 1. පහන්. 2. පිටියෙන් සාදන රොටි විශේෂයක්. 3. උදය. 4. ආලෝකය. 5. ප්‍රසන්න; සතුටු.

පාන් ඇසෑ = 1. එළිය තොරණ.

පාන්කඩය = 1. පහන් තිරය.

පාන් කඳ = 1. ඉටිපන්දම් ගහන භාජනය.

පාන් කාරයා = 1. පාන් විකුණන්නා. 2. පාන් පුළුස්සන්නා.

පාන් ගිරවා = 1. පාන්පිටියෙන් සෑදූ ගිරවා.

පාන් ගෙය = 1. පාන් පුළුස්සන ස්ථානය. 2. ප්‍රදීපාගාරය.

පාන්වී වෙනවා = 1. ඇලවෙනවා.

පාන් තරුව = 1. පහන් තරුව. 2. සිකුරු තරුව.

පාන් තිරය = 1. පාන් කඩය.

පාන් තුඹු = 1. පාන් තිරය.

පාන් තොරණ = 1. ආලෝක කළ තොරණ; පහන් සහිත තොරණ.

පාන්දඩ = 1. පාන්දර; ඉතා උදෑසන; අලුයම් කාලය.

පාන්දර = 1. අලුයම්කාලය; ඉතා උදෑසන; පාන්දඩ.

පාන් පිසැලි = 1. පහන් තිරය.

පාන් පූජාව = 1. ප්‍රදීපයන්ගෙන් කරන පූජාව.

පාන් බක්කරේ = 1. පාන් පුළුස්සන්නා.

පාන් බේකරිය = 1. පාන් ගෙය. 2. පාන් පුළුස්සන ස්ථානය.

පාන් මඩුව = 1. දෙවියන් උදෙසා කරන යාග විශේෂයක්. 2. දේවපූජා පැවැත්වීම. 3. පූනා මඩුව. 4. ගම් මඩුව.

පාන්මාලා = 1. පානෙහි තෙල් වක්කරන කොටස.

පාන් මාංස = 1. පාන් සෑදීමට අනා සකස් කළ පිටි.

පාන්වර = 1. උදෑසන; එළිය වැටෙන කාලය.

පාන්වැඹ = 1. පහන් පෙළ. 2. පහන් දල්වීමට තැනූ තට්ටු සහිත වැට.

පාන් වැපිය = 1. පහන් කඩය 2. පහන් තිරය. 3. පාන්වැට.

පාන් වෙනවා = 1. එළිය වැටෙනවා. 2. එළි වෙනවා.

පාන්සජ = 1. බලල් ලුණු.

පාන්සික් = 1. ප්‍රසන්න චිත්තය; සතුටු සිත.

පාන්සිය = 1. අත්හැරීම. 2. ඇලය.

පාන් සිල = (පාන් සිළුව) 1. පහන් දැල්ල

පානා = 1. ප්‍රකාශ කරන. 2. ගෙන හැර දක්වන. 3. පෙන්වන.

පානාගාර = (පාන + ආගාර) 1. රා බොන ගෙය; තැබෑරුම.

පානි = 1. ප්‍රාණියා; සත්වයා.

පානිලය = 1. පාන පාත්‍රය; පැන් බිමට ගන්නා කෝප්පය.

පානීය = 1. බීමට සුදුසු. 2. පිය යුතු දෙය. 3. ජලය.

පානීය ඝට = 1. පැන් කළය.

පානීය චාටි = 1. පැන් හැළිය.

පානීය තීර්ථ = 1. පැන් ඇති ස්ථානය.

පානීය ථාලිකා = 1. පැන් බොන බඳුන. 2. පැන් තලිය.

පානීය දාන = 1. පැන් දන්දීම.

පානීය මාලක = (පානීය සාලා) 1. පැන් කළ තබන ශාලාව.

පානීය මණ්ඩප = 1. පැන් තබන මඩුව.

පානීය සාලා = 1. පැන් කළ තබන ශාලාව; පැන් මඩුව.

පානීය සාලිකා = 1. දිය මැස්ස.

පානු = 1. හාල් සේදූ දිය. 2. රසය.

පානුදිය = (පානු දියර) 1. හාල් සේදූ වතුර.

පාන්ථයා = 1. මගියා. 2. ගමන් කරන්නා.

පානෝත්සවය = (පාන + උත්සවය) 1. බොන උත්සවය.

පාණ = 1. ප්‍රාණය 2. ජීවිතය. 3. සත්වයා. 4. ප්‍රාණියා 5. වාතයක්. 6. ගෞරවණීය පූජකයා.

පාණක = 1. පණුවා. 2. සතා. 3. කුඩා සතා.

පාණඝාත = 1. ප්‍රාණය නැසීම. 2. සතුන් මැරීම,

පාණඝාති = 1. සතුන් මරන්නා.

පාණද = 1. ජීවිතය දෙන්නා.

පාණන = 1. හුස්ම ගැනීම. 2. ජීවත්වීම.

පාණවධ = 1. සතුන් මැරීම.

පාණවැසි = 1. හිම වැස්ස; ගල් වැස්ස.

පාණහර 1. පණ නසන.

පාණ්ඩර = 1. සුදු. 2. ලා කහ පැහැය; 3. ඇත් කුලයක්.

පාණ්ඩර අම්බර = 1. සුදු රෙද්ද.

පාණ්ඩරඞ්ග = 1. සුදුරෙදි පොරවා ගෙන තැනින්තැන ඇවිදිමින් සවකීය ආගම දේශනා කරන පූජක කොටසක්.

පාණ්ඩව = 1. පාණ්ඩුරාජ වංශිකයා. 2. දඹදිව පර්වතයක්. 3. ලා කහ පැහැය. 4. ඇතුන් වර්ගයක්.

පාණ්ඩිත්‍යය = 1. පණ්ඩිත භාවය. 2. උගත්කම.

පාණ්ඩු = 1. සුදු කහ මිශ්‍ර පාට; පඬුවන් (පැහැය) 2. රතු පැහැය. 3. සුදුමැලි. 4 ඇගේ ලේ අඩුවීමෙන් සෑදෙන එනම් රෝගය. 5 සුදු පැහැය. 6. සුදු ඇතා. 7. චන්ද්‍රවංශයේ රජ කොටසක්.

පාණ්ඩුකම්බල = 1. කහපාට ලොම් සළුව. 2. පඬුවන් වූ කම්බලය. 3. ශක්‍රයාගේ ආසනය.

පාණ්ඩුකම්බලශෛලාසනය = 1. ශක්‍රයාගේ ගල් ආසනය; පඬු ඇඹුල් සලස්න.

පාණ්ඩුකම්බිලිය = 1. ඇතාගේ සැරසුම. 2. පාට කිපයකින් යුත් ඇඳුම.

පාණ්ඩුවර්ණ = 1. පඬු පාට.

පාණ්ඩුර = 1. ලා කහ පැහැය. 2. සුදු. 3. සුදු කහ මුසු පාට.

පාණ්ඩුරය = 1. පාණ්ඩු රෝගය. 2. කුෂ්ට රෝගය. 3. ලා කහ පැහැය.

පාණ්ඩුව = 1. එනම් රෝගය.

පාණ්ඩුසිංහ = 1. සිංහ විශේෂයක්.

පාණ්ඩුහංස = 1. පඬුවන් හංස වර්ගයක්.

පාණ්ඩුශර්කරාව = 1. එනම් රෝගය.

පාණාතිපාතය = 1. ප්‍රාණඝාතය; සතුන් මැරීම.

පාණි = 1. අත්ල. 2. අත. 3. අතේ අග කොටස. 4. ප්‍රාණියා. 5. සත්වයා.

පාණිකාව=1. දිග හැන්ද; කිණිස්ස; කෙණිස්ස; දිග මිටකින් යුත් පොල් කැටය. 2. අතක් මෙන් සැදූ දෙය.

පාණිග්‍රහ = 1. විවාහය. 2. අතින් ගැනීම. 3. කසාද බැඳීම.

පාණිනි = 1. පාණිනී නම් සංස්කෘත ව්‍යාකරණ ග්‍රන්ථය නිෂ්පාදනය කළ පණ්ඩිතයා.

පාණිතල = 1. අත්ල.

පාණිපාත්‍ර = 1. අත්ල නමැති පාත්‍රය.

පාණිපීඩණය = 1. අතින් අත ඇල්ලීම. 2. කසාද බැඳීම.

පාණිප්‍රහාරය = 1. අතින් ගැසීම. 2. අත් පොලසත් දීම.

පාණිමුක්තය = 1. විසිකර ගසන ආයුධයක්.

පාණිය = 1. අත. 2. හැන්ද. 3. නියපොත්ත.

පාණිලතාව = 1. අත්වැල.

පාත = 1. පහත. 2. යට. 3. වැටීම. 4. මිටි; උස් නොවූ.

පාතංගී = 1. සෙනසුරා.

පාතක = 1. පාපය. 2. වැරැද්ද.

පාතඛඩ = 1. පහත් ස්ථානය.

පාතන = 1. වැටීම. 2. හෙළීම. 3. බිම දැමීම. 4. ගව කිරි.

පාතය = 1. බැස්ම. 2. වැටීම.

පාතරට = 1. කන්ද උඩ නොවන රට. 2. සිංහල රජ කාලයෙහි ලංකාවේ ඉංග්‍රීසින්ට යටත්ව පැවැති පෙදෙස.

පාතරාශ = 1. උදය බත. 2. උදය කෑම.

පාතව්‍ය = 1. රක්ෂා කළ යුතුවූ. 2. බීමට යුතුවූ.

පාත් = 1. පහත. 2. යට.

පාත්කරනවා = 1. පහතට ගන්නවා.

පාත්තයා = 1. එනම් පක්ෂියා.

පාත්ති = 1. පාත්තයාගේ ගැණුසතා. 2. යම් කිසි වැවිල්ලක් කිරීමට සකස් කොට ගත් (මදක් උස) බිම් කට්ටි.

පාත්බසිනවා = 1. කිඳෙනවා; ගිලෙනවා. 2. පහළ බසිනවා.

පාතාල = 1. පහත් බිම. .2. පොළොවේ යට පැත්ත. 2 නාග භවනය, අසුර භවනය හා නිරය යන ලෝක. 4. ගැඹුරු ස්ථානය.

පාතාලමුඛ = 1. මකර කට.

පාති = 1. තලිය 2. භාජනය. 3. තැටිය.

පාතික = 1. කුඩා තලිය.

පාතිමොක් = 1. භික්ෂූන්ගේ ශික්ෂාපද ඇතුලත් පොත. 2. භික්ෂු ශීලය. 3. ප්‍රාති මෝක්ෂය.

පාතිලිය = 1. පාත්‍රය. 2. මලපත. 3. උගුල.

පාතී = 1. හෙළන්නා. 2. නසන්නා

පාතුක = 1. වැටෙන්න පුළුවන්වූ.

පාතුකය = 1. ප්‍රපාතය. 2. පල්ලම.

පාතුකාම = 1. බොන්නු කැමති.

පාතුභව = 1 පහළවීම. 2. ප්‍රකට කිරීම.

පාතුභූත = 1. පහලවූ. 2. ප්‍රකටවූ.

පාත්‍ර = 1. යෝග්‍ය; සුදුසු. 2. භික්ෂූන් ආහාර වළඳන භාජනය. 3 භාජනය. 4. සමණී.

පාත්‍රතාව = 1. සුදුසු බව.

පාත්‍රආධාර = 1. පාත්‍ර අඩිය.

පාත්‍රචීවර = 1. පාත්‍රය හා සිවුර.

පාත්‍රධාතු = 1. බුදුන් වහන්සේ වැළඳූ පාත්‍රය.

පාත්‍රපසි = 1. පාත්‍රය දමන පසුම්බිය.

පාත්‍රභූත = 1. ගරු කළයුතු.

පාත්‍රමණ්ඩල = 1. පාත්‍ර තබන දරණුව.

පාත්‍රවත් = 1. පාත්‍රය පිළිබඳ වත.

පාත්‍රා = 1. පාත්‍රය.

පාත්‍රාපත් = 1. පාත්‍රා පියන.

පාත්‍රිය = 1. පාත්‍රය. 2. කුඩා ලිප.

පාතො = 1. උදෑසනෙහි.

පාථය = 1. සූර්යයා. 2. ගින්න. 3. වතුර.

පාථෙය = 1. ගොදුරට ගිනැ කරන බඩු. 2. මග වියදම්. 3. ගොදුර.

පාථෝධිය =1. සමුද්‍රය.

පාථෝය 1. මාගෝපකරණ.

පාද = 1. පාදය; කකුල. 2. සිවුපදයකින් යුත් ශ්ලෝකයක, ගාථාවක හෝ කවක එක් පදයක්. 3. අඩිය. 4. රශ්මිය. 5. කහවනු වෙන් හතරෙන් කොටසක මිලය. 6. (වෘක්ෂයක) මුල. 7. පර්වතය. 8. හතරෙන් පංගුව. 9. පාමුල. 10. ගරු-කටයුතු, පූජ්‍ය යන අර්ථයෙහි.

පාද අංගුලි = 1. පයෙහි ඇඟිලිවල පලඳින ආභරණයක්. 2. පයෙහි ඇඟිලි.

පාදක = 1. පා ඇති. 2. අත්තිවාරම. 3. පදනම.

පාද කටක = 1. පයේ දමන වළල්ලක්. 2. නූපුර; හුවරුලා.

පාද කඨලිකා = 1. පය සේදීමේදී උලන ලෑල්ල.

පාද කිඞ්කිණිකා = 1. පයෙහි පලඳින ආභරණයක්. 2. පය ලන ගෙජ්ජි වළල්ල.

පාද ඞ්ගුෂ්ඨ = 1. පයේ මාපටැඟිල්ල.

පාදඞ්ගුලි = 1. පයේ ඇඟිල්ල.

පාද ගමන = 1. බයින් යාම; පා ගමන.

පාද ගණ්ඩීරය = 1. බරවා රෝගය.

පාද ඝණ්ඨි = 1. පයේ ඇට.

පාද චරණයා = 1. පාබල හේවායා.

පාද ජඞ්ඝාව = 1. පයේ දූල.

පාද ගුල්ඵය = 1. වළලු කර.

පද ග්‍රහණය = 1. පය අල්වා ගරුකිරීම.

පාද ජඞ්ඝා මිළුලු = 1. බත් කොණ්ඩෙහි පලඳින ආභරණයක්.

පාද ජාලා = 1. පයෙහි ලන ආභරණයක්. 2. පයේ දමන වැස්මක්. 3. මෙස් කකුල.

පා දඩ = 1. ඉබාගාතේ යන. 2. අවලම්.

පාදඩුව = 1. ගොයම් පෑගීමේදී ඇල්ලීමට යොදා ගත් ලීය.

පාද තල 1. යටි පතුල; පයේ පතුල.

පාදත්‍ර = 1. පය ආරක්ෂා වීමට දමන සපත්තු-සෙරෙප්පු ආදිය. 2. පාද තුන.

පාද දර = 1, සර්පයා. 2, නාගයා

පාදදූනිය = (පාද දැරිය) 1. කකුලේ දිය බුබුල.

පාද දූෂික = 1. පය පැලී ඇතිවන රුජාවක්.

පාද ධෝවනය = 1. පා සේදීම.

පාදන = 1. තේරුම්කරන. 2. පැහැදිලි කරන. 3. පිරිසුදු කරන. 4. පහදන. 5. මතු කරන.

පාද නමස්කාර = 1. පා වැඳීම.

පාදප = 1. පාදයෙන් බොන්නා 2. මුලෙන් බොන්නා. 3. වෘක්ෂය. 4 ගසේ මුල.

පාද පට = 1. පයෙහි පලඳින ආභරණයක්.

පාද පතුල = 1. අඩි පතුල.

පාද පද්ම = 1. පා නමැති නෙළුම් මල.

පාද පරිචාරිකා = 1. පාද සේවනය කරන්නී. 2. භාර්යාව. 3. වැඩකාරයා.

පාද පාව = 1. සෙරෙප්පුව. 2. සපත්තුව.

පාද පාංශු = 1. පයෙහි ඇලුණු පස්.

පාද පීඨ = 1. පා පුටුව. 2. පය තබන පුටුව.

පාද පීඨිකා = 1. පා පුටුව.

පාද පුඤ්ඡන = 1. පා පිස්න.

පාද ප්‍රණාමය = 1. පා වැඳීම.

පාද ප්‍රහාරය = 1. පා පහර.

පාද බන්ධන = 1. අරම්ණිය ගෙතීම. 2. පා බැඳීම.

පාද මර්ෂණය = 1. පය පිරිමැදීම.

පාද මුද්‍ර = 1. පා මුද්ද.

පාද මූල = 1. පා මුල. 2. අඩිය.

පාද මූලික =1 සේවකයා.

පාද රජස් = 1. පයෙහි තැවරුණු ධූලි.

පාදරය = ඇඳේ කකුල දමන පැත්ත.

පාද ලාඤ්ඡනය = 1. පා සටහන; අඩි ලකුණ.

පාද ලෝල = 1. ඇවිදීමෙහි ලොල් අය.

පාද ශංඛලාව = 1. පයේ දමන විලංගුව. 2. පාදාභරණයක්.

පාද සම්බාහන = 1. පා මිරිකීම.

පාද සටහන = 1. අඩි ලකුණ.

පාද සාර = 1. පැරණි කාසියක්.

පාද සේවනය = 1. සේවය. 2. පා ඇසුරු කිරීම.

පාද ශිලා = 1. කණු සවිකිරීමට ගන්නා මැද වළක් ඇති ගල; තොසිට් ගල?

පාද ශෝථ = 1. කකුලේ ඉදිමුම.

පාද හරය = 1. පයේ දමන ආභරණයක්.

පාදු = 1. පාත්‍රධාතුව. 2. මතුකොට. 3. පහදු

පාදඞ්ගුලි = (පාද + අඞ්ගුලි) 1. පයෙහි ඇඟිල්ල. 2. පයේ ඇඟිලිවල දමන මුදු.

පාද ඞ්ගුෂ්ඨය = 1. පයෙහි මාපටැඟිල්ල.

පාදාග්‍ර = 1. පතුල.

පාදඞ්ග = 1. පා සලඹ.

පාදතිකයා = (පාදතිකයා) 1. පයින් යන්නා. 2. පාබලහේවායා

පාදාන්ත = (පාද + අන්ත) 1. පා කෙළවර. 2. පද්‍යයෙහි අග

පාදාන්ත යමකය = 1. පද්‍යයෙහි අගට යොදන යමක බන්ධනය.

පාද භරණය = (පාද + ආභරණය) 1. පයෙහි දමන ආභරණය.

පාදාර්ධය = 1. සිවු පදයකින් යුත් පද්‍යයක පේළියකින් භාගය; කවියකින් අටෙන් කොටස.

පාද වලය = 1. පයෙහි දමන වළල්ල.

පාද සනය (පාද + ආසනය) 1. පා පුටුව.

පාදික = 1. පයට අයිති. 2. පා ඇති.

පාදිනය = 1. හතරෙන් පංගුව.

පාදිනවා = (පහදිනවා) 1. පැහැදෙනවා. 2. පිරිසිදු වෙනවා.

පාදිය = 1. වතුරේ බැස එතෙරවන තැන. 2. පය වැසෙන තරම් දිය ඇති.

පාදිරි උන්නාන්සේ = (පාදිලි උන්නාන්සේ) 1. ක්‍රිස්තියානි ආගමේ දේවගැතිවරයා.

පාදු = 1. ආරක්ෂාව.

පාදුකා = 1. මිරිවැඩි. 2. (වැසිකිළි ආදියෙහි) අඩිය තැබීමට සෑදූ පඩිය. 3. සෙරෙප්පු, සපත්තු ආදිය. 4 වැසිකිළියෙහි මල මුත්‍ර කිරීමට ඉඳ ගන්නා තැන. 5. කක්කුස්සි ටැල්ල.

පාදූදර = (පාද + උදර) 1. සර්පයා; බඩ පය කොට ඇත්තා.

පාදු ජේනය = (පාදු ප්‍රවේසම්) 1. පරෙස්සම් වීම. 2. ආරක්ෂාව.

පාදෙනිය = (පාදෙණිය) 1. පය සෝදන ස්ථානය. 2. පය සේදීම. 3. කිරි හෝ දිය ඔරුව.

පාදේ = 1. කොටස. 2. හතරෙන් පංගුව. 3. සිවුපදයක එක පේළියක්. 4. කකුල. 5. පාරුව.

පාදෝවනය = 1. පා සේදීම.

පාදෝදක = (පද + උදක) 1. පය සෝදන ජලය. 2. පා සෝදන තැන. 3. පය තබන ලෑල්ල.

පාද්‍ය = 1. අඩියට අයිති.

පාප = 1. අකුසලය; පව. 2. දුශ්චරිතය. 3. පව් කරන්නා. 4. පවිටු. 5. දුෂ්ට. 6. ලාමක. 7. නින්දිත.

පාප අධ්‍යාශය = 1. පව් අදහස.

පාප ආචාර = 1. ලාමක හැසිරීම; පවෙහි ගැලීම.

පාප ඉච්ඡ = 1. පව් කිරීමෙහි කැමැත්ත ඇති.

පාප උච්චාරණ = 1. තමා කළ පව් කීම.

පාපක = 1. පව්කරන. 2. පවිටු. 3. පමුණුවන. 4. අවමඟුල.

පාපකම්ම = 1. පවිටු ක්‍රියාව. 2. දුශ්චරිතය. 3. අකුසලය.

පාප කර = 1. පව් කරන.

පාපකර්මය = 1. පව්කම. 2. අකුසල.

පාපගර්හී = 1. පාපීන්ට ගරහන සුළු.

පාපඝ්න = 1. පව් නසන.

පාපචරිත = 1. අකුසල්හි යෙදෙන සුළු. 2. ලාමක චරිත ඇති.

පාපචේතනා = 1. පව් සිතිවිල්ල 2 පව් කිරීමේ අදහස.

පාපජහන = 1. පව් දුරු කරන. 2. පව් හැර දමන.

පාපජනක = 1. පව් උපදවන; පව් ඇති කරන.

පාපධර්මය = 1. පාප කර්මය. 2. පාපයෙහි හැසිරීම. 3. ලාමක සවභාවය.

පාපන = 1. පැමිණවීම.

පාපනාශක = 1. පව් නසන.

පාපනිර්ගමන = 1. පවින් නික්මීම.

පාපතර = 1. පවින් තරවූ තැනැත්තා. 2. පව්කාරයා.

පාපපිලිමල් = 1. පාපය නමැති තරඟකාරයා; පාපය නමැති ප්‍රතිමල්ලයා.

පාපපුද්ගලයා = 1. පාපිෂ්ටයා; පිවිටු මිනිසා.

පාපභික්ෂු = 1. ලාමක භික්ෂුව. 2. දුශ්ශීල භික්ෂුව. 3. සිවුරේ රැකවරණය ගෙන පව් කම්හි යෙදෙන්නා.

පාපබුද්ධි = 1. පව් සිතුවිලි ඇත්තා. 2. පව්කාරයා.

පාපභීරුක = 1. පවට බියවන සුළු.

පාපභීරුතා = 1. පවට බියවන බව.

පාපමිත්ත = (පාප මිත්‍ර) 1. පවිටු මිත්‍රයා. 2. අවැඩෙහි යොදවන යහළුවා. 3. ලාමක යහළුවා.

පාපමිත්‍ර සංසර්ගය = 1. පවිටු යහළුවන් හා එක්වීම.

පාපමෝචනය = 1. පවෙන් මිදීම.

පාපයා = 1. පව්කාරයා.

පාපරෝග = 1. ලාදුරු, පරංගි ආදි භයානක රෝග; විඳවන ලෙඩ. 2. පූර්ව කර්මයෙන් ඇතිවියයි සැලකෙන භයානක රෝග.

පාපවෘත්ති = 1. පවිටු පැවැත්ම. 2. පවිටු දිවි පැවැත්ම.

පාපශමනය = 1. පව් නැති කිරීම.

පාපක්ෂයය = 1. පව් රැස් කිරීම.

පාපසංකල්ප = 1. පවිටු කල්පනාව.

පාපසුපින = 1. නරක හීනය; නපුරු හීනය.

පාපහ = 1. රජගෙය.

පාපහර = 1 පව් දුරුකරන.

පාප් උන්නාන්සේ = 1. රෝමානු කතෝලික ආගමේ නායක උතුමා; පෝප් තුමා.

පාප්ප = 1. (කඩදාසි ආදිය ඇලවීම සඳහා) පිටියෙන් සකස්කොට ගත් තලපය. 2. තුවාලවලට දමන පිටි තලපයක්.

පාපානුශය = (පාප + අනුශය) 1. පවට ලැදිකම.

පාපි = 1. පවිටු; පව්කාර. 2. කාලකණ්ණි.

පාපිකා = 1. පවිටුවූ.

පාපිකාදෘෂ්ටි = 1. පවිටුවූ මිථ්‍යා දෘෂ්ටිය.

පාපිටගස්වා = 1. පා වන්දවා.

පාපිට්ටු = 1. පිටි පතුල.

පාපිඩු = 1. කිරි පිඩු. 2. කිරි බත්. 3. පායාස පිණ්ඩය.

පාපිත = 1. පැමිණවූ.

පාපියුම් = 1. පා නමැති නෙළුම් මල්; පාද පද්මය. 2. පයෙහි ලන ආභරණයක්.

පාපිල්ල = 1. ව්‍යඤ්ජනාක්ෂරයන්ගේ පහතින් 'උ-ඌ' යන ස්වර දෙක සඳහා යොදන ලකුණු.

පාපිස්ස = (පාපිසුන්) 1. පාබිස්ස; පය පිහින උපකරණයක්.

පාපිෂ්ඨ = 1. පව්කාර. 2. කාලකණ්ණි.

පාපුටුව = 1. පය තබන පුටුව.

පාපුණන = 1. පැමිණවීම.

පාපුස්නා = 1. පය පිස දමන.

පාපෙල = 1. ප්‍රාසාද පංක්තිය.

පාපොච්චාරණය = 1. කල පව් කීම.

පාබත් = 1. ක්ෂිරබත. 2. පාත්‍රයට ලූ බත.

පාබල = 1. රථ-වාහනාදියෙහි නොනැගී පයින් යන යුධ භටයා.

පාබල සේනාව = 1. පයින් ගමන් කරන සේනාව.

පාබිස්ස = 1. පාපිස්ස; පය පිසදමන බිස්ස.

පාභත = 1. තෑග්ග. 2. පඬුර.

පාමා = 1. කුෂ්ට රෝගයක්.

පාමඩග = 1. හවඩිය.

පාමර = 1. දුෂ්ට. 2. මෝඩ.

පාම්බච්ඡි = 1. අහිගුණ්ඩිකයා; නයි නටවන්නා.

පාමින් = 1. දක්වමින්. 2. ගෙන හැර දක්වමින්. 3. ප්‍රකාශ කරමින්.

පාමිලි = 1. පාද සේවනය කරන මෙහෙකරුවා.

පාමුල් = 1. පාද මූලය. 2. ප්‍රාසාදයෙහි මූලය. 3. ඇඳේ පය දමන පැත්ත.

පාමුල් පෙට්ටිය = 1. රාජ භාණ්ඩාගාරය. 2 ඇඳ පාමුල තබා ගන්නා මුදල් හා රත්-රිදී ආභරණ දමන පෙට්ටියක්.

පාමුව = 1. ගෙනහැර දක්වමුව. 2. පාත්‍රයෙහි කට.

පාමෙණෙන = 1. (පයින් කටයුතු) පණිවුඩ ආදිය ගෙනයාමේ මෙහෙය.

පාමොක් = 1. ප්‍රමුඛ 2. ප්‍රධාන නායක. 3 ප්‍රධානත්වය. 4. ප්‍රාතිමෝක්ෂය. 5. රහදිය. 6. ප්‍රධානකොට ඇති.

පාමොක් ඇදුරු = 1. ප්‍රධාන ආචාර්යවරයා. (බුදු පාමොක්=බුදුන් වහන්සේ ප්‍රමුඛ කොට ඇති, දිසාපාමොක් ඇදුරු=දිශාවෙහි ප්‍රධාන ආචාර්යවරයා; රටේ ප්‍රධාන ගුරුවරයා.

පාමොක්ඛ = 1. ප්‍රධානයා. 2. නායකයා.

පාමොජ්ජ = (පාමුජ්ජ) 1. ප්‍රීතිය; සතුට. 2. නොමේරූ ප්‍රීතිය?

පාය = 1. ප්‍රාසාදය. 2. මාලිගාව. 3. බිම. 4. කිරි. 5. පාත්‍රය. 6. දිය. 7. අඩිය. 8. බොහෝ. 9. කණුව. 10. ගසමුල. 11. රුකුල. 12. අධික කොට ඇති.

පායක = 1. පොවන්නා.

පායන = 1 උදුවන. 2. හිරු රැස් තදින් ඇති. 3. වැහි 4. ගුඩ කරන. 5. පාදන. 6. හෙළි කරන.

පායමාන = 1. පොවන; පොවමින්.

පායස = (පායසික) 1. කිරි.

පායාසය = 1. කිරි බත්. 2. එළකිරි, සව්හාල්, වියලි මිදි ආදිය හොඳ සකස් කොට ගන්නා පානයක්.

පායාසාන්න = (පායාස + අන්න) කිරිබත් අහර.

පායී = 1. පානය කරන. (ක්ෂීරපායී=කිරි පානය කරන)

පායිකා = 1. පොවන්නී.

පායින් = 1. ආභරණ.

පායුග = 1. දෙකකුල්. 2. අශුචි. 3. වාතය යැම.

පායුරු = 1. භූමිය.

පායුව = 1. අධෝ මාර්ගය.

පාර = 1. මාර්ගය; මාවත. 2. පහර. 3. වාරයෙහි. 4. එකවානුවෙහි. 5. පසුපස්ස. 6. අනෙක් පැත්ත. 7. එගොඩ 8. පරතෙර. 9. වෙරළ. 10. කාලය.

පාරගත = (පාරගූ-පාරප්‍රාප්ත) 1. පරතෙරට-අවසානයට පැමිණි. 2. ගැඹුරු ලෙස උගත්

පාරගවේෂී 1 =. පරතෙර හෝ අවසානය සොයන්නා.

පාරගාමී = 1. පරතෙරට යන්නා.

පාරගූ = (පාරඞ්ගත, පාරප්පත්ත) 1. පාර-ප්‍රාප්තවූ; පරතෙරට ගිය. 2. සම්පූර්ණකල

පාරක්ඛවත් = 1. පය රකින (උපකරණය) වස්තුව; වහන්-සෙරෙප්පු ආදිය.

පාරච්චුව = 1. වර්ණනාව. 2. අනර්ඝ බව. 3. අගය කොට කථාකිරීම. 4. බොරු ප්‍රශංසාව.

පාරණ = 1. වේදනා කරන. 2. ගසන. 3. ප්‍රකාශ වන. 4. පහර දෙන. 5. හැප්පෙන. 6. උපවාසයෙන් පසු ලැබෙන ප්‍රථම භෝජනය.

පාරත = (පාරද) 1. රසදිය. 2. බුද්ධරජ.

පාර තොට = 1. මාවත් හා තොටු පොල ආදිය. 2. ගමන් මඟ; මඟ තොර තුරු.

පාර දර්ශක = 1. පරතෙර පෙනෙන.

පාරදාර්ය = 1. පරදාරය.

පාරදාරික = 1. අනුන්ගේ භාර්යාවන් කරා යන්නා.

පාරපාර = 1. වේදනා කොට-කොට. 2.ඇන-ඇන. 3. නැවත-නැවතත්.

පාරාපත = 1. පරෙවියා.

පාරම් = 1. රාත්තල් 560 ක (හොණ්ඩර පහක) බර ප්‍රමාණය. 2. පුරසාරම් වචන. 3. තර්ජනාත්මක වචන.

පාරම්බානවා = 1. තර්ජනාත්මක වචන කියනවා. 2. පුරසාරම් කියනවා.

පාරම්පර්‍යයී = 1. පරම්පරාවෙන් පැවත ආ; පරම්පරාවට අයත්.

පාරම්පර්‍යය = 1. පරම්පරාගත ඉගැන්වීම; ඉතිහාසය.

පාරමාර්ථික මතය = 1. උතුම්ම අදහස. 2. උසස්ම අදහස.

පාරමිතා = 1. බුදු බව අත්කර ගැනීම පිණිස පුරණ දාන - ශීලාදී ගුණ. 2. සම්පූර්ණත්වය.

පාරමිතා පුණ්‍ය = 1. පාරමිතා නමැති කුසල්.

පාරමිතා භූමි = 1. පාරමිතා පුරණ කාලය.

පාරමී = 1. පාරමිතා.

පාර ලෝකික = (පාර ලෞකික) 1. පරලොව සම්බන්ධවූ.

පාරවනවා = 1. (ගෙඩි-වණ ආදිය) මිරිකනවා. 2. වේදනා කරනවා.

පාරවළල්ල = 1. සතුරාට දමා ගසන චක්‍රාකාර ආයුධයක්.

පායස = 1. කිරිබත්.

පාරසී = 1. පාර්සි නම් මනුෂ්‍ය වර්ගයා. 2. පරිසියා දේශය.

පාර්සිකාරයා = 1. පර්සියන් ජාතිකයා.

පාරශර = (පාරාශර) 1. නක්ෂත්‍ර ග්‍රන්ථයක් නිෂ්පාදනය කළ ඍෂිවරයෙක්.

පාරා = 1. වේදනා කොට. 2. මැඩ ගෙන. 3. රබර් වර්ගයක්.

පාරාජික = 1. භික්ෂු ශීලය නසාගත් පුද්ගලයා.

පාරාවත = 1. වඳුරා. 2. පරෙවියා.

පාරාවතී = ගඟක නමක්.

පාරාවළල්ල = (පාරවළල්ල බලන්න.)

පාරාවාර = 1. ගඟේ දෙගොඩ.

පාරාශව = 1. අයෝමය (යකඩ) ආයුධය.

පාරාශවයා = 1. අවජාතකයා.

පාරායණ = 1. අවසාන බලාපොරොත්තුව. 2. පරමාර්ථය. 3. එතෙරට යාම. 4. එතෙරට යන මඟ.

පාරාවාරය = 1. සමුද්‍රය; මුහුද.

පාර්ථ = (පාර්ථිව) 1. රජකුමරා. 2. රජ. 3. සීතා දේවී.

පාර්ථවය = 1. මහත්කම.

පාර්වතේය = 1. පර්වතය සම්බන්ධ.

පාර්වත = (පාර්වතීය) 1. කඳුකරයෙහි ජීවත්වන.

පාර්වතී = 1. උමයඞ්ගනාව; ඊශ්වරයාගේ භාර්යාව.

පාර්වතී නන්දන = (පාර්වතී සුත) 1. පාර්වතී යගේ පුත්‍රයා; කතරගම දෙවි.

පාර්ශ්ව = 1. පැත්තකට අයිති. 2. පැත්ත. 3. ඇල පත.

පාර්ශ්වගත = 1. පැත්තක් ගත්. 2. පක්ෂ භජනයෙන් යුත්.

පාර්ශ්වය = 1. පක්ෂය. 2. දිශාව. 3. පැත්ත. 4. නිකාය.

පාර්ශ්වරුජා = 1. ඇලපත රුජාව.

පාර්ශ්වශූලය = 1. පැත්තක වේදනාව.

පාර්ශුකාව = 1. ඉල ඇටය.

පාර්ෂ්ණි = 1. විලුඹ. 2. පිට.

පාර්ශසූචි = 1. ඇලපතෙහි රුජාව.

පාර්ෂණී = 1. සංඩුකාරිය.

පාරිචර්යා = (පාරිචය්‍යා) 1. වතාවත් කිරීම. 2. සේවය කිරීම.

පාරිජක්තක = 1. කොබෝලීල ගස. 2. පරසතු රුක. 3. එරබදු ගස.

පාරිජාත = 1. එරබදු ගස. 2. කල්ප වෘක්ෂය.

පාරිජාතක = 1. එරබදු ගස.

පාරිනවා = 1. ගසනවා. 2. වේදනා කරනවා. 3. පලනවා.

පාරිතෝෂිකය = 1. සතුට දක්වීමට දෙන තෑග්ග. 2. සන්තෝෂම.

පාරිතෝෂිකාදීමනා = 1. සතුට දක්වීමට දෙන දීමනාව.

පාරිපන්ථික = 1. විරුද්ධ. 2. බාධා පමුණුවන. 3. මං පහරන්නා.

පාරිපාටිය = 1. පටිපාටිය; පිළිවෙළ.

පාරිපූරි = 1. සම්පූර්ණ වීම. 2. පිරීම.

පාරිපූර්යයී = 1. සම්පූර්ණවීම.

පාරිප්ලව = (පාරිප්ලව්‍ය) 1. චංචල.

පාරිපුල්ල = 1. හාත්පසින් ම පිපුණු. 2. මොනවට පිපුණු.

පාරිභද්ද = 1. කොසඹ ගස. 2. එරබදු ගස.

පාරිහච්චකතා = 1. දරුවන් වැඩීම.

පාරිභෝගික = 1. පාවිච්චි කළ (පැළඳු) වස්තුව. 2. ප්‍රයෝජනයට ගත්. 3. සේවනය කළ.

පාරිම = 1. එගොඩෙහි වූ.

පාරිමණ්ඩල්‍යය = 1. පරමාණුව.

පාරිමුඛය = 1. අභිමුඛය.

පාරිය = 1. ඇතුන් බඳින කණුව. 2. කෝප්පය.

පාරියානික = 1. රථය; කරත්තය.

පාරිවට්ටක = 1. මාරුකොට ගත් දෙය.

පාරිශේෂ = 1. හැම අතින් ඉතිරිවීම.

පාරිසජ්ජ = (පාරිෂද්‍ය) 1. පිරිසෙහි වූ 2. පිරිසට අයත් පුද්ගලයෝ.

පාරිශුද්ධි = 1. පිරිසුදු බව.

පාරිහාරික = 1. පරිහරණය කරන.

පාරිහාරය = 1. පැවැත්විය යුතු. 2, පරිහරණය කළයුතු.

පාරිහාරිණී = 1. ප්‍රහේලිකා විශේෂයක්.

පාරු = 1. ජල යාත්‍රා විශෙෂයක්. 2. පළල් ඕරු වෙසෙසක්.

පාරුකාරයා = 1. පාරුව පදින්නා; තන්ඩලේ.

පාරුක්කානි = 1. පුරාණ රෙදි වගීයක්.

පාරුගල = 1. පොළවේ යට පස්. 2. පාරුව නතර කිරීමට දිය යට බස්සවන ගල.

පාරුත = 1. පෙරවූ; පොරවාගත්. 2. අඳින ලද. 3. වැසුවාවූ

පාරුකල්ල = 1. පාරුවේ කෙළවර (පාරුවට නැගීමට) තනා ඇති පලල් ලෑලි තට්ටුව.

පාරුපණ=1. (සිවුරු) පෙරවීම. 2. පොරෝණා වස්ත්‍රය.

පාරුපණවාදය = 1. සිවුරු පෙරවීමේ පිළිවෙළ පිළිබඳව ඇතිවූ වාදය.

පාරුපන්ත = 1. පාරුවෙහි පැතිලෑල්ල.

පාරුපාලම = 1. රථවාහන ආදිය ගඟකින් එතෙර කරන පාරුව; පාලම් පාරුව.

පාරු බත = 1. පාරුවේ යත්නත් විසින් සකස්කොට ගන්නා කරවල පොල් සම්බල් ආදියෙන් යුත් බත.

පාරුෂක = 1. බොරලු දමනු ගස; උගුරැස්ස.

පාරුෂකපානය = 1. අෂ්ටපාන අතුරින් එකක්වූ බොරලුදමනු මිරිකාගත් ඉස්ම.

පාරුෂ්‍ය = 1. රළු වචනය. 2. පරොස් බව. 3. කුෂ්ට රෝගයක්. 4. නපුරු ගතිය. 5. අපහාස කිරීම. 6. ඉන්ද්‍ර දෙවියාගේ උද්‍යානය.

පාරුෂ = 1. පාර්ශ්වය.

පාරේවත = 1. පරෙවියා. 2. කොබෙයියා.

පාරෝහ = 1 අතුබලය. 2. (නුග අරළු මෙන්) උඩින් පහතට එල්ලෙන මූල. 3. නුග අරළුව.

පාල = 1. රකින; ආරක්ෂාකරන. 2. පාලනය.

පාලක = 1. ආරක්ෂා කරන්නා. 2. රැක බලා ගන්නා.

පාලංකඩ = 1. ඒදණ්ඩ. 3. පුංචි පාලම.

පාලංක = 1. සුවඳ දුම්.

පාලකත්වය = 1. ආරක්ෂා කිරීම. 2. පාලනය කිරීමේ බලය.

පාලඟ = 1. (බුලත් විඩට කන පොතු සහිත) වැල් වර්ගයක්. 2. පත්තිනි දේවියගේ පුරුෂයායයි සැලකෙන පාලඟ නම් කැනැත්තා.

පාලනය = 1. රැකීම. 2. නඩත්තු කිරීම. 3. පෝෂණය කිරීම. 4. සකස් කිරීම. 5. රැක බලා ගැනීම.

පාලම් = 1. ගංගා ඇල - දොල ආදියෙන් රථ වාහන එතෙර කිරීමට හා මිනිසුන්ට යාම්-ඊම් කිරීමට (ගඩගා ආදිය මත්තෙහි) තැනූ සේතුව.

පාලම් පාරුව = 1. පාරු පාලම බලන්න.

පාල මග = 1. ප්‍රසිද්ධ පාර.

පාලයා = (පාලකයා) 1. ආරක්ෂා කරන්නා.

පාලා සෝමි = 1. එරබදු ගස.

පාලාශ = 1. කොළ පැහැය.

පාලි = 1. හැටිය; අන්දම. 2. මාගධී භාෂාව. 3. ධර්ම මාර්ගය. 4. පෙළ. 5. නියර. 6. පංක්තිය. 7. එනම් සිංහල කුමාරිය; සුවර්ණපාලිය. 8 බුද්ධ වචනය. 9. පුරාණ දුත් ශාලාවක්. 10. රකින්නී. 11. ආකාරය.

පාලිකා = 1. රැක බලාගන්නී. 2. ආරක්ෂා කරන්නී. 3. උඩරට සැරසිල්ලක්; රැළි පාලම්. 4. කත් පෙත්ත. 5. මුවාත.

පාලිගාම = 1. පේළිය. 2. පිල.

පාලිච්ච = 1. හිසකෙස් සුදුවීම.

පාලිනී = 1. ආරක්ෂා කරන්නී.

පාලිය = 1. කත් පෙත්ත. 2. පේළිය. 3. මුවාත. 4. පාළි භාෂාව. 5. ලකුණ 7. ආකාරය.

පාලිත = 1. ආරක්ෂා කරන ලද. 2. පාලනය කළ. 3. තල ඇටය. 4. පැරණි රහතුන් වහන්සේ නමක්.

පාලි භද්ද = 1. එරබදු ගස.

පාලි පොක්ඛ = 1. ඉතිමං පෙත්ත.

පාලිය = 1. ඉතිමග.

පාලෙන්ත = (පාලයමාන) 1. රකිමින්; පාලනය කරමින්.

පාලෙන්තෙන් = 1. පුරාණ රෝම කථාවක සඳහන් කුමාරයෙක්.

පාල = 1. ප්‍රසිද්ධ 2. පහන.

පාළු = (පාලු) 1. හිස්. 2. නොවැවූ; වගා නොකළ 3. නාස්තිය; නැතිවීම. 4. ජනයන් නැති.

පාළු අම්බලම = 1. ජනයන් නැති අම්බලම.

පාවක = 1. ගින්න.

පාවකයා = 1. ගිනි දෙවියා.

පාවගන්නවා = (පාවා ගන්නවා) 1. කාන්තා-වක් අවාහ කොට ගන්නවා. 2. බාර ගන්නවා. 3. ලබා ගන්නවා.

පා වචන = 1. බුද්ධ වචනය. 2. බුද්ධ ධර්මය.

පාවට්ටා = 1. ආඩතෝඩා ගස. 2. මූනිස්සම් වැනි ගෙඩි වලින් හා සුදු කුඩා මල් වලින් ද යුත් (පාවට්ටා නම්) ගසක්.

පාවඩය = (පාවාඩය – පාවාඩෙ) 1. පියවිලි; පා තබා යාමට බිමට එලන සුදු රෙද්ද. 2. හිඳීමට එලන ඇතිරිය.

පාවන = 1. පිරිසුදු බව. 2. පිරිසිදු කරන.

පාවර = 1. කමත; ගොයම් මඩින තැන; ගොයම් කොළ පාගන තැන.

පාවරණ = 1. පොරෝණය.

පාවාඩය = (පාවඩය බලන්න.)

පාවා දෙනවා = 1. යම්කිසි කාන්තාවක් විවාහ කොට දීම. 2. යටත් වී බාර දෙනවා. 3. බාර කරනවා. 4. ද්‍රෝහිකමින් අල්වා දෙනවා.

පාවාර = 1. උතුරු සළුව. 2. පොරෝණා වස්ත්‍රය.

පාවාරික = 1. උතුරු සළු වෙළෙන්දා.

පාවාල = 1. තට්ටම් දෙක.

පාවිච්චිය = 1. ප්‍රයෝජනයට ගැනීම. 2. පරිභෝගය. 3 පරිශීලනය. 4. වැළඳීම. 5. පිළි පැදීම.

පාවිඹි = 1. පහත කොටස 2. පාදයේ කෙළවර.

පාවී = 1. පච්චාරිය. 2. පාවීගත ගොස්. 3. ගෙන හැර දක්වාවි.

පාවු = 1. පහත ස්ථානය. 2. පහත් බිම.

පාවුරණ = 1. පෙරවීමට ගන්නා වස්ත්‍රය.

පාවුරු = 1. භූමිය. 2. දේශය.

පාවුස = 1. වර්ෂා කාලය. 2. මාළු ජාතියක්.

පාවුස්ස = 1. ලූලා. 2. ආඳා?

පාවුස්සක = 1. වර්ෂා කාලයට අයත්.

පාස = 1. උගුල. 2. මලපත. 3. පුඩුව. 4. රැහැ. 5. බොත්තම් කාසය. 6. ස්පර්ශය.

පාස කියනවා = 1. අපහාස කරනවා. 2. එකට එක කියනවා. 3 ඇනුම්පද කියනවා. 4. තර්ජනය කරනවා.

පාසක = 1. පස ඇටය; දාදු කෑටය.

පාසණ්ඩ = 1. මිථ්‍යාදෘෂ්ටිය.

පාස බන්ධන = 1. මල පුඩුව නමැති බන්ධනය.

පාසලබ = 1. පයේ දමන ගිගිරි වළල්ල.

පාස් = 1. ස්පර්ශය; පහස. 2. තර්ජන වචනය.

පාස්කරනවා = 1. යමක් යමකට හිලව් කරනවා.

පාස්කු = 1. රෝමානු කතෝලිකයන්ගේ ආගමික උත්සව කාලයක්.

පාස්පොත = 1. ගනු දෙනු ආදිය ලියන, සාක්කුවේ පාවිච්චි කරන කුඩා පොතක්.

පාස්වෙනවා = 1. සමත් වෙනවා.

පාස් වෙන්නෙ නෑ = 1. පහු වෙන්නේ නෑ. 2. දෙවැනි වෙන්නේ නෑ.

පාස්සනවා = 1. එකට - එක කරනවා. 2. පාහනවා; එකට සම්බන්ධ කරනවා.

පාසා = 1. එක - එකින් පසු. 2. එකින්-එකට. 3. දෙකක් හෝ කීපයක් එකට සම්බන්ධ කිරීමෙහි (ගෙයක් - ගෙයක් පාසා; ගෙයක් - ගෙයක් ගානේ) 4. බැගින්.

පාසානං = (පාසානම්) 1. එනම් උග්‍ර විෂ.

පාසාණ = 1. ගල. 2. ගල් පර්වතය.

පාසාණගුල = 1. ගල් බෝලය.

පාසාණ චේතිය = 1. ගල් සෑය; ගලින් කළ චෛත්‍යය.

පාසාණ පීඨ = 1. ගල මතු පිට. 2. ගල් ආසනය.

පාසාණ ඵලක = 1. ගල්ලෑල්ල.

පාසාණ ලේඛා = 1. ගලේ කෙටූ ලිපිය. 2. ශිලා ලිපිය.

පාසාද = 1. ප්‍රාසාදය; විශාල ගෘහය. 2. සතරැස් ගෙය.

පාසාදතල = 1. ප්‍රාසාද තලය; උඩුමහල; සොල්දර තට්ටුව.

පාසාදික = 1. පැහැදීම ඇතිකරන. 2. සතුට එළවන; සතුටු දයක.

පාසැල = (පාසල) 1. පාඨශාලාව; ශාස්ත්‍ර ශාලාව

පාසි = 1. පෙඳ. 2. දිය සෙවෙල්.

පාසිනවා = (පාහිනවා - පහිනවා) 1. කොටා ශුඬ කරනවා.

පාසු = 1. පහසුව. 2. සුවය. 3. විවේකය. 4. සනීපවූ. 5. සුලභ. 6. පහසුවෙන් සපයා ගත හැකි. 7. කරදර නැති.

පාසුන් = 1. කැඩුණු පා ඇති. 2. කැපුණු පා ඇති.

පාසෙ = 1. උගුල. 2. තොණ්ඩුව. 3. විලංගුව. 4. රැහැ. 5. මල පුඩුව.

පාශක = (පාසක බලන්න.)

පාශ බන්ධය = (පාශ බන්ධනය) 1. සතුන් ඇල්ලීමේ උගුල.

පාෂණ්ඩ = (පාෂාණ්ඩ) 1. මිථ්‍යා දෘෂ්ටිකයා. 2. ධර්මය පරිදි නොහැසිරෙන්නා.

පාශින් = (පාශි) 1. මුවන් අල්ලන්නා.

පාෂාණ = 1. ගල්. 2. ගල් පොත්ත. 3. බොරළු.

පාෂාණචක්‍ර = 1. ගලින් නිමවන ලද කුඩය.

පාෂාණමය = 1. ගලින් කළ.

පාෂාණාශනාශා = 1. ගල් කන්නා. 2. මොනරා. 3. පැස්බරා.

පාෂාණ යුග = 1. ගල් යුගයට අයිති.

පාෂාණී භූත = 1. ගල් ගැසුණු. 2. ගල් බවට පත් වූ. 3. ගලක් වැනි වූ. 4. කොසෙලවෙන.

පාහනවා = 1. පාස්සනවා.

පාහර = 1. නීච. 2. දුර්ජන 3. මෝඩ. 4. අධම.

පාහැකිල්ල = 1. පයේ දමන විලංගුව.

පාහිනවා = (පාසිනවා බලන්න.)

පාහුණ = 1. යැවිය යුතු පඬුර. 2. ආගන්තුකයා. 3. ආගන්තුක දානය.

පාහුණේය = 1. ආගන්තුක දානය දියයුත්තා.

පාහුණෙය්‍ය = 1. ආගන්තුක සත්කාරයට හෝ පඬුරු යැවීමට සුදුස්සා.

පාළි = (පාලි බලන්න.)

පැ

පෑ = පැහැය; පාට.

පැංච = (පැංචා) 1. කොලුවා.

පැංචි = 1. කෙල්ල.

පැකම = (පැකුම්) 1. මඩ.

පැකැටිබුඩ = 1. කුඩා බඩු මිටිය.

පැක් එක = බුසලෙන් හතරෙන් පංගුව. 2. සුදු කුට්ටම.

පැකි = 1. ගෙඩිය.

පැකිරීම = 1. ඇනුම් ඇරීම. 2. දිග ඇදීම.

පැකිලි = 1. ගස් මුල් ආදියෙහි පටලැවුණු.

පැකිල්ම = (පැකුලුම්) 1. පැකිලීම.

පැකිලෙන = 1. පසුබටවන. 2. පසුබාන. 3. නැතිගත් ගතියකින් යුත්.

පැකුම් = (පැකුත්) 1. මඩ.

පැගිරා = 1. නම් පුරම් සිරුරකින් යුත් පැටියා. 2. පැටියා; කුඩා සතා.

පැගිරි = 1. දෙහි, දොඩම් ආදි ගෙඩිවල ලෙල්ලෙහි ඇති ඉස්ම. 2. එනම් පැලැටි විශේෂය; පැගිරි මාස්. 3. එම තෙල්.

පැගිරි දර = 1. දෙහි, දොඩම්, නාරං, යකිනාරන්, සුඹලු දෙහි යන පස් වගීයේ දර.

පැගිරි පුස්බ = 1. දෙහි ආදියෙහි සුවඳ.

පැගිරි වයස = 1. තරුණ වයස. 2. අවුරුදු දහඅතරින් වැඩි විස්සෙන් අඩු වයස.

පැටලිල්ල = 1. අවුල. 2. කරදරය.

පැට = 1. කුඩා සතා. 2. පැටවා. 3. ළා බාලයා.

පැටවිල්ල = 1. බර පැටවීම. 2. කරත්ත ආදියෙහි බර දැමීම.

පැටවීම් = 1. ආරම්භය. 2. කොපෙනීයාම. 3. සැඟවීම. 4. පැටවිල්ල. 5, වැසීම. 6, කෝපවීම.

පැටි = 1. දක්ෂ තැනැත්තී. 2. පෝතිකාව. 3. සැඟවීම. 4. කුඩා සතා. 5. පටන්ගත්.

පැටි කිරිය = 1. ඔප්පු පැවත ආ පිළිවෙළ. 2. ඔප්පුවල අයිතිය.

පැටික්කි = 1. පැගිරි වයසේ තරුණිය. 2. කෙල්ල.

පැටිකි = 1. පුංචි පැටියා.

පැටී = 1. දක්ෂ තැනැත්තී. 2. පැටික්කි.

පැටු = 1. සැඟවීම. 2. වැසීම.

පැඩ්ඩා = 1. කුඩා සතෙක්.

පැඩිලි = (පැඩිලි) 1. සුදු. 2. සුදුමැලි.

පැන = 1. ප්‍රශ්නය. 2, ප්‍රඥාව. 3. කළය. 4. මහ කැළිය. 5. ජලය. 6. හළදෙය.

පැන ඇස = 1. ප්‍රඥාව නමැති ඇස.

පැන නගිනවා = 1. උද්ගත වෙනවා; මතු වෙනවා. 2. හට ගැනෙනවා 3. ඉදිරිපත් වෙනවා.

පැනය = 1. ප්‍රශ්නය.

පැනලා = 1. වඳුරා. 2. උඩ පැන.

පැනලා යනවා = 1. සොරෙන් යනවා. 2. පැන දුවනවා. 3. සැඟවී යනවා 4. උඩින් පැන යනවා.

පැනවීම = 1. අණසක් පිළියෙළ කොට තැබීම. 2. නීති ආදිය ඇති කිරීම.

පැන් = 1. ජලය. 2. පැන් තලිය. 3. ප්‍රඥාව. 4. ඉරිවෙරිය. 5. කොළය.

පැන් කැලි = 1. කොළ වලින් කළ ලකුණ.

පැන් කොම = 1. දිය සහිත ගල් වළ.

පැන් සබ 1. දිය කළය.

පැන් කැළිය = 1 දිය සහිත හැළිය. 2. දිය බඳුන.

පැන් තැඹිය = 1. පැන් බඳුන.

පැන් තැන් = 1. ජලය ඇති ස්ථානය; ජලාශය.

පැන් තිබාසය = (පැන් පිපාසය) 1. දිය තිබහ; දිය පිපාසය.

පැන් තුරු = 1. ළා පුවක් ගෙඩිය. 2. වැවර වෙන්නටත් පළමු ලොඳ හිඳී නැති ළා පොල් ගෙඩිය 3. ළපටි පලතුරු.

පැන් තොට = 1. දිය ගන්නා තොටුපළ.

පැන්නවීම = 1. එලවා දැමීම. 2. පතිත්කට සිදු කිරීම.

පැන්නා = 1. පැනීම කළා. 2. එනම් කුඩා මාළුවා; කාරලු වර්ගයක්.

පැන් නැහැම් = 1. දිය නෑම.

පැන් පම = 1. පිපාසය.

පැන් පල 1. 1. කොස කිළිය. 2. නාන හෝ සෝදන ස්ථානය.

පැන් පවස් = 1. දිය පිපාසය.

පැන් පොකුණු = 1. පොකුණ. 2. බිමට දිය ගන්නා පොකුණ.

පැන් බත් = 1. පළමු දින රෑ බත් (හැළියට දිය වත්කොට හෝ) දියෙහි දමා හෝ එළිවනතුරු තබා පොල්කිරි හා ලියාගත් රතුළූනු මිශ්‍රකොට සකස්කොට ගන්නා බත; දියබත්.

පැන්මඩවනවා = 1. දිය වත්කොට මිරිකනවා.

පැන්මඩු = 1. පැන් බඳුන තබන මඩුව.

පැන්මල් = (පැන්මලා) 1. කුසලාන. 2. ගුරුලේත්තුව. 3. කෝප්පය 4. බොන භාජනය.

පැන්මුසු = 1. දිය මිශ්‍රකළ.

පැන්මෝරු = 1. කිරිමෝරු.

පැන්වළ = (පැන්වළි) 1. ළිඳ.

පැන්වළන් = 1. දිය සහිත වළන්; දිය බඳුන්.

පැන්විම = 1. පන්නා දැමීම. 2. උඩ පැන්නවීම.

පැන්සය = (සත හතරක වටිනාකම ඇති) පැරණි කාසියක්. 2. ඉංග්‍රීසි කාසියක්.

පැන්සක් = 1. පැන් ගැනීමට කෙණෙස්සක් වාගේ තැනූ හක් ගෙඩිය.

පැන්සල = 1. ලිවීමට ගන්නා එකම් උපකරණය.

පැන්සැළ = 1. පැන් සහිත හැළිය.

පැනි = (පැනී) 1. දිය පිපාසය ඇත්තා. 2. පැන් කැමති වන.

පැනිති = 1. පැන්ටිකා.

පැනීම් = (පැනුම්) 1. පැනීම; පතින බව.

පැනු = 1. පානය. 2. යුස; ඉස්ම.

පැනෙන = 1. පෙනෙන. 2. ප්‍රකට වන.

පැන්නුම් = 1. එලවා දැමීම්; පලවා හැරීම්. 2. (කොඩිවින ආදිය කොට) උඩින් පැන්නවීම්. 3. වැව් ආදියෙහි වැඩි වතුර බැස්සවීමට සෑදූ තැන.

පැන්නූ = 1. පසු-පස්සේ එලවා ගිය.

පැණ = 1. ප්‍රශ්නය. 2. පෙණය. 3. නුවණ. 4. පණාව. 5. කළය. 6. මහ හැළිය. 7. භාජනය. 8. පුන් කලස.

පැණ ඇස් = 1. නුවණ නමැති ඇස.

පැණවත් = 1. ප්‍රඥාවන්ත; පණ්ඩිතයා.

පැණවෙසෙස් = 1. ප්‍රඥා විශෙෂය; විශිෂ්ටවූ නුවණ.

පැණවිම = 1. නීති ආදිය පැනවීම. 2. ආසන සූදානම් කිරීම.

පැණසර = 1. ප්‍රඥාවෙන් සරුවූ; නුවණැති. 2. උගත්. 3. ප්‍රඥාව නමැති හරය ඇති. 4. පණ්ඩිත.

පැණි = 1. පොල් පැණි, කිතුල් පැණි, උක්පැණි ආදි රසවත් ඕජාව. 2. පැසුණු ගෙඩිවල යුස. 3. පණුවා. 4. ලාටු. 5. පණුවාගේ ගැණු සතා. 6. කුරුමිණියා. 7. රසවත්.

පැණි අඹ = 1. පත් පැණි කරගත් අඹ. 2. එකම් රසවත් අඹ. 3. පැණියෙහි බහා පිසගත් අඹ.

පැණි අන්නාසි = 1. මිහිරි රසයෙන් යුත් අන්නාසි.

පැණි ආප්ප = 1. පැණි මිශ්‍ර කළ පිටියෙන් තැනූ ආප්ප.

පැණි කොමඩු = 1. මිහිරි රසයෙන් යුත් කොමඩු.

පැණි දොඩම් = 1. මධුර රසයෙන් යුත් දොඩම්.

පැණින් = 1. සතුටින්.

පැණිපිවමු = 1. රසවත් කැවිලි විශේෂයක්.

පැණිපොල් = 1. පැණියෙන් පත් පැණි කොට ගත් පොල්.

පැණිරස = 1. මධුර රසය. 2. දිව පිනවන රසය.

පැණිරසැති ලිය = 1. වැල්මී.

පැණිවරකා = 1. මධුර රසයෙන් යුත් වරකා විශේෂයක්.

පැණෙන = 1. දෘශ්‍යමාන වන; පෙණෙන.

පැතලි = 1. සමතලා.

පැත් = 1. පංක්තිය; පෙළ.

පැත්ත = 1. දිශාව. 2. ප්‍රදේශය. 3. භාගය. 4. පාර්ශ්වය.

පැත්තක් = 1. කොටසක්. 2. දිශාවක්.

පැති = 1. පැත්ත. 2. ප්‍රාණීනා කශ.

පෑතිණි = 1. භාර්යාව. 2. පතිව්‍රතාව. 3. ප්‍රධාන තැනැත්තී.

පෑතිරි = 1. පතළ. 2. විසිරි.

පෑතිරීම් = 1. ව්‍යාප්තවීම; වට-පිට විසිරීම.

පෑතිරෙනවා = 1. විසිරෙනවා. 2. ගලායනවා. 3. ප්‍රසිඬ වෙනවා.

පෑතිවිලි = 1. ප්‍රාර්ථනාව.

පෑතීම් = (පැතුම්) 1. ප්‍රාර්ථනාව. 2. අයැදුම.

පෑතූ = 1. ප්‍රාර්ථනය කළ.

පෑද = 1. (ඔරු-පාරු ආදිය) හබලින් යාත්‍රා කොට.

පෑදකුණු කරනවා = 1. ප්‍රදක්ෂිණා කරනවා; යම් කිසි පූජ්‍ය වස්තුවකට ගෞරව කරනු වස් තමාගේ දකුණු අත පැත්ත ඒ වස්තුව දෙසට සිටින ලෙස ඒ වටා ගමන් කරනවා.

පෑදගනයාම = (ඔරු-පාරු ආදිය) පෑදීමේ බලයෙන් යාම. 2. බයිසිකල්, මෝටර් රථ ආදි වාහන පදවාගෙන යාම.

පෑද්දෙනා = 1. වැනෙන 2. එහා මෙහා වන්නාවූ.

පෑද්දෙස = 1. නැගෙනහිර දිශාව.

පෑදි = 1. පදින ලද. 2 පාද (සහිත) ඇති. 3. නැගෙනහිර පැත්ත 4. නූල් ඇදීම.

පෑදිදොර = 1. නැගෙනහිර දොරටුව.

පෑදීම් = 1. ඔරු ආදිය පැදගෙන යාම්; යාත්‍රා-කරවීම්. 2. නූල් ඇදීම්. 3. එහාමෙහා වීම. 4. (ඒ මේ අත) වැනීම්.

පෑදුම = 1. නැගෙනහිර. 2. මේඝය. 3. වලාකුළු. 4. උදය පර්වතය. 5. ඉන්ද්‍රදෙවි. 6. යාත්‍රා කිරීම. 7. කලාඳුරු.

පෑදුම්අග = 1. උදය පර්වතය.

පෑදුම්කුළු = 1. නැගෙනහිර පර්වත කූටය.

පෑදුම්දිස = (පැදුම් දිසා) 1. නැගෙනහිර පැත්ත.

පෑදුම්දික් = (පැදුම් දිග්) 1. නැගෙනහිර දිශාව. 2. නැගෙනහිර දිශාවට අධිපති.

පෑදුම්දික්පති = 1. ඉන්ද්‍ර දෙවි.

පෑදුම්මරු = 1. නැගෙනහිරින් හමන සුළඟ.

පෑදුම්රද = (පැදුම් දෙවි) 1. මහා මේඝය.

පෑදුම්ශාඛා = නැගෙනහිර අත්ත.

පෑදුර = 1. බොරුපන්, ගල්ඇහැ පන් ආදියෙන් වියා බිම හෝ ඇඳන් මතුයෙහි එළීමට ගන්නා කලාල විශේෂය.

පෑදුරුආන = 1. පැදුරු එල්ලීමට සකස්කොට ගත් සැල්ල. 2. පැදුරු තබන මැස්ස.

පෑදුරුකබඩ = 1. පැදුරු කැබැල්ල.

පෑදුරු කාබෙ = 1. පැදුරු ආදිය විකුණන වෙළෙඳ සැල.

පෑදුරුකබල = 1. කබල් පැදුර.

පෑදුරුමාලු = 1. පරණ පැදුර.

පෑදුරු මාගල = 1. මාගල; මාගල් පැදුර.

පෑදුරුවාණ = (පැදුරු ආන බලන්න)

පෑපොල් = 1. එකම බෝවෙන රෝගය. 2. ගස් ලබු නම් (ගස් හෝ) ගෙඩි වර්ගය.

පෑපොල් කිරි = 1. පැපොල් ගෙඩි වලින් වෑස්සෙන කිරි හෝ පැපොල් කොළ වලින් වෑස්සෙන කිරි.

පෑමිණි = (පැමිණි) 1. පැමුණුනු. 2. සිඬවුණු. 3. පැමිණිලි කළ.

පෑමිණිනැනා = 1. ඔබ වහන්සේ.

පෑමිණිනැන් = 1. වැඩිවිය පැමිණි කෙනෙක්. 2. පැමිණි පුද්ගලයා.

පෑමිණිලි = 1. නඩු පැවරීම.

පෑමිණිලිකාරයා = 1. නඩුව කියන්නා. 2. චෝදනා නගන්නා.

පෑමිණීම = 1. සම්ප්‍රාප්ත වීම. 2. ජම.

පෑය = 1. සව්කාව. 2. පැතැටිය. 3. මිනිත්තු හැටක කාලය.

පෑයකටුව = 1. ඔර්ලෝසුවේ පැය ගණන දක්වන කටුව.

පැරකුම් = 1. වික්‍රමය. 2. බල පරාක්‍රමය. 3. විශාල බලය. 4. එනම් රජ.

පැරණි = 1. පුරාණ 2. අතීතයෙහිවූ 3. ආදි කාලයට අයත්.

පැරද = (පැරදී) 1. පරාජිතව; පරාදව.

පැරදිච්ච = 1. පැරදුණු. 2. ඇගිටි.

පැරදිම් = (පැරදුම්) 1. පරාජය.

පැරජ් = 1. කරජ් ගෙඩිය; මාළු ඇල්ලීමට ගන්නා එනම් කූඩය.

පැරපුම = (පැරුම) 1. බලාපොරොත්තුව.

පැරසිම් = (පැරයුම්) 1. පැරදවීම.

පැරදූ = 1. පැරදවූ.

පැරහැර = 1. පරිහරණය. 2. සත්කාරය.

පැරළිජූ = 1. පරාජයවී; පරාදවී.

පැරළිවිසා = (පැරළිවිසා) 1. එනම් මත්ස්‍යයා; පරාවියා.

පැරළින්න = 1. නැවත-නැවත ඉල්ලීම. 2. පෙරළත්තය; ඇවිට්ටිල්ල. 2. යාච්ඤාව.

පැරළිත්ති = 1. කපු ගස.

පැරළුසු = 1. පරාද කළ.

පැරළිහැන් = 1. පෙරහන; දියපෙරන රෙදි ගොට්ට; පෙරහන් කඩය.

පැරළිහැන් පඩ = 1. පෙරහන්කඩය.

පැරුම් = 1. පාරමිතා; පාරමී; දානාදී පින්කම්.

පැරුම් දම් = (පෙරුම් දම්) 1. පාරමිතා ධම්.

පැරුම් බිම් = 1. පාරමිතා භූමිය.

පැල = (පැල්) 1. කුටිය; කුඩා ගෙය. 2. පැල් පත. 3. මුර මඩුව. 4. බස්නාහිර පැත්ත.

පැලඟි = 1. සමාන්. 2. පුදුණු.

පැලන්දි = 1. පැලඳි.

පැලඳුම් = 1. පළඳනා; ආභරණ; ආයිත්තම්.

පැලපි = 1. පැලමද; පැලපොල් ගෙඩියේ මදය.

පැලඹි = 1. පෙළඹී; උනන්දු වී. 2. යොමු වී. 3. ආශා වී.

පැලඹුම් = 1. පෙළඹීම්. 2. උනන්දු වීම්. 3. ආශා වීම්.

පැලඹෙන = 1. පෙළඹෙන. 2. උනන්දු වන. 3. ආශාවන. 4. බැබළෙන.

පැලලී = 1. බට පතුරු වලින් හෝ වේවැල් වලින් සැදූ ආවරණය. 2. දොර පුවරුව. 3. ලුණු කරවල පෙති?

පැලලි කවි = 1. කාව්‍ය සම්ප්‍රදාය ගැන කිසිත් දැනුමක් නැති කවියන්ගේ රචනා විලාසයක් වන එනම් කවි. 2. විරිතකට නැති කවි.

පැලසා = 1. පුළුස්සා.

පැලසි = 1. ප්‍රතික්ෂේප කළ; එපා කළ.

පැලහෙන = 1. දැවෙන; පිළිස්සෙන; පිච්චෙන.

පැලන් පෝරු = 1. වහලේ යටි පැත්තට දමන ලෑලි. 2. මුදුන් යට ලීය?

පැලසන් = 1. පැලන් පෝරුව.

පැලහු = 1. පිළිස්සූ.

පැල්කවි = 1. පැල් රකින්නන් විසින් රාත්‍රී කාලයෙහි දී කියනු ලබන කවි.

පැල්කාරයා = 1. පැලේ හිඳ ගොවිතැන් රකින්නා. 2. දළු පත් කාරයා.

පැල්ම = 1. පැලීම. 2. ඉරිතැලීම. 3. පිපිරීම.

පැල් ලගිනවා = 1. ගේන්, කුඹුරු ආදියෙහි ආරක්ෂාවට රාත්‍රී කාලයෙහි (එහි වූ පැල් පතෙහි) මුර - කාවල් කරමින් ඉන්නවා.

පැල්ලම = 1. ලපය. 2. කිත. 3. පළුද්ද. 4. කිළුට. 5. පුල්ලිය. 6. කබර.

පැල්මනිය = 1. නොනඩවා පැවතීම. 2. අශුබකම.

පැලා = 1. පැනගිය. 2. පලාගිය. 3. පැන දිව්වාවූ.

පැලෑඟි = 1. පලඟ (ප්‍රමාණය) ඇති. 2. යෝග්‍ය.

පැලෑන්නිය = 1. පෙලක්කිය. 2. වරිගය. 3. පෙළපත් නාමය. 3. වරිගවාන්නිය. 5. වංශ පරම් පරාව.

පැලෑන්ද = 1. පැලඳී.

පැලෑඹෙන = 1. පැලෑඹෙන කල්හි; බැබළෙන කල්හි.

පැලැල්ල = (පැලලි බලන්න.)

පැලැඤ්ඤ = 1. කුඩා කැලැව. 2. ලෙන. 3. සතෙකු වසන බෙනය.

පැලැස්තර = 1. තුවාල ආදියට එලන බෙහෙත් සහිත රෙදි කැබැල්ල. 2. ඉරුණු රෙදි ආදියට යොදන අණ්ඩය 3. දිරච්ච තහඩු ආදිය මුට්ටු කරන තහඩු කැබැල්ල.

පැලැහුණු = 1. දැවුණු. 2. පිළිස්සුණු.

පැලැනේ නාහිමි = 1. පැලැනේ වජිර ඥාණ මහානායක ස්වාමීන්ද්‍රයෝ; (සුපේසල ශික්ෂා කාමී මහා සංඝ පිතෘවරයෙකි ලෝක ශාසන වයට උදාර සේවයක් කරන සිසු පරපුරක් ඇති කළ මූන්වහන්සේ අතින් වැදගත් පොත් රැසක් ලියැවිණි.)

පැල = 1. බස්නාහිර දිශාව. 2. පැලැටි 3. පීඩාව. 4. ළා ගස; අංකුරය. 5. පිටි පස්ස. 6. පැල; කුරුණි දහය. 7. දූත. 8. ලපටි.

පැල ඉණි = 1. (වැට - කොටු ආදියට සිට වූ) පැලවෙන ඉත්ත.

පැලඉණිවැට = 1. පැලඉණි සිටුවා බැඳි වැට.

පැලකරනවා = 1. වවනවා.

පැලගැටියා = 1. පළගැටියා.

පැලගොයම් = 1. ලපටි ගොයම්; කොළමරු සස්‍යය.

පැලතුරු = 1. ජනපදය. 2. මිනිසුන් වෙසෙන පළාත.

පැලදිග = (පැල දිගු) 1. බස්නාහිර දිශාව.

පැලදිගුහිමි = 1. බස්නාහිර දිශාවට අධිපති දෙවි; වරුණ දෙව් රජ.

පැලදෙස් = 1. බස්නාහිර පැත්ත.

පැලඳගැනීම = 1. ආභරණ වලින් සැරසීම. ආයිත්තම් ඇඳගැනීම.

පැලඳුම = 1. පළඳනාව.

පැලදොර = 1. ගෙයි පිටිපස පැත්ත. 2. පස්සා දොර.

පැලපස = (පැල පස්) 1. බස්නාහිර පැත්ත.

පැලපත = 1. ළා ගොයම.

පැලපොල් = 1. ඉකිරි ඇදුණු පොල්.

පැලමද = 1. පැළ පී; පැළපොල් ගෙඩියේ මදය.

පැලමුහුණ = 1. පසු පැත්ත. 2. බට හිර පැත්තේ දොරටුව.

පැලමුහුදු = 1. බස්නාහිර දිග මුහුද.

පැලය = 1. පැළැටිය.

පැලවෙනවා = 1. වැවෙනවා.

පැලසක්වළ = 1. බට හිර දිග සක්වළ.

පැලසයුරු = 1. පැල මුහුදු බලන්න.

පැලහිඳවූ = 1. පැළ සිටුවන ලද; රෝපණය කරන ලද.

පැලහුම් = 1. පිළිස්සීම 2. පළු කිරීම 3 ඉරීම.

පැළැලි = 1. පැලැල්ල. 2. බට පතුරු ඇදියෙන් සැදූ මසුන් ඇල්ලීමට ගන්නා උපකරණයක්; කෙමිත?

පැළැඹිට = 1. පැළය; කුඩා පැළය.

පැළි = 1. පැළුණු

පැළිබල = 1. ඉරි තැළීම; බිම තෙක්වූ තැන.

පැළිමලනු = 1. මඩ වියළී ගිය විට පැළී ඇතිවන කැබැලි.

පැළිහිරි = 1. පැළීමෙන් ඇතිවන ඉරි.

පැළියම් = 1. පැළීමට කැමති.

පැළෙනවා = 1. වෙන් වී යනවා. 2. පුපුරණවා. 3. ඉරි තලනවා. 4. ඉරෙනවා.

පැළෙනු = 1. පැළීම. 2. කැබලි වලට කැඩී බිඳීයාම.

පැවසඤ්ඤා - 1. පරම්පරාවෙන් = පරම්පරාවට එන. 2. පැවතීගත එන. 3. පරම්පරාවට අයිති.

පැවති = 1. පැවතුණු.

පැවතුම = 1. චරිතය. 2. හැසිරෙන පිළිවෙළ. 3. කාව්‍යාලඞ්කාරයක්. 4. පැවතීම.

පැවරීම = (පැවරුම්) 1. පවාරණය. 2. ආරාධනය. 3. බාරකිරීම. 4. පත්කිරීම. 5. පංගබෑත්තු කිරීම.

පැවසිම = (පැවසුම) 1. ප්‍රකාශ කිරීම; කීම. 2. දක් විම.

පැවැජි = 1. ප්‍රව්‍රජ්‍යාව; මහණ කම.

පැවැජිකිස = 1. පැවිදි කිස; මහණදම් පිරිම.

පැවැත් = 1. ප්‍රවෘත්තිය.

පැවැත්ම = 1. වංසය කිරීම. 2. සිරිත. 3. පුරුද්ද. 4. පැවතීම.

පැවැති = 1. පැවතුණු. 2. පව් ඇති; පව් කාර.

පැවැසෙනු = 1. ප්‍රකාශ කරනු ලබන; කියනු ලබන.

පැවැහි = 1. පාපයෙහි.

පැවි = 1. ගෙහැර දක් වී; දක්විය; පැය. 2. පර්වතය.

පැවිජි = (පැවිදි) 1. පැවිද්ද. 2. මහණ කම; මහණ වූ.

පැවිදි = (පැවිජි බලන්න.)

පැවිද්දා = 1. ප්‍රව්‍රජිතයා; ශ්‍රමණයා; මහණ දම් පුරන්නා.

පැවින් = 1. පවින්; පාපයෙන්.

පැස = 1. කූඩය. 2. මල්ල 3. වේවැල් ආදියෙන් තැනූ මසුන් දමන කූඩය. 4. පැහැ. 5. පසු.

පැසවනු = 1. පැසීම කරවන. 2. පලතුරු ආදීය මේරීම කරවන. 3. හිතේ වෛරය දියුණු කරවන. 4. ගඩා ගෙඩි ආදියෙහි ඕජස ඇති කරවන. 5. යම්කිසි දෙයක් උඩුතෙක් පිය ගැනීම කරවන. 6. ඉදවන.

පැසසිම් = (පැසසුම්) 1. ප්‍රශංසාව; ස්තුතිය. 2. වණ්ණනාව. 3. ගුණ කථනය.

පැස් = 1. මල්ල. 2. පැහැ. 3. කුඹාපෙට්ටිය.

පැස්බරා = 1. එතම්පක්ෂියා. 2. බටු කුකුළා.

පැස්මාලු = 1. මහලු පැහැ. 2. මලු කබල. 3. පරණ වේවැල් කූඩය.

පැසෑ = 1. පවනාශ කොට; පිය.

පැසැපිය = 1. ප්‍රශංසා කරන්නට; ස්තුති කරන්නට.

පැසි = 1. පිසූ. 2. පැහි; අංනාර විශෙෂයක්. 3. මේරූ. 4. බස්නාහිර දිශාව 5. අච්චාරු. 6. අන්තිම. 7. ඇඹුල්.

පැසිබත් = 1. පැහි සහිත බත; ඇඹුල් බත.

පැසිහිඟුරු = 1. පැහි සැදූ ඉඟුරු; ඉඟුරු පැසි. 2. ඉඟුරු ශෙසි.

පැසෑහි = 1. ප්‍රශංසා කළ.

පැසිගිනියා = 1. ලෝභයා. 2. කෑදරයා.

පැහිම් = 1. පශ්චිම.

පැහිම්යම් = 1. පශ්චිම යාමය; රාත්‍රියේ අන්තිම යාමය; අලුයම් කාලය.

පැසීම = (පැහීම) 1. මේරීම. 2. ඉදීම. 3. පිසීම; ඉවීම.

පැහුණ් = 1. පැහීම; මුහුකිරීම; මේරීම.

පැහුණ්තැවි = 1. පශ්චාත්තාපය; පසුතැවිල්ල.

පැසුම් = 1. පශ්චිම.

පැසුම්සල් = 1. පශ්චිම කාලය; අවසාන කාලය.

පැසුම්යම් = 1. පශ්චිම යාමය.

පැසුම්විය = 1. පශ්චිම වයස; අන්තිම කාලය.

පැසුළු = (පැසුළු) 1. පසුව; පසු වූ. 2. පස්ස; පත්සා.

පැසුළුදෙර = 1. පස්සා දොර. 2. (ගෙයි) පස්සා පැත්ත.

පැසුළුබල = 1. අනුබලය.

පැසූ = 1. පියන ලද; උයන ලද.

පැසෙනු = 1. පිසෙන; ඉදෙන. 2. (නරකයෙහි) විපාක විඳින. 3. මුහුකුරා යන; මෝරන 4. උපදින. 5. (දිය) රත්වන. 6. (බුලත් ආදිය) පීදෙන.

පැහැ = 1. වැල්වලින් සැදූ කූඩය. 2. මසුන් බඟාලන කූඩයක්. 3. පාට; වර්ණය. 4. රශ්මිය. 5. ආලෝකය. 6. ප්‍රභාව; දීප්තිය.

පැහැඋදුල = 1. ප්‍රභාවෙන් බබලන.

පැහැකරනවා = 1. සංගම් ගානවා; සංගම් ශබ්දවනවා. 2. ඔප කරනවා; ඔප දමනවා.

ඵැහැකිඳු = 1. කාන්ති ධාරාව..

ඵැහැගන = 1. ප්‍රභාවෙන් ඝනවූ; අධික වූ; ප්‍රභාවෙන් යුක්තවූ.

ඵැහැඳ = 1. ප්‍රසන්නව; සතුටුවී. 2. තේරුම් ගෙන. 3. ඒක්තු නෙන.

ඵැහැදිලි = 1. ප්‍රභාවෙන් බබළන. 2. ප්‍රත්‍යක්ෂ 3. පිරිසිදු. 4. හොඳින් පෙනෙන. 5. බොරු නොවූ 6. සුබාවබෝධවන; පහසුවෙන් තේරුම් යන. 7. නිර්මල.

ඵැහැදිලිකරනවා = 1. පහදා දෙනවා. 2. තේරුම් කරනවා.

ඵැහැණ = 1. මහ හැළිය.

ඵැහැනඳ = 1. ප්‍රභාවෙන් යුක්තවූ. 2. ප්‍රභාව බැඳුණු.

ඵැහැනිල් = 1. නීල වර්ණයෙන් යුක්ත වූ; නිල් පැහැති.

ඵැහැත් = 1. රශ්මිය. 2. හිරුරැස්.

ඵැහැසත් = 1. ප්‍රභාවෙන් යුක්තවූ 2. පැහැදිලි. 3. බබළන. 4. පාට ඇති: පැහැය ඇති.

ඵැහැපියා = 1. පැහැලා; කොටා පැහැලා.

ඵැහැබර = 1. ප්‍රභාවෙන් බරවූ; අධික ප්‍රභාව ඇති; පාටින් වැඩිවූ.

ඵැහැය = 1. වර්ණය; පාට.

ඵැහැයමිනි = 1. පහදමින්.

ඵැහැසෙන = 1. පැදෙන; සතුටුවන.

ඵැහැර = (පහර බලන්න)

ඵැහැරඅරිනවා = 1. මගහරිනවා. 2. අත් හරිනවා. 3. කොාසලකා ඉන්නවා. 4. යන්නට හරිනවා.

ඵැහැරඳ = 1. ප්‍රභාරාජිය; කාන්ති ධාරාව; රැස් සමූහය.

ඵැහැරි = 1. ගැසූ; පහර දුන්.

ඵැහැරීම් = (පැහැරුම්) 1. පහර දීම්. 2. පැහැර ගැනීම්. 3. විරේකය වීම්.

ඵැහැල = 1. පහළ.

ඵැහැවතුරු = 1. ප්‍රභාව නමැති වතුර පාර.

ඵැහැස = 1. අපහාස කොට.

ඵැහැසර = 1. ප්‍රභාවෙන් සරුවූ; ප්‍රභාවෙන් යුක්තවූ. 2. ඉතා බබළන.

ඵැහැසි = 1. සැඩි කිරීම; පැස්සීම; එක්වීම. 2. මනාකොට නෙවූ; ශුද්ධ කළ.

ඵැහැසී = 1. පැස්සී; ගැටී.

ඵැහැසපු = 1. වර්ණ සම්පත්තිය.

ඵැකි = 1. අච්චාරු වර්ගයක්. 2. කෑම වර්ගයක්.

ඵැගිච්ච = 1. පැහුණු. 2. මුහුකුරා ගිය; මේරූ 3. සුදුවූ.

ඵැගිච්චකම = 1. ව්‍යාජ පණ්ඩිතකම. 2. පණ්ඩිතමානී කම.

ඵෑ

ඵෑ = 1. පැය. 2. පැතැවිය. 3. පැහැය; පාට; සායම. 4 ලස්සණ. 5. දක්වා. 6. ප්‍රිය. 7. කෝප්පය. 8. දත්වා.

ඵෑකාටුව = 1. පැය කටුව; ඔර්ලෝසුවෙහි පැය දක්වන කටුව.

ඵෑගස් = 1. ඔලිඳ වැල.

ඵෑගත් = 1. පැහැය ඇති: 2. බඳින ලද.

ඵෑගැලු = 1. පාට ගානලද.

ඵෑගීම = (පැගුම) 1. යටත්කර ගැනීම. 2. පාගා යාම. 3. පයින් මැඩීම.

ඵෑන = 1. තීන්තෙන් ලිවීමට ගන්නා උපකරණය.

ඵෑන්තලය = 1. පෑනට සවිකොට ලිවීමට ගන්නා තුඩ සහිත කොටස.

ඵෑනපිහිය = 1. පෑන මස් පිහිය; නවන - දිග හරින කුඩා පිහිය.

ඵෑන්මිට = 1. පෑනෙහි අතට අසුවන කොටස.

ඵෑන් මිත්‍රයා = 1. නුදුටු මිතුරා; ලියුම් වලින් හඳුනාගත් මිත්‍රයා.

ෂැතැව්ය = 1. සිහිත් සිදුරකින් පිරෙන දිය නියා ෂැයකින් හිඳ බසින අන්දමට පරත්තන් විසින් සකස්කොට ගන්නා ලද ලොල් කටුව හෝ නැටිය.

ෂැඳෑ = 1. ප්‍රසන්නව; සතුටුව.

ෂැදූ = 1. පාදන ලද.

ෂැඳෙනවා = 1. පිරිසිදු වෙනවා. 2. වැට-හෙනවා. 3. ප්‍රසන්න වෙනවා; සතුටු වෙනවා.

ෂැපත් = 1. පැහැයට පැමිණි; පැහැයෙන් යුතු.

ෂැමු = 1. දුක්වීම; පෙත්වීම.

ෂැමැඩි = 1. පාට මැටි 2. පැහැය ඇතිකිරීම සඳහා ගාන මැටි වෙසෙස. 3. සමරි?

ෂැය = 1. පැහැය; පාට. 2. පැ නැටිය.

ෂැරීම් = 1. පැහැරීම. 2. කෙටීම.

ෂැරෙනවා = 1. කකියනවා. 2. වේදනා වෙනවා. 3. ගැටෙනවා.

ෂැලි = 1. කුරුණි දහයක්. 2. බස්නාහිර. 3. පස්නා පැත්ත. 4. පසු පැත්ත.

ෂැලුඳිශ = (පැලුදෙස) 1. බස්නාහිර පැත්ත.

ෂැලුමඳුර = 1. බස්නාහිර පැත්තේ දොර. 2. පස්සාදොර.

ෂැලවිය = 1. පසළොස්වක හෝ මාසේ පෝය දවසට පසු දවස; පූර්ව-අපර පක්‍ෂයන්හි පළමුවන දවස.

ෂැලූඤ්ඤ = 1. පියස; ප්‍රදේශය. 2. කුඹුරු ආදියෙහි කොණක පිහිටි බිම.

ෂැස්සිඹ = 1. එකට පිරිද්දීම. 2. එකතු වීම. 3. සම්බන්ධ කිරීම.

ෂැස්සුනු = 1. බොල් වී ආදිය පොලා ශුද්ධ කළ-යුතු. 2. අතු රිකිලි ආදිය කැපිය යුතු.

ෂැහිම් = 1. ගැලපීම්. 2. සමානත්වය. 3. සාමයෙන් කටයුතු කිරීම. 4. (බොල් ආදිය) ශුද්ධ කිරීම. 5. (අතු-රිකිලි ආදිය) කැපීම 6. එකඟවීම.

ප්‍රථම භාගය සමාප්තයි.